පාලි අට්ඨකථා සිංහල පරිවර්තන - 7

අට්ඨකථාචාර්ය්‍ය බුද්ධඝොෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# සමන්තපාසාදිකා විනයට්ඨකථා

## සඞ්ඝාදිසෙස සිට භික්ඛුනීවිභඞ්ග අවසානය දක්වා

(සිංහල පරිවර්තනය)

දෙවෙනි කොටස

සිංහල පරිවර්තනය

**රාජකීයපණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල**
**මහානායක ස්ථවිර**

බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අවසරය පිට
මුද්‍රණය කරන ලදී.

අට්ඨකථාචාර්ය බුද්ධඝොෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

# සමන්තපාසාදිකා විනයට්ඨකථා

## සඞ්ඝාදිසෙස සිට භික්ඛුනීවිභඞ්ග අවසානය දක්වා

(සිංහල පරිවර්තනය)

**දෙවෙනි කොටස**

ප්‍රථම මුද්‍රණය : ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය - 2004

**පරිවර්තනය**

අම්බලම්ගොඩ ශාස්ත්‍රොදයපරිවෙණාධිපතිව වැඩ විසූ
ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය විනයකීර්ති ශ්‍රී මහොපාධ්‍යාය

**රාජකීයපණ්ඩිත අම්බලම්ගොඩ ධම්මකුසල**

**අමරපුර නිකායේ මහානායක මහාස්ථවිරයන්වහන්සේ**

## ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ
## අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුව

මහාචාර්ය ඇම්. බී. ආරියපාල (සභාපති)

රාජකීය පණ්ඩිත ආචාර්ය පී. එස්. බී. සේනානායක

මහාචාර්ය එන්. ඒ. ජයවික්‍රම

ආචාර්ය ඇස්. පී. සමරසිංහ

ආචාර්ය කේ. ඩී. පරණවිතාන (භාණ්ඩාගාරික)

මහාචාර්ය කපිල අභයවංස (ලේකම්)

ආචාර්ය අභය අධිකාරී

මහාචායර් රත්න විජේතුංග

# පෙරවදන (පළමු මුද්‍රණය)

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ කටයුතු පිළිබඳ කමිටුව මගින් ක්‍රියාත්මක කරනු ලබන පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියෙහි සත්වැනි කෘතිය ලෙසින් සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ ද්විතීය භාගය මුද්‍රණකටයුතු නිමවා පාඨකයන් හමුවට මෙසේ ඉදිරිපත් කිරීමට ලැබීම කමිටුවේ බලවත් සතුටට හේතුවෙයි.

සමන්තපාසාදිකා විනයට්ඨකථා ප්‍රථමභාගයේ මෙන්ම මෙම ද්විතීයභාගයේද පරිවර්තන කාර්‍යය සිදුවී ඇත්තේ ලක්දිව මෑතභාගයෙහි පාලිභාෂාව පිළිබඳ ප්‍රවීණ විද්වතකු වූ අම්බලන්ගොඩ ශාසනෝදය පරිවෙණාධිපතිව වැඩ විසූ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය විනයකීර්ති ශ්‍රී මහොපාධ්‍යාය රාජකීය පණ්ඩිත **අතිපූජ්‍ය අම්බලම්ගොඩ ධම්මකුසල මහානායක මාහිමිපාණන් වහන්සේ** අතිනි. සමන්තපාසාදිකා විනයට්ඨකථාවේ සිංහල පරිවර්තනයේ පාරාජික කාණ්ඩය හැර ඉතිරි කොටස උන්වහන්සේගේ අත් අකුරින් ලියා අමුද්‍රිතව පැවතිණ.

මුද්‍රිතව පැවති පාරාජික කාණ්ඩයද ඇතුළත්වූ සම්පූර්ණ කෘතිය මෙසේ කොටස් වශයෙන් පළකිරීමට ශ්‍රී ලංකා රාජකීය සමිතියේ අත්ථකථා පරිවර්තන කමිටුවට අනුග්‍රහය දක්වන ලද්දේ උන්වහන්සේගේ ශිෂ්‍යවර ශ්‍රී දෙවානන්ද ධම්මකුසල වංශාලංකාර ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය මහොපාධ්‍යාය චන්ද්‍රකීර්ති ශ්‍රී පණ්ඩිත ශාස්ත්‍රවේදී අතිපූජ්‍ය **අම්බලම්ගොඩ සුමඞ්ගලාභිධාන අමරපුර නිකායේ මහානායක මාහිමිපාණන් වහන්සේ** විසිනි. අතිපූජ්‍ය අම්බලම්ගොඩ ධම්මකුසල මහනාහිමිපාණන් වහන්සේගේ ශ්‍රී නාමයට උපහාරයක් වියහැකි පරිද්දෙන් සමන්තපාසාදිකා

විනයට්ඨකථාව මුද්‍රණය කිරීමෙහිලා අනුග්‍රහය දැක්වූ අතිපූජ්‍ය අම්බලම්ගොඩ සුමඞ්ගල මහානායක මාහිමිපාණන්වහන්සේට පරිවර්තන කමිටුවේ කෘතඥතාව පළවෙයි. මේ හැර මෙම කෘතිය මුද්‍රණයේදී ශොධ්‍යපත්‍ර කියවීමෙන් උන්වහන්සේ දැක්වූ අනුග්‍රහයද කෘතඥතා පූර්වකව සිහිපත් කරමු.

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීම පිළිබඳ කමිටුව මගින් මෙම පරිවර්තන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන්නේ බුද්ධශාසන අරමුදලෙන් ලැබෙන මූල්‍ය ප්‍රතිපාදනයේ අනුග්‍රහයෙනි. බුද්ධශාසන අමාත්‍යාංශය මගින් ඒ පිළිබඳව කෙරෙන සම්බන්ධීකරණයද මෙම අට්ඨකථා පරිවර්තන ග්‍රන්ථ සම්පාදනයට මාහැඟි පිටුබලයක් වෙයි. පාලිභාෂා ප්‍රවීණත්වය කෙරෙහි විශේෂ අවධානයක් නොදැක්වෙන මෙබඳු අවධියක පාළි අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට අට්ඨකථා පරිශීලනය කිරීමේ වරප්‍රසාදය සිංහලපාඨකයන් අතට පත් කිරීම යුග මෙහෙවරක් ලෙස අපි දකිමු. එම යුග මෙහෙවර ඉටු කිරීමට අවශ්‍ය ක්‍රියාත්මක ශක්තිය අප වෙත පැවරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමිය ඇතුළු බුද්ධ ශාසන අරමුදලේ භාරකාර මණ්ඩලය, බුද්ධශාසන අමාත්‍යාංශය හා එහි කාර්‍ය්‍ය මණ්ඩලයද පැසසුමට බඳුන්වනු නොඅනුමානය.

මෙම ග්‍රන්ථයෙහි මුද්‍රණ කටයුතු ඉතා මැනවින් කමනීය ලෙස නිමකරදුන් දෙහිවල ශ්‍රීදේවී ප්‍රින්ටර්ස්හි අධිපති මහේන්ද්‍ර සේනානායක මැතිතුමාටද අපගේ කෘතඥතාව හිමිවෙයි.

**ශ්‍රීලංකා රාජකීය ආසියාතික සමිතියේ**
**පාලි අට්ඨකථා පරිවර්තන කටයුතු පිළිබඳ කමිටුව**

ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය
96, ආනන්ද කුමාරස්වාමි මාවත
කොළඹ 07

දුරකථනය : 2699249

# පටුන


| | |
|---|---|
| පෙරවදන | |
| අට්ඨකථා පරිවර්තන කමිටුව | |
| සමන්තපාසාදිකා විනයට්ඨකථාව | 1-416 |
| තෙරස සඞ්ඝාදිසෙස වණ්ණනාව | 1-106 |
| අනියත වණ්ණනාව | 107-110 |
| නිස්සග්ගිය පාචිත්තිය වණ්ණනාව | 111-200 |
| පාචිත්තිය වණ්ණනාව | 201-349 |
| පාටිදෙසනීය වණ්ණනාව | 350-351 |
| සෙඛිය වණ්ණනාව | 352-362 |
| භික්ඛුණී විභඞ්ගවණ්ණනාව | 363-416 |
| i. පාරාජික කාණ්ඩ වණ්ණනාව | 363-369 |
| ii. සත්තරසක සඞ්ඝාදිසෙස වණ්ණනාව | 370-379 |
| iii. තිංසක නිස්සග්ගිය වණ්ණනාව | 380-384 |
| iv. පාචිත්තිය වණ්ණනාව | 385-415 |
| v. පාටිදෙසනීය වණ්ණනාව | 416 |

# සමන්තපාසාදිකා
# විනයට්ඨකථා

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

### යං පාරාජිකකණ්ඩස්ස සඞ්ගීතං සමනන්තරං
### තස්ස තෙරසකස්සායමපුබ්බපදවණ්ණනා

පාරාජිකකාණ්ඩයට අනතුරුව යම් තෙරසසඞ්ඝාදිශෙෂකාණ්ඩයක් සඞ්ගායනා කරන ලද්දේද, ඒ තෙරස ශික්‍ෂාපද කාණ්ඩයේ මේ පෙර නොතිබූ පදවර්ණනාය.

"**තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන පන සමයෙන ආයස්මා සෙය්‍යසකො අනභිරතො බ්‍රහ්මචරියං චරති**" යන මෙහි "**ආයස්මා**" යනු ප්‍රියවචනයි. "**සෙය්‍යසකො**" යනු මේ මහණහුගේ නාමයයි. "**අනභිරතො**" විසුරුනු සිත් ඇත්තේ කාමරාගපරිදහයෙන් හාත්පසින් දැවෙනුයේ ගිහිබව පතමින් නොවේ. "**සො තෙන කිසො හොති**" ඒ සෙය්‍යසක තෙමේ ඒ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි ඇලුම් නැති බැවින් කෘශ වූයේවේ. "**අද්දසා ඛො ආයස්මා උදායි**" මෙහි උදයී යනු ඒ තෙරුන්ගේ නාමයවේ. මෙතෙමේ වනාහි සෙය්‍යසක මහණහුගේ උපාධ්‍යායවූ **ලාලුදයී** නම්වේ. භ්‍රාන්තමෘගයකු සමාණවූ එතෙමේ නිද්‍රාරාමතාදියෙහි යෙදුනුවුන් අතුරෙහි එක්තරා ලොල් මහණෙකි. "**කච්චි නො ත්වං**" කච්චි නු ත්වං, යනු පද යෙදුමයි. කිම, තෝ "**යාවදත්ථං, භුඤ්ජ**" යනාදි තන්හි යම්පමණ ප්‍රයෝජනවූයේයි යාවදත්ථ නම. 'යම්පමණ තට භෝජනයෙන් ප්‍රයෝජනවේද, තෝ යම්පමණ කැමැත්තෙහිද, එපමණ අනුභව කරව, යම් පමණ කල් රෑ හෝ දවල් නිදන්නට කැමැත්තෙහිද, එපමණ කල් නිදව. මැටි ආදියෙන් කය උළා හුණු ආදියෙන් ගටා

නැම යම්පමණ කැමැත්තෙහිද, එපමණ නහව, උදෙසීමෙන්, හෝ පිළිවිසීමෙන් හෝ වත්පිළිවෙතින් හෝ කමටහනින් හෝ ප්‍රයොජන නැත්තේයයි මෙය කියනලද්දේය. "**යදා තෙ අනභිරති උප්පජ්ජති**". යම්කලෙක තට කාමරාග වසයෙන් උකටලීබවෙන් විසුරුනු සිත් ඇති බවක් උපදීද, "**රාගො චිත්තං අනුද්ධංසෙති**" කාමරාගය සිත පෙරළාද ප්‍රකම්පයෙන් පෙරළාද, හසුරුවාද, මලානික කෙරේද "**තදා හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙහි**" එකල්හි අතින් වෑයම්කොට ශුක්‍ර මොචනය කරව, එසේ කළ කල්හි තාගේ සිතෙහි එකහබව වන්නේය. මෙසේ උපාධ්‍යාය තෙමේ ඒ සෙය්‍යසක මහණහට අනුශාසනා කෙළේය. බාලයෙක් බාලයෙකුට, ගොළුවෙක් ගොළුවෙකුට[1] යම්සේද එසේය.

"**තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං**" සිහිය හා වැඩ අවැඩ සලකන නුවණ හැර නින්දට බස්නාවූ. එහි කෙසේ නමුත් නින්දට බසින්නවුන් පිළිබඳ අව්‍යාකෘත භවාඞ්ගවාරය පවත්නේය. ස්මෘතිසම්ප්‍රජන්‍යවාරය ගිලෙන්නේය. එසේ නමුත් නිදන කාලයෙහි මනස්කාරය කටයුතුය. දවල නිදන්නහු විසින් යම්තාක් දිය නෑ මහණහුගේ කෙස් නොවියලේද, ඒතාක් නිද නැගිටෙන්නෙමියි උත්සාහ සහිතව නිදගතයුතුය. රෑ නිදන්නහු විසින් මෙතරම් රාත්‍රිභාගයක් නිද සඳ හෝ තරුවක් හෝ මෙනම් තැනට පැමිණිකල්හි නැගිටින්නෙමියි උත්සාහ සහිතව නිදගතයුතුය. බුද්ධානුස්මෘති ආදී දශ කම්ස්ථාන අතුරෙහි සිතට රුචි එක් කම්ස්ථානයක් හෝ අතිත් කම්ස්ථානයත් හෝ ගෙනම නින්දට පැමිණියයුතුය. මෙසේ කරන්නේම සිහි ඇත්තේ, මොනවට දන්නේ ස්මෘතියද සම්ප්‍රජන්‍යයද නොහැරම නින්දට බසීයයි කියනුලැබේ. බාලවූ ලොල්වූ භ්‍රාන්තමෘගයන් වැනි මහණෝ මෙසේ නොකළාහුය. "තෙසං මුට්ඨස්සතීනං අසම්පජානානං නිද්දං ඔක්කමන්තානං"යි එහෙයින් වදාරනලදී. "**අපි චෙත්ථ චෙතනා ලබ්භති**" යන මෙහිද නින්දෙහි ආස්වාදචෙතනාව ඇත්තීය. ලැබෙන්නීය. "**අත්ථෙසා භික්ඛවෙ චෙතනා සා ච ඛො අබ්බොහාරිකා**" මහණෙනි, මේ ආස්වාදචෙතනාව ඇත්තීය. ඒ චෙතනාව අවිසයෙහි උපන්බැවින් අව්‍යවහාරික වන්නීය. ඇවැතට අඞ්ගයක් නොවේ.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ ස්වප්නාන්ත චෙතනාවෙහි අව්‍යවහාරිකාභාවය දක්වා "**එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ, සඤ්චෙතනිකා සුක්කවිස්සට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා සඞ්ඝාදිසෙසො**"යි අනුප්‍රඥප්ති සහිතවූ ශික්ෂාපදය පණවා වදළසේක. එහි මේ සුක්කවිස්සට්ඨියට චෙතනාව විද්‍යාමානවන්නීයයි සඤ්චෙතනා නම. සඤ්චෙතනාවම සඤ්චෙතනිකා නම. විද්‍යමාන චෙතනා මෝහට ඇත්තීනුයි හෝ සඤ්චෙතනිකා නම. යම්හෙයකින් යමක්හට චෙතනා

සහිත සුක්කවිසට්ඨියවේද හෙතෙමේ දන්නේ මොනවට දන්නේවේ. මොහුගේ ඒ සුක්කවිසට්ඨිය මොනවට චේතනා වසයෙන් දැන සිතා උපක්‍රමවශයෙන් මැඩීමෙන් ව්‍යතික්‍රමයවේද, එහෙයින් ව්‍යඤ්ජනයෙහි ආදරය නොකොට අර්ථයම දක්වනු පිණිස "**ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො**" යි මෙසේ මේ ශික්ෂාපදයෙහි පදභාජනය වදාළසේක. එහි "**ජානන්තො**" යනු 'උපක්‍රම කරමි'යි දන්නේ "**සඤ්ජානන්තො**" යනු ශුක්‍ර මුදමි'යි හැමුතින් දන්නේ. ඒ උපක්‍රමය දන්නා ආකාරය සමග දන්නේය යන අර්ථය. "**චෙච්ච**" මොචනාස්වාදචේතනා වශයෙන් සිතා, තදින් කල්පනාකොට "**අභිවිතරිත්වා**" උපක්‍රමවශයෙන් මඩිමින් නිසැක සිත යවා, "වීතික්කමො" මෙසේ පැවති යම් ව්‍යතික්‍රමයක්වේද, මෙය සඤ්චෙතනිකා ශබ්දයෙහි කෙළපැමිණි යන අර්ථයයි කියනලද්දේවේ.

දැන් "**සුක්කවිසට්ඨි**" යන මෙහි යම් ශුක්‍රයක් පහකිරීමක්වේද, එය සඞ්ඛ්‍යා විසින් වර්ණභේද විසින් දක්වන්නට "**සුක්කන්ති දසසුක්කානි**" යනාදිය කීහ. එහි ශුක්‍රයන්ගේ ආශ්‍රයභෙදයෙන්ද, ධාතූන්ගේ නානත්වයෙන්ද නීලාදිවර්ණභෙදය දතයුතුය. "**විසට්ඨි**" පහකිරීමය. අර්ථවශයෙන් මෙය තුබූ තැනින් පහකිරීමය. "**විසට්ඨීති ඨානා චාවනං වුච්චතියි** එහෙයින් කීය.

එහි ශුක්‍රය පිහිටි ස්ථානය, හෝ ශුක්‍රය පිහිටි තැන වස්තිමස්තය, කටිය, හා සියලු කයයි. තෙපරිද්දෙකින් කල්පනා කෙරෙත්. ප්‍රකාශ කෙරෙත්. එක් ආචාර්යවරයෙක් වස්තිමස්තකය ශුක්‍රයට ස්ථානයයි කීය. එක් ආචාර්යවරයෙක් කටියයි කීය. එක් ආචාර්යවරයෙක් සියලු කයැයි කීය. ඒ ආචාර්යවරයන් අතුරෙහි තෙවැන්නහුගේ කීම මනා කීමය. කෙස්, ලොම්, නිය, දත් යන මොවුන් පිළිබඳ මස් රහිත තැන්ද, මලමූ කෙළ, සොටුද තදවියලි මස්ද හැර සෙසු සම්, මස්, ලේ හා එක්වූ සියලුම කය, කායප්‍රසාදභාව ජීවිතෙන්ද්‍රිය අබද්ධපිත්තයන්ට හා ශුක්‍රයට ස්ථානමවේ. ඒ එසේමය. රාගය හාත්පසින් බලවත්ව නැගීමෙන් මැඩුණු ඇතුන්ගේ දෙකන් සිළුවෙන් ශුක්‍ර නික්මෙන්නේය. මහසෙන් රජ තෙමේද රාගයෙන් මඩනාලද්දේ ශුක්‍රවේගය ඉවසන්නට නොහැකිව සැතින් උරහිස පලා වණමුවින් නික්මුනු ශුක්‍රය දැක්වීය. මෙහි ප්‍රථමාචාර්යයන්ගේ වාදයෙහි මොචනාස්වාදයෙන් නිමිත්තෙහි උපක්‍රම කරන්නහුට කුඩා මැස්සෙකු බොන පමණ ශුක්‍ර වස්තිමස්තකයෙන් මිදී මූත්‍ර නික්මෙන මගට බට ඇසිල්ලෙහි පිටතට නික්මුනුකල්හි හෝ නොනික්මුනු කල්හි හෝ සඞ්ඝාදිසෙසයවේ. ද්විතීයාචාර්යයන්ගේ වාදයෙහි එසේම මොචනස්වාදයෙන් නිමිත්තෙහි උපක්‍රම කරන්නහුට කටියෙන් මිදී මූත්‍රමාර්ගයට බට කල්හිද, තෘතීයාචාර්යයන්ගේ වාදයෙහි එසේම මුළු

කය සොලොවා එයින් ශුක්‍ර මිදී මූත්‍රමාර්ගයට බට ඇසිල්ලෙහි පිටතට නික්මුනු කල්හි හෝ නොනික්මුනු කල්හි සඞ්ඝාදිසෙසයවේ. මූත්‍රමාර්ගයට බැසීමද මෙහිදී ඉවසා අතරදී වළකාලන්නට නොහැකි බැවින් කියනලදී. තුබූ තැනින් ගිලිහුනු පමණින්ම ආපත්ති දතයුතුය. ඒ ආපත්තියද නිමිත්තෙහි උපක්‍රම කරන්නහුටම වන්නීය. අත්පිරියම් පාපිරියම් සිරුරු පිරියම් කරණකොට ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. මේ සියලු ආචාර්යයන්ගේ සාධාරණ විනිශ්චයයි. ''**අඤ්ඤත්‍ර සුපිනන්තා**'' මෙහි සුපිනයම සුපිනන්තනම්වේ. ඒ සුපිනන්තය හැරය, පහකොටයයි කියනලද්දේවේ. ඒ සිහිනය දක්නේද ධාතු කැළඹීමෙන් හෝ පෙර ඇසුරු කළ අරමුණෙන් හෝ දෙවියන් විසින් එළවීමෙන් හෝ පෙර කළ පින් පව් විසින් හෝ යන කරුණු සතරින් සිහින දක්නේය. පිත්, සෙම් ආදිය කළඹන හේතු යෙදීමෙන් චලනයවූ ධාතුක්ෂොභයෙන් සිහින දක්නේය. දක්නේද පර්වතයෙන් හෙන්නකු මෙන්ද, අහසින් යන්නකු මෙන්ද, ව්‍යාලමෘග, ඇත් සොර ආදීන් විසින් ලුහුබැන්දෙකු මෙන්ද යන නන්වැදෑරුම් සිහින දක්නේය. පෙර කළ ක්‍රියාවන්ට අනුව දක්නේ පෙර අනුභවකළ අරමුණු දක්නේය. දෙවියන්ගේ එළවීම් වසයෙන් දක්නහුට දෙවියෝ වැඩ කැමැතිබැවින් හෝ අවැඩ කැමැතිබැවින් හෝ වැඩ පිණිස හෝ අවැඩ පිණිස හෝ නන්වැදෑරුම් අරමුණු එළවත්, හෙතෙමේ ඒ දෙවියන්ගේ අනුභාවයෙන් ඒ අරමුණු දක්නේය. පූර්වනිමිත්ත වශයෙන් දක්නේ කුසල් අකුසල් වසයෙන් උපදිනු කැමැත්තහු පිළිබඳ වැඩට හෝ අවැඩට පෙරනිමිතිවූ සිහින දක්නේය. බෝසත්මව මෙන් පුතකු ලැබීමෙහි නිමිත්ත, බෝසතුන් මෙන් පස්මහසිහින, කොසොල්රජුමෙන් සොළොස් සිහින දැකීම එහිලා දතයුතුය. එහි ධාතුක්ෂොභයෙන්ද, අනුභූතපූර්වයෙන් යම් සිහිනයක් දක්නේද, ඒ සිහින සත්‍ය නොවේ. දෙවතොපසංහාර වසයෙන් යම් සිහිනයක් දක්නේද, එය සත්‍ය හෝ අසත්‍ය හෝ වේ. කිපුණු දෙවියෝ උපායයෙන් නසනු කැමැතිව විපරීතකොට සිහින දක්වන්නාහුය. පූර්වනිමිත්ත වශයෙන් යම් සිහිනයක් දක්නේද? ඒ සිහිනය ඒකාන්තයෙන් සත්‍යම වේ. මේ චතුර්විධ මූල කාරණයන් පිළිබඳ සත්‍ය අසත්‍ය සංසර්ගභේදයෙන් සවප්න වේමය. ශෛක්ෂ පෘථග්ජනයෝම මේ සිව්වැදෑරුම් සිහින දකින්නාහ. එසේ දකින්නේ ප්‍රහීණ නොකළ විපර්‍යාස ඇතිබැවිනි. අශෛක්ෂයෝ සිහින නොදකිත්. ප්‍රහීණ කළ විපර්‍යාස ඇතිබැවිනි.

කිම, යම් සිහින දක්නේ නිදිගත්තේ සිහින දකීද, පිබිදී සිටියේ දකීද, නොහොත් නොම නිදිගන්නේ නොම පිබිදුනේ දකීද, යන මෙහි නිදිගත්තේ සිහින දකීනම් අභිධර්මවිරොධයවේ. භවාඞ්ගචිත්තයෙන්ම නිදන්නේය. ඒ කාලයෙහි පැවැති ඒ භවාඞ්ගචිත්තයට රූපනිමිති ආදීවූ

අරමුණක් හෝ රාගාදීන් හා යෙදුනක් හෝ නොවන්නේය. සිහින දකින්නහුටද මෙබඳු සිත් උපදී. පිබිදියේ සිහින දකියි කියා නම් විනයවිරෝධය පැමිණේ. පිබිදියේ යමක් දකී ද, එය ප්‍රත්‍යක්ෂ චිත්තයෙන් දක්නේය. ප්‍රකෘතිචිත්තයෙන් ව්‍යතික්‍රමය කළකල්හි අනාපත්තියක් නම් නැත්තීය. සිහින දකින්නහු විසින් ව්‍යතික්‍රමය කළකල්හි ඒකාන්තයෙන් අනාපත්තිමවේ. නැවත නොම නිදිගත්තේ නොම පිබිදියේ දකීනම්, කවරෙක් දකීද, මෙසේ ඇති කල්හිද, සිහිනයෙහි අභාවයම පැමිණේද, අභාවය නොපැමිණේ. කුමක්හෙයින්ද යත්, යම් හෙයකින් වඳුරුනින්දෙන් යුක්තවූයේ දකීද එහෙයිනි. 'මහරජ වඳුරුනින්දෙන් යුක්තවූයේම සිහින දකීයයි මෙය කියන ලද්දේය. '**කපිමිද්ධපරෙතො**' වඳුරන්ගේ නින්දෙන් යුක්තවූයේය. වඳුරාගේ නින්ද ලුහුව' පෙරළේද එසේ යම් නින්දක් නැවත නැවත කුසලාදීවූ සිතින් ව්‍යාකීර්ණ බැවින් ලුහුව පෙරළේ ද, යම් නින්දක පැවැත්මෙහි නැවත නැවත භවාඞ්ගයෙන් එතෙරවීමක්වේද, එයින් යුක්තවූයේ සිහින දක්නේය. එකරුණෙන් මේ සිහිනය කුසල්දවේ. අකුසල්දවේ. අව්‍යාකෘතදවේ. එහි සිහිනයෙහි සෑ වැඳීම් බණ ඇසීම් බණ දෙසීම් යනාදිය කරන්නහුට කුසල්වේ. පරපණනැසුම් ආදිය කරන්නහුට අකුසල්වේ. කුසල් අකුසල් දෙඅභින්[1] මිදුනේ ආවර්ජන තදලම්බනක්ෂණයෙහි අව්‍යාකෘතයි දතයුතුය. ඒ මේ අර්ථය දුර්වලවස්තුවක් බැවින් චේතනාවෙන් ප්‍රතිසන්ධිය ඇදගන්නට අසමර්ථවේ. ප්‍රවෘත්තියෙහි වනාහි අනික් කුසලාකුසලයන් විසින් රුකුල්දෙනලද්දේ විපාක දෙන්නේය. කෙසේ නමුත් විපාක දේද යන මෙහි අවිසයයෙහි උපන්බැවින් සුපිනන්ත චේතනාව අව්‍යවහාරිකම වන්නීය. එහෙයින් '**ඨපෙත්වා සුපිනං**' යනු වදළසේක. '**සඞ්ඝාදිසෙසො**' යනු මේ ආපත්තිසමූහයට නමකි. එහෙයින් ස්වප්නාන්තය හැර යම් සඤ්චෙතනිකා සුක්කවිස්සට්ඨියක්වේද, මෙය සඞ්ඝාදිසෙස නම් ආපත්තිසමූහයයි. මෙහි මෙසේ සම්බන්ධය දතයුතුය. සඞ්ඝ තෙමේ මේ ඇවතට ආදියෙහිද සෙස්සෙහිද කැමතිවිය යුත්තේනුයි සඞ්ඝාදිසෙස නම්වේ යනු මෙහි වචනාර්ථයවේ. මේ ඇවැතට පැමිණ නැගී සිටිනු කැමැත්තහුගේ යම් ආපත්තිවුට්ඨානයෙක්වේද, ඒ ආපත්ති වුට්ඨානයට ආදියෙහි මුලදී පරිවාසදනය පිණිසද, ආදියෙන් සෙසු මධ්‍යයෙහි මානත්තදනය පිණිසද මූලායපටිකස්සනය සමග මානත්තදනය පිණිසද, අවසානයෙහි අබ්භානය පිණිසද සඞ්ඝතෙමේ කැමතිවිය යුත්තේය. මෙහි එකද කර්මයක් සඞ්ඝයා හැර කරන්නට නොහැකියි. සඞ්ඝතෙමේ මේ ඇවැතට ආදියෙහිද සෙස්සෙහිද කැමැතිවිය යුත්තේයයි සඞ්ඝාදිසෙස නම්වේ. ව්‍යඤ්ජනය නොගෙන අර්ථයම දක්වන්නට 'සඞ්ඝතෙමේම ඒ ඇවැතට පරිවාසය දෙයි. මූලායපටිකස්සනය කරයි. මානත්තය දෙයි.

---

1. පාඨාන්තරය: ද්වීහි අනෙකහි, රෝ. මු.

අබ්භානය කරයි. දෙතුන් දෙනෙක් නොවෙති. එක් පුද්ගලයෙක් නොවේ. එහෙයින් සඞ්ඝාදිසෙසයි කියනුලැබේ. මේ මෙය පිළිබඳ පදභාජනයයි.

> 'සඞ්ඝාදිසෙසොති යං වුත්තං - තං සුණොහි යථා තථං,
> සඞ්ඝොව දෙති පරිවාසං - මූලාය පටිකස්සති
> මානත්තං දෙති අබ්භෙති-තෙනෙතං ඉති වුච්චති'.

සඞ්ඝාදිසෙසයි යමක් කියනලදද, ඒ මෙසේයයි එය අසව. සඞ්ඝතෙමේම පිරිවෙස් දෙයි. මූලායපටිකස්සනය කරයි. මානත දෙයි. අබ්භානය කරයි. සඞ්ඝයා මුල, මැද, අග යන තුන් තැනට කැමැතිවිය යුතුය යන අර්ථයෙන් මේ ඇවැත සඞ්ඝාදිසෙසයි කියනුලැබේ.

පරිවාරයෙහි මෙසේ වචනකාරණයද කියනලදි. එක පරිවාසදනාදීහු සමුච්චයක්ඛන්ධකයෙහි විස්තරවශයෙන් ආවාහුය. එහිදීම ඔවුන්ගේ සංවර්ණනය කරන්නෙමු. '**තස්සෙව ආපත්තිනිකායස්සව**' ඒ ඇවැත් සමූහයටමය. මෙහි මේ එක්ම ඇවැතකි. රූඪී ශබ්දයෙන් අවයවෙහි සමූහව්‍යවහාරයෙන් හෝ නිකායයි කියනලද්දේය. එක් වෙදනාස්කන්ධයෙක. එක් විඥනස්කන්ධයෙක යනාදිතන්හි මෙනි.

මෙසේ උදෙසනලද ශික්ෂාපදය පද පිළිවෙළින් විභාග කොට දැන් මේ සූක්තවිසටයියට පැමිණෙන්නහු පිළිබඳ උපායද කාලයද අභිප්‍රායද අභිප්‍රාය වස්තුවද දක්වනු පිණිස '**අජ්ඣත්තරූපෙ මොචෙති**' යනාදිය වදළසේක. මෙහි ආධ්‍යාත්මික රූපාදීවූ සිවු පෙදෙන් උපාය දක්වන ලද්දේය. ආධ්‍යාත්මික රූපයෙහි හේ බාහිර රූපයෙහි හෝ දෙතැන්හි හෝ අහස කටිය සොලොවමින් හෝ ශුක්‍ර මුදන්නේය. මෙයින් අන්‍යවූ උපායක් නැත්තේය. එහි රූපයෙහි ගටා මුදන්නේ ද රූපයෙන් ගටා මුදන්නේ ද රූපයෙහි ශුක්‍ර මුදයි මැයි දතයුතුය. හෙතෙමේ රූපය ඇති කල්හිම ශුක්‍ර මුදයි. රූපය නොලැබ නොමුදයි. රාගොපස්තමභාදීවූ පසින් කාලය දක්වන ලද්දේය. රාගයෙන් රුකුල්දීම් ආදි කාලයන්හි අඞ්ගජාතය කර්මණ්‍ය වේ. යම් නිමිත්තක් කර්මයට යොග්‍යභාවය ඇතිකල්හි ශුක්‍ර මුදද, මෙයින් අන්‍යවූ කාලයක් නැත්තේය. රාගයෙන් රුකුල්දීම් ආදිය හැර පෙරවරු ආදී කාලභෙද ශුක්‍ර මිදීමට නිමිත්ත නොවේ. ආරොග්‍යත්ථාය යනාදි දසයෙන් අභිප්‍රාය දක්වන ලද්දේය. මෙබඳුවූ අභිප්‍රාය භෙදයෙන් ශුක්‍ර මුදලයි. අන්පරිද්දෙකින් නොමුදලයි. නීලාදීවූ දසයෙන් නවවැනි වීමංසාභිප්‍රායෙහී වස්තුව දක්වන ලදි. විමසන්නේ නීලාදීන් අතුරෙහි එක්තරා එකක්හුගේ වසයෙන් විමසයි. ඔවුන් කෙරෙන් විනිර්මුක්ත නොවේ.

මෙයින් මතු මේ ආධ්‍යාත්මික රූපාදි පදයන් ප්‍රකාශ කිරීම පිණිස **'අජ්ඣත්තරූපෙති අජ්ඣත්තං උපාදින්නරූපෙ'** යනාදිය වදළසේක. එහි **'අජ්ඣත්තං උපාදින්නරූපෙ'** යනු තමන්ගේ හස්තාදීන්ගේ වසයෙන් හෙදවූ රූපයෙහි **'බහිද්ධා උපාදින්නෙ'** අත්හු පිළිබඳ එබඳු රූපයෙහිම. **'අනුපාදින්නෙ'** තල්සිදුරු ආදි භෙද ඇති අවිඥනරූපයෙහි, **'තදුභයෙ'** තමන්ගේ හා අන්‍යයාගේ රූපයෙහි දෙදෙනාගේ ගැටීම වසයෙන් මෙය කියන ලදි. තමන්ගේ රූපය සමගද අවිඥනකරූපය සමගද එකට ගැටීමෙහිද ලැබේ. **'ආකාසෙ වායමන්තස්ස'** කිසිරූපයක් සමග නොගටා අහසෙහිම කටිය සලන පියොවින් අඞගජාතය සොලොවන්නහුට **'රාගූපත්ථම්භෙ'** රාගයෙහි බලවත් බැවින්, රාගයෙන් හෝ අඞගජාතයේ රුකුල්දීම තදබව හටගත් කල්හියයි කියනලද්දේවේ. **'කම්මනියං හොති'**, මොචනක්‍රියාවට යොග්‍යවේ. ආධ්‍යාත්මික රූපාදියෙහි උපක්‍රමයට සුදුසුවේ. **'උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භෙ'** බූපණුවන් දෂට කිරීමෙන් අඞගජාතය තදවූ කල්හි උච්චාලිඞ්ග පණුවෝ නම් බොහෝ ලොම් ඇති පණුවෝ වෙත්. ඔවුන්ගේ ලොම්වලින් පහසලද අඞගජාතය කැසීම හටගෙන තදවේ. යම්හෙයකින් ඒ ලොම අඞ්ගජාතය ඨහ මෙන් විදිත්ද, එහෙයින් 'උච්චාලිඞ්ගපාණකදට්ඨෙන'යි කියනලදි. අර්ථවශයෙන් නම් බූපණුවන්ගේ විදීමෙනැයි කියනලද්දේවේ. **'අරොගො භවිස්සාමි'** ශුක්‍ර මුද නීරොගියෙක් වන්නෙමි. **'සුඛං වෙදනං උප්පාදෙස්සාමි'** මොචනයෙන්ද, මොචනය හෙතුකොටද, මුදනලද්ද හෙතුකොටද යම් සැප වෙදනාවක් වේද එය උපදවන්නෙමි යන අර්ථයි. **'භෙසජ්ජං භවිස්සති'** මා විසින් මේ ශුක්‍රය මුදනලද්දේ කිසි බෙහෙතක් වන්නේය. **'දානං දස්සාමි'** මුද පණු කැළිහිනි ආදීන්ට දන් දෙන්නෙමි. **'පුඤ්ඤං භවිස්සති'** ශුක්‍ර මුද පණු ආදීන්ට දෙන්නහුට පින් සිදු වන්නේය. **'යඤ්ඤං, යජිස්සාමි'** ශුක්‍ර මුද පණු ආදීන්ට යාගයක් කරන්නෙමි. කිසියම් කිසියම් මන්ත්‍රපදයක් කියා දෙන්නෙමියි කියනලද්දේවේ. **'සග්ගං ගමිස්සාමි'** ශුක්‍ර මුද පණු ආදීන්ට දුන් දනින් හෝ පිනෙන් හෝ යාගයෙන් හෝ ස්වර්ගයට යන්නෙමි. **'බීජං භවිස්සති'** කුලවංශයට බිජුවට වන්නේය. 'මේ බීජයෙන් පුත්‍රයෙක් උපදින්නේය, යන මේ අදහසින් ශුක්‍ර මුදය යන අර්ථය. **'වීමංසනත්ථාය'** දැනීම පිණිස 'නීලං භවිස්සති' යනාදියෙහි කිම, මාවිසින් මිදූ ශුක්‍ර නිල් වන්නේද, පීතකාදීන් අතුරෙහි එක්තරා එකක් වන්නේදැ'යි දැන ගන්නෙමි'යි මෙසේ අර්ථ දතයුතුය. **'කීළාධිප්පායො'** ක්‍රීඩාවෙහි යෙදුනේ ඒ ඒ අදහසින් ක්‍රීඩා කරමින් මුදයයි කියනලද්දේවේ.

දැන් **'අජ්ඣත්තරූපෙ මොචෙති'** යනාදීවූ මේ යමක් වදළසේක්ද, එහි යම්සේ මුදන්නේ ඇවැතට පැමිණේද, ඒ පදයන්ගේ වසයෙන්ද, යම්

පමණ ආපත්තිභෙදයක්වේද, ඒ සියල්ල දක්වනසේක් '**අජ්ඣත්තරූපෙ චෙතෙති, උපක්කමති, මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස**' යනාදිය වදළසේක. එහි '**චෙතෙති**, මොචනයට පූර්වභාගයෙහි පැවැති ආස්වාදසම්ප්‍රයුක්ත චේතනාවෙන් 'මිදේවා'යි සිතයි. '**උපක්කමති**' එයට අනුරූපවූ ව්‍යායාමය කරයි. '**මුච්චති**' මෙසේ සිතන, එයට අනුරූපවූ, ව්‍යායාමයෙන් ව්‍යායාම කරන්නහුගේ ශුක්‍රය තුබූ තැනින් පහවේ. '**ආපත්ති සඞ්ඝාදිසෙස**' මේ තුන් අගින් මේ පුද්ගලයාහට සඞ්ඝාදිසෙස නම් ආපත්තිය වේය යන අර්ථයි. '**බහිද්ධාරූපෙ**' යනාදීවූ සෙසු අටවිසි පදයන්හිද මේ නයවේ.

මෙහි වනාහි දෙදහස් ආපත්තීහු ගෙණහැර දැක්විය යුත්තාහ. පළමුකොට ආධ්‍යාත්මික රූපයෙහි රාගයෙන් තදබව හටගත් කල්හි ආරොග්‍යය පිණිස නිල් පැහැති ශුක්‍ර මුදන්නහුට එක් ඇවැතක්වේ. ආධ්‍යාත්මික රූපයෙහිම රාගයෙන් තදබව හටගත් කල්හි ආරොග්‍යය පිරිස කසාවත් ආදී ශුක්‍ර මොචනවසයෙන් අත් නවයකැයි දසයක්වේ. ආරොග්‍යය පිණිස යම්සේ දසයක්වේද, එසේ සුඛාදි නවපදයන් පිණිස එක් එක් පදයක දසය දසයකොට අනූවක්වේ. මෙසේ මේ අනූවද පළමු දසයදැයි රාගයෙහි තදබවෙහි සියයක්වේ. රාගයේ තදබවෙහි යම්සේද වර්ස් ආදී සතරෙහි බලවත්බව ඇති කල්හි, එක් එක් බලවත්බවෙහි සියය සියයකොට සාරසියයක්වේ. මෙසේ මේ සාරසියයද පළමු එක් සියයදැයි ආධ්‍යාත්මික රූපයෙහි පඤ්චොපක්කමහයන්ගේ වසයෙන් පන්සියයක්වේ. ආධ්‍යාත්මිකරූපයෙහි යම්සේ පසක්වේද, එසේ බාහිර රූපයෙහි පසෙක, ආධ්‍යාත්මික බාහිර රූපයෙහි පසෙත, අහස්හි කටිය චලනය කරන්නහුට පසෙකැයි සිවු පඤ්චකයන්ගේ වසයෙන් සියලුම ආපත්තීහු දෙදහසකැයි දතයුත්තාහ.

දැන් ආරොග්‍යත්ථාය යනාදි දස පදයන්හි පිළිවෙළින් හෝ උපිළිවෙළින් හෝ යට හෝ ගෙන මත්තෙහි ගන්නහුට, මත්තෙහි හෝ ගෙන යටට ගන්නහුට, දෙපයින් ගෙන මැද තබන්නහුට, මැද හෝ ගෙන දෙපසින් හරනහුට, සියල්ල මුල්කොට ගන්නහුට චෙතනා-උපක්‍රම-මොචන යන මෙය ඇතිකල්හි විසඞ්කෙතයක් නම් නැහැයි දක්වනු පිණිස '**ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච**'යි ඛණ්ඩචක්‍රබද්ධචක්‍රාදි භෙදයෙන් විසිතුරුවූ පෙළක් වදළසේක. එහි ආරොග්‍යත්ථඤ්ච-සුඛත්ථඤ්ච-ආරොග්‍යත්ථඤ්ච-භෙසජ්ජත්ථඤ්චයි මෙසේ ආරොග්‍යපදය සියලු පද සමග යොද කියනලද්දේ එක් ඛණ්ඩචක්‍රයෙකි. සුඛපදදිවූ සියලු පද සමග තම තමන්ගේ ඉකුත් අනතුරු පදයක් වේද එය ගෙනවුත් කියනලද බද්ධචක්‍ර නවයදැයි මෙසේ එකමූලකවූ දශචක්‍ර පෙළක්වෙයි. ඒ දශ චක්‍ර ද්විමූලකාදිය සමග නොමුළාවසයෙන් විස්තරකොට දතයුතුවෙයි. මෙහි අර්ථය වනාහි

ප්‍රකටමය. **ආරොග්‍යත්ථාය** යනාදි දසයෙහි යම්සේද එසේ නීලාදීන් අතුරෙහිද **'නීලඤ්ච පීතකඤ්ච චෙතෙති, උපක්කමති'** යනාදි නයින් කියනලද්දේවේ. ඔවුහුද නොමුළාවසයෙන් විස්තරකොට දතයුත්තාහ. මෙහිද අර්ථය ප්‍රකටමය. නැවත 'ආරොග්‍යත්ථඤ්ච' නීලඤ්ච, ආරොග්‍යත්ථඤ්ච සුඛත්ථඤ්ච නීලඤ්ච පීතකඤ්ච'යි එකක් හා එකක්ද දෙකක් හා දෙකක්ද -පෙ- දසයක් හා දසයෙකැයි මෙසේ පළමු පද සමග පැසුළුපද යොද එක් මිශ්‍රකචක්‍රයක් කියනලද්දේය. දැන් යම්හෙයකින් නිල්පැහැති ශුක්‍ර මුදන්නෙමියි සිතා උපක්‍රම කරන්නහුට කසාවන් ශුක්‍ර මිදුණුකල්හි කසාවන් ශුක්‍ර ආදීන්ගේ වසයෙන් සිතා උපක්‍රම කරන්නහුට අන්‍යවූ ශුක්‍ර මිදුණු කල්හිද විසඞ්කෙතයක් නොම ඇත්තේය. එහෙයින් මේනය දක්වන්නට **'නීලං මොචෙස්සාමීති චෙතෙති, උපක්කමති, පීතකං, මුච්චති'** යනාදි නයින් චක්‍ර දක්වනලදි. ඉන්පසු සියලු පසුපද නීලාදි නවපද සමග යොද කුච්ඡිචක්‍රය කියනලදි. ඉන්පසු පීතකාදි නව පද එක් නීලපදයක් සමග යොද පිට්ඨිචක්‍රය කියනලදි. ඉන්පසු ලොහිතකාදි නවපදයන් එක් පීතකපදය සමග යොද දෙවැනි පිට්ඨිචක්‍රයක් කියනලදි. මෙසේ ලොහිතකපදදිය සමග අනිත් නව නව පදයන් යොදා අනිකුදු චක්‍රඅට කියනලදැයි මෙසේ දසගතියක් ඇති පිට්ඨිචක්‍රය දතයුත්තේය. මෙසේ ඛණ්ඩචක්‍රාදිවූ නොයෙක් චක්‍රවල වසයෙන් විස්තර විසින් ගරුකාපත්තියම දක්වා අඞ්ගවසයෙන්ම ගරුකාපත්තියද ලහුකාපත්තියද අනාපත්තියද දක්වන්නට **'චෙතෙති, උපක්කමති, මුච්චති,'** යනාදිය වදළසේක. එහි පෙරනයින් ආධ්‍යාත්මික රූපාදීන් කෙරෙහි රාගාදීන්ගේ බලවත්බව ඇති කල්හි ආරොග්‍යාදීන් පිණිස සිතන්නහුට උපක්‍රම කොට ශුක්‍ර මිදීමෙහි අඞ්ගතුනකින් යුක්තවූ ගරුකාපත්තිය වදරනලදි. දෙවැනි නයින් සිතන්නහුටද උපක්‍රම කරන්නහුටද ශුක්‍ර මිදීමක් නැති කල්හි දෙඅඟකින් යුක්තවූ ලඝුවූ ථුල්ලච්චයාපත්තිය වදරනලදි. **'චෙතෙති, න උපක්කමති, මුච්චති'** යනාදීවූ සවැදෑරුම් නයින් ආපත්තිය වදරනලදි.

මේ ආපත්ති අනාපත්තිභෙදය මෘදුය, සියුම්ය. එහෙයින් මැනැවින් සැලකිය යුතුය. මැනැවින් සලකා කුකුස විචාළහු විසින් ආපත්තිය හෝ අනාපත්තිය හෝ කිවයුතුය. විනයකර්මය හෝ කටයුතුය. නොසලකා කරන්නේ රොගනිදානය නොදැන බෙහෙත් කරන වෙදෙකුමෙන් දුකටද පැමිණේ. ඒ පුද්ගලයාහට පිළියම් කරන්නට සමර්ථ නොවේමය. එහි මේ මතු කියනුලබන්නේ සලකන විධියයි. කුකුසින් පැමිණි මහණතෙමේ තුන්යල දක්වා කවර ප්‍රයොගයකින් කවර රාගයකින් පැමිණියෙහිදැයි විචාළයුතුය. පළමුකොට අනිකක් කියා පසුව අනිකක් කියාද, එක් මගකින් නොකියාද,'තෝ එක්මගකින් නොකියහි, පරිහරණය කෙරෙහි,

තට විනයකර්මය කරන්නට නොහැක්කේය. යව, යහපතක් සොයවයි හෙතෙම කියයුත්තේය. ඉදින් තෙවරම එක් මගකින්ම කියානම්, තමාට වූයේ පහළකෙරේනම් එකල්හි ඔහුගේ ආපත්ති අනාපත්ති ගරුකලහු කාපත්ති විනිශ්චය කරනු පිණිස එකොළොස් රාගයන්ගේ වසයෙන් එකොළොස් ප්‍රයොග පරීක්ෂා කටයුතුය. මේ එහි එකොළොස් රාගයි. මොචනස්සාදය, මුච්චනස්සාදය, මුත්තස්සාදය, මෙථුනස්සාදය, ඵස්සස්සාදය, කණ්ඩුවනස්සාදය, දස්සනස්සාදය, නිසජ්ජස්සාදය, වාචස්සාදය, ගෙහසිතපෙමය හා වනභඞ්ගියයි. එහි ශුක්‍ර මුදන්නට කරන ආස්වාදය මොචනස්සාදයයි. ශුක්‍ර මිදෙන කල්හිවන ආස්වාදය මුච්චනස්සාදයයි. ශුක්‍ර මිදුණුකල්හි වන ආස්වාදය මුත්තස්සාදයයි. මෙවුන්දම්හි වන ආස්වාදය මෙථුනස්සාදයයි. පැහැසීමෙහි වන ආස්වාදය ඵස්සස්සාදයයි. කැසීමෙහි වන ආස්වාදය කණ්ඩුවනස්සදයයි. දැකීමෙහි වන ආස්වාදය දස්සනස්සාදයයි. නිපද්‍යයෙහි වන ආස්වාදය නිසජ්ජස්සාදයයි. වචනයෙහි ආස්වාදය වාචස්සාදයයි. ගෘහිනිශ්‍රිත ප්‍රේමය ගෙහසිතපෙමයයි. වනයෙන් කඩාගෙන එන ලද යම්කිසි මල්, ගෙඩි ආදිය වනභඞ්ගිය නම්. මෙහිද නව පදයෙන් යෙදීගත් ආස්වාදශීර්ෂයෙන් රාගය කියනලද්දේය. එක් පදයකින් ස්වරූපවශයෙන් කියනලදි. එක් පදයකින් වස්තුව සමග කියනලදි. වනභඞ්ගය රාගයට වස්තුවක්වේ. රාගයම නොවේ. මේ රාගයන්ගේ වසයෙන්ම ප්‍රයොග මනාකොට බැලිය යුත්තාහ.

**මොචනස්සාදයෙහි** මොචනස්සාදචෙතනාවෙන් සිතන්නේද ආස්වාද කරන්නේද උපක්‍රම කෙරේද, ශුක්‍ර මිදේද, සඞ්ඝාදිසෙසයවේ. එසේම සිතන්නේද, ආස්වාද කරන්නේද, උපක්‍රම කෙරේද? ශුක්‍ර නොමිදේද ථුල්ලච්චයවේ. නිදන කල්හි රාගයෙන් මඩනාලදුව කලවයෙන් හෝ මිටින් හෝ අඞ්ගජාතය දැඩිකොට පෙළා මොචනය පිණිස උත්සාහ සහිතව නිදද, නිදන මොහුගේ ශුක්‍ර මිදේද, සඞ්ඝාදිසෙසයවේ. රාගයෙහි නැගීසිටීම අශුභමනසිකාරයෙන් සන්සිඳුවා පිරිසිදු සිතැතිව නිදද නිදන්නහුට ශුක්‍ර මිදුණු කල්හිද ඇවැත්නොවේ.

**මුච්චනස්සාදයෙහි** තමාගේ ධර්මතාවෙන් මිදෙන ශුක්‍ර ආස්වාද කෙරේද, උපක්‍රම නොකෙරේද, ශුක්‍ර මිදේද, ඇවැත්නොවේ. මිදෙන ශුක්‍ර ආස්වාද කරමින් උපක්‍රම කෙරේද, ඒ උපක්‍රමයෙන් ශුක්‍ර මිදේද, එකල්හි සඞ්ඝාදිසෙසයවේ. තමන්ගේ ධර්මතාවෙන් ශුක්‍ර මිදෙනකල්හි සිවුර හෝ සෙනසුන හෝ දූෂිත නොවේවායි අඞ්ගජාතය අතින් අල්ලාගෙන සෝදනු පිණිස දියතිබෙන තැනටයේද, ඒ වටීයයි මහාපච්චරියෙහි කියනලදි.

**මුත්තසසාදයෙහි** තමාගේ ධර්මතාවෙන් ශුක්‍ර මිදුණුකල්හි ශුක්‍ර තැබූ තැනින් ගිලිහුණුකල්හි පසුව ආස්වාද කරන්නහුට උපක්‍රමයක් නැතිව ශුක්‍ර මිදේනම් ඇවැත් නොවේ. ආස්වාදකොට නැවත ශුක්‍ර මිදීම පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුද තම් සඞ්ඝාදිසෙසයවේ.

**මෙථුනසසාදයෙහි** මෛථුනරාගයෙන් මාගමක් අල්ලාගනීද, ඒ ප්‍රයොගයෙන් ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. මෛථුන ධර්මය පිළිබඳ කළ ප්‍රයොගය බැවින් එබඳු ගැනීමෙහි දුක්කටයවේ. කෙළපැමිණිකල්හි පාරාජිකයවේ. මෛථුනරාගයෙන් රත්වූයේ නැවත ආස්වාදකොට ශුක්‍ර මුදනුපිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදනම් සඞ්ඝාදිසෙසයවේ.

**ඵස්සසසාදයෙහි** ආධ්‍යාත්මිකය, බාහිරයයි ස්පර්ශය දෙවැදෑරුම්වේ. ආධ්‍යාත්මික ස්පර්ශයෙහි තමාගේ නිමිත්ත තදද මොළොක්දැයි දැනගන්නෙමියි හෝ ලොල්බැවින් හෝ නටවන මහණහුට ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. නිමිත්ත නටවන්නේ ආස්වාදකොට ශුක්‍ර මිදීම පිණිස නිමිත්තෙහි උපක්‍රම කොට ශුක්‍ර මුදද සඞ්ඝාදිසෙසයවේ. බාහිර ස්පර්ශයෙහි කායසංසර්ගරාගයෙන් මාගමකගේ ශරීරාවයවයන් පරාමර්ශනය කරන්නහුටද වැළඳ ගන්නහුටද ශුක්‍ර මිදේනම් ඇවැත් නොවේ. කායසංසර්ගසඞ්ඝාදිසෙසයට පැමිණේ. කායසංසර්ගරාගයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද මොහුට දුක්කවිසටයි සඞ්ඝාදිසෙසයවේ.

**කණ්ඩුවනසසාදයෙහිද**, වණ, කැසීම්, පිළිකා, පණු ආදීන් අතරෙහි එකක්හුගේ වසයෙන් කසන නිමිත්ත කසන ආස්වාදයෙන්ම කැසීමෙන් ශුක්‍ර මිදේද, ඇවැත්නොවේ. කසන ආස්වාදයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනුපිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද දුක්කවිසටයි සඞ්ඝාදිසෙසයවේ.

**දස්සනඞ්සාදයෙහි** දර්ශනාස්වාදයෙන් නැවත නැවත මාගමකගේ නිමිත්තප්‍රදේශය ගුණ සිතන්නහුට, බලන්නහුට ඇවැත් නොවේ. මාගමකගේ නිමිත්තප්‍රදේශය ගුණ සිතීමෙන් බැලීමෙන් දුක්කටයවේ. දර්ශනාස්වාදයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද, දුක්කවිසටයිසඞ්ඝාදිසෙසයවේ.

**නිසජ්ජසසාදයෙහි** මාගමක හා රහසිව නිෂද්‍යාස්වාදරාගයෙන් හුන්නහුගේ ශුක්‍ර මිදේද, දුක්කවිසටයිසඞ්ඝාදිසෙසය නොවේ. රහසිව හිඳීම් හේතුවෙන් පැමිණ ඇවැතින් විනයකර්ම කරවිය යුතුය. හිඳීමෙහි ආස්වාදයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද, සඞ්ඝාදිසෙසයවේ.

**වාචස්සාදයෙයි** වාචාස්වාදරාගයෙන් මාගමකට මෙවුන්දම් ඇසුරුකළ බසින් බණින්නහුගේ ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. දුට්ඨුල්ලවාචාසඞ්ඝාදිසෙසයට පැමිණේ. වාචාස්වාදරාගයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද, සඞ්ඝාදිසෙසයවේ.

**ගෙහසිතපෙමයෙහි** මාතෘප්‍රේමයෙන් මව හෝ භගිනිප්‍රේමයෙන් නැගනිය හෝ නැවත නැවත පිරිමදින්නහුගේද වැළඳගන්නහුගේද, ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. ගෘහනිශ්‍රිතප්‍රේමයෙන් පැහැසීම් හේතුවෙන් දුක්කටයවේ. ගෘහනිශ්‍රිතප්‍රේමයෙන් රත්වූයේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද, සඞ්ඝාදිසෙසයවේ.

**වනභඞ්ගයෙහි** ස්ත්‍රීපුරුෂයෝ ඔවුනොවුන්ට බුලත් ගඳමල් විලවුන් ආදීවූ නොයෙක් ආකාරවූ, කිසියම් පඬුරක් මිත්‍රසන්ථවයාගේ දැඩිබව පිණිස යවත්. මේ වනාහි වනභඞ්ග නම. ඒ වනභඞ්ගය මාගමක් තමන් හා ඇලුණු එක්වූ විසීම් ඇති කිසියම් කුලූපග මහණක්හට යවාද, අසවල් තැනැත්තිය විසින් මේ වනභඞ්ගය එවනලදැයි නැවත නැවත ඒ වනභඞ්ගය අතින් ගෙන නටවන ඔහුගේ ශුක්‍ර මිදේද ඇවැත් නොවේ. වනභඞ්ගයෙහි ඇලුනේ නැවත ආස්වාදයකොට ශුක්‍ර මුදනු පිණිස නිමිත්තෙහි උපක්‍රමකොට ශුක්‍ර මුදද සඞ්ඝාදිසෙසයවේ. උපක්‍රම කරනකල්හි ශුක්‍ර නොමිදේ නම් ථුල්ලච්චයවේ.

මෙසේ මේ එකොළොස් වැදෑරුම්වූ රාගයන්ගේ වසයෙන් මේ එකාදසවිධ ප්‍රයෝගයෙන් මැනවින් බලා ආපත්තිය හෝ අනාපත්තිය හෝ සැලකිය යුතුය. සලකා බලා ගරුකාපත්තිය වන්නී නම්, ගරුකාපත්තියයි කියයුතුය. ලහුකාපත්තිය වන්නීනම්, ලහුකාපත්තියයි කියයුතුය. එයට අනුරූපවූ විනයකර්මයද කටයුතුය. මෙසේ කරනලද්දේම මැනවින් කරනලද්දේවේ. රෝගනිදානය දැන වෙදහු විසින් කළ බෙහෙත මෙන් ඒ පුද්ගලයාහට ස්වස්තිභාවය පිණිස පවතී.

**'චෙතෙති න උපක්කමති'** යනාදි තන්හි මොචනාස්වාද චෙතනාවෙන් සිතාද, උපක්‍රම නොකෙරේද, ශුක්‍ර මිදේද, ඇවැත් නොවේ. මොචනාස්වාදයෙන් පෙළුණේ 'ඒකාන්තයෙන් මේ ශුක්‍ර මිදෙන්නේ වීනම් යෙහෙකැ'යි සිතාද, උපක්‍රම නොකෙරේද, ශුක්‍ර නොමිදේද, ඇවැත් නොවේ. මොචනාස්වාදයෙන් නොසිතාද ස්පර්ශාස්වාදයෙන් හෝ කණ්ඩූවනාස්වාදයෙන් හෝ උපක්‍රම කෙරේද, ශුක්‍ර මිදේද ඇවැත් නොවේ. එසේම නොසිතාද, උපක්‍රම කෙරේද, ශුක්‍ර නොමිදේද ඇවැත් නොවේ. කාමවිතර්කයක් විතර්කණය කරන්නේ ශුක්‍ර මුදනු පිණිස නොසිතාද, උපක්‍රම නොකෙරේද, ශුක්‍ර

මිදේද, ඇවැත් නොවේ. විතර්කණය කරන ඔහුගේ ශුක්‍ර නොමිදේද, 'න **චෙතෙති න උපක්කමති න මුච්චති අනාපත්තියි** මේ ලක්‍ෂණය ආයේමවේ.

'**අනාපත්ති සුපිනන්තෙන**' නිදිගත් යමෙකුගේ, සිහිනෙහි මෛථුන්දම් සෙවනය කරන්නකුගේ මෙන්, කායසංසර්ගාදියට පැමිණියෙකුගේ මෙන්, ස්වප්නාන්තවූ කාරණයෙන්ම ශුක්‍ර මිදේද, ඔහුට ඇවැත් නොවේ. සිහිනෙහි උපන් ආස්වාදචේතනාවෙන් ඉදින් මේ මහණහුට විෂය වේනම්, නිශ්චල වියයුතුය. අතින් නිමිත්ත නොනැටවිය යුතුය. සිවුරු පසතුරුණු රැකීම පිණිස අත්ගොටුවෙන් ගෙන සෝදනු පිණිස දිය ඇති තැනකට යායුතුය. '**න මොචනාධිප්පායස්ස**' බෙහෙතින් නිමිත්ත ආලේප කරන මලමුත්‍රාදිය පහ කරන ශුක්‍ර මිදීමෙහි අදහස් නැති යමෙකුගේ ශුක්‍ර මිදේද, ඔහුට ඇවැත් නැත්තේය. දෙවැදෑරුම්වූ උන්මත්තකයාහට ඇවැත් නොවේ. මේ ශික්‍ෂාපදයෙහි ආදිකර්මික සෙය්‍යසක මහණය. ආදිකර්මිකවූ ඔහුට ඇවැත් නොවේ.

පදභාජනීය වර්ණනාව නිමි.

——\\——

සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්‍ෂාපදය ප්‍රථමපාරාජික සමුට්ඨානය ඇත්තේවේ. කායචිත්ත දෙකින් උපදී. ක්‍රියාවෙන් පැමිණිය යුතුබැවින් ක්‍රියාසමුට්ඨානය ඇත්තේය. ව්‍යතික්‍රමසංඥ අභාවයෙන් මිදෙනබැවින් සංඥවිමොක්‍ෂවේ. සිත් සහිතව කටයුතුබැවින් සචිත්තකසමුට්ඨානයි. ලොකයා විසින් අකුසල්බැවින් හළයුතුයයි නියමය හෙයින් ලොකවද්‍යයි. කයින් කටයුතුබැවින් කායකර්මයි. අකුසල චිත්තයි. සුඛ මදධ්‍යස්ථ දෙකින් ද්විවෙදනවේ.

විනීතවස්තූන් අතුරෙහි **සුපින** වස්තුව අනුප්‍රඥප්තියෙහි කියනලද නය ඇත්තේමය. **උච්චාරපස්සාව** වස්තූහු ප්‍රකට අර්ථ ඇත්තාහුමය. **විතක්ක** වස්තුවෙහි '**කාමවිතක්කං**' යනු ගෘහනිශ්‍රිත කාමවිතර්කයයි. එහෙත් එහි අනාපත්තිය වදාරණලදි. තවද විතර්කගත ඇතියෙකු නොවිය යුතුය. **උණ්හොදක** වස්තූන් අතුරෙහි ප්‍රථමවස්තුව ප්‍රකටමය. ද්විතීයවස්තුවෙහි ඒ මහණතෙමේ ශුක්‍ර මුදනු කැමැත්තේ උණු පැනින් නිමිත්තට පහර දෙමින් නැවේය. එහෙයින් ඔහුට ආපත්තිය වදාරනලදි. තෘතීය වස්තුවෙහි උපක්‍රමය ඇතිබැවින් ථුල්ලච්චයවේ. **භෙසජ්ජ කණ්ඩුවන** වස්තූහු ප්‍රකට අර්ථ ඇත්තාහුමය. **මග්ග** වස්තූන් අතුරෙහි ප්‍රථමවූ මහත්වූ කලවා ඇති මග බැස යන්නහුගේ සම්බාධස්ථානයෙහි ගැටීමෙන් ශුක්‍ර මිදුනේය. ඔහුට ශුක්‍ර මිදීමෙහි අදහස් නැති බැවින් ඇවැත් නොවේ. දෙවැන්නහුගේද එසේම ශුක්‍ර මිදුනේයයි මිදීමෙහි අදහස් ඇති බැවින්

සඞ්ඝාදිසෙසයවේ. තෙවැන්නහුගේ ශුක්‍ර මිදුනේය. උපක්‍රමයෙහි හටගැනීමෙන් ථුල්ලච්චය වූයේය. එහෙයින් මග බැස යන්නහු විසින් පරිදහය උපන් කල්හි නොයායුතුය. ගමන නවතා අසුභාදිය මෙනෙහි කිරීමෙන් සිත සන්සිඳුවා ගෙන පිරිසිදු සිතින් කර්මස්ථාන ගෙනයායුතුය. නැවතී සිටියේ දුරු කරන්නට නොහැක්කේද, මගින් ඉවත්ව හිඳ දුරුකොට කර්මස්ථාන ගෙන පිරිසිදු සිතින්ම යායුතුය. **වර්ච** වස්තුන්හි ඒ මහණෝ නිමිත්තෙහි අග මූත්‍ර නික්මෙන තැන සම දැඩිකොට අල්වාගෙන මූත්‍ර පුරව පුරවා හරිමින් ගම්දරුවන් මෙන් මූත්‍ර කළහ. **ජන්තාඝර** වස්තුවෙහි ශුක්‍ර මුදන අදහස් ඇත්තාවූද ශුක්‍ර නොමුදන අදහස් ඇත්තාවූද, බඩ තවන්නහුගේ ශුක්‍ර මුදන අදහස් ඇත්තාවූද ශුක්‍ර නොමුදන අදහස් ඇත්තාවූද බඩ තවන්නහුගේ ශුක්‍ර මිදුණු කල්හි ඇවැත් නොවේ. පිරියම් කරන්නහුගේ නිමිත්ත සැලීම්වසයෙන් ශුක්‍ර මිදුනේය. එහෙයින් ආපත්තිස්ථානයෙහි ආපත්තිය වදරනලදි. **ඌරුඝට්ටාපන** වස්තුන්හි යම් කෙනකුන්ට ආපත්තිය වදරනලදද, ඔවුහු අඞ්ගජාතය පහසවාලූහයි දතයුත්තාහයි කුරුන්දට්ඨකථාවෙහි කියනලදි. **සාමණේරාදී** වස්තූහු ප්‍රකට අර්ථ ඇත්තාහුම වෙති. කායත්ථම්භන වස්තුවෙහි '**කායං ථම්භෙන්තස්ස**' බොහෝ කලක් හිඳ හෝ නිදගෙන හෝ නවකර්මාන්තයක්කොට හෝ අලසබව මුදහරිනු පිණිස ඇඟ මැලි කඩන්නහුට **උපනිජ්ඣායන** වස්තුවෙහි පිළිසියයක් හඳින ලද්දීවේද ඉදිරිපසෙහි හෝ පසුපසෙහි හෝ සිට 'මෙනම් අවකාශයෙහි නිමිත්තය'යි සිතා බලන්නහුට එක්ම දුක්කටයමවේ. පිළිනොහැඳි ගම්දැරියන්ගේ නිමිත්ත ගැන සිතා බලන්නහුට කියයුතු කිම, තිරිසනුන්ගේ නිමිත්තෙහි මේම නයවේ. ඔබ මොබ නොබලා දවසකුදු එක් ප්‍රයොගයෙන් සිතා බලන්නහුට දුක්කටයක්වේ. ඔබමොබ බලා නැවත නැවත සිතා බලන්නහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටවේ. ඇස ඇරීම් වැසීම් වසයෙන් නොකරවිය යුතුය. ඉක්මනින් සිතා බලා නැවත තුවණින් සලකා සංවරයෙහි සිටින්නහුට ඇවැත් නොවේ. ඒ සංවරය හැරපියා නැවත සිතා බලන්නහුට දුක්කටමවේ. **තාලච්ඡිද්දාදී** වස්තූහු ප්‍රකට අර්ථ ඇත්තාහුම වෙති. **න්හාන** වස්තුන්හි යම් කෙනෙක් දියපහරට ගැසූහුද ඔවුන්ට ඇවැත වදරනලදි. **උදඤ්ජල** වස්තුන්හිද මෙම නයවේ. '**උදඤ්ජලං**' යන මෙයින් කලල්මඩ කියනු ලැබේ. මෙම උපායෙන්ම මෙයින් පසු සියලුම **උදකධොවනාදී** වස්තූහු දතයුත්තාහ. මේ වනාහි විශෙෂයයි. **පුප්ඵාවලිය** වස්තුන්හි ශුක්‍ර මුදන අදහස් නැත්තහුට ඇවැත් නොවේ. ක්‍රීඩාහේතුවෙන් වනාහි දුක්කටය වේයයි දතයුතුය.

සුක්කවිස්සට්ඨිශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන බුද්ධො භගවා**' යනු කායසංසර්ගශික්ෂාපදයයි. එහි මේ ප්‍රකාශ නොකළ පදයන්ගේ වර්ණනාවයි. '**අරඤ්ඤෙ විහරති**' පරම්පරාවකට අයත් වනයක නොවේ. ජේතවන විහාරයෙහිම කෙළවර එක් පසෙක්හි '**මජ්ඣෙගබ්භො**' ඒ විහාරයෙහිම මැද ගර්භයක්වේ. '**සමන්තාපරියාගාරො**' - මේ ගර්භය හාත්පස නිෂද්‍යශාලාවෙන් කළ පිරිකෙව් ඇත්තේය. ඒ උදයී ස්ථවිරතෙමේ මැද සිවුරැස් ගබඩාවක් කොට පිටත නිෂද්‍යශාලා පරික්ෂේපයෙන් ඇතුළතම වට කැරකැවෙන්නහු විසින් හැසිරෙන්නට යම්සේ හැකිවේද එසේ කෙළේය. '**සුපඤ්ඤත්තං**' මැනවින් තබනලද්දේය. යම් යම් ලෙසකින් යම් යම් අවකාශයක තබනලද්ද ප්‍රසාද එළවන්නේවේද, ලොකයා රඳවන්නේද ඒ ඒ ලෙසින් ඒ ඒ අවකාශයෙහි තබනලද්දේය. හෙතෙමේ වත්හිසින් එක් කිසකුත් නොකරන්නේය. '**එකච්චෙ වාතපානෙ විවරන්තො**' යම් කවුළු විවෘත කළකල්හි අන්ධකාරය වේද, ඒ කවුළු වසමින් '**එවං වුත්තෙ සා බ්‍රාහ්මණී තං බ්‍රාහ්මණං එතදවොච**' මෙසේ ඒ බ්‍රාහ්මණයා විසින් පසසා කියූකල්හි ඒ බැමිණිතොමෝ 'මේ බමුණු පහන්වූයේ පැවිදිවනු කැමැත්තේයයි හඟනේයයි සලකා වැසියයුතුවූද තමාගේ විප්‍රකාරය පවසන්නී හුදෙක් ඔහුගේ ශ්‍රද්ධාව නැසීම බලාපොරොත්තුවන්නී '**එතං කුතො තස්ස උළාරත්තතා**' යනාදීවූ වචනය කිවූය. එහි මහත්වූ ප්‍රණීතාධිමුත්ති මෝහටහුයි උළාරත්තා නම. මහත්වූ ප්‍රණීතාධිමුත්තියෙහි භාවය උළාරත්තතා නම. '**කුලිත්ථීහි**' යනාදිතන්හි කුලස්ත්‍රීහු නම් ගෘහසාමිනීහුය කුලදුහිතත්හු නම් පුරුෂයන් අතරට ගිය කුලදුහිතෘහුය. කුලකුමාරීහු නම් සරණ නොගිය කුලදුහිතෘයයි කියනු ලැබෙත්. කුලසුණ්හා නම් අන්‍යකුලයකින් ආවාහවශයෙන් ගෙනෙනලද කුලදරුවන්ගේ අඹුවෝය.

'**ඔතිණ්ණො**' යක්ෂාදීන් කරණකොට සත්වයන් මෙන් ඇතුළත උපදින රාගයෙන් හෝ ළිං ආදියට සත්වයන් මෙන් බටුයේය. යථාස්වභාවය පරීක්ෂා නොකොට ඇලියයුතු තැන ඇලෙමින් තෙමේ හෝ රාගයට බටුයේය. යම්හෙයකින් දෙඅයුරින්ම රාගයෙන් යුක්තවූවහුට මේ නම්වේද, එහෙයින් '**ඔතිණ්ණොනාම සාරත්තො අපෙක්ඛවා පටිබද්ධචිත්තො**'යි මෙසේ මේ පදයෙහි පදභාජනය වදරනලද්දේය. එහි '**සාරත්තො**' කායසංසර්ගරාගයෙන් මොනවට රත්වූයේය. '**අපෙක්ඛවා**' කායසංසර්ගාපෙක්ෂාවෙන් අපෙක්ෂා ඇත්තේය. '**පටිබද්ධචිත්තො**' කායසංසර්ගරාගයෙන්ම ඒ වස්තුවෙහි පිළිබඳසිත් ඇත්තේය. '**විපරිණතෙන**' පිරිසිදුවූ භවඞ්ගසන්තති සඞ්ඛ්‍යාත ප්‍රකෘතිය හැර අන් අයුරකින් පැවති විරූපයට හෝ පෙරළුණු, වෙසෙසින් පෙරළුණු යම් ලෙසකින් පෙරළෙනුයේ විරූපවේද, එසේ පෙරළීසිටි සිතින්, යනු අභිප්‍රායයි. යම්හෙයකින් රාගාදිය

හා ඒ යෙදීම, නොඉක්මවාද, එහෙයින් **'විපරිණතන්ති රත්තම්පි චිත්තං'** යනාදිනයින් මේ පදෙහි පදබෙදුම වදරා කෙළවර මෙහි අභිප්‍රේතාර්ථය දක්වනසේක් **'අපි ච රත්තං චිත්තං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතං විපරිණතං'** යනු වදළසේක.

**'තදනුජාතා'** එදවස උපන්නාවූ, උපන් කෙණෙහි හෙයින් තෙත් මස්වැදිලි පැහැ ඇත්තාවූ මෙවැන්නියක සමගද කායසංසර්ගය නිමිතිකොට සඞසාදිසෙසයවේ. මෛථුනව්‍යතික්‍රමය නිමිතිකොට පාරාජිකයවේ. රහොනිෂද්‍යාසඞාදය නිමිතිකොට පාචිත්තියදවේ. **'පගෙව'** පළමුකොට **'කායසංසග්ග සමාපජ්ජෙය්‍ය'** යනු අත් ගැනීම් ආදියෙන් කය හා යෙදීමට කාය මිශ්‍රක භාවයට පැමිණෙන්නේය. යම් හෙයකින් මෙයට පැමිණෙන්නහුගේ යම් ඒ කාය සංසර්ගයක් වේද, එය අර්ථවශයෙන් අධ්‍යාචාරයවේ. රාගවසයෙන් ශීල පරිච්ඡේදය මැඩ පවත්වා අත්ගැනීම් ආදිවසයෙන් පැවති ක්‍රියාය. එහෙයින් 'අස්ස කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය' යන මේ පදයයන්හි අර්ථය සැකෙවින් දක්වනසේක් **'අජ්ඣාචාරො වුච්චති'**යි පදභාජනය වදළසේක.

**'හත්ථග්ගාහං වා'** යනාදිභෙදය මේ පදයෙහි විස්තර විසින් අර්ථ දැක්මවේ. එහි හස්තාදීන්ගේ විභාගය දැක්වීමපිණිස **'හත්ථො නාම කප්පරං උපාදය'** යනාදිය වදළසේක. එහි **'කප්පරං උපාදය'** යනු දෙවන මහාසන්ධිය පටන්. අන් තන්හි මැණික්කටුව පටන් නියඅග තෙක් හස්තයයි. මෙහි අගබාහුව සමග වැළමිට පටන් අදහස් කරනලදී. **'සුද්ධ කෙසාවාහු'** ආදීන් සමග මිශ්‍ර නොවූ පිරිසිදු කෙස් පිළිබඳමය. **'වෙණිං'** කෙස්වැටි තුනකින් වෙළා කළ කෙස් කළඹට මේ නමකි. **'සුත්තමිස්සා'** පස්පැහැති හුයින් කෙස් මිශ්‍රකොට කරනලදය. **'මාලාමිස්සා'** සීනිද්ද මල්ආදිය මිශ්‍රකොට කෙස්වැටි තුනකින් වෙළා කරනලදය. නොගෙතූ හෝ හුදු මලින් මිශ්‍රවූ කෙස්කළඹ මෙහි වෙණියයි දතයුතුය. **'හිරඤ්ඤමිස්සා'** කහවණු මාලාවෙන් මිශ්‍රකොට කරනලදය. **'සුවණ්ණමිස්සා'** රන් වැහරියෙන් හෝ හවඩිදම් ආදියෙන් හෝ මිශ්‍රකොට කරනලදය. **'මුත්තාමිස්සා'** මුතුවැලින් මිශ්‍රකොට කරනලදය. **'මණිමිස්සා'** හුවලින් ඇවුණු මිණියෙන් මිශ්‍රකොට කරනලදය. මොවුන් අතුරෙහි යම් කිසි කෙස්කළඹක් ගන්නහුට සඞසාදිසෙසයමවේ. 'මම මිශ්‍රක වෙණියක් ගත්තෙමි'යි කියන්නහුට ඇවැතින් මිදීමක් නැත්තේය. මෙහි වෙළු ග්‍රහණයෙන්ම කෙශයද ගන්නාලද්දහුම වෙති. එහෙයින් යමෙක් එක්ම කෙශයක් ගනීද ඒ මහණහුටද ඇවැත්මය. **'හත්ථඤ්ච වෙණිඤ්ච ඨපෙත්වා'** මෙහි කියූ ලකුණු ඇති අතද සර්වප්‍රකාරවූ වෙණියද හැර සෙසු සිරුර අඞගජයි දතයුතුය. මෙසේ පිරිසිදි අත් ආදීන් අතුරෙහි අත ගැනීම

**හත්ථගාහ** නම්. වෙනිය ගැනීම **වෙණිගාහ** නම්. සෙසු සිරුර පිරිමැඩුම යම්ම අවයවයක පිරිමැඩීමය. යමෙක් ඒ අතගැනීමට හෝ වෙනිය ගැනීමට හෝ යම්ම අවයවයක පිරිමැඩීමට පැමිණෙන්නේනම් ඒ මහණහුට සඞ්ඝාදිසෙස නම් ආපත්තිසමූහයවේය යනු මේ ශික්ෂාපදයේ අර්ථයවේ.

යම් හෙයකින්, යම් අත්ගැනුමක් හෝ වලිගය ගැනුමක් හෝ යම්ම අවයවයක පිරිමැඩුමෙන් හෝ වේද, ඒ සියල්ල ප්‍රභෙද විසින් සොළොස් වැදෑරුම්වේද, එහෙයින් ඒ භෙදය දක්වන්නට '**ආමසනා පරාමසනා**' යනාදි නයින් එහි පදභාජනය වදළසේක. එහි '**ආමසනා නාම ආමට්ඨමත්තා**' යමක් කියනලදද, '**ඡුපනං නාම ඵුට්ඨමත්තං**'යි යමක් කියනලදද, මොවුන්ගේ මේ විශේෂයවේ. '**ආමසනා**' ආමර්ශයයි. අතගෑමය. පැහැසූ අවකාශය නොඉක්මවා එහිම ගැටීමය. මෝ ආමර්ශමාත්‍රායි කියනුලැබේ. '**ඡුපනං**' ස්පර්ශකිරීම්මාත්‍රය. නොගටා පැහැසූ පමණය. **උම්මසනා** යන පදයටද, **උල්ලඞ්ඝනා** යන පදයටද නිර්දේශයෙහි උඩට සෙලවීමයයි යම් එක්ම පදයක් කියනලදී. එහිදු මේ විශේෂයවේ. පළමු පදය තමාගේ කය ස්ත්‍රියගේ සිරුරෙහි මතුපිට යැවීම් වසයෙන් කියනලදී. දෙවන පදය ස්ත්‍රියගේ කය එසවීම් වසයෙන් කියනලදී. සෙස්ස ප්‍රකටමය.

දැන් යම් මේ එකෙක් කායසංසර්ගරාගයට බටුයේ පෙරළුණු සිතින් යම් කායසංසර්ගරාගයකට පැමිණේද, ඔහු පිළිබඳ මේ පදයන්ගේ වසයෙන් විස්තර විසින් ආපත්තිභෙදය දක්වනසේක් '**ඉත්ථී ච හොති ඉත්ථිසඤ්ඤී සාරත්තො ච භික්ඛු ච නං ඉත්ථියා කායෙන කායං**' යනාදිය වදළසේක. එහි '**භික්ඛු ච නං ඉත්ථියා කායෙන කායං**' කායසංසර්ගරාගයෙන් රත්වූද ස්ත්‍රිය යන හැඟීම් ඇත්තාවූද, ඒ මහණතෙමේ තමන්ගේ කයින්. **නං** යනු නිපාතමාත්‍රයි. නොහොත් ඒ ස්ත්‍රියගේ මේ හස්තාදිභෙදඇති කය. '**ආමසති, පරාමසති,**' ආමර්ශනය කරයි. පරාමර්ශනය කරයි යන මොවුන් අතුරෙහි එක් ආකාරයෙනුදු ව්‍යතික්‍රමය කෙරේනම් සඞ්ඝාදිසෙසාපත්තියවේ. එහි එක්වරක් ආමර්ශනය කරන්නහුට එක් ඇවැතක්වේ. නැවත නැවත ආමර්ශනය කරන්නහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා සඞ්ඝාදිසෙසයවේ. පරාමර්ශනය කරන්නේද කයින් අත නොමුදු ඔබමොබද තමාගේ අත හෝ කය මෙහෙයවාද, පහකෙරේද, යවාද, එසේ දවස මුළුල්ලෙහිද පරාමර්ශනය කරන්නහුට එක්ම සඞ්ඝාදිසෙසාපත්තියක්වේ. ස්ත්‍රියගේ කයින් තමාගේ අත මුදමුදා ආමර්ශනය කෙරේද ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේ. '**ඔමසන්තො**' යටට පිරිමදින්නේද කයින් අත නොමුදම ස්ත්‍රියගේ හිසපටන් පාපිට තෙක් ආමර්ශනය කෙරේද, එක්ම සඞ්ඝාදිසෙසාපත්තියක්වේ. උදරාදීන් අතුරෙහි ඒ ඒ තැනට පැමිණ මුදමුදා ආමර්ශනය කෙරේද,

ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේ. '**උම්මසනාය**'ය. උඩට පිරිමැදීමෙහිද පය පටන් හිසතෙක් උඩට පිරිමදින්නහුට මෙම නයවේ. '**ඔලඞ්ඝනාය**' යටට නැමීමෙහි හෙවත් කර කැවීමෙහි. මාගමක කෙස්වලින් අල්ලාගෙන තමා ඉඹීම් ආදීන් අතුරෙහි යම් අනාචාරයක් කැමැත්තේද ඒ අනාචාරයකොට මුදන්නහුට එක්ම ඇවැතක්වේ. නැගී සිටි තැනැත්තිය නැවත නැවැත නමන්නහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේ. '**උලඞ්ඝනායපි**' උඩට නැමීමෙහිද කෙස්වලින් හෝ අත්වලින් හෝ අල්ලාගෙන නැගිටවන්නහුට මෙම නයවේ. '**ආකඩ්ඪනාය**' තමා වෙතට ඇදගැනීමෙහි. තමාට අභිමුඛකොට අදින්නේ යම්තාක් නොමුදද, එක්ම ඇවැතක්වේ. මුදමුද අදින්නහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේයයි '**පතිකඩ්ඪනාය**'.

තමන් වෙතට හරවා ගැණීමෙහිද පිටිපෑ තැනැත්තිය පිටින් අල්ලාගෙණ තමාවෙතට නතුකරන්නහුට මේ නයවේ. '**අභිනිග්ගණ්හනාය**' සිරුරු අවයව ගෙණ පෙළීමෙහි. වැළමිට පටන් අත හෝ වැළමිටින් උඩ බාහුව හෝ දැඩිකොට අල්ලාගෙණ යොදුනකුදු යන්නහුට එක්ම ඇවැතක්වේ. මුද නැවැත නැවැත ගන්නහුට ප්‍රයෝගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේ. නොමුද නැවැත නැවැත ස්පර්ශ කරන්නහුටද වැළඳ ගන්නහුට ද ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේයයි.

**මහාසුමම** ස්ථවිරයන් වහන්සේ කීහ. **මහාපදුම** ස්ථවිරයන්වහන්සේ වනාහි මුල් ගැනීමම ප්‍රමාණය. එහෙයින් යම්තාක් නොමුදද, ඒ තාක් **එක්ම** ඇවැතකැ'යි කීහ. '**අභිනිප්පීළනාය**' කිසිවක් මැඩීමෙහි. වස්ත්‍රය සමග හෝ ආභරණය සමග හෝ පෙළන සිරුර නොපහසන්නහුට ථුල්ලච්චයවේ. පහසන්නහුට සඞ්ඝාදිසෙසයවේ. එක් ප්‍රයොගයෙන් එක් ඇවැතක්වේ. නානා ප්‍රයොගයන්ගෙන් නොයෙක් ඇවැත්වේ. ගැනීම් පැහැසීම්හි අන් කිසි විකාරයක් නොකරන්නේද, ගත්පමණින් හා පැහැසූපමණින් ඇවැතට පැමිණේ.

මෙසේ මේ ආමර්ශනාදීන් අතුරෙහි එක් අයුරකිනුදු අධ්‍යාචාරයෙන් ස්ත්‍රිය කෙරෙහි ස්ත්‍රීසංඥ ඇත්තහුට සඞ්ඝාදිසෙසයවේ. ස්ත්‍රිය නොවේදැයි විමති ඇතියහුට ථුල්ලච්චයවේ. පණ්ඩකපුරුෂතිරච්ඡානගත 'යන සංඥ ඇත්තහුටද ථුල්ලච්චයමවේ.

පණ්ඩකයා කෙරෙහි පණ්ඩකසංඥ ඇත්තහුට ථුල්ලච්චයවේ. පණ්ඩකයා නොවේදැයි විමති ඇත්තහුට දුක්කටයවේ. පුරුෂ-තිර්‍ය්‍යග්ගත-ස්ත්‍රීසංඥ ඇත්තහුට දුක්කටයවේ.

පුරුෂයා කෙරෙහි, පුරුෂසංඥ ඇත්තහුටද, විමති ඇත්තහුටද, ස්ත්‍රී-පණ්ඩක-තිර්‍ය්‍යග්ගතසංඥ ඇත්තහුටද දුක්කටය වේ. තිර්‍ය්‍යග්ගතයා කෙරෙහිද, සර්‍වාකාරයෙන් දුක්කටයමවේ.

එක් ස්ත්‍රියක මුල්කොට ඇති නයෙහි, මේ ඇවැත් සලකා මේ උපායෙන්ම '**ද්වෙ ඉත්ථියො ද්වින්නං ඉත්ථීනං**' යනාදි වසයෙන් කියූ ද්විමූලකනයෙහිද, ද්විගුණවූ ඇවැත්හු දතයුත්තාහ. ස්ත්‍රීන් දෙදෙනකුන් නිමිතිකොට යම්සේ සඞ්ඝාදිසෙස දෙකක්වේද, එසේ බොහෝ ස්ත්‍රීන් නිමිතිකොට බොහෝ ඇවැත්හු දතයුත්තාහ. යම් මහණෙක් එකතුව සිටි බොහෝ ස්ත්‍රීන් අතින් වටකොට අල්ලාගනීද, යම් පමණ ස්ත්‍රීහු පහසනලද්දහුද, ඔවුන්ගේ ගණනින් හෙතෙමේ සඞ්ඝාදිසෙසාපත්තීන්ට පැමිණේ. මධ්‍යගත ස්ත්‍රීන්ගේ ගණනින් ථුල්ලච්චයාපත්තීන්ට පැමිණේ. ඔහු විසින් ඒ ස්ත්‍රීහු කායප්‍රතිබද්ධයෙන් ආමර්‍ශනය කරනලද්දහුවෙති. යම් මහණෙක් බොහෝ ස්ත්‍රීන්ගේ ඇඟිලි හෝ කෙස් හෝ එකට අල්ලා ගනීද, හෙතෙමේ ඇඟිලිද, කෙස්ද, නොගැණ ස්ත්‍රීන් ගැණ සඞ්ඝාදිසෙසාපත්තින්ගෙන් (චෝදනා) කරවිය යුත්තේය. යම් ස්ත්‍රීන්ගේ ඇඟිලි හෝ කෙස් හෝ මධ්‍යගතවූවාහු මෙන්ද, ඒ ස්ත්‍රීන්ගේ ගණනින් හෙතෙමේ ථුල්ලච්චයාපත්තීන්ට පැමිණේ. ඒ ස්ත්‍රීහු ඔහු විසින් කය පිළිබැඳියකින් ආමර්‍ශනය කරනලද්දහු වෙති. බොහෝ ස්ත්‍රීහු කය පිළිබැඳි රැහැන්වත් ආදියෙන් වටකොට ගන්නේ, වටකිරීම තුළට ගිය සියලු ස්ත්‍රීන්ගේ ගණනින් ථුල්ලච්චයාපත්තීන්ට පැමිණේ. **මහාපච්චරියෙහි** පහස නොලත් ස්ත්‍රීන් නිමිතිකොට දුක්කටයයි කියනලදි. එහි යම්හෙයකින් පෙළෙහි කය පිළිබැඳියක් කය පිළිබැඳියකින් ආමර්‍ශනයෙක් නැත්තේද, එහෙයින් සියලුම කය පිළිබැඳියකින් පිළිබැඳියක් කය පිළිබැඳියෙක්ම සඞ්ග්‍රහ කොට **මහාඅට්ඨකථාවෙහි** හා **කුරුන්දි අට්ඨකථාවෙහි** කියනලද්දේය. මෙහි පළමු නයම යුක්තතරයයි දක්නාලැබේ.

යම් මහණෙක් අතිනත ගෙන පිළිවෙළින් සිටි ස්ත්‍රීන් කෙරෙහි කායසංසර්‍ගරාගයෙන් සමරාගය ඇත්තේ එක් ස්ත්‍රියක අතින් අල්ලාගනීද, අල්ලාගත් ස්ත්‍රියගේ වසයෙන් හෙතෙමේ සඞ්ඝාදිසෙසයට පැමිණේ. අන් ස්ත්‍රීන්ගේ ගණනින් පෙර කියූ නයින්ම ථුල්ලච්චයාපත්තීන්ට පැමිණේ. ඒ මහණතෙමේ ඒ ස්ත්‍රියගේ කය පිළිබැඳි වස්ත්‍ර හෝ මල් හෝ ගනීද, සියලු ස්ත්‍රීන්ගේ ගණනින් ථුල්ලච්චයාපත්තීන්ට පැමිණේ. යම් ලෙසකින් රැහැන් වත් ආදියෙන් වට කරන්නහු විසින් සියලුම ස්ත්‍රීහු කය පිළිබැඳියකින් ආමර්‍ශනය කරනලද්දහු වෙත්ද, එසේ මෙහිද සියලු ස්ත්‍රීහුම කයපිළිබැඳියකින් ආමර්‍ශන කරනලද්දහු වෙත්. ඒ ස්ත්‍රීහු, උනුන් වස්ත්‍ර

කෙළවර ගෙන සිටියාහු වෙත්ද, එහිදී ඒ මහණතෙමේ පළමු කියූ නයින්ම පළමු ස්ත්‍රීය අතින් අල්ලාගනීද, අතින් අල්ලාගත් ස්ත්‍රියගේ වසයෙන් සඞ්ඝාදිසෙසයට පැමිණේ. අන් ස්ත්‍රීන්ගේ ගණනින් දුක්කටයන්ට පැමිණේ. ඒ කියූ පෙර නයින්ම ඒ සියලු ස්ත්‍රීන්ගේම කාපිළිබැඳියෙන් කාපිළිබැඳිය ආමර්ශනය කරනලද්දේවේද, ඒ මහණතෙමේද ඒ ස්ත්‍රිය කාපිළිබැඳියෙහිම අල්ලාගනීද, ඇයගේ වසයෙන් ථුල්ලච්චයට පැමිණේ. අන්‍ය ස්ත්‍රීන්ගේ ගණනින් කයපිළිබැඳියෙන් කය පිළිබැඳිය ආමර්ශනය කරන අනන්තරනයින්ම දුක්කටයන්ට පැමිණේ.

යම් මහණෙක් තෙමේ ඝන වස්ත්‍රයක් හැඳි ස්ත්‍රියක් කායසංසර්ගරාගයෙන් වස්ත්‍රයෙහි ගටාද, එකල ථුල්ලච්චයට පැමිණේ. තුනීවතක් හැඳියක ගටාද, එහි වස්ත්‍ර අතුරෙන් නිකුත්වූ ස්ත්‍රියගේ ලොම හෝ මහණහු, මහණහුගේ පිවිසි ලොම හෝ ස්ත්‍රිය පහසත් නම්, දෙදෙනාගේම ලෝම උනුනුගේ ලොමයන් පහසත් නම් සඞ්ඝාදිසෙසවේ. නොනට කායප්‍රසාදය ඇති කර්මජරූපයෙන් නොනට කායප්‍රසාදය ඇති කායෙන්ද්‍රියයෙන් යුත් අවයවයක් හෝ, නට කායප්‍රසාදය ඇති කායෙන්ද්‍රියයෙන් යුක්තනොවූ අවයවයක් හෝ, අනුපාදින්නකවූද කෙස් ආදියෙන් උපාදින්නකයක් හෝ, අනුපාදින්නකයක් හෝ පහසන්නේ සඞ්ඝාදිසෙසයට පැමිණේමය. එහි කුරුන්දියෙහි ලොම් ගැන සඞ්ඝාදිසෙසැයි කියනලදි. මහාඅට්ඨකථාවෙහි 'ලොම් ගැන ඇවැතින් නොකරවියයුතුය. එක්ම සඞ්ඝාදිසෙසයට පැමිණේ. සහසතු ඇඳක නොඅතුරා හොත්තේ ලොව් ගැන කරවිය යුතුයයි කියනලදි. එයම යුතුවේ. ස්ත්‍රීන්ගේ වසයෙන්ම මේ ඇවැතවේ. කොටස් වසයෙන් නොවේ. මෙහි යමෙක් කයපිළිබැඳියක් ගන්නෙමියි. කය අල්ලාගනීද, කය හෝ ගන්නෙමියි කය පිළිබැඳියක් අල්ලාගනීද, හෙතෙමේ කුමකට පැමිණේදැයි කීය. මහාසුමම ස්ථවිරයන්වහන්සේ ඒ තාක් වස්තුවම පරිදියයි කියත්, මේ වනාහි මුන්වහන්සේගේ ලබ්ධියයි.

**'වත්ථු සඤ්ඤාච රාගො ච - ඵස්ස පටිවිජානනා**
**යථා නිද්දිට්ඨනිද්දෙසෙ - ගරුකං තෙන කාරයෙති.'**

වස්තු -සංඥා-රාග--ස්පර්ශ-ප්‍රතිවිජානන යන එයින් යථොක්ත කාය සංසර්ගනිර්දේශයෙහි යම් කරුණකින් වස්තු සංඥාදීහු මෙන්ද ඒ කාරණයෙන් ගරු ඇවැත කටයුත්තේය.

මෙහි 'වත්ථු' යනු ස්ත්‍රියයි. 'සඤ්ඤා' යනු ස්ත්‍රීය යන හැඟීමය. 'රාග' යනු කායසංසර්ගරාගයයි. 'ඵස්සපටිවිජානනා' යනු කායසංසර්ගරාගයෙන් වන පහස දැනීමය. එහෙයින් යමෙක්, ස්ත්‍රිය යන

හැඟීම් ඇතිව කායසංසග්ගරාගයෙන් ස්ත්‍රියගේ කය පිළිබැඳියක් ගන්නෙමියි පැවත්තේම කය පහසාද, ගරු සඞ්ඝාදිසෙසයටම පැමිණේ. අනිකෙක් ථුල්ලච්චයට පැමිණේයයි කීය.

## මහාපදුම ස්ථවිරයන්වහන්සේ

'සඤ්ඤාය විරාගිතම්හි - ගහණෙ ච විරාගිතෙ
යථා නිද්දිට්ඨනිද්දෙසෙ - ගරුකං තත්‍ථ න දිස්සතීති'

හැඟීම වැරදී ගිය කල්හිද, ගැනීම වැරදී ගියකල්හිද එහි යථොක්ත නිර්දේශයෙහි ගරු ඇවැත නොදක්නේයයි කීහ. මේ වනාහි මුන්වහන්සේගේ ලබ්ධියයි.

ස්ත්‍රිය කෙරෙහි ස්ත්‍රිය යන හැඟීම් ඇත්තහුට සඞ්ඝාදිසෙසය කියනලදි. මොහු විසිනුදු ස්ත්‍රීසංඥව දුරුකරනලදී. කායප්‍රතිබද්ධයෙහි කායප්‍රතිබද්ධසංඥව උපදවන ලදි. ඒ කායප්‍රතිබද්ධය ගන්නහුට ථුල්ලච්චය කියනලදි. මොහු විසින් ගැනීමද වරදවන ලදි. ඒ කායප්‍රතිබද්ධය නොගෙන ස්ත්‍රිය අල්ලාගන්නාලදි. එහෙයින් මෙහි ස්ත්‍රිය යන හැඟීම නොවූබැවින් සඞ්ඝාදිසෙසය නොපැනේ. කායප්‍රතිබද්ධයක් නොගත් බැවින් ථුල්ලච්චය නොපැනේ. කායසංසග්ගරාගයෙන් පැහැසූබැවින් දුක්කටයවේ. කායසංසග්ගරාගයෙන් මෙනම් වස්තුවක් පහසන්නහුට අනාපත්තියයි කීමෙක් නැත්තේය. එහෙයින් දුක්කටයමැයි මෙයද කියයි. 'කායසංසග්ගරාගයෙන් ඇලීම් සහිතව ස්ත්‍රියක ගන්නෙමියි කායසංසග්ගරාගයෙන් ඇලුනියක ගත්තේද, සඞ්ඝාදිසෙසයවේ. නොඇලුනියක ගන්නෙමියි නොඇලුනියක ගත්තේද, මාතෘප්‍රෙමාදිවශයෙන් ගැනීමෙහි දුක්කටයවේ. ඇලුනියක ගන්නෙමි,යි නොඇලුනියක ගත්තේද, නොඇලුනියක ගන්නෙමියි ඇලුනියක ගත්තේද දුක්කටයමයයි මේ චතුක්ක කීහ. මෙසේ කීවාහුද, එහෙත් මහාසුමම ස්ථවිරවාදයම මෙහි 'ඉත්‍ථී ච හොති ඉත්‍ථීසඤ්ඤී ච, සාරත්තො ච භික්ඛු ච තං ඉත්‍ථියා කායෙන කායපටිබද්ධං ආමසති පරාමසති - පෙ- ගණ්හාති, ඡුපති, ආපත්ති ථුල්ලච්චයස්ස' යන මේ පෙළ හාද, **යො හි එකතො ඨිතා සම්බහුලා ඉත්‍ථියො බාහාහි පරික්ඛිපිත්වා ගණ්හාති, සො යත්තකා ඉත්‍ථියො ඡුට්ඨා, තාසං ගණනාය සඞ්ඝාදිසෙසෙ ආපජ්ජති. මජ්ඣගතානං ගණනාය ථුල්ලච්චයෙ,** යනාදීවූ අත්‍ථකථාවිනිශ්චය හාද සමවේ. '**පණ්ඩකො ච හොති ඉත්‍ථිසඤ්ඤී,** යනාදියෙහි මෙන් සංඥදිය වැරදවීමෙන් වරදවන ලද්දේ නම් වන්නේද, '**කායපටිබද්ධසඤ්ඤී හොති කායසඤ්ඤී**' යනාදි නයින් පෙළෙහි විශෙෂය කියන්නේය. යම්හෙයකින් ඒ වෙනස නොකියන ලද්දේද, එහෙයින් ස්ත්‍රිය කෙරෙහි ස්ත්‍රීසංඥ ඇති

කල්හි ස්ත්‍රිය ආමර්ශනය කරන්නහුට සඞ්ඝාදිසෙසයවේ. කායප්‍රතිබද්ධය ආමර්ශනය කරන්නහුට ථුල්ලච්චයයි වස්තුව පරිදිම යෙදේ. **මහාපච්චරියෙහිද** නිල් පැහැති වස්ත්‍රයක් පොරොවා සයනය කළ කලුපැහැති ස්ත්‍රියකගේ කය ගටන්නෙමියි කය ගටාද, සඞ්ඝාදිසෙසයවේ. කය ගටන්නෙමියි නීලවස්ත්‍රය ගටාද, ථුල්ලච්චයවේ. නීලවස්ත්‍රය ගටන්නෙමියි කය ගටාද, ථුල්ලච්චයවේයයි මේ ලක්ෂණය කියනලද්දේය. යම් මේ '**ඉත්ථී ච පණ්ඩකො ච**' යනාදි නයින් වස්තුමිශ්‍රකනය කියනලද්දේද, එහිද වස්තුව පිළිබඳ සංඥවිමති වශයෙන් කියනලදි. ආපත්තීහු පෙළෙහි නොමුළාවන්නහු විසින් දතයුත්තාහ.

කයින් කායප්‍රතිබද්ධවාරයෙහි ස්ත්‍රිය කෙරෙහි ස්ත්‍රීසංඥ ඇතිව කායප්‍රතිබද්ධය ගන්නහුට ථුල්ලච්චයවේ. සෙසු හැම තන්හි දුක්කටයවේ. කායප්‍රතිබද්ධයෙන් කායප්‍රවාරයෙහිද මෙම නයවේ. කායප්‍රතිබද්ධයෙන් කායප්‍රතිබද්ධවාරයෙහිද නිස්සග්ගියෙන් කායවාරාදීන්හිද මොහුට හැම තන්හි දුක්කටයමවේ.

'**ඉත්ථී ච හොති ඉත්ථිසඤ්ඤී, සාරත්තො ච, ඉත්ථී ච නං භික්ඛුස්ස කායෙන කායං**' යනාදි වාරය වනාහි මහණහු කෙරෙහි මාගමගේ කායසංසග්ගරාගය වසයෙන් වදරන ලද්දේය. එහි '**ඉත්ථී ච නං භික්ඛුස්ස කායෙන කායං**' මහණහු කෙරෙහි කායසංසග්ගරාගයෙන් ඇලුම් සහිතවූ ස්ත්‍රීතොමෝ ඒ මහණහු හුන් තැනට හෝ හොත් තැනට හෝ ගොස් තමන්ගේ කයින් මහණහුගේ ඒ කය ආමර්ශනය කරයි. පහසයි. එකල්හි සෙවනයෙහි අදහස් ඇත්තේ කයින් වැයම් කෙරේද '**ඵස්සං පටිවිජානාති**' මෙසේ ඒ ස්ත්‍රිය විසින් ආමර්ශනය කරනලද්දේ හෝ පහසනලද්දේ හෝ සේවනයෙහි අදහස් ඇතිව පහස දැනගනුපිණිස මඳකුත් කය සොලොවාද, කම්පිත කෙරේද, සඞ්ඝාදිසෙසයට පැමිණේ. '**ද්වෙ ඉත්ථියො**' මෙහි සඞ්ඝාදිසෙස දෙකකට පැමිණේ. ස්ත්‍රිය කෙරෙහි හා පණ්ඩකයා කෙරෙහිද සඞ්ඝදිසෙසය සමග දුක්කටයවේ. මේ උපායෙන් යම්තාක් නිස්සග්ගියෙන් නිස්සග්ගිය ආමර්ශනය කෙරේද, පහස්සුව හා සේවනයෙහි අදහස් ඇතිව කයින් වැයම් කෙරේද, පහස නොදනීද, දුක්කටාපත්තිය වේයයි වදළසේක්ද ඒ තාක් පෙර නයින්ම ආපත්තිභෙදය දතයුතුය. මෙහිද '**කායෙන වායමති, න ච ඵස්සං පටිවිජානාති**' තමන් හළ මලක් හෝ ඵලයක් ස්ත්‍රියක හෝ තමන් හළ මලකින් හෝ ඵලයකින් හෝ පහරදෙන්නිය දැක කයින් විකාරයක් කෙරේද, ඇඟිල්ලක් හෝ සොලොවාද, බැම හෝ ඔසොවාද ඇස හෝ කණීද මෙබඳුවූ අන්‍යවිකාරයක් හෝ කෙරේද, මෙය 'කයින් වැයම් කෙරේද පහස දැන නොගනියි කියනු ලැබේ. මෙතෙමේද කයින් වැයම් කළබැවින් දුක්කටයට

පැමිණේ. ස්ත්‍රීන් දෙදෙන කෙරෙහි දුක්කට දෙකකටද පණ්ඩක ස්ත්‍රීන් දෙදෙන කෙරෙහි දුක්කට දෙකකටද පැමිණේ.

මෙසේ වස්තුවශයෙන් විස්තර විසින්, ආපත්තිභෙදය දක්වා, දැන් ලක්ෂණ වශයෙන් සඞ්ක්ෂප විසින් ආපත්තිභෙදයද, අනාපත්තියද දක්වනසේක් 'සෙවනාධිප්පායො' යනාදිය වදාළසේක. එහි 'පෙර කියූ නයින් ස්ත්‍රිය විසින් පහස්නා ලදුයේ සෙවනය කිරීමෙහි අදහස් ඇත්තේ කයින් වෑයම් කෙරේද, පහස දැනගනීදැයි යන ත්‍රිවිධ අඞ්ගසම්පත්තියෙන් සඞ්ඝාදිසෙසයවේ. දෙවන නයෙහි හළ වස්තුවකින් හළ වස්තුවක් ආමර්ශනයෙහි මෙන් වෑයම්කොට නොපැහැසීමෙහි මෙන්ද පහස නොදන්නහුට ද්විවිධ අඞ්ගසම්පත්තියෙන් දුක්කටයවේ. තෙවන නයෙහි කයින් වෑයම් නොකරන්නහුට ඇවැත් නොවේ. යමෙක් සෙවනය කිරීමෙහි අදහස් ඇත්තේද, නිසල කයින් හුදෙක් පහස දන ගනීද, ඉවසාද, වළඳද ඔහුගේ චිත්තොත්පාද මාත්‍රයෙක්හි ඇවැත් නොවනබැවින් ඇවැත් නොවේ. සිවුවන නයෙහි හළ වස්තුවකින් හළ වස්තුවක් ආමර්ශනයෙහි මෙන් පහස දැන ගැන්මෙක් නැත්තේද, හුදෙක් සිත උපන් පමණෙක්ම වේද, එහෙයින් ඇවැත් නොවේ. මිදෙන අදහස් ඇත්තහුට සියලු ආකාරයන්හි ඇවැත් නොවේ. මෙහි යමෙක් ස්ත්‍රියක විසින් අල්ලාගන්නාලද්දේ ඒ ස්ත්‍රිය තමසිරුරෙන් මුදහරිනු කැමැත්තේ හාත්පසින් නමාද, පහරදේද, මෙතෙමේ කයින් වෑයම් කෙරේ. පහස දනියි. යම් මහණෙක්තෙමේ එන්තියක දැක ඇගෙන් මිදෙනු කැමතිව බිය ගන්වා පලවාහරීද, මෙතෙමේ කයින් වෑයම් කෙරේ. පහස දැන නොගනියි. යම් මහණෙක්තෙමේ එබඳු කයට නැගි දීර්ඝජාති ඇත්තියක දැක වහා යේවා, ගටනු ලබන්නී අවැඩ පිණිස පවත්තේයයි නොගටාද, ස්ත්‍රියකම හෝ සිරුර පහසත්තිය දැන මෝ තොමෝ 'මෙතෙමේ මාගෙන් ප්‍රයොජන නැත්තෙකැ'යි තොමෝම යන්තේයයි නොදන්නකුමෙන් නිසලවේද, බලවත් ස්ත්‍රියක විසින් හෝ දැඩිව අල්ලාගත්බැවින් නිසලවේද, මෙතෙමේ කයින් වෑයම් නොකෙරේ. පහස දැනගනියි. යමෙක් තෙමේ එන්තියක දැක, ඒවා, ඇයට පහරදී හෝ පහකොට හෝ යන්නෙමියි නිසලවේද, මෙතෙමේ කයින් වෑයම් නොකෙරේ. පහස දැනගනියි. යමෙක් තෙමේ එන්තියක දැක, ඒවා ඇයට පහරදී හෝ පහකොට හෝ යන්නෙමියි නිසලවේද, මෙතෙමේ මිදීමෙහි අදහස් ඇතිව කයින් වෑයම් නොකෙරේ. පහස නොදනීයයි දතයුතුය. "අසඤ්චිච්ච" මේ උපායෙන් මැය පහසන්නෙමියි නොසිතා. මෙසේ නොසිතා පා පිළිගැණීම් ආදියෙහිදී මාගමක සිරුර පැහැසූ කල්හිද ඇවැත් නොවේ. 'අසතිසා' අන් තැනක තැබූ සිහි ඇත්තේවේද, මාගමක පහසන්නෙමියි සිහියක් නැත්තේද, මෙසේ

නොසිහියෙන්, අත්පා දිගු කිරීම් ආදිය කරන කාලයෙහි පහසන්නහුට ඇවැත් නොවේ. 'අජානන්තස්ස' දරුවෙසින් සිටි දැරියක ස්ත්‍රියයි නොදන්නේ කිසියම් කටයුත්තෙකින් පහසන්නේද, මෙසේ ස්ත්‍රියයි නොදනිමින් පහසන්නහුට ඇවැත් නොවේ. 'අසාදියන්තස්ස' කායසංසග්ගය නොඉවසන්නහුට හස්තපරම්පරාවෙන් පැමිණි මහණහුට මෙන් ඔහුට ඇවැත් නොවේ. උන්මත්තකාදීහු කියූ නය ඇත්තාහුමය. මෙහි උදායි ස්ථවිරතෙමේ ආදිකර්මිකවූයේය. ඒ ආදිකර්මිකයාහට ඇවැත් නොවේ.

පදභාජනීය වර්ණනාව නිමි.

—||—

සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ප්‍රථම පාරාජික සමුට්ඨානය ඇත්තේවේ. කායචිත්ත දෙකින් උපදී. ක්‍රියාවෙන් පැමිණියයුතුබැවින් ක්‍රියාසමුට්ඨානය ඇත්තේය. ව්‍යතික්‍රම සංඥවගේ අභාවයෙන් මිදෙනබැවින් සංඥවිමොක්ෂවේ. සිත් සහිතව කටයුතු බැවින් සචිත්තකස- මුට්ඨානයි. ලොකයා විසින් අකුසල්බැවින් හළයුතුයයි නියමය හෙයින් ලොකවද්‍යයි. කයින් කටයුතුබැවින් .කායකර්මය. අකුසලචිත්තයි. සුඛ මද්‍ධ්‍යස්ථ දෙකින් ද්විවෙදනයි.

විනීතවස්තූන්හි 'මාතුයා මාතුපෙමෙන' මාතෘප්‍රෙමයෙන් මවගේ කය ආමර්ශනය කෙළේය. දුහිතෘ භගිනිවස්තූන්හි මේ නයවේ. එහි යම්හෙයකින් මව හෝ වේවා, දුව හෝ වේවා. ස්ත්‍රීහු සියල්ලෝම බ්‍රහ්මචර්‍ය්‍යයට සැතිරියහමය. එහෙයින් 'මෝ මාගේ මෑනියොමෝය, මෝ මාගේ දූය, මෝ මාගේ බුහුනැයි ගෘහනිශ්‍රිතප්‍රෙමයෙන් ආමර්ශනය කරන්නහුටද දුක්කටය වදරනලද්දේමය. භාග්‍යවතුන්වහන්සේගේ මේ අණ සිහිකරන්නහු විසින් ගඟදියපහරින් ගසාගෙන යනුලබන මව දකීද, එහෙත් අතින් නොපැහැසිය යුත්තීය. නුවණැති මහණහු විසින් නැවක් හෝ ලෑලිකඩක් හෝ කෙහෙල් කදක් හෝ දැවකදක් හෝ එළවිය යුතුය. එබන්දක් නැති කල්හි කසටවතක් නමුත් එළවා ඉදිරියෙහි තැබිය යුතුය. 'මෙහි එල්බ ගනුවයි නොකියයුත්තීය. එල්බ ගත් කල්හි පිරිකර ඇද ගන්නෙමියි අදිමින් යායුතුය. බියවේ නම්, ඉදිරියෙන් ඉදිරියෙන් ගොස් බිය නොවයි අස්වැසිය යුත්තීය. බියවන්නී වහා පුතුගේ කදෙහි හෝ නැගේද, අත හෝ අල්ලා ගනීද, 'මැහැල්ල පහවෙවයි සලා නොදැමිය යුත්තීය. ගොඩට පැමිණවිය යුත්තීය. මඩෙහි ගැලුනිය කෙරෙහිද, ළිදෙහි වැටුනිය කෙරෙහිද මෙම නයවේ. එහිද යොතක් හෝ වස්ත්‍රයක් හෝ බහා අතින් අල්ලාගත්බව දැන උඩට නැංවිය යුත්තීය. ආමර්ශනය

නොකට යුත්තීමය. හුදෙක් මාගමගේ සිරුර පමණක්ම ආමශීනය නොකටයුතු නොවේ. හිදිවත් පොරෝණද ආභරණ භාණ්ඩද, තණසුඹුළුව හෝ තල්පතින් කළ මුද්ද හෝ පටන් අනාමාසමවේ. ඒ නිවාසනපාරුපණද පලදනා පිණිස තබනලද්දක්මය. නිවාසනය හෝ පාරුපණයක් හෝ නිවාසන පාරුපණභාවයෙන් පෙරළා පහකොට සිවුරු පිණිස පාමුල තබාද ගන්නට වටියි. ආභරණභාණ්ඩයන් අතුරෙහි හිසේ පලදනා දත්මුවාකුරු ආදීවූ කප්පිය භාණ්ඩයක් 'ස්වාමීනි මෙය ඔබවහන්සේටය, ගනුමැනවැයි දෙනු ලබන්න දැළිපිහි, ඉදිකටු දමන කොපුවක් පිණිස ගතයුතුය. රත්රිදී මුතු ආදියෙන් කළ භාණ්ඩය වනාහි අනාමාසමවේ. දෙනුලබන්නේද නොගතයුතුය.

හුදෙක් මොවුන්ගේ සිරුරෙහි එළවිය යුත්තම අනාමාස නොවේ. ස්ත්‍රීසටහනින් කළ ලීයෙන් කළ රූපයද දන්තරූපයද යකඩරූපයද ලොහරූපයද ඊයම් රූපයද හුණුපිරියමින් කළ රූපයද සියල්ල රුවන්මුවා රූපයද යටත්පිරිසයින් පිටිමුවා රූපයද අතනොගෑයුතුමය. පරිභෝගය පිණිස 'මෙය ඔබවහන්සේටවේවයි ලැබ සර්වරත්නමය භාණ්ඩය හැර සෙස්ස බිඳහැර උපකරණයට සුදුසුදැයි උපකරණයෙහිද පරිභොගයට සුදුසුදැයි පරිභොගයෙහිද එළවීම වටින්නේය.

ස්ත්‍රීරූපය යම්සේද එසේ සප්තවිධ ධාන්‍යද අතනොගෑයුතුය. කුඹුරක් මැදින් යන්නහු විසින් එහි හටගත් ධාන්‍යඵලද අතනොගාම යායුතුය. ගෙදෙරක හෝ අතරමග හෝ ධාන්‍යය දිගහැර තබනලද්දේවේද, එහි පසෙකින් මගක් ඇත්තේ නම් ධාන්‍ය නොමැඩම යායුතුය. යන මගක් නැතිකල්හි මාර්ගසංඥ ඇතිව මග ඉටා යායුතුය. ඇතුළුගෙයි ධාන්‍ය මතුයෙහි අසුනක් පණවා දෙත්නම් හිඳීම වරද නොවේ. කිසිකෙනෙක් ආසනශාලාවෙහි ධාන්‍ය වගුරුවත්ද ඒ ධාන්‍ය බැහැර කරවන්නට හැක්කේ නම් බැහැර කරවියයුතුය. බැහැර කරවනු නොහැකිවේනම්, ධාන්‍ය නොමඩින ලෙස එකත්පසෙක්හි පුටුවක් පණවා හිදිය යුතුය. ඉඩක් නොවේනම් මිනිස්සු ධාන්‍යමැදම අසුනක් පනවා දෙත්ද, හිදියයුතුය. එහි හටගත් මුං මෑ ආදීවූ ධාන්‍යවර්ගද, තල් කොස් ආදීවූ ඵලද සෙල්ලම් පිණිසද නොපැහැසියයුතුය. මිනිසුන් විසින් රැස්කොට තැබූ දැයෙහිද මෙම නයවේ. වනයෙහි ගස්වලින් නැමුනු ඵල අනුපසම්පන්නයන්ට දෙමියි ගැනීම සුදුසුවේ.

මුත්තා - මණි - වෙළුරිය - සඞ්ඛ - සිලා - පවාළ - රජත - ජාතරූප - ලොහිතඞ්ක - මසාරගල්ල යන යන මේ දස රුවන් අතුරෙහි නොසේදූ නොවිදි, හටගත් පරිදිමවූ මුතු පැහැසීමට සුදුසුය. සෙස්සෝ නොපැහැසිය

යුතුයයි කියත්, **මහාපච්චරියෙහි** සේදූ නොසේදූ මුතු නොපැහැසිය යුතුය. බඩුමිල පිණිසද පිළිගන්නට නොවටියි. කුෂ්ඨරෝග ඇත්තහුට බෙහෙත් පිණිස වටීයි කියනලද්දේය. යටත් පිරිසෙයින් දැපලිඟු පටන් සියලු නීල පීතවර්ණාදි ප්‍රභෙදවත් මාණික්‍යය දෙවුම් විදුම් වටකිරීම් ඇත්තේ නොපැහැසියයුතුය. හටගත් පරිදිමවූ ආකාර ඇති මුතු පාත්‍ර ආදී බඩුමිල පිණිස පිළිගන්නට වටීයයි කියනලදය. ඒද **මහාපච්චරීයෙහි** වනාහි ප්‍රතික්ෂෙප කරනලදී. පචනයකොට කළ එක් කදම්ණම වටීයයි කියනලද්දේය. වේළුරියෙහිද විනිශ්චය මැණිකෙහි කියූ විනිශ්චය සමානවේ. සඞ්ඛය තෙමේ, ධමනසඞ්ඛයද දෝනාලද්දේ මණි ආදි භාවයෙන් කළ සිදුරු ඇත්තේද, කසුත්ලිය ආදියෙන් විසිතුරුවූයේ මුතු ආදීරුවන් ඔබ්බනලද්දේද නොපැහැසියයුතුය. පානීය සඞ්ඛය දෝනාලද්දේද, නොදෝනා ලද්දේද පැහැසිය හැක්කේය. රුවන් ඔබ්බනලද සඞ්ඛය හැර සෙස්සද අඳුන් ආදී බෙහෙත් පිණිසද පාසිවුරු ආදි බඩුමිල පිණිසද පිළිගන්නට වටියි. සේදූ විදි රුවන් එබ්බුගල මුං පැහැ ඇත්තේ නොපැහිසියයුතුය. සෙසු ගල් කරගල් ආදිය පිණිස ගැනීම මෙහි වරද නැත්තේය. මෙහිද **'රතනසංයුත්තා'** යනු රන් හා යොදු ගිනියම් කොට කරනලදැයි කියත්, පබළු දෙවා විදිනලද්දේ අනාමාසවේ. සෙසු පබළු ආමාසය. පාසිවුරු ආදි බඩු මිල පිණිසද පිළිගන්නට වටියි. **මහාපච්චරියෙහි** වනාහි දෙවියේද නොදෙවියේද සියල්ල අනාමාසය. පිළිගන්නටද නොවටීයයි කියනලදි. රිදීද, රන්ද, කළබඩුද, නොකළබඩුද යන සියල්ල, මුළුමනින් ධාතුපාසාණය පටන් අනාමාසදවේ. නොපිළිගතයුතුදවේ. **උත්තරරාජපුත්‍ර** තෙමේ රන්සෑයක් කරවා **මහාපදුම** ස්ථවිරයන්වහන්සේට යැවීය. උන්වහන්සේ එය නොකැපැයි ප්‍රතික්ෂෙප කළහ. චෛත්‍යගර්භයෙහි රන්පියුම්, රන්බුබුලු ආදීහු මෙන්ද, මොවුහුද අනාමාසය. චෛත්‍ය සරරක්ෂකයෝ වනාහි රූපියඡඩ්ඩකස්ථානයෙහි සිටියෝය. එහෙයින් ඔවුන්ට, පහසා ඔබමොබ හසුරුවන්නට වටීයයි කියනලදි. **කුරුන්දියෙහි** වනාහි එය ප්‍රතික්ෂෙප කරනලදය. රන්සෑයෙහි කුණුකසළම පහකරන්නට වටීයයි මෙපමණක්ම අනුදන්නාලදි. පිත්තලද ස්වර්ණගතිතවමවේ. අනාමාසැයි සියලු අට්ඨකථාවන්හි කියනලදි. සෙනාසනපරිභොගයෙහි සියල්ල කැපවේ. එහෙයින් රන්රදීමුවා සියලු සෙනසුන් පිරිකරම ආමාසවේ. ධර්මවිනය වර්ණනාස්ථානයෙහි පලිඟු ටැම් ඇති, රුවන්දමින් සැරසූ, රතනමණ්ඩප කෙරෙත් එහි සියලු උපකරණ භික්ෂූන්ට පිළිදගින්නට වටියි. ලොහිතඞ්ක මසාරගලලයෝ දෙව විදිනලද්දහු අනාමාසවෙති. සෙසු නොදෙවි නොවිදිනලද්දේ ආමාසයෝය. බඩුමිල පිණිස වටිත්යි කියනලදය. මහාපච්චරියෙහි වනාහි දෙවියාහුද

නොදෙවියාහුද මුළුමනින් අනාමාසයය. පිළිගන්නට නොවටීයයි කියනලද්දේය.

සියලු ආයුධභාණ්ඩ අනාමාසවේ. බඩුමිලපිණිස දෙනු ලබන්නද නොපිළිගතයුතුය. සැත් වෙළෙඳම නොදවටියි. ශුද්ධධනුදණ්ඩද දුනුදියද කැවිටද, අකුස්සද යටත් පිරිසෙයින් වැ පොරෝ ආදියද ආවුධසඬෙක්පයෙන් කරනලද්දහු අනාමාසමවේ. කිසිවකු විසින් විහාරයෙහි අඩයටියක් හෝ තෝමරයක් හෝ තබනලද්දේවේද, වෙහෙර දකින්නහු විසින් 'ගෙන යෙත්වායි හිමියන්ට හසුනක් යැවියයුතුය. ගෙන නොයෙත් නම්, ඒ ආවුධය නොසොල්වන්නහු විසින් විහාරය පිළිදැගියයුතුය. යුදබිම වැටුණු කඩුවක් හෝ අඩයටියක් හෝ තෝමරයක් හෝ දැක පහණකින් හෝ අන්කිසිවකින් හෝ කඩුව බිඳ සැතක් පිණිස ගැනීම වටියි. අන් අඩයටි ආදියද වෙන්කොට කිසිවක් සැත් පිණිස කිසිවක් කතුරු දඬුආදිය පිණිස ගතයුතුය. 'මෙය ගනුවුයි දෙනුලබන්නද කඩා විනාශකොට කැපබඩුවක් කරන්නෙමියි සියල්ලම පිළිගන්නට හැකිය. මස්දැල් පක්ෂිදැල් පෝරුදැල් ආදීද ඊතල රක්නා බඩුද යන සියල්ල අනාමාසය. පරිභොගය පිණිස ලැබෙනකල්හි දැල්, අසුනෙහි හෝ සැයෙහි හෝ මත්තෙහි බඳින්නෙමි. චෛත්‍යඡත්‍රය හෝ වෙළන්නෙමියි හෝ පිළිගතයුතුය. ඊ රක්නා සියලු බඩුම බඩුමිල පිණිස පිළිගැණීම සුදුසුවේ. මෙය පරපීඩා නිවාරණය කරන්නෙක්මය. පීඩා කරන්නක් නොවේ. පලිහය දැහැටි බඳුනක් කරන්නෙමියි ගැනීම වටියි.

සමින් වෙළූ විණා බෙර ආදිය අනාමාසය. **කුරුන්දියෙහි** වනාහි ගැටූ සම් ඇති බෙරයද ගැටූ සම් ඇති වීණාවද සමින් නොවැසූ බෙරවීණා කරවියද බෙරවීණාදීන්ගේ වෙළීම පිණිස මුවවිට නැගූ සමද, පසුව එයින් බැහැරකොට වෙන්ව තැබූ මුඛ වර්‍ෂීමාත්‍රයද වීණාදණ්ඩද යන සියල්ල අනාමාසැයි කියනලදී. බෙරකරවි ආදීන්ට සම නගා සම්මැටි ආදියෙන් වෙළන්නටද වෙළවන්නටද වයන්නටද, වයවන්නටද, නොලබාමය. සැම්දුලෙහි පූජාකොට මිනිසුන් විසින් හැරදමන ලද්දක් දැකද නොසොල්වාම අතරතුර හැමදිය යුතුය. කුණුකසළ හැරදමන කාලයෙහි කුණුකසළ නියමයෙන්ම ගෙනගොස් එකත් පසෙක තැබීම වටීයයි **මහාපච්චරියෙහි** කියනලදී. බඩුමිල පිණිස පිළිගැණීම වටියි. පරිභොගය පිණිස ලැබෙන කල්හි විණා දෙණද බෙරකරාවියද, දැහැටිබඳුනක් කරන්නෙමු. හම ශස්ත්‍රකොෂයක් කරන්නෙමුයි ඒ ඒ පිරිකර උපකරණ පිණිස ගෙන එසේ එසේ කරන්නට වටියි.

**පුරාණදුතියිකා** වත්ථුව ප්‍රකට අර්ථ ඇත්තේමය. යක්ඛී වත්ථුවෙහි පරනිර්මිත වශවර්තී දෙවියක හා කායසංසග්ගියට පැමිණේද, ථුල්ලච්චයමවේ. **පණ්ඩක වත්ථුවත් සුත්තිත්ථී වත්ථුවත්** ප්‍රකටමය. **මතිත්ථී වත්ථුවෙහි** පාරාජිකයට පෙහෝනා කාලයෙහි ථුල්ලච්චයවේ. ඉන් මොබ දුක්කටයවේ. **තිරච්ඡානගත** වත්ථුවෙහි නා මෙණවියක හාද ගුරුළු මෙනෙවියක හාද, කිඳුරියක හාද, ගවදෙනක හාද, කායසංසග්ගියට පැමිණෙන්නහුට දුක්කටයමවේ. **දරුධීතලිකා** වත්ථුවෙහි හුදෙක් දැවයෙන් කළ ස්ත්‍රීරූපය පමණක්ම නොවේ. යම් සිතියම් කළ ස්ත්‍රීරූපයෙහිද දුක්කටයවේ. **සම්පීළන වත්ථුව** ප්‍රකට අර්ථ ඇත්තේමය. **සඞ්කම වත්ථුවෙහි** මාගමක නැගීසිටි කුඩා හේදණ්ඩක් හෝ වේවා, ගැල්මගක්වූ මහහේදණ්ඩක් හෝ වේවා, සොලවන්නෙමියි ප්‍රයොගකළ ඇසිල්ලෙහිම සොලවාවා හෝ නොසොලොවාවා හෝ දුක්කටය වේ. **මග්ග වත්ථුව** ප්‍රකටමය. **රුක්ඛ වත්ථුවෙහි** මාගමක් නැගී සිටිරුක මහත්වූ මහාදඹ රුකක් පමණ හෝ වේවා, කුඩා රුකක් හෝ වේවා, ඒ රුක සොලවන්නට හැකිවේවා හෝ නොහැකිවේවා හෝ ප්‍රයොග කළ පමණින් දුක්කටය වේ. **නාවා වත්ථුවෙහිද** මේ නයමවේ. **රජ්ජු වත්ථුවෙහි** ස්ත්‍රියක ගත් රැහණ අදින්නේ ගත් තැනින් සොලවන්නට හැකිවේද, එහි ථුල්ලච්චයවේ. යම් මහා රැහණක් වේනම්, එය තුබූ තැනින් මදකුත් නොසැලේද, එහි දුක්කටයවේ. ස්ත්‍රිය ගත් දඬුවෙහිද මෙම නයවේ. බිම වැටුණු මහාරුකක් නමුදු දණ්ඩ ග්‍රහණයෙන්ම මෙහි ගන්නාලද්දේය. **පත්ත වත්ථුව** ප්‍රකටමය. **වන්දන වත්ථුවෙහි** ස්ත්‍රිය පාදසම්බාහනයකොට වදිනු කැමැත්තීද, වැළකිය යුත්තීය. පාදයන් හෝ සිවුරෙන් හෝ අත්කිසිවකින් වැසිය යුත්තාහ. නිශ්චල හෝ වියයුතුය. නිශ්චලව සිටින් ඉවසන්නාහුටද සඞ්ඝාදිසෙසාපත්තිය නොවේ. අවසානයෙහි ස්ත්‍රියක ගන්නෙමියි වෑයම් කළ වත්ථුව ප්‍රකටමය. මනුෂ්‍ය ස්ත්‍රියක, මනුෂ්‍යස්ත්‍රියක යන සංඥය. කාය සංසග්ගීරාගය, ව්‍යායාමය, හස්තග්‍රහණාදියට පැමිණීමයයි මෙහි අඞ්ග පසක්වේ.

කායසංසග්ග ශික්ෂාපද වර්ණනා නිමි.

—||—

'**තෙන සමයෙන බුද්ධො භගවා**' යනාදිය දුට්ඨුල්ලවාචා ශික්ෂාපදයයි. එහි '**ආදිස්ස**' දක්වා '**වණ්ණම්පි භණති**' යනාදීහු ඉදිරියෙහි ප්‍රකාශවන්නාහුය. '**ඡින්නිකා**' සිඳුනු ඔතප් ඇතියෝය. '**ධුත්තිකා**' කපට පැවැතුම් ඇතියෝය. '**අහිරිකායො**' ලජ්ජා නැතියෝය. '**ඌහසන්ති**' සිනහකොට, මද සිනාවෙන් සිනාසෙත්. '**උල්ලපන්ති**' ආයාචීතෙමේ

යෙහෙකැයි ආදිනයින් උසස් කරන නන්වැදෑරුම්වූ පොළොඹවන කථා කියත්. ‘**උජ්ජග්ඝන්ති**’ මහසිනාවෙන් සිනාසෙත්. **උප්පණ්ඩෙන්ති** මේ තෙමේ පණ්ඩකයෙකි. මෙතෙමේ පුරුෂයෙක් නොවේයි යනාදි නයින් නින්ද කෙරෙත්. ‘**සාරත්තො**’ දුට්ඨුල්ලවාචාස්සාදරාගයෙන් තදින් ඇලුනේය. ‘**අපෙක්ඛවා පටිබද්ධචිත්තො**’ කියනලද නයමය. හුදෙක් මෙහි වාචාස්සාදරාගය යෙදියයුතුය. ‘**මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි**’ මෙහි අභිමතවූ මාගම දක්වනසේක් ‘**මාතුගාමො**’ යනාදිය වදළසේක. එහි ‘**විඤ්ඤු පටිබලා සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං**’ යම් **ස්ත්‍රියක්** තොමෝ නුවණැත්තී සාත්ථිකනිරත්ථිකකථා අසද්ධර්ම සද්ධර්ම ප්‍රතිසංයුක්ත කථා දැනගන්නට ප්‍රතිබලවූවාද මෝතොමෝ මෙහි අදහස් කරනලදී. යම් ස්ත්‍රියක් තොමෝ මහලුද බාලද කෙළතොලුද මෝ මෙහි අදහස් නොකරනලදැයි දක්වයි. ‘**ඔභාසෙය්‍ය**’ අවමන්කොට කියන්නේය. නන් වැදෑරුම්වූ අසද්ධර්මවචන කියන්නේය. යම්හෙයකින් මෙසේ අවමන් වචන කියන්නහුගේ යම් ඔභාසයෙක් නම් වේද, එය අර්ථවශයෙන් අද්ධ්‍යාචාරයවේ. රාගවසයෙන් අභිභවනයකොට සංයමයෙහි සීමාව ඉක්මවීම අද්ධ්‍යාචාර නම. එහෙයින් ඒ අර්ථය දක්වනසේක් ‘**ඔභාසෙය්‍යාති අජ්ඣාචාරො වුච්චති**’ යනු වදළසේක. ‘**යථා තං**’ මෙහි ‘**තං**’ යනු නිපාත මාත්‍රයි. තරුණයෙක් තරුණියකට යම්සේ කියාද, එසේය යන අර්ථයි.

‘**ද්වෙ මග්ගෙ ආදිස්ස**’ යන මේ ආදී යම් අයුරකින් බණන්නහුට සඞ්ඝාදිසේසයෙක් වේද, එය දක්වන්නට කියනලදි. එහි ‘**ද්වෙ මග්ගෙ**’ වසුරුමග හා පසමගද යන දෙමගය. සෙස්ස උදෙසීමෙන්ම ප්‍රකටමය. නිර්දේශයෙහි වනාහි ‘**ථොමෙති**’ ස්ත්‍රීලක්ෂණයෙන්, ශුභලක්ෂණයෙන් යුක්තවූවා මෙහියි කියාද, ඒතාක් කෙළවරට නොපැමිණේ. ‘තීගේ වසුරුමගද පසමගද මෙබඳුය. එනම්වූ මෙබඳුවූ ස්ත්‍රීලක්ෂණයෙන් ශුභලක්ෂණයෙන් යුක්තවූවා වෙහියි කියාද, කෙළවරට පැමිණේ. සඞ්ඝාදිසෙසයවේ. ‘**වණ්ණෙති පසංසති**’ මේ පද ප්‍රශංසාපදවල වේවචනවෙයි. ‘**ඛුංසෙති**’ වචන නැමැති කැවිටින් ගටයි. ‘**වම්හෙති**’ අවමන් කෙරෙයි ‘**ගරහති**’ දෙස් දක්වයි. ඉදිරියෙහි පෙළෙහි ආ ‘**අනිමිත්තාසි**’ යනාදීවූ එකොළොස් පද සමග නොගැළපූකල්හි කෙළවරට නොපැමිණේ. ගැළපූ කල්හිද ඒ එකොළොස් පද අතුරෙහි ‘සිඛරිණීසි, සම්භින්නාසි, උභතොබ්‍යඤ්ජනාසීයි, යන මේ තෙපදය සමග ගැළපූකල්හිම සඞ්ඝාදිසෙසයවේ. (සෙසු අටපදයෙන් නුගුණ කියූකල්හි දුට්ඨුල්ලවචයවේයයි දතයුතුය). ‘**දෙහි මෙ**’ මට දෙව, යන ඉල්ලීමෙහිද මෙපමණකින්ම කෙළවරට නොයයි. ‘මෛථුනධර්මය දෙවයි මෙසේ මෛථුනධර්මවචනය සමග ගැළපූ

කල්හිම සඞ්ඝාදිසෙසයවේ. '**කදා තෙ මාතා පසීදිස්සති**' යනාදීවූ ආයාචනවචනයන්හිද මෙපමණකින්ම කෙළවරට නොයයි. 'කවර කලෙක තාගේ මව පහදින්නීද, කවර කලෙක තීගේ මෛථුනධර්මය ලබන්නෙම්දැයි හෝ තීගේ මව පහන්කල්හි මෛථුනධර්මය ලබන්නෙමියි හෝ යනාදිනයින් මෛථුනධර්මපදය සමග ගැළපූ කල්හිම සඞ්ඝාදිසෙසයවේ. '**කථං ත්වං සාමිකස්ස දෙසි**' තී කෙසේ හිමියාහට දෙහිදැ'යි යනාදීවූ පෘච්ඡාවචනයන්හිද මෛථුනධර්මය කීවූකල්හිම සඞ්ඝාදිසෙසයවේ. අන් අයුරකින් නොවේ. '**එවං කිර ත්වං සාමිකස්ස දෙසි**' මෙසේ තී හිමියාහට දෙහිදැයි ප්‍රතිපෘච්ඡාවචනයන්හිද මෙම නයවේ. '**ආචික්ඛති නාම පුට්ඨො භණති**'. කෙසේ දෙන්නී හිමියාහට ප්‍රිය වන්නීදැයි විචාරණලද්දේ කියයි. මෙහිද 'මෙසේ දෙව, මෙසේ දෙන්නීය'යි කීවූකල්හිද කෙළවරට නොයයි. මෛථුනධර්මය මෙසේ දෙව, මෙසේ එළවව, මෙසේ මෛථුනධර්මය දෙන්නී එළවන්නී ප්‍රිය වන්නීයයි යනාදිනයින් මෛථුනධර්මපදය සමග ගැළපූකල්හිම සඞ්ඝාදිසෙසයවේ. අනුශාසනී වචනයන්හිද මෙම නයවේ.

ආක්‍රොශනිර්දේශයෙහි, '**අනිමිත්තාසි**' නිමිත්ත නැත්තෙහිය. තීගේ මුත්‍රමාර්ගය කෙසිසිදුරක් පමණමැයි කියනලද්දේවේ. '**නිමිත්තමත්තාසි**' තීයේ ස්ත්‍රීනිමිත්ත නොපිරිපුන්ය. හැඟීම් පමණක් මැයි කියනලද්දේවේ. '**අලොහිතා**' වියලුණු ඔසප්ලේ ඇත්තීවෙහි. '**ධුවලොහිතා**' නිතිවැහෙන ඔසප්ලේ ඇත්තීවෙහි. තෙත්වූ මුත්‍රමාර්ග ඇත්තීවෙහි. '**ධුවචොලා**' නිති බැඳූ පිළියෙන් කළ ඇණ ඇත්තීවෙහි. හැමකල්හි ස්ත්‍රී නිමිත්තෙහි රෙදිකඩක් ඇණයක්කොට සේවනය කරන්නීයයි කියනලද්දේවේ. '**පග්ඝරන්ති**' මුත්‍ර වගුරුවන්නීවෙහි. හැමකල්හි තීගේ මුත්‍ර වැගිරේයයි. කියනලද්දේවේ. '**සිඛරිණී**' පිටත නික්මුණු ආණිමාංස ඇත්තීවෙහි. '**ඉත්ථිපණ්ඩකා**' නිමිත්ත නැත්තීමැයි කියනුලැබේ. '**වෙපුරිසිකා**' දැළි රැවුලු සහිත පිරිමි අයුරු ඇති ස්ත්‍රියයි. '**සම්භින්නා**' එක්වූ වසමග පසමග ඇත්තීවෙහි. '**උභතො බ්‍යඤ්ජනා**' ස්ත්‍රීනිමිත්තෙන්ද පුරුෂනිමිත්තෙන්ද යන දෙකෙන්ම යුක්තවූවාවෙහි. මේ එකොළොස් පදයන් අතුරෙහි 'සිඛරිණිය, සම්භින්නාය, උභතොබ්‍යඤ්ජණය' යන මේ තෙපද පිරිසිදුව කෙළවරට පැමිණත්. මෙසේ මේ තෙපදද, හා පළමු වච්චමග්ග-පස්සාවමග්ග-මෛථුනධම්මපද තෙපදයදැයි යන සපද පිරිසිඳුව ඇවැත් කරන්නාහ. සෙසු 'අනිමිත්තා' යනාදි පද 'නිමිත්ත නැත්තිය' මට මෛථුනධර්මය දෙව'යි හෝ නිමිත්ත නැත්තීවෙහි. මම මෛථුන ධර්මයදෙව'යි හෝ යනාදි නයින් මෛථුනධර්මය හා ගළපනලද්දහුම ඇවැත් කරන්නාහු වෙතියි දතයුතුය.

දැන් යම් මේ මහණෙක් තෙමේ දුට්ඨුල්ලවාචාස්වාදරාගයට බටුයේ පෙරළුණු සිතින් උදෙසා කියාද, ඇයගේ වසමග පසමග අරබයා මේ

ගුණකීම් ආදීන්ගේ වසයෙන් විස්තර විසින් ආපත්තිභේදය දක්වනසේක් **'ඉත්ථී ච ඉත්ථිසඤ්ඤී'** යනාදිය වදළසේක. ඔවුන්ගේ අර්ථය කායසංසර්ගී ශික්ෂාපදවර්ණනායෙහි කියූ නයින්ම දතයුත්තේය. මේ වෙනසයි. **'අධක්ඛකං'** අකුව පටන් යට. **'උබ්භජාණුමණ්ඩලං'** දණමඬලපටන් උඩ. **'උබ්භක්ඛකං'** අකුවපටන් උඩ. **'අධොජාණුමණ්ඩලං'** දණමඬල පටන් අකුවෙන් යට දණමඬලද මෙහිම දුක්කටක්ෂෙත්‍රයෙහි සඞ්ග්‍රහවට යන්නේය. මෙහෙණගේ කායසංසර්ගීයෙහි මෙනි. බුදුවරයෝ මෙහෙණගේ ගරුකාපත්තිසඞ්ඛ්‍යාත කායසංසර්ගීපාරාජිකාපත්තිය භාවශෙෂකොට නොපණවත්. **'කායපටිබද්ධං'** වස්ත්‍රයක් හෝ පුෂ්පයක් හෝ ආභරණයක් හෝයි. **'අත්ථපුරෙක්ඛාරස්ස'** අනිමිත්ත යනාදි පදයන්ගේ අර්ථය කියන්නහුට. අර්ථකථාව හෝ හදරන්නහුට. **'ධම්මපුරෙක්ඛාරස්ස'** පෙළ කියවන්නහුට හෝ හදරන්නහුට හෝ මෙසේ අර්ථයදී ධර්මයද පෙරටුකොට කියන්නහුට, අර්ථය පෙරටුකොට ඇත්තහුටද ධර්මය පෙරටුකොට කියන්නහුටද ඇවැත් නොවේ. **'අනුසාසනීපුරෙක්ඛාරස්ස'** දැනුදු නිමිත්ත නැත්තීවෙහි. උභතොබ්‍යඤ්ජන වූවාවෙහි. දැන් අප්‍රමාදය කරවා මතුයෙහි මෙවැන්නියක් නොවෙව'යි මෙසේ අනුශාසනය පෙරටුකොට කියන්නහුට, අනුශාසනය පෙරටුකොට ඇත්තහුට ඇවැත් නොවේ. යම් මහණෙක් තෙමේ මෙහෙණන්ට පෙළ කියවන්නේ ප්‍රකෘතිවාචනාමාර්ගීය හැර සිනාසෙමින් පිටත නික්මුණු ආර්ණමාංස ඇත්තීවෙහි. එක්වූ වසමග පසමග ඇත්තීවෙහි. ඉතිරි පිරිමි දෙහදන් ඇත්තී වෙහියි නැවත නැවත කියාද, ඔහුට ඇවැත්මය. උන්මත්තකයාහට ඇවැත් නොවේ. මෙහි ආදිකර්මික තෙමේ උදයි ස්ථවිරය. ඒ ආදි කර්මිකයාහට ඇවැත් නොවේ.

පදභාජනීය වර්ණනා නිමි.

—||—

සමුට්ඨානාදීන් අතුරෙහි ත්‍රිසමුත්ථානයි. කායිචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන් නගියි. ක්‍රියාවෙන් පැමිණිය යුතුබැවින් ක්‍රියාසමුත්ථානයි. ව්‍යතික්‍රමසංඥවෙහි අභාවයෙන් මිදෙනබැවින් සංඥවිමොක්ෂයි. සිත් සහිතව කටයුතුබැවින් සචිත්තක සමුත්ථානයි. ලොකයා විසින් අකුසල්බැවින් හළයුතුයයි නියමහෙයින් ලොකවද්‍යයි. කය පිළිබඳව කටයුතුබැවින් කායකර්මයි. වචනයෙන් සිදුවියයුතුබැවින් වාක්කර්මයි. අකුසලචිත්තයි. ද්විවෙදනයි. විනීතවස්තූන් අතුරෙහි **ලොහිත** වස්තුවෙහි ඒ මහණතෙමේ ස්ත්‍රියගේ ලේ ඇති නිමිත්ත සඳහා කීයේය. අතික් ස්ත්‍රීතොමෝ නොදන්නීය. එහෙයින් දුක්කටයවූයේය. **'කක්කසලොමං'** නොදිග් ලොම්වලින් බොහෝ ලොම් ඇත්තේය. **'ආකිණ්ණ ලොමං'**

අවුල්වූ ලොම් ඇත්තේය. '**ඛරලොමං**' තදලොම් ඇත්තේය. '**දීඝලොමං**' දිග්ලොම් ඇත්තේය. සියල්ලම ස්ත්‍රීනිමිත්ත සඳහාම කියනලදී. '**වාපිතං ඛො තෙ**' යනු අසද්ධර්මය සඳහා කියනලදී. ඕතොමෝ එය නොසලකා '**නො ච පටිවුත්තං**'යි කිවුය. පටිවුත්ත නම්. දියෙහි වැපිරීමෙහි බිජුවට නොපිහිටි තැන හෝ පණුවන් කා විනාස කළ බිජුවට ඇති තැන හෝ නැවත බිජුවට පිහිටුවා දිය ඉසින ලද්දේද ගොඩ වැපිරීමෙහි අතන මෙතැන විසමව වැටුණු බිජුවට සම කිරීම පිණිස නැවත අෂ්ටදන්තකයෙන් සමකරන ලද්දේද ඔවුනතුරෙහි එකක් කරා එකක් සඳහා මොතොමෝ මෙසේ කිවුය. **මග්ග** වස්තුවෙහි '**මග්ගො සංසිදති**' අඞ්ගජාතමාර්ගය සඳහා කිවුය.

දුට්ඨුල්ලවාචාශික්ෂාපද වර්ණනාව නිමි.

—||—

'**තෙන සමයෙන බුද්ධො භගවා**' යනු ආත්මකාමශික්ෂාපදයයි. එහි '**කුලුපගො**' කුල සෙවනය කරන්නේය. සිවු පසය පිණිස කුලයන් කරා එළඹීමෙහි නිතර යෙදීගත්තේය. '**චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරං**' සිවුරු පිඬුපා සෙනසුන් ගිලන්පස බෙහෙත් පිරිකර. 'ගිලානප්පච්චය භෙසජ්ජපරික්ඛාරං' යන මෙහි රෝදුක්වලට ප්‍රතිපක්ෂභාවයෙන් පවත්නා අර්ථයෙන් පච්චය නම්. යම්කිසි සත්ප්‍රායකට මේ නමකි. වෙදහුගේ ක්‍රියායෙන් අනුදත්බැවින් **භෙසජ්ජ** නම්. ගිලානප්පච්චයම භෙසජ්ජවූයේ ගිලානප්පච්චය භෙසජ්ජ නම්. ගිලනහුට හිතවූ වෙදහුගේ යම්කිසි කර්මයක්වේද, එය තෙල් මීපැණි ආදිය හෙතුකොට කියනලද්දෙද්වේ. '**පරික්ඛාරො**' සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛිතං හොති' යනාදිනත්හි පිරිවර කියනුලැබේ '**රථො සෙතපරික්ඛාරො ඣානක්ඛො චක්කවීරියො**' යනාදි තන්හි අලඞ්කාරය කියනුලැබේ. '**යෙ චිමෙ පබ්බජිතෙන ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා**' යනාදි තන්හි සම්භාරය කියනුලැබේ. මෙහි වනාහි සම්භාරයද පරිවාරයද වටියි. ඒ ගිලන්පස බෙහෙත් ජීවිතයට පිරිවරදවේ. දිවි නසන ආබාධයන්ගේ ඉපදීමට ඉඩ නොදී රකිනබැවින් සම්භාරදවේ. ජීවිතය බොහෝ කලක් මුළුල්ලෙහි යම්සේ පවත්නේද එසේ මේ ජීවිතයෙහි කල් පැවැත්මට කාරණබැවිනි. එහෙයින් පරික්ඛාරයයි කියනුලැබේ. මෙසේ ගිලන්පස බෙහෙත්වූයේද ඒමය. පිරිකරවූයේද ඒමයයි ගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාර නම්වේ. ඒ ගිලන්පස බෙහෙත් පිරිකරයි. මෙසේ අර්ථ දතයුතුය. '**වසලං**' හීනවූ ලාමකවූ නොහොත් කෙලෙස් වැසි වර්ෂය'යි වසල නම්වේ. වැගිරෙයි යන අර්ථයි. ඒ වසලවූ අශුචි වැගිරෙන්නෙකැයි කියනලද්දේවේ. '**නිට්ඨුභිත්වා**'

කෙළ ගසා **'කස්සාහං කෙන හායාමි'** මම අන් කවර ක්ෂත්‍රියකගේ කවර භොගයකින් හෝ කවර අලඞ්කාරයකින් හෝ කවර රූපයකින් හෝ පිරිහෙම්ද, මට වඩා කවරියක් උත්තරිතරදැයි දක්වන්නීය.

**'සන්තිකෙ'** යමක් අවබෝධ කරන්නට හැකි උපචාරයෙහි සිට. හාත්පස නොදුරෙහි. පදභාජනයෙහිද මේ අර්ථයම දක්වනලද්දේය. **'අත්තකාමපාරිචරියාය'** මෛථුනධර්මසඞ්ඛ්‍යාතකාමයෙන් පරිචරණය කාමපරිචරියා නම. තමන් පිණිසවූ කාමපරිචරියාව **අත්තකාමපාරිචරියා** නම. තමන් විසින් හෝ කැමතිවනලද්දී අත්තකාමාය. තමන් විසින් මෛථුනරාගවශයෙන් පතනලද්දීය යන අර්ථයි. අත්තකාමාවූවාද ඕමය. පාරිචරියාවූවාද ඕමනුයි. අත්තකාම පාරිචරියා නම. ඒ අත්තකාමපාරිචරියාවගේ. **'වණ්ණං භාසෙය්‍ය'** ගුණය ආනිසංසය කියන්නේය. එහි යම් හෙයකින්, තමන් පිණිසවූ කාමපාරිචරියාය යන මේ අර්ථවිකල්පයෙහි කාමයද හෙතුවද පාරිචරියායි අර්ථයි. සෙස්ස ව්‍යඤ්ජනයවේද, අත්තකාමාවූවාද ඕමය. පාරිචරියාවූවාද ඕමනුයි අත්තකාමපාරිචරියා යන මේ අර්ථවිකල්පයෙහි අභිප්‍රායද පාරිචයර්‍යාවද යන අර්ථයි. සෙස්ස ව්‍යඤ්ජනය වේද, එහෙයින් ව්‍යඤ්ජනයෙහි ආදරය නොකොට අර්ථමාත්‍රයම දක්වනු පිණිස 'තමන්ගේ කාමය, තමන්ගේ හේතුවය, තමන්ගේ අභිප්‍රායය, තමන්ගේ පාරිචයර්‍යාවයයි පදභාජනය වදරනලදී. තමන්ගේ කැමැත්තය, තමන්ගේ හේතුවය, තමන්ගේ පාරිචයර්‍යාවයයි කියූකල්හි නුවණැත්තෝ 'මෙපමණකින් තමන් පිණිස කාමපාරිචයර්‍යාව කියනලදැයි දැනගන්නාහුය. තමන්ගේ අභිප්‍රායය, තමන්ගේ පාරිචයර්‍යාවයයි කියූකල්හිද 'මෙපමණකින් තමන් විසින් කැමැතිවනලද අර්ථයෙන් අත්තකාමපාරිචරියා කියනලදැයි දැනගන්නාහුය.

දැන් ඒ අත්තකාමපාරිචරියාවගේ ගුණ කියන ආකාරය දක්වනසේක් **'එතදග්ගං'** යනාදිය වදළසේක. එය උද්දෙශ වශයෙන්ද නිර්දේශ වශයෙන්ද ප්‍රකට අර්ථ ඇත්තේමය. මේ මෙහි පද සම්බන්ධයද ආපත්තිවිනිශ්චයදවේ. 'එතදග්ගං -පෙ- පරිචරෙය්‍ය' යම් ස්ත්‍රියක්තොමෝ සිල්වත් කලණ දහමින් යුත් බඹසර හැසිරෙනසුලු මා වැනියක්හු මේ මෛථුනධර්මයෙන් පරිචරණය කෙරේ නම්, මා වැනියකු පරිචරණය කරන ඇයගේම යම් මේ පාරිචයර්‍යාවක් නම් වන්නීද, පාරිචයර්‍යාවන්ගෙන් ඕ පාරිචයර්‍යතොමෝ අග්‍රවන්නීය. **'මෛථුනුපසංහිතෙන සඞ්ඝාදිසෙසො'** මෙසේ අත්තකාම පාරිචරියාවෙහි ගුණ කියන්නාවූද යමෙක්, මෛථුන නිශ්‍රිතවූම මෛථුනධර්ම ප්‍රතිසංයුක්තවූම වචනයෙන් කියන්නේ නම් ඒ මහණහුට සඞ්ඝාදිසෙසයවේ. දැන් යම් හෙයකින් මෛථුන නිශ්‍රිතවූම වචනයෙන් කියන්නහුට සඞ්ඝාදිසෙසය කියනලද්දේද, එහෙයින් 'මමද

ක්ෂත්‍රියවෙමි, තෝද ක්ෂත්‍රියවෙහි, සමජාති ඇතිබැවින් ක්ෂත්‍රියතොමෝ ක්ෂත්‍රියාහට දෙන්නට සුදුසු වන්නීයයි මේ ආදී වචනයන්ගෙන් පාරිචරියාවෙහි ගුණ කියන්නහුටද සඞඝාදිසෙසයෙක් නැත්තේය. මමද ක්ෂත්‍රියා වෙමි, යනාදීවූ බොහෝ සමාන වචන කියා තී මට මෛථුනධර්මය දෙන්නට සුදුස්සෙහියි මෙසේ මෛථුන ප්‍රතිසංයුක්ත වචනයෙන්ම කියන්නහුට සඞඝාදිසෙසයවේ. **'ඉත්ථී ච හොති'** යනාදිය පෙර කියූ නයමය. මෙහි ආදිකර්මික උදයි සථවිරතෙමේය. ඒ ආදිකර්මිකයාහට සඞඝාදිසෙසාපත්තිය නොවේ.

පදභාජනිය වණ්ණනාව නිමි.

——\\——

සමුට්ඨානාදීවූ සියල්ල දුට්ඨුල්ලවාචාශික්ෂාපදය හා සමය. විනීත වස්තුහුද ප්‍රකට අර්ථ ඇත්තාහුමය.

චතුත්ථසඞඝාදිසෙස වණ්ණනාව නිමි.

——\\——

**'තෙන සමයෙන බුද්ධො භගවා'** යනු සඤ්චරිත්තශික්ෂාපදයයි. එහි **'පණ්ඩිතා'** පාණ්ඩිත්‍යයෙන් යුක්තය. ඥාණගතියෙන් යුක්තයි. **'ව්‍යත්තා'** විශාරදභාවයෙන් යුක්තය. උපායයෙන් යුක්තය. උපාය දන්නීය. විශාරදය. **'මෙධාවිනී'** නුවණැත්තීය. දුටු දුටුවක් කරන්නීය. **'දක්ඛා'** දක්ෂය. **'අනලසා'** උත්ථානවීර්‍යයෙන් යුක්තය. **'ඡන්නා'** සුදුසුය. **'කිස්මිං විය'** දුකක් මෙන් කෙලශයක් මෙන් ලජ්ජාවක් මෙන් අපට වේය යන අභිප්‍රායයි. **'කුමාරිකාය වත්තුං'** තෙපි මැය ගනිවුයි කුමරිය කාරණකොට කියන්නට. ආවාහාදියෙහි **'ආවාහො'** තරුණයාහට අන් කුලයකින් තරුණියක ගෙනර්මය. **'විවාහො'** තමන්ගේ දැරිය අන්කුලයකට පාවාදීමය. **'වාරෙය්‍යං'** අපගේ තරුණයාට තරුණියක දෙනු මැනවැයි ඉල්ලීමය. දින නැකැත් මොහොත පිරිසිදීම හෝය. **'පුරාණගණකියා'** එක් ගණයක්හුගේ භාර්‍යාවක. ඕතොමෝ ගණකයා ජීවත්වනකල්හි ගණකීයි ප්‍රසිද්ධවූය. ගණකයා මළකල්හි පුරාණගණකීයි ගිනීමට ගියාය. **'තිරොගාමො'** පිටත ගමය. අන් ගමක යන අදහසයි. **'මනුස්සා'** උදයි තෙරුන්ගේ මේ සඤ්චරිත්තකර්මයෙහි යුක්තප්‍රයුක්තභාවය දන්නා මනුෂ්‍යයෝය. **'සුණිසා භොගෙන'** යම් භොගයකින් යෙහෙලිතොමෝ පාලනය කටයුත්තීවේද, බත් පිසදීම අවුළු සැපයීම වැළඳවීම ආදීවූ ඒ ආකාරයෙන් පාලනය කළාහුය. **'තතො**

**අපරෙන දසිභොගෙන** මසක් ඉකුත්ව ගියකල්හි කෙත්කම් කසල හැරදැමීම් දිය ගෙනීම් ආදීවූ යම් පරිභොගයකින් දසීතොමෝ පාලනය කටයුතුවේද, ඒ ආකාරයෙන් පාලනය කළාහුය. **'දුග්ගතා'** දිළිඳුවූය. කොතැනක හෝ ගිය ස්ත්‍රිය දිළිඳුවේද, එබඳු කුලයකට ගියාය. **'මායොහා ඉමං කුමාරිකං,'** ආයභීතෙමේ මේ කුමරිය දසීපරිභොගයෙන් පරිභොග නොකරව. **'ආහාරූපහාරො'** ආහාරයද උපහාරයද, ගැනීමද දීමද අප විසින් කිසිවක් නොගෙනෙන ලදය. නොදෙනලදය. තී සමග අපගේ ගැනීමක් දීමක් ව්‍යවහාරයක් නැහැයි දක්වත්. **'සමණෙන භවිතබ්බං අබ්‍යාවටෙන සමණො අස්ස සුසමණො'** මහණහු විසින් නම් මෙබඳු කර්‍මයන්හි අව්‍යාවෘත්තයකු අව්‍යාපාරයකු වියයුතුය. මෙසේ වන්නාවූ මහණතෙමේම යහපත් මහණෙක් වන්නේයයි මෙසේ ඒ උදයී තෙරුන් පහකොට 'තෝ යව, අපි යුෂ්මතුන් නොදනිමුයි කීය. **'සජ්ජිතො'** සියලු උපකරණයෙන් යුක්තවූයේය. බාහිරෝපකරණඅලඞ්කාරයෙන්ද කෙසාදීන්ගේ මනා තැබීම නම්වූ සැරසීමෙන් යුක්තවූයේ හෝයි. **'ධුත්තා'** ස්ත්‍රීධූර්තයෝය. **'පරිචාරෙන්තා'** මනවඩන රූපාදීන්හි ඔබමොබද හාත්පසද ඉඳුරන් හසුරුවන්නාහු, ක්‍රීඩා කරන්නාහු, ඇලෙන්නාහුයි කියනලද්දේවේ. **'අබ්භුතමකංසු'** ඉදින් කරන්නේ නම්, තෝ මෙපමණ දිනුයෙහිය. ඉදින් නොකරන්නේ නම් මම මෙපමණැයි ඔට්ටුවක් කළහ. මහණුන්ට ඔට්ටු අල්ලන්ට නොවටියි. යමෙක් කෙරේනම් පැරදුනහුවිසින් දියයුතුයයි **මහාපච්චරියෙහි** කියනලදි. **'කථං හි නාම අයොහා උදයී තඞ්ඛණිකං'** මෙහි **'තං ඛණෙ'** යන මෙයින් නොබෝ කාලය කියනුලැබේ. **'තඞ්ඛණිකං'** නොබෝකල් අධිකාරය ඇති **'සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය'** ස්ත්‍රීපුරුෂයන් අතර සඤ්චරණභාවයට පැමිණෙණන්නේය. යම්හෙයකින් ඒ සඤ්චරණභාවයට පැමිණෙන කිසිවකු යවනලද්දහු විසින් කිසි තැනක යායුතුවේද, පසුභාගයෙහිද **'ඉත්ථියා වා පුරිසමතිං'** යනාදියබැවින් මෙහි ස්ත්‍රී පුරුෂයෝ අදහස් කරනලද්දාහුද එහෙයින් ඒ අර්ථය දක්වන්නට **'ඉත්ථියා වා පහිතො පුරිසස්ස සන්තිකෙ ගච්ඡති, පුරිසෙන වා පහිතො ඉත්ථියා සන්තිකෙ ගච්ඡති'**යි මෙසේ මේ පිළිබඳ පදභාජනය වදරනලදී. **'ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං'** යන මෙහි ආරොචෙය්‍යායි යන පාඨශෙෂය දතයුතුය. එහෙයින්ම මේ පිළිබඳ පදභාජනයෙහි **'පුරිසස්ස මතිං ඉත්ථියා ආරොචෙති, ඉත්ථියා මතිං පුරිසස්ස ආරොචෙති'**යි වදරණලද්දේය.

දැන් යම් කරුණක් පිණිස ඔවුන්ගේ මනස අභිප්‍රාය අධ්‍යාශය ඡන්දය රුචිය ආරොචනය කෙරේද, එය දක්වනසේක් **'ජායත්තනෙ වා ජාරත්තනෙ වා'** යනාදිය වදළසේක. එහි **'ජායත්තනෙ'** යනු භාය්‍ය්‍යාභාවය නිමිති කොටය. **'ජාරත්තනෙ'** යනු වෛරස්වාමිභාවය නිමිතිකොටය.

පුරුෂයාගේ මතය ස්ත්‍රියට ආරොවනය කරන්නේ භායඝීභාවය නිමිතිකොට ආරොවනය කෙරේ. ස්ත්‍රියගේ මතය පුරුෂයාට ආරොවනය කරන්නේ හොරසැම්බව නිමිතිකොට ආරොවනය කෙරේ. තවද පුරුෂයාගේම මතය ස්ත්‍රියට ආරොවනය කරන්නේ භායඝීභාවය නිමිතිකොට හෝ නිබඳ භායඝීභාවය නිමිතිකොට හෝ ආරොවනය කෙරේ. සොරඅඹුබව නිමිතිකොට හෝ මිථ්‍යාචාරභාවය නිමිතිකොට හෝ ආරොවනය කෙරේ. යම් හෙයකින් මේ කාරණය ආරොවනය කරන්නහු විසින් 'තී මොහුට භායඝීා වන්නෙහියි යන ආදිය කියයුතුවේද, එහෙයින් ඒ කියයුතු ආකාරය දක්වනු පිණිස **'ජායත්තනෙ වාති, ජායා භවිස්සසි, ජාරත්තනෙ වාති ජාරී භවිස්සසි,** මේ පද පිළිබඳ පදභාජනය වදරනලදී. මේ උපායෙන්ද ස්ත්‍රියගේ මතය පුරුෂයාහට ආරොවනය කිරීමෙහිද, 'පති භවිස්සසි, සාමිකො භවිස්සසි, ජාරො භවිස්සසි, කියයුතු ආකාරය දතයුත්තේය. **'අන්තමසො තඛණිකායපි'** සියලු අන්තිමපරිච්ඡෙදයෙන් යම් මේ ස්ත්‍රියක් තොමෝ එකෙණෙහි මුහුතීමාත්‍රයෙක්හි විසියයුතුබැවින් තඛණිකායි කියනුලැබේ. මුහුත්තිකා යන අත්‍ථයි. ඇයටද **'මුහුත්තිකා'** වන්නෙහියි මෙසේ පුරුෂමතය දන්වන්නහුට සඞසාදිසෙසයවේ. මේ උපායෙන්ම මුහුත්තිකයෙක් වන්නෙහියි මෙසේ පුරුෂයාහට ස්ත්‍රියගේ මතය දන්වන්නේද සඞසාදිසෙසයට පැමිණේයයි දතයුතුය.

දැන් **'ඉත්‍ථියා වා පුරිසමතිං'** යන මෙහි අභිමත ස්ත්‍රීන් ප්‍රභෙදවශයෙන් දක්වා ඔවුනතුරෙහි සඤ්චරිත්තවසයෙන් ආපත්තිභෙදය දක්වන්නට **'දස ඉත්‍ථියො'** යනාදිය වදළසේක. එහි **'මාතුරක්ඛිතා'** මව විසින් රක්නාලද්දීය. යම්සේ පුරුෂයෙකු හා සංවාසය නොකෙරේද, එසේ මව විසින් රක්නාලද්දීය. එහෙයින් මේ පදයෙහිද පදභාජනයෙහිද **'මාතා රක්ඛති, ගොපෙති, ඉස්සරියං කාරෙති, වසං වත්තෙති'** යනු වදරනලද්දේය. එහි **'රක්ඛති'** යනු කිසි තැනක යන්නට නොදෙයි. **'ගොපෙති'** යනු යම්සේ අන්‍යයෝ නොදකිත්ද, එසේ ගුහාස්ථානයෙහි තබයි. **'ඉස්සරියං කාරෙති'** මැයගේ තමන් කැමතිසේ හැසිරීම වළකාලන්නී යටතට ගෙන පවතියි. **'වසං වත්තෙති'** මෙය කරව, මෙය නොකරවයි මෙසේ තමාගේ අණ ඇයගේ මතුවෙහි පෙන්වයි. මේ උපායෙන්ම පිතුරක්ඛිතාදීහුද දතයුත්තාහ. ගෞතමගොත්‍රාදීවූ ගොත් ඇතියෙක් හෝ පණ්ඩරඞගාදීවූ දම්සැරියෙක් හෝ නොරකියි. සමාන ගොත් ඇත්තවුන් විසින් හා සමග හැසිරියයුතු ධම් හෝ කුලධම් ඇතියවුන් විසින්ද එක් ශාස්තෘවරයෙකු උදෙසා පැවිදිවූවන් විසින් හෝ මාලාකාරාදීවූ එක් ගණයකට ඇතුළත්වූවන් විසින්ද රක්නාලද්දී **'ගොත්තරක්ඛිතා, ධම්මරක්ඛිතා'**යි

කියනුලැබේ. එහෙයින් ඒ පදයන්ගේ **'සගොත්තා රක්ඛන්ති'** යනාදි නයින් පදභාජනය වදරනලදී. රැකුම් සහිතව පවත්නී **'සාරක්ඛා'** නම. දඬුවම් සහිතව පවත්නී **'සපරිදණ්ඩා'** නම. ඔවුන්ගේ නිර්දේශ ප්‍රකටමවේ. මේ දශස්ත්‍රීන් අතුරෙහි පුරුෂයන් අතරට යන පශ්චිමවූ දෙදෙනාහටම මිථ්‍යාචාරයවේ. මාතුරක්ඛිතාදීවූ අනික් අට දෙනාට මිථ්‍යාචාරය නොවේ.

ධනක්කීතාදීන් අතුරෙහි ස්වල්පවූ හෝ බොහෝවූ හෝ ධනයෙන් භාර්‍ය්‍යාභාවය පිණිස මිලදී ගන්නාලද්දී **ධනක්කීතා** නම. යම්යෙහකින් ඕතොමෝ ධනයෙන් මිලදී ගත්පමණ ඇත්තීම භාර්‍ය්‍යා නොවන්නීද, සංවාසය පිණිස මිලදී ගත්බැවින් භාර්‍ය්‍යා වන්නීද, එහෙයින් මේ පදයෙහි නිර්දේශයෙහි **'ධනෙන කීතා වාසෙති'** කියනලදී. ඡන්දයෙන් තමන්ගේ රුචියෙන් වසාතුයි **ඡන්දවාසිනී** නම. යම්හෙයකින් ඕතොමෝ ඡන්දය පමණින්ම භාර්‍ය්‍යා නොවන්නීද, පුරුෂයා විසින් පිළිගත්බැවින් භාර්‍ය්‍යා වන්නීද, එහෙයින් මේ පද නිර්දේශයෙහි **පියො පියං වාසෙති**'යි කියනලදී. භොගය හෙතුකොට වසාතුයි **භොගවාසිනී** නම. වං මොහොල් ආදීවූ ගෘහොපකරණ ලැබ භාර්‍ය්‍යාභාවයට යන ජනපද ස්ත්‍රියට මේ නමකි. වස්ත්‍රය හේතුකොට වසාතුයි **පටවාසිනී** නම. හඳින පිළි පමණක් හෝ පොරෝනා පිළි පමණක් හෝ ලැබ භාර්‍ය්‍යාභාවයට එළඹෙන දිළිඳු ස්ත්‍රියට මේ නමකි. **'ඔදපත්තකිනී'** දෙදෙනාගේ අත් එක් දියතලියක බහා 'මේ දිය මෙන් ගැටුණු නොබිඳුණු වහුයි කියා පිළිගැණුම් ලද්දියට මේ ව්‍යවහාරනාමයවේ. නිර්දේශයෙහිදී මේ ඇය සමග දියතලිය පහසා ඇය වස්වායි මෙසේ අර්ථය දතයුතුය. ඉවත්කොට තැබූ සුඹුළුව මැයගේනුයි **ඔභතචුම්බටා** නම. කාෂ්ඨශාරිකාදීන් අතුරෙහි එක්තරා ස්ත්‍රියක. යම් ස්ත්‍රියකගේ හිසින් සුඹුළුව බහා ගෙයි වස්වාද, ඇයට මේ නමකි. **'දසී ච'** තමන්ගේම දසියදවේ. භාර්‍ය්‍යාවදවේ. **'කම්මකාරිණී'**, නම් ගෙයි බැලය පිණිස වැඩ කෙරේද, ඕ තොමෝය. යමෙක් තමන්ගේ භාර්‍ය්‍යාවගෙන් ප්‍රයොජන නැත්තෙක්ව ඇය සමග ගෘහවාසය කෙරේද, මෝතොමෝ කම්මකාරීයිද භාර්‍ය්‍යායිද කියනුලැබේ. ධජය මාර්ගයෙන් ගෙනෙන ලද්දී **ධජාහටා** නම. නැගූ ධජ ඇති සෙනාව සමග ගොස් අනුන් අයත් රට විලොපනයකොට ගෙනෙන ලද්දීයයි කියනලද්දීය. කිසිවෙක් ඇය භාර්‍ය්‍යාව කෙරේද, මෝතොමෝ ධජාහටා නම්වේ. **මුහුත්තිකා**තොමෝ කියූ නය ඇත්තීමය. මේ දශ ස්ත්‍රීන්ටද අන්‍යපුරුෂයන් කරා යෑමෙහි මිථ්‍යාචාරයවේ. පුරුෂයන්ට වනාහි විසි වැදදෑරුම්වූම මොවුන් අතුරෙහි මිථ්‍යාචාරයවේ. මහණහුහටද සඤ්චරිත්ත වේයයි දතයුතුය.

දැන් **'පුරිසො භික්ඛුං පහිණාති'** යනාදි තන්හි **'පතිගණ්හාති'** ඒ මහණතෙමේ 'යව වහන්ස' මව්පියන් රක්නාලද මෙනම් ඇත්තියට,

මෙනම් ඇත්තහුට ධනයෙන් මිලදී ගත් භාර්‍යාවක් වෙවයි කියව'යි මෙසේ කියූ වචනය 'උපාසක මැනවැයි හෝ වේවායි හෝ සැලකරන්නෙමියි හෝ යන යම්කිසි ආකාරයකින් වාග්භේදකොට හෝ හිස සැලීම් ආදියෙන් හෝ පිළිගණියිද, **'වීමංසති'** මෙසේ පිළිගෙන ඒ ස්ත්‍රිය වෙත ගොස් ඒ හසුන දන්වාද, **'පච්චාහරති'** ඔහු විසින් දැන්වූකල්හි ඒ ස්ත්‍රීතොමෝ 'මැනවැ'යි පිළිගණීවා හෝ පිළිකෙව් කෙරේවා හෝ ලජ්ජාවෙන් නොබැණ සිටීවා හෝ නැවත අවුත් ඒ පුරුෂයාහට ඒ ප්‍රවෘත්තිය සැලකෙරේද, මෙපමණකින් පිළිගැනීම සැලකිරීම නැවත ගෙනර්ම නම්වූ මේ අංගතුන පිරීමෙන් සඞ්ඝාදිසෙසයවේ. ඒ ස්ත්‍රී තෙමෝ ඔහුට භාර්‍යාවේවා හෝ නොවේවා හෝ යන මෙය කරුණක් නොවේ. ඉදින් ඒ මහණතෙමේ මවවිසින් රක්නාලද තැනැත්තිය වෙතට යැවූයේ ඇය නොදැක ඇයගේ මවට ඒ හසුන සැලකෙරේද, පිටතින් විමසුයේවේද, එහෙයින් විසඞ්කෙතයයි **මහාපදුම** සථවිරයන්වහන්සේ කීහ. **මහාසුමම** සථවිරයන්වහන්සේ 'මව හෝ වේවා, පියා හෝ වේවා, යටත් පිරිසෙයින් ගෙයි දැස්සන් හෝ වේවා, අන් යම්කිසිවෙක් හෝ වේවා, ඒ ක්‍රියාව සම්පාදනය කරන්නේද, ඔහුට කියූකල්හිද විමසුයේ වේ. තෙඅඟ පිරිසිටි කාලයෙහි ඇවැතවේ මය. යම්සේ 'බුද්ධං පච්චක්ඛාමි, කියනු කැමැත්තේ වැරදී 'ධම්මං පච්චක්ඛාමියි කියන්නේ නම් මොහු විසින් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යානය කරනලද්දීම නොවේද, යම්සේ හෝ 'පඨමජ්ඣානං සමාපජ්ජාමියි කියනු කැමැත්තේ වැරදී 'දුතියජ්ඣානං, සමාපජ්ජාමියි කියන්නේ නම් පාරාජිකාවට පැමිණියේවන්නේ නොවේද, මේ කාරණයද එසේයයි කීහ. "ඒ මෙය පිළිගණියි. අතවැස්සෙකු ලවා විමසවා තමා නැවත පිළිතුරු ගෙන ඒද සඞ්ඝාදිසෙසාපත්තියවේය," යන මෙය හා සමවේ. එහෙයින් සුභාෂිතවේ. යම්සේ 'මාතුරක්ඛිතාවට කියව'යි කියනලද්ද, ගොස්, ඇයට දන්වන්නට සමත්වූ මාතෘආදීන්ට කියන්නහුට විසඞ්කෙතයක් නැත්තේද, එපරිද්දෙන්ම 'මෙනම් ඇත්තහුට ධනක්කීතා භාර්‍යාවෙව'යි කියයුත්තෙහි 'මෙනම් ඇත්තහුට ඡන්දවාසිනී භාර්‍යා වෙවයි මෙසේ පෙළෙහි කියූ ඡන්දවාසිනී ආදි වචනයන් අතුරෙහි එක්තරා එකක් වසයෙන් හෝ පෙළෙහි නොකියනලද මෙනම් ඇත්තහුට භාර්‍යා ජායා ප්‍රජාපති පුත්‍රමාතෘ ගෘහිණී ගෘහස්වාමිනී බත් පිසන්නී මොනවට කීකරුවූවා කාමපරිචාරිකා වෙව'යි මේ ආදීවූ සංවාසපරිදීපකවූ වචන අතුරෙහි එක්තරා එකක වසයෙන් කියන්නහුටද විසඞ්කෙතයක් නැත්තේයයි තෙඅඟ පිරීමෙන් ඇවැත්මවේ. 'මාතුරක්ඛිතාවට කියවයි යවනුලැබූ, ගොස් අන්‍යවූ පිතුරක්ඛිතාදීන් අතුරෙහි එක්තරා එකියකට කියන්නහුට විසඞ්කෙතයවේ. පිතුරක්ඛිතාවට කියව,

යනාදියෙහිද මේ නයවේ. හුදෙක් මෙහි එකමූලික දවිමූලකාදීන්ගේ වසයෙන් 'පුරුෂයාගේ මවුතොමෝ මහණෙකු යවයි, මාතුරක්ඛිතාවගේ මවුතොමෝ මහණෙකු යවයි, මාතුරක්ඛිතාතොමෝ මහණෙකු යවයි යන මේ මූලසථානාදීන්ගේ වසයෙන්ද පෙයාාලභෙදයම වෙනස්වේ. ඒද පෙර සඞ්ඝාදිසෙසයෙහි කියූනය ඇතිබැවින් පෙළ අනුසරින්ම දැනගන්නට හැක්කේයයි මේ පිළිබඳ විභාගය දක්වන පිණිස ආදරයක් නොකෙළෙමු.

**'පටිගණ්හාති'** යනාදියෙහි වනාහි චතුෂ්ක දෙක අතුරෙහි ප්‍රථම චතුෂ්කයෙහි ආදිපදයෙන් තෙඅඟ පිරීමෙන් සඞ්ඝාදිසෙසයවේ. මධ්‍යයෙහි දෙපදයෙන් දෙඅඟ පිරීමෙන් ථුල්ලච්චයවේ. කෙළවර එක් පදයෙන් එක් අඟක් පිරීමෙන් දුක්කටයවේ. ද්විතීය චතුෂ්කයෙහි ආදිපදයෙන් දෙඅඟ පිරීමෙන් ථුල්ලච්චයවේ. මධ්‍යයෙහි දෙපදයෙන් එක් අඟක් පිරීමෙන් දුක්කටයවේ. කෙළවර එක් පදයෙන් අඞ්ගයක් නැතිබැවින් සඞ්ඝාදිසෙසාපත්තිය නොවේ.

එහි **'පටිගණ්හාති'** අණකරන්නහුගේ හසුන පිළිගනියි. **'වීමංසති'** යැවූ තැනට ගොස් එය සැලකරයි. **'පච්චාහරති'** නැවත අවුත් ඇණවූවහුට දන්වයි. **'න පච්චාහරති'** දන්වා මෙදෙසින්ම යන්නේය. **'න වීමංසති පච්චාහරති'** පුරුෂයා විසින් 'මෙනම් ඇත්තියට කියවයි කියනුලබන්නේ මැනවැයි ඔහුගේ හසුන පිළිගෙන එය මැනව හෝ නොමුළාව හෝ අන් කටයුත්තකින් ඇය වෙතට ගොස් කිසියම් කථාවක් කියමින් හිඳීද මෙපමණකින් පිළිගනියි. නොවිමසා නම්වේයයි කියනුලැබේ. එකල ඒ මහණහුට ඒ ස්ත්‍රීතොමෝම 'ඔබවහන්සේගේ උපස්ථායකතෙමේ මාගෙයි කරනු කැමැත්තේදැයි කියාද, මෙසේ කියාම 'මම ඔහුට භාය්‍ර්‍යා වන්නෙමියි හෝ නොවන්නෙමියි හෝ කියාද, ඒ මහණතෙමේ ඇයගේ වචනය නොසතුටුව නොගරහා පිළිකෙව් නොකොට නිහඬවම හුනස්නෙන් නැගිට ඒ පුරුෂයා වෙතට අවුත් ඒ පුවත දන්වාද, මෙපමණකින් නොවිමසයි. නැවත ගෙන ඒයයි කියනුලැබේ. **'න වීමංසති න පච්චාහරති'** හුදෙක් හසුන දන්වන කාලයෙහි පිළිගැණීමද විමසීම් නැවත ගෙනඒම් දෙක නොකෙරෙයි. **'න පතිගණ්හාති වීමංසති පච්චාහරති'** කිසි පුරුෂයෙක් මහණහු සිටි තැන හෝ හුන් තැන හෝ එබඳු කථාවක් කෙරේද, මහණතෙමේ ඔහු විසින් නොයැවූයේද යැවූවෙකු මෙන්ම ස්ත්‍රිය වෙතට ගොස් 'මෙනම් ඇත්තහුට භාය්‍ර්‍යාවේවයි යනාදිනයින් විමසා ඇයගේ කැමැත්ත හෝ නොකැමැත්ත නැවත අවුත් මොහුට දන්වාද, ඒ නයින්ම විමසා නැවත නොගෙනෙන්නේ 'නොපිළිගණියි විමසයි. නැවත නොගෙනේයි කියනු ලැබේ. එනයින්ම ගියේ නොවිමසා ඇය විසින් ඉපදවූ කථාවක් අසා ප්‍රථම චතුෂ්කයෙහි තෙවන පදයෙහි කියූ නයින්ම

අවුත් මොහුට දන්වන්නේ 'නොපිළිගණියි, නොවිමසයි, නැවත ගෙන ඒයයි කියනුලැබේ. සිවුවන පදය ප්‍රකටමය.

**'සමබහුලෙ හිකඛූ ආණාපෙති'** මේ ආදි නය ප්‍රකටමය. බොහෝ හිකෂූහුද යම්සේ එක් වස්තුවක් ඇවැතට පැමිණෙත්ද, එසේ එක් මහණෙක්හටද බොහෝ වස්තූන්හි බොහෝ ඇවැත් දතයුතුය. කෙසේදයත් පුරුෂයෙක්තෙමේ 'ස්වාමීනි, යනු මැනව, අසුවල් පහයෙහි සැටක් පමණවූ හෝ සැත්තෑවක් පමණවූ හෝ ස්ත්‍රීහු සිටියාහුය. මෙනම් ඇත්තහුට හායඝ්‍රාවෙවයි ඔවුනට කියවයි මහණක්හට අණ කෙරේ. හෙතෙමේ පිළිගෙණ එහි ගොස් දන්වා නැවත ඒ හසුන ගෙන ඒද, යම් පමණ ස්ත්‍රීහු වෙත්නම් එපමණ ආපත්තීන්ට පැමිණේ, පරිවාරයෙහිවෙයි.

**'පදවීතිහාරමත්තෙන වාචාය හණිතෙනච**
**සබ්බානි ගරුකානි සප්පටිකම්මානි**
**චතුසට්ඨි ආපත්තියො ආපජ්ජෙය්‍ය එකතො**
**පඤ්හාමෙසා කුසලෙහි චින්තිතාති'** කියනලදි.

පදවීතිහාර මාත්‍රයෙන්ද වචනයෙන් බිණීමෙන්ද ගරුකවූ ප්‍රතිකර්මසහිතවූ සියලු සූසැටක් ආපත්තීන්ට එක්වර පැමිණෙන්නේය. මේ ප්‍රශ්නය දක්‍ෂයන් විසින් සිතනලදී.

මේ කාරණය නිසා මේ ප්‍රශ්නය කියනලදී. වදත් සිලුටුබව පිණිස මෙහි සූසැටක් ඇවැත්යි කියනලදි. මෙසේ කරන්නේ ඇවැත් සියයකටද දහසකටද පැමිණේ. එකෙකු විසින් යැවූ එක් මහණෙක්හට බොහෝ ස්ත්‍රීන් නිමිතිකොට බොහෝ ඇවැත් යම්සේවේද, එසේ එක් පුරුෂයෙක් තෙමේ බොහෝ මහණුන් එක් ස්ත්‍රියක වෙත යවාද, සියල්ලන්ට සඬසාදිසෙසයවේ. එක් පුරුෂයෙක් බොහෝ මහණුන් බොහෝ ස්ත්‍රීන්වෙත යවාද, ස්ත්‍රීන්ගේ ගණිනින් සඬසාදිසෙසවේ. බොහෝ පුරුෂයෝ එක් මහණෙකු එක් ස්ත්‍රියකවෙත යවත්ද, පුරුෂයන්ගේ ගණිනින් සඬසාදිසෙසවේ. බොහෝ පුරුෂයෝ එක් මහණෙකු බොහෝ ස්ත්‍රීන් වෙතයවත්ද, ස්ත්‍රීපුරුෂයන්ගේ සමවැයි කියූ වස්තුගණිනින් සඬසාදිසෙසවේ. බොහෝ පුරුෂයෝ බොහෝ මහණුන් එක් ස්ත්‍රියකවෙත යවත්ද, පුරුෂයන්ගේ ගණිනින් සඬසාදිසෙසවේ. බොහෝ පුරුෂයෝ බොහෝ මහණුන් බොහෝ ස්ත්‍රීන්වෙත යවත්ද වස්තු ගණිනින් සඬසාදිසෙසවේ. **'එකා ඉත්ථී එකං හිකඛුං'** යනාදි තන්හි මේ නයවේ. මෙහිදු සභාග විසභාගතාව නම් ප්‍රමාණනොවේ. මවුපියන්ගේද පස්සහදෑමියන්ගේද සඤ්චරිත්තකර්මය කරන්නහුට ඇවැත්මය.

**‘පුරිසො භික්ඛුං ආණාපෙති ගච්ඡ භණෙත’** යන චතුෂ්ක අඩගවසයෙන් ආපත්තිභෙදය දැක්වීම පිණිස වදරනලදී. ඒ චතුෂ්කයෙහි පසු පදයෙහි **‘අන්තෙවාසිං වීමංසිත්වා බහිද්ධා පච්චාහරති’** යන්නෙහි අවුත් ඇදුරුහට නොදන්වා මෙයින්ම ගොස් ඒ පුරුෂයාහට දන්වයි. **‘ආපත්ති උභින්නං ථුල්ලච්චයස්ස’** ඇදුරුහට පිළිගත්බැවින්ද, විමසූබැවින්ද යන දෙඅඟින් ථුල්ලච්චයවේ. අතවැසියාහට විමසූ බැවින්ද පසුව ගෙනආබැවින්ද යන දෙඅඟින් ථුල්ලච්චයවේ. සෙස්ස ප්‍රකටමය. **‘ගච්ඡන්තො සම්පාදෙති’** පිළිගැණීමද කරයි. විමසීමද කරයි. **‘ආගච්ඡන්තො විසංවාදෙති’** යනු පෙරළා නොගෙනේයි. **‘ගච්ඡන්තො විසංවාදෙති’** යනු නොවීළිගනියි. **‘ආගච්ඡන්තො සම්පාදෙති’** විමසීමද කරයි. පෙරළා ගෙනඊමද කරයි. මෙසේ දෙතන්හිලා දෙඅඟින් ථුල්ලච්චයවේ. තෙවන පදයෙහිලා ඇවැත්වේ. සිවුවන පදයෙහිලා ඇවැත් නොවේ. **‘අනාපත්ති සඞ්ඝස්ස වා චෙතියස්ස වා ගිලානස්ස වා කරණීයෙන ගච්ඡතො උම්මත්තකස්ස ආදිකම්මිකස්ස’** යන මෙහි භික්ෂුසඞ්ඝයාගේ පොහෝගෙයක් හෝ අන්කිසිවක් හෝ අඩාලවූයේවේද, එහි කම්කරුවන්ට බත්වැටුප් පිණිස උපාසකයෙක් හෝ උපාසිකාවකවෙත මහණෙකු යවන්නේ නම් උපාසිකාවක් හෝ උපාසකයෙකුවෙත මහණෙකු යවන්නී නම් මෙබඳුවූ සඞ්ඝයා පිළිබඳ කටයුත්තකින් යන්නහුට ඇවැත්නොවේ. සෑකම් කරනුලබන කල්හිද මෙම නයවේ. ගිලනුන්හට බෙහෙත් පිණිසද උපාසකයකු විසින් උපාසිකාවකවෙතට හෝ උපාසිකාවක විසින් උපාසකයෙකු වෙතට හෝ යවනුලැබ යන්නහුට ඇවැත් නොවේ. උන්මත්තක ආදිකර්මිකයෝ කියූ නය ඇත්තාහුමය.

සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ඡසමුට්ඨානවේ. හිස එසවීම් ආදීවූ කායවිකාරයෙන් හසුන ගෙනගොස් හස්තමුද්‍රාවෙන් විමසා නැවත අවුත් හස්තමුද්‍රාවෙන්ම සැලකරන්නහුට කයින් සමුට්ඨානයවේ. අසුන් හලෙහි සිටිකෙනෙකුහට ‘මෙනම් ඇත්තිය එන්නීය, ඇයගේ සිත දැන ගනු මැනවැ’යි කිසිවෙකු විසින් කියනලද්දේ ‘මැනවැ’යි පිළිගෙණ පැමිණ ඇයට කියා ඇය ගියකල්හි නැවත ඒ පුරුෂයා පැමිණිකල්හි සැලකරන්නහුට වචනයෙන් සමුට්ඨානයවේ. වචනයෙන් ‘මැනව’යි හසුන ගෙන අන් කටයුත්තකින් ඇයගේ ගෙට ගොස් අන් තැනක හෝ යනකල්හි ඇය දැක වාග්භෙදයෙන්ම විමසා නැවත අන් කටයුත්තකින්ම එයින් බැහැරව කවද හෝ ඒ පුරුෂයා දැක සැලකරන්නහුටද වචනයෙන්ම සමුට්ඨානයවේ. ප්‍රඥප්තිය නොදන්නා රහත් මහණහටද කය-වචන දෙකින් ඇවැත හටගනියි. කෙසේදයත් ඉදින් ඔහුගේ මවුපියෝ කිපී සම්බන්ධකරන්නෙකුගේ වචනයක් නැතිව එකතු නොවන්නාහුවෙත්ද,

ගෙට පැමිණ ඒ මහණුහුට තෙරුන්ගේ පියතෙමේ, 'පින්වත' ඔබගේ මවුතොමෝ මහලුවූ මා හැරදමා නෑකුලයට ගියාය යන්න, මට උපස්ථාන කරන්නට ඇය පිටත්කර එවනු මැනවැයි කියාද, ඒ ස්ථවිරතෙමේ එහි ගොස් එය කියා නැවත ඇයගේ ඊම හෝ නොඊම පියාට කියාද, සඞ්ඝාදිසෙසයවේ. මේ තුන අචිත්තකසමුට්ඨානයි. ප්‍රඥප්තිය දැන මේ තුන් තයින්ම සඤ්චරිත්තයට පැමිණෙන මහණුහුට කායචිත්තයෙන්ද වාචාචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද ඇවැත හටගනියි. මේ තුන, ප්‍රඥප්තිය දන්නා සිතින් සචිත්තකසමුට්ඨානවේ. කිරීමෙන් පැමිණියයුතුබැවින් කිරියාසමුට්ඨානයි. ව්‍යතික්‍රම සංඥවෙහි අභාවයෙන් නොමිදෙනබැවින් නොසංඥ විමොක්ෂයි. ප්‍රඥප්තියෙහි හැසිරිය යුතුයයි නියම හෙයින් ප්‍රඥප්තිවද්‍යය කයින් කටයුතුබැවින් කායකර්මයි. වාගොහදකොට බිණිය යුතුබැවින් වාක්කර්මයි. මේ ශික්ෂාපදයෙහිලා කුශලාදි වශයෙන්ද තෙසිතක් ඇත්තේය. සුඛාදිවසයෙන් වෙදනා තුනකි.

විනීතවස්තූන් අතුරෙහි සුත්තා යනාදීන් දක්වනලද ආදියෙහිවූ වස්තුපඤ්චකයෙහි පිළිගත් පමණ ඇතිබැවින් දුක්කටයවේ. **කලහ** වස්තුවෙහි '**සම්මොදනීයං අකාසි**' ඇයට හඟවා නැවත ගෙට යාඥුත්තක් කළේය. '**නාලං වචනීයා**' අත් නොහරනලදය යන අර්ථයි. යම් ස්ත්‍රියක් තොමෝ යම් යම් ලෙසකින් යම් යම් ජනපදයන්හි හරනලද්දීමවේද, භායඖාභාවය ඉක්මවාද, මෝතොමෝ අලංවචනීයා හෙවත් සමබන්ධකරන්නෙකුගේ වචනයක් නොලැබ එකතු නොවන්නීයයි කියනුලැබේ. මෝතොමේ වනාහි අලංවචනීයා නොවේ. ඕතොමෝ කිසි කරුණකින් කලහකොට ගියාය. එහෙයින්ම මෙහිලා අනාපත්තියි භාග්‍යවතුන්වහන්සේ වදළසේක. යම්හෙයකින් වනාහි කායසංසග්ගයෙහි යක්ඛිනිය තිම්තිකොට ථුල්ලච්චය වදරනලද්දේද, එහෙයින් දුට්ඨුල්ලාදීන් විෂයයෙහිද යක්ෂිනී ප්‍රෙතියෝ ථුල්ලච්චය වස්තුමැයි දතයුත්තාහ. අර්ථකථාවන්හි මෙය නොවිචාරණලදය. සෙස්ස සියලු ප්‍රකට අර්ථ ඇත්තේමය.

සඤ්චරිත්ත ශික්ෂාපද වර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන**' යනාදිය කුටිකාරශික්ෂාපදයයි. '**ආළවකා**' ආළවිරටෙහි උපන් දරුවෝ ආළවක නම් වෙති. ඔවුහු පැවිදිවූ කල්හිද ආළවකයෝමයයි ප්‍රසිද්ධ වූහ. ඔවුන් සඳහා ආළවකා භික්ඛූයි වදරනලදි. '**සඤ්ඤාචිකායො**' තමන් ඉල්ලාගත් උපකරණයෝය. 'කාරාපෙන්ති' කෙරෙත්මය. කරවත්මය. ඔවුහු සසුනෙහි විදර්ශනාධුරය හා ග්‍රන්ථධුරයද

යන ධුර දෙකම හැරදමා නවකම්ම ධුරකොට ගත්හ. **'අස්සාමිකායො'** හිමියෝ නැත්තාවූ. කරවා දෙන්නෙකුගෙන් තොරවූ යන අර්ථයි. **'අත්තුද්දෙසිකායො'** තමන් උදෙසා තමන්ගේ ප්‍රයෝජනය පිණිස පටන්ගත් යන අර්ථයි. **"අප්පමාණිකායො"** මෙපමණ දැව ආදියෙන් නිමාවට යන්නාහයි. මෙසේ නොපිරිසිඳි පමණ ඇති, පමණින් වැඩිවූ, පමණින් මහත්වූ යන අර්ථයි. මොවුන්ගේ ඉල්ලීමම බහුලය. මොවුන්ගේ අන් වැඩ මඳයයි **යාචනබහුලා** නම. **'විඤ්ඤත්ති බහුලා'** යනුද මෙසේ දතයුතුය. මෙහි අර්ථවශයෙන් වෙනස්බවක් නැත්තේය. නොයෙක් වර 'පුරුෂයකු දෙවු, පුරිස අත්තමක් දෙවුයි ඉල්ලන්නවුන්ට මේ නමකි. ඒ ඉල්ලීමෙහි මූලච්ඡේද්‍යවශයෙන් පුරුෂයකු ඉල්ලීම නොවටියි. සහාය පිණිස වැඩකිරීම පිණිස **'පුරිසං දෙථ'** පුරුෂෙයකු දෙවුයි ඉල්ලීම නොවටිනේ නොවේ.

**'පුරිසත්ථකරං'** පුරුෂයෙකු විසින් කටයුතුවූ අත්කම් කියනුලැබේ. එය ඉල්ලීම වටියි. අත්කම නම් කිසි වස්තුවක් නොවේ. එහෙයින් මුවවැදි කෙවුල් ආදීන්ගේ ඒ සියකම් හැර සෙසු සියලු කම් කැපය. 'ස්වාමිනි' කුමට ආවාහුද, කුමකින් කටයුතුදැයි විචාළකල්හි හෝ නොවිචාළකල්හි හෝ ඉල්ලීම වටියි. විණවීම් හේතුවෙන් දෙෂයක් නැත්තේය. එහෙයින් මුවවැදි ආදීන්ගෙන් ඒ සියකම් නොඉල්ලියයුතුය. 'අත්කම් දෙවුයි නියමක් නොකොටද නොඉල්ලිය යුතුය. මෙසේ ඉල්ලනලද්දහු නම් ඔවුහු 'ස්වාමීනි' මැනවැ'යි මහණහු පිටත්කොට යවා මුවන්ද මරා ගෙන්නාහුය. නියමකොට 'විහාරයෙහි කිසි කටයුත්තක් ඇත්තේය, එයට අත්කමක් දෙවුයි ඉල්ලියයුතුය. කැවිටි, නඟුල් ආදී උපකරණ ගෙන සාන්නට හෝ වපුරන්නට හෝ ගොයම් කපන්නට හෝ යන සිය වැඩෙහි යෙදුණු ගොවියෙකු ගෙන් හෝ අනිකෙකුගෙන් හෝ අත්කමක් ඉල්ලීම වටීමය. යම් ඉඳුල් බත් කන්නෙක් හෝ අන් කිසි වැඩ නැත්තෙක් හෝ වැඩ නැති බස් බෙණෙන්නෙක් හෝ නිදන්නෙක් හෝ වාසය කෙරේද, මෙබන්දෙක් ලවා නොඉල්වාද, 'බොල' එව, මේ මේ කරව'යි කැමති දෙයක් කරවීම වටියි.

අත්කම් පිළිබඳ සියල්ල කැපබව දක්වනු පිණිස මේ නය කියත්: ඉදින් මහණෙක්තෙමේ පහයක් කරවනු කැමැත්තේ නම් එහි ටැම් පිණිස ගල් කපන්නන්ගේ ගෙට ගොස් 'උපාසකයෙනි' අත්කම් ලැබියයුතුයයි කියයුතුය. 'ස්වාමීනි' කුමක් කටයුතුදැ'යි විචාළකල්හි පහන්ටැම් උදුරා දියයුතුයයි කියයුතුය. ඉදින් ඔවුහු උදුරාදෙත්නම්, උදුරාදමා තුබූ තමන්ගේ ටැම් හෝ දෙත්ද, වටියි. නැවැතද 'ස්වාමිනී' අත්කම් කරන්නට අපට ඉඩ නැත, අනිකෙකු ලවා උදුරුවාලනු මැනව, ඔහුට මිල දෙන්නෙමුයි කියත්ද, එකල්හි පහන්ටැම් උදුරවා උදුරු මිනිසුන්ට මිල දෙවුයි කියයුතුය.

මේ උපායෙන්ම පහයෙහි දැව පිණිස වඩුවන් වෙතද, ගඩොල් පිණිස ගඩොල්වඩුවන් වෙතද, සෙවෙණි පිණිස ගෙවල් සෙවෙලි කරන්නන් වෙතද සිත්කම් පිණිස සිත්තරුන් වෙතදැයි යමකින් යමකින් වැඩ ඇත්තේවේද, ඒ ඒ පිණිස ඒ ඒ සිප්කරුවන් වෙත ගොස් අත්කම් ඉල්ලීම වටියි. අත්කම් ඉල්ලීම් වසයෙන්ද මූලවෛජ්‍යවශයෙන් හෝ බත්, වැටුප් දීමෙන් හෝ ලැබූ සියල්ල ගැනීම වටියි. වනයෙන් ගෙන්වන්නහු විසින්ද අනුන් විසින් අයත්කොට නොගන්නා ලද්දම ගෙන්වියයුතුය. පහයක් කරවනු කැමැත්තහු විසින් පමණක්ම නොව ඇඳ පුටු පාත්‍ර පෙරහන්ඩබරා සිවුරු ආදියද කරවනු කැමැත්තහු විසින්ද දැව ලොහොහු ආදිය ලැබ ඒ ඒ සිප්කරුවන් වෙත එළඹ කියූ නයින්ම අත්කම් ඉල්ලියයුතුයි. අත්කම් ඉල්ලීම වසයෙන් හෝ මූලවෛජ්‍ය වශයෙන් හෝ බත්වැටුප් දීමෙන් හෝ ලැබූ සියල්ලද ගතයුතුය. ඉදින් කරන්නට නොකැමති වෙත්නම්, බත්වැටුප් බලාපොරොත්තු වෙත්නම්, අකැප කහවණු නොදියයුතුය. පිඩු සිඟීමෙහි වතින් සහල් ආදිය සොයාදීම වටියි. අත්කම් වසයෙන් පාත්‍රයක් කරවා එසේම පිසවා අලුත පිඩු පාත්‍රයෙහි තෙල් පිණිස ගමතුළට පිවිසියහු විසින් පිඩු පිණිස ආයේයයි සලකා කැඳ හෝ බත් හෝ එළවූකල්හි අතින් පාත්‍රය වැසියයුතුය. උපාසිකාතොමෝ දැක, 'සඬාමිනි' කිමැයි විචාරානම් 'මේ අලුත පිඩු පාත්‍රයෙකි. ආලෙප තෙලින් ප්‍රයොජනයයි කියයුතුය. මේ උපාසිකාතොමෝ 'සඬාමීනි, දුන මැනවැ,යි කියා පාත්‍රය ගෙන තෙල් ගා පිසදමා කැඳෙන් හෝ බතින් හෝ පුරවා දේනම් පිණවීමක් නැත්තේයයි ගැනීම වටියි. භික්‍ෂූහු පළමුකොටම පිඩු පිණිස හැසිර අඳුන්හලකට ගොස් අඳුනක් දක්නාහු නැඟී සිටිත්ද, එහිදී උපාසකයෝ නැඟීසිටි මහණුන් දැක තුමූම අඳුන් ගෙන්වත්ද, එහි හිඳ යන්නවුන් විසින් විචාරා යායුතුය. නොවිචාරා ගියවුන්ටද නය නොවේ. විචාරා යෑම වතයි. මහණුන් විසින් අඳුන් ගෙනඑවුයි කියනලද්දවුන් විසින් ගෙනෙනලද්දහු වෙත්නම්, විචාරාම යායුතුය. නොවිචාරා ගියවුන්ට චාරිත්‍රභෙදයදවේ. නටුයේනම් නයදවේ. අතුරුණු කොඳු පලස් ආදියෙහිද මෙම නයවේ. මැස්සෝ බොහෝ වෙත්නම්, මැසිවිජිනිය ගෙනෙවුයි කියයුතුය. කොසඹ අතු ආදිය ගෙන එත්නම්, කැප කරවා පිළිගතයුත්තාහ. අඳුන්හලෙහි පැන් බඳුන හිස්වූයේවේද, 'ඩබරාව ගතුවයි නොකියයුතුය. ඩබරාව හිස්බඳුනෙහි බහන්තේ බිදෙන්නේය. 'ගහකට හෝ විලකට හෝ ගොස් පැන් ගෙන එව'යි කීම වටියි'. ගෙයින් ගෙනෙවැයි කීම නොවටීමය. එසේ ගෙනෙන ලද්ද විඤ්ඤත්තිදුක්කටබැවින් පරිභොග නොකට යුතුය. අඳුන්හලෙහි හෝ වනයෙහි හෝ බත්කිස කරන්නේ එහි හටගත් අනුන් අයත් නැති

යම්කිසි රසකැවිල්ලට සුදුසුවූ පත්‍රයක් හෝ ඵලයක් හෝ කිසියම් වැඩක් කරන්නෙකුලවා ගෙන්වානම්, අත්කම් වසයෙන් ගෙන්වා පරිභොග කිරීම වටියි. අලජ්ජී මහණුන්ලවා හෝ හෙරණුන්ලවා හෝ අත්කම් නොකරවියයුතුය. මේ වනාහි අත්කම්හි නයයි.

'**ගොණං**' ගොනකු නොනෑ නොපැවරූ තැනින් ගෙන්වීම නොවටියි. ගෙන්වන්නහුට දුක්කටයවේ. නෑ පැවරූ තැනින්ද මූලච්ඡෙද්‍ය වශයෙන් ඉල්ලීම නොවටියි. තාවකාලික නයින් සියලු තන්හි වටියි. මෙසේ ගෙන්වනලද ගොනුද රැක පොෂණයකොට හිමියන්ට පාවාදියයුතුය. ඒ ගොනුගේ පයක් හෝ අහක් හෝ බිඳුණේ හෝ නැසුණේ හෝ වේද, හිමියෝ පිළිගණිත්තම් මෙය මැනවි. නොපිළිගණිත්තම් නයවේ. 'නොපටම දෙමු'යි කියත්නම් නොපිළිගතයුතුය. 'වෙහෙරට දෙමු'යි කීකල්හි, පොෂණකරනු පිණිස ආරාමිකයන්ට කියමුයි කියයුතුය.

'**සකටං දෙථ**' ගැලක් දෙවු'යි නොනෑ නොපැවරුවන්ට කියනු නොයෙදෙයි. විණ්වීමමවේ. දුක්කටයට පැමිණේ. නෑපැවරූ තන්හි වටියි. තාවකාලික වශයෙන් ඉල්ලීම සුදුසුය. වැඩකොට නැවත දියයුතුය. නිම්වළලු ආදීහු බිඳීයෙත්නම් ප්‍රකෘතිමත්කොට දියයුතුය. නැසීගියකල්හි නයවේ. 'ඔබට දෙමු'යි කීකල්හි දැව බඩුවක් නම් පිළිගතයුතුය. වැපොරෝ කෙටේරි, උදලු, නියන්හිද මේ නයවේ.

'**වල්ලී**' වැල් ආදීවූ මෙරමා අයත් ද්‍රව්‍යයන්හිද, ගරුබඩුවට පොහොනාමවූ වැල්ආදියෙහිද විණ්වීමවේ. ඉන් මොබ වස්තූන්හි විඥප්තිය නොවේ. අනුන් අයත් නොවූ යම් කිසිවක් ගෙන්වීම වටියි. රක්ඛිතගොපිතස්ථානයෙහිම විඥප්තිය කියනුලැබේ. ඒ විඥප්තිය චීවර පිණ්ඩපාත යන දෙපසෙහි මුළුමනින් නොවටියි. සෙනසුන් පයෙහි වනාහි, 'මේ දෙය ගෙනෙව, දෙවයි විඥප්තිමාත්‍රයම නොවටියි. පරිකථා ඔභාසකථා නිමිත්තකම් යන මොවුහු වටිත්. එහි පොහෝගෙයක් හෝ බොජුන්හලක් හෝ අන්කිසි සෙනසුනක් හෝ කරනු කැමැත්තහු විසින් ඒකාන්තයෙන් මේ අවකාශයෙහි මෙබඳු සෙනසුනක් කරනු වටීයයි හෝ යුතුයයි හෝ සුදුසුයයි හෝ මේ ආදි නයින් කීම පරිකථා නම. 'උපාසකයෙනි, තෙපි කොතැනක වසනුදැ'යි විචාරා 'ස්වාමීනි' පහයෙකැයි කීකල්හි 'උපාසකයෙනි, මහණුන්ට පහය නොවටීදැයි මේ ආදිය කීම ඔභාස නම. මිනිසුන් දැක රැහැණක් හෝ දිගු කෙරේද, උල් හෝ සිටුවාද, 'ස්වාමිනි, මේ කිමැ'යි ඇසූකල්හි මෙතැන ආවාසයක් කරන්නෙමුයි මේ ආදිය කිරීම නිමිත්තකම් නම. ගිලන්පසෙහි විඥප්තියද වටියි. පරිකථාදිය කියනු කිම,

‘**මනුස්සා උපද්දුතා යාචනාය උපද්දුතා විඤ්ඤත්තියා**’ ඒ භික්ෂූන්ගේ ඒ යාඥාවෙන්ද විඥප්තියෙන්ද පෙළුනාහු. ‘**උප්පජ්ජන්ති**’ කුමක් ගෙන්වන්නාහුදැයි උද්වේගය කම්පනය චලනය පිළිලබත්, **උත්තසන්ති** යනු සර්පයෙකුදැයි මෙන් වහා තැතිගෙන පහවෙත්. ‘**පලායන්ති**’ දුරින්ම යම් ඒ තැනකට පලායෙත් ‘**අඤ්ඤෙනපි ගච්ඡන්ති,** යම් මගකට පිළිපන්නාහු ඒ මග හැර වම හෝ දකුණ හෝ ගෙන යෙත්. දෙරද වසත්.

‘**භූතපුබ්බං භික්ඛවෙ**’ මේ ප්‍රකාරයෙන් භාග්‍යවතුන්වහන්සේ ඒ මහණුන්ට ගරහා එයට අනුරූපවූ දැහැමි කතාකොට නැවැතද විණිවීමෙහි දෙස් ප්‍රකට කරනසේක් ‘**භූතපුබ්බං භික්ඛවෙ**’ යනාදි ක්‍රමයෙන් වස්තු තුනක් දැක්වූසේක. එහි ‘**මණිකණ්ඨො**’ ඒ නාරජතෙමේ සියලු කැමතිදෙය දෙන මහඟු මැණිකක් බොටුවෙහි පැලඳගෙන හැසිරෙන්නේය. එහෙයින් ‘මණිකණ්ඨයි ප්‍රකටවූයේය. ‘**උපරි මුද්ධනි මහන්තං ඵණං කරිත්වා අට්ඨාසි**’ ඒ සෘෂීන් දෙදෙනාගෙන් ඒ කණිටු සෘෂිතෙමේ මෛත්‍රීවිහරණ ඇත්තේවීය. එහෙයින් ඒ නාරජතෙමේ ගඞ්ගානදියෙන් ගොඩනැගී දිව්‍යවෙශයක් මවා ඔහු වෙත හිඳ සතුටුවියයුතු කතාවක්කොට ඒ දිව්‍යවෙශය හැර සියවෙසයටම පැමිණ ඒ සෘෂිහු වටකොට පැහැදුණු අයුරක් කරමින් මතු මුදුනෙහි මහත් පෙණයක් කොට ඡත්‍රයක් දරන්නකුමෙන් මොහොතක් සිට යන්නේය. ‘උපරිමුද්ධනි මහන්තං ඵණං කරිත්වා අට්ඨාසි’ යනු එහෙයින් වදළසේක. ‘**මණිස්ස කණ්ඨෙ පිළන්ධනං**’ මැණික මොහුගේ ගෙළ පලඳනාලද්දේය. බඳින ලද්දේය යන අර්ථයි. ‘**එකමන්තං අට්ඨාසි**’ ඒ දිව්‍යවෙශයෙන් අවුත් තාපසයා සමග සතුටුවෙමින් එක් පෙදෙසෙක සිටියේය. ‘**මමන්නපානං**’ මාගේ අහරද පැන්ද, ‘**විපුලං**’ බොහෝය. ‘**උළාරං**’ ප්‍රණීතය. ‘**අතියාචකොසි**’ වැඩියක් ඉල්ලන්නෙක් වෙහි, නැවත නැවත ඉල්ලන්නෙහියි කියනලද්දේවේ. ‘**සුසූ**’ තරුණයෙකි. ශක්තිසම්පන්නවූ යොවුන්බවට පැමිණි පුරුෂයෙකි. කළුගල සක්ඛාරායි කියනුලැබේ. එහි මුවහත් තැබූ කඩුව සක්ඛරධොත නමැයි කියනුලැබේ. මුවහත් තැබූ කඩුව මොහුගේ අතෙහියි **සක්ඛරධොතපාණී** නම්වේ. කළුගලක මුවහත් තැබූ තියුණුවූ කඩුගත් අත් ඇත්තේය යන අර්ථයි. යම්සේ ඒ කඩුගත් අත් ඇති පුරුෂතෙමේ ත්‍රස්ත කරන්නේද, එපරිද්දෙන් ගල ඉල්ලමින් මා ත්‍රස්ත කෙළේය. මැණික ඉල්ලන්නේය යන අර්ථයි. ‘**න තං යාචෙ**’ එය නොඉල්ලන්නේය. කවරක්ද, ‘**යස්ස පියං ජිගිංසෙ**’ යම් සත්වයෙකුහට යමක් ප්‍රියයි දන්නේ නම්ය. ‘**කිමඞ්ග පන මනුස්සභූතානං**’ මිනිස් වූවන්ට අමනාපයයි මෙහි කියයුතු කිම:

‘**සකුණසඞ්ඝස්ස සද්දෙන උබ්බාළ්හා**’ ඒ පක්ෂි සමූහය ප්‍රථම යාමයෙහිද පශ්චිමයාමෙහිද නිරතුරු හඬම නගයි. ඒ මහණතෙමේ ඒ

හඩින් පෙළුණෙක්ව භාග්‍යවතුන්වහන්සේ වෙතට ගියේය. එහෙයින් ‘**යෙනාහං තෙනුපසඞ්කමි**’ යනු වදළසේක. ‘**කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසි**’ මෙහි හුන් ඒ මහණතෙමේ නොඑයි. වර්තමානකාලය ‘**ආගතොසි**’යි කියයුත්තෙහි ‘**ආගච්ඡසි**’යි මෙසේ කියන්නටලැබේ. ‘**කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසි**’ එහෙයින් වදළාසේක. කොහි සිට ආයේ වෙහිද, යන අර්ථයි. ‘**තතොහං භගවා ආගච්ඡාමි**’ යන මෙහිද මෙම නයවේ. ‘**උබ්බාළ්හා**’ පෙළුණේවීමි. කලකිරීමට පත්කරන ලද්දේක්වූ යන අර්ථයි ‘**සො සකුණසඞ්ඝො භික්ඛු පත්තං යාචති**’ මෙහි ඒ පක්ෂීහු මහණහුගේ වචනය නොදනිත්. භාග්‍යවතුන්වහන්සේ වනාහි තමන් වහන්සේගේ බුද්ධානුභාවයෙන් යම්සේ දනිත්ද එසේ කළසේක. ‘**අපාහං තෙ න ජානාමි**’ තවද මම ඒ මේ ජනයෝ කවරහුද, මොවුහු කවරක්හුගේදැයි නොදනිමි. ‘**සඞ්ගම්ම යාචන්ති**’ එක්ව වගී වගීව ඉල්ලත්. ‘**යාචකො අප්පියො හොති**’ යමෙක් ඉල්ලාද හෙතෙමේ අප්‍රියවේ. ‘**යාචං අදදමප්පියො**’ **යාචං** ඉල්ලනලද්ද කියනු ලැබේ. ඉල්ලන ලද දෙය නොදෙන්නේද අප්‍රියවේ. නොහොත් **යාචං** ඉල්ලන්නහුට **අදදමප්පියො** නොදෙන්නේ අප්‍රියවේ. ‘**මා මෙ විදෙස්සනා අහු**’ මා පිළිබඳ අප්‍රියභාවයක් නොවේවා. මම හෝ ඔබටද, ඔබ හෝ මටද වෛරයක් අප්‍රියබව නොවේවා යන අර්ථයි. ‘**දුස්සංහරානි**’ ගොවිකම් ගෙරිරැකුම් ආදි උපායෙන් දුකින් රැස්කටයුතුය.

‘**සඤ්ඤාචිකාය පන භික්ඛුනා**’ මෙහි සඤ්ඤාචිකා නම් තමන් විසින් පවත්වනලද ඉල්ලීම කියනුලැබේ. එහෙයින් සඤ්ඤාචිකාය යනු තමන්ගේ ඉල්ලීමෙනැයි කියනලද්දේවේ. තමන් ඉල්ලාගත් උපකරණයන්ගෙනියි යන අර්ථයි. යම් හෙයකින් තමන් ඉල්ලාගත් උපකරණයන්ගෙන් කරනු ලබන්නී තමන් ඉල්ලාගෙන කරනු ලබන්නීවේද, එහෙයින් ඒ අර්ථපර්යාය දක්වන්නට ‘**සයං යාචිත්වා පුරිසම්පි**’යි මේ පදයෙහි පදභාජනය වදරන ලදි. ‘**උල්ලිත්තා**’ ඇතුළත ආලෙප කරනලද්දීය. ‘**අවලිත්තා**’ පිටත ආලෙප කරනලද්දීය. ‘**උල්ලිත්තාවලිත්තා**’ ඇතුළත පිටත ආලෙප කරනලද්දීයයි කියනලද්දේවේ. ‘**කාරයමානෙන**’ මේ පදයෙහි පදභාජනයෙහි ‘**කාරාපෙන්තෙන**’ කරවන්නහු විසිනැයි මෙපමණක්ම කියයුත්තේ වන්නේය. මෙසේ ඇතිකල්හි ව්‍යඤ්ජනය සමවේ. යම්හෙයකින් තමන් ඉල්ලාගත් උපකරණයන්ගෙන් කිළියක් කරන්නහු විසින්ද මෙහි කියූනයින්ම පිළිපැදිය යුතුද, එහෙයින් කරන්නෙක් හෝ වේවා, කරවන්නෙක් හෝ වේවා මේ දෙදෙනාම ‘**කාරය මානෙන**’ යන මේ පදය සමගම සඞ්ග්‍රහ කරන ලදහයි මේ අර්ථය දක්වන්නට ‘**කරොන්තො වා කාරාපෙන්තො වා**’යි වදරන ලද්දේවෙයි. ඉදින් කරන්නහු විසින් හෝ කරවන්නහු විසින් හෝයි කියන්නේ නම් ව්‍යඤ්ජනය විරුද්ධ වන්නේය කරවන්නේ කරන්නේ

නම් නොවේ. එහෙයින් අර්ථමාත්‍රයක්ම මෙහි දක්වන ලද්දේයයි දතයුතුය. '**අත්තුද්දෙසං**' මෝ කුටිය මාගේයයි මෙසේ තමන් උදෙදසය මොහුටනුයි අත්තුදෙදස නම. ඒ අත්තුදෙදස කුටියයි. යම්හෙයකින් යම් කුටියකට තෙමේ උදෙදසවේද, ඒ කුටිය තමා පිණිසවේද, එහෙයින් අර්ථපයර්‍යාය දක්වනසේක් '**අත්තුද්දෙසන්ති අත්තනො අත්ථාය**'යි වදළසේක. '**පමාණිකා කාරෙතබ්බා**' ප්‍රමාණ යුක්තව කරවියයුතුය.

'**තත්‍රිදං පමාණං**' ඒ කුටියෙහි මේ ප්‍රමාණයවේ. '**සුගතවිදත්ථියා**' සුගත්වියතනම්, දැන් මෙකල මද්‍යමපුරුෂයාගේ තුන්වියතෙකි. වඩුරියනෙන් එක්රියන් හමාරක්වේ. '**බාහිරිමෙන මානෙන**' කුටියෙහි පිටබිත්තිය මැනීමෙන් දොළොස් වියතක්වේ. මතින්නහු විසින් සියල්ලට පළමුව දුන් මහ මැටි කෙළවර නොගතයුතුය. වීපොතු හා මුසුකොට තැබූ මැටි පිඩු කෙළවරින් මිතිය යුතුය. දෙමැටිය මතුවෙහි සුණු පිරියම පමණ නොවේ. දෙමැටියෙන් ප්‍රයෝජන නැත්තේවේද, මහමැටියෙන්ම නිමවාද, මහමැටියම පිරිසිදීමවේ. '**තිරියං**' පුළුලින් '**සත්ත**' සත් සුගත් වියතෙකි. '**අන්තරා**' මේ ප්‍රමාණයෙහි මේ නිදේශයවේ. '**අබ්භන්තරිමෙන මානෙන**' බිත්තියෙහි පිට කෙළවර නොගෙන ඇතුළත කෙළවරින් මතිනකල්හි සරස සත් සුගත්වියතෙක් පමණැයි කියනලද්දේවේ. යම් මහණෙක් ලෙසක් නගන්නේ කියූ පමණ ඇත්තක්ම කරන්නෙමියි දිගින් එකොළොස් වියතක්, සරසින් සිවියතක් නොහොත් දිගින් තෙළෙස් වියතක් සරසින් සවියතක් ඇතිකොට කරන්නේනම් නොවටියි. එක් භාගයකින් පමණ ඉක්මුණේ පමණ ඉක්මුණේමවේ. වියතක් තිබේවා, කෙසගක් පමණකුත් දිගින් හෝ පිරිහෙළා සරස සරසින් හෝ පිරිහෙළා දිග වැඩීම නොවටියි. දෙකින් වැඩීම නොවටිනු කියනු කිම, '**ආයාමතො වා විත්ථාරතො වා අන්තමසො කෙසග්ගමත්තම්පි අතික්කමිත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං**'යි වදරනලදි. 'දිගින් හෝ පුළුලින් හෝ යටත් පිරිසෙයින් කෙසගත් පමණකුදු ඉක්මවා කෙරේ නම් හෝ කරවා නම් හෝ ප්‍රයොගයක් පාසා දුකුළාවේය යන මෙය වදරනලදි. කියූ පමණ ඇත්තීම වටියි. යම් කුටියක් තොමෝ දිගින් සැටරියනක්වේද, සරසින් තුන්රියනක් හෝ අඩුසිවුරියනක් හෝවේද, යම් තැනෙක පමණින් යුත් ඇඳක් ඔබ මොබ නොපෙරළේද මෝ කුටියි ගිණීමට නොයයි. එහෙයින් මේ කුටියත් වටියි. **මහාපච්චරියෙහි** පැසුළු කෙළවරින් සිවුරියන් පුළුල ඇත්තී වටීයයි කියනලදී. එයින් අඩුවූවා කුටියක් නොවේයයි සේයි. කියූ පමණ ඇත්තී නමුත් නොදෙසූ කුටිවාසතු ඇත්තී හෝවේද, කැලසිනි ආදීන්ගේ ආශ්‍රයස්ථාන ඇත්තී හෝවේද ගොන් යෙදූ ගැලක් වට හැසිරෙන්නට නොහැකි වන්නීවේද? ඒ නොවටියි. පමණින් යුක්තවූවා

දෙසූ කුටිවාස්තු ඇත්තී කැලසිති ආදීන්ගේ ආශ්‍රයස්ථාන නැත්තී උපචාර සහිත වන්නීම වටියි. පෙළෙහි කියූ පමණින් අඩුතරම්වූද සිවුරියන් පස්රියන් පමණවූද කුටියක් කරන්නහු විසින් දෙසූ කුටිවාස්තු ඇත්තීම කරවිය යුතුය. පමණින් ඉකුත්වූ පමණ ඉක්මවූ කුටියක් කරන්නේද ආලෙපයාගේ අවසානයෙහි ගරු ඇවැතට පැමිණේ. එහි ලේපයද අලෙවියද ලොපොකාසයද ආලෙපයදැයි ආලෙපදෙකකි. මේ ආලෙප දෙක හැර සෙසු අළුගොම ආදීවූ ආලෙපය, ලෙපයක් නොවේ. කිසි ලහටුවකින් හෝ තඹමැටියෙන් හෝ කළ ආලෙපයක්වේද,- එය ආලෙපමවේ. ලොපොකාස යනු බිත්තියද සෙවෙණියදවේ. බිත්ති හා සෙවෙණිය හැර සෙසු වැම් තලාම් දෙරබා ජනෙල් කවුළු දුම්සිදුරු ආදීවූ ආලෙපකිරීමට නොසුදුසුවූ සියලුම අවකාශය, අලෙපොකාසයයි දතයුතුය.

'**භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය**' යම් තැනක කිළියක්කරනු කැමැතිවේද, එහි කුටිවාස්තු දෙසීම පිණිස භික්ෂූහු කැඳවිය යුත්තාහුය. '**තෙන කුටිකාරකෙන**' යනාදිය යම් විධියකින් ඒ භික්ෂූහු කැඳවිය යුත්තාහුද ඒ විධිය දක්වනු පිණිස වදාරනලදි. එහි '**කුටිවත්ථුං සොධෙත්වා**' යනු මෙයින් විසමවූ වනයට භික්ෂූන් ගෙන නොයායුතුය. කුටිවාස්තුව පළමුකොටම පිරිසිදුකොට සමතලකොට සීමාමණ්ඩලයක් සමානකොට පසුව සඞ්ඝයා වෙත එළඹ යාඥකොට පැමිණවිය යුත්තාහයි දක්වනසේක. '**එවමස්සවචනීයො**' සඞ්ඝතෙමේ මෙසේ කියයුතු වන්නේය. මෙයට ඉදිරියෙහි '**දුතියම්පි යාචිතබ්බා**'යි භික්ෂූන් සඳහා බහුවචනය වදාරනලදී. '**නො චෙ සබ්බො සඞ්ඝො**' ඉදින් සියලු සඞ්ඝතෙමේ නොකැමැති වේනම්, ඒ භික්ෂූහු හැදෑරීම් මෙනෙහිකිරීම් ආදියෙහි යුක්තවූවාහු වෙත්. '**සාරම්භං අනාරම්භං**' උපද්‍රව සහිතය. උපද්‍රව රහිතය. '**සපරික්කමනං අපරික්කමනං**' උපචාරසහිතය. උපචාර රහිතය. '**පත්තකල්ලං**' පැමිණි කාලය මේ බැලීම පිළිබඳයයි පත්තකාල නම. පත්තකාලයම පත්තකල්ල නම. කුටිවාස්තුව බැලීම පිණිස මේ සම්මුති කර්මය අනුශ්‍රාවණනයින් බලාද කිරීම වටියි. ඉදිරියෙහි එන කුටිවාස්තුදෙශනා කර්මය යට කියනලද්දවූම ඤත්තියෙන්ද අනුශ්‍රාවණයෙන්ද කටයුතුය. අපලොකනනයකොට කිරීම නොවටියි. '**කිපිල්ලිකානං**' රතු කලු පිහුවන් ආදීවූ ප්‍රභෙද ඇති යම්කිසි කුහුඹුවන්ගේ. 'කිපීලිකානං'යිද පාඨයක්වේ. '**ආසයො**' නිබඳවසන තැනය. යම්සේ කුහුඹුවන්ගේ නිබඳ වසන තැනවේද, එසේවේ ආදීන්ගේද නිබදවසන තැනම ආශ්‍රයයි දතයුතුය. යම් තැනක ගොදුරුපිණිස අවුත් යෙත්ද, සියල්ලන්ගේම එබඳුවූ සඤ්චරණප්‍රදේශය නොවළකනලදය. එහෙයින් එහි කුහුඹු ආදීන් පහකොට පිරිසිදුකොට කිරීම වටියි. මේ සතැන සත්වානුකම්පාව පිණිස ප්‍රතික්ෂෙප කරනලදී. '**හත්ථීනං වා**'

ඇතුන්ගේ නිබද වසන තැනද නිබඳ ගොදුරු තැනද නොවටියි. සිංහාදීන්ගේ ආශ්‍රයස්ථානයද ගොදුරු පිණිස යන්නවුන්ගේ නිබද ගමන් මගද නොසුදුසුය. මොවුන්ගේ ගොදුරුබිම නොගන්නාලදි. '**යෙසං කෙසඤ්චි**' අතිකුදු වල් තිරිසනුන්ගේය. මේ සත් තැන ප්‍රතිභය සහිතවූයේ භික්ෂූන්ගේ ආරෝග්‍ය සලකා වළකනලදය. එහි **පුබ්බණ්ණනිස්සිකාදිවූ** සෙසු තැන් නොයෙක් උවදුරින් උවදුරුසහිතය.

එහි '**පුබ්බණ්ණනිස්සිත**' පෙරවරුවෙහි වැපිරිය යුතු ධාන්‍ය ඇසුරුකළ, සප්තවිධ ධාන්‍යයන් වැඩෙන කෙත් සමීපයෙහි පිහිටිතැනය. **අපරණ්ණනිස්සිතාදීවූ** තැන්හිද මේ නයමවේ. මෙහි වනාහි '**අබ්භාඝාතං**' යනු කම් කටොලු ගෙයයි. වෛරීගෘහයයි. සොරුන් ඝාතනය කිරීම පිණිස කරන ලද්දක්යයි කියනලදි. **කුරුන්දි** ආදියෙහි **ආඝාතනං** යන මෙයින් දම්ගෙඩිය කියනුලැබේ. '**සුසානං**' මහසොහොන. **සඤ්චරණං** නොවිනිවිද යායුතුවූ. යායුතු ආයුතුමග කියනුලැබේ. සෙස්ස නොගැඹුරුවේමය. '**න සක්කා හොති යථා යුත්තෙන සකටෙන**' ගොන් දෙදෙනකු යෙදූ ගැලින්. එක් සකක් ජලය කෙළවර දිය වැටෙන තැනද එක් සකක් පිටතද කොට වට හැසිරෙන්නට නොහැකිවේ. **කුරුන්දියෙහි** ගොන් සිවු දෙනෙකු යෙදූ ගැලිනැයි කියනලදී. '**සමන්තා නිස්සෙණියා අනුපරිගමනං**' හිණිමගෙ සිට ගෙය සෙවිලි කරන්නවුන් විසින් හාත්පස හිණිමගෙන වට හැසිරෙන්නට නොහැකිවේද, මෙසේ මෙබඳුවූ උපද්‍රව සහිතවූද උපචාර රහිතවූද තැන නොකරවිය යුත්තීය. උපද්‍රව රහිතවූ උපචාර සහිතවූ තැන කරවිය යුත්තීය. එය කියනලද්දට ප්‍රත්‍යක්ෂනයින් පෙළෙහි ආයේමය. නැවත '**සඤ්ඤාචිකා නාම**' යන මේ ආදිය '**සාරම්භෙ චේ භික්ඛු වත්ථුස්මිං අපරික්කමනෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය**'යි මෙසේ වදළ සඤ්ඤාචිකාදීන්ගේ අර්ථය පවසනු පිණිස වදරනලදී.

'**පයොගෙ දුක්කටං**' මෙසේ නොදෙසූ කුටිවාස්තු ඇත්තාවූ හෝ පමණ ඉක්මවූ හෝ කිළියක් කරවන්නෙමියි වනයෙන් රුක් ගෙනර්ම පිණිස වෑයක් හෝ පොරොවක් හෝ මුවහත් තබාද, දුක්කටයවේ. වනයට පිවිසේද, දුක්කටයවේ. එහිදී තෙත් තණ සිඳීද, දුක්කටය සමග පාචිත්තියවේ. වියලි තණ ආදිය සිඳීද දුක්කටයවේ. රුක්හිද මේ නයමය, බිම පිරිසිදු කෙරේද, බිම සාරාද, පස් ගොඩගනීද, පස් රැස් කෙරේදැයි මෙසේ යම්තාක් අඩිතාලම බඳීද, ඒතාක් පූර්වප්‍රයොග නම්වේ. මේ පූර්වප්‍රයොගයෙහි හැම තැන පාචිත්තිය ස්ථානයෙහි දුක්කටය සමග පාචිත්තියවේ. දුක්කට ස්ථානයෙහි දුක්කටයවේ. එතැන් පටන් සහප්‍රයොග නම්වේ. එහි ටැම්වලින් කළයුතු කිළියෙහි ටැඹ නංවාතබාද දුක්කටයවේ. ගඩොලින් බැඳියයුතු කිළියෙහි ගඩොල් රැස් කෙරේද, දුක්කටයවේ.

මෙසේ යම් යම් උපකරණයක් යොදද සියලු තන්හි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයවේ. සසින්නහුට අත්වරක් අත්වරක් පාසාද, ඒ පිණිස යන්නහුට පියවරක් පියවරක් පාසාද දුක්කටයවේ. මෙසේ කරනලද දැවබිත් කිළියක් හෝ ගල්බිත් කිළියක් හෝ ගඩොල් බිත්ති කිළියක් හෝ යටත් පිරිසයින් පත්සලක් නමුදු බිත්ති සහිත සෙවෙණිය ආලෙප කරන්නෙමියි සුණින් හෝ මැටියෙන් හෝ ආලෙප කරන මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා යම්තාක් ථුල්ලච්චය නොවේද, ඒතාක් දුක්කටයවේ. මේ දුක්කටය වනාහි මහාලෙපයෙන්ම සිදුවේ. සුදු රතු පැහැකිරීම නිමිතිකොට හෝ සිතුයම් කිරීම නිමිතිකොට හෝ ඇවැත් නොවේ. **'එකං පිණ්ඩං අනාගතෙ'** සියලු වැඩට පසුව කරන යම් ලෙපපිණ්ඩයක්වේද, ඒ එක් පිඩ නොතැබූ කුටිකම්යෙහිය. දැන් දෙපිඩෙකින් නිමාවට යන්නේයයි මෙය කියනලද්දේය. ඔවුන් අතුරෙහි පළමු පිඩ දීම නිමිතිකොට ථුල්ලච්චයවේ. **'තස්මිං පිණ්ඩෙ ආගතෙ'** යම් එක් පිඩක් නොතැබූ කුටිකම්යෙහිය. දැන් දෙපිඩෙකින් නිමාවට යන්නේයයි මෙය කියනලද්දේය. ඔවුන් අතුරෙහි පළමු පිඩදීම නිමිතිකොට ථුල්ලච්චයවේ. **'තස්සං පිණ්ඩෙ ආගතෙ'** යම් එක් පිඩක් නොතැබූ කුටිකම්යෙහි ථුල්ලච්චයවේද, ඒ අවසන් පිඩ ආකල්හි දුන්කල්හි තැබූකල්හි ලෙපය ගැටුබැවින් සඞ්ඝාදිසෙසාපත්තියවේ. මෙසේ ආලෙප කරන්නහුට ඇතුල් ලෙපය හෝ ඇතුල්ලෙපය සමග බිත්තිය හා පියස්සද එකාබද්ධකොට ගැළපූකල්හි පිටත ලෙපයෙහි හෝ පිටත ලෙපය සමග ගැළපූකල්හි සඞ්ඝාදිසෙසයවේ.

දෙරබාව හෝ ජනෙල් කවුළුව හෝ නොතබාම මැටියෙන් ආලෙප කෙරේනම් ඒ දෙරබාජනෙල් කවුළුවෙහි ඔහුගේ අවකාශය නැවත වඩා හෝ නොවඩා තැබූකල්හි ලෙපය නොගැටේද, ඒතාක් ඇවතින් රැකේ. නැවත ආලෙප කරන්නහුට ගැටූ ඇසිල්ලෙහි සඞ්ඝාදිසෙසයවේ. තබනුලබන එය, පළමු දුන් ලෙපය සමග අතර රහිතවම සිටීද, පළමුකොටම සඞ්ඝාදිසෙසයවේ. වේයන් මුදහරිනු පිණිස අටඟුලක් පමණින් වහල නොතබා බිත්තිය ආලෙප කෙරේද, ඇවැත් නොවේ. වේයන් මුදහරිනු පිණිසම යට ගල්බිත්තියක්කොට ඒ බිත්තිය ආලෙපකොට මත්තෙහි ආලේප කෙරේද? ආලේපය නොගැටේ නම් සඞ්ඝාදිසෙසාපත්තිය නොවේමය. ගඩොලින් කළ කිළියෙහි ගඩොලින්ම වාකවුළුද, දුම්සිදුරුද කෙරේනම් ආලෙපය ගැටීමෙන්ම ඇවැත්වේ. කොළ සෙවෙණිකළ ශාලාවක් නමුත් කෙරේනම් ආලෙපය ගැටීම සමගම ඇවැත්වේ. එහි එළිය පිණිස අටඟුලක් පමණ හැර ආලෙපය කෙරේනම් ආලේපය නොගැටේනම් ඇවැත් නොවේ. වාකවුළුවක් ලැබ එය මෙහි තබන්නෙමියි වාකවුළුව තැබූකල්හි

ආලේපය ගැටීමෙන් ඇවැත්වේ. මැටියෙන් බිත්තියක් කෙරේද, වහලෙහි ලෙපය සමග ගැටීම නිමිතිකොට ඇවැත්වේ. එක් මහණෙක් එක් පිඩක් ඉතිරිකොට තබාද, අනිකෙක් එය දැක මෙය නොමනාව කරනලදැයි වත්හිසෙන් ආලෙප කෙරේද දෙදෙනාහටම ඇවැත්නොවේ.

**'භික්ඛු කුටිං කරොති'** මේ ආදීවූ පෙළෙහි, වදළ සතිස් චතුෂ්ක ආපත්තිභෙදය දක්වනු පිණිස වදරනලදහ. එහි උපද්‍රව සහිත කිළියෙහි දුක්කටයවේ. උපචාරරහිත කිළියෙහි දුක්කටයවේ. පමණ ඉකුත් කිළියෙහි සඞ්ඝාදිසෙසයවේ. කුටිවාස්තු නොදෙසූ කිළියෙහි සඞ්ඝාදිසෙසයවේ. මොවුන්ගේ වසයෙන් මිශ්‍රකාපත්ති දතයුත්තාහ. **'ආපත්ති ද්වින්නං සඞ්ඝාදිසෙසෙන ද්වින්නං දුක්කටානං'** යනාදි තන්හිද සඞ්ඝාදිසෙස දෙකක් සමග දුක්කට දෙකක යනාදි නයින් අර්ථය දතයුතුය.

**'සො චෙ විප්පකතෙ ආගච්ඡති'** යනාදි තන්හිද මේ අර්ථවිනිශ්චයවේ. **සො** යනු සමාදන් කරවා දික්හි ගිය මහණතෙමේය. **'විප්පකතෙ'** කුටිකර්මය නොනිමිකල්හි **'අඤ්ඤස්ස වා දාතබ්බා'** අන් පුද්ගලයෙක්හට හෝ සමූහයකට හෝ අත්හැර දියයුත්තේය. **'භින්දිත්වා වා පුන කාතබ්බා'** පමණකින් බිඳුනීවේද, ටැම් බිම සිටුවනලද්දේද ඉදිරියයුත්තාහ. ගල්මතුවෙහි තබනලද්දේද, ටැම් බිම සිටුවනලද්දේද ඉදිරියයුත්තාහ. ගල්මතුවෙහි තබනලද්දේද, පහකටයුත්තාහ. ගඩොලින් බැඳි කිළියෙහි මගුල් ගඩොල යම්තාක් තුබුනේද ඒ තාක් බිත්ති ඉවත් කටයුත්තාහ. සැකෙවින් බිම සමකොට වනසන ලද්දීනම් බිඳුනීවේ. බිමින් මතුවෙහි සතරඟුලක් පමණකුදු සිටිකල්හි නොබිඳුනීමවේ. සෙස්ස සියලු චතුෂ්කයන්හි ප්‍රකටමය. මෙහි අන්කිසි යමක් ඇත්තේද එය පාළි අනුසාරයෙන්ම නොදතහැකි නොවන්නේය. **'අත්තනා විප්පකතං'** යනාදි තන්හි තමන් පටන්ගත් කිළිය. **'අත්තනා පරියොසාපෙති'** මහ මැටියෙන් හෝ දෙමැටියෙන් හෝ යන යමකින් කළ නිමවූබවට පමුණුවනු කැමැත්තේවේද, එයින් අවසන් පිඩුව දෙන්නේ නිම කෙරේද? **'පරෙහි පරියොසාපෙති'** තමන් පිණිසම අනුන්ලවා නිමකරවයි තමන් විසින් හෝ අනුන් ලවා හෝ දෙදෙන විසින් හෝ එක්ව අඩාල කරනලද්දීවේවා, සඞ්ඝාදිසෙසයමවේ. මේ මෙහි විනිශ්චයයි. **කුරුන්දියෙහි** දෙතුන් නමක් මහණහු එක්ව වසන්නෙමුයි කිළිය කරත්ද, ඒතාක් රැකේ. නොබෙදූබැවින් ඇවැත් නොවේ. 'මෙතැන තටය, මෙතැන මටයයි බෙද කරත්ද, ඇවැත්වේ. සාමණේරනමක්ද භික්ෂුනමක්ද එක්ව කිළියක් කරත්ද, එය යම්තාක් නොබෙදනලදද ඒතාක් රැකේ. පෙරනයින් බෙද කිළියක් කරත්ද, භික්ෂූන්ට ඇවැත්වේයයි කියනලදි. **'අනාපත්ති ලෙනෙ'** යනාදි තන්හි මහත් ලෙනක් කරන්නහුටද

ඇවැත්නොවේ. මෙහි ආලේපය නොගැවේ. ගුහාවද ගඩොලින් කළ ගුහාවක් හෝ ගලින් කළ ගුහාවක් හෝ දැවයෙන් කළ ගුහාවක් හෝ බිම් ගුහාවක් හෝ මහත් මහත්ව කරන්නහුට ඇවැත්නොවේ. 'තිණකුටිකාය' සත්මහලක් ඇති පහයද තණපතින් කළ වහල ඇත්තේ තිණකිළියයි කියනුලැබේ. අර්ථකථාවන්හි වනාහි 'කුක්කුටච්ඡිකගෙහ' යන මෙයින් දිගින්ද සරසින්ද තැබූ දඬු සමග වහල දැලක්මෙන් බැඳුනක්කොට තණවලින් හෝ කොළවලින් වැසූ කිළියම කියනුලැබේ. එහි ඇවැත්නොවේ. තණින් සෙවෙණික ගෙය මහත්කොටද කිරීම වටියි. උල්ලිත්තාදිභාවයම කිළියෙහි ලක්‍ෂණවේ. එද වහලම සඳහා කියනලදැයි දතයුතුය. සක්මන් හලෙහි තණසුණු ඇදවැටේ. 'අනුජානාමි භික්ඛවෙ ඔගුමෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං' යනාදියද මේ තණකිළියෙහි සාධකවේ. එහෙයින් දෙපියස්ස ඇති කිළියක් හෝ තර්ණිකා බැදි කිළියක් හෝ වට කිළියක් හෝ සිවුරැස් කිළියක් හෝවේද, මේ ගේ පිළිබඳ යම් මේ වහලක්වේද, එය ඡදන සඩෙක්‍ෂපයෙන් කරනලද්දේවේද ඒ වහලෙහි බිත්ති ලෙපය සමග ලෙපය ගැටුණුකල්හි ඇවැත්වේ. ඇතුලත-පිටත, උඩ-යට ආලෙප කළ වහලෙහි ආලෙපය රැකීම පිණිස මතුවෙහි තණින් වසාද මෙපමණකින් තණකිළි නම්නොවේ. කිම, මෙහි නොදෙසූ කුටිවාස්තු ඇතිබව හා පමණ ඉක්මවා සිටීම් හේතුවෙන්ම ඇවැත් නොවේද, නොහොත් සොපද්‍රව අනුපචාර හෙතුවෙන් ඇවැත් නොවේද, සියලු අයුරෙන් ඇවැත්නොවේ. ඒ එසේමය එබඳු කිළිය සඳහා පරිවාරයෙහි,

භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කරොති
අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං
සාරම්භං අපරික්කමනං අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතාති

මහණතෙමේ තමන් ඉල්ලාගත් වැ පොරෝ ආදි උපකරණයෙන් නොදෙසූ කුටිවත් ඇති පමණ ඉක්මවූ උපද්‍රව සහිතවූ උපචාර රහිතවූ කිළියක් කෙරේද, ඇවැත් නොවේ මේ ප්‍රශ්නය දක්‍ෂයන් විසින් සිතනලදැයි කියනලදී. 'ආපත්තිකාරකානං තිණ්ණං දුක්කටානං' යනාදි පෙළෙහි යමක් වදරනලද්දේද එය මනාව නොඉටා නොකිරීම් හේතුවෙන් වදරනලදී. 'අඤ්ඤස්සත්ථාය' කුටි ලක්‍ෂණයට පැමිණි කිළියක් අන්‍ය උපාධ්‍යායයා සඳහා හෝ ආචාර්‍ය්‍යයා සඳහා හෝ සඞ්ඝයා පිණිස හෝ කරන්නහුට ඇවැත්නොවේ. 'වාසාගාරං ඨපෙත්වා සබ්බත්ථ' තමන්ගේ විසීම පිණිස ගෙය හැර අන් පොහෝගෙයක් හෝ ගිනිහල් ගෙයක් හෝ බොජුන් හලක් හෝ වහනිශාලාවක් හෝ වන්නේයයි කරවාද, සියලුතන්හි ඇවැත්නොවේ. ඉදින් මේ මහණහුට පොහෝ ගෙයක්ද වන්නේය. මමද

වසන්නෙමි, ගිහිහල් ගෙයක්ද බොජුන් හලක්ද වහනිශාලාවක්ද වන්නේය, මමද වසන්නෙමියි සිතක්වේද, කරවූ කල්හිද ඇවැත්වේමය. **මහාපච්චරියෙහි** වනාහි අනාපත්තියි කියා තමන්ගේ විසීමට ගෙයක් පිණිස කරන්නහුටම ඇවැත්යයි කියනලදි. උන්මත්තකයාහටද ආදිකර්මිකවූ ආළවක භික්ෂූන්ටද ඇවැත්නොවේ. සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ඡසමුට්ඨානයි. කිරීමෙන්ද, කිරීමෙන් හා නොකිරීමෙන්ද සමුට්ඨානයවේ. මෙය කුටිවත් දෙසවා පමණ ඉකුත් කිළියක් කරණ මහණහුට ක්‍රියාවෙන් සමුට්ඨානයවේ. කුටිවත් නොදෙසවා කරන්නහුට කිළිය කිරීමද කුටිවත් නොදෙසීමද යන ක්‍රියා ක්‍රියාහෙයින් සමුට්ඨානයවේ. ව්‍යතික්‍රමසංඥවෙහි අභාවයෙන් නොමිදෙනබැවින් නොසංඥවිමොක්ෂයයි. ප්‍රඥප්තියයි නොදන්නා සිත හෙතුකොට අචිත්තකය. ශික්ෂා ප්‍රඥප්තියෙහි වරදයයි හැරියයුතුබැවින් ප්‍රඥපතිවද්‍යයි. කයින් කටයුතුබැවින් කායකර්මයි. වචනයෙන් සිදුවියයුතුබැවින් වාක්කර්මයි, සුඛදුඃඛාදීවූ තුන්සිත් ඇතිබැවින් ත්‍රිචිත්තයි. එසේම සුඛදුඃඛාදි වෙදනා ඇති බැවින් ත්‍රිවෙදනයි.

කුටිකාරශික්ෂාපද වර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන**' යනු විහාරකාර ශික්ෂාපදයයි. එහි '**කොසම්බියං**' මෙනම් ඇති නගරයෙහි, '**ඝොසිතාරාමෙ**' ඝොෂිත සිටුහුගේ ආරාමයෙහි. ඝොෂිත නම් ඇති සිටුහු විසින් ඒ ආරාමය කරවනලද්දේය. එහෙයින් ඝොෂිතාරාමයයි කියනු ලැබේ. '**ඡන්නස්ස**' බොධිසත්ව කාලයෙහි උපස්ථායකවූ ඡන්නස්ථවිරයන්හට '**විහාරවත්ථුං භන්තෙ ජානාහි**' ස්වාමිනි විහාරය පිහිටන තැනක් දනු මැනව. මෙහිද විහාරයි කීයේ සියලු වෙහෙර නොවේ. එක් ආවාසයෙකි. '**අය්‍යස්ස විහාරං කාරාපෙස්සාමි**'යි එහෙයින්ම කීයේය. '**චෙතියරුක්ඛං**' ගරුබුහුමන් කටයුතු අර්ථයෙන් චෛත්‍ය නම. පිදීමට සුදුසුවූ දෙවස්ථානයන්ට මේ නමකි. චෛත්‍යයයි සම්මත වෘක්ෂය චෛත්‍යවෘක්ෂ නම. ගම්වැසියන් විසින් පුදනලද්දේ ගාමපූජිත නම. සෙසු පදයන්හිද මෙම නයවේ. තවද මෙහි **ජනපද** එක් රජක්හුගේ රාජ්‍යයෙහි එක් කොටසෙකි. **රට්ඨං** යනු සතු රාජ්‍යයයි දතයුතුය. සකලරාජ්‍යයම ඒ රුකට කිසියම් කිසියම්කල්හි පූජා කරන්නේය. '**රට්ඨ පූජිතං**' යනු එහෙයින් වදරනලදී. '**එකින්ද්‍රියං**' යනු කායෙන්ද්‍රිය සදහා වදරත්. '**ජීවසඤ්ඤිනො**' සත්වසංඥ ඇත්තාහු. '**මහල්ලකං**' ස්වාමිකභාවයෙන් සඤ්ඤාචිකකුටියට වඩා මහත්බව මොහුට ඇත්තේනුයි මහල්ලක නම. යම්හෙයකින් කුටිවත් දෙසවා පමණ ඉකුත් කිරීමෙන්ද

කිරීම වටීද, එහෙයින් පමණ මහත් බැවිනුදු මහලලකය. ඒ මහලලක කුටියයි. යම්හෙයකින් මේ මහත් කිළියෙහි ඒ පමණ මහත්බව සස්වාමිකභාවයෙන්ම ලැබේද, එහෙයින් ඒ අර්ථය දැක්වීම පිණිස **'මහල්ලකො නාම විහාරො සස්සාමිකො වුච්චති'**යි පදභාජනයෙහි වදරනලදී. සමුට්ඨානාදියසමග සෙසු සියල්ල කුටිකාර ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය. සස්වාමිකභාවමාත්‍රයම මේ ශික්ෂාපදයෙහි ක්‍රියාවෙන් සමුට්ඨානුභාවයද ප්‍රමාණනියමාභාවයද වෙනසි. ප්‍රමාණනියමය නොමැතිහෙයින් අභාවචතුෂ්කය පිරිහුනේය.

විහාරකාර ශික්ෂාපද වර්ණණාව නිමි.

——\\——

**'තෙන සමයෙන බුද්ධො භගවා'** යනු දුට්ඨදොස ශික්ෂාපදයයි. එහි **'වෙළුවනෙ කලන්දකනිවාපෙ'** වෙළුවන යනු ඒ උයනට නමකි. එය උණගස්වලින්ද අටළොස්රියන් පවුරෙන්ද වටකරනලද්දේවීය. දෙරකොටුවෙන් හා පවුරමතුයෙහි පිහිටවූ අටල්ලෙන් යුක්තය. හුණයෙන් වටකළබැවින්, මල්පල දැරූ රුකින් වටකළබැවින් නිල් පැහැ ඇත්තේවිය. සිත්කලුය. එහෙයින් වෙළුවනැයි කියනුලැබේ. මෙහි ලෙහෙනුන්ට බත් වැටුප් දුන්හ. එයින් **කලන්දකනිවාපයි** කියනුලැබේ. පෙර එක්තරා රජෙක් එහි උයනෙහි ක්‍රීඩා කරනු පිණිස ආයේ සුරාමදයෙන් මත්වූයේ දවල්නින්දෙන් නිදිගත්තේය. මොහුගේ පිරිවරජනතෙමේද 'රජතෙමේ නිදිගත්තේයයි මල්පල ආදියෙන් පෙළඹෙනුයේ ඔබමොබ ගියේය. එකල්හි සුරාගඳින් එක්තරා සිදුරු රුකකින් කෘෂ්ණසර්පයෙක් නික්ම අභිමුඛව එන්නේය. එහි අරක් ගත් රුක්දෙවිතෙමේ ඌ දැක 'රජුට දිවි දෙමි'යි ලෙහෙනෙකුගේ වෙශයෙන් අවුත් කණමුල ශබ්ද කෙළේය. රජතෙමේ පිබිදුනේය. කෘෂ්ණසර්ප නැවතුනේය. රජතෙමේ ලේනා දැක 'මේ ලේනාහු විසින් මට දිවිදෙන ලදැ'යි ලෙහෙනුන්ට එහි බත්වැටුප් තැබුයේය. අභයඝොෂයද ඝොෂා කරවීය. එහෙයින් එය එතැන් පටන් කලන්දකනිවාපැයි ගිණීමට ගියේය. කලන්දක යනු ලෙහෙණුන්ට නමකි. **'දබ්බො'** ඒ තෙරුන්ගේ නමයි. **'මල්ලරාජපුත්තො'** මල්ලරජුගේ පුත්කුමරුය. **'ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං'** ස්ථවිරතෙමේ වනාහි සත්හැවිරිදිවූයේම සංවෙගය ලබා පැවිදිවූයේ කරකම් අගම රහත්බවට පැමිණියේයයි දතයුතුය. **'යං කිඤ්චි සාවකෙන පත්තබ්බං සබ්බං තෙන අනුප්පත්තං'** ශ්‍රාවයෙකු විසින් පැමිණිය යුත්තේ නම් ත්‍රිවිද්‍යා චතුර්විධ ප්‍රතිසම්භිද ෂට්අභිඥ නවලොකොත්තර ධර්ම යන මේ ගුණ සමූහයයි. ඒ

සියල්ල ඔහු විසින් ලබන ලද්දේවේ. ‘**නත්‍ථි චස්ස උත්තරිං කරණීයං**’ සිවුසස් දහම්හි සිවුමගින් සොළොස් වැදෑරුම් කිස කළබැවින් දැන් මත්තෙහි මොහුට කිසි කටයුත්තෙක් නැත්තේය. ‘**කතස්ස වා පතිචයො**’ සේදූ පාත්‍රයක නැවත සේදීමක්, ඇඹරූ සුවඳක නැවත ඇඹරීමක්, පිපුණු මලක නැවත පිපීමක්, නැතිසේ ඒ කළ කිසෙහි නැවත වැඩිමෙක් නැත්තේය. ‘**රහොගතස්ස**’ රහසිගතවූ ‘**පතිසල්ලීනස්ස**’ ඒ ඒ කිසෙන් හෝ අරමුණෙන් වැළකී සංලීනවූ එකීභාවයට පැමිණියාවූයි කියනලද්දේවේ.

‘**අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස එතදහොසි යන්නූනාහං සෙනාසනඤ්ච පඤ්ඤපෙය්‍යං භත්තානි ච උද්දිසෙය්‍යං**’ ස්ථවිරතෙමේ වනාහි තමන් කළ කිස ඇතිබව දැක ‘මම මේ අවසන් සිරුර දරමි, එද වාතය හමුවෙහි තැබූ පහනක් මෙන් අනිත්‍යතා මුඛයෙහි සිටියේය, නොබෝකලකින්ම නිවීයන ස්වභාව ඇත්තේය යම්තාක් නොවේද, ඒතාක් කිම, මම සඞ්ඝයාහට වතාවතක් කරන්නෙම්දැයි සිතන්නේ, පිටරටවල බොහෝ කුලපුත්‍රයෝ භාග්‍යවතුන්වහන්සේ නොදැකම පැවිදිවෙත්, ඔවුහු ‘භාග්‍යවතුන්වහන්සේ දකින්නෙමුයිද වඳින්නෙමුයිද දුරසිට එන්නෝය, එහිදී යම් කෙනෙකුන්ට සෙනසුන් නොපොහොනේද ඔවුහු ගල්තලාවෙහිද සයනය කරත්, මම මාගේ අනුභාවයෙන් ඒ කුලපුත්‍රයන්ගේ කැමැත්ත ලෙසින් ප්‍රාසාද විහාර අඩියොගාදීවූ ඇතිරිලි සහිත ඇඳපුටු සෙනසුන් මවාදෙන්නට පොහොසත් වෙමියි මෙසේ සැලකුයේය. මෙහි දෙවනද ඇතැම්හු වැඩියක් කලානත ස්වරූප ඇත්තාහුවෙත්. ඔවුහු ගෞරවයෙන් භික්ෂූන් ඉදිරියෙහි සිටද බත් නොඋදෙසවති. මම ඔවුන්ට බත්ද උදෙසන්නට පොහොසත් වෙමියි. සිතන්නාවූ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට ‘මම සඞ්ඝයාහට සෙනසුන්ද පණවන්නෙම් නම් බත්ද උදෙසන්නෙම් නම් ඉතා මැනවැ’යි මෙබඳු සිතක් විය. හංසාරාමතාදියෙහි යෙදී වසන මහණහුට මේ දෙකරුණ යුතුනොවේද, මෙතෙමේද ක්ෂීණාශ්‍රවයෙක්වේ, අප්‍රමාදයෙහි ඇලී ගත්තේය. කුමක් හෙයින් මොහුට මේ දෙකරුණ වැටහුනේද, යත්: පෙරකරන ලද පැතීමෙන් මෙහෙයුණුබැවිනි. සියලු බුදුවරයන්ට මේ තනතුරට පැමිණි ශ්‍රාවකයෝ වෙත්මය.

මෙතෙමේද පියුමතුරා බුදුරජුන් දවස එක්තරා කුලගෙයක උපන්නේ මේ තනතුරට පැමිණි මහණක්හුගේ අනුභාවය දැක අටසැට ලක්ෂයක් භික්ෂූන් සමග බුදුරජුන් පවරා සත්දිනක් මහදන්දී බුදුරජුන්ගේ පාමුල හෙව, මත්තෙහි ඔබවහන්සේ වැනි බුදුකෙනෙකුන් උපන්කල්හි මමද ඔබවහන්සේගේ මෙනම් ඇති ශ්‍රාවකයා මෙන් සෙනසුන් පණවන්නෙක්ද බත් උදෙසන්නෙක්ද වන්නෙමියි ප්‍රාර්ථනා කෙළේය. භාග්‍යවතුන්වහන්සේ

අනාගතසංඥාණය යවා බැලූසේක් දුටුසේක. දැකද මෙයින් කල්පලක්‍ෂයක් ඇවෑමෙන් ගෞතම නම් බුදුරජතෙමේ ලොව පහළවන්නේය. එකල තෝ දබ්බ නම් මල්ලපුත්‍රයෙක්ව ඉපද, උත්පත්තියෙන් සත්හැවිරිදිවූයේ ගිහිගෙයින් නික්ම පැවිදිව රහත්බව ප්‍රත්‍යක්‍ෂ කරන්නෙහිය. මේ තනතුරද ලබන්නෙහිය'යි ප්‍රකාශ කළසේක. හෙතෙමේ එතැන් පටන් දන්සිල් ආදිය පුරමින් දෙව් මිනිස් සැප විඳ අප බුදුරජුන්දවස ඒ පියුමතුරා බුදුරජුන් විසින් වදළ පරිදිම රහත්බව ප්‍රත්‍යක්‍ෂ කෙළේය. එකල්හි රහසිගතව 'කිම, මම සඞ්ඝයාහට වතාවතක් කරන්නෙම්දැ'යි සිතන්නහුම ඒ පූර්වප්‍රාර්ථනාවෙන් මෙහෙයුණුබැවින් මේ දෙකරුණ වැටහුනේය. ඉක්බිති මේ තෙරුන්හට 'මම තමන් කෙරෙහි ඉදුරෙක් නොවෙමි, ශාස්තෘන්වහන්සේ සමග එක් තැන වසමි, ඉදින් භාග්‍යවතුන්වහන්සේ මට මේ දෙකරුණ අනුදන්නාසේක් නම් සමාදන් වන්නෙමියි සිතක් උපන්නේය. මෙසේ සිතා භාග්‍යවතුන්වහන්සේ වෙතට ගියේය. එහෙයින් **'අථ ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො -පෙ- භත්තානි ච උද්දිසතුං'**යි කියනලදය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඔහුට 'යහපත, යහපත, දබ්බ'යි පසසා අගතිගමනින් තොරවූ මෙබඳු මහණතෙමේ මේ දෙකරුණ විචාරන්නට යම්හෙයකින් සුදුසුවේද, එහෙයින් **'තෙනහි ත්වං දබ්බ සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙහි, භත්තානි ච උද්දිස'**යි වදළසේක. **'භගවතො පච්චස්සොසි'** භාග්‍යවතුන්වහන්සේගේ වචනය අභිමුඛව අස්වාලීය. පිළිගත්තේයයි කීයේවේ. **'පඨමං දබ්බො යාචිතබ්බො'** කුමක්හෙයින් භාග්‍යවතුන්වහන්සේ යාඥාකරවනසේක්ද, ගැරහීමෙන් මිදෙනු පිණිසය. භාග්‍යවතුන්වහන්ස් 'අනාගතයෙහි දබ්බහට මෙ කරුණ නිසා මෙත්තියභූම්මජකයන්ගේ වසයෙන් මහ උවදුරක් වන්නේය, එහිදී කිසිකෙනෙක් මෙතෙමේ නිහඬව තමන්ගේ කටයුතු නොකොට කුමක් හෙයින් මෙබඳු තනතුරක් විචාරාදැයි ගරහන්නාහු අන් කෙනෙක් මොහුගේ කවර දෙෂයක්ද මොවුන් විසින්ම යාඥාකොට තබනලද්දේයයි කියන්නාහ. මෙසේ ගැරහීමෙන් මිදෙන්නේයයි දක්නාසේක්මය.

මෙසේ ගැරහීමෙන් මිදීම පිණිස යාඥා කරවාද, නැවත යම්හෙයකින් සම්මත නොකළ මහණෙක් සහමැද උස්හඬ කෙරේද, ඉදුරුබව දක්වාදැයි නුගුණ පහළ කිරීමක් වන්නේය. සම්මත කරනලද්දහු කියනකල්හි 'ආයුෂ්මත්හු කිසිවක් නොකියවූ, සම්මතකරනලද මෙතෙමේ සුවසේ කියාවායි කියන්නෝවෙති. සම්මත නොකරනලද්දහු බොරුවෙන් ගටා කියන්නහුට දුක්කටමාත්‍රවූ ලහුකාපත්තියක් වන්නීය. සම්මත කරනලද්දහුට ගටාකියන්නහුට ඉතාගරුවූ පාචිත්තියාපත්තිය වන්නීය. තවද සම්මතකරනලද මහණතෙමේ ආපත්තිය ගරුබැවින් වෛරීන් විසිනුදු

කිසිලෙසකිනුදු නොමැඩිය හැක්කේවේ. එහෙයින් ඒ ආයුෂමත්හු සම්මත කරවන්නට '**ව්‍යත්තෙන භික්ඛුනා**' යනාදිය වදළසේක. 'කිම, සම්මුතිදෙකක් එක් මහණක්හට දෙන්නට වටීද, දෙකක් පමණක් නොවේ. හැක්කේ නම් භත්තුද්දෙසක-සෙනාසනගාහාපක-භණ්ඩාගාරික-චීවරපටිග්ගාහක-චීවරභාජක-යාගුභාජක-ඵලභාජක-ඛජ්ජකභාජක-අප්පමත්තකවිස්සජ්ජක - වස්සිකසාටියගාහාපක - පත්තගාහාපක - ආරාමිකපෙසක - සාමණේරපෙසක සම්මුතීන්ගේ වසයෙන් තෙළෙසම නමුදු දෙන්නට වටියි.

'**සභාගානං**' ගුණසභාගයන්ගේ වසයෙන්වේ. මිත්‍රසන්ථවයෙන් සභාගවූවන්ගේ වසයෙන් නොවේ. '**යෙතෙ භික්ඛූ සුත්තන්තිකා තෙසං එකජ්ඣං**' යනාදිය එහෙයින් වදළසේක. යම් පමණ භික්ෂූහු සූත්‍රාන්තික වෙත්ද, ඔවුන් තෝරාගෙන ඔවුන්ට සුදුසුවූම සෙනසුන් එකට පණවයි. සෙනසුන මෙසේය. '**කායදළ්හී බහුලා**' කයෙහි දැඩිබව කිරීම බහුලකොට ඇත්තාහු, කායපොෂණය බහුලකොට ඇත්තාහු යනු අර්ථයි. '**ඉමායපි චෙ ආයස්මන්තො රතියා**' ආයුෂමත්හු සගමග අවුරන්නාවූ මේ තිරිසන් කතාකිරීමෙහි ඇලීමෙන් '**අවසිස්සන්ති**' වාසය කරන්නාහුය. '**තෙජො ධාතුං සමාපජ්ජිත්වා තෙනෙවාලොකෙන**' තෙජොකසිණ චතුර්ථ ධ්‍යානසමාපත්තියට සමවැද, එයින් නැගිට අභිඥඥනයෙන් ඇඟිලි දැල්වීම ඉටා, තෙජොධාතු සමාපත්තියෙන් උපන් ඒ ඇඟිලි දැල්වූ ආලොකයෙන්ම, යන අර්ථයි. තෙරුන්ගේ මේ ආනුභාවය නොබෝ කලකින්ම මුළු දඹදිව ප්‍රකටව ගියේය. තවද එය අසා සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යය දකිනු කැමැතිවූ භික්ෂූහු දැන, නොකල්හි පැමිණෙත්. '**තෙ සඤ්චිච්ච දූරෙ අපදිසන්ති**' ඔවුහු දුරබව දන්නාහුම දුරතැන් දක්වත්. කෙසේද යත් **අම්හාකං ආවුසො දබ්බ ගිජ්ඣකූටෙ**' යන මේ ලෙසිනි. '**අඞ්ගුලියා ජලමානාය පුරතො පුරතො ගච්ඡති**' ඉදින් එක් මහණෙක් වේනම් තෙමේමයයි. ඉදින් බොහෝ වෙත්නම් බොහෝ ආත්මභාවයන් මවයි. සියල්ලෝ තමන් සමානයෝයි සෙනසුන් පණවයි. '**අයං මඤ්චො**' යනාදිතන්හි තෙරුන් මේ ඇඳයයි කියනකල්හි නිර්මිතයෝද, තමතමන් ගියතැන මේ ඇඳයයි කියත්. සියලු පදයන්හි මෙසේය.

මේ වනාහි මවනලද්දවුන්ගේ ධර්මතාය.

'එකස්මිං භාසමානස්මිං - සබ්බෙ භාසන්ති නිම්මිතා
එකස්මිං තුණ්හීමාසීනෙ - සබ්බෙතුණ්හී භවන්ති තෙති.

එක් මහණෙකු කතාකරනකල්හි මවනලද සියල්ලෝ කතා කරති. එක් මහණෙකු නොබැණ හුන්කල්හි සියල්ලෝ නිහඬවෙති.

යම් විහාරයෙක්හි ඇඳ පුටු ආදිය පමණ නොවෙත්ද, එහි තමන්ගේ අනුභාවයෙන් පුරාලන්නේය. ඔහු විසින් මවනලද්දවුන්ගේ නිරර්ථක වචනයක් නොවේ. '**සෙනාසනං පඤ්ඤපෙත්වා පුනදෙව වෙළුවනං පච්චාගච්ඡති**' ඔවුන් සමග ජනපදකථා කියමින් නොහිඳියි. තමන් වසන තැනටම පෙරළා එයි. '**මෙත්තියභුම්මජකා**' මෙත්තියද භුම්මජකද යනමේ දෙදෙන සවග මහණුන්ගේ අග්‍රපුරුෂයෝය. '**ලාමකානි ච භත්තානි**' නවකයන්ට ලාමකවූ සෙනසුන්ම පැමිණේය යන ආශ්චර්යයක් නොවේ. බත්ද ලහ පැසක හෝ චීවරභොගයෙක හෝ බහා අළලා එක එක උදුරා දෙත්. ඒ ලහද ඔවුන් මඳපිනැතිබැවින් සියල්ලට පැසුළුවූ ලාමකවූම ලහ පැමිණේ. ඉතාමනාප බැවින් සියල්ලන්ගේ ලැබීම පිණිස වෙන්ව ඨිතිකාවසයෙන් පැමිණිය යුතු යම් බතක්වේද, එද ඔවුන්ට පැමිණි දිනයෙහි ලාමක හෝවේ. මොවුන් දැකම ප්‍රණීත වූවක් නොදී ලාමකවූවක්ම දෙත්. '**අභිසඞ්ඛාරිකං**' නොයෙක් ද්‍රව්‍යයෙන් සකස්කොට කරනලද මොනවට සදනලද මොනවට සම්පාදනය කරනලදැයි යන අර්ථයි. '**කණාජකං**' කුඩුසහිත බත. '**බිළඞ්ගදුතියං**' කාඩි දෙවැනිකොට ඇති. '**කල්‍යාණභත්තිකො**' යහපත්වූ සොඳුරුවූ ඉතා ප්‍රණීතවූ බත මොහුටනුයි කල්‍යාණභත්තික නම. ප්‍රණීතයක්ම දෙනබැවින් බතින්ම තෙරසක වර්ණනා ප්‍රසිද්ධ වූයේය. '**චතුක්කභත්තං දෙති**' බත් සතරක් දෙන්නේය. තද්ධිතව්‍යවහාරයෙන් '**චතුක්කභත්තං**' කියනලද්දේය. '**උපතිට්ඨිත්වා පරිවිසති**' සියලු කර්මාන්තයන් හැරදමා මහත්වූ පූජාසත්කාරකොට අසල සිට වළඳවයි. '**ඔදනෙන පුච්ඡන්ති**' බත් ගත් අත් ඇතිව එළඹ 'කිම, ස්වාමීනි' බත් දෙමුදැයි විචාරත්. මෙසේ මෙය කරණාර්ථයෙහිම කරණාවචනයවේ. සූපාදීන් විෂයයෙහිද මෙම නයවේ. '**ස්වාතනාය**' හෙට වන භත්තපරිභොගය ස්වාතන නම. ඒ පිණිසය. හෙට වන භත්තපරිභොගය පිණිසය. හෙට කටයුතු භත්තපරිභොගය පිණිසැයි කියනලද්දේවේ. '**උද්දිට්ඨං හොති**' පමණුවා දෙනලද්දේවේ. '**මෙත්තිය භුම්මජකානං ඛො ගහපති**' ස්ථවිරතෙමේ මේ වචන කල්පනා නොකොට කීයේය. ඔවුන්ගේ මඳපිනැතිබව මෙසේ බලවත්මය. සිහිය මහත්බවට පැමිණියවුන්ටද මෙසේ අනාභොගයවේ. '**යෙ ජෙ**' 'ජේ' යන මෙයින් දසියට ආමන්ත්‍රණය කරයි. '**හීය්‍යො ඛො ආවුසො අම්හාකං**' රාත්‍රියෙහි මන්ත්‍රණය කරන්නාහු ඉකුත් දිවසභාගය සඳහා 'හීය්‍යො'යි කියත්. '**න චිත්තරූපං**' සිත් සේ නොවේ. පෙර යම්සේ යම් පමණ කැමතිවෙත්ද, එපමණ සයනය කරත්, එසේ සයනය නොකළහ. මදක්ම සයනය කළහයි කියනලද්දේවේ. '**බහාරාමකොට්ඨකෙ**' වෙළුවන විහාරයෙහි දෙරකොටුවෙන් පිටත. '**පත්තක්ඛන්ධා**' නැමූ කඳ ඇත්තාහු. කඳට නමා හුන්නාහු. '**පජ්ඣායන්ති**'

ක්‍රොධවශයෙන් දුම් නගන්නාහු. **'යතො නිවාතං තතො පවාතං'** යම් තැනක (හමායන) වාතය නැත්තේද, මදවූද වාතයක් නැත්තේද, එහි මහාවාතයක් නැගී ගියේය යන අදහසය. **'උදකං මඤ්ඤෙ ආදිත්තං'** දිය ඇවිලගත්තක් මෙන් **'සරසි ත්වං දබ්බ එවරූපං කත්තා'** දබ්බ තෝ මෙබන්දක් කෙළේ සිහි කිරීමෙන්ද? නොහොත් 'මේ මෙහෙණ යම්සේ කීවාද, එබන්දක් තෝ සිහි කෙරෙහිද, යම්සේ මේ මෙහෙණ කීවාද එබන්දක් හෝ කෙළෙහිම වෙහිදැයි මෙසේ යොදද මෙහි අර්ථ දතයුතුය. යම් කෙනෙක් 'කත්වා'යි හදරත්ද, ඔවුන්ගේ ප්‍රථම අර්ථග්‍රහණය සෑදුම්වේ.

**'යථා මං භන්තෙ භගවා ජානාති'** ස්ථවිර තෙමේ මෙයින් කුමක් දක්වාද, 'ස්වාමීනි' භාග්‍යවතුන්වහන්සේ සියල්ල දත්සේක. මමද ක්‍ෂයකළ ආශ්‍රව ඇත්තෙමි. මාගේ මෛථුනධර්මසෙවනයක් නැත්තේය. භාග්‍යවතුන්වහන්සේ ඒ මා දන්නාසේක. භාග්‍යවතුන්වහන්සේ යම්සේ මා දන්නාසේක්නම් එහිලා මම කුමක් කියම්ද, එසේම මම දතයුතුවෙමියි සැලකෙළේය. **'න ඛො දබ්බ දබ්බා එවං නිබ්බෙඨෙන්ති'** යන මෙහි 'දබ්බ' තෝ අන්‍යප්‍රත්‍යයක් හෙතුකොට යම්සේ නිරවුල් කෙරෙහිද පණ්ඩිතයෝ එසේ නිරවුල් නොකෙරෙති, තවද යමක් තමන් විසින් දන්නා ලද්දේද එයින් නිරවුල් කෙරෙත්යි මෙසේ අර්ථ දතයුතුය. **'සචෙ තයා කතං කතං'** මෙයින් කුමක් දක්වනසේක්ද යත්:- පිරිස බලයෙන් හෝ පක්‍ෂයක රැකුල්දීමෙන් අකාරකයෙකු කාරකයෙකු කරන්නට හෝ කාරකයෙකු අකාරකයෙකු කරන්නට හෝ නොහැක්කේය. එහෙයින් යමක් තමන් විසින් කරනලද්දේ හෝ නොකරනලද්දේ හෝවේද, එයම කියයුතුයයි දක්වනසේක. කුමක් හෙයින් භාග්‍යවතුන්වහන්සේ දන්නාසේක්ද, 'මම දනිමි, තෝ ක්‍ෂීණාශ්‍රව වෙහි. තට දෙෂයක් නැත්තේය, මේ මෙහෙණ බොරු කියන්නීයයි නොවදළසේක්ද යත්: පරහට අනුකම්පා ඇතිබැවිනි. භාග්‍යවතුන්වහන්සේ යමක් යමක් දන්නාසේක්ද, ඒ ඒ වදරනසේක් නම්, පරිජියයට පැමිණි අන්‍යයකු විසින් විචාරණ ලද්දහු මම දනිමි, තෝ පරිජිවූයෙහියි කියයුතු වන්නේය. එහෙයින් ඒ පුද්ගලතෙමේ 'මේ භාග්‍යවත්තෙමේ පෙර දබ්බමල්ලපුත්‍රයා පිරිසිදුකොට දැන් අපිරිසිදු කරන්නේය. දැන් කවරක්හට කුමක් කියම්ද, යම් තැනක ශාස්තෘතෙමේද ශ්‍රාවකයන් කෙරෙහි ඡන්දයෙන් අගතියට යන්නේය, මොහුට සර්වඥභාවයක් කොයින්දැයි වෛර බැඳ අපායට පැමිණෙන්නෙක් වන්නේද එහෙයින් භාග්‍යවතුන්වහන්සේ පරහට අනුකම්පා ඇතිබැවින් දන්නාසේක්ද, නොවදළසේක. තවද බොහෝසේ උපවාද දුරුකිරීම් වසයෙන්ද නොවදළසේක. ඉදින් භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදරනසේක් නම්, දබ්බමල්ලපුත්‍රයාගේ නැගී සිටීම නම් බැරෑරුම්ය. සම්‍යක්සම්බුද්ධයන්

සාක්ෂ්‍යයට ලැබ නැගී සිටියේයයි මෙසේ උපවාදයක් වන්නේය. මේ උත්ථානලක්ෂණයයි හඟිමින් 'බුද්ධකාලයෙහිද සාක්ෂියෙන් ශුද්ධිය හෝ අශුද්ධියවේ. 'මේ පුද්ගලතෙමේ අපිරිසිදුයයි අපි දතුම්හයි මෙසේ පාපභික්ෂූහු ලජ්ජීන්ද නසන්නාහ. තවද අනාගතයෙහිද භික්ෂූහු වස්තුව අවතීර්ණවූකල්හි චෝදනාකොට සිහිකරවා 'ඉදින් තාවිසින් කරනලද්දේ නම් කරනලද්දේයයි කියවයි ලජ්ජීන්ගේ ප්‍රතිඥව ගෙන කර්ම කරන්නාහයි විනයලක්ෂණයෙහි පෙල තබමින් 'මම දනිමියි නොකියා ඉදින් තාවිසින් කරනලද්දේ නම් කරනලද්දේයයි කියවයි වදළසේක. '**නාභිජානාමි සුපිනන්තෙනපි මෙථුනං ධම්මං පතිසෙවිතා**' සිහිනෙහුදු මෙවුන්දමක් නොදනිමි. මම මෙවුන්දම් සේවනය නොකෙළෙමියි කියනලද්දේවේ. නොහොත් පිළිසෙවුනෙක්ව සිහිනෙන්වත් මෛථුනධර්මයක් නොදනිමියි කියනලද්දේවේ. යම් කෙනෙක් 'පතිසෙවිත්වායි හදරත්ද, ඔවුන්ගේ අර්ථග්‍රහණය සෘජුමවේ. '**පගෙව ජාගරො**' නොනිදන්නේ වනාහි පළමුකොට නොදනිමියි.

'**තෙන හි භික්ඛවෙ මෙත්තියං භික්ඛුනිං නාසෙථ**' යම්හෙයකින් දබ්බගේද මේ මෙත්තියාවගේද වදන් නොගැළපේද, එහෙයින් මෙත්තියා මෙහෙණ සුදුවත්දී ලිඞ්ගනාසනයෙන් නසවු'යි වදරනලද්දේය. එහි ලිඞ්ගනාසනා-සංවාස නාසනා- දණ්ඩකම්මනාසනායි නාසනා තුනක්වේ. ඔවුනතුරෙහි දූෂකතෙමේ නැසිය යුත්තේය යන මෙය ලිඞ්ගනාසනාය. ඇවැත් නොදැක්මෙහි හෝ පිළියම් නොකිරීමෙහි හෝ ලාමක දෘෂ්ටිය අත්නොහැරීමෙහි හෝ උත්ක්ෂෙපණීය කෙරෙත්ද මෙය සංවාසනාසනාය. යව, මමත්වයක් නැත්තාවූ තෝ අදර්ශනයට යවයි දඬුවම් කෙරෙත්ද මෙය දණ්ඩකම්මනාසනාය. මෙහි වනාහි ලිඞ්ගනාසනය සඳහා 'මෙත්තියං භික්ඛුනිං නාසෙථ'යි වදළසේක. '**ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථ**' මෙයින් 'මේ මෙහෙණ තමාග් ධර්මතාවෙන් නොකළාය. ඒකාන්තයෙන් අන්‍යයන් විසින් යොදනලද්දීය. එහෙයින් යම් කෙනෙකුන් විසින් යොදනලද්දීද, ඒ මහණුන් විමසවු, සොයවු, දනිවුයි මෙය දක්වා වදළසේක. 'කිම, භාග්‍යවතුන්වහන්සේ විසින් මෙත්තියා මෙහෙණ ප්‍රතිඥවෙන් නසනලදද, අප්‍රතිඥවෙන් නසනලදද, කිම, මෙහි පළමුකොට ප්‍රතිඥවෙන් නසනලද නම් ස්ථවිරතෙමේ කාරකවේ. දෙස් සහිතවේ. අප්‍රතිඥවෙන් නසනලද නම් ස්ථවිරතෙමේ අකාරකවේ. නිදෙස්වේ.

හාතියරජුගේ කාලයෙහිද මහාවිහාරවාසීවූද, අභයගිරිවිහාරවාසීවූද තෙරුන්ගේ මෙම පදයෙහිම විවාදයක් වූයේය. අභයගිරිවාසීහුද තමන්ගේ සූත්‍රය කියා 'ථුෂමතුන්ගේ වාදයෙහි ස්ථවිරතෙමේ කාරක වේයයි කියත්. මහාවිහාරවාසීහුද තමන්ගේ සූත්‍රය කියා 'ථුෂමතුන්ගේ වාදයෙහි

ස්ථවිරතෙමේ කාරකවේයයි කියත්. ප්‍රශ්නය නොසිඳේ. රජතෙමේ අසා තෙරුන් රැස් කරවා දීඝකාරායණ නම් බ්‍රාහ්මණ ජාතික අමාත්‍යයාහට තෙරුන්ගේ කතාව අසවයි අණකෙළේය. අමාත්‍යතෙමේ පණ්ඩිතය. භාෂාන්තරයෙහි දක්ෂය. හෙතෙමේ 'තෙරහු සූත්‍රය කියත්වායි කීයේය. ඉක්බිති අභයගිරිවාසීවූ තෙරහු 'මහණෙනි, එසේ වීනම් මෙත්තියා මෙහෙණී ස්වකීය ප්‍රතිඥවෙන් නසවු'යි තමන්ගේ සූත්‍රය කීහ. අමාත්‍යතෙමේ 'ස්වාමිනි' ඔබවහන්සේලාගේ වාදයෙහි ස්ථවිරතෙමේ කාරකයෙක්වේයයි. දෙස් සහිතය'යි කීයේය. මහාවිහාරවාසීහුද 'මහණෙනි' එසේවීනම් මෙත්තියා මෙහෙණ නසවු'යි තමන්ගේ සූත්‍රය කීහ. අමාත්‍යතෙමේ 'ස්වාමිනි' ඔබවහන්සේලාගේ වාදයෙහි ස්ථවිරතෙමේ කාරකයෙක්වේයයී කීයේය. මෙහි වනාහි කුමක් සුදුසුවේද, යමක් පසුව කියනලදද, මෙය අත්ථකථාචාර්‍යයන් විසින් විමසනලද්දේය. මහණෙක් මහණකු අමූලිකවූ අන්තිමවස්තුවකින් චොදනා කෙරේනම් සඞ්ඝාදිසෙසයවේ. මෙහෙණකට චොදනාකෙරේ නම් දුක්කටයවේ. කුරුන්දියෙහි වනාහි මෙහෙණකට චොදනා කරන මහණහුට මුසාවාදයෙහි පාචිත්තියයි කියනලදි.

ඒ දුක්කට පාචිත්තිදෙක්හි මේ විමසීමය. 'මෙහෙණකට චොදනා කෙරේනම් දුක්කටයවේයයි ප්‍රථම මහාඅත්ථකථානයෙහි චොදනා කිරීමෙහි අදහස ඇතිබැවින් දුක්කටයම යෙදේ. මුසාවාදය ඇතිකල්හිද මහණක්හට අමූලික අන්තිම වස්තුවෙන් චොදනා කරන මහණහට සඞ්ඝාදිසෙසයවේ. මුසාවාදය ඇතිකල්හිද අපිරිසිදුවූවෙකුට ශුද්ධදෘෂ්ටි ඇතිව ආක්‍රොෂ කරන අදහසින් කියන්නහුට ඔමසවාදහෙතුවෙන්ම පාචිත්තියවේ. දැන බොරුකීමෙන්නොවේ. මෙහිද එසේ ආකොෂකරන අදහස ඇතිබැවින් දැන බොරු කීමෙහි පාචිත්තිය නොයෙදේ දුක්කටයම යුතුවේ. මෙහෙණකට චොදනා කරන මහණහට මුසාවාදය නිමිතිකොට පාචිත්තියවේයයි කුරුන්දියෙහි කියූ පශ්චිමනයෙහි, මුසාවාදයබැවින් පාචිත්තියම යෙදේ. බුදුරජුන් වදළ පාළිවචනය ප්‍රමාණ විසින් ගෙන චොදනාකරන අදහසින් මහණක්හට චොදනා කරන මහණහුට සඞ්ඝාදිසෙසයවේ. ආක්‍රොෂ කිරීමෙහි අදහස ඇත්තහුටද ඔමසවාදපාචිත්තියවේ. මහණහුට මෙහෙණකට චොදනා කිරීම නිමිතිකොට දුක්කටයවේයයි වචනයක් නැත්තේය. දැන බොරු කීමෙහි පාචිත්තියවේය යන වචනය ඇත්තේය. එහෙයින් පාචිත්තියම යෙදේ. එහෙයින් පාචිත්තියම යෙදේ යන ඒ වාදයෙහි මේ කාරණය පරීක්ෂා කටයුතුය. චොදනා කිරීමෙහි අදහස නැතිකල්හි පාචිත්තියවේ. එය ඇතිකල්හි කුමක් වියයුතුද:

යම්හෙයකින් එහි බොරු කියන්නහුට පාචිත්තිය සිද්ධකල්හිද අමූලික සඞ්ඝාදිසෙසයෙන් චොදනා කිරීමෙහි සම්පජාන මුසාවාදයෙන් වෙන්ව පාචිත්තිය කියනලද්දේද, එහෙයින් චොදනා කරන අදහස ඇතිකල්හි දැන බොරුකීම නිමිතිකොට ඇති පාචිත්තියට අවකාශයක් නොපෙනේ. චොදනා කරන්නහුට නිරාපත්තිය වන්නට නොහැකියයි පළමුනයම මෙහි ඉතා පිරිසිදුයයි වැටහේ. එසේ මෙහෙණක් මෙහෙණකට අමූලිකවූ අන්තිම වස්තුවකින් චොදනාකෙරේද සඞ්ඝාදිසෙසයවේ. මහණක්හට චොදනාකෙරේද දුක්කටයවේ. එහි සඞ්ඝාදිසෙසය උට්ඨානගාමීවේ. දුක්කටය දෙශනාගාමීවේ. මෙයින් නැසීමක් නැත්තේය. යම් හෙයකින් ඕතොමෝ ප්‍රකෘතියෙන්ම දුශ්ශීලවූ ලාමක මෙහෙණක දැන් තොමෝම දුශ්ශීල වෙමියි කිවුය. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ ඇය අපිරිසිදු බැවින්ම නැසූසේක.

**'අථ ඛො මෙත්තිය භුම්මජකා'** මෙසේ මෙත්තියා මෙහෙණ නසවු. මේ මහණුන්ද විමසවු'යි වදරා භාග්‍යවතුන්වහන්සේ හුනස්නෙන් නැගිට විහාරයට පිවිසිකල්හි ඒ භික්ෂූන් විසින් 'මැයට දැන් සුදුවත් දෙවු'යි නසනුලබන ඒ මෙහෙණ දැක ඒ මහණෝ ඇය මුදගණු කැමැතිබැවින් තමන්ගේ අපරාධය ප්‍රකාශ කළහ. මේ කරුණ දක්වනු පිණිස **'අථ ඛො මෙත්තියභුම්මජකා'** යනාදිය වදළසේක. **'දුට්ඨො දොසො'** දූෂිතවනලද්දේද දූෂණය කරන්නේදවේ. දෙසයක් උපන්කල්හි ඒ දෙසයෙන් පුද්ගලතෙමේ දූෂිතවේ. ප්‍රකෘතිභාවය හරවන ලද්දේය, එහෙයින් දුට්ඨයි කියනුලැබේ. අන්හුද දූෂණයකරයි. නසයි. එහෙයින් දෙස'යි කියනුලැබේ. මෙසේ 'දුට්ඨො, දොසො, යන මෙය එක්ම පුද්ගලයෙකුහුගේ ආකාරනානත්වයෙන් දැක්වීමය. එහෙයින් **'දුට්ඨො දොසොති දූසිතො චෙව දූසකො ච,** යනු කියනලද්දේය. එහි ශබ්දලක්ෂණ සෙවිය යුතුය. යම්හෙයකින් හෙතෙමේ දුට්ඨ, දෙසයි ගිනීමට ගියේද, එහෙයින් ප්‍රතිඝයෙන් යුක්ත පුද්ගලතෙමේ කුපිතාදිභාවයෙහි සිටියේමවේ. එහෙයින් මේ පදයේ පදභාජනයෙහි **'කුපිතො'** යනාදිය වදරනලද්දේය. එහි 'කුපිතො' කිපුණුබවට ප්‍රකෘතියෙන් ගිලිහුණුබවට පැමිණියේ. **'අනත්තමනො'** නොසතුටු සිතැත්තේ තමන්ගේ වශයෙහි නොපිහිටි සිතැත්තේ. නොහොත් ප්‍රීතිසුඛයෙන් නොසතුටුවූයේ. තම සිතැත්තේ නොවූයේ අනත්තමනනම. **'අනභිරද්ධො'** සුඛිත නොවූයේ නොපැහැදුනේ අනභිරද්ධ නම. ප්‍රතිඝයෙන් වැඩුණු සිත මොහුට ඇත්තේනුයි. **ආහතචිත්ත** නම. සිත්හි තදබව නමැති සිත්හි කසළැයි කියූ ප්‍රතිඝහුල් හටගත්තේ මොහුටනුයි **ඛීලජාත** නම. **'අප්පතීතො'** නොසතුටුවූයේ ප්‍රීතිසුඛයෙන් තොරවූයේ. ප්‍රීතිසුඛයෙන් යුක්ත නොවූයේය

යන අර්ථයි. පදභාජනයෙහි වනාහි යම් ධර්ම කෙනෙකුන්ගේ වසයෙන් නොසතුටුවේද, ඒ ධර්ම දක්වන්නට **'තෙනාච කොපෙන,** යනාදිය කියනලදය.

එහි **'තෙන ච කොපෙන'** යමකින් දුට්ඨය කුපිතයයි කියනලද්දේද මේ දෙකම ප්‍රකෘතිය දුරුකරවනබැවින් ඒකාකාරවේ. **'තෙන ච දොසෙන'** යම් දෙසයකින් දෙසයි කියනලද්දේද, මේ දෙපදයෙම සංඝකාරස්කන්ධයම දක්වනසේක. **'තාය ච අනත්තමනතාය'** යමකින් අනත්තමනයයි කියනලද්දේද, **"තාය ච අනභිරද්ධියා"** යමකින් අනභිරද්ධයයි කියනලද්දේද මේ දෙපදයෙන් වෙදනාස්කන්ධය දක්වනසේක. **'අමූලකෙන පාරාජිකෙන'** මෙහි මොහුට මුල් නැත්තේනුයි අමූලක නම. මොහුගේ ඒ අමූලකභාවය යම්හෙයකින් චොදකයාගේ වසයෙන් අදහස් කරන ලද්දේද, චුදිතකයා වසයෙන් අදහස් නොකරනලද්දේද, එහෙයින් එකරුණ දක්වන්නට පදභාජනයෙහි අමූලකය නම් නොදක්නාලද්දේය. නොඅසනලද්දේය. සැක නොකරනලද්දේයයි වදළසේක. එයින් යම් පාරාජිකයක් චොදකයා විසින් චුදිතපුද්ගලයා කෙරෙහි නොදක්නාලද්දේද නොඅසනලද්දේද නොසැකකරනලද්දේද මේ දැකීම් ඇසීම් සැකකිරීම්යි කියනලද මුල් නැතිබැවින් අමූලක නම. 'මෙතෙමේ එයට පැමිණියේ හෝ වේවා, නොපැමිණියේ හෝ වේවා, මෙය මෙහි අප්‍රමාණයයි මෙය දක්වනසේක. එහි **'අදිට්ඨං'** තමන්ගේ ප්‍රසාදචක්ෂුසින් හෝ දිව්‍යචක්ෂුසින් හෝ නොදක්නාලද්දේය. **'අසුතං'** එසේම කිසිවෙකු විසින් කියනුලබන්න නොඅසනලද්දේය. **'අපරිසඞ්කිතං'** සිතින් නොසැක කරනලද්දේය. **'දිට්ඨං'** තමන් විසින් හෝ අන්හු විසින් හෝ ප්‍රසාදචක්ෂුසින් හෝ දිවැසින් හෝ දක්නාලද්දේය. **'සුතං'** එසේම අසනලද්දේය. **'පරිසඞ්කිතමපි'** තමන් විසින් හෝ අන්හු විසින් හෝ සැක කරනලද්දේය. එහි තමන් විසින් දක්නාලද්ද දක්නාලද්දේමය. අන්හු විසින් දක්නාලද්ද, තමන් විසින් අසනලද්ද, අන්හු විසින් අසනලද්ද, අන්හු විසින් සැකකරනලද්දැයි මේ සියල්ලම තමන් විසින් අසනලද තැන්හිම සිටුනේය. සැකකරනලද්ද වනාහි දිට්ඨපරිසඞ්කිත - සුතපරිසඞ්කිත - මුතපරිසඞ්කිතයි ත්‍රිවිධවේ. එහි දිට්ඨපරිසඞ්කිතය නම්, එක් මහණෙක් මල මූ කිස කරණකොට ගම සමීපයෙහි එක් ලැහැබකට පිවිසියේ එක්තරා ස්ත්‍රියක්ද කියිකටයුත්තක් සඳහා ඒ ලැහැබට පිවිස පෙරළා හැරුනීය. මහණ, ඒ ස්ත්‍රිය නොදුටුයේමය. ස්ත්‍රීතොමෝද ඒ මහණ නොදුටුවාය. දෙදෙනාම උනුන් නොදැකම කැමතිදේ ලැහැමින් පිටත්ව ගියහ. එක්තරා මහණෙක් ඒ දෙදෙනාගේ එතැනින් නික්මීම සලකා එකාන්තයෙන් මොවුන් විසින් කරනලද්දේ හෝය. කරන්නාහුයි හෝ සැකකරයි. මේ වනාහි දිට්ඨපරිසඞ්කිත නම්වේ. සුතපරිසඞ්කිත නම් මෙහි ඇතැම් මහණෙක් අඳුරෙහි හෝ පිළිසන්

තැනක හෝ මාගමක සමග මහණක්හුගේ එබඳු පිළිසඳරබසක් අසයි. සමීපයෙහි අන් විද්‍යමනයක් ඇත්තේද නැත්තේදැයි නොදනියි. හෙතෙමේ 'ඒකාන්තයෙන් මොවුන් විසින් කරනලද්දේ හෝයි. නරත්නාහුයි හෝ සැකකරයි. මේ වනාහි සුතපරිසඞ්කිත නම්වේ. මුතපරිසඞ්කිත නම් බොහෝ ධූර්තයෝ රාත්‍රියෙහි මල් සුවඳ මස් සුරා ආදිය ස්ත්‍රීන් සමග එක් පිරිසර වෙහෙරකට ගොස් මණ්ඩපයක හෝ බොජුන්හල් ආදියෙහි හෝ සැපසේ කෙළ මල් ආදිය විසුරුවා ගියහ. පසුද මහණෝ ඒ විප්‍රකාරය දැක මේ කවරක්හුගේ වැඩක්දැයි සොයත්, එහිද පළමුකොට වත්හිසින් මණ්ඩපය හෝ බොජුන්හල හෝ පිළිදැගුම් කරන කිසි මහණකු විසින් මල් ආදීහු පහසනලද්දාහු වෙත්. කිසිවකු විසින් උපස්ථායක කුලයෙන් ගෙනෙනලද මල් ආදියෙන් පූජා කරනලද්දීවේ. කිසිවෙකු විසින් බෙහෙත් පිණිස අරිෂ්ට බොන ලද්දේවේ. එකල්හි මේ කවරෙකුගේ වැඩක්දැ'යි සොයන මහණෝ අත්හි ගඳද මුවගඳද, සිඹ ඒ මහණුන් සැකකරත්, මේ වනාහි මුතපරිසඞ්කිත නම්වේ.

එහි මුල් සහිතවූ දක්නාලද්දක් ඇත්තේය. මුල් රහිතවූ දක්නාලද්දක් ඇත්තේය. සංඥසමූලකවූ දක්නාලද්දක්ම ඇත්තේය. සංඥ අමූලකවූ දක්නාලද්දක් ඇත්තේය. අසනලද්දෙහිද මේ නයවේ. සැක කරනලද්දෙහි වනාහි මුල් සහිතවූ දක්නාලද සැකකරනලද්දක් ඇත්තේය. මුල්රහිතවූ දක්නාලද සැක කරනලද්දක් ඇත්තේය. සංඥ සමූලකවූ දක්නාලද සැක කරනලද්දක්ම ඇත්තේය. සුතමුතපරිසඞ්කිතයන්හි මේ නයවේ. එහි මුල් සහිතවූ දක්නාලද්ද නම් පාරාජිකයට පැමිණෙන්නහු දැකම මාවිසින් දක්නාලදැයි කියාද, අමූලිකය නම් පිළිසත් තැනකින් නික්මෙන්නහු දැක ව්‍යතික්‍රමයක් නොදැක මා විසින් දක්නාලදැයි කියාද, හේය. දක්නාලද්දවූම සංඥසමූලකය නම් දැකම දක්නාලද හැඟීම් ඇත්තේම චොදනා කෙරේද හේය. සංඥඅමූලකය නම් පෙර පාරාජිකව්‍යතික්‍රමයක් දැක පසුව නොදක්නාලද හැඟීම් ඇත්තෙක්වූයේය. හෙතෙමේ හැඟීමෙන් මුල්රහිත කොට මාවිසින් දක්නාලදැයි චොදනා කෙරේද හේය. මෙතයින් සුතමුතපරිසඞ්කිතයෝද විස්තරවශයෙන් දතයුත්තාහ. මෙහිද සියලු අයුරෙන්ම සමූලකයෙන් හෝ සංඥසමූලකයෙන් හෝ චොදනා කරන්නහුට ඇවැත්නොවේ. අමූලකයෙන් හෝ සංඥ අමූලකයෙන් හෝ චොදනා කරන්නහුටම ඇවැත්වේ. '**අනුද්ධංසෙය්‍ය**' නසන්නේය. ප්‍රකර්ෂයෙන් නසන්නේය. මැඩලන්නේය. යටපත් කරන්නේය. ඒ චෝදනා කිරීම යම්හෙයකින් තමා චෝදනා කරන්නේද අන්හු ලවා චෝදනා කරවන්නේද චෝදනා කෙරේමය. එහෙයින් පදභාජනයෙහි '**චොදෙති වා චොදපෙති වා**''යි වදළසේක. එහි '**චොදෙති**' 'පාරාජිකධම්මයට පැමිණියේ වෙහි'යි

යනාදි වචනයන්ගෙන් තෙමේ චොදනා කරයි. ඔහුගේ වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසයවේ. '**චොදපෙති**' තෙමේ සොලොස්රියන් පමණ සමීපයෙහි සිටි අන් මහණක්හට අණකරන්නේය. හෙතෙමේ ඔහුගේ වචනයෙන් ඔහුට චොදනා කරයි. චොදනා කරවුවහුට වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසයවේ. එකල්හි හෙතෙමේද මාවිසින් දක්නාලද්දක් අසනලද්දක් ඇතැයි චොදනා කෙරේද, දෙදෙනාහටම වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසයවේ.

චොදනාවෙහි ප්‍රභෙදකෞශල්‍ය පිණිසද මෙහි එකවස්තුක එකචොදකාදි චතුෂ්කය පළමුකොට දතයුත්තේය. එහි එක් මහණෙක්තෙමේ එක් මහණක්හට එක් වස්තුවකින් චොදනා කරයි. මේ චොදනාවට එක් වස්තුවක්වේ. එක් චොදකයෙක්වේ. බොහෝ මහණෝ එක් මහණක්හට එක් වස්තුවකින් චොදනා කෙරෙත්. පන්සියයක් මෙත්තියභුම්මජක ප්‍රමුඛවූ සවග මහණෝ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට මෙනි. මේ චොදනාවට එක් වස්තුවක්වේ. නොයෙක් චොදකයෝය. එක් මහණෙක්තෙමේ එක් මහණක්හට බොහෝ වස්තුන්ගෙන් චොදනා කරයි. මේ චොදනාවට නොයෙක් වස්තු ඇත. එක් චොදකයෙක්වේ. බොහෝ මහණෝ බොහෝ මහණුන්ට බොහෝ වස්තුන්ගෙන් චොදනා කෙරෙත්. මේ චොදනාවට නොයෙක් වස්තු වෙයි. නොයෙක් චොදකයෝ වෙත්. චොදනා කරන්නට කවරෙක් ලබාද, කවරෙක් නොලබාද, යත්:- දුර්වලචොදකයාගේ බස් ගැණීමෙන් කිසිවෙක් නොලබයි. දුර්වල චොදකයා නම්, බොහෝ දෙනා එක්ව කථා සලලාපයෙන් හුන්කල්හි එකෙක් එකෙකු අරබයා නොඋදෙසීමකොට පාරාජිකවස්තුවක් කියයි. අනිකෙක් එය අසා ගොස් අනිකාහට එකරුණ සැලකරයි. හෙතෙමේ ඔහු කරා එළඹ' තෝ මට මේ මේ කරුණු කියහයි කියයි. හෙතෙමේ 'මම මෙබන්දක් නොදනිමි. කථාප්‍රවෘත්තියෙහිදී උදෙසීමක් නොකොට කියනලද්දක් ඇත්තේය, ඉදින් මම තාගේ මේ දුඃඛොත්පත්තිය දන්නෙම් නම් මෙපමණකුදු නොකියන්නෙමි'යි කියාද, මෙතෙමේ දුර්වලචොදකවේ. ඔහුගේ මේ කථාසලලාපය ගෙන ඒ මහණහුට කිසිවෙක් චොදනා කරන්නට නොලබයි. මේ කථාසලලාපය නොගෙන සිල්වත් මහණතෙමේ මහණක්හට හෝ මෙහෙණකට හෝ, සිල්වත් මෙහෙණක්තොමෝ මෙහෙණකටම චෝදනා කරන්නට ලබායයි මහාපදුම ස්ථවිරයන්වහන්සේ කීහ. මහාසුමම ස්ථවිරයන්වහන්සේ පස්සහදැහැමියෝම චොදනා කරන්නට ලබත්හයි කීහ. ගොදත්ත ස්ථවිරයන්වහන්සේ කිසිවෙක් ලබායයි කියා '**භික්ඛුස්ස සුත්වා. චොදෙති භික්ඛුනියා සුත්වා චොදෙති -පෙ- තිත්ථියසාවකානං**

**සුත්වා චොදෙති**"යි මේ සූත්‍රය ගෙනහැර දැක්වූහ. තෙරුන් තුන්නමගේම වාදයෙහි චුදිතකයාගේම ප්‍රතිඥවෙන් කටයුත්තේය.

මේ චොදනාව නම් දූතයෙකු හෝ පතක් හෝ මුවහස්නක් හෝ යවා චොදනා කරන්නහුට කෙළවරට නොපැමිණේ. චොදනාව ලබන පුද්ගලයාගේ සමීපයෙහි සිට හස්තවිකාරයෙන් හෝ වාග්භේදයෙන් හෝ චොදනා කරන්නහුට කෙළ පැමිණේ. ශික්ෂාප්‍රත්‍යාඛ්‍යානයම හස්තමුද්‍රාවෙන් කෙළවරට නොපැමිණේ. මේ චොදනාකිරීම අභූතාරොචනයටද පැමිණේමය. යමෙක් දෙදෙනෙකු සිටි තැන එකෙකු නියමකොට චොදනා කරයි. ඉදින් හෙතෙමේ දනීනම් කෙළ පැමිණේ. අනිකා දැන ගනීනම් කෙළ නොපැමිණේ. දෙදෙනම නියමකොට චොදනා කෙරේද, එකෙක් හෝ දැනගනීවා, දෙදෙනාම දැන ගනිත්වා. කෙළ පැමිණේමය. සඞ්ඝාදිසෙසයවේය යන අදහසය. බොහෝ දෙනකෙරෙහි මේ නයවේ. එකෙණෙහිම දැනගැන්ම දුෂ්කරවේ. අන් කලෙක ආවජ්ජනයකොට දත්කල්හිද දන්නාලද්දේමවේ. පසුව දැනගණීනම් කෙළනොපැමිණේ. සික්ඛාපච්චක්ඛාන අභූතාරොචන-දුට්ඨුල්ලවාචා-අත්තකාම-දුට්ඨදෙස-භූතාරොචන ශික්ෂාපද යන මේ සියලු ශික්ෂාපද එක්ම පිරිසිඳීම් ඇත්තේය. මෙසේ කායවාචාවසයෙන් මේ චොදනා ද්විවිධ වන්නීද නැවත දිට්ඨචොදනා ශ්‍රුතචොදනා පරිසඞ්කිතචොදනායි ත්‍රිවිධ වන්නීය. අන්‍යවූද චොදනා සීලවිපත්තිචොදනා ආචාරවිපත්තිචොදනා දිට්ඨිවිපත්තිචොදනා ආජීවවිපත්තිචොදනායි' චතුර්විධය. එහි ගරුකවූ උභයාපත්තිස්කන්ධයන්ගේ වසයෙන් සීලවිපත්තිචොදනා දතයුතුය. සෙසු ලහුකාපත්තීන්ගේ වසයෙන් ආචාරවිපත්තිචොදනා දතයුතුය. මිච්ඡාදිට්ඨි අන්තග්ගාහිකදිට්ඨි වසයෙන් දිට්ඨිවිපත්තිචොදනා දතයුතුය. ආජීව හෙතුවෙන් පැණවූ ෂට්ශික්ෂාපදයන්ගේ වසයෙන් ආජීවවිපත්ති චොදනා දතයුතුය.

අතිකුදු චොදනාවක් තොමෝ වත්ථුසන්දස්සනා - ආපත්තිසන්දස්සනා - සංවාසපටික්ඛෙප - සාමීචිපටික්ඛෙපයි චතුර්විධවෙයි. එහි වත්ථුසන්දස්සනා නම් 'තෝ මෙවුන්දම් සෙවියෙහි, නොදුන් දෙය ගත්තෙහි, මිනිසෙකු මැරූයෙහි, උතුරුමිනිස්දම් පැවසූයෙහියි මෙසේ පැවති ආපත්තිසන්දස්සනා නම් 'තෝ මෙවුන්දම් පරිජි ඇවැතට පැමිණියෙහියි මේ ආදිනයින් පැවතිණී. සංවාසපටික්ඛෙප නම්, 'තාසමග උපොසථයක් හෝ පවාරණයක් හෝ සඞ්ඝකර්‍මයක් හෝ නැතැයි මෙසේ මෙපණකින් කෙළ නොපැමිණේ. 'අශ්‍රමණයෙක් වෙහි, අශාක්‍යපුත්‍රයෙක් වෙහියි යනාදි වචනයන් සමග ගැටුණු කල්හිම කෙළපැමිණේ. සාමීචිපටික්ඛෙප නම්, වැඳීම, දැක හුනස්නෙන් නැගීසිටීම, ඇඳිලිබැඳීම පවන්සැලීම් ආදි ක්‍රියා නොකිරීමය.

පිළිවෙළින් වැඳීම් ආදිය කරන්නහුට, එකෙක්හට නොකොට සෙසු මහණුන්ට කරනකල්හි එය දතයුතුය. මෙපමණකින්ද චොදනා නම්වෙයි. ඇවැත කෙළනොපැමිණේ. කුමක් හෙයින් මම වැඳීම් ආදිය නොකෙරෙහිදැ'යි විචාළකල්හි 'අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රයෙහි, යනාදි වචන සමග ගැටූකල්හිම කෙළපැමිණේ. කැඳබත් ආදියෙන් යමක් කැමැත්තේද, එය විචාරාද එපමණකින් චොදනාව නොවේ.

පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකයෙහි 'මහණෙනි' එක් පාමොක් තැබීමෙක් ධාර්මිකය. එක් පාමොක් තැබීමෙක් අධාර්මිකයයි ආදිකොට අධාර්මිකවූ පාමොක් තැබීම් දසයෙක, ධාර්මිකවූ දසයෙකැයි මෙසේ අධාර්මිකයෝ පස් පණසෙක, ධාර්මිකයෝ පස් පණසෙකැයි දසයකින් වැඩි සියයක් අන්‍යවූද චොදනා වදරනලදහ. ඒ චොදනාවෙන් දැකීමෙන් චොදනා කරන්නහුට දසයෙන් වැඩි සියයෙක, ඇසීමෙන් චොදනා කරන්නහුට දසයෙන් වැසිසියයෙක, සැකයෙන් චොදනා කරන්නහුට දසයෙන් වැඩි සියයෙකැයි තුන්සියතිසක් වෙත්. ඒ තුන්සිය තිස කයින් චොදනා කරන්නහුට, වචනයෙන් චොදනා කරන්නහුට, කය වදන් දෙකින් චොදනා කරන්නහුටයි තුනෙන් ගුණකරනලද්දහු නවසිය අනූවක් ඒ චොදනා නවසිය අනූව, තමන් විසින් චොදනා කරන්නහුටද අන්හු ලවා චොදනා කරවන්නහුටද එපමණමැයි. විස්සක් අඩු දෙදහසක්වේ. නැවත දිට්ඨාදිභෙදයෙහි සමූලක අමූලක වසයෙන් දහස් ගණන් චොදනා වෙයි දතයුත්තාහ.

මෙතැන සිට අට්ඨකථාවෙහි 'උපාලි චොදනා කරනු කැමති මහණනු විසින් අඞ්ගපසකින් යුත් චොදනාව කටයුතුයයිද, උපාලි අන්හට චොදනාකරනු කැමති චොදක භික්‍ෂුහු විසින් ධම්පසක් තමසතන්හි ප්‍රත්‍යවෙක්‍ෂාකොට අනිකෙක් චොදනා කටයුත්තේයයිද, මෙසේ උපාලිපඤ්චකාදීන් අතුරෙහි වදළ බොහෝ සූත්‍ර ගෙනහැර දක්වා අත්තාදනලක්‍ෂණයද චොදකවතද චුදිතකවතද සඞ්ඝයා විසින් කළයුතු කෘත්‍යයද අනුවිජ්ජකවතද යන සියල්ල විස්තර විසින් කියනලද්දේය. අපි එය ආතන්හිම වර්ණනා කරන්නෙමු. කියූ ප්‍රභෙද ඇත්තාවූ මේ චොදනාවන් අතුරෙහි යම්කිසි චොදනාවක් වසයෙන් සහමැදට වසනුව බටකල්හි 'තෙපි අපගේ විනිශ්චයෙන් තුටුවන්නහුදැයි චුදිත චොදකයෝ විචාළ යුත්තාහුය. ඉදින් තටුවන්නෙමුයි කියත්නම් සඞ්ඝයා විසින් ඒ අධිකරණය පිළිගතයුතුය. තවද 'ස්වාමිනි', විනිශ්චය කළ මැනව, අපට රුච්චන්නේ නම් ගන්නෙමුයි කියත්ද, 'සෑ වදිවු' යනාදිය කියා කල් හැර කළයුතු කටයුත්තක්කොට හැරියයුතුය. ඔවුහු බොහෝකලක් වෙහෙසට පත්වූවාහු, ගිය පිරිස් ඇත්තාහු, සුන් පක්‍ෂ ඇත්තෝව නැවත

යාඥා කරත්නම් තුන්යල දක්වා ප්‍රතික්ෂෙපකොට යම්කලෙක මදරහිත වෙත්ද, එකල්හි ඔවුන්ගේ අධිකරණය විනිශ්චය කටයුතුය. විනිශ්චය කරත්තවුන් විසින්ද අලජ්ජීන් අධිකවූ පිරිසක් වන්නීද සම්මතකරගත් පිරිස විසින් ඒ අධිකරණය විනිශ්චය කටයුතුය. ලොල් මහණුන් අධික පිරිසක් වන්නීද 'තොපට සභාග විනයධරයන් සොයවූ'යි විනයධරයන් සොයවා යම් ධර්මයකින් යම් විනයකින් යම් ශාස්තෘශාසනයකින් ඒ අධිකරණය සන්සිඳේද, එසේ ඒ අධිකරණය සන්සිඳවියයුතුය.

එහි 'ධර්ම' යනු විද්‍යමාන වස්තුවයි. 'විනය' යනු චොදනාව හා සිහිකරවීමයි. 'ශාස්තෘශාසන' නම් ඥත්තිසම්පත්තිය හා අනුසාවණසම්පත්තියයි. එහෙයින් චොදනා කරන්නහු විසින් වස්තුව සැලකළකල්හි 'මේ කරුණ විද්‍යමානද අවිද්‍යමානදැයි චොදනාලද පුද්ගලතෙමේ විචාළයුතුය. මෙසේ වස්තුව පරීක්ෂාකොට විද්‍යමාන වස්තුවෙන් චොදනාකොට සිහිකරවා ඥත්තිසම්පත්තියෙන්ද අනුසාවණසම්පත්තියෙන්ද ඒ අධිකරණය සන්සිඳවියයුතුය. එහි අලජ්ජියෙක් ලජ්ජියෙකුට චොදනා කෙරේනම් ඒ අලජ්ජී තෙමේත් බාලවේද, අව්‍යක්තවේද, මොහුට නය නොදියයුතුය. 'මෙසේ කවර වස්තුවෙක්හි ඔහුට චොදනා කෙරෙහිදැයි විචාළයුතුය. ඒකාන්තයෙන් ඒ අලජ්ජී චොදකතෙමේ 'ස්වාමිනි' 'කිම්හි යන මේ වචනය නම් කිමැයි කියා දන්නේය. තෝ "කිම්හි නං" යන මේ වචනය නම් කිමැයි කියා දන්නේය. තෝ 'කිම්හි නං' යන මේ වචනය නොදන්නේය. මෙබඳු බාලයා විසින් අන්හට චොදනා කරන්නට නොසුදුසුය'යි යැවියයුත්තේය. මොහුට පුච්ඡා පටිපුච්ඡා නොදියයුතුය. ඒ අලජ්ජී චොදකතෙමේ පණ්ඩිතවේද, ව්‍යක්තවේද දක්නාලද්දෙන් හෝ අසනලද්දෙන් හෝ යටපත්කොට සම්පාදනය කරන්නට හැක්කේවේද, මොහුට පෘච්ඡා ප්‍රතිපෘච්ඡාව දී ලජ්ජීහුගේම ප්‍රතිඥවෙන් කර්මය කටයුතුය. ලජ්ජියෙක් තෙමේ අලජ්ජියෙකුට චොදනා කෙරේනම් ඒ ලජ්ජී තෙමේත් බාලවේද, අව්‍යක්තවේද, අනුයොගය දෙන්නට නොහැක්කේවේද, ඔහුට නය දියයුතුය. 'කවර වස්තුවක ඔහුට චොදනා කෙරෙහිද, සීල විපත්තියෙන් හෝ ආචාරවිපත්ති ආදීන් අතුරෙහි එකක් පිළිබඳදැයි විචාළයුතුය. කුමක් හෙයින් මොහුටම මෙසේ නය දියයුතුද, අනිකක්හට නොදිය යුතුද, විනයධරයන්ගේ අගතිගමන අයුතු නොවේද, අයුතුමවේ. මේ වනාහි අගතිගමනක් නොවේ. මෙය ධර්මානුග්‍රහයෙක්වේ. අලජ්ජීන්ට නිග්‍රහ පිණිසද ලජ්ජීන්ට ප්‍රග්‍රහය පිණිසද ශික්ෂාපද පණවනලද්දේය. එහි අලජ්ජීතෙමේ නය ලැබ එන්නේය. ලජ්ජී වනාහි නය ලැබ දක්නාලද්දෙහි දක්නාලද නියමයෙන්ද අසනලද්දෙහි අසනලද නියමයෙන්ද පිහිටා කියන්නේය. එහෙයින් ඒ ලජ්ජීහට ධර්මානුග්‍රහය වටියි. ඉදින් ඒ ලජ්ජීතෙමේ

පණ්ඩිතවේද, ව්‍යක්තවේද, පිහිටා කියාද, අලජ්ජීතෙමේත් මෙයද නැත්තේය, මෙයද නැත්තේයයි ප්‍රතිඥා නොදේද, අලජ්ජීහුගේම ප්‍රතිඥාවෙන් නොකටයුතුය. ඒ අර්ථය දක්වනු පිණිසද මේ වස්තුව දතයුතුය.

ත්‍රිපිටකචූලාභය ස්ථවිරයන්වහන්සේ ලෝවාමහපහය යට මහණුන්ට විනය කියා සවස නැගී සිටියි. උන්වහන්සේ නැගීසිටුනා කාලයෙහි විවාදවස්තු සඞ්ඛ්‍යාත අර්ථයෙහි පටහැනිවූ දෙදෙනෙක් කතාවක් පැවැත්වූහ. එකෙක් මෙයද නැත, මෙයද නැතැයි ප්‍රතිඥාවක් නොදෙයි. එකල්හි පළමු යම මදක් ඉතිරිව තිබියදී තෙරුන්හට මෙතෙමේ ඒ පුද්ගලයා කෙරෙහි පිහිටා කියයි. මෙතෙමේ ප්‍රතිඥා නොදෙයි, බොහෝ වස්තූහුද ඉදිරිපත්වූහ. ඒකාන්තයෙන් මේ කර්මය කරනලද්දේ වන්නේයයි ඒ පුද්ගලයා කෙරෙහි අශුද්ධලබ්ධියක් උපන. ඉක්බිති විජිනිද්‍රාවයෙන් නොසේදූ පාතබන පුවරු තුඩින් සංඥා දී ඇවැත්නි' මම විනිශ්වය කරන්නට නොසුදුසු වෙමි. අනිකෙකුලවා විනිශ්වය කරවයි කීයේය. 'ස්වාමීනි, කුමක් හෙයිනැයි විචාළ කල්හි ස්ථවිරතෙමේ එකරුණ වදළේය. චෝදනා ලද පුද්ගලයාගේ කයෙහි ඩහ නැංගේය. ඉන්පසු හෙතෙමේ තෙරුන් වැද, 'සවාමිනි', විනිශ්වය කරන්නට සුදුසු විනයධරයෙකුනම් ඔබවහන්සේ වැනියකුම වන්නට වටියි චෝදකද මෙවැනිම වන්නට වටීයයි කියා සුදුවත් ඇඳ 'බොහෝ කල්ක් මාවිසින් වෙහෙසට පත්කරනලදැයි කමා කරවා ගියේය. මෙසේ ලජ්ජීහු විසින් චෝදනා කරනු ලබන අලජ්ජීතෙමේ බොහෝ වස්තූන් උපන්කල්හි ප්‍රතිඥා නොදෙන්නේය. හෙතෙමේ නොම පිරිසිදුයයි කියයුත්තේය. අපිරිසිදුයයිද නොකිය යුත්තේය. මේ තෙමේ දිවිඇති මැරුණෙක් නම. අමුවුනු කුණුවූවෙක් නම. ඉදින් මොහුට අන්‍යවූද එබඳු වස්තුවක් උපදීද, විනිශ්වය නොකටයුතුය. එසේ ඇතිකල්හි නසනලද්දෙක් වන්නේය. අලජ්ජීයෙක්ම අලජ්ජීයෙකුට චෝදනාකෙරේද, ඇවත "තාගේ වචනයෙන් මෙතෙමේ කිසිවක් කියන්නට හැකිදැ"යි කියයුතුය. අනිකාහටද එසේම කියා දෙදෙන එක් සමෙහාගපරිභොග ඇත්තෝව ජීවත්වනුයි හැරිය යුත්තාහ. සීලය පිණිස ඔවුන්ගේ විනිශ්වය නොකටයුතුය. පාසිවුරු පිරිවෙන් ආදිය පිණිස සුදුසු සාක්ෂ්‍යයක් ලැබ විනිශ්චය කටයුතුය.

නැවත ලජ්ජියෙක්තෙමේ ලජ්ජියෙකුට චෝදනා කෙරේද, ඔවුන්ගේ විවාදය කිසිත් වස්තුවෙක්හි ස්වල්පමාත්‍රවේද, "හභවා 'මෙසේ නොකරවු'යි වරද දෙසවා පිටත්කළයුතුය. නැවත මෙහි චූදිතකයා විසින් වහා තම දෙස් වසනු පිණිස බොරුවක් කියා වරදනලද්දේවේද, මුලපටන් අලජ්ජියෙක් නම් නැත්තේය. හෙතෙමේද පක්ෂානුරක්ෂණය පිණිස ප්‍රතිඥා නොදේද, 'අපි අදහමු, අපි අදහමු'යි බොහෝ දෙන නැගී සිටිත්ද, හෙතෙමේ ඔවුන්ගේ ප්‍රතිඥාවෙන් එක්වරක් දෙවරක් පිරිසිදුවේවා. එහෙත් වැරදුණු

කාලයෙහි පටන් යථා ස්ථානයෙහි හෙවත් ලජ්ජී ස්ථානයෙහි නොසිටියි. අලජ්ජීභාවයට පැමිණීබැවින් විනිශ්චය නොදියයුත්තේය.

මෙසේ යම්කිසි චොදනාවක් වසයෙන් වස්තුව සඟමැදට බැසසිටිකල්හි චුදිත චොදකයන් කෙරෙහිවූ පිළිවෙත දැන එම චොදනාවෙහි සම්පත් විපත් හෙදය දැනගණු පිණිස ආදි මධ්‍ය පර්‍ය්‍යවසානාදීන්ගේ වසයෙන් විනිශ්චය දතයුතුය. ඒ කෙසේද යත්: චොදනාවෙහි ආදිය කවරේද? මැද කිම, අවසන කවරේද, චොදනාවෙහි මම ඹහුට කියනු කැමත්තෙමි. 'ආයුෂ්මත්තෙමේ මට අවකාස කෙරේවා'යි මෙසේ අවකාස කිරීම ආදියවේ. අවතීර්‍ණවස්තුවෙන් චොදනාකොට සිහිකරවා විනිශ්චය කිරීම මදධ්‍යවේ. ආපත්තියෙහි හෝ අනාපත්තියෙහි හෝ පිහිටුවීමෙන් සන්සිඳවීම පර්‍ය්‍යවසානයවේ. චොදනාවට මූලයෝ කෙතෙක්ද, වස්තූහු කෙතෙක්ද, භූමිහු කෙතෙක්ද යත්: චොදනාවට සමූලිකවූ හෝ අමූලිකවූ මුල් දෙකකි. දිට්ඨ ශ්‍රැත පරිසඞ්කිතයි වස්තු තුනකි. අවකාශ කරවා කාලයෙහි කියන්නෙමි, සලාකගගයාගූ අගගභික්ඛාචාරස්ථානාදියෙහි චොදනාකරන්නේ අකාලයෙහි නොකියන්නෙමි. විද්‍යමානයෙන් කියන්නෙමි, අවිද්‍යමානයෙන් නොකියන්නෙමි, සිලිටුවචනයෙන් කියන්නෙමි, පරුෂවචනයෙන් නොකියන්නෙමි. අර්ථසංහිතයෙන් කියන්නෙමි. අනර්ථසංහිතයෙන් නොකියන්නෙමි. මෛත්‍රීසිත් ඇත්තේ කියන්නෙමි, ද්වේෂසිත් ඇත්තේ නොකියන්නෙමියි භූමිපසෙකි. මේ චොදනාවෙහි චොදකපුද්ගලයා විසින් පිරිසිදු කායසමාචාර ඇත්තෙම්ද, නැත්තෙම්දැයි යනාදිනයින් උපාලි පඤ්චකයෙහි කියූ පරිසුද්ධකායසමාචාරතා, වචීසමාචාරතා, සබ්‍රහ්මචාරීසුමෙත්තචිත්තතා, බහුස්සුතතා, උභින්නං පාතිමොක්ඛානං ස්වාගතතා, 'කාලෙන වක්ඛාමි'යි ආදිවිසින් කියූ ධර්‍මපස, කාරුණ්‍යතා, හිතෙසිතා, අනුකම්පකා, ආපත්තිවුට්ඨානතා, විනයපුරෙක්ඛාරතා පසළොස් ධර්‍මයන්හි පිහිටාගතයුතුය. චුදිතකයා විසින් වාක්සත්‍යයෙහි හා නොකිපීමෙහිද යන ධර්‍ම දෙක්හි පිහිටිය යුතුය.

**'අපෙපවනාම තං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍යං'** ඒ පුද්ගලයා මේ ශ්‍රේෂ්ඨ චර්‍ය්‍යයෙන් ච්‍යුත කරන්නෙමි නම් මැනව. ඉදින් මම මේ පුද්ගලයා මේ ශ්‍රේෂ්ඨ චර්‍ය්‍යයෙන් ච්‍යුත කරන්නෙමි නම් ඒකාන්තයෙන් යහපත් වන්නේය. යන මේ අදහසින් චොදනා කරන්නේයයි වදරනලද්දේවේ. පදභාජනයෙහි වනාහි 'බ්‍රහ්මචරියා චාවෙය්‍යං'යි මේ බ්‍රහ්මචර්‍ය්‍යයගේම පර්‍ය්‍යායමාත්‍රයක් දක්වනු පිණිස **'භික්ඛුභාවා චාවෙය්‍යං'** යනාදිය වදළසේක. ඛණාදීහු කාලවෙවචනයෝය. **'තං ඛණං තං ලයං තං මුහුත්තං වීතිවත්තෙති'** ඒ ක්‍ෂණය ඒ කාලය ඒ මොහොත ඉක්මුණුකල්හි මෙය ආධාරාර්ථයෙහි උපයොගවචනයි.

සමනුග්ගාහියමාන නිදේශයෙහි - **'යෙන වත්ථුනා අනුද්ධංසිතො හොති'** චතුර්විධපාරාජිකවස්තූන් අතුරෙහි යම් වස්තුවකින් චෝදකයා විසින් චුදිතකතෙමේ චෝදනා කරනලද්දේවේද, මඩිනලද්දේවේද, යටපත් කරනලද්දේවේද, **'තස්මිං වත්ථුස්මිං සමනුග්ගාහියමානො'** චෝදකයා විසින් ඒ කියූ වස්තුවෙහි ඒ චෝදකතෙමේ අනුවිජ්ජකයා විසින් තා විසින් කුමක් දක්නාලදද, තාවිසින් කුමකැයි දක්නාලදදැයි ආදී නයින් විචාරනු ලබන්නේය. විමසනු ලබන්නේය. පරීක්‍ෂා කරනු ලබන්නේය. අසමනුග්ගාහියමාන නිදේශයෙහි - **'න කෙනචි වුච්චමානො'** අනුවිජ්ජකයා විසින් හෝ අන් කිසිවෙකු විසින් හෝ, නොහොත් දිට්ඨාදිවස්තූන් අතුරෙහි කිසිවෙකින් නොකියනු ලබන්නේය. මේ මාතෘකා පදදෙක්හි පසු භාගයෙහි **'භික්ඛු ච දොසං පතිට්ඨාති,** යන මෙය හා සම්බන්ධය දතයුතුය. **'එවං සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා භික්ඛු ච දොසං පතිට්ඨාති පටිච්ච තිට්ඨති පටිජානාති සඞ්ඝාදිසෙසො'**යි මෙයම වදරනලදි. මෙද අමූලක භාවයාගේ ප්‍රකටකාලය දක්වනු පිණිසම වදරනලදය. චෝදනාකළ කෙණෙහිම ඇවැතට පැමිණේ.

දැන් **'අමූලකඤ්චෙව තං අධිකරණං හොති'** යන මෙහි යම්හෙයකින් අමූලකලක්‍ෂණය පෙර කියනලද්දේද, එහෙයින් එය නොකියා පෙර නොකියනලද්දක්ම දක්වනු පිණිස 'අධිකරණං නාම' යනාදිය කීහ. එහි යම්හෙයකින් අධිකරණය අධිකරණාංර්ථයෙන් එකක්වූයේද, වස්තු වශයෙන් නොයෙක් අර්ථඇත්තේද, එහෙයින් මොහුගේ ඒ නානාත්වය දක්වනු පිණිස **'චත්තාරි අධිකරණානි විවාදධිකරණං'** යනාදිය කීහ. ඒ අධිකරණාර්ථය වනාහි කවරේදයත්:- යම්හෙයකින් මේ අධිකරණර්ථය සමථයන්ගෙන් සන්සිඳවියයුතු අර්ථයෙන් එකක්වේද එහෙයින් යමක් ප්‍රධානකොට සමථයෝ පවතිත්ද, ඒ අධිකරණයයි දතයුතුය. අර්ථකථාවන්හි වනාහි අධිකරණයයි ඇතැම් කෙනෙක් 'අදුවලාට චෝදනා කරන්නෙමි' යන සිතින් චෝදනා කරන ආකාරය ගැනීමයයි කියත්. ඇතැම් කෙනෙක් චෝදනා කරන්නෙමියි උපන් චිත්තව්‍යාපාර සඞ්ඛ්‍යාතවූ චෙතනාවයයි කියත්. ඇතැම් කෙනෙක් චුදිතකයා පිළිබඳ විපත දැක උපන් අසහනය හෝ එසේ පැවති යම් කිසි චිත්ත චෛතසික රාශියක් හෝ කියත්. ඇතැම් කෙනෙක් චෝදනාවශප්‍රවෘත්ත වචනයයි කියත්. ඇතැම් කෙනෙක් චෝදනාවශප්‍රවෘත්ත චිත්තයෙන් පරිකල්පිත නාම ප්‍රඥප්තියයි කියත්. නැවත මෙසේ විචාරණය කරනලදි. ඉදින් ආකාරය ගැනීම අධිකරණය වේනම්, එකෙක් චෝදනාව සිතින් ගෙන සභාග මහණෙකු සමග මන්ත්‍රණය කරන්නේ එහි ආදීනවය දැක නැවත අත්හරීද, ඔහුගේ ඒ ග්‍රාහලක්‍ෂණ අධිකරණය සමථයට පැමිණියෙක් වන්නේද,

ඉදින් චොදනා කරන්නෙමියි උපන් චිත්තව්‍යාපාරසඞ්ඛ්‍යාතවූ චෙතනාව අධිකරණය වේනම්, මේ සිතින් ගත් චොදනාව ගනිමියි උපන් චෙතනාව නිරුද්ධවේද, ඉදින් චුදිතකයා පිළිබඳ විපත දැක උපන් අසහනය අධිකරණය වේනම්, නොඉවසීමෙන් චිත්තචොදනාව ගෙනද මැනභාගයෙහි විනිශ්චයක් නොලබමින් හෝ කමා කරවනලද්දේ හෝ අත්හරීද, ඉදින් චොදනාවශප්‍රවෘත්ත වචනය අධිකරණයවේනම්, කියමින් ඇවිද මැන භාගයෙහි නිශ්ශබ්දවේද, නිහඬවේද, මෙසේ මොහුගේ ඒ නිහඬවීම නම්වූ අධිකරණය සමථයට පැමිණියෙක් වන්නේද, එහෙයින් චොදනාවශප්‍රාප්ත නාමප්‍රඥප්තිය අධිකරණයයි කියත්. ඒ මේ ප්‍රඥප්ති අධිකරණය වනාහි 'මෛථුනධර්ම පාරාජිකාපත්තිතොමෝ මෛථුනධර්මපාරාජිකාපත්තියට තදභාගියවේ. -පෙ- මෙසේ ආපත්තාධිකරණයට ආපත්තාධිකරණය තදභාගීයයිද, විවාදධිකරණය කිසිකලෙක කුසලයවේ. කිසි කලෙක අකුසලයවේ, කිසිකලෙක අව්‍යාකෘතවේයයිද යන මේ ආදිය සමග විරුද්ධවේ. ඒ අර්ථකථාචාර්‍ය්‍යයෝ ප්‍රඥප්තිය පිළිබඳ කුසලාදිභාවය නොකැමැති වෙත් 'අමූලකෙන පාරාජිකෙන ධම්මෙනයි මෙහිආ පාරාජිකාපත්තිය ප්‍රඥප්ති නම් නොවන්නීය. කුමක් හෙයිනද යත්: ලොකවද්‍ය හෙයින් පාරාජිකාපත්තිය ඒකාන්ත අකුසල්බැවිනි.

ආපත්තාධිකරණය කිසි කලෙක අකුසලයවේ, කිසි කලෙක අව්‍යාකෘතයවේයයි මෙය කියනලද්දේමය. '**අමූලකෙන පාරාජිකෙන**' යන මෙහි යම් මේ අමූලක පාරාජිකයක් දක්වන ලද්දේද, ඔහුගේම මේ අමූලකං චෙව තං අධිකරණං හොති' යනු ප්‍රතිනිර්දේශයවේ. ප්‍රඥප්තියේ ප්‍රතිනිර්දේශය නොවේ. ප්‍රඥප්තියෙන් අනිකක් දක්වා නැවත අනිකක් ප්‍රතිනිර්දේශය නොකරන්නේය. යම්හෙයකින් යම් ප්‍රඥප්තියකින් යම් අභිලාපයකින් චොදකයා විසින් ඒ පුද්ගලතෙමේ පාරාජිකාපත්ති සංඛ්‍යාත අධිකරණයට මුල් නැතිබැවින් ඒ ප්‍රඥප්තියද අමූලිකවේ. අධිකරණයෙහි පැවතිබැවින්ද අධිකරණවේ. එහෙයින් මේ පර්‍ය්‍යායයෙන් ප්‍රඥප්තිය අධිකරණයයි යෙදෙන්නේද යම්හෙයකින් හෝ යමක් අමූලක නම් අධිකරණයවේද, එය ස්වභාවයෙන් නැත්තේද, ප්‍රඥප්ති මාත්‍රයක්ම ඇත්තේද, එහෙයිනුදු ප්‍රඥප්තිය අධිකරණයයි යෙදෙන්නේය. ඒද මේ ශික්ෂාපදයෙහිමවේ. හැමතන්හි නොවේ. විවාදදීන් පිළිබඳ ප්‍රඥප්තියෙහි අධිකරණාර්ථය නොවේ. අධිකරණාර්ථය වනාහි ඔවුන්ගේ පෙර කියූ සමථයන්ගෙන් සමථය කටයුතුබවය. මෙසේ මේ අධිකරණාර්ථයෙන් මෙහි සමහර විවාදයෙන් විවාදයදවේ. අධිකරණයදවේයයි විවාදධිකරණනම්. සෙසු තන්හිද මේ නයවේ. ඒ විවාදධිකරණයෙහිලා 'මෙ ශාසනයෙහි භික්ෂූහු අධර්මය ධර්මයයි හෝ ධර්මය අධර්මයයි හෝ

විවාද කෙරෙත්ද, යන මෙසේ අටළොස් භෙදකර වස්තූන් නිසා උපන්නාවූ විවාදය විවාදාධිකරණ නම්. 'මේ ශාසනයෙහි මහණකෙනෙක් මහණක්හට සීලවිපත්තියෙන් චොදනා කෙරෙත්ද, ආක්‍රොශ කෙරෙත්ද, මෙසේ සිවුවිපත් නිසා උපන්නාවූ ගැරහීම ආක්‍රොශ කිරීම අනුවාදධිකරණ නම්. පඤ්චාපත්තිස්කන්ධයෝ ආපත්තාධිකරණ නම්. සප්තාපත්තිස්කන්ධයක්ද ආපත්තාධිකරණයයි මෙසේ ආපත්තියම ආපත්තාධි කරණනම්. සඞ්ඝයා විසින් කටයුතු ඉටුකළයුතු අපලොකනකර්මඥප්තිකර්ම ඥප්තිද්විතියකර්ම, ඥප්තිචතුර්ථ කර්මයි මෙසේ සිවුවැදෑරුම්වූ සඞ්ඝකෘත්‍යය කිච්චාධිකරණයි දතයුතුය. මේ අර්ථයෙහි වනාහි පාරාජිකාපත්තිසඞ්ඛ්‍යාත ආපත්තාධිකරණයම අදහස් කරනලද්දේය. සෙස්සෝ අපේක්ෂාධාරවශයෙන් කියනලදහ. අධිකරණ ශබ්දයාගේ අර්ථ මෙපමණක්ම වෙයි. ඔවුනතුරෙහි පාරාජිකයම මෙහි අදහස් කරනලදි. එය දිට්ඨාදි මූලයන්ගෙන් අමූලකවූම අධිකරණයවේ. මේ මහණතෙමේ දෙෂයෙහි පිහිටාද නිසා සිටීද 'මා විසින් හිස්වූවක් කියනලද්දේයයි යනාදිය කියමින් පිළිදනීද ඒ මහණහුට චොදනා කළ කෙණෙහිම සඞ්ඝාදිසෙසයවේ. මේ වනාහි පදභාජනසහිතවූ ශික්ෂාපදයන්හි අර්ථයවේ.

දැන් සැකෙවින් ඒ නොදක්නා ලද්දවූ චොදනාවස්තූහු කියනලදහ. ඔවුන්ගේ වසයෙන් විස්තර විසින් ඇවැත නගා දක්වනසේක් '**අදිට්ඨස්ස හොති**' යනාදිය වදළසේක. එහි 'අදිට්ඨස්ස හොති' මේ චොදකයා විසින් නොදක්නා ලද්දේවේ. ඒ පුද්ගලතෙමේ පාරාජිකාපත්තියට පැමිණෙන්නේය යන අර්ථයි '**අස්සුතස්ස හොති**' යනාදියෙහිද මේ නයවේ. '**දිට්ඨො මයා**' මා විසින් දක්නා ලද්දේවෙහියි කියනලද්දේවේ. '**සුතො මයා**' යනාදියෙහිද මේ නයවේ. සෙස්ස අදිට්ඨමූලකයෙහි ප්‍රකට අර්ථ ඇත්තේමය. දිට්ඨමූලකයෙහි වනාහි '**තං චෙ චොදෙති සුතො මයා**' ඉදින් ඔහුට චොදනා කෙරේද මා විසින් අසනලද්දේයයි මෙසේ කියූ, සුතාදීන්ගේ අභාවයෙන් අමූලකබව දතයුත්තේය. මේ සියලු චොදකවාරයෙහිම යම්සේ මෙහි ආ 'පාරාජිකාපත්තියට පැමිණියෙහිය, අශ්‍රමණයෙහිය, අශාක්‍යපුත්‍රයෙහිය'යි මේ වචනයන් අතුරෙහි එකක් එකක්හුගේ වසයෙන් වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසයවේ. මෙසේ අන්‍යවූ ඔමසවාදදි ශික්ෂාපදයන්හි ආ 'දුශ්ශීලයෙහිය, ලාමකස්වභාව ඇත්තෙහිය, අපවිත්‍රයෙහිය, සැකකටයුතු සමාචාර ඇත්තෙහිය, සැඟවුණු කර්මාන්ත ඇත්තෙහිය, අශ්‍රමණයෙහිය, ශ්‍රමණප්‍රතිඥ ඇත්තෙහිය, අශ්‍රෙෂ්ඨචර්‍ය්‍යා ඇත්තෙහිය, බ්‍රහ්මචාරීප්‍රතිඥ ඇත්තෙහිය, ඇතුළත කුණුවූයෙහිය, තිදෙරින් පාරාජික වස්තුවූ දුශ්චරිතයන්ගේ වැගිරීමෙන් තෙත්වූයෙහිය. හටගත් කෙලෙස් කසළ ඇත්තෙහිය යන මේ වචන

අතුරෙහි එක එකක්හුගේ වසයෙන් වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසයවේමය. 'තා සමග උපොසථයක් හෝ පවාරණයක් හෝ සඞ්ඝකර්මයක් හෝ නැත්තේය යන මේ ශුද්ධ පද කෙළනොපැමිණෙත්. 'දුශ්ශීලයෙහි, තා හා උපොසථයක් හෝ නැතැයි මෙසේ දුශ්ශීලාදිපද අතුරෙහි හෝ 'පාරාජිකාපත්තියට පැමිණියේවෙහියි යනාදි පද අතුරෙහි හෝ යම්කිසි පදයක් සමග ගළපනලද්දහුම කෙළපැමිණෙත් සඞ්ඝාදිසෙස කරන්නාහුවෙත්. මහාපදුම ස්ථවිරතෙමේ වනාහි එකලාව මේ ශික්ෂාපද පෙළෙහි නොආ '**දුස්සීලො පාපධම්මො**' යනාදි පද කෙළනොපැමිණෙත්, සොරවෙහි, මහා හෙරණවෙහි, මහා උවැසිවෙහි, කාලිදෙවියන්ගේ ව්‍රත දරන්නෙහි, නිගණ්ඨවෙහි, ආජීවකවෙහි, තාපසවෙහි, පරිව්‍රාජකවෙහි, පණ්ඩකවෙහි, ථෙය්‍යසංවාසකවෙහි, තිත්ථියපක්කන්තකවෙහි, තිර්යග්ගතවෙහි, මාතෘඝාතකවෙහි, පිතෘඝාතකවෙහි, අර්හද්ඝාතකවෙහි සඞ්ඝභෙදකවෙහි, ලොහිතුප්පාදකවෙහි, භික්ෂුණී දූෂකවෙහි, උභතොබ්‍යඤ්ජනකවෙහි, යන මේ පදද කෙළපැමිණෙත්මැයි කීයේය. මහාපදුම ස්ථවිරතෙමේම '**දිට්ඨෙ වෙමතිකො**' යනාදිතන්හි යම් කරුණකින් යම් පමණකින් විමති ඇතිවූයේද එකරුණෙන් නොඅදහන්නේය. යම් කරුණකින් නො අදහන්නේද එකරුණෙන් සිහි නොකෙරේ. යම් කරුණකින් සිහි නොකෙරේද එකරුණෙන් මුළාවූයේයයි කියයි. මහාපදුම ස්ථවිරතෙමේ වනාහි එකක් එකක් දෙකට බිඳ සතර පිළිබඳවම වෙන් වෙන්වූ නය දක්වාලන්නේය. 'දිට්ඨෙ වෙමතිකො' යන මෙය වනාහි 'දැකීමෙහි හෝ පුද්ගලයා කෙරෙහි විමති ඇත්තේවේයි වදරනසේක. එහි 'මාවිසින් දක්නාලද්දේද, නොදක්නාලද්දේදැයි මෙසේ දැකීමෙහි විමති ඇත්තේවේ. මාවිසින් දක්නාලද්දේ මෙතෙමේද, අනිකෙක්දැයි මෙසේ පුද්ගලයා කෙරෙහි විමති ඇත්තේවේ. මෙසේ දැකීම හෝ පුද්ගලයා හෝ නොඅදහන්නේය. දැකීම හෝ පුද්ගලයා හෝ සිහිනොකෙරේ. දැකීම කෙරෙහි හෝ පුද්ගලයා කෙරෙහි හෝ මුළාවූයේවේ. මෙහිද '**වෙමතිකො**' හටගත් විමති ඇත්තේය. '**නො කප්පෙති**' නොඅදහයි. '**න සරති**' සිහිකරවනු ලබන්නේ සිහි නොකරයි. යම් කලෙක වනාහි 'ස්වාමීනි' අසුවල් තැන, අසුවල් කාලයෙහියි එය සිහිකරවත්ද, එකල්හි සිහිකරයි. '**පමුට්ඨො**' යමෙක් ඒ ඒ උපායන්ගෙන් සිහි කරවනු ලබන්නේද, සිහිනොකෙරේමයයි, මේ උපායෙන්ම චොදපකවාරයද දතයුතුය. හුදෙක්ම එහි 'මයා' යනු පිරිහුනේය. සෙස්ස චොදකවාරය සමානවේ.

ඉතික්බිති ආපත්තිභෙදයද අනාපත්තිභෙදයද දක්වනු පිණිස '**අසුද්ධෙ සුද්ධදිට්ඨි**' යනාදීවූ චතුෂ්කය හැර එක් එක් පදය සතර සතර ප්‍රභෙදයකින් දක්වනලද්දේය. ඒ සියල්ල පෙළ නයින්ම දැනගන්නට හැක්කේය. හුදෙක්

මෙහි අභිප්‍රායභෙදය දතයුතුය. මේ අභිප්‍රාය නම්, ච්‍යුතකරන අභිප්‍රාය, ආක්‍රොශකරන අභිප්‍රාය, තර්ජනීයාදිකර්‍ම කරවන අභිප්‍රාය, ඇවැතින් නැඟී සිටුවන අභිප්‍රාය, උපොසථපවාරණස්ථපනාභිප්‍රාය, විනිශ්චයාභිප්‍රාය, ධර්‍මකථාභිප්‍රායයි අනෙකප්‍රාකාරවේ. එහි පළමු සිවු අභිප්‍රායන්හි අවකාස නොකරවන්නහුට දුක්කටයවේ. අවකාස කරවාද හමුවෙහි අමූලක පාරාජිකයෙන් ච්‍යුත කරන අදහසින් චොදනා කරන්නහුට සඞ්ඝාදිසෙසයවේ. අමූලකසඞ්ඝාදිසෙසයෙන් චොදනා කරන්නහුට පාචිත්තියවේ. ආචාරවිපත්තියෙන් චොදනා කරන්නහුට දුක්කටයවේ. ආක්‍රොශ කිරීමෙහි අදහසින් චොදනා කරන්නහුට පාචිත්තියවේ. නොහමුවෙහි සප්තාපත්ති ස්කන්‍ධයෙන්ම චොදනා කරන්නහුට දුක්කටයවේ. නොහමුවෙහිම සත්වැදෑරුම්වූ කර්‍මයම කරන්නහුට දුක්කටයමවේ.

කුරුන්දියෙහි වනාහි නගා සිටුවීමෙහි අදහසින් හෝ මෙනම් ඇවැතට පැමිණියෙහිය, එයට පිළියම් කරවයි කියන්නහුට අවකාශ කිරීමෙක් නැතැයි කියනලදී. සියලු අට්ඨකථාවන්හිම උපොසථපවාරණ තබන්නහුට අවකාශ කර්‍මයක් නැත්තේය. ස්ථපනක්ෂෙත්‍රය වනාහි දතයුතුය. **'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අජ්ජුපොසථො පණ්ණරසො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො උපොසථං කරෙය්‍ය'** යන මෙහි රෙ කාරය නොඉක්මුණුකල්හි උපොසථය තැබීම ලබන්නේය. ඉන්පසු ය්‍ය කාරය පැමිණිකල්හි උපොසථය තැබීම නොලබන්නේය. පවාරණයෙහිද මේ නයවේ. අනුවිජ්ජකයාහටද වස්තුව බැස සිටිකල්හි තට මේ කරුණ ඇතැ'යි විනිශ්චය කරන අදහසින් කියන්නහුටද අවකාශ කර්‍මයක් නැත්තේය. ධර්‍මකථිකයාහටද ධර්‍මාසනයෙහිහිද 'යමෙක් මේ මේ ක්‍රියා කෙරේද, මේ මහණ අශ්‍රමණය, යනාදි නයින් නොඋදෙසා දම් දෙසන්නහුට අවකාශ කර්‍මයක් නැත්තේය. ඉදින් වනාහි උදෙසා නියම කොට අසුවලාත් අසුවලාත් අශ්‍රමණය, අනුපාසකයි කියාද, ධර්‍මාසනයෙන් බැස ඇවැත දෙසා යායුතුය. ඒ ඒ තන්හි 'අනොකාසං කාරෙත්වා'යි යමක් කියනලදද, එයට අවකාශ නොකරවායි මෙසේ අර්ථ දතයුතුය. කිසි අනවකාශයක් නම් නැත්තේය. මෙතෙමේ යම් අවකාශයක් කරවා ඇවැතට පැමිණේද, අවකාශ නොකරවා පැමිණේයයි දතයුතුය. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීන් අතුරෙහි ත්‍රිසමුත්ථානයක් ඇත්තේය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද ඇවැත නැඟීසිටියි. කිරීමෙන් පැමිණිය යුතුබැවින් ක්‍රියාසමුත්ථානයවේ. ව්‍යතික්‍රම සංඥවෙහි අභාවයෙන් මිදෙනබැවින් සංඥවිමොක්ෂවේ. සචිත්තක සමුත්ථානවේ. ලොකයා විසින් අකුසල්බැවින් හැරිය යුතුයයි නියම හෙයින් ලොකවද්‍යය කයින්

කටයුතුබැවින් කායකර්මයි. වචනයෙන් කටයුතුබැවින් වාක් කර්මයි. අකුසල් සිත් ඇත්තේය. දොම්නස් වේදනා විසින් දුඃඛවේදනා ඇත්තේය.

ප්‍රථම දුෂ්ටදෝෂ ශික්ෂාපද වර්ණනාව නිමි.

—\\—

**'තෙන සමයෙන බුද්ධො භගවා'** ද්විතීය දුෂ්ටදෝෂ ශික්ෂාදයයි. එහි **'හන්ද මයං ආවුසො ඉමං ඡකලකං දබ්බං මල්ලපුත්තං නාම කරොම'** ඒ මෛත්‍රිය භුම්මජක භික්ෂූහු තමන්ගේ මනදෙළ සම්පාදනය කරන්නට නොහැකිවනුවෝ ලැබූ තිගාවෙන් දුකට පැමිණියාහු 'දැන් දන්නෙමු'යි එබඳු වස්තුවක් සොයමින් හැසිරෙත්. එකල්හි එක් දවසක් එළුදෙනක හා විපිළිපන් එළුවෙකු දැක තුටුවූවෝ උනුන් දෙස බලා 'ඇවැත්නි' එබැවින් අපි මේ එළු, දබ්බමල්ලපුත්‍ර නම් කරමු'යි මෙසේ කීහ. 'මෙතෙමේ දබ්බමල්ලපුත්‍ර නමැයි මෙසේ මේ එළුහට නම් කරමු'යි කියනලද්දේවේ. **'මෙත්තියං නාම භික්ඛුනිං'** යන මෙහිද මේ නයවේ. **'තෙ භික්ඛූ මෙත්තියභුම්මජකෙ භික්ඛූ අනුයුඤ්ජිංසු'** ඇවැත්නි' කොතැන්හිදී තොප විසින් දබ්බමල්ලපුත්‍රතෙමේ මෛත්‍රියා මෙහෙණ සමග දක්නාලද්දේද, ගිජුකුළුපවු පාමුලදීය, කවර වේලාවකද, 'පිඩු සිහාගිය වේලාවෙහිය', 'ඇවැත් 'දබ්බ', මොවුහු මෙසේ කියත්. 'තෝ එකල්හි කොහිද,' 'වෙළුවනයෙහි බත් උදෙසම්,' ඒ 'වේලෙහි තා වෙළුවනයෙහි ඇතිබව කවරෙක් දනීද, ස්වාමීනි' භික්ෂුසඞ්ඝ තෙමේය.' ඒ 'භික්ෂූහු' තෙපි ඒ වෙලෙහි මොහු වෙළුවනයෙහි ඇතිබව දනිවුදැ'යි සඞ්ඝයා විචාළාහුය. 'ඇවැත්නි', එසේය. දනුම්හ.' 'ස්ථවිරතෙමේ සම්මුතිය ලත් දිනපටන් වෙළුවනයෙහියයි මෙසේ දැන්වූහ. ඉනික්බිති මෛත්‍රිය භුම්මජකයන්ට 'තොපගේ කථාව සම නොවේ. කිම, අපට ලේශයක් නගා කියවු'දැයි කීහ. මෙසේ ඒ භික්ෂූන් විසින් පරීක්ෂාකරනු ලබන්නාවූ ඔවුහු 'ඇවැත්නි', එසේයයි' කියා මේ කරුණ සැලකළහ. **'කිං පන තුම්හෙ ආවුසො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස'**යි අන් කොටස පිළිබඳවූ මෙය හෝ, මොහුට එළු ජාතිය හෝ අන් කොටසක් හෝ ඇත්තේයයි අඤ්ඤභාගිය නම. අධිකරණ යනු ආධාරයයි දතයුතුය. වස්තුව අධිෂ්ඨානැයි කියනලද්දේවේ.

එළුතෙමේ යම් ඒ දබ්බමල්ලපුත්‍ර නමැයි කියනලද්දේද, ඒ එළුතෙමේ, ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රගේ යම් මේ භාගයක් කොටසක් පක්ෂයක් මනුෂ්‍යජාතියක් භික්ෂුභාවයක් වේද, ඒ මනුෂ්‍යජාතියෙන් හා භික්ෂුභාවයෙන්ද අන්‍යවූ තිරච්ඡානජාතිය පිළිබඳවූද ඡකලකභාවය පිළිබඳවූද භාගය කොටස

පක්‍ෂය පිළිබඳවේ. තිරච්ඡානජාතිය පිළිබඳවූද ඡකලකභාවය පිළිබඳවූද ඒ අන්‍යභාගය හෝ මේ එළුට ඇත්තේනුයි. එහෙයින් එළු අඤ්ඤභාගිය සංඥව ලබයි. යම්හෙයකින් අපි මේ එළු දබ්බමල්ලපුත්‍ර නම් කරමුයි කියන්නාවූ ඒ මෙත්තිය භුම්මජකභික්‍ෂූන්ගේ ඒ නාම කරණසංඥවට ඒ එළු අධාර වූයේද වස්තුව වූයේද අධිෂ්ඨානය වූයේද, එහෙයින් අධිකරණයයි දතයුතුය. ඒ එළු සඳහා ඒ අනුයුඤ්ජක භික්‍ෂූහු අන් කොටස් ඇති අධිකරණය පිළිබඳයයි කීහ. විවාදධිකරණාදීන් අතුරෙහි එක්තරා එකක් නොවේ. කුමක් හෙයින්දයත්: අසම්භව හෙයිනි. ඒ මෙත්තිය භුම්මජක භික්‍ෂූහු චතුර්විධ අධිකරණයන්ගෙන් කිසි අන් කොටසක් ඇති අධිකරණයක කිසිලෙශමාත්‍රයක් නොගත්තාහුය. චතුර්විධ අධිකරණයන්ගේ ලෙශයක් නම් නැත්තේය. ජාතිලෙශාදීහු පුද්ගලයන්ගේම ලෙශයෝයයි කියනලදහ. විවාදධිකරණාදීන්ගෙන් එකක් නොවේ. මේ දබ්බමල්ලපුත්‍ර යන නාමයයි. අන්‍යභාගීයාධිකරණභාවයෙහි සිටියාවූ ඒ කිසිවළුගේ ලෙශයක්වේ. තෙරුන් අමූලකපාරාජිකයෙන් චොදනා කරන්නට ලෙශමාත්‍රයක් මෙහිද පෙනේ. මොහුට, මෙතෙමේයයි හැගේ, මෙතෙමේයයි ව්‍යවහාර කරනු ලැබේනුයි දෙශ නම. ජාති ආදීන් අතුරෙහි එක්තරා කොටසකට මේ නමකි. අතිකුදු වස්තුවක ව්‍යවහාරමාත්‍රයෙන් මදක් ඇලේනුයි ලෙශ නම. ජාති ආදීන් අතුරෙන්ම එක්තරා කොටසකට මේ නමකි. ඉනික්බිති ප්‍රකට අර්ථ ඇත්තේමය. ශික්‍ෂාප්‍රඥප්තියෙහිද මෙම අර්ථයවේ.

පදභාජනයෙහි වනාහි යම් අන්‍යභාගියායි කරණයක්හුගේ කිසි ලෙශමාත්‍රයක් ගෙන පාරාජිකාපත්තියකින් චොදනා කරන්නේද, එය යම්හෙයකින් අර්ථොත්පත්තිවශයෙන්ම ප්‍රකාශ වූයේද, එහෙයින් විභාග නොකරනලදැයි දතයුතුය. අධිකරණ යන වචන සමානත්වයෙන් අර්ථාධාරවශයෙන් පැවති යම් චතුර්විධ අධිකරණ කෙනෙක් වෙත්ද, ඔවුන්ගේ අන්‍යභාගීය භාවයද තද්භාගීය භාවයද යම්හෙයකින් අප්‍රකටද, විනයධරයන් විසින් දැනගතයුතුද, එහෙයින් වචන සමානත්වයෙන් ලද අධිකරණය නිසා එය ප්‍රකාශ කරනසේක් **'අඤ්ඤභාගියස්ස අධිකරණස්ස'** යනු ආපත්ති අන්‍යභාගීය හෝ අධිකරණ අන්‍යභාගීය හෝවේ, යනාදිය වදළසේක. අවසානයෙහි ආපත්ති අන්‍යභාගීයවූ අධිකරණයෙහි වසයෙන් යම් ඒ චොදනාවක් කියනලදද, එද දක්වනු පිණිස සියලු අධිකරණයන්ගේ මේ තද්භාගිය අන්‍යභාගියභාවය එක් කරනලදැයි දතයුතුය.

එහිද **'ආපත්තඤ්ඤභාගියං වා'**යි පළමුකොට උදෙසනලදබැවින් ආපත්තිතොමෝ ආපත්තියට කෙසේ අන්‍යභාගියවේදැයි නිර්දේශය ඇරඹිය යුතුකල්හි යම්හෙයකින් ආපත්තාධිකරණයෙහි තද්භාගිය විචාරණයෙහිම

මේ අර්ථය පැමිණෙන්නේද, එහෙයින් මෙසේ ආරම්භ නොකොට අධිකරණය අධිකරණයට කෙසේ අන්‍යභාගිය වේදැයි පසු පදයම ගෙන නිර්දේශය පටන්ගන්නාලදැයි දතයුතුය. එහි අන්‍යභාගියවාරය ප්‍රකට අර්ථ ඇත්තේමය. එක් එක්ම අධිකරණයක් අනික් තුන් තුන් අධිකරණයන්ට අන්‍යභාගියවේ. අන්‍ය පක්ෂයක් ඇත්තේවේ. අනික් කොටසක් ඇත්තේවේ. වස්තු විසභාගබැවිනි. තද්භාගියවාරයෙහි වනාහි විවාදධිකරණය විවාදධිකරණයට තද්භාගියවේ. තත් පක්ෂ ඇත්තේවේ. තත් කොට්ඨාස ඇත්තේවේ. වස්තුසභාගබැවිනි. අනුවාදධිකරණය අනුවාදාධිකරණයට එසේය.

බුද්ධකාලයෙහි පටන් අටළොස් භෙදකරවස්තූන් නිසා උපන් විවාදයද වස්තුසභාගබැවින් එක්ම විවාදධිකරණයක්වේ. එසේ බුද්ධකාලයෙහි පටන් සිවු විපත් නිසා අනුවාදයද දැන් උපදින අනුවාදයද වස්තුසභාගබැවින් එක්ම අනුවාදධිකරණයක්වේ. යම්හෙයකින් ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට සභාගවිසභාග වස්තු වශයෙන්ද ස්වභාවයෙන් සමාන අසමානබැවින්ද ඒකාන්තයෙන් තද්භාගිය නොවේද, එහෙයින් 'ආපත්තාධිකරණය ආපත්තාධිකරණයට කිසිකලෙක තද්භාගියද කිසිකලෙක අන්‍යභාගියදවේයයි කියනලද්දේය.

එහි පටන් අන්‍යභාගියය. පළමුකොට දැක්වූබැවින් මෙහිදු අන්‍යභාගියම පළමුකොට දක්වනලදි. එහි අන්‍යභාගියභාවයද ඉන්පසු තද්භාගියභාවයද 'සභාග විසභාගතො' යනාදි කියූ නයින්ම දතයුතුය. 'කෘත්‍යාධිකරණය කෘත්‍යාධිකරණයට තද්භාගියයන මෙහි බුද්ධකාලයෙහි පටන් චතුර්විධ සඞ්ඝකර්ම නිසා උපන් අධිකරණයද දැන් චතුර්විධ සඞ්ඝකර්ම නිසා උපදින අධිකරණයද සභාගබැවින්ද සමානබැවින්ද එක්ම කෘත්‍යාධිකරණයවේ. 'කිම, සඞ්ඝකර්ම නිසා උපන් අධිකරණය කෘත්‍යාධිකරණයවේද, නැත, සඞ්ඝකර්මයන්ටම මේ නමක්වේද, සඞ්ඝකර්මයන්ටම නමක්වේ. මෙසේ ඇතිකල්හිද 'සඞ්ඝකර්මය නම් මේ මේය, මෙසේ කටයුතුයයි මෙසේ යමක් කර්මලක්ෂණයයි මෙතෙහි කෙරේද, ඒ නිසා උපදිනබැවින්ද පළමු පළමු සඞ්ඝ කර්ම නිසා උපදිනබැවින්ද සඞ්ඝකර්ම නිසා උපන් අධිකරණය කෘත්‍යාධිකරණයයි කියනලදී.

'**කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදය**' යන මෙහි යම් හෙයකින් දෙසයි හෝ ලෙසමත්තයි හෝ යනු පෙර කියූ නයින්ම ව්‍යඤ්ජන හෙයින් වෙනස්වේද, අර්ථ හෙයින එකක් වේද, එහෙයින් '**ලෙසොති දස ලෙසො ජාතිලෙසො' නාමලෙසො**' යනාදිය වදළසේක. එහි ජාතියම ජාතිලෙස නම සෙස්සෙහිද මේ නයවේ. දැන් ඒ ලෙසම විස්තර විසින් දක්වනු

පිණිස යම්සේ එය ගෙන චෝදනා කිරීමවේද, එසේ පුද්ගලාධිෂ්ඨානයකොට දක්වනසේක් **"ජාතිලෙසො නාම ඛත්තියො දිට්ඨො හොති"** යනාදිය වදාළසේක. එහි **"ඛත්තියො දිට්ඨො"** මේ චෝදකයා විසින් අන් කිසි ක්‍ෂත්‍රිය ජාතිකයෙක් දක්නාලද්දේවේ. **"පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජන්තො"** මෛථුන්දම් ආදීන් අතුරෙහි එක්තරා එකකට පැමිණෙන්නේ **"අඤ්ඤං ඛත්තියං පස්සිත්වා චොදෙති"** එකල්හි හෙතෙමේ තමාට වෛරීවූ ක්‍ෂත්‍රියජාති ඇති අන් මහණෙකු දැක ඒ ක්‍ෂත්‍රියජාතිලෙශය ගෙන, "පාරාජිකාපත්තියට පැමිණෙන ක්‍ෂත්‍රියයෙක්තෙමේ මාවිසින් දක්නාලද්දේය. "තෝ ක්‍ෂත්‍රියවෙහි, පාරාජිකාපත්තියට පැමිණියෙහි," නොහොත් එකල තෝ ඒ ක්‍ෂත්‍රිය තෙමේය, අනිකෙක් නොවූයේය. පාරාජිකාපත්තියට පැමිණියෙහි, අශ්‍රමණයෙහි, අශාක්‍යපුත්‍රීයෙහි, තා හා උපොසථය හෝ පවාරණය හෝ සඞ්ඝකර්මය හෝ නැතැයි මෙසේ චෝදනා කෙරේද, වචනයක් වචනයක් පාසා සඞ්ඝාදිසෙසාපත්තියවේ. මෙහිද ඒ ක්‍ෂත්‍රියයන්ගේ උනනුනුට අසමානවූ ඒ ඒ දීර්ඝාදීන්ගේ වසයෙන් හෝ දෘෂ්ඨාදීන්ගේ වසයෙන් හෝ අන්‍යභාගියභාවයද, ක්‍ෂත්‍රියජාතිප්‍රඥප්තියට ආධාරවශයෙන් අධිකරණභවයද දතයුතුය. මේ උපායෙන්ම සියලු පදයන්හි යොජනාව දතයුත්තීය.

පත්තලෙසනිද්දෙසයෙහිද "සාටකපත්තො" ලොහපාත්‍රයක් සමානවූ මනාසිවි ඇති සිනිඳුවූ බමරපැහැ ඇති මැටියෙන් කළ පාත්‍රය කියනුලැබේ. **"සුම්භකපත්තො"** පියවිමැටියෙන් කළ පාත්‍රයයි. යම්හෙයකින් ආපත්තිලෙසය පිළිබඳ නිර්දේශය එක්ම පදයෙන් සැකෙවින් කියනලද්දේද, එහෙයින් විස්තර විසින්ද එය දක්වන්නට **"භික්ඛු සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො හොති"** යනාදිය වදරනලද්දේය. කුමක්හෙයින් මේ ආපත්තිලෙසයාගේ නිර්දේශය එහිම නොකියා මෙහි වෙන්ව කියනලද්දේද යත්: සෙසු නිර්දේශයන් හා සභාග නොවනබැවිනි. සෙසු නිර්දේශ අනිකෙකු දැක අනිකෙක්හට චෝදනාවසයෙන්කියනලදය. මේ නිර්දේශය වනාහි අන් එක්ම ඇවැතකට පැමිණෙන්නෙකු දැක අන් ඇවැතකින් චෝදනාවසයෙන් කියනලදය. ඉදින් එසේ නම් කෙසේ අන්‍යභාගිය අධිකරණයක්වේද, යත් ඇවැත හෙතුකොටගෙනය. **"එවම්පි ආපත්තඤ්ඤභාගියඤ්ච හොති ලෙසො ච උපාදින්නො"** යනු එහෙයින්ම වදාළසේක. හෙතෙමේ යම් සඞ්ඝාදිසෙසයකට පැමිණියේද එය පාරාජිකයට අන්‍යභාගිය අධිකරණයවේ. ඒ අන්‍යභාගිය අධිකරණයෙහි ලෙසය නම් සියලු ක්‍ෂත්‍රියයන්ට සාධාරණවූ යම් ඒ ක්‍ෂත්‍රියභාවය මෙන් සියලු ආපත්තීන්ට සාධාරණවූ ආපත්තිභාවයවේ. මේ උපායෙන්ම සෙසු ඇවැත් මුල්කොට ඇති නයද චොද්‍යපකවාරයද දතයුතුය. **"අනාපත්ති තථාසඤ්ඤී චොදෙති**

**වා චොදපෙති වා** 'මෙතෙමේ පාරාජිකයටම පැමිණියේයයි යමෙක් මෙසේ එසේ හැඟීම් ඇතිව චොදනා කරයි හෝ චොදනා කරවයි හෝ ඒ මහණහුට ඇවැත්නොවේ. සෙස්ස හැමතන්හි ප්‍රකටමය. සමුට්ඨානාදීහුද ප්‍රථම දුෂ්ට දොෂශික්ෂාපදය හා සමාන වෙති.

ද්විතීය දුෂ්ටදොෂශික්ෂා පදවර්ණනාව නිමි.

—\\—

'**තෙන සමයෙන බුද්ධො භගවා**' සඞ්ඝභෙදශික්ෂාපදයයි. එහි '**අථ ඛො දෙවදත්තො**' යනාදි තන්හි යම් දෙවදත්තයෙක්තෙමේ යම්සේ පැවිදි වූයේද, යම් කරුණකින් කොකාලිකාදීන් කරා එළඹ 'ඇවැත්නි, එවු, අපි ශ්‍රමණ ගෞතමස්වාමින්ගේ සඞ්ඝ භෙදය ආඥභෙදය කරම්හයි කීයේද, ඒ සියල්ල සඞ්ඝභෙදකඛන්ධකයෙහි ආයේමය, පඤ්චවස්තු යාචනයද එහිම එන්නේය. එහෙත් මෙහිද ආබැවින් මෙහි යමක් කියයුතුද, එය කියාම යන්නෙමු. '**සාධු භන්තෙ**' ආයාචනාය. '**සාධු භික්ඛූ යාවජීවං ආරඤ්ඤිකා අස්සු**' සියලු භික්ෂූහු යම්තාක් ජීවත්වෙත්ද, ඒතාක් ආරණ්‍යක ධුතාඞ්ගය සමාදන්ව ආරණ්‍යකයෝ වෙත්වා, ආරණ්‍යයෙහිම වසත්වා. '**යො ගාමන්තං ඔසරෙය්‍ය වජ්ජං නං ඵුසෙය්‍ය**' යම් එක් මහණෙක්ද ආරණ්‍යය හැර විසීම පිණිස ගමට වදනේද වරද ඒ මහණහු පහසන්නේය. දෙෂය තෙමේ ඒ මහණහු පහසාවා භාග්‍යවතුන්වහන්සේ ඒ මහණහු ඇවැතින් කෙරෙත්වා, යන අදහසින් කියයි. සෙසු තන්හිද මේ නයයි. '**ජනං සඤ්ඤාපෙස්සාම**' ජනයා ලවා අපගේ අලෙපවජ්ජතාදිභාවය දන්වන්නෙමු. නොහොත් සතුටු කරවන්නෙමු. පහදවන්නෙමුයි කියනලද්දේවේ.

මේ පඤ්චවස්තූන් යාඥකරන දෙව්දත්හුගේ වචනය අසාම භාග්‍යවතුන්වහන්සේ 'මෙතෙමේ සඞ්ඝභෙදය කැමතිව යාඥ කෙරේයයි දැන වදළසේක. යම්හෙයකින් ඒ පඤ්චවස්තූහු අනුදනුලබන්නාහු බොහෝ කුලපුත්‍රයන්ට මාර්ගාන්තරාය පිණිස පවතිත්ද, එහෙයින් භාග්‍යවතුන්වහන්සේ 'කම් නැත දෙවදත්ත'යි ප්‍රතික්ෂෙපකොට, යමෙක් කැමතිවේද, හෙතෙමේ ආරණ්‍යකවේවා, යනාදිය වදළසේක. මෙහිදී භාග්‍යවතුන්වහන්සේගේ අදහස දැන කුලපුත්‍රයා විසින් තමහට සුදුස්සක් දතයුතුය. මේ මෙහිලා භාග්‍යවතුන් වහන්සේගේ අදහසය: එක් මහණෙක් මහත් අදහස් ඇත්තේ මහත් උත්සාහ ඇත්තේවේ. හෙතෙමේ ග්‍රාමාන්තසෙනාසනය අත්හැර ආරණ්‍යයෙහි වසන්නේ දුක් කෙළවර කරන්නට හැකිවේ. එක් මහණෙක් දුර්වලවූයේ මද ශක්ති ඇත්තේ

ආරණ්‍යයෙහි වසනුයේ දුක් කෙළවර කරන්නට නොහැකිවේ. ග්‍රාමාන්තයෙහිම වසනුයේ දුක් කෙළවර කරන්නට හැකිවේ. එක් මහණෙක් මහත්බල ඇත්තේ සමව පවත්නා ධාතු ඇත්තේ අධිවාසන ක්ෂාන්තියෙන් යුක්තවූයේ ඉෂ්ටානිෂ්ටවස්තූන්හි සමසිත් ඇත්තේ අරණ්‍යයෙහිද ග්‍රාමාන්තයෙහිද වසනුයේ දුක් කෙළවර කරන්නට හැක්කේමය. එක් මහණෙක් ව්‍යඤ්ජනපදයම පරමකොට ඇත්තේ ග්‍රාමාන්තයෙහි ද වසනුයේ දුක් කෙළවර කරන්නට නොහැකිවේ. අරණ්‍යයෙහි වසනුයේ දුක් කෙළවර කරන්නට නොහැකිවේ.

ඔවුනතුරෙහි යම් මේ මහණෙක්තෙමේ මහත් අදහස් ඇත්තේ මහත් උත්සාහඇත්තේ වේද, ග්‍රාමාන්තසේනාසනය හැරපියා අරණ්‍යයෙහි වසනුයේ දුක් කෙළවර කරන්නට හැකිවේද, හෙතෙමේ අරණ්‍යයෙහිම වෙසේවා. මේ මහණහුට මේ සෙනසුන සුදුසුවේ. මේ මහණහුගේ සද්ධිවිහාරිකාදීහුද අනුව හික්මෙන්නෝ අරණ්‍යයෙහි විසියයුතුමැයි සිතන්නාහුය. යම් මහණෙක් තෙමේ දුර්වලවූයේ මදශක්ති ඇත්තේ ග්‍රාමාන්තයෙහිම වසනුයේ දුක් කෙළවර කරන්නට හැකිවේද, අරණ්‍යයෙහි වසනුයේ දුක් කෙළවර කරන්නට නොහැකිවේද, හෙතෙමේ ග්‍රාමාන්තයෙහිම වෙසේවා. යම් මේ මහණෙක් තෙමේ මහත්බල ඇත්තේ සමව පවත්නා ධාතු ඇත්තේ අධිවාසන ක්ෂාන්තියෙන් යුක්තවූයේ ඉෂ්ටානිෂ්ටවස්තූන්හි සමසිත් ඇත්තේ අරණ්‍යයෙහිද ග්‍රාමාන්තයෙහි වසනුයේද දුක් කෙළවර කරන්නට හැක්කේමවේද, මෙතෙමේද, ග්‍රාමාන්තසේනාසනය හැරපියා අරණ්‍යයෙහි වෙසේවා. මේ මහණහුට මේ සෙනසුන සුදුසුවේ. මේ මහණහුගේ සද්ධිවිහාරිකයෝද, අනුව හික්මෙන්නෝ අරණ්‍යයෙහි විසියයුතුයයි සිතන්නාහුය. යම් මේ මහණෙක් ව්‍යඤ්ජනපදයම පරමකොට ඇත්තේ ග්‍රාමාන්තයෙහි වසනුයේද දුක් කෙළවර කරන්නට නොහැකිවේද අරණ්‍යයෙහි වසනුයේද දුක් කෙළවර කරන්නට නොහැකිවේද, මෙතෙමේද, අරණ්‍යහෙිම වෙසේවා. මේ වනාහි මේ පදපරමයාහට ධුතාඞ්ගවශයෙන්ද කර්මස්ථාන භාවනාවශයෙන්ද මත්තෙහි මාර්ගඵලයන්ට උපනිශ්‍රය වන්නේය. මොහුගේ සද්ධිවිහාරිකයෝද අනුව හික්මෙන්නෝ අරණ්‍යයෙහි විසියයුතුයයි සිතන්නාහුය. මෙසේ යම් මේ මහණෙක් තෙමේ දුර්වලවූයේ මදශක්ති ඇත්තේ ග්‍රාමාන්තයෙහිම වසනුයේ දුක් කෙළවර කරන්නට හැකිවේද, අරණ්‍යයෙහි වසනුයේ දුක් කෙළවර කරන්නට නොහැකිවේද, මේ පුද්ගලයා සඳහා භාග්‍යවතුන්වහන්සේ 'යමෙක් කැමතිවේද, හෙතෙමේ ග්‍රාමාන්තයෙහි වෙසේවායි වදළසේක. මේ පුද්ගලයා විසින්ද අන්හටද අවාරය දෙන ලද්දේය. ඉදින්වනාහි භාග්‍යවතුන්වහන්සේ දේවදත්තයාගේ වාදය පිළිගන්නාසේක් නම්, යම් මේ පුද්ගලයෙක් තෙමේ ප්‍රකෘතියෙන් දුර්වලවේද,

මදශක්ති ඇත්තේවේද, යමෙක් තරුණකාලයෙහි අරණ්‍යයෙහි විසීම නිෂ්පාදනයකොට, මහලු කාලයෙහි හෝ වාපිත් ආදියෙන් හටගත් ධාතුක්ෂොභකාලයෙහි හෝ ආරණ්‍යයෙහි විසීම නිපදවාද ග්‍රාමාන්තයෙහිම වසමින් දුක් කෙළවර කරන්නටවේද, ඔවුන්ට ආයසීමාගීයේ සිදීම වන්නේද, අභීත්ඵලාධිගමය නොවන්නේද, ශාස්තෘශාසනය ධර්මයෙන් පහවූවෙක් විනයෙන් පහවූවෙක් විරුද්ධවූවෙක් නෛර්යාණික නොවූවෙක් වන්නේද, ඔවුන්ගේ ශාස්තෘතෙමේද සියල්ල දන්නෙක් නොවන්නේද 'සවකීයවාදය හැරපියා දෙවදත්තවාදයෙහි පිහිටියහයි ගැරහියයුත්තාහු වන්නාහ. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ මෙබඳු පුද්ගලයන්ට සඞ්ග්‍රහ කරනසේක් දෙවදත්තයාගේ වාදය ප්‍රතික්ෂෙප කළසේක. මේ උපායෙන්ම පිණ්ඩපාතිකවස්තුවෙහිද පංසුකූලිකවස්තුවෙහිද අටමසෙක්හි වෘක්ෂමූලික වස්තුවෙහිද විනිශ්චයදතයුතුය. සිවුමසක් වෘක්ෂ මූලසේනාසනය ප්‍රතික්ෂෙප කරන ලද්දේමය.

මච්ඡමංසවස්තුවෙහි '**තිකොටිපරිසුද්ධං**' මරනු නොදක්නාලද, නොඅසනලද, සැක නොකරනලද යන කරුණු තුනින් පිරිසිදුවූ දක්නාලද ආදීවූ අපරිසුද්ධීන්ගෙන් තොරවූ යන අර්ථයි. එහෙයින්ම '**අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං**' යනු වදළසේක. එහි **අදිට්ඨ** නම් භික්ෂූන් සඳහා මෘගමත්ස්‍ය මරාගනුලබන්නේ නොදක්නාලද්දේය. අසුත නම් භික්ෂූන් සඳහා මෘගමත්ස්‍යයන් මරා ගන්නාලදැයි නොඅසනලද්දේය. අපරිසඞ්කිත නම් දිට්ඨපරිසඞ්කිතය සුතපරිසඞ්කිතය, එදෙකින් විමුක්තපරිසඞ්කිතයද දැන එයට විපක්ෂවශයෙන් දතයුතුයි. කෙසේදයත්, මෙහි මහණෝ මත්ස්‍යබන්ධන මෘගබන්ධනාදිය ගත් අත් ඇතිව ගමින් නික්මෙන මිනිසුන් හෝ වෙනෙහි හැසිරෙන මිනිසුන් හෝ දකිත්ද, දෙවනදද, ඒ ගමට පිඩු පිණිස පිවිසි ඒ මහණුන්ට මත්ස්‍ය සහිතවූ පිණ්ඩපාතය එළවත්ද, ඒ මහණෝ ඒ දැකීමෙන් 'මහණුන් සඳහා කරනලදැ'යි සැක කෙරෙත්ද, මෙය දිට්ඨපරිසඞ්කිත නම්වේ. මෙය ගන්නට නොවටියි. මෙසේ යම් මත්ස්‍ය මාංසයක් ගැන මෙසේ සැක නොකරනලද්දේද එය වටියි. ඉදින් වනාහි ඒ මිනිස්සු 'ස්වාමීනි' කුමක් හෙයින් නොපිළිගනිහුදැයි විචාරා, එබව අසා, 'ස්වාමිනි' මෙය භික්ෂූන් සඳහා නොකරනලදය, අප විසින් මෙය අප සඳහා හෝ රාජානුවතිකාදීන් සඳහා හෝ කරනලදැ'යි කියත්නම් කැපවේ. මහණෝ නොම දකිත්, නොම අසත්. එහෙත් ගමට පිඩු පිණිස පිවිසි ඒ මහණුන්ගේ පාත්‍රය ගෙන මෙසේ සැක නොකරනලද්දේද, එය වටියි. ඉදින්වනාහි ඒ මිනිස්සු 'ස්වාමීනි' කුමක් හෙයින් නොපිළිගනිහුදැ'යි විචාරා එබව අසා, 'ස්වාමීනි' මෙය භික්ෂූන් සඳහා නොකරලදයි, අප විසින් මෙය අපසඳහා හෝ රාජානුවතිකාදීන් සඳහා හෝ කරනලදැයි

කියත්නම් කැපවේ. මහණෝ නොම දකිත්. නොම අසත්. එහෙත් ගමට පිඩු පිණිස පිවිසි ඒ මහණුන්ගේ පාත්‍රය ගෙන මත්ස්‍ය මාංස සහිතවූ පිණ්ඩපාතය පිළියෙලකොට එළවත්. ඒ මහණෝ 'මහණුන් සඳහා පිළියෙල කරනලදදැයි සැක කරත්ද, ඒ මෙය දිට්ඨශ්‍රුත දෙකින් මිදුණු පරිසඞ්කිත නම්වේ. මෙද ගන්නට නොවටියි. යම් මත්ස්‍ය මාංසයක් මෙසේ සැක නොකරනලද්දේ නම් එය වටියි. ඉදින්වනාහි ඒ මිනිස්සු 'ස්වාමීනි' කුමක් හෙයින් නොපිළිගනීහුදැයි විචාරා එබව අසා 'ස්වාමීනි' මෙය භික්ෂූන් සඳහා නොකරනලදය, අප විසින් තමන් සඳහා හෝ රාජාතුවතිකාදීන් සඳහා හෝ කරනලදය, මිලදීගත් මාංසය හෝ කැපයක්ම ලැබ භික්ෂූන් සඳහා සපයනලදැයි කියත්ද, කැපවේ. මළවුන් පිළිබඳ ප්‍රෙතකෘත්‍යය පිණිස හෝ මගුල් ආදිය පිණිස හෝ කරනලද්දෙහිද මෙම නයවේ. යමක් යමක් භික්ෂූන් සඳහාම නොකරනලදද, යමක විමති නැත්තේවේද, ඒ සියල්ල කැපවේ. ඉදින් එක් වෙහෙරක භික්ෂූන් උදෙසා කරන ලද්දක්වේද, ඔවුහුද තමන් පිණිස කළබව නොදනිත්ද, අන්හු දනිත්ද, යම් කෙනෙක් දනිත්ද, ඔවුන්ටම නොවටියි. අන්හට වටියි. ඒ භික්ෂූහුද 'අප සඳහා කරනලදැ'යි දනිත්ද, අන්‍යයෝත් මොවුන් සඳහා කරනලදැයි දනිත්ද සියල්ලන්ටම නොවටියි සියල්ලෙන් නොදකිත්ද සියල්ලන්ට වටියි.

පස්මහදැහැමියන් අතුරෙහි යම් ඒ එකෙකු පිණිස උදෙසා කරනලදද, සියල්ලන්ට කැප නොවේ. ඉදින් කිසිවෙක් එක් මහණෙකු උදෙසා ප්‍රාණයක් නසා ඒ මහණහුට පාත්‍රය පුරවා දේද, හෙතෙමේ තමන් පිණිස කළබව දන්නේම ගෙන අන් මහණක්හට දේද, ඒ මහණතෙමේ ඔහු ඇදහීමෙන් වළඳද, එකල්හි කවරක්හට ඇවැත්වේද යත්: දෙදෙනාහටම ඇවැත් නොවේ. යමෙකු උදෙසා කරනලදද, නොවැළඳූබැවින් ඔහුට ඇවැත් නොවේ. අනිකාහට නොදත්බැවින් කැපමය පිළිගැණීමෙහි ඇවැතක් නැත්තේය. යමෙකු උදෙසා කරනලදද නොදැන වැළඳූවහුට පසුව දැන ඇවැත් දෙසීම් කියත් නම් නැත්තේය. අකැප මසක් වනාහි නොදැන වැළඳූවහු විසින් පසුව දැනද ඇවැත දෙසියයුතුය. උදෙසා කරනලද්ද දැන වළඳන්නහුටම ඇවැත්වේ. අකැපමය. නොදැන වළඳන්නහුටද ඇවැත්වේමය. එහෙයින් ආපත්තිභීරුකවූ රූපය සලකන්නහු විසිනුදු විචාරාම මස පිළිගතයුතුය. 'පරිභොග කාලයෙහි විචාරා වළඳන්නෙමියි ගෙන විචාරා වැළඳියයුතුය. කුමක් හෙයින්දයත්: දැනගත නොහැකිබැවිනි. වලස්මසද ඌරුමස වැනිය. දිවිමස් ආදියද මුවමස් ආදිය වැනිය. එහෙයින් විචාරා ගැණීමම වටනේයයි කියත්.

'භවෙඨා උදගෙගා' තුටුවූයේද, ඔදවැඩි කාය චිත්ත ඇතියෙක්ද වී ඒ දෙව්දත්තෙමේ 'භාග්‍යවත්තෙමේ මේ පඤ්ච වස්තූන් නොඅනුදනියි.

දැන් සඞ්ඝභෙදය කරන්නට හැකි වන්නෙමියි කොකාලිකහට අදහස් කළ ආකාරය දක්වා විස කෑමෙන් හෝ රැහැණෙන් ගෙල බැද එල්බීමෙන් හෝ ආවුධයක් ගැනීමෙන් හෝ මැරෙනු කැමති පුරුෂයෙක්තෙමේ ඒ විස ආදීන් අතුරෙහි එක්තරා එකක් ලැබ ඒ හේතුවෙන් ලංව සිටි මරණදුක්ද නොදන්නේ යම්සේ සතුටුවේද, ඔදවැඩි සිත්, ඇත්තේවේද, එසේම සඞ්ඝභෙද හෙතුවෙන් අවීචියෙහි ඉපිද විඳියයුතුවූ ලංවසිටි දුක නොදන්නේ 'දැන් මා විසින් සඞ්ඝභෙදයට උපාය ලද්දැ'යි සතුටුවූයේ ඔදවැඩි සිතැත්තේ පිරිස් සහිතව හුනස්නෙන් නැගිට ඒ සන්තොෂයෙන්ම භාග්‍යවතුන්වහන්සේ වැද පැදකුණුකොට ගියේය.

'**තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහි සමාදය වත්තාම**' යන මෙහි වනාහි '**ඉමානි පඤ්චවත්ථූනි**' කිය යුත්තෙහිම තෙ ම'යං ඉමෙහි පඤ්චහි වත්ථූහි ජනං සඤ්ඤපෙස්සාම'යි නිත්‍යපරිවිතර්කවශයෙන් විභක්ති විපර්‍ය්‍යාසය නොසලකා නිත්‍යපරිවිතර්කයට අනුරූපවම '**තෙ මයං ඉමෙහි පඤ්චහි වත්ථූහු**' යනු කීයේය. විසිරීගිය සිතැත්තෙක් යම්සේද එසේය. '**ධුතා සල්ලෙඛවුත්තිනො**'.

යම් ප්‍රතිපදාවක් කෙලෙසුන් සලාද, ඒ ප්‍රතිපදාවෙන් යුක්තබැවින් ධුත නම් වෙයි. යම් ප්‍රතිපදාවක් කෙලෙසුන් කපා හරීද, ඒ ප්‍රතිපදාව මොවුන්ගේ පැවැත්මැයි සල්ලෙඛවුත්තීනම් වෙයි. '**බාහුලිකො**' චීවරාදිප්‍රත්‍යයන්ගේ බහුලභාවය බාහුල්ල නම. ඒ බහුලබව මොහුට ඇත්තේය. ඒ බහුලභාවයෙහි නියුක්තවූයේ හෝ සිටියේයයි බාහුලික නම. '**බාහුල්ලාය චෙතෙති**' බහුලබව පිණිස සිතයි. කල්පනා කරයි. තදින් කල්පනා කරයි. 'කෙසේ නම් මමද ශ්‍රාවකයන්ටද චීවරාදීන්ගේ බහුලබව වේදැ'යි මෙසේ උත්සාහයට පැමිණියේය යන අදහසය. '**චක්කභෙදය**' ආඥාභෙදය පිණිස '**ධම්මිං කථං කත්වා**' ඛන්ධකයෙහි කියූ නයින් 'දෙවදත්ත' කම් නැත. සඞ්ඝභෙදය රුචි නොවේවා, දෙවදත්ත, සඞ්ඝභෙදය බරය, දෙවදත්ත, යමෙක් සමගි සඞ්ඝයා බිඳහරීද, හෙතෙමේ කල්පයක් සිටුනා පව් රැස් කරයි. කපක් නිරයෙහි පැසෙයි. දෙවදත්ත, බිඳීගිය සඞ්ඝයා සමගිකරයිද, හෙතෙමේ ශ්‍රෙෂ්ඨ පුණ්‍යයක් රැස්කරයි. කපක් ස්වර්ගයෙහි සතුටුවේයයි දෙව්දත්හටද භික්ෂූන්ටද මේ ආදීවූ නන්වැදෑරුම්වූ එයට සුදුසුවූ එයට අනුලොම්වූ දැහැමිකතාකොට.

'**සමග්ගස්ස**' එක්වූ සිතින්ද සිරුරෙන්ද නොවෙන්වූ යන අර්ථයි. පදභාජනයෙහිද මේ අර්ථයම දක්වන ලද්දේය 'සමානසංවාසකයි කියන්නහු විසින් සිතින් නොවෙන්වීම දක්වන ලද්දේවේ. සමාන සීමාවෙහි සිටියේයයි කියන්නහු විසින් සිරුරෙන් නොවෙන්වීම දක්වන ලද්දේවේ.

සමානසංවාසකතෙමේ වනාහි උත්ක්ෂිප්තානුවර්තික භාවයෙන් යුක්ත ලබ්ධි නානාසංවාසකයා කෙරෙන්ද, උත්ක්ෂෙපණීය කර්මය කරනලද කර්ම නානාසංවාසකයා කෙරෙන්ද වෙන්වූයේ සමසිත් ඇතිබැවින් සිතින් නොවෙන්වූයේවේ. සමානසීමාවෙහි සිටියේ කායසාමග්‍රිදනයෙන් සිරුරෙන් නොවෙන්වූයේවේ. සමානසීමාවෙහි සිටියේ කායසාමග්‍රිදනයෙන් සිරුරෙන් නොවෙන්වූයේය.

'**භෙදනසංවත්තනිකං අධිකරණං**' බිඳීම පිණිස සඞ්ඝභෙදය පිණිස පවත්නා කරුණක්. මේ අවකාශයෙහි 'කාමහෙතු කාමනිදනං කාමාධිකරණං' යනාදි තන්හි මෙන් කාරණය අධිකරණැයි අදහස් කරනලද්දේය. එද යම්හෙයකින් අටළොස් වැදෑරුම්වේද, එහෙයින් පදභාජනයෙහි '**අට්ඨාරසභෙදකර වත්ථූනි**' යනු කියනලදී. '**ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති** යනාදි නයින් ඔවුහු ඛන්ධකයෙහි ආවාහුද එහෙයින් එහිදීම ඔවුන්ගේ අර්ථය වර්ණනා කරන්නෙමු. මේ අටළොස් වැදෑරුම්වූ භෙදකර වස්තූන් නිසා අන්‍යවූද අපලොකනාදි චතුර්විධ කර්ම අතුරෙන් එක්තරා එකකින්, පඤ්චවිධ ප්‍රාතිමොක්ෂොද්දෙශ අතුරෙන් එක්තරා එකකින්, අටළොස් භෙදකරවස්තූන් දැක්වීම නම්වූ ව්‍යවහාරයෙන්, තමන්ගේ ලබ්ධිය ගන්වනු පිණිස නැවත නැවත කණමුල ඇස්වීමෙන්, තමන්ගේ පක්ෂය ගත්බව දක්වනු පිණිස සලාක ගැන්වීමෙන් යන කරුණුපසින් යම් මේ සඞ්ඝභෙදයක්වේද, එද ආතන්හිම ප්‍රකාශ කරන්නෙමු.

සැකෙවින් වනාහි '**භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදය**' මෙහි සඞ්ඝභෙදය පිණිස පවත්නා සඞ්ඝභෙදයෙහි සිද්ධියට සමත්වූ කරුණක් ගැනැයි මෙසේ අර්ථය දතයුතුය. '**පග්ගය්හ**' දැඩිව ගන්නාලද්දක් තදින් එසුවුණක් ප්‍රකටවූවක්කොට. '**තිට්ඨෙය්‍ය**) සමාදන්වූ ලෙසට දැඩිව ගන්නාලද පරිදිමකොට සිටින්නේය. යම්හෙයකින් මෙසේ ගන්නහු විසින්ද සිටින්නහු විසින්ද ඒ දක්වන ලද්දම නොහරනලද්දේත්වේද, එහෙයින් පදභාජනයෙහි '**දීපෙය්‍ය**' යනුත් '**නප්පටිනිස්සජ්ජෙය්‍ය**' යනුත් වදරනලදී. '**භික්ඛූහි එවමස්ස වචනීයො**' අන්‍යවූ ලජ්ජී භික්ෂූන් විසින් මෙසේ කියයුතු වන්නේය. මේ පිළිබඳ පදභාජනයෙහිද '**යෙ පස්සන්ති**' යම් කෙනෙක් හමුවෙහි ගෙන සිටින්නහු දකිත්ද, '**යෙ සුණන්ති**' යම් කෙනෙක් අසුවල් විහාරයෙහි භික්ෂූහු බිඳීම පිණිස පවත්නාවූ කරුණක් සමාදන්ව දැඩිවගෙන සිටිත්යයි අසත්ද, එකල්හි '**සමෙතායස්මා සඞ්ඝෙන**' ආයුෂ්මත් තෙමේ සඞ්ඝයා සමග එක්වේවා, සමබවට යේවා, එක් ලබ්ධි ඇත්තේවේවා, යන අර්ථයි. කුමක් හෙයින්දයත් '**සමග්ගොහි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරති**'යි වදළබැවිනි.

එහි '**සම්මොදමානො**' ඔවුනොවුන් ශීලාදිසම්පත්තියෙන් මොනවට සතුටු වෙමින්, '**අවිවදමානො**' මේ ධර්මය, ධර්මය නොවේයයි මෙසේ විවාද නොකරමින් එක් උද්දෙසයක් මොහුටනුයි **එකුද්දෙස** නම. එක්ව පැවති ප්‍රාතිමොක්ෂොද්දෙශය ඇත්තේය. නොවෙන්ව යන අර්ථයි. '**ඵාසු විහරති**' සුවසේ වෙසෙයි '**ඉච්චෙතං කුසලං**' මේ ලබ්ධිය අත්හැරීම මැනවි නිරුපද්‍රය. ඒ මහණහුගේ සවස්ති භාවයවේ. '**නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස** තුන්වරක් කියනලදුව නොහරින්නහුට දුක්කටයවේ. '**සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස**' යම් කෙනෙක් අසා නොකියත්ද, ඔවුන්ටද, දුක්කටයවේ. කොපමණ දුරසිට අසා නොකියන්නවුන්ට දුක්කටය වේදයත් එක් වෙහෙරෙහි සිට අසන්නවුන් පිළිබඳව කිය යුත්තක් නැත්තේය. අර්ථකථාවෙහි වනාහි භාත්පස අඩයොදුනක් තැන සිටි භික්ෂූන්ට භාරයවේ. දූතයෙකු හෝ හසුනක් හෝ යවා කියන්නහුටද ඇවැතින් මිදීමක් නැත්තේය. තෙමේම ගොස් 'ඇවැත, සඞ්ඝභෙදය බරය, සඞ්ඝභෙදය පිණිස උත්සාහ නොකරවයි වැළක්විය යුතුයයි කියනලදී. යන්නට සමත් නොගිලන්හු විසින් දුරටද යායුතුය. නොගිලනුන්ට දුරපවා භාරමය. දැන් '**එවඤ්ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො**' යනාදි තන්හි අර්ථය පමණක්ම දක්වනු පිණිස '**සො භික්ඛු සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා**' ඉදින් පෙර කියූ නයින් කියනුලබන්නේ නොහරීද, අත් හා පාද ගෙනද සභමැදට ඇද නැවැතත් '**මා ආයස්මා**' යනාදි නයින් තෙවරක් කියයුතුය. '**යාවතතියං සමනුභාසිතබ්බො**' තෙවන සමනුභාෂණය යම්තාක්ද ඒතාක් සමනුභාෂණය කටයුතුය. ත්‍රිවිධ සමනුභාසනකර්මවාක්‍යයෙන් කර්මය කටයුතුයයි කියනලද්දේවේ.

පදභාජනයෙහි දෙවරක් මේ ශික්ෂාපදයෙහි අර්ථයම ගෙන සමනුභාසන විධිය දක්වනු පිණිස '**සො භික්ඛු භික්ඛූහි සමනුභාසිතබ්බො, එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බො**' යනාදිය වදරන ලද්දේය. එහි ඤත්තියෙන් දුක්කටයවේ. කර්මවාක්‍ය දෙකින් ථුල්ලච්චය දෙකක්වේ. '**පටිප්පස්සම්භන්ති**' ඤත්තියෙහි කෙළවර යම් දුක්කටයකට පැමිණියේද, කර්මවාක්‍ය දෙකින් යම් ථුල්ලච්චය දෙකකට පැමිණියේද, ඒ තුන් ඇවැත්හු '**යස්ස නක්ඛමති සො භාසෙය්‍ය**' යන මෙහි මෙසේ තෙවන කර්මවාක්‍යය යථාකාරයට පැමිණි මාත්‍රයෙහි සංසිදෙත් සඞ්ඝාදිසෙසයෙහිම සිටිය කිම, පැමිණ ඇවැත්හු සාසිදෙත්ද, නොපැමිණි ඇවැත්හු සංසිදෙත්, යත් මහා සුම්මස්ථවිරතෙමේ වනාහි 'යමෙක් කර්මවාක්‍යයෙහි කෙළවර අත්හරීද, හෙතෙමේ ඒ ඇවැතුන්ට නොපැමිණේ. එහෙයින් නොපැමිණි ඇවැත්හු සංසිදෙත්යි කියයි. මහාපදුමස්ථවිර තෙමේ 'ලිඞ්ගපරිවර්තනයෙන් අසාධාරණ

ඇවැතුන් මෙන් පැමිණ ඇවැත්හු සංසිදෙන්නාහ. නොපැමිණියවුන්ගේ සංසිඳීමෙන් කිමැයි කීයේය.

**'ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී'** ඒ සමනුභාෂනකර්මය ධර්මකර්මවේනම් එහි ධර්මකර්මය යන හැඟීම් ඇත්තේය යන අර්ථයි. හැමතන්හි මේනයයි. මෙහි සංඥ නොරකියි. කර්මය තමා ධාර්මික බැවින්ම නොහරින්නේ පැමිණේ. **'අසමනුභාසන්තස්ස'** සමනුභාෂකර්මය නොකරනුලබන ඒ ලබ්ධිය නොහරින්නහුට ද සඞ්ඝාදිසෙසයෙන් ඇවැත් නොවේ. **'පටිනිස්සජ්ජන්තස්ස** ඥත්තියෙන් පෙර හෝ ඥත්ති කෙරෙහි හෝ ඥත්ති කෙළවර හෝ පළමුවන හෝ දෙවන හෝ තෙවන හෝ අනුශ්‍රාවණයෙන් යම්තාක් ය්‍ය කාරයට නොපැමිණේද, ඒතාක් අත්හරින්නහුට සඞ්ඝාදිසෙසයෙන් ඇවැත් නොවේ. **'ආදිකම්මිකස්ස'** යන මෙහි 'දෙවදත්ත තෙමේ සමගිසඞ්ඝයාගේ බිඳීම පිණිස උත්සාහ කෙළේය. ඒ වස්තුවෙහියි. **පරිවාරයෙහි** ආ බැවින් දෙවදත්තතෙමේ ආදිකර්මිකවේ. හෙතෙමේද සඞ්ඝභෙදය පිණිස උත්සාහ කරන්නහුගේ වසයෙන් ආදිකර්මිකවේ. අත්නොහරින්නහු පිළිබඳව නොවේ. ඔහුට ඒ කර්මය නොකරනලද්දේය. මෙය කෙසේ දතයුතුද යත්: සූත්‍රයෙන් දතයුතුය. 'පෙර ගිජුලිහිණියන් නැසූ තැනැත්තෙක්ව සිටි අරිට්ඨභික්ෂුතෙමේ තෙවනවර දක්වා කළ සමනුභාෂණයෙන් ඒ උත්සාහය අත්නොහළේය. ඒ වස්තුවෙහියි පරිවාරයෙහි ආබැවින් අරිට්ඨභික්ෂුහට කර්මය කරනලදැයි යම්සේ ප්‍රකටවේද, දෙවදත්තහට එසේ නොවේ. එහෙත් මේ දෙවදත්තහට කළ කර්මයකින් වියයුතුයයි කිසිවෙක් තමාට රිසිපමණින් කියන්නේද, එහෙත් උත්සාහය අත්නොහැරීමෙහි ආදිකර්මිකයාහට අනාපත්තියක් නම් නැත. **'අනුජානාමි භික්ඛවෙ රොමන්ථකස්ස රොමන්ථං'**යි ආදි විසින් උදෙසා අනුඥතශික්ෂාපදය හැර ප්‍රඥප්තිශික්ෂාපදයක් ඉක්මවන්නහුට අනාපත්තියක් නම් නොපෙනේ. අරිට්ඨශික්ෂාපදය පිළිබඳව ආදිකර්මිකයාහට අනාපත්තියි පොත්වල යමක් ලියූද එය ප්‍රමාද ලිඛිතයක්වේ. මේ පිළිබඳ ප්‍රමාදලිඛිතභාවයද 'පළමුකොට අරිට්ඨ භික්ෂුතෙමේ චොදනා කටයුත්තේය. චොදනාකොට සිහිකරවිය යුත්තේය. සිහිකරවා ආපත්තිය ආරොපණය කටයුත්තීයයි මෙසේ කර්මස්කන්ධකයෙහි ආ ආපත්ති ආරොපණවචනයෙන් දතයුත්තේය. මෙසේ භෙදය පිණිස උත්සාහ කිරීමෙහි ආදිකර්මික දෙවදත්තහට යම්හෙයකින් ඒ කර්මය නොකරනලද්දේද, එහෙයින් මේ දෙවදත්තයාහට ඇවැත නොවූයේමය. ශික්ෂාපදය වනාහි ඔහු අරබයා පණවනලදැයිකොට ආදිකර්මිකයෙකැයි කියනලද්දේය. මෙසේ ඇවැත නොවනබැවින්ම මේ දෙවදත්තයාහට අනාපත්තිය කියනලදි. ඒ මේ අනාපත්තිය **'අසමනුභාසන්තස්ස'** යන

මෙයින්ම සිද්ධය. යම්හෙයකින් සමනුභාෂණය නොකරනුයේ නම් යමක්හට හුදෙක් සමනුභාෂනය නොකෙරෙත්ද, හෙතෙමේ ආදිකර්මික නොවේයයි කියනුලැබේ. මෙතෙමේද ආදිකර්මිකමවේ. එහෙයින් **ආදිකම්මිකස්සයි** වදරනලදි. මේ උපායෙන් අරිට්ඨශික්ෂාපදය හැර සියලු සමනුභාෂණයන්හි විනිශ්චය දතයුතුය. සෙස්ස සියලු තන්හි ප්‍රකටමය. සමුට්ඨානාදීන් අතුරෙහි කායවාචාචිත්තවසයෙන් අඞ්ගත්‍රයක් ඇත්තේය. කායවාචා චිත්තසඞ්ඛ්‍යාත එක් සමුට්ඨානයක් ඇත්තේය. මේ සමනුභාෂණ සමුට්ඨානය නම් කායවාචාචිත්තයෙන් නගින්නේය. ඒ උත්සාහය හරිමියි කායවිකාරයක් හෝ වාගෙදයක් හෝ නොකරන්නහුටම පැමිණියයුතුබැවින් අක්‍රියාසමුට්ඨානයි. නොහරිමියි යන සංඥවයේ අභාවයෙන් සංඥවිමොක්ෂයයි. නොහරිමියි දන්නා සිත ඇතිබැවින් සචිත්තකය. ලොකයා විසින් නියමිතබැවින් ලොකවද්‍යය. හස්තසංඥවෙන් කයින් කළයුතු බැහැර කිරීම නොකළබැවින් කායකර්මයි. වචනයෙන් කළයුත්ත නොකළබැවින් වාකකර්මයි. අකුශලචිත්තයි. දෙම්නස් වසයෙන් දුඃඛවෙදනායි.

ප්‍රථම සඞ්ඝභෙදශික්ෂාපද වර්ණනාව නිමි.

—॥—

**'තෙන සමයෙන බුද්ධො භගවා'** ද්විතීය සඞ්ඝභෙදශික්ෂාපදයයි. එහි **'අනුවත්තකා'** ඔහුගේ දෘෂ්ටිය ඉවසීම රුචිය යන මොවුන්ගේ ගැනීමෙන් එයට අනුව පිළිපදින්නාහු. ව්‍යග්‍රවූ අසාමග්‍රියපාක්ෂික වචන කියන්නුයි **වග්ගවාදක** නම. පදභාජනයෙහි වනාහි ඒ පිළිබඳ වර්ණනාවෙහි පක්ෂයෙහි සිටියාහු වෙත්යි වදරනලදි. සඞ්ඝභෙදය පිණිස උත්සාහ කරන්නාවූ ඔහුගේ ගුණකීම පිණිසද, පක්ෂවෘද්ධිය පිණිසද සිටියාහු යන අර්ථයි. යම් කෙනෙක් ව්‍යාග්‍රවාදක වූවාහුද ඔවුහු නියමයෙන් මෙබන්දෝ වෙති. එහෙයින් මෙසේ වදරනලදි. යම්හෙයකින් යම්හෙයකින් තිදෙනකුට වැඩියක් කර්මයට සුදුස්සෝ නොවෙත්ද, සඞ්ඝතෙමේ සඞ්ඝයාට කර්ම නොකෙරේද, **'එකො වා ද්වෙ වා තයො වා'** එහෙයින් 'එකෙක් හෝ දෙදෙනෙක් හෝ තිදෙනෙක් හෝයි වදරනලදි. **'ජානාති නො'** අපගේ ඡන්දාදිය දනියි. **'භාසති'** මෙසේ කරමුයි අප සමග කියයි. **'අම්හාකමෙපතං ඛමති'** හෙතෙමේ යමක් කෙරේද, මේ කිරීම අපටද රුස්නේය. **'සමෙතායස්මන්තානං සඞ්ඝෙන'** ආයුෂ්මතුන්ගේ සිත සඞ්ඝයා සමග එක්වේවා. එකීභාවයට යේවායි කියනලද්දේවේ. මෙහි සෙස්ස ප්‍රථම ශික්ෂාපදයෙහි කියූ නය

ඇතිබැවින්ද උත්තානාර්ථ ඇතිබැවින්ද ප්‍රකටමය. සමුට්ඨානාදීහුද ප්‍රථම ශික්ෂාපදය සමාන වෙත්මය.

ද්විතීයසඞ්ඝභෙද ශික්ෂාපද වර්ණනාව නිමි.

——\\——

‘**තෙන සමයෙන බුද්ධො භගවා**’ දුබ්බච සික්ෂාපදයයි. එහි ‘**අනාචාරං ආචරති**’ අනෙකප්‍රකාරවූ කායවාක්ද්වාර ව්‍යතික්‍රමය කරයි. ‘**කින්නු බො නාම**’ මෙය ගර්හාවචනයි. ‘**අහං බො නාම**’ මෙය උත්කර්ෂවචනයි. ‘**තුම්හෙ වදෙය්‍යං**’ මෙය කරවු, මෙය නොකරවු’යි තොපට කියන්නට මම සුදුසු වෙමියි දක්වයි. කුමක් හෙයින්ද යත්, ‘අපගේ බුදුරජාණන්වහන්සේ යම්හෙයකින් කන්ථක අසු පිට නැග මා සමග නික්ම පැවිදිවූහයි මේ ආදි අර්ථය සඳහා කීය. අපගේ ධර්මයයි කියා තමන් සතු බැව්හි යුක්තිය දක්වමින් ‘**අම්හාකං අය්‍යපුත්තෙන ධම්මො අභිසමිතො**’ යනු කීහ. යම්හෙයකින් අපගේ ආර්‍ය්‍යපුත්‍රයා විසින් චතුස්සත්‍යධර්මය අවබොධ කරනලද්දේද, එහෙයින් ධර්මයද අපගේයයි කියනලද්දේවේ. සඞ්ඝයා තම වෛරීපක්ෂයෙහි සිටියහුයි සිතමින් අපගේ සඞ්ඝතෙමේයි නොකියැයි උපමාවක් කියා සඞ්ඝයා පහකරනු කැමතිව ‘**සෙය්‍යථාපි** නාම යනාදිය කීයේය. ‘**තිණකට්ඨපණ්ණසටං**’ ඒ ඒ තැන වැටුණු තණ වියලි දඬු පරලා නොහොත් තෘණද, හර නැති සැහැල්ලු වියලිදඬුද තිණකට්ඨ නම. ‘පණ්ණසටං’ පුරාණපත්‍ර ‘**උස්සාදෙය්‍ය**’ රැස් කරන්නේය. ‘**පබ්බතෙය්‍යා**’ පර්වතයෙන් උපන් ඕ වනාහි වේගවත් දියපහර ඇත්තීය. එහෙයින් ඒ වේගවත් දියපහරම ගනියි. ‘**සඞ්ඛසෙවාලපණකං**’ යන මෙහි ‘සඞ්ඛො’ යනු දිග්මුල් ඇති කොළසෙවෙල් කියනුලැබේ. ‘සෙවාලො’ නිල්සෙවෙල් සෙසු රොන්මඩ වියලි පැළුණු කබල් තලබිජු ආදීවූ සියල්ලම පණකයි. ගිනීමට යෙයි. ‘**එකතො උස්සාදිතා**’ කිසිවෙකු විසින් එක් තැනක පිඬු කරනලදය. රැස්කරනලදයයි දක්වයි.

‘**දුබ්බචජාතිකො**’ දුර්වසක ස්වභාව ඇත්තේය. කියන්නට නොහැක්කේය යන අර්ථයි. මේ ශික්ෂාපදයෙහි පදභාජනයෙහිද ‘**දුබ්බචො**’ යන මෙයින් දුකින් අවවාද කටයුත්තේය. සැපසේ කියන්නට නොහැකියයන අර්ථය වදරනලද්දේය. ‘**දොවචස්සකරණෙහි**’ දුර්වචභාවය කරන්නාවූ යම් ධර්මයක් පුද්ගලයා දුර්වච කෙරෙත්ද, ඒ ධර්මයන්ගෙන් යුක්තවූයේය යන අර්ථයි. ඔවුහු වනාහි ඇවැත්ති, දුර්වචභාවය කරන ධර්මයෝ කවරහුදැ?’යි ඇවැත්ති’ මේ ශාසනයෙහි මහණතෙමේ ලාමක ආසා ඇත්තේවේය, යනාදි නයින් පිළිවළින් අනුමානසූත්‍රයෙහි ආවාවූ ලාමක ආසා ඇතිබව,

තමා උසස් තැන තබා අන්හු පහත් තැන තැබීම, ක්‍රොධකරනසුලුබව, ක්‍රොධය හෙතුකොට බද්ධවෛර ඇතිබව, ක්‍රොධය හෙතුකොට ගැටෙනබව, ක්‍රොධය හෙතුකොට ක්‍රොධයට අසලවූ විහිදෙනබව, චොදකයාහට පටහැනිබව, චොදකයාට ගැරහීම, චොදකයාහට වටාලා චොදනා කිරීම, අනෙකෙකින් අනික වසනබව, චරිතය සපයා කියන්නට නොහැකිවීම, ගුණමකුව යුගග්‍රාහ ඇතිබව, පරසම්පත්ති නොඉවසීම හා මසුරුබව, නැතිගුණ පහළ කිරීම හා මායා ඇතිබව, තදබව හා අධිකමානය ඇතිබව, තමදෘෂ්ටිය පහසා සැහැවිබව ඉක්මවා පසුභාගයෙන් පැහැසීම ඇතිබව, දැඩිව ගැනීම ඇතිබව, යුතුකරුණ දැකද හරින්නට නොහැකි ලබ්ධිය ඇතිබව යන එකුන් විසි ධර්මයෝයයි දතයුතුයි.

අවවාදය නොඉවසයි, නොඋසුලාතුයි අක්ඛම නම. අනුශාසනා ලෙසින්, නොපිළිපැදීමෙන්, ගෞරවයෙන් අනුශාසනාව නොගතිතුයි **අප්පදක්ඛිණග්ගාහී අනුසාසනිං**. නම **'උද්දෙසපරියාපන්නෙසු'** ප්‍රාතිමොක්ෂොද්දෙශයෙහි යෙදුණු ඇතුළත්වූ **'යස්ස සියා ආපත්ති සො ආවිකරෙය්‍ය'**යි මෙසේ සඞ්ග්‍රහ කළබැවින් ප්‍රාතිමොක්ෂයතුළ පවත්නාවූ යන අර්ථයි. **'සහධම්මිකං වුච්චමානො'** ප්‍රඥප්ත ශික්ෂා පදයෙන් කියනුලබන්නේ. කරණාර්ථයෙහි ද්විතීයාවචනයි. පස්මහ දහැමියන් විසින් හික්මියයුතුබැවින්, නොහොත් ඔවුන් සතුබැවින් සහධම්මිකයි ලැබූ නම් ඇති බුදුරජුන් විසින් පැණවූ ශික්ෂාපදයෙන් කියනු ලබන්නේය යන අර්ථයි. **'විරමථායස්මන්තො මම වචනාය'** යම් වචනයකින් මට කියවුද, ඒ මට කියූ වචනයෙන් වෙන්වවූ, මට ඒ වචනය නොකියවුයි කියනලද්දේවේ. **'වදෙතු සහධම්මෙන'** සහධාර්මික ශික්ෂාපදයෙන් හෝ සහධාර්මිකවූ අනිකුදු ප්‍රාසාදිකභාවය පිණිස පවත්නා වචනයෙන් හෝ කියාවා, **'යදිදං'** වෘද්ධිකාරණය නිදර්ශනාර්ථයෙහි නිපාතයෙකි. එයින් ඔවුනොවුන්ට යම් මේ හිතවචනයක්වේද, ඇවැතින් නගාසිටුවීමක් හෝ වේද ඒ ඔවුනොවුන්ට කියූ වචනයෙන්ද ඔවුනොවුන් නගාසිටුවීමෙන්ද පිරිස් වැඩෙන්නීයයි මෙසේ පිරිසෙහි වෘද්ධිකාරණය දක්වන ලද්දේවේ. සෙස්ස සියලු තන්හි ප්‍රකටමය. සමුට්ඨානාදීහු ප්‍රථම සඞ්ඝභෙදශික්ෂාපදය සමානවූවාහුමවෙති.

දුබ්බචශික්ෂාපද වර්ණනාව නිමි.

——||——

**'තෙන සමයෙන බුද්ධො භගවා'** කුලදූෂකශික්ෂාපදයයි. එහි 'අස්සජිපුනබ්බසුකා නාම' අස්සජිද පුනබ්බසුකද යන දෙදෙනය.

'**කීටාගිරිස්මිං**' මෙනම් ඇති ජනපදයෙහි. '**ආවාසිකාහොන්ති**' මෙහි ආවාසය මොවුන්ට ඇත්තේනුයි ආවාසික නම. විහාරය ආවාසැයි කියනුලැබේ. ඒ ආවාසය නවකම් කිරීම. පැරණිතැන් පිළිදැගුම් කිරීම ආදීවූ බර උසුලනබැවින් යම් කෙනකුන්ට අයත්වූයේද ඔවුහු ආවාසිකයෝ වෙත්. යම් කෙනෙක් හුදෙක් විහාරයෙහි වසත්ද, ඔවුහු නෙවාසිකයි කියනුලැබෙත්. මොවුහු ආවාසිකයෝවූහ. '**අලජ්ජිනො පාපභික්ඛූ.** ලජ්ජාවිරහිත ලාමක භික්ෂූහුය. ඒ අස්සජිපුනබ්බසුකයෝ සවග මහණුන් අතුරෙහි වැඩිමහලු සවගමහණෝය. සැවැත්නුවර වනාහි යහළුවූ පණ්ඩුක-ලොහිතකා-මෙත්තිය-භුම්මජක-අස්සජි-පුනබ්බසුකයි සදෙනෙක් කෘෂිකර්මාදීහු දුෂ්කරයහ, යහළුවෙති, එබැවින් අපි පැවිදි වම්හ. පැවිදිවන්නත් විසිනුදු කටයුත්තක් උපන්කල්හි එය උසුලන්නට පොහොසත් තැනක පැවිදිවන්නට වටීයයි මන්ත්‍රණය කොට දැගසව්වන්ගේ සමීපයෙහි පැවිදිවූහ. ඔවුහු පස්වස් ඇත්තෝව මාතෘකාව පුහුණුකොට ජනපදය සමහර කලෙක සුභික්ෂ වේ. සමහර කලෙක දුර්භික්ෂවේ. එහෙයින් අපි එක් තැනක නොවසමු, තුන් තැනක වසමුයි මන්ත්‍රණය කළහ.

ඉක්බිති ඇවැත්නි, සැවැත් නුවර සත්පණස් ලක්ෂයක් කුල වාසය කළේය. ගම් අසූදහසකින් ප්‍රතිමණ්ඩිතවූ තුන්සියයක් යොදුන් ඇති කාසි-කොසල දෙරට අය උපදින දෙරකඩ විය. තෙපි එහි ජේතවන දෙරටුව සමීපයෙහි පිරිවෙන් කරවා අඹ කොස් පොල් ආදිය රෝපණය කරවා මල්වලින් හා ගෙඩිවලින් කුලසඞ්ග්‍රහ කරමින් කුලදරුවන් පැවිදි කරවා පිරිස වඩාලමුයි පණ්ඩුක-ලොහිතකයන්ට කීහ. මෙත්තිය භුම්මජකයන්ට 'ඇවැත්නි රජගහනුවර අටළොස් කෙළක් මිනිසුන් වසනලදය, ගම් අසූදහසකින් ප්‍රතිමණ්ඩිතවූ යොදුන් තුන්සියයක් ඇති අඟුමගධ දෙරටම අය උපදින දෙර වූයේය, තෙපි එහි ඉදිරිතැනකම - පෙ- පිරිස වඩාලවුයි කීහ. අස්සජි-පුනබ්බසුකයන්ට 'ඇවැත්නි කීටාගිරිය, වස්සාන හෙමන්ත යන සෘතු දෙක්හි වස්නා දෙවැස්සෙන් අනුගෘහිතය. ත්‍රිවිධ ධාන්‍ය පැසෙයි. තෙපි එහි ඉදිරියෙහිම පිරිවෙන් කරවා -පෙ- පිරිස වඩාලවුයි කීහ. ඔවුහු එසේ කළහ.

ඔවුන් අතුරෙහි එක් එක් පක්ෂයට පන්සිය පන්සිය භික්ෂූහු පිරිවරවූහ. මෙසේවූ භික්ෂූහු එක්දහස් පන්සියයකට අධිකවූහ. එහි පිරිවර සහිතවූ පණ්ඩුක-ලොහිතකයෝ සිල්වත්වම භාග්‍යවතුන්වහන්සේ සමග ජනපදචාරිකාවෙහිද හැසිරෙත්. ඔවුහු පෙර නොකළ වැරදි කරත්. හෙවත් කණිකාරාදීවූ අලුත් මල්වතු වවත්. අන් සියල්ලෝ අලජ්ජීහුය. පෙර නොකළ වැරැදිද කරත්. පැණවූ සිකපදද මඩිත් '**අලජ්ජිනො පාපභික්ඛූ**'

යනු එහෙයින් වදාළසේක. '**එවරූපං**' මෙබඳු සැහැවි ඇති. '**අනාචාරං ආචරන්ති,** නොහැසිරියයුත්තෙහි හැසිරෙත්. නොකටයුත්ත කරත්. '**මාලාවච්ජං**' තරුණමල්රුක්ය. තුරුණ මල්රුක්ද මල්ගස්ද මාලාවච්ජයි කියනු ලැබෙත්. ඔවුහුද නන්වැදෑරුම්වූ මල්ගස් මල්රුක් තුමූද රෝපණය කරත්. අන්හු ලවාද රෝපණය කරවත්, '**මාලාවච්ජං රෝපෙන්තිපි රෝපාපෙන්තිපි**'යි වදරනලදී. '**සිඤ්චන්ති**' තුමූම දිය ඉසිත්. '**සිඤ්චාපෙන්තිපි**' අනුන්හු ලවාද දිය ඉස්වත්, මෙහිලා අකැප ව්‍යවහාරය, කැපව්‍යවහාරය, පරියාය, ඕභාසය, නිමිත්තකම්මය යනමේ පස දතයුත්තේය.

එහි අකප්පිය වොහාරය නම්, නෙත් තිල් තණ සිඳීම, සිඳවීම, වළ කැණීම, කැණවීම, මල්ගස් මල්රුක් සිටුවීම, සිටුවාලීම, තියරබැඳීම, බැඳවීම, දිය ඉසීම, ඉස්වාලීම, දිය ඇළ තමා දෙසට නමා ගැනීම, කැපදිය ඉසීම, අත්මුව පා දෝනට. නැමට දිය ඉසීමය යන මේවේ. කප්පිය වොහාරය නම්, මෙරුක දනුව, මේ වළ දනුව, මේ මල්රුක් මල්ගස් දනුව, මෙහි පැන් දනුව යන වචනය. වියළි ඇළ සෘජු කිරීමද වේ. පරියාය නම්, පණ්ඩිතයා විසින් මල්ගස් ආදිය සිටුවාලිය යුතුය. නොබෝ කලකින්ම උපකාරය පිණිස පවතිත්ය යනාදිය කීමය. ඕභාසය නම්, උදලු, බිම කණිනහුල් ආදියද, මල්ගස්ද ගෙන සිටීමය. සාමණේරාදීහු මෙසේ සිටියහු දැක 'ස්ථවිරතෙමේ කරවනු කැමැත්තේයයි ගොස් කරත්, නිමිත්තකම්ම නම්, උදලු, බිම කණිනහුල්, වැපොරෝ, දිය බඳුන් ගෙනවුත් සමීපයෙහි තැබීමය. මේ පසම කුලසඞ්ග්‍රහය පිණිස සිටුවීමෙහි නොවටියි. ඵලපරිභොගය පිණිස කැප අකැප ව්‍යවහාර දෙකම නොවටියි. පරියාය ඕභාස නිමිත්තකම්ම යන තුන ඵලපරිභොගය පිණිස වටියි. මහාපච්චරියෙහි 'කැප ව්‍යවහාරයද වටියි, තමන්ගේ පරිභොගය පිණිස යමක් වටීද, එය අන්‍යපුද්ගලයෙකු පිණිස හෝ සඞ්ඝයා පිණිස හෝ චෛත්‍යයක ප්‍රයොජනය පිණිස හෝ වටීයයි කියනලදී. ආරාමය පිණිසද වනය පිණිසද සෙවන පිණිසද අකැප ව්‍යවහාර මාත්‍රයක්ම නොවටියි. සෙස්ස වටියි. හුදෙක් සෙසු සියල්ල පමණක් නොවේ. වියලි නොවියලි යම්කිසි ඇළක් සෘජු කරනු පිණිස කැපදිය ඉසින්නටද නානකොටුවක්කොට නාන්නටද, අත්පා මුවදෝනා දියද එහි දමන්නට වටියි. මහාපච්චරියෙහිද කුරුන්දියෙහිද 'කැප පොළොවෙහි තමා විසින් සිටුවන්නටද වටීයයි කියනලදී. ආරාමාදිය පිණිස වනාහි රෝපණය කරන ලද්දක හෝ රෝපණය කරවන ලද්දක හෝ ඵලය පරිභොග කරන්නටද, වටියි. නෙළීම නෙලවීම්හි සැහැවියෙන්ම පාචිත්තියවේ.

කුලදූෂණය පිණිස පාචිත්තියද දුක්කටයදවේ. ගෙතීම් ආදිකොට ඇති ලෙහි පලදින මල්දම කෙළවරකොට ඇති මොවුන් අතුරෙහි කුලදූෂණය පිණිස හෝ වස්තුපූජාදීවූ අනිකක් පිණිස හෝ කරන්නහුට දුක්කටයමවේ. කුමක් හෙයින, යත්: අනාචාර බැවින්ද 'පාපසමාචාරො'යි මෙහි කියූ පාපසමාචාර බැවින්දවේ. ආරාමාදිය පිණිස ගස් සිටුවීමෙහි මෙන් තෙරුවන් පිදීම පිණිස ගස් සිටුවීමෙහිදී කුමක් හෙයින් අනාපත්ති නොවන්නීද යත්:- අනාපත්තිමය. යම්සේ ඒ ආරාමාදිය පිණිස ගස් සිටුවීමෙහි පරියායාදියෙන්ද අනාපත්තිවන්නීද, එසේ තෙරුවන් පිදීම පිණිසද අනාපත්තිමවේ. එහි කැප පොළොවෙහි තමන් විසින් ගස් සිටුවන්නටද වටීයයි කියනලද්දේ නොවේද, කියනලද්දේය. මහා අත්ථකථාවෙහි නොකියන ලද්දේය. එහෙත් අන්අටුවාවන්හි කියනලද ප්‍රමාණය පිළිගතයුතුය. මහා අටුවාවෙහිද කැපදිය ඉසීම කියනලදී. ඒ කීයේය යත්: එද විරුද්ධ නොවේ. එහි විශේෂයක් නොතබා 'රුක්ඛං රොපෙත්තිපි රොපාපෙත්තිපි සිඤ්චත්තිපි සිඤ්චාපෙත්තිපි' කිය යුත්තෙහි 'මාලාවච්ඡං'යි කියමින් 'කුලසඞ්ග්‍රහය පිණිස මල්පලරුක්වැල් ආදියම සඳහා මෙය කියනලද්දේය. අන් තන්හි වනාහි ආරාමාදිය පිණිස පරියායෙක් ඇත්තේයයි හඟවයි. එහෙයින් එහි පරියායද මෙහි පරියාභාවයද දැන යමක් අටුවාවන්හි කියනලදද, එය මොනවට කියනලද්දේමය.

> බුදුරජුන් විසින් යම් ධර්‍මයක් විනයක් වදාරනලද්දේද, ඒ ධර්‍මවිනය උන්වහන්සේගේ පුත්‍රයන් විසින් එසේම දන්නාලද්දේය. යම් කෙනෙක් උන්වහන්සේලාගේ අදහස නොහරිමින් යම්හෙයකින් පෙර අත්ථකථා කළාහුද, එහෙයින් අත්ථකථාවන්හි යමක් කියනලදද, එහි ප්‍රමාදලිඛිතවූ එය හැරපියා අන් සියල්ල මෙහි ශික්‍ෂාවන්හි ගෞරව සහිතවූ පණ්ඩිතයන්ට ප්‍රමාණවේයයි මේ කියනලද්දේය.

සියල්ලයට කියූ නයින්ම දතයුතුය. එහි තෙරුවන් පිදීම පිණිසද මල්දම් ගෙතීම් ආදියෙහි ඉදින් ඇවැත්වේද, තෙරුවන් පිදීම පිණිස ගෙනයෑම් ආදියෙහි කුමක් හෙයින් අනාපත්ති වන්නීද, කුලස්ත්‍රී ආදීන් පිණිස ගෙන යෑමෙන් හරණධිකාරය වෙනස්කොට 'තෙ කුලිත්ථීනං' යනාදිය කියනලදී. එහෙයින් බුද්ධාදීන් සඳහාගෙන යන්නහුට ඇවැත් නොවේ.

එහි 'එකතොවණ්ටිකං' මල්නටු එක්කොට කළ මල්දමය. 'උභතො වණ්ටිකං' දෙපසෙහි මල්නටුකොට කළ මල්දමය. 'මඤ්ජරිකං' යනාදි තන්හි පොකුරක් මෙන් කළ පුෂ්පවිකෘතිය මඤ්ජරිකායි කියනුලැබේ.

**'විධූතිකා'** හිදියෙන් හෝ කුරෙන් හෝ තිකමල් ආදියවීද කළ මල්දමය. **'වතංසකො'** මුදුන් මල්කඩය. **'ආවෙළො'** බොහෝ මල් හෝ මල්දම් හෝ එක්කොට බැඳ කරණලද පොකුරය. **'උරච්ඡදෙ'** මුතුහර වැනි ලෙහි පලඳින මල්දමය. මේ මෙහි පදවණිනාය. මේ වනාහි මුල පටන් විස්තර විසින් ආපත්තිවිනිශ්චයයි. කුලදූෂණය පිණිස අකැප පොළොවෙහි මල්ගස් මල්රුක් සිටුවන්නහුට පාචිත්තියද දුක්කටයදවේ. එසේ නොකැප වහරින් රෝපණය කරවන්නාහට කැප පොළොවෙහි සිටවීමෙහි, සිටුවාලීමෙහිද දුක්කටයමවේ. කැප නොකැප දෙතන්හිම වරක් ඇණවීමෙන් බොහෝවූද මල්ගස් සිටවීමෙහි එක්ම පාචිත්තිය සහිතවූ දුක්කටයක් හෝ සුද්ධදුක්කටය හෝවේ. පරිභොගය පිණිස කැප බිම හෝ නොකැප බිම හෝ කැපවහරින් රොපණය කරවීමෙහි ඇවැත් නොවේ. ආරාමාදිය පිණිසද නොකැප පොළොවෙහි රොපණය කරන්නහුට හෝ නොකැප වචනයෙන් රොපණය කරවන්නහුට හෝ පාචිත්තියවේ.

මේ නය වනාහි මහාඅට්ඨකථාවෙහි මනාකොට විභාග නොකරනලද්දේය. මහාපච්චරියෙහි විභාග කරනලද්දේය. නොකැප දිය ඉසීම් ඉස්වීම්හි හැම තැන පාචිත්තියවේ. කුලදූෂණ පරිභොගය පිණිස දුක්කටයදවේ. කැපදියෙන් කුලදූෂණ පරිභොග යන එදෙකම පිණිස කිරීමෙහිදී දුක්කටයවේ. පරිභොගය පිණිසද මෙහි කැපවහරින් ඉස්වීමෙහි ඇවැත් නොවේ. ආපත්තිස්ථානයෙහි දියදහර සිදීම්වසයෙන් ප්‍රයොග බහුලභාවයෙන් ආපත්තිබහුලභාවය දතයුතුය. කුලදූෂණය පිණිස මල් නෙලීමෙහිදී මල් ගණනින් දුක්කට පාචිත්තීයවේ. තෙරුවන් පිදීම් ආදී අන් අදහසකින් නෙලීමෙහිදී පාචිත්තියවෙයි. බොහෝ මල් එක් ප්‍රයොගයෙන් නෙලන්නේ ප්‍රයොගවශයෙන් කරවිය යුතුය. කුලදූෂණය පිණිස මල් වරක් අණකරනලද්දේ බොහෝමල් නෙලාද එක්ම පාචිත්තියක් හා දුක්කටයක්වේ. අන්තන්හි පාචිත්තියමවේ.

ගෙතීම් ආදියෙහි සියලු සවැදෑරුම්වූ පුෂ්පවිකෘතීහු දතයුත්තාහුය. ගන්ථිම-ගොප්ඵිම-වෙධිම-වෙඨිම-පූරිම-වායිම යන මොහුය. එහි ගන්ථිම නම්, දඬු සහිත උපුල් පියුම් ආදියෙහි හෝ අන්‍යවූ දිග්නටු ඇති පුෂ්පයන්හි දතයුතුය. දඬුවෙන් දඬුව හෝ නටුවෙන් නටුව හෝ ගොතා කරනලද්දම ගන්ථිම නම. එය මහණහට හෝ මෙහෙණහට හෝ කරන්නට නොකැප වචනයෙන් කරවන්නටද නොවටියි. 'මෙසේ දනුව, මෙසේ කළකල්හි හොබනේය. මේ මල් යම්සේ නොවිසිරේද, එසේ කරව, යනාදි කැපවචනයෙන් කරවීම වටියි. ගොප්ඵිම නම්, හුයින් හෝ තියද කෙඳි ආදියෙන් හෝ සීතිද්ධ මල් ආදිය එක් පසකට නටු තබා හෝ දෙපසට නටු තබා හෝ මල්දම් වසයෙන් ගෙතීම, තියද කෙඳි හෝ හූ දව්ගුණකොට

ඒ ඒ තැන නටු නැති බක්මීමල් ආදිය ඇතුල්කොට පිළිවෙළින් බඳිත් මෙද ගොප්‍ඵිමමවේ. සියල්ල පෙර කියූ නයින්ම නොවටියි. වෙධිම නම්, නටු සහිත සීනිද්දමල් ආදිය නැටිවලද නටුරහිත මූනමල් ආදිය සිදුරතුළද හිදි තල්ඉරටු ආදියෙන් විනිවිද අවුණත් මේ වෙධිම නම්වේ. එද පෙර කියූ නයින්ම නොවටියි. ඇතැම් කෙනෙක් කෙසෙල් කඳෙහි කටු හෝ තල් ඉරටු ආදිය හෝ ඇතුල්කොට එහි විද මල් තබත්, ඇතැම් කෙනෙක් කටුඅතුවලද ඇතැම් කෙනෙක් මල්සත් මල්කුළුගේ කරනු පිණිස ඡත්‍රයෙහිද භිත්තියෙහිද ඇතුල්කොට තැබූ කටුවලද, ඇතැම් කෙනෙක් ධර්මාසනයෙහි කළ වියනෙහි බැඳි කටුවලද, ඇතැම් කෙනෙක් කිණිහිරි මල් ආදිය ඉරටුවලින් විදිත්. සතක් මතුයෙහි සතක් සේද කරත්. එය අතිඖදරිකමවේ. මල් විදින්නට ධර්මාසනයෙහි බැඳි වියනෙහි කටුද බඳින්නට කටුආදියෙන් එක් මලකුදු විදින්නට හෝ මල්කම් මලක් ඇතුලත් කරන්නට හෝ නොවටියි. දැල් වියන් පිල්කඩ නාදැති මල්බඳුන් තල්පත් ගුළකයනාදීන්ගේ සිදුරුවල හෝ, හෝපලුමල් සමූහයෙහි හෝ අතරෙහි මල් ඇතුල්කිරීම දෙසයක් නොවේ. මෙය වෙධිමැයි නොගැණේ. වට ඇද බැඳි රූහණෙහිද මේ නයමවේ.

වෙධිම නම්, මල්දම්, මල්මිටි ආදියෙහිලා දතයුතුය. ඇතැම් කෙනෙක් ධර්මාසනාදිය මතුයෙහි එල්බෙන මල්දම් කරන්නෝ යට ·සටාකාරය දක්වනු පිණිස මල්දම්වලින් වෙළත්, ඇතැම් කෙනෙක් අට අට හෝ දසය දසය හෝ උපුල්මල් ආදිය හූයකින් හෝ තියඳ කෙඳිවලින් හෝ දඬුවල බැඳ උපුල්මල්මිටි පියුම්මල්මිටි කරත්, ඒ සියල්ල පෙර කියූ නයින්ම නොවටනේය. හෙරණුන් විසින් උපුටා ගොඩ තැබූ උපුල් ආදිය කසාවතින් පොදිකොට බැඳීමද නොවටියි. ඒ උපුල් ආදීන්ගේම කෙන්දකින් හෝ දඬුවකින් හෝ බැඳීම, අංසයෙහිලූ පොදියක් හෝ කිරීම සුදුසුය. අංසභණ්ඩිකායි නම්, කඳෙහි තැබූ සිවුරෙහි දෙකොණ ගෙන ගැට ගසා එහි පසුම්බියෙහි මෙන් මල් බහාලති. මෙය අංසභණ්ඩිකායි කියනුලැබේ. මේ අංසභණ්ඩිකය කිරීම වටියි. දඬුවෙන් පියුම්පත් විද උපුල් ආදිය පත්‍රයෙන් වෙළා ගනිත්. එහිද මල් මතුවෙහි පියුම්පතම බැඳීම වටියි. යට දඬු බැඳීම නොවටියි. පූරිම නම්, මල්දමෙහිද මල්පිළියෙහිද දතයුතුය. යමෙක් මල්දමින් සෑයක් හෝ බොධියක් හෝ පිල්කඩක් හෝ වට කරමින් නැවත ගෙනවුත් පළමු මල්දම තුබූ තැන ඉක්මවා තබාද, මෙපමණකිනුදු පූරිම නම්වේ. නාදත් අතරින් හෝ ඇතුල්කොටගෙන යමින් එල්බෙන්නක්කොට නැවැත නාගදන්තය වට කෙරේද එසේ නොයෙක් වර වට කරන්නහු පිළිබඳව කියනුම කවරේද, මෙද පූරිම නම්. නාගදන්තයෙහි මල් වළල්ලක් ඇතුල්කිරීම වටියි.

මල්වැලින් මල් පිළී කරත්ද එහිද එක්ම මල්වැලක් ගෙනයෑම වටියි. නැවත ගෙන එන්නහුට පූරිමයමවේ. ඒ සියල්ල පෙර කියූ නයින්ම නොවටියි. බොහෝවූද මල්වැලින් කළ මල්දමක් ලැබ අනුන් මත ආදියෙහි බැඳීම වරද නැත. ඉතා දිග්වූ මල්වැල එක්වරක් ගෙනගොස් වටකොට නැවැත අන් මහණක්හට දීම වටියි. ඔහු විසිනුදු එසේම කළයුතුය.

වායිම නම්, මල්දැල් මල්පට මල්රූපයන් විෂයෙහි දතයුතුය. සෑයෙහි මල්දැලක් කරන්නහුට එක් එක් දැල් සිදුරක් පාසා දුක්කටයවේ. බිත්ති, සත්. බෝටැම් ආදියෙහිද මේ නයමවේ. මල්පට වනාහි අනුන් විසින් පිරවූයේද වියීම නොලබයි. හුවැහැරියෙන් ගෙතූ මල්වලින්ම ඇත් අස් ආදී රූප කෙරෙත්ද ඔවුහුද වායමස්ථානයෙහි සිටිත්. පෙර කියූ නයින්ම සියල්ල නොවටියි. අනුන් කළ පිරිසිඳීමෙහි මල් තබන්නහු විසින් ඇත් අස් ආදි රූප කිරීමද වටියි. මහාපච්චරියෙහි වනාහි එල්බෙන මල්දම හා අඩසඳවත් මල්දම සමග පුෂ්පවිකෘති අටක් කියනලද්දේය. එහි 'කලමබක' යන මෙයින් අඩසඳවත් මල්දම අතරවූ ඝටිකාකාරවූ එල්බෙන මල්දම කියනලද්දේය. 'අඩ්ඪචන්‍දක' යන මෙයින් අඩසඳ අයුරින් මල්වැලින් වටකිරීම කියනලද්දේය. එදෙකම පූරිමයෙහිම පිවිසියේය. කුරුන්දියෙහි වනාහි මල්වැල් දෙකක් තුනක් එක්කොට මල්දම් කිරීමද වායිමයමැයි කියනලදී. එද මෙහි පළමු කියූ තැනම පිවිසියේය. මල්දම පමණක්ම නොවේ. පිටියෙන් කළ දමද නූල් ආදියෙන් වටකුරුකොට කළ මල්දමද කුරුන්දියෙහි කියනලද්දේය. බරපත්‍රදමයද ශික්ෂාපදයට සාධාරණබැවින් මහණුන්ටද මෙහෙණින්ටද කිරීම හා කරවීම නොවටියි. පූජාවට නිමිත්තවූ කැප වචන සියලුතන්හි කියයුතුය. පරියාය ඔභාස නිමිත්ත කර්මයෝ වටිත්මය.

'**නුවටෙන්ති**' නුරුඑකරගෙන හොවින් '**ලාසෙන්ති**' ප්‍රීතියෙන් ඉල්පෙන්නහු මෙන් නැගිට තම තමන්ගේ අදහස පවසා මෙසේ නැටිය යුතුයයි පළමුව නැගිට නටත්. මෙසේ නටවත්, අත්පා ආදියෙන් රඟ දක්වත්. '**නච්චන්තියාපි නච්චන්ති**' යම් කලෙක නළඟනක් නටාද, එකල ඔවුහුද ඇය ඉදිරියෙහි හෝ පසුපස හෝ යමින් නටත්. 'නච්චන්තියාපි ගායන්ති' යම් කලෙක ඕ නටාද, එකල නැටීමට සුදුසු පරිදි ගයත්. හැම තැන මේ නයයි. '**අට්ඨපදෙපි කීළන්ති**' අටපදදූපෝරුවෙහි කෙළිත්. **දසපදෙ කීළන්ති** දසපද දූපෝරුවෙහි කෙළිත්. '**ආකාසෙපි**' අටපදදසපද දූපෝරුවල මෙන් අහසෙහිද කෙළිත්. '**පරිහාරපථෙ**' බිම නොයෙක් මං ඇති මඩුල්ලක්කොට එහි පරිහරණය කටහැකි මග පරිහරණය කරමින් කෙළිත්. '**සන්තිකායපි කීළන්ති**' කැට ඇත් මැත් කොටද කෙළිත්. එක්කොට තැබූ හිරටු හෝ කැටකැබලිති හෝ නොසොල්වමින් තියෙන්ම බැහැරද

කෙරෙත්. සමීපයෙහිද කෙරෙත්. ඉදින් එහි කිසිවක් සැලේද පරාජයවේ. 'බලිකාය' දූපෝරුවෙහි පසැටකෙළියෙන් කෙළිත්. 'සටිකාය' දඬුවෙන් කරන ක්‍රීඩාව සටිකායි කියනුලැබේ. එයින් කෙළිත්. දිග්දඬුවෙන්කොට දඬුකඩට පහරමින් හැසිරෙත්. 'සලාකහත්ථෙන' ලාකඩින් හෝ මදටකසටින් හෝ පිටිදියෙන් හෝ ඉරටුමිටියක් තෙමා කුමක් හෝ වේවායි බිම හෝ බිත්තියෙහි හෝ එය ගසා ඇත් අස් ආදී රූප දක්වමින් කෙළිත්. 'අක්ඛෙන' පන්දු කෙළියෙන්. 'පඞ්ගචීරෙන' පත් ආදියෙන් වියූ නළාව පඞ්ගචීරයි කියනුලැබේ. එය පිඹමින් කෙළිත්. 'වඞ්කකෙන' ගම්දරුවන් කෙළින කුඩා නගුලෙන්. 'මොක්ඛචිකාය' ඔබමොබ පෙරළීකරන ක්‍රීඩාව මොක්ඛචිකායි කියනුලැබේ. දඬුකඩක් ගෙන අහසෙහි හෝ බිම හෝ හිස තබා යටිපස උඩුපස පිහිටියේ පෙරළෙමින් කෙළිත්ය යන අර්ථයි.

'චිඞ්ගුලකෙන' තල්පත් ආදියෙන් කළ වාපහරින් කැරෙකෙන චක්‍රය චිඞ්ගුලැයි කියනුලැබේ. ඒ හුලංපෙති කැරකැවීමෙන් කෙළිත්. 'පත්තාළ්හකෙන' පතින් කළ නැළිය. පත්තාළ්හකැයි කියනුලැබේ. එයින් වැලි ආදිය මනිමින් කෙළිත්. 'රථකෙන' කුඩා රියෙන්. 'ධනුකෙන' කුඩාදුන්නෙන් 'අක්ඛරිකාය' අහසෙහි හෝ පිටෙහි හෝ අකුරුලියා දන්වන ක්‍රීඩාව අක්ඛරිකායි කියනුලැබේ. 'මනෙසිකාය' සිතින් සිතුවක් දැනගන්නාවූ ක්‍රීඩාව මනෙසිකායි කියනුලැබේ. එයින් කෙළිත්. 'යථාවජ්ජෙන' කණ අත්පා කොරු ආදීන්ගේ යම් යම් අත්පා ආදියෙහි ඇදකුදවීම වසයෙන් නොයෙක් දෙසයක්වේද යොද දක්වන ක්‍රීඩාව යථා වජ්ජයි කියනුලැබේ. එයින් ඉක්මන් ගමන් නැත්තවුන් මෙන් කෙළිත්. 'හත්ථිස්මිම්පි සික්ඛන්ති' ඇතුන් නිමිතිකොට යම් ශිල්පයක් හික්මිය යුතුද, එහි හික්මෙත්. අශ්වාදීන් කෙරෙහිද මේ නයයි. 'ධාවන්තිපි' පරාඞ්මුඛව යමින් දුවත්. 'ආධාවන්තිපි' යම් පමණ දුවත්ද, එපමණක්ම අභිමුඛව නැවත එමින් පෙරටද දුවත්, 'නිබ්බුජ්ඣන්තිපි' මල්ලව පොරද කරත්. 'තලාටිකම්පි දෙන්ති' 'මැනවි, මැනවි, නැගනි'යි තම නළලෙහි ඇඟිලි තබා ඇයගේ නළලෙහි තබත්. 'විවිධම්පිඅනාචාරං ආචරන්ති' පෙළෙහි නොදැක්වූ අන්‍යවූද මුවබෙර ගැසීම් ආදීවූ නොයෙක් අනාචාරයෙහි හැසිරෙත්.

'පාසාදිකෙන' පැහැදුම් එළවන, සරුප්වූ, මහණුන්ට සුදුසුවූ 'අභික්කන්තෙන' පෙරටුව ගමනින්. 'පටික්කන්තෙන' පෙරළා නැවැත්මෙන් 'ආලොකිතෙන' ඉදිරි බැල්මෙන්. 'විලොකිතෙන' ඔබමොබ බැල්මෙන් 'සම්මිඤ්ජිතෙන' අත්පා පුරුක් හකුළුවමින් 'පසාරිතෙන' ඒ අත්පා පුරුක් දිගහැරීමෙන් හැමතැන ඉත්ථම්භූතාර්ථයෙහි කරනවචනයි. සමෘති ප්‍රඥා දෙකින් මොනවට පිළියෙලවූ බැවින් පැහැදුම් එළවීම් ඇති යෑම, නැවැත්ම.

ඉදිරිය බැලීම. ඔබමොබ බැලීම. අත්පා හුදෙක් හැකිළීම, අත්පා පුරුක් දිගුකිරීම ඇතිවයයි කියනලද්දේවේ. 'ඔක්ඛිත්තචක්ඛු' යට හෙලූ ඇස් ඇතිව. 'ඉරියාපථසම්පන්නො' ඒ පැහැදීම එළවන යැම් ආදියෙන් යුත් ඉරියවූ ඇතිව. 'කො'යං' මේ කවරෙක්. අබලබලොවිය' බල නැති ලොල් පුද්ගලතෙමේ කියනුලැබේ. මෙය අතිශයාර්ථයෙහි ආමෙණ්ඩිතය දෙතුන්වර කීමය. එහෙයින් ඉතා ලොල්වූ මන්දධාතුකයෙකු මෙනැයි කියනලද්දේවේ. 'මන්දමන්දො' යැම් නැවැතීම් ආදිය නොසැලෙනබැවින් ඉතා මදවූයේය. ඉතාසියුම් වූයේයයි මෙසේ ගුණයම දෙස් වසයෙන් දක්වත්. 'භාකුටික භාකුටිකො විය' යටහෙලූ ඇස් ඇතිබැවින් බැම බිදීමකොට හැකුළු මුහුණු ඇති කිපියෙකුමෙන් හැසිරේයයි සිතමින් කියත්. 'සණ්හා' නිපුණයහ. 'මැණියනි, පියාණෙනි, නැගණියෙනි මෙසේ උපාසකජනයා සුදුසු තැනට පමුණුවන්නට දක්ෂයහ. මෙතෙමේ යම්සේද එසේ අබලබල ඇතියෙකු මෙන් නොවේය යන අදහසයි. 'සඛිලා' මෘදුවචනයෙන් යුක්තයහ. 'සුඛසම්භාසා' යන මෙය පළමු වචනයෙහි කාරණවචනයි. යම් කෙනකුන්ගේ වනාහි සැප එළවන වචන ඇති සතුටු වියයුතු කථා විලාසය නිදෙස්වූවා කණට සුව එළවන්නීද, ඔවුහු සඛිලහයි කියනුලැබේ. එහෙයින් 'සඛිලා සුඛසම්භාසා'යි කියනලදි. මේ මෙහි අධිප්‍රායවේ. 'අපගේ ආර්‍ය්‍යයෝ උපාසකයන් දැක මිහිරිවූ සතුටුවිය යුතුවූ කතා කියත්. එහෙයින් උන්වහන්සේ මොළොක් වචන ඇත්තාහ. සැප එළවන කතා ඇත්තාහ. මෙතෙමේ එසේ නොවේ. මන්දමන්දයන් වැනිවේ යනුයි. 'මිහිතපුබ්බඞ්ගමා' මද සිනහ පෙරදැරිවූයේ මොවුන්ගේ වචනයටැයි මිහිතපුබ්බඞ්ගම නම. පළමුකොට සිනාසී පසුව කියත්ය යන අර්ථයි. 'එහි සවාගතවාදිනො' උපාසකයෙකු දැක 'තාගේ ඊම යහපති, එවයි මෙසේ කියන්නෝය. මෙතෙමේ යම්සේද එසේ හැකුළුනු මුහුණු ඇති බැවින් බැම බිදින්නවුන් මෙන් නොවෙත්. මෙසේ මදසිනහ ආදිය පෙරදැරිකොට ඇතිබැවින් අභාකුටිකභාවය අර්ථවශයෙන් දක්වා නැවත සරූප විසින් දක්වන්නාහු 'අභාකුටිකා උත්තානමුඛා පුබ්බභාසිනො'යි කීහ. උපිළිවෙළින් හෝ තුන් ආකාරයන්ගේ මේ අභාව දර්ශනයයි දතයුතුය. කිසේය යත්: මෙහි අභාකුටිකා යන මෙයින් බැම බිදීම හා බැම් බිදින ආකාරයෙහි අභාවය දක්වනලද්දේය. උත්තානමුඛා යන මෙයින් මන්දමන්දකාරයාගේ අභාවය දක්වනලදී. යම් කෙනෙක් ඇස් දල්වා බැලීමෙන් උඩුකුරු මූණු ඇත්තාහු වෙත්ද, ඔවුහු මන්දමන්දවූවාහු නොවෙත්. පුබ්බභාසිනො යන මෙයින් ලොලාකාරයාගේ අභාවය දක්වනලදී. යම් කෙනෙක් නොබිණීමෙහි දක්ෂබැවින් මැණියෙනි, පියාණෙනි'යි ඉතා පළමුකොට නොබෙණෙත්ද ඔවුහු ලොල්වූවාහු මන්දධාතුකවූවාහු නොවෙත්.

'**එහි භන්තෙ සරං ගමිස්සාමි**' ඒ උපාසකතෙමේ ඇවැත, පිණ්ඩය නොලැබිනැයි කීකල්හි ඔබවහන්සේලාගේ භික්ෂූන් විසින්ම මෙය කරන ලද්දේය, මුළු ගමද 2හැසිරෙන්නාහු නොලබහු'යි කියා පිණ්ඩපාතය දෙනු කැමැතිව 'එව ස්වාමීනි, ගෙට යන්නෙමු'යි කීයේය. 'කිම, මෙය ප්‍රයුක්තවචනයක්වේද, නොවේද යත්: නොවේ. විචාළ ප්‍රශ්නය නම්වූ මෙය කියන්නට වටියි. එහෙයින් දැනුදු පෙරවරුයෙහි හෝ පස්වරුවෙහි හෝ ඇතුළුගමට වත් මහණහු අතින් කිසිවෙක් 'ස්වාමිනි, කුමක් හෙයින් හැසිරෙවුදැයි විචාරන්නේ නම් යම් කරුණකින් හැසිරේද, එය කියා, 'ලදද, නොලදදැයි විචාළකල්හි ඉදින් නොලද්දේනම් නොලද්දේයයි කියා හෙතෙමේ යමක් දේද එය ගැනීමවටියි. '**දූසෙය්‍යා**' පැහැදීම් ආදිය නැසීයාමෙන් දූෂිතවූයේ නොවේ. පුද්ගලවශයෙන් දූෂිතවූයේය. '**දනපථානි**' යන මෙයින් දනයම කියනු ලැබෙත්. නොහොත් '**දනපථානි**' නිබඳ දෙන දනයෙහි දන්වටැයි කියනලද්දේවේ. '**උපච්ඡින්නානි**' දයකයන් විසින් සිඳිනලදහ. ඒ දයකයෝ දැන් ඒ දන්වැට නොදෙත්. '**රිඤ්චන්ති**' වෙත් වෙත්. බැහැර යෙත්යයි කියනලද්දේවේ. '**සණ්ඨහෙය්‍යා**' මනාව පිහිටන්නේය. ප්‍රියශීලි භික්ෂූන්ට පිහිට වන්නේය. ඒ මහණතෙමේ 'එසේය ඇවැත'යි කියා සැදැහැති තෙරුවන් කෙරෙහි පහන්වූ උපාසකයාගේ හසුන පිළිගත්තේය. මෙවැනි කැප හසුන ගෙන යෑම වටියි. එහෙයින් 'මාගේ වචනයෙන් භාග්‍යවතුන්වහන්සේගේ පා වඳිවුයි හෝ සෑපිළිම බෝ සහතෙරහු වඳිවුයි හෝ 'සෑයෙහි සුවඳ පූජා කරවු, මල් පූජා කරවුයි හෝ 'භික්ෂූන් රැස් කරවු, දන් දෙන්නෙමු, බණ අසන්නමු,යි හෝ මෙබඳු හසුන්හි කුකුස් නොකළයුතුය. මොවුහු කැප හසුන් වෙත්. ගිහින්ගේ ගිහිකම් පිළිබඳ වූවාහු නොවෙති. '**කුතො ච ත්වං භික්ඛු ආගච්ඡසි**' හුන් ඒ මහණතෙමේ නොඑයි. අතීතවශයෙන් ආයේවේ. මෙසේ ඇතිකල්හිද වර්තමානසමීපකාලයෙහි වර්තමාන වචනය ලබයි. එහෙයින් දෙසක් නැත්තේය. කෙළවර 'තතො අහං භගවා ආගච්ඡාමි' යන මේ වචනයෙහිද මේ නයමවේ.

'**පඨමං අසසජ්පුනබ්බසුකා භික්ඛූ චොදෙතබ්බා**' 'අපි තොපට කියනු කැමැත්තම්හ'යි අවකාශ කරවාගෙන වස්තුවෙන්ද ආපත්තියෙන්ද චොදනා කටයුත්තාහ. චොදනාකොට යමක් සිහි නොකෙරෙත්ද, එය සිහිකරවියයුතුය. ඉදින් වස්තුවත් ආපත්තියත් පිළිදනිත් නම්, ආපත්තියම හෝ පිළිදනිත් නම්, වස්තුව නොපිළිනොදනිත් නම්, කුල දූෂණ ක්‍රියාවෙන් පැමිණි ඇවැත නැගිය යුතුය. නැවත වස්තුව පමණක්ම පිළිදනිත් නම්, ඇවැත නොපිළිදනිත් නම්, එසේ කල්හිද 'මෙනම් වස්තුවෙහි මෙනම් ඇවැතයයි නැගිය යුතුය. ඉදින් මෙසේ

වස්තුව නොමපිළිදනිත්ද ඇවැත නොපිළිදනිත්ද එකල්හි ඇවැත නොනැගිය යුතුයයි, මේ මෙහි විනිශ්චයයි. පිළිණලෙසින් ඇවැත නගා මෙසේ පබ්බාජනීයකර්මය කටයුතුයයි දක්වනසේක් '**ව්‍යක්තෙන භික්ඛුනා**' යනාදිය වදළසේක. එය ප්‍රකටවූඅර්ථ ඇත්තේමය.

මෙසේ පබ්බාජනීයකර්මය කළ යම් වෙහෙරක වසන මහණහු විසින් යම් ගමක කුලදූෂකකර්මය කරනලද්දේවේද ඒ විහාරයෙහි හෝ ඒ ගමෙහි හෝ නොවිසිය යුතුය. ඒ විහාරයෙහි වසන්නාහු විසින් සමීපගමෙහිද පිඩුපිණිස නොහැසිරිය යුතුය. සමීප විහාරයෙහි වසන්නාහු විසින්ද එගම පිඩු පිණිස නොහැසිරිය යුතුය. උපතිෂ්‍ය ස්ථවිරතෙමේ 'ස්වාමිනි, නුවර නම් මහත්‍ය, දෙළොස් යොදුන් ඇත්තේ වේයයි අතවැසියන් විසින් කියනලදුයේ යම් වීථියක කුලදූෂකකර්මය කරනලදද, එහිම වළකනලදැයි කීය. ඉක්බිති 'වීථියද මහත්‍ය, නුවරතරම්මයයි කියනලදුයේ යම් වීථියක ගෙපිළිවෙළිනැයි කීය. 'ගෙපිළිවෙළද වීථිය තරම්ම වේය'යි කියනලදුයේ ඔබමොබද ගෙවල් සතක් වළකනලදැ'යි කීය. ඒ සියල්ල තෙරුන්ගේ අදහස් මාත්‍රයක්මය. ඉදින් විහාරය තුන් යොදුන් පරම කොට ඇත්තේද; නුවර දෙළොස් යොදුන් පරමකොට ඇත්තේවේද විහාරයෙහි විසීම නොලැබේ. නුවර හැසිරීම නොලැබේ.

'**තෙ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා**' සඞ්ඝතෙමේ කෙසේ ඒ භික්ෂූන්ට පබ්බාජනීය කර්මය කෙළේද, නොගොස්ම වැඩ කෙළේදයත්, එකල කුල විසින් පවරා සහබත් කරනු ලබනකල්හි ඒ ඒ තැන තෙරහු ශ්‍රමණප්‍රතිපදව කියා 'මේ ශ්‍රමණය, මෙතෙමේ ශ්‍රමණ නොවේයයි මිනිසුන්ට හඟවා එක් නමක් දෙනමක් භික්ෂූන් සීමාවට යවා මේ උපායෙන්ම සියල්ලන්ට පබ්බාජනීය කර්මය කළහයි දතයුතුය. මෙසේ පබ්බාජනීයකර්මය කරනලදුව (කම්මක්ඛන්ධකයෙහි) අටළොස්වත් පුරා යාඥ කරන්නාහුගේ කර්මය සන්සිඳවිය යුතුය. සන්සිඳවූ කර්මය ඇති ඒ මහණහු විසින් පෙර යම් කුලයන්හි කුලදූෂකකර්මය කරන ලද්දේද, එයින් ප්‍රත්‍යයෝ නොගතයුත්තාහුය. කෙලෙස් නැසීමට පැමිණියහු විසින්ද නොගතයුතුය. අකැපම වෙති. 'කුමක් හෙයින් නොගනිවුදැ'යි විචාරණ ලද්දහු විසින් 'පෙර මෙසේ කළ බැවිනැයි කීකල්හි 'අපි ඒ කරුණෙන් නො දෙමු, දැන් සිල්වත්බැවින් දෙමුයි කියත් නම් ගතයුතුය. ප්‍රකෘතියෙන් දෙන තැනකම කුලදූෂකකර්මය කරන ලද්දේවේද, එතැනින් ප්‍රකෘතිදනයම ගැනීම වටියි. යමක් වඩා දෙත්ද එය නොවටියි.

'**න සම්මා වත්තන්ති**' ඒ අස්සජි පුනබ්බසුකයෝ අටළොස්වත්හි මනාව නොපවතිත්. '**න ලොමං පාතෙන්ති**' අනුලොම් පිළිවෙතෙහි නොපිළිපදිනබැවින් අනුකූල පැවැතුම් ඇත්තෝ නොවෙත්. '**න නෙත්ථාරං වත්තන්ති**' තමන් එතර වන උපාය නො පිළිපදිත්, '**භික්ඛූ න ඛමාපෙන්ති**' ස්වාමීනි අප විසින් කරනලද්දේ නින්දිත එකකි. නැවත මෙසේ නොකරන්නෙමු, අපට කමාවනු මැනව'යි මෙසේ භික්ෂූන් කමාකරවීම නො කරත්. '**අක්කොසන්ති**' දශ ආක්‍රොශවස්තුවෙන් කාරකසඞ්ඝයාහට ආක්‍රොශ කරත්. '**පරිභාසන්ති**' ඔවුන්ට බිය දක්වත් '**ඡන්දගාමිනා -පෙ- භයගාමිනා පාපෙන්ති**' මේ භික්ෂූහු ඡන්දයෙන්ද අගතියට යන්නාහුය -පෙ- බියෙන්ද අගතියට යන්නාහුයයි මෙසේ ඡන්දයෙන් අගතියට යන බවටද බියෙන් අගතියට යනබවටද පමුණුවත් යොදත්ය යන අර්ථයි. '**පක්කමන්ති**' ඒ අස්සජිපුනබ්බසුකයන්ගේ පිරිවරවූ පන්සියයක් ශ්‍රමණයන් අතුරෙහි ඇතැම් කෙනෙක් දිසා බලා යෙත් '**විබ්භමන්ති**' ඇතැම් කෙනෙක් ගිහි වෙත්. '**කථං හි නාම අස්සජිපුනබ්බසුකා**' මෙහි ප්‍රධාන දෙදෙනාගේ වසයෙන් සියල්ලෝම අස්සජිපුනබ්බසුකයෝයි කියනලදහ.

'**ගාමං වා**' මෙහි නුවරද ග්‍රාමග්‍රහණයෙන්ම ගන්නාලද්දේය. එහෙයින් මේ පදයෙහි පදභාජනයෙහි 'ගාමොපි නිගමොපි නගරම්පි ගාමො චෙව නිගමො ච'යි වදරනලද්දේය. එහි පවුරෙන් වට නොකළ කඩපිල් සහිතවූයේ නිගමැයි දතයුතුය. කුලයන් දූෂිත කෙරේනුයි කුලදූසක නම. දූෂිත කරන්නේ ද අශුචිමඩ ආදියෙන් දූෂිත නොකෙරේ. වැලි තමන්ගේ දුෂ්ප්‍රතිපත්තියෙන් ඔවුන්ගේ ප්‍රසාදය විනාශ කෙරේ. එහෙයින්ම මේ ශික්ෂාපදයෙහි පදභාජනයෙහි **පුප්ඵෙන**' යනාදිය වදළසේක. එහි යමෙක් ගෙනගොස් හෝ යවා හෝ කැඳවා හෝ කැඳවවා හෝ තෙමේ හෝ පැමිණියවුන්ට තමන්සතු යම්කිසි මලක් කුලසඞ්ග්‍රහය පිණිස දේද, දුක්කටයවේ. අන්හු අයත් වූවක් දේද, දුක්කටයමවේ. සොරසිතින් දේනම් බඩු ඇගීමෙන් කරවිය යුතුය. සඞ්සිකයෙහිද මේ නයවේ. මේ වෙනසයි: සෙනසුන් පිණිස නියම කරන ලද්දක් ඉසුරුමත් බැවින් දෙන්නහුට ථුල්ලච්චයවේ. මල් කවරක්හට දියයුතුද, කවරක්හට නොදිය යුතුද යත්: මවුපියන්ට ගෙනගොස්ද යවාද කැඳවාද කැඳවවාද දියයුතුය. සෙසු නෑයන්ට කැඳවවාම දිය යුතුය. හෙද තෙරුවන් පිදීම පිණිසය. සැරසීම පිණිස හෝ ශිවලිඞ්ගපූජාදිය පිණිස හෝ මවුපිය ආදී කිසිවකුහටත් නොදිය යුතුය. මවුපියන්ට යවන්නහු විසින් හෙරණුන්ලවාම යැවියයුතුය. අන්‍යයෝ වනාහි තුමූම කැමති වෙත්නම් වටියි.

සම්මතකළ මල් බෙදන්නහු විසින් බෙදනකල්හි එහි පැමිණි තෙරුණුන්ට කොටස් බාගයක් දීම වටියි. කුරුන්දියෙහි වනාහි පැමිණි ගිහියන්ට කොටසින් අඩක් දීමද, මහාපච්චරියෙහි සතරෙන් කොටසක් දීම වටීයයි කියනලදී. සම්මතය නොලද්දහු විසින් අපලොකනයකොට දියයුතුය. ආචාර්ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි ගෞරව සහිතවූ හෙරණහු බොහෝ මල් ගෙනවුත් රැස්කොට තබත්. තෙරහු උදයම පැමිණි සද්ධිවිහාරිකාදීන්ට හෝ උපාසකයන්ට හෝ 'තෝ මෙය ගනුව, තෝ මෙය ගනුවයි දෙත්ද, එය මල්දීමක් නම් නොවේ. 'සෑය පුදන්නෙමියි ගෙනයන්නාහුද, පූජා කරන්නාහුද, ඒ ඒ තැන' පැමිණෙන අයට සෑය පුදනු පිණිස දෙත්ද මෙද මල්දීමක් නම් නොවේ. වරාමල් ආදියෙන් පුදින උපාසකයන් දැක 'උපාසකයෙනි' විහාරයෙහි කිණිහිරිමල් ආදිය ඇත, ඒ මල් ගෙන පුදවූයි කීමද වටියි. භික්ෂූහු මල් පුද ඉතාදවල් ගමට පිවිසිකල්හි 'කිම, ස්වාමිනි' ඉතා දවල් පිවිසියහුදැයි විචාරත්, එකල්හි විහාරයෙහි බොහෝ මල් පිදුවෙමුයි කියත්ද, මිනිස්සු විහාරයෙහි බොහෝ මල් ඇතැ'යි දෙවන දිනයෙහි බොහෝ කැයුතු බිදියයුතුදැය ගෙණ විහාරයට ගොස් මලු පුදත්ද දන් දෙත්ද වටියි. මිනිස්සු 'ස්වාමීනි' අපි අසුවල් දින නම් පුදන්නෙමුයි මල්වාරය ඉල්ලා අනුදත් දිනයෙහි එත්ද, හෙරණුන් විසින්ද පළමුකොට මල්නෙලා තබනලද්දහු වෙත්ද, ඔවුහු රුක්වල මල් නො දක්නාහු 'ස්වාමිනි' මල් කොහිදැයි අසත් ද, හෙරණුන් විසින් මල් නෙලා තබනලදය. තෙපි පුද යවූ, සඞ්ඝතෙමේ අන් දිනෙක දන්නේයයි කීකල්හි ඔවුහු පුදා දන් දී යෙත්ද ඒ වටියි.

මහාපච්චරියෙහි හා කුරුන්දියෙහි 'තෙරහු හෙරණුන් ලවා දෙන්නට නොලබත්. ඉදින් තුමූම ඒ මල් ඔවුන්ට දෙත්ද වටියි, තෙරුන් විසින් හෙරණුන් නෙලා තබනලදැයි මෙපමණක්ම කියයුතුය යි කියන ලද්දේය. ඉදින් මල්වාරය ඉල්ලා මල් නොනෙලූකල්හි කැඳබත් ආදිය ගෙනවුත් හෙරණුන්ලවා නෙලාදෙවු'යි කියත්ද, නෑහෙරණුන්ටම නෙලාදීම වටියි. නොනෑහෙරණුන් ඔසොවා රුක් අත්තක තබත්ද, බැස නො යායුතුය. මල් නෙලාදීම වටියි. කිසි ධම්කථිකයෙක් 'උපාසකයෙනි' විහාරයෙහි බොහෝ මල් ඇත. කැඳබත් ආදිය ගෙන ගොස් මල් පූජා කරවූයි කියාද ඔහුටම කැප නොවේයයි මහාපච්චරියෙහිද කුරුන්දියෙහිද කියනලදී. මහාඅට්ඨකථාවෙහි වනාහි මේ කැඳබත් ආදිය නොකැපය, නොවටීයයි වෙනසක් නොතබා කියන ලදි. තමාසතු ඵල ද මල් ගුණ කියූ නයින්ම මවුපියන්ට ද

සෙසු නෑයන්ටද දීම වටියි.' කුලසංග්‍රහය පිණිස දෙන්නහුට කියූ නයින්ම තමන් සතු දැයෙහිද අන්හු සතු දැයෙහිද සඞ්ඝිකයෙහිද සෙනසුන් පිණිස නියමකරන ලද්දෙහිද දුක්කටාදීහු දතයුත්තාහ. තමන් සතු දැයම ගිලන් මිනිසුන්ට හෝ පැමිණි ඉසුරන්ට හෝ හීනවූ මගවියදම් ඇත්තන්ට හෝ දීම වටියි. එය එලදනයක් නොවේ. සම්මතය ලද එල බෙදන්නහු විසින්ද සඞ්ඝයාගේ එල බෙදන කාලයෙහි පැමිණි මිනිසුන්ට අඩකොටසක් දෙන්නට වටියි. සම්මතය නොලද්දහු විසින් අපලොකනයකොට දියයුතුය. සඞ්ඝාරාමයෙහිද යම් පමණ දියයුතුයයි එල පිරිසිදීමෙන් හෝ රුක් පිරිසිදීමෙන් හෝ කතිකා කටයුත්තීය. එහෙයින් ගිලන් මිනිසුන්ට හෝ එල ඉල්ලන අන්‍යයන්ට හෝ පිරිසිඳි පරිද්දෙන් එල සතරක් පසක් දියයුතුය. මෙයින් ගන්නට ලැබේයයි ගස් හෝ දැක්විය යුතුය. 'මේ ගසෙහි එල සොඳුරුය. මෙයින් ගනිවුයි මෙසේ නොකිය යුතුය.

**'චුණ්ණෙන'** මෙහි වනාහි තමන් සතු මහරිසුණු හෝ අන් කසාසුණක් හෝ කුලසඞ්ග්‍රහය පිණිස දේද, දුක්කටයවේ. අන්සතු ආදියෙහිද කියූ නයින්ම විනිශ්චය දතයුතුය. මේ වනාහි වෙනසයි. මෙහි සඞ්ඝයා පිළිබඳ රක්ෂිත ගොපිතවූද රුක්පතුරු ගරුභාණ්ඩමය. මැටි දැහැටි හුණදඬුවලද ගරුබඩු ගණනට පැමිණියක් දැක සුණෙහි කියූ නයින්ම විනිශ්චය දතයුතුය. පත් දීම මෙහි නොආයේය. එද කියූ නයින්ම දතයුතුය. ඉදිරියෙහි ගරුභාණ්ඩ විනිශ්චයෙහි සියල්ල විස්තරවශයෙන් වර්ණනා කරන්නෙමු. **'වෙජ්ජිකාය වා'** වෛද්‍ය කර්මවිධිය තෘතීයපාරාජිකවර්ණනාවෙහි කියූ නයින්ම දතයුතුය. **'ජඞ්ඝපෙසනිකෙන'** මෙහි ජඞ්ඝපෙසනිය යනු ගිහින් පිළිබඳ පණිවුඩ ගෙන යෑමය. හසුන් ගෙන ඊම් ක්‍රියාය. එය නොකටයුතුය. ගිහින්ගේ හසුන් ගෙන යන්නහුට පියවරක් පියවරක් පාසා දුක්කටවේ. ඒ කර්මය නිසා ලත් බොජුන් අනුභව කරන්නහුටද පිඩක් පිඩක් පාසා දුක්කටවේ. පළමුකොට හසුන නොගෙණද පසුව 'දැන් මේ ඒ ගමය, එබැවින් ඒ හසුන සැලකරමි යි මඟින් ඉවත්ව යන්නහුටද පියවරක් පියවරක් පාසා දුක්කටවේ. හසුන සැලකිරීමෙන් ලත් බොජුන් අනුභව කරන්නහුට පෙර කියූ නයින්ම දුක්කට වේ. හසුන නොගෙන ආවා වූ 'සවාමිනී' එගම මෙනම්හුගේ පුවත් කවරේදැයි විචාරණු ලබන්නහු විසින් කීම වටියි. ඇසූ ප්‍රශ්නයෙහි දෙසයක් නැත්තේය. පස්මහ දැහැමියන්ගේ මවුපියන්ගේද ප්‍රව්‍රජ්‍යාපෙක්ෂකයාගේද තම වතාවත් කරන්නහුගේද හසුන් ගෙන යෑම වටියි. ගිහින්ගේද 'භගවතො පාදෙවන්‍දථ' යනාදී

වශයෙන් පෙරකියූ අයුරු ඇති මේ කැප හසුන ජඞ්ඝපෙසනිකකර්ම නම් නොවේ. මේ අටවැදෑරුම් කුල නොවේ. නැතිගුණ පැවසීමෙන් හා මසු කහවණු ගණුදෙනුවෙන් උපන් ප්‍රත්‍යය සමාන වෙත් ලාමකවූ සමාචාරයෝ මොහුටනුයි **පාපසමාචාර** නම. යම්හෙයකින් ඒ මල්ගස් සිටුවීම් ආදීහු මෙහි අදහස් කරනලද්දහුද එහෙයින් '**මාලවච්ඡං රොපෙන්තිපි**' යනාදි නයින් මේ පදයෙහි පදභාජනය වදරනලදි. '**තිරොක්ඛා**' පිටිපැවාහු. '**කුලානි ච තෙන දූට්ඨානි**' යන මෙහි යම්හෙයකින් කුලානි යනු මෙය ව්‍යවහාර මාත්‍රයක්වේද, අර්ථවශයෙන් මනුෂ්‍යයෝ එයින් දූෂිත වෙත්ද, එහෙයින් මේ පිළිබඳ පදභාජනයෙහි '**පුබ්බෙ සද්ධා හුත්වා**' යනාදිය වදළසේක. '**ඡන්දගාමිනො**' ඡන්දය කරණකොට යෙත්නුයි ඡන්දගාමී නම. සෙසු තන්හිද මේ නයවේ. '**සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය**, මෙහි කුලදූෂක කර්මයෙන් දුක්කටයමවේ. ඒ මහණතෙමේ සඞ්ඝයාට පරිභවකොට '**ඡන්දගාමිනො**' යනාදි යමක් කීයේද, එය දුරලීම පිණිස සමණුභාෂණකර්මය කටයුත්තේයයි මෙසේ අර්ථය දතයුත්තේය. සෙස්ස හැම තන්හි ප්‍රකටමය. සමුට්ඨානාදීහුද ප්‍රථමසඞ්ඝභෙදශික්ෂාපදය සමාන වෙති.

කුලදූෂකශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

'**උද්දිට්ඨා ඛො -පෙ- එවමෙතං ධාරයාමි**' මෙහි පළමුකොට පැමිණියයුතු ඇවැත මොවුන්ටනුයි පඨමාපත්තිකා නම. පළමුකොට ව්‍යතික්‍රමය කළ කෙණෙහිම පැමිණිය යුත්තීය යන අර්ථයි. අන්‍යාපත්තීහු, යම්සේ තෙවන සිවුවන දවසෙහි වේයයි ජනතෙමේ තෘතීයකය, චතුර්ථකයි කියනු ලැබේද, එසේ යාවතෘතීය සමනුභාෂණ කර්මයෙහිදී වෙත්යි යාවතතියකහයි දතයුතුය. '**යාවතිහං ජානං පටිච්ඡාදෙති**' යම් පමණ දිනයන් දන්නේයි වසයිද, මම මෙනම් ඇවැතට පැමිණියෙමියි සබ්‍රහ්මචාරීන්ට නොකියාද. '**තාවතිහං**' එපමණ දවස්, '**අකාමා පරිවත්ථබ්බං**' කැමැත්තෙන් නොවේ. පිරිවෙසින් නොවේ. තවද නොකැමැත්තහු විසින්, පිරිවෙස් නැතියහු විසින් පිරිවෙස් ගෙන විසිය යුතුය. '**උත්තරිං ඡාරත්තං**' පිරිවෙසින් මතුවෙහි සරැයක් '**භික්ඛු මානත්තාය**' භික්ෂූන්ට බුහුමන් පිණිස, සතුටු කිරීම පිණිසැයි කියනලද්දේවේ. විංශතිසඞ්ඛ්‍යාගණය මොහුටැයි **විසතිගණ** නම '**තත්‍ර**' යම් සීමාවෙක්හි සියලු අන්තිම පිරිසිඳීමෙන් විංශද්වර්ගික භික්ෂුසඞ්ඝතෙමේ ඇත්තේද ඒ සීමාවෙහි 'අබ්භෙතබ්බො' කැඳවිය යුතුය.

පිළිගත යුතුය. අබ්භානකම් වශයෙන් ඇතුළත් කටයුතුයයි කියනලද්දේවේ. කැදවිය යුත්තේයි හෝ අර්ථයවේ. **'අනබ්භිතො'** නොකැඳවනලදය. නොපිළිගන්නාලදය. නොකළ අබ්භානකම් ඇත්තේයයි කියනලද්දේවේ. නොකැදවනලද්දේයි හෝ අර්ථයවේ. **'සාමීචි'** අනුධර්මතා තොමෝය. ලොකොත්තරධර්මය අනුව ගිය අවවාදනුශාසනා තොමෝ සාමීචිධර්මතායි කියනු ලද්දේය. මෙහි සෙස්ස කියූ නය ඇත්තේමය.

විනයවිවෘති
නම් වූ
සිංහල සමන්තපාසාදිකාවෙහි
තෙරසසඞ්ඝාදිසෙස වර්ණනාව නිමි.

ආයුෂ්මත්නි මේ අනියතධර්මයෝ දෙදෙන උදෙසීමට එති.

'**තෙන සමයෙන බුද්ධො භගවා**' ප්‍රථම අනියත ශික්ෂාපදයයි. එහි '**කාලයුත්තං සමුල්ලපන්තො**' යනු කල් සලකා යම් කලෙක්හි අන් කිසිවෙක් සමීපයෙන් නොයන්නේ හෝ නොඑන්නේ හෝ, එකල්හි එයට අනුරූපව 'කිම, නොකළකිරෙහිද, නොවෙහෙසෙහිද, බඩගිනි අතියෙහිද, යනාදීවූ ගෘහනිශ්‍රිත කථා කියමින් '**කාලයුත්තං ධම්මං භණන්තො**' යනු කල් සලකා යම් කලෙක්හි අන් කිසිවෙක් සමීපයෙන් යන්නේ හෝ එන්නේ හෝ එකල්හි එයට අනුරූප පොහොය කරන්නෙහි, ලහබත් දෙන්නෙහි, යනාදීවූ ධර්මකථා කරමින් බොහෝ දූවරුද පුත්‍රයෝද මැහටනුයි **බහුපුත්තා** නම. ඇයට වනාහි පුත්‍රයෝ දසදෙනෙක්ද දුහිතෘහු දසදෙනෙක්ද වූහ. මෙසේ ඕ තොමෝ විස්සක් අධික කොට ඇති සාරසියයක් දූපුත් මුනුබුරු මිනිබිරියන් පිරිවරකොට ඇත්තීවූය. '**අභිමඞ්ගලසම්මතා**'යි උත්තම මඞ්ගල සම්මතය. '**යඤ්ඤෙසු**' කුඩා මහත් දනයන්හි. '**ඡණෙසු**' යනු ආවාහවිවාහ මඞ්ගලාදි උත්සවයන් අතරතුර පැවැති උත්සවයන්හි '**උස්සවෙසු**' ඇසැළමස පවුරුණු නැකත් ආදී මහත් උත්සවයන්හි. '**පඨමං භොජෙන්ති**' යනු මේ දරුවෝ තා හා සමාන ආයු ඇතිව නීරෝග වෙත්වායි යාඥ කරමින් පළමුකොටම වළඳවත්. යම් කෙනෙක් සැදැහැ ඇත්තෝ පහන්වූවාහු වෙත්ද, ඔවුහු භික්ෂූන් වළඳවා එයට අනතුරුවම සියල්ලට පළමුව ඒ විසාඛාවම වළඳවත්. '**න ආදියි**' යනු ඇයගේ වචනය නොගත්තේය. එයට ආදරය නොකෙළේයයිද අර්ථයි. '**අලං කම්මනියෙ**' කර්මක්ෂමය කර්මයට යෝග්‍යයි කම්මනිය නම. කර්මණ්‍යභාවයට යෝග්‍යය. සෑහේයයි අලං කම්මනිය නම, ඒ කර්මයට යෝග්‍යතන්හි, යම් තැනක අධ්‍යාචාරය කරන්නාහු ඒ අධ්‍යාචාරකර්මය කරන්නට හැකි වෙත්ද, එබඳු තන්හිය යන අර්ථයි. එහෙයින්ම මෙයට පදභාජනයෙහි '**සක්කා හොති මෙථුනං ධම්මං පතිසෙවිතුං**'යි වදළසේක. යම් තැනක මෙවුන්දම් සෙවුමට හැකි වේයයි කියනලද්දේවේ. '**නිසජ්ජං කප්පෙය්‍ය**' හිඳීම කරන්නේය. හිඳින්නේය යන අර්ථයි. යම්හෙයකින් වනාහි හිඳම නොවීද, එහෙයින් මෙයට පදභාජනයෙහි දෙකම වදරනලදි. එහි '**උපනිසින්නො**' එළැඹ හුන්නේය. මෙසේ '**උපනිපන්නොපි**' හොත්තේදැයි දතයුත්තේය. '**භික්ඛු නිසින්නෙ**'යනු මහණහු හුන්කල්හි යන අර්ථයි. '**උභො වා නිසින්නා**' මහණහු හා මාගම යන දෙදෙනම පෙරපසු නොව හුන්නාහු. මෙහිද පෙළෙහි '**සොතස්ස රහො**' කණට රහස්වයි ආයේය. ඇසට රහස්වසයෙන්ම රහොනිසජ්ජාපත්තියගේ පිරිසිදීම දතයුතුය. වැසූ කවුළු ඇති ගැබක දෙර ලඟ හුන් නුවණැති පුරුෂයෙක්වේද, එයින්ම අනාපත්තිය නොකරයි. නොවැසූ කවුළු ඇති ගැබක දෙරලඟ හුන්නේ අනාපත්තිය

කරයි. හුදෙක් දොරලඟ හුන්නේ අනාපත්තිය නොකරන්නේය. දෙළොස්රියනක් තුළ අවකාශයෙහි හුන්නේද අනාපත්තිය කරන්නේය. ඉදින් ඇස් ඇත්තෙක් විසුරුනු සිත් ඇත්තේ වේද, නිදන්නේද, අනාපත්තිය කරන්නේය. සමීපයෙහි සිටි අන්ධතෙමේද, නොකරන්නේය. ඇස් ඇත්තේද හෙව නිදන්නේ නොකරන්නේය. ස්ත්‍රීන් සියයකුදු අනාපත්ති නොකෙරේමය.

**'සද්ධෙය්‍ය වචසා'** ඇදහිය යුතු වචන ඇත්තීය. ඕ වනාහි යම් හෙයකින් ආර්‍ය්‍ය ශ්‍රාවිකාවක්මවේද, එහෙයින් මේ ශික්‍ෂාපදයාගේ පදභාජනයෙහි **'ආගතඵලා'** යනාදිය වදරනලදි. එහි පැමිණි ඵලය මැයටනුයි ආගතඵලා නම. පිළිලද සෝවවන්පල ඇත්තීය යන අර්‍ථයි. **'අභිසමෙතාවිනී'** යනු පිළිවිදි සිවුසස් ඇත්තීය. මැය විසින් ශික්‍ෂාත්‍රය සංගෘහිතශාසනය ඇත්තී **විඤ්ඤාතසාසනා** නම. **'නිසජ්ජං භික්ඛු පටිජානමානො'** යනු මෙවැනි උපාසිකාවන්තොමෝ දැක කියයි. එහෙත් මහණ තෙමේ හිඳීම පිළිණකරන්නේම පාරාජිකයෙන් වේවයි, සඞ්ඝාදිසෙසයෙන් වේවයි, පාචිත්තියෙන් වේවයි යන තුන අතුරින් එක්තරා එකෙකින් කරවිය යුතුය. පිළිණ නොකරන්නේ නොකටයුතුය. **'යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො'**යි නිෂද්‍යාදි ආකාරයන් අතුරෙහි යම් ආකාරයක් සමග මෙවුන්දම් ආදිය ආරොපණය කොට ඒ උපාසිකා තොමෝ කියන්නී නම් එයින් පිළිණ කරන්නාවූම ඒ මහණ තෙමේ කරවිය යුතුය. මෙවැනි උපාසිකාවකගේද වදන් පමණින් නොකරවිය යුතුය යන අර්‍ථයි. කුමක් හෙයින, යත් යම්හෙයකින් දක්නාලද්ද එසේද වේ. අන්ලෙසකින්ද වේ. එහෙයිනි. ඒ කරුණ දක්වනු පිණිස මේ වස්තුව ගෙණහැර දක්වත්.

මලලාරාම විහාරයෙහි එක් රහත්තෙරනමක් එක් දිනෙක උපස්ථායක කුලයකට ගොස් ගෙය තුළ හුන්නේය. උපාසිකා තොමෝද නිදන අසුන ඇසුරු කොට සිටියාය. එකල එක් පිඩුසිහා යන මහණෙක් දෙරලඟ සිටියේ දැක, ස්ථවිර තෙමේ උවැසිය හා එක් අසුනෙහි හුන්නේයයි සංඥා ලැබ සිතා නැවැත නැවැත බැලූයේය. ස්ථවිර තෙමේද, මෙතෙමේ මා කෙරෙහි අශුද්ධිලබ්ධි ඇත්තේ වීය'යි සලකා කළ බත්කිස ඇත්තේ විහාරයට ගොස් තමන් වසන තැනට වැද ඇතුළතම හුන්නේය. ඒ මහණතෙමේද තෙරුන්ට චොදනා කරන්නෙමියි අවුත් කාරා දෙර හැරියේය. ස්ථවිරතෙමේ ඔහුගේ සිත දැන අහසට පැනනැගී කුළුගෙයි කැණිමඬල ඇසුරුකොට අරමිණිය ගොතා හුන්නේය. ඒ මහණතෙමේද ඇතුළට වැද ඇඳද ඇඳයටද බලා තෙරුන් නොදක්නේ උඩබැලීය. එකල අහස හුන්තෙරුන් දැක 'ස්වාමීනි' මෙසේ මහත් සෘද්ධි ඇති ඔබවහන්සේලා මාගම හා එක් අසුනෙහි හුන්බව කියවවුමදැ'යි කීයේය. ස්ථවිර තෙමේ

'ඇවැත' ඇතුළුගෙය පිළිබඳවම මේ දෙසයවේ. මම, වනාහි එය අදහවන්නට නොහැකිවන්නේ මෙසේ කෙළෙමි, මා රකුවයි කියා බැසසිටියේය.

මෙයින් මතු **'සා චෙ එවං වදෙය්‍ය'** යනාදි සියල්ල පිළිණ ගැණීමෙහි ආකාරය දක්වනු පිණිස වදරනලදී. එහි **'මාතුගාමස්ස මෙථුනං ධම්මං පතිසෙවන්තො'** යනු මාගමකගේ මගෙහි මෙවුන්දම් සෙවනය කරන්නේය යන අර්ථයි. **'නිසජ්ජාය කාරෙතබ්බො'**යි හිඳීම පිළිනකොට මෙවුන්දම් පිළිසෙවුම නොපිළිදන්නේ මෛථුන ධර්මපාරාජිකාපත්තියෙන් නොකරවා හිඳීම පමණින් යම් ඇවැතකට පැමිණේද ඒ ඇවැතින් කරවිය යුත්තේය. පාචිත්තියාපත්තියෙන් කරවිය යුත්තේය යන අර්ථයි. මේ නයින් සියලු චතුෂ්කයන්හි විනිශ්චය දතයුත්තේය. ශික්ෂාපදයන්ගේ අවසානයෙහි ආපත්ති අනාපත්තීන්ගේ පිරිසිඳීම දක්වනු පිණිස කියන ලද **'ගමනං පටිජානාති'** යනාදිතන්හි **'ගමනං පටිජානාති'** රහස්හි හිඳීමෙහි ආස්වාදය පිණිස ගියේ වෙමි'යි මෙසේ ගමන පිළිනකරයි. **'නිසජ්ජං'** හිඳීමෙහි ආස්වාදයෙන්ම හිඳීම පිළිනකරයි. **'ආපත්තිං'** තුන් ඇවැතුන් අතුරෙහි එක්තරා ඇවැතකි. **'ආපත්තියා කාරෙතබ්බො'** තුන් ඇවැතුන් අතුරෙහි යමක් පිළින කෙරේද, එයින් කරවිය යුතුය. මෙහි සෙස්ස චතුෂ්කයෙහි ප්‍රකටවූ අභිප්‍රායමවේ. දෙවන චතුෂ්කයෙහි වනාහි **'ගමනං න පටිජානාති'** රහස්හි හිඳීමෙහි ආස්වාදවශයෙන් නොපිළිදනියි. ලහබත් ආදීවූ තමන්ගේ කටයුත්තක් නිසා ගියේ වෙමි'යි කියයි. ඕ තොමෝ මා හුන්තැනට ආවායයි කියයි. මෙහිද සෙස්ස කියනලද්දවුන්ගේ අභිප්‍රායමවේ.

මේ වනාහි හැම තන්හි විනිශ්චයයි:- රහොනිෂද්‍යාස්වාදයි. මෛථුන ධර්ම නිශ්‍රිතකෙලශය කියනු ලැබේ. යම් මහණෙක් ඒ ආස්වාදයෙන් මාගමක වෙත යනු කැමැතිව ඇස අඳුන් ගාද, දුක්කටයට පැමිණේ. අඳනය අඳීද, පටිය බඳීද, සිවුර පොරොවාද හැම තැන ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයට පැමිණේ. මාගම අවුත් හුන් ඇසිල්ලෙහි පාචිත්තියට පැමිණේ. ඒ ස්ත්‍රිය කිසි කටයුත්තක් නිසා නැගිට නැගිට නැවත නැවත හිඳීද, නිෂද්‍ය ගණනින් පාචිත්තියට පැමිණේ. යම් මාගමක සඳහා ගියේ, ඕතොමෝ නොදක්නාලදද, අන් ස්ත්‍රියක් අවුත් හිඳීද, ආස්වාදය ඉපදීම නිමිතිකොට පාචිත්තියවේ. මහාපච්චරියෙහි වනාහි යන කල පටන් අපරිසිදු සිත් ඇති බැවින් ඇවැත්මැයි කියනලදී. බොහෝ ස්ත්‍රීහු එත්ද, මාගමුන්ගේ ගණනින් පාචිත්තියාපත්තීහු වෙත්. ඉඳින් නැගිට නැගිට නැවැත නැවැත හිදිත්ද නිෂද්‍ය ගණනින් පාචිත්තියාපත්තීහු වෙත්, නියම නොකොට දුටුදුටුවක හා රහස්හි ආස්වාදය කරන්නෙමියි ගොස් හුන්තහුටද ආ ආ ස්ත්‍රීන්ගේ වසයෙන් නැවැත නැවැත නිෂද්‍යවශයෙන්ද කියූ නයින් ආපත්තීහු දතයුත්තාහ.

ඉදින් පිරිසිදු සිතින් ගොස් හුන් මහණහු වෙතට අවුත් ස්ත්‍රිය කෙරෙහි රහස් ආස්වාදය උපදීද, චිත්තොත්පාදමාත්‍රයකින් ඇවැත් නොවේ. සමුත්ථානාදීහු ප්‍රථම පාරාජික ශික්ෂාපදය සමාන වෙත්මය.

ප්‍රථම අනියතවර්ණනාව නිමි.

—॥—

"**තෙන සමයෙන බුද්ධො භගවා**" ද්විතීයානියත ශික්ෂාපදයයි. එහි "**භගවතා පටික්ඛිත්තං**" යනාදියෙහි එකලා මහණෙක් තෙමේ එකලා මාගමක හා රහස්හි කර්මයට යොග්‍යවූ පිළිසන් අසුනෙක යම් හිඳීමක් කරන්නේ නම් ඒ හිඳීම කිරීම ප්‍රතික්ෂෙප කරනලදැ'යි මෙසේ සම්බන්ධය දතයුතුය. අන්අයුරකින් වනාහි එකලා මහණක්හුගේ එකලා එකියක සමග කියයුතු වන්නේය. කුමක් හෙයිනයත්: ප්‍රතික්ෂෙප කරනලදැයි වදළ බැවිනි. සම්බන්ධාර්ථයෙහි 'එකො' යන මේ ප්‍රථමාවචනය දතයුතුය. "**නහෙව ඛො පන පටිච්ඡන්නං**" යන මෙහි වනාහි පිටත පවුරු ආදියෙන් වටකළ ඇතුළත අරිනලද යම් පිරිවෙන් මළු ආදියක් වේද, එද ඇතුළතයි දතයුතුය. මෙබඳු තැන් නොපිළිසන් තැනෙහිම ගන්නාලදැයි මහාපච්චරියෙහි කියනලදී. සෙස්ස ප්‍රථම ශික්ෂාපදනයින්ම දතයුත්තේය. හුදෙක් මෙහි නුවණැති අන්ධ නොවූ බිහිරි නොවූ යම් කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දෙළොස්රියන් තුළ අවකාශයෙහි සිටියේ හෝ හුන්නේ හෝ විසුරුනු සිතැත්තේද, නොවිසුරුනු සිතැත්තේද, නිදන්නේද, අනාපත්ති කරයි. බිහිරිවූයේ වනාහි ඇස් ඇත්තේද අන්ධ වූයේ බිහිරි නොවූයේද, අනාපත්ති නොකරයි. පාරාජිකාපත්තියද පිරිහෙලා දුට්ඨුල්ලාපත්තිය කියනලදැයි මේ වෙනස වේ. සෙස්ස ප්‍රථමය සමානමවේ. මේ අනියත දෙක්හිම උම්මත්තක, ආදිකර්මිකයන්ට ඇවැත් නොවේ. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ත්‍රිසමුත්ථානවේ. කායචිත්තයෙන් හෝ වාචාචිත්තයෙන් හෝ කායවාචා චිත්තයෙන් හෝ උපදී. ක්‍රියාවෙන් පැමිණිය යුතු බැවින් ක්‍රියා සමුත්ථානයි. ව්‍යතික්‍රම සංඥාවගේ අභාවයෙන් මිදෙන බැවින් සංඥාවිමොක්ෂයි. සචිත්තකයි. ලොකවද්‍යයි. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. සුඛමධ්‍යස්ථ වෙදනා වශයෙන් ද්විවෙදනයි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය.

විනයවිවෘති
නම්වූ
සිංහලසමන්තපාසාදිකාවෙහි
අනියතවර්ණනාව නිමි.

—॥—

තිංසනිස්සග්ගියා ධම්මා - යෙ වුත්තා සමිතාවිනා
තෙසන්දානි කරිස්සාම - අපුබ්බපදවණ්ණනං

සමනය කළ පව් ඇති භාග්‍යවත් බුදුරජුන් විසින් යම් නිස්සග්ගිය පාචිත්තිය කෙනෙක් වදරන ලද්දහුද, දැන් ඔවුන්ගේ පෙර නොකියූ පදවණ්ණනාව කරන්නෙමු.

**'තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති ගොතමකෙ චෙතියෙ තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං තිචීවරං අනුඤ්ඤාතං හොති'** එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ විසාලා මහානුවර ගොතමක නම් යක්ෂයාගේ චෛත්‍යස්ථානයෙහි කරනලද විහාරයෙහි වැඩ වාසය කරනසේක. එසමයෙහි වනාහි භාග්‍යවත්හු විසින් භික්ෂූන්ට තුන් සිවුර අනුදන්නා ලද්දේවේ. මෙහි **'තිචීවරං'** අන්තරවාසකය උත්තරාසඞ්ගය සඞ්ඝාටියයි. මේ තුන් සිවුර පරිභොග කරන්නට අනුදන්නාලද්දේවේ. යම් තැනෙක්හි වනාහි මේ තුන්සිවුරු පරිභොගය අනුදන්නාලද්දේද, යම් කලෙක්හි අනුදන්නා ලද්දේද, යම් කරුණක් හේතුකොට අනුදන්නා ලද්දේද, ඒ සියල්ල චීවරක්ඛන්ධකයෙහි ජීවතවස්තුවෙහි ආයේමවේ. **'අඤ්ඤෙනෙව තිචීවරෙන ගාමං පවිසන්ති'** යම් සිවුරකින් යුක්තව විහාරයෙහි හිඳිත්ද, නානතොටට බසිත්ද, එයින් අනිකෙකින්මය. මෙසේ දවස්පතා අලුත් සිවුරු දරත්, **'උප්පන්නං හොති'** අනුප්‍රඥපතියට දෙර දෙමින් ප්‍රතිලාභවශයෙන් උපන්නේ වේ. නිෂ්පත්තිවශයෙන් උපන්නේ නොවේ. **'ආයස්මතො සාරිපුත්තස්ස දාතුකාමො හොති'** ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ 'භාග්‍යවතුන් වහන්සේ හැර ගුණයෙන් විශිෂ්ටවූ මෙබඳු අන්‍ය පුද්ගලයෙක් නැතැ'යි ගුණයට බුහුමන් කිරීමෙන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මමායනය කරත්. ඒ ආනන්දස්ථවිරයන් වහන්සේ හැම කල්හිම මනවඩන සිවුරක් ලැබ රදන් ගන්වා කප්බිදු පිහිටුවා තෙරුන් වහන්සේටම දෙත්. උපස්ථායක කුලයන්ගෙන් දරුවන් ගෙන්වාගෙණ පැවිදිකොට තෙරුන් වෙතම උපාධ්‍යාය ග්‍රහණය කරවා තුමූ අනුශ්‍රාවණකර්මය කරත්, ආයුෂ්මත් කාරීපුත්‍රස්ථවිරයන් වහන්සේද, 'පියා විසින් කටයුතු කිස නම් වැඩිමහල් පුතුට අයත්ය. මා විසින් භාග්‍යවතුන් වහන්සේට කටයුතු කිස ආනන්ද ස්ථවිර තෙමේ කරන්නේය. මම ආනන්ද තෙරුන් නිසා උත්සාහ රහිතව වසන්නට ඉඩලබම්'යි ආයුෂ්මත් ආනන්ද තෙරුන්ට මමායන කරත්. උන්වහන්සේද, 'තමන්ට ලැබෙන මනවඩන සිවුරු ආනන්ද තෙරුන්ටම දෙතියි යන සියල්ල පළමු කියනලද්ද සමානම වේ. මෙසේ ගුණයට බුහුමන් කිරීමෙන් මමායනය කරන්නේ එකල්හි උපන් ඒ සිවුර ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට දෙනුකැමැත්තේ වේයයි දතයුතුය.

'**නවමං වා භගවා දිවසං දසමං වා**' යන මෙහි වනාහි ස්ථවිරයන්වහන්සේ කෙසේ දනිත්දැයි ඉදින් කිසිවක්හට මෙබඳු සැකයෙක් වන්නේ නම් බොහෝ කරුණෙන් දනිතියි දතයුතුය. ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ ජනපදචාරිකාවෙහි හැසිරෙනසේක් මම මෙපමණකලකින් එන්නෙමි, මේ අතරෙහි භාග්‍යවතුන් කෙරෙහි ප්‍රමාද නොවවු'යි ආනන්‍දස්ථවිරයන් වහන්සේට දන්වාම වඩිනසේක. ඉදින් ඉදිරියෙහිදී නොකියත්නම්, භික්‍ෂූන් යවාද දන්වාම යන්නාහ. අන් තැනක වස් වසන්නාහු නම් යම් මහණ කෙනෙක් පළමුකොට එත්ද, මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේද පාදයන් හිස තබා වඳිවු, ආනන්‍දගේ ද නීරොගභාවය විචාරා මා අසුවල් දිනයෙහි එන්නේය'යි කියා වඳිවු'යි ඒ භික්‍ෂූන් මෙසේ පිටත් කොට යවත්, හැම කල්හිම පිරිසිඳිදිනයෙහිම පැමිණෙති. තවද ආයුෂ්මත් ආනන්‍දස්ථවිරයන් වහන්සේ, අනුමානයෙනුදු 'මෙතෙක් දවස් භාග්‍යවතුන් වහන්සේගෙන් වෙන්ව විසීම ඉවසමින් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ විසූසේක, දැන් මෙතැන් පටන් අසුවල් දිනය නම් නොඉක්ම වන්නාහ, ඒකාන්තයෙන් එන්නාහයි. දනිත්. යම් යම් කෙනකුන්ගේ ප්‍රඥාව මහත් වන්නීද, උන් උන්ගේ භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ප්‍රේමයද ගෞරවයද මහත්වේයයි මේ නයිනුදු දනිත්. මෙසේ බොහෝ කරුණෙන් දනිත්. එහෙයින් 'නවමං වා භගවා දිවසං දසමං වා'යි කීහ.

මෙසේ කියූ කල්හි යම්හෙයකින් මේ ශික්‍ෂාපදය ප්‍රඥප්ති වද්‍යවේද, ලොකවද්‍ය නොවේද, එහෙයින් එය ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ විසින් කියූ දිනයමැයි පිරිසිඳීම කරමින් '**අථ ඛො භගවා -පෙ- ධාරෙතුං**' යනු කීහ. ඉදින් තෙරුන් විසින් අඩ මසක් හෝ මසක් හෝ උදෙසනලද්දේ වන්නේද, එද භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද්දේ වන්නේය. '**නිට්ඨිතචීවරස්මිං**' යම් කිසි නිමවීමකින් නිමවූ සිවුර ඇති කල්හි, යම්හෙයකින් ඒ සිවුර කිරීමෙන්ද නැසීම් ආදියෙන්ද හිටියේද එහයින් මේ ශික්‍ෂාපදයාගේ පදභාජනයෙහි අර්ථමාත්‍රයම දක්වනු පිණිස '**භික්ඛුනො චීවරං කතං වා හොති**' යනාදිය වදරනලදී. එහි '**කතං**' හිදිකම් කෙළවර කිරීමෙන් කරනලදය. හිදිකම් කෙළවර කිරීම් නම්, හිදියෙන් පාසවැටි ගණ්ඨිකවැටි කෙළවර කොට යම්කිසිවක් කටයුතුද ඒ කොට හිද්ද හිදිකුළාවෙහිලා රැකීමය. '**නට්ඨං**' සොරුආදීන් විසින් පැහැරගන්නා ලදය. මෙද කරණපළිබොධය නිමකළ බැවින් නිට්ඨිතයි කියනු ලැබේ. '**විනට්ඨං**' වේ ආදීන්විසින් කනලදය. '**දඩ්ඪං**' ගින්නෙන් දනලදය. '**චීවරාසා වා උපච්ඡින්නා**' අසුවල් නම් කුලයෙහි සිවුරක් ලබන්නෙම්'යි යම් චීවරාශාවක් උපන්නීවේද, ඒ ආශා තොමෝ හෝ සිඳුනීය.

විනෂ්ටාදීවූ මොවුන්ගේද කරණපළිබොධයම තිමවූ බැවින් නිට්ඨිතභාවයයි දත යුතුය.

'**උබ්භතස්මිං කඨිනෙ**' කඨිනය ඉදුරු කල්හි මෙයින් දෙවන ආවාස පළිබොධයාගේ අභාවය දක්වති. ඒ කඨිනය වනාහි යම් හෙයකින් අෂ්ටමාතෘකාවන් අතුරෙහි එකකින් හෝ දෙවැදෑරුම් කඨිනොද්ධරණයෙන් හෝ උදුරනු ලැබේද එහෙයින් මෙයට නිදේශයෙහි '**අට්ඨන්නං මාතිකානං**' යනාදිය වදරනලදි. එහි 'අට්ඨිමා භික්ඛවෙ මාතිකා කඨිනස්ස උබ්භාරාය. පක්කමනන්තිකා නිට්ඨානන්තිකා සන්නිට්ඨානන්තිකා නාසනන්තිකා සවණන්තිකා ආසාවච්ඡෙදිකා සීමාතික්කන්තිකා සහුබ්භාරායි මෙසේ අෂ්ටමාතෘකාවෝ කඨිනක්ඛන්ධකයෙහි ආවාහුය. අන්තරුබ්භාරයද 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො කඨිනං උද්ධරෙය්‍ය එසා ඤත්ති, සුණාතු මෙ භන්තෙ සඞ්ඝො කඨිනං උද්ධරති, යස්සායස්මතො ඛමති කඨිනස්ස උබ්භාරො, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය, උබ්භතං සඞ්ඝෙන කඨිනං, ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමි'යි මෙසේ භික්ඛුණීවිභඞ්ගයෙහි ආයේය. එහි යමක් කියයුතුනම් එය ආ තන්හිම වර්ණනා කරන්නෙමු. මෙහි කියූ කල්හි පෙළද ගෙණහැර දැක්විය යුතුවේ. අර්ථයද කියයුතුය. අස්ථානයෙහි කියූ බැවින් කියනලද්දේද මැනැවින් නොදත හැකිවේ.

'**දසාහපරමං**' දසදවසක් පිරිසිඳීම මේ සිවුර ඇත්තේනුයි දසාහපරම නම. ඒ දසදවසක්හුගේ පිරිසිඳීම් කාලයක් දැරියයුතුය යන අර්ථයි. පදභාජනයෙහි වනාහි අර්ථය පමණක් දක්වනු පිණිස '**දසාහපරමතා ධාරෙතබ්බො**'යි වදරනලදි. මේ කියනලද්දේවේ. 'දසාහපරමං' යන මෙහි යම් දස දවසක්හුගේ පරමතාවයක් ඇත්තීද, දසදවසක්හුගේ පිරිසිඳීමවේද, මෙපමණ කාලයක් තෙමේ යම්තාක් නොඉක්මේද, ඒතාක් දැරිය යුතුය යන මේ අර්ථය දතයුතුය. ඉටූ විකැපූ සිවුරු කෙරෙහි ඇතුළත් නොවන බැවින් අයිරිත් සිවුරුයි **අතිරෙක චීවර** නම. එහෙයින්ම මෙහි පදභාජනයෙහි '**අනධිට්ඨිතං අවිකප්පිතං**'යි වදරන ලදි. '**ඡන්නං චීවරානං අඤ්ඤතරං**' කොමුවැහරියෙන් කළ චීවරය, කපුහුයෙන් කළ චීවරය, පටහුයෙන් කළ චීවරය, එළලොම් ආදියෙන් කළ චීවරය, හණ වැහරියෙන් කළ චීවරරය, කොමුහු ආදිය මුසුකොට කළ චීවරය යන මේ සවැදෑරුම් සිවුරු අතුරෙහි එක්තරා එකක්වේ. මෙයින් සිවුරු පිළිබඳ ජාතිය දක්වා දැන් ප්‍රමාණය දක්වනු පිණිස '**විකප්පනූපග පච්ඡිමං**' යනු වදළ සේක. විකප්පනූපග පච්ඡිමයි කියූ ඒ විකපනයට පොහොනා පශ්චිම චීවරයෙහි ප්‍රමාණය දිගින් දෙවියතක් හෙවත් වඩුරියනක්වේ. පුළුලින් වියතක්වේ. 'අනුජානාමි භික්ඛවෙ ආයාමෙන අට්ඨඞ්ගුලං සුගතඞ්ගුලෙන

චතුරඞ්ගුලවිත්ථතං පච්ඡිමං චීවරං විකප්පෙතුං' යනු එහි පාලියයි. 'මහණෙනි' දිගින් සුගත් අඟලෙන් අටඟලක් ඇති පුළුලින් සතරඅඟලක් ඇති පැසුළුසිවුර විකපනය කරන්නට අනුදනිමි, යනු අරුත්ය. '**තං අතික්කාමයතො නිස්සග්ගියං පාචිත්තියං**' කියූ ජාතිය හා පමණ ඇති ඒ සිවුර දසදවසක් පමණ කොට ඇති කාලය ඉක්ම වන මේ අතර යම්සේ අතිරේක චීවරයක් නොවේද, එසේ නොකරන මහණහුට නිස්සග්ගිය පාචිත්තියෙක්වේ. ඒ සිවුරද නිස්සග්ගිය වේ. පාචිත්තියාපත්තියක්ද මොහුට වන්නීය යන අර්ථයි නොහොත්, බැහැරකිරීම නිස්සග්ගිය නම. පූර්ව භාගයෙහි කටයුතුවූ විනයකර්මයට මේ නමෙකි. බැහැර කිරීම මොහුට ඇත්තේනුයි නිස්සග්ගියමය. ඒ කිමෙක්ද, යත්:- පාචිත්තියය. ඒ කාලය ඉක්මවන්නහුට නිස්සග්ගිය විනයකර්ම සහිතවූ පාචිත්තියක් වේය යනු මෙහි මේ අර්ථයයි, පදභාජනයෙහි වනාහි පළමු කොට අර්ථ විකල්පය දක්වනු පිණිස '**තං අතික්කාමයතො නිස්සග්ගියං හොති**'යි මාතෘකාව තබා '**එකාදසමෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති නිස්සජ්ජිතබ්බං**'යි වදරනලදි. නැවැත යමක්හට නිස දියයුතුද, යම්සේ නිස දියයුතුද, එය දක්වනු පිණිස '**සඞ්ඝස්ස වා**' යනාදිය වදළසේක. එහි '**එකාදසෙ අරුණුග්ගමනෙ**' යන මෙහි යම් දවසෙක සිවුර උපන්නේද, ඒ දවස පිළිබඳ යම් අරුණක් ඉක්ම ගියේද, ඒ ඉකුත් අරුණ උපන් දවස ඇසුරු කොට සිටියේද, එහෙයින් සිවුරු උපන් දවස සමග එකොළොස්වන අරුණ නැගීම නිමිතිකොට නිස්සග්ගිය වේයයි දතයුතුය. ඉදින් බොහෝ සිවුරු එක්කොට රැහැන් ආදියෙන් බැඳ හෝ, වස්ත්‍රාදියෙන් වෙළා හෝ, තබන තබනලදද එක්ම ඇවැතක් වේ. නොබඳිනලද නොවෙළනලද වස්ත්‍රයන්හි වස්තුසඞ්ඛ්‍යාත වස්ත්‍ර ගණනින් ඇවැත්හු වෙත්.

'**නිස්සජ්ජිත්වා ආපත්ති දෙසෙතබ්බා**' නිසද ඇවැත් දෙසියයුතුය. කෙසේ දෙසියයුතුද, යත්: ඛන්ධකයෙහි යම්සේ කියනලදද, එසේ දෙසියයුතුය. එහි කෙසේ කියනලදද, යත්: 'මහණෙනි' නිසගි සිවුරු ඇති ඒ මහණහු විසින් සඞ්ඝයා වෙත එළැඹ උතුරුසඟසිවුර සකස්කොට පොරොවා වැඩිමහලු මහණුන්ගේ පා වැඳ, උක්කුටිකයෙන් හිඳ, ඇදිලි බැඳ 'ස්වාමීනි' මම මේ ඇවැතට පැමිණියෙමි, එය දෙසමි'යි මෙසේ පාලියෙන් හෝ අන් කිසි බසකින් හෝ කියයුතු වන්නේය. මෙහි වනාහි ඉදින් එක් සිවුරක් වේද, එහිදී 'එතං නිස්සග්ගියං පාචිත්තියං ආපන්නො'යි කියයුතුය. ඉදින් සිවුරු දෙකක් වේනම් 'ද්වෙ නිස්සග්ගියානි පාචිත්තියානි ආපන්නො'යි කියයුතුය. ඉදින් බොහෝ සිවුරු වෙත් නම් 'සම්බහුලා නිස්සග්ගියා පාචිත්තියාපත්තියො ආපන්නො'යි කියයුතුය. නිසදීමෙහිද ඉදින් එක් සිවුරක් වේනම්, පෙළවූ පරිදිම 'ඉදං මේ භන්තෙ චීවරං,යි කියයුතුය.

ඉදින් දෙකක් හෝ බොහෝ සිවුරු වේ නම් ඉමානි මෙ භන්තෙ චීවරානි දසාහාතික්කන්තානි නිස්සග්ගියානි, ඉමානාහං සඞ්ඝස්ස නිස්සජ්ජාමි,යි කියයුතුය. පාලිය කියන්නට නොහැකිවන්නහු විසින් අන් ආකාරයකිනුදු කියයුතුය. **'ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන ආපත්ති පටිග්ගහෙතබ්බා'**යි ඛන්ධකයෙහි කියූ නයින්ම පිළිගතයුතුය. එහි මෙසේ කියනලදී:- ප්‍රතිබල සම්පන්නවූ ව්‍යක්ත භික්ෂූහු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේය. කියේය, යත්:- 'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, අයං ඉත්ථන්නාමො භික්ඛු ආපත්තිං සරති විවරති උත්තානී කරොති දෙසෙති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්ථන්නාමස්ස භික්ඛුනො ආපත්තිං පතිගණ්හෙය්‍යං'යි ඒ ඇවැත පිළිගත් මහණහු විසින් 'පස්සසි'යි කියයුතුය. 'ආම පස්සාමි'යි ඇවැත දෙසූවහු විසින් කියයුතුය. 'ආයතිං සංවරෙය්‍යාසි'යි ඇවැත පිළිගත්තහු විසින් කියයුතුය. 'සාධු සුට්ඨු සංවරිස්සාමි,යි ඇවැත දෙසූවහු විසින් කියයුතුය. ඇවැත් දෙකක් ඇතිකල්හිද බොහෝ ඇවැත් ඇති කල්හිද පෙර කියූ නයින්ම වචනභෙදය දතයුතුය. චීවරදානයෙහිද 'සඞ්ඝො ඉමං චීවරං, ඉමානි චීවරානි'යි වස්ත්‍ර සඞ්ඛ්‍යාත සිවුරුගණනින් වචනභෙදය දතයුතුය. ගණයාහටද පුද්ගලයා හටද නිසදීමෙහිද මේ නයමවේ. මෙහි ඇවැත් දෙසීම් පිළිගැණුම්හි වනාහි මේ පෙලයි:- 'තෙන භික්ඛවෙ භික්ඛුනා සම්බහුලෙ භික්ඛූ උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා බුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්සු වචනීයා:- අහං භන්තෙ ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො තං පටිදෙසෙමි'යි. එකල්හි ප්‍රතිබල සම්පන්නවූ ව්‍යක්ත භික්ෂූහු විසින් ඒ භික්ෂූහු මෙසේ දැන්විය යුත්තාහ:- 'සුණන්තු මෙ ආයස්මන්තා අයං ඉත්ථන්නාමො භික්ඛු ආපත්ති, සරති විවරති උත්තානී කරොති, දෙසෙති, සදායස්මන්තානං පත්තකල්ලං අහං ඉත්ථන්නාමස්ස භික්ඛුනො ආපත්තිං පතිගණ්හෙය්‍යං'යි ඒ ඇවැත පිළිගන්නහු විසින් 'පස්සසි'යි කියයුතුය. ඇවැත දෙසූවහු විසින් 'ආම පස්සාමි'යි කියයුතුය. ඇවැත පිළිගත්තහු විසින් 'ආයතිං සංවරෙය්‍යාසි' කියයුතුය. ඇවැතට පැමිණි මහණහු විසින් එක් මහණක්හු වෙත එළැඹ උතුරු සඟ සිවුර සකස් කොට උක්කුටික හිඳ ඇඳිලි බැඳ 'අහං ආවුසො ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො තං පටිදෙසෙමි, මෙසේ කිය යුතු වන්නේය. ඇවැත පිළිගත්තහු විසින් 'පස්සසි'යි කියයුතුය. ඇවැත දෙසූවහු විසින් 'ආම පස්සාමි'යි කියයුතුය. ඇවැත දෙසූවහු විසින් 'ආම පස්සාමි'යි කියයුතුය. ඇවැත පිළිගන්නහු විසින් 'ආයතිං සංවරෙය්‍යාසි' කියයුතුය. එහි පෙර කියූ නයින්ම ආපත්තියෙහි නාමග්‍රහණයද වචනභෙදයද දතයුතුය. ගණයාහට නිසදීමෙහි යම්සේද, දෙදෙනකුහට නිසදීමෙහිද පෙළ දතයුතුය. ඉදින් විශෙෂයෙක්

වන්නේ නම්, 'අනුජානාමි භික්ඛවෙ තිණ්ණන්නං පාරිසුද්ධිඋපොසථං කාතුං, එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බො:- ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා' යනාදි නයින් තුන් දෙනකුහට පාරිශුද්ධි උපොසථය වදරා, නැවැත 'අනුජානාමි භික්ඛවෙ ද්වින්නං පාරිසුද්ධි උපොසථං කාතුං, එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බො:- ථෙරෙන භික්ඛුනා උත්තරාසඞ්ගං, යනාදිනයින් වෙන්වම දෙදෙනකුට පාරිසුද්ධිඋපොසථය වදරනලද්දේද මෙසේ මෙහිද වෙන්ව පාළිය කියන්නේ යම්හෙයකින් නැත්තේද එහෙයින් නොකියා ගියේයයි ගණයාහට වදළ පාළියම මෙහි පාළියවේ.

ඇවැත් පිළිගැණීමෙහි වනාහි මේ වෙනසයි. යම්සේ ගණයාහට නිස දී ඇවැත දෙසනු ලබනකල්හි ඇවැත පිළිගන්නා මහණතෙමේ ඤත්තිය තබාද, එසේ නොතබා දෙදෙන අතුරෙහි එක්තරා එකකු විසින් එක් පුද්ගලයෙක් යම්සේ පිළිගණුලැබේද, එසේ ඇවැත පිළිගත යුත්තීය. දෙදෙනකුත් පිළිබඳව ඤත්තිය තැබීමක් නැත්තේය. ඉදින් වන්නී නම් දෙදෙනකු පිළිබඳව පාරිසුද්ධි උපොසථය වෙන්ව නොවදරන්නේය. නිසදන ලද සිවුරු දීමෙහිද යම්සේ 'ඉමං චීවරං ආයස්මතො දම්මි'යි එකෙක් කියාද, එසේ 'ඉමං මයං චීවරං ආයස්මතො දෙම'යි කීම වටියි මෙයට වඩා අතිශය ගරුවූ ඤත්තිදුතියකර්මද අපලොකනය කොට කටයුතුයයි වදළසේක. ඔවුන්ට අනුලොම්වූ නිසදනලද සිවුර දියයුත්තේමය. නොදෙනු නොලැබේ. මේ විනය කර්මමාත්‍රයෙක්මය. සිවුරු නිසදන්නහු විසින් ඒ සිවුර සඞ්ඝයාහට හෝ ගණයාහට හෝ පුද්ගලයක්හට හෝ මුල් සිඳීම් වසයෙන් නොදුන්නේම වේයයි දතයුතුය.

'**දසාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී**' දස දවස ඉකුත් වූ සිවුරෙහි මෙය අතික්‍රාන්තයයි මෙසේ හැඟීම් ඇත්තේද, නොහොත් දස දවස ඉක්ම ගිය කල්හි දස දවස ඉක්ම ගියේයයි මෙසේ හැඟීම් ඇත්තේද, '**නිස්සග්ගියං පාචිත්තියං**' යනු මෙහි විමති ඇත්තාවූද දස දවස නොඉක්මුනේය යන මෙසේද්වූ සංඥතොමෝ තොර කියා. මෙසේ සංඥ ඇත්තාවූ යමෙක්වේද, ඔහුගේද ඒ සිවුර නිසගිවේ. පාචිත්තියාපත්තියද වන්නීය. නොහොත් නිසදිය යුතු විනය කර්මය සහිතවූ පාචිත්තියයි. ද්විධවූ අන්‍යවිකල්පයෝ යෙදෙත්. සියලු තන්හි මේ නය වේ. '**අවිස්සජ්ජිතෙ විස්සජ්ජිතසඤ්ඤී**'යි කිසිවක්හට නොදුන්කල්හි පරිත්‍යාග නොකළ කල්හි මා විසින් පරිත්‍යාග කරනලද්දේයයි මෙසේ සංඥ ඇත්තේ, '**අනට්ඨෙ නට්ඨසඤ්ඤී**' තමන්ගේ සිවුර සමග අනුන්ගේ බොහෝ සිවුරු එකට තබනලද්දවුන් සොරුගෙණ යෙත්. එහි මෙතෙමේ තමන්ගේ සිවුර නොනට කල්හිද, නෂ්ටසංඥ ඇත්තේවේ. අවිනෂ්ටාදීන් අතුරෙහිද මේ නයවේ.

**'අච්ඡුපෙත්ත'** මෙහි වනාහි ගබඩාව බිඳ පසය්‍යාවහාරවසයෙන් පැහැර නොගත් කල්හියයි දතයුතුය. **'අතිසාපජ්ජිත්වා පරිභුඤ්ජති දුක්කටස්ස'** වරක් හඳිනලද සිවුර හෝ වරක් පෙරවූ සිවුර හෝ සිරුරෙන් නොමුදා දවසක් මුළුල්ලෙහි නමුත් හැසිරේද, එක්ම ඇවැතක් වේ. සිරුරෙන් මුදා අඳියි හෝ පොරොවා හෝ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. හැඳීමට නොහැකි සිවුරක් හෝ පොරෝනට නොහැකි සිවුරක් හෝ මනාකොට තබාගන්නහුට ඇවැත්නොවේ. අතිකක්හුගේ ඒ නිසගි සිවුර පරිභොග කරන්නහුටද ඇවැත්නොවේ. 'අනාපත්ති අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති' යනාදී වචනයද මෙහි සාධකවේ. දස දවස නොඉක්මුනු කල්හිද, ඉකුත්ය යන සංඥ ඇත්තහුටද විමති ඇත්තහුටද දුක්කටයවේය යන මෙය පරිභොගය සඳහා **අනාපත්ති අන්තොදසාහං අධිට්ඨෙති විකප්පෙති,** යනු වදාරනලදී. මෙහි වනාහි ඉටීමට යොග්‍යයද විකපනයට යොග්‍යයද දතයුතුය.

එහි මේ පෙළයි, එකල්හි භික්ෂූන්ට 'භාග්‍යවතුන්වහන්සේ විසින් තුන් සිවුරයි හෝ වැසිසළුවයි හෝ නිසීදනයි හෝ පසතුරුණයි හෝ කුණ්ට පිළිසනයි හෝ මුවපිස්නා සේළයි හෝ පිරිකරසේළයි හෝ යම් ඒ සිවුරු අනුදන්නාලද්දහුද, ඒ සියල්ල ඉටිය යුතුද, නොහොත් විකපිය යුතුදැයි මෙබඳු සිතෙක් වූයේය. එකල්හි ඔවුහු භාග්‍යවතුන් වහන්සේට මෙකරුණ සැලකළහ. 'මහණෙනි' තුන් සිවුර ඉටන්නට, නොවිකපන්නට, වැසිසළුව වැසිසාරමස ඉටන්නට එයින් පසු විකපන්නට, නිසීදනය ඉටන්නට නොවිකපන්නට, පසතුරුණ ඉටන්නට නොවිකපන්නට කුණ්ට පිළිසන ආබාධය තෙක් ඉටන්නට එයින් පසු විකපන්නට, මුව පිස්නාසේළය ඉටන්නට නොවිකපන්නට පිරිකරසේළය ඉටන්නට නොවිකපන්නට අනුදනිමි'යි උන්වහන්සේ වදළසේක.

එහි තුන් සිවුර ඉටන්නහු විසින් රඳන් ගත්වා කප්බින්දු දී පමණින් යුක්තවූම සිවුර ඉටිය යුතුය. ඒ සිවුරෙහි ප්‍රමාණය උසස් පිරිසිඳීමෙන් සුගත් සිවුරෙන් අඩුවූවක් වියයුතුය. පහත් පිරිසිඳීමෙන් සඞ්ඝාටියෙහි හා උතුරුසඟ සිවුරෙහි පමණ, සිවුරියනක් හා එක් මිටිරියනක්ද පුළුලින් දෙරියනක් හා එක් මිටිරියනක්ද වියයුතුය. අන්තර වාසකය තෙමේ දිගින සිවුරියනක් හා එක් මිටිරියනක්ද පුළුලෙන් දෙරියනක්ද ඇත්තේ වටනේය. පොරෝනයෙන්ද නාභිය වසන්නට හැක්කේය. කියූ පමණින් වැඩි වූයේද අඩුවූයේද පරික්කාරචොළයි ඉටිය යුතුය. එහි යම් හෙයකින් කයින් හෝ ඉටයි වචන හෝ ඉටායි සිවුර පිළිබඳ අධිෂ්ඨාන දෙකක් වදරන ලද්දේද, එහෙයින් පැරණි සඟළ සිවුර 'ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි' මේ සඟළසිවුරෙහි ඉටීම ඔසවමි'යි

පච්චුද්ධරණයකොට අලුත් සහළ සිවුර අතින් ගෙණ 'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'යි මේ සහළසිවුර ඉටමි,යි සිතින් ආභොග කොට අතින් සිවුර පිරිමදින්නහු විසින් කයින් ඉටිය යුතුය. මේ කයින් ඉටීමය. ඒ කයින් ඉටීම යම් කිසි සිරුරු අවයවයකින් නොපහසන්නහුට නොවටියි. වචනයෙන් ඉටීමෙහිදී වාග්භෙද කොට වචනයෙන් ඉටියයුතුය. එහි අධිෂ්ඨානය සම්මුඛ අසම්මුඛභෙදයෙන් දෙවැදෑරුම්වේ. ඉදින් අත්පසෙහි වේ නම් අතින්ද පහසා 'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'යි වාග්භෙදය කටයුතුය. නැවැත ගැබතුළ හෝ පහය මතුයෙහි හෝ එදවස ගොස් එන්නට හැකි ලඟ වෙහෙරක හෝ වේද, තැබූ තැන සලකා 'එතං සඞ්ඝාමිං අධිට්ඨාමි'යි වාග්භෙදය කටයුතුය. උත්තරාසඞ්ගයෙහිද අන්තරවාසකයෙහිද මේ නයවේ. මෙහි නාමමාත්‍රයම වෙනස් වේ. එහෙයින් සඞ්ඝාටිං, උත්තරාසඞ්ගං, අන්තරවාසකං'යි තම තමන්ගේ නමින්ම සියල්ල ඉටිය යුතුය. ඉදින් පරිෂ්කාරචොල නාමයෙන් ඉටා තැබූ වස්ත්‍රයන්ගෙන් සඞ්ඝාටිආදිය කෙරේද, රඳන් ගැන්වීම හා කප් බින්දු තැබීමද තිම්කල්හි මෙය 'පච්චුද්ධරාමි'යි කියා පච්චුද්ධරණයකොට නැවැත ඉටිය යුතුය. ඉටූ සිවුර සමග ඉතා මහත්වූම දෙවන පටක් හෝ රෙදිකඩක් හෝ මහත්නහු විසින් ('සඞ්ඝාටි ආදි තුන් සිවුරු නාමයෙන් ඉටා පරිභොග කරනු කැමැත්තහු විසින්) නැවැත ඉටිය යුතුය. සමවූවෙක හෝ කුඩා වූවෙක හෝ අධිෂ්ඨානකෘත්‍යයෙක් නැත්තේය. මුෂ්ටිපඤ්චකාදි ප්‍රමාණයෙන් යුත් තුන් සිවුර පරිෂ්කාර චොලයක් කොට ඉටීම වටීද, නොවටීද යන මෙහිලා මහාපදුමස්ථවිරයන් වහන්සේ වනාහි 'තුන් සිවුර, තුන් සිවුරම කොට ඉටිය යුතුය, පරිෂ්කාරචොලාධිෂ්ඨානය ලබන්නේ නම් උද්දෙසිතශික්ෂාපදයෙහි චීවර පරිහාරය නිරත්ථක වන්නේයයි කීහ. මෙසේ කියූ කල්හි සෙසු භික්ෂූහු 'පරිෂ්කාරචොලයද භාග්‍යවත්හු විසින්ම ඉටිය යුතුයයි වදරන ලද්දේද, එහෙයින් වටීයයිද මහාපච්චරියෙහිද මෙය පරිෂ්කාරචොල නම් වෙන්වූ නිදනමුඛයෙක, තුන් සිවුර පරිෂ්කාරචොලයි ඉටා පරිභොග කිරීමවටියි කියනලදී. උද්දෙසික ශික්ෂාපදයෙහි තුන් සිවුර ඉටා පරිහරණය කරන මහණහට පරිහාරය කියනලදැයි කීහ.

උභතොවිභඞ්ගභාණක පූණ්ණවාලිකවාසී මහාතිෂ්‍යස්ථවිරයන් වහන්සේ 'අරණ්‍යවාසීවූ භික්ෂූහු රුක්සිදුරු ආදියෙහි සිවුර තබා වීය්‍යීය කරනු පිණිස යන්නාහ, අසල වෙහෙරෙහි ධර්මශ්‍රවණය පිණිස ගියාවූද ඔවුන්ගේ පාසිවුරු හිරු නැගි කල්හි හෙරණහු හෝ ලදරු මහණහු හෝ ගෙණ යෙත්, එහෙයින් සුඛපරිභොගය පිණිස තුන් සිවුරු පරිෂ්කාරචොලයයි කියා හෝ ඉටීම වටීයයි පෙර අපි මහතෙරුන්ගෙන් ඇසූම්හ. මහාපච්චරියෙහිද 'පෙර ආරණ්‍යක භික්ෂූහු අබද්ධසීමාවෙහි

තුන් සිවුරු පරිහරණය කට නොහැක්කේයයි පරිෂ්කාරචෝලයම ඉටා පරිභොග කළහ'යි කියනලදැයිද කීහ. වැසිසළුව වනාහි නොඉක්මවිය යුතු පමණ ඇත්තී නාමය ගෙණ කියූ නයින්ම වැසි සාරමස ඉටිය යුත්තීය. ඒ වැසිසාරමසින් පසු, පසුදුරා විකප්පනය කටයුත්තීය. වර්ණභෙද මාත්‍රයෙන් රදත් කළ මෝතොමෝ නෑම පිණිස අනුදත් බැවින් ගතයුතුය. දෙකක් නොවටියි. නිසීදනය කියූ නයින් ඉටිය යුතුමය. එද පමණින් යුක්තවූ එකක්ම වටියි. දෙකක් නොගතයුතුය. පසතුරුණද ඉටිය යුතුමය. එය මහත්වූයේද වරද නැත. එකක් ගැණීමද වටියි. බොහෝ ගණනක් ගැණීමද වටියි. එය නිල්වූයේද රත්වන් වූයේද දවලු සහිත වූයේද, මල්දවලු සහිතවූයේද මෙකියූ සියලු ආකාර ඇතියේ ද සුදුසුය. වරක් ඉටුයේ ඉටුයේම වේ. කුණ්ට පිළිසන ආබාධ ඇත්තේ යම්තාක් ද, ඒ තාක් පමණින් යුක්ත වූවක්ම ඉටාගත යුතුය. ආබාධ සන්සිඳුනු කල්හි පසුදුරා විකපනය කටයුතුය. එකක්ම ගැණීම වටියි. මුවපිස්නාසේලය ඉටිය යුතුමය. එකක් සෝද ගන්නාතුරු අතිකක් පරිභොගය පිණිස කැමැති වියයුතුයයි දෙකක් නමුදු ගත හැකිය. අන් තෙරහු වනාහි මේ නිදන මුඛ මාත්‍රයකැ'යි කියා බොහෝ ගණනක් ගැණීම වටියයි කියත්. පරිෂ්කාරචෝලයෙහි ගණනක් නැත්තේය. යම් පමණක් කැමැති වේනම් එපමණක් ඉටිය යුතුමය. පසුම්බිය ද පෙරහනද විකපනයට සුදුසුවූ පැසුළුසිවුර පමණ වූයේ පරිෂ්කාරචෝලැයි ඉටිය යුතුමය. බොහෝ ගණනක් එක් කොට 'ඉමානි චීවරානි පරික්ඛාරචොළානි අධිට්ඨාමි'යි ඉටීම වටීමය. බෙහෙත් නවකම් මවුපිය ආදීන් පිණිස තබන්නාහු විසින්ද ඉටිය යුතුමය. තමන් සතු රෙදිපිළි සඳහා මහා පච්චරියෙහි අනාපත්ති'යි කියනලදි. ඇඳබිසි, පුටුබිසි, කොට්ට, උතුරුසළු, කොඩුපලස යන මොවුන් අතුරෙහි සෙනසුන් පිරිකර පිණිස දුන් පසතුරුණෙහිද අධිෂ්ඨාන කෘත්‍යයෙක් නැත්තේමය.

ඉටු සිවුර පරිභොග කරන්නහුගේ අධිෂ්ඨානය කෙසේ හරීද, යත්: අන්හට දීමෙන්, අසිඳ ගැණීමෙන්, විශ්වාසග්‍රහණයෙන්, ගිහිබවට පැමිණීමෙන්, ශික්‍ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන්, කාල ක්‍රියාවෙන්, ලිඞ්ගපරිවර්තනයෙන්, පච්චුද්ධරණයෙන්, සිදුරුවීමෙන් යන මේ කරුණු නවයෙන් අධිෂ්ඨානය හරියි. එහි පළමු අටින් සියලු සිවුරු අධිෂ්ඨානය හැරලත්. සියලු අට්ඨකථාවන්හි තුන් සිවුරෙහිම අධිෂ්ඨානවිජහනය සිදුරු වීමෙන් වේයයි කියනලදී. ඒ අධිෂ්ඨානවිජහනය ද නියපිටු පමණ සිදුරෙන් වන්නේය. එහි සිදුර නියපිටු පමණ සිදුරු, කණිටු ඇඟිලි නිය වසයෙන් දතයුතුය. සිදුරද විනිවිදගිය සිදුරම වේ. සිදුරතුළ එක් හුයක් නමුත් නොසිඳුනේ වේද, රකියි. එහි සහළසිවුරෙහි හා උතුරුසහසිවුරෙහි දිග් අතින්

පියව්වියතින් වියතක් පමණවූද සරස් අතින් පියව්අහලෙන් අටහල් පමණවූද පෙදෙසෙහි මැතින්වූ සිදුරු අධිෂ්ඨානය බිදහරියි. අඳනයෙහි වනාහි දිග් අතින් පියව් වියතක් පමණවූම සරස් අතින් පියව් සිවු අහල් පමණවූ පෙදෙසෙහි මැතින්වූ සිදුර අධිෂ්ඨානය බිදියි. ඈතින්වූ සිදුර අධිෂ්ඨානය නොබිදියි. එහෙයින් සිදුරක් වූ කල්හි ඒ සිවුර අතිරෙක චීවරස්ථානයෙහි සිටියි. එහි හිදිකම් කොට නැවැත ඉටියයුතුය.

මහාසුමමස්ථවිරයන් වහන්සේ වනාහි 'පැසුළුපමණින් යුත් සිවුරෙහි යම් කිසි තැනක වූ සිදුර අධිෂ්ඨානය බිදියි. මහත් සිවුරෙහි පමණින් පිටත්හිවූ සිදුර අධිෂ්ඨානය නොබිදියි, ඇතුළතවූ සිදුර අධිෂ්ඨානය බිදීය'යි කීහ. කරවීකතිෂ්‍ය ස්ථවිරයන් වහන්සේ 'කුඩා මහත්බව පමණ නොවේ, ඇතුළුගම් වදින පිණිස සුප්‍රතිච්ඡන්න ශික්ෂාපදයෙහි කියූ නයින් සහළසිවුර හා උතුරුසඟ සිවුර එක්කොට සිවුරුදෙක පොරවන්නහුගේ වම් අත අකුලා තැබූ තැනවූ සිදුර අධිෂ්ඨානය නොබිදියි, මැත කොට සෙහිවූ සිදුර අධිෂ්ඨානය බිදියි, අඳනයෙහිද හිණැගන්වා සිසාර වන්නහු විසින් දෙකෙළවර ගැටූ තන්හි සිදුර අධිෂ්ඨානය නොබිදියි. ඉන් මෙපිටවූ සිදුර අධිෂ්ඨානය බිදීයයි කීහ. අඬකාත්ථකථාවෙහි වනාහි තුන් සිවුරෙහි මහාසුමමස්ථවිරවාදය ප්‍රමාණ කොට මත්තෙහිද පශ්චිම ප්‍රමාණය අධිෂ්ඨානය රකීය'යි මෙය කියනලදී. පරිෂ්කාර චොලයෙහි දිගින් සුගත් අහලෙන් අටහලෙක්හි සරස සිවුඅහුලෙක්හි යන යම් කිසි තැනකවූ සිදුර අධිෂ්ඨාන හරින්නේය. මහත්සේලයෙහි ඉන් පසුව වූ සිදුර අධිෂ්ඨානය නොහරින්නේය. ඉටිය යුතු සියලු චීවරයන්හි මේ නයවේ.

එහි යම්හෙයකින් සියලුම ඉටියයුතු සිවුරු අතුරෙන් විකපනයට පොහොනා පශ්චිමප්‍රමාණයට වඩා සූත්‍රයෙහි ආ අන්‍යපශ්චිම ප්‍රමාණයෙක් නම් නැත්තේය. තිසීදන කණ්ඩුපටිච්ඡාදි වස්සිකසාටිකයන්ගේ යම් ප්‍රමාණයෙක් කියන ලද්දේද, එයින් මත්තෙහි වළකාලූ බැවින් ඒම උත්කෂ්ටප්‍රමාණය නම්. එයින් යට නොවැළකූ බැවින් පශ්චිම ප්‍රමාණය නොවේ. තුන් සිවුරෙහිද සුගත් සිවුරෙහි පමණට වඩා අඩුබව උත්කෘෂ්ට ප්‍රමාණයමවේ. සූත්‍රයෙහි වෙන්ව කියනලද පශ්චිම ප්‍රමාණයෙක් නැත්තේය. මුඛපුඤ්ඡනය, පච්චත්ථරණය, පරික්ඛාරචොළය යන මොවුන්ගේ උත්කෘෂ්ටපරිච්ඡේදයෙක් නැත්තේමවේ. විකපනයට පොහොනා පශ්චිම චීවරය කරණ කොට පශ්චිම පරිච්ඡේදය කියනලද්දේය. එහෙයින් අඬකාත්ථකථාවෙහි 'පශ්චිමප්‍රමාණය අධිෂ්ඨානය රකීය'යි කියා එහි පරිෂ්කාරචොලයාගේම සුගත් අහලෙන් අටහුල් සිවුහුල් වූ පශ්චිම ප්‍රමාණය සඳහා 'ඉටිය යුතු සියලු චීවරයන්හි මේ නය වේයයි යමක් කියනලද්දේද, එය සම නොවේ. කරවීකතිෂ්‍යස්ථවිරවාදයෙහිද දිග් අතින්ම සිදුර

දක්වනලද්දේද පුළුල් අතින් නොදක්වන ලද්දේය. එහෙයින් නොපිරිසිදදුනේය. මහාසුම්මසථවිරවාදයෙහි 'ප්‍රමාණ කළ සිවුරෙහි යම් කිසි තැනකවූ සිදුර අධිෂ්ඨානය නොබිඳීය'යි කියනලද්දේය. මේ වනාහි ප්‍රමාණ කළ සිවුරෙහි ප්‍රමාණයෙන් පිටත්හිවූ සිදුර අධිෂ්ඨානය නොබිඳිය'යි කියනලද්දේය. මේ වනාහි පමණකළ සිවුරය. මෙයින් මතුවෙහි මහත් සිවුර'යි මෙය නොකියන ලද්දේය. එහෙත් මෙහි තුන් සිවුරු ආදීන් පිළිබඳ මුෂ්ටි පංචකාදි ප්‍රභෙදය තෙමේ පශ්චිමප්‍රමාණයයි අදහස් කරනලදි. එහි ඉදින් පශ්චිමප්‍රමාණයෙන් පිටතවූ සිදුර අධිෂ්ඨානය නොබිඳින්නේ නම් උත්කෘෂ්පාත්‍රය පිළිබඳවූද මධ්‍යම පාත්‍රය පිළිබඳවූ ද පශ්චිම ප්‍රමාණයෙන් පිටත්හි වූ සිදුර අධිෂ්ඨානය නොබිඳින්නේද, යත්: නොබිඳින්නේ නොවේ. එහෙයින් මේ වාදයද නොපරිසිදුනේය. යම් මේ සියල්ලට ප්‍රථම වූ අට්ඨකථාවාදයෙක් වේද, මේම මෙහි ප්‍රමාණ වේ. කුමක් හෙයින්දයත්:- පිරිසිඳීම ඇතිබැවිනි. තුන් සිවුරෙහි පශ්චිමප්‍රමාණයද ඡිද්‍රප්‍රමාණයද ඡිද්‍රොත්පත්ති ප්‍රදෙශප්‍රමාණයද යන සියල්ල අට්ඨකථාවන්හි ම පිරිසිද කියනලද්දේද, එහෙයින් එම වාදය තෙමේ ප්‍රමාණවේ. ඒකාන්තයෙන් ඒ වාදය තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ අදහස අනුවගොස් කියනලද්දේය. අන් වාදයන්හි වනාහි පිරිසිඳීමෙක් නො ඇත්තේය. පූර්වය හා අපරයද, අපරය හා පූර්වයද සම නොවේ. යමෙක් වනාහි දුබල තැන පළමුකොට රෙදිකඩක් තබා මසා, පසුව දුබල තැන සිද පහ කෙරේද, අධිෂ්ඨානය නොබිඳේ. මැඩිලි පෙරළීමෙහිද මේ නයම වේ. දෙපට සිවුරෙහි එක් පටලයෙක්හි සිදුරක් වූ කල්හි හෝ එක් පටක් ගිලිහුනු කල්හි හෝ අධිෂ්ඨානය නොබිඳේ. කුඩා සිවුරක් මහත් කෙරේද, මහත්වූ සිවුරක් කුඩා කෙරේද, අධිෂ්ඨානය නොබිඳේ. දෙකෙළවර ගෙණ මැද කරන්නේ පළමු කොට සිද පසුව ගටාද අධිෂ්ඨානය බිඳෙන්නේය. දෙකෙළවර එක්කොට මසා නැවැත සිඳීද, අධිෂ්ඨානය නොබිඳේ. රදවුන් ලවා සෝදවා සුදුපැහැ කරවන්නහුගේද අධිෂ්ඨානය අධිෂ්ඨානයම යයි දතයුතුය. මේ වනාහි '**අනොතාදසාහං අධිට්ඨෝති විකප්පෙති**' යන මෙහි අධිෂ්ඨානයෙහි විනිශ්චයයි.

විකල්පනයෙහි වනාහි සම්මුඛාවිකප්පනා පරම්මුඛාවිකප්පනායි විකප්පනා දෙකකි. සම්මුඛාවිකප්පනා තොමෝ කෙසේ වේද, යත්: සිවුරු එකක්බව හෝ බොහෝ බවද ආසන්නදූරභාවයද දැන හමුවූ එක් සිවුරක් වුවහොත් 'ඉමං චීවරං'යි කියාද හමුවූ බොහෝ සිවුරු වුවහොත් '**ඉමානි චීවරානි**' කියාද, අත්පසින් ඈත්හි නොහමුවූ එක් සිවුරක් වුවහොත් '**එතං චීවරං**' කියාද, අත්පසින් ඈත්හි නොහමුවූ බොහෝ සිවුරු වුවහොත් '**එතානි චීවරානි**' කියාද, '**තුය්හං විකප්පෙමි**'යි කිය

යුතුය. මෙසේ එක බහුභාවය හා දූරාසන්නභාවය සලකා වාක්‍යය යෙදිය යුතුය. මේ එක් සම්මුඛාවිකප්පනාවකි. මෙපමණකින් තබන්නට වටියි. පරිභොග කරන්නටද බැහැරලන්නටද ඉටන්නටද නොවටියි. 'මා සතු සිවුර, මා සතු සිවුරු පරිභොග කරවයි හෝ බැහැරලවයි හෝ ප්‍රත්‍යයපරිදි කරව'යි හෝ මෙසේ කියූ කල්හි පච්චුද්ධාර නම්වේ. හෙවත් බැහැරලීම කෙළේ නම්වේ. විකපීම කළ සිවුර ලත් මහණහු විසින් එක් සිවුරක් වුවහොත් '**මය්හං සන්තකං පරිභුඤ්ජ**' කියා හෝ '**මය්හං සන්තකං විස්සජ්ජේහි**' කියා හෝ '**මය්හං සන්තකං යථාපච්චයං කරොහි**' කියා හෝ මේ වාක්‍යයෙන් සිවුර හිමි මහණහුට දියයුතුය. බොහෝ සිවුරු වුවහොත් '**මය්හං සන්තකානි**' කියා යෙදිය යුතුය. එතැන් පටන් පරිභොගාදීහුද වටිත්. මෙහි අන් ක්‍රමයෙක්දවේ. එසේම සිවුරු එකක්බව හා බොහෝ බවද ආසන්නදූරභාවයද දැන එම මහණහුගේ සමීපයෙහි අත්පසෙහි එක් සිවුරක් වුවහොත් '**ඉමං චීවරං**' කියාද, අත්පසෙහි බොහෝ සිවුරු වුවහොත් '**ඉමානි චීවරානි**' කියාද අත්පසින් ඇත්හි එක් සිවුරක් වුවහොත් '**එතං චීවරං**' කියාද, අත්පසින් ඇත්හි බොහෝ සිවුරු වුවහොත් '**එතානි** චීවරානි' කියාද පස් මහදැහැමියන් අතුරෙහි තමාට රුචිවූ යම්කිසි එක්තරා එකක්හුගේ නාමය ගෙණ, 'තිස්ස නම් මහණහුට විකපීම කරමි'යි හෝ 'තිස්සා නම් මෙහෙණට, ශික්ෂමාණාවට, තිස්ස නම් තෙරණහුට, තිස්සා නම් හෙරණියට විකපීම කරමි'යි හෝ කියයුතුය. මේ අන්‍යවූද හමුවෙහිවූ විකපීමය. මෙපමණකින් තබන්නට වටියි. පරිභොගාදීන් අතුරෙහි වනාහි එකෙකුදු නොවටියි. ඒ සිවුර ලත් මහණහු විසින් 'තිස්සස්ස භික්ඛුනො සන්තකං -පෙ- තිස්සාය සාමණෙරියා සන්තකං පරිභුඤ්ජ, කියා හෝ 'විස්සජ්ජේහි' කියා හෝ 'යථාපච්චයං කරොහි' කියා හෝ කියූ කල්හි බැහැර කෙළේ නම්වේ. එතැන් පටන් පරිභොගාදීහුද වටිත්.

පරම්මුඛා විකප්පනා තොමෝ කෙසේ වේද, යත්: එසේම සිවුරු පිළිබඳ එක බහුභාවය හා දූරාසන්නභාවයද දැන '**ඉමං චීවරං**'යි හෝ '**ඉමානි චීවරානි**'යි හෝ '**එතං චීවරං**'යි හෝ '**එතානි චීවරානි**'යි හෝ කියා, '**තුය්හං විකප්පනත්ථාය දම්මි**'යි කිය යුතුය. ඒ මහණහු විසින් 'තම දැඩි මිතුරුවූයේ හෝ දුටු මිතුරු වූයේ හෝ කවරෙක්දැ'යි විචාළයුතුය. ඉන්පසු අනිකා විසින් පෙර නයින්ම 'තිස්සො භික්ඛු'යි හෝ -පෙ- 'තිස්සා සාමණෙරී'යි හෝ කියයුතුය. නැවැත ඒ මහණහු විසින් 'මම තිස්ස මහණහුට දෙමි'යි හෝ -පෙ- තිස්සා හෙරණයටට දෙමි'යි හෝ කියයුතුය. මේ පරම්මුඛා විකප්පනාය. මෙ පමණකින් තබන්නට වටියි. පරිභොගාදීන් අතුරෙහි වනාහි එකෙකුදු නොවටියි. ඒ මහණහු විසින්

දෙවන සම්මුඛාවිකප්පනාවෙහි කියූ නයින්ම 'මේ නම්හුගේ සන්තකය පරිභොග කරව'යි හෝ ප්‍රත්‍යය පරිදි කරව'යි හෝ කියූ කල්හි පච්චුද්ධාරය නම්වේ. එතැන් පටන් පරිභොගාදීහුද වටිත්. මෙහි ද්විධ විකප්පනාවන්ගේ කිනම් වෙනස්බවෙක් වේද, යත්:- සම්මුඛාවිකප්පනාවෙහි තමන් විකපා අන්හුලවා පච්චුද්ධරණය කරවයි. පරම්මුඛා විකප්පනාවෙහි අන්හුලවාම විකපීම කරවා අනුහුලවාම පච්චුද්ධරණය කරවයි. මේ මෙහි වෙනස්බවය. ඉදින් යමක්හට විකපාද, හෙතෙමේ, මෙසේ විකපූ කල්හි අනතුරුවම මෙසේ පච්චුද්ධරණය කටයුතුය'යි විනයප්‍රඥප්තියෙහි දක්‍ෂනොවේද, පච්චුද්ධරණය කරන්නට නොදනීද, ඒ සිවුර ගෙණ අන්‍යව්‍යක්තකයකු වෙතට ගොස් නැවැත විකපා පච්චුද්ධරණය කරවිය යුතුය. මේ විකැපූ විකපීම නම් වටියි. '**විකප්පෙති**' යන මේ පදයෙහි මේ විනිශ්චයයි.

'අනුජානාමි භික්ඛවෙ තිචීවරං අධිට්ඨාතුං න විකප්පෙතුං' යනාදි වචනයෙන්ද 'ඉදං විකප්පෙති' තිචීවරාදීන්ටද සාධාරණව අවිශේෂයෙන් වදළ වචනය විරුද්ධ වූවක් මෙන් පෙනේ. විරුද්ධ වූවක් තථාගතවරයෝ නොමවදරත්. එහෙයින් මේ පදයෙහි අර්ථය මෙසේ දතයුතුය. තුන් සිවුර සඞඝාටි ආදීවූ අධිෂ්ඨාන වශයෙන් පරිහරණය කරන්නහුට ඉටන්නටම අනුදනිම්, විකපීමට නොඅනුදනිම්. වැසිසළුව වනාහි වැසිසාරමසින් මත්තෙහි විකපීමටම අනුදනිම්. ඉටන්නට නොඅනුදනිම්. මෙසේ ඇතිකල්හි යම් මහණෙක් තෙමේ තුන් සිවුරෙහි එක් සිවුරකින් වෙන්ව වසනු කැමැත්තේවේද, ඔහුගේ චීවරාධිෂ්ඨානය පච්චුද්ධරණය කොට වෙන්ව විසීමෙහි සැපය පිණිස විකපීමට අවකාශය දුන්නේවේ, දස දවසක් ඉක්මීමෙහිදීද අනාපත්තියයි දතයුතුය. මේ උපායයෙන් හැම තන්හි විකපීම පිළිබඳ අප්‍රතිෂෙධභාවය දතයුත්තේය.

'**විස්සජ්ජෙති**' අතික්කක්හට දෙයි. කෙසේ වනාහි දෙනලද්දේවේද, කෙසේ ගන්නාලද්දේ වේද, යත්: 'ඉදං තුය්හං දෙමි'යි හෝ 'දදමි'යි හෝ 'දජ්ජාමි'යි හෝ ඔණොජෙමි'යි හෝ 'ඉත්ථන්නාමස්ස දෙමි. -පෙ- නිස්සජාමි'යි හෝ කියාද, හමුවෙහිද නොහමුවෙහිද දෙනලද්දේමවේ. 'තට ගණුව'යි කියූ කල්හි 'මම ගණිමි'යි කියාද, මනාකොට දෙන ලද්දේත් මනාකොට ගන්නා ලද්දේත්වේ. 'තාසතු කරව, තා සතුවේවා, මාසතු කරන්නෙමි'යි කියාද, වරදවා දෙනලද්දේත් වැරදිලෙසින් ගන්නා ලද්දේත්වේ. දෙන තැනැත්තේ දෙන්නට නොම දනියි. අන්‍යයා ගන්නට නොදනියි. ඉදින් 'තාසතු කරව'යි කියූ කල්හි 'ස්වාමීනි' යහපති, මම ගණිමි'යි ගනීද මනාකොට ගන්නාලද්දේය. ඉදින් එකෙක් 'ගණුවැයි කියාද අන්‍යයා 'නොගණිමි'යි කියාද, නැවැත හෙතෙමේ 'මා විසින් දෙන ලද්දේය, තට ගණුව'යි කියාද, අන්‍යයාත් 'මට මෙයින් වැඩෙක්

නැතැ'යි කියාද ඉන්පසු පළමු තෙමේද 'මා විසින් දෙන ලදැ'යි දස දවස ඉක්මවාද, පශ්චිම තෙමේත් 'මා විසින් ප්‍රතික්ෂෙප කරනලද්දේයයි දසදවස ඉක්මවාද එකල්හි කවරක්හට ඇවැත් වේද, යත්ඃ කවරක්හටත් ඇවැත් නොවේ. යමක්හට රුස්නේද, ඔහු විසින් ඉටා පරිභොග කටයුතුය. යමෙක් අධිෂ්ඨානයෙහි විමති ඇතියේවේද, ඔහු විසින් කුමක් කටයුතුද, යත්ඃ විමති ඇතිබව සැලකොට ඉදින් නොඉටනලද්දේ වන්නේනම් 'මෙසේ මට කැප වේය'යි කියා කියූ නයින්ම නිසදිය යුතුය. මෙසේ දන්වා විනයකර්ම කරන්නහුට මුසාවාදය නොවේ. කිසිකෙනෙක් වනාහි එක් මහණක්හු විසින් විශ්වාසයෙන් ගෙණ නැවැත දෙනලද්දේ වටීයයි කියත්. එය නොයෙදේ. ඔහුගේ මෙය විනයකර්මයෙක් නොවේ. මෙපමණකින් එය අතික් වස්තුවක්ද නොවේ. '**නස්සති**' යනාදිය ප්‍රකට අර්ථ ඇත්තේමය. '**යො න දදෙය්‍ය ආපත්ති දුක්කටස්ස**' මෙහි මොහු විසින් මට දෙනලද්දේය, යන මේ සංඥව කරණකොට නොදෙන්නහුට දුක්කටය වේ. ඔහු සතුබව දැන ලෙසයෙන් අසිද ගන්නේ භාණ්ඩය අගය කරවා කරවිය යුත්තේය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය කඨිනසමුත්ථාන නම්. කායවාචායෙන් හෝ කාය වාචාචිත්තයෙන් හෝ සමුත්ථානයවේ. නොඉටීමෙන්ද නොවිකපීමෙන්ද ඇවැතට පැමිණීම වන බැවින් අක්‍රියාය. ව්‍යතික්‍රම සංඥවගේ අභාවයෙන්ද නොමිදේ. නොදන්නේද පැමිණේයයි සංඥවිමොක්ෂය නැත්තේය. අචිත්තකසමුත්ථානයි. ප්‍රඥප්තිවද්‍යයයි. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

ප්‍රථමකඨින ශික්ෂාපදවර්ණනාව නිමි.

—||—

'**තෙන සමයෙන බුද්ධො භගවා**' උද්දෙසිත ශික්ෂාපදයයි. එහි '**සන්තරුත්තරෙන**' යන්නෙහි '**අන්තර**' යනු අන්තරවාසකය කියනුලැබේ. '**උත්තරං**' යනු උත්තරාසඞ්ගය කියනුලැබේ. අන්තරවාසකය සමග උත්තරාසඞ්ගය සන්තරුත්තර නම්. ඒ සන්තරුත්තරයෙන්, අඳනයෙන් හා උතුරුසහසිවුරෙන් යන අර්ථයි. '**කණ්ණකිතා**'නීති යනු ඩහදියෙන් පැහැසූ අවකාශයන්හි හටගත් කලුසුදු මඩුලු '**අද්දසා ඛො ආයස්මා ආනන්දො සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො**ති' ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ දහවල් විවෙකය පිණිස ගඳකිළියට වැඩමකළ කල්හි ඒ අවකාශය ලැබ නොමනාව තැබූ දුවබඩු මැටිබඩු තැන්පත් කරමින්, නොහැමදිතැන් හමදිමින්, ගිලන් මහණුන් හා පිළිසඳර කරමින් ඒ භික්ෂූන්ගේ සෙනාසනස්ථානයට පැමිණියාහු දුටහ. 'අද්දසා ඛො ආයස්මා ආනන්දො සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො'යි එහෙයින් කියනලදී.

**'අවිප්පවාසසම්මුතිං දත්වා'** අවිප්‍රවාසය නිමිතිකොට සිටි සම්මුති තොමෝ අවිප්පවාසසම්මුති නම. අවිප්‍රවාසය පිණිස හෝ කටයුතු සම්මුති තොමෝ අවිප්පවාසසම්මුති නම. මෙහි ආනිසංසය කවරේද, යත්:- යම් සිවුරකින් වෙන්ව වසාද, ඒ සිවුර නිසඟි නොවේ. ඇවැතටද නොපැමිණේ. මේ ආනිසංසයයි. කොපමණකල් වෙන්ව විසිය යුතුද, යත්: මහාසුමමස්ථවිරයන් වහන්සේ 'යම්තාක් කල් රෝගය නොසන්සිඳී පවතීද ඒ තාක්කල්ය. රෝගය සන්සිඳී ගිය කල්හි නොලැසිව සිවුර තැබූ තැනට ආයුතුය'යි කීහ. මහාපදුම ස්ථවිරයන් වහන්සේ 'වහා යන්නහුගේ රෝගය නැවැත කිපෙන්නේය, එහෙයින් හිමින් ආයුතුය. යම් කලෙක පටන් ජනසමූහයක් හෝ සොයාද, 'යමි'යි ආභොගය හෝ කෙරේද, එතැන් පටන් වටියි. 'දැන් නොයන්නෙමි'යි මෙසේ ධුරනික්ෂෙපය කරන්නහු විසින් පච්චුද්ධරණය කටයුතුය. පච්චුද්ධරණය නොකෙරේනම් අතිරෙක චීවරස්ථානයෙහි සිටින්නේය'යි කීය. මොහුගේ රෝගය නැවැතත් කිපේ නම් කුමක් කටයුතුද, යත්:- එහිලා ඵුස්සදෙව ස්ථවිරයන්වහන්සේ 'ඒ රෝගයම නැවැත කිපේ නම්, ඒ සම්මුතියම වන්නීය. නැවැත සම්මුතිදානයෙක් නැත්තේය, නැවැත අනික් රෝගයෙක් කිපේද, නැවැත සම්මුතිය දියයුතුය'යි කීහ. උපතිස්ස ස්ථවිරයන්වහන්සේ 'ඒ රෝගය හෝ වේවා, අනික් රෝගයෙක් හෝ වේවා, නැවැත සම්මුතිදානයෙක් නැත්තේය'යි කීහ.

**'නිට්ඨිතචීවරස්මිං භික්ඛුනා'** මෙහි ප්‍රථම ශික්ෂාපදයෙහි මෙන් අර්ථය නොගෙණ 'නිට්ඨිතෙ චීවරස්මිං භික්ඛුනො'යි මෙසේ සම්බන්ධයාගේ වසයෙන් කරණවචනයාගේ අර්ථය දතයුතුය. කරණවසයෙන් මහණහු කරණ කොටගෙණ මෙය නම් කටයුතුය'යි අර්ථයෙක් නැත්තේය. සම්බන්ධවසයෙන් වනාහි මහණහුගේ සිවුර කොට නිමි කල්හිද කඨිනය උදුල කල්හිද මෙසේ සුත් පිළිබොධය ඇති මහණ තෙමේ එක් රැයකුදු තුන්සිවුරෙන් වෙන්ව වසන්නේ නම්යි මෙසේ අර්ථය යෙදෙන්නේය. එහි **'තිචීවරෙන'** ඉටූ තුන් සිවුරු අතුරෙහි යම්කිසි එකෙකින් වෙන්ව විසූයේද, තුන් සිවුරෙන් වෙන්ව විසූයේම වේ. වෙන්ව විසීම වැළකූ තුන් සිවුරට ඇතුළත්වූ එකෙකින් වෙන්ව විසූ බැවිනි. එහෙයින්ම මේ ශික්ෂාපදයෙහි පදභාජනයෙහි **'සඞ්ඝාටියා වා'** යනාදිය වදළසේක. **'විප්පවසෙය්‍ය'** වෙන්ව වසන්නේය. **'ගාමො එකූපචාරො'** යනාදිය අවිප්‍රවාසලක්ෂණ ව්‍යවස්ථාව පිණිස වදරන ලද්දේය. එයින් මත්තෙහි යථාක්‍රමයෙන් එම පසළොස් මාතෘකාපදයන් විස්තර කරන්නේ **'ගාමො එකූපචාරො නාම'** යනාදිය වදළාහුය.

එහි '**එකකුලස්ස ගාමො**' එක රජකුගේ හෝ එක් ග්‍රාමභොජකයකුගේ හෝ ගමය. '**පරික්ඛිත්තො**' යම් කිසි පවුරකින් හෝ වැටකින් හෝ දිය අගලකින් හෝ වටකරන ලද්දේය. '**පරික්ඛිත්තො**' මෙපමණකින් එක් කුලයක් ඇති ගමෙහි එක් උපචාරයක් ඇතිබව දක්වන ලදී '**අන්තො ගාමෙ වත්ථබ්බං**' මෙබඳු ගමෙහි සිවුර තබා ගම ඇතුළෙහි කැමැති තැනක අරුණ නංවන්නට වටියි. '**අපරික්ඛිත්තො**' මෙයින් ඒ ගමෙහිම නොයෙක් උපචාර ඇතිබව දක්වනලදී. මෙබඳු ගමෙහි යම් ගෙයක සිවුර තබනලද්දේද, එහිම විසිය යුතුය. '**හත්ථපාසා වා න විජහිතබ්බා**' නොහොත් අත්පසින් නොහැරිය යුතුය. දෙරියන් හමාරක් පමණ පෙදෙසින් මතුවෙහි නොහැරිය යුතුයයි කියනලද්දේවේ. දෙරියන් හමාරක් අභ්‍යන්තරයෙහි විසීම වටියි. ඒ ප්‍රමාණය ඉක්මවා සෑදිමත් භික්ෂුතෙමේ අහසෙහි අරුණ නංවාද නිසගියමවේ. මෙහිද '**යස්මිං ඝරෙ**' ගෙයි පිරිසිඳීම 'එක්කුලයක නිවෙසනය වේය' යන ආදිලක්ෂණයෙන් දතයුතුය. '**නානාකුලස්ස ගාමො**' නොයෙක් රජුන්ගේ හෝ නොයෙක් ග්‍රාම භොජකයන්ගේ හෝ වේසාලි කුසිනාරාදිය සමානවූ ගම. '**පරික්ඛිත්තො**' යන මෙයින් නොයෙක් කුල ඇති ගමෙහි එක් උපචාරයක් ඇතිබව දක්වනලදී. '**සභායෙ වා ද්වාරමූලෙ වා**' මෙහි '**සභායං**'යි කියයුත්තෙහි ලිඞ්ගවිපර්‍යාසයෙන් සභාශබ්දය කියනලදය. '**ද්වාරමූලෙ**' නුවරදෙර සමීපයෙහි, මේ කියනලද්දේවේ. මෙබඳු ගමක යම් ගෙයක සිවුර තබන ලද්දේද ඒ ගෙයි හෝ විසිය යුතුය. එහි ශබ්ද ගැටීමෙන් හෝ ජනසම්බාධයෙන් හෝ වසන්නට නොහැකියහු විසින් ශාලාවක හෝ නුවරදෙර සමීපයෙහි හෝ විසිය යුතුය. එහිදු වසන්නට නොහැකියහු විසින් යම්කිසි පහසු තැනෙක්හි වාසය කොට අරුණතුළ අවුත් ඒ සභාද්වාරමූල යන මොවුන්ගේම අත්පසින් හෝ නොහැරිය යුතුය. සිවුර තැබූ ගෙයි හෝ සිවුරෙහි අත්පසෙහි විසීම ගැණ කියයුත්තක්ම නැත්තේය. '**සභායං ගච්ඡන්තෙන හත්ථපාසෙ චීවරං නික්ඛිපිත්වා**' ගෙයි නොතබා ශාලාවෙහිම තබන්නෙමියි ශාලාවට යේද, ශාලාවට යන්නාවූ ඔහු විසින් '**හත්ථපාසෙ**' අත දිගුකොට මේ සිවුර තබව'යි මෙසේ තැබීමට පහසුවූ අත්පසට පැමිණි කිසි කඩයක සිවුර තබා පෙරනයින්ම ශාලාවක හෝ නුවරදෙර සමීපයෙහි හෝ විසිය යුතුය. නොහොත් අත්පසින් නොහැරිය යුතුය.

එහි මේ විනිශ්චයයි:- ඵුස්සදෙව ස්ථවිරයන් වහන්සේ වනාහි 'සිවුරෙහි අත්පසෙහි විසිය යුත්තෙක් නැත්තේය. යම් කිසි වීථිහත්ථ පාසයෙක්හි හෝ ද්වාරහත්ථපාසයෙක්හි හෝ විසීම වටීයයි කීහ. උපතිස්සස්ථවිරයන් වහන්සේ වනාහි 'නුවරෙහි බොහෝ ද්වාරයෝද

ශාලාවෝද වෙත්, එහෙයින් ඒ සැම තැන විසීම නොවටියි. යම් වීථියක සිවුර තබනලද්දේද, ඒ වීථියට හමුවූ තන්හි යම් ශාලාවක් ද්වාරයක් වේද, ඒ ශාලාවෙහිද ද්වාරයෙහිද අත්පසින් නොහැරිය යුතුය. මෙසේ ඇතිකල්හි සිවුරෙහි තොරතුරු දැන ගන්නට හැක්කේය'යි කීහ. ශාලාවට යන්නහු විසින් වෙළඳම් මඩුවෙක යෙදී සිටියකුගේ අතෙහි තබනලද්දේද හෙතෙමේ ඒ සිවුර වීථිය ඉක්මවා සිටි අන් ගෙයක තබාද, වීථිහත්ථපාසය තෙමේ ඇවැතින් නොරක්නේය. ගේ පිළිබඳ අත්පසෙහිම අරුණ නැංවිය යුතුය. ශාලාවෙක තබා ශාලාවෙහි හෝ ඒ ගෙට ඉදිරියෙහි තුවරදෙර සමීපයෙහි හෝ ඔවුන්ගේම අත්පසෙහි හෝ අරුණ නැංවිය යුතුය. '**අපරික්ඛිත්තො**' මෙයින් එගමෙහිම නොයෙක් උපචාර ඇතිබව දක්වනලදය. මේ උපායයෙන්ම හැමතන්හි එකූපචාරභාවය හා නානූපචාරභාවයද දතයුතුය. පෙළෙහි වනාහි '**ගාමො එකූපචාරො නාම**' යන මේ ආදියෙහි '**අජ්ඣොකාසො එකූපචාරො නාම**'යි මෙසේ අන්තයෙහිද එක්ම මාතෘකාපදයක් උදුරා පදභාජනය විස්තර කරනලද්දේය. එහෙයින් එම පදයාගේ අනුසාරයෙන් සියලුතන්හි පරික්ෂෙපාදිවශයෙන් එකූපචාරභාවයද නානූපචාරභාවයද දතයුතුය.

නිවෙසනාදීන් අතුරෙහි '**ඔවරක**' ගෘහයන්ගේ පර්‍යායවචනයි. '**හත්ථපාසා වා**' ගෘහයෙහි අත්පසින් හෝ '**ද්වාරමූලෙ වා**' සියල්ලන්ට සාධාරණවූ ගෙදෙර සමීපයෙහි. '**හත්ථපාසා වා**' ගැබෙහි හෝ ගෙදෙරසමීපයෙහි හෝ අත්පසින්. '**උදොසිතො**' ශාලා සමුද්‍රතීරාදියෙහි නගනලද යානාදි භාණ්ඩතබන ශාලාය. මෙතැන් පටන් නිවෙසනයෙහි කියූ නයින්ම විනිශ්චය දතයුතුය. '**අට්ටො**' සතුරු රජුන් වළකාලනු පිණිස ගඩොලින් කළ සනහිත්ති ඇති සතර පස් මහලින් යුත් ගෘහවිශේෂයෙකි. '**මාලො**' එක් කැණිමඬලින් සඞ්ග්‍රහ කළ සිවුරැස් පහයය. '**පාසාදෙ**' දිග්පහයය. '**හම්මියං**' ඉතා උස් නොවූ සඳලුතලයෙන් යුත් මුදුන් කැණිමඩුලු සාලාදියෙන් තොරවූ පහයය. '**සත්ථබභන්තරා**' මෙහි අභ්‍යන්තරය අටවිසිරියනෙක් වේ. ඉදින් ජනසමූහ තෙමේ යන්නේ ගමක් හෝ ගහක් හෝ යටපත් කොට සිටීද, ගමතුළට හෝ ගඟ තුළට පැමිණියහු සමග එකට බැදී එතෙර මෙතෙර පැතිර සිටියේවේද, සමූහ යන පරිහාරයම ලැබේ. නොහොත් ගමෙහි හෝ නදියෙහි හෝ ඇතුළත් වූයේ වේද, ඇතුළත්හි පිවිසියේද, ග්‍රාමපරිහාරයද නදීපරිහාරයද ලැබේ. ඉදින් විහාරසීමාව ඉක්මවා සිටීද, සීමාවතුළ සිවුර වේද, විහාරයට ගොස් විසිය යුතුය. ඉදින් සීමාව පිටත සිවුර වේනම්, ජනසමූහය වෙතම විසිය යුතුය. ඉදින් යන්නේ ගැළ බිඳුනු කල්හි හෝ ගොන්නට කල්හි හෝ අතර සිදීයේ නම් යම් කොටසක සිවුර වේද ඒ කොටසෙහි

විසිය යුතුය. එක් කුලයක් පිළිබද කෙතෙහි අත් පසනම් කෙත්දෙර පිළිබඳ අත්පසයි. යමකින් වටකිරීමක් නොලද කල්හි සිවුරෙහිම අත්පසවේ.

'**ධඤ්ඤකරණං**' මෙයින් කලවිට කියනුලැබේ. '**ආරාමො**' පුෂ්පාරාමය හෝ ඵලාරාමය හෝය. පුෂ්පාරාම ඵලාරාම යන දෙතැන්හිම කෙතෙහි කියනලද්ද සමානවූම විනිශ්චය දතයුතුය. විහාරයෙහි විනිශ්චය නිවෙසනයෙහි විනිශ්චය සමානවේ. රුක්මුලෙහි '**අනෙතා ඡායායං**' සෙවනින් පැහැසූ අවකාශය තුළම තුනීවූ අතු ඇති රුකක්හුගේ අව්වෙන් පැහැසූ අවකාශයෙහි තැබූයේ නිසගිමවේ. එහෙයින් එබඳුවූ ගස් අතු සෙවනෙහි හෝ කඳසෙවනෙහි හෝ තැබිය යුතුය. ඉදින් අත්තක හෝ වෙළෙපෙක්හි හෝ තබා දම්, මත්තෙහි අත් අතුසෙවණකින් පහසලද අවකාශයෙහිම තැබිය යුතුය. කුදු රුකක ඡායාව දුර යන්නී නම්, ඡායාව ගිය තැන තැබීම වටීමය. මෙහිදු අත්පස සිවුරෙහි අත්පසමය. '**අගාමකෙ අරඤ්ඤෙ**' යනු ගමක් නැති අරණ්‍ය නම් වින්ධ්‍යපවනාදි මහාවනයන්හි හෝ මුහුද මැද හෝ කෙවුළන්ට එදවස ගොස් එදවසම එන්නට නොහැකි මං ඇති දිවයින්හි ලැබේ. '**සමන්තා සත්තබ්භන්තරා**' මැද සිටියහුට සියලු දිසාවන්හි සත් අබතුර විනිවිද යෑමෙන් තුදුසක් වේ. මැද හුන්නේ පෙරදිග හෝ පැසුළුදිග හෝ කෙළවර තුබූ සිවුර ඇවැතින් රකින්නේය. ඉදින් අරුණ නගින කාලයෙහි කෙසගක් පමණ නමුදු පෙරදිගටයේද, පැසුළුදිග තුබූ සිවුර නිසගිවේ. පෙරදිග තුබූ සිවුරෙහිද මේ නයවේ. උපොසථ කාලයෙහි පිරිස් කෙළවර හුන් මහණහු පටන් සත්තබ්භන්තර සීමා තොමෝ ශුද්ධකට යුත්තීය. භික්ෂු සඞ්ඝ තෙමේ යම් පමණ වැඩේද සීමා තොමෝද එපමණ වැඩෙන්නීය.

'**අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස**' මෙහි ඉදින් ප්‍රදහනවීයඹීයෙහි යෙදුනු මහණ තෙමේ මුළුරැය ප්‍රදහනවීයඹීයෙහි යෙදීසිට අළුයම් කාලයෙහි නාන්නෙමියි තුන් සිවුරු ඉවුරෙහි තබා අත්පස මුද ගහට බසීද, මොහු නානකල්හිම අරුණ නැගේ නම් කුමක් කටයුතුද, යත්:- ඒ මහණතෙමේ ගොඩ නැගී සිවුර හඳීද, නිසගි සිවුර නොනිසද පරිභොග කිරීම නිමිතිකොට දුක්කටයට පැමිණේ. නැවැත නගනවූයේද මෙසේ ඇතිකල්හි දුක්කටයට පැමිණේද, යත්:- නොපැමිණේ. හෙතෙමේ අන් මහණකු දැක යම්තාක් විනයකම් නොකෙරේද, ඒතාක් ඒ චීවරපරිභොගය. නොසුදුසු බැවින් නට සිවුරුතන්හි සිටියේ වේ. නට සිවුරු ඇතියහුටද අකැපයෙක් නම් නැත්තේය. එහෙයින් එකක් හැඳ දෙකක් අතින් ගෙණ විහාරයට ගොස් පළමු කොට සහළසිවුර හා උතුරුසඟසිවුරද නිස දෙසා නැවැත උතුරුසඟසිවුර පොරොවා පසුව අඳනය දැයි මෙසේ නිසදෙසීම් වසයෙන් විනයකම් කටයුතුය. විහාරය

දූරයෙහි වේනම්, අතරමග මිනිස්සු හැසිරෙත්ද, එකක් හැඳ එකක් පොරෝවා එකක් උරහිස තබා යායුතුය. විහාරයෙහි සභාග මහණකු නොදකීද, භික්ෂාචාරයට ගියෝ වෙත්ද, සඟළසිවුර පිටතගමෙහි තබා අඳනය හා උතුරුසඟසිවුරෙන් යුක්තව ආසනසාලාවකට ගොස් විනයකම් කටයුතුය. පිටත ගමෙහි සොරබිය වේනම්, පොරෝවා ගෙණ යායුතුය. ආසනසාලාවෙහි සම්බාධ වේනම්, ජනයාගෙන් ගැවසී ගත්තීනම්, එකත් පසෙක සිවුර බැහැර කොට විනයකම් කරන්නට නොහැක්කේද, එක් මහණකු ගෙණ පිටතගමකට ගොස් විනයකම් කොට සිවුරු පරිභොග කටයුතුය.

ඉදින් භික්ෂූහු, ලදරු භික්ෂූන්ගේ අතට පාසිවුරු දී මග බැස යන්නාහු පැසුළුයම සැතපෙනු කැමැත්තාහුද තමතමන්ගේ සිවුරු අත්පසෙහි කොටම විසිය යුතුය. ඉදින් යන කල්හිම ලදරු භික්ෂූන් නොපැමිණිවිට අරුණ නැගේද, සිවුරු නිසගිවේ. ලදරු භික්ෂූන්ගේ ගමනෙහි උත්සාහ සහිත බැවින් නිස නොසන්සිදෙන්නේය. පෙරටුව යන ලදරු භික්ෂූන්ටද තෙරුන් නොපැමිණි කල්හි මෙම නයවේ. මග වැරද වනයෙහිදී ඔවුනොවුන් නොදක්නා කල්හිද මෙම නයවේ. ඉදින් ලදරු භික්ෂූහු 'ස්වාමීනි' අපි මොහොතක් නිද හිඳ අසුවල් අවකාශයෙහිදී ඔබවහන්සේලා කරා පැමිණෙන්නෙමුයි කියා අරුණ නැගීම දක්වා සයනය කෙරෙත්ද, එකල්හි සිවුරද නිසගිවේ. උත්සාහය ඇතිකල්හි ගමන නොසිදුවූ බැවින් නිසද සන්සිඳුනේවේ. ලදරු භික්ෂූන් යවා තෙරුන් නිදන කල්හිදු මෙම නයවේ. දෙමංහන්දියක් දැක තෙරහු 'මේ මගය, ලදරු භික්ෂූහු මේ මගය'යි කියා ඔවුනොවුන්ගේ වචන නොපිළිගෙණ ගියාහුද, අරුණනැගීම සමග සිවුරුද නිසගි වේ. නිසද සන්සිදෙන්නේය. ලදරු භික්ෂූහු මගින් ඉවත්ව අරුණය තුළම නවතින්නෙමුයි බෙහෙත් පිණිස ගමට වැද එත්ද, ඔවුන් නොපැමිණි කල්හිම අරුණ නගීද, සිවුරු වනාහි නිසගිවේ. නිස වනාහි නොසන්සිදෙන්නේය. ඉදින් ධෛතුභය කරණකොට ගෙණ හෝ සූනබභය කරණකොට ගෙණ හෝ මොහොතක් සිට යන්නෙමුයි සිට හෝ හිඳ හෝ යෙත්ද, අතරමගදී අරුණ නැගිකල්හි සිවුරුද නිසගිවේ. නිසද සන්සිදෙන්නේය. අරුණතුළදීම එන්නෙමුයි ගමත් ගාමූපචාරයත් හැර සම්මත කළ අවිප්පවාසසීමාව තුළ ගමකට පිවිසියවුන්ට අතරමගදී අරුණ නගීද, සිවුරු නොමනිසගිවේ. නිසද නොසන්සිදෙන්නේය. අරුණ නගීවා හෝ නොනගීවා හෝ ඒතාක් හිඳිත්ද, අරුණ නැගි කල්හිද සිවුරු නිසගි නොවේ. නිස වනාහි සන්සිදෙන්නේය. යම් කෙනෙක් අරුණතුළම එන්නෙමු'යි සමීපවිහාරයකට ධර්මශ්‍රවණය පිණිස උත්සාහ සහිතව යෙත්ද, අතරමගදීම ඔවුන්ට අරුණ නගීද සිවුරු නිසගිවේ.

නිසවනාහි උත්සාහවත් බැවින් නොසන්සිඳෙන්නේය. ධර්මගෞරවය කරණකොට කෙළවර දක්වා අසාම යන්නෙමු'යි හිඳිත්ද, අරුණ නැගීම සමග සිවුරුද නිසගිවේ. උත්සාහ රහිත බැවින් නිසද සන්සිඳෙන්නේය. සිවුරු දෝනා පිණිස ලදරු මහණකු ගමකට යවන්නාවූ තෙරහු විසින් තමාගේ සිවුර පසුදුරා හෝ දිය යුතුය. ලදරු මහණහුගේ සිවුර පසුදුරවා හෝ තැබිය යුතුය. ඉදින් නොසිහියෙන් යේද, තමාගේ සිවුර පසුදුරා ලදරු මහණහුගේ සිවුර විශ්වාසයෙන් ගෙණ තැබිය යුතුය. ස්ථවිර තෙමේ සිහි නොකෙරේනම්, ලදරු මහණතෙමේම සිහි කෙරේනම් ලදරු මහණහු. විසින් තමාගේ සිවුර පසුදුරා තෙරුන්ගේ සිවුර විශ්වාසයෙන් ගෙණ ගොස් 'ස්වාමීනි' ඔබවහන්සේගේ සිවුර ඉටා පරිභොග කළ මැනැවැ'යි කියයුතුය. තමාගේ සිවුරද ඉටිය යුතුය. මෙසේ එකක්හුගේ සිහියෙන්ද ආපත්ති මොක්ෂයවේ. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීන් අතුරෙහි ප්‍රථම කඨින ශික්ෂාපදයෙහි නොඉටීමද නොවිකපීමද අක්‍රියාය. මේ ශික්ෂාපදයෙහි පච්චුද්ධරණය අක්‍රියාය. මෙපමණක්ම වෙනස වේ. සෙස්ස හැම තන්හි කියනලද නයමය.

උද්දෙසිත ශික්ෂාපදවර්ණනාව නිමි.

—||—

**තෙන සමයෙන** තෘතීය කඨින ශික්ෂාපදයයි. එහි '**උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජති**' යනු රැලි නැසුනු කල්හි මේ වස්ත්‍රය මහත් වන්නේය'යි සිතන්නේ දිය ඉස පයින් පාගා අතින් ඇද ඔසොවා පිටෙහි ගටාද, එය අව්වෙහි වියලුනේ පළමු පමණම වේද, හෙතෙමේ නැවතත් එසේ කෙරේද, එහෙයින් 'උස්සාපෙත්වා පුනප්පුනං විමජ්ජති'යි වදළසේක. මෙසේ වෙහෙසන ඔහු දැක භාග්‍යවතුන් වහන්සේ ගඳකිළියෙහි හුන්සේක් නික්ම සෙනාසනචාරිකාවෙහි ඇවිදින්නකු මෙන් එහි වැඩියසේක. 'අද්දසා ඛො භගවා' යනාදිය එහෙයින් කියනලදී. '**එකාදසමාසෙ**' එක් ඉල්මස හැර සෙසු එකොළොස් මාසයෙහි '**සත්තමාසෙ**' ඉල්මසද හෙමන්තයෙහි සිවුමසදැයි යන පස්මස හැර සෙසු සත්මසෙහි '**කාලෙපි ආදිස්ස දින්නං**' සඞ්ඝයාට හෝ මේ අකාලචීවරයයි උදෙසා දෙනලද්දකි. එක් පුද්ගලයක්හට හෝ 'මේ තට දෙමි'යි දෙනලද්දකි. '**සඞ්ඝතො වා**' තමාට පැමිණි කොටස් වසයෙන් සඞ්ඝයා කෙරෙන් හෝ උපදින්නේය. '**ගණතො වා**' 'මේ වස්ත්‍රය සූත්‍රාන්තිකගණයට දෙමු, මේ වස්ත්‍රය ආභිධර්මික ගණයටය'යි මෙසේ ගණයට දෙත්ද, තමාට පැමිණි කොටස් වසයෙන් ඒ ගණයාගෙන් හෝ උපදින්නේය. '**නො වස්ස පාරිපූරී**' පරිපූර්ණ නොවන්නේ නම්, යම් පමණකින් කරනුලබන්නේ අධිෂ්ඨාන චීවරයට පොහොනේද, ඒ සිවුර

එපමණ නොවන්නේ නම්, අඩු වන්නේ නම් යන අර්ථයි. **'පච්චාසා හොති සඞ්ඝතො වා'** යනාදි තන්හි 'අසුවල් දවසෙහි සඞ්ඝතෙමේ සිවුරු ලබන්නේය, ගණ තෙමේ සිවුරු ලබන්නේය, එයින් මට සිවුරක් ලැබෙන්නේය'යි මෙසේ සඞ්ඝයා කෙරෙන් හෝ ගණයා කෙරෙන් ප්‍රත්‍යාශාවක්වේද, 'මට සිවුරු පිණිස නෑයන් විසින් එවන ලද්දේය, මිතුරන් විසින් එවනලද්දේය, ඔවුහු ආවාහු සිවුරු දෙන්නාහ'යි මෙසේ නෑයන් කෙරෙන් හෝ මිතුරන් කෙරෙන් හෝ ප්‍රත්‍යාශාවක් වේ. **'පංසුකුලං වා'** මෙහි පංසුකුලයක් හෝ ලබමි'යි මෙසේ ප්‍රත්‍යශාවක් වේය'යි යෙදිය යුතුය. **'අත්තනො වා ධනෙන'** තමන්ගේ කපුනූල් ආදි ධනයෙන් අසුවල් දවසෙහි වනාහි ලබමි'යි මෙසේ හෝ ප්‍රත්‍යාශාව වේය යන අර්ථයි.

**'තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය'** මසකට වැඩියෙන් තබන්නේ නම් නිසගිපචිතිය යන අර්ථයි. මෙසේ වනාහි 'තතො උත්තරිං'යිද, 'ඉමස්ස මාසපරමතො උත්තරිං'ද පදභාජනය නොකියා යම්හෙයකින් අතර උපදින ප්‍රත්‍යාශාචීවරයෙහි මූලචීවරය උපන්දින පටන් දිනය යම්තාක්ද ඒතාක් උපන් ප්‍රත්‍යාශාචීවරය මාසපරම මූලචීවරය කොට තම ඝතික කෙරේද, ඉන් මත්තෙහි මූලචීවරගතික කෙරේද, එහෙයින් ඒ විශෙෂය දක්වන්නට **'තදහුප්පන්නෙ මූලචීවරෙ'** යනාදි නයින් පදභාජනය වදරනලදී. එය ප්‍රකට අර්ථ ඇත්තේමය. **'විසභාගෙ උප්පන්නෙ මූලචීවරෙ'** ඉදින් මූලචීවරය සියුම්වේද, ප්‍රත්‍යාශාචීවරය දළවේද, එක්කොට මසන්නට නොහැකිවේද, රාත්‍රීහුද ඉතිරි වෙත්ද, ඒ තාක් මාසය නොපිරේද, නොකැමැත්තෙන් නිග්‍රහවශයෙන් සිවුර නොකරවිය යුතුය. අන්‍යවූ ප්‍රත්‍යාශාචීවරයක් ලැබම නියම කාලයතුළම කරවිය යුතුය. දළවූ ප්‍රත්‍යාශාචීවරය පරිෂ්කාචොලය කොට ඉටිය යුතුයි. නැවැත මූලචීවරය දළවේද, ප්‍රත්‍යාශාචීවරය සියුම්වේද, මූලචීවරය පරිෂ්කාරචොලය කොට ඉටා ප්‍රත්‍යාශාචීවරයම මූලචීවරය කොට තැබිය යුතුය. ඒ ප්‍රත්‍යාශාචීවරය නැවැත මසක් පරිහාරය ලබයි. මේ උපායයෙන් යම්තාක් කල් කැමැත්තේද, ඒතාක් කල් ඔවුනොවුන් මූලචීවරය කොට තබන්නට සුදුසුය. සෙස්ස ප්‍රකටමය. සමුත්ථානාදීහු ප්‍රථම කඨින ශික්ෂාපදය සමානම වෙත්.

තෘතීය කඨින ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

**'තෙන සමයෙන'** පුරාණචීවරශික්ෂාපදයයි. එහි **'යාව සත්තමා පිතාමහයුගා'** පියහුගේ පියතෙමේ පිතාමහ නම. මුත්තනුය. මුත්තනුගේ

යුගය පිතාමහයුග නම. යුග නම් ආයුපමණයි. මේ වචනමාත්‍රයෙක් මය. අත්‍ථවශයෙන් වනාහි මුත්තාම පිතාමහයුග නම්වේ. ඉන්මතු සියලු පූර්වපුරුෂයෝ මුත්තා ගැණීමෙන්ම ගන්නා ලදහ. මෙසේ යම්තාක් සත්වන පුරුෂතෙමේ වේද ඒතාක් යම් ස්ත්‍රියක් තොමෝ මවුපසින් පියපසින් සමබන්‍ධයක් නැත්තීද, ඕ තොමෝ 'යාව සත්තමා පිතාමහයුගා අසමබන්‍ධා'යි කියනු ලැබේ. මෙද දෙශනා මුඛයෙක්ම වේ. **'මාතිතො වා පිතිතො වා'**යි කියූ බැවින් මුත්තාගේ ආයුපමණද, පියාගේ මවු වූ මුත්තනියගේ ආයුපමණද, මවුගේ පියවූ මුත්තාගේ ආයුපමණද, මවුගේ මවු වූ මුත්තනියගේ ආයුපමණද, ඔවුන්ගේ සහොදර සහොදරී බෑනා, දූපුත්, මුණුබුරු මුනුබිරී ආදීහුද යන සියලු දෙන මෙහි සඞ්ග්‍රහ කරනලද්දාහුමයයි දතයුතුය.

එහි මේ විස්තරනයය:- පියතෙමේ, පියාගේ පියතෙමේ, ඔහුගේ පියතෙමේ, ඔහුගේද පියතෙමේයි මෙසේ සත්වන යුගය දක්වා පියතෙමේ, පියාගේ මවුතොමෝ, ඇයගේ පියතෙමේ, මවුතොමෝ, සහෝදර තෙමේ, සහෝදරී තොමෝ, පුත්‍රයෝ තුමූ දුහිතෘහු තුමූ දැයි මෙසේද උඩද යටද යන සත්වන යුගය දක්වා පිය තෙමේ, පියාගේ සහෝදර තෙමේ, පියාගේ සහෝදරී තොමෝ, පියාගේ පුත්‍රයෝ තුමූ, පියාගේ දුහිතෘහු තුමූද යන මොවුන් හා ඔවුන්ගේ පුත්‍ර දුහිතෘ පරම්පරාදැයි මෙසේද සත්වන යුගය දක්වා, මවුතොමෝ, මවුගේ සහෝදර තෙමේ, මවුගේ සහෝදරී තොමෝ, මවුගේ පුත්‍රයෝ තුමූ, මවුගේ දුහිතෘහු තුමූ, ඔවුන්ගේද පුත්‍ර දුහිතෘ පරම්පරාදැයි මෙසේද සත්වන යුගය දක්වා, මාතෘසමබන්‍ධයෙන් සමබන්‍ධයක් නැත්තාවූ පිතෘසමබන්‍ධයෙන් සම්බන්‍ධයක් නැත්තාවූ මෝ තොමෝ අඤ්ඤාතිකා නම.

**'උභතො සඞ්ඝෙ'** භික්ෂුණී සඞ්ඝයා සමීපයෙහි. ඤප්තිචතුත්‍ථවූද භික්ෂුසඞ්ඝයා සමීපයෙහි ඤප්තිචතුත්‍ථවූද අෂ්ටවාචික විනය කර්මයෙන් උපසපන් මෙහෙණ තොමෝය. **'සකිං නිවත්‍ථම්පි සකිං පාරුතම්පි'** පඬු පොවා කප් බින්දු කොට එක්වරක් නමුදු හඳින ලද්දක් හෝ පොරෝනා ලද්දක් හෝ යටත් පිරිසයින් පිරිබෝහිසින් දසරුවෙහි හෝ හිසමතුයෙහි හෝ කොට මග ගියේ වේද, හිස මතුයෙහි කොට හොත්තේවේද, මෙද පුරාණ චීවරයමවේ. පසතුරණට යට කොට හොවීද, අතින් හෝ ඔසොවා අහස්වියනක් කොට හිසින් නොපහසමින් යේද, මෙය පරිභොගයෙක් නම් නොවේයයි කුරුන්‍දියෙහි කියනලදි.

**'ධොතං තිස්සගගියං'** මෙහි මෙසේ ඇණවූ මෙහෙණක් තොමෝ දෝනා පිණිස උදුන සඳද, දර එක් කෙරේද, ගිනි දල්වාද, දිය ගෙණ

ඒද, යම්තාක් ඒ සිවුර ධොවනය කොට ඔසොවාද, ඒතාක් මෙහෙණගේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා මහණහුට දුක්කටය වේ. ධොවනය කොට එසවූ ඇසිල්ලෙහි නිසගි වේ. ඉදින් නොමනාකොට දෝනාලදැයි. හගිමින් නැවැත පිසයි හෝ සෝදයි හේ යම්තාක් නිමාවට යේද, ඒතාක් ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. රඳන් කිරීමෙහිද තැළීමෙහිද මේ නයවේ. රඳන් දෙණෙහි හෙවත් පඩුඔරුවෙහි පඩු වක් කර යම්තාක් සිවුර වරක් පඩු පොවාද එයට පෙර යම් කිසිවක් පඩු පෙවීම පිණිස කෙරේද, පසුව හෝ නැවැත පඩු පොවාද, සියලු තැන්හි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා මහණහුට දුක්කටයවේ. තැළීමෙහිද ප්‍රයොගය තෙමේ මෙසේ දතයුතුය.

'**අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී පුරාණචීවරං ධොවාපෙති**' 'මේ සිවුර ධොවනය කරව'යි නොකියාද, එහෙත් දේනා පිණිස කාය විකාරයක් කොට අතින් හෝ අතට දේද, පා මුල්හි හෝ තබාද මත්තෙහි දමාද, ශික්ෂමාණ සාමණේර සාමණේරී උපාසක තීර්ථිකාදීන්ගේ හෝ අත යවාද, ගංතොට ධොවනය කරන්නියගේ දෙළොස්රියනක් තුළ උපචාරයෙහි හෝ දමාද, දෙළොස් රියනක් තුළ අවකාශයෙහි හෝ සිට ධොවනය කරවනලද්දේනම් ධොවනය කරවනලද්දේමවේ. ඉදින් දෙළොස්රියන් උපචාරය මුදු මැතින් තබාද, ඕතොමෝද ධොවනය කොට ගෙණ එන්නීද ඇවැත් නොවේ. ශික්ෂමාණවකගේ හෝ සාමණෙරියකගේ හෝ උපාසිකාවකගේ හෝ අතට දෝනා පිණිස දේද, ඕ තොමෝ උපසපන් වී ධොවනය කෙරේනම් ඇවැත්වේමය. උපාසකයකුගේ අතට දේද, ඔහුද ලිඞ්ගපරිවර්තනය වූකල්හි මෙහෙණන් අතුරෙහි පැවිදිව උපසපන්ව ධොවනය කෙරේනම් ඇවැත්මය. සාමණේරයකුගේ භික්ෂූනමක්හුගේ හෝ අතට දුන් කල්හිද ලිඞ්ගපරිවර්තනයෙහිදී මේ නයමවේ.

'**ධොවාපෙති රජාපෙති**' යනාදි තන්හි පළමුකොට නිමවූ එක් වස්තුවකින් නිසගියවේ. දෙවන වස්තුවෙන් දුක්කටයවේ. තුනම කරවන මහනිසගියවේ. සෙසු දෙකින් දුක්කට දෙකක්වේ. යම්හෙයකින් මේ ධොවනාදිය පිළිවෙළින් හෝ උපිළිවෙළින් හෝ කරවන්නහුට මිදීමෙක් නැත්තේද, එහෙයින් මෙහි ත්‍රිවතුෂ්කයෝ කියනලදහ. 'මේ සිවුර පඩු පොවා සෝද ගෙණෙව'යි කීකල්හි ඒ මෙහෙණ තොමෝ පළමු කොට සෝද පසුව පඩු පොවාද, නිසගිය හා දුක්කටයෙක්ම වේ. මෙසේ සියලු විපරීතවචනයන්හි නය දතයුතුය. ඉදින් 'සොද ගෙණෙව'යි කියනලද්දී සෝද්ද පඩු පොවාද සේදවීම නිමිති කොටම ඇවැත්වේ. පඩුපෙවීමෙහි ඇවැත් නොවේ. සියලු තැන්හි උක්තාධික කරණයෙහි මෙසේය. 'නොකියනලද්දී සෝදයි' යන මේ ලක්ෂණයෙන් අනාපත්තිය දතයුත්තීය.

මේ සිවුරෙහි යමක් කටයුත්තේද, ඒ සියල්ල තට භාරය'යි කියන්නේ එක් වචනයෙන් බොහෝ ඇවැතුන්ට පැමිණේ.

**'අඤ්ඤාතිකාය වෙමතිකො අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී'** මේ පදයෝද කියූ ත්‍රිචතුෂ්කයන්ගේ වශයෙන්ම විස්තර විසින් දතයුත්තාහ. **'එකතො උපසම්පන්නාය'**යි මෙහෙණින් වෙත උපසපන් මෙහෙණින් ලවා ධොවනය කරවන්නහුට දුක්කටය වේ. මහණුන් වෙත උපසපන් මෙහෙණක් ලවා ධොවනය කරවන්නහුට (යථා වත්ථුක) නිසගියම වේ. මහණුන් වෙත උපසපන් වූවෝ නම් පන්සියයක් ශාක්‍ය භික්ෂුණීහුය. **'අවුත්තා ධොවති'** උද්දෙසය පිණිස හෝ අවවාදය පිණිස හෝ ආ මෙහෙණක් තොමෝ කිලිටි සිවුර දැක තැබූ තැනින් ගෙණ 'ආයසීය' දෙනු මැනැව, සෝදන්නෙමි'යි ගෙන්වා සොදද, පඬු පොවාද, තළාද, මෝතොමෝ නොකියනලදුව ධොවනය කරයි නම්වේ. 'මේ සිවුර සෝද ලව'යි ලදරු මහණක්හට හෝ හෙරණක්හට හෝ අණවන මහණක්හුගේ වචනය අසා, යම් මෙහෙණක් තොමෝ 'ආයසීය' මම සෝදන්නෙමි'යි ගෙණ සෝදද, තාවකාලිකව හෝ ගෙණ සෝද පඬු පොවා දේද, මෝ තොමෝද, නොකියනලදුව ධොවනය කරයි නම්වේ. **'අඤ්ඤං පරික්ඛාරං'** වහන් පසුම්බි පාත්‍රපසුම්බි අස්වැටි කාබාන් ඇඳපුටු බිසි ආදීවූ යම් කිසිවක් සෝදවාද ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවෙද්‍යය. කාය කර්මය. වාක්කර්මය. ත්‍රිචිත්තය. ත්‍රිවෙදනය.

පුරාණ චීවර ධොවාපන ශික්ෂාපදවර්ණනාව නිමි.

—||—

**'තෙන සමයෙන'** චීවර ප්‍රතිග්‍රහණ ශික්ෂාපදයයි. එහි **'පිණ්ඩපාත පටික්කන්තා'** පිණ්ඩපාතයෙන් වැළකුනී. **'යෙන අන්ධවනං තෙනුපසඞ්කමි'** ගණඹහීයන ශික්ෂාපදය නොපැණවූ, කල්හි අන්ධවනය යම් තැනෙක්හිද උපුල්වන් මෙහෙණ එහි එළැඹියාය. **'කතකම්මා'** කළ සොරකම් ඇත්තාහු. ගේහන්දි බිඳීම් ආදියෙන් මෙරමා සතු භාණ්ඩ පැහැර ගත්තාහු'යි කියනලද්දේවේ. **'චොරගාමණිකො'** සොරදෙටු තෙමේ. හෙතෙමේ, පෙර උපුල්වන් ස්ථවිරාව හඳුනන්නේය. එහෙයින් සොරුන්ගේ පෙරටුව යන්නේ ඒ ස්ථවිරාව දැක 'මෙහෙන් නොයවු, සියල්ලෝ මෙහෙන් එවු'යි ඔවුන් ගෙන අන්මගකින් ගියේය. **'සමාධිම්හා වුට්ඨහිත්වා'** ස්ථවිර තොමෝ පිරිසිඳි වේලාවෙහිම සමාධියෙන් නැගී සිටියාය. ඒ සොරදෙටු තෙමේද එකෙණෙහිම මෙසේ කීයේය. එහෙයින් ඕ තොමෝ ඇසූය. අසාද 'දැන්

මෙහි මාහැර අන් මහණෙක් හෝ බමුණෙක් හෝ නැත්තේය'යි සොරදෙටු ගසක එල්ලා තැබූ ඒ පිඬු මස්මුළ ගත්තීය. එහෙයින් '**අථ ඛො උප්පලවණ්ණා භික්ඛුනී**' යනු කියන ලදි.

'**ඔහීයාතකො**' එකලාවූයේ. ඉතිරිවූයේ. විහාරයෙහි පිළිදැගුම් වාරයට පැමිණ එකලාවමම විහාරයෙහි සිටියේය යන අර්ථයි. '**සචෙ මෙ ත්වං අන්තරවාසකං දදෙය්‍යාසි**' යනු කුමක් හෙයින් කීයේද, යත්:- සියුම්වූ ඝනබද්ධවූ අඳනය දැක ලොභයෙන් කීයේය. තවද, ස්ථවිරාවගේ අඳනයෙහි කළ ඔහුගේ ලොභය මදවේ. ස්ථවිරාවගේ කෙසාදි පස් කොටසෙහි කල්‍යාණතා තොමෝ කෙළ පැමිණියාය. එයින් ඒ ස්ථවිරාවගේ සිරුරෙහි පිරිපුන්බව බලන්නෙමි'යි විසමලොභය උපදවා මෙසේ කීයේය. '**අන්තිමං**' පස් වැදෑරුම් සිවුරු අතුරෙහි සියල්ලට කෙළවර වූයේ අන්තිමය. අන්තිම නම් පශ්චිමය. අන්‍යලෙශයකිනුදු විකපා හෝ පසුදුරා හෝ තැබූ සිවුරක් නැත්තේය'යි මෙසේ අනුදන්නාලද පරිදි පස්වැදෑරුම් සිවුරු දැරීම් වසයෙන්ම උදයි තෙරුන් අඳනය ඉල්ලූ කල්හි දෙන්නට නොපිළිවනැයි කිවුය. ලොභයෙන් නොකිවුය. රහතුන්ට ලොභයෙක් නැත්තේය. '**නිප්පීළියමානා**' උපමා හා කරුණු දක්වා දැඩිකොට පෙළනු ලබන්නී. '**අන්තරවාසකං දත්වා අගමාසි**' තනවෙළුම හැඳ උදයි තෙරුන්ගේ මනදෙළ යම්සේ නොපිරේද, එසේ අත්තල පමණක්ම දක්වා ගියාය. කුමක් හෙයින් පෙරළා දෙනු ලබන සිවුර නොපිළිගන්නා කල්හි අවමන් කළාහුද, යත්:- ඉදින් අප කෙරෙහි ආයර්‍යයන්ගේ මෙපමණවූද, විශ්වාසයෙක් නැත්තේ නම් අපි කෙසේ යැපෙන්නෙමුදැ'යි පිළිසරණ නැති බැවින් පෙළෙන බැවිනි.

'**අනුජානාමි භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං**' සම සැදැහැති සම සිල් ඇති සමදිටු ඇති මේ පස්මහ දැහැමියන්ගේ පෙරළා දෙනුලබන සිවුර ගන්නට අනුදනිමි, යන අර්ථයි. '**පයොගෙ දුක්කටං**' ගැණීම පිණිස අත්දිගු කිරීම් ආදිය නිමිති කොට දුක්කටය වේ. '**පටිලාභෙන**' පිළිගැණීමෙන් එහිද අතින් අතට හෝ දේවා, පාමුල්හි හෝ තබාවා, මත්තෙහි හෝ දමාවා, ඉදින් ඉවසා නම් ගන්නා ලද්දේම වේ. ශික්ෂමාණ සාමණෙරී උපාස්ථාදීන්ගේ අත යැවූ සිවුර පිළිගණී නම්, ඇවැත් නොවේ. සිවූ පිරිස්හු සිවුරුද නොයෙක් පැහැති පිළීද ගෙණවුත් දහම් දෙසන්නහුගේ පාමුල්හි තබත්ද, දෙළොස්රියන් තුළ උපචාරයෙහි හෝ සිට උපචාරය හෝ මුදු දමත්ද, එහි යමක් මෙහෙණක් සතුද, එය පිරුළක් නැතුව ගන්නහුට ඇවැත්මවේ. තවද රාත්‍රිකාලයෙහි දමනලද්දහු වෙත්ද, 'මේ සිවුර මෙහෙණගේය. මේ සිවුර අන්හුගේයයි දැන ගන්නට නොහැක්කේය. එහි පිරුළෙක් නැතැයි මහා පච්චරියෙහි හා කුරුන්දියෙහිද කියනලදී.

එය අචිත්තකභාවය හා සමනොවේ. ඉදින් මෙහෙණක් නොමෝ වස්සාවාසිකයක් දේද, එය පිරුළුවක්ම කටයුතුය. පංසුකූල වසයෙන් ගන්නාහයි කසළගොඩ ආදියෙහි තබාද, පංසුකූලවසයෙන් ඉටා ගන්නට වටිය.

**'අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී'** නොනෑ මෙහෙණ කෙරෙහි නොනෑ සත් ඇතියේද පාචිත්තිය තුනක්වේ. **'එකතො උපසම්පන්නාය'** මෙහෙණන් වෙත උපසපත් වූ මෙහෙණකගේ අතින් ගන්නහුට දුක්කටය වේ. මහණුන් වෙත උපසපන්වූ මෙහෙණකගේ අතින් ගන්නහුට පාචිත්තියම වේ. **'පරිත්තෙන වා විපුලං'** මද ඇගීම් ඇති සිවුරකින් හෝ වහන් පසුම්බි පාපසුම්බි අස්වැටි කාබාන් ආදියකින් හෝ මාහැඟි සිවුරක් පිළිගණී නම් ඇවැත් නොවේ. මහාපච්චරියෙහි වනාහි යටත් පිරිසෙයින් අරළු කඩකිනැයිද කියනලද්දේවේ. **'විපුලෙන වා පරිත්තං'** මේ කීම කියනලද්දට විපර්‍ය්‍යාසවශයෙන් දතයුතුය. **'අඤ්ඤං පරික්ඛාරං'** පා පසුම්බි ආදීවූ යම්කිසි විකපීමට පොහොනා පැසුළු සිවුර පමණවූ පටපෙරහණක්ද නොවටියි. යම් සිවුරක් ඉටීමට නොපොහොනේද, විකපීමට නොපොහොනේද, ඒ සියල්ල වටියි. ඇඳ පමණවූ ගුදිළුරයක් වේද, වටියි. පාපසුම්බි ආදියෙහි කවර වාදයෙක්ද, සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාක්‍රියය. නොසංඥවිමොක්‍ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

චීවරප්‍රතිග්‍රහණශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

**'තෙන සමයෙන'** යනු අඥාතක විඥප්තිශික්ෂාපදයයි. එහි **'උපනන්දො සක්‍ය පුත්තො'**යි අසූ දහසක් පමණවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ මහණුන් අතුරෙහි ලාමකවූ ලොල් ස්වභාව ඇතියේය. **'පට්ඨො'** දක්‍ෂයෙක. සමර්ථයෙක. ප්‍රතිබලයෙක. ස්වරසම්පන්නයෙක. කණට මිහිරිවූ බසින් යුක්තයෙක. **'කිස්මිං විය'** කිං විය, යන අර්ථයි. දුකක් මෙනැයි යන අදහසයි. කෙලෙසීමක් වූවාක් මෙනි. හිරි ඔතප් වසයෙන් කම්පනයක් මෙන් තද කම්පනයක් මෙන් වේය යන අර්ථයි. **'අද්ධානමග්ගං'** අද්ධාන සඞ්ඛ්‍යාතවූ දිග්මගට නුවරවීථිමාර්ගයට යන අර්ථයි. **'තෙ භික්ඛූ අච්ඡින්දිංසු'** සොරකම් කළහ. ඒ භික්ෂූන්ගේ පා සිවුරු පැහැර ගත්හ. යන අර්ථයි. **'අනුයුඤ්ජාහි'** භික්ෂුභාවය දැනගණු පිණිස විචාරව. **'අනුයුඤ්ජමානා'** පැවිදිබව උපසපන්බව පාසිවුරු ඉටීම යන මේ ආදිය විචාරණු ලබන්නාහු.

**'එතමත්ථං ආරොචෙසුං'** භික්ෂුභාවය දන්වා යම් අර්ථයෙක් තෙමේ **'සාකෙතා සාවත්ථිං අද්ධානමග්ගං පටිපන්නා'** යනාදිනයින් කියනලද්දේද මේ කරුණ සැලකළහ. **'අඤ්ඤාතකං ගහපතිං වා'** යනාදි තැන්හි පසුභාගයෙහි තෘණයෙන් හෝ පර්ණයෙන් හෝ වසායයි යමක් වදරන ලදද, ඒ ආදි කොට මෙසේ අනුපූර්වකථා තොමෝ දතයුත්තීය. ඉදින් ලදරු භික්ෂූහු සොරුන් දැක පාසිවුරුගෙණ පලාගියාහුද, සොරු තෙරුන්ගේ හඳනා පොරෝනා පමණක්ම ගෙණ යෙත්ද, තෙරුන් විසින් එපමණකින් සිවුර නොම විනවිය යුතුය. කොළ අතු නොබිඳිය යුතුය. එකල්හි ලදරු භික්ෂූහු සියලු බඩු හැරදමා පලා ගියාහුද, සොරු තෙරුන්ගේ හඳනා පොරෝනයද ඒ බඩුද පැහැර ගෙණයෙත්ද, ලදරු භික්ෂූන් අවුත් තමතමන්ගේ නිවාසන පාරුපණයෝ එපමණකින් තෙරුන්ට නොදිය යුත්තාහ. පැහැර නොගත් සිවුරු ඇත්තාහු තමතමන්ට ප්‍රයොජනය පිණිස කොළ අතු බිඳින්නට නොලබත්. පැහැර ගත් සිවුරු ඇත්තවුන්ගේ ප්‍රයොජනය පිණිස කොළ අතු බිඳින්නට ලබත්. පැහැර ගත් සිවුරු ඇත්තාහුම තමන්ටත් අන්හටත් ප්‍රයොජනය පිණිස කොළ අතු බිඳින්නට ලබත්. එහෙයින් තෙරුන් විසින් හෝ කොළඅතු බිඳ කෙඳිවලින් ගොතා ලදරු භික්ෂූන්ට දියයුතුය. ලදරු භික්ෂූන් විසින් හෝ තෙරුන්ට ප්‍රයොජනය පිණිස කොළඅතු බිඳ ගොතා ඔවුන්ගේ අතටදී හෝ නොදී හෝ තමන් හැඳ තමන්ගේ නිවාසන පාරුපණාදීහු තෙරුන්ට දිය යුත්තාහ. බීජගාම භූතගාම, විකොපනය නිමිතිකොට පාචිත්තිය නොමවේ. ඔවුන්ට තීර්ථකධ්වජ දැරීම නිමිතිකොට දුක්කටය නොවේ. අතරමග රඳතොටක් හෝ වේද, එබඳු අනාථවූ මිනිසුන් හෝ දකිත්ද සිවුරක් විනවිය යුත්තේය. ඒ භික්ෂූන්ට ඉල්ලීම ලද මනුෂ්‍යයෝ හෝ අන් කෙනෙක් හෝ කොළඅතු හැඳගත් භික්ෂූන් දැක උපන් උත්සාහ ඇත්තාහු යම්බඳු වස්ත්‍ර දෙත්ද, ඒ වස්ත්‍රයෝ දවලු සහිත හෝ වෙත්වා, දවලුරහිත හෝ වෙත්වා, නිල් ඈ නොයෙක් පැහැ ඇත්තාහු හෝ වෙත්වා, කැපවූ අකැපවූත් සියල්ල අච්ඡින්නචීවරස්ථානයෙහි සිටි බැවින් ඒ භික්ෂූන්ට හඳින්නටද පොරොවන්නටද වටියි. මෙය පරිවාරයෙහි,

'අකප්පකතං නපි රජනාය රත්තං
තෙන නිවත්ථො යෙන කාමං වජෙය්‍ය
න චස්ස හොති ආපත්ති
සො ච ධම්මො සුගතෙන දෙසිතො
පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා'

කප්බින්දු නොකරනලද, රඳනින් නොරඳනාලද සිවුර ඒ මහණහු විසින් හඳිනලදුව යම් දිසාවකට කැමැති සේ යන්නේනම් ඒ මහණහුට

ඇවැතෙක් නොවේයයි ඒ ධර්මය තෙමේ සුගත්හු විසින් දෙසනලද්දේය. මේ ප්‍රශ්නය දක්‍ෂයන් විසින් සිතිය යුතුය'යි කියනලද්දේය.

මේ ප්‍රශ්නය පැහැරගත් සිවුරු ඇති මහණුහු සඳහා කියනලදි. තවද තීර්ථකයන් සමග එක්වෙත්ද, ඒ තීර්ථකයෝද, ඒ මහණුන්ට කුසවැහැරිමුවාසිවුරු රුක්පතුරුමුවාසිවුරු ඵලකවැහැරිමුවාසිවුරු දෙත්ද ඒ සිවුරු ඔවුන්ගේ ලබ්ධිය නොගෙණ හැඳීම වටියි. හැඳද ලබ්ධිය නොගතයුතුය. දැන් '**යං ආවාසං පඨමං උපගච්ඡති සචෙ තත්ථ හොති සඞ්ඝස්ස විහාරචීවරං වා**' යනාදි තැන්හි විහාරචීවරය නම් මිතිස්සු ආවාසයක් කරවා සිවු පසයද අපම සතුය. පරිභොගයට යෙත්වායි තුන් සිවුරු පිළියෙල කොට තමන් විසින් කරවනලද ආවාසයෙහි තබත්. මෙය විහාරචීවරය නම.

'**උත්තරත්ථරණං**' ඇඳ මතුවෙහි අතුරන පසතුරුණ කියනුලැබේ. '**භූම්මත්ථරණං**' පිරියම් කළ බිම පැහැය රකිනු පිණිස පටපිළියෙන් කරනලද අතුරන වස්ත්‍රයයි. ඒ මතුවෙහි තල්පතින් හෝ වැහැරියෙන් මැඩිලි යොද වියූ තටුවක් එළා සක්මන් කෙරෙත්. '**භිසිච්ඡවි**' ඇඳ ගුදිරියෙහි හෝ පුටුගුදිරියෙහි හෝ උරිය යමකින් පුරවනලද්දීද, ගසාදමා ගන්නට වටියි. මෙසේ මේ විහාරචීවරාදීන් අතුරෙහි යමක් ඒ ආවාසයෙහි වේද, එය නොවිචාරාද ගෙණ පැහැර ගත් සිවුරු ඇති මහණුන්ට හඳින්නට හෝ පොරොවන්නට ලැබේය'යි දතයුතුය. හෙද ලැබ පොරොවන්නෙම්, නැවැත තබන්නෙම් යන අදහසිනි. මූලච්ඡේද්‍ය වශයෙන් නොවේ. ලැබද වනාහි නෑයන් කෙරෙන් හෝ උපස්ථායකයන් කෙරෙන් හෝ අන් තැනකින් හෝ යන කොතැනකින් හෝ පියවි ඇතියක්ම කටයුතුය. නොරට ගියහු විසින් එක් සඞ්ඝික ආවාසයෙක්හි සඞ්ඝිකපරිභොගයෙන් පරිභොග කරනු පිණිස තැබියයුතුය. ඉදින් ඔහුගේ පරිභොගයෙන්ම ඒ සිවුර දිරයි හෝ නසියි හෝ නම් ග්‍රීවා නොවේ. කියූ ආකාර ඇති ගිහිවස්ත්‍ර ආදිකොට ඇති ගුදිරිඋර කෙළවර කොට සිටි මොවුන්ගෙන් කිසිවක් නොලබාද, ඒ මහණුහු විසින් තෘණයෙන් හෝ පණීයෙන් හෝ වසාගෙණ ආයුතුය.

'**කෙහිචි වා අච්ඡින්නං**' මෙහි පැහැරගත් සිවුරු ඇති ආචාර්‍ය උපාධ්‍යායයෝ අන්හු අතින් 'ඇවැත්ති' සිවුරක් ගෙණ එව'යි ඉල්ලා හෝ විශ්වාසයෙන් හෝ යමක් ගණීත්ද එද සඞ්ග්‍රහවට යේයයි කියයුතුය. '**පරිභොගජිණ්ණං වා**' මෙහිද පැහැරගත්' සිවුරු ඇති ආචාර්‍යොපාධ්‍යායාදීන්ට තමන් විසින් තෘණපණීයෙන් වසා දුන් සිවුරුද සඞ්ග්‍රහවට යේයයි කියයුතුය. මෙසේ ඔවුහු අච්ඡින්නචීවරස්ථානයෙහි හා

නෂ්ටචීවරස්ථානයෙහි සිටියාහු වන්නාහ. එයින් ඔවුන්ට පිනවීම නිමිති කොටද අකැපසිවුරු පරිභොගය නිමිතිකොටද ඇවැත් නොවේ. ඒ අනාපත්ති තොමෝ සුදුසුවූවා වන්නීය. **'ඤාතකානං පවාරිතානං'** මෙහි මොවුන් සන්තකය දෙවුයි විත වන්නහුට ඉල්ලන්නහුට අනාපත්තියි මෙසේ අර්ථය දතයුතුය. නෑයන්ගෙන්ද පැවරුවන්ගෙන්ද ඉල්ලන්නහුට ආපත්තියක්ද අනාපත්තියක්ද නොවේමය. **'අත්තනො ධනෙන'** මෙහිද තමන්ගේ කප්පිය භාණ්ඩයෙන් කැපවහරින් සිවුරක් විනවන්නහුට විකුණවා ගන්නහුට පෙරළවන්නහුට අනාපත්තියි මෙසේ අර්ථය දතයුතුය. **'පවාරිතානං'** මෙහිද සඞ්ඝයාගේ වසයෙන් පවරනලද්දවුන් විෂයෙහි හඳින්නට පොරාවන්නහුට සෑහෙන පමණක්ම වටියි. පුද්ගලයන් පිළිබඳ පවාරණයෙන් යමක් යමක් පවරාද ඒ ඒ දෙයම විනවිය යුතුය. යමෙක් සිවුපසයෙන් පවරා තෙමේම සලකාබලා කලින්කල සිවුරු දවස් පතා කැඳබත් ආදියදැයි මෙසේ යමකින් යමකින් ප්‍රයොජනයෙක් වේද, ඒ ඒ දෙය දේද, ඔහුට විනවන කිසක් නැත්තේය. යමෙක් වනාහි පවරා බාලභාවයෙන් හෝ සිහිමුළාවෙන් හෝ නොදේද, ඔහු විනවිය යුතුය. යමෙක් 'මාගේ ගෙය පවරාදෙමි'යි කියාද ඔහුගේ ගෙට ගොස් සුවසේ හිඳිය යුතුය. සැතපිය යුතුය. කිසිවක් නොගතයුතුය. යමෙක් වනාහි 'මාගේ ගෙයි යමක් ඇත්තේද, එය පවරාදෙමි'යි කියාද, එහි යමක් කැපවේද, එය පිනවිය යුතුය. ගෙයි හිඳින්නට හෝ නිදන්නට හෝ නොලබායයි කුරුන්දියෙහි කියනලද්දේය. **'අඤ්ඤස්සත්ථාය'**යි මෙහි තමන්ගේ නෑ පැවරුවන් අතින් හුදෙක් තමන් පිණිස ඉල්ලන්නහුට පමණක් ඇවැත් නොවන්නේ නොවේ. අතිකක්හු පිණිස විනවන්නහුටත් අනාපත්තියි යනු මේ එක් අර්ථයෙක්වේ. මේ වනාහි දෙවන අර්ථයයි. **'අඤ්ඤස්ස'** යම් කෙනෙක් අතිකක්හුගේ ඥාතකපාවාරිතයෝ වෙත්ද ඔවුහු ඔහුටම 'අඤ්ඤස්ස'යි ලැබූ ව්‍යවහාරය ඇති බුද්ධරක්ඛිතයා පිණිස හෝ ධම්මරක්ඛිතයා පිණිස හෝ විනවන්නහුට අනාපත්තිය වේය යනුයි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුට්ඨානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදයද ෂඩ්සමුට්ඨානිකය. ක්‍රියාය. නොසංඥවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

**'තෙන සමයෙන'** තතුත්තරිශික්ෂාපදයයි. එහි **'අභිහට්ඨුං'** අභියනු උපසර්ගයි. හැරගැණීමට යන අර්ථයි. ගන්නටැයි කියනලද්දේවේ.

**'පවාරෙය්‍ය'** යනු කැමැති කරවන්නේය. ඊප්සාව රුචිය උපදවන්නේය. කියන්නේය. නිමන්ත්‍රණය කරන්නේය, යන අර්ථයි. එළවා පවරන්නහු විසින් යම්සේ කියයුතුද, ඒ ආකාරය දක්වනු පිණිස **'යාවතකං ඉච්ඡසි තාවතකං ගණ්හාහි'**යි මෙසේ මේ පදභාජනය තෙමේ වදරන ලද්දේය. නොහොත් 'යථා නෙක්ඛම්මං දට්ඨුං ඛෙමතො' යන මෙහි දැක යන අර්ථය වේද, එසේ මෙහිදු 'අභිහට්ඨුං පවාරෙය්‍ය' එළවා පවරන්නේය යන අර්ථය වේ. එහි කයින් එළවීමය. වචනයෙන් එළවීමයයි එළවීම දෙවැදෑරුම් වේ. කයින් හෝ වස්ත්‍ර එළවා පාමුල්හි තබා 'යම්පමණ කැමැත්තෙහිද, එපමණ ගණුවයි කියමින් පවරන්නේය. වචනයෙන් හෝ අපගේ වස්ත්‍ර කොෂ්ඨාගාරය පිරීසිටියේය. යම්පමණ කැමැත්තෙහිද, එපමණ ගණුව'යි කියමින් පවරන්නේය. එදෙකම එක් කොට 'අභිහට්ඨුං පවාරෙය්‍ය'යි වදරනලදය.

**'සන්තරුත්තරපරමං'** අඳනය සහිතවූ උතුරුසඟ සිවුර පරමවූයේ ඉවසිය යුතු මේ සිවුරමැයි සන්තරුත්තරපරම නම. අඳනය සමග පොරෝනය උත්කෘෂ්ට පරිච්ඡේදයක් වූයේ මේ සිවුරමැයි කියන ලද්දේවේ. **'තතො චීවරං සාදිතබ්බං'** එළවූ සිවුරෙන් මෙපමණ සිවුරක් ගතයුතුය. මෙයින් වැඩියක් නොගතයුතුය යන අර්ථයි. යම් හෙයකින් අසිදගත් සියලු සිවුරු ඇති තෙචීවරිකවූම භික්ෂූහු විසින් මෙසේ පිළිපැදිය යුතුය. තුන්සිවුරු අතුරෙන් එකක් හෝ දෙකක් අසිදගත් සිවුරු ඇති අන්‍යයා විසින් 'සන්තරුත්තරපරමං' යනාදි වසයෙන් කියනලද විධියෙන් අන් අයුරකින්ද පිළිපැදිය යුතුය. එහෙයින් ඒ විභාගය දක්වනු පිණිස **'සචෙ තීනි නට්ඨානි හොන්ති'** යනාදිනයින් මේ ශික්ෂාපදයෙහි පදභාජනය වදරනලද්දේය. එහි මේ විනිශ්චය යි: යම් මහණක්හුගේ තුන් සිවුරු නැසුනාහුද, ඔහුවිසින් දෙකක් ඉවසිය යුතුය. එකක් හැඳ එකක් පොරොවා අනික සභාගස්ථානයකින් සොයන්නේය. යම් මහණක්හුගේ දෙකත් සිවුරු නැසුනාහුද, ඔහු විසින් එකක් ඉවසිය යුතුය. ඉදින් ස්වභාවයෙන්ම අඳනය හා උතුරුසඟ සිවුරෙන් හැසිරේද, දෙකක් ඉවසිය යුතුය. මෙසේ ඇති කල්හි තුන් සිවුරෙන් දෙකක් නැසුනු කල්හි එකක් ඉවසන්නහු හාම සම වන්නේය. යමක්හුගේ තුන්සිවුරෙන් එකක් නැසුනේද, එකකුත් නොඉවසිය යුතුය. යම් මහණක්හට එක්ම සිවුරක්වේද, එද නැසුනේද දෙකක් ඉවසිය යුතුය. මෙහෙණක විසින් වනාහි සිවුරු පසම නැසුනු කල්හි දෙකක් ඉවසිය යුතුය. සතරක් නැසුනු කල්හි එකක් ඉවසිය යුතුය. තුනක් නැසුන් කල්හි කිසිවක් නොඉවසිය යුතුය. දෙකක් හෝ එකක් නැසුනු කල්හි කියනු කවරේද, යම් කිසිවකු විසින් හඳනය හා පොරෝනය පරම කොට ඇතිබැවින් සිටියයුතුය. එයින් මතුවෙහි

නොලැබේය යනු මෙහි මේ ලක්‍ෂණයවේ. **'සෙසකං ආහරිස්සාමි'** සිවුරු දෙකක් කොට සෙස්ස නැවැත ගෙණ එන්නෙමි' යන අර්ථයි. **'න අච්ඡින්නකාරණා'** අසිඳගැණීම කරුණු කොට නොවේය යනු බහුශ්‍රැතත්ත්වාදි ගුණවශයෙන් දෙත්. **'ඤාතකානං'** යනාදිතන්හි නෑයන් දෙනකල්හි ඉවසන්නහුටද පැවරුවන් දෙන කල්හි ඉවසන්නහුටද, තමාගේ ධනයෙන් ඉවසන්නහුටද අනාපත්තිය යනු අර්ථයි. අර්ථකථාවන්හි චනාහි නෑ පැවැරූ තන්හි ස්වභාවයෙන්ම බොහෝද වටියි, අසිඳ ගැණීම කරුණුකොට පමණම වටීයයි කියනලදී. එය පෙළ හා සම නොවේ. යම්හෙයකින් මේ ශික්‍ෂාපදය අතිකක්හු පිණිස විඤ්ඤාපන වස්තුවෙහි ම පණවනලද්දේද එහෙයින් මෙහි 'අඤ්ඤස්ස අත්ථාය'යි නොකියනලදී. සෙස්ස ප්‍රකට අර්ථඇත්තේමය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්‍ෂාපදය ෂඩ්සමුත්ථානිකය ක්‍රියායි. නොසංඥවිමොක්‍ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

තතුත්තරි ශික්‍ෂාපද වර්ණනාව නිමි.

—॥—

**'තෙන සමයෙන'** උපක්ඛට ශික්‍ෂාපදයයි. එහි **'අත්ථාවුසො මං සො උපට්ඨාකො'** ඇවැත 'තෝ' යමක් කියහිද, මාගේ මෙබඳුවූ උපස්ථායකයෙක් ඇත්තේය'යි මෙහි මේ අර්ථය වේ. **'අපි මය්‍ය එවං හොති'** 'හිමියෙනි' මට මෙසේ සිතෙක් වූයේය. 'අපි මයහ එවං'යි කියාද පාඨය වේ. **'භික්ඛුං පනෙව උද්දිස්ස'** මෙහි **'උද්දස්ස'** යනු උදෙසා ඇරබැ යම්හෙයකින් යමකු උදෙසා යම් සිවුරු මිලයක් රැස්කරන ලද්දේවේද, ඒ සිවුරු මිලය ඔහුට ප්‍රයොජනය පිණිස රැස්කරන ලද්දේ නම්වේද, එහෙයින් මේ පදයාගේ පදභාජනයෙහි 'භික්ඛුස්සත්ථාය'යි වදරන ලද්දේය. **'භික්ඛුං ආරම්මණං කරිත්වා'** මහණකු කරුණුකොට මහණකු උදෙසා යමක් රැස් කරනලද්දේද, ඒ සිවුරු මිලය නියමයෙන්ම මහණකු කරුණු කොට රැස්කරන ලද්දේවේද, භික්ඛුං ආරම්මණං කරිත්වා'යි එහෙයින් වදරනලදී. ප්‍රත්‍යය තෙමේද 'ලභති මාරෝ ආරම්මණං' යනාදි තන්හි ආරම්මණැයි ආයේය. දැන් 'උද්දිස්ස' යන මෙහි යමෙක් කතෘවේද, ඔහුගේ ආකාරය දක්වනු පිණිස **'භික්ඛුං අච්ඡාදෙතුකාමො'** යනු වදළසේක. මහණහු අන්දවනු කැමැත්තාවූ ඔහු විසින් ඒ උපනන්ද තෙරහු උදෙසා රැස්කරන ලද්දේය. අනික් කරුණකින් නොවේයයි මෙසේ හෙතෙමේ අන්දවනු කැමැත්තේවේ. **'භික්ඛුං අච්ඡාදෙතුකාමො'** යනු එහෙයින් වදරනලදය. **'අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා'** නොනෑ ගැහැවියකු කරණකොටගෙණ, යන අර්ථයි.

මෙය කරණාර්ථයෙහි සාමිවචනයි. පද භාජනයෙහි ව්‍යඤ්ජනය නොවිමසා අර්ථමාත්‍රයම දක්වනු පිණිස 'අඤ්ඤාතකො ගහපති නාම' යනාදිය වදරනලදී. **'චීවරචේතාපන්නං'** සිවුරුමිල. එය වනාහි යම්හෙයකින් හිරණ්‍යාදීන් අතුරෙහි එක්තරා එකක් වේද, එහෙයින් පදභාජනයෙහි 'හිරඤ්ඤං වා' යනාදිය වදරනලදී. **'උපක්ඛටං හොති'** පිළියෙල කරන ලද්දේවේ. එකතුකොට තබන ලද්දේය. යම්හෙයකින් 'හිරඤ්ඤං වා' යනාදි වචනයෙන් මේ සිවුරු මිල රැස්කළබව දක්වන ලද්දේවේද, එහෙයින් 'උපක්ඛටං නාම' යන පදය උදුරා වෙන්ව පදභාජනය නොවදළසේක. **'ඉමිනා'** යනු රැස් කරනලද්ද සඳහා කීහ. එහෙයින්ම මේ පදය පිළිබඳ පදභාජනයෙහි 'පච්චුපට්ඨිතෙන'යි වදරනලදය. යමක් වනාහි රැස්කරන ලද්දේද එකතු කොට තබනලද්දේද, එය එළවා තබනලද්දේ වේ. **'අච්ඡාදෙස්සාමි'** යන මෙය ව්‍යවහාර වචන මාත්‍රයෙකි. 'මෙනම් ඇති මහණහුට දෙන්නෙමි, යන මෙහි මේ අර්ථය වේ. එහෙයින් ම මේ පදයාගේ පදභාජනයෙහිද 'දස්සාමි'යි වදරනලදය. **'තත්‍ර චෙසො භික්ඛු'** යම් තැනෙක්හි ඒ ගෘහපති තෙමේ හෝ ගෘහපතිනී තොමෝ හෝ වේද, එහි ඒ මහණතෙමේ පෙර නොපවරන ලද්දේ එළැඹැ සිවුරෙහි අධිකවිධානයට පැමිණෙන්නේ නම්යි. මෙහි මේ පදසම්බන්ධය වේ. එහි **'උපසඞ්කමිත්වා'** යන මෙයට 'ගන්ත්වා' යන මෙයින් ම අර්ථය සිද්ධ කල්හි බහුල ව්‍යවහාරවශයෙන් ගෘහයි කියනලද්දේය. යම් තැනක ඒ දායක තෙමේ වේද එහි ගොස්යි මෙහි මේ අර්ථය වේ. එහෙයින් නැවැතද 'යත්ථ කත්ථචි උපසඞ්කමිත්වා'යි කියනලද්දේය. **'ආපජ්ජෙය්‍ය'** විසිට්ඨකප්පං ශූසේයි. අධිකවිධානයට පැමිණෙන්නේය. පදභාජනයෙහි වනාහි යම් අයුරකින් අධිකවිධානය පැමිණියේ වේද, එම දක්වනු පිණිස 'ආයතං වා' යනාදිය වදරනලදි. **'සාධු'** යනු අභිමුඛයාඥවෙහි නිපාතයෙකි. **'වත'** යනු පරිවිතර්කයෙහි නිපාතයෙකිඃ **'මං'**යි තමන් දක්වයි. **'ආයස්මා'**යි අන්හු අභිමුඛ කෙරෙයි. ආමන්ත්‍රණය කෙරෙයි. යම් හෙයකින් මේ සියල්ල ව්‍යඤ්ජනමාත්‍රයෙක්ම වූයේ ප්‍රකට අර්ථ ඇත්තේම වේද එහෙයින් මේ ශික්ෂාපදයෙහි පදභාජනයෙහි අර්ථය තෙමේ නොකියනලද්දේය.

**'කල්‍යාණකම්‍යතං උපාදය'** යනු යහපතක් කැමැතිබව විශිෂ්ටයක් කැමැතිබව සිතින් ගෙණය. එයට පැමිණෙන්නේ නම්යි යන මේ හා සම්බන්ධ වේ. යම්හෙයකින් යමෙක් යහපතක් කැමැතිබව කරණුකොට පැමිණේද හෙතෙමේ සොඳුරුබව කැමැතියෙක්වේ. මාහැඟිබව කැමැත්තේවේ. එහෙයින් මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි ව්‍යඤ්ජනය හැරදමා අභිමතාර්ථයම දක්වනු පිණිස එම වචනය වදරන ලද්දේය. යම්හෙයකින් වනාහි මෙයට පැමිණීම් මාත්‍රයකින්ම ආපත්ති තොමෝ

කෙළවරට නොපැමිණේද, එහෙයින් '**තස්ස වචනෙන**' යනාදිය වදළසේක. '**අනාපත්ති ඤාතකානං**' යනාදි තන්හි '**ඤාතකානං**' නෑයන්ගේ සිවුරෙහි අධික විධානයට පැමිණෙන්නහුට අනාපත්තියි මෙසේ අර්ථය දතයුතුය. '**මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති**' යනු විස්සක් අගනා සිවුරක් මිලකරනු කැමැති ගැහැවියක්හට 'මට මෙයින් කම් නැත්තේයි, දසයක් අගනාවූ හෝ අටක් අගනාවූ හෝ සිවුරක් දෙව'යි කියාද, ඇවැත් නොවේ. '**අප්පග්ඝං**' යන මෙද අධිකය වැළකීම පිණිසම වදරන ලද්දේය. සමවූ විධානය තිමිතිකොටද ඇවැත් නොවේ. හෙද ඇඟීම් වසයෙනි. පමණවිසින්ම නොවේ. මේ ශික්ෂාපදය අගය වැඩීම පමණකොට ඇත්තේමය. එහෙයින් යමෙක් විස්සක් අගනා අඳනයක් මිලදී ගණු කැමැත්තේ වේද, ඔහුට මෙපමණක් අගනා සිවුරක් මට දෙව,යි කියනු වටියි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුට්ඨානාදීහු ද තතුත්තරිශික්ෂාපදය සමානම වෙත්.

ප්‍රථම උපක්ඛටශික්ෂාපද වර්ණනාව නිමි.

——\\——

දුතිය උපක්ඛට ශික්ෂාපදයෙහිද මේ නයින්ම අර්ථය දතයුතුය. ඒ වනාහි මේ ශික්ෂාපදයෙහි අනුප්‍රඥප්තිය සමානවේ. හුදෙක් ප්‍රථම ශික්ෂාපදයෙහි එකක්හට පීඩා කරනලදී. ද්විතීය ශික්ෂාපදයෙහි දෙදෙනකුට පීඩා කරනලදි. මෙපමණෙක්ම මෙහි වෙනසවේ. සියල්ල ප්‍රථම ශික්ෂාපදය සමානම වේ. දෙදෙනකුට යම්සේද, බොහෝ දෙනාට පීඩාකොට ගන්නාහුටද ඇවැත් දතයුතුය.

ද්විතීය උපක්ඛටශික්ෂාපද වර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙනාති.**' යනු රාජශික්ෂාපදයයි. එහි '**උපාසකං සඤ්ඤාපෙත්වා**' දන්වා. 'මේ මිලයෙන් සිවුරක් මිලදීගෙණ තෙරහුට දෙව'යි මෙසේ කියා යන අදහසය. '**පඤ්ඤාසබන්ධො**' පණසක් කහවණු දඬායි කියන ලද්දේවේ. 'පඤ්ඤාසං බන්ධො'යි ද පාඨය වේ. පණසක් දිනුයේ වේ. පණසක් දෙවිය යුත්තේය යන අදහසයි. '**අජ්ජණ්හො භන්තෙ ආගමෙහි**' 'ස්වාමීනි' එක් දවසක් සිටිනු මැනැවි, අපට ඉවසනු මැනැව, යන අර්ථයි. '**පරාමසී**' ගත්තේය. '**ජීතොසි**' දිනනලද්දේ වෙහිය. '**රාජභොග්ගො**' රජු ගෙන් භොග්ගං යුයේයි බිදිය යුත්ත මොහුට ඇත්තේනුයි රාජභොග්ගනම. 'රාජභොගො'යි පාඨයෙක්ද වේ. රජුගෙන් බිදිය යුත්ත

මොහුට ඇත්තේය යන අර්ථයි. **'පහිණෙයා'** යවන්නේය. ප්‍රකට අර්ථ ඇති බැවින් මේ ශික්ෂාපදයාගේ පදභාජනය නොවදරනලදි. මේ පදය පිළිබඳ යම්සේද එසේ **'චීවරං ඉජ්ජනාමං භික්ඛුං'** යනාදි පදයන්ද ප්‍රකට අර්ථ ඇති බැවින් පදභාජනය නොවදරනලදැයි දතයුතුය.

**'ආහතන්ති'** ගෙණ එනලද්දේය **'කාලෙන කප්පියං'** සුදුසුකාලයෙහි. 'යම් කලෙක්හි අපට ප්‍රයොජන ඇත්තේ වේද, එකල්හි කැප සිවුරක් ගණුම්හ'යන අර්ථයි. **'වෙයාාවච්චකරෝ'** කෘත්‍යය කරන්නෙක්. කැප කරුය යන අර්ථයි. **'සඤ්ඤත්තො සො මයා'** මා විසින් ඔහු යම්සේ තොපට සිවුරකින් ප්‍රයොජන ඇති කල්හි සිවුරක් දෙන්නේද එසේ කියනලද්දේය යන අර්ථයි. **'අත්‍ථො මේ ආවුසො චීවරෙන'** මෙය චොදනාවගේ ලක්ෂණ දැක්වීමය. මේ වචනය හෝ වනාහි කියයුතුය. නොහොත් මොහුගේ අර්ථය යම් කිසි භාෂාවකින් කියයුතුය. මේ චොදනාලක්ෂණය වේ. 'දෙහි මෙ චීවරං' යනාදීහු නොකියයුතු අයුරු දැක්වීම පිණිස කියනලදහ. මේ වචනද මොවුන්ගේ අර්ථයද යම් කිසි භාෂාවකින් නොකිය යුතුය. **'දුතියම්පි වත්තබ්බො තතියම්පි වත්තබ්බො'** 'අත්‍ථො මේ ආවුසො චීවරෙන' යන මේම තුන්යලක් කියයුතුය. මෙසේ **'ද්විත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො'** මෙහි උදෙසූ ශික්ෂාපදයෙහි පිරිසිඳීම දක්වා දැන් 'ද්වත්තික්ඛත්තුං චොදයමානො චරයමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය ඉච්චෙතං කුසලං' යන මේ පදයන්ගේ අර්ථය සැකෙවින් දක්වනුවෝ **'සචෙ අභිනිප්ඵාදෙති ඉච්චෙතං කුසලං'**යි කීහ. මෙසේ තුන්යල දක්වා චොදනා කරන්නේ ඒ සිවුර ඉදින් නිපදවාද, තමන්ට ප්‍රතිලාභවශයෙන් නිපදවන්නට හැකිද, මේ අයුරින් මේ නිපදවීම මැනැවි. යහපති. සුවදුසුනැදරං යනුද මෙයට පයයීයය. **'චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං'** යනු මේ සිටීම් ලකුණු දැක්වීමය. 'ඡක්ඛත්තුපරමං' යන මෙය භාවනපුංසකවචනයි. සවරක් පරම කොට සිවුර උදෙසා මොහු විසින් තුෂ්ණීම්භූතව සිටිය යුතුය. අන්කිසිවක් නොකට යුතුය. මේ සිටීම් ලක්ෂණයයි. එහි සියලු සිටීම්වලට සාධාරණවූ යම් තුෂ්ණීම්භාවයෙක් වේද, ඒ නොබිණීම දක්වනු පිණිස පදභාජනයෙහි **'තත්‍ථ ගන්ත්වා තුණ්හීභූතෙන'** යනාදිය වදළසේක. එහි **'න ආසනෙ නිසීදිතබ්බං'** ස්වාමීනි, මෙහි හිඳුනු මැනැවැ'යි කියනලද්දහු විසින්ද, නොහිඳිය යුතුය. **'න ආමිසං පටිග්ගහෙතබ්බං'** කැඳ කැවිලි ආදි භෙද ඇති කිසි ආමිෂයක් ගණුව ස්වාමීනි'යි යදිනු ලබන්නහු විසින්ද නොගතයුතුය. **'න ධම්මො භාසිතබ්බො'** මඞගලයක් හෝ අනුමොදනාවක් හෝ වදරනු මැනැවැයි යදිනු ලබන්නහු විසින්ද කිසිවක් නොබිණිය යුතුය. හුදෙක් 'කවර කරුණක් හෙතු කොට ආයෙහිදැ'යි විචාරනු

ලබන්නහු විසින් 'ඇවැත දනිහි' කියයුතුය. 'පුච්ඡියමානො' යන මෙය කරණාර්ථයෙහි ප්‍රථමාවචනයි. නොහොත් විචාරීම කරනුයේ විචාරනු බලන්නේයයි මෙසේද මෙහි අර්ථ දතයුතුය. යමෙක් විචාරීම කෙරේද, හෙතෙමේ මෙපමණක් කියයුත්තේය. 'ඨානං භඤ්ජති' ආ කරුණ විනාශ කරයි.

දැන් යම් චොදනා තුනක් සිටීම් සයක් කියනලදද, එහි වෘද්ධියද හානියද දක්වන්නාහු **'චතුක්ඛත්තුං චොදෙත්වා'** යනාදිය වදාළසේක. යම්හෙයකින් මෙහි එක් චොදනාවක්හුගේ වැඩීම පිළිබඳ සිටීම් දෙකක්හුගේ හානිය කියනලදද, එහෙයින් චොදනාවගේ සිටීම ද්විගුණයයි ලක්ෂණ දක්වන ලද්දේවේද මෙසේ මේ ලක්ෂණයෙන් තෙවරක් චොදනා කොට සවරක් සිටියයුතුය. දෙවරක් චොදනා කොට අටවරක් සිටිය යුතුය. එක්වරක් චොදනා කොට දසවරක් සිටිය යුතුය. සවරක් චොදනා කොට නොසිටිය යුතුයයි යම්සේ කියනලදද, එසේ දෙළොස් වරක් සිට චොදනා නොකොට යුත්තේයයිද කියන ලද්දේම වේ. එහෙයින් ඉදින් චොදනා කෙරේම නම් නොසිටීද, චොදනා සයක් ලැබේ. ඉදින් සිටීමම කෙරේනම්, චොදනා නොකෙරේනම් සිටීම් දෙළොසක් ලැබේ. ඉදින් චොදනාත් කෙරේනම්, සිටීමත් කෙරේනම් එක් චොදනාවෙන් සිටීම් දෙකක් පිරිහෙලිය යුතුය. එහි යම් මහණෙක් එක් දවසම නැවැත නැවැත ගොස් සවරක් චොදනා කෙරේද, එක්වරක්ම ගොස් 'ඇවැත මට සිවුරෙන් ප්‍රයොජන වේය'යි සවරක් කියයිද, එසේ එක් දවසක්ම නැවැත නැවැත ගොස් දෙළොස් වරක් සිටීද එක්වරක්ම හෝ ගොස් ඒ ඒ තැන සිටීද, හෙතෙමේද සියලු චොදනාද සියලු සිටීම්ද විනාශ කරයි. නොයෙක් දිනයන්හි මෙසේ කරන්නහුට කියනු කවරේදැයි මෙසේ මෙහි විනිශ්චය දතයුතුය.

**'යතස්ස චීවරචෙතාපන්නං ආභතං'** යම් රජකු කෙරෙන් හෝ රජ ඇමැතියෙකු කෙරෙන් හෝ මේ මහණහුට සිවුරු මිලයක් ගෙණ එනලද්දේද **'යත්වස්ස'**යි පාඨයෙක්ද වේ. මෙම අර්ථයි. 'යත්ථස්ස'යි ද හදරත්. යම් තැනෙක්හිදී මොහුට සිවුරු මිලයක් එවනලද්දේයයිද අර්ථ කියත්. ව්‍යඤ්ජනය වනාහි සම නොවේ. **'තත්ථ'** ඒ රජුගේ හෝ රජ ඇමැතියකුගේ හෝ සමීපයෙහි මෙය සමීපාර්ථයෙහි භුම්මවචනයි **'න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්ථං අනුභොති'** යනු ඒ සිවුරු මිලය ඒ මහණහුගේ ස්වල්පමාත්‍රවූද කිසි කාර්‍ය්‍යයක් නොපිදවයි. **'යුඤ්ජන්තායස්මන්තො සකං'**යි ආයුෂ්මත්හු තම තමන්සතු ධනයට පැමිණෙත්වා. **'මා වො සකං විනස්ස'** තොපගේ සන්තකය නොනසාවා යමෙක් වනාහි තෙමේ නොමයේද, දූතයකු නොයවාද වත් බිදීම නිමිතිකොට දුක්කටයට පැමිණේ.

කිම, සියලු කැපකරුවන් කෙරෙහි මෙසේ පිළිපැදිය යුතුද, යත්:- පිළිපැදියයුතු නොවේ. මේ කැපකරු තෙමේ නිර්දිෂ්ට තෙමේය. අනිර්දිෂ්ට තෙමේයයි සැකෙවින් දෙවැදෑරුම්වේ. එහි නිර්දිෂ්ට තෙමේද මහණහු විසින් දක්වනලද්දේය. දූතයා විසින් දක්වන ලද්දේයයි දෙවැදෑරුම්වේ. අනිර්දිෂ්ට තෙමේද මුඛය විවෘත කොට තෙමේ කැප කරුබවට පැමිණියේය. අනභිමුඛයෙහි කැපකරුබවට පැමිණියේයයි දෙවැදෑරුම් වේ. ඔවුන් අතුරෙහි මහණහු විසින් දක්වන ලද්දේ සම්මුඛාසම්මුඛවසයෙන් සිවුවැදෑරුම් වේ. දූතයා විසින් දක්වනලද්දේද එසේ සිවුවැදෑරුම් වේ.

කිසේය, යත්:- මේ ලෝකයෙහි ඇතැම් එකෙක් මහණහුට සිවුරු පිණිස දූතයකුලවා අකැපවස්තුවක් යවයි. දූතයා ඒ මහණහු වෙත එළැඹ 'ස්වාමීනි' මෙනම් ඇත්තහු විසින් ඔබවහන්සේට සිවුරු පිණිස මේ වස්ත්‍රය එවනලද්දේය, එය ගණු මැනැවැ'යි කියාද, මහණතෙමේ මේ කැප නොවේයයි ප්‍රතික්ෂෙප කෙරේද, දූතතෙමේ 'ස්වාමීනි' ඔබවහන්සේට වතාවත් කරන්නෙක් ඇත්තේදැයි විචාරාද පින් කැමැති උපාසකයන් විසින් භික්‍ෂූන්ගේ වතාවත් කරවු'යි අණවන ලද්දවූ හෝ දුටුපමණින් මිත්‍රවූ දැඩි මිත්‍රවූ වතාවත් කරන්නාවූ කිසි කෙනෙක් වෙත්ද ඔවුන් අතුරෙන් එක්තරා එකෙක් මහණුහු වෙත හුන්නේ වේද, මහණතෙමේ 'මෙතෙමේ භික්‍ෂූන්ගේ වතාවත් කරන්නේයයි ඔහු දක්වාද, දූතතෙමේ ඔහු අතට අකැපවස්තුව දී තෙරුන්ට සිවුරක් මිලදී ගෙණ දෙව'යි කියා යේද මෙතෙමේ මහණහු විසින් හමුවෙහි දක්වනලද්දේය. මහණහුගේ සමීපයෙහි හුන්නෙක් නොවේද, එහෙත් මහණතෙමේ 'අසුවල් නම් ගමෙහි මෙනම් ඇත්තේ මහණුන්ගේ වතාවත් කරන්නේය'යි ඔහු දක්වාද, හෙතෙමේ ගොස් ඔහුගේ අතට අකැපවස්තුව දී 'තෙරුන්ට සිවුරක් මිලදී ගෙණ දෙව'යි කියා අවුත් මහණහුට සැල කොටයේද, මෙතෙමේ මහණහු විසින් නොහමුවෙහි දක්වන ලද එකෙක් වේ. ඒ දූත තෙමේ තමා අවුත් නොම සැලකෙරේද එහෙත් 'ස්වාමීනි' මා විසින් ඔහුගේ අතට සිවුරුමිලය දෙන ලද්දේය. සිවුරක් ගණුමැනැවැ'යි අනිකකු යවාද, මෙතෙමේ මහණහු විසින් නොහමුවෙහි දක්වනලද දෙවැන්නාවේ. අනිකකු නොමයවාද එහෙත් යන්නේම 'මම ඔහු අතට සිවුරු මිල දෙන්නෙමි, යුෂ්මත්හු සිවුර ගණු මැනැවැ'යි මහණහුට කියාද, මෙතෙමේ මහණහු විසින් නොහමුවෙහි දක්වනලද තෙවැන්නා වේ. මෙසේ එක් කැපකරුවෙක් තෙමේ හමුවෙහි දක්වන ලද්දේය. තිදෙනෙක් නො හමුවෙහි දක්වන ලද්දහයි. මේ සිවු දෙන මහණහු විසින් දක්වන ලද කැපකරුවෝ නම්වෙත්. මොවුන් අතුරෙහි මේ රාජශික්‍ෂාපදයෙහි කියූ නයින්ම පිළිපැදිය යුතුය.

අන් මහණෙක් තෙමේ පෙරනයින්ම දූතයා විසින් විචාරණ ලදුයේ කැපකරුවකු නැති බැවින් හෝ මේ පක්ෂයෙහි අපට කැපකරුවෙක් නැත්තේයයි නොවිචාරණු කැමැත්තෙන් හෝ 'අපට කැපකරුවෙක් නැත්තේය'යි නොවිචාරණු කැමැත්තෙන් හෝ 'අපට කැපකරුවෙක් නැත්තේය'යි කියයි. එකෙණෙහි කිසියම් මිනිසෙක් ඒද, දූතතෙමේ ඔහු අතට අකැප වස්තුවදී 'මොහුගේ අතින් සිවුර ගණු මැනැවැ'යි කියා යේද, මෙතෙමේ දූතයා විසින් හමුවෙහි දක්වන ලද්දේය. අන් දූතයෙක් තෙමේ ගමට වැද තමන් කැමැතිවූ යම් කිසිවකු අතට අකැපවස්තුව දී පෙර කියූ නයින්ම අවුත් හෝ සැලකෙරේද, අනිකකු හෝ යවාද, 'මම අසුවලාගේ අතට සිවුරුමිලයක් දෙන්නෙමි, නුඹවහන්සේ සිවුර ගණු මැනැවැ'යි කියා හෝ යේද, මෙතෙමේ දූතයා විසින් නොහමුවෙහි දක්වන ලද තෙවැන්නාවවේ. මෙසේ එකෙක් හමුවෙහි දක්වන ලද්දේය. තිදෙනෙක් නොහමුවෙහි දක්වන ලදහයි මොවුහුසිවුදෙන දූතයා විසින් දක්වන ලද කැපකරුවෝ නම් වෙත්. මොවුන් අතුරෙහි මෙණ්ඩක ශික්ෂාපදයෙහි කියූ නයින්ම පිළිපැදිය යුතුය. මෙය මෙසේ වදරන ලද්දේය. 'මහණෙනි' සැදැහැති පහන්වූ මිනිස්සු ඇත්තාහ. ඔවුහු කැපකරුවන්ගේ අතෙහි මෙයින් යමක් ආයුෂ්‍යයන් වහන්සේට කැපවේද, එය ගෙණ දෙවුයි අමුරන් තබත්ද, මහණෙනි එයින් යමක් කැපද, එය ඉවසන්නට අනුදනිමි. මහණෙනි මම මොන ලෙසකිනුත් රන්රිදී මසු කහවණු ඉවසිය යුතුය. සෙවිය යුතුය'යි නොකියමියි. මේ රන්රිදී ආදිය ඉවසීමෙහි සෙවීමෙහි චොදනාවගේ ප්‍රමාණයෙක් නැත්තේය. මිල නොඉවසන්නාහු විසින් දහස්වර නමුදු චොදනා වෙත් හෝ සිටීමෙන් හෝ කැප බඩු ඉවසන්නට වටියි. නොදේ නම්, අන් කැපකරුවකු තබාද ගෙන්විය යුතුය. ඉදින් කැමැත්තේ නම් මිලහි මියන්ටද කියයුතුය. නොකැමැත්තේ නම් නොකිය යුතුය.

අන් මහණෙක් තෙමේ පෙරකියූ නයින්ම දූතයා විසින් විචාරණ ලදුයේ 'අපට කැපකරුවෙක් නැත්තේයයි කියයි. එයින් අනිකෙක් වෙත සිටියේ අසා 'පින්වත' ගෙණ එව, මම ආයුෂ්‍යයන් වහන්සේට සිවුරක් මිලදී ගෙණ දෙන්නෙමි'යි කියයි. දූත තෙමේ 'පින්වත' එසේනම් දෙන්නෙහියයි ඔහු අතට දී මහණහුට නොදන්වාම යේද, මෙතෙමේ මුඛවට්ටික කප්පිය කාරක නම, අන් මහණෙක් තෙමේ මහණහුගේ උපස්ථායකුගේ හෝ අනෙකකුගේ හෝ අතට අකැප වස්තුවක්දී තෙරුන්ට සිවුරක් දෙව'යි කියා මෙයින්ම බැහැරයේද, මෙතෙමේ පරාමුඛ කප්පිය කාරකය. මේ දෙදෙන නොදක්වනලද කැපකරුවෝ නම් වෙත්. ඔවුන් අතුරෙහි නොනෑ නොපැවරුවන් කෙරෙහි මෙන් පිළිපැදිය යුතුය. ඉදින්

තුමූම ගෙණවුත් දෙත්ද, ගතයුතුය. නොදෙත් නම් කිසිවක් නොකිය යුතුය. 'දූතෙන චීවරචෙතාපනනං පහිණෙය්‍ය' යන මෙය දෙශනාමාත්‍රයෙක්මය. තමන් ගෙණවුත් පිණ්ඩපාතාදිය පිණිස දෙන්නවුන් කෙරෙහිද මේනයමවේ. හුදෙක් තමාගේ ප්‍රයොජනය පිණිස පමණක්ම පිළිගැණීම නොවටින්නේ නොවේ. ඉදිනුදු කිසිවෙක් රත්රිදී මස කහවණු ගෙණවුත් 'මෙය සඞ්ඝයාට දෙමි, ආරාමයක් හෝ චෛත්‍යයක් හෝ හොජනසාලාදීන් අතුරෙහි එක්තරා එකක් හෝ කරවු'යි කියාද මෙද පිළිගන්නට නොවටියි. යම් කිසි අතිකක්හුගේ ප්‍රයොජනය පිණිස පිළිගන්නහුට දුක්කටය වේයයි මහාපච්චරියෙහි කියනලදී. ඉදින් 'මේ දෙය මහණුන්ට පිළිගන්නට නොවටීය'යි ප්‍රතික්ෂෙප කළ කල්හි 'වඩුවන්ගේ හෝ කම්කරුවන්ගේ හෝ අතෙහි වන්නේය. හුදෙක් නුඹවහන්සේලා සුකෘත දුෂ්කෘතය දනිවු'යි කියා ඔවුන්ගේ අතට දීයේද, වටියි. යලිදු 'මාගේ මිනිසුන්ගේ අතෙහි වන්නේය, මාගේම හෝ අතෙහි වන්නේය. හුදෙක් නුඹ වහන්සේලා යමක් යමක්හට දියයුතුද ඒ පිණිස කියා එවන්නාහුයි කියාද මෙසේද වටියි.

ඉදින් සඞ්ඝයා හෝ ගණයා හෝ පුද්ගලයා හෝ නොළදෙසා මේ හිරණ්‍ය සුවර්ණයසැයට දෙමු, වෙහෙරට දෙමු'යි නවකර්මාන්තය. පිණිස දෙමු'යි කියත්ද, ප්‍රතික්ෂෙප කිරීම නොවටියි. 'මොවුහු මෙය කියත්'යි කැපකරුවන්ට කිය යුතුය. චෛත්‍යාදීන්ට ප්‍රයොජනය පිණිස නුඹවහන්සෙලා ගෙණ තබවුයි කියූ කල්හි 'අපට ගන්නට නොවටීය'යි ප්‍රතික්ෂෙප කටයුතුය. ඉදින් වනාහි කිසිවෙක් බොහෝ හිරණ්‍යසුවර්ණ ගෙණවුත් 'මේ හිරණ්‍යසුවර්ණ සඞ්ඝයාට දෙමි, සිවු පසය පරිහොග කළ මැනැවැ'යි කියාද, සඞ්ඝතෙමේ ඒ හිරණ්‍යසුවර්ණ පිළිගණී නම් පිළිගැණීම නිමිති කොටද පරිහොගය නිමිති කොටද ඇවැත්වේ. පිළිගැණීමෙහි පාචිත්තිය හා පරිහොගයෙහි දුක්කටයයි. එහි එක් මහණෙක් තෙමේ 'මේ හිරණ්‍ය සුවර්ණ කැප නොවේය'යි ප්‍රතික්ෂෙප කෙරේනම් උපාසක තෙමේද නොකැප නම් මටම වන්නේය'යි කියායේද, ඒ මහණතෙමේ 'තාවිසින් සඞ්ඝයාගේ ලාභයට අන්තරාය කරනලදැයි කිසිවකු විසින් නොකිය යුතුය. යමෙක් වනාහි ඔහුට චොදනා කෙරේද, හෙතෙමේම දුක්කටාපත්තිසහිතවේ. ඒ එක් මහණක්හු විසින් බොහෝ දෙන නිරාපත්තිකයෝ කරනලදහ.

ඉදින් වනාහි මහණුන් විසින් නොවටීයයි ප්‍රතික්ෂෙප කල කල්හි 'කැපකරුවන්ගේ හෝ අතෙහි වන්නේය. මාගේ පුරුෂයන්ගේ හෝ මාගේ හෝ අතෙහි වන්නේය. හුදෙක් නුඹ වහන්සේලා ප්‍රත්‍යය වළඳනු මැනැවැ'යි කියාද වටියි. සිවුපසය පිණිසද දෙනලද්ද යම් යම් ප්‍රත්‍යයකින් ප්‍රයොජන

ඇත්තේවේද ඒ පිණිස එළවිය යුතුය. සිවුරු පිණිස දෙනලද්ද සිවුරෙහිම එළවිය යුතුය. ඉදින් සිවුරෙන් එබඳු වැඩක් නැත්තේද, සඞ්ඝතෙමේ පිණ්ඩපාතාදියෙන් කලාන්තවේද, සඞ්ඝයාගේ පහසුව පිණිස අපලොකනය කොට ඒ පිණිසද එළවිය යුතුය. පිණ්ඩපාත ගිලානප්‍රත්‍යය පිණිස දෙනලද්දෙහිද මේ නයවේ. සෙනසුන් පිණිස දෙනලද්ද වනාහි සෙනසුන තමා ගරුභාණ්ඩ බැවින් සෙනසුනෙහිම එළවිය යුතුය. ඉදින් මහණුන් සෙනසුන හැර දමා ගියකල්හි සෙනසුන එබඳු කාලයෙහි සෙනසුන හැරද මහණුන්ට පරිභොගය අනුදන්නා ලද්දේය. එහෙයින් සෙනසුන් දැගීම පිණිස මුල් සිඳීම නොකොට යැපෙන පමණක් පරිභොග කටයුතුය.

හුදෙක් හිරණ්‍යසුවර්ණම නොවේ. අන්‍යවූද කෙත්වත් ඈ ඇකැපය. නොපිළිගත යුතුය. ඉදින් කිසිවෙක් 'මාගේ සස්‍යසම්පාදනය කරන මහත් තටාගයෙක් ඇත්තේය. ඒ තටාගය සඞ්ඝයාට දෙමි'යි කියාද ,ඒ තටාගය සඞ්ඝ තෙමේ පිළිගණීනම් පිළිගැණීම නිමිති කොටද පරිභොගය නිමිති කොටද, ඇවැත්වේමය. යම් මහණෙක් තෙමේ ඒ තටාගය ප්‍රතික්‍ෂෙප කෙරේද හෙතෙමේ පෙර කියූ නයින්ම කිසිවකු විසින් කිසිවක් නොකිය යුතුය. යමෙක් ඔහුට චොදනා කෙරේද, හෙතෙමේම සාපත්තික වේ. ඒ එක් මහණක්හු විසින් බොහෝ මහණෝ නිරාපත්තික කරනලදහ. යමෙක් වනාහි එබඳුවූම තටාගයක් දෙමි'යි කියා මහණුන් විසින් නොවටී'යි ප්‍රතික්‍ෂෙපකරන ලද්දේ 'සඞ්ඝයාගේ අසුවල් අසුවල් තටාකයෙක් ඇත්තේය. ඒ කෙසේ වටීදැයි කියාද, එකල්හි කැප කොට දෙන ලද්දේයයි හෙතෙමේ කියයුතු වන්නේය. කෙසේ දෙනලද්ද කැප වේදැ. යත්:- සිවුපසය පරිභොග කළ මැනැවැයි කියා දෙනලද්දය. හෙතෙමේ 'මැනැවැ සවාමීනි' සිවුපසය පරිභොග කළ මැනැව'යි දේද, ඒ වටියි. නැවැතද තටාගය ගණුව'යි කියා නොවටීයයි ප්‍රතික්‍ෂෙප කරන ලද්දේ කැපකරුවෙක් ඇත්තේදැයි විචාරා නැතැයි කීකල්හි 'අසුවලා මේ තටාකය විචාරන්නේය. අසුවලාගේ හෝ අතෙහි මාගේ හෝ අතෙහි වන්නේය. සඞ්ඝ තෙමේ කැප භාණ්ඩයක් පරිභොග කෙරේවා'යි කියා නම් වටියි. ඉදිනුදු නොවටීයයි ප්‍රතික්‍ෂෙප කරනලද්දේ ජලය පරිභොග කරන්නේය. භාණ්ඩය ධොවනය කරන්නේය. මෘග පක්‍ෂීහුද බොන්නාහයි කියාද මෙසේද වටියි. නැවැතද නොවටීය'යි ප්‍රතික්‍ෂෙප කරනලද්දේ 'කැපහිසින් ගණු මැනැවැ'යි කියාද 'මැනැව, උපාසක' සඞ්ඝතෙමේ පැන් වළඳන්නේය. භාණ්ඩ ධොවනය කරන්නේය, මෘගපක්‍ෂීහුද බොන්නාහයි කියා පරිභොග කරන්නට වටියි.

නැවැතද 'මාගේ තටාගය හෝ පොකුණ හෝ සඞ්ඝයාට දෙමි'යි කියූ කල්හි 'මැනැවැ' උපාසක, 'සඞ්ඝ තෙමේ පැන් පානය කරන්නේය. යනාදිය කියා පරිභොග කරන්නට වටීමය. ඉදින් වනාහි මහණුන්

විසින් අත්කම් ඉල්ලා සියතින්ද කැප පොළොව කැණ ජලපරිභොගය පිණිස තටාගයක් කරවන ලද්දේවේද, ඒ තටාගය නිසා මනුෂ්‍යයෝ සස්‍ය නිපදවා විහාරයට කැප භාණ්ඩයක් දෙත්නම් වටියි. යලි මනුෂ්‍යයෝ මෙසේ සඩසයාහට උපකාර පිණිස සහසතු බිමක් කැණ ඒ නිසා උපන් සස්‍යයෙන් කැප භාණ්ඩයක් දෙත්ද, මෙසේද වටියි. 'අපට එක් කැපකරුවකු තබවු'යි කියූ කල්හිද තබන්නටද ලැබේ.

නැවැත ඒ මනුෂ්‍යයෝ රජබලිය කරණකොට පෙළුනාහු බැහැරයෙත් අන්‍යයෝ එයට පිළිපදිත්. මහණුන්ට කිසිවක් නොදෙත්. ජලය වළකාලන්නට ලබයි. එද සීසාන කාලයෙහිමය. සස්‍ය කාලයෙහි නොවේ. ඉදින් ඔවුහු 'ස්වාමීනි' පෙරද මිනිස්සු මේ ජලය නිසා සස්‍ය කළාහු නොවෙත්ද යි කියත්ද, ඉන්පසු ඒ මිනිස්සු සඩසයාහට මේ මේ උපකාර කළහ. මේ මේ කප්පියභාණ්ඩ දුන්හයි කිය යුත්තාහ. ඉදින් 'අපිත් දෙන්නෙමු'යි මෙසේ කියත්ද වටියි. කිසි අව්‍යක්තයෙක් අකැපවහරින් තටාගය පිළිගණියි හෝ කරවාලයි හෝ එම තටාකය මහණුන් විසින් පරිභොග නොකටයුතුය. ඒ තටාකය නිසා ලද කප්පියභාණ්ඩය අකැපමවේ. මහණුන් විසින් අත්හළ බව දැන හිමියා හෝ ඔහුගේ දූපුත්හු හෝ වංශයෙහි උපන් අන් කිසිවෙක් හෝ නැවැත කැපවහරින් දේනම් වටියි. කුලවංශය සිඳීගිය කල්හි ඒ ජනපදයට යමෙක් හිමියාවේද හෙතෙමේ අසිදගෙණ නැවැත දේද සිතුල්පව්වෙහි මහණහු විසින් බැහැර කරනලද කුඩාදිය ඇල අළනාගරද මෙහෙසිය මෙනි. මෙසේද වටියි. කැපවහරෙහිද ජලය වසයෙන් පිළිගත් තටාකයෙහි සියලු අයුරින් ජලපරිභොගය පිණිසය යන පිරිසිදු සිත් ඇතියවුන් විසින් මැටි ඉදිරීම් නියරබැඳීම් ආදියද කරන්නට වටියි. ඒ තටාකය නිසා සස්‍ය කරන්නවුන් දැක කැපකරුවකු තබන්නට නොවටියි. ඔවුහු තුමූම කැප භාණ්ඩයක් දෙත්නම් ගතයුතුය. නොදෙත්නම් චොදනා නොකටයුතුය. සිහි නොකරවිය යුතුය. ප්‍රත්‍යයවශයෙන් පිළිගත් තටාකයෙහි කැපකරුවකු තැබීම වටියි. මැටිඉදිරීම් නියරබැඳීම් ආදිය කිරීම නොවටියි. කැපකරුවෝ තුමූම කරත් නම් වටියි. අව්‍යක්ත ලජ්ජී භික්ෂූහු විසින් කරවනලද තටාකයන්හි පිළිගැණීම කැපවේ. මහණහුගේ ප්‍රයොගහෙතුවෙන් උපන් ද්‍රව්‍යයන් හා මිශ්‍රබැවින් විෂමිශ්‍ර පිණ්ඩපාතය මෙන්ද, අකැපමස් රස මුසු බොජුන් මෙන්ද නින්දිත වූ හැරදැමිය යුතු පරිභොගය ඇත්තේ සියල්ලන්ට අකැපමවේ.

ඉදින් ජලයට ඉඩකඩ ඇත්තේද, තටාකයෙහි ඉවුර සථිරවේද, බොහෝ ජලය ගණීද, 'මෙසේ කරව, ඉවුර සමීපයෙහි ජලය කරව'යි

මෙසේ ජලයම විචාරාද වටියි. 'උපාසකයෙනි' උදුනෙහි ගිනි නොහෙලත්, ජලය මාගෙන් ලබාවා'යි කීම වටියි. 'සස්‍ය කොට ගෙණ එවු'යි කීම සුදුසු නොවේ. ඉදින් තටාකයෙහි ඉතා බොහෝ ජලය දැක පසකින් හෝ පිටින් හෝ දියඇල හරවාද, වනය සිඳවා කුඹුරු කරවාද, පැරණි කුඹුරුවල හෝ සිවු අමුණක් පමණවූ පියවි කොටස නොගෙණ වැඩියක් ගණීද, පෙර නොකළ කෙතෙහි අලුත් සස්‍යයෙහිද අකාලසස්‍යයෙහිද මෙපමණ බිම් කොටසෙක්හි මෙපමණ කොටසක් දියයුතුයයි මෙසේ නොපිරිසිඳ කොටසෙහි මෙපමණ කහවණු දෙවුයි කහවණු නගාද, සියල්ලන්ට අකැප වේ. යමෙක් කසිවු, වපුරවු'යි නොකියා මෙපමණ බිමින් මෙපමණ කොටසෙක්යයි මෙසේ බිම හෝ පිහිටුවාද, මෙපමණ බිම් කොටසෙක්හි අපවිසින් සස්‍ය කරන ලද්දේය. මෙපමණ කොටසක් ගණිවු'යි සීසාන්නන් කියන කල්හි බිම් පමණ ගැණීම පිණිස රැහැණින් හෝ දඬුවෙන් හෝ මනීද සොරකම් කරන්නවුන් දැක නොගණිවු'යි කියමින් කලවිට හෝ සිට රකීද, කලවිටින් පිටතට ගන්වාද කොටුගුල්හි හෝ තැන්පත් කෙරේද ඔහුටම එය අකැපවේ. ඉදින් ගොවියෝ කහවණු ගෙණඅවුත් 'මේ කහවණු සඞ්ඝයාහට ගෙණ එනලදහයි කියත්ද එක්තරා මහණෙක් තෙමේද 'සඞ්ඝතෙමේ කහවණු නොකාය' යන හැඟීමෙන් 'මෙපමණ කහවණුයෙන් සළු ගෙණ එව, මෙපමණකින් කැඳ ආදිය සම්පාදනය කරවු'යි කියාද, ඒ ගොවියෝ යමක් ගෙණ එත්ද සියල්ලන්ට අකැප වේ. කුමක්හෙයින්ද, යත්:- කහවණු විචාරය කළ බැවිනි. ධාන්‍යය ගෙණවුත් 'මේ ධාන්‍යය සඞ්ඝයාහට ගෙණෙනලදැයි කියත්ද, එක්තරා මහණෙක් තෙමේද, පෙර කියූ නයින්ම මෙපමණ වීයෙන් මේ මෙය ගෙණ එවු'යි කියාද, ඔවුහු යමක් ගෙණ එත්ද, ඔහුටම අකැපවේ. කුමක් හෙයින, යත්:- ධාන්‍යය තමා විචාරය කළ බැවිනි. ඉදින් සහල් හෝ මුද්ගාදි අපරාන්නය හෝ ගෙණඅවුත් 'මේ දෙය සඞ්ඝයාහට ගෙණ එන ලදැයි කියත්ද, එහි එක්තරා මහණෙක් තෙමේ පෙරකියූ නයින්ම මෙපමණ සහලින් මේ මේ දෙය ගෙණඑවු'යි කියාද, ඔවුහු යමක් ගෙණ එත්ද, සියල්ලන්ට ඒ ගෙණ ආ දෙය කැපවේ. කුමක් හෙයින, යත්:- කැපසහල් ආදිය විචාරය කළබැවිනි. කැපකරුහට කියූ බැවින් ගණුදෙනු කිරීමෙහිද ඇවැත් නොවේ. පෙර සිතුල්පව්වෙහි එක් මහණෙක් තෙමේ බොජුන්හල්දෙර 'එකාන්තයෙන් හෙට සඞ්ඝයාහට මෙපමණ කැවුම් පිසන්නාහු නම් මැනැවැ'යි ආරාමිකයන්ට හැඟීම උපදවනු පිණිස බිම මඬුල්ලක් කෙළේය. එදැක දක්ෂ කැපකරුවෙක් එසේම කොට දෙවන දිනයෙහි බෙරය ගැසූ කල්හි සඞ්ඝයා රැස්වූ කල්හි කැවුම් ගෙණ සඞ්ඝස්ථවිරයන්හට 'ස්වාමීනි' අපවිසින් මෙයින් පෙර මවුපියන් අතින් මෙබන්දක් නොඅසන ලද්දේය. මුත්තනි මුත්තනුවන් අතින් මෙබන්දක්

නොඅසන ලද්දේය, එක් ආයෂ්යකු විසින් බොජුන්හල්දෙර කැවුම් පිණිස හැඟීමක් කරනලද්දේය. දැන් මෙතැන් පටන් ආයෂ්යෝ තමතමන්ගේ සිතට අනුරූපවූවක් කියත්වා. අපටද එය සැපවිහරණය වන්නේයයි කීයේය. මහාස්ථවිර තෙමේ එයින්ම නැවතුනේය. එක් මහණකු විසිනුදු කැවුම් නොගන්නාලද්දේය. මෙසේ පෙර එයින් උපන් දෙය නොවැළඳූහ. එහෙයින් 'සැහැල්ලුබව නොහරින්නාවූ අප්‍රමත්ත මහණුහු විසින් කැපයෙහිද ආමිෂය පිණිස ලොල්බව නොකටයුතුය. තටාකයෙහි යම් මේ ක්‍රමයෙක් කියනලද්දේද, පොකුණුදිය උසුලා සිටින ඇල් ආදියෙහිද මෙමනය වේ. හැලි ආදිය හා මුං ආදියද උක් එලාවලාදියෙහි හටගැණීමට සථානවූ යම් කිසිකෙතක් හෝ වත්තක් හෝ දෙමියි කියූ කල්හිද නොවටීයයි ප්‍රතික්ෂෙප කොට තටාකයෙහි කියනලද නයින්ම යම් කලෙක්හි කැපවහරින් සිවුපස පරිභොගය පිණිස දෙම්'යි කියාද එකල්හි පිළිගත යුතුය. 'වනය දෙම්, අරණ්‍යය දෙම්'යි කියූ කල්හි වටියි. ඉදින් මිනිස්සු මහණුන් විසින් නොඅණවනලද්දහුම එහි රුක් සිඳ මුං ආදිය සපයා මහණුන්ගේ කොටස දෙත්නම් වටියි. නොදෙන්නාහු චොදනා නොකොට යුත්තාහ. කිසි අනතුරකින් ඔවුන් ගිය කල්හි අන්‍යයෝ කෙරෙත්ද, මහණුන්ට කිසිවක් නොදෙත්ද, ඔවුහු වැළකිය යුත්තාහ. 'ස්වාමීනි' පෙරද මිනිස්සු මෙහි සස්‍යයන් කළාහු නොවෙත්දැ'යි කියත්ද, අනතුරුව ඒ මිනිස්සු සඞ්ඝයාහට මේ මේ කැප භාණ්ඩය දුන්හ'යි කියයුත්තාහ. අපිදු දෙන්නෙමුයි කියත්ද, මෙසේ ඇතිකල්හි වටියි. සස්‍ය උපදින කිසි බිම් පෙදෙසක් සඳහා සීමාවක් දෙමුයි කියත්ද වටියි. සීමාව පිරිසිඳීම පිණිස ටැම් හෝ පහන් හෝ තමන් විසින් නොතැබිය යුත්තාහ. කුමක් හෙයින, යත්:- භූමිය අනර්ඝවන්නීය. ස්වල්පයකිනුදු පාරාජික වන්නේය. 'අපගේ සීමාතොමෝ මෙතැනින් ගියා'යි ආරාමිකයන්ට කියයුතුය. ඒ ආරාමිකයෝ වැඩියක් ගණිත්නම්, ගණිවූ නොකියා සීමාව ගියා'යි පයෂ්‍යායයෙන් කියූ බැවින් ඇවැත් නොවේ. රාජරාජ මහාමාත්‍යාදීහු තුමූම ටැම් තබ්බවා සිවුපසය පරිභොග කළ මැනැව'යි කියා දෙත් නම් පිළිගැණීම සුදුසුය. කිසිවෙක් සීමාව තුළ තටාකයක් හෝ කණිද, වෙහෙරෙ මැදින් ඇලක් ගෙණයේද, චෛත්‍යාඞ්ගන බොධ්‍යඞ්ගනාදිය දූෂිත කෙරේද, වැළකිය යුතුය. සඞ්ඝතෙමේ කිසිවක් ලැබ ආමිසගරුක බැවින් නොවළකාද එක් මහණෙක් වළකාද, ඒ මහණතෙමේ එහි ඊශ්වරවේ. එක් මහණෙක් 'තෙපි නොම කරවු'යි නොවළකාද තෙපි ගෙණයවු'යි ඔවුන්ටම පක්ෂවේද, සඞ්ඝ තෙමේ වළකාද එකල්හි සඞ්ඝ තෙමේම ඊශ්වර වේ. සඞ්ඝිකකර්මාන්තයන්හි යමෙක් ධාර්මිකකාර්මාන්ත කෙරේද හෙතෙමේ ඊශ්වර වේ. වළකාලනු ලබන්නේත් කෙරේද, යටින් ගත් පස් යට බහා උඩින් ගත් පස් උඩ බහා පිරවිය යුතුය.

කිසිවෙක් හටගත් පරිදිම වූ උක් හෝ උඳු මුං ආදියක් හෝ ලබා කොමඬු ආදීවූ වැල්ඵලයක් හෝ දෙනු කැමැතිව මේ සියලු උක්කෙත හෝ උඳුමුං ආදි වත්තක් හෝ වැල්ඵලා වත්තක් හෝ දෙමියි කියාද, වස්තුව සමග පරාමර්ෂණය කළ බැවින් නොවටීයයි මහා සුමමස්ථවිරයන් වහන්සේ කීහ. මහාපදුම ස්ථවිරයන් වහන්සේ "මේ වචනමාත්‍රයෙක්මය. ඒ භූමිභාගය හිමියන්ගේම වේද, එහෙයින් වරද නැතැ"යි කීහ. 'දසයකු දෙමි'යි කියාද, පිළිගැණීම සුදුසු නොවේ. 'ආරාමිකයකු දෙමි, වතාවත් කරන්නකු දෙමි. කැපකරුවකු දෙමි'යි කියූකල්හි පිළිගැණීම කළයුතුය. ඒ ආරාමික තෙමේ පෙරබතද පසුබතද සඞ්ඝයාගේම කර්‍ම කෙරේද, හෙරණහට මෙන් ඔහුගේ සියලු බෙහෙත් පිළිදැගුම්ද කටයුතුය. පෙරබතම සඞ්ඝයාගේ කර්‍ම කෙරේද, පසුබත තමන්ගේ කර්‍ම කෙරේද, එහෙයින් සවස වැටුප නොදිය යුතුය. යම් කෙනෙක් පස් දවස් වාරයෙන් හෝ පක්ෂදිනවාරයෙන් හෝ සඞ්ඝයාගේ කර්‍ම කොට සෙසු කාලයෙහි තමන්ගේ කර්‍ම කෙරෙත්ද, ඔවුන්ටද කර්‍ම කරනකාලයෙහිම බත්ද වැටුප්ද දියයුතුය. සඞ්ඝයාගේ කර්‍මයෙක් නැත්තේ නම් තමන්ගේමම කර්‍මකොට ජීවත් වෙත්ද, ඒ ආරාමිකාදීහු අත්කම් මිල ගෙණ අවුත් දෙත් නම් ගතයුතුය. නොදෙත්නම් කිසිවක් නොකියයුතුය. යම්කිසි රදදසයකු නමුදු පෙසකාරදසයකු නමුදු ආරාමිකනාමයෙන් පිළිගත හැකිය. ගවයන් දෙමු'යි කියත්ද ඒ නොවටීයි වැළක්විය යුතුය. 'මේ ගවයෝ කොයින්දැ'යි විචාළ කල්හි තුවණැතියන් විසින් පස්ගෝරස වළඳනු පිණිස දෙන ලදහ. කීකල්හි අපිදු පස්ගෝරස වැළඳීම පිණිස දෙමුයි කියූකල්හි වටීත්. එළු ආදීන් කෙරෙහිද මෙම නයවේ. ඇතකු දෙමු, අසකු දෙමු, කුකුළකු දෙමු, ඌරකු දෙමු'යි කියත්ද පිළිගැණීම නොවටියි. ඇතැම් මිනිස්සු 'ස්වාමීනි' ඔබවහන්සේලා අල්පොත්සාහ ඇත්තාහු වවු, අපි මොවුන් ගෙණ තුඹවහන්සේලාට කැප භාණ්ඩ දෙන්නෙමු'යි ගණීත් නම් වටියි. කුකුළෝ ඌරෝ සුවසේ ජීවත් වෙත්වා'යි වනයෙහි හැරලෑම සුදුසුය. මේ පළාත මේ කෙත මේ වත්ත විහාරයට දෙමු'යි කියූ කල්හි වළකාලීමට නොලැබෙන්නේය. මෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදයද ෂඩ්සමුත්ථානිකය ක්‍රියාය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

රාජශික්ෂාපදවර්‍ණනාව නිමි.

ප්‍රථම චීවර වර්‍ගයද නිමියේය.

——\\——

'**තෙන සමයෙන**'යි කොසිය ශික්ෂාපදයයි. එහි '**සන්ථරිත්වා කතං හොති**' සම බිම මතුමතුවෙහි කොසිය අංසු අතුරා කැඳ ආදියෙන් ඉස කරනලද්දේවේ. '**එකෙනපි කොසියංසුනා මිස්සෙත්වා**' යනු තමාගේ රුචිය වසයෙන් මිශ්‍ර කරනලද්දෙක් තිබේවා. ඉදින් ඒ ඇතිරිය කරන තැන වාතය තෙමේ එක් කෑම්හුයක් ගෙණ හෙලාද, මෙසේද මිශ්‍රකොට කරනලද්දේම වේයයි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. මේ ශික්ෂාපදය කායාදි ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

කොසිය ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන**'යි සුද්ධකාළකශික්ෂාපදයයි. එහි '**සුද්ධකාළකානං**' යනු ශුද්ධවූ කාලවර්ණවූ අන්හු හා මිශ්‍රනොවූ කාලවර්ණ ඇත්තාවූ යන අර්ථයි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීහුද කොසිය ශික්ෂාපදය සමානම වෙත්.

සුද්ධ කාළක ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන**'යි ද්වෙභාගශික්ෂාපදයයි. එහි '**අනොත ආදියත්වා**' යනු ඇතිරියෙහි කෙළවර තුවාව මෙන් දක්වා සුදුපැහැති රෙදිකඩක් අලවා '**ද්වෙභාගා**' දෙකොටසක්. '**ආදාතබ්බා**' ගතයුතුය. **ගොචරියානං** කිඹුල්වන් එළකලොමයන්ගෙන්. '**ද්වෙ තුලා ආදාතබ්බා**' සතරතුලාවකින් කරවන්නට කැමැතිබව සඳහා කියනලදී. අර්ථවශයෙන් වනාහි යම් පමණ එළුලොමින් කරනු කැමැත්තේ වේද, ඒ එළුලොම් අතුරෙහි කලු එළුලොමින් දෙකොටසෙක සුදු එළුලොමින් එක් කොටසෙක. කිඹුල්වන් එළුලොමින් එක් කොටසෙකැයි මෙම ප්‍රමාණය දක්වන ලදැයි දතයුතුය. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීහු කොසිය ශික්ෂාපදය සමානම වෙත්. හුදෙක් මේ ඇතිරිය ගෙණද නොගෙණද කරන හෙයින් ක්‍රියාක්‍රියයි දතයුතුය.

ද්වෙභාග ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

**'තෙන සමයෙන'** යි ෂඩ්වර්ෂ ශික්ෂාපදයයි. **'ඌහදන්තිපි උම්මිහන්තිපි'** යනු ඇතිරි මතුවෙහි වර්චස්ද මූත්‍රද කෙරෙත්යි කියන ලද්දේවේ. **'දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සන්ථතසම්මුති'** යනු මෙසේ ලද සම්මුති ඇති මහණතෙමේ යම්තාක් රෝගය නොසන්සිදේද, ඒතාක් යම් යම් තැනකට යේද, ඒ ඒ තන්හි ඇතිරියක් කරන්නට ලබන්නේය. ඉදින් නීරෝගීව නැවැත මුල් ව්‍යාධියෙන්ම ගිලන්වේද ඒම පරිහාරයවේ. එහි අන්‍යවූ සම්මුති කෘත්‍යයෙක් නැතැ'යි ඵුස්සදෙව ස්ථවිරයන් වහන්සේ කීහ. උපතිස්ස ස්ථවිරයන් වහන්සේ 'ඒ ව්‍යාධිය හෝ නැවැත කිපේවා, අන්‍යවූ ව්‍යාධියෙක් හෝ කිපේවා, වරක් ගිලන්යි නම් ලද්දේද? ලද්දේමය. නැවැත සම්මුතිකෘත්‍යයෙක් නැතැ'යි කීහ. **'ඔරෙන වෙ ඡන්නං වස්සානං'** යනු ෂඩ් වර්ෂයක්හුගේ මෑතභාගයෙහි ඇතුළතය යන අර්ථයි. පදභාජනයෙහි වනාහි සඞ්ඛ්‍යාමාත්‍රයක් දක්වනු පිණිස **'ඌනකඡබ්බස්සානි'** යි වදරනලදී. **'අනාපත්ති ඡබ්බස්සාකරොති'** යම් කලෙක සවස පිරුනේවේද, එකල්හි ඇතිරිය කෙරේද එහි අනාපත්තියයි දෙවන පදයෙහිද යම් කලෙක අතිරෙක ෂඩ්වර්ෂයෙක් වේද, එකල්හි කෙරේයයි මෙය අර්ථ දතයුතුය. හෙතෙමේ ෂඩ්වසය තුළ නොකෙරේයයි දතයුතුය. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීහු කොසිය ශික්ෂාපදය සමානම වෙත්.

ඡබ්බස්ස ශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

**'තෙන සමයෙන'** යි නිසීදනසන්ථත ශික්ෂාපදයයි එහි **'ඉච්ඡාමහං භික්ඛවෙ'** භාග්‍යවතුන් වහන්සේ වනාහි තමන් විවේකයට පැමිණි ඒ තෙමස මුළුල්ලෙහි කිසි අවබෝධ කට හැකි සත්වයකු නොදුටුසේක. එහෙයින් මෙසේ වදළ ස්ක. මෙසේ ඇති කල්හිදු පාළි විසින් ධර්මදේශනා කටයුතු වන්නීය. යම්හෙයකින් මේ භාග්‍යවතුන් වහන්සේහට 'මා අවකාශ කරවා චිත්තවිවේකයෙන් යුක්ත කල්හි භික්ෂූහු අධාර්මික කතිකාවතක් කරන්නාහ. එය උපසෙන තෙමේ බිදින්නේය. මම ඔහුට පැහැද භික්ෂූන්ගේ දැකීම අනුදන්නෙමි, එයින් මා දක්නා කැමැති බොහෝ භික්ෂූහු ධූතාඞ්ග සමාදන් වන්නාහ. මමද ඒ භික්ෂූන් තැන තැන දැමූ නිසීදන සන්ථතය කරුණු කොට ශික්ෂාපදය පණවන්නෙමි. මෙබඳු සිතෙක් වූයේද, එහෙයින් 'එවං බහුනිහි එත්ථ ආතිසංසානි'යි මෙසේ වදළසේක. **'සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි'** උපසෙන වඞ්ගන්තපුත්‍ර ස්ථවිර තෙමේ වනාහි 'න භික්ඛවෙ ඌනදසවස්සෙන උපසම්පාදෙතබ්බො, යො උපසම්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස' යන මේ බන්‍ධකශික්ෂාපදයෙහි 'කථං හි නාම ත්වං

මොඝපුරිස' අඤ්ඤෙහි ඔවදියො අනුසාසියො අඤ්ඤං ඔවදිතුං අනුසාසිතුං මඤ්ඤිස්සසි' යන මේ ආදි නයින් ගැරහුම් ලබා 'ශාස්තෘන්වහන්සේ මාගේ පිරිස නිසා ගර්හා කළසේක. ඒ මම දැන් ඒ කරුණෙන්ම භාග්‍යවතුන් වහන්සේ ලවා පුත්සඳමෙන් සශ්‍රීකවූ සර්වාකාර පරිපූර්ණ වූ ශ්‍රී මුඛයෙන් බමගොස් විදුරුවවා පිරිසම නිසා සාධුකාර දෙවන්නෙමි'යි මනාසිත් ඇති කුලපුත්‍ර තෙමේ යොදුන් සියයකින් වැඩිතැන නැවතී පිරිස හික්මවාගෙණ පන්සියයක් පමණ භික්ෂූන් විසින් පිරිවරනලදුව භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹෙනුයේ 'සපරිසො යෙන භගවා තෙනුපසඞ්කමි'යි එහෙයින් කියනලදී. ව්‍රතසම්පත්තිය හැර අන් අයුරකින් බුදුවරයෝ සතුටු කරන්නට නොහැක්කාහ. '**භගවතො අවිදූරෙ නිසීනො**' ව්‍රතසම්පත්තිය පිරිසිදු බැවින් කඳුන්පව්වට සිංහයකු මෙන් නිසැකව භාගවතුන් වහන්සේට නොදුරු තැනෙක්හි හුන්නේය. '**එතදවොච**' කථාව උපදවනු පිණිස මේ වචනය වදළසේක.

'**මනාපානි තෙ භික්ඛු පංසුකූලානි**' මහණ 'තාගේ පංසුකූලයෝ මනාපයහ. තමාගේ රුචියෙන් කැමැත්තෙන් ගන්නාලදහ යන අර්ථයි. '**න ඛො මෙ භන්තෙ මනාපානි**' යනු ස්වාමීනි' මා විසින් තමාගේ රුචියෙන් නොගන්නා ලදහ. ගලග්‍රාහයෙන් මෙන් මස්තකතාඩනයෙන් මෙන් ගන්නා ලද්දෙමියි දක්වයි. '**පඤ්ඤායිස්සති**' ප්‍රකටවූයේ, වෙසෙසින් ප්‍රසිද්ධ වූයේ වන්නේය. එහි දක්නාලැබේයයි කියනලද්දේවේ. '**න මයං අපඤ්ඤත්තං පඤ්ඤපෙස්සාම**' ශ්‍රාවකවූ අපි නම් නොපණවනලද්දක් නොපණවන්නෙමු. යම්මේ පාචිත්තියය දුක්කටයයි ආදි නයින් නොපණවනලද ශික්ෂාපද පැණවීම, පණවනද ශික්ෂාපද සමූහනය යන මෙය බුද්ධවිසයමවේ. '**සමාදය**' ඒ ශික්ෂාපදය සමාදන්ව 'සාධු සුට්ඨු'යි පිළිගෙණ පැණවූ පරිදි සියලු ශික්ෂාපදයන්හි හික්මෙන්නෙමු'යි දක්වාලන්නේය. භාග්‍යවතුන්වහන්සේ ඔහු විසින් සතුටුකළ සිත් ඇතිසේක් නැවැතද යහපත, යහපතැයි සාධුකාර දුන්සේක. '**අනුඤ්ඤතාවුසො**'යි ඇවැත' අනුදන්නාලද්දේය. '**පිහෙන්තා**' පතන්නාහු '**සන්ථතානි උජ්ඣිත්වා**' යනු ඇතිරියෙහි චතුර්ථචීවරය යන සංඥ ඇති බැවින් සියලු ආස්තරණ උදුරා '**ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි**' භාග්‍යවතුන් වහන්සේ විසුරුනු ආස්තරණ දැක ශ්‍රද්ධාවෙන් දෙනලද්දහුගේ විනිපතනයෙහි කාරණයෙක් නැත්තේය. පරිභොගුපායය ඔවුන්ට දක්වන්නෙමි'යි දැහැමි කතා කොට භික්ෂූන් ඇමැතුසේක. '**සකිං නිවත්ථම්පි සකිං පාරුතම්පි**' වරක් හුන්නකුද වරක් හොත්තකුද '**සමන්තා**' එක් පසකින් වටයක් හෝ සිවුරැසක් හෝ සිඳහැර ගත් තැන යම්සේ වියතක් පමණවේද, එසේ ගතයුතුය. අතුරන්නහු විසින් වනාහි පෙළෙහි කියූ නයින්ම එක් දෙසක

හෝ ඇතිරිය යුතුය. අවුල් හැර හෝ මිශ්‍ර කොට හෝ ඇතිරිය යුතුය. මෙසේ කල්හි ස්ථිරතර වේ. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. මේ ශික්ෂාපදයාගේ සමුත්ථානාදීහු ක්‍රියාක්‍රිය බැවින් ද්වෛභාග ශික්ෂාපදය සමානවෙත්.

තිසීදනසන්ථත ශික්ෂාපදවර්ණනාව නිමි

—\\—

(මේ පස්වැදෑරුම් ආස්තරණයන් අතුරෙහි පළමු තුන විනයකර්ම කොට පිළිලැබ පරිභොග කිරීම නොවටියි. පසුදෙක වටීයයි දතයුතුය.)

—\\—

**'තෙන සමයෙන'** එළකලොම ශික්ෂාපදයයි. එහි **'උප්පණ්ඩෙසුං'** යනු ස්වාමීනි', කොපමණකින් මිලදී ගන්නා ලද්දහුදැ'යි යනාදිය කියමින් අපහාස කළාහුය. **'ඨිතකොව ආසුම්භි'**යි සිතිස්සු වනයෙන් මහත් දැවබරක් ගෙණවුත් වෙහෙසට පත්වූවාහු සිටියාහුම යම්සේ හෙලත්ද, එසේ හෙලූයේය යන අර්ථයි. **'සහත්ථා'** සිය අතින් තමා විසින් ගෙණ යායුත්තාහයි කියනලද්දේවේ. **'බහි තියොජනං පාතෙති'** තුන් යොදුනකින් පිටත හෙලයි. අනතුරක් නැතිව වැටෙන එළුලොම් අතින් මිදුනු ඇසිල්ලෙහි ලොම් ගණනින් නිස්සග්ගිය පාචිත්තීහුවෙත්, ඉදින් තුන් යොදුනකින් පිටත රුකෙක හෝ ටැඹෙක හෝ වැදී නැවැත ඇතුළත වැටෙත්ද, ඇවැත්නොවේ. බිම වැටී සිට සිට පෙරළෙන්නාවූ එළුලොම් පොදිය නැවැත ඇතුළතට වදීද, ඇවැත්මය. ඇතුළත සිට අතින් හෝ පයින් හෝ යටියෙන් හෝ පෙරළාද සිට හෝ නොසිට හෝ පෙරළෙන පොදිය යේවා, ඇවැත්වේමය. අනිකෙක් ගෙණ යන්නේයයි තබාද, ඔහු විසින් ගෙණගිය කල්හිද ඇවැත් වේමය. පිරිසිදු සිතින් තබන ලද්දක් වාතය හෝ අනිකෙක් හෝ තමාගේ ධර්මතාවෙන් පිටත හෙලාද ඇවැත් වේමය. එසේ වනුයේ තුන් යොදුන ඉක්මවීමෙහි උත්සාහසහිත බැවින් හා ශික්ෂාපදය අචිත්තකබැවිනි කුරුන්දි ආදියෙහි වනාහි මෙහි අනාපත්තියි කියනලදි. ඒ අනාපත්ති තොමෝ පෙළහා සම නොවේ. යුගවිසින් බැඳි පොදියක් ඒකාබද්ධ කොට එක් පොදියක් සීමාතුළ එක් පොදියක් සීමාවෙන් පිටත කරමින් තබාද ඒතාක් රැකේ. එකාබද්ධ කදෙහිද මේ නයමවේ. ඉදින් නොබැඳ කදෙහි කෙළවර තැබූ මාත්‍රයෙක්ම වේද, නොරැකේ. එකාබද්ධයද පෙරළා තැබූ කල්හි ඇවැත්වේමය.

'**අස්සාදස්ස යානෙ වා**' මෙහි ගමන්ගත් යානාවක හෝ ඇතුපිට ආදියෙහි හෝ හිමියා නොදනිත්ම ගෙණ යන්නේයයි තබාද ඒ එළු ලොම් තුන් යොදුන ඉක්මවූ කල්හි ඇවැත්වේ. එන කල්හිදු මෙම නයවේ. ගමන් නවතා සිටි යානාවක හෝ ඇතුපිට ආදියෙහි හෝ තබා නැගී ගමන් කරවාද, බිමින් හෝ යන්නේ මෙහෙයාද, කැඳවමින් හෝ ලුහුබඳවාද, අනිකකු ලවා ගෙණ යවාදැ,යි කී බැවින් ඇවැත් නොවේ. කුරුන්දි ආදියෙහි වනාහි ඇවැතැයි කියනලදී. ඒ කීම 'අනිකකුලවා ගෙණ යවාද, යන මෙය හා සම නොවේ. අදින්නාදනයෙහි වනාහි සුඞ්කඝාතස්ථානයෙහිලා ඇවැත්වේ. එහි යම් ඇවැතක්වේද, මේ ශික්ෂාපදයෙහි ඕ ඇවැත් නොවේ. මෙහි යම් ඇවැතක් වේද, ඕ එහි ඇවැත් නොවේ. ඒ සුඞ්කඝාතස්ථානයට පැමිණ අන්‍යවිහිතවූයේ හෝ සොරු ආදීන් විසින් උවදුරු කරනලදුයේ හෝ යේද ඇවැත්මය. හැම තන්හි ලොම් ගණනින් ආපත්තිපරිච්ඡෙදය දතයුතුය. '**වාසාධිප්පායො ගන්ත්වා තතො පරං හරති**'යි විසයැටිවූයේ ගොස් ඉන් මත්තෙහි ගෙණයේ නම්, යම් තැනෙක ගියේවේද, එහි උදෙසීම් පිළිවිසීම් ආදිය හෝ ප්‍රත්‍යයයන් හෝ නොලැබීමෙන් එයින් මතුවෙහි අන් තැනක යේද එතැනින් අන් තැනකැයි මෙසේ යොදුන් සියයකුදු ගෙණයන්නහුට ඇවැත්නොවේ. '**අච්ඡින්නං පටිලභිත්වා**' සොරු පැහැරගෙණ නිරත්ථකභාවය දැන නැවැත දෙත්ද, ඒ ලොම් ගෙණයන්නහුට ඇවැත්නොවේ. '**නිස්සට්ඨං පටිලභිත්වා**' විනයකර්‍ම කරනලද්දක් පිළිලැබ, යන අර්ථයි. '**කටභණ්ඩං**' කම්බිලි කොඳුපලස් ඇතිරි ආදීවූ යම්කිසි කරනලද භාණ්ඩයක් යටත් පිරිසයින් හුයින් බැදි පමණ ඇත්තක් හෝ වේද එහිද ඇවැත් නොවේ. යම් මහණෙක් තෙමේ තුනීවූ පාපසුම්බි අතුරෙහි හෝ එල්බගන්නා රෙදිපටි අස්වැටි කාබාන් ආදීන් අතුරෙහි හෝ කතුරුයට ආදියෙහි මලරකිනු පිණිස කතුරු කොසයෙහි හෝ යටත් පිරිසයින් වාතාබාධ ඇත්තෙක් කන් සිදුරෙහිද ලොම් බහායේද ඇවැත්මය. හුයින් බැද බහනලද්ද කෘතභාණ්ඩස්ථානයෙහි සිටියි. වැටි කොට ගෙණයේද, මේ නිදනමුඛ නම. කළභාණ්ඩ සඞ්ඛ්‍යාවටයේ. ඇවැත් වේමය. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීන් අතුරෙහි මේ ශික්ෂාපදය එළකලොමසමුත්ථාහිකය. කයින්ද, කායචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකයි. ප්‍රඥප්තිවද්‍යයි. කායකර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

එළකලොම ශික්ෂාපදවර්‍ණනාව නිමි.

—\\—

**'තෙන සමයෙන'**යි එළකලොම ධොවාපන ශික්ෂාපදයයි. එහි **'රිඤ්චන්ති'** හරිත්. බැහැර කෙරෙත්. විචාරන්නට නොහැකිවෙත්යි කියනලද්දේවේ. මෙහි සෙස්ස සමුට්ඨානාදිය සමග පුරාණචීවර ශික්ෂාපදයෙහි කියූ නය ඇත්තේමය.

එළකලොම ධොවාපනශික්ෂාපදවර්ණනාව නිමි.

—||—

**'තෙන සමයෙන'**යි රූපිය ශික්ෂාපදයයි. එහි **'පටිවිංසො'** යනු කොටසයි. **'ජාතරූපරජතං'** එහි 'ජාතරූපරජතං' යනු ස්වර්ණයට නමෙකි. යම්හෙයකින් එය තථාගතයන් වහන්සේගේ පැහැය සමානවේද? එහෙයින් **'සත්ථුවණ්ණො වුච්චති'**යි පදභාජනයෙහි වදාරනලද්දේය. ශාස්තෘවර්ණය වැනි වර්ණය ඇති යම් ලොහ විශෙෂයෙක්වේද, මේ ලොහය ජාතරූප නම. රජතය වනාහි සක් මැසිරිගල් පබළු, රිදී, රත්රන් යනාදිතන්හි රිදීයයි කියනලදී. මෙහි වනාහි ව්‍යවහාරයට යායුතුවූ කහවණු ආදී යම්කිසිවක් අදහස් කරනලදී. එහෙයින්ම මෙයට පදභාජනයෙහි **'කහාපණො ලොහමාසකො'** යනාදිය වදාරන ලදී.

එහි **'කහාපණො'** රන්මුවා කහවණු හෝ රිදීමුවා කහවණු හෝ පියවි කහවණු හෝය. **'ලොහමාසකො'** තඹලෝ ආදියෙන් කළ මස්සය. **'දරුමාසකො'** හරදැවයෙන් හෝ හුණපතුරෙරන් හෝ යටත් පිරිසයින් තල්පතෙක්හිදු රුවක් සිඳ කරනලද මස්සය. **'ජතුමාසකො'** ලාකඩින් හෝ මැලියමින් හෝ රුවක් නගා කරනලද මස්සය. **'යෙ වොහාරං ගච්ඡන්ති'** මේ පදයෙන් යමෙක් යමෙක් යම් ජනපදයෙක්හි යම් යම් කාලයෙක්හි ගණුදෙනුවට යේද, ඒය. යටත්පිරිසයින් ඇටවලින් කරනලද්දවූද, සම්වලින් කරනලද්දවූද, සියඹලා ආදීවූ වෘක්ෂයන්ගේ එලබිජුවටින් කරනලද්දවූද නැගු රූප ඇත්තාවූද නොනැගු රූප ඇත්තාවූද සියල්ලද මෙහි සඞ්ග්‍රහ කරනලද්දේය.

මෙසේ රජත ජාතරූප ජාතරූපමාසක යන මේ සියල්ලද කියූ හෙද ඇති රජතමාසකය යන සියල්ලද සිවුවැදෑරුම්වූ නිස්සග්ගිය වත්ථුවේ මුතු, මැණික් සක් සිලා පබළු, පියුම්රාමිණි, මැසිරිගල්, සප්තවිධධාන්‍ය, දැසිදස් කෙත්වත් මල්වතු ගෙඩිවතු යනාදීහු දුක්කටවත්ථුහුය. හූ හීවැල පිළී කපුද, නන්වැදෑරුම්වූ අපරණ්‍ය (විවිධ ධාන්‍ය වර්ග) ගිතෙල්, වෙඬරු, තෙල්, මී, සකුරු ආදී බෙහෙත්ද කප්පියවත්ථුය.

එහි නිස්සග්ගියවස්තු තමාට ප්‍රයොජනය පිණිස හෝ සඞ්ඝ ගණ පුද්ගල චෛත්‍ය යන මොවුන්ට ප්‍රයොජන පිණිස හෝ පිළිගන්නට නොවටියි. තමන්ගේ ප්‍රයොජනය පිණිස පිළිගන්නාහුට නිස්සග්ගියපාචිත්තිය වේ. සෙස්සන්ගේ ප්‍රයොජනය පිණිස දුක්කටවස්තු පිළිගන්නාහුට දුක්කටයම වේ. කප්පියවස්තු පිළිගැණීම නිමිතිකොට ඇවැත් නොවේ. තැන්පත් කොට තබනු පිණිස භාණ්ඩාගාරික ශීෂ්‍යයෙන් සියල්ලද පිළිගන්නාහුට මත්තෙහි රතනශික්ෂාපදයෙහි ආලෙසින් පාචිත්තිය වේ.

'**උග්ගණ්හෙය්‍ය**'යි ගන්නේය. යම්හෙයකින් වනාහි ගන්නේ ඇවැතට පැමිණේද එහෙයින් මේ පදය පිළිබඳ පදභාජනයෙහි '**සයං ගණ්හාති නිස්සග්ගියං පාචිත්තියං**'යි වදරනලදී. සෙසු පදයන්හි ද මේ නයවේ.

එහි රන්රිදී බඩු අතුරෙහිද කහවණු මසු අතුරෙහිද එකක් ගන්නාහුටද ගන්වන්නාහුටද එක් ඇවැතක්වේ. දහසක් නමුදු එකට ගණීද, ගන්වාද වස්තු ගණනින් ඇවැත්වේ. මහාපච්චරියෙහිද කුරුන්දියෙහිද ලිහිල් කොට බඳනාලද පසුම්බියෙහිද ලිහිල් කොට පුරවනලද බඳුනෙහිද රූ ගණනින් ඇවැත්වේ. ඝන කොට බඳිනලද්දෙහිද ඝනකොට පුරවනලද්දෙහිද, පසුම්බි බඳුන් නිමිති කොට එක්ම ඇවැතක් වේයයි කියනලදී. වෙත තැබූවක් ඉවසීමෙහි 'මේ මසු කහවණු ආයෂ්‍යාහට වේවායි කීකල්හි සිතින් ඉවසා නම් ගණු කැමැත්තේ වේනම් කයින් හෝ වචනයෙන් හෝ මේ මසු කහවණු කැප නොවේයයි ප්‍රතික්ෂේප කෙරේනම් ඇවැත් නොවේ. කය වචන දෙකින් හෝ ප්‍රතික්ෂෙප නොකොටද පිරිසිදු සිත් ඇතිව මේ මසු කහවණු අපට කැප නොවේයයි නොඉවසා නම් ඇවැත් නොවේමය. තුන් දෙරින් වනාහි යම්කිසි දෙරකින් ප්‍රතික්ෂේප කරනලද්ද ප්‍රතික්ෂේප කරනලද්දේමවේ. ඉදින් කයවචන දෙකින් ප්‍රතික්ෂෙප නොකොට සිතින් ඉවසාද, කයවචන දෙකින් කටයුතු ප්‍රතික්ෂේපය නොකරන බැවින් අක්‍රියසමුත්ථාන වේ. කායද්වාරයෙහි හා වාග්ද්වාරයෙහිද ඇවැතට පැමිණේ. මනොද්වාරයෙහි නම් ඇවැතක් නැත්තේය. එකෙක් මසුකහවණු සියයක් හෝ දහසක් හෝ 'මෙය යුෂ්මත්හට වේවා'යි පාමුල තබාද මහණ තෙමේ මෙය කැප නොවේය'යි පහ කෙරේද, එකල්හි උපාසක තෙමේ 'මා විසින් ඔබවහන්සේලාට පරිත්‍යාග කරනලදැ'යි යේද, එවිට අනිකෙක් එහි අවුත් 'ස්වාමීනි' මේ කිමැ'යි විචාරාද ඔහු විසිනුත් තමා විසිනුත් යමක් කියන ලද්දේද, ඒ කියනලද්ද කියයුතුය. ඉදින් හෙතෙමේ 'ස්වාමීනි' ආරක්ෂා කරන්නෙමු, රක්නා තැනක් දක්වනු මැනැවැයි කියාද, සත්මහල් පහයකට හෝ නැගී මේ රක්ෂාස්ථානයයි කියයුතුය. 'මෙහි තබව'යි නොකිය යුතුය. මෙපමණකින් කැපයද අකැපයද තිසා සිටියේ වේ. (මනාවිචාරීමෙන් උපන් ප්‍රත්‍යය

පරිභොගය කැපය නිසා සිටියේය.නොමනා විචාරීමෙන් උපන් ප්‍රත්‍යය පරිභොගය අකැපය නිසා සිටියේයයි දතයුතුය.) දෙර පියා රකින්නහු විසින් විසිය යුතුය. ඉදින් විකිණිය යුතුවූ කිසි භාණ්ඩයක් පාත්‍රයක් හෝ සිවුරක් හෝ ගෙණ ඒද, 'ස්වාමීනි' මෙය ගණු මැනැවැ'යි කියූ කල්හි 'උපාසක' අපට මෙයින් ප්‍රයොජන ඇත්තේය. මෙ බඳු වස්තුවක්නම් ඇත්තේය.කැපකරුවෙක් නැත්තේය'යි කියයුතුය. ඉදින් හෙතෙමේ 'මම කැපකරු වන්නෙමි' දෙර හැර දෙනු මැනැවැ'යි කියා නම් දෙර ඇර 'මේ අවකාශයෙහි තුබූයේය'යි කිය යුතුය. 'මෙය ගණුව'යි නොකිය යුතුය. මෙසේද වූ කල්හි කැපයද අකැපයද නිසා සිටියේම වේ. හෙතෙමේ එය ගෙණ ඒ මහණුහුට කැප බඩුවක් දේනම් වටියි. වැඩියක් ගණීනම් 'අපි තොපගේ භාණ්ඩය නොගණුම්හ'. බැහැර යවයි කියයුත්තේය.

**'සඞ්ඝමජ්ඣෙ නිස්සජ්ජිතබ්බං'** මෙහි යම්හෙයකින් රිදී අකැප නම්වේද, එහෙයින් නිස දිය යුතුය. සඞ්ඝයාට හෝ ගණයාට හෝ පුද්ගලයාට හෝයි නොකියනලදි. යම්හෙයකින් ඒ රිදිය පිළිගත් පමණක්ම වේද, ඔහු විසින් කිසි බඩුවක් මිලදී නොගන්නා ලද්දේද, එහෙයින් උපායයෙන් පරිභොගය දක්වනු පිණිස සඞ්ඝයා මැද නිස දිය යුතුයයි කියනලදි. **'කප්පියං ආචික්ඛිතබ්බං සප්පිං වා'** 'උපාසක' පැවිද්දන්ට ගිතෙල් හෝ තෙල් හෝ වටීයයි කහවණු පිළිගත් මහණුහු විසින් ඒ කහවණු සඟමැද නිස දුන් කල්හි එහි පැමිණියකු විසින් මෙයින් කුමක් ගෙණෙම්දැ'යි විචාරණ ලදුව මෙසේ කිය යුත්තේය. **'රූපියපටිග්ගාහකං ඨපෙත්වා සබ්බෙහෙව පරිභුඤ්ජිතබ්බං'** කහවණු පිළිගන්නහු හැර සියල්ලන් විසින් ඒ මිලදී ගෙණෙන ලද ද්‍රව්‍යය බෙද පරිභොග කටයුතුය. රිදිය පිළිගන්නහු විසින් තමාගේ කොටස නොගතයුතුය. අන් මහණුන්ට හෝ ආරාමිකයන්ට හෝ පැමිණි කොටසද ලැබ පරිභොග කිරීමද නොවටියි. යටත් පිරිසයින් වඳුරු ආදීන් විසින් අන්හට පැමිණි කොටසින් ගෙණවුත් වනයෙහි තබනලද්දක් හෝ ඒ වඳුරු ආදීන්ගේ අතින් ගිලිහී වැටුනක් හෝ තිරශ්චීනපරිගෘහිතද පංසුකූලද පිළිගැණීම නොසුදුසුය. ඒ පිළිගත් මිලයෙන් ගෙණනලද උක් සකුරුයෙන් සෙනාසන ධූපනයද නොවටියි. ගිතෙලින් හෝ තෙලින් හෝ පහනක් කොට පහන් එළියෙහි හොවීමද කිසුණු පිරියම් කිරීමද පොත් කියවීමද සුදුසු නොවේ. තෙල්, මී, උක්සකුරු වලින් සිරුරෙහිවූ වණ ආලෙපයද නොසුදුසුමය. ඒ පිළිගත් මිලයෙන් ඇඳපුටු ආදිය හෝ ගණීත්ද, පොහෝගෙයක් හෝ බොජුන් හලක් හෝ කෙරෙත් නම් පරිභොග කිරීම නොවටියි. ගෘහපරිච්ඡෙදය ඉක්මවා සිටි සෙවන ආගන්තුක බැවින් වටියි. ඒ පිළිගත් මිලය වියදම් කොට කළ මගින්, ඒදණ්ඩන්ද, නැවෙන්ද, පහුරෙන්ද, යෑම නොවටියි. ඒ පිළිගත්

මිලයෙන් කණවනලද පොකුණෙහි නැගුණු දිය බීම හෝ පරිභොග කිරීම නොවටියි. පොකුණ තුළ දිය නැති කල්හි අන්‍යවූ ආගන්තුක ජලයක් හෝ වර්‍ෂාජලයක් හෝ ලැබුනොත් බීමට හා පරිභොගයට වටියි. මිලදීගත් පොකුණෙක්හි යම් ජලයක් සමග මිලදීගත් ඒ ජලය ආගන්තුකයක් වුවද නොවටියි. ඒ වස්තුව උකස්කොට තබා සඩසතෙමේ ප්‍රත්‍යය පරිභොග කෙරේද, ඒ ප්‍රත්‍යයයෝ මිල පිළිගත් ඒ මහණහුට නොවටිත්. ආරාමයෙක් මිලට ගන්නාලද්දේ වේද, ඒ ආරාමයද පරිභොග කිරීම සුදුසු නොවේ. බිමත් බීජත් අකැප වේනම් බිම පරිභොග කිරීමත් නොවටියි. ඵලපරිභොග කිරීමත් නොවටියි. බිමම මිලදී ගෙණ එහි අන් බිජුවට රොපණය කරනලද්දේ එයින් උපන් ඵලය පරිභොග කිරීම වටියි. බිජුවට මිලද ගෙණ කැප බිමෙහි රොපණය කරනලද්දේ එයින් උපන් ඵලය නොවටියි. බිම හිඳීමත් හොවීමත් වටියි.

'**සචෙ සො ඡඩ්ඩති**'යි එහි පැමිණි ගිහිතෙමේ ඒ කහවණු යම් කිසි තැනක දමාද, තවද නොදමාද, ඒ ගිහිතෙමේ ඒ කහවණු ගෙණයේද නොවැළක්විය යුතුය. '**න චෙ ඡඩ්ඩති**'යි සඟ මැද කහවණු තිසදූ කල්හි එහි පැමිණි ගිහියකුහට 'මේ කහවණු දමව'යි කියූ කල්හි නොම ගෙණයේද, නොදමාද' මේ උත්සාහයෙන් මට කම් කිමැ'යි කැමැති පරිදි යම් දිසාවකට යේද, ඉන්පසු පෙරකියූ ලක්‍ෂණ ඇති මසු කහවණු දමන්නෙක් සම්මත කටයුතුය.

'**යො න ඡන්‍දාගතිං**' යනාදි තන්හි ලොභවශයෙන් ඒ වස්තුව තමාහට හෝ කරන්නේ තමා හෝ උසස් කරන්නේ ඡන්‍දයෙන් අගතියට යේ නම. දෙවෂ වශයෙන් 'මෙතෙමේ මාතෘකාව නොමදතියි, විනය නොදතීය'යි අන්හු පහ කරන්නේ දෙවෂයෙන් අගතියට යේ නම, මොහවසයෙන් මුළාවූ තදින් මුළාවූ සිහියට පැමිණෙන්නේ මොහයෙන් අගතියට යේනම. මසු කහවණු පිළිගත් මහණහුට බියෙන් බැහැරලන්නට නොහැකිවනුයේ බියෙන් අගතියට යේ නම. මෙසේ නොකරන්නේ ඡන්‍දගතියට නොයෙයි. -පෙ- භයාගතියට නොයේයයි දතයුතුය. '**අනිමිත්තං කත්වා**' නිමිති නොකොට ඇස් පියා ගහක හෝ කඳු බෑවුමක හෝ වනගහනයෙක හෝ ගුඵයක් මෙන් බලාපොරොත්තු රහිතව වැටුන අවකාශය සිහිනොකරන්නහු විසින් හෙලිය යුතුය යන අර්ථයි. මෙසේ පිළිකුල් කටයුතු මසු කහවණුයෙහි භාග්‍යවතුන් වහන්සේ පර්‍ය්‍යායයෙන් භික්‍ෂූන්ට වදළසේක. මසුකහවණු පිළිගත් මහණහුට කිසිත් ක්‍රමයකින් එයින් උපන් ප්‍රත්‍යය පරිභොගය නොවටියි. මේ ප්‍රත්‍යය මේ මහණහුට යම්සේ නොවටීද, එසේ තමන් කෙරෙහි නොමැති උතුරුමිනිස් දම් සැලකිරීමෙන් හෝ කුලදූෂක කර්‍මයෙන් හෝ කුහනාලපනාදියෙන් හෝ

උපන් ප්‍රත්‍යයයෝ ඒ මහණහුට නොම වටිත්. අතිකක්හට නොවටිත්. දැහැමින් සෙමෙන් උපන් ප්‍රත්‍යයයෝද ප්‍රත්‍යවෙක්‍ෂා නොකොට පරිභොග කරන්නට නොවටිත්.

ථෙය්‍යපරිභොග - ඉණපරිභොග - දායජ්ජපරිභොග - සාමිපරිභොගයි පරිභෝගයෝ සතරක්ම වෙත්. එහි සඟමැද හිඳ පරිභොග කරන දුශ්ශීලයාගේ පරිභොගය ථෙය්‍යපරිභොග නම්වේ. සිල්වත්හුගේ පස්විකුම් නොකළ පරිභොගය ඉණපරිභොග නම්වේ. එහෙයින් සිවුර කයින් මුදා කරන පරිභොගයක් පරිභොගයක් පාසා පස්විකුම් කටයුතුය. පිණ්ඩපාතය තෙමේ පිඩක් පිඩක් පාසා ප්‍රත්‍යවෙක්‍ෂා කටයුතුය. එසේ නොහැකිවන්නහු විසින් පෙරබත, පසුබත, පෙරයම, මැදුම්යම, පැසුළුයම යන මෙතැන්හි ප්‍රත්‍යවෙක්‍ෂා කටයුතුය. ඉදින් ප්‍රත්‍යවෙක්‍ෂා නොකරන මහණහුට අරුණ නගීද, ඉණපරිභොගස්ථානයෙහි සිටියි. සෙනසුනද පරිභොගයක් පරිභොගයක් පාසා පස්විකිය යුතුය. එසේ නොහැකි වූවහු විසින් අතීතප්‍රත්‍යවෙක්‍ෂාව කටයුතුය. බෙහෙත් පිළිගැන්මෙහිද පරිභොගයෙහිද ප්‍රත්‍යවෙක්‍ෂා ස්මෘතියෙහි ප්‍රත්‍යයභාවය වටියි. ප්‍රත්‍යවෙක්‍ෂා කොටම පිළිගතයුතුය. පරිභොග කළයුතුය. මෙසේ ඇති කල්හිදු පිළිගැන්මෙහි සිහිය උපදවා පරිභොගයෙහි ප්‍රත්‍යවෙක්‍ෂා නොකරන මහණහුටම ඇවැත්වේ. පිළිගැන්මෙහි සිහිය නොඋපදවා පරිභොගයෙහි ප්‍රත්‍යවෙක්‍ෂා කරන මහණහුට ඇවැත් නොවේ.

දෙසනාසුද්ධි - සංවරසුද්ධි - පරියෙට්ඨිසුද්ධි - පච්චවෙක්ඛණසුද්ධියි සුද්ධිතොමෝ සිවුවැදෑරුම් වේ. එහි දෙසනා සුද්ධි නම් ප්‍රාතිමොක්‍ෂ සංවරසීලයයි. එය දෙසනාවෙන් පිරිසිදු වන බැවින් දෙසනාසුද්ධියි කියනු ලැබේ. සංවරසුද්ධි නම් ඉන්ද්‍රිය සංවරසීලයයි. එය 'මම නැවත මෙසේ නොකරන්නෙමි'යි චිත්තාධිෂ්ඨානසංවරයෙන්ම පිරිසිදු වන බැවින් සංවරසුද්ධියි කියනුලැබේ. පරියෙට්ඨිසුද්ධි නම් ආජීවපාරිසුද්ධිසීලයයි. එය අනෙසනය හැර දැහැමින් සෙමෙන් සිවුපසය උපදවන්නහුගේ සෙවීමෙන් පිරිසිදු වන බැවින් පරියෙට්ඨිසුද්ධියි කියනුලැබේ. පච්චවෙක්ඛණසුද්ධි නම් පච්චයපරිභොගසන්නිස්සිතසීලයයි එය 'පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති' යනාදිනයින් කියනලද ප්‍රත්‍යවෙක්‍ෂාවෙන් පිරිසිදු වන බැවින් පච්චවෙක්ඛණසුද්ධියි කියනු ලැබේ. 'පටිග්ගහණෙ සතිං අකත්වා පරිභොගං කරොන්තස්ස අනාපත්ති'යි එහෙයින් කියනලදී. සත්වැදෑරුම් ශෛක්‍ෂයන්ගේ ප්‍රත්‍යයපරිභොගය දායජ්ජපරිභොග නම්වේ. ඒ සත් ශෛක්‍ෂයෝ භාග්‍යවතුන්වහන්සේගේ පුත්‍රයෝය. එහෙයින් පියසතුවූ සිවුපසයට දායාදයෙන්ම උන්වහන්සේලා ප්‍රත්‍යය පරිභොග කෙරෙත්, කිම, භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රත්‍යය පරිභොග කෙරෙත්ද, ගිහීන්ගේ

ප්‍රත්‍යය පරිභොග කෙරෙත්ද, යත්:- ගිහීන් විසින් දෙනලද්දහු නමුත් භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නාලද බැවින් ඒ ප්‍රත්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ සතු වෙත්. එහෙයින් භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රත්‍යය වළඳත්යි දතයුතුය. මෙහිලා ධම්මදයාද සූත්‍රය සාධකවේ. රහතුන් වහන්සේගේ පරිභොගය සාමිපරිභොග නම්වේ. උන්වහන්සේලා තෘෂ්ණාවගේ දසබව ඉක්මවූ බැවින් ස්වාමීහුම වී වළඳත්. මෙසේ මේ පරිභොගයන් අතුරෙහි සාමිපරිභොගය හා දයජ්ජපරිභොගය සියල්ලන්ටම වටියි. ඉණපරිභොගය නොවටියි. ථෙය්‍යපරිභොගයෙහි කථාවක්ම නැත.

ලජ්ජිපරිභොග - අලජ්ජිපරිභොග - ධම්මියපරිභොග - අධම්මියපරිභොගයි අන්‍යවූද පරිභොගයෝ සතරක් වෙත්. එහි අලජ්ජියාහට ලජ්ජියා සමග පරිභොගය වටියි. ඇවතින් නොකරවිය යුතුය. ලජ්ජියාහට අලජ්ජියා සමග පරිභොගය යම්තාක් දනීද ඒතාක් වටියි මුලපටන්ම අලජ්ජියෙක් නම් නැත්තේය. එහෙයින් යම් කලෙක ඔහුගේ අලජ්ජිභාවය දනීද, එකල්හි 'තෙපි කායද්වාරයෙහි හා වාග්ද්වාරයෙහි ව්‍යතික්‍රමය කරවුද, ඒ නොසුදුසුය. මෙසේ නොකරවු'යි කියයුතුය. එවදත් නොපිළිගෙණ කෙරේම නම්, ඔහු සමග පරිභොගය කෙරේද හෙතෙමේද අලජ්ජිම වේ. යමෙක් තමාට භාරවූ අලජ්ජියා සමග පරිභොගය කෙරේද හෙතෙමේද වැළක්විය යුතුය. නොවළකීනම් මෙතෙමේද අලජ්ජිම වේ. මෙසේ එක් අලජ්ජියෙක් අලජ්ජීන් සියයකුදු කරයි. අලජ්ජියාහට අලජ්ජියා සමග පරිභොගයෙහි ඇවැතක් නම් නැත්තේය. ලජ්ජියා සමග ලජ්ජියාගේ පරිභොගය කැත් කුමරුන් දෙදෙනකුන්ගේ රන්තලියක බුදීමක් සමානවේ. ධම්මියාධම්මිය පරිභොගය ප්‍රත්‍යය වශයෙන්ම දතයුතුය. එහි පුද්ගල තෙමේත් අලජ්ජිවේද, පිණ්ඩපාතයත් අධාර්මිකවේද, මේ පුද්ගල - පිණ්ඩපාත දෙක පිළිකුල් කටයුතුය. පුද්ගල තෙමේ අලජ්ජි වේද, පිණ්ඩපාතය ධාර්මික වේද, පුද්ගලයා පිළිකුල් කොට පිණ්ඩපාතය නොගත යුතුය. මහාපච්චරියෙහි වනාහි දුශශීල තෙමේ සඞ්ඝයා වෙතින් උද්දෙසභත්තාදිය ලබා සඞ්ඝයාහටම දේද, මේ උද්දෙසභත්තාදිය දුන් පරිදිම ගිය බැවින් ගැණීම වටීයයි කියනලදී. පුද්ගල තෙමේ ලජ්ජියෙක් වේද, පිණ්ඩපාතය අධාර්මිකවේද, පිණ්ඩපාතය පිළිකුල් කටයුතුය. නොගතයුතුය. පුද්ගල තෙමේ ලජ්ජිවේද පිණ්ඩපාතයත් ධාර්මික වේද වටියි.

ලජ්ජිපග්ගහ - අලජ්ජිපග්ගහ - ධම්මපරිභොග - ආමිසපරිභොගයි අන්‍යවූ පග්ගහ දෙකක් හා පරිභොග දෙකක්ද වෙත්. එහි අලජ්ජියාහට ලජ්ජියා ප්‍රකර්ෂයෙන් ගැණීම වටියි. හෙතෙමේ ඇවැතින් නොකරවිය යුතුය. ලජ්ජි තෙමේ අලජ්ජියා දැඩිව ගණීද, අනුමොදනා පිණිස ආරාධනා කෙරේද, කුලයන්හි වහල්ව ගණීද, අන්‍යලජ්ජියෙක් තෙමේ 'අපගේ

ඇදුරුතෙමේ මෙබඳු මෙබඳුය'යි පිරිසෙහි ඒ අලජ්ජීයාගේ ගුණ කියාද, මේ ලජ්ජිතෙමේ සඳුන පසුබස්වයි. අතුරුදහන් කරවා'යි දතයුතුය.

ධම්මපරිභොග - ආමිසපරිභොගයන් අතුරෙහි යම් තැනෙක්හි ආමිෂ පරිභොගය වටීද, එහි ධර්මපරිභොගයද වටියි. කෙළවර සිටි යම් ග්‍රන්ථයෙක් ඒ පුද්ගලයාගේ ඇවෑමෙන් නසීද, එය ධර්මානුග්‍රහයෙන් ඉගෙණීම වටීයයි කියනලදි. එහි මේ වස්තුව දතයුතුය:- මහාභයෙහි වනාහි එක්ම මහණක්හට මහානිද්දේශය ප්‍රගුණවූයේය. එකල්හි චතුනිකායික මහාතිස්ස ස්ථවිරයන්ගේ උපාද්‍යායවූ මහාත්‍රිපිටක ස්ථවිරතෙමේ මහාරක්ඛිත ස්ථවිරයන්ට 'ඇවැත' මහාරක්ඛිත, 'මොහුගේ සමීපයෙහි මහානිද්දේශය උගණුව'යි කීයේය. 'ස්වාමීනි' මෙතෙමේ වනාහි පාපයෙකි. ඔහු වෙත නොඋගණිම්'යි කීය. 'ඇවැත උගණුව, මම තාගේ සමීපයෙහි හිඳින්නෙම්'යි කීකල්හි 'ස්වාමීනි' මැනැවි, ඔබවහන්සේ හුන්කල්හි උගන්නෙම්'යි කියා පටන් ගෙණ රෑදවල් දෙක්හි පුහුණු කරනුයේ හදරා අවසන් කරන දිනයෙහි ඇඳ යට හුන් ස්ත්‍රියක දැක 'ස්වාමීනි' පෙර මෙය අසනලද්දේමය, මම මෙසේ දන්නෙම් නම් මෙබන්දක්හුගේ සමීපයෙහි ධර්මය නොපුහුණු කරන්නෙම්'යි කීය. ඒ මහාරක්ඛිත ස්ථවිරයන්ගේ සමීපයෙහි වනාහි බොහෝ මහා ස්ථවිරයන් වහන්සේලා උගෙණ මහානිද්දේශය පිහිටුවාලූහ.

**'රූපියෙ රූපියසඤ්ඤී'** මෙහි සිහලුම රන්රිදී, රූපියසඞ්ග්‍රහයටම ගියේයයි දතයුතුය. **'රූපියෙ වෙමතිකො'** රන්ද, රන්වැනි කරකොළදැයි මේ ආදි නයින් හටගත් සැක ඇත්තේය. **'රූපියෙ අරූපියසඤ්ඤී'** රන් ආදියෙහි කරකොළය යනාදි හැඟීම් ඇත්තේය. අනිකෙකුදු ඇත්තේය. පින් කැමැත්තාවූ රාජනෙතපුරාදියෙහි වූවෝ බත් කැවිලි සුවඳ පිඬු ආදියෙහි බහා හිරණ්‍යසවර්ණ දෙන්නාහ. රෙදි සිහායෑමෙහි හැසිරෙන්නවුන්ට දෙකෙළවර බැඳි කහවණු ආදිය සමගම වස්ත්‍ර දෙන්නාහ. භික්ෂූහු බත් ඈ හැඟීමෙන් හෝ වස්ත්‍රසංඥවෙන් හෝ පිළිගණිත්. මෙසේ කහවණුවෙහි කහවණු නොවේය යන හැඟීම් ඇතිව කහවණු පිළිගණීයයි දතයුතුය. පිළිගන්නා මහණහු විසින් මේ ගෙයිදී මේ ලද්දේය'යි සැලකිය යුතුය. යමක්හු විසින් නොසිහියෙන් දෙනලද්දේවේද, හෙතෙමේ සිහිය ලැබ නැවැත ඒද, එකල්හි මොහුට 'තාගේ වස්ත්‍රය බලව'යි කියයුතුය. මේ ශික්ෂාපදයෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. සමුත්ථානාදීන් අතුරෙහි කයින්, වචනයෙන්, කායවාචායෙන්, කායචිත්තයෙන්, වාචාචිත්තයෙන්, කායවාචාචිත්තයෙන් උපදින බැවින් ෂඩ් සමුත්ථානිකය. කිසි කලෙක ගැණීම කරණකොට ඇවැතට පැමිණෙන බැවින් ක්‍රියාවෙන් උපදීයි. කිසි කලෙක ප්‍රතික්ෂෙපය නොකරන බැවින් අක්‍රියාවෙන් උපදියි. රූපිය අඤ්ඤවාදක උපස්සුති ශික්ෂාපද තුන ක්‍රියාක්‍රියාභාවයෙන් එක් පරිච්ඡෙද

ඇත්තාහු වෙත්. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

රූපිය ශික්ෂාපදවර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙන**'යි රූපිය සංවොහාරශික්ෂාපදයයි. එහි '**නානප්පකාරකං**', කළ නොකළ ඇ විසින් නන්වැදෑරුම්වේ. '**රූපියසංවොහාරං**' රන්රිදී මසු කහවණු ගණුදෙනුව. '**සමාපජ්ජන්ති**' පිළිගැණීම පිළිකෙව් නොකළ බැවින් පිළිගත් කහවණු ආදිය ගණුදෙනුවෙහි දෙස් නොදක්නාහු කෙරෙත්. '**සසූපගං**' යනාදි තන්හි හිසට පැමිණේනුයි සීසූපගනම. පොත්හි වනාහි 'සීසූපක'යි ලියත්. මෙය, යම් කිසි ශීර්ෂාලඞ්කාරයකට නමෙකි. සියලු තන්හි මේ නයවේ. '**කතෙන කතං**' යනාදිතන්හි පිරිසිදු කහවණු ව්‍යවහාරයම කියනලද්දේවේ. '**රූපියෙ රූපිය සඤ්ඤී**' යනාදි තන්හි පූරිම ශික්ෂාපදයෙහි කියූ වස්තූන් අතුරෙහි නිස්සජ්ජිය වස්තුවක් කරණකොට නිස්සග්ගියවස්තුවක් ව්‍යවහාර කරන මහණහුට මුල් ගැණීමෙහි පූරිම ශික්ෂාපදයෙන් නිස්සග්ගිය පාචිත්තිය වේ. ඔබමොබ පෙරළීමෙහි මේ ශික්ෂාපදයෙන් නිස්සග්ගිය පාචිත්තියමවේ. නිස්සග්ගිවස්තුවකින් දුක්කට වස්තුවක් හෝ කැපවස්තුවක් හෝ ව්‍යවහාර කරන මහණහුටද මේ නයමවේ. කහවණු නොවූවෙක්හි කහවණුය යන හැඟීම් ඇතිව කහවණු ව්‍යවහාර කෙරේ, යනාවූ යම්මේ ද්විතීය ත්‍රිකයෙක් වදරන ලද්දේද, එයට අනුලොම් බැවින් 'කහවණුයෙහි කහවණුය යන හැඟීම් ඇතිව කහවණු නොවූවක් ව්‍යවහාර කෙරේ, යනාදීවූ මේ අන්‍යවූ ත්‍රිකය දතයුත්තේය. තමාගේ කහවණු නොවූවකින් අන්හුගේ කහවණු ව්‍යවහාර කරන්නේද තමන්ගේ හෝ කහවණුයෙන් අන්හුගේ කහවණු නොවූවෙක් ව්‍යවහාර කෙරේද, දෙයයුරෙන්ම රූපිය සංවොහාරය කරනලද්දේමවේ. එහෙයින් පෙළෙහි එකතකින් කහවණු පක්ෂයෙහි එක්ම ත්‍රිකයෙක් වදරනලද්දේය.

දුක්කට වස්තුවකින් නිස්සග්ගිය වස්තුවක් ගණුදෙනු කරන මහණහුට මුල් ගැණීමෙහිදී පූරිම ශික්ෂාපදයෙන් දුක්කටයවේ. පසුව පෙරළීමෙහි මෙයින් නිස්සග්ගිය පාචිත්තියවේ. ගරුකය ගණුදෙනු කළ බැවිනි. දුක්කට වස්තුවකින් දුක්කට වස්තුවක්ම හෝ කැප වස්තුවක් හෝ ගණුදෙනු කරන මහණහුට මුල් ගැණීමෙහි පූරිමශික්ෂාපදයෙන් දුක්කටය වේ. පසුව පෙරළීමෙහිද මෙයින් දුක්කටයමවේ. කුමක් හෙයින, යත්:- අකැප වස්තුවකින් ගණුදෙනු කළ බැවිනි. අට්ඨකථාවෙහි ක්‍රයවික්‍රයට පැමිණෙන්නේ නම් නිස්සග්ගිය පාචිත්තියයි කියනලදී. එය දුර්භාෂිත වේ.

කුමක් හෙයින, යත්:- දීම ගැණීමට වඩා අන්‍යවූ ක්‍රය වික්‍රයෙක් නම් නැත්තේය. ක්‍රයවික්‍රය ශික්‍ෂාපදයද කැපවස්‍තුවකින් කැපවස්‍තු පෙරළීමම සඳහා වදරන ලද්දේද එහෙයිනි. එද වනාහි පස්සහදූහැමියන් හැර මේ ශික්‍ෂාපදය කහවණුයෙන් කහවණු හා කහවණු නොවූවක් ගණුදෙනු කිරීමද කහවණු නොවූවකින් කහවණු ගණුදෙනු කිරීමද දුක්කට වස්‍තුවකින් දුක්කට වස්‍තුවක් ගණුදෙනු කිරීමද මේ රූපිය සංවොහාර ශික්‍ෂාපදයෙහි නොම වදරනලදී. ඒ ක්‍රයවික්‍රය ශික්‍ෂාපදපාලියෙහි නොවදරනලදි. මෙහි අනාපත්ති වන්නට සුදුසු නොවේ. එහෙයින් දුක්කට වස්‍තුවක් පිළිගැණීමෙහි යම්සේම දුක්කටය වේද, එසේම ඒ දුක්කටය වියයුතුයයි භාග්‍යවතුන් වහන්සේගේ අදහස දන්නන් විසින් කියන ලද්දේය. කැප වස්‍තුවකින් වනාහි නිස්සග්ගිය වස්‍තුවක් ගණුදෙනු කරන මහණහුට මුල් ගැණීමෙහි පුරිමශික්‍ෂාපදයෙන් ඇවැත්නොවේ. පසුව පෙරළීමෙහි මෙයින් නිස්සග්ගියපාචිත්තිය වේ. 'කහවණු නොවූවෙහි කහවණු නොවූවෙක යන හැඟීම් ඇත්තේ කහවණු ගණුදෙනු කෙරේද නිස්සග්ගිය පාචිත්තිය'යි මෙය වදරන ලද්දේය. එහෙයින්ම දුක්කට වස්‍තුවක් ගණුදෙනු කරන්නහුට මුල් පිළිගැණීමෙහි එසේම ඇවැත්නොවේ. පසුව පෙරළීමෙහි මෙයින් දුක්කටයවේ. කුමක් හෙයිනද යත්:- අකැපය ගණුදෙනු කළ බැවිනි. කැපවස්‍තුවකින් වනාහි කැපවස්‍තුවක් පස්සහදැහැමියන් හැර ගණුදෙනු කරන මහණහුට මුල්ගැණීමෙහි පුරිමශික්‍ෂාපදයෙන් ඇවැත් නොවේ. පසුව පෙරළීමෙහි මතුවෙහි කයවික්‍රය ශික්‍ෂාපදයෙන් නිස්සග්ගිය පාචිත්තියවේ. කයවික්‍රය මුදහැර ගන්නහුට මතු ශික්‍ෂාපදයෙන්ද ඇවැත් නොවේ. පොලිය යොදන්නහුට දුක්කටයවේ.

මේ කහවණු ව්‍යවහාරයාගේ ගරුබව දක්වන්නාවූ මේ පත්තචතුක්කය දතයුතුය. යම් මහණෙක් කහවණු පිළිගෙණ ඒ කහවණුයෙන් අයබිජුවටක් උපදවාද, ඒ අයබිජුවට කොටවා ඒ ලොහයෙන් පාත්‍රයක් කරවාද, මේ පාත්‍රය මහා අකැපය නම්වේ. කිසි උපායයකින් කැප කරනු නොහැක්කේය. ඉදින් ඒ පාත්‍රය විනාශ කොට තැලියක් කරවාද, එද නොකැපය. වෑයක් කරවාද, ඒ වෑයෙන් සිඳිනලද දැහැටිටද නොකැපය. බිළියක් කරවාද, එයින් මැරූ මත්‍ස්‍යයෝද නොකැපයහ. වැතලය තවා ජලය හෝ කිරිහෝ උණුසුම් කරවාද, එද නොකැපය වේ. යම් මහණෙක් තෙමේ කහවණු පිළිගෙණ ඒ මිලයෙන් පාත්‍රයක් මිලදී ගණීද, ඒ පාත්‍රයෙන් නොකැපම වේ. පස්සහදූහැමියන්ටම කැප නොවේය'යි මහාපච්චරියෙහි කියනලදී. ඒ පාත්‍රය කැප කරන්නට හැක්කේද, එහි මිලය මිල හිමියන්ටත් පාත්‍රය පාත්‍ර හිමියන්ටත් දුන් කල්හි කැපවේ. කැප බඩුවක්දී ගෙණ පරිභොග කිරීම වරද නොවේ.

යම් මහණෙක් තෙමේ කහවණු පිළිගන්නවා ගෙණ කැපකරු සමග කඹුරුගෙයකට ගොස් පාත්‍රයක් දැක 'මේ පාත්‍රය මට රුස්නේය'යි කියාද, කැපකරු තෙමේද, ඒ කහවණුදී මේ පාත්‍රය කැප වහරින් ගන්නාලද්දේද දෙවන පාත්‍රය සමානමැයි කඹුරහු හඟවාද, මිල පිළිගත් බැවින් නොකැපවේ. කුමක් හෙයින් සෙස්සන්ට කැප නොවේද, යත්ඃ මිල නොහළබැවිනි. යම් මහණෙක් තෙමේ කහවණු නොපිළිගෙණ 'තෙරුන්ට පාත්‍රයක් මිලදීගෙණ දෙව'යි යැවූ කැපකරුවකු සමග කඹුරුගෙයකට ගොස් පාත්‍රයක් දැක 'මේ කහවණු ගෙණ මේ පාත්‍රය දෙව'යි කහවණු දෙවා ගත් මේ පාත්‍රය මෙම මහණහුට නොවටියි. නොමනාකොට පරීක්‍ෂා කළ බැවිනි. අන්‍යයන්ට වනාහි මිල නොපිළිගත් බැවින් වටියි.

මහාසුමම ස්ථවිරයන් වහන්සේගේ උපාධ්‍යායයෝ අනුරුද්ධ නම් ස්ථවිරයන් වහන්සේ වූහ. හෙතෙමේ තමන්ගේ මෙබඳු පාත්‍රයක් ගිතෙල් පුරවා සඞ්ඝයාට තිසඳුයේය. ත්‍රිපිටක චූලනාග ස්ථවිරයන් වහන්සේගේද සද්ධිවිහාරිකයන්ට මෙබඳු පාත්‍රයෙක් වූයේය. ස්ථවිර තෙමේ ඒ පාත්‍රය ගිතෙල් පුරවා සඞ්ඝයාට නිසදෙව්වේයයි මෙය අකප්පිය පත්තචතුක්කයයි. ඉදින් කහවණු නොපිළිගෙණ 'තෙරුන්ට පාත්‍රයක් මිලදී ගෙණ දෙව'යි යැවූ කැපකරු සමග කඹුරුගෙයකට ගොස් පාත්‍රයක් දැක 'මේ පාත්‍රය මට රුස්නේය'යි හෝ 'මේ පාත්‍රය මම ගන්නෙමි'යි හෝ කියාද, කැපකරු තෙමේ ඒ කහවණුදී 'මේ පාත්‍රය සියල්ලන්ට කැපවේ. බුදුවරයන්ට පවා පරිභොගයට සුදුසු' වේය'යි කඹුරාට හඟවයි.

'**අරූපියෙ රූපියසඤ්ඤී**' බරපත්‍රාදීන් අතුරෙහි ස්වර්‍ණය යන හැඟීම් ඇත්තේය. '**ආපත්ති දුක්කටස්ස**' ඒ බරපත්‍රාදියෙන් කහවණු නොවූවත් ගණුදෙනු කෙරේ නම් දුක්කටාපත්තිය වේ. විමති ඇත්තහු කෙරෙහි මෙම නයවේ. කහවණු නොවූවෙක්හි එසේ හැඟීම් ඇතිව පස්සහදෑහැමියන් සමග 'මෙය ගෙණ මෙය දෙවු'යි ක්‍රයවික්‍රය කරන්නහුටද ඇවැත්නොවේ. සෙස්ස ප්‍රකටමය. මේ ශික්‍ෂාපදය කයින් වචනයෙන් කාය වාචායෙන් කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන් උපදින බැවින් ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාවෙන් උපදී. නො සංඥාවිමොක්‍ෂය. අචිත්තකයි. ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

රූපියසංවොහාරශික්‍ෂාපද වර්‍ණනාව නිමි.

—॥—

'**තෙන සමයෙන**'යි ක්‍රයවික්කය ශික්‍ෂාපදයයි. එහි '**කතිහි පිත්ත්‍යායං**' යනු 'තාගේ මේ සඞ්ඝාටිය කොපමණ දවස් මෙහි හිතාරය පදපූරණයවේ.

පිකාරය ගැරහීමෙහි වේ. 'තාගේ දුවීලසඞ්ඝාටිය කොපමණ දවස් වන්නේදැ'යි යන අර්ථයි. නොහොත් 'කතිහම්පිත්‍යායං'යිද පාඨය වේ. එහි **'කතිහං'** කොපමණ දිනද, කොපමණ දවස්යි කියනලද්දේවේ. සෙස්ස කියූ නයමවේ. **'කතිහිපි ම්‍යායං'** යන මෙද මෙම නයින් දතයුතුය. **'ගිහීනම්පි ගිහිස්ස'** යන මෙහි 'නං' යනු නාමාර්ථයෙහි නිපාතයි. ගිහියෝ නම් ගිහියකුහටැයි කියනලද්දේ වේ. **'නානප්පකාරකං'** යනු චීවරාදීවූ කප්පිය භාණ්ඩයන්ගේ වසයෙන් නානා ප්‍රකාර වේ. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි සිවුර දවාලූහුය. කෙළවර කොට කප්පිය භාණ්ඩයම දක්වන ලද්දේවේ. අකප්පියභාණ්ඩපරිවර්තනය ක්‍රයවික්‍රය සඞ්ග්‍රහයට නොයන්නේය. **'කය වික්කයං'** ක්‍රයද වික්‍රයද 'මෙයින් මේ බඩුව දෙව, යනාදි නයින් අන්හුගේ කැප බඩුවක් ගන්නේ ක්‍රයට පැමිණේ. තමාගේ කැප බඩුවක් දෙන්නේ වික්‍රයට පැමිණේ. **'අජ්ඣාචරති'**යි අභිභවනය කොට හැසිරේ. ව්‍යතික්‍රමවචන කියාය යන අර්ථයි. **'යතො කයිතඤ්ච හොති වික්කීතඤ්ච'** යම් කලෙක්හි අන්හු අයත් බඩුවක් තමාගේ අතෙහි වූවක් කරන්නහු විසින් ගන්නා ලද්දේවේද, තමන් අයත් බඩුවක් අනුන්ගේ හස්තගත කරන්නහු විසින් දෙනලද්දේවේද, **'ඉමිනා ඉමං'** යනාදි වචනයට අනුරූප හෙයින් පාඨයෙහි පළමු කොට තමන් අයත් භාණ්ඩය දක්වන ලද්දේය. **'නිස්සජ්ජිතබ්බං'** මෙසේ අන්‍යයාගේ අතින් ගණු දෙනු කිරීම් වසයෙන් ගන්නාලද කැප භාණ්ඩය නිසදිය යුතුය. මේ ගණුදෙනු කිරීම පස්සහදැහැමියන් හැර සෙසු ගිහීන් හා පැවිද්දන් හාද යටත් පිරිසයින් මවුපියන් හාද නොකටයුතුය.

එහි මේ විනිශ්චයයි:- වස්ත්‍රයකින් වස්ත්‍රයක් හෝ වේවා, බතින් බතක් හෝ වේවා, යම්කිසි කැප භාණ්ඩයක් 'මෙයින් මේ බඩුව දෙව'යි කියාද දුක්කටය වේ. මෙසේ කියා තමාගේ භාණ්ඩයක් මවටද දේද දුක්කටය වේ. මෙයින් මේ බඩුව දෙව'යි කියනලද්දේ හෝ 'මේ බඩුව දෙවා මේ බඩුව තට දෙමි'යි කියාහෝ මවුගේද, බඩුවක් තමා ගණීද, දුක්කටය වේ. තමන් අයත් බඩුව අන්හු අතටද අන්හු අයත් බඩුව තමන්ගේ අතටද පැමිණිකල්හි නිසගිවේ. මවුට හෝ පියාට හෝ මේ බඩුව දෙව'යි කියන්නහුට විඥප්තියක් නොවේ. 'මේ ගණුව'යි දෙන්නහුට සද්ධාදෙය්‍ය විනිපතයෙක් නොවේ. නොනෑයකුට මෙය දෙව'යි විඥප්තිය වේ. 'මෙය ගණුව'යි දෙන්නහුට සද්ධාදෙය්‍ය විනිපතනය වේ. 'මෙය දෙව'යි ගණු දෙනුවට පැමිණෙන්නහුට නිසගි වේ. එහෙයින් කැපබඩුවක් පෙරළන්නහු විසින් මවුපියන්ද සමග ගණුදෙනු කිරීමද, අඤ්ඤාතක විඤ්ඤත්ති සද්ධාදෙය්‍ය විනිපාතන කයවික්කයාපත්ති සඞ්ඛ්‍යාතවූ තුන් ඇවැතුන් මුදන්නහු විසින් නොනෑයන් සමග පරිවර්තනය කටයුතුය.

එහි මේ පරිවත්තනවිධියයි:- මහණහුට මහවියදම් පිණිස සහල් ඇත්තේය. හෙතෙමේ අතරමගදී බත් අතේ ඇති පුරුෂයකු දැක 'අපට සහල් ඇත්තේය. අපට මේ සහලින් ප්‍රයොජන නැත, බතින් නම් ප්‍රයොජන ඇත්තේ'යි කියාද, පුරුෂතෙමේ සහල් ගෙණ බත් දේද වටියි. අඤ්ඤාතකවිඤ්ඤත්ති සද්ධාදෙය්‍යවිනිපාතනකයවික්කයාපත්තීහු නොවෙත්. යටත් පිරිසයින් නිමිත්තකම්මාත්‍රයෙක්ද නොවේ. කුමක් හෙයින, යත්:- මිල ඇති බැවිනි. 'ඉදං අම්හාකං අත්ථි අම්හාකඤ්ච ඉමිනාච අත්ථෝති භණති'යි පසු භාගයෙහිද කියනලද්දේමය. යම් මහණෙක් තෙමේ මෙසේ නොකොට 'මෙයින් මෙය දෙවා'යි පරිවත්තනය කෙරේද, වස්තුවට අනුරූපවූ ඇවැත්මය. ඉඳුල් කන්නකු දැක 'මේ බත් අනුභව කොට පඩුපතුරු හෝ දර හෝ ගෙණ එව'යි කියාද, පඩුපතුරු ගණිනින්ද දර ගණිනින්ද, නිසගි ඇවැත්හු වෙත්. මේ බත් අනුභව කොට 'මෙය කරවු'යි දන්තකාරකාදිවූ ශිල්පීන් ලවා ධබරාදීන් අතුරෙහි ඒ ඒ පිරිකර කරවාද, රදවුන් ලවා හෝ වස්ත්‍ර ධොවනය කරවාද වස්තූන්ට අනුරූපවූ ඇවැත්මය. කරනවෑමියකුලවා කෙස් සිඳවාද කම්කරුවන් ලවා නවකර්මාන්ත කරවාද, වස්තූන්ට අනුරූපවූ ඇවැත්මය. 'මේ බත අනුභව කොට මේ කර්මාන්තය කරවු'යි නොකියාද, 'මේ බත අනුභව කරවා අනුභව කරනලද්දේ වෙහි, අනුභව කරන්නෙහි, මෙනම් කර්මාන්තය කරව'යි කියාද වටියි. මෙහිද කිසිසේත් වස්ත්‍රධොවනයෙහි හෝ කෙස් සිඳීමෙහි හෝ භූමිශොධනාදිවූ නවකර්මාන්තයෙහි හෝ මෙරමා සතු බඩුවක් තම අතට පත්වූයේ නිසදිය යුත්තෙක් නම් නැත්තේය. මහාඅට්ඨකථාවෙහි දැඩිකොට කියූ බැවින් මේ කීම වළකාලන්නට නොහැක්කේය. එහෙයින් යම්සේ නිසගිවස්තුවක් පරිහොග කළ කල්හි හෝ නැසුනු කල්හි හෝ පාචිත්තිය දෙසාද, එසේ මෙහිද දෙසිය යුතුය.

'**කයවික්කයෙ කයවික්කයසඤ්ඤී**'යි යනාදියෙහි යමෙක් තෙමේ ගණුදෙනු කිරීමට පැමිණේද, හෙතෙමේ එහි ගණුදෙනු කරන හැඟීම් ඇත්තෙක් හෝ වේවා, විමති ඇත්තෙක් හෝ වේවා, ගණුදෙනු කරන හැඟීම් නැත්තෙක් හෝ වේවා, නිස්සග්ගියපාචිත්තියම වේ. මූලත්‍රිකයෙහි දෙපදයන්හි දුක්කටය මැයි මෙසේ අර්ථ දතයුතුය. '**අග්ඝං පුච්ඡති**' 'මේ තාගේ පාත්‍රය කුමක් අගීදැ'යි විචාරයි. 'මෙනම්'යි කියූ කල්හි ඉදින් ඔහුගේ කැප බඩුව මැහැගිවේද, මෙසේද ඔහුට 'උපාසක' මාගේ මේ වස්තුව මාහැගිය, තාගේ පාත්‍රය අනිකක්හට දෙව'යි නැවැත කියාද, ඒ අසා අන්‍යයා අත්තලියකුදු දෙන්නෙමි'යි කියාද, ගැණීම වටියි. 'අපගේ මෙනම් බඩුවක් ඇතැයි කියූ ලක්ෂණයෙහි වැටේ. ඒ පාත්‍රය මහැගිවේද, මහණහුගේ වස්තුව මද අගය ඇත්තේද, පාත්‍ර සවාමිතෙමේ මේ වස්තුවෙහි

අගය අඩුබව නොදනී නම්, පාත්‍රය නොගතයුතුය. 'මාගේ වස්තුව මද අගය ඇත්තේයයි කියයුත්තේය. මහැඟිබව දැන වඤ්චා කොට ගන්නේ බඩුව අගය කරවා කරවිය යුතුබවට පැමිණේ. ඉදින් පාත්‍රස්වාමි තෙමේ 'ස්වාමිනි' වේවා, සෙස්ස මට පින් වන්නේයයි දේ නම් වටියි.

'**කප්පිය කාරකස්ස ආචික්ඛති**'යි යමකු අතින් බඩුවක් ගණීද, ඔහු හැර යටත් පිරිසයින් ඔහුගේ අන්‍යවූ පුතකු සහෝදරයකු කැපකරු කොට 'මෙයින් මෙනම් බඩුව ගෙණ දෙව'යි කියාද, හෙතෙමේ දක්‍ෂවේද. නැවැත නැවැත ගෙණ අවුත් විවාද කොට ගණීද, නොබෙණෙන්නහු විසින් සිටිය යුතුය. දක්‍ෂ නොවේනම් ගන්නට නොදනීද, වෙළෙඳ තෙමේ ඔහු රවටාද, නොගණුවයි කියයුතුය. 'ඉදං අම්හාකං' යනාදියෙහි 'මේ පිළිගත් තෙල් හෝ ගිතෙල් අපට ඇත්තේය, අපටද අනික් පිළිගන්නාලද්දකින් ප්‍රයොජන ඇත්තේය'යි කියාද, ඉදින් හෙතෙමේ එය ගෙණ අතිකක් දේද, පළමුකොට තමාගේ තෙල් නොමැන්නවිය යුතුය. කුමක් හෙයින, යත්:- හැළියෙහි ඉතිරි තෙල් වේද, ඒ තෙල් පසුව මනින්නහුගේ නොපිළිගත් තෙල් දූෂිත කරන්නේද, එහෙයිනි සෙස්ස ප්‍රකටමය. කයින් වචනයෙන් කායවාචායෙන් කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන් උපදින බැවින් ෂඩ් සමුත්ථානිකය ක්‍රියාවෙන් හටගණියි. නොසංඥාවිමොක්‍ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

කයවික්කය ශික්‍ෂාපදවර්ණනාව නිමි.

ද්විතීය කොසියවර්ගයද නිමියේය

—||—

'**තෙන සමයෙන**'යි පත්ත ශික්‍ෂාපදයයි. එහි '**පත්තවණිජ්ජං**' යනු ගම් නියම්ගම්හි හැසිරෙන්නෝ පාත්‍ර වෙළඳම හෝ කරන්නාහුය. '**ආමත්තිකාපණං වා**' භාජනයෝ ආමත්තිකායි කියනු ලැබෙත්. ඒ භාජනයෝ යම් කෙනකුන්හට විකිණිය යුතු භාණ්ඩ කොට ඇත්තාහුද ඔවුහු ආමත්තිකයෝය. ඒ ආමත්තිකයන්ගේ කඩපිළ 'ආමත්තිකාපණ' නම්. කුඹල් බඩු විකුණන වෙළඳුන්ගේකඩපිළය යන අර්ථයි. '**තයො පත්තස්ස වණ්ණා**' පාත්‍රයෙහි ප්‍රමාණ තුනෙකි. '**අඩ්ඪාළ්හකොදනං ගණ්හාති**' මගධ නැළියෙන් සහල් නැළි දෙකක බත් ගණියි. මගධ නැළිය නම් අඩතෙලෙස් පලමෙක් වේයයි අන්ධකාත්ථකථාවෙහි කියනලදී. ආචාර්‍ය්‍යධර්මපාල ස්ථවිරයන් වහන්සේ ප්‍රකෘතියෙන් සිවු මිටෙක් කුඩුබයෙක. සිවුකුඩුබයෙක් නැළියෙක. ඒ නැළියෙන් සොළොස් නැළියෙක් ද්‍රොණයෙක.

ඒ ද්‍රෝණය, මගධ නැළියෙන් දෙළොස් නැළියෙක් වේය'යි කියනලදී. එනයින් මගධ නැළියනම්, පස් කුඩුබ එක් මිටක් හා තවත් මිටකින් තෙවන කොටසද යන මෙකියූ පමණ ගණියයි දතයුතුය. හෙළදිවයිනැ පියවිනැළිය මහත්වන්නීය. ද්‍රවිඩ නැළිය කුඩා වන්නීය. මගධ නැළිය ප්‍රමාණ යුක්තය. ඒ මගධ නැළියෙන් නැළි එකහමාරක් එක් හෙළ නැළියක් වේය'යි මහාඅට්ඨකථාවෙහි කියනලදී. **'චතුභාගං ඕදනං'** බතෙහි සිවුවන කොටස පමණ කැවිලිය. ඒ කැවිලි අතින් ගතහැකි මුද්ගසූපයාගේ වසයෙන් දතයුතුය. **'තදුපියඤ්ච බ්‍යඤ්ජනං'** ඒ බතට සෑහෙන පමණවූ මස් මාංස පලාපල කිළිල් ආදී බ්‍යඤ්ජනය. එහි මේ විනිශ්චයයි:- මනාකොට කෙටූ මනාකොට පිරිසිදු කළ නොකැඩුනු පරණ ඇල් සහලින් මගධ නැළි දෙකක් ගෙණ ඒ සහලින් නොපැසුනු සහල් නැති නොකෙළසුනු හෙවත් බෙරිනොවූ කැටිනොවූ උලක උල නොබැඳුනු කොඳකැකුළු රැසක් වැනිවූ නොබෙරිබත පිසා ඉතිරි නොකොට පාත්‍රයෙහි බහා ඒ බතෙහි සිවුවන කොටස පමණවූ ඉතා ඝන නොවූ ඉතා තුනී නොවූ අතින් ගතහැකිවූ සියලු කුළුබඩුවෙන් මනාකොට පිළියෙල කළ මුද්ගසූපය එහි බැහිය යුතුය. ඉක්බිති පිඩකට පිඩකට සෑහෙන අවසන් පිඩ දක්වා පොහොනා මස් මාංසාදිව්‍යඤ්ජන බහාලිය යුතුය. ගිතෙල් තෙල් මෝරු රසකාඩි ආදීහු ගිණීමට නොපැමිණෙත්. ඒ ගිතෙල් ආදීහු ප්‍රසන්නහෙයින් ඔදනගතිකම වෙත්. පිරිහෙලන්නට වඩන්නට නොහැකිවෙත්. මෙසේ බැහූ මේ සියල්ලම පාමුවවිටෙහි යට රෙඛාව සමව සිටීනම්, හුයකින් හෝ හිරටකින් හෝ ගසන කල්හි පාමුදුනෙහි හසුරුවන හුයෙහි හෝ හිරටෙහි යටකෙළවර පහසා නම් හෙවත් යට කෙළවරෙහි වදීනම් මේ පාත්‍රය **උක්කට්ඨපත්ත** නම්වේ. ඒ ඉර ඉක්මවා මුදුන් කරනලදුව සිටීද, මේ පාත්‍රය උක්කට්ඨෝමක පත්ත නම්වේ. ඒ ඉරට නොපැමිණේද, ඇතුළට පැමිණියක්ම වේද, මේ පාත්‍රය **උක්කට්ඨුක්කට්ඨපත්ත** නම්වේ. **'නාළිකොදනං'** යනු මගධනැළියෙන් එක් සහල් නැළියක බත. **'පත්ථොදනං'** මගධනැළියෙන් නැළිබාගයක බත. සෙස්ස කියූ නයින්ම දතයුතුය.

මේ වනාහි නාමමාත්‍රයෙහි වෙනසයි. නැළියක බත් ආදි සියල්ල බහාලනලද්දේ කියූ ලෙසින්ම යට රෙඛාව සමව සිටීනම් මේ **මජ්ඣිමපත්ත** නම්වේ. ඒ රෙඛාව ඉක්මවා මුදුන් කරනලදුව සිටීනම් මේ පාත්‍රය **මජ්ඣිමොමකපත්ත** නම්වේ. ඒ රෙඛාවට නොපැමිණේද ඇතුළතම වූයේද, මේ පාත්‍රය මජ්ඣිමුක්කට්ඨපත්තනම් වේ. නැළිබාගයකබත් ආදි සියල්ල බහනලද්දේ යට රෙඛාවට සමවසිටීනම් මේ පාත්‍රය **ඔමකපත්ත** නම්වේ. ඉදින් ඒ රෙඛාව ඉක්ම මුදුන් කරනලදුව සිටීද, මේ පාත්‍රය

**ඔමකොමකපත්ත** නම්වේ. ඒ රේඛාවට නොපැමිණේද, ඇතුළත වූයේමවේද, මේ පාත්‍රය **ඔමකුක්කට්ඨපත්ත** නම්වේ. මෙසේ මේ පාත්‍ර නවයෙක් වේ. ඒ පාත්‍ර අතුරෙහි උක්කට්ඨුක්කට්ඨපාත්‍රය හා ඔමකොමකපාත්‍රය පාත්‍රනොවේ. '**තතො උක්කට්ඨො අපත්තො ඔමකො අපත්තො**' යන මෙය මේ පාත්‍රදෙක සඳහා කියනලදි. '**උක්කට්ඨුක්කට්ඨො**' මෙහි උත්කෘෂ්ටයටත් වඩා උත්කෘෂ්ට බැවින් 'තතො උක්කට්ඨො අපත්තො'යි කියනලදි. ඔමකොමකපාත්‍රයද අඩුපාත්‍රයටත් වඩා අඩු බැවින් 'තතො ඔමකො අපත්තො'යි කියනලදි. එහෙයින් මේ පාත්‍ර නොවූවාහු භාජනපරිභොගයෙන් පරිභොග කටයුත්තාහු අධිෂ්ඨානයට නොසුදුස්සහ. විකප්පනයට නොසුදුස්සහ. අන්‍යවූ පාත්‍රසත අධිෂ්ඨානකොට හෝ විකප්පනය කොට හෝ පරිභොග කටයුත්තාහ. මෙසේ නොකොට ඒ පාත්‍රය දසදවසක් පරම කොට ඇති කාලය ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තිය'යි. සත්වැදෑරුම්වූම ඒ පාත්‍රය දස දවසක් පරමකොට ඇතිකාලය ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තිය වේයයි දතයුතුය. '**නිස්සග්ගියං පත්තං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජති**' යනු කැඳ බී සේදූ කල්හි දුක්කටය වේ. කැවිලි කා බත් අනුභව කොට සේදූ කල්හි දුක්කටයයි මෙසේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටයවේ.

'**අනාපත්ති අන්තොදසාහං අධිට්ඨෙති විකප්පෙති**'යි මෙහි වනාහි පමණින් යුත් පාත්‍රයෙහිද අධිෂ්ඨානයට හා විකප්පනයට සුදුසුබව මෙසේ දතයුතුය. අයොමය පාත්‍රය පස්පාකයකින්ද මත්තිකාපාත්‍රය දෙපාකයකින්ද පිසනලද්දේ අධිෂ්ඨානයට සුදුසුවේ. පාත්‍රදෙකටම යම් මිලක් දිය යුත්තේද, ඒ මිලය. දුන්කල්හිම අධිෂ්ඨානයට සුදුසුවේ. එක් පාකයෙක් අඩුවූයේ වේද, දෙවියැට සමාරකුදු හෙවත් ඇටකාසියක් නමුදු මිල නොදෙන ලද්දේද, අධිෂ්ඨානයට නොසුදුසු වෙත්. ඉදින් පාත්‍රස්වාමි තෙමේ 'තුඹ වහන්සේලාට යම් කලෙක මිල වන්නේද එකල්හි දුනමැනැවැ' ඉටා පරිභොග කළ මැනැවැ'යි කියාද ඉටීමට සුදුසු නොවේමය. යම්හෙයකින් පාකය අඩුවූ බැවින් පාත්‍රසඞ්ඛ්‍යාවට නොයේද, සියලු මිල හෝ එක් කොටසක් හෝ නොදුන් බැවින් තමන් සතුබවට නොපැමිණේද අන්හුට අයත්වේද, එහෙයින් පාකය හා මිලය නිමිකල්හිම අධිෂ්ඨානයට සුදුසුවේ. යම් පාත්‍රයෙක් අධිෂ්ඨානයට සුදුසුවේද, ඒ පාත්‍රය විකප්පනයටත් සුදුසුවේ. ඒ පාත්‍රය අතට ආයේද, නොආයේද ඉටියයුතුය. විකපිය යුතුය. පාත්‍රකාරක තෙමේ මිලලැබ තෙමේ හෝ දෙනු කැමැතිව 'ස්වාමීනි' මම තුඹවහන්සේට පාත්‍රයක් කොට අසුවල් දිනයෙහි පිස තබන්නෙමි'යි කියාද, මහණ තෙමේද ඔහු විසින් පිරිසිඳිනලද දිනයෙන් දසදවස ඉක්මවා නම් නිස්සග්ගිය පාචිත්තියවේ.

ඉදින් පත්‍රකාරකතෙමේ 'මම නුඹවහන්සේට පාත්‍රයක් කොට අසුවල් දිනයෙහි හසුනක් එවන්නෙමි'යි කියා එසේම කෙරේද, ඔහු විසින් එවූ මහණ තෙමේ ඒ මහණහුට නොසැලකෙරේද, අනිකෙක් දැක හෝ අසා හෝ 'ඤාමීනි' නුඹවහන්සේගේ පාත්‍රය නිමවනලදැ'යි සැලකෙරේද, මොහුගේ සැලකිරීම පමණ නොවේ. යම් කලෙක ඔහු විසින් එවනලද්දේම සැලකෙරේද, ඔහුගේ වචනය ඇසූ දවස පටන් දසදවස ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තියවේ. ඉදින් පාත්‍රකාරක තෙමේ 'මම නුඹවහන්සේට පාත්‍රයක් කොට පිස කිසිවකු අත එවන්නෙමි'යි කියා එසේම කෙරේද, පාත්‍රය ගෙණ ආ මහණ තෙමේ තමාගේ පිරිවෙණෙහි තබා ඔහුට ආරොචනය නොකෙරේද, අන් කිසිවෙක් 'කිම, ඤාමීනි' අලුතගෙණ ආ පාත්‍රය සොඳුරුදැ'යි විචාරාද 'ඇවැත' පාත්‍රය කොතැනදැ'යි විචාළවිට 'මෙතම් ඇත්තහු අත එවනලද'යි කියාද, මොහුගේද මේ වචනය ප්‍රමාණ නොවේ. යම් කලෙක ඒ මහණතෙමේ පාත්‍රය දේද, එය ලද දිනපටන් දසදවස ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තියවේ. එහෙයින් දසදවස නොඉක්මවාම ඉටිය යුතුය. විකපිය යුතුය.

එහි පාත්‍රය පිළිබඳ ඉටීම් දෙකෙකි. කයින් හෝ ඉටයි. වචනයෙන් හෝ ඉටයි. ඔවුන්ගේ වසයෙන් ඉටන්නහු විසින් 'ඉමං පත්තං පච්චුද්ධරාමි'යි හෝ 'එතං පත්තං පච්චුද්ධරාමි'යි හෝ මෙසේ හමුවෙහි හෝ නොහමුවෙහි හෝ තුබූ පුරාණපාත්‍රය පසුදුරා අතිකක්හට හෝ දී යම්කිසි තැනක තුබූ අලුත් පාත්‍රය අතින් පිරිමැද 'ඉමං පත්තං අධිට්ඨාමි'යි සිතින් ආභොග කොට කායවිකාරය කරන්නහු විසින් කයින් හෝ ඉටිය යුතුය. වාගෙහද කොට වචනයෙන් හෝ ඉටියයුතුය. එහි අධිෂ්ඨානය තෙමේ දෙවැදෑරුම්ය. ඉදින් අත්පසෙහි වේනම් 'ඉමං පත්තං අධිට්ඨාමි'යි වාගෙහදය කටයුතුය. නැවැත ගැබතුළ හෝ පහය මතුවෙහි හෝ අසල වෙහෙරෙහි හෝ වේද, පාත්‍රය තැබූ තැන සලකා 'එතං පත්තං අධිට්ඨාමි'යි වාගෙහද කටයුතුය. ඉටන්නහු විසින් එකලා වූවහු විසිනුදු ඉටන්නට වටියි. අතිකක්හුගේ සමීපයෙහි ඉටන්නටද වටියි. අතිකක්හුගේ සමීපයෙහි කරන අධිෂ්ඨානයාගේ මේ ආනිසංසය වේ. මාවිසින් ඉටනලදද, නොඉටනලදදැයි මේ මහණහුට විමතියක් උපදීද, අන්‍යයා සිහි කරවා විමතිය සිඳලන්නේය.

කිසිවෙක් පාත්‍ර දසයක් ලැබ සියල්ල තෙමේම පරිභොග කරනු කැමැතතේ වේද, සියලු පාත්‍ර නොඉටිය යුතුය. එක් පාත්‍රයක් ඉටා නැවැත දෙවන දිනයෙහි එය පසුදුරා අනික් පාත්‍රයෙක් ඉටියයුතුය. මේ උපායයෙන් අවුරුදු සියයක් නමුදු පරිහරණය කරනු හැක්කේය. මෙසේ අප්‍රමත්තවූ මහණහුගේ අධිෂ්ඨානවිජහනය කිසි කලෙක වන්නේද, යත්:

කිසි කලෙක වන්නේය. ඉදින් මෙතෙමේ පාත්‍රය අතිකක්හට දේද, ගිහි හෝ වේද, ශික්‍ෂාප්‍රත්‍යක්ඛ්‍යානය හෝ කෙරේද, කලුරිය හෝ කෙරේද, මොහුගේ ලිඞ්ගපරිවර්තනය හෝ වේද, පච්චුද්ධරණය හෝ කෙරේද, පාත්‍රයෙක්හි සිදුරෙක් හෝ වේද, අධිෂ්ඨානය හරියි. 'දීමෙන් සිවුරු හැරීමෙන් ශික්‍ෂාප්‍රත්‍යක්ඛ්‍යානයෙන් කාලක්‍රියාවෙන් ලිඞ්ගපරිවර්තනයෙන් පච්චුද්ධරණයෙන් සත්වැනිව සිදුරෙන්ද අධිෂ්ඨානය විජහනයවේය'යි මෙය කියනලද්දේය. සොරු ගැණීමෙන් හා විශ්වාසයෙන් ගැණීමෙන්ද ඉවීම හරීමය. කොපමණ සිදුරකින් අධිෂ්ඨානය බිඳේද, යත්:- යම් සිදුරකින් මෙනේරිබත් උලක් නික්මේද, පිවිසේද, එපමණ සිදුරෙන් අධිස්ඨානය බිඳෙන්නේය. මේ වනාහි සප්පවිධ ධාන්‍යයෙන් ගෙන් ලාමකධාන්‍යයෙන් කළ බත් උලයි. ඒ සිදුර යකඩසුණෙන් හෝ ඇණයකින් හෝ නැවැත ප්‍රකෘතිමත් කළ කල්හි දසදවසතුළ නැවැත ඉටිය යුතුය. මේ වනාහි 'අනෙනාදසාහං අධිට්ඨෙති විකප්පෙති' යන මෙහි අධිෂ්ඨානයෙහි විනිශ්චයයයි.

විකප්පනයෙහි වනාහි සම්මුඛාවිකප්පනා - පරම්මුඛා විකප්පනායි විකප්පනා දෙකක් වේ. එහි සම්මුඛ විකප්පනා තෙමෝ කෙසේ වන්නීද, යත්: පාත්‍රයන්ගේ එකක් බව හා බොහෝබවද ලඟදුර තුබූබවද දැන ලඟ එකක් වුව 'ඉමං පත්තං'යිද ලඟබොහෝ වුව 'ඉමෙ පත්තෙ'යිද, අත්පසින් දුර එකක් වුව 'එතං පත්තං'යිද අත්පසින් දුර බොහෝ වුව 'එතෙ පත්තෙ'යිද කියා 'තුයහං විකප්පෙමි' කියයුතුය. මේ එක් සම්මුඛා විකප්පනාවක් වේ. මෙපමණකින් තැබීම සුදුසුය. පරිභොගය හෝ හැරලීම හෝ ඉවීම හෝ නොකළයුතුය. 'මය්හං සන්තකං පරිභුඤ්ජ වා, මය්හං සන්තකං විස්සජ්ජෙහි වා, මය්හං සන්තකං යථාපච්චයං වා කරොහි'යි මෙසේ කියූ කල්හි පච්චුද්ධාරය වේ. එතැන් පටන් පරිභොගාදිය කළ හැකිය.

මෙහි අන්‍ය ක්‍රමයෙක්ද වේ. එසේම පාත්‍ර එකක්බව හා බොහෝ බවද ලඟදුර තුබූ බවද දැන එමමහණහුගේ සමීපයෙහි අත්වස එක් පාත්‍රයෙක් වීනම් 'ඉමං පත්තං'යි හෝ අත්පස බොහෝ පාත්‍ර වුවහොත් 'ඉමෙ පත්තෙ'යි හෝ අත්පසින් පිටත එක් පාත්‍රයක් වුවහොත් 'එතං පත්තං' යි හෝ අත්පසින් පිටත බොහෝ පාත්‍ර වුවහොත් 'එතෙ පත්තෙ'යි හෝ කියා පස්සහදහැමියන් අතුරෙහි එක්තරා තමහට කැමැතිවූ යම්කිසිවක්හුගේ නාමය ගෙණ 'තිස්සස්ස භික්ඛුනො විකප්පෙමි'යි හෝ තිස්සාය භික්ඛුනියා - තිස්සාය සික්ඛමානාය - තිස්සස්ස සාමණෙරස්ස තිස්සාය සාමණෙරියා විකප්පෙමි'යි හෝ කියයුතුය. මේ අතිකදු සම්මුඛා විකප්පනාය. මෙපමණකින් තැබීම වටියි. පරිභොගාදීන් අතුරෙහි එකෙකුත්

නොවටියි. ඒ මහණහු විසින් වනාහි 'තිස්සස්ස භික්ඛුනො සන්තකං -පෙ- තිස්සාය සාමණෙරියා සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහී'යි කියූ කල්හි පච්චුද්ධාරය නම්වේ. එතැන් පටන් පරිභොගාදීහුද වටිත්.

පරම්මුඛා විකප්පනා තොමෝ කෙසේ වන්නීද, එසේම පාත්‍ර එකක් බව හා බොහෝ බවද ලඟදුර තුබූබවද දැන 'ඉමං පත්තං'යි හෝ 'ඉමෙ පත්තෙ'යි හෝ 'එතං පත්තං'යි හෝ 'එතෙ පත්තෙ'යි හෝ පෙර කියූ නයින් කියා 'තුය්හං විකප්පනත්ථාය දම්මි'යි කියයුතුය. ඔහුවිසින් 'කවරෙක් තාගේ මිත්‍රයෙක් හෝ වේද, සන්දිට්ඨ මිත්‍රයෙක් හෝ වේදැ'යි විචාළයුතුය. ඉක්බිති අන්‍යයා විසින් පෙරකියූ නයින්ම 'තිස්සො භික්ඛූ'යි හෝ -පෙ- තිස්සා සාමණෙරී'යි හෝ කියයුතුය. නැවැත ඒ මහණහු විසින් 'අහං තිස්සස්ස භික්ඛුනො දම්මි'යි හෝ -පෙ- 'තිස්සාය සාමණෙරියා දම්මි'යි හෝ කියයුතුය. මේ පරම්මුඛාවිකප්පනාය. මෙපමණකින් තබන්නට වටියි. පරිභොගාදීන් අතුරෙහි එකෙකුත් නොවටියි. ඒ මහණහු විසින් දෙවන සම්මුඛා විකප්පනාවෙහි කියූ නයින්ම 'මෙනම් ඇත්තහුගේ සන්තකය පරිභොග කරව'යි හෝ බැහැර කරව'යි හෝ කැමැතිසේ කරව'යි හෝ කියූ කල්හි පච්චුද්ධාරය නම්වේ. එතැන් පටන් පරිභොගාදීහු වටිත්. මේ දෙවැදෑරුම් විකප්පනාවන්ගේ වෙනස හා සමුට්ඨානාදිය සමග සෙසු සියලු වර්ණනා ක්‍රමයද ප්‍රථම කඨින ශික්ෂාපද වර්ණනාවෙහි කියූ නයින්ම දතයුත්තේය.

පත්තශික්ෂාද වර්ණනාව නිමි.

——\\——

'**තෙන සමයෙ**'යි ඌනපඤ්චබන්ධන ශික්ෂාපදයයි. එහි '**න යාපෙති**' යනු ඒ කුඹල් තෙමේ වනාහි ඉදින් ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් නොවූයේ නම් වෙනස්බවටද යන්නේය. මෙසේ ඒ මහණුන් විසින් පීඩාකරන ලද්දේ සෝවාන් බැවින් හුදෙක් සිරුරෙන් පමණක්ම නොයැදුනේය. 'අත්තනාපි න යාපෙති, පුත්තදාරොපිස්ස කිලමති' යනු එහෙයින් කියනලදි. '**ඌනපඤ්චබන්ධනෙන**'යි. එහි අඩුවූ පස්බැඳුමෙක් මේ පාත්‍රයටනුයි ඌනපඤ්චබන්ධන නම. මේ පාත්‍රයෙහි පස්බැඳුමෙක් නොපිරේය යනු අර්ථයි. ඒ අඩු පස් බැඳුම් ඇති පාත්‍රය කරණකොට ගෙණ. ඉත්ථම්භූත ලක්ෂණයෙහි කරණවචනයි. එහි යම්හෙයකින් මුළුමනින් නැති බැවින් බැඳුම් රහිත පාත්‍රයෙහිද පඤ්චබන්ධනයෝ නොපිරෙත්ද, එහෙයින් පදභාජනයෙහි 'අබන්ධනොවා' යනාදිය වදරනලදි. 'ඌනපඤ්චබන්ධනෙනයිද කියූ බැවින් යම් මහණක්හට පඤ්චබන්ධනයෙන් යුත් පාත්‍රයෙක්වේ , ඒ

මහණහුගේ ඒ පාත්‍රය පාත්‍රයෙක් නොවේ. එහෙයින් අතිකක් විනවාගැණීම වටියි. මේ බන්ධනය නම් යම්හෙයකින් බැඳීමට ඉඩ ඇති කල්හි වේද නැති කල්හි නොවේද, එහෙයින් එහි ලක්‍ෂණ දැක්වීම පිණිස 'අබන්ධනොකාසො නාම' යනාදිය කියනලදි. '**අඩ්ඪඞ්ගුල රාජි න හොති**'යි මුවවිටින් යට දැහුල් පමණවූ එකද රෙඛාවක් නොවේද, '**යස්ස අඩ්ඪඞ්ගුලා රාජි හොති**' යම් පාත්‍රයක එබඳු එක් රෙඛාවක් වේද, ඒ පාත්‍රය ඒ රෙඛාවෙහි යට කෙළවර පාවිදින කටුවකින් විද පිස හුරුහන් නියද වැහැරි රැහැන් ආදියකින් හෝ ඊයම් හුයකින් හෝ බැදිය යුතුය. ඒ බැඳුම ආමිස නො ඇලෙනු පිණිස ඊයම් පටකින් හෝ බැඳී සිටුනා කිසි ලහටුවකින් හෝ වැසිය යුතුය. ඒ පාත්‍රයද ඉටා පරිභොග කටයුතුය. සියුම් සිදුරක් හෝ කොට බැදිය යුතුය. පිරිසිදුවූ මීඉටි ලාකඩ දුම්මල ආදියෙන් බැඳීම නොවටියි. පැණි දවා ගල්කුඩු වලින් බැඳීම වටියි. මුවවිට සමීපයෙහි පාවිදින කටුවෙන් විදිනු ලබන්නේ කබල ඝන බැවින් බිඳී යේද එහෙයින් මුවවිටින් යට විදිය යුතුය.

යම් පාත්‍රයක්හුගේ රෙබා දෙකක් හෝ එකක් ම හෝ සතරහුල් වීද, ඒ පාත්‍රයට බැඳුම් දෙකක් දියයුතුය. යම්පාත්‍රයක රෙබාතුනක් හෝ වේද එකක්ම සයහුල් ඇත්තීද ඒපාත්‍රයට බැඳුම් තුනෙකි. යම් පාත්‍රයක රෙබා සතරක් හෝ එකක්ම අහුල් පමණ වේද, ඒ පාත්‍රයට බැඳුම් සතරෙක් වේ. යම් පාත්‍රයක පස් රෙබාවක් හෝ එකක්ම හෝ දසහුල් පමණවේද, ඒ පාත්‍රය බඳිනලද්දේද නොබඳිනලද්දේද පාත්‍රයෙක් නොවේමය. අතික් පාත්‍රයෙක් තෙමේ ඉල්ලා ගතයුතුය. මේ වනාහි මැටියෙන් කළ පාත්‍රයෙහි විනිශ්චයයි. යකඩින් කළ පාත්‍රයෙහි පසක් හෝ එයට වැඩියක් හෝ සිදුරුවේද, ඒ සිදුරුදු යකඩ කුඩුවලින් හෝ ඇණයෙන් හෝ ලොහොමඩුල්ලෙන් හෝ බඳිනලද්දේ මට කරන ලද්දේවේද, එම පාත්‍රය පරිභොග කටයුතුය. නැවැත එක් සිදුරෙක් මහත්වේද, ලොහොමඩුල්ලෙන් බඳින ලද්දේත් මට නොවේද, පාත්‍රයෙහි ආමිස ඇලේද, මේ පාත්‍රය නොකැපවේ. අතික් පාත්‍රයෙක් ඉල්ලා ගත යුතුය.

'**ථෙරො වත්තබ්බො**'යි ස්ථාමීනි' මේ පාත්‍රය පමණින් යුක්තය. සොදුරුය, තෙරුන්ට සුදුසුය'යි තිසදනලද පාත්‍රයෙහි අනුසස් දක්වා 'එය ගණු මැනැවැ'යි තෙරුන්ට කිය යුතුය. '**යො න ගණ්හෙය්‍ය**' අනුකම්පා වෙන් නොගන්නා මහණහුට දුක්කටය වේ. යම් මහණෙක් වනාහි සතුටින් 'මට අතික්න පාත්‍රයකින් කිමැ'යි නොගණීද, ඒ මහණහුට ඇවැත් නොවේ. '**පත්තපරියන්තො**' එසේ ක්‍යූ කල්හි ස්ථවිර තෙමේ ඒ පාත්‍රය ගන්නේ නම්,ස්ථවිරයන්ගේ පාත්‍රය දෙවන ස්ථවිරයන්ට දියයුතුය. ස්ථවිර තෙමේ මට පාත්‍රයෙක් තිබේයි කියා අනුකම්පා වෙන් නොගන්නේ

නම් ඒ නිසදනලද පාත්‍රයම දෙවන ස්ථවිරයන්ට දියයුතුය. මේ පිළිවෙළින් කෙළවර සිටි මහණහු දක්වා ඒ කෙළවර සිටි පාත්‍රය සම්මතලද මහණහු විසින් මේ පාත්‍රය බිඳීම දක්වා පරිහරණය කරවායි කියා පාත්‍රය නිසදූ මහණහුට දියයුතුයයි මෙසේ පෙළෙහි කියූ නයින් පෙරළා කෙළවර සිටි පාත්‍රය '**අදෙසෙ**' ඇඳ පුටු සත් බිතුයෙහි ගැසූ නාදත් ආදීවූ නොතැන්හි නොතැබිය යුතුය. යම් තැනක පළමු කොට සොඳුරු පාත්‍රයක් තබාද, එහිම තැබිය යුතුය. පාත්‍රය තබන පෙදෙස '**අනුජානාමි භික්ඛවෙ ආධාරකං**' යනාදි නයින් ඛන්ධකයෙහි කියන ලද්දේමය. '**න අභොගෙන**' කැඳ පිසීම් ආදීවූ අයුතු පරිභොගයෙන් නොවැළඳිය යුතුය. අතරමගදී ව්‍යාධියක් උපන් කල්හි අන් බඳුනක් නැති කල්හි මැටියෙන් ආලෙප කොට කැඳ හෝ උයන්නට වතුර හෝ උණු කරන්නට වටියි. '**න විස්සජ්ජෙතබ්බො**' අනිකක්හට නොදිය යුත්තේය. සද්ධිවිහාරිකයෙක් හෝ අන්තෙවාසිකයෙක් හෝ අනික් සොඳුරු පාත්‍රයක් තබා 'මේ පාත්‍රය මට සුදුසුය. මේ පාත්‍රය තෙරුන්ට සුදුසුය'යි ගණී නම් වටියි. අන් මහණෙක් හෝ ඒ පාත්‍රය ගෙණ තමන්ගේ පාත්‍රය දේ නම් වටියි. 'මාගේම පාත්‍රය ගෙණ එව්'යි කියයුතු කෘත්‍යයෙක් නැත්තේය. '**පවාරිතානං**' මෙහි සඞ්ඝයාගේ වසයෙන් පැවරූතන්හි පඤ්චබන්ධනයෙන්ම සුදුසුවේයයි කුරුන්දියෙහි කියනලදි. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාවෙන් උපදී. නොසංඥවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

ඌනපඤ්චබන්ධන ශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

'**තෙන සමයෙන**' යනු භෙසජ්ජශික්ෂා පදයයි. එහි '**අතෙථා භනෙත**'යි රජ තෙමේ පිළින්දවච්ඡ තෙරුන්ට ලෙනක් කරනු පිණිස කඳු බෑවුමක් පිරිසිදු කරන එහි උත්සාහයට පැමිණි මහණුන් දැක ආරම්කයකු දෙනු කැමැතිව විචාළේය. '**පාටයෙකො**'යි වෙන්ව එකෙක් '**මාලාකිතෙ**'යි කළ මල් ඇති මල්දම් දරන මල්මාලාවෙන් ප්‍රතිමණ්ඩිත වූයේය යන අර්ථයි. '**තිණණ්ඩුපක**'යි තණසුඹුලක්. '**පටිමුඤ්චි**'යි තැබූයේය. '**සා අහොසි සුවණ්ණමාලා**' දැරියගේ හිසෙහි තැබූ මල ඇත්තීම, තෙරුන්ගේ ඉටීමෙන් රන්පියුම් මාලාවක්වූය. ඒ තණමසුඹුලුව හිසෙහි තැබූ ඇසිල්ලෙහිම රන්මාලාවක් වේවා'යි ස්ථවිර තෙමේ ඉටුයේය. '**දුතියම්පි ඛො -පෙ- උපසඞ්කමි**' දෙවන දවසෙහිම එළැඹියේය. '**සුවණ්ණන්ති අධිමුච්චි**' ස්වර්ණමය වේවා'යි ඉටුයේය.

'**පඤ්චන්නං භෙසජ්ජානං**' ගිතෙල් ආදීන්ගේ '**බාහුලිකා**' ප්‍රත්‍යබහුල භාවයට පිළිපන්නාහුය. '**කොළුම්බෙපි ඝටෙපි**' මෙහි කොළඹ නම් මහත් මුව ඇති සැළි කියනු ලැබේ. '**ඔලීනවිලීනානි**' යටද දෙපස්හිද වැගිරෙන්නාහ. '**ඔකිණ්ණවිකිණ්ණා**'යි ගිතෙල් ආදීන්ගේ ගඳින් බිම සාරන්නවුන්ගෙන් ගැවසුනාහ. බිත්ති සාරන්නාවුන්ගෙන්ද මතුවෙහි හැසිරෙන්නාවුන්ගෙන්ද හාත්පසින් ගැවසුනාහ. '**අන්තොකොට්ඨාගාරිකා**' ඇතුළත මොනවට කරනලද ගබඩාය. '**පටිසායනීයානි**' රස විඳියයුතුවූ පරිභොග කටයුතුවූ යන අර්ථයි. '**භෙසජ්ජානි**' බෙහෙත් කිස කෙරෙත්වා හෝ නොකෙරෙත්වා හෝ මෙසේ ලද ව්‍යවහාර ඇත්තාහු '**ගොසප්පි**' යනාදියෙන් ලෙව්හි ප්‍රකට දැය දක්වා 'යෙසං මංසං කප්පති' යන මෙයින් මුව රොහිත සා ආදීන්ගේ ගිතෙල්ද සඞ්ග්‍රහ කොට දැක්වූහ. යමකුන්ගේ කිරි ඇත්තේද ඔවුන්ට ගිතෙල්ද ඇත්තෙමය. ඒ ගිතෙල වනාහි සුලභ හෝ වේවා දුර්ලභ හෝ වේවා නොමුළාබව පිණිස කියනලදි. වෙඬරුද මෙසේය. '**සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි**'යි තැන්පත් කොට තබා පරිභොග කටයුත්තාහ. කිසේද, යත්:- පෙළෙහි ආ ගිතෙල් ආදීන් අතුරෙහි පළමු කොට ගිතෙල් පෙරබත පිළිගන්නා ලද්දේ එදවස පෙරබත ආමිසසහිතවද ආමිස රහිතවද පරිභොග කිරීම සුදුසුය. පසුබත පටන් සත්දවසක් මුළුල්ලෙහි ආමිසරහිතව පරිභොග කටයුතුය. සත්දවස ඉකුත් කල්හි එක් බඳුනෙක තබනලද්දේනම් එක් නිසගියෙක් වේ. බඳුන් බොහෝ ගණනක තබනලද්දේ නම් වස්තු ගණනින් නිස්සග්ගියාපත්තීහු වෙත්. පසුබත පිළිගන්නාලද්දේ සත්දවස මුළුල්ලෙහි නිරාමිසයට සුදුසුවේ.

පෙරබත හෝ පසුබත හෝ පරිභොගය පිණිස තමන් විසින් පිළි ගන්නා ලද්දක් කොට තමන්ම ගෙණ තබන ලද්දක් අනුභව කිරීම නොවටියි. ඇඟ ගැල්වීම් ආදියෙහි එළවිය යුතුය. සත්දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. අනුභව නොකට යුතුබවට පැමිණි බැවින් 'පටිසායනීයානි'යි කියනලදි. අනුපසම්පන්නයෙක් තෙමේ පෙරබත පිළිගත් වෙඬුරෙන් ගිතෙල් සාද දේද, එදවස පෙරබත ආමිසසහිතව වටියි. ඉදින් තෙමේ කෙරේද, සත්දවසක් නමුත් ආමිසරහිතවම සුදුසුවේ. පසුබත පිළිගත් වෙඬුරෙන් යම් කිසිවකු විසින් කරන ලද ගිතෙල සත්දවසක් නමුත් ආමිසරහිතවම වටියි. තමන් විසින්ම ගන්නාලද වෙඬුරෙන් කළ ගිතෙලෙහි පෙරකියූ පිරිසිදු ගිතෙල් නයින්ම විනිශ්චය දතයුතුය. පෙරබත පිළිගත් කිරෙන් හෝ දියෙන් හෝ කරනලද ගිතෙල් අනුපසම්පන්නයකු විසින් කරනලද්දේ ආමිසසහිතවද එදවස පෙරබත වටියි. තමන් විසින් කරනලද්දේ ආමිසරහිතවම ගතහැකිය. වෙඬරු උණු කරන මහණහුට සාමංපාකය නොවේ. තමන් විසින් පිසිනලද ඒ වෙඬරු සමග ආමිසය

පිළිගත නොහැකියි. පසුබත පටන්ද නොවටීමය. සත්දවසක් ඉක්මීමෙහිද ඇවැත් නොවේ. වස්තුසහිතව පිළිගත් බැවින් ‘තානි පටිග්ගහෙත්වා’යි කියනලද්දේමය. පසුබත පිළිගත් කිරෙන් හා දියෙන් කරනලද ගිතෙල් ඇඟ ගැල්වීම් ආදීයෙහි එළවිය යුතුය. පෙරබතද නොපිළිගත් තමන් විසින් ගත් කිරෙන් හා දියෙන් කරනලද ගිතෙල්, පසුබත පිළිගත් කිරෙන් හා දියෙන් කරන ලද්දවුද, පෙරබත නොපිළිගෙණ තමන් විසින් ගන්නා ලද දැයින් කරනලද්දවුද යන දෙකොටසටද සත්දවස ඉක්මී මෙහි ඇවැත් නොවේ. නොකැප මස් ගිතෙල්හි මේ නයමවේ.

මේ වනාහි විශේෂය වේ. යම් තැනෙක පෙළෙහි දැක්වූ ගිතෙලින් නිස්සග්ගිය වේද, එහි මේ ගිතෙලින් දුක්කයටය වේ. සචජාතීන්ගේ ගිතෙල් බැවිනැයි අන්ධකාත්‍ථකථාවෙහි කාරණ ප්‍රතිරූපකය කියා මිනිස් ගිතෙල් වෙඩරුද ප්‍රතික්‍ෂෙපකරනලද්දේය. සියලු අත්‍ථකථාවන්හි අනුදත් බැවින් ඒ ප්‍රතික්‍ෂෙපය නොමනා ප්‍රතික්‍ෂෙපයෙක්වේ. ඉදිරියෙහිද මෙහි විනිශ්චය එන්නේය. පෙළෙහි කියනලද වෙඩරුද පෙරබත පිළිගන්නාලද්දේ එදවස පෙරබත ආමිසසහිතවද වටියි. පසුබත පටන් ආමිස රහිතවම වටියි. සත්දවසක් ඉක්මීමෙහි නන් වැදෑරුම් බඳුන්හි තැබූ කල්හි බඳුන් ගණනින්ද එක් බඳුනෙකද මිශ්‍රනොකොට පිඩු පිඩු වසයෙන් තැබූ කල්හිද පිඩු ගණනින් නිසග්ගීහු වෙත්. පසුබත පිළිගන්නාලද්දේ ගිතෙල් ලෙසින්ම දත යුතුය. මේ වෙඩුරෙහි දී ගුළිද මෝරු බින්දුද වෙත්. එහෙයින් දේනාලද්ද පිළිගත්තුට වටීයයි උපාධ්‍යායස්ථවිරයෝ කීහ. මහාසීව ස්ථවිරයන් වහන්සේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදත් කාලයෙහි පටන් මෝරුවෙන් නගාගත් ඇතියක්මම කැවාහුයි කීහ. එහෙයින් වෙඩරු වළඳන්නහු විසින් සෝද දී මෝරු වැකුණු මැසි හිනි ආදීන් පහකොට වැළඳිය යුතුය. පිස ගිතෙල් කොට වළඳනු කැමැත්තේ නොසෝදනලද්දක්ද පිසන්නට වටියි. ඒ වෙඩුරෙහි යම් දීයක් හෝ මෝරුවක් හෝ වේද එය නැසී යන්නේය. නිරාමිසවේ. එහෙයින් විකාලයෙහිද වටීය යන අත්‍ථයි. මෙපමණකින්ම ආමිසසඞ්ඛ්‍යාත වස්තුව සහිතව පිළිගන්නාලද්දේ නම් නොවේය, යනු මෙහි අදහසවේ. ආමිසය සමග පැසුනු බැවින් නිරාමිසයෙහිද කුකුස් කරනුවෝ කුකුස් කෙරෙත්.

දැන් තමන්ම ගෙණ තබනලද වෙඩුරෙහිද පෙරබත කිරි දී පිළිගෙණ කළ වෙඩුරෙහිද පසුබත ඒ කිරි දී පිළිගෙණ කළ වෙඩුරෙහිද නොපිළිගෙණ තමන් විසින් ගන්නා ලද්දේ කරනලද වෙඩුරෙහිද අකප්පිය මාංසසත්‍වයන්ගේ වෙඩුරෙහිද සියලු ආපත්ති අනාපත්ති පරිභොග අපරිභොග නය තෙමේ ගිතෙලෙහි කියූ ක්‍රමයෙන්ම ගතයුතුය. තෙල් සිඟීමට ගිය මහණුන්ගේ පාත්‍රයන්හිම ගිතෙල්ද වෙඩරුද පැසවූ තෙල්ද

වක්කරත්. එහි, දී ගිතෙල් බින්දුද බත් උලුද සහල් කඩසහල්ද මැසි ආදීහුද වෙත්. හිරුරැසින් පිසීමකොට පෙරා ගන්නාලද ගිතෙල සත්තාහකාලිකවේ. කිරි හා දී පිළිගෙණ තැබූ බෙහෙත් සමග පිස නස්‍ය කරන්නටද සුදුසුය. ඉදින් වැසි කල්හි ලජ්ජීසාමණේරයෙක් තෙමේ, එහි වැටුනු සුන්සහල් ආදීහු යම්සේ නොපැසෙත්ද, එසේ ගින්නෙහි කකියවා පෙරා නැවැත පිස දේද පෙර නයින්ම සත් දවසක් වටියි.

තෙල් අතුරෙහි, තලතෙල් වනාහි පෙරබත පිළිගන්නාලද්දේ පෙරබත ආමිසසහිතවද වටියි. පසුබත පටන් ආමිස රහිතවම වටියි. සත් දවස ඉක්මීමෙහි මේ තෙල් පිළිබඳ බඳුන් ගණනින් නිසගිබව දතයුතුය. පසුබත පිළිගන්නාලද තලතෙල සත් දවසක් ආමිසරහිතවම වටියි. නොපිළිගෙණ තමන් විසින්ම ගන්නාලද්දක් කොට තබනලද්දේ අනුභව කරන්නට නොවටියි. හිසැ ගැම් ආදියට එලවිය යුතුය. සත් දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. පෙරබත බැදීම් ආදිය නොකොට තල පිළිගෙණ කළ තෙල එදවස පෙරබත ආමිස සහිතවද වටියි. තමන් විසින් කරනලද්ද පසුබත පටන් අනුභව නොකටයුත්තේවේ. හිසැ ගැම් ආදියෙහි එළවිය යුතුය. සත්දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. පසුබත තල පිළිගෙණ කළ තෙල අනුභව නොකට යතුතේමය. සවත්‍ථුකව පිළිගත් බැවිනි. සත්දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. හිසැ ගැම් ආදියෙහි එළවිය යුතුය. පෙරබත හෝ පසුබත හෝ නොපිළිගෙණ තමන් විසින් ගන්නාලද තලවලින් කරනලද තෙලෙහිද මෙම නයවේ. පෙරබත පිළිගත් තල බැද තලපිටි පිරිසිඳු කොට හෝ උණුදියෙන් හෝ තෙමා කළ තෙල ඉදින් අනුපසම්පන්නයකු විසින් කරනලද්දේ නම්, පෙරබත ආමිස සහිතයද වටියි. තමන් විසින් කරනලද්දේ තාවකාලික වස්තුවෙන් වෙන්කළ බැවින් පෙරබත ආමිස රහිතවම වටියි. තමන් විසින් පැසවූ බැවින් ආමිස සහිතය. නොවටියි. සවත්‍ථුකව පිළිගත් බැවින් පසුබත පටන් තමන් විසින් හා අන්හු විසින් කරනලද දෙකම අනුභව නොකටයුතුය. හිසැ ගැම් ආදියෙහි එළවිය යුතුය. සත්දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. ඉදින් උණුදිය මඳවේද, ඉසනලද පමණක්වේද, අව්‍යවහාරිකවේ. සමාපාක සඞ්ඛ්‍යාවට නොයයි. වහා රහිතව පිළිගන්නාලද අබතෙල් ආදියෙහිද වස්තුරහිත තලතෙලෙහි කියනලද සමානවූම විනිශ්චයවේ.

ඉදින් පෙරබත පිළිගත් අබ ආදීන්ගේ සුණුවලින් හිරුරැස් පාකයෙන් තෙල් පිසන්නට හැකිවේද, ඒ තෙල එදවස පෙරබත ආමිසසහිතවද වටියි. එදවස පසුබත පටන් ආමිසරහිතවම වටියි. සත්දවස ඉක්මීමෙහි නිසගි වේ. යම්හෙයකින් වනාහි අබ මීබිජු පිරිසිදු කොට එරඬු ඇටද බැද මෙසේ තෙල් සාදත්ද, එහෙයින් මොවුන්ගේ තෙල අනුපසම්පන්නයන්

විසින් කරනලද්දේ එදවස පෙරබත ආමිස සහිතවද වටියි. වස්තුව තබා යාවජීවක බැවින් වස්තුසහිතව පිළිගැණීමෙහි දෙසෙක් නැත්තේය. තමන් විසින් කරනලද්දේ සත් දවසක් නිරාමිස පරිභොගයෙන්ම පරිභොග කටයුතුය. නොපිළිගත් තමන් විසින් ගන්නාලද්දෙන් කරනලද්දේ අනුභව නොකටයුත්තේ බාහ්‍යපරිභොගයෙන් වටියි. සත්දවස ඉක්මීමෙහිද ඇවැත්නොවේ. තෙල් කිරීම පිණිස අබ මී ඇට එරඩු ඇට හෝ පිළිගෙණ කරනලද තෙල සත්තාහකාලිකවේ. පිළිගත් දියෙන් දෙවන දිනයෙහි කරනලද්දේ සදවසක් වටියි. පිළිගත් දිනයෙන් තෙවන දිනයෙහි කරනලද්දේ පස් දවසක් වටියි. සිවුවන පස්වන සවන සත්වන දිනයෙහි කරනලද්දේ එදවසම වටියි. ඉදින් සත්වන දිනයෙහි කරනලද තෙල අරුණ නැගීම දක්වා තිබේද, නිසගි වේ. පිළිගත් දිනයෙන් අටවන දිනයෙහි කරනලද්දේ අනුභව කටයුතු නොවේ. නිසගි නොවූ බැවින් බාහිර පරිභොගයෙලා ගැණීම වටියි. ඉදිනුදු තෙල නො කෙරේනම් තෙල් පිණිස ගත් අබ ආදීන්ගේ සත්දවස ඉක්මීමෙහිදී දුක්කටයවේ. පෙළෙහි නොදැක්වූ අන්‍යවූද පොල් කොසොඹ කොහොන් කරඹ යොහොඹු ආදීන්ගේ තෙල් ඇත්තේය. ඒ තෙල් පිළිගෙණ සත්දවස ඉක්මවන මහණහුට දුක්කටය වේ. මේ මොවුන් අතුරෙහි වෙනසයි. සෙසු යාවකාලික වස්තුවද යාවජීවික වස්තුවද සලකා සියලු සමපාක සවස්තුකවූද පෙරබත පසුබත පටිගගහිත උගගහිත වස්තුකවූද මොවුන්ගේ විධානය කියූ නයින්ම දතයුතුය.

'**වසාතෙලං**' යනු මහණෙනි' වලස් මස්තෙල, මත්ස්‍ය මස්තෙල, කිඹුල් මස්තෙල, ඌරු මස්තෙල, කොටලු මස්තෙල යන පස් වැදෑරුම් මස්තෙල් අනුදනිමි'යි මෙසේ අනුදැන වදළ මස් තෙල්ය. මෙහිද '**අච්ඡවසං**' යන වචනයෙන් මිනිස්මස් තෙල් හැර සියලු අකප්පිය මාංසයන්ගේ තෙල් අනුදන්නාලද්දේය. මත්ස්‍යග්‍රහණයෙන් කිඹුල්ලුද ගන්නා ලද්දහුවෙත්. රෞද්‍ර මත්ස්‍යයකු බැවින් වෙන්ව කියනලදී. මත්සාදීන්ගේ ගැණීමෙන්ද මෙහි සියලු කප්පිය මාංසයන්ගේ තෙල් අනුදන්නාලදි. මස් අතුරෙහි මනුෂ්‍ය හස්ති අශ්ව සුනඛ නාග සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්, කලුහිස් වලස් යන මොවුන්ගේ දශමාංසයෝ අකැපවෙත්. මස්තෙල් අතුරෙහි එක් මිනිස්මස් තෙල් අකැපය. කිරි ආදීන් අතුරෙහි අකැප කිරෙක්නම් නැත්තේය. අනුපසම්පන්නයන් විසින් කරනලද යාවකාලිකවස්තුවෙන් වෙන්කරනලද මස්තෙල් පෙරබත පිළිගන්නාලද්දේ එදවස පෙරබත ආමිස සහිතවද වටියි. පසුබත පටන් සත්දවසක් නිරාමිසවම වටියි. එහි සියුම් රජස් සමානවූ යම් මසක් හෝ නහරක් හෝ ඇටයක් හෝ රුධිරයක් හෝ වේද, එය අව්‍යවහාරිකවේ. ඉදින් මස්තෙල් පිළිගෙණ තෙමේ කෙරේද, පෙරබත පිළිගෙණ පිස පෙර සත් දවසක් නිරාමිසපරිභොගයෙන් පරිභොග

කටයුතුය. නිරාමිසපරිභොගයම සඳහා 'කාලයෙහි පිළිගන්නාලද්දේ කාලයෙහි පැසවන ලද්දේ කාලයෙහි පෙරන ලද්දේ තෙලපරිභොගයෙන් පරිභොග කරන්නට වටීයයි කියනලද්දේය. එහිද අව්‍යවහාරිකය අව්‍යවහාරිකමවේ. පසුබත පිළිගන්නට හෝ කරන්නට හෝ නොවටීමය. මෙය මෙසේ වදළසේක. 'මහණෙනි' පස්වරු කාලයෙහි පිළිගත් පස්වරු කාලයෙහි පැසවූ පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම් දුක්කටා පත්ති තුනක්වේ. මහණෙනි' පෙරවරු කාලයෙහි පිළිගත් පස්වරු කාලයෙහි පැසවූ පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම් දුක්කටාපත්ති දෙකක්වේ. මහණෙනි 'පෙරවරු කාලයෙහි පිළිගත් පෙරවරු කාලයෙහි පැසවූ පස්වරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම් දුක්කටාපත්තියක් වේ. මහණෙනි' පෙරවරු කාලයෙහි පිළිගත් පෙරවරු කාලයෙහි පැසවූ පෙරවරු කාලයෙහි පෙරූ එය වළඳන්නේ නම් ඇවැත් නොවෙයි.

අතැවැස්සෝ 'ස්වාමීනි' ගිතෙල් වෙඩරු වුරුණුතෙල් එකට පිස යාව කාලිකවස්තුවෙන් වෙන් කරනලද්දේ වටීදැයි උපතිස්ස ස්ථවිරයන්වහන්සේ අතින් විචාළාහුය. 'නොවටිත්ය ඇවැත්ති'යි කීහ. ස්ථවිරයන් වහන්සේ මෙහි පැසවනලද තෙල් කාඩියෙහි මෙන් කුකුස් කෙරෙත්. නැවැත 'ස්වාමීනි' වෙඩරුවෙහි දීගුළි හෝ මෝරු බිඳුවක් හෝ වේනම් මෙය වටීදැ'යි උන්වහන්සේගෙන් ඇසූහ. උන්වහන්සේ 'ඇවැත්ති' මෙද නොවටීය'යි කීහ. ඉක්බිති ඔවුහු උන්වහන්සේට 'ස්වාමීනි' එකට පිස පෙරනලද්දවුහු තෙදවත් වූවාහු වෙත්. රොගයට නිග්‍රහ කෙරෙත්'යි කීහ. ස්ථවිරයන් වහන්සේ 'මැනැවැ ඇවැත්ති'යි පිළිගත්හ. මහාසුම්ම ස්ථවිරයන් වහන්සේ කැපමස් වුරුණුතෙල් ආමිස සහිතවූ පරිභොගයෙහිලා වටියි. අතික් වුරුණුතෙල් ආමිසරහිත පරිභොගයෙන් වටීය'යි කීහ. මහාපදුම ස්ථවිරයන් වහන්සේ 'මේ කිමැ'යි ප්‍රතික්ෂෙප කොට වාතාබාධ ඇති භික්ෂූහු පඤ්චමූල කසට යාගුවෙහි වලස්උෟරු තෙල් ආදිය බහා යාගුපානය කරන්නෝ නොවෙත්ද, ඒ යාගුව තෙද බලවත් බැවින් රොග නිග්‍රහ කෙරෙති'යි කියා එය වටීය'යි කීහ.

**'මධු නාම මක්ඛිකාමධූ'යි** මීමැස්සන් විසින්ද කුඩා මීමැස්සන් විසින්ද, මහබමරමීමස්සන් විසින්ද කරනලද මීයය. එය පෙරබත පිළිගන්නාලද්දේ පෙරබත ආමිසසහිත පරිභොගයටද වටියි. පසුබත පටන් සත් දවසක් නිරාමිස පරිභොගයටම වටියි. සත්දවස ඉක්මීමෙහි ලභවූ සමානවූ මහාමීයක් කඩකඩ කොට තබනලද්දේද අතික් තුනී මීයක් හෝ නොයෙක් බඳුන්හි තබනලද්දේද වස්තු ගණනින් නිසගීහු වෙත්. ඉදින් එක්ම කඩක් එක් බඳුනෙක හෝ අතික් තුනී මීයක් එක් බඳුනෙක හෝ වේද, එමම නිසගියක්වේ. උග්ගහිතකයද කියූ ලෙසින්ම

දතයුතුය. වණලෙපාදියෙහි එළවිය යුතුය. මීවදයක් හෝ මීඉටි හෝ ඉදින් මීයෙන් නොතැවරුනේ පිරිසිදු වූයේ යාවජීවිකවේ. මීයෙන් තැවරුනේ මධුගතිකාම වේ. චීරිකා නම් පියාපත් සහිතවූ දිග් මැස්සෝය. තුම්බල නම් ඇත්තෝද ඇටපියාපත් ඇති කලුමහ බමරුය. ඒ මැස්සන්ගේ ආශ්‍රයස්ථානයන්හි මැලියම් සමානවූ මී ඇත්තේය. ඒ මී යාවජීවිකවේ. '**ඵාණිතං නාම උච්ඡුම්හා නිබ්බත්තං**'යි උක්පැණි පටන් නොපැසවූ හෝ ද්‍රව්‍ය විරහිතව පැසවූ හෝ සියලුම ද්‍රව්‍ය විරහිත උක් විකෘති තොමෝ ඵාණිතයි දතයුතුය. ඒ ඵාණිතය පෙරබත පිළිගත්නාලද්දේ එදවස පෙරබත සාමිසයද වටියි. පසුබත පටන් සත් දවසක් නිරාමිසවම වටියි. සත්දවස ඉක්මීමෙහි වස්තුගණනින් නිසගි වේ. බොහෝ පිඩු සුණු කොට එක් බඳුනෙක දමන ලද්දහු ඝනපැවැතුම් ඇත්තාහු වෙත්ද එක්ම නිසගියෙක්වේ. උග්ගහිතකය කියූ නයින්ම දතයුත්තේය. කෙවල දුම්දීම් ආදියෙහි එළවිය යුතුය. පෙරබත පිළිගත් නොපෙරූ උක්පැණියෙන් කළ හකුරු අනුපසම්පන්නයකු විසින් කරනලද්දේ නම් සාමිසයද වටියි. තමන් විසින් කරනලද්දේ නම් නිරාමිසයම වටියි. පසුබත පටන් ද්‍රව්‍ය සහිතව පිළිගත් බැවින් අනුභව නොකටයුතුය. සත්දවස ඉක්මීමෙහිදී ඇවැත්නොවේ. පසුබත නොපෙරනලදුව පිළිගන්නා ලද්දෙන් කරන ලද්දේද අනුභව නොකටයුතුම වේ. සත්දවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. උක් පිළිගෙණ කළ හකුරෙහිද මෙම නයවේ. පෙරබත පෙරනලදුව පිළිගත් හකුරෙන් කරනලද්දේ, අනුපසපන්නයකු විසින් කරනලද්දේ නම් පෙරබත සාමිසයද වටියි. පසුබත පටන් සත්දවසක් නිරාමිසයම වටියි. තමන් විසින් කරනලද සකුරු පෙරබතද නිරාමිසයම වටියි. පසුබත පෙරනලදුව පිළිගත් උක් පැණියෙන් කරනලද්ද වනාහි නිරාමිසවම සත්දවසක් වටියි. උග්ගහිතකයෙන් කරනලද්ද කියූනය ඇත්තේමය. ගින්නෙහිලා තැවූ ද්‍රව්‍ය රහිත උක්පැණි හෝ කුඩා කුඩා කොට උක් සිඳ කොටා පෙළා පැසවූ බොහෝ සෙයින් කසට සහිතවූ සකුරු හෝ පෙරබතම වටීය'යි මහාඅට්ඨකථාවෙහි කියනලදී. මහාපච්චරියෙහි වනාහි 'ද්‍රවසහිතව පැසවූ මේ උක්හකුරු වටීද, නොවටීදැ'යි විචාරීම කොට 'උක්හකුරු පසුබත නොවටින්නක් නම් නැත්තේය'යි කියනලදි. එබඳු කසටය අව්‍යවහරික බැවින් ඒ යුතුයයි කියනලදී. සිහිල් දියෙන් මැඩ පෙරා කරනලද මීමලින් කළ හකුරු එදවස පෙරබත සාමිසව වටියි. පසුබත පටන් සත්දවසක් නිරාමිසවම වටියි. සත්දවස ඉක්මීමෙහි වස්තුගණනින් දුක්කටය වේ. කිරි බහා කළ මීපැණිය යාවකාලිකවේ. කඩසකුරු කිරිපෙණ බැහැර කොට පිරිසිදු කෙරෙත්. එහෙයින් වටියි. තෙත් මීපුප් පෙරබතද වටියි. බදින ලද්දේද වටියි. බැද තල ආදිය සමග මිශ්‍රකොට හෝ අමිශ්‍රකොට

හෝ කොටනලද්දේද වටියි. ඉදින් ඒ මීමල් ගෙණ මේරය පිණිස යොදත් නම් යොදනලද්ද බීජය පටන් නොවටියි. කෙසෙල් ඉදි අඹ, දෙල්, කොස්, සියඹලා සියලු යාව කාලිකඵලයන්ගේ පැණි යාවකාලිකමවේ. ඉදිනු මිරිස්පලයෙන් පැණි සාදත්ද එද යාවජීවික වේ. '**තානි පටිග්ගහෙත්වා**'යි ගිතෙල් ආදීවූ පස්වැදෑරුම් සියලු බෙහෙත් පිළිගෙණ කළයෙක වෙනස් නොකොට තබාද, සත්දවස ඉක්මීමෙහි එක්ම නිසගියෙක් වේ. පස් වැදෑරුම් බෙහෙත් පිළිගෙණ කළයෙක වෙනස් නොකොට තබාද, සත්දවස ඉක්මීමෙහි එක්ම නිසගියෙක්වේ. පස්වැදෑරුම් බෙහෙත් වෙන්කළ කල්හි සත් දවස නොඉක්මවා ගිලනහු විසින්ද, නොගිලනහු විසින්ද, කියූ නයින්ම සැපසේ වැළඳිය යුතුය.

ව්‍යාධිඔදිස්ස - පුග්ගලොදිස්ස - කාලොදිස්ස - සමයොදිස්ස - දෙසොදිස්ස - වසොදිස්ස - හෙසජ්ජොදිස්ස යි ඔදිස්සය සත් වැදෑරුම්වේ. එහි ව්‍යාධිඔදිස්ස නම් 'මහණෙනි' අමනුෂ්‍යකාබාධයෙහි අමුමස් අමුලේ අනුදනිමි'යි මෙසේ ව්‍යාධීන් උදෙසා අනුදන්නාලද්දේය. ඒ අමුමස් අමුලේ ඒ ආබාධයෙන්ම පෙළීම් ඇත්තහුට වටියි. අන්හට නොසුදුසය. එද කාලයෙහි හා විකාලයෙහිද කැපයද අකැපයද ගැණීම වරද නොවේ. පුග්ගලොදිස්ස නම් 'මහණෙනි'[1] මහණහුට[2] අනුදනිමි. මහණෙනි', මුවදෙරින් පිටතට ගෙණ අනුභව නොකටයුතුය'යි මෙසේ පුද්ගලයා උදෙසා අනුදන්නා ලද්දේය. ඒ ගොමත්‍ථය ඒ මහණහුටම සුදුසුවේ. අන්හට සුදුසු නොවේ. කාලොදිස්ස නම්, ගුථ, මූත්‍ර, අලු, මැටි යන සිවුවැදෑරුම්වූ මහාවිකටයන් අනුදනිමි'යි මෙසේ සපියන් දෂ්ටකළ කාලය උදෙසා අනුදන්නා ලද්දේය. ඒ චතුර්විධ මහාවිකටය ඒ කාලයෙහිම නොපිළිගන්නාලද්දේද වටියි. අන් කලෙක ගැණීම සුදුසුනොවේ. සමසොදිස්ස නම් 'ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා' යනාදිනයින් ඒ ඒ සමය උදෙසා අනුදත් අනාපත්තීහුය. ඒ අනුදන්නාලද්දහු ඒ ඒ කාලයෙහිම අනාපත්තීහු වෙත්. අන් කලෙක්හි නොවෙත්. දෙසොදිස්ස නම්, 'මහණෙනි' මෙබඳු පසල් දනවුහි විනයධරයා පස්වන කොට ඇති ගණයා විසින් උපසම්පදව අනුදනිමි'යි මෙසේ පසල් දනවු උදෙසා අනුදත් උපසම්පදදීහුය. ඒ උපසම්පදදීහු එහිම වටිත්. මධ්‍යම දෙශයෙහි නොවටිත්. වසොදිස්ස නම්, 'මහණෙනි' වුරුණු බෙහෙත් අනුදනිමි'යි මෙසේ වුරුණු නාමයෙන් අනුදන්නාලද්දය. මිනිස් වුරුණු හැර සියලු කැප අකැප වුරුණු තෙලක් වේද, ඒ වුරුණු එය ප්‍රයොජන කොට ඇත්තන්ට තෙලපරිභොගයෙන් පරිභොග කිරීම වටියි. මෙය හෙසජ්ජොදිස්ස නම්, 'මහණෙනි' පස්වැදෑරුම් බෙහෙත් අනුදනිමි'යි මෙසේ භෛෂජ්‍ය නාමයෙන් අනුදත් ආහාර පිණිස ගැණීමට සමත්වූ

1. වමාරා අනුභව කරන 2. වමාරා අනුභව කිරීම 3. (විනාසයට පත් ද්‍රව්‍ය)

ගිතෙල්, වෙඬරු, තල, තෙල්, මී, හකුරුය. ඒ පංචවිධ භෛෂජ්‍යයන් පිළිගෙණ එදවස පෙරබත සැපයේද පසුබත පටන් ප්‍රත්‍යය ඇති කල්හි කියූ නයින්ම, සත්දවසක් පරිභොග කටයුතුය. '**සත්තාහාතික්කන්තෙ අතික්කන්තසඤ්ඤී නිස්සග්ගියං පාචිත්තියං**' ඉදින් අබැටක් පමණවේද, වරක් හෝ ඇඟිල්ලෙන් ගෙණ දිවින් ලෙවින පමණ වේද, නිස දිය යුතුමය. පාචිත්තියද දෙසිය යුතුය. '**න කායිකෙන පරිභොගෙන පරිභුඤ්ජිතබ්බං**'යි කය හෝ කයෙහි හටගත් වණය හෝ ආලෙප නොකට යුතුය. ඒ ගිතෙල් ආදියෙන් ආලෙප කළ කසාවත් සැරයටි වහන් පාතබන පුවරු ඇඳ පුටු පරිභොග නොකටයුත්තාහ. දෙරජනෙල්, කවුළුවල අතින් ගන්නා ආලෙප නොකටයුත්තේයයි මහාපච්චරියෙහි කියනලද්දේය. කසටෙහි බහා දෙර ජනෙල් කවුළු ආලෙප කටයුතුය'යි මහාඅට්ඨකථාවෙහි කියනලදී.

'**අනාපත්ති අන්තො සත්තාහං අධිට්ඨෙති**' යනු සත්දවසතුල ගිතෙල්ද තලතෙල්ද වුරුණුද මුදුනෙහි ගාන තෙලට හෝ ඇඟ ගැමට හෝ, මී වණලෙපයට එළඹීතය. ගෘහධූපනයට ඉටාද ඇවැත් නොවේ. ඉටූ තෙල් නොඉටූ තෙල් බඳුනෙක එක්කරනු කැමැත්තේ වේද, බඳුනෙහිවූ සියුම් සිදුර එක්කළ එක්කළ තෙල් පරණ තෙලින් යටපත් කරනු ලැබේද නැවැත ඉටිය යුතුය. තවද මහාමුඛයෙක් වේද, ඉක්මන්වම බොහෝ තෙල් ඇතුල්ව පරණතෙල් යට කෙරේද, නැවැත ඉටීම් කිසෙක් නැත්තේය. ඒ තෙල ඉටූගත ඇත්තේම වේ. මේ නයින් ඉටූ තෙල්බඳුනෙහි නොඉටූතෙල් වැක්කිරීමද දතයුතුය. '**විස්සජ්ජෙති**'යි මෙහි දෙදෙනකු සන්තකය එකකු විසින් පිළිගන්නා ලද්දේ නොබෙදන ලද්දේවේද සත්දවස ඉක්මීමෙහි දෙදෙනාහටම ඇවැත් නොවේ. නිසගි නොවේය යන අදහසය. මහණක්හු විසින් පිළිගත් බැවින් සත් දවස ඉක්මීමෙහි යම් කිසි මහණක්හට පරිභොගකිරීම සුදුසුනොවේ. යමකු විසින් පිළිගන්නා ලද්දේද, හෙතෙමේ 'ඇවැත' මේ තෙල ඔබ සත්දවසක් පමණ පරිභොග කරහු'යි අන් මහණක්හට කියයිද, හෙතෙමේද පරිභොගය නොකෙරේ'යි. එකල්හි කවරක්හට ඇවැත්වේද, යත්: කිසිවකු හටත් ඇවැත් නොවේ. කුමක් හෙයින, යත්: යමක්හු විසින් පිළිගන්නා ලද්දේද, ඔහු විසින් හළබැවිනි. අන් මහණහු නොපිළිගත් බැවිනි. '**විනස්සති**'යි අපරිභොගය වේ. '**වන්තෙන**' යනු යනාදි තන්හි පරිත්‍යාග කරන කැමැති සිතින් බෙහෙත හරනලද්දේ වේද, වමනය කරනලද්දේවේද, මුදනලද්දේවේද, ඒ සිත වන්තය. වන්තය, මුක්තයයි කියනු ලැබේ. ඒ සිතින් පුද්ගල තෙමේ අපෙක්‍ෂා රහිතයයි කියනුලැබේ. මෙසේ අපෙක්‍ෂා රහිතව හෙරණක්හට දනය කොට යන අර්ථයි. මේ කාරණය කුමක් හෙයින් කියනලද්දේද, යත්: මෙසේ සත්

දවස තුළ දනය කොට නැවැත ලබා පරිභොග කරන මහණහුට ඇවැත් නොවේයයි දක්වනු පිණිසැයි **මහාසුමම** ස්ථවිරයන් වහන්සේ කීහ. **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ 'අපෙක්ෂාරහිතව දෙනලද මෙය නොඉල්ලිය යුතුය. සත් දවසතුළ දුන් මහණහුට නැවැත පරිභොගයෙහි ඇවැතක් නැත්තේමය. සත් දවස ඉක්මවන මහණහුට පරිභොගයෙහි අනාපත්ති දක්වනු පිණිස මෙය කියනලදැයි කීහ. එහෙයින්ම දෙනලද බෙහෙත ඉදින් හෙරණෙක් තෙමේ සකස් කොට හෝ සකස් නොකොට හෝ ඒ මහණහුට නස්‍ය කිරීම පිණිස දෙන්නේ නම් ගෙණ නස්‍ය කර්‍මය කටයුතුය. ඉදින් බාලයෙක් වේනම් දෙන්නට නොදනීනම් අන් මහණක්හු විසින් 'හෙරණ' තෙල් තිබේදැ'යි විචාළ යුතුය. 'ස්වාමීනි' එසේය, ඇත්තේයයි කියූ කල්හි 'ගෙණ එව, තෙරුන්ට බෙහෙත් කරන්නෙමුයි මෙසේද වටියි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. කඨිනසමුට්ඨානිකය. අක්‍රියා සමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

භෙසජ්ජශික්ෂාපදවර්ණනාව නිමි.

—||—

'**තෙන සමයෙන**' යනු වස්සිකසාටිකශික්ෂාපදයයි. එහි '**වස්සිකසාටිකා අනුඤ්ඤාතා**'යි චීවරක්ඛන්ධකයෙහි විසාඛා වස්තුවෙහි අනුදන්නා ලද්දීය. '**පටිගච්චෙව**' පෙරම. '**මාසො සෙසො ගිම්හානං**' ග්‍රීෂ්මමාස පිළිබඳ සිවු මාසයෙහි එක් පැසුළුමස ඉතිරිව '**කත්වා**' මැසීම රඳන් කිරීම කප්බිඳු තැබීම කෙළවර කොට ඇති කෘත්‍යයන් නිමකොට කරන්නහු විසින්ද එකක්ම කොට වැසි කාලයෙහි 'ඉමං වස්සිකසාටිකං අධිට්ඨාමි'යි කියා ඉටිය යුතුය. දෙකක් ඉටීම නොවටියි. '**අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ**' ගිම්හාන නම්වූ අතිරෙක මාසයක් ශෙෂව ඇතිකල්හි '**අතිරෙකද්ධමාසෙ සෙසෙ ගිම්හානෙ කත්වා**' යන මෙහි සිට වැසි සළුව පිළිබඳ පරියෙසනක්ඛෙත්ත, කරණක්ඛෙත්ත, නිවාසනක්ඛෙත්ත, අධිට්ඨානක්ඛෙත්තයි සිවුවැදෑරුම්වූ ක්ෂෙත්‍රයද, කුච්ඡිසමය, පිට්ඨිසමයයි දෙවැදෑරුම්වූ සමයයද, පිට්ඨිසමයචතුක්ක, කුච්ඡිසමයචතුක්කයි දෙවැදෑරුම් වූ චතුෂ්කද දතයුතුය.

එහි පොසොන් මස මුල් පසළොස්වක පොහොයෙන් පැසුළු පැළවිය දින පටන් කෘෂ්ණපක්ෂයෙහි පොහොය දක්වා මේ එක් අඩමස පරියෙසනක්ඛෙත්තයද, කරණක්ඛෙත්තයද වේ. මේ අතර වැසි සළුව නොලද්දේ නම් සොයන්නටද, ලද්දේ නම් කරන්නටද වටියි.

හදින්නටද ඉටන්නටද නොවටියි. කෘෂ්ණ පක්ෂප්‍රෞෂ්ඨයාගේ පැළවිය දින පටන් ඇසළමස පසළොස්වක දක්වා මේ එක් අඩ මස සෙවීම කිරීම හැඳීම යන තුනටම ක්‍ෂෙත්‍රයවේ. මේ අතර සොයන්නටද කරන්නටද හඳින්නටද වටියි. ඉටීමම නොවටියි. ඇසළමස පසළොස්වක පොහොයෙන් පැසුළු පැළවිය දින පටන් ඉල් මස පුරපසළොස්වක දක්වා මේ සිවුපස සෙවීම කිරීම හිඳීම ඉටීම යන සතරටම ක්‍ෂෙත්‍රය වේ. මේ අතර නොලද්දේ නම් සොයන්නටද, ලද්දේ නම් කරන්නටද හඳින්නටද ඉටන්නටද වටියි. මේ වනාහි චතුර්විධ ක්‍ෂෙත්‍රයයි දතයුතුය. ඉල්මස පසළොස්වක පොහොයෙන් පැසුළු පැළවිය දින පටන් පොසොන් මස මුල් පසළොස්වක දක්වා මේ සත්මස පිටයීසමය නම්වේ. මේ අතර 'වැසිසළුවට කාලය'යි යනාදි නයින් සිහි ඉපදවීම කොට නොනෑ නොපැවරූ තැනින් වැසිසළු සිවුර නිපදවන මහණහුට මේ ශික්‍ෂාපදය කරණ කොට නිස්සග්ගිය පාචිත්තිය වේ. 'මට වැසිසළුසිවුර දෙවු'යි යනාදිනයින් විනවීම කොට නිපදවන මහණහුට අඤ්ඤාතකවිඤ්ඤත්ති ශික්‍ෂාපදයෙන් නිස්සග්ගිය පාචිත්තිය වේ. කියූලෙසින්ම සිහි ඉපදවීම කොට නෑ පැවරූ තැනින් නිපදවන මහණහුට මේ ශික්‍ෂාපදයෙන් නිසගගිය පාචිත්තිය වේ. විනවීම කොට නිපදවන මහණහුට අඤ්ඤාතකවිඤ්ඤත්ති ශික්‍ෂාපදයෙන් ඇවැත් නොවේ. මෙය **පරිවාරයෙහි:**

'මාතරං චීවරං යාචෙ - නො ච සඞ්ඝෙ පරිණතං
තෙනස්ස හොති ආපත්ති - අනාපත්ති ච ඤාතකෙ,
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා'ති'

'සඞ්ඝයාට නො පිරිනමනලද සිවුරක් නොඉල්ලන්නේය. ඉදින් මවගෙන් ඉල්ලන්නේය ඔහුට කවර ශික්‍ෂාපදයකින් ඇවැත් වේද නෑයන්ගෙන් ඉල්ලීමෙහි දී ඇවැත් නොවේ. මේ ප්‍රශ්නය දක්‍ෂයන් විසින් සිතිය යුතුය'යි කියනලදී. මේ ප්‍රශ්නය මේ අර්ථය සඳහා කියනලද්දේය. මෙසේ පිටයීසමයචතුෂ්කය දතයුතුය. පොසොන් මස මුල්පසළොස්වක පැසුළු පැළවිය දින පටන් ඉල් පසළොස්වක දක්වා මේ පස්මස කුච්ජිසමය නම්වේ. මේ අතර කියූ නයින් සිහි ඉපදවීම කොට නොනෑ නොපැවරූ තැනින් වැසිසළු සිවුර නිපදවන මහණහුට වත් බිඳීම නිමිති කොට දුක්කටය වේ. යම් මිනිස් කෙනෙක් පෙරද වැසිසළු සිවුර දෙත්ද මොවුහු වනාහි ඉදින් තමාගේ නොනෑ නොපැවරූවෝ වෙත්ද එහෙයින් වත් බිඳීමෙක් නැත්තේය. ඔවුන් සමීපයෙහි සතුප්පාදකරණය අනුදන් බැවිනි. විනවීම කොට නිපදවන මහණහුට අඤ්ඤාතකවිඤ්ඤත්ති ශික්‍ෂාපදයෙන් නිස්සග්ගිය පාචිත්තිය වේ. මේ වනාහි ප්‍රකෘතියෙන් වැසිසළුදෙන්නවුන් අතුරෙහිද වේමය. කියූ නයින්ම සිහි ඉපදීම කොට

නෑ පැවරූ නැතින් නිපදවන මහණහුට මේ ශික්ෂාපදයෙන් ඇවැත් නොවේ. විනවීම කොට නිපදවන මහණහුට අඤ්ඤාතක විඤ්ඤත්ති ශික්ෂාපදයෙන් ඇවැත් නොවේ. 'දෙථ මෙ' මෙය වනාහි සොයන කාලයෙහි නොනෑ නොපැවරුවක්ම සඳහා කියනලදී. කුවජ්ජසමයවතුෂ්කය මෙසේ දතයුතුය.

**'නග්ගො කායං ඔවස්සාපෙති, ආපත්ති දුක්කටස්ස'** යනු මෙහි දියබිඳුගණනින් නොකොට නෑමෙහි කෙළවර වසයෙන් ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටාපත්තියෙන් කරවිය යුතුය. එදවනාහි ගස්වැල් ආදි කිසිවකින් ඇවුරුම් නැති තැනෙක අහසින් වැඩුනු ජලයෙන්ම නාන මහණතෙමේය. නාන කොටු වැව් ආදියෙහි කළයෙන් වක්කරනලද ජලයෙන් හෝ නාන මහණහුට ඇවැත් නොවේ. **'වස්සං උක්කඩ්ඪීයති'**යි කළ කෙළවර ඇති වැසිසළුවෙන් ග්‍රීෂ්මඍතුව පිළිබඳ පශ්චිමමාසය ගෙවා නැවැත වස්සාන ඍතුවගේ ප්‍රථම මාසය උඩට ඇද ග්‍රීෂ්ම ඍතුවෙහි පශ්චිම මාසයම කෙරෙත්ද, වැසිසළුව සෝද තැබිය යුතුය. නොඉටනලද්දී විකපනය නොකරන ලද්දී දෙමසක් පරිහාරය ලබයි. වස් එළැඹෙන දිනයෙහි ඉටිය යුත්තීය. ඉදින් සිහි මුළා බැවින් හෝ නොපොහොනා බැවින් හෝ නොකරනලද්දීවේද, ඒ දෙමසද වස්සාන ඍතුව පිළිබඳ ඒ සිවු මසයදැයි සමසක් පරිහාරය ලබයි. ඉදින් ඉල් මාසයෙහි කඨිනය අතුරනු ලැබේද, අනික් සිවුමසකුදු පරිහාරය ලබයි. මෙසේ දසමසෙක්වේ. එයින් පසුද චීවර ප්‍රත්‍යාශාවක් ඇති කල්හි මූලචීවරය කොට තබන්නහුට එක් මසෙක්යි මෙසේ එකොළොස් මසක් පරිහාරය ලබයි. එක් දවසක්ය දෙදවසක්ය යනාදි වසයෙන් දසදවස දක්වා වස් එළැඹෙන දිනය නො පැමිණි කල්හි හෝ වසතුළ හෝ ලදද නිමවනලදද කවරකලෙක, ඉටිය යුතුදැයි මේ ඉටීම අට්ඨකථාවන්හි නොවිචාරණලද්දේය. ලද දින පටන් දස දවස තුළ නිමවන ලද්දී වනාහි ඒ දසදවසතුළම ඉටිය යුත්තීය. දසදවස ඉක්මීමෙහිදී නිමවන ලද්දී එදවස්හිම ඉටිය යුත්තීය. දස දවස නොපොහොනා කල්හි චීවරකාලය නොඉක්මවිය යුත්තීය. මේ අපගේ අත්තනොමතියයි. කුමක් හෙයින යත්: 'මහණෙනි' තුන් සිවුර ඉටන්නට විකපනය නොකරන්නට, වැසිසළුව වර්ෂාඍතුව පිළිබඳ සිවුමස ඉටන්නට ඉන් මත්තෙහි විකපනය කරන්නට අනුදනිමි'යි වදරන ලද්දේද, එබැවිනි. එහෙයින් වස් එළැඹෙන දිනෙන් පෙර දසදවස ඉක්මීමෙහිද ඇවැත් නොවේ. 'දසදවසක් පරම කොට ඇති කාලයක් අතිරෙක චීවරය දැරිය යුත්තේය'යි ද වදරන ලදී. එහෙයින් එක් දවස දෙදවස යනාදි වසයෙන් දස දවස දක්වා වස් එළැඹෙන දිනය නොපැමිණි කල්හි වසතුළ ලදද, නිමවනලදද කියූ නයින්ම දස දවස තුළ හෝ

එදවස හෝ ඉටිය යුත්තීය. දස දවස නොපොහොනා කල්හි චීවර කාලය නොඉක්මවිය යුත්තීය. එහි 'වර්ෂාසෘතුව පිළිබඳ සිවුමස ඉටන්නටැ'යි කීමෙක් වන්නේය. එසේ කී බැවින් සිවු මසතුළ යම් ඒ කලෙක ඉටන්නට වටීද, ඉදින් මෙසේ නම් 'කුණට පිළිසන ආබාධය යම්තාක්ද ඒතාක් ඉටන්නටැයි වදරනලදද, ඕ තොමෝත් දස දවස ඉක්මවියයුත්තී වන්නීය. මෙසේ ඇති කල්හි 'දස දවසක් පරම කොට ඇති කාලයක් අතිරෙකචීවරය දැරිය යුත්තේය, යන මේ කීම විරුද්ධ වේ. එහෙයින් කියනලද්දම ගතයුතුය. අන්‍යවූ හෝ නිශ්චල කරුණක් ලැබ හැරිය යුතුය. තවද **කුරුන්දියෙහි** නිස්සග්ගියාවසානයෙහි 'කවර දවසක ඉටිය යුත්තීද, ලද දින පටන් දස දවසතුළ නිමියාද, ඒ දස දවසතුළම ඉදින් නොපොහොනේ නම් ඉල් පසළොස්වක දක්වා පරිහාරය ලබාය'යි කියනලදී. '**අච්ඡින්න චීවරස්ස**'යි මෙය වැසි සළුව සඳහාම කියනලදී. නග්නවූ ඔවුන්ට කය තෙමේම නිමිත්කොට ඇවැත් නොවේ. මෙහිද මාහැඟි වැසි සළුවක් හැඳ නාන්නහුගේ චෞරොපද්‍රවය **ආපද** නම්වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානයි. නොසංඥවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවෙද්‍යය. කාය කර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

වස්සිකසාටිකශික්ෂාපදවර්ණනාව නිමි.

——॥——

'**තෙන සමයෙන**'යි චීවර අච්ඡින්දන ශික්ෂාපදයයි. එහි '**යම්පි ත්‍යාහං**'යි 'මම තට යම් කරුණක් නිසා සිවුරක් දුන්නෙම්ද, ඒ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ වනාහි 'මාගේ පාසිවුරු වහන් පසුතුරුණු උසුලමින් මා සමග චාරිකාවට යන්නේය'යි දුන්නේය. එහෙයින්ම 'මයා සද්ධිං ජනපද චාරිකං පක්කමිස්සති'යි කීයේය. '**අච්ඡින්දි**' බලාත්කාරයෙන් ගත්තේය. තමාගේය යන හැඟීමෙන් ගත් බැවින් මේ උපනන්ද භික්ෂූහට පරිජියෙක් නැත්තේය. වෙහෙස කොට ගත් බැවින් ඇවැත් පනවනලදි. '**සයං අච්ඡින්දති නිස්සග්ගියං පාචිත්තියං**' යනු එක් සිවුරක්ද එකට බැඳි බොහෝ සිවුරුද අසිඳ ගන්නා මහණහුට එක් ඇවැතක්වේ. එකට නොබැඳුනු වෙන්වෙන්ව තුබූ බොහෝ සිවුරු අසිඳ ගන්නා මහණහුට 'සඞ්ඝාටිය ගෙණ එව, උත්තරාසඞ්ගය ගෙණ එව'යි මෙසේ ගෙන්වන මහණහුටද වස්තුගණනින්ඇවැත්හු වෙත්. 'මා විසින් දුන් සියල්ල ගෙණ එව'යි කියන්නහුටද එක් වචනයකින්ම බොහෝ ඇවැත්හු වෙත්. '**අඤ්ඤං ආණපෙති ආපත්ති දුක්කටස්ස**'යි සිවුර ගණුව'යි අණවාද, එක් දුක්කටයෙක් වේ. අණවනලදුයේ බොහෝ සිවුරු ගණීද, එක් පාචිත්තියක් වේ. 'සඞ්ඝාටිය ගණුව, උත්තරාසඞ්ගය ගණුව'යි කියන්නහුට වචනයක් වචනයක් පාසා

දුක්කට වේ. 'මා විසින් දෙනලද සියලු සිවුරු ගණුව'යි කියන්නහුට එක් වචනයෙන් බොහෝ ඇවැත්හු වෙත් '**අඤ්ඤං පරික්ඛාරං**' විකප්පනයට පොහොනා පශ්චිමචීවරය තබා යම් කිසිවකි. යටත් පිරිසයින් හිද්දක්ද වේ. වෙළා තැබූ හිදින්හි වස්තුගණනින් දුක්කටයෝ වෙත්. ලිහිල් කොට වෙළූ හිදීන්හි මෙය්ය. දැඩිකොට බඳිනලද්දවුන් කෙරෙහි වනාහි එක්ම දුක්කටයෙක් වේය'යි **මහාපච්චරීයෙහි** කියනලදී. හිදිතුලාවෙහි බහනලද්දවුන් කෙරෙහිද මෙම නයවේ. පසුම්බියෙක ලා ලිහිල් කොට බැදි තද කොට බැද තිකුළු ආදීවූ බෙහෙත් හිද මෙම නයවේ.

'**සො වා දෙති**'යි 'ස්වාමීනි' නුඹ වහන්සේටම මෙය සරුප්යයි මෙසේ හෝ දේය. නොහොත් ඇවැත්ති' අපි, තට වත් පිළිවෙත් කරන්නේය, අපගේ සමීපයෙහි උපාධ්‍යායග්‍රහණය කරන්නේය, ධර්‍මය ප්‍රගුණ කරන්නේය'යි සිවුරක් දුනිමු. දැන් ඒ තෝ වත් නොකෙරෙහි, උපාධ්‍යායග්‍රහණය නොකෙරෙහි, ධර්‍මය ප්‍රගුණ නොකෙරෙහි'යි මේ ආදිය කියනලදුයේ 'ස්වාමීනි' සිවුර පිණිස කියහුයි හඟිමි, ඔබවහන්සේගේ මේ සිවුරයයි තුටුවූයේ හෝ කිපියේ හෝ දේද, මෙසේද හෙතෙමේ හෝ දෙයි. දිග්ගිය ලදරු ඒ මහණක්හට නවතිවූ කියාද, හෙතෙමේ නොවතීද, 'සිවුර අල්ලා වළකාලවූ'යි කියාද, ඉදින් මෙසේ නවතීනම් මැනැවි. ඉදින් ඔබවහන්සේ පාසිවුරු පිණිස කියහුයි හඟිමි, 'ගණිවූ'යි ඒ සිවුර දේද, මෙසේද හෙතෙමේ හෝ දෙයි. ගිහි වූවකු හෝ දැක 'අපි තට වත් කරන්නේය'යි පාසිවුරු දුනිමු, දැන් ඒ තෝ සිවුරු හැර ගිහිව හැසිරෙහි කියාද, අන්‍යයා 'ඔබවහන්සේගේ පාසිවුරු ගණිවූ'යි දේද, මෙසේද හෙතෙමේ හෝ දෙයි. 'මා වෙත උපාධ්‍යායග්‍රහණය කරන්නාවූම තට දෙමි, අන් තැනක උපාධ්‍යාය ග්‍රහණය කරන්නක්හට නොදෙමි, වත් කරන්නක්හට දෙමි, නොකරන්නක් හට නොදෙමි. ධර්‍මය පුහුණු කරන්නක්හටම දෙමි. පුහුණු නොකරන්නක් හට නොදෙමි. සිවුරු නොහරින්නක්හටම දෙමි. සිවුරු හරින්නක්හට නොදෙමි'යි මෙසේ දීම නොවටියි. දෙන්නහුට දුක්කටය වේ. ගෙන්වීම නොවටියි. බලාපොරොත්තු හැර ඔහුට දුන් පිරිකරක් පැහැර ගන්නේ බඩුව අගය කිරීමෙන් කරවිය යුත්තේය. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රි සමුට්ඨානිකය. කායචිත්තයෙන්ද වාචාචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාවෙන් සමුට්ඨානයවේ. සංඥාවිමොක්ෂය සචිත්තකය. ලොකවද්‍යය කායකර්‍මය. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

චීවරඅච්ඡින්දන ශික්ෂාපදවර්‍ණනාවි නිමි.

——॥——

**තෙන සමයෙන**' සුත්තවිභඞ්ගයුත්ති ශික්ෂාපදයයි. එහි '**ඛොමං**' යනු එනම් ගස් වැහැරියෙන් කළහුය. '**කප්පාසිකං**' කපුවෙන් නිපන්හුය. '**කොසියං**' කිහිරිහුයෙන් කැට කරනලදහුය. '**කම්බලං**' එළුලොමින් කළහුය. '**සාණං**' හණ වැහැරියෙන් කළහුය. '**භඞ්ගං**' වෙන් වෙන්ව වැහරියෙන් කළහුයයි ඇතැමුහු කියත්. මේ පස මිශ්‍ර කොට කළහු, සඞ්ගයි දත යුතුය. '**වායාපෙති පයොගෙ පයෙගෙ දුක්කටං**' රෙදිවියන්නහුට හොත්කන වෙම්දඬු ආදිය නැත්තාහුද ඒ හොත්කන වෙම්දඬු වනයෙන් ගෙණ එන්නෙමි'යි වෑයක් හෝ පොරොවක් හෝ මුවහත් තබාද එතැන් පටන් උපකරණ පිණිස හෝ සිවුර පියවනු පිණිස හෝ යමක් යමක් කෙරේද, ඒ හැමතැන්හි රෙදිවියන්නහුගේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා මහණහුට දුක්කටය වේ. දිගින් වියතක් පමණද සරසි රියනක් පමණද වියූ කල්හි නිස්සග්ගිය පාචිත්තිය වේ.

**මහාපච්චරියෙහි** වනාහි කෙළවර දක්වා වියවන මහණහුට පුවරුවක් පුවරුවක් පාසා නිස්සග්ගිය පාචිත්තිය වේයයි කියනලදී. එද මෙම ප්‍රමාණය සඳහ කියනලද්දේයයි දතයුතුය. විකපනයට පොහොනා පශ්චිමචීවරය චීවරසඞ්ඛ්‍යාවට යයි. තවද මෙහි විනිශ්චය මෙසේ දතයුතුය: හූ, තමන් විසින් වියවනලද්දේ අකැප වේ. නෑ ආදීන්ගේ වසයෙන් උපන් සෙස්ස කැපවේ. රෙදි වියන්නාද නොනෑ නොපැවරුවෙක් වේද, විඥප්තියෙන් ලද්දේ අකැප වේ. සෙස්ස කැපවේ. එහි අකැප හූ අකැප පෙහෙරකුලවා වියවන මහණහුට පෙරකියූ නයින් නිසගිවේ. ඒ අකැප පෙරෙහරකු ලවාම කැප හූ වියවන මහණහුට පෙර යම්සේද එසේ නිසගියෙක්ද දුක්කටයෙක්දවේ. ඒ අකැප පෙහෙරහු ලවාම කැපවූද අකැපවූද හූ වියවන මහණහුට ඉදින් පශ්චිම චීවරප්‍රමාණයෙන් එක් කොටසක් අකැප හුයින් වියන ලද්දේවේද. මෙසේ සිවුර කෙත් දෙකක් එකට බැඳීම මෙන් වේද, අකැප හුයින් වියනලද කොටස් නිමිතිකොට පාචිත්තියද අන්තන්හි එසේම දුක්කටයවේ. එයට වඩා අඩු කොටස්හු වෙත්ද, යටත් පිරිසයින් ඇස්මඬල පමණවූවාහුද, කොටස් ගණනින් දුක්කටය වේ. නැවැත එකකින් අතර ඇත්තාවූ හෝ හුයින් කැප කොට දිගින් හෝ අකැප කොට සරසින් හෝ වියන ලද්දේවේද, පුවරුවක් පුවරුවක් පාසා දුක්කටය වේ. කැප පෙහෙරහු ලවාද නොකැප හූ වියවන මහණහුට යම්සේ පෙර නිස්සග්ගිය වේද,එසේ දුක්කටයදවේ. ඒ කැප පෙහෙරහු ලවාම කැපවූද අකැපවූද හූ වියවන මහණහුට ඉදින් පශ්චිම චීවර ප්‍රමාණවූ හෝ ඌනවූ හෝ අකැප හූ කොටස්හු වෙත්ද, ඒ කොටස්හි කොටස් ගණනින් දුක්කටය වේ. කැප හූ කොටස්හි ඇවැත් නොවේ. නැවැත එකකින් අතර ඇත්තාවූ හෝ හුයින් කැපකොට දිගින් හෝ, අකැප කොට සරසත් හෝ, වියනලද්දේ වේද, පුවරුවක්

පුවරුවක් පාසා දුක්කටය වේ. ඉදින් පෙහෙරහු දෙදෙනෙක් වෙත්ද, එකෙක් කැපය. එකෙක් අකැපය. හූද අකැප වේ. ඔවුහු ඒ හූ වරින්වර වියත්නම්, අකැප පෙහෙරහු විසින් වියූ කල්හි පුවරුවක් පුවරුවක් පාසා පාචිත්තිය වේ. ඉතා ඌනවූ කල්හි දුක්කටය වේ. අතික් කැප පෙහෙරහු විසින් වියූ කල්හි දෙතැන්හි දුකකටය වේ. ඉදින් දෙදෙනාම රෙදිවියන නඩාව ගෙණ එකතුව වියත්ද, පුවරුවක් පුවරුවක් පාසා පාචිත්තිය වේ. නැවැත හූ කැප වේද, සිවුරද කෙදරබඳාදි විසින් මෙන් කොටස් ඇත්තේද අකැප පෙහෙරහු විසින් විදූ කල්හි කොටසක් කොටසක් පාසා දුක්කටය වේ. අන් කැප පෙහෙරහු විසින් වියූ කල්හි ඇවැත් නොවේ. ඉදින් දෙදෙනම රෙදිවයන නඩාව ගෙණ එකතුව වියත්ද පුවරුවක් පුවරුවක් පාසා දුක්කටය වේ. නැවැත හූ ද කැපත් වේද අකැපත් වේද, ඒ කැප අකැපපෙරෙහු වරින්වර වියත්ද, අකැප පෙහෙරහු විසින් අකැප හුවලින් කළ පශ්චිම චීවර ප්‍රමාණවූ කොටස් වියූ කල්හි කොටස් ගණනින් පාචිත්තිය වේ. ඉතා ඌනවූ තන්හිද කැප හුයින් විසූ චීවරයන්හිද දුක්කටය වේ. කැප පෙහෙරහු විසින් අකැප හුවලින් කරනලද පමණින් යුක්තවූ හෝ ඌනවූ හෝ සිවුරු වියූ කල්හි දුක්කටයමවේ. කැප හුවලින් කරනලද චීවරයන්හි ඇවැත් නොවේ. නැවැත එකෙකින් අතර ඇත්තාවූ හෝ හුයින් අකැප කොට දිගින් හෝ, කැප කොට සරසින් හෝ වියත්ද, දෙවියෙහි හෝ රෙදි වියන නඩාව ගෙණ එකතු කොට වියත්ද, අපරිච්ඡෙද චීවරය නිමිති කොට පුවරුවක් පුවරුවක් පාසා දුක්කටය වේ. පරිච්ඡෙද සහිත චීවරය නිමිතිකොට පරිච්ඡෙදවශයෙන් දුක්කටයෝ වෙත්. මේ අර්ථය වනාහි **මහාඅට්ඨකථාවෙහි** ප්‍රකට නොවූයේය. **මහාපච්චරියෙහි** ප්‍රකටය.

ඉදින් හූත් කැපවේද, පෙහෙරතෙමේත් කැපවේද, නැපැවරු නැතිත් හෝ මිලයෙන් හෝ යොදන ලදුයේ වියවීම කරුණු කොට ඇවැත් නොවේ. දසදවස ඉක්මීම කරුණු කොට ඇවැත රකින්නහු විසින් විකප්පනයට සෑහෙන පමණ වියූ කල්හි හූ සිටියදීම ඉටියයුතුය. දසදවස ඉක්මීමෙන් තිමවතු ලබන්නේ නිස්සග්ගිය වන්නේය. නෑ ආදීන් විසින් හුයට නගා 'ස්වාමීනි ඔබවහන්සේලාගේ මේ සිවුර ගණිවූ'යි පාවාදුන් කල්හිද මෙම නයවේ. ඉදින් පෙහෙරතෙමේ මෙසේ යොදනලද්දේ හෝ තමා දෙනු කැමැතිව හෝ 'ස්වාමීනි' මම ඔබවහන්සේගේ සිවුර අසුවල් දිනයෙහි වියා තබන්නෙමි'යි කියාද, මහණතෙමේද ඔහු විසින් පිරිසිඳි දිනයෙන් දස දවස ඉක්මවාද, නිස්සග්ගිය පාචිත්තිය වේ. ඉදින් පෙහෙර තෙමේ 'මම ඔබවහන්සේගේ සිවුර වියා හසුනක් එවන්නෙමි'යි කියා එසේම කෙරේද, ඔහුවිසින් එවූ මහණතෙමේ ඒ මහණහට එය නොදන්වාද,

අන් මහණෙක් දැක හෝ අසා හෝ 'ස්වාමීනි' ඔබ වහන්සේගේ සිවුර නිමවන ලද්දේය'යි සැල කෙරේද, ඒ මහණහුගේ සැලකිරීම පමණ නොවේ. යම්කලෙක ඔහු විසින් එවනලදුයේම සැලකෙරේද, ඔහුගේ වචනය ඇසූ දින පටන් දස දවසක් ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තියවේ. ඉදින් පෙහෙර තෙමේ 'මම ඔබවහන්සේගේ සිවුර වියා කිසිවකුගේ' අත එවන්නෙමි'යි කියා එසේම කෙරේද, සිවුර ගෙණගිය මහණතෙමේ තමන්ගේ පිරිවෙණෙහි තබා ඔහුට ආරොචනය නොකෙරේද, අන් කිසිවෙක් 'ස්වාමිනි' කිම, අලුත ගෙණ සිවුර යහපත්දැ'යි විචාරාද හෙතෙමේ 'ඇවැත' සිවුර කොතැනැදැයි විචාරාද මෙනම් ඇත්තහුගේ අත එවනලදැයි හෙතෙමේ කියාද, මොහුගේ මේ වචනයද ප්‍රමාණ නොවේ. යම් කලෙක ඒ මහණතෙමේ සිවුර දේද, ලද දින පටන් දසදවස ඉක්මවන මහණහුට නිස්සග්ගිය පාචිත්තිය වේ. වියැවූ මිල නොදෙන ලද්දේවේද, යම්තාක් දෙවියැට සමාරකුදු ඉතිරිවූයේ වේද, ඒතාක් රකියි. '**අනාපත්ති චීවරං සිබ්බතු**' සිවුර මසනු පිණිස හූ විනවන මහණහුට ඇවැත් නොවේය යන අර්ථයි. '**ආයොගෙ**' යනාදි තන්හි නිමිත්තාර්ථයෙහි සප්තමීවචනයි. ආයොගාදිය නිමිති කොට විනවන මහණහුට ඇවැත් නොවේය'යි කියනලද්දේ වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාවෙන් පැමිණිය යුතුබැවින් ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකයි. ප්‍රඥප්ති වද්‍යය. කායකර්මය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සුත්තවිඤ්ඤත්ති ශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

'**තෙන සමයෙන**'යි මහාපෙසකාරශික්ෂාපදයයි. එහි '**සුත්තං ධාරයිත්වා**'හූ ප්‍රමාණ කොට ප්‍රමාණය පිරිසිඳීම කොට '**අප්පිතං**' ඝන වූවක් "**සුවීතං**" මනාකොට වියනලද සියලුතන්හි සමකොට වියන ලද්දක්. '**සුප්පවායිතං**' මනාකොට වියනලද. සැමතැන සම කොට නූල් දිගුකරනලද්දක්. '**සුවිලෙඛිතං**' කටුමලින් මනාකොට කටු මල දෙනලද්දක් '**සුවිතච්ඡිතං**' කොස්සෙන් මනාකොට මදිනලද්දක්. මනාකොට දෝනාලද්දක්ය යන අර්ථයි. '**පටිබද්ධං**' විකලබව. '**තනෙන**' හූ දිගින් දිගලැමෙහිම එළවා යන අර්ථයි. '**තත්‍ර ච සො භික්ඛු**' යම් ගමෙක හෝ නියම් ගමෙක හෝ ඒ පෙහෙකරුවෝ වෙත්ද, එහි '**විකප්පං ආපජ්ජෙය්‍ය**' විශිෂ්ට කල්පයට අධික විධානයට පැමිණෙන්නේය. පෙළෙහි වනාහි යම් අයුරකින් අධික විධානයට පැමිණියේවේද, එය දක්වනු පිණිස 'ඉදං බො ආවුසො' යනාදිය වදළ සේක. '**ධම්මම්පි භණති**' ධර්මකථාද කියයි. ඒ මහණහුගේ වචනයෙන් දිග හෝ පුළුල් හෝ ඝන හෝ යන

මෙයින් හූ වඩන අයුරම දක්වාලන්නේය. '**පුබ්බෙ අප්පවාරිතො**' සිවුරු හිමියන් විසින් පෙර නොපවරනලද්දෙක්ව, සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුට්ඨානිකය. ක්‍රියාවෙන් උපදී නොසංඥාවිමොක්ෂය අචිත්තකය.

ප්‍රඥප්තිවද්‍යය. කායකර්මය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.
මහාපෙසකාර ශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

'**තෙන සමයෙන**' අච්චෙකචීවර ශික්ෂාපදයයි. '**දසාහානාගතං**' දස දවස්හු දසාග නම්. ඒ දස දවසින් නොපැමිණියා දසාහානාගතා නම. දසදවසින් නොපැමිණියා යන අර්ථයි. 'තං දසාහානාගතං' අත්‍යන්ත සංයොග වශයෙන් සප්තමී අර්ථයෙහි ද්විතීයාවචනයි. එහෙයින්ම මේ ශික්ෂාපදය පිළිබඳ පදභාජනයෙහි 'දසාහානාගතාය'යි වදරන ලද්දේය. '**පවාරණාය**' යම් ඒ පවාරණයක් 'දසාහානාගතා'යි කියනලදී. ඒ දසදවසින් නොපැමිණියහු ස්වරූපවශයෙන් දක්වන්නට දසාහානාගත දයෙහි නොමුළාබව පිණිස අනුප්‍රයොගවචනය කියනලදී. '**කත්තිකතමාසිකපුණ්ණමං**' වප්මස මැදිපොහොයෙහි. මෙහිද පඨම පදයාගේ නුප්‍රයොග බැවින් පෙරනයින්ම සප්තම්‍යර්ථයෙහි ද්විතීයාවචනයි. මෙය යනලද්දේවේ. යම් කලක්පටන් ප්‍රථම මහාපවාරණය දසදවසින් නොපැමිණියායි කියනුලැබේද, ඉදිනුදු ඒ දිනයන්හි නිරන්තරයෙන්ම මහණුහුට සඞ්ඝයා කෙරෙන් හෝ ගණයා කෙරෙන් හෝ සෘජුව අතිරේක චීවරයක් උපන්නේ නම් ඒ අතිරේකචීවරයයි දන්නාවූ මහණුහු විසින් සියල්ලම පිළිගත යුත්තේය'යි එයින් පවාරණමාසයෙහි ශුක්ලපක්ෂපංචමිය පටන් උපන් චීවරයාගේ තබන කාලය දක්වන ලද්දේවේ. එකාන්තයෙන් 'දසදවසක් පරම කොට ඇති කාලයක් අතිරේකචීවරය දැරිය යුතුය යන මේ කාලය මෙයින් සිද්ධය. අත්ථොත්පත්තිවශයෙන් පෙර නොවූවක් මෙන් අර්ථය දක්වා ශික්ෂාපදය තබන ලද්දේය. '**අච්චෙකචීවරං**' යන මෙයින් ඉක්මන් සිවුර කියනු ලැබේ. ඒ ඉක්මන් සිවුරෙහි ඉක්මන්බව දක්වනු පිණිස '**සෙනාය වා ගන්තුකාමො හොති**' යනාදිය වදළසේක.

එහි '**සද්ධා**' යන මෙයින් ධර්මශ්‍රවණාදියෙන් එකෙණෙහි උපන් ශ්‍රද්ධා මාත්‍රයක්ම දක්වන ලද්දේය. '**පසාදෙ**' යන මෙයින් සුප්‍රසන්නවූ බලවත් ශ්‍රද්ධාතොමෝ දක්වනලදී. '**එතං අච්චෙකචීවරං**' මේ කරුණු හෙතුකොට මේ අතිරේකචීවරය දෙනු කැමැත්තහු විසින් දූතයකු හෝ යවා තමා හෝ අවුත් වස්සාවාසිකය දෙන්නෙමි'යි මෙසේ සැල කළ කොට දුන් චීවරය, අච්චෙකචීවර නම්වේ. සයවක පටන් උපන් අනතිරෙක

චීවරයද පසුදුරාතැබූ චීවරයද මේ පරිහාරය ලබාමය. **'සඤ්ඤාණං කත්වා නික්ඛිපිතබ්බං'** කියි සලකුණක් කොට තැබිය යුතුය. කුමක් හෙයින් මෙය කියන ලද්දේද, යත්:- ඒ සලකුණු කොට තැබූ සිවුර පවාරණයෙන් පෙර බෙදත්ද, යමකු විසින් ගන්නාලද්දේද, ඔහු සුත්වස් ඇතියකු නොවියයුතුය. ඉදින් සුත්වස් ඇත්තේවේද, ඒ සිවුර සඞ්ඝිකම වේ. එයින් සලකා සුවසේ දීම වන්නේයයි. **'අච්චෙකචීවරො අච්චෙකචීවරසඤ්ඤී'** යන මේ ආදිය බෙද ගන්නාලද සිවුර සඳහාම වදරනලදී. නොබෙදන ලද්දක් වේනම් සඞ්ඝයාගේයේ හෝ භාණ්ඩාගාරයෙහිවූ සිවුරුද චීවර සමය ඉක්ම ගිය කල්හිද ඇවැත් නොවේ.

මේ අයුරෙන් අතිරේකචීවරයට දසදවසක් පරිහාරයවේ. නොකළ වැසිසළු සිවුරට කඨිනය නොඅතුළකල්හි පස්මසක්ද වස්සූපනායිකඩාත්‍ය කළ කල්හි සමසක්ද කඨිනය අතුළ කල්හි අන් සිවුමසක්ද හෙමන්තඍතුවෙහි පශ්චිමදිනයෙහි මූලචීවරාධිෂ්ඨානවශයෙන් අතිකුදු එක් මසක්දැයි එකොළොස් මසක් පරිහාරය වේ. චීවරප්‍රත්‍යාශාවක් ඇති කල්හි මුල් සිවුරට එක් මසක්ද අච්චෙකචීවරයට කඨිනය නොඅතුළ කල්හි එකොළොස් දිනක් අධිකකොට ඇති මසක්ද කඨිනය අතුළ කල්හි එකොළොස් දිනක් අධික කොට ඇති පස්මසක්ද පරිහාරය වේ. එයින් මත්තෙහි එක් දවසකුදු පරිහාරයෙක් නැත්තේයයි දතයුතුය. **'අනච්චෙක චීවරෙ'** අච්චෙකචීවරය සමාන අත්සිවුරෙක්හි මෙහි සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. තෙවන සවන සමුට්ඨානයෙන් උපදින බැවින් කඨින සමුට්ඨානිකය. අක්‍රිය සමුට්ඨානිකය. නොසංඥාවිමොක්ෂය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අච්චෙකචීවර ශික්ෂාපදවර්ණනාව නිමි.

—\\—

**'තෙන සමයෙන'** සාසඞ්ක ශික්ෂාපදයයි එහි **'වුත්ථවස්සා ආරඤ්ඤකෙසු'** යනු ඒ භික්ෂූහු පෙරද අරණ්‍යයෙහිම වාසය කළහ. දුබල සිවුරු ඇති බැවින් ප්‍රත්‍යයවශයෙන් ග්‍රාමාන්තසෙනාසනයෙහි වස් වැස නිමවනලද සිවුරු ඇතිව දැන් පළිබොධ විරහිතව මහණදම් කරන්නෙමු'යි අරණ්‍යසෙනාසනයන්හි වාසය කරත්. **'කත්තිකචොරකා'** ඉල්මස හැසිරෙන සොරු. **'පරිපාතෙන්ති'** උවදුරු කෙරෙත්. ඒ ඒ තැන දුවපැන බිය ගන්වත්. පලවා හරිත්. **'අන්තරඝරෙ නික්ඛිපිතුං'** තුන් සිවුරෙන් එක් සිවුරක් ඇතුළුගම්හි තබන්නට භාග්‍යවතුන්වහන්සේ යම් හෙයකින් ප්‍රත්‍යයෝ නම් දැහැමෙන් සෙමෙන් දුර්ලභ වෙත්ද, සැහැල්ලු පැවැතුම්

ඇති මහණ තෙමේ මවද විතවන්නට අපොහොසත් වේද, එහෙයින් චීවරගොපනය පිණිස ගොදුරුගමෙහි තබන්නට අනුදැන වදාළ සේක. භික්ෂූන්ට සුදුසු බැවැත් අරණ්‍යවාසය ප්‍රතික්ෂේප නොකළහ.

'**උපවස්සං ඛො පන**' යන මෙහි 'උපවස්සං' යනු පෙරවස් වැස. පෙරවස් වැසයයි කියනලද්දේවේ. 'උපසම්පජ්ජ' යනාදියෙහි මෙන්ම මෙහි අනුනාසිකය දතයුතුය. වස් එළැඹ, නොකඩ කොට වැස'යිද අර්ථයි. 'තථාරූපෙසු භික්ඛු සේනාසනෙසු විහරන්තො' යන මේ හා මේ පදයාගේ සම්බන්ධය වේ. කුමක් කියනලද්දේද, යත්:- වස් එළැඹැද නොකඩව වැසද, එයින් මත්තෙහි ඉල්මස පුරපසළොස්වක කෙළවර කොට ඇති කාලය 'සැකසහිතයයි සම්මත කරනලද ප්‍රතිභය සහිතවූ යම් ආරණ්‍යක සෙනාසනයෝ වෙත්ද, මහණ තෙමේ එබඳු සෙනසුන්හි වාසය කරන්නේ කැමැති වනුයේ තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ගොදුරුගමෙහි තබන්නේය'යි (මෙපමණකින් පෙරවස් එළැඹ නොකඩ කොට වැසූ වස් ඇති ආරණ්‍යක සෙනසුන්හි වසන්නහු විසින් සියලු කාර්තික මාසය මුළුල්ලෙහි තුන් සිවුරෙන් වෙන්ව වසන්නට අනුදන්නා ලද්දේවේය'යි සේයි) යම්හෙයකින් යම් මහණෙක් තෙමේ පෙරවස් එළැඹ වප්මස පුරපසළොස්වක දක්වා වෙසේද, ඒ මහණ තෙමේ පෙර විසුවන්ට ඇතුළත් වේද, එහෙයින් මේ අධිකග්‍රහණය පෙරවස් එළැඹ නොකඩ කොට වැස, යනාදි ව්‍යඤ්ජන විචාරණය නොකොට පදභාජනයෙහි හුදෙක් සිවුර තැබීමට සුදුසුවූ පුද්ගලයා දක්වනු පිණිස 'වුත්ථවස්සානං' යනු වදරනලදි. 'වුත්ථවස්සානං' යන ඒ විභඞ්ගපදයද 'භික්ඛු සෙනාසනෙසු විහරන්තො' යන මේ හා සම්බන්ධ වේ. මේ මෙහි අර්ථයයි:- පෙරවස් වැසූ භික්ෂූන් අතුරෙහි යම් කිසි භික්ෂු නමක් සෙනසුන්හි වසන්නේය මෙබඳුවූ භික්ෂූන් අතුරෙහි යම් කිසි භික්ෂු නමකැයි කියනලද්දේ වේ. අරණ්‍යලක්ෂණ අදින්නාදානවර්ණනාවෙහි කියනලදි. මේ වනාහි විශෙෂය වේ. ඉදින් විහාරය තෙමේ යමකින් වට කරනලද්දේ වේද, වටකළ ගමෙහි ඉන්ද්‍රඛීලය පටන් නොවටකළ ගමෙහි වටකිරීමට සුදුසු තැන පටන් විහාරපරික්ෂේපය දක්වා මැනියයුතුය. ඉදින් විහාරය තෙමේ නොවටකරනලද්දේ වේද,ගමට අභිමුඛවූ දිසාභාගයෙන් සියල්ලට ප්‍රථමවූ යම් සෙනසුනක් හෝ බත්හලක් හෝ නිතර රැස්වන තැනක් හෝ බොධියක් හෝ චෛත්‍යයක් හෝ සෙනසුනෙන් දුර නමුදු වේද, ඒ පළමු සෙනසුන් ආදිය පරිච්ඡෙද කොට මැනිය යුතුය. ඉදින් ආසන්නයෙහි ගමවේද, විහාරයෙහි සිටියවුන් විසින් ගෙවල මිනිසුන්ගේ ශබ්දය අසනුලැබේද, පර්වත ගඞ්ගා ආදියෙන් අතර කළ බැවින් ඍජුව යන්නට නොහැකිවේද, මේ සෙනසුනට යෑමට යම් පියවි මගෙක් වේද, ඉදින්

නැවෙත් ඒ මගින් ගමින් නැගූ ඇදුරුදුන්නෙන් පන්සියයක් දුනු ගතයුතුය. යම් මහණෙක් තෙමේ අසල ගමෙහි අඞ්ගසම්පාදනය පිණිස ඒ ඒ තන්හි මග වසාද, මෙතෙමේ, 'දුහභසොරු'යි දතයුතුය. **'සාසඞ්කසම්මතානි'** සොරුන් වසන තැන් ආදීවූ අවකාශයන් දැක සැක සහිතයයි සම්මත කරනලද මෙසේ දන්නාලද්දවූ, යන අර්ථයි. පදභාජනයෙහි වනාහි යම් කරුණක් හෙතුකොට ඒ සෙනසුන් සැකසහිතයයි සම්මත කරනලදද, ඒ දක්වනු පිණිස **'ආරාමෙ ආරාමූපචාරෙ'** යනාදිය වදළසේක. ප්‍රතිභය සහිත වූවාහු **'සප්පටිභයානි'** නම්. ලංව තුබූ ව්‍යාලභය ඇත්තාවූ යන අර්ථයි. එහෙයින් පදභාජනයෙහි යම් කරුණක් හෙතුකොට ඒ සෙනාසනයෝ ප්‍රතිභය සහිතවූවාහුද, ඒ දක්වනු පිණිස 'ආරාමෙ ආරාමූපචාරෙ' යනාදිය වදරනලදී. **'සමන්තා ගොචරගාමෙ නික්ඛිපෙය්‍ය'** වන සෙනසුනෙහි හාත්පස සියලු දිසාභාගයන්හි තමන් විසින් කැමැති වනලද ගොදුරුගමෙහි අඞ්ගසම්පත්තිය ඇති කල්හි බහා තබන්නේය.

මේ එහි අඞ්ගසම්පත්තියයි:- පෙරවස් එළැඹ මහා පවුරුනෙන් පැවරුයේ වේද, මේ එක් අඞ්ගයෙකි. පසුවස් එළැඹියේ වේද, සුන්වස් ඇත්තේ හෝ වේද, ඇතුළු ගම්හි සිවුර තබන්නට නොලබයි. කාර්තිකමාසයම වේද, මේ දවන අඞ්ගයයි. කාර්තික මාසයෙන් පසු නොලබයි. පන්සියයක් දුනු ඇත්තාවූ පශ්චිමවූ ප්‍රමාණයෙන් යුත් සෙනස්නක්ම වේද, මේ තෙවන අඞ්ගයයි. අඩු පමණෙහි හෝ ගව්වෙන් වැඩිපමණෙහි හෝ නොලබයි. යම් තැනක පිඩු පිණිස හැසිර නැවැත බත්වේලාවෙහි වෙහෙරට එන්නට හැක්කේද, එයම මෙහි අදහස් කරනලදී. නිමන්ත්‍රණය කරනලද්දේ වනාහි අඩ යොත්තක්ද යොත්තක්ද ගොස් විසීමට පෙරළා ඒද, මෙද ප්‍රමාණ නොවේ. සැකසහිත ප්‍රතිභය සහිතමවේ. මේ සිවුවන අඞ්ගයයි. සැක රහිත ප්‍රතිභය රහිත අඞ්ගයෙන් යුක්ත වූද සෙනසුනෙහි වසන්නේ ඇතුළු ගමෙහි සිවුර තබන්නට නොලබයි.

**'අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා'** උදෙදසිත ශික්ෂාපදයෙහි යම් කොසම්බකසම්මුතියක් අනු දන්නාලදද, ඒ කොසම්බක සම්මුතිය හැර ඉදින් ඒ සම්මුති නොමෝ ලද්දී වේද, සරයට වැඩියක් නමුදු වෙන්ව වසන්නට වටියි. **'පුන ගාමසීමං ඔක්කමිත්වා'** ගොදුරු ගමින් පෙරදිග සෙනසුන වේද, මේ මහණ තෙමේද පැසුළුදිගට ගියේ වේද, විසූ සෙනසුනට අවුත් සත්වන අරුණ ඉක්මවා සිවුරෙහි තොරතුරු දැන යෑම වටීය'යි යන අර්ථයි. මෙසේ නොහැකි වන්නහු විසින් අතිරෙකචීවර ස්ථානයෙහි සිටින්නේයයි ඒ ගියතන්හිම සිටියහු පච්චුද්ධරණය කටයුතුය. සෙස්ස ප්‍රකටමය. කඨීන සමුට්ඨානිකය. කාය වාචායෙන් කාය වාචාචිත්තයෙන්ද

උපදි. අක්‍රිය සමුට්ඨානිකය. නො සංඥවිමොක්‍ෂය. අචිත්තකය. ප්‍රඥප්ති වද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සාසඞ්ක ශික්‍ෂාපදවර්ණනාව නිමි.

——||——

'**තෙන සමයෙන**'යි පරිණත ශික්‍ෂාපදයයි. එහි '**පූගස්ස**' සමූහයට. ධර්මසමූහයකටය, යන් අර්ථයි. '**පටියත්තං**' පිළියෙල කරනලද. '**බහු සඞ්ඝස්ස භද්දං**'යි සඞ්ඝයාහට නන්වැදෑරුම්වූ යහපත්වූ ලාභමුඛයෝ බොහෝය. සඞ්ඝයාහට කිසිවකින් පරිහානියක් නැතැයි දක්වත්. 'ඔනොජෙථ' දෙවූ. කිම මෙසේ කියනු වටීද, කුමක් හෙයින් නොවටීද, යත්: මේ එළවනලද භික්‍ෂා තොමෝ එළවා එක් අවකාශයෙක්හි සඞ්ඝයාහට ප්‍රයොජනය පිණිස පිළියෙල කරනලද එළවනලද්දෙහි හා පිළියෙල කරනලද්දෙහිද තමන්ගේ ගෙයි නමුදු උදෙසා වෙන්ව තැබූ කොටසෙහිද ප්‍රයුක්තවචනයෙක් නම් නැත්තේය. 'සඞ්ඝිකං' සඞ්ඝසන්තකය. එය වනාහි සඞ්ඝයාහට පිරිනැමූ බැවින් අතට නොපැමිණියේද එක් ආකාරයකින් සඞ්ඝයාගේ සන්තකය වේ. පදභාජනයෙහි වනාහි '**සඞ්ඝිකං නාම සඞ්ඝස්ස දින්නං හොති පරිච්චත්තං**'යි මෙසේ අපේ‍ාදධාරවශයෙන් නිෂ්පයර්‍යාය විසින් සඞ්ඝිකය දක්වන ලද්දේය. '**ලාභං**' ලැබිය යුතු වස්තුවැයි කීයේය. එහෙයින්ම මෙයට නිර්දේශයෙහි 'චීවරම්පි' යනාදිය කියනලදි. '**පරිණතං**' සඞ්ඝයාහට බරවූවක්ව සිටි. යම් කාරයක් හෙතුකොට එය පිරිනැමුනේ වේද, එය දක්වනු පිණිස '**දස්සාම කරිස්සාමාති වාචා භින්නා හොති**'යි පදභාජනයෙහි වදරනලදී. '**පයොගෙ දුක්කටං**' පිරිනමනලද ලාභය තමාට පිරිනමවාගැණීම් ප්‍රයොගය නිමිතිකොට දුක්කටය වේ. ප්‍රතිලාභයෙන් එය අතට පැමිණිකල්හි නිස්සග්ගිය වේ. ඉදින් සඞ්ඝයාහටම දියයුතුය. යමෙක් තෙමේ ආරාමිකයන් සමග එක්ව කාද, බඩුව අගය කරවා ඇවැත හෙතුකොට කරවිය යුතුය පිරිනමනලද්ද වනාහි පස්සභ දැහැමියන්ගේ හෝ ගිහියන්ගේ හෝ සන්තකයක් යටත් පිරිසයින් මව සතුවුවක් නමුදු යම් දෙයක් මට දෙව'යි සඞ්ඝයාහට පිරිනැමූ බව දන තමාට පිරිනම්මවා ගන්නහුට නිස්සග්ගිය පාචිත්තිය වේ. 'මේ මහණහුට දෙව'යි මෙසේ අන් මහණෙක්හට පිරිනම්මවන්නහුට ශුද්ධිකපාචිත්තිය වේ. එක් පාත්‍රයක් හෝ එක් සිවුරක් හෝ තමන්හටද, එකක් අන්හටද පිරිනමවාද නිස්සග්ගිය පාචිත්තියක්ද ශුද්ධිකපාචිත්තියක්ද වේ. බොහෝ පාත්‍රචීවරයන්හි මෙම නයවේ. පරිවාරයෙපි.

'නිස්සග්ගියෙන ආපත්තිං ඛුද්දකෙන පාචිත්තියං,
ආපජ්ජෙය්‍ය එකතො පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා'

'නිස්සග්ගිය පාචිත්තියටද, සුද්ධිකපාචිත්තියටද එකවර පැමිණෙන්නේය. මේ ප්‍රශ්නය දක්ෂයන් විසින් සිතිය යුතුය'යි මෙය කියනලද. මේ වනාහි පිරිනැම්මවීම සඳහා කියනලදී. යම් මහණෙක් තෙමේ වැසියළුවක් දැන තමාට පිරිනමවාද නිස්සග්ගිය වේ. අන්හට පිරිනම්මවාද සුද්ධිකපාචිත්තිය වේ. මිනිස්සු 'සඟබතක් කරන්නෙමු'යි ගිතෙල් තලතෙල් ආදිය ගෙණ එත්ද, ගිලන් මහණෙක් තෙමේද සඞ්ඝයාහට පිරිනැමූබව දැන කිසිවක් ඉල්ලාතම් නිස්සග්ගිය පාචිත්තියම වේ. ඉදින් 'ගෙණ එන ලද ගිතෙල් ආදිය තොපවෙත ඇත්තේදැ'යි විචාරා 'එසේය ඇත්තේය'යි කියූ කල්හි 'මටත් දෙවු'යි කියාද වටියි. තවද උපාසකයෝ 'කුකුස් කරන ඔහුට 'ස්වාමීනි' සඞ්ඝතෙමේද අප විසින් දුන් දෙයක්ම ලබන්නේය. ගණු මැනැවැ'යි කියත්නම්. මෙසේද වටියි. **'සඞ්ඝස්ස පරිණතං අඤ්ඤසඞ්ඝස්ස'** එක් වෙහෙරක වැසි සඞ්ඝයාහට පිරිනැමූදෙයක්. අන් වෙහෙරක් උදෙසා අසුවල් විහාරයෙහි සඞ්ඝයාහට පිරිනැමූදෙයක් අන් වෙහෙරක් උදෙසා අසුවල් විහාරයෙහි සඞ්ඝයාහට දෙවු'යි පිරිනම්මවයි. **'චේතියස්සවා'** සඞ්ඝයාහට දීමෙන් කිම, සෑයට පුද කරවු'යි. මෙසේ සෑයට හෝ පිරිනමවයි. 'චේතියස්ස පරිණතං' මෙහි නියම කොට අන් සෑයක් පිණිස කිසිවකු විසින් රොපනය කරනලද මල් රුකෙන් අන් සෑයෙක්හි මලකුදු නගාලන්නට නොවටියි. එක් සෑයකට ඡත්‍රයක් හෝ පතාකාවක් නගා සිටියකු දැකි සෙස්ස අන් සෑයකට දෙවීම වටියි. **'පුග්ගලස්ස පරිණතං'** යටත් පිරිසයින් බල්ලකුහටද පිරිනැමූ දෙයක් 'මේ බල්ලාට නොදේවා'යි අරබල්ලාට දෙව'යි මෙසේ අන්‍යපුද්ගලයක්හට පිරිනමවාද දුක්කටය වේ. හුදෙක් දයකයෝ 'අපි සඟබත් දෙනු කැමැත්තම්හ, සෑ පුදනු කැමැත්තම්හ, එක් මහණෙක්හට පිරිකරක් දෙනු කැමැත්තම්හ. යුෂ්මතුන්ගේ කැමැත්තෙන් දෙම්හ. කොතැන දෙමුදැයි කියවූයි කියත්ද, මෙසේ කියූ කල්හි ඒ මහණහු විසින් 'යම් තැනෙක කැමැත්තහු නම් එහි දෙවු'යි කියයුතුය. ඉදින් හුදෙක් 'කොතැනක දෙමුදැ'යි විචාරත්ද පෙළෙහි ආ නයින් කියයුතුයි. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියා සමුට්ඨානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. අකුශල චිත්තයි. ත්‍රිවෙදනයි.

පරිණත ශික්ෂාපද වර්ණනාව නිමි.

—\\—

විනයවිවෘති
නම්වූ
සිංහලසමන්තපාසාදිකාවෙහි
තිංසකවර්ණනාව නිමි.

# පාචිත්තියාත්ථකථා

——\\——

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

යෙසං නවහි වග්ගෙහි - සඞ්ගහො සුප්පතිට්ඨිතො,
ඛුද්දකානං අයන්දානි - තෙසං භවති වණ්ණනා

යම් කෙනකුන්ගේ සඞ්ග්‍රහය තෙමේ වර්ග නවයකින් මොනවට පිහිටියේ ද, බහු ශබ්දපර්‍ය්‍යායවූ ඒ ඛුද්දකයන්ගේ දැන් මේ වර්ණනා තොමෝ වන්නීය.

එහි මුසාවාදවර්ගයාගේ පළමු කොට ප්‍රථමශික්ෂාපදයෙහි '**හත්ථකො**' යනු ඒ තෙරුන්ගේ නාමයයි. ශාක්‍යයන්ගේ පුත්‍රනුයි **සක්‍යපුත්ත** නම්වේ. බුද්ධකාලයෙහි වනාහි ශාක්‍යකුලයෙන් අසූදහසක් පුරුෂයෝ පැවිදි වූහ. ඔවුන් අතුරෙහි ඒ ස්ථවිර තෙමේ එක්තරා එකෙක් වේ. "**වාදක්ඛිත්තො**" වාද කරන්නෙමු'යි මෙසේ පරිවිතර්කනය කරන ලද වාදයෙන් යුක්තව පරවාදීන් වෙතට හරිනලද්දේය. පක්ඛිත්තො, පහිතො, පෙසිතො යනුද එම අර්ථයි. වාදයෙහිලා සිය සිතින් හෝ හරිනලද්දේය. යම් යම් තැනක වාදයෙක් වේද ඒ ඒ තැනම දක්නා ලැබේනුයි "වාදක්ඛිත්ත" නම. "**අවජානිත්වා පටිජානාති**" තමන්ගේ වාදයෙහි කිසි දෙසක් සලකමින් 'මේ මාගේ වාදයෙක් නොවේ'යි වසා නැවැත කියමින් නිදෙස්බව සලකා මාගේම මේ වාදයයි නැවැත ප්‍රතිඥා කරයි. "**පටිජානිත්වා අවජානාති**" කිසියම් වචනයෙක්හි අනුසස් සලකමින් 'මේ මාගේ වාදයයි ප්‍රකාශකොට නැවැත එහි දෙස් සලකා 'මේ මාගේ වාදයෙක් නොවේ'යි වසාලයි. "**අඤ්ඤෙනාඤ්ඤං පටිචරති**" අනික් කරුණකින් අනික් කරණක් වසයි. යටපත් කෙරෙයි. 'රූපය අනිත්‍යය, දැනගතයුතු හෙයිනැ'යි කියා නැවැත 'ජාතිධර්ම හෙයිනැ'යි කියයි. **කුරුන්දියෙහි** වනාහි එක් වාදයක් වැසීමට හෙතුවූ අන් බොහෝ කරුණු කියා'යි කියනලද්දේය. එහි මේ අදහසය:- යම් ඒ පිළිදැන්මක්, වැසීමක් වේද, ඒ ප්‍රතිජානන අවජානන වැසීම පිණිස 'කවරෙක් කීයේද, කුමක් කීයේද, කොතැන්හිදී කීයේදැ'යි යම් ආදීවූ බොහෝ කරුණු කියායි. නැවැත මහාත්ථකථාවෙහි අවජානනය කොට ප්‍රතිජානනය කරන්නේ, ප්‍රතිජානනය කොට අවජානනය කරන්නේ මෙසේද අන් කරුණකින් අන් කරුණක් වසායි කියනලද්දේය.

"**සම්පජානමුසා භාසති**" මැනවින් දන්නේ බොරු කියයි. "**සඞ්කෙතං කත්වා විසංවාදෙති**" පෙරබත් ආදීන් අතුරෙහි අසුවල් කාලයෙහි අසුවල් පෙදෙසෙහි දී වාදය වේයයි සලකුණු කොට, සලකුණෙන් පෙර හෝ පසුව හෝ ගොස් 'පින්වත්ති' බලවූ, තීර්ථකයෝ නොආහ, පැරදනලදහ'යි යෙයි. "**සම්පජානමුසාවාදෙ**" පූර්වභාගයෙහිද දැන වචනක්‍ෂණයෙහිද දන්නහුට බොරුකීම නිමිතිකොට. "**විසංවාදන පුරෙක්ඛාරස්ස**" බොරු කියමි'යි යන සිත් පෙරදැරි කොට කියන්නහුගේ "**වාචා**" මිථ්‍යාවචනයට ඇතුළත් වචනයෙන් උපදවන චෙතනා තොමෝය. "**ගිරා**" ඒ චෙතනාවෙන් උපද වනලද ශබ්දය දක්වයි. "**ව්‍යප්පථො**" වචනපථය. වාක්තොමෝම, දෘෂ්ට්‍යනුගතියට පැමිණෙන්නාවූ අන්‍යයන්ටද මාර්ගය බැවින් ව්‍යප්පථ'යි කියනුලැබේ. "**වචීභෙදො**" වචීසංඥිත වචනයෙහි බිඳීම. ප්‍රභෙද ගත වාක් තොමෝම මෙසේ කියනු ලැබේ. "**වාචසිකාවිඤ්ඤත්ති**" වාග්විඥප්තියයි. මෙසේ ප්‍රථමපදයෙන් ශුද්ධචෙතනාවද මධ්‍යයෙහිවූ තෙපදයෙන් එයින් නැගුණු ශබ්දසහිත චෙතනාවද කෙළවරවූ එකෙක් විඥප්තිය සහිතවූ චේතනාවද කියනලදැයි දතයුතුය. "**අනරියවොහාරා**" අනාර්‍ය්‍යවූ බාල පෘථග්ජනයන්ගේ ව්‍යවහාරයෝය. මෙසේ සම්පජානමුසාවාදය දක්වා, දැන් අවසන කියූ සම්පජානමුසාවාදසඞ්ඛ්‍යාත වූ අනාර්‍ය්‍යව්‍යවහාරයන්ගේ ලක්‍ෂණ දක්වනසේක් "**අදිට්ඨං දිට්ඨං මෙ**" යනාදිය වදාළ සේක.

එහි "**අදිට්ඨං දිට්ඨං මෙ**" 'මා විසින් නොදක්නාලද්දක් දක්නා ලදැයි මෙසේ කියන්නහුගේ වචනය. එය ඉපදවූ චෙතනාව හෝ එක් අනාර්‍ය්‍යව්‍යවහාරයෙකැයි මේ නයින් අර්ථය දතයුතුය. තවද මෙහි ඇස ඇසුරු කළ විඥානයෙන් නොගත් අරමුණ **අදිට්ඨ** නම. කන ඇසුරු කළ විඥානයෙන් නොගන්නාලද්ද **අසුත** නම. ඝාන ජිව්හා කාය විඥානාදීන්ගේ වසයෙන් දැන ත්‍රිවිධ ඉන්ද්‍රියන් විසින් එකට බැඳුනක් මෙන් කොට පැමිණ නොගන්නාලද්ද **අමුත** නම. පඤ්චෙන්ද්‍රියයන් හැර ශුද්ධවිඥානයෙන්ම නොගන්නාලද්ද අවිඤ්ඤාත'යි දතයුතුය. පෙළෙහි වනාහි 'නොදක්නාලද්ද නම් ඇසින් නොදක්නා ලද්දේය'යි මෙසේ ඖදරිකනයින්ම දෙශනා තොමෝ කරනලදය. දක්නාලද ආදීන් අතුරෙහිද තමන් විසින්ද අන්හු විසින්ද දක්නාලද්ද, දක්නාලද්දේමය. සුත, මුත, විඤ්ඤාතයෝද මෙසේය. මේ එක් ක්‍රමයෙක්වේ. අන්‍යක්‍රමයෙක්ද ඇත්තේය. තමන් විසින් දක්නාලද යමක් වේද, එය දක්නාලද්දේමය. සුතාදීන් කෙරෙහිද, මෙම නයවේ. යමක් අන්හු විසින් දක්නාලද්දේද, එය තමන් ඇසූ තැන සිටියි. මුතාදීහුද මෙසේය.

දැන් ඒ අනාර්‍ය්‍යව්‍යවහාරයන්ගේ වසයෙන් ඇවැත නගා දක්වනසේක් "**තීහි ආකාරෙහි**" යනාදිය වදාළසේක. එහි අර්ථය තෙමේ 'තුන් අයුරකින්

ප්‍රථමධ්‍යානයට සමවැදුනෙමි'යි දැන බොරු කියන මහණහුට ඇවැත පාරාජිකා'යි මේ ආදි වසයෙන් චතුර්ථපාරාජික පාලි වර්ණනාවෙහි කියූ නයින්ම දතයුතුය. හුදෙක්ම ඒ චතුර්ථ පාරාජිකපාලි වර්ණනාවෙහි ප්‍රථමධ්‍යානයට සමවැදුනෙමි'යි ආතන්හි මේ ශික්ෂාපදපාලියෙහි 'මා විසින් නොදක්නා ලද්දේ දක්නාලද්දේය කියා නම්, එහි චතුර්ථපාරාජික පාලිවර්ණනාවෙහි' ඇවැත පාරාජිකා'යි කියූ තන්හි මේ ශික්ෂාපදයෙහි ඇවැත පාචිත්තිය'යි මෙසේ වස්තුමාත්‍රයෙහි හා ආපත්තිමාත්‍රයෙහිද විශේෂය වේ. සෙස්ස එකලක්ෂණමය. **"තීහාකාරෙහි දිට්ඨෙ වෙමතිකො"** යනාදීන්ගේ අර්ථයද "දිට්ඨස්ස හොති පාරාජිකං ධම්මං අජ්ඣාපජ්ජනෙතා දිට්ඨෙ වෙමතිකො"යි මේ ආදි දුට්ඨදෙසපාලිවර්ණනාවෙහි කියූ නයින් දතයුතුය. පෙළ පමණක්ම මේ ශික්ෂාපදයෙහි වෙනසයි. අර්ථයෙහි වනාහි ස්වකීය ථෙරවාදයෙහි කිසි වෙනස් බවෙක් නැත්තේය. **"සහසා භණති"** නොවිමසා හෝ නොසලකා හෝ වේගයෙන් දක්නාලද්දේද, 'මා විසින් නොදක්නා ලද්දේය'යි කියයි. **"අඤ්ඤං භණිස්සාමීති අඤ්ඤං භණති"** මුළා බැවින් ජඩ බැවින් පැකිළෙමින් චීවර'යි කිය යුත්තෙහි චීර'යි මේ ආදිය කියයි. යමෙක් වනාහි හෙරණකු විසින් 'කිමෙක්ද, ස්වාමීනි' මාගේ උපාධ්‍යායයන් වහන්සේ දුටුවහුද'යි විචාරණ ලද්දේ සෙල්ලම් කරමින් 'ඔබගේ උපාධ්‍යාය තෙමේ දැවගුළක් යොදගෙණ එහි නැග ගියේ වන්නේය'යි කියා හෝ, කැනහිල් හඬක් අසා "සවාමීනි, මේ හඬ කවරකුගේ දැ'යි විචාරණලද්දේ 'ඔබගේ මව යානයකින් යන කල්හි මඩෙහි එරුණු ගැළ ගොඩට ගන්නවුන්ගේ මේ හඬය'යි හෝ මෙසේ නොම කෙළිම් වසයෙන්, නොරැවීම් වසයෙන් කියාද **"සො ආපජ්ජති"** හෙතෙමේ ඇවැතට පැමිණේමය. අන්‍යවූ පුරාණකථාවක් මෙහි වේ. එක් මහණෙක් ගමෙහි තෙල් ටිකක් ලැබ විහාරයට ආයේ හෙරණක්හට 'තෝ අද කොතැන ගියෙහිද, ගම එක්තෙල් ඇත්තෙක් වූයේ'යි හෝ පැසෙහි තැබූ පූකැබල්ලක් දැක 'අද ගමෙහි පැසිවලින් පූ එළවූහයි හෝ කියාද මෙය මුසාවාදයෙක්මවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුත්ථානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

ප්‍රථම මුසාවාද ශික්ෂාපදයයි

——\\——

ද්විතීය ශික්ෂාපදයෙහි **"ඔමසන්ති"** අනුන් පහත් කොට කතාකරත්. හෙලා දකිත් **"ඛුංසෙන්ති"** ආක්‍රොශකරත්. **"වම්භෙන්ති"** අවමන් කරත්.

'**භූතපුබ්බං**' භාග්‍යවතුන්වහන්සේ මේ වස්තුව ඔමසවාදය ගරහනු පිණිස ගෙණහැර දැක්වූසේක. "**නන්දිවිසාලො නාම**" නන්දි යනු ඒ ගොනුගේ නමයි. මේ ගොනුගේ විසාණයෝ(අං) විසාලයහ. එහෙයින් නන්දිවිසාලයයි කියනුලැබේ. ඒ කාලයෙහි බොධිසත්ව තෙමේ නන්දිවිශාල නම් වෘෂභ වූයේය. බමුණු තෙමේ ඒ වෘෂභ කැඳබත් ආදිය දී ඉතා මැනැවින් පොෂණය කෙළේය. එකල්හි ඒ නන්දිවිශාල තෙමේ බමුණහුට අනුකම්පා කරන්නේ, "**ගච්ඡ ත්වං**" යනාදිය කීය. 'තථෙව අට්ඨාසි' අහෙතුකප්‍රතිසන්ධි කාලයෙහිද අන්හට ගැරහීම මන නොවඩනා බැවින්ම 'මේ මන නොවඩායි දැන ගත්තේය. එහෙයින් බමුණුහට දෙස් දක්වනු කැමැතිව සිටියේය. '**සකටසතං අතිබද්ධං පවට්ටෙසි**' මුං මෑ වැලි ආදියෙන් පිරුණු ගැල්සියයක් පිළිවෙළින් තබා යට රුකුල් දෙන දඬු දී එකට බැඳ ගැල්සියය පෙරළුනුයේ පළමු පිහිටි අර(රෝද) පෙදෙසට නැවැත අර(රෝද) පැමිණි කල්හි පෙරළුනේ වේ. බොධිසත්වතෙමේ පළමු ගැළ පිහිටි තැන අන්තිම ගැළ පිහිටුවනු පිණිස ගැල් සියයක පමණ පෙදෙස පෙරළූයේය. බෝසතුන්ගේ වනාහි බුරුල් කිරීමෙක් නම් නැත්තේය. එහෙයිනි. '**තෙන චත්තමනො අහුං**' බමුණගේ ඒ ධනලාභය කරණකොට හා තමාගේ ක්‍රියාව කරණකොටද ඒ නන්දිවිශාල තෙමේ සතුටු සිත් ඇත්තේ වූයේය. '**අක්කොසෙනපි**' මෙහි වනාහි යම්හෙයකින් ඉදිරියෙහි හීනවූ ආක්‍රොශය උත්කෘෂ්ටවූ ආක්‍රොශය යන ආක්‍රොශ දෙක බෙදනු කැමැත්තාහුද, එහෙයින් අනේ‍ාත්පත්තියට පෙර යම්සේද, එසේ '**හීනෙනපි අක්කොසෙන ඛුංසෙන්ති**'යි වදරනලද්දේය. මෙසේ නොවදරා '**අක්කොසෙන**'යි මෙසේ වදළසේක. '**වෙණජාති**' වඩුජාතියය. කුළුපොතුජාතියයිද කියත්. '**නෙසාදජාති**' මුවවැදිආදිජාතියය. '**රථකාරජාති**' සොම්වරු ජාතියය. '**පුක්කුසජාති**' පුප්සැඩු (කසළ ඉවත්කරන) ජාතියය. අවකණ්ණකාදීවූ දසයන්ට නමෙක්වේ. එහෙයින් හීනය. '**ඔඤ්ඤාතං**' අවමන් කරනලද්දේය. '**උඤ්ඤාතං**'යි කියාද හදරත්. '**අවඤ්ඤාතං**' හෙලා දන්නාලද්දේය. '**හීළිතං**' පිළිකුල් කරනලද්දේය. '**පරිභූතං**' මෙයින් කිමැ'යි පරිභව කරනලද්දේය. '**අචිත්තීකතං**' ගරු නොකරනලද්දේය. '**කොට්ඨකම්මං**' ගල්වඩුකම්ය. '**මුද්දා**' ඇඟිලි නැමීමෙන් ගිණීමය. '**ගණනා**' එක්තැන - දසතැන ආදීන්හි බෙල්ලන් තබා ගිණීම නම්වූ අච්ඡිද්දකාදී වූ සෙසු ගිණීමය. '**ලෙඛා**' අකුරුලිවීමය. '**මධුමෙහාබාධො**' මධුමෙහාබාධය. වෙදනා නැති බැවින් '**උක්කට්ඨො**' උත්කෘෂ්ටයයි කියනලද්දේය. '**පාටිකඞ්ඛා**' කැමැතිවියයුතුය. '**යකාරෙන වා භකාරෙන වා**' යකාරය හෝ භකාරය යොද යම් ආක්‍රොශයෙක් වේද, '**කාටකොටචිකාය**' කාට යනු පුරුෂනිමිත්තයි. '**කොටචිකා**' යනු ස්ත්‍රීනිමිත්තයි. මෙයින් හෝ යම් ආක්‍රොශයෙක් වේද, '**එසො හීනො නාම අක්කොසො**' මේ ආක්‍රොශය තෙමේ හීන නම් ආක්‍රොශයයි.

දැන් ඒ ජාති ආදීන්ගේ ප්‍රභෙදවශයෙන් ඇවැත් නගා දක්වන සේක් **'උපසම්පන්නො උපසම්පන්නං'** යනාදිය වදාළසේක. එහි **'ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුං කත්තුකාමො'** ආක්‍රොශ කරනු කැමැත්තේය. යටපත් කරනු කැමැත්තේය. ගරහනු කැමැත්තේය. නිස්තේජස්ක කරනු කැමැත්තේය, යන අර්ථයි. **'හීනෙන හීනං'** හීනවූ ජාතිවචනයෙන් හීනජාතිකය. මේ උපායයෙන් සියලු පදයන්හි අර්ථ දතයුත්තේය මෙහි ද හීනවූ වචනයෙන් හීනයකුට කියන්නේ සැබවක් කියයි. වචන නැමැති හුලින් විදිනු කැමැතිබව හෙතු කොට මේ මහණහුට වචනයක් වචනයක් පාසා පාචිත්තිය වේ. උත්කෘෂ්ට ජාතිය කරණකොට හීනයකුට කියන්නේද, අසත්‍යයක් කියාද විදිනු කැමැති බව හෙතුකොට මේ ශික්ෂාපදයෙන් පාචිත්තියට පැමිණේ. ප්‍රථම මුසාවාද ශික්ෂාපදයෙන් පාචිත්තියට නොපැමිණේ. යම් මහණෙක් තෙමේ 'අතිචණ්ඩාල වෙහි, අතිබ්‍රාහ්මණ වෙහි, දුෂ්ටචණ්ඩාල වෙහි. දුෂ්ටබ්‍රාහ්මණ වෙහි'යි යනාදිය කියාද, හෙතෙම්ද ඇවැතින් කරවිය යුත්තේමය. **'සන්ති ඉධෙකච්චෙ'** වාරයෙහි පරිහරණය කියූ බැවින් දුක්කටය වේ. **'යෙ නූන - පෙ-න මයං'** යන වාරයන්හිද මෙම නයවේ. අනුපසම්පන්නයකු කෙරෙහි සියලු වාරයන්හි දුක්කටයම වේ. **'චොරොසි ගණ්ඨිභෙදකොසි'** යනාදි වචනයන්ගෙන් උපසම්පන්නයකු කෙරෙහිද අනුපසම්පන්නයකු කෙරෙහිද යන සියලු වාරයන්හි දුක්කටයමවේ. කෙළි කැමැති බැවින් උපසම්පන්නයකු කෙරෙහිද අනුපසම්පන්නයකු කෙරෙහිද යන සියලු වාරයන්හි දුබ්භාසිතයවේ. **'දවකම්‍යතා'** නම් කෙළිසිනා අදහස් ඇතිබවය. මේ ඕමසවාද ශික්ෂාපදයෙහි මහණහු හැර, මෙහෙණ ආදි සියලු සත්ත්වයෝ අනුපසම්පන්නස්ථානයෙහි සිටියහ'යි දතයුත්තාහ. **'අත්ථපුරෙක්ඛාරස්ස'** යනාදි තන්හි පෙළෙහි අර්ථවර්ණනා කරනුයේ අර්ථය පෙරටුකොට ඇත්තේ නම. පෙළ කියවනුයේ **'ධම්මපුරෙක්ඛාරො'**. ධර්මය පෙරටු කොට ඇත්තේ නම. අනුශාසනාවෙහි සිට 'දැන්ද සැඩොල් වූයෙහි, පව් නොකරව, තමො තමපරායණ නොවව, මේ ආදි ක්‍රමයෙන් කියනුයේ **'අනුසාසනී පුරෙක්ඛාරො'** නැමැයි දතයුත්තේය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුත්ථානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛමධ්‍යස්ථතායි. ද්විවේදනයි.

දිතීය ඕමසවාද ශික්ෂාපදයයි

—॥—

තෘතීයශික්ෂාපදයෙහි '**භණ්ඩනජාතානං**' උපන් ඩබර ඇත්තවුන්ගේ. **භණ්ඩන** යනු කලහයෙහි පූර්වභාගයයි. 'මොහු විසින්. මොහු විසින් මේ කරනලදැ'යි මෙසේ කියූ කල්හි 'මෙසේ කියමි'යි යනාදීවූ ස්වකීය ස්වකීය පක්ෂයෙහි රහසිව කරන මන්ත්‍රණයයි. **කලහ** නම් ඇවැතට පමුණුවන කායවාග්ව්‍යතික්‍රමයයි. **විවාද** නම් විග්‍රහය පිණිස පවත්නා කථාය. ඒ විවාදයට පැමිණියවුන්ගේ'යි '**විවාදපන්නානං**' යනුවේ. '**පෙසුඤ්ඤං**' යනු ප්‍රියභාවය ශූන්‍ය කරන වචනැයි කියනලද්දේ වේ. '**භික්ඛුපෙසුඤ්ඤෙ**' මහණුන්ගේ පෛශුන්‍යයෙහි. මහණක්හු වෙතින් අසා මහණක්හු විසින් මහණක්හට එළවනලද පෛශුන්‍යයෙහි යන අර්ථයි. '**ද්වීහාකාරෙහි**' කරුණු දෙකෙකින්. '**පියකම්‍යස්ස වා**' 'මම මෙසේ මොහුට ප්‍රියවන්නෙමි'යි තමාට ප්‍රියභාවය පතන්නහුට හෝ '**භෙදාධිප්පායස්ස වා**' 'මෙසේ මෙතෙමේ මොහු සමග බිදෙන්නේයයි අන්‍යයාගේ අන්‍යයා හා බිඳීම කැමැති වන්නහුට හෝ '**ජාතිතො වා**' යනාදි සිය පළමු ශික්ෂාපදයෙහි කියනලද නය ඇත්තේමය. මෙහිද මෙහෙණ ආදි කොට සියල්ලෝ අනුපසම්පන්නයෝ නම් වෙත්. '**න පියකම්‍යස්ස න භෙදාධිප්පායස්ස**' ආක්‍රොශ කරන එකක්හුද, ඉවසන එකක්හුද දැක 'ලජ්ජා නැත්තේ පුදුමය. මෙබන්දක් කියන්නහු නැවැත කියයුතුය'යි සිතන්නේය'යි මෙසේ හුදෙක් පාපයට ගැරහීම් වසයෙන් කියන්නහුට ඇවැත් නොවේ. සෙස්ස කියූ අර්ථ ඇත්තේමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන් උපදී. ක්‍රියාසමුත්ථානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශල චිත්තයි. ත්‍රිවෙදනයි.

තෘතීය පෙසුඤ්ඤශික්ෂාපදයයි

චතුර්ථශික්ෂාපදයෙහි - '**අප්පතිස්සා**' යටත් පහන් පැවැතුම් නැත්තාහු. උපාසකයහ'යි කියූ කල්හි වචනයකුදු නොඅසනු කැමැත්තාහුය. ආදර රහිතයහ යන අර්ථයි. 'අප්පතිස්සායා වා' යටත් පැවැතුම් නැත්තාහුය යනු අර්ථයි. '**අසභාගවුත්තිකා**' විසභාග ජීවිකා ඇත්තාහු. මහණුන් කෙරෙහි යම්සේ පැවැතිය යුතුද, එසේ නොපැවැතියයුතු පැවැතුම් ඇත්තාහුය යන අර්ථයි.

'**පදසො ධම්මං වාචෙය්‍ය**' අනුපසම්පන්නයකු සමග පදයක් පදයක් වසයෙන් ධර්මය කියන්නේ නම්. කොටස් කොටස් වසයෙන් කියන්නේය යන අර්ථයි. යම්හෙයකින් කොට්ඨාස යන නාමය ඇති ඒ පදය සිවුවැදෑරුම් වේද, එහෙයින් ඒ දක්වනු පිණිස '**පදං අනුපදං අන්වක්ඛරං**

**'අනුබ්‍යඤ්ජනං'** පදභාජනයෙහි වදරන ලදි. එහි 'පදං' යන මෙයින් එක් ගාථාපාදයෙක් අදහස් කරන ලද්දේය. **'අනුපදං'** යනු දෙවන පාදයයි. **'අන්වක්ඛරං'** යනු එක් එක් අකුරෙකි. **'අනුබ්‍යඤ්ජනං'** යනු පූර්වව්‍යඤ්ජනය සමාන වූ පශ්චාත් ව්‍යඤ්ජනයයි. යම්කිසි එක් අකුරක් වේද, එය අන්වක්ඛරයි. අවිභක්තික අක්ෂරසමූහය අනුබ්‍යඤ්ජනයි. අක්ෂර අනුව්‍යඤ්ජන සමූහය පද නම. විභක්ත්‍යන්ත ප්‍රථම පදය පදයමවේ. දෙවන පදය අනුපද නමැයි මෙහි වෙනස මෙසේ දතයුතුය. දැන් **'පදං නාම එකතො පට්ඨපෙත්වා එකතො ඔසාපෙන්ති'** ගාථාලෙසින් බැඳුනු ධර්මයක් කියනුයේ 'මනො පුබ්බඞ්ගමා ධම්මා'යි මෙසේ එක් එක් පදය හෙරණුහු සමග එක්ව පටන් ගෙණ එක්වම අවසන් කෙරේද, මෙසේ කියන්නාහුට පදගණනින් පාචිත්තියාපත්තීහු වෙත්යි දතයුතුය. **'අනුපදං නාම පාටෙක්කං පට්ඨපෙත්වා එකතො ඔසාපෙන්ති'** තෙරුන් විසින් 'මනොපුබ්බඞ්ගමා ධම්මා'යි කියූ කල්හි හෙරණ තෙමේ ඒ පදය එකට නොකියා 'මනොසෙට්ඨා මනොමයා'යි දෙවනපදය එකට කියාද, මොවුහු වෙන්ව පටන්ගෙණ එකට අවසාන කෙරෙත් නම. මෙසේ කියන මහණුහුටද දෙවන පදගණනින් පාචිත්තියාපත්තීහු වෙත්. **'අන්වක්ඛරං නාම රූපං අනිච්චන්ති වුච්චමානො රූන්ති ඔපාපෙති'** 'හෙරණ' 'රූපං අනිච්චං'යි කියව, කියනුලබන්නේ රූකාරය පමණක්ම එකට කියා සිටීද, මෙසේ කියන මහණුහුටද එක් එක් අකුරුගණනින් පාචිත්තියාපත්තීහු වෙත්. ගාථාබන්ධයෙහිද මෙම නය ලැබේමය. **'අනුබ්‍යඤ්ජනං නාම රූපං අනිච්චන්ති වුච්චමානො වෙදනා අනිච්චාති සද්දං නිච්ඡාරෙති'** 'රූපං භික්ඛවෙ අනිච්චං වෙදනා අනිච්චා' යන මේ සූත්‍රය කියවනුලබන්නේ. තෙරුන් විසින් 'රූපං අනිච්චං'යි කියනු ලබන්නේ හෙරණ තෙමේ වේගවත් ප්‍රඥ ඇති බැවින් 'වෙදනා අනිච්චා' යන මේ අනිච්චපදය, තෙරුන්ගේ 'රූපං අනිච්චං' යන මේ අනිච්ච පදය සමග එකට වචන නිකුත් කෙරේද, මෙසේ කියන මහණුහුටද අක්ෂරසමූහගණනින් පාචිත්තියාපත්තීහු වෙත්. මේ වනාහි මෙහි සඞ්ක්ෂෙපයයි. මේ පදදීන් අතුරෙහි යම්යම් පදයක් එකට කියාද, ඒ ඒ පදයෙන් ඇවැතට පැමිණේයයි දතයුතුය.

**'බුද්ධභාසිතො'** සියලු විනයපිටකය අභිධර්මපිටකය ධම්මපදය චරියාපිටකය උදානය ඉතිවුත්තකය ජාතකය සුත්තනිපාතය විමානවත්ථුය. පෙතවත්ථුය. බ්‍රහ්මජාලාදි සූත්‍රහයි යන මොවුහුය. **'සාවකභාසිතො'** සිවු පිරිසට ඇතුළත්වූ ශ්‍රාවකයන් විසින් කියනලද **අනඞ්ගන සම්මාදිට්ඨි අනුමානසුත්ත චූලවෙදල්ල මහාවෙදල්ල** ආදි සූත්‍ර. **'ඉසිභාසිතො'** බාහිර පරිව්‍රාජකයන් විසින් කියන ලද සියලු පරිබ්බාජකවර්ගය බාවාරීහුගේ අතැවැසිවූ සොළොසක් බ්‍රාහ්මණයන්ගේ ප්‍රශ්නය යන මේ ආදියයි.

'**දෙවභාසිතො**' දෙවියන් විසින් කියනලද්දය. එය දෙවතා සංයුත්ත දෙවපුත්ත සංයුත්ත මාරසංයුත්ත බ්‍රහ්මසංයුත්ත සක්කසංයුත්ත යනාදීන්ගේ වසයෙන් දතයුතුය. '**අත්ථූපසංහිතො**' අර්ථකථාවන් ඇසුරුකරන ලද්දය. '**ධම්මූපසංහිතො**' පාළිය ඇසුරු කරනලද්දය. අත්ථූපසංහිත ධම්මූපසංහිත දෙකින්ම නිවන ඇසුරු කරන ලද්දම කියයි. කිසිසේත් නිවන ඇසුරු කරනලද්දක් කියාද, ත්‍රිවිධ සඞ්ගීතියට නැගූ ධර්මයක්ම අනුපසම්පන්නයකු සමග පදවසයෙන් කියන මහණහුට ඇවැත්වේ. නිවන ඇසුරු කරන ලද්දෙහිද නොයෙක් භාෂාවශයෙන් ගාථාශ්ලොක බන්ධනාදියෙන් පිළියෙල කරනලද්දෙහි ඇවැත් නොවේ. ත්‍රිවිධසඞ්ගීතියට නොනැගූ **කුලුම්බසුත්ත රාජොවාදසුත්ත තික්ඛින්ද්‍රිය චතුපරිවට්ට නන්දොපනන්ද** යන මෙබන්දෙහි ඇවැත්මය. **මහාපච්චරියෙහි** ප්‍රතිෂෙධ කරනලද **අපලාල දමනයද** කියනලදී. **මෙණ්ඩකමිලින්දප්‍රශ්නයන්හි** නාගසෙන තෙරුන්ගේ ස්වකීය ප්‍රතිභාණයෙහි ඇවැත් නොවේ. රජුට හඟවනු පිණිස යමක් ගෙණ හැර දක්වා කියනලද්දේද, එහි ඇවැත්වේ. **වණ්ණපිටක අඞ්ගුලිමාලපිටක රට්ඨපාල ගජ්ජිත ආලවකගජ්ජිත** ගුළ්හුම්මග්ග ගුළ්හ වෙස්සන්තර ගුළ්හවිනය වෙදල්ලපිටක යනාදීහු අබුද්ධවචනයෝම'යි කියනලදහ. **සීලූපදෙසය** නම් ධම්මසේනාපතිහු විසින් කියනලද්දේයයි කියත්. එහි ඇවැත්මය. අනාගවූද මග්ගකථා ආරම්මණකථා බුද්ධිකරණ්ඩකන්දණවත්ථු අසුභකථා යනාදීහුද ඇත්තාහුය. එහි සත්තතිංසබොධිපක්ඛිය ධර්මයෝ බෙද දක්වන ලදහ. ධුතාඞ්ග ප්‍රශ්නයෙහි ප්‍රතිපදවෝ විභාගකරනලදහ. එහෙයින් එහි ඇවැත්'යි කියනලදි. **මහාපච්චරී** ආදියෙහි වනාහි සඞ්ගීතියට නොනැගූ රාජොවාද තික්ඛින්ද්‍රිය චතුපරිවට්ට නන්දොපනන්ද කුලුම්බසූත්‍රයන්හිම ඇවැත්'යි කියා සෙසුතන්හි බුද්ධවචනයෙන් යමක් ගෙණහැර දක්වා කියනලදද, එයම ආපත්ති වස්තු වේ. අනිකක් ඇවැතට වස්තු නොවේය, යන මේ අර්ථය පිළිගන්නා ලද්දේය. '**එකතො උද්දිසාපෙන්තො**' අනුපසම්පන්නයකු සමග එකට උදෙසීම් ගන්නේද, එකට කියාද අනාපත්තිය යන අර්ථයි. එහි මේ විනිශ්චයයි. උපසම්පන්නයෙක්ද අනුපසම්පන්නයෙක්ද හිඳ උදෙසවා ගණිත්. ආචාර්ය්‍ය තෙමේ හුන්නවුන්ට කියම්'යි ඔවුන් සමග එකට කියාද, ආචාර්ය්‍යයාහටම ඇවැත්වේ. අනුපසම්පන්නයකු සමග උදෙසීම් විසින් කියවා ගන්නහුට ඇවැත් නොවේ. දෙදෙනම සිටියාහු කියවා ගණිත්ද මේ නයමවේ. ලදරු මහණෙක් හුන්නේය. හෙරණෙක් සිටියේය. හුන්නහුට කියම්'යි කියන මහණහුටද ඇවැත් නොවේ. ඉදින් ලදරු මහණ තෙමේ සිටීද, අනික් මහණ තෙමේ හිඳීද සිටියහුට කියම්'යි කියන්නහුටද ඇවැත් නොවේ. ඉදින් බොහෝ මහණුන් අතුරෙහි එක් හෙරණෙක් හුන්නේ වේද, ඒ හුන්නහු කෙරෙහි

පදවසයෙන් ධර්මය කියවන්නාවූ ආචාර්‍යයාහට අචිත්තකාපත්තිවේ. ඉදින් හෙරණ තෙමේ උපචාරය මුද සිටියේ හෝ හුන්නේ හෝ වේද, යම් කෙනකුන්ට කියවාද ඔවුන් කෙරෙහි ඇතුළත් නොවූ බැවින් එක් දිසාභාගයකින් පලා යන ග්‍රන්ථයක් ගණිය යන සඞ්ඛ්‍යාවට යන්නේද, එහෙයින් ඇවැත් නොවේ. 'එකතො සජ්ඣායං කරොන්තොපි, යන මෙහි අනුපසම්පන්නයකු සමග උපසම්පන්නයෙක් එකට හදරමින් ඔහු සමග ම කියාද, ඇවැත් නොවේ. අනුපසම්පන්නයකු වෙත උද්දෙස ගන්නා මහණහුටද, ඔහු සමග එකට කියන මහණහුටද ඇවැත් නොවේ. මෙතෙමේද එකට හැදෑරීම කෙරේය යන සඞ්ඛ්‍යාවට යන්නේය. '**යෙභුය්‍යෙන පගුණං ගන්ථං භණන්තං ඔපාතෙති**' ඉදින් එක් ගාථාවක පෙර පුහුණුව තුබූ පසුව සිහි නොකරන එක් පදයෙක් නොඒද, සෙස්ස පැමිණේද මේ වනාහි බොහෝසෙයින් ප්‍රගුණ ග්‍රන්ථය නම්වේ. මේ නයින් සූත්‍රයද දතයුත්තේය. ඒ ප්‍රගුණග්‍රන්ථය එකට කියන මහණහුටද 'මෙසේ කියව'යි එකට කියන මහණහුටද ඇවැත් නොවේ. '**ඔසාරෙන්තං ඔපාතෙති**' සූත්‍රයක් කියන පිරිස් මැද සැක කරන්නහුට 'මෙසේ කියව'යි ඔහු සමග එකටද කියන මහණහුට ඇවැත් නොවේ. මහාපච්චරියාදියෙහි 'මා සමග නො කියව'යි කියනලද්දේ ඉදින් කියා නම් අනාපත්ති'යි යමක් කියනලද්දේද, එය මහාඅට්ඨකථාවෙහි නැත්තේය. මෙය නැතිබවම යුක්තියවේ. කුමක් හෙයින, යත්: ක්‍රියාසමුට්ඨාන බැවිනි. අත් අයුරකින් වනාහි ක්‍රියා ක්‍රියසමුට්ඨානික වේ. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. පදසොධම්මසමුට්ඨානයයි. වචනයෙන්ද වාචාචිත්තයෙන්ද උපදියි. ක්‍රියා සමුට්ඨානිකය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

චතුර්ථ පදසොධර්ම ශික්ෂාපදයයි

——\\——

පඤ්චම ශික්ෂාපදයෙහි '**මුට්ඨස්සති අසම්පජානා**' නිදීමට පෙර ස්මෘතිසම්ප්‍රජන්‍යය නොකිරීම් වසයෙන් මෙය කියනලදී. භවාඞ්ගයට බැසගත් කල්හි ස්මෘතිසම්ප්‍රජන්‍යයෙක් කොයින් වේද, '**විකූජමානා**' නත් දෙඩවන්නාහු. '**කාකච්ඡමානා**' නාසයෙන් කාකශබ්දය මෙන් තිරච්ඡ ශබ්ද මුදන්නාහු. '**උපාසකා**' ඉතා පළමු කොට නැගිටින ලද උපාසකයෝ. '**එතදවොචුං**' 'ඇවැත' රාහුල භාග්‍යවතුන්වහන්සේ විසින් ශික්ෂාපදය පනවනලදැ'යි භික්ෂූහු ශික්ෂාපදගෞරවයෙන්ම මෙය කීහ. ඒ භික්ෂූහු ස්වභාව විසින් භාග්‍යවතුන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන්ද ආයුෂ්මත්

රාහුල තෙරුන්ගේ ශික්ෂාකාමතාවෙන්ද වසන තැනට පැමිණියාවූ ඒ ආයුෂ්මත්හට කුඩා ඇඳක් හෝ පිටට දෙන ලෑලිකඩක් හෝ යමක් ඇත්තේද එය පනවා සිවුර හෝ උතුරුසඟ සිවුර හෝ හිස තබා ගැනීමට දෙන්නාහ. මේ එහි ඒ ආයුෂ්මත්හුගේ ශික්ෂාකාමතාවෙන්:- භික්ෂූහු එන්නාවූ රාහුල තෙරුන් දුරදීම දැක මිටිමුසුන් කසළ බහන බඳුන් පිටතට දමන්නාහ. නැවැත අන්‍ය භික්ෂූන් විසින් 'ඇවැත්නි' මෙය කවරකු විසින් හෙළනලදදැයි විචාළ කල්හි අන් කෙනෙක් 'ස්වාමීනි' රාහුල තෙමේ ,මේ පෙදෙසෙහි හැසුරුනේය. ඔහු විසින් හෙළන ලද්දේදැ'යි මෙසේ කියත්. ඒ ආයුෂ්මත් රාහුලතෙමේ 'ස්වාමීනි' මේ මාගේ වැඩක් නොවේය'ය එක් දවසකුදු නො කියා එය තැන්පත් කොට තබා භික්ෂූන් තමා කරවා ගෙණ යන්නේය. '**වච්චකුටියා සෙය්‍යං කප්පෙසි**' ඒ ශික්ෂා කාමතාව වඩමින් දම්සෙනෙවි මහමුගලන් අනඳතෙර ආදීන්ගේ සමීපයට නොගොස් නිදන්නට තැනක් නොලත් රාහුල ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වැසිකිළියෙහි සයනය කෙළේය. ඒ කිළිය වනාහි කවුළු බඳින ලදය. සුවඳින් පිරිබඩ කරනලදය. මැනැවින් රැස්කොට තැබූ මල්දම් ඇත්තී චෛත්‍යස්ථානයක් මෙන් පවති. අන්‍යයන්ගේ පරිභොගයක් නැත්තීය.

'**උත්තරිං ද්විරත්තතිරත්තං**' කුලදරුවන් පැවිදි කරවා ඔවුන්ට අනුග්‍රහ නොකිරීම නොසුදුසුයයි භාග්‍යවතුන් වහන්සේ හෙරණුන්ට සඞ්ග්‍රහ කිරීම පිණිස අනුපසම්පන්නයනස්‍යමග උපසම්පන්නයන්ට එක්ගෙයි නිදන්නට තෙරැයක් නිදහස දුන්සේක. '**සහසෙය්‍යං**' එක්ව නිදීම. සෙය්‍ය යනු කයදිගු කිරීමැයි කියූ සයනයද, කියනුලැබේ. යම් සෙනසුනෙක සයනය කෙරෙත්ද එද ගත යුතුය. එහි සෙනසුන පළමුකොට දක්වන්නට '**සෙය්‍යානාම සබ්බච්ඡන්නා**' යනාදිය වදළසේක. කයදිගහැරීම දක්වන්නට '**අනුපසම්පන්නෙන නිපන්නෙ භික්ඛු නිපජ්ජති**' යනාදිය වදරනලදි. එහෙයින් මෙහි මේ අර්ථයවේ. සෙනාසන සඞ්ඛ්‍යාත සෙය්‍යාවට ප්‍රවිෂ්ටව කායප්‍රසාරණ සඞ්ඛ්‍යාත සෙය්‍යාව කෙරේනම්, වාසය කෙරේනම්, සම්පාදනය කෙරේනම්'යි යනුය. '**සබ්බච්ඡන්නා**' යනාදියෙන් ඒ සෙනාසන සඞ්ඛ්‍යාත සෙය්‍යාවෙහි ලක්ෂණ කියනලදි. එහෙයින් යම් සෙනසුනක් මතුවෙහි ගඩොල් ගල් සුණු තණ කොළ යන පස් සෙවනියෙන් හෝ අන් යම් කිසිවකින් හෝ සියලු තැන්ම වසනලද්දේද, මෙය සබ්බච්ඡන්නා නම් සෙය්‍යාය. අර්ථකථාවන්හි ප්‍රකටව්‍යවහාරය ගෙණ වාචොද්ගත කිරීම් වසයෙන් 'සබ්බච්ඡන්නා නාම පඤ්චහි ඡදනෙහි ඡන්නා'යි කියනලදි. එසේ කියනලද්දේ නමුත් වස්ත්‍රයෙන් කළ කිළියෙහි වසන්නහුටද, අනාපත්ති කරන්නට නොහැක්කේද, එහෙයින් වැසීමට සමර්ථවූ යම්කිසි සෙවනියක්ද

පිරිසිඳින ලද්ද මෙහිලා දතයුතුය. පස්වැදෑරුම් සෙවනියම ගණුලබන කල්හි පුවරුයෙන් වසනලද සෙනසුනෙහිද සහසෙයයාාව නොවන්නීද, එහෙයින් යම් සෙනසුනක් බිම පටන් සෙවනිය දක්වා හපා පවුරකින් හෝ අත්කිසිවකින් හෝ යටත් පිරිසයින් වස්ත්‍රයකින් නමුත් වට කරනලද්දීද, මෝතොමෝ සබ්බච්ඡන්නා නම් සෙයාාය. සෙවනිය නොහපා යටත් පිරිසයින් එක්රියන් හමාරක් උස්වූ පවුරු ආදියකින් වට කරන ලද්දීද සියල්ල වටකරනලද්දීමයයි කුරුන්දි අට්ඨකථාවෙහි කියනලදි. යම් කිළියක මත්තෙහි ඉතා බොහෝ තැනක් හෙවත් සතරින් තුන් කොටසක් වසන ලද්දේද, මදක් හෙවත් සතරින් එක් කොටසක් නොවසන ලද්දේද, වටින් සතරින් තුන් කොටසක් වට කරනලද්දේද සතරින් එක් කොටසක් වටනොකරන ලද්දේද මෝතොමෝ බොහෝ සෙයින් වසනලද, බොහෝ සෙයින් වට කරනලද සෙයාාව නම. මේ ලක්ෂණයෙන් යුක්තවූ සත්මහල් පහයෙකි. තෙමේ එක් උපචාරය ඇත්තේ වේද, සියයක් ගබඩා ඇති පහයක් හෝ සිවුරුස් සාලාවක් හෝ එකුපචාරය වේද, මේ හැම එකසෙයාා'යි කියාම සඞ්ඛ්‍යාවට යෙයි. ඒ සඳහා 'සතරවන දිනයෙහි හිරු අමාවට ගිය කල්හි අනුපසම්පන්නයා හොත් කල්හි මහණතෙමේ හොවීද, පාචිත්තියාපත්තිය වන්නීය යනාදිය වදරනලද්දේය. එහිද හෙවීම් පමණකින්ම පාචිත්තිය වේ. ඉදින් සාමණේරයෝ බොහෝ වෙත්ද, එක් මහණෙක් වේද, සාමණේරයන්ගේ ගණනින් පාචිත්තියාපත්තීහු වෙත්. ඒ හෙරණහු නැගිට නැගිට හොවිත්ද ඒ හෙරණුන්ගේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා මහණහුට ඇවැත්වේ. මහණහු නැගිට නැගිට හොවීමෙහි මහණහුගේම ප්‍රයොගයෙන් මහණහුට ඇවැත්වේ. ඉදින් බොහෝ මහණෝ වෙත්ද එක් හෙරණක් වේද, සියල්ලන්ට ඇවැත් කරයි. ඒ හෙරණහු තමා නැගිට නැගිට හොවීමෙන්ද මහණුන්ට ඇවැත්මය. උපසපන් හෙරණ දෙපසෙහි බොහෝ බැව්හිද මේ නයමවේ.

තවද මෙහි එකාවාසාදීවූ චතුෂ්කය දතයුත්තේය. යම් මහණෙක් තෙමේ එක් ආවාසයෙක එක්ම අනුපසම්පන්නයකු සමග තෙරයක් එකට සයනය කෙරේද, ඒ මහණහුට සතරවන දින පටන් දවස්පතා ඇවැත්වේ. යම් මහණෙක් එක්ම ආවාසයෙක නොයෙක් අනුපසම්පන්නයන් සමග තෙරයක් එකට සයනය කෙරේද, ඒ මහණහුටද, යම් මහණෙක් නොයෙක් ආවාසයන්හි නොයෙක් අනුපසම්පන්නයන් සමග සියක් යොදුනක් නමුදු ගොස් එකට සයනය කෙරේද, ඒ මහණහුටද සතර වන දින පටන් දවස්පතා ඇවැත්වේ.

මේ සහසෙය්‍යාපත්තිය නම්. **'භික්ඛුං ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම'** මහණහු හැර සෙසු දෙන අනුපසම්පන්න නැමැයි වදළ බැවින් තිරිසන්ගියකුද සමග වේ. එහි තිරිසන්ගියහුගේ පිරිසිදීම මෙවුන්දම් ඇවැතෙහි කියූ නයින්ම දතයුත්තේය. එහෙයින් ගොයි බළල්, මුගටි ආදීන් අතුරෙහි කිසිවෙක් පිවිස මහණහු වසන සෙනසුනෙහි එකූපචාරස්ථානයෙහි සයනය කෙරේද, එකට සයනය කිරීමම වේ. ඉදින් ටැම් මතුවෙහි කළ පහයෙහි මතුතලය සමග සම්බන්ධ නොවූ බිත්ති ඇති පහයෙක බිත්තිය මතුවෙහි තුබූ සිදුරුවූ තලාද හිස්වූ සිදුරකින් ඇතුල්ව තලාදය තුළ නිද ඒ සිදුරෙන්ම නික්මයේද, යට පහයෙහි නිදිගත් මහණහුට ඇවැත් නොවේ. ඉදින් සෙවනියෙහි සිදුරක්වේද, එයින් පිවිස සෙවනියතුළ වැස ඒ සිදුරෙන්ම බැහැරයේද, යම් තැනක පිටත හිණිමග කොට මතුතලයට නගීද, එබඳු නානූපචාරය ඇති පහයෙහි මතුතලයෙහි සෙවනියතුළ නිදිගත් මහණහුට ඇවැත් වේ. යට තලයෙහි හොත් මහණහුට ඇවැත් නොවේ. ඉදින් ඇතුල් පහයෙන්ම නැගී සියලුම තල පරිභොග කෙරෙත්ද, එකූපචාරයෝ වෙත්ද, ඒ තලයන්හි යම්කිසි තැනක නිදිගත් මහණහුට ඇවැත් වේ. ශාලා ආකාරයෙන් කළ එක් පසක් හැර තුන් පැත්තක බඳිනලද බිත්ති ඇති එක් පැත්තක බිත්තිය නගා දෙපැත්තක අඩ අඩ කොට බිත්ති නගා කළ අඩ්ඪකුඩ්ඩක සෙනාසනයෙහි නිදිගත් මහණහුට, ටැම් මතුවෙහි වහල රූපයන්ගෙන් කරනලද ගෘහාවයවයන්හි පරිවි ආදීහු සයනය කෙරෙත්ද, ඇවැත් නොවේ. හාත්පසින් වටවූ හෝ සිවුරුස්වූ හෝ එක් සෙවනියක් ඇති ගබඩාපෙළෙහි සියක් ගබඩා ඇති සෙනසුනෙක් වේද, එහි එක් සාධාරණවූ දොරකින් පිවිස, වෙන්ව පවුරකින් නො පිරිසිදිනලද ගැබ් උවසර ඇති සියලු ගබඩාවන්හි පිවිසෙත්ද, එක් ගබඩාවෙක නමුදු අනුපසම්පන්නයකු නිදිගත් කල්හි සියලු ගබඩාවන්හි නිදිගත් මහණුන්ට ඇවැත්වේ. පිල් සහිතවූ ගබඩාවෝ වෙත්ද, පිල නොවසනලද්දේද උස් බිමක්වේද පිලෙහි නිදිගත්තේ ගබඩාවෙහි නිදිගත් මහණුන්ට ඇවැත් නොකෙරේ. ගබඩාවෙහි ජලය සමග ම සම්බන්ධවූ ජලය ඇත්තේ වේද, ඒ පිලෙහි නිදිගත්තේ සියල්ලන්ට ඇවැත් කෙරේ. කුමක් හෙයින, යත්:- උඩ සියල්ල සෙවිලි කළ බැවින් හා සියල්ල වටකළ බැවිනි. මේ ගබඩාව පිළිබඳ වටකිරීමම පරික්ෂෙපයයි. 'යමකින් වට නොකළ ප්‍රමුඛ යෙහි ඇවැත් නොවේ, මාල්තලය හැර පොළොවෙහි ප්‍රමුඛය සඳහා යමක් අන්ධකාත්ථ කථාවෙහි කියනලදැයි කියනලද්දේද ඒ කීම අන්ධක රටෙහි වෙන්ව විසීම් ඇත්තාවූ එක් ජලය ඇත්තාවූ ගබ්භඩක්තිය සඳහා කියනලදී. එහි 'භූමියං විනා ජගතියා'යි යමක් කියනලදද එය අත්ථකථාවන්හි නොමැත්තේය. පෙළ

හා සම නොවේ. දහරියනක් උස ඇත්තාවූද පොළොව පරික්ෂෙපසඞ්ඛ්‍යාවට නොයයි. එහෙයින් ඒ අන්ධකාත්ථකථාවෙහි දෙවන සහසෙය්‍යා සික්ෂාපදයෙහි පොළොවෙහි යම් ප්‍රමාණයක් කියා මෙය එකූපචාරය ප්‍රතිච්ඡන්න නම් වේයයි කියන ලදද, එය නොගතයුතුය. එක් දිසාවෙක්හි කෙළින්ම දිග් කොට වැසූ ප්‍රාසාද නම්වූ එකසාලා සන්නිවෙසයද, දෙදිසාවන්හි සතරමංහන්දි සටහන් ඈ විසින් කරනලද තිසාලා සන්නිවෙසයද, සිවුදසාවෙහි සතරමංහන්දි සටහන් විසින් කරනලද චතුස්සාලා සන්නිවෙසයද යන යම් මහා ප්‍රාසාදයෝ වෙත්ද එක් ඉඩපහසු ඇති තැනෙක පාද ධොවනය කොට පිවිසියහු විසින් සියලු තන්හි වටට යන්නට හැකි වෙත්ද, ඒ ගබඩා වන්හිද. සහසෙය්‍යාපත්තියෙන් නොමිදේ. ඉදින් ඒ ඒ තැන උපචාරය පිරිසිඳ කරනලද්දහු වෙත්ද, එකූපචාරස්ථානයෙහිම ඇවැත් වේ. දෙදෙරින් යුත් සුණෙන් බැඳි ප්ලය ඇති මණ්ඩපයෙක මැද පවුරක් කරත්ද, එක් දෙරකින් පිවිස එක් කොටසෙක්හි අනුපසම්පන්නයෙක් තිද්ද, එක් කොටසෙක්හි මහණෙක් තිද්ද, ඇවැත් නොවේ. පවුරෙහි ගොයි ඇනට පිවිසීමට පමණවූ සිදුරක්වේද, එක් කොටසෙක්හි ගොයිහු තිදත්ද, ඇවැත් නොවේමය. සිදුරෙන් ගෘහය තෙමේ එකූපචාර නම් නොවේ. ඉදින් පවුර මැද සිඳ දෙර යොදත්ද එක් උපචාරයක් ඇති බැවින් ඇවැත්වේ. ඒ දෙර කවුළුවෙන් වසා සයනය කෙරෙත්ද, ඇවැත්මය. දෙර වැසීමෙන් ගෘහය නානූපචාර නම් නොවේ. දෙර ඇත්තාවූ හෝ දෙර නැත්තාවූ හෝ කවුළුව වනාහි වැහීමෙන් ඇරීමෙන් සුවසේ පරිභොගය පිණිස කරන ලද්දේය. පරිභොගය වළකනු පිණිස නොවේ. ඉදින් ඒ දෙර නැවැත ගඩොලින් වසත්ද, එකල්හි දෙර නැත්තේ වේ. පළමු කියූ නානූපචාරභාවයෙහිම සිටියි. දිග් පිල ඇති සැගෙයක් වේද, එහි ඇතුළත එක් කවුළුවෙක්වේද, පිටත එක් කවුළුවෙක් වේද, කවුළුදෙක අතර අනුපසම්පන්නයෙක් තිද්ද, සැගෙයතුළ නිදිගත් මහණහුට ඇවැත් කරයි. කුමක්හෙයින, යත්: එක් උපචාරයක් ඇති බැවිනි.

එහි යම් ගෘහයෙක මේ එකූපචාරනානූපචාරභාවය නම් වන්නේද එය උද්දෙසිත ශික්ෂාපදයෙහි කියනලද්දේය. මෙහි වනාහි සෙය්‍යා නම් උඩසියල්ල සෙවිලිකළ කිළියය. සියල්ල වට කළ කිළියය. බොහෝසෙයින් වැසූ කිළියය. බොහෝ සෙයින් වට කළ සෙය්‍යායි මෙපමණක්ම කියනලද්දේය. වැසූ දෙර ඇති ගහීය සියල්ල වටකරන ලද්දේමවේ. එහෙයින් එහි ඇතුළත නිදිගත්තහු සමගම ඇවැත්වේ. පිටත නිදිගත්තහු සමග අනාපත්තියයි. හෙතෙමේ මෙසේ කියයුතු වන්නේය. 'නොවැසූ දෙර ඇති කල්හි කුමක් හෙයින් පිටත නිදිගත්තහු සමග ඇවැත් වේදැ'යි

ආලින්දය තමා ගබඩාව සමග උඩ සියල්ල වැසූ බැවිනි. කිම, ගබඩාව වැසූ කල්හි පලය නසනලද්දේ වේද, යත්:- නොනසනලද්දේය. ගබඩාව සමග ආලින්දය තමා සියල්ල වැසූබවෙක් නොවේ. කිම, වටකිරීම නසනලද්දේද, යත්:- එකාන්තයෙන් කියයි. නොනසන ලද්දේය. කවුළුවෙන් උපචාරය පිරිසිඳිනලද්දේය. මෙසේ ඉතා දුර නමුදු ගොස් නැවත එකූපචාරනානූපචාරභාවයටම පෙරළා එන්නේය. ව්‍යඤ්ජනමාත්‍රයෙන්ම අර්ථය මොනවට දැනගත හැකි වන්නේය. 'සබ්බච්ඡන්නා'යි කීබැවින් පස්වැදෑරුම් වූ සෙවනි අතුරෙන් එක්තරා සෙවනියකින් වසනලද්දීම සෙය්‍යා වන්නීය. අනිකකින් වසනලද්දී සෙය්‍යා නොවන්නීය. මෙසේ ඇති කල්හි පුවරු ආදියෙන් වැසූ සෙය්‍යා ආදියෙහි ඇවැත් නොවන්නීය. එහෙයින් යමක් පිණිස ශික්ෂාපදය පනවනලද්දේද එම අර්ථය තෙමේ පිරිහෙන්නේය. පිරිහේවා හෝ නොපිරිහේවා, නොකියනලද්දක් කෙසේ ගතයුත්තේදැ'යි නොකියනලද්දක් ගතයුතුය'යි කවරෙක් කියාද, නොකියාමය. අනියත ශික්ෂාපදයන්හි' පිළිසන් අසුන නම් බිත්තියෙන් හෝ කවුළුවකින් හෝ කලාලකින් හෝ තිරපවුරකින් හෝ රුකකින් හෝ වැඹකින් හෝ රුක්පතුරෙන් හෝ යන යම් කිසිවකින් වසන ලද්දේවේය'යි මේ කරුණ වදරනලදමය. එහෙයින් යම්සේ එහි යම් කිසිවකින් වසනලද්දේ නම් වසනලද්දේමය. මෙහිද මෙසේ ගතයුතුය. එහෙයින් සෙනසුන කුඩා හෝ වේවා, මහත් හෝ වේවා අනිකක් සමග සම්බන්ධ හෝ අසම්බන්ධ හෝ දිග් හෝ වට හෝ සිවුරැස් හෝ එක් මහලක් ඇත්තේ හෝ නොයෙක් මහල් ඇත්තේ හෝ යම් යම් සෙනසුනක් එක් උපචාරයක් ඇත්තේ හැමතන්හි යම් කිසි වැස්මකින් මතු සියල්ල වැසූ කල්හි සියල්ල වටකළ කල්හි බොහො සෙයින් වැසූ කල්හි හෝ බොහෝ සෙයින් වටකළ කල්හි සහසෙය්‍යාපත්තිය වන්නීය. මතු දෙකොටසින් එක්කොටසක් සෙවිලි කළ කිළියෙහි දෙකොටසින් කොටසක් සෙවිලි කළ කිළියෙහි ඇවැත දුක්කටයයි. මෙහි සබ්බච්ඡන්නෙ, උපඩ්ඪ පරිච්ඡන්නෙ, යන මේ ආදියෙහිද **මහාපච්චරියෙහි** දුක්කටමයයි කියනලදි. **මහාඅර්ථකථාවෙහි**' වනාහි 'මතු සියල්ල සෙවිලිකළ සෙනසුනෙහි සිවුකොටසින් තුන් කොටසක් වටකළ සෙනසුනෙහි පාචිත්තියය. සියල්ල සෙවිලි කළ සෙනසුනෙහි අඩක් වට කළ සෙනසුනෙහි පාචිත්තයය. බොහෝ සෙයින් සෙවිලිකළ කිළියෙහි අඩක් වටකළ සෙනසුනෙහි පාචිත්තියය. සියල්ල වටකළ සෙනසුනෙහි අඩක් සෙවිලිකළ සෙනසුනෙහි පාචිත්තියයි, බොහෝ සෙයින් වටකළ සෙනසුනෙහි අඩක් සෙවිළි කළ සෙනසුනෙහි පාචිත්තියය, පෙළෙහි වදළ පාචිත්තිය සමග සත් පාචිත්තියක් වදරනලදී. සියල්ල වැසූ සිවු කොටසින් එක් කොටසක් වටකළ

සෙනසුනෙහි දුක්කටය තුන් කොටසින් දෙකොටසක් සෙවිලි කළ සිවු කොටසකින් එක් කොටසක් වටකළ සෙනසුනෙහි දුක්කටය. සියල්ල සෙවිලි කළ සිවු කොටසින් එක් කොටසක් වට කළ සෙනසුනෙහි දුක්කටය, තුන් කොටසින් දෙකොටසක් වටකළ, සිවු කොටසින් එක් කොටසක් සෙවිලි කළ සෙනසුනෙහි දුක්කටය. පෙළෙහි ආ දුක්කටය සමග දුක්කට පසක් වදරනලදී. අඩක් සෙවිලි කළ සිවුවන කොට වටකළ සෙනසුනෙහි ඇවැත් නොවේ. අඩක් වටකළ සතරින් කොටසක් වැසූ සෙනසුනෙහි ඇවැත් නොවේ. සතරින් කොටසක් සෙවිලි කළ සතරින් කොටසක් වටකළ සෙනසුනෙහි ඇවැත් නොවේ. 'සබ්බච්ඡන්නෙන සබ්බ අපරිච්ඡන්නෙන' යන මෙහි සෙනම්බමණ්ඩප සටහන් ඇත්තේ වේයයි කියනලදි. සිංහලද්වීපයෙහි උස්වූ පොළොව ඇති සියල්ල සෙවිලි කළ සියල්ල වටකළ මෙනම් ඇති සන්නිපාත මණ්ඩපයෙක් ඇත්තේය. 'සෙනම්බමණ්ඩප වණ්ණං හොති' යනු මේ සඳහා මෙය කියනලද්දේය. මෙයිනුදු මෙය දතයුත්තේය. භූමිය පරික්ෂෙපසඞ්ඛ්‍යාවට නොයන්නේය, යනුයි. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. එළකලොමං සමුට්ඨානිකය. කයින්ද කායචිත්තයෙන්ද උපදියි. ක්‍රියාසමුට්ඨානය නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මය. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

පස්වන සහසෙය්‍යශික්ෂාපදයයි

—||—

ද්වීතිය සහසෙය්‍ය ශික්ෂාපදයෙහි '**ආවසථාගාරං**' ආගන්තුකයන් වසනගෙය. '**පඤ්ඤත්තං හොති**' පින් කැමැති බැවින් කොට තබන ලද්දේවේ. '**යෙන සා ඉත්ථී තෙනුපසඞ්කමි**' අසුවල් නම් තැන පනවනලද ආවසථාගාරයක් ඇත්තේය'යි මිනිසුන්ගෙන් අසා එළැඹියේය. '**ගන්ධගන්ධිනී**' කලුවැල් කොකුම් ආදී ගන්ධයන්ගේ ගන්ධය තෙමේ '**ගන්ධගන්ධ**' නම්වේ. ඒ ගන්ධය තෙමේ මැයට ඇත්තේය'යි 'ගන්ධගන්ධිනී නම. '**සාටකං නික්ඛිපිත්වා**' මේ විප්‍රකාරය දක්නාවූ මේ ස්ථවිරයන්ට රාගය උපදින්නේනම් ඉතා මැනැවැ'යි සිතා මෙසේ කළාය. '**ඔක්ඛිපිත්වා**' යටහෙළා '**අච්චයො**' අපරාධය '**මං අච්චගමා**' මා ඉක්මවා මැඩ පවත්වා පැවැත්තේය. සෙස්ස ප්‍රථම ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුත්තේය. මේ වනාහි විශේෂය වේ. ප්‍රථම ශික්ෂාපදයෙහි සතරවන දිනයෙහි ඇවැත්වේ. මෙහි ප්‍රථම දිනයෙහිද ඇවැත්වේ. පෙනෙන රූපයෙන් යුත් යකිනි ප්‍රෙතියන් සමගද මෛථුනධර්මයට වස්තුවූම තිරිසන්ගිය

ස්ත්‍රියක සමගද සහසෙය්‍යාව කරන මහණහුට දුක්කටය වේ. සෙසු ස්ත්‍රීන් සමග නිදන මහණහුට ඇවැත් නොවේ. සමුට්ඨානාදීහු ප්‍රථම ශික්‍ෂාපදය හා සමානම වෙත්.

සවැනිවූ දෙවන සහසෙය්‍යාශික්‍ෂාපදයයි

—||—

සප්තමශික්‍ෂාපදයෙහි '**ඝරණී**' ගෙහිමි දූය. '**නිවෙසනද්වාරෙ**' නිවෙස්නෙහි මහදෙර සමීපයෙහි. '**ඝරසුණ්හා**' ඒ ගෙයි යෙහෙළි. '**ආවසථද්වාරෙ**' ඇතුළු ගෙයි දෙර සමීපයෙහි '**විස්සට්ඨෙන**' තදින් නික්මුනු ශබ්දයෙන්. '**විවටෙන**' මැනැවින් පවසන්නහු, විසින් නොහික්මුණහු විසින් '**ධම්මො දෙසෙතබ්බො**' මේ සරණ සීලාදිභෙදවූ ධර්මය කිය යුත්තේය. '**අඤ්ඤාතුං**' දැනගන්නට '**විඤ්ඤුනා පුරිසවිග්ගහෙන**' නුවණැති පුරුෂයකු විසින් පුරුෂශරීරයක් මවාගෙණ සිටි යකෙකු සමග සිටි එකියකට දහම් දෙසීම නොසුදුසුය. ප්‍රෙතයකු සමග සිටි එකියකට දහම් දෙසීම නොසුදුසුය. තිරිසන්ගියකු සමග සිටි එකියකට දහම් දෙසීම නොවටියි. '**අනාපත්ති විඤ්ඤුනා පුරිසවිග්ගහෙන**' නුවණැති මනුෂ්‍යපුරුෂයකු සමග සිටින්නියකට බොහෝ වූද, දහම් දෙසන මහණහුට ඇවැත් නොවේ. '**ඡප්පඤ්චවාචාහි**' වචන සයකින් හෝ වචන පසකින් හෝ යම් මහණෙක් තෙමේ නුවණැති පුරුෂයකු ලඟ නැතිව කියූ ආකාර ඇති ස්ත්‍රියකට දහම් දෙසාද, ඒ මහණහුටද ඇවැත් නොවේ. එහි '**එකො ගාථා පාදො එකා වාචා**' එක් ගාථාපාදයෙක් එක් වචනයෙකැ'යි මෙසේ හැම තන්හි වචනප්‍රමාණය දතයුතුය. ඉදින් අර්ථකථාවක් හෝ ධර්මපදයක් හෝ ජාතකාදිවස්තුවක් හෝ කියනු කැමැත්තේ වේද, සපදයක් පමණම කීම වටියි. පෙළ සමග කියන්නහු විසින් පෙළෙන් එක් පදයෙක අර්ථකථාවෙන් පස් පදයෙකැයි මෙසේ සපදය නොඉක්මවාම කියයුතුය. පදසොධම්මශික්‍ෂාවෙහි කියූ ප්‍රභෙද සියල්ලම මෙහිද ධර්මැයි කියනලද්දේමය. '**තස්මිං දෙසෙති**' එකෙණෙහි දෙසයි. නොහොත් මෙය සම්ප්‍රදනාර්ථයෙහි සප්තමීවචනයි. ඇයට දෙසයි යන අර්ථයි. '**අඤ්ඤිස්සා මාතුගාමාය**' එකියක්හට දෙසා නැවැත ආ ආ අන් එකියක්හට දෙසයි. මෙසේ එක් අසුනෙක හුන්නේ මාගම් සියයකටද දෙසයි යන අර්ථයි. '**පඤ්හං පුච්ඡති පඤ්හං පුට්ඨො කථෙති**' මාගම 'ස්වාමීනි' දීඝනිකාය කවර අර්ථයක් දක්වාද'යි විචාරාද, මෙසේ ප්‍රශ්න විචාරණලද මහණ තෙමේ සියලුම දීඝනිකාය කියා නම් ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. පදසොධම්ම සමුට්ඨානිකය. වාචායෙන්ද වාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියා සමුට්ඨානිකය.

නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සත්වන ධර්මදෙශනා ශික්ෂාපදයයි

—\\—

අෂ්ටමශික්ෂාපදයෙහි වස්තුකථාවෙහි පළමු කොට යමක් කියයුතු වන්නේ නම් ඒ සියල්ල සතරවන පාරාජිකවර්ණනාවෙහි කියූ නය ඇත්තේමය. එහි මේ විශේෂය වේ: එහි අවිද්‍යමාන ගුණය සැලකළහ. මෙහි විද්‍යමානගුණය සැලකළහ. විද්‍යමානගුණයත් අවිද්‍යාමනගුණයත් පෘථග්ජනයෝ සැලකළහ. ආයර්‍යයෝ නොවෙති. ආයර්‍යයන්ගේ වනාහි ප්‍රයුක්තවචනයෙක් නම් නැත්තේය. තමන්ගේ ගුණය සැලකරන කල්හි අන්‍යයෝ නොවැළකුහ. එසේ උපන් ප්‍රත්‍යයයන්ද ඉවසූහ. එසේ උපන්බව නොදන්නාවූ **'අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං'** යනාදියෙහි යම් කෙනෙක් තුමූ උත්තරිමනුෂ්‍යධර්මය පිළිබඳ ගුණ කියවාහුද, ඔවුහු සැල කළහයි දතයුතුය. **'කච්චි පන වො භික්ඛවෙ භූතං'** කීම, මහණෙනි, තොපගේ විද්‍යමන වූවක්දැ'යි විචාළ කල්හි සියල්ලෝම **'භූතං භගවා'** භාග්‍යවතුන් වහන්ස විද්‍යමනය'යි පිළිනකළහ. ආයර්‍යයන්ගේම අභ්‍යන්තරයෙහි උත්තරිමනුෂ්‍යධර්මය විද්‍යමානයයි එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයර්‍ය මිශ්‍ර බැවින් 'තුච්ඡපුරුෂයෙනි'යි නොවදරා **'කථං හි නාම තුම්හෙ භික්ඛවෙ'** 'මහණෙනි' තෙපි කෙසේ නම්'යි වදරා **'උදරස්ස කාරණා'** යනාදිය වදළසේක. එහි යම්හෙයකින් ආයර්‍යයෝ අන්‍යයන් අතින් අසා 'ස්වාමීනි' ආයර්‍ය තෙමේ සෝවාන්දැ'යි යනාදි නයින් ප්‍රසන්නමනුෂ්‍යයන් විසින් විචාරණු ලබන්නාහු ශික්ෂාපදය නොපැනවූ කල්හි ආදීනව නොදක්නෝ පිරිසිදු සිත් ඇති බැවින් තමන්ගේද අන්‍යයන්ගේද විශේෂාධිගමය පිළිත කළහ. මෙසේ පිළිත කරන්නාවූද ඔවුන් විසින් අන්‍යයෝ උදරය කරණු කොට උත්තරිමනුෂ්‍යධර්මයෙහි ගුණ කියා යම් පිණ්ඩපාතයක් ඉපදෙව්වාහුද, ඒ පිණ්ඩපාතය පිරිසිදු සිත් ඇතිබැවින් ඉවසන්නන් විසින්ද, උදරය කරුණු කොට උත්තරමනුෂ්‍යධර්මයෙහි ගුණය කියනලද්දක් මෙන් වේ. එහෙයින් සර්වසඞ්ග්‍රාහික නයින්ම 'කථංහි නාම තුම්හෙ භික්ඛවෙ උදරස්ස කාරණා ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිස්සථ'යි වදළසේක. සෙස්ස සතරවන පාරාජිකවස්තුව සමානමවේ. ශික්ෂාපදවිභඞ්ගයෙහිද හුදෙක් එහි පාරාජිකයද ථුල්ලච්චයද පනවා වදළසේක. මෙහි විද්‍යමන බැවින් පාචිත්තියද දුක්කටයද පනවා වදළසේක. මේ වෙනසයි. සෙස්ස කියනලද නයමය. **'උපසම්පන්නස්ස භූතං ආරොචෙති'**

යනු උත්තරිමනුෂ්‍යධර්මය සඳහාම වදරනලදී. පිරිනිවන්පාන කාලයෙහි හෝ පිරිනිවන්පාන කාලයෙන් අනික් කාලයෙක හෝ 'ස්වාමීනි' කියනුමැනැවැ තුඹවහන්සේ විසින් කුමක් අධිගතදැයි පීඩාකරනු ලබන්නහු විසින් උපසම්පන්නයක්හට විද්‍යමාන ගුණයක් සැලකිරීම වටියි. ශ්‍රැතගුණය පර්‍ය්‍යාප්තිගුණය ශීලගුණය යන මේ ගුණයන් අනුපසම්පන්නයක්හට නමුදු කීම වටියි. ආදිකර්මිකයාහට ඇවැත් නොවේ. 'උම්මත්තකස්ස' මෙය වනාහි නොවදරනලදි. කුමක්හෙයින, යත්:- මාර්ගඵල දෘෂ්ටියෙන් යුක්තවූවන් අතර උමතුවූවකු හෝ විසුරුනු සිත් ඇත්තකු හෝ නොවන බැවිනි. මහාපච්චරියෙහිද 'ධ්‍යානලාභී තෙමේ වනාහි ධ්‍යානය පිරිහුනු කල්හි උමතුවන්නේය. ඔහුටද භූතාරෝචනය කරුණු කොට අනාපත්තිය නොකියයුත්තීය, විද්‍යමානයාගේම අභාවය හෙයිනැ'යි විචාරණය කරනලදි. සෙස්ස ප්‍රකටමය. භූතාරෝචන නම්වූ මෙය පෙර සතරවන පාරාජිකයෙහි නොකියනලද ත්‍රිසමුත්ථානයෙන් කයින්ද වචනයෙන්ද කායවචායෙන්ද උපදි. ක්‍රියාසමුත්ථානිකය නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. කුශල ව්‍යාකෘතචිත්තයන්ගෙන් ද්විචිත්තයි. සුඛමධ්‍යස්ථ වෙදනාවෙන් ද්විවෙදනයි.

අටවන භූතාරෝචනශික්ෂාපදයයි

—\\—

නවම ශික්ෂාපදයෙහි '**දුට්ඨුල්ලා නාම ආපත්ති චත්තාරි පාරාජිකානි තෙරස ච සඞ්ඝාදිසෙසා**' යන මේ පාළියෙහි 'පාරාජිකානි' යනු දුට්ඨුල්ල ශබ්දයාගේ අර්ථ දක්වනු පිණිස කියනලද්දේය. සඞ්ඝාදිසෙසය මෙහි අදහස් කරනලදැයි අර්ථකථාවන්හි කියනලදී. එහි මේ විචාරණයයි. ඉදින් අනුපසම්පන්නයක්හට පාරාජිකාපත්තියක් සැලකරන මහණහුට පාචිත්තියාපත්තිය නොවන්නීනම් භික්ෂු භික්ෂුණීන් පිළිබඳ උපසම්පන්න ශබ්දය යම්සේ සමාන කල්හි යම් තැනක භික්ෂුණී තොමෝ අදහස් නොකරනලද්දී වේද, එහි භික්ෂූහු හැර සෙසු දෙන අනුපසම්පන්නයි කියනුලැබෙත්. මෙසේ මෙහි පාරාජික සඞ්ඝාදිසෙසයන්ට දුට්ඨුල්ලශබ්දය සමාන කල්හිද පාරාජිකාපත්තිය අදහස් නොකරනලද්දී නම් 'දුට්ඨුල්ලාපත්ති නම් තෙරස සඞ්ඝාදිසෙසයෝ'යි මෙම කියයුතු වන්නේය. යම් මහණෙක් තෙමේ පාරාජිකාපත්තියට පැමිණියේ වේද, ඒ මහණතෙමේ භික්ෂුභාවයෙන් චුතවූයේ වේ. එහෙයින් ඒ මහණහුට ඇවැත ආරෝචනය කරන්නේ දුක්කටයට පැමිණේදැයි එහි විමති වන්නේය. මෙසේ ඇති කල්හි ඔමසවාදයෙන් ආක්‍රොශ කරන්නේද දුක්කටයට පැමිණේ නම් පාචිත්තියටත්

පැමිණේමය. 'පුග්ගල තෙමේ එක්තරා පාරාජිකාපත්තියකට පැමිණියේ අපිරිසිදු වේ. අශුද්ධදෘෂ්ටි ඇතියෙක් ඔහුට ඔකාස කරවා ආක්‍රොශ කරන අදහස් ඇතිව කියා නම් ඔමසවාදපාචිත්තියාපත්තියට පැමිණීම වේය'යි මෙය වදරනලද්දේය. මෙසේ පාළිය විචාරණ ලබන කල්හි පාරාජිකාපත්තිය ආරෝචනය කරන මහණහුටද පාචිත්තියම දන්නාලැබේද, කිසිසේත් දක්නාලැබේ. කුමක්හෙයින, යත්ඃ සියලු අට්ඨකථාවන්හි කියූ බැවිනි. අට්ඨකථාචාර්‍ය්‍යයෝම මෙහි ප්‍රමාණ වෙත්. අනික් විමසීමෙක් නැත්තේය. පෙරද 'බුද්ධෙන ධම්මො විනයොච වුත්තො, යො තස්ස පුත්තෙහි තථෙව ඤාතො' යනාදිය කීම්හ. අට්ඨකථාචාර්‍ය්‍යයෝ වනාහි බුදුරජානන් වහන්සේගේ අදහස දනිත්, මෙද මේ ක්‍රමයෙන් දතයුතුය. භික්ෂුසම්මුතිය හැරැයි කියනලද්දේය. භික්ෂුසම්මුතියෙන් ආරෝචනය කිරීමද මත්තෙහි සංවරය පිණිසය. නැවැත එබඳු ඇවැතකට නොපැමිණීම පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නාලදී. ඒ මහණහුගේ අවර්ණමාත්‍රයක් පවසනු පිණිස නොවේ. ශාසනයෙහි හෝ මේ මහණහුට පිහිට වළකනු පිණිස නොවේ. පාරාජිකාපත්තියට පැමිණි මහණහුගේ, නැවැත එබඳු ඇවැතට නොපැමිණීම් හෙතුවෙන් භික්ෂුභාවයෙක් නම් නැත්තේය. එහෙයින් පාරාජිකානි දුට්ඨුල්ලසද්දත්ථදස්සනත්ථං වුත්තානි. සඞ්ඝාදිසෙසං ඉධ අධිප්පෙතං'යි යමක් අට්ඨකථාවන්හි කියනලද්දේද, එය මනාකොට කියනලද්දේමය. **'අත්ථි භික්ඛුසම්මුති ආපත්තිපරියන්තා'** යනාදියෙහි වනාහි යම් මේ භික්ෂු සම්මුතියක් කියනලදද, ඕතොමෝ කිසි තැනක නොආය. මෙහි කියූ බැවින්ම නිතර ඇවැතුනට පැමිණෙන මහණකු දැක මෙසේ මෙතෙමේ අනුන් කෙරෙහි හිරිඔතප් දෙකෙනුදු මත්තෙහි සංවරයට පැමිණෙන්නේයයි ඒ මහණහුට වැඩ සොයන බැවින් තුන් යලක් අපලොකනය කොට සඞ්ඝයා විසින් කටයුත්තීය'යි දතයුතුය. **'අදුට්ඨුල්ලං ආපත්තිං ආරොචෙති ආපත්ති දුක්කටස්ස'** පඤ්චවිධ ආපත්තිසකන්ධයයන් අනුපසම්පන්නයක්හට ආරෝචනය කරන මහණහුට දුක්කටය වේ. **මහාපච්චරියෙහි** වනාහි පාරාජිකාපත්තියක් ආරෝචනය කරන මහණහුටද දුක්කටයම කියනලදී. **'අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං'** යන මෙහි ආදියෙහි ප්‍රාණඝාතාදි ශික්ෂාපද පස දුට්ඨුල්ල නම්වූ අධ්‍යාචාරයවේ. විකාලභොජනාදීවූ සෙසු සිකපද අදුට්ඨුල්ල නම් අධ්‍යාචාරයයි. සුක්කවිස්සට්ඨි-කායසංසග්ගරාග- දුට්ඨුල්ලය අත්තකාමය මේ ශික්ෂාපදයාගේ අධ්‍යචාර නමැයි කියනලදි. **'වත්ථුං ආරොචෙති'** මේ සුක්කවිස්සට්ඨියට පැමිණි මෙතෙමේ දුට්ඨුල්ලයට පැමිණියේය. අත්තකාමපාරිචරියාවට පැමිණියේය. කායසංසග්ගරාගයට පැමිණියේයයි මෙසේ කියන මහණහුට

ඇවැත් නොවේ. '**ආපත්තිං ආරෝචෙති**' 'මෙතෙමේ පාරාජිකයට පැමිණියේය, සඞ්ඝාදිසෙසයට, ථුල්ලච්චයට, පාචිත්තියට, පාටිදෙසනීයට, දුක්කටයට. දුබ්භාසිතයට පැමිණියේය,යි කියා නම් ඇවැත් නොවේ. 'මේ මහණ ශුකල මුද සඞ්ඝාදිසෙසයට පැමිණියේය, යනාදි නයින් වස්තුව සමග ඇවැත ගටා ආරෝචනය කරන මහණහුටම ඇවැත්වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන්ද වාචාචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශල චිත්තයි. දුක්ඛවෙදනයි.

නවවන දුට්ඨුල්ලාරෝචන ශික්ෂාපදයයි.

——\\——

දසවන ශික්ෂාපදයෙහි '**ජාතා ච පඨවී අජාතා ච පඨවී**' යන මේ පදයන්ගෙන් ජාතපඨවියත් අජාතපඨවියත් දක්වන්නේය. '**අප්පපාසාණා**' යනාදීන් අතුරෙහි 'මදක් පාසාණ මෙහිනු'යි අප්පපාසාණයි. මෙසේ අර්ථය දතයුතුය. එහි මිට පමණින් මත්තෙහි වූ පාසාණයෝයි දතයුතුය. මිට පමණවූ ගල්කැට '**සක්ඛරා**' නම්වෙත්. '**කඨලා**' කැට කැබැලිති. '**මරුම්බා**' කැටගල් '**වාලිකා**' වැලිම්. '**යෙභුය්‍යෙන පංසු**' තුන් කොටසින් දෙකොටසක් පස්. එක් කොටසක් පාසාණාදීන් අතුරෙහි එක්තරා කොටසෙකි. '**අදඩ්ඪාපි**' උඳුන් පාපිදුම් කුඹල්වප් ආදීන්ගේ වසයෙන් ඒ ඒ පරිදි නොදැවුනු බිම. ඒ බිම වෙන්ව නැත්තීය. පිරිසිදු පස් ආදීන් අතුරෙහි එක්තරා බිමක්ම දතයුත්තීය. '**යෙභුය්‍යෙන සක්ඛරා**' ඉතා බොහෝවූ මිටපමණ ගල්කැට ඇති බිම. හස්තිකුක්ෂි ප්‍රදෙශයෙහි එක් පැසක් පුරවා ගෙන්වා දෙණක ලා සෝද පොළොවෙහි බොහෝ සෙයින් ගල්කැට ඇතිබව දැන භික්‍ෂූහු තුමූ පොකුණක් සෑරූහ. 'මජෙක්ඛ අප්පපංසු අප්පමත්තිකා'යි යම් දෙපදකෙනෙක් වෙත්ද, ඒ දෙපදයෝ බොහෝ සෙයින් පාසාණාදිපක්‍ෂකයටම ඇතුළත් වෙත්. ඒ දෙපදයන්ගේම මේ ප්‍රභෙද දැක්වීමය. '**සයං ඛනති ආපත්ති පාචිත්තියස්ස**' යන මෙහි පහරක් පහරක් පාසා පාචිත්තිය දතයුතුය. '**සකිං ආණත්තෙති බහුකම්පි ඛනෙතා**' මුළුදවස සාරාද, වරක් ඇණවූ මහණහුට එක්ම පාචිත්තියක් වේ. ඉදින් කුසීතවේද, නැවැත නැවැත ඇණවිය යුත්තේය. ඒ කුසීතයා අනවා සාරවන මහණහුට වචනයක් වචනයක් පාසා පාචිත්තිය වේ. මේ වනාහි පාලිවර්‍ණනා තොමෝය.

මේ වනාහි පාළිමුත්තකවිනිශ්චයයි පොකුණක් සාරව'යි කියාද, වටියි. කනිතලද්දීම පොක්ඛරණී නම්වේද, එහෙයින් මෙය කප්පිය ව්‍යවහාරය වේ. වැවක් තටාකයක් වළක් සාරව යනාදියෙහිද මේ නයවේ. මේ අවකාශය සාරව, මේ අවකාශයෙහි පොකුනක් සාරවයි කියනු නොවටියි. 'අල හාරව, මුල හාරව'යි නියම නොකොට කියනු වටියි. 'මේ වැල හාරව, මේ අවකාශයෙහි අලයක් හෝ මුලක් හෝ හාරවයි කීම නොවටියි. පොකුණ ශුද්ධ කරන්නවුන් විසින් යම් දිය මිශ්‍ර මඩක් කළවලින් ඉසින්නට හැක්කේ වේද, ඒ මඩ පහකරන්නට වටියි. ඝනවූ මඩ පහකිරීම නොවටියි. අව්වෙන් වියලුනු මඩ පැලීයයි. එහි යම් මඩක්යට පොළොව හා සම්බන්ධ නොවූයේද, ඒ මඩ පහකළ හැකිය. දිය ගලාගිය තැන රොන්මඩ වේ. හුළං පහරින් එය සැලෙන්නේය. එය බැහැර කිරීම වටියි. පොකුණු ආදීන්ගේ ඉවුර බිඳ ජලයෙහි හාත්පස වැටේද, ඉදින් සිවුමසට අඩුව වැස්සෙන් තෙමුනේද, සිඳ හැරීම හෝ බිඳහැරීම වටියි. සිවුමසට වැඩිකලක් තෙමුනේද සිඳහැරීම හා බිඳහැරීම නොවටියි. ඉදින් ජලයෙහිම වැටේද, සිවුමසට වැඩියක් වැසි වට කල්හිද ජලයෙහිම ජලය වැටුනු බැවින් සිඳීම හා බිඳීම කළ හැකිය. ගල්පිට ගල්පොකුණක් සාරත්ද, ඉදින් එහි පළමු කොටම සියුම් රජස් වැටේද, එය වැස්සෙන් තෙමුනේද, සිවුමස ඇවෑමෙන් අකප්පිය පඨවි සඞ්ඛ්‍යාවට යන්නේය. ජලය සිඳීගිය කල්හි ගල්පොකුණ ශුද්ධ කරන මහණුන් විසින් එය සිඳීම බිඳීම නොවටියි. ඉදින් පළමු කොටම ජලයෙන් පිරීයේද, ඉන් පසු රජස් වැටේද, එකල්හි ඒ රජස් සිඳබිඳ හැරීම සුදුසුය. එහි වැසි වස්නාකල්හිද ජලයෙහිම ජලය වැටේ'යි, ගලපිට සියුම් රජස් වේද, එය වැසි වැටෙන කල්හි ඇලීයේද, එද සිවුමසක ඇවෑමෙන් විකොපනය කිරීම නොවටියි. පරිභොග නොකළ ඉදිරියට නැවීසිටි පෙදෙසෙහි තුඹසක් නැගී සිටියේවේද, රුචිසේ විකොපනය කළ හැකිය. අභ්‍යවකාශයෙහි නගීද, සිවුමසට අඩුකලක් තෙමුනේම සිඳබිඳ හැරීම කළහැකිය. ගස්වැල් ආදියෙහි නැගුණු, වේතුඹස් ආදියෙහිද මේ නයමවේ. ගැඩවිල් මලමීයන් බල්ලන් නැගුපස ගවකුරෙන් නැගි මැටි යනාදියෙහිද මේ නයමවේ. ගොකණ්ටක නම් දෙනුන්ගේ කුරයෙන් සිදුනු මඩ'යි කියනු ලැබේ. ඉදින් යට පැත්තෙන් භූමිය හා සම්බන්ධ වේ නම් එක් දවසකුත් වැස්සෙන් සිඳීම බිඳීම නොවටියි. සීසෑතන්හිදු නගුලෙන් සිඳුනු මැටිපිඩ ගන්නා මහණහුට මේ නයමවේ. පැරණි සෙනසුනක්, සෙවිල්ලක් නැත්තේ හෝ වේද, නැසුනු පලය ඇත්තේ හෝ වේද, සිවු මසට වැඩිකලක් තෙමුනේ ජාතපඨවිසඞ්ඛ්‍යාවටම යන්නේය. එයින් සෙසු සෙවෙනි උළු හෝ පරාල ආදීවූ උපකරණයක් හෝ 'උළු ගණිමි, පරාල බිතුපා අතුළලැලි ගල්වැම්

ගණිම්'යි යන හැඟීමෙන් ගැණීම වටියි. ඒ පරාල ආදිය සමග මැටි ඇද වැටේද, ඇවැත් නොවේ. බිතුමැටි ගන්නා මහණහුට ඇවැත්වේ. ඉදින් යම් යම් මැටියක් නොතෙමුනීද, ඒ ඒ මැටි ගණිද ඇවැත් නොවේ. ගෙයතුළ මැටි ගොඩක් වේද, ඒ මැටිගොඩ එක් දවසක් තෙමුනු කල්හි ඒ ගෙය සෙවිලි කරත්ද, සියල්ල තෙමුනේ සිවුමස ඇවෑමෙන් ජාතපඨවියම වේ. මේ මැටිගොඩෙහි මතුභාගයම තෙමුනේ ඇතුළත නොතෙමුනේ යම්පමණ තෙමුනේද ඒ තෙමුණු මැටි කැප කරුවන් ලවා කැපවහරින් පහකරවා ඉතිරිය රුචිසේ පරිභොග කිරීම වටියි. අහස් දියෙන් තෙමී මැටි බිම හා ඒකාබද්ධ වීද ජාතපඨවියම වේ. අහස්දියෙන් නොතෙමී ඒකාබද්ධ නොවූ අන් මැටි ජාතපඨවිය නොවේ. අභ්‍යවකාශයෙහි මැටියෙන් කළ පවුරෙක්වේද, සිවුමසකට වැඩි කලක් තෙමුනේද ජාතපඨවිසඞ්ඛ්‍යාවට යන්නේය. එහි ඇලුනු පස් තෙත් අතින් පහසා ගත හැකිය. ඉදින් ගඩොලින් කළ පවුරෙක්වේද, එය බොහෝසෙයින් මිට පමණවූ කැබැලිති තන්හි සිටියි. එහෙයින් රිසිසේ විකොපනය කළ හැකිය. අභ්‍යවකාශයෙහි සිටුවා තුබූ මඩු ටැඹ ඔබ මොබ සොලොවා පෘථිවිය විකොපනය කරන්නහු විසින් ගැණීම නොවටියි. සෘජුවම ඉදිරීම දෙසෙක් නොවේ. අන් වියලිරුකක් හෝ වියලි කණුවක් හෝ ගන්නාවූ මහණහුට මෙම නය වේ. නවකර්මාන්ත පිණිස ටැඹක් හෝ ගලක් හෝ රුකක් හෝ දණ්ඩන් ඔසොවා පෙරළමින් යෙත්ද, එහි පොළොව බිඳීයේද, එහෙත් පොළොව නොබිඳිම්යි පිරිසිදු සිත් ඇත්තාහු පෙරළත්ද ඇවැත් නොවේ. නැවැත ඒ කරණකොට පොළොව බිඳිනු කැමැත්තාහුම වෙත්ද, ඇවැත්වේ. අතු ආදිය කඩන මහණුන්ටද පොළොවෙහිලා දැව පලන මහණුන්ටද මෙම නයය. පොළොවෙහි ගොමහිෂාදි ඇට ඉදිකටු රුක්කටු ආදීන් අතුරෙහි යම් කිසිවක් එක් කොණක් බිම ඇතුල් වනසේ තළන්නට හෝ ඇතුල් කරන්නට හෝ නොවටියි. මූත්‍ර ධාරාවේගයෙන් පොළොව බිඳින්නෙම්'යි මෙසේ සිතා මූත්‍ර කිරීමද වරද සහිතය. පොළොව සෑරෙන සේ මූත්‍ර කරන මහණහුට ඇවැත්වේ. විසමබිම සමකරන්නෙම්යි මුස්නෙන් ගැටීමද නොසුදුසුය. වත්හිසින්ම හැමන්ද යුතුය. සමහර කෙනෙක් සැරයටියෙන් බිම කොටත්ද, පා ඇඟිල්ලෙන් ඉරිගසත්ද, සක්මන් කළ තැන දක්වන්නෙමු'යි නැවැත නැවැත පොළොව බිඳිමින් සක්මන් කෙරෙත්ද, මේ සියල්ල නොවටනේය. වීර්‍ය්‍යයට රුකුල් දෙනු පිණිස ශ්‍රමණධර්මය කරන්නහු විසින් පිරිසිදු සිතින් සක්මන් කිරීමෙහි දෙසෙක් නැත්තේය. එසේ සක්මන් කරන්නහුට පොළොව බිඳී ගියේද, ඇවැත් නොවේ. 'අත සෝදන්නෙමි, පොළොවෙහි ගටත්ද, එද දෙස් සහිතය. අත පොළොවෙහි නොගටන්නහු විසින්, තෙත් අත පොළොවෙහි තබා රජස් ගෙණ අත

සේදීම වටියි. ඇතැම් කෙනෙක් කණ්ඩුකච්ඡු ආදියෙන් පීඩිතවූවාහු සිඳුනු තටාදියෙහි සිරුරු අවයව ගටත්ද එද දෙස් සහිතය.

**'ඛනති වා ඛනාපෙති වා'** යටත් පිරිසයින් පාඇහිල්ලෙනුදු, මුසුන් ඉරටකිනුදු තෙමේ හෝ සාරාද, අනිකකු ලවා හෝ සාරවාද, **'භිඤ්ජති වා භිඤ්ජාපෙතිවා'** යටත් පිරිසයින් ජලයද දමන්නේ තෙමේ හෝ බිඳීද, අනිකකු ලවාහෝ බින්දවාද, **'දහති වා දහාපෙති වා'** යටත් පිරිසයින් පාත්‍රයකුදු පුළුස්සනුයේ තෙමේ හෝ දවාද, අනිකකු ලවා හෝ දවවාද, යම් පමණ තැනෙක්හි ගිනි දෙන්නේ හෝ දෙවවන්නේ හෝ එපමණ පාචිත්තියාපත්තීහු වෙත්, පා පුළුස්සන්නහු විසින්, පෙර පිළිස්සූ තැනෙක්හිම පිළිස්සිය යුතුය. නොදැ පොළොවෙහි ගිනි තැබීම නොවටියි. පා පුළුස්සන කබල මතුයෙහි ගිනි තැබීමෙහි දෙසෙක් නැත්තේය. දැව මතුවෙහි ගිනි තබාද ඒ තැබූ ගින්න ඒ දැව දවමින් ගොස් පොළොව දවාද නොවටියි. ගඩොල්කබල් ආදියෙහිද මෙම නයයි. එහිදු ගඩොල් ආදීන්ගේම මතුපිට තැබීම වටියි. කුමක් හෙයින, යත්: ඔවුන් ගිනිගන්නා දර නොවන බැවිනි. ඒ ගඩොල් ගින්නගේ උපාදනසඞ්ඛ්‍යාවට හෙවත් දර ගණනට නොයත්. වියලිකණු වියලිරුක් ආදියෙහි ගිනි දීම නොවටියි. 'පොළොවට නොපැමිණියක්ම නිවා යන්නෙමි'යි දේනම් වටියි. නිවන්නට නොහැකි වන බැවින් පසුව නිවන්නට නොහැකිවේද, ඇවැත් නොවේ. තණහුලක් ගෙණ යන්නේ අත දවනුලබන කල්හි බිම හෙළාද, ඇවැත් නොවේ. වැටුනු තැනම දර දමා ගිනි දැල්වීම වටීය'යි මහාපච්චරියෙහි කියනලදී. දැවුනු පොළොවෙහිද යම් පමණ තැන උණුසුමෙන් යුක්තවේද, සියල්ල විකොපනය කිරීම වටීය'යි එහිම කියනලදී. නොදන්නාවූ යම් මහණෙක් තෙමේ ගිනිගානා දඬු සහිත යමකින් ගිනි උපදවා අතින් ඔසොවා **'කුමක්** කෙරෙම්දැ'යි විචාරාද, එකල්හි 'දල්වවයි, කිය යුතුය. 'අත දනුලැබේයයි කියා නම්, 'යම්සේ නොදැවේද, එසේ කරව'යි කිය යුතුය. 'බිම පොළව'යි නොකියයුතුය. අත දනුලබන කල්හි හෙළාද, 'පොළොව දවන්නෙමි' නොදැමූ බැවින් ඇවැත් නොවේ. වැටුනු තැන ගිනි දල්වීම වටීය'යි **කුරුන්දියෙහි** කියනලදී.

**'අනාපත්ති ඉමං ජානාති'** යනාදි තන්හි 'මේ ටැඹට වළක් දනුව, මහමැටිය දනුව, කටුමැටිය දනුව, මහමැටිය දෙව, කටුමැටිය දෙව, මැටි ගෙණ එව. පස් ගෙණ එව, මැටියෙන් ප්‍රයොජන ඇත්තේය. පසින් ප්‍රයොජන ඇත්තේය. මේ ටැඹට වළ කැප කරව, මේ මැටි කැප කරව, මේ පස් කැප කරව'යි මෙසේ අර්ථය දතයුත්තේය. **'අසඤ්චිච්ච'** ගල්රුක් ආදිය හෝ පෙරළන මහණහුටද, සැරයටියෙන් හෝ හපා යන මහණහුටද, පොළොව බිඳේද, 'එයින් පොළොව බිඳින්නෙම්'යි මෙසේ දැන සිතා

නොබින්ද බැවින් ඒ පොළොව නොදැන බිඳින ලද්දී නම්වේ. මෙසේ නොදැන බිඳින්නහුට ඇවැත් නොවේ. **'අසතියා'** අන්තන්හි යැවූ සිත් ඇත්තේ, කිසිවකු හා කිසිවක් කථා කරමින් පා ඇඟිල්ලෙන් හෝ සැරයටියෙන් පොළොවෙහි ඉරි අඳින්නහුටද, පොළොව බිඳින්නහුටද ඇවැත් නොවේ. ඇතුළුගෙයි වැසිදියෙන් තෙමුනු වැසුනු පොළොව අකප්පියපඨවි'යි නොදනියි. කැපපොළොව යන හැඟීමෙන් විකොපනය කරයි. සාරමි, බිඳිමි, දවමි'යි හෝ නොදනියි. හුදෙක් රැකීම පිණිස කුන්තානි ආදිය හෝ තබයි. දවතුලබන අත් ඇත්තේ හෝ ගිනි හෙළයි. මෙසේ නොදන්නහුට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන්ද, වාචාචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද උපදියි. ක්‍රියාසමුට්ඨානිකය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන පඨවිඛනනශික්ෂාපදයයි.

වර්ණනාක්‍රමයෙන් ප්‍රථම මුසාවාදවර්ගය සමාප්තය.

——\\——

සෙනාසනවර්ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි **'අනාදියන්තො'** ඒ දෙවඟනගේ වදන් නොගණිමින්. **'දරකස්ස බාහුං ආකොටෙසි'** ඔසොවනලද පොරොව දරන්නට නොහැක්කේ මිනිසුන්ගේ චක්ෂුර්විෂය ඉක්මවූ වෙසමුණු මහරජහු වෙතින් ලද රුකෙක පිහිටි දෙව්විමනෙක හොත් දරුගේ අත තනය මුලින්ම සින්දේය. **'න ඛො මෙතං පතිරූපං'** යනාදියෙහි මේ සඞ්ක්ෂිප්තවර්ණනා තොමෝ'ය. හිමවතෙහි පක්ෂදිනයන්හි දෙවතාසන්නිපාතයවේ. 'තී වෘක්ෂධර්මයෙහි සිටියාද, නොසිටියාදැ'යි එහි වෘක්ෂධර්මය විචාරත්. වෘක්ෂධර්ම නම්, රුක සිඳිනු ලබන කල්හි එහි රුක්දෙවියා විසින් සිත දූෂිත නොකිරීමය. එහි යම් දෙවතාවක් වෘක්ෂධර්මයෙහි නොසිටියා වේද, ඒ දෙවතා තොමෝ දෙවියන්ගේ රැස්වීමට පිවිසෙන්නට ඉඩ නොලබයි. මෙසේ ඒ දෙවතා තොමෝ වෘක්ෂධර්මයෙහි මේ අස්ථානප්‍රත්‍යයද ආදීනවයද දුටුවාය. භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහිද පෙර අසනලද ධර්මානුසාරයෙන් ෂද්දන්තාදි කාලයෙහි තථාගතයන් වහන්සේගේ පූර්වචරිතය සිහි කළාය. එහෙයින් මැයට 'න ඛො මෙතං පතිරූපං -පෙ- වොරොපෙය්‍යං'යි මෙබඳු සිතෙක් වූයේය. **'යන්නූනාහං භගවතො එතමත්ථං ආරොචෙය්‍යං'** මේ මහණ තෙමේ පියකු සහිත පුත්‍රයෙකි, එකාන්තයෙන් භාග්‍යවතුන්වහන්සේ මේ මහණහුගේ මේ අනාචාරය අසා සීමාබඳින සේක, ශික්ෂාපද පනවන

සේක'යි මෙසේ කල්පනා කරන්නාවූ මේ දෙව්දුවට මෙබඳු සිතෙක් වූයේය. **'සචජ්ජ ත්වං දෙවතෙ'** දෙවතාව' ඉදින් අද තී **'පසවෙය්‍යාසි'** උපදවන්නෙහිය මෙසේද වදරා භාග්‍යවතුන්වහන්සේ ඒ දෙව්දුවට හඟවමින්

'යො වෙ උප්පතිතං කොධං - රථං භන්තංව වාරයෙ,
තමහං සාරථිං බ්‍රෑමි - රස්මිග්ගාහො ඉතරො ජනො'

යමෙක්, උපන් ක්‍රොධය ඉතා වේගයෙන් දුවන රියක් මෙන් වළකාලන්නේද, මම ඔහු රියැසැරියි කියමි, අන්‍යවූ ජන තෙමේ රජ යුවරජ ආදීන්ගේ රිය රැහැණ පමණක් අතට ගත්තේය'යි කියමි, යන මේ ගාථාව වදාළ සේක. ගාථාවගේ කෙළවර ඒ දෙවතා තොමෝ සෝවාන් පෙළෙහි පිහිටියාය. නැවැත භාග්‍යවතුන් වහන්සේ පැමිණි පිරිසට දහම් දෙසන සේක්,

'යො වෙ උප්පතිතං විනෙති කොධං - විසටං සප්පවිසංව ඔසධෙහි,
සො භික්ඛු ජහාති ඔරපාරං - උරගො ජිණ්ණමිව තචං පුරාණං'

ක්ෂත්‍රියාදි කුලයෙන් පැවිදිවූ යම් මහණෙක් තෙමේ ඒකාන්තයෙන් සියසතන්හි උපන් ක්‍රොධය හා තෘෂ්ණාව සිරුර පැතිරගත් සර්පවිෂය බෙහෙදින් නසන්නාක් මෙන් දුරුකෙරේද, ඒ මහණ තෙමේ දැදුරුවූ පැරණි හැවය හරින්නාවූ සර්පයකු මෙන් ඔරපාර සඞ්ඛ්‍යාත ඔරම්භාගීය උද්ධම්භාගීය සංයොජනයන් හැරදමා'යි යන මේ ගාථාව වදාළ සේක. එහි ප්‍රථම ගාථා තොමෝ **ධම්මපදයෙහි** සඞ්ග්‍රහයට නගනලදී. ද්විතීය ගාථා තොමෝ **සුත්තනිපාතයෙහි** සඞ්ග්‍රහයට නගනලදී. වස්තුව වනාහි විනයයෙහිය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනසේක්ම ඒ දෙව්දුවට වසන්නට තිසි තැනක් ආවර්ජනය කරනසේක් සුදුසු තැනක් දැක, 'දෙවතාව' යව, අසුවල් අවකාශයෙහි පිහිටි වෘක්ෂය විවික්තය, එහි එළැඹෙව'යි වදාළ සේක. ඒ වෘක්ෂය වනාහි අලව්රටෙහි නොවේ. ජේතවනයෙහි පවුරතුළ වූයේය. යම් කිසි දිව්‍යපුත්‍රයකු විසින් අයත් කරගන්නා ලද්දේද, ඒ දිව්‍යපුත්‍ර තෙමේ ච්‍යුතව ගියේය. එහෙයින් විවික්තයි වදාළ සේක. එතැන් පටන් ඒ දෙවතා තොමෝ සම්මා සම්බුදුරජුන් වෙතින් ලැබූ පරිහාර ඇත්තී බුද්ධොපස්ථායිකාවක් වූය. යම් කලෙක දෙවියන්ගේ සමාගමය වේද, එකල්හි මහෙශාක්‍යදෙවතාවන් එන කල්හි අන්‍යවූ අල්පෙශාක්‍ය දෙවතාවෝ මහාසමුද්‍රචක්‍රවාල පර්වතය දක්වා ගොස් නවතිත්. මෝතොමෝ තමන් වසන තැන හිඳ බණ අසයි. ප්‍රථමයාමයෙහි මහණහු යම් ප්‍රශ්නයක් විචාරත්ද, මධ්‍යමයාමයෙහි දෙවතාවෝ ප්‍රශ්න විචාරත්ද, ඒ සියල්ල එහිම හිඳ අසයි. සිවු මහාරජහු පවා භාග්‍යවතුන් වහන්සේට උපස්ථානයට අවුත් යන්නාහු ඒ දෙව්දුව දැකම යන්නාහ.

'**භූතගාමපාතව්‍යතාය**' මෙහි වැඩෙත්, වැඩුනාහු 'භූත' නම්වෙත්. හටගණිත්, වැඩෙත්, හටගන්නාහු, වැඩුනාහු යන අර්ථයි. '**ගාමො**' සමූහය. භූත සංඥිතවූ තිල්පැහැති තෘණ වෘක්‍ෂලතාදීන්ගේ සමූහය 'භූතගාම' නම්. නොහොත් භූතසංඥිත තෘණවෘක්‍ෂලතාදීහුම සමූහ වූවාහු භූතගාම නම්වේ. පිහිටි තිල්පැහැති තණරුක් ආදීන්ට මේ නාමෙකි. සිඳිය බිඳිය යුතුබව '**පාතබ්‍යතා**'ය. සිඳීම් බිඳීම් ආදියෙන් රිසිසේ පරිභොග කටයුතුය යන අර්ථයි. ඒ තෘණවෘක්‍ෂලතාදීන්ගේ සිඳීම් ආදිය නිමිතිකොට නිමිත්තාර්ථයෙහි සප්තමීවචනයි. භූතගාමපාතබ්‍යතා හෙතුවෙන් භූතගාමයාගේ සිඳීම් ආදිප්‍රත්‍යයයෙන් පාචිත්තිය යන අර්ථයි. දැන් ඒ භූතගාමය බෙද දක්වන සේක්, '**භූතගාමො නාම පඤ්චබීජජාතානි**' යනාදිය වදළසේක. එහි '**භූතගාමො නාම**' භූතගාමය උදුරා. යමක් ඇති කල්හි භූතගාමය වේද. එය දක්වනු පිණිස 'පඤ්චබීජජාතානි' යනු වදළාහුය'යි අර්ථකථාවන්හි කියනලදී. මෙසේ ඇති කල්හිදු 'යානි වා පනඤ්ඤානිපි අත්ථි මූලෙ ජායන්ති' යනාදීහු සම නොවෙත්. මූලබීජාදීහු මුල් ආදියෙහි නොඋපදිත්. මුල් ආදියෙහි උපදින්නාහු වනාහි ඔවුහු බීජගත වෙත්. එහෙයින් මෙහි මෙසේ වර්ණනා තොමෝ දතයුත්තීය. '**භූතගාමො නාම**' යනු බෙදිය යුතු පදයයි. '**පඤ්ච**' යනු ඒ භූතගාමයාගේ විභාග පිරිසිඳීමය. '**බීජජාතානි**' යනු පිරිසිඳි ධර්මයන්ගේ දැක්වීමය. බීජයන්ගෙන් උපන්නාහු බීජ ජාතානි යනු එහි අර්ථයි. වෘක්‍ෂාදීන්ට මේ නමෙකි. මෙහි අන්‍ය ක්‍රමයෙක් වේ. 'බීජවූවාහුද ඔවුහුමය. උපන්නාහුද, ප්‍රසූත වූවාහුද, උපන් පත් මුල් ඇත්තාහුද ඔවුහුමනුයි බීජජාතානි නම් වෙත්. මෙයින් කෙත් වැලි ආදියෙහි තැබූ උපන් පත් මුල් ඇති ඉහුරු ආදීන්ගේ සඞ්ග්‍රහය කරනලද්දේවේ. දැන් යම් බීජයන්ගෙන් උපන් බැවින් වෘක්‍ෂාදීහු බීජජාතානියි කියනලද්දාහුද, ඒ බීජයන් දක්වන සේක් '**මූලබීජං**' යනාදිය වදළසේක. ඔවුන්ගේ උද්දෙසය ප්‍රකටමය. නිර්දේශයෙහි '**යානි වා පනඤ්ඤානිපි අත්ථි මූලෙ ජායන්ති මූලෙ සඤ්ජායන්ති**' යන මෙහි බීජයෙන් ඉපදීමෙන් බීජ යි දක්වනලදි. එහෙයින් මෙහි මෙසේ අර්ථ දතයුතුය. යම් අතිකුදු බීජජාතයෝ ඇත්තාහුද, ඕලු කෙකටිය රත්පියුම් උපුල් හෙලපියුම් හෙල්මැලි කොඳ පළොල් මුල් ආදි ප්‍රභෙද ඇති මූලෙහි ගස්වැල් රුක් ආදීහු හටගණිත්ද. උපදිත්ද, ඔවුහු යම් මුලෙක හටගණිත්ද නැවැත නැවැත උපදිත්ද, එද පෙළෙහි කියනලද කසා ආදියද යන මේ සියල්ල මූලබීජ නම්වේ. මූලම මූලබීජනම්. ඛන්ධබීජාදියෙහි ද මෙම නයයි. යම් ඛන්ධබීජයන්හි වනාහි මෙහි අඹරැල්ල ඉඳුසැල් උක් එරබදු කිණිහිරි ආදීහු ඛන්ධබීජනම් වෙත්. මුල් රහිතවූ වැල් සිවුරස් වැල් කනවේරිය යනාදීහු පුරුක් බීජයෝ නම් වෙත්. තියඳ සමන් බඳුවද යනාදීහු අග්‍රබීජයෝ නම් වෙත්. අඹ දං කොස් ඇට ආදීහු බීජබීජයෝ'යි දතයුත්තාහ.

දැන් 'භූතගාමපාතව්‍යතාය පාචිත්තිය' යි යමක් වදරනලදද, එහි සංඥවශයෙන් ආපත්ති අනාපත්තිභෙදයත් පාතබ්‍යතාභෙදයත් දක්වන සේක්, **'බීජෙ බීජසඤ්ඤී'** යනාදිය වදළසේක. එහි යම්සේ 'සාලීනම්පි වෙ ඔදනං භුඤ්ජති' යනාදි තන්හි හැල් සහල්බත හැල්බතයයි කියනුලැබේද, එසේ බීජයෙන් උපන් භූතගාමය බීජයයි කියනලද්දේයයි දතයුතුය. 'බීජගාමභූතගාම සමාරම්භා පටිවිරතො' යනාදි තන්හි වදළ භූතගාමයෙන් මිදීම කොට වෙන්කොට තැබූ යම් බීජයක් වේද, එය දුක්කට වස්තුවේ. තවද 'භූතගාමො'යි ශික්ෂාපදවිභඞ්ගයෙහි යම් මේ ආදිපදයෙක් වේද, එය සමග යොද යම් බීජයක් භූතගාම නම් වේද, ඒ භූතගාම නම්වූ බීජයෙහි බීජය යන හැඟීම් ඇතිව සැත් ආදිය ගෙණ තෙමේ හෝ සිඳීද, අනිකකුලවා හෝ සිඳවාද, ගල් ආදිය ගෙණ තෙමේ හෝ බිඳීද, අනිකකුලවා හෝ බිඳුවාද, ගිනි එක් කොට තෙමේ හෝ පිසාද, අනිකකුලවා හෝ පිසවාද පාචිත්තියාපත්තියට පැමිණීම වේයයි මෙසේ මෙහි අර්ථය දතයුතුය. පෙළ පරිදි ගෙණ භූතගාමයෙන් මිදී සිටි බීජයක් සිඳීම් ආදිභෙදවූ සිඳුම් බිඳුම් නිමිති කොට පාචිත්තිය නොකිය යුතුය. මේ මෙහි විනිශ්චය කථාය. භූතගාමය විකොපනය කරන මහණහුට පාචිත්තිය වේ. භූතගාමයෙන් මිදූ පස්වැදෑරුමුවූම බීජගාමය සිඳින බිඳින මහණහුට දුක්කටය වේ. මේ බීජගාම භූතගාමය තෙමේ ජලයෙහි සිටියේද ඇත්තේය. ගොඩබිම සිටියේද ඇත්තේය. එහි ජලයෙහි සිටියේ ඇබැට පමණවූ තල ඇට ඈ බේද ඇති පත්‍ර සහිතවූද පත්‍රරහිත වූද සියලු සෙවෙල් ජාති තොමෝ යටත් පිරිසයින් උදකපප්පටක නම් සෙවෙල් පටන් භූතගාමැයි දතයුතුය. උදකපප්පටකය මතුවෙහි තදවූයේ රළු පැහැ ඇතියේ යට මොළොක් වූයේ තිල්පැහැතියේ වේ. එහි යම් සෙවෙලක මුල් යටට බැස පොළොවෙහි පිහිටියේද ඒ සෙවෙලට පොළොව ස්ථාන වේ. යම් සෙවෙලක් ජලය මතුවෙහි පාවේද, ඒ සෙවෙලට ජලය ස්ථානවේ. පොළොවෙහි පිහිටියක් මුල මැද අග යන යම් කිසි තැනෙක්හි සිඳින බිඳින මහණහුටද. උදුරා හෝ අන්තැනකට පමුණුවන මහණහුටද පාචිත්තියවේ. ජලයෙහි හැසිරෙන්නක් සිඳින බිඳින මහණහටද පාචිත්තිය වේ. අතින් දියෙන් නොමුද එහා මෙහා ඉවත්කොට ස්නානය කිරීම වටියි. සියලුම ජලය, ජලයෙහි හැසිරෙන සෙවෙලව ස්ථානවේ. එහෙයින් ඒ සෙවෙල මෙපමණකින් තුබූ තැනින් පහකරනලද්දේ නොවේ. ජලයෙන් ජලය හැර දැන ඔසොවන්නට නොවටියි. ජලය සමග ඔසොවා නැවැත ජලයෙහි බැහීම වටියි. පෙරහන අතරින් නික්මේද, කැප කරවාම පැන් පරිභොග කටයුතුය. උප්පලපදුම්නී ආදීවූ ජලයෙහි හටගත් වැල් තණ දියෙන් උදුරන මහණහුටද. එහිම සිඳින බිඳින මහණහුටද පාචිත්තියවේ. අනුන් විසින්

උදුරා ගන්නාලද්දවුන් සිඳින බිඳින මහණහුට දුක්කටයවේ. ඒ දියෙහි හටගත්තාහු භූතගාමයෙන් වෙන්වූ බැවින් බීජගාමයෙහි සඞ්ග්‍රහයට යන්නාහ. තලැට අබැට පමණවූ සෙවෙලද දියෙන් නගනලද්දේ නොමැලවුනේ අග්‍රබීජසඞ්ග්‍රහයට යන්නේය. **මහාපච්චරී** ආදියෙහි කෙළවරක් නැති තල ඇට රොන්මඩ වියලිකබල් ආදීහු දුක්කටවස්තූහුය'යි කියනලදී. එහි කරුණක් නොදක්නාලැබේ. අන්ධකාත්ථකථාවෙහි සම්පූර්ණභූතගාමය නොවේද එහෙයින් දුක්කටයි කියනලදී. එද සම නොවේ. භූතගාමයෙහි පාචිත්තිය, භූතගාමයෙහි දුක්කටයි කියනලදී. මුල්පත් ආදියෙන් සම්පූර්ණ නොවූ බැවින් භූතගාමය නම් එහි තෙවන කොටසැයි. පෙළෙහි නොම ආයේය. අත්ථකථාවන්හි නොආයේය. එකල්හි එය බීජගාම සඞ්ග්‍රහයට යන්නේද, එද යුතුනොවේ. එබඳු බීජගාමය තමා භූතගාමය මුල් කොට කරුණක් නැති බැවිනි. අතිකුදු ඇත්තේය. ගරුකලහුකයන් අතුරෙහි ගරුකයෙහි සිටියයුතුය යනු මේ විනය ලක්ෂණයයි. ගොඩබිම පිහිටි සිඳදැමූ වෘක්ෂයන්ගෙන් ඉතිරිවූයේ තිල් කණුවක් නම්වේ. එහි කුඹුක් කරඳ පුවඟු කොස් ආදීන්ගේ කණුව උඩට වැඩේ. ඒ කණුව භූතගාමයෙන් සඞ්ග්‍රහ කරනලද්දේය. තල්, පොල් ආදීන්ගේ කණුව උඩට නොවැඩේ. ඒ කණුව බීජගාමයෙන් සඞ්ග්‍රහ කරනලද්දේය. නොපීදුනු කෙහෙල් ගසෙහි කඳ භූතගාමයෙන් සඞ්ග්‍රහ කරනලද්දේය. පීදුනු ගසෙහි කඳ බීජගාමයෙන් සඞ්ග්‍රහකරනු ලැබේ. පීදුනු කෙහෙල්ගස යම්තාක් තිල්පත් ඇත්තීද, ඒතාක් භූතගාමයෙන්ම සඞ්ග්‍රහ කරනලද්දීය. එසේ පීදුනු උණගස යම් කලෙක අග පටන් වියලේද, එකල්හි බීජගාමයෙන් සඞ්ග්‍රහයට යන්නේය. කවර බීජගාම සඞ්ග්‍රහයකටයේද, පුරුක් බීජසඞ්ග්‍රහයෙන් සඞ්ග්‍රහයට යන්නේය. එයින් කුමක් උපදීද, කිසිවක් නොඋපදී. ඉදින් උපදින්නේ නම් භූතගාමයෙන් සඞ්ග්‍රහයට යන්නේය. ඉඳුසල්ආදි රුක් සිඳ රැස් කෙරෙත්ද, රැස් කළ දඬුවලින් රියනක් පමණවූද ශාඛා නික්මෙත්ද, බීජගාමයෙන්ම සඞ්ග්‍රහයට යෙත්. මණ්ඩපයක් පිණිස හෝ වැටක් පිණිස හෝ වැල් ආරොපණය පිණිස හෝ බිම කැන සිටුවත්ද, මුල්ද පත්‍රද නික්මුනු කල්හි භූතගාම සඞ්ඛ්‍යාවට යෙත්. මුල් පමණක් හෝ කොළපමණක් හෝ නික්මුනු කල්හි, බීජගාමයෙහි සඞ්ග්‍රහයෙහි සඞ්ග්‍රහකරන ලද්දහුමය. යම්කිසි බීජ කෙනෙක් පොළොවෙහි හෝ දිය ඉස තබන ලද්දහුද කබල් ආදියෙහි හෝ තෙත් පස් දමා තබන ලද්දහුවෙත්ද, ඒ සියල්ලෝ මුල් පමණක් හෝ කොළපමණක් හෝ නික්මුණු කල්හි බීජයෝම වෙත්. ඉදින් මුල් හා මත්තෙහි අඞ්කුරය නික්මේද, ඒ අඞ්කුරය යම්තාක් තිල් පැහැත්තේ නොවූයේද, ඒතාක් බීජයෝම වෙති. මුං ආදීන්ගේ කොළ හටගත් කල්හි වී ආදීන්ගේ අඞ්කුරය තිල්වත් වූ කල්හි තිල්

කොළ පැහැති වූ කල්හි භූතගාමසඞ්ග්‍රහයට යන්නේය. තල් ඇටවල පළමු කොට ඌරුදළ මෙන් මුලක් නික්මෙන්නේය. නික්මුනු කල්හිද යම්තාක් මත්තෙහි ගොබය නොනික්මේද, ඒතාක් බීජගාමයමවේ. පොල්කටුව බිඳගෙණ දත්මුවා හිද්දක් මෙන් අඞ්කුරය නික්මේද, යම්තාක් මුවඅත් සමාන තිල්පත්වැටිය නොවේද, ඒතාක් බීජගාමයම වේ. මුල් නොනික්මුනු කල්හිද, එබඳු පත්වැටිය හටගත් කල්හි මුල් රහිත භූතගාමසඞ්ග්‍රයට යන්නේය. අඹ ඇට ආදීහු වී ආදීන් හා විනිශ්චය කටයුත්තාහුය. ඉටිකෙහෙල් (පිළිල) හෝ අන්‍ය වූ යම්කිසිවක් රුකෙහි හටගෙණ රුක් යට කෙරේද, රුකම එයට ස්ථානවේ. එය විකොපනය කරන මහණුහුට හෝ උදුරන මහණුහුට හෝ පාචිත්තිය වේ. මුල් නැති එක් වැලක් වේ. ඇහිලි මුද්දක් මෙන් වනපදුරුදඩු වෙළා ගණීද, මේ වැලෙහිද මෙම විනිශ්චය වේ. ගෙයිපවුරු පිල්කඩ සෑ ආදී තන්හි තිල් පැහැති සෙවෙලක් වේද, එහි යම් තාක් කොළ දෙක තුනක් නොහටගණීද, ඒතාක් අග්‍රබීජසඞ්ඛ්‍යාවට යන්නේය. කොළ හටගත් කල්හි පාචිත්තිය වස්තුවේ. එහෙයින් එබඳු තන්හි හුණු ආලෙප කිරීම නොවටියි. අනුපසම්පන්නයකු විසින් කළ ආලෙපය මතුවෙහි සොහාලෙපය දීම වටියි. ඉදින් නියන් කාලයෙහි වියලුණු සෙවෙලෙක් රඳ සිටී නම්, ඒ සෙවෙල් මුසුන් ආදියෙන් උලා පහකිරීම වටියි. පැන් කළ ආදියෙහි පිටත තුබූ සෙවෙල් දුක්කට වස්තු වේ. ඇතුළත තුබූ සෙවෙල් ව්‍යවහාරයට නොයන්නේය. දැහැටි පූ ආදියෙහි පුස්ද වහරට නොයන්නේමය. 'ඉදින් සුවන්ගුරුයෙන් පිරිබඩ කළ බිත්තිය පුස් වැකුනීවේද, රෙදිකඩක් තෙමා පොළා පිරිමැදිය යුත්තීය'යි මෙය වදරනලද්දේමය. ගල්දෑ ගල්දද ගල් සෙවෙල ගලෙහි හටගත් සුවඳ දෑ ආදීහු තිල්වන් නොවූවාහු කොළ රහිත වූවාහු දුක්කට වස්තුවෙත්. නයිහතු යම්තාක් කැකුළවේද, ඒතාක් දුක්කට වස්තුවේ. පිපුනු කල පටන් අව්‍යවහාරිකවේ. තෙත් රුකෙකින් නයිහත්තක් ගන්නේ රුක්සිවිය විකොපනය කෙරේද, එහෙයින් එහා පාචිත්තියවේ. රුක් පතුරෙහිද මෙම නයවේ. ඉඳුසල් කුඹුක් ආදීන්ගේ පතුර රුකින් වෙන්වී ගැලවී සිටුනේද, ඒ පතුර ගන්නා මහණුහුට ඇවැත් නොවේ. මැලියම්ද රුකින් මිදී සිටියේ වියලි රුකෙහි හෝ ඇලුනේද එය ගැණීම වටියි. තෙත් රුකෙන් ගැණීම නොවටියි. අත්තෙහිද මෙම නයවේ. රුක සොලොවා පඩුවන් කොළ හෝ මූකළ කිණිහිරි ආදි මල් හෝ සොලොවා හෙලන මහණුහුට පාචිත්තිය වේමය. අතෙහි අසංයමයෙන් මොලොක් වූ ඉඳුසල් උක් කඳන් ආදියෙහි හෝ එහි හටගත් තල්පත් ආදියෙහි හෝ අකුරුලියන මහණුහුටද මෙම නයවේ. හෙවත් පාචිත්තිය වේ. මල් නෙලන හෙරණුන්ට අත්ත නමාදීම වටියි. ඒ

මල්වලින් තමන් සඳහා පැන්සුවඳ නොගැන්විය යුතුය. පැන් සුවඳගන්වනු කැමැත්තහු විසින් හෙරණකු ඔසොවා හෙලවිය යුතුය. ගෙඩි ඇති අතුද තමා කනු කැමැත්තහු විසින් නොනැමිය යුතුය. හෙරණකු ඔසොවා ගෙඩි ගැන්විය යුතුය. යම්කිසි ගසක් හෝ වැලක් හෝ උපුටන්නහු විසින් හෙරණුන් සමග ගෙණ ඇදීම වරද සහිතය. ඔවුන්ට උත්සාහය උපදිනු පිණිස නොඅදින්නහු විසින් අදින ආකාරය දක්වන්නක්හු විසින් මෙන් රැහණ අගින් අල්ලාගැණීම නිවරදය. යම් වෘක්ෂයන්ගේ අතු පැලවේද ඒ ගස් අතු මැස්සන් පැන්නීම පිණිස කැප නොකරවා ගන්නාලද්දහු සිවියෙහි හෝ කොළයෙහි හෝ යටත් පිරිසයින් තියෙන්ද ඉරිගසන මහණහුට දුක්කටයවේ. තෙත් ඉහුරු ආදියෙහිද මෙම නයවේ. ඉදින් කැප කරවා සීතල පෙදෙසෙක්හි තබන ලද්දහුගේ මුල හටගණීද, මතු කොටසෙහි සිඳ හැරීම නිවරදය. ඉදින් අඞකුරය නගීනම් යටකොටසෙහි සිඳීමද නිවරදය. මුල්ද නිල්පැහැති අඞකුරද හටගත් කල්හි සිඳීම වරදසහිතය.

'**ඡින්දති වා ඡේදාපෙති වා**' යටත් පිරිසයින් මුදුන් ඉරටෙන් නමුදු තණ සිඳින්නෙමි'යි බිම හැමදිනුයේ තෙමේ හෝ සිඳියි. අනිකකු ලවා හෝ සිඳවයි. '**භින්දති වා භේදාපෙති වා**' යටත් පිරිසයින් සක්මන් කරන්නේ 'සිඳෙන්නක් සිඳේවා බිඳෙන්නක් බිඳේවා සක්මන් කළ තැන දක්වන්නෙමි'යි සිතා පයින් පාගන්නේ තණවැල් ආදිය තෙමේ බිඳියි හෝ අනිකකු ලවා බිඳුවා හෝ මෙහි පාචිත්තියයි දන්නේය. ඉදින් තණගසක් හෝ වැලක් හෝ ගැටගසන කල්හි බිඳේ නම් ගැටද ගැසීම නොවටියි. තල්රුක් ආදියෙහි සොරුන්ගේ නොනැගීම පිණිස දැවමුවා වඳුරු රුවක් තබත්. කටු බඳිත්. මහණහුට මෙසේ කිරීම නොසුදුසුය. දැවමුවා වඳුරු රුකෙහි ඇලුනු පමණක්ම වේද, රුක නොපෙළාද වටියි. 'රුක සිඳුව, වැල සිඳුව, අලයක් හෝ මුලක් හෝ උදුරව'යි නියම නොකළ බැවින් කීම නිවරදය. නියම කොට 'මේ රුක සිඳුව, යනාදිය කීම සුදුසු නොවේ. නම ගෙණද 'අඹරුක, සිවුරස්වැල, ඕලුඅල, මුදුතණ, අසුවල් රුක, පතුර සිඳුව, බිඳුව, උදුරව, යනාදි වචනද නියම නොකරනලද්දේම වේ. 'මේ අඹරුක, යනාදි වචනම නියම කරනලද්දේ නම් වේ. ඒ නොවටියි. '**පචති වා පචාපෙති වා**' යටත් පිරිසයින් පාත්‍රයකුදු පුළුස්සනු කැමැත්තේ තණකොළ ආදීන්ගේ මතුවෙහි දැන සිතා ගිනි දල්වන්නේ තෙමේ හෝ පිසයි. අනිකකු ලවා හෝ පිසවයි යන සියල්ල පඨවි ඛනන ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය. නියම නොකොට වනාහි 'මුං ඇට පිසව, මැඇට පිසව යනාදිය කීම වටියි. 'මේ මුං ඇට පිසව, මේ මැඇට පිසව, මෙසේ කීම නොවටියි. '**අනාපත්ති ඉමං ජාන**' යනාදිතන්හි 'මේ

මුල් බෙහෙත දනුව, මේ මුල හෝ කොළය හෝ දෙව, මේ රුක හෝ වැල හෝ ගෙණෙව, මේ මලින් හෝ ගෙඩියෙන් හෝ කොළයෙන් වැඩෙක් ඇත්තේය, මේ රුක හෝ වැල හෝ ගෙඩිය හෝ කැප කරව'යි මෙසේ අර්ථ දතයුත්තේය. මෙපමණකින් භූතගාමයාගේ මිදීම කරනලද්දේ වේ. වළඳන්නහු විසින් බීජගාම මුක්තිය පිණිස නැවැත කැප කරවිය යුතුය.

මෙහි කැපකිරීම මේ සූත්‍රානුසාරයෙන් දතයුතුය. 'අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං අග්ගිපරිචිතං සත්ථපරිචිතං නඛපරිචිතං අබීජං නිබ්බට්ටබීජමෙව පඤ්චමං' යන ඒ සූත්‍රයයි. එහි '**අග්ගිපරිචිතං**' ගින්නෙන් පැසවනලද්දය. මඩනා ලද්දය. දනලද්දය. පහස්නාලද්දය යන අර්ථයි. '**සත්ථපරිචිතං**' ශස්ත්‍රයෙන් පහරනලද්දය. මඩනාලද්දය. සිඳිනලද්දය. විඳින ලද්දේ හෝය යන අර්ථයි. **නඛපරිචිතයෙහි** මේ ක්‍රමය වේ. '**අබීජනිබ්බට්ටබීජානි**' ඇට නැති නොපැසුනු අඹ පැල ඇ පල හා මඳුලෙන් ඇට පහකළ හැකි කොස් ඇ පල තුමූම කැප වෙත්. ගින්නෙන් කැප කරන්නහු විසින් කාෂ්ඨාග්නිගොමයාග්නි ආදීන් අතුරෙහි යම් 'කිසිවකින් යටත් පිරිසයින් රත්කළ ලොහොකඩකින් නමුදු කැප කළයුතුය. ඒ කැප කිරීමද එක් දෙසෙක පහසන්නහු විසින් 'කප්පියං'යි කියාම කටයුතුය. ශස්ත්‍රයෙන් කැප කරන්නහු විසින් යම් කිසි ලොහොමුවා සැතක හෝ යටත් පිරිසයින් හිදි නිය කටු ආදීන්ගේ හෝ තුඩින් හෝ මුවාතින් හෝ සිදීමක් හෝ විදීමක් හෝ දක්වන්නහු "කප්පියං"යි කියාම කටයුතුය. නියෙන් කැප කරන්නහු විසින් කුණුවූ නියෙන් නොකටයුතුය. මිනිසුන්ගේද, සී වග දිවි වඳුරු ආදීන්ගේද, පක්ෂීන්ගේද නිය තියුණුය. ඒ නියෙන් කටයුතුය. අශ්ව මහීෂ සූකර මෘග ගොරුපාදීන්ගේ කුර නොතියුණුය. ඒ කුරවලින් නොකටයුතුය. කරනලද්දේද නොකරනලද්දේවේ. ඇත් නිය වනාහි කුර නොවේ. ඒ ඇත්නියෙන් කිරීම වරද නොවේ. යමකින් කප්පියං කිරීම වටීද, එහි උපන් එයින්ද උදුරා ගත් යමකින් නමුත් සිදීම හෝ විදීම හෝ දක්වන්නහු විසින් කප්පියං යි කියාම කටයුතුය. එහි ඉදින් බීජයන්ගේ කන්දක් පමණ රැසෙක් වේද, රුක්දහසක් හෝ සිඳ එකාබද්ධ කොට උක් ගස් වලින් හෝ මහත් බරක් බැඳ තබන ලද්දේ වේද, එක් බීජයක් හෝ ගස් අත්තක් හෝ උක්ගසක් හෝ කැප කළ කල්හි සියල්ල කැප කරනලද්දේවේ. උක්ද දැවද එකට බඳිනලද්දහු වෙත්ද, එකල්හි 'උක් කැප කරන්නෙමි'යි දැව විදීද, ඒ නිවරදය. ඉදින් රැහණකින් හෝ වැලකින් හෝ බඳින ලද්දහු, ඒ විදීනම් එය සුදුසු නොවේ. උක් කැබලිවලින් පැසක් පුරවා ගෙණ එත්ද, එක් කැබල්ලක් කැප කළ කල්හි සියල්ල කැප කරනලද්දේම

වේ. මිරිස්පක් ආදියෙන් මිශ්‍ර කොට බත් ගෙණ එත්ද, 'කැප කරව'යි කියූ කල්හි බත්උලු විදී නම් එද වරදෙක් නොවේ. තලසහල් ආදියෙහිද මෙම නයයි. කැදෙහිලූ මිරිස්පත් ආදීහු එකට බැදී නොසිටිත්ද, එහි එකක් එකක් විද කැප කටයුතුමය. ගිවුල්පල ආදීන්ගේ කටුව බිඳහැර ඇතුළත මදුල හැසිරේද, බිඳුවා කැප කරවිය යුතුය. එකට බැද සිටියේ නම් කටුවෙහිද කැප කිරීම වටියි.

'අසඤ්චිච්ච' ගල්ගස් ආදියක් හෝ පෙරළන කල්හි අත්තක් හෝ අදින කල්හි සැරයටියෙන් හෝ පොළොව පැහැර යන කල්හි තණ සිඳේද, ඒ තණ ඔහු විසින් 'සිඳින්නෙමි'යි මෙසේ සිතා නොසිඳි බැවින් නොසිතා නොදැන සිඳුනේ නම්වේ. මෙසේ නොසිතා සිඳින මහණහුට ඇවැත් නොවේ. 'අසතියා' අන්‍යවිහිත වූයේ කිසිවකු සමග කිසිවක් කියනුයේ පය ඇඟිල්ලෙන් හෝ අතින් හෝ තණ කොළයක් හෝ වැලක් හෝ සිඳිමින් සිටීද, මෙසේ නොසිහියෙන් සිඳින මහණහුට ඇවැත් නොවේ. 'අජානන්තස්ස' මෙහි තුළ බීජගාමැයි හෝ භූතගාමැයි හෝ නොදනී, සිඳිමියිද නොදනී. හුදෙක් තණහස්සෙහි හෝ පිදුරුගොඩෙක හෝ බිම කනින හුලක් හෝ උදැල්ලක් හෝ ආරක්ෂාව පිණිස තබාද, දැවෙන අත් ඇත්තේ හෝ ගිනි හෙළාද එහි තණ සිඳීයේද, දැවේද ඇවැත් නොවේ. මනුෂ්‍යවිග්‍රහපාරාජිකා වර්ණනාවෙහිද සියලු අට්ඨකථාවන්හිද 'ඉඳින් මහණෙක් තෙමේ ගසකට හෝ යටවූයේද, වළෙක හෝ වැටුනේද, එකල්හි ඒ ගස හෝ සිඳදමා පොළොව හෝ කැන නික්මෙන්නට හැකිවේද, ජීවිතය හෙතු කොට ගෙණද, තමන් විසින් එය නොකටයුතුය. අන් මහණකු විසින් පොළොව හෝ කැන රුක හෝ සිඳ නෙත් රුකකින් දණ්ඩක් කඩාගෙණ ඒ ගස බැහැරට පෙරළා නික්ම වන්නට වටියි. එහි ඇවැත් නොවේය'යි වදරන ලද්දේය. එහි කරුණෙක් නොදක්නා ලැබේ. 'මහණෙනි' ලැවු ගින්නෙන් දනු ලබන කල්හි ගිනි නවතාලන ගිනි දීම ආරක්ෂා කිරීම අනුදනිමි'යි යන මේ එක්ම සූත්‍රයෙක් දක්නා ලැබේ. 'තමාට නොවටියි, අන්හට වටියි, යනු මෙයට අනුලොම් වේ නම්, මේ නානාකරණය ලබනු නොහැක්කේය. තමන් පිණිස කරන්නේ ආත්ම සෙනහයෙන් අකුශල චිත්තයෙන්ම කරන්නේය. අන්‍යයා කරුණාවෙන් කරන්නේය. එහෙයින් අනාපත්තිද, යත්: මෙද කරුණු රහිතය. කුසල චිත්තයෙන්ද මේ ඇවැතට පැමිණේ. සියලු අට්ඨකථා වන්හි කියූ බැවින් වළකාලන්නට නොහැක්කේය. මෙහි යුක්තිය සෙවිය යුතුය. අට්ඨකථාචාර්‍ය්‍යයන්ගේ හෝ වාදය ඇදහීමෙන් යා යුතුය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානිකය.

සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

ප්‍රථම භූතගාම ශික්ෂාපදයයි

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි **'අනාචාරං ආචරිත්වා'** නොකොටයුතු කොට කාය වාග්ද්වාරයන්හි ඇවැතට පැමිණෑ යි වදරන ලද්දේවේ. **'අඤ්ඤෙනඤ්ඤං පටිචරති'** අනික් වචනයකින් අනික් වචනයක් වසයි. යටපත් කරයි. දැන් ඒ ප්‍රතිච්ඡාදනවිධිය දක්වන සේක්. **'කො ආපන්නො'** යනාදිය වදළ සේක. එහි මේ වචනසම්බන්ධයයි. ඒ ජන්තාසථවිර තෙමේ කිසි ව්‍යතික්‍රමයක් දැක 'ඇවැත' ඇවැතට පැමිණියෙහිද'යි සහ මැදදී ඇවතින් චොදනා කරනු ලබන්නේ 'කවරෙක් පැමිණියේදැයි කියයි. ඉන්පසු 'තෝ'යි කියනලද්දෙහි, 'මම කුමකට පැමිණියෙම්දැ'යි කියයි. නැවැත 'පාචිත්තියට හො දුක්කටයට හෝ, යි කියනලද්දෙහි, වස්තුව විචාරන්නෙහි 'මම කිනම් වස්තුවෙහි'යි කියනලද්දෙහි, 'මම කෙසේ පැමිණියෙම්ද, කුමක් කරන්නෙම් පැමිණියෙම්දැ'යි විචාරයි. එකල්හි 'මෙනම් කරන්නෙහි පැමිණියෙහි'යි කියනලද්දෙහි 'කවරකුට කියහුදැ'යි කියයි. ඉන්පසු 'ඔහුට කියමු'යි කියනලද්දෙහි 'කුමක් කියහුදැ'යි කියයි. අනිකෙකුදු ඇත්තේය. මෙහි මේ පෙළින් මිදුනු අනික වචනයකින් අනික් වචනයක් වසාලන විධියයි මහණුන් විසින් තාගේ පසුම්බියෙහි කහවණුවෙක් දක්නාලද්දේය. කුමක් හෙයින් මෙසේ නොසුදුස්සක් කෙරෙහි දැ'යි කියනලද්දෙහි 'ස්වාමීනි' දක්නා ලද්දේ මැනැවැ, මෙය කහවණුවෙක් නොවේ. මේ ඊයම් ගුළියෙකැ'යි කියන්නේ හෝ 'තෝ සුරා බොන්නේ දක්නා ලද්දෙහිය, කුමක් හෙයින් මෙසේ නොසුදුස්සක් කෙරෙහිදැ'යි කියන ලද්දෙහි, 'ස්වාමීනි' දක්නාලද්දේ මැනැවැ, මේ සුරා නොවේ, බෙහෙත් පිණිස සපයනලද අරිෂ්ටයෙකැ'යි කියන්නේ හෝ 'තෝ ප්‍රතිච්ඡන්න ආසනයෙක්හි මාගමක සමග හුන්නෙහි දක්නා ලද්දෙහිය, කුමක් යේන් මෙසේ නොසුදුස්සක් කෙරෙහිදැ'යි කියන ලද්දෙහි 'යමකු විසින් දක්නාලද්දේ මනාකොට දක්නාලද්දේය. මෙහි නුවණැති දෙවැන්නෙක් ඇත්තේය, කුමක් හෙයින් හෙතෙමේ නොදක්නා ලද්දේදැ'යි කියන්නේ හෝ 'තාවිසින් මෙබඳු වූ කිසිවක් දක්නාලද්දේදැ'යි විචාරණලද්දෙහි, 'නොඅසමි'යි කණ එළවන්නේ හෝ, ශ්‍රොත ද්වාරයෙහි විචාරන්නන්ට ඇස එළවන්නේ හෝ අනික් වචනයකින් අනික් වචනයක් වසාලන්නේයයි දතයුතුය.

**'අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං'** මෙහි අනිකක් කියාතුයි 'අඤ්ඤවාදක' නම්. අනික් වචනයකින් අනික් වචනයක් වසන්නහුට මේ නමකි. වෙහෙසාතුයි 'විහෙසක' නම්. නොබණින්නහුට මේ නමකි. ඒ අන්‍යවාදකය නිමිති කොටද නොබිණීම නිමිති කොටද **'පාචිත්තියං'**යි වස්තු දෙක නිමිති කොට පාචිත්තිය දෙකක් වදරන ලදී. **'අඤ්ඤවාදකං රොපෙතු'** අන්‍යවාදකත්වය ආරෝපණය කෙරේවා. ඥප්තිද්විතීය කර්මයෙන් පිහිටුවාවා යන අර්ථයි. **'විහෙසකං රොපෙතු'** මෙහිද මෙම නයවේ. **'ආරොපිතෙ අඤ්ඤවාදකෙ'** කර්මවාක්‍යයෙන් අන්‍යවාදකය ආරෝපණය නොකළ කල්හි අන්‍යවාදකයෙහි පාචිත්තිය වේ. **'ආරොපිතෙ විහෙසකෙ'** යන මෙහිද මෙම නය වේ. **'ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී'** යනාදියෙහි යම් ඒ අන්‍යවාදකවිහෙසකාරොපණකර්මය කරනලද්දේද, එය ධර්මකර්මය වේනම් ඒ මහණතෙමේ එහි ධර්මකර්ම යන හැඟීම් ඇත්තේ අන්‍යවාදකත්වය හා විහෙසකත්වය කෙරේද, එසේ ඇති කල්හි මේ මහණහුට ඒ අන්‍යවාදකත්වය නිමිති කොටද, විහෙසකත්වය නිමිති කොටද පාචිත්තියාපත්තිය වන්නීය යි යන මේ නයින් අර්ථ දතයුත්තේය. **'අජානන්තො පුච්ඡති'** ඇවැත හෝ ඇවැතට පැමිණිබව හෝ නොදන්නේම 'තෙපි කුමක් බෙණෙවුද, මම නොදනිම්'යි විචාරාද, එහි ඇවැත් නොවේ. **'ගිලානො වා න කථෙති'** යම් ව්‍යාධියක් කරණ කොට කියන්නට නොහැක්කේද, මුඛයෙහි එබඳු ව්‍යාධියෙක් වේද, එකල්හි නොකියන්නහුට ඇවැත් නොවේ. **'සඞ්ඝස්ස භණ්ඩනං වා'** යනාදි තන්හි සඟමැදදී කියූ කල්හි ඒ හේතුවෙන් සඞ්ඝයාගේ දබරයෙක් හෝ -පෙ- විවාදයෙක් හෝ නොවන්නේද, ඒ භණ්ඩනාදිය නොවේවා යි හඟිමින් නොකියාද එහිද ඇවැත් නොවේ යන මේ නයින් අර්ථ දතයුතුය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. කිසි කලෙක ක්‍රියා සමුත්ථානිකය. කිසි කලෙක අක්‍රියසමුත්ථානිකය. අනික් වචනයකින් අනික් වචනයක් වසාලන මහණහුට ක්‍රියාසමුත්ථාන වේ. තුෂ්ණීම්භාවයෙන් වෙහෙසන මහණහුට අක්‍රියාසමුත්ථානවේ. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

ද්විතීය අඤ්ඤවාදකශික්ෂාපදයයි

—\\—

තෘතීයශික්ෂාපදයෙහි - **'දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙන්ති'** 'ඡන්දාය දබ්බො මල්ලපුත්තො' යනාදිය කියන්නෝ ඒ ආයුෂ්මත්හට ඒ භික්ෂූන් ලවා අවමන් කරවත්. අවඥාවෙන් බලවත්. ලාමක වසයෙන් හෝ

සිතවත් යන අර්ථයි. මෙහි ලක්ෂණය ශබ්දශාස්ත්‍රානුසාරයෙන් දතයුතුය. 'ඔජ්ඣාපෙන්ති'යිද පාඨයෙක්වේ. මේ අර්ථමය. **'ඡන්දාය'** ඡන්දයෙන්. පක්ෂපාතයෙන් තමතමන්ගේ සන්දිට්ඨ සම්භත්ත මිත්‍රයන්ට ප්‍රණීත ප්‍රණීතයන් පතවා යන අදහසවේ. **'ඛීයන්ති'** 'ඡන්දාය දබ්බො මල්ලපුත්තො' යනාදිය කියමින් ප්‍රකාශ කෙරෙත්. **'උජ්ඣාපනකෙ ඛීයනකෙ පාචිත්තියං'** මෙහි යම් වචනයකින් ලාමක කොට සිතවත්ද, ඒ 'උජ්ඣාපනක' නම. යම් වචනයකින් නුගුණ කියත්ද, ඒ 'ඛීයනක' නම. ඒ ලාමකකොට සිතවීමද, නුගුණ කීමද නිමිති කොට, 'පාචිත්තියං' වස්තු දෙකනිමිති කොට පාචිත්තිය දෙකක් වදරනලදී. **'උජ්ඣාපනකං නාම උපසම්පන්නං සඞ්ඝෙන සම්මතං සෙනාසනපඤ්ඤාපකං වා -පෙ- අප්පමත්තකවිස්සජ්ජකං වා'** යන මේ පද **'මඞ්කුං කත්තුකාමො'** යන මේ හා සම්බන්ධ වේ. **'අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො'** යන මොවුන්ගේ වසයෙන් **'උපසම්පන්නං'** යනාදි තන්හි **'උපසම්පන්නස්ස'**යි විභක්ති විපර්‍යාසය කටයුතුය. **'උජ්ඣාපෙති වා ඛීයති වා ආපත්ති පාචිත්තියස්ස'** යන මෙහි යම්හෙයකින් 'ඛීයනකං නාම'යි මාතෘකාපදය උදුරාද, 'උජ්ඣාපනකං නාම' යන මේ පදය පිළිබඳ වදළ විභඞ්ගයම කියයුත්තේවේ. අඤ්ඤවාදකශික්ෂාපදයෙහි මෙන් අතික් වෙහෙසෙක් නැත්තේය. එහෙයින් එය වෙන්කොට නොඋදුරා විභාග නොකොටම නිගමනයම එක්ව කරනලද්දේයයි දතයුතුය. **'ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී'** යනාදිතන්හි ඒ උපසම්පන්නයක්හට යම් සම්මුතිකර්මයක් කරනලදද, ඉදින් ඒ සම්මුති කර්මය ධර්මකර්ම වේද, ඒ මහණතෙමේද, එහි ධර්මකර්මැයි හැඟීම් ඇත්තේ ලාමක කොට සිතවීමද නුගුණපහළ කිරීමද කෙරේනම්, නැවැත මොහුට ඒ ලාමක කොට සිතවීම නිමිති කොටද නුගුණ පහළකිරීමද නිමිතිකොටද පාචිත්තියාපත්තිය වන්නේයයි. මේ නයින් අර්ථ දතයුතුය. **'අනුපසම්පන්නං උජ්ඣාපෙති වා ඛීයති වා'** යන මෙහි සඞ්ඝයා විසින් සම්මත කරනලද උපසම්පන්නයක්හට අතික් අනුපසම්පන්නයකු ලවා ලාමකකොට සිතවවයි. අවමන් කරවයි. ඒ අනුපසම්පන්නයාගේ හෝ සමීපයෙහි ඒ උපසම්පන්නයාගේ නුගුණ ප්‍රකාශ කෙරේය යන අර්ථයි. **'උපසම්පන්නං සඞ්ඝෙන අසම්මතං'** කර්මවාක්‍යයෙන් සම්මත නොකරනලද හුදෙක් 'තම මේ භාරයයි සඞ්ඝයා විසින් නගනලද භාරය ඇති මහණුන්ගේ පහසුවිහරණය පිණිස තමන්ම ඒ භාරය උසුලන යම් තැනෙක හෝ මහණහු දෙතුන් නමක් වෙසෙත්ද, එහි හෝ එබඳු කර්ම කරන්නාවූ යන අදහස වේ. **'අනුපසම්පන්නං සඞ්ඝෙන සම්මතං වා අසම්මතං වා'** යන මෙහි අනුපසම්පන්නයක්හට තෙරසසම්මුති දීම කිසිසේත් නොවටියි. එහෙත් උපසපන් කාලයෙහි ලද සම්මුති ඇත්තේ පසුව අනුපසම්පන්නභාවයෙහි

සිටියේද, ඒ සඳහා 'සඞ්ඝෙන සම්මතං වා' යනු වදළ සේක. යම් ව්‍යක්ත ශ්‍රාමණේරයක්හට හුදෙක් සඞ්ඝයා විසින් සම්මත කරනලද්දවූ හෝ මහණක්හු විසින් 'තෝ මේ කර්‍මය කරව'යි භාර කරනලද්දේද, එබඳු හෙරණහු සඳහා 'අසම්මතං වා'යි වදරන ලදී. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්‍ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි, වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

තෘතීය උජ්ඣාපනශික්‍ෂාපදයයි.

—||—

චතුර්ත්ථශික්‍ෂාපදයෙහි '**හෙමන්තිකෙ කාලෙ**' හෙමන්ත කාලයෙහි. හිම වැටෙන කාලයෙහි '**කායං ඔතාපෙන්තා**' ඇඳපුටු ආදියෙහි හුන්නාහු ලහිරුරැසින් කය තවන්නාහු. '**කාලෙ ආරොචිතෙ**' කැඳබත් ඈ අතුරෙහි යම් කිසිවක් පිණිස කල් දැන්වූ කල්හි. '**ඔවට්ඨං හොති**' හිම වැස්සෙන් තෙමුනේ තෙත් වූයේ වේ. '**අවස්සික සඞ්කෙතෙ**' වැසි ලකුණු නැති, වැසි නැත්තාවූ. වස්සානමාසැයි මෙසේ නොපැනවූ හිමවැටෙන සිවු මසය, ග්‍රීෂ්මසහිත සිවුමසය යන අට මස්හිය යන අර්ත්ථයි. '**මණ්ඩපෙවා**' අතුමඩුවෙහි හෝ පුවරුමඩුවෙහි හෝ. '**රුක්ඛමූලෙ**' යම් කිසි ගසක් යට. '**යත්ථ කාකා වා කුලලා වා න ඌහදන්ති**' යම් තැනක නිත්‍යවාසහෙතුවෙන් කැදලි කොට වසන්නාවූ මේ කවුඩන් හා උකුස්සෝ හෝ ඉන් අන්‍ය පක්‍ෂීහු හෝ ඒ සෙනසුන මල නොගවසත්ද, එබඳු රුක්මුලෙහි යට කියූ අටමස්හි තබන්නට අනුදනිමි. එහෙයින් යම් තැනක ගොදුරෙහි යෙදුනු පක්‍ෂීහු විඩා හැර යෙත්ද, ඒ රුක්මුල සෙනසුන තැබීම නිවැරදය. යම් තැනක නිත්‍යවාසහෙතුවෙන් කැදලි කොට වසත්ද, ඒ රුක්මුල නොතැබිය යුතුය. 'අට්ඨමාසෙ'යි කියූ බැවින් යම් ජනපදයන්හි වැසිකල නොවසීද, ඒ ජනපදයන්හිද වැසිසාර මස්හි ද සෙනසුන් තැබීම වරද සහිතමය. අවස්සිකසඞ්කෙතෙ' කියූ බැවින් යම් හෙමන්ත ඍතුවෙක්හි වැසි වසීද, ඒ හෙමන්තඍතුවෙහිද එලමහනෙ'හි සෙනසුන් තැබීම නොසුදුසුය. ග්‍රීෂ්ම ඍතුවෙහි වනාහි හැමතැන පහවූ වලා ඇති අහස පිරිසිදු වේද, මෙබඳු කාලයෙහි කිසියම් කරුණකින් වුවද එලිමහනෙහි ඇඳපුටු තැබීමෙහි වරදෙක් නැත්තේය. අබ්භොකාසික භික්‍ෂූන් විසින්ද වත දැනගත යුතුය. ඒ අබ්භොකාසිකයාගේම පෞද්ගලික ඇඳක් වේද, එහිම සැතපිය යුතුය. සඞ්ඝිකයක් ගන්නහු විසින් වේවැලින් හෝ වැහැරියෙන් හෝ වියූ ඇඳක් ගතයුතුය. එබඳු ඇඳක් නැති කල්හි පැරණි ඇඳක් ගතයුතුය. එබන්දකුදු නැති කල්හි අලුතවියූ ඇඳක් හෝ මෙට්ටසහිත ඇඳක් හෝ ගතයුතුය.

ගෙණ 'මම උපසම්පන්නභික්ඛූපසම්පාදිකවෙමි, උත්තම අභ්‍යවකාශිකවෙමි, සිවුරු කිළියක්ද නොකොට සොකල්හි එලි මහනෙහි හෝ රුක්මුලෙහි හෝ සෙනසුනක් නොපතාවා තිදීම නොවටියි. ඉදින් සිවු ගුණවූද සිවුරෙන් කළ කිළිය නොතෙමෙන්නක් කොට රකින්නට නොහැක්කේද හද්දවැසි ආදීහු වෙත්ද, එකල්හි මහණහු තමා කායානුගතික බැවින් වටියි. වනයෙහි පත්කිළියෙහි වසන්නවුන්ට ශීලසම්පත්තියෙහි පහන් සිත් ඇති මිනිස්සු 'සඞ්ඝික පරිභොගයෙන් පරිභොග කළ මැනැවැ'යි අලුත් ඇඳපුටු දෙත්ද, එහි වැස යන්නවුන් විසින් සමීපවෙහෙරක සභාග භික්ෂූන්ට යවා යායුතුය. සභාග භික්ෂූන් නැති කල්හි නොතෙමෙන තැනක තබා යායුතුය. නොතෙමෙන තැනක් නැති කල්හි රුකෙක එල්ලා යා යුතුය. සැම්දුලෙහි මුස්න ගෙණ බොජුන්හල මිදුල හෝ පොහෝ ගේ මිදුල හෝ පිරිවෙන් දිවාතැන් ගිනිහල් ආදීන් අතුරෙහි එක්තරා තැනක් හෝ හැමද මුසුන සෝද මුසුන්මළුවෙහිම තැබිය යුතුය. පොහෝ ගෙවල් ඈ අතුරෙහි එක් තැනක ගෙන සෙසු තැන් හමදින මහණහුට ද මෙම නය වේ. යම් මහණෙක් පිඬුසිහා යන මගද නමදින්ම යනු කැමැත්තේ වේද, හු විසින් හැමද අතරමග ශාලාවක් ඇත්තේ නම් එහි තැබිය යුතුය. ඉදින් නැත්තීනම් වැහි පටල නොනැගිබව සලකා 'යම්තාක් මම ගමින් නික්මෙම්ද, ඒතාක් නොවස්නේයයි දන්නහු විසින් යම්කිසි තැනක තබා නැවත පෙරළා එන්නහු විසින් තුබූ තැන තැබිය යුතුය. ඉදින් වස්නේයයි දන්නේ එළිමහනෙහි තබා නම් දුක්කට යි **මහාපච්චරියෙහි** කියනලදී. සැම්දුල් ආදි ඒ ඒ තැනම හැමදිම පිණිස මුස්න තබනලද්දේවේද, ඒ ඒ තැන හැමද ඒ ඒ තැනම තැබීම නිවරද වේ. අසුන්හල හමදින්නහු විසින් වත දතයුතුය. එහි මේ වතයි. මැද සිට හිඳින්නවුන්ගේ පා තබනතැනට අභිමුඛ වූ හෝ හමදින්නහුගේ පාදස්ථානයට අභිමුඛවූ හෝ වැලි ගෙණ යායුතුය. කසළ අතින් ගෙණ පිටත දැමිය යුතුය.

'**මසාරකො**' ඇඳ පා විද එහි විට්ටම ප්‍රවෙශකොට කරනලද්දේය. '**බුන්දිකාබද්ධො**' විට්ටමෙන් ඇඳ පා ඩැහැගන්වා පයඞ්ඝකසඞ්ඛෙපයෙන් කරනලද්දේය. '**කුළීරපාදකො**' අස්, බැටළු ආදීන්ගේ පා සමාන පාදයෙන් කරනලද්දේය. වක් පා ඇති යම්කිසි ඇඳක් වේද, මෙය කුළීරපාදකැයි කියනු ලැබේ. '**ආහච්චපාදකො**' මේ ආහච්චපාදක නම් ඇඳ අවයවයන් විද කරනලද්දේ වේය යි මෙසේ පදභාජනයෙහි පෙළෙහිම කියනලද්දේය. එහෙයින් විට්ටම් විද එහි පාමුදුන ඇතුල්කොට මත්තෙහි ඇණ ගසා කරනලද ඇඳ ආහච්චපාදකැයි දතයුතුය. පුටුවෙහිද මෙම නයයි '**අඤ්ඤං සංවෙඨෙත්වා බද්ධං හොති**' යවද උඩද පළල් කොට මැද කෙටි කොට මිහිඟුබෙර සටහන් කොට බඳිනලද්දේ වේ. එය මැද සී වගපමින්

වටකොටද කරත්. මෙහි අකැප සමෙක් නම් නැත්තේය. සෙනසුන රන්මුවා වූයේද වටියි. එහෙයින් එය මහැඟි වේ. **'අනුපසම්පන්නං සන්ථරාපෙති තස්ස පළිබොධො'** යමකු විසින් අතුරුවනලද්දේද, ඒ මහණහුට පළිබොධයවේ. **'ලෙඩ්ඩුපාතං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස'** බලමැදුම් පුරුෂයකුගේ ලෙඩ්ඩුපාතයක් ඉක්මවන මහණහුට පාචිත්තිය වේ. මෙහි මේ විනිශ්චයයි.

ස්ථවිර තෙමේ බොජුන්හලෙහි බත්කිස කොට ලදරු හෙරක්හට 'යව දිවාතන්හි ඇඳපුටු පනවා යි අණවයිද, හෙතෙමේ එසේ කොට හුන්නේය. ස්ථවිර තෙමේ කැමැතිසේ හැසිර එහි ගොස් ථවිකයක් හෝ උතුරුසඟ සිවුර හෝ තබාද, එතැන් පටන් තෙරහුට පළිබොධය වේ. හිඳ තෙමේ යන්නේ නොම උදුරාද, නොඋදුරුවාද, ලෙඩ්ඩුපාතය ඉක්මීම නිමිති කොට පාචිත්තිය වේ. ස්ථවිර තෙමේ එහි ථවිකයක් හෝ උතුරුසඟසිවුර හෝ නොතබා සක්මන් කරමින්ම ලදරු හෙරණහුට 'තෝ යවයි කියා නම්, ඔහු විසින් 'ස්වාමීනි' මේ ඇඳපුටුය යි කිය යුතුය. ස්ථවිර තෙමේ වත දනී නම්, 'තෝ යව, මම ප්‍රකෘතිමත් කරන්නෙමියි කිය යුතුය. ඉදින් බාලයෙක් වේ නම්, නොඋගත් වත් ඇත්තේ 'යව, මෙහි නොසිටුව, හිඳින්නට නොම දෙව, නිදන්නට නොම දෙව'යි ලදරු හෙරණහුට තර්ජනය කෙරේමය. ලදරු හෙරණහු විසින් 'ස්වාමීනි' සැපයේ සයනකරවු'යි, මෙහි නොසිටුවයි කියූ වචනය ලැබ වැඳ යායුතුය. ඔහු ගියකල්හි තෙරහුටම පළිබොධය වේ. පෙර කියූනයින්ම මේ මහණහුට ආපත්තිය දතයුත්තීය. එකල්හි ඇණ වූ කෙණෙහිම ලදරු හෙරණ තෙමේ 'ස්වාමීනි' මට බඩු සේදීම් ආදීවූ කිසි කටයුත්තෙක් ඇත්තේය'යි කියාද, ස්ථවිර තෙමේද, 'තෝ ඒ සෙනසුන පනවා යව'යි කියා බොජුන්හලින් නික්ම අන් තැනක යේද, පා ඉදිරීම හෙතුකොට කරවිය යුතුය. ලෙඩ්ඩුපාතොපචාරයෙන් පිටත සිටි බැවින් පාදුද්ධාරය් හේතුකොට කරවිය යුත්තේයයි කියනලදී. අන් තැනකට යන මහණහුට පළමු පය ඉදිරීම නිමිතිකොට පාචිත්තිය යන අර්ථයි. ඉදින් එහිම ගොස් හිඳීද, පළමුකී නයින්ම ඔහුට ලෙඩ්ඩුපාතය ඉක්මවීම නිමිතිකොට ඇවැත් වේ. ස්ථවිර තෙමේ හෙරණහුට අණවා නම්, හෙරණහු එහි ඇඳපුටු පනවා හුන් කල්හිද, බොජුන් හලින් අන් තැනක යන්නේද පය ඉදිරීම හෙතුකොට කරවිය යුතුය. ගොස් හුන්නේ නැවැත යන කල්හි ලෙඩ්ඩුපාතය ඉක්මීම නිමිති කොට වන ඇවැතින් කරවිය යුතුය. අණවනුයේ ඇඳපුටු පනවා එහිම හිඳුවයි අණවාද, යම් තැනක කැමැති වේද, එහි ගොස් එන්නට ලබන්නේය. තමන් ප්‍රකෘතිමත් නොකොට යන මහණහුට ලෙඩ්ඩුපාතය නිමිති කොට පාචිත්තිය වේ. අතර අතර රැස්වීමෙහි ඇඳපුටු පනවා

හුන්නහු විසින් යන කල්හි ආරාමිකයන්ට 'මේ සෙනසුන තැන්පත් කරවු'යි කිය යුතුය. නොකියා යන්නවුන්ට ලෙඩ්ඩුපාතය ඉක්මීම නිමිතිකොට ඇවැත්වේ. මහාධර්‍මශ්‍රවණයෙක් වේ. එහි පොහෝගෙයින්ද බොජුන් හලින්ද ගෙණ අවුත් ඇඳපුටු පනවත්ද, ආවාසිකයන්ටම පළිබොධය වේ. ආගන්තුකයෝ 'මේ අසුන අපගේ උපාධ්‍යායාහට මේ අසුන ආචාර්‍ය්‍යයාහටැයි ගණිත් නම් එතැන් පටන් ඒ ආගන්තුක මහණුන්ටම පළිබොධය වේ. යන කල්හි තැන්පත් නොකොට ලෙඩ්ඩුපාතය ඉක්මවන මහණුන්ට ඇවැත්වේ. **මහාපච්චරියෙහි** වනාහි යම්තාක් අන් මහණහු නොහිඳිත්ද, ඒතාක් යම් කෙනකුන් පනවනලද්දේද ඔවුන්ට භාරය, අන්‍යයන් අවුත් හුන් කල්හි හුන් මහණුන්ට භාරය. ඒ මහණහු නොඋදුරා හෝ නොඋදුරවා හෝ යෙත්ද, දුක්කටය වේ. කුමක්හෙයින,දයත්:- නොඇණවීමෙන් පැනවූ බැවිනැයි කියන ලදී. ධර්‍මාසනය පැනවූ කල්හි යම්තාක් මතුමතු පාලිපාඨය පවත්වන්නෙක් හෝ ධර්‍මකථිකයෙක් හෝ නොවේද, නො ඒද, ඒතාක් සෙනසුන පැනවූවන්ට පළිබොධයවේ. සියලු රෑදවල ධර්‍මශ්‍රවණය වේද, අනික් සරභාණකයෙක් හෝ ධර්‍මකථිකයෙක් හෝ නැගී සිටීද, අනිකෙක් හිඳීද, යමෙක් යමෙක් අවුත් හිඳීද, ඒ ඒ මහණහුට භාරවේ. නැගිටින්නහු විසින් මේ අසුන තොපට භාර'යි කියාම යායුතුය. අනිකකු නො ආකල්හිම පළමු කොට හුන් මහණ නැගිට යේද, ඔහුද උපචාරයතුළ සිටියදීම අන් මහණෙක් අවුත් හිඳීද, නැගිට ගිය මහණ තෙමේ ඇවැතින් නොකරවිය යුතුය. 'අන් මහණකු නො ආකල්හම පළමු කොට හුන් මහණ තෙමේ හුනස්නෙන් නැගිට ලෙඩ්ඩුපාතය ඉක්මවාද, ඇවැතින් කරවිය යුතුය. හැම තන්හිද ලෙඩ්ඩුපාත ඉක්මීම නිමිති කොට පළමු පියෙහි දුක්කටය වේ. දෙවන පියෙහි පාචිත්තිය වේ. මේ ක්‍රමය මහාපච්චරියෙහි කියනලද්දේය.

'**චිලිමිකං වා**' යනාදියෙහි චිලිමිකා නම් සුණු පිරියම් කළ බිම පැහැය රකිනු පිණිස කරනලද්දීය. ඒ චිලිමිකාව යටට එළා ඒ මතුවෙහි කළාල එළත්. **උත්තරත්ථරණ** නම් ඇඳපුටුමතුවෙහි ඇතිරිය යුතු පසතුරුණය. **භුම්මත්ථරණ** නම් බිම ඇතිරිය යුතුවූ කළල් ආදි විකෘතිය. **තට්ටික** නම් තල්පතින් හෝ වැහැරියෙන් හෝ කළ තටුවය. **චම්මඛණ්ඩ** නම් සී වග දිවි වලස් සම් ආදීන් අතුරෙහි යම්කිසි සමෙක. අට්ඨකථාවන්හි වනාහි සෙනාසන පරිභොගයෙහි වැළකු සමක් නම් නොපෙනේ. එහෙයින් සිංහ චර්‍මාදිය පරිහරණය කිරීමෙහිම ප්‍රතික්ෂෙපය දතයුතුය. **පාදපුඤ්ඡනී** නම් රැහණින් හෝ කඩවැටියෙන් හෝ පාපිස්නා පිණිස කරන ලද්දීය. **ඵලකපීඨ** නම් පුවරුයෙන් කළ පුටුවය. නොහොත් පුවරුවද දැවමුවා පුටුවද. මෙයින් සියලුම දැවබඩු ආදිය සඞ්ග්‍රහ කරනද්දේය. **මහාපච්චරියෙහි**

චනාහි පාත්‍රදරණුව පාත්‍රපියන පාසෝදන දඬුකඩ තල්වැට විජනිපත යන යම් කිසි දවබඩුවක් යටත් පිරිසයින් පැන්කිණිස්ස පැන්සක එළිමහනෙහි තබා යන මහණහුට දුක්කටැයි කියනලදී. මහාඅට්ඨකථා වෙහි චනාහි මේ නය ද්විතීය ශික්ෂාපදයෙහි දක්වනලද්දේය. එළිමහනෙහි පඩුපිස පඩුබඳුන පඩුකිණිස්ස පඩුඹරුව යන සියල්ල ගිනිහලෙහි තැන්පත් කටයුතුය. ගිනිහලක් නැත්තේනම් නොතෙමෙන කඳුතොල්ලෙක තැන්පත් කටයුතුය. එද නැතිකල්හි යම් තැනෙක්හි බලන්නාවූ භික්ෂූහු දකිත්ද එබඳු තැනක තබාද යායුතුය. **'අඤ්ඤස්ස පුග්ගලිකෙ'** යමකු කෙරෙහි විශ්වාසයෙන් ගැණීම නොහටගණීද, ඔහු වෙත තැබීම නිමිති කොට දුක්කටය වේ. යමකුකෙරෙහි විශ්වාසය හටගැණේද, ඔහු සතු දැය තමන්ගේ පුද්ගලිකයන් මෙන් වේයයි **මහාපච්චරී** ආදියෙහි කියනලද්දේය. **'ආපුච්ඡිත්වා ගච්ඡති'** යම් මහණෙක් හෝ හෙරණෙක් හෝ ආරාමිකයෙක් හෝ ලජ්ජියෙක්වේද, තමාට පළිබොධයක් මෙන් සලකාද යමෙක් එබන්දකු විචාරායේද, ඔහුට ඇවැත් නොවේ. **'ඔතාපෙන්තො ගච්ඡති'** අව්වෙහිලා වියලනේ අවුත් උදුරන්නෙමි'යි යේද, මෙසේ යන මහණහුට ඇවැත් නොවේ. **'කෙනචි පළිබුද්ධං හොති'** සෙනසුන කිසිවකු විසින් උපද්‍රව කරනලද්දේවේය යන අර්ථයි. ඉතා මහලු මහණෙක් තෙමේ නැගිටුවා ගණී නම්, යකෙක් හෝ ප්‍රෙතයෙක් හෝ අවුත් හිඳී, නම් කිසි ඉසුරෙක් අවුත් ගණී නම්, සෙනසුන උපද්‍රැත වේ. සිංහව්‍යාඝ්‍රාදීන් හෝ ඒ ප්‍රදෙශයට අවුත සිටි කල්හිද සෙනසුන උපද්‍රුතමවේ. මෙසේ කිසිවකු විසින් උපද්‍රැත කල්හි නොඋදුරා යන මහණහුටද ඇවැත් නොවේ. **'ආපදාසු'** ජීවිතයට හා බ්‍රහ්මචර්‍ය්‍යයට අන්තරායයක් ඇති කල්හිය. එහිද ඇවැත් නොවේයයි දන්නේය. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන් කායවාචාචිත්තයෙන් උපදී. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

චතුර්ථ වූ ප්‍රථමසෙනාසන ශික්ෂාපදයයි.

—\\—

ද්විතීය සෙනාසන ශික්ෂාපදයෙහි **'භිසිං'** ඇඳ බිස්සක් හෝය පුටු බිස්සක් හෝය. චිමිලිකාදීහු ප්‍රථම ශික්ෂාපදයෙහි කියූ ආකාර ඇත්තාහුම වෙති. **'නිසීදනං'** ද සහිත නිසීදනය දතයුතුය. **'පච්චත්ථරණං'** පොරෝනා රෙද්ද හා මහාකොඳු පලසය යි අට්ඨකථාවන්හි මෙපමණෙක්ම කියනලදී. **'තිණසන්ථාරො'** යම් කිසි තෘණයකින් කරනලද ඇතිරියය. පණ්ණසන්ථාරයෙහිද මේ නය වේ. **'පරික්ඛෙපං අතික්කමන්තස්ස'** මෙහි

සඞ්ඝිකවිහාරයෙහි භිසි ආදියක් පනවා තමා නොඋදුරා හෝ අනිකකු ලවා නොඋදුරවා හෝ නොවිචාරා පළමු පය ඉක්මවන මහණහුට දුක්කටය වේ. දෙවන පය ඉක්මීම නිමිති කොට පාචිත්තිය වේ. වට නොකළ සෙනසුනෙහි උපචාරය නම් කෙළවර තුබූ සෙනසුනෙන් ලෙඩ්ඩුපාත දෙකෙකි. '**අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය**' මෙහි මහණකු ඇති කල්හි මහණතෙමේ විචාළයුතුය. ඒ මහණකු නැති කල්හි සාමණේරයෙක් විචාළයුතුය. සාමණේරයකු නැති කල්හි ආරාමිකයෙක් විචාළයුතුය. ආරාමිකයකුද නැති කල්හි යමකු විසින් විහාරය කරවන ලද්දේද, ඒ විහාරස්වාමි තෙමේ හෝ ඔහුගේ කුලයෙහි යම්කිසි නෑයෙක් හෝ විචාළ යුතුය. ඔහුද නැතිකල්හි ගල් සතරක් මතුවෙහි ඇඳ තබා ඒ ඇඳෙහි සෙසු ඇඳ පුටු නංවා මතුවෙහි බිසි ආදීවූ දස වැදෑරුම් ශය්‍යාවන් රැස් කොට දැවබඩු හා මැටිබඩු තැන්පත් කොට දෙරජනෙල් පියා ගම්කවන පුරා යායුතුය. ඉදින් සෙනසුන තෙමේ නම් සෙවිලි කිරීම පිණිස තණ හෝ උළු හෝ ගෙණෙන ලද්දේ නම් සෙවිලි කිරීමට හැකිවේනම් සෙවිලි කළ යුතුය. නොහැක්කේ නම් නොතෙමෙන යම් අවකාශයෙක් වේ නම් එහි ඇඳපුටු ආදිය තබා යායුතුය. සියලු තැන තෙමේ නම් හැකිවන්නහු විසින් ගමතුල උපාසකයන්ගේ ගෙයි තැබිය යුතුය. ඒ උපාසකයෝද 'ස්වාමීනි' සඞ්ඝිකය නම් බරය. අග්නිදහාදීන්ට බියවෙමු'යි නොපිළිගණිත්ද, එළිමහනෙහිද ගල් මතුවෙහි ඇද තබා සෙස්ස පෙර කියූ නයින් තබා තණවලින් හා කොළවලින් වසා එහි යම් අවයව මාත්‍රයක් නමුදු ඉතිරිවේද එය එහි පැමිණි අන් මහණුන්ට උපකාර වන්නේයයි යෑම වටියි.

'**විහාරස්ස උපචාරෙ**' යනාදි තන්හි විහාරොපචාරය නම් එක් එක් විහාරයෙහි පවුරඇතුළ පිරිවෙණය. '**උපට්ඨානසාලා**' පිරිවෙන් බොජුන්හල. '**මණ්ඩපෙ**' පිරිවෙන් මඩුව. '**රුක්ඛමූලං**' පිරිවෙන් රුක්මුල. මේ නය වනාහි **කුරුන්දට්ඨකථා**වෙහි කියනලදී. තවද '**විහාරො**' යනු ඇතුළුගැබ හෝ අන්‍යවූ සියල්ල වැසුනු ගුප්තසෙනාසනය හෝයි දතයුතුය. '**විහාරස්ස උපචාරෙ**' ඒ විහාරයෙහි පිටත ළංවූ අවකාශයෙහිය. '**උපට්ඨානසාලාය වා**' බොජුන් හලෙහි හෝ. '**මණ්ඩපෙවා**' නොපිරිසිදිනලද්දවූ හෝ පිරිසිදිනලද්දවූ හෝ බොහෝ දෙන රැස්වන මඩුවෙහි. රුක්මුලෙහි විශෙෂවශයෙන් කියයුත්තෙක් නැත්තේයි කියනලදී. '**ආපත්ති දුක්කටස්ස**' කියූ ආකාරවූම දසවැදෑරුම් ශය්‍යාව ඇතුළුගැබ් ආදියෙහි ගුප්තස්ථානයෙක්හි පනවා තබා යන මහණහුට යම්හෙයකින් ශය්‍යාවත් සෙනාසනයත් වේයන් විසින් නසනු ලැබේද, තුඹස් රැසක්ම වේද, එහෙයින් පාචිත්තිය වදරනලදී. පිටත වනාහි උපස්ථාන ශාලාදියෙහි

පනවා යන මහණහුට ශය්‍යාව පමණක්ම ස්ථානය අගුප්ත බැවින් නස්නේද, සෙනසුන නොනස්නේද, එහෙයින් මෙහි දුක්කටය වදරන ලදී. '**මඤ්චං වා පීඨං වා**' යන මෙහි යම්හෙයකින් ඇඳපුටු වහා වේයන් විසින් කන්නට නොහැක්කේද, එහෙයින් ඒ ඇඳපුටු විහාරයෙහිද අතුරා යන මහණහුට දුක්කටය වදරනලදී. විහාරොපචාරයෙහි විහාරචාරිකාවෙහි ඇවිදින්නෝද, ඒ සෙනසුන දැක තැන්පත් කරන්නාහුය. '**උද්ධරිත්වා ගච්ඡති**' යන මෙහි උදුරා තබා යන්නහු විසින් සියලු ඇඳපුටු කවුළුවෙන් බැහැර කොට එක්කොට සිවුරුලන හුණෙහි එල්වා යායුතුය. පසුව අවුත් වසන මහණහු විසින්ද, නැවැත ඇඳපුටු පනවා එහි තිද හිද යන්නහු එසේම කළයුතුය. බිත්තියෙන් ඇතුළත ශය්‍යාව බිත්තියෙන් පිටත පනවා වසන්නහු විසින් යන කල්හි ගත් තැනම තැන්පත් කළයුතුය. පහයමත්තෙන් බහා පහය යට වසන මහණහටද මෙම නයවේ. රාත්‍රිස්ථාන දිවා ස්ථානයන්හි ඇඳපුටු පනවා යන කල්හි නැවැත ගත්තැනම තැබිය යුතුය.

'**ආපුච්ඡිත්වා ගච්ඡති**' යන මෙහි මේ ආපුච්ඡා කටයුතු ආපුච්ඡා නොකටයුතු විනිශ්චයයි. ඒතාක් බිම යම් දිග්සාලාවක් හෝ පන්සලක් හෝ වේද, රුක්ටැඹෙක්හි කළ යම් ගෙයක් හෝ වේයන් නගින තැනක් වේද, එතැනින් යන්නහු විසින් ඒතාක් ආපුච්ඡා කොටම යායුතුය. එද කිහිප දවසක් පිළිදැගුම් නොකරන කල්හි තුඹස්හුම නැගී සිටිත්ද, එහෙයිනි. ගල්පිට හෝ ගල්ටැම්හි හෝ කරනලද යම් සෙනසුනක්, පර්වතගුහාවක් හෝ වේද, සුණු පිළියම් කළ සෙනසුනක් හෝ වේද, යම් තැනක වේයන් නගිනු ඇතැයි සැකයෙක් නැත්තේද, එයින් බැහැර යන මහණහුට ආපුච්ඡා කොටද ආපුච්ඡා නොකොටද යෑම වටියි. ආපුච්ඡා නම් වතයි. ඉදින් එබඳු සෙනසුනෙහිද එක් පසෙකින් වේයෝ නගිත්ද, ආපුච්ඡා කොටම යායුතුය. යම් ආගන්තුක මහණෙක් සඞ්ඝිකසෙනසුනක් ගෙණ වසන මහණහුට අනුව පවතිනුයේ තමන්ට සෙනසුන නොගෙණ වෙසේද, යම්තාක් හෙතෙමේ නොගණීද, ඒතාක් ඒ සෙනසුන පළමු මහණහුටම පළිබොධය වේ. යම් කලෙක ඒ මහණ තෙමේ සෙනසුන ගෙණ තමන්ගේ ඓශ්චර්‍ය්‍යයෙන් වෙසේද, එතැන් පටන් ආගන්තුක මහණහුටම පළිබොධය වේ. ඉදින් දෙදෙනම බෙද ගණිත්ද දෙදෙනාහටම පළිබොධය වේ. **මහාපච්චරියෙහි** වනාහි කියනලදී. ඉදින් දෙතුන් දෙන එකතුව පනවත්ද යන කල්හි සියල්ලන් විසින් ආපුච්ඡා කටයුතුය. ඔවුන් අතුරෙහි පළමු කොට යනුයේ 'පැසුළු මහණතෙමේ පොෂණය කරන්නේය'යි කල්පනා කොට යේ නම් වටියි. පශ්චිමයාගේ කල්පනාවෙන් මිදීමක් නැත්තේය. බොහෝ මහණෝ එකකු යවා අතුරුවත්ද, යන

කල්හි සියල්ලන් විසින්ම ආපුච්ඡා කටයුතුය. එකකු යවා හෝ විචාළ යුතුය. අන් තැනකින් ඇඳපුටු ආදිය ගෙණ අවුත් අන් තැනක වැසද, යන කල්හි එහිම ගෙණ යායුතුය. අන් තැනකින් ගෙණ අවුත් වසන කල්හි අන් ඉතා මහලු මහණෙක් ඒද, පිටමං නොකොටයුතුය. 'ස්වාමීනි' මාවිසින් අතික් ආවාසයකින් ගෙණ එන ලද්දේය. ප්‍රකෘතිමත් කළ මැනවැ'යි කිය යුතුය. ඔහු විසින් 'මෙසේ කරන්නෙමි'යි පිළිගත් කල්හි අතික් මහණහුට යෑම වටියි. මෙසේ අතික් තැනක ගෙණ ගොස්ද සඞ්ඝික පරිභොගයෙන් පරිභොග කරන මහණහුට නැසුනේ හෝ දිරුයේ හෝ සොරුන් විසින් හෝ ගන්නාලද්දේ වේද, නය නොවේ පෞද්ගලික පරිභොගයෙන් පරිභොග කරන්නහුට වනාහි නය වේ. අන් මහණක්හුගේ ඇඳපුටු වනාහි සඞ්ඝිකපරිභොගයෙන් හෝ පෞද්ගලිකපරිභොගයෙන් හෝ පරිභොග කරන්නහුට නැසුනේ නයවේමය. **'කෙනචි පළිබුද්ධං හොති'** මහලු මහණ ඉසුරු යක්ෂ සිංහ ව්‍යාල මෘගකෘෂ්ණ සර්පාදීන් අතුරෙහි යම් කිසිවකු විසින් සෙනසුන උපද්‍රැත වේද, **'සාපෙඛො ගන්ත්වා තත්ථ ඨිතො ආපුච්ඡති කෙනචි පළිබුද්ධො හොති'** අදම අවුත් පිළිදැගුම් කරන්නෙමි'යි මෙසේ බලාපොරොත්තු සහිතව ගහින් එතෙරට හෝ අන් ගමකට හෝ ගොස් යම් තැනකදී මේ මහණහුට යන සිත උපදීද, එහිම සිටියේ කිසිවකු යවා විචාරාද, ගඟපිරීම රජ සොර ආදීන් අතුරෙහි හෝ කිසිවකින් උපද්‍රැත වේද, උවදුරු ලද්දේද පෙරළා එන්නට නො හැකිවේද, මෙසේවූ මහණහුටද ඇවැත් නොවේ. සෙස්ස සමුට්ඨානාදීන් සමග ප්‍රථම ශික්ෂාපදයෙහි කියූනයමය.

පඤ්චම ද්විතීය සෙනාසනශික්ෂාපදයයි.

—॥—

ෂෂ්ඨශික්ෂාපදයෙහි **'පළිබුද්ධන්ති'** ඉතා පළමුව ගොස් පාසිවුරුගෙණ අවුරා සිටිත්. **'ථෙරෙ භික්ඛූ වුට්ඨාපෙන්ති'** ඇවැත්ති' අපට පැමිණේය'යි වස්ගණනින් ගෙණ ස්ථවිර භික්ෂූන් නැගිටුවත්. **'අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙන්ති'** 'ස්වාමීනි' ඔබවහන්සේට මඤ්චස්ථානයම පැමිණේ. සියලු විහාරය නොපැමිණේ. දැන් මෙතැන අපට පැමිණේයයි වැද ඇඳපුටු පනවා හිඳීමද කෙරෙත්. නිදීම ද කෙරෙත්. හැදෑරීමද කෙරෙත්. **'ජාතං'** 'මෙතෙමේ නොනැගිටවිය යුතුය'යි දන්නේ. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ විභඞ්ගයෙහි **'වුඩ්ඪො ජානාති'** යනාදිය වදරනලද්දේය. වෘද්ධතෙමේ වනාහි තමන් වෘද්ධ බැවින් නොනැගිටවිය යුතුය. ගිලන් තෙමේ ගිලන් බැවින් නොනැගිටවිය යුතුය. සඞ්ඝ තෙමේ වනාහි භාණ්ඩාගාරික භික්ෂූහුගේ හෝ ධර්මකථික විනයධරාදීන්ගේ හෝ ගණවාචක ආචාර්‍ය්‍යයාගේ හෝ

බොහෝ උපකාර ඇතිබවද ගුණ විශිෂ්ටබවද සලකමින් නිත්‍යවාසය පිණිස විහාරයක් සම්මත කොට දෙන්නේය. එහෙයින් යම් මහණක්හට සඞ්ඝයා විසින් දෙන ලද්දේද, හෙතෙමේද නොනැගිට වියයුතුය. මෙහිද ඒකාන්තයෙන් ගිලනහුටද සඞ්ඝතෙමේම සුදුසු සෙනසුනක් දෙන්නේය. ගිලන් තෙමේ වනාහි අපලෝකනය කොට සඞ්ඝයා විසින් නොදුන් සෙනසුන් ඇත්තේද, නො පෙළියයුත්තේය. අනුකම්පා කටයුතුයයි දක්වන්නට වෙන්ව කියන ලද්දේය. '**උපචාරෙ**' යන මෙහි මඤ්චපීඨයන් පිළිබඳ මහල්ලක විහාරයෙහි වටින් එක්රියන් හමාරෙක් උපචාරයවේ. ඛුද්දක විහාරයෙහි යම් තැනකින් පොහොනේද එතැනින් එක්රියන් හමාරෙක් උපචාරයවේ. පා දෙවා ඇතුල් වන්නහුගේද, මූත්‍ර කිරීම පිණිස නික්මෙන්නහුගේද දෙර තබනලද පා දේනා ගලපටන්ද මූත්‍ර කරනස්ථානය පටන්ද, යම්තාක් ඇඳපුටු වේද, ඒතාක් එක්රියන් හමාරක් පළල්වූ මාර්ගය උපචාර නම්වේ. එහි ඇඳක හෝ පුටුවක හෝ උපචාරයෙහි සිටියාවූ හෝ ඇතුල් වන්නාවූ හෝ නික්මෙන්නාවූ හෝ මහණහුගේ උපචාරයෙහි යම් මහණෙක් සමීපයට පිවිස ශයනය කරනු කැමැත්තේ දශවිධ ශය්‍යාවෙන් අතුරෙහි එක් ශය්‍යාවක් අතුරා හෝ අතුරවා හෝ දුක්කටාපත්තිය වේ. '**අභිනිසීදති වා අභිනිපජ්ජති වා**' මෙහි හිඳීම් පමණකින් හෝ නිදීම් පමණකින් හෝ පාචිත්තිය වේ. ඉදින් දෙකම කෙරේ නම් පාචිත්තිය දෙකක් වේ. නැගිට නැගිට හිඳින්නහුටට හෝ නිදන්නහුට හෝ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය වේ. '**උපචාරං ඨපෙත්වා සෙය්‍යං සන්ථරති වා සන්ථරාපෙති වා**' යන මෙහිද මෙයින් මතුවෙහිද '**විහාරස්ස උපචාරෙ**' යනාදිවූ දුක්කට වාරයෙහි ද යම්සේ මේ ශික්ෂාවෙහි හිඳීම් පමණෙක්හි නිදීම් පමණෙක්හි මෙදෙක කිරීමෙහි ප්‍රයොග භෙදයෙහිද පාචිත්තිය ප්‍රභෙදය කියනලද්දේද, එසේ දුක්කටාදිප්‍රභෙද්‍ය දතයුතුය. යම් හෙයකින් මෙබඳුවූ විසභාගපුද්ගලයකු සමග එක් වෙහෙරක හෝ එක් පිරිවෙණක හෝ විසීමෙන් අර්ථයෙක් නැත්තේද, එහෙයින් හැම තන්හිම මොහුගේ විසීම වළක්වන ලද්දේය. '**අඤ්ඤස්ස පුග්ගලිකෙ**' යන මෙහිද විශ්වාසිකයාගේ පෞද්ගලිකය තමන්ගේ පෞද්ගලිකය සමානම වේ. එහි ඇවැත් නොවේ. '**ආපදාසු**' ඉදින් පිටත වසන්නහුගේ ජීවිතයට හා බ්‍රහ්මචර්‍ය්‍යයට අනතුරු වේද, මෙබඳු ආපදවන්හි යම මහණෙක් තෙමේ පිවිසේද ඒ මහණහුටද ඇවත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජිකසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සවැනිවූ අනුපඛජ්ජශික්ෂාපදයයි.

—\\—

සප්තම ශික්ෂාපදයෙහි **'එකෙන පයොගෙන බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති'** සිවුමහල් පස්මහල් ඇති යම් ප්‍රාසාදයෝ වෙත්ද, හයක් හතක් දෙර කොටු ඇති චතුස්සාලාවෝ වෙත්ද, එබඳු සඞ්ඝික සෙනාසනයන්හි අත් හෝ ග්‍රීවය හෝ ගෙණ අතර නොතබමින් එක් ප්‍රයොගයකින් ඉක්මවාද එක්ම පාචිත්තියෙක් වේ. තබ තබා නොයෙක් ප්‍රයොගයෙන් ඉක්ම වන මහණහුට දෙර ගණනින් පාචිත්තියයෝ වෙත්. අතින් ආමර්ෂණය නොකොට නික්මෙවයි. කියා වචනයෙන් නික්මවන මහණහුටද මෙම නය වේ. **'අඤ්ඤං ආණාපෙති'** යන මෙහි 'මොහු නික්මව'යි ඇණවූ මාත්‍රයෙක්හි දුක්කටය වේ. ඉදින් ඇණවූමිලද හෙතෙමේ වරක් අණවනලදුයේ බොහෝ වූ ද්වාරයන් ඉක්මවාද, එක් පාචිත්තියක් වේ. මෙපමණ දෙර නික්මවයි හෝ, මහදෙර තෙක් නික්මවාලවයි හෝ මෙසේ නියම කොට අණවනලද්දේ වේද, දෙර ගණනින් පාචිත්තියා පත්තීහු වෙත්. **'තස්ස පරික්ඛාරං'** ඔහු සතු වූ පාසිවුරු පෙරහන් ඩබරා ඇඳපුටු බිසි කොට්ට ආදී භෙද ඇති යම් කිසි පිරිකරක් යටත් පිරිසයින් පඩුපතුරුද යම් මහණෙක් බැහැර කරා නම් හෝ බැහැර කරවා නම් හෝ ඒ මහණහුට වස්තුගණනින් දුක්කට වෙත්. දැඩිකොට බැඳ තැබූ පරික්ෂකාරයන්හි වනාහි එක්ම ඇවැතක් වේය යි **මහාපච්චරියෙහි** කියනලදී. **'අඤ්ඤස්ස පුග්ගලිකෙ'** මෙහිද විශ්වාසිකයන්ගේ පෞද්ගලික පරිෂ්කාරය තමන්ගේ පෞද්ගලිකය සමානමවේ. මේ ශික්ෂාපදයෙහි යම්සේද සියලු තන්හි එසේය. යම් තැනක වෙනසක් වන්නේද, එහි එය කියන්නෙමු. **'අලජ්ජිං නික්කඩ්ඪති වා'** යනාදිතන්හි ඩබර කරන්නාහු කලහ කරන්නාහුම සියලු සඞ්ඝාරාමයෙන් පිටකරන්නට ලබන්නේය. හෙතෙමේ පක්ෂයක් ලබා සඞ්ඝයාද බිඳින්නේය. අලජ්ජිආදීහු තමන්ගේ වාසස්ථානයෙන්ම පිටකළයුතුය. සියලු සඞ්ඝාරාමයෙන් ඔවුන් නෙරපීම නොවටියි. 'උම්මත්තකස්ස' තමන් උමතුවූවහුට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියා සමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

සත්වන නික්කඩ්ඪනශික්ෂාපදයයි

—\\—

අෂ්ටම ශික්ෂාපදයෙහි **'උපරිවෙහාසකුටියා'** මතුතෙලෙහි පුවරු නොඅතුරනලද දෙමහල් කිළියක හෝ තෙමහල් කිළියක හෝ **'මඤ්චං සහසා අභිනිසීදති'** ඇඳ වෙගයෙන් අභිභවනය කොට, යටපත් කොට

හුන්නේය. මෙය සප්තම්‍යර්ථයෙහි ද්විතීයා වචනයි. ඇඳෙහි හුන්නේය යන අර්ථයි. **අභි** යන මෙය පද ශොභනය පිණිසවූ උපසර්ගමාත්‍රයෙක්මය. '**නිප්පතිත්වා**' වැටී. නික්ම හෝය. ඒ ඇඳෙහි මතුවෙහි ඇණයකුදු නොගසනලද්දීය. එහෙයින් නික්මුනේ '**විස්සරමකාසි**' විරූපවූ බැගෑ හඬක් කෙළේය. '**වෙහාසකුටි නාම මජ්ඣිමස්ස පුරිසස්ස අසීසඝට්ටා**' යම් කිළියක් තොමෝ පමණින් මධ්‍යමපුරුෂක්හුගේ හිස සියල්ලට යටින් සිටි තලාත් හා නොගැටේද, යන මෙයින් මෙහි අදහස් කළ අහස්කිළිය දක්වනලද්දීවේ. අහස්කිළි ලකුණු දක්වන ලද්දේ නොවේ. යම් කිසි මතු නොවැසූ තලය ඇති දෙමහල් කිළිය හෝ තෙමහල් ඈ කිළිය හෝ අහස් කිළියයි කියනු ලැබේ. මේ ශික්ෂාපදයෙහි වනාහි තලාත්හි හිස නොවදින කිළිය අදහස් කරනලදී. අභිනිසීදනාදීන් අතුරෙහි පෙර කියූ නයින්ම ප්‍රයොගවශයෙන් ආපත්තිභෙදය දතයුතුය. '**අවෙහාසකුටියා**' බිම කරනලද පන්සල් ආදීන් කෙරෙහි ඇවැත් නොවේ. එහි අන්හට පීඩා කරන්නට නොහැක්කේය. '**සීසඝට්ටාය**' යම් කිළියක් තොමෝ හිස ගැටීම් ඇත්තීද, එහිදු ඇවැත් නොවේ. එහි යටපහයෙහි නොනැමුනහු විසින් හැසිරෙන්නට නොහැක්කේද, එහෙයින් නොහැසිරෙන තැන් බැවින් අන්හට පෙළීමක් නොවන්නේය. '**හෙට්ඨා අපරිභොගං හොති**' යම් කිළියක යට දැවසමූහාදීන් ලූ බැවින් පරිභොගයට නොයාද, එහිද ඇවැත්නොවේ. '**පදරසඤ්චිතං හොති**' යම් කිළියක මතුතලය දැවපුවරුවෙන් හෝ සතව අතුළේ වේද, සුණු ආදියෙන් පිරියම් කරනලද්දේ හෝ වේද, එහිද ඇවැත් නොවේ. '**පටාණි දින්නා හොති**' ඇඳපුටුවල පාසිළුහි ඇණ ගසනලද්දීවේද, යමක හුන් කල්හිත් නොවැටෙත්ද එබඳු ඇඳපුටුවල හිඳින මහණහුටද ඇවැත් නොවේ. '**තස්මිං ඨිතො**' පාසිළු විද ඇණ නොගැසූ ඇඳක හෝ පුටුවක හෝ සිටියේ මතු බිත්තියෙහි ගැසූ නාදත් ආදියෙහි එල්ලූ සිවුරක් හෝ අන් කිසිවක් හෝ ගණී හෝ අනිකක් එල්වා හෝ එසේ කරන මහණහුටද ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුට්ඨානිකය. කයින්ද කායචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අටවන වෙහාසකුටි ශික්ෂාපදයයි.

——\\——

නවම ශික්ෂාපදයෙහි '**යාව ද්වාරකොසා**' මෙහි ද්වාරකොස නම්, දෙරබාවට වටින් කවුළුවෙහි පුළුල පමණවූ අවකාශයයි. **මහාපච්චරී**යෙහි වනාහි දෙරබාව පටන් එක්රියන් හමාරෙකැයි කියනලදී. කුරුන්දියෙහි

වනාහි දෙර දෙපස කවුළුව පමණයයි කියනලදී. **මහාඅට්ඨකථාවෙහි** 'කවුළුව නම් එක්රියන් හමාරෙක්ද වේ. දෙරියනෙක්ද වේ, දෙරියන් හමාරෙක්ද වේය'යි කියනලදි. ඒ කියනලද්ද මැනැවි. ඒ සඳහාම භාග්‍යවතුන්වහන්සේ විසින් 'දෙරබාවගේ වටින් අත්පසිනැ'යි මේ උත්කෘෂ්ටනිද්දේශය කරනලදි. '**අග්ගලට්ඨපනාය**' දෙරකවුළු සහිත අක්දෙරිය තැබීම පිණිස. කවුළුසහිත අක්දෙරිය නොසැලෙනු පිණිසයය යන අර්ථයි. '**ද්වාරට්ඨපනාය**' මේ පදභාජනයද මේ අර්ථය සඳහාම වදරනලදී. මේ වනාහි මෙහි අදහසය: කවුළුව වනාහි ලුහුව පෙරළෙන්නේය. අරිනකල්හි බිත්තිය පෙළන්නේය. වසන කල්හි අක්දෙරිය පෙළන්නේය. ඒ හැපීමෙන් පෙළීමෙන් බිත්තිය දෙදරන්නීය. එයින් මැටි සැලී යයි. සැලීමෙන් බුරුල් හෝ වේ. වැටීම හෝ වේ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ 'යාව ද්වාරකොසා අග්ගලට්ඨපනාය'යි වදාළසේක. එහි කිසිසේත් 'මේ නම් කටයුතුය'යි මාතෘකාවෙහි නොම වදරනලදී. පදභාජනයෙහි නොවදරනලදී. **අට්ඨොත්පත්තියෙහි** වනාහි '**පුනප්පුනං ඡඩ්ඩෙසි හුනප්පුනං ලිම්පාපෙසි**'යි අධිකාරවශයෙන් දෙරබාව දක්වා අගුල්කණුව නැවතීම පිණිස නැවැත නැවැත ලෙපය කටයුත්තේය. ලෙපය කරවිය යුත්තේය'යි මෙසේ අර්ථය දතයුත්තේය. පදභාජනයෙහි '**පිට්ඨසඞ්ඝාටස්ස සමන්තා හත්ථපාසා**' යමක් වදරනලදද, එහි යම් විහාරයක මැද දෙර වේද, මතු කොටසෙහි උස් බිත්තිය වේද, ඒ විහාරයෙහි තුන් දිසාවන්හි හාත්පසින් අත්පසින් උපචාරය වේ. කුඩා විහාරයෙක දෙදිසාවන්හි උපචාරයවේ. එහිද යම් කවුළුවක් හරිනු ලබන්නේ බිත්තිය පෙළාද, ඒ බිත්තිය හාත්පසින් කවුළුවෙහි පුළුල් පමණින් උපචාර රහිත හෙයින් නොපිරිපුන් උපචාර ඇත්තී වන්නීය. උත්කෘෂ්ටපරිච්ඡේදයෙන් වනාහි තෙදිසාවන්හි හාත්පසින් අත්පසන් දොර තිසලකරනු පිණිස ලෙපය අනුදන්නාලදී. ඉදින් දෙර යට කොටසෙහි ලෙපයට අවකාශයෙක් ඇත්තේද, එයද ආලෙපකිරීම වටියි. '**ආලොකසන්ධිපරිකම්මාය**' යන මෙහි ආලොකසන්ධි යනු ජනෙල්කවුළු කියනුලැබෙත්. ඒ ජනෙල් කවුළු හරින කාලයෙහි වියතක් පමණද, එයට වැඩිවූද බිතුපෙදෙස පහරත් මෙහි උපචාරය වනාහි සියලු දිසාවන්හි ලැබේ. එහෙයින් සියලු දිසාවන්හි කවුළුවෙහි පුළුල්පමණවූ අවකාශය ජනෙල්කවුළු පිරියම් පිණිස ආලෙප කටයුත්තේ හෝය. ආලෙප කරවිය යුත්තේ හෝයි, මෙහි මේ අදහස වේ. 'සෙතවණ්ණං' යනාදිය මාතෘකාපදභාජනය නොවේද, මෙයින් විහාරයෙහි බරබවෙක් නැත්තේයයි පදභාජනයෙම අනුදන්නා ලද්දේය. එහෙයින් මේ සියල්ල සුවසේ කටයුත්තේය.

මෙසේ ලෙපකර්මයෙහි යමක් කටයුතුද, එය දක්වා නැවැත පලයෙහි කටයුතු දක්වනු පිණිස 'ද්වත්තිච්ඡදනස්ස' යනාදිය කියනලද්දේය. එහි

'**ඡත්තිච්ඡදනස්සපරියායං**' සෙවනිය පිළිබඳ මතු මතු සෙවීම් වසයෙන් දෙතුන් වරක් වටකිරීමෙක් වටකිරීම පරියායයි කියනුලැබේ. වටකිරීම් දෙකක් හෝ වටකිරීම් තුනක් හෝ විධානය කටයුතුය යන අර්ථයි. '**අප්පහරිතෙ ඨිතෙන**' පුබ්බන්න අපරන්න නැති තන්හි සිටියහු විසින්. මෙහි සප්තවිධධාන්‍යප්‍රභෙද වූ පුබ්බන්නයද මුං, මෑ, තල, කොල්ලු, ලබු, කොමඩු ආදි ප්‍රභෙදවූ අපරන්නයද හරිතයි අදහස් කරනලදි. එහෙයින්ම 'හරිතං නාම පුබ්බන්නං අපරන්නං'යි කීහ. '**සචෙ හරිතෙ ඨිතො අධිට්ඨාති ආපත්ති දුක්කටස්ස**' මෙහි යම් කෙතක වපුළ බීජ ඒ තාක් නොසැපයේද වැසි වටකල්හි සැපයෙන්නේද, එද හරිතසඞ්ඛ්‍යාවටම යන්නේය. එහෙයින් මෙබඳු කෙතකද සිටියහු විසින් විධාන නොකටයුතුය. අහරිතයෙහිම සිටියහු විසින් විධානය කටයුතුය. එහිද මේ පිරිසිදීම වේ. ගෙයි මුදුන් පඝ හෝ කූටාගාරකණ්ණිකා නම්වූ මතු කොක්හි හෝ පසෙක හුන්නේ සෙවනි මුවවිට කෙළවරින් බලනුයේ යම් බිම්පෙදෙසෙක සිටියකු දකීද, යම් බිම් පෙදෙසෙක සිටියේ මතුවෙහි හුන් ඔහු දකීද, එතැන විධාන කටයුතුය. ඒ බිම්පෙදෙසෙහි ඇතුළත අහරිතයෙහිද සිට විධාන කිරීමට නොලබන්නේය. කුමක් හෙයින, යත්, වැටෙන්නාවූ විහාරය පිළිබඳ මේ වැටෙන්නාවූ අවකාශය වේද, එහෙයිනි. '**මග්ගෙන ඡාදෙන්තස්ස**' මෙහි මගින් වැසීම නම් වට නොකට ඍජුවම වැසීමය. ඒ වැසීම ගඩොල් ගල්සුණෙන් ලැබෙන්නේය. '**ද්වෙ මග්ගෙ අධිට්ඨහිත්වා**' ඉදින් සෙවනි දෙකක් නපුරු කොට වසනලද්දේ වේද, බැහැර කොටද නැවැත නැවැත වස්වාලන්නට ලබන්නේය. එහෙයින් කැමැතිසේ සෙවනිදෙකක් විධාන කොට තෙවන සෙවනිය 'දැන් මෙසේ වසව'යි අණවා යායුතුය. '**පරියායෙන**' පරික්ෂෙපයෙන් මෙසේ සෙවනිය තෘණ පර්ණයෙන් ලැබේ. එහෙයින් මෙහිද යම්සේ කැමැති වේද, එසේ දෙතුන් පරික්ෂෙපයක් සංවිධානය කොට තෙවන පරික්ෂෙපය 'දැන් මෙසේ සෙවෙලි කරව'යි අණවා යායුතුය. ඉදින් නොයේනම් නිහඬවූවකුව සිටියයුතුය. මේ සියලුම සෙවිලි පලය මතුවෙහි දතයුතුය. මතුමතු සෙවිලි කළ විහාරය බොහෝ කලක් නොතෙමේයයි. හභින්නාහු මෙසේ සෙවිලි කරත්. '**තතො චෙ උත්තරිං**' මාර්ගවශයෙන් සෙවිලි කළ ත්‍රිවිධ ඡදනයන්ගේ හෝ පරික්ෂෙපන්ගේ හෝ මතුවෙහි සිවුවන මගෙහි හෝ පරික්ෂෙපයෙහි හෝ '**කරළෙ කරළෙ**' තණමිටක් තණමිටක් පාසා, මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන මහල්ලකවිහාරශික්ෂාපදයයි

——\\——

දශමශික්ෂාපදයෙහි '**ජානං සප්පාණකං**' මේ ජලය තෙමේ පණුවන් සහිතය'යි යම් කිසි අයුරකින් දන්නේ. '**සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා**' ඒ ජලයෙන් තෙමේ හෝ ඉසින්නේය. අණවා අනිකකු ලවා හෝ ඉස්වන්නේය. මෙසේ කරන කරවන මහණහුට පාචිත්තිය වේ. පෙළෙහි වනාහි '**සිඤ්චෙය්‍යාති සයං සිඤ්චති**' යන මෙබඳු වචනයන්ගේ අර්ථය පෙර කියූ නයින්ම දතයුතුය. එහි දිය දහර නොසිඳ ඉසින මහණහුට එක් දිය කළයක් නිමිතිකොට එක්ම ඇවැතක් වේ. සියලු බඳුන්හි මෙම නය වේ. දියදහර සිඳින මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත් වේ. දිය ඇල තමා දෙසට හරවාද, දවසක් නමුදු ගලා යේවා, එක්ම ඇවැතක් වේ. ඉදින් ඒ ඒ තැන බැඳ අනික් අනික් තැනකින් පමුණුවාද, ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත් වේ. ගැලක් බර පමණනමුදු තණ එක් ප්‍රයොගයකින් දියෙහි බහාද, එක්ම ඇවැතක්වේ. එක් එක් තෘණයක් හෝ පත්‍රයක් හෝ දියෙහි බහන මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ඇවැත්වේ. මැටියෙහි හා අන් ලීදඬු ගොම ආදීන් අතුරෙහිද මෙම නයවේ. මේ තණමැටි බැහීම වනාහි මහත් ජලය සඳහා මාතෘකාවෙහිද 'තිණං වා මත්තිකං වා'යි මෙසේ අර්ථකථාවන්හිද කියනලදි. යම් ජලයක් තෘණයෙහි හෝ මැටියෙහි හෝ බැහීමෙන් දිය සිඳීමෙන් කෙළවරට යේද, කැළඹුනේ හෝ වේද, යම් තැනක පණුවෝ මැරෙත්ද, එබඳු ජලය සඳහා කියනලද්දේයයි දතයුතුය. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. කාය චිත්තයෙන්ද වාචාචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන සප්පාක ශික්ෂාපදයයි.
වර්ණනා ක්‍රමයෙන් දෙවනවූ සෙනාසනවර්ගීය සමාප්තය.

——\\——

භික්ෂුණීවර්ගීය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි '**ලාභිනො හොන්ති**' මෙහි මෙහෙණන්ට අවවාද කරන ඒ මහණුන්ට මෙහෙණෝ නොදෙත්. නොදෙවත්. මහත් කුලයන්ගෙන් නික්ම පැවිදි වූ කුලදුහිතෘහු 'ආර්‍ය්‍යී වෙති' කොතැනින් අවවාද උදෙසීම් පිළිවිසීම් ලබවුදැ'යි විචාරන්නාවූ තමන් වෙත පැමිණි නෑ මිනිසුන්ට 'අසුවල් අසුවල් ස්ථවිර' තෙමේ අවවාද කෙරේය'යි අසූ මහාසච්චන් උදෙසා 'ඒ ස්ථවිර තෙමේ කෙබඳු සිල් ඇත්තේද, කෙබඳු හැසිරීම් ඇත්තේද, කවර කුලයකින් නික්ම පැවිදි වූයේද යනාදි ලෙසින් විචාරන්නාවුන්ට පෘච්ඡාකථානුසාරයෙන් ඒ

මහතෙරුන්ගේ ශීලශ්‍රුත ආචාරජාති ගොත්‍රාදිභෙදවත් විද්‍යමාන ගුණ ප්‍රකාශ කෙරෙත්. මෙබඳුවූ විද්‍යමාන ගුණ පැවසීම වටියි. එයින් පහන් සිත් ඇති මිතිස්සු තෙරවරුන්ට චීවරාදීවූ මහත් ලාභසත්කාර එළවූහ. එහෙයින් 'ලාභිනො හොන්ති චීවර -පෙ- පරික්ඛාරානං'යි කියනලදී. **'භික්ඛුනියො උපසඞ්කමිත්වා'** ඒ ෂඩ්වර්ගිකභික්ෂූන් වෙතට ඒ මෙහෙණන් අතුරෙහි එක් මෙහෙණකුදු නොපැමිණේ. ලාභතෘෂ්ණාවෙන් අදිනු ලබන හෘදය ඇත්තාහු ඒ මෙහෙණන්ගේ වෙරෙහරට ගියහ. 'භික්ඛුනියො උපසඞ්කමිත්වා' යන ඒ සඳහා කියනලදී. ඒ මෙහෙණෝ සසලසිත් ඇති බැවින් ඒ ෂඩ්වර්ගික භික්ෂූන්ගේ වචනය කළාහුමය. එහෙයින් 'අථ ඛො තා භික්ඛුනියො -පෙ- නිසීදිංසු' යනු කියනලදී. **'තිරච්ඡානකථං'** සගමග ගමනෙහි පවා සරස්වූ රාජකථාදීවූ නන්වැදෑරුම් තිරශ්චීනකථා **'ඉදෙධා'** සමෘද්ධ වූයේද. අර්ථයෙන් යුක්ත වූයේද, අර්ථගාම්භීර්‍යයෙන් ගැඹුරුවූයේද අර්ථරසාදි බොහෝ රස ඇත්තේද ලක්ෂණ ප්‍රතිවෙධයෙන් යුක්තවූයේද යන අදහසය. **'අනුජානාමි භික්ඛවෙ'** මෙහි යම්හෙයකින් ඒ භික්ෂූහු 'මහණෙනි' තෙපි මෙහෙණන්ට අවවාද නොකරවු'යි කියනුලබන්නාහු නොදුටු, චතුසත්‍යය ඇති බැවින් තථාගතයන් වහන්සේ කෙරෙහි වෛර බැඳ අපායයට පැමිණෙන්නෝ වන්නාහුද, එහෙයින් ඔවුන්ගේ ඒ අපායයට පැමිණීම දුරුකරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ අනික්ම උපායයකින් ඒ ෂඩ්වර්ගික භික්ෂූන් මෙහෙණන්ට කරන අවවාදයෙන් බැහැර වූවත් කරනු කැමැතිසේක් මේ භික්ෂුණී ඔවාදක සම්මුතිය අනුදත්හ'යි දතයුතුය. මෙසේ මෙහි පරිබාහිරයන් කරනු කැමැති බැවින් අනුදැන මත්තෙහි පරිබාහිරයන් කරමින්ම **'අනුජානාමි භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතං'** යනාදිය වදාළ සේක. මේ අෂ්ටාඞ්ගයෝ ෂඩ්වර්ගික භික්ෂූන්ට සිහිනෙනුදු පෙර නොවූ විරූහ.

එහි ශිලය මේ මහණහුට ඇතැයි සීලවා නම. දැන් යම් ඒ ශීලයෙක් වේද, යම්සේ ඒ ශීලය ඔහුට ඇත්තේ නම් වේද, එය දක්වමින් **'පාතිමොක්ඛසංවරසංවුතො'** යනාදිය වදාළසේක. එහි චාරිත්‍රවාරිත්‍ර ශික්ෂාපද සඞ්ඛ්‍යාත ප්‍රාතිමොක්ෂයම සංවර වූයේ පාතිමොක්ඛසංවර නම්. ප්‍රාතිමොක්ෂසංවරයෙන් පිහිත කායවාග්ද්වාර ඇත්තේ එයින් සමන්වාගත වූයේයි පාතිමොක්ඛසංවරසංවුත නම්. **'විහරති'** ආත්මභාවය පවත්වන්නේය. ධ්‍යානවිභඞ්ගයෙහිද **'පාතිමොක්ඛං'** යනු ශීලයවේ. භික්ෂුශාසනයෙහි පිහිටානුයි ප්‍රතිෂ්ඨාව වේ. පූර්වොත්පත්තිවශයෙන් ආදිය වේ. නිවන්ගමනෙහි චරණය වේ. සංයමන විසින් සංයමයවේ. සංවරණ විසින් සංවරයවේ. චාතුර්භූමික කුශලයන්ට ශීලමුඛයෙන් වැද අර්ථසිද්ධිය සිදුකරන බැවින් මොක්ෂය වේ. චාතුර්භූමිකකුසලයන්ගේ ප්‍රතිලාභය පිණිස ප්‍රධාන වේයයි

මෙය වදරනලද්දේය. **'සංවරො'** යනු ත්‍රිවිධ කාය සුචරිතය නොඉක්මවීමය. චතුර්විධ වාක්සුචරිතය නොඉක්මවීමය. කායසුචරිතවචීසුචරිත නොඉක්මවීමය **'සංවුතො'** යනු මේ ප්‍රාතිමොක්ෂසංවරයෙන් යුක්තවූයේය. මොනවට යුක්තවූයේය. ප්‍රාතිමොක්ෂසංවරයට පැමිණියේය. මොනවට පැමිණියේය. උප්පන්න වේ. සමුප්පන්නවේ. සමන්වාතවේ. එහෙයින් 'පාතිමොක්ඛසංවර සංවුතැ'යි කියනු ලැබේ. 'විහරති' යනු චතුර්විධ ඊර්‍යාපථයන් අතුරෙහි එක්තරා එකෙක යෙදීමෙන් පවති. ඒ ඊර්‍යාපථ චතුෂ්කයෙන් කායසකට වර්තනයෙන් පවති. එක් ඊර්‍යා පථයක් අනික් ඊර්‍යාපථයකින් වළකා චිරස්ථිතක භාවයෙන් සිරුර රැකීමෙන් පාලනය කරයි. එක් ඊර්‍යාපථයෙක නොසිට සියලු ඊර්‍යාපථයන්හි පැවතීමෙන් තබයි. ඒ ඒ ඊර්‍යාපථයෙන් ඒ ඒ ලෙසින් සිරුර පැවැත්වීමෙන් සාපනය කරයි. බොහෝ කල් පැවැත්වීමෙන් හැසිරෙයි. ඊර්‍යාපථයෙන් ඊර්‍යාපථය සිඳහැර දිවි පවත්වන බැවින් වාසය කරයි. එහෙයින් **'විහරති'**යි කියනු ලැබේ. **'ආචාරගොචරසම්පන්නො'** මිථ්‍යාජිවය වළකන වෙළුදනාදියෙන් නොවූ ආචාරයෙන්ද, වෙශ්‍යාදි අගොචර හැසිරීම් හැර ශ්‍රද්ධාසම්පන්නකුලාදිය ඇසුරු කිරීම වූ ගොචරයෙන් යුක්තවූයේය. **'අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී'** ඝුලපමාත්‍ර වූ නොදැන පැමිණි සෙඛිය අකුසල චිත්තුප්පාදදි භෙද ඇති හැරියයුතු තන්හි භයවසයෙන් දක්නාසුලුව. ඒ හැරිය යුතු වරද භයවසයෙන් දක්නාසුලුවයයි කියනලද්දේවේ. **'සමාදය සික්ඛාපදෙසු'** අධිශීල ශික්ෂාදිභාවයෙන් ත්‍රිවිධ වූ ශික්ෂාපදයෙන්හි ඒ ඒ ශික්ෂාපදය දැඩිව ගෙණ මනාකොට ගෙණ මැනවින් ගෙණ අත් නොහරිමින් හික්මෙය යන අර්ථයි. මෙහි මේ කෙටිකථාය. යමෙක් විස්තර කැමැත්තේ නම් ඔහු විසින් **විශුද්ධිමාර්ගයෙන්** ගතයුතුය. බොහෝ වූ ශ්‍රුතසඞ්ඛ්‍යාත පර්‍යාප්තිය මොහටනුයි **බහුශ්‍රැත** නම. ව්‍රතදුඃඛය නසනු කැමැතියන්විසින් ඇසිය යුතු බැවින් ශ්‍රැත නම්වූ පර්‍යාප්තිය දරානුයි **සුතධර** නම. මොහු විසින් යම් ඒ පර්‍යාප්තියක් බොහෝ අසනලද නම්වේද, එය ශ්‍රුතමාත්‍රයෙක්ම නොවේ. තවද ඒ පර්‍යාප්තිය දරාය යන අර්ථයි. පෙට්ටියක ලූ රුවනක් මෙන් පර්‍යාප්තිය මොහු කෙරෙහි එක් පදයකුදු එක් අකුරකුදු නොනැසී රැස්ව සිටියේයි **සුතසන්නිචය** නම. මෙයින් හෙතෙමේ යම් පර්‍යාප්තියක් දරාද, ඒ පර්‍යාප්තිය පෙට්ටියක ලා රැක රැස් කොට තැබූ රුවනකගේ මෙන් බොහෝ කලක්ම නොනැසී පැවැත්ම දක්වාලන්නේය. දැන් ඒ ශ්‍රැතය ස්වරූපවශයෙන් දක්වන සේක්. **'යෙ තෙ ධම්මා'** යනාදිය වදළසේක. එය වෙරඤ්ජාකාණ්ඩයෙහි කියූ නයම වේ. මේ මෙහි නිගමනයයි. එබඳුවූවහු විසින් බොහෝ කොට අසනලද්දහු වෙත්ද, එහෙයින් බහුශ්‍රැතය. අසුවල් සූත්‍රය හෝ ජාතකය

හෝ කියවයි කියූ කල්හි එය උදුරා කියාද, එහෙයින් ශ්‍රුතධරය. වචනයෙන් පුරුදු කරනලද්දහුද, කොටස් වසයෙන් සිතන ලද්දහුද, දෘෂ්ටියෙන් මැනැවින් තතු ලෙසින් ප්‍රතිවෙධ කරන ලද්දහුද, එහෙයින් ශ්‍රුතසන්නිචය. එහි **'වචසා පරිචිතා'** වචනයෙන් පුහුණු කරනලදහ. **'මනසානුපෙක්ඛිතා'** සිතින් කොටස් වසයෙන් සිතනලදහ. ආවර්ජනය කරන්නහුට පහන් දහසකින් දල්වනලද්දහු මෙන් වෙත්. **'දිට්ඨියා සුප්පටිවිද්ධා'** අර්ථ විසින්ද කරුණු විසින්ද ප්‍රඥවෙන් මොනවට ප්‍රතිවෙධ කරනලදහ. මොනවට ප්‍රත්‍යක්ෂකරනලද්දහු වෙත්.

මේ බහුශ්‍රැත තෙමේ නිස්සයමුච්චනකය, පරිසුපට්ඨාකය, භික්ඛුනොවාදකයයි තෙවැදෑරුම් වේ. එහි නිස්සයමුච්චනකවූ උපසම්පත්තියෙන් පස්වස් ඇතියහු විසින් යටත් පිරිසයින් භික්ෂුභික්ෂුණී මාතිකා දෙක ප්‍රගුණ කළයුතුය. වාචොග්‍රත කළයුතුය. පක්ෂ දිනයන්හි දහම් ඇස්වීම පිණිස සූත්‍රපිටකයෙන් බණවර සතරක්ද, පැමිණියවුන්ට පරිකථනය පිණිස අන්ධකවින්ද මහාරාහුලොවාද අම්බට්ඨසූත්‍ර සමානවූ එක් කථාමාර්ගයක්ද. සඟබත් මගුල් අවමගුල්හි අනුමොදනා පිණිස සඟබත් ආදියෙහි දනානිසංස ප්‍රතිසංයුක්තවූ නිධිකණ්ඩ සූත්‍රාදි අනුමොදනා, ගෘහප්‍රවෙශ මඞ්ගලාදියෙහි මඞ්ගලසූත්‍රාදි අනුමොදනා, මතකභත්ත ආදි අවමඞ්ගලාදියෙහි තිරොකුඩ්ඩසූත්‍රාදි අනුමොදනා යන ත්‍රිවිධ අනුමොදනාද, උපොසථ පවාරණාදිය දැනගණු පිණිස කර්මාකර්මවිනිශ්චයද, මහණදහම් කරනු පිණිස සමාධිවශයෙන් හෝ විදර්ශනාවශයෙන් හෝ රහත්බව කෙළවර කොට ඇති එක් කර්මස්ථානයක්ද යන මෙපමණෙක් උගතයුතුය. මෙපමණකින්ම මෙතෙමේ බහුශ්‍රැත වේ. සිවු දිසාවෙහි නොපැකිළෙන ගමන් ඇති බැවින් සිවුදිසා ඇත්තේ වේ. තමන්ගේ ඓශ්චර්යයෙන් යම්කිසි තැනක වසන්නට ලබාද, පරිසුපට්ඨාපකවූ උපසම්පත්තියෙන් දසවස් ඇත්තහු විසින් යටත් පිරිසයින් පිරිස සියලු විනය පිටකයෙහි හික්මවන්නට භික්ෂු භික්ෂුණී විභඞ්ග දෙක ප්‍රගුණ කටයුතුය. වාචොග්‍රත කටයුතුය. නොහැක්කහු විසින් තුන් දෙනකුන් සමග හැදෑරීමට සුදුසුවූවාහු කටයුත්තාහ. කර්මාකර්මවිනිශ්චයද උගතයුතුය. කඳුවත්ද උගතයුතුය. පිරිස නාමරූප පරිච්ඡෙදයෙහි හික්මවනු පිණිස ඉදින් **මද්ධ්‍යම භාණකයෙක්** වේ නම්, මූලපණ්ණාසකය උගතයුතුය. **දීඝභාණකයා** විසින් මහාවග්ගය උගතයුතුය. **සංයුක්තභාණකයා** විසින් මහාවග්ගයෙන් යට හෝ සගාථකවග්ග නිදනවග්ග ඛන්ධකවග්ග යන තෙවග හෝ උගත යුතුය. අඞ්ගුත්තර භාණකයා විසින් යට හෝ මතුවෙහි හෝ අර්ධනිකායයක් උගතයුතුය. නොහැක්කහු විසින් තිකනිපාතය පටන් යට එකකනිපාත දුකනිපාත උගෙණීම වටියි. **මහාපච්චරියෙහි** වනාහි එක් නිපාතයක්

උගත්නහු විසින් චතුක්කනිපාතය හෝ පංචකනිපාතය හෝ උගතයුතුයයි කියනලදී. ජාතකභාණකයා විසින් අට්ඨකථා සහිත වූ ජාතකය උගතයුතුය. ඉන් මෙපිට උගෙණීම නොවටියි. **ධම්මපදයද** වස්තූන් සහිතව උගතයුතුයයි **මහාපච්චරියෙහි** කියනලදී. ඒ ඒ තැනින් එක් රැස් කොට මූලපණ්ණාසකය තරම් වටීද, නොවටීද, යත්: නොවටීයයි කුරුන්දි අට්ඨකථාවෙහි ප්‍රතික්ෂෙප කරනලදී. අන් තන්හි විචාරීමෙක්ම නැත්තේය. අභිධර්මයෙහි කිසිවක් ගතයුතුයයි නොකියනලදී. යමක්හට වනාහි අර්ථ කථා සහිතවූම විනයපිටකයද අභිධර්මපිටකයද ප්‍රගුණවේද සූත්‍රාන්තයෙහිද කියූ අයුරු ඇති ග්‍රන්ථයෙක් ප්‍රගුණවූයේ නොවේද, හෙතෙමේ පිරිසලවා උවැටැන් කරවන්නට නොලබයි. යම් මහණකු විසින් සූත්‍රාන්තයෙන් හා විනයයෙන්ද කියූ පමණැති ග්‍රන්ථයෙක් උගන්නාලද්දේද මෙතෙමේ පරිෂ්පට්ඨාපක බහුස්සුත නම්වේ. දිසාපාමොක්කවේ. යම්කිසි දිසාවෙක කැමැතිසේ පවත්නේ වේ. පිරිස ලවා උවැටැන් කරවා ගන්නට ලබන්නේය. භික්ෂුණීන්ට අවවාද කරන මහණහු විසින් අට්ඨකථා සහිතවූ ත්‍රිපිටකය උගතයුතුය. නොහැකිවන්නහු විසින් සිවු නිකායයන් අතුරෙහි එක් නිකායයක අට්ඨකථාව ප්‍රගුණකටයුතුය. එක් නිකායයක් ඉගෙණීමෙන් සෙසු නිකායයන්හිද, ප්‍රශ්ණ විසදන්නට හැකිවන්නේය. සප්තප්‍රකරණයන් අතුරෙහි ප්‍රකරණසතරක අට්ඨකථාව ප්‍රගුණ කටයුතුය. එහි ලද නයින් සෙසු ප්‍රකරණයන්හිද ප්‍රශ්ණ විසදන්නට හැකිවන්නේය. විනයපිටකය වනාහි නොයෙක් අර්ථ ඇත්තේය. නොයෙක් කරුණු ඇත්තේය. එහෙයින් එය අට්ඨකථාව සමග ප්‍රගුණ කටයුතුමය. මෙපමණකින් භික්ඛුණොවාදක බහුස්සුතවේ.

**'උභයානි ඛො පනස්ස'** යනාදිය වනාහි යම්හෙයකින් අන්‍ය වූ සියලු නවාඞ්ගයෙහි බහුශ්‍රැතභාවය ඇතිකල්හි අට්ඨකථා සහිතවූ විනයපිටකය හැර නොම වටීද එහෙයින් වෙන්ව කියනලද්දේය. එහි **'විත්ථාරෙන'** භික්ෂු භික්ෂුණී විභඞ්ග දෙක සමග, **'ස්වාගතානි'** මැනැවින් දන්නාලදහ. යම්සේ දන්නාලද්දහු මැනැවින් දන්නාලද්දහු වෙත්ද, එය දක්වන්නට 'සුවිභත්තානි' යනාදිය කියනලදී. එහි **'සුවිභත්තානි'** මැනවින් විභාගකරන ලදහ. පදපිළිවෙළ වැරදවීමෙන් වන සඞ්කරදෙස රහිතයහ. **'සුප්පවත්තිනී'** ප්‍රගුණවූවාහුය. වාචොග්ගතවූවාහුය. **'සුවිනිච්ඡිතානි සුත්තසො'** ඛන්ධකයෙන් හා පරිවාරයෙන් ගෙණහැර දක්විය යුතු සූත්‍රවශයෙන් මැනැවින් විනිශ්චය කරනලදහ. **'අනුබ්‍යඤ්ජනසො'** අක්ෂරපද පරිපූර්ණත්වයෙන්ද මැනැවින් විනිශ්චය කරනලදහ. කඩනොවූහ. විපරීත නොවූ අක්ෂර ඇතියහ. මෙයින් අට්ඨකථා තොමෝ දක්වනලද්දීය. අට්ඨකථාවෙන්ම මේ විනිශ්චයවේ. **'කල්‍යාණවාචො'** සිථිලධනිතාදීන්ගේ

විධානපරිදි කීමෙන් ස්ථාන කරණ සම්පත්තියෙන් හා ශික්ෂාසම්පත්තියෙන් කිසි තැනකුදු අනූන බැවින් පරිපූර්ණවූ පද හා අක්ෂර ඇති පිත්සෙම් ආදියෙන් නොපෙළෙනලද අශිස්‍රතාදිභෙදදොෂ රහිතවූ කෙළතොලු නොවූ මුල මැද අග ප්‍රකට කොට කියනලද අර්ථය අවබොධ කරවිය යුතුවූ ගුණපරිපූර්ණභාවයෙන් පිරීසිටියාවූ ප්‍රිය වචනයෙන් යුක්තවූයේය. ‘**කල්‍යාණවාක්කරණො**’ මිහිරිහඬ ඇත්තේය. මාගම වනාහි ස්වරසම්පත්තියෙහි ඇලුනේය. එහෙයින් ස්වරසම්පත්තියෙන් තොරවූ පරිපූර්ණ පදබ්‍යඤ්ජනයෙන් යුක්තවචනයට නින්ද කරයි. ‘**යෙභුය්‍යෙන භික්ඛුනීනං පියො හොති මනාපො**’ සියලු මෙහෙණන්හට ප්‍රියයෙක් නම් දුර්ලභවේ. ඉතා බොහෝවූ නුවණැති මෙහෙණන්ට ශීලාචාරසම්පත් හෙතු කොට ප්‍රිය වේ.’ මනවඩන්නේ වේ. ‘**පටිබලො හොති භික්ඛුනියො ඔවදිතුං**’ යුක්තිය ද කාරණයද දක්වමින් යොවුන් මදදියෙන් මත්වූ මෙහෙණන් සසරබියෙන් තැති ගන්වා මෙහෙණන්ට අවවාද කරන්නට, එබඳුදහම් දෙසන්නට සමර්ථ වේද. ‘**කාසායවත්ථවසනාය**’ කසටවත් හැන්දවූ ‘**ගරුධම්මං**’ ගිහිකල මෙහෙණක සමග කායසංසග්ගියකට හෝ ශික්ෂමාණා සාමණේරීන් කෙරෙහි මෙවුන්දමට හෝ පෙර නොපැමිණියේවේද, මාගම වනාහි පෙර කරනලද්ද සිහි කරමින් සංවරයෙහි සිටියහුගේද, ධර්මදෙශනාවට ගෞරව නොකරයි. තවද පෙර කළ ඒ අසද්ධර්මයෙහි සිත උපදවයි. ‘**වීසතිවස්සො වා**’ උපසම්පත්තියෙන් විසිවයස් ඇත්තේ හෝ එයට වැඩි වයස් ඇත්තේ හෝ මෙබඳුවූ විසභාග වස්තූන් හා නැවැත නැවැත එක්වනුයේද ලදරුවකු මෙන් වහා ශීලවිනාශයට නොපැමිණෙයි. තමන්ගේ වයස බලා නොසුදුසු තන්හි ඡන්දරාගය දුරු කරන්නට ප්‍රතිබල ඇත්තේවේද, එහෙයින් **වීසතිවස්සො වා හොති අතිරෙකවීසතිවස්සො වා’යි** වදරන ලද්දේය. මෙහිද ‘සීලවා’ යනාදිය එක් අඞ්ගයෙකි. ‘බහුස්සුතො හොති’ යනාදිය දෙවන අඞ්ගය වේ. ‘උභයානි ඛො පනස්ස’ යනාදිය තෙවන අඞ්ගයවේ. ‘කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො’ යනාදිය සිවුවන අඞ්ගයවේ. ‘යෙභුය්‍යෙන භික්ඛුණීනං පියො හොති මනාපො’ යනු පස්වන අඞ්ගය වේ. ‘පටිබලො හොති භික්ඛුණියො ඔවදිතුං’ යනු සවන අඞ්ගය වේ. න ඛො පනෙතං’ යනාදිය සත්වන අඞ්ගය වේ. ‘වීසතිවස්සො’ යනාදිය අටවන අඞ්ගය වේයයි දතයුතුය.

‘**ඤත්තිචතුත්ථෙන**’ පෙර වස්තුවෙහි කියනලද්දවූම කර්මයෙන්. ‘**ගරුධම්මෙහි**’ ගරුකධර්මයන්ගෙන් ඒ ධර්මයෝ ගෞරවකොට මෙහෙණක් විසින් පිළිගතයුතු බැවින් ගරුධර්මැයි කියනු ලැබෙත් ‘**එකතො උපසම්පන්නාය**’ මෙහි මෙහෙණන්ගේ සමීපයෙහි එක් පසකින් උපසපන් මෙහෙණක් කෙරෙහි යම් මහණෙක් තෙමේ ගරුධර්මයෙන් අවවාද කෙරේද,

ඒ මහණහුට දුක්කටය වේ. මහණුන් සමීපයෙහි උපසපන් මෙහෙණක්හට දහම් දෙසන මහණහුට යථාවස්තුකම වේ. හෙවත් පාචිත්තියමවේ. **'පරිවෙණං සම්මජ්ජිත්වා'** ඉදින් උදෑසන නොහමදිනලද්ද වූ හෝ හමදින ලද්දවූ හෝ පිරිවෙන් බිම නැවැත තණ පත් ආදියෙන් කසළින් ගැවසුනේද පාපහරින් විසුරුනු වැලි ඇත්තේ වීනම්, හැමදිය යුතුය. නොහමදිනලද එතැන දැක 'ආයඝීයන් වහන්සේ තමන්ගේ ඇසුරෙහි සිටි ලදරු මහණුන් වත්පිළිවෙත්හි නොයොදන්නෝය, ධර්‍මයම කියන්නාහ'යි ඒ මෙහෙණෝ නොඅසතු කැමැත්තියන් මෙන් වන්නාහුය. එහෙයින් 'පරිවෙණං සම්මජ්ජිත්වා'යි කියනලදී ඇතුළු ගමින් වනාහි එන මෙහෙණෝ හටගත් පිපාසා ඇත්තාහුද වෙහෙසට පත්වූවාහුද වෙත්. ඒ මෙහෙණෝ පැන්ද අත්පාමුව සිහිල් කිරීමද බලාපොරොත්තු වෙත්. ඒ නැති කල්හි පෙර කියූ ලෙසින්ම අගෞරව උපදවා නොඅසතු කැමැත්තාහුද වෙත්, එහෙයින් **'පානීයං පරිභොජනීයං උපට්ඨපෙත්වා'**යි කියනලදී. **'ආසනං'** මිටි පුටු පුවරුතටු කළාල් ආදී හෙදවත් ආසනය. යටත් පිරිසයින් අතුරිකිළිද ඒ මෙහෙණන්ට මේ ආසනය වන්නේයයි මෙසේ අසනක් පණවා දහම් දෙසීමෙන් වන ඇවැතින් මිදීම පිණිස දෙවැන්නෙක් කැමැතිවිය යුතුය. එහෙයින් **'දුතියං ගහෙත්වා නිසීදිතබ්බං'**යි කියනලදී. වෙහෙර කෙළවර නොහිඳිය යුතුය. එහෙත් වෙහෙරමැද හෝ පොහෝගෙයි දෙරකඩ හෝ බොජුන්හලෙහි දෙරකඩ හෝ සියල්ලන් රැස්වන තැනක හිඳිය යුතුය.

**'සමග්ගත්ථා'** සියලු මෙහෙණෝ ආවාහුය යන අර්ථයි. **'වත්තන්ති'** එන්නාහුය. ප්‍රගුණවූවාහු, වාචොදගතවූවාහු යන අර්ථයි **'නීයාදෙතබ්බො'** කැඳවිය යුතුය. **'ඔසාරෙතබ්බො'**යි පෙළ කියයුතුය. **'වස්සසතූපසම්පන්නාය'** යනාදිය කියයුතු පෙළ දැක්වීමය. එහි **'සාමීචිකම්මං'** මගදීම විජනිපත සැලීම, පැනින් විචාරීම යනාදීවූ සුදුසුවත්. මෙහිද මෙහෙණ විසින් මහණහුට වැඳීම නම්, ඇතුළු ගමෙහි දී හෝ ගමෙන් පිටතදී හෝ වෙහෙර තුළදී හෝ වෙහෙරෙන් පිටතදී හෝ ගේතුළදී හෝ වීථියෙහිදී හෝ යටත් පිරිසයින් රජුන් පිළිබඳ උත්සවයන් පවත්නා කල්හිද වැසි වස්නා කල්හි මඩසහිත බිමැ ඡත්‍රපත්‍ර ගත් අත් ඇත්තිය විසිතුදු ඇත් ඇස් ආදීන් විසින් ලුහුබඳින ලද්දිය විසිතුදු කළ යුතුමය. එකට පෙළ ගැසී පිඬු පිණිස හැසිරෙන්නවුන් දක. එක් තැනක හිඳ, 'ආයඝීයෙනි' වඳිමි'යි වැඳිය යුතුය. අතර අතර දොළොස් රියනක් හැර යෙත්ද, වෙන් වෙන්ව වැඳිය යුත්තාහ. මහාජන රැස්වීමෙක හුන් කල්හි එක්ම තැනක හිඳ වැඳිම කළ යුතුය. අඤ්ජලිකර්‍මයෙහිද මේ නයවේ. යම් කිසි තැනක හුන් මෙහෙණ විසින් දැක හුනස්නෙන් නැගීසිටීම කටයුතුය. ඒ ඒ සාමීචිකර්‍මයට සුදුසු දේසයෙහිද කාලයෙහිද ඒ ඒ සාමීචිකර්‍ම කටයුතුය.

**'සක්කත්වා'** යම්සේ කරනලද්දේ. මැනැවින් කරනලද්දේවේද, එසේ කොට. **'ගරුකත්වා'** එහි ගෞරව උපදවා **'මානෙත්වා'** සිතින් ප්‍රියකොට **'පූජෙත්වා'** මේ ත්‍රිවිධකෘත්‍ය කරණයෙන් පුද. **'අනතික්කමනීයො'** නොඉක්මවිය යුත්තේය.

**'අභික්ඛුකෙ ආවාසෙ'** මෙහි මෙහෙණඅසපුවෙන් අඩයොදුනක් තුළ ඔවදන් දෙන මහණෝ නොවසත්ද, මේ අභික්ෂුක ආවාස නම්වේ. මෙහි වස් නොවිසිය යුතුය. 'අභික්ඛුකො නාම ආවාසො න සක්කා හොති ඔවාදය වා සංවාසාය වා ගන්තුං'යි මෙය වදරන ලද්දේමය. ඉන් ඈත පසුබතෙහි ගොස් ධර්‍මය අසා එන්නට නොහැක්කේද, ඉදින් එහි වස් වසන්නට නොකැමැතිවූ මෙහෙණන්ට නෑයෝ හෝ උවැටැන් කරන්නෝ හෝ 'ආයර්‍යවෙනි' වසනු මැනැව, අපි මහණකු ගෙණ එන්නෙමු'යි මෙසේ කියත් නම්, වටියි. කියූ පමණැති පෙදෙසෙහි වස් එළැඹෙනු කැමැති මහණෝ අවුත් අතුමඩුවෙක්හි නමුදු එක් රැයක් විසූවාහු වෙත්ද, නිමන්ත්‍රණය නොකරන ලදුව යනු කැමැත්තාහුද, මෙපමණකිනුදු සභික්ෂුක ආවාසය වේ. එහි වස් එළැඹෙන්නට වටියි. වස් එළැඹෙන්නියන් විසිනුදු පක්ෂය පිළිබඳ තෙළෙස්වන දිනයෙහි 'ආයර්‍යයෙනි' අපි ඔබ වහන්සේලාගේ අවවාදයෙන් වසන්නෙමු'යි භික්ෂූහු යාඥ කටයුත්තාහ. යම් මෙහෙණ අසපුවකින් ඍජුමාර්‍ගයෙන් යන්නාවූ මෙහෙණන්ගේ ජීවිතයට අනතුරෙක් හෝ බ්‍රහ්මචර්‍යයට අනතුරෙක් හෝ වේද, අන් මගකින් යන්නාවූ මෙහෙණන්හට අඩයොදුනෙන් වැඩියෙක් වේද, මේ ආවාසය තෙමේ අභික්ෂුකාවාස ස්ථානයෙහිම සිටියි. එයින් ගව්වක් පමණ තැන නිර්‍භයස්ථානයෙක අන් මෙහෙණවරෙක් වේද, ඒ මෙහෙණන් විසින් ඒ මෙහෙණීහු යාඥකොට නැවැත ගොස් 'ආයර්‍යයෙනි' ඍජුමාර්‍ගයෙහි අපට අන්තරාය ඇත්තේය. අන් මගින් අතිරෙක අර්‍ධයොජනයෙක් වේ. අතරමග අපගේ අසපුවෙන් ගව්වක් පමණ තැන අන් මෙහෙණ අසපුවෙක් ඇත්තේය, ආයර්‍යයන්ගේ සමීපයෙන් එහි පැමිණි අවවාදයෙන් වසන්නෙමු'යි භික්ෂූහු යාඥ කටයුත්තාහුය. ඒ භික්ෂූන් විසින් පිළිගතයුතුය. ඉන්පසු ඒ මෙහෙණන් විසින් ඒ මෙහෙණ අසපුවට අවුත් පොහොය කටයුතුය. ඒ මෙහෙණන් දැක හෝ තමාගේ අසපුවටම අවුත් පොහොය කිරීම වටියි. ඉදින් වස් එළෙඹෙනු කැමැති භික්ෂූහු තුදුස්වකෙහි වෙහෙරට එත්ද, මෙහෙණන් විසින්ද 'මෙහි ආයර්‍යයෝ වස් වසන්නහුදැයි විචාරනලද්දහු 'එසේය'යි කියා නැවැත ඒ මෙහෙණන් විසින් 'එසේවීනම් ආයර්‍යයෙනි' අපිදු ඔබවහන්සේලාගේ අවවාදය අනුව ජීවත් වන්නමෝ වසන්නෙමු'යි කියනලද්දහු දෙවන දිනයෙහි ගමෙහි භික්ෂාචාරසම්පත්තිය නොදක්නෝ 'මෙහි වසන්නට නොහැක්කම්හ'යි බැහැරයෙත්ද, නැවැත ඒ මෙහෙණෝ

උපොසථදිනයෙහි විහාරයට ගියාහු භික්ෂූන් නොදකිත්ද, එකල්හි මෙහි කුමක් කටයුතුද, යත්: යම් තැනක භික්ෂූහු වසත්ද, එහි ගොස් පසුවස් එළැඹිය යුතුය. පසුවස් එළැඹීමට එන්නාහුයයි හෝ කල්පනා කොට ආවුන්ගේ සමීපයෙහි අවවාදයෙන් විසිය යුතුය. ඉදින් පසුවස් පිණිසද කිසි කෙනෙක් නොඑත්ද, අතරමගද රජබියෙක් හෝ සොරබියෙක් හෝ දුර්භික්ෂයෙක් හෝ වේද, අභික්ෂුකා වාසයෙහි වසන්නියට ඇවැත්වේ. වස් සිඳීම කොට යන්නියටද ඇවැත්වේ. ඕතොමෝ රැකියයුතුය. විපත් ඇති කල්හි අභික්ෂුකාවාසයෙහි වසන්නියට අනාපත්තිය කියනලදී. ඉදින් අවුත් වස් එළැඹි භික්ෂූහු නැවැත කිසි කරුණක් හෙතුකොට බැහැර යෙත්ද, විසියයුතුමය. 'අනාපත්ති වස්සූපගතා භික්ඛූ පක්කන්තා වා හොන්ති විබ්භන්තා වා කාලකතා වා පක්ඛසඞ්කන්තා වා ආපදසු උම්මත්තිකාය ආදිකම්මිකාය' යන මෙය වදරන ලද්දේමය. පවරන්නිය විසිනුදු යම් තැනක භික්ෂූහු ඇත්තාහුද එහි ගොස් පැවරිය යුතුය.

**'අන්වද්ධමාසං'** අඩමසක් අඩමසක් පාසා **'ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා'** ධර්ම දෙකක් කැමැති වියයුතුය. **'උපොසථපුච්ඡකං'** පොහොය විචාරීමය. එහි පසළොස්වක් පොහොයෙහි පක්ෂය පිළිබඳ තුදුස්වකෙහි තෙළෙස්වක් පොහොයෙහි ගොස් පොහොය විචාළයුතුය. **මහාපච්චරියෙහි** වනාහි පක්ෂය පිළිබඳ තෙළෙස්වක්හිම ගොස් 'මේ පොහොය තුදුස්වකද පසළොස්වකදැයි විචාළ යුතුයයි. කියනලදී. පොහොය දිනයෙහි අවවාදය පිණිස එළැඹිය යුතුය. පැළවිය දින පටන් ධර්මශ්‍රවණය පිණිස යායුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අන්‍ය කර්මයකට අවකාශ නොදී නිරතුරුව මෙහෙණන්හට මහණුන්ගේ සමීපයට යෑමම පැනවූ සේක. කුමක් හෙයින, යත්:- මාගම මඳ නුවණැති බැවිනි. මාගම මඳ නුවණැත්තේමය. මාගමට නිතර බණ ඇසීම බොහෝ උපකාරවේ. මෙසේ ඇති කල්හි 'අපි යමක් දනිමුද, ආයර්‍යයන් වහන්සේත් එයම දනිතැ'යි මානය නොකොට භික්ෂු සඞ්ඝයා පයිරුපාසනය කරමින් පැවිද්ද සාත්ථක කරන්නාහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ කළසේක. මෙහෙණෝද අවවාද පරිදි පිළිපදින්නෙමු'යි සියල්ලෝම නිරතුරුව වෙහෙරට එළැඹියාහුය. 'තෙන ඛො පන සමයෙන සබ්බො භික්ඛුණිසඞ්ඝො ඔවාදං ගච්ඡති, මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ජායායො ඉමා ඉමෙසං, ජාරියො ඉමා ඉමෙසං ඉදානි, මෙ ඉමාහි සද්ධිං අභිරමිස්සන්තීති භගවතො එතමත්ථං ආරොචෙසුං, න භික්ඛවෙ සබ්බෙන භික්ඛුණී සඞ්ඝෙන ඔවාදෙ ගන්තබ්බො ගච්ඡෙය්‍ය චෙ ආපත්ති දුක්කටස්ස, අනුජානාමි භික්ඛවෙ, චතූහි පඤ්චහි භික්ඛුණීහි ඔවාදං ගන්තුන්ති' මේ වදරන ලද්දේමය. නැවැත එසේම අවමන් කළහ. නැවැත භාග්‍යවතුන්

වහන්සේ 'අනුජානාමි භික්ඛවෙ 'දෙව තිසෙසා භික්ඛුණීහි ඔවාදං ගන්තුං'යි වදළ සේක. එහෙයින් භික්ෂුණීසඞ්ඝයා විසින් දෙතුන් මෙහෙණිහු යාඥ කොට යැවිය යුත්තාහ. 'ආය්‍යාවෙනි එවු, භික්ෂුසඞ්ඝයා වෙතට අවවාදය පිණිස එළැඹීම ඉල්ලවු, ආය්‍යියෙනි' භික්ෂුණී සඞ්ඝ තෙමේ භික්ෂුසඞ්ඝයාගේ පා වදියි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ආය්‍යියෙනි' භික්ෂුණී සඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාවා'යි ඒ මෙහෙණින් විසින් ආරාමයට යායුතුය. ඉන්පසු අවවාද පිළිගන්නා එක් මහණකු කරා එළැඹැ වැඳ ඒ මහණතෙමේ එක් මෙහෙණක විසින් 'ආය්‍යිය', භික්ෂුණීසඞ්ඝ තෙමේ භික්ෂුසඞ්ඝයාගේ පා වදියි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ආය්‍යිය' භික්ෂුණී සඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාවා'යි මෙසේ කියයුතු වන්නේය. ඒ මහණහු විසින් පාමොක් උදෙසන මහණහු වෙත එළැඹැ 'ස්වාමීනි', භික්ෂුණීසඞ්ඝ තෙමේ භික්ෂුසඞ්ඝයාගේ පා වදියි, අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ස්වාමීනි', භික්ෂුණී සඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාවා'යි මෙසේ කියයුතු වන්නේය. පාමොක් උදෙසන මහණහු විසින් 'සම්මත කරනලද භික්ඛුණොවාදකවූ කිසි මහණෙක් ඇත්තේදැයි විචාළයුතුය. ඉදින් සම්මත කරනලද භික්ඛුණොවාදක වූ කිසි මහණෙක් වේද, පාමොක් උදෙසන මහණහු විසින් 'මෙනම් ඇති මහණ තෙමේ භික්ඛුණොවාදකයි සම්මත කරනලද්දේය. භික්ෂුණීසඞ්ඝ තෙමේ ඔහු වෙත එළෙඹේවා'යි කියයුතුය. ඉදින් කිසි මහණෙක් භික්ඛුණොවාදකැයි සම්මත නොකරනලද්දේවේද, පාමාක් උදෙසන මහණහු විසින්, 'කවර නම් ආයුෂ්මත් තෙමේ මෙහෙණින්හට අවවාද කරන්නට උත්සාහ කෙරේදැයි විචාළ යුතුය. ඉදින් කිසිවෙක් මෙහෙණින්හට අවවාද කරන්නට උත්සාහ කෙරේනම් ඒ මහණතෙමේ අටගින් සමන්වාගත වේද, ඔහු සම්මත කොට 'මෙනම් ඇති මහණ තෙමේ මෙහෙණින්හට අවවාද කරනු පිණිස සම්මත කරනලද්දේය. භික්ෂුණීසඞ්ඝ තෙමේ ඔහු වෙත එළැඹේවා'යි කියයුතුය. ඉදින් කිසි මහණෙක් තෙමේ මෙහෙණින්හට අවවාද කරන්නට උත්සාහ නොකෙරේද, පාමොක් උදෙසන්නහු විසින් සම්මත කරනලදද භික්ඛුණොවාදකවූ කිසි මහණෙක් නැත්තේය, ප්‍රසාදජනක නිර්දෝෂවූ කායකර්මාදියෙන් භික්ෂුණී සඞ්ඝ තෙමේ ත්‍රිවිධ ශික්ෂාව සම්පාදනය කෙරේවා'යි කියයුතුය. මෙපමණකින් සියලුම ශික්ෂාත්‍රය ඇතුළත් ශාසනය සැලකරනලද්දේ වේ. ඒ මහණහු විසින් 'මැනැවැ'යි පිළිගෙණ පැළවිය දිනයෙහි මෙහෙණින්හට සැලකළයුතුය. භික්ෂුණී සඞ්ඝයා විසිනුදු 'ආය්‍යාවෙනි' යවු, ආය්‍යිය භික්ෂුණීසඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම කිම, ලබාදැ'යි විචාරවු'යි ඒ මෙහෙණෝ යැවිය යුත්තාහුය. ඒ මෙහෙණින් විසින් 'ආය්‍යාවෙනි' යහපතැයි පිළිගෙණ ආරාමයට ගොස්

ඒ මහණහු වෙත එළැඹැ 'ආයෲය' කිම, භික්‍ෂුණී සඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාදැ'යි මෙසේ කියයුතුය. ඒ මහණහු විසින් සම්මත කරනලද භික්‍ෂුණොවාදකවූ මහණෙක් නැත්තේය, භික්‍ෂුණී සඞ්ඝ තෙමේ ප්‍රසාදජනක නිද්‍රෝෂවූ කායකර්‍මාදියෙන් ත්‍රිවිධ ශික්‍ෂාව සම්පාදනය කෙරේවා'යි කිය යුතුය. ඒ මෙහෙණත් විසින් 'ආයෲය' මැනැවැ'යි පිළිගතයුතුය. එකට ආවුන්ගේ වසයෙන් මේ කියනලදී. ඒ මෙහෙණන් අතුරෙහි එක් මෙහෙණක විසින් කියයුත්තේද වේ. පිළිගත යුත්තේද වේ. අන් මෙහෙණෝ ඒ මෙහෙණගේ යහළු මෙහෙණෝය. භික්‍ෂුසඞ්ඝ තෙමේ හෝ භික්‍ෂුණීසඞ්ඝ තෙමේ හෝ දෙපසින්ම නොපිරේද, ගණමාත්‍රයක්ම හෝ පුද්ගලමාත්‍රයක් හෝ වේද, එක් මෙහෙණක් හෝ බොහෝ අසපුවැසියන් විසින් අවවාද පිණිස යවනලද්දීවේද, එහි මේ මතු කියන්නේ වචනක්‍රමයයි.

'ආයෲය' මෙහෙණෝ භික්‍ෂුසඞ්ඝයාගේ පාවදිත්. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලත්. ආයෲය මෙහෙණෝ අවවාදය පිණිස එළැඹීම ලබත්වා. ආයෲය' මම භික්‍ෂුසඞ්ඝයාගේ පා වදිමි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලමි. ආයෲය' මම අවවාදය පිණිස එළැඹීම ලබමි. ආයෲය' භික්‍ෂුණීසඞ්ඝ තෙමේ ආයෲයන්ගේ පා වදියි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ආයෲය' භික්‍ෂුණීසඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාවා. ආයෲය 'මෙහෙණෝ ආයෲයන්ගේ පා වදිත්. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලත්. ආයෲය මෙහෙණෝ අවවාදය පිණිස එළැඹීම ලබත්වා. ආයෲය, මම ආයෲයන්ගේ පා වදිමි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලමි. ආයෲය, මම අවවාදය පිණිස එළැඹීම ලබමි. ආයෲය, භික්‍ෂුණී සඞ්ඝ තෙමේ ආයෲයාගේ පා වදියි. අවවාදය පිණිස එළැඹීමද ඉලයි. ආයෲය, භික්‍ෂුණීසඞ්ඝ තෙමේ අවවාදය පිණිස එළැඹීම ලබාවා. ආයෲය, මෙහෙණෝ ආයෲයාගේ පා වදිත්. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලත්. ආයෲය, මෙහෙණෝ අවවාදය පිණිස එළැඹීම ලබත්වා. ආයෲය', මම ආයෲයාගේ පා වදිමි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලමි. ආයෲය' මම අවවාදය පිණිස එළැඹීම ලබමි. ආයෲය', භික්‍ෂුණීසඞ්ඝ තෙමේද, මෙහෙණෝද මෙහෙණද, භික්‍ෂුසඞ්ඝයාගේ ආයෲයන්ගේ ආයෲයාගේ පා වදියි. වදිත්, අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ඉල්ලත් ආයෲය භික්‍ෂුණී සඞ්ඝ තෙමේද, මෙහෙණෝද මෙහෙණද අවවාදය පිණිස එළැඹීම ලබාවා. ලබත්වා. ලබාවායි. ඒ මහණහු විසිනුදු උපොසථකාලයෙහි 'ස්වාමීනි' මෙහෙණෝ භික්‍ෂු සඞ්ඝයාගේ පා වදිත්. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලත්. ස්වාමීනි, මෙහෙණෝ අවවාදය පිණිස එළැඹීම ලබත්වා. ස්වාමීනි, 'මෙහෙණ තොමෝ භික්‍ෂුසඞ්ඝයාගේ පා වදියි. අවවාදය පිණිස එළැඹීමද

ඉල්ලයි. ස්වාමීනි', මෙහෙණ තොමෝ අවවාදය පිණිස එළැඹීම ලබාවා. ස්වාමීනි' භික්ෂුණීසඞ්ඝ තෙමේ ස්වාමීනි' මෙහෙණෝ - ස්වාමීනි' මෙහෙණ තොමෝ ආයුෂ්මතුන්ගේ පා වඳියි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ස්වාමීනි 'මෙහෙණ තොමෝ අවවාදය පිණිස එළැඹීම ලබාවා. ස්වාමීනි භික්ෂුණී සඞ්ඝ තෙමේද මෙහෙණෝද මෙහෙණද සඞ්ඝයාගේද ආයුෂ්මතුන්ගේද පා වඳියි. වඳිත් වඳියි. අවවාදය පිණිස එළැඹීමද ඉල්ලයි. ඉල්ලත්. ස්වාමීනි', භික්ෂුණීසඞ්ඝ තෙමේද, මෙහෙණෝද, මෙහෙණද අවවාදය පිණිස එළැඹීම ලබාවා. ලබත්වා. ලබාවා'යි මෙසේ කියයුතුය.

පාමොක් උදෙසන්නහු විසිනුදු සම්මත කරනලද මහණෙක් ඇත්තේ නම් පෙර නයින්ම මෙහෙණෝද ඔහු වෙත, මෙහෙණ තොමෝද ඔහුවෙත, භික්ෂුණීසඞ්ඝ තෙමේද, ඔහුවෙත මෙහෙණෝද, මෙහෙණතොමෝද, එළැඹේවා - එළැඹේවා - එළැඹේවා - එළැඹෙත්වා - එළැඹේවායි කියයුතුය. ඉදින් සම්මතලද මහණෙක් නැත්තේ නම්. ප්‍රසාදජනක නිර්දෝෂ කායකර්මාදියෙන් මෙහෙණෝ - භික්ෂුණීසඞ්ඝ තෙමේද - මෙහෙණෝද - මෙහෙණ තොමෝද සම්පාදනය කෙරෙත්වා. සම්පාදනය කෙරේවා. සම්පාදනය කෙරෙත්වා. සම්පාදනය කෙරේවායි කියයුතුය. අවවාද පිළිගන්නහු විසින් පැළවිය දිනයෙහි පෙරළා ගෙණඅවුත් එසේම කියයුතුය. අවවාදය වනාහි බාල-ගිලාන-ගමිකයන් හැර අනෙකෙක් වේද, ඉදින් ආරණ්‍යකයෙක් වේද, නොපිළිගන්නට නොලබයි. භාග්‍යවතුන්වහන්සේ විසින් 'අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා බාලං, ඨපෙත්වා ගිලානං ඨපෙත්වා ගමිකං අවසෙසෙහි ඔවාදං ගහෙතුං'යි මෙය වදාරනලද්දේය. එහි යමෙක් තුදුස්වක් පසළොස්වක් පොහොයෙහි හෝ පැළවිස දිනයෙහි හෝ යනු කැමැත්තේ වේද, හෙතෙමේ ගමිය වේ. දෙවන පක්ෂදිනයෙහි යනුයේද නොගැණීම නොලබයි. 'න භික්ඛවෙ ඔවාදො න ගහෙතබ්බො, යො න ගණ්හෙය්‍ය ආපත්ති දුක්කටස්ස'යි වදළ ඇවැතට පැමිණේමය. අවවාදය පිළිගෙණද පොහෝගෙයිදී නොසැලකිරීමට හෝ පැළවිය දිනයෙහි මෙහෙණන්හට පෙරළා නොගෙණ එන්නට හෝ නොවටියි. 'න භික්ඛවෙ ඔවාදො නාරොචෙතබ්බො යො නාරොචෙය්‍ය ආපත්ති දුක්කටස්ස' මෙය වදරන ලදමය. තවද 'න භික්ඛවෙ ඔවාදො න පච්චාහරිතබ්බො යොන පච්චාහරෙය්‍ය ආපත්ති දුක්කටස්ස'යි අතිකක්ද වදරනලදී. එහි ආරණ්‍යකයා විසින් පෙරළා ගෙණ ඊම පිණිස සලකුණෙක් කටයුතුය. 'අනුජානාමි භික්ඛවෙ ආරඤ්ඤකෙන භික්ඛුනා ඔවාදං ගහෙතුං සඞ්කෙතං ච කාතුං අත්‍ර පටිහරිස්සාමි' මෙය වදරනලදමය. එහෙයින් ආරණ්‍යකභික්ෂු තෙමේ මෙහෙණන් වසන ගමෙහිදී භික්ෂාව ලබාද ඒ මහණහු විසින් එහිම හැසිර මෙහෙණන් දක ආරෝචනය කොට යායුතුය. මොහුට එහි

භික්ෂාව සුලභ නොවේද, අසල ගමෙහි හැසිර මෙහෙණින් වසන ගමට අවුත් එසේම කටයුතුය. ඉදින් දුර යායුතුවේ නම් 'මම තොපගේ අසුවල් නම් ගම්දෙරෙහි සභාවට හෝ මණ්ඩපයට හෝ රුක්මුලට හෝ එළැඹෙන්නෙමි, එහි එවු'යි සලකුණෙක් කටයුතුය. මෙහෙණින් එහි යායුතුය. නොයැම නොලබන්නේය. 'න භික්ඛවෙ භික්ඛුණියො සඞ්කෙතං, න ගන්තබ්බං යා න ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස' මෙය වදරන ලදමය.

**'උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං'** මෙහි මෙහෙණින් විසින් තුදුස්වකෙහි තමන් පවරා උපොසථ දිනයෙහි භික්ෂු සඞ්ඝයා සමීපයෙහි පැවරිය යුතුය. 'අනුජානාමි භික්ඛවෙ අජ්ජතනාය පවාරෙත්වා අපරජ්ජු භික්ඛුසඞ්ඝං පවාරෙතුං'යි මෙය වදරන ලදමය. **භික්ඛුණී ඛන්ධකයෙහි** කියූ නයින්ම මෙහි විනිශ්චය දත යුතුය. 'තෙන ඛො පන සමයෙන සබ්බො භික්ඛුණීසඞ්ඝෙන පවාරෙන්තො කොලාහලමකාසි භගවතො එතමත්ථං ආරොචෙසුං අනුජානාමි භික්ඛවෙ එකං භික්ඛුණිං ව්‍යත්තං පටිබලං සම්මන්නිතුං භික්ඛුණී සඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බා:- පඨමං භික්ඛුණී යාචිතබ්බා යාචිත්වා ව්‍යත්තාය භික්ඛුණියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො:- සුණාතු මෙ අය්‍යෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුණිං සම්මන්නෙය්‍ය භික්ඛුණීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. යස්සා අය්‍යාය ඛමති ඉත්ථන්නාමාය භික්ඛුණියා සම්මති භික්ඛුණීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවරෙතුං, සා තුණ්හස්ස යස්ස නක්ඛමති. සා භාසෙය්‍ය. සම්මතා සඞ්ඝෙන ඉත්ථන්නාමා භික්ඛුණී භික්ඛුණීසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති තාය සම්මතාය භික්ඛුණියා භික්ඛුණීසඞ්ඝං ආදාය භික්ඛුසඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො:- භික්ඛුණී සඞ්ඝො අය්‍ය භික්ඛුසඞ්ඝං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා. වදෙය්‍ය භික්ඛුසඞ්ඝො භික්ඛුණීසඞ්ඝං අනුකම්පංඋපාදාය. පස්සන්තො පටිකරිස්සති. දුතියම්පි අය්‍ය, තතියම්පි අය්‍ය, භික්ඛුණීසඞ්ඝො -පෙ- පටිකරිස්සති'යි මෙය වදරනලදමය. ඉදින් භික්ෂුණී සඞ්ඝ තෙමේ නො පිරේද, 'භික්ඛුණියො අය්‍ය භික්ඛුසඞ්ඝං පවාරෙන්ති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදන්තය්‍යා භික්ඛුසඞ්ඝං භික්ඛුණියා අනුකම්පං උපාදාය පස්සන්තියො පටිකරිස්සන්ති'යි කියාද, 'අහං අය්‍ය භික්ඛුසඞ්ඝං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදතු මං අය්‍ය භික්ඛු සඞ්ඝො අනුකම්පං උපාදාය. පස්සන්තී පටිකරිස්සාමි' මෙසේ තුන් යලක් කියයුතුය. ඉදින් භික්ෂු සඞ්ඝතෙමේ නොපිරේනම්, 'භික්ඛුණීසඞ්ඝො අය්‍යා අය්‍යෙ පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තය්‍යා

භික්ඛුණීසඞ්ඝං අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සති'යි කියාද, 'භික්ඛුණීසඞ්ඝො අය්‍ය අය්‍යං පවාරෙති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා, වදතයේ‍යා භික්ඛුණීසඞ්ඝං අනුකම්පං උපාදය පස්සන්තො පටිකරිස්සති'යි කියාද මෙසේ තුන් යලක් කියයුතුය. භික්ෂු භික්ෂුණී දෙපක්ෂයෙහි නොපිරීමක් ඇතිකල්හි 'භික්ඛුණියො අය්‍ය අයේ‍ය පවාරෙන්ති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තයා්‍ය භික්ඛුණීනං අනුකම්පං උපාදය. පස්සන්තියො පටිකරිස්සන්ති'යි කියාද, 'භික්ඛුණියො අය්‍ය අය්‍යං පවාරෙන්ති දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතයේ‍යා භික්ඛුණියො අනුකම්පං උපාදය පස්සන්තියො පටිකරිස්සන්ති'යි කියාද, 'අහං අය්‍යා අයේ‍ය පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදන්තු මං අය්‍යා අනුකම්පං උපාදය පස්සන්තී පටිකරිස්සාමි'යි කියාද 'අහං අය්‍ය අය්‍යං පවාරෙමි දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා වදතු මං අයේ‍යා අනුකම්පං උපාදය පස්සන්තී පටිකරිස්සාමි'යි කියාද මෙසේ තුන්යලක් කියයුතුය.

මානතෙහි හැසිරීමද, උපසම්පද පරියෙසනයද යථාස්ථානයෙහිම පහළවන්නේය.

**'න භික්ඛුණියා කෙනචි පරියායෙන'** දශවිධ ආක්‍රොශ වස්තූන්ගෙන් හෝ අන් කිසි කරුණකින් හෝ මහණ තෙමේ නොම ආක්‍රොශ කටයුත්තේය. පරිභව නොකටයුත්තේය. භයින් තර්ජනය නොකටයුත්තේය. **'ඔවටො'** වසනලද්දේය. වළකනලද්දේය. ප්‍රතික්ෂෙප කරනලද්දේය. වචනයම **වචනපථ** නම. **'අනොවටො'** නොවසනලද්දේය. නොවළකනලද්දේය. ප්‍රතික්ෂෙප නොකරනලද්දේය. එහෙයින් මෙහෙණ විසින් අධිපති තත්හි සිට දෙවුතත්හි සිට 'මෙසේ යව, මෙසේ නවතුව, මෙසේ හිඳුව, මෙසේ පොරොව'යි කිසි අයුරකින් මහණ තෙමේ නොම අවවාද කටයුතුය. අනුශාසනා නොකටයුතුය. දෙසක් දැක 'පෙර මහා තෙරහු මෙසේ නොයෙත්. නොහඳිත්. නොපොරොවත්. මෙබඳු කසටවත් නොදරත්, මෙසේ ඇස් අඳුන් නොගාත්'යි යනාදි නයින් ඇති දෙස් දැක්වීම වටියි. මහණුන් විසින් වනාහි මේ මහලු මෙහෙණ මෙසේ හිඳියි. මෙසේ පොරොවයි. මෙසේ නොහඳුව. මෙසේ නොපොරොව, තිලකකම් පත්‍රකර්මාදිය නොකරව'යි සුවසේ මෙහෙණහට අවවාදකිරීම අනුශාසනා කිරීම වටියි.

**'සමග්ගත්ථායාති භණන්තං'** ආයර්‍යය' සමගි වෙමු'යි කියන භික්ෂුණී සඞ්ඝයාහට **'අඤ්ඤං ධම්මං භණති'** අන්‍ය වූ සූත්‍රාන්තයක් හෝ අභිධර්මයක් හෝ 'සමග්ගත්ථායා' යන වචනයෙනුදු අවවාදය ප්‍රාර්ථනා කෙරෙත්. එහෙයින් අවවාදය හැර අන්‍ය ධර්මයක කියන මහණහුට දුක්කටය වේ.

'**ඔවාදං අනියාදෙත්වා**' නැගනියෙනි' මේ අවවාදයයි නොකියාම '**අධම්මකම්මෙ**' යනාදිතන්හි භික්ඛුනොවාදක සම්මුතිකර්‍මය, කර්‍මයයි දතයුතුය. එහි අධර්‍මකර්‍මයෙහි නවක දෙකක්හුගේ වසයෙන් අටළොසක් පාචිත්තියයෝ වෙත්. ධර්‍මකර්‍මයෙහි දෙවන නවකයාහට කෙළවර පදයෙහි ඇවැත් නොවේ. සෙසු සතළොස් පදයන්හි දුක්කටයෝ වෙත්. '**උද්දෙසං දෙන්තො**' අෂ්ටගරු ධර්‍මයන්ගේ පාළිය උදෙසමින්. '**පරිපුච්ඡං දෙන්තො**' ඒ මෙහෙණහටම ප්‍රගුණවූ ගරුධර්‍මපාලියෙහි අර්ථකථාව කියමින් යන අර්ථයි. '**ඔසාරෙහි අය්‍යාති වුච්චමානො ඔසාරෙති**' මෙසේ කියනුලබන්නේ අෂ්ටගරුධර්‍මපාලිය කියාය යන අර්ථයි. මෙසේ උද්දේසය දෙමින් පරිපුච්ඡාව දෙමින් යමෙක් තෙමේද 'කියව'යි කියනු ලබන්නේ අෂ්ටගරුධර්‍මය කියාද, ඒ මහණහුට පාචිත්තියෙන් ඇවැත් නොවේ. අන්‍යධර්‍මයක් කියන මහණහුට දුක්කටයෙන් ඇවැත් නොවේ. '**පඤ්හං පුච්ඡති පඤ්හං පුට්ඨො කථෙති**' මෙහෙණ තොමෝ ගරුධර්‍ම නිශ්‍රිතවූ හෝ ඛන්ධාදිනිශ්‍රිතවූ හෝ ප්‍රශ්නයක් විචාරාද, ඒ ප්‍රශ්නය යම් මහණෙක් තෙමේ කියාද ඒ මහණහටද ඇවැත් නොවේ. '**අඤ්ඤස්සත්ථාය භණන්තං**' සිවු පිරිසෙහි දහම් දෙසන මහණකු වෙත එළැඹ මෙහෙණෝ අසත්ද, එහිද මහණහුට ඇවැත් නොවේ. '**සික්ඛමානාය සාමණෙරාය**' මොවුන්ට දෙසන මහණහුටද ඇවැත්නොවේ. සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේමය. පදසොධර්‍මසමුත්ථානිකය. වචනයෙන්ද වාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියා සමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

ප්‍රථම ඔවාදශික්ෂාපදයයි

—\\—

ද්විතීය ශික්ෂාපදයෙහි '**පරියායෙන**' වාරයෙන් පිළිවෙළින් යන අර්ථයි. '**අධිචෙතසො**' අධිචිත්තවත්වූ සියලු චිත්තයන් අතුරෙහි අධිකවූ අර්හත්ඵල චිත්තයෙන් සමන්වාගතවූ යන අර්ථයි. '**අප්පමජ්ජතො**' නොපමාවූ. අප්‍රමාදයෙන් කුශලධර්‍මයන් පිළිබඳ සතතක්‍රියාවෙන් යුක්තවූයි කියනලද්දේවේ. '**මුනිනො**' 'සො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති'යි මෙසේ දෙලොව දැන ගැණීමෙන් හෝ, නුවණ මොනයි කියනුලැබේ. අර්හත්ඵල සඞ්ඛ්‍යාතවූ ඒ ඤාණයෙන් යුක්ත බැවින් හෝ ක්ෂීණාශ්‍රව තෙමේ මුනි නැමැයි කියනුලැබේ. ඒ මුනිහට '**මොනපථෙ සික්ඛතො**' අර්හත් ඥානසඞ්ඛ්‍යාත මොනපථයන්හි හෝ සපත්ති සම්බොධිපාක්ෂික ධර්‍මයන්හි හෝ ත්‍රිවිධ ශික්ෂාවන්හි හෝ හික්මෙන්නාවූ මෙද පූර්වභාගප්‍රතිපත්තිය ගෙණ කියනලදී. එහෙයින් මෙසේ පූර්වභාගයෙහි හික්මෙන්නාවූ මේ ශික්ෂාවෙන් මුනිභාවයට පැමිණි මුනිහටයි මෙසේ

අර්‍ථ දත යුත්තේය. '**සොකා න භවන්ති තාදිනො**' එබඳුවූ ක්ෂීණාශ්‍රවමුනිහුගේ අභ්‍යන්තරයෙහි ඉෂ්ටවියොගවස්තුක ශොකයෝ නැත්තාහුය. නොහොත් '**තාදිනො**' තාදීලක්‍ෂණයෙන් යුක්තවූ මෙබඳු මුනිහට ශොකයෝ නොවෙත්යි මෙහි මේ අර්‍ථය වේ. '**උපසන්තස්ස**' රාගාදීන්ගේ සංසිඳීමෙන් සංසිඳුනාවූ. '**සද සතීමතො**' ස්‍මෘති විපුලත්‍වයට පැමිණි බැවින් සෑම කල්හි සිහියෙන් වෙන් නොවූ. '**ආකාසෙ අන්තලික්ඛෙ**' අන්තරීක්‍ෂසඞ්ඛ්‍යාත ආකාශයෙහි කසිණුග්ඝාටිමාකාසයෙහි නොවේ. රූපපරිච්ඡෙදාකාසයෙහි නොවේ. '**චඞ්කමතිපි තිට්ඨතිපි**' ඒ මෙහෙණින්ගේ කථාව අසා 'මේ මෙහෙණෝ මෙතෙමේ මෙපමණින්ම දනී'යි මට අවමන් කරත්. එබැවින් දැන් මේ මෙහෙණන්ට තමන්ගේ ආනුභාවය දක්වන්නෙමි'යි ධර්‍මය කෙරෙහි බුහුමන් උපදවා අභිඥපාදක චතුර්‍ථධ්‍යානයට සමවැද එයින් නැගිට 'ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි -පෙ- අන්තරා පිධායතිපි' යන එහි '**අන්තරා පිධායතිපි**' අතුරුදහන් වේ. නොදැක්මට යේය යන අර්‍ථයි. '**තස්සෙව උදානං භණති අස්සුදෙව බහුං බුද්ධවචනං**' ස්ථවිර තෙමේ තමන්ගේ බෑ තෙරහු සමීපයෙහි-

'පදුමං යථා කොකනදං සුගන්ධං පාතො සියා ඵුල්ලමවීතගන්ධං
අඞ්ගීරසං පස්ස විරොචමානං තපන්තමාදිච්චමිවන්තලික්ඛෙ'

යන මේ ගාථාව උදෙසවා සිවු මසක් මුළුල්ලෙහි හැදෑරුයේය. පුහුණු කරන්නට නොහැකිවූයේය. ඉක්බිති ස්ථවිර තෙමේ ඔහු 'තෝ මේ සසුනෙහි අභව්‍යයි වෙහෙරින් නෙරපා හැරියේය. ඒ චූලපන්ථක තෙමේ අඩමින් දෙරකොටුවෙහි සිටියේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ බුදුන් විසින් හික්මවිය යුතු සත්‍වයන් බලා වදාරන සේක් . ඔහු දැක විහාරචාරිකාවෙහි හැසිරෙන්නහු මෙන් ඔහු සමීපයට වැඩමවා 'චූලපන්ථක' කුමක් හෙයින් අඩන්නෙහි දැ'යි අසා වදාළසේක. හෙතෙමේ ඒ කාරණය සැල කෙළේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට පිරිසිදු රෙදිකඩක් දී 'මේ රෙදිකඩ 'රජොහරණං, රජොහරණං'යි කියමින් පිරිමදුවයි වදාළසේක. හෙතෙමේ මැනැවැ'යි පිළිගෙණ තමන් වසන තැන හිඳ ඒ රෙදිකඩෙහි එක් කෙළවරක් පිරිමැද්දේය. පිරිමැදි තැන කළුපැහැ ඇත්තේ විය. එකල්හි හෙතෙමේ 'මෙසේ පිරිසිදුවූද වස්ත්‍රය මේ ආත්මභාවය නිසා කළුපැහැත්තේ වීයයි අශුභසංඥා අනිත්‍යසංඥ එළවමින් සංවෙගය පිළිලැබ විදසුන් වැඩීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මොහුගේ ඇරඹූ වැර ඇති බව දැන 'අධිචෙතසො' යන මේ ඔභාසගාථාව වදාළසේක. ස්ථවිර තෙමේ ගාථා කෙළවර රහත්බවට පැමිණියේය. එහෙයින් ස්ථවිර තෙමේ ප්‍රකෘතියෙන්ම මේ ගාථාවට මමත්‍වය කරයි. හෙතෙමේ මේ ගාථාව

පිළිබඳ ඒ මමත්වය දන්වනු පිණිස ඒ ගාථාවම කියයි. අතරතුර අන් බොහෝ බුදුවදන්ද ගෙණහැර කියයි.

'**එකතො උපසම්පන්නාය**' භික්ෂුණීසඞ්ඝයා සමීපයෙහි උපසපන් මෙහෙණකට භික්ෂු සඞ්ඝයා සමීපයෙහි උපසපන් මෙහෙණකට අවවාද කරන මහණහට පාචිත්තියක් වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. මෙද පදසොධම්සමුට්ඨානිකම වේ.

දෙවන අත්ථඞ්ගත ශික්ෂාපදයයි

——\\——

තෘතීයශික්ෂාපදයෙහි - 'අඤ්ඤත්‍ර සමයා ඔවදති ආපත්ති පාචිත්තියස්ස, යනාදි තන්හි අෂ්ටගරුධර්මයෙන් අවවාද කරන මහණහටම පාචිත්තිය වේ. අනික් ධර්මයකින් අවවාද කරන මහණහට දුක්කටය දතයුතුය. '**එකතො උපසම්පන්නාය**' භික්ෂුණී සඞ්ඝයා සමීපයෙහි උපසපන් මෙහෙණහට භික්ෂුසඞ්ඝයා සමීපයෙහි උපසපන් මෙහණහට අවවාද කරන මහණහට පාචිත්තියම වේ. මෙයින් මතුද යම් යම් තැනක 'එකතො උපසම්පන්නාය'යි කියනුලැබේද, ඒ සියලු තැන මේ අර්ථයම දතයුතුය. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන භික්ඛුණී උපස්සය ශික්ෂාපදයයි

——\\——

එහි මේ ප්‍රකීර්ණකය වනාහි මහාපච්චරියෙහි කියනලදි. සම්මත නොකළ මහණෙක් තෙමේ හිරු බැස ගියකල්හි මෙහෙණ අසපුවට එළැඹැ අෂ්ටගරුධර්මයෙන් අවවාද කෙරේනම් පාචිත්තිය තුනක් වේ. අන් ධර්මයකින් අවවාද කරන මහණහට දුක්කට දෙකක්වේ. එක් පාචිත්තියක් වේ. කෙසේද යත්: අසම්මතය මුල්කොට ඇති දුක්කටය. අසපුවට ගොස් අන් ධර්මයකින් අවවාදකිරීම මුල්කොට ඇති දුක්කටය. හිරුබැස ගිය කල්හි අවවාද කිරීම මුල් කොට ඇති පාචිත්තියයි. සම්මත කළ හිරු බැසගිය කල්හි එහි ගොස් අෂ්ටගරුධර්මයෙන් අවවාදකරන මහණහට අනාපත්ති එකක. පාචිත්තිය දෙකක. කෙසේද යත්:- සම්මතය ලද බැවින් අනාපත්ති වේ. හිරු බැස ගිය කල්හි අවවාද කිරීම මුල්කොට ඇති එකක. ගොස් අෂ්ටගරුධර්මයෙන් අවවාද කිරීම මුල්කොට ඇති

එකකැයි පාචිත්තිය දෙකක. අන්ධර්මයකින් අවවාද කරන ඔහුටම අනාපත්ති එකක. දුක්කට එකක. පාචිත්තිය එකක කෙසේද, යත්:- සම්මතය ලද බැවින් අනාපත්ති වේ. ගොස් අන් ධර්මයකින් අවවාද කිරීම මුල්කොට ඇති දුක්කටය වේ. හිරු බැස ගිය කල්හි අවවාද කිරීම මුල්කොට සිටි පාචිත්තිය වේ. දවල ගොස් අවවාද කරන සම්මතය ලද්දහුටද සම්මතය නොලද්දහුටද රාත්‍රියෙහි අවවාද කිරීම මුල්කොට ඇති පාචිත්තිය බැහැර කොට සෙසු ආපත්ති අනාපත්තීහු දත යුත්තාහ.

චතුර්ථශික්ෂාපදයෙහි **'න බහුකතා'** නො කළ බුහුමන් ඇත්තාහුය. ධර්මයෙහි බුහුමන් කොට අවවාද නොකෙරෙත්, යන අදහසය. 'භික්ඛුනොවාදකං අවණ්ණං කත්තුකාමො' යනාදීන්ගේ අර්ථය උජ්ඣාපනක ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය. **'උපසම්පන්නං සඞ්ඝෙන අසම්මතං'** මෙහි අසම්මත නම් සම්මතයෙන් හෝ සඞ්ඝයා විසින් හෝ භාර කොට නොතබන ලද්දේයයි දතයුතුය. **'අනුපසම්පන්නං සම්මතං වා අසම්මතං වා'** යන මෙහි භික්ෂු කාලයෙහි සම්මුතිය ලැබ සාමණේර භූමියහි සිටියේ සම්මත වේ. සම්මතයෙන් හෝ සඞ්ඝයා විසින් හෝ තබනලද බහුශ්‍රැත සාමණේර තෙමේ අසම්මතයයි දතයුතුය. සෙස්ස කියූ නය ඇති බැවින් ප්‍රකමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුත්ථානය. සංඥ විමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශල චිත්තයි. ත්‍රිවෙදනයි.

සිවුවන ආමිසශික්ෂාපදයයි

——\\——

පඤ්චශික්ෂාපදයෙහි - **'විසිඛාය'** වීථියෙහි. **'පිණ්ඩාය චරති'** නිබඳ හැසිරීම් වසයෙන් නිතර හැසිරේ. **'සන්දිට්ඨා'** දුටු මිතුරෝ වූහ. මෙහි සෙස්ස පදවසයෙන් ප්‍රකට අර්ථ ඇත්තේය. විනිශ්චය වශයෙන් චීවර ප්‍රතිග්‍රහණශික්ෂාපදයෙහි කියූ නයින්ම සමුත්ථානාදිය සමග දතයුතුය. එහි මහණ තෙමේ ප්‍රතිග්‍රාහකවේ. මෙහි මෙහෙණ තොමෝයි. මේ වෙනසයි. සෙස්ස එබඳුමය.

පස්වන චීවරදාන ශික්ෂාපදයයි.

——\\——

ෂෂ්ඨශික්ෂාපදයෙහි 'උදායී' ලාලුදායී තෙමේය. 'පටු' ප්‍රතිබල ඇත්තේය. නිපුණය. සමර්ථයයි කියනලද්දේවේ. '**අඤ්ඤතරා භික්ඛුනී**' ඒ ලාලුදායී තෙරුන්ගේම පුරාණභාර්‍ය්‍යා තොමෝය. '**පටිභාණචිත්තං**' තමාගේ වැටහීමෙන් කළ සිතියම. ලාලුදායී ස්ථවිර තෙමේ සිවුර පඩු පොවා ඒ සිවුර මැද නන් පැහැය යොද පටන්ගත් නොනිමි මෙවුන්දම් දැක්වෙන ස්ත්‍රීපුරුෂරූපයක් ඇත්දේය. එහෙයින් 'මජ්ඣෙ පටිභාණචිත්තං වුට්ඨාපෙත්වා'යි කියනලදී. '**යථාසංහතං**' හැකුළු පරිදිම. '**චීවරං**' යමක් හඳින්නට හෝ පොරවන්නට හැකිවේද, ඒ චීවරයයි මෙසේ මහාපච්චරි ආදියෙහි කියනලදී. '**සයං සිබ්බති**' මෙහි මසන්නෙමි'යි නූල් ගසන්නහුටද සිඳින්නහුටද දුක්කටය වේ. මසන මහණහුට පාචිත්තිය වේ. '**ආරපථෙ ආරපථෙ**' හිද්ද ඇතුල් කොට ඇතුල් කොට බැහැර කිරීමෙහි. මුළු මතින් හිද්ද බැහැර නොකරමින්. දිග් හූ ඇතුල් කරනු පිණිස සියක් වරක් නමුදු විද බැහැර කෙරේ නම් එක්ම පාචිත්තියක් වේ. '**සකිං ආණත්තා**' වරක් සිවුර මසවයි කියනලද්දේ. '**බහුකම්පි සිබ්බති**' ඉදින් සියලු හිදිකම් අවසන්කොට සිවුර නිම කෙරේනම් එක්ම පාචිත්තියක් වේ. තවද 'මේ සිවුරෙහි කටයුතු කිස තට භාරය'යි කියනලද්දේ කෙරේද, ඇණ වූ මහණහුට හිද්ද ඇතුල් කොට බැහැර කිරීමෙහි එක්ම පාචිත්තියක් වේ. අණකළ මහණහට එක් වචනයෙන් බොහෝ ඇවැත්හු වෙත්. නැවත නැවත ඇණවීමෙහි කියයුත්තෙක්ම නැත්තේය. යම් කෙනෙක් ඉදින් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් තම නෑයන්ගේ සිවුරක් මසන කල්හි ඔවුන්ගේ නිශ්‍රිතකයෝ ආචාර්‍ය්‍ය උපාධ්‍යායවත හෝ කඨිනවත හෝ කරමු'යි මසත් ද, ඔවුන්ටද හිදිගමන් ගණනින් ඇවැත්වෙත්. ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ තම නෑයන්ගේ සිවුරක් අතැවැස්සන් ලවා මස්වත්ද, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ට දුක්කටය වේ. අතැවැස්සන්ට පාචිත්තිය වේ. ඇතැවැස්සෝ තම නෑයන්ගේ සිවුරක් ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් ලවා මස්වත්ද, එහිද මේ නයමවේ. අතැවැසියන්ගේද ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්ගේද නැමෙහෙණකගේ සිවුරක් වේද, ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ අතැවැසියන් රවටා ඒ සිවුර මස්වත්ද, දෙදෙනහටම දුක්කටය වේ. කුමක් හෙයින, යත්:- අතැවැසියන්ට නොනෑයන හැඟීමෙන් මැසූ බැවිනි. අන්‍යයන්හට නොකැපයෙහි යෙදූ බැවිනි. එහෙයින් 'මේ තොපගේ මවුගේ සිවුරය. මෙය නැගනියගේ සිවුරය'යි කියා මැස්විය යුතුය. '**අඤ්ඤං පරික්ඛාරං**' වහන් පසුම්බි ආදි යම්කිසි පිරිකරකි. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන චීවරසිබ්බනශික්ෂාපදයයි.

——||——

සප්තම ශික්ෂාපදයෙහි **'පච්ඡාගච්ඡන්තීනං චොරා අච්ඡින්දිංසු'** පසුව යන මෙහෙණුන්ගේ පාසිවුරු සොරු පැහැර ගත්හ. **'සෙසුං'** සොරු ඒ මෙහෙණුන් දූෂිත කළහ. ශීලවිනාශයට පැමිණවූහ යන අර්ථයි. **'සංවිධාය'** එක්ව බැණගෙණ. යන කල්හි සලකුණු කොට යන අර්ථයි **'කුක්කුටසම්පාදෙති'** මෙහි යම්හෙයකින් ගමින් නික්ම කුකුළු තෙමේ පයින්ම අන් ගමකට යේද, මෙය කුක්කුටසම්පාදයයි කියනුලැබේ. එහි මේ වචනාර්ථයයි. මෙහි යෙත්නුයි සම්පාද නම්. කවරහු යෙත්ද, යත් කුකුළෝ යෙත්. කුකුළන්ගේ යෑම කුක්කුට සම්පාදයි. නොහොත් සම්පාදෙ යනු ගමනයි. කුකුළන්ගේ ගමන මෙහි ඇත්තේයයිද කුක්කුටසම්පාද නම්වේ. කුක්කුටසම්පාතෙයිද පාඨයෙක් වේ. එහි යම් ගමක ගෙයි සෙවනිය පිටින් කුකුළා පැන පැන ගොස් අන් ගෙයක පලය පිට වැටේද, මෙය කුක්කුටසම්පාතයි කියනුලැබේ. මෙහි වචනාර්ථය වනාහි කියූ නයින්ම දතයුතුය. දෙපරිද්දෙකින් කියූ අයුරු ඇත්තාවූද මේ ගම ඉතා ආසන්නවේ. උපචාරයෙක් නොලැබේ. යම් ගමක උදැසන හඬලන කුකුළාගේ හඬ අනතුරු ගමෙහි ඇසේද, එබඳු ගම් වලින් පිරුණු රටෙහි ගාමාන්තරය ගාමාන්තරය නිමිතිකොට පාචිත්තිය වේයයි අර්ථකථාවන්හි කියයනලද්දේය. 'ගාමාන්තරයක් ගාමාන්තරයක් පාසා ඇවැත පාචිත්තිය වන්නීය'යි කී හෙයින් ඉදිනුදු රියනක් පමණ අතර ඇති ගමෙක් වේද, මිනිසුන් විසින් තබනලද යම් උපචාරයෙක් වේද, ඒ උපචාරයට බස්නා මහණුහුට ඇවැත්මය. එහි මේ ආපත්තිවිනිශ්චයයි. එක්ව බැණගෙණ යන කල්හි දෙදෙනම මෙහෙණ අසපුවක හෝ අතුරු අරමෙක හෝ අසුන් හලෙක හෝ තීර්ථකයන්ගේ සෙනස්නෙක හෝ සිට සංවිධාන කෙරෙත්ද, ඇවැත් නොවේ. මේ වනාහි කැපබිමය. එහෙයින් මෙහි සංවිධාන හෙතුවෙන් දුක්කටාපත්තිය නොකියත්. යන්නහුට පාචිත්තියමවේ. ඉදින් ගමතුළ මෙහෙණ අසපුවක දෙරළඟ හෝ වීථියෙහි හෝ සතරමංහන්දි ඇත්හල් ආදීන් අතුරෙහි හෝ එක්ව බැණගණිත්ද, මහණුහුට දුක්කටාපත්තිය වේ. මෙසේ එක්ව බැණගෙණ ගමින් නික්මෙත්ද නික්මීම නිමිතිකොට ඇවැත් නොවේ. අනතුරු ගමෙහි උපචාරයට බැසගැණීමෙහිදී මහණුහුට පාචිත්තිය වේ. එහිද පළමු පා තැබුමෙහි දුක්කටයද දෙවන පාතැබුමෙහි පාචිත්තියද වේයයි **මහාපච්චරියෙහි** කියනලදී. ගමින් නික්ම අතුරු ගමෙහි උපචාරයට නොබසිත්ද, මේ අතරෙහි සංවිදහනය කළ කල්හිද, මහණුහුට දුක්කටය වේ. උපචාරයට බැස ගැණීම නිමිතිකොට පළමු කියූ නයින්ම ඇවැත්වේ. ඉදින් දුර යනු කැමැත්තාහු වෙත්ද, ග්‍රාමොපචාරගණනින් බැසීම බැසීම නිමිති කොට ඇවැත්වේ. ඒ ඒ ගම ඉක්මීම නිමිතිකොට ඇවැත් නොවේ. ඉදින්

මෙහෙණ තොමෝ 'අසුවල් ගමට යන්නෙමි'යි අසපුවෙන් නික්මේද, මහණතෙමේත් ඒ ගම සඳහාම අසුවල් ගමට යන්නෙමියි වෙහෙරින් නික්මේද, නැවැත දෙදෙනම ගම්දෙරදී එක්ව 'තෙපි කොතැනක යහුද, අසුවල් ගමටය. තෙපි කොතැනකද, අපිදු එහිමැ'යි කියා 'එව, දැන් යමු'යි එක්ව බැණගෙණ යෙත්ද, ඇවැත්නොවේ. කුමක් හෙයින, යත්:- පෙරම යන්නෙමි'යි නික්මුනු බැවිණියි **මහාපච්චරියෙහි** කියනලදී. ඒ කීම පෙළ හා සමනොවේ. සෙසු අත්ථකථාවන් හාද සම නොවේ. 'අද්ධයොජනෙ අද්ධයොජනෙ' එක් එක් අඩයොදුන ඉක්මවන මහණහුට දැස් ඉක්මවන්නෙමි'යි පළමු පියෙහි දුක්කටයවේ. දෙවන පියෙහි පාචිත්තියවේ. මෙම නයයෙහි ඉක්මීම නිමිතිකොට ඇවැත්වේ. බැස ගැණීම නිමිතිකොට ඇවැත් නොවේ. **'භික්ඛු සංවිදහති'** තුවර දෙර වෙතදී හෝ වීථියෙහිදී හෝ මෙහෙණක දැක 'අසුවල් ගමට පෙර ගියෙහිදැ'යි විචාරාද, ආයශ්‍රීයෙනි' පෙර නොගියෙමි, එව යමු'යි හෝ මම හෙට යන්නෙමි, තීද එව'යි හෝ කියයි. 'භික්ඛුණී සංවිදහති' ග්‍රාමාන්තරයෙහි සෑ වදිනු පිණිස ගමින් නික්මුනු මහණකු දැක 'ආයශ්‍රීයෙනි' නොතැන යනුදැ'යි විචාරයි. 'අසුවල් සෑය වදිනු පිණිසැ'යි මහණ තෙමේ කියයි. 'ආයශ්‍රීයෙනි' මමද එමි'යි මෙසේ මෙහෙණ තොමෝම විධාන කරයි. මහණතෙමේ විධාන නොකරයි. **'විසඞ්කෙතෙන'** මෙහි පෙරබත යන්නෙමු'යි කියා පසුබතයෙත්ද, 'අද හෝ යන්නෙමු'යි කියා හෙට යෙත්ද, මෙසේ කාලවිසඞ්කතයක් ඇති කල්හිම ඇවැත්නොවේ. ද්වාරවිසඞ්කතයෙහි වනාහි මාර්ගවිසඞ්කය හෝ ඇතිකල්හි ඇවැත්වේමය. **'ආපදාසු'** රට පැහැර ගැන්මක් ඇති කල්හි ඊර්‍ය්‍යාපථචක්‍රයට හෝ ශකටචක්‍රයට හෝ නැංගාවූ ජනපදයෝ පවතිත්ද මෙබඳු ආපදවන්හි ඇවැත්නොවේ. සෙස්ස ප්‍රකටමය. චතුසසමුට්ඨානිකය. කයින් කායවාචායෙන් කායචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සත්වන සංවිධාන ශික්ෂාපදයයි.

—\\—

අෂ්ටමශික්ෂාපදයෙහි **'සංවිධාය'** ලොකාස්වාද වශයෙන් හෝ මිත්‍ර සන්ථවවශයෙන් හෝ කෙළනා සිත් පෙරටු කොට ඇත්තාහු සංවිධාන කොට. **'උද්ධගාමිනිං'** ගඟ ඉහළට උඩුගං බලා යන. යම්හෙයකින් වනාහි යම් මහණෙක් තෙමේ උඩුගං බලා යන බැවින් උජ්ජවනිකා නම්

නැවකින් ක්‍රීඩා කෙරේද, හෙතෙමේ උඩුගං බලා යන නැවකට නගීයයි කියනු ලැබේ. එහෙයින් මේ පද පිළිබඳ පදභාජනයෙහි අර්ථය දක්වනු පිණිසම **උජ්ජවනිකායයි** කියනලදී. '**අධොගාමිනිං**' යටට. යටිගං බලා යන යම්හෙයකින් වනාහි යම් මහණෙක් තෙමේ යටිගං බලා යන බැවින්, ඔජවනිකා නම් නැවකින් ක්‍රීඩා කෙරේද, හෙතෙමේ යටිගං බලායන නැවකට නගීයයි කියනුලැබේ. එහෙයින් මේ පද පිළිබඳ පදභාජනයෙහි අර්ථය දක්වනු පිණිසම **ඔජවනිකායයි** කියනලදී. එහි තොට පිළියෙල කරනු පිණිස යම් නැවක් උඩු ගහට හෝ යටිගහට හෝ පදිත්ද, මෙහි ඇවැත් නොවේ. '**තිරියං තරණාය**' ද්විතීයාර්ථයෙහි ෂෂ්ඨමීවචනයි. '**ගාමන්තරෙ ගාමන්තරෙ**' මෙහි යම් නදියක එක් තෙරක්. කුක්කුටසම්පාදක ගම්වලින් අතරරහිත වේද, එක් තෙරක් ගම නොවූ අරණ්‍යයත් වේද, ඒ ගඟෙහි ගමසහිත ඉවුරු පසින් යනකල්හි ග්‍රාමාන්තර ගණනින් පාචිත්තියයෝ වෙත්. ගම් රහිත ඉවුරුපසින් යන කල්හි අඩයොදුන් ගණනින් පාචිත්තියයෝ වෙත්. යම් ගඞ්ගාවක් තොමෝ යොදුනක් පුළුල ඇත්තීවේද, ඒ ගඟෙහි මැදින් යන කල්හිද අඩ යොදුන් ගණනින් පාචිත්තීහු දතයුත්තාහ. '**අනාපත්ති තිරියං තරණාය**' හුදෙක් නදියෙන් පමණෙක් නොවේ. යමෙක් වනාහි මහතොට පටුනෙන් තාමලිප්තියට හෝ සුවර්ණභූමියට හෝ යේද, ඒ මහණහුටද ඇවැත් නොවේ. සියලු අර්ථකථාවන්හි ගඟෙහිම ඇවැත් විචාරණ ලදී. මුහුදෙහි විචාරණය නොකරනලදී. '**විසඞ්කෙතෙන**' මෙහිද කාල විසඞ්කෙතයෙන්ම ඇවැත් නොවේ. තීර්ථ විසඞ්කෙතයෙන් හෝ නාවා විසඞ්කෙතයෙන් හෝ යන්නහුට ඇවැත්ම වේ. සෙස්ස සමුට්ඨානාදිය සමග ප්‍රථම ශික්ෂාපදය සමානම වේ.

අටවන නාවාභිරූහණ ශික්ෂාපදයයි

—||—

නවමශික්ෂාපදයෙහි '**මහානාගෙ තිට්ඨමානෙ**' සප්තම්‍යර්ථයෙහි ද්විතීයාවචනයි. ශ්‍රෙෂ්ඨයන් සිටුනා කල්හි යන අර්ථයි. නොහොත් සිටින ශ්‍රෙෂ්ඨයන් නොදැකැයි මෙහි පාඨශෙෂය දතයුතුය. අන් අයුරකින් වනාහි අර්ථය නොයෙදේ. '**අන්තරාකථා**' කෙළවරට නොපැමිණ. ආරම්භයෙහිද, අවසානයෙහිද මැදතැනට පැමිණි කථා තොමෝ විප්පකථායයි කරනලද්දීවේ. '**සච්චං මහානාගා ඛො තයා ගහපති**' අඩ ඇසින් බලමින් පිවිසෙන මහතෙරුන් දැක ඔවුන් විසින් ඇසූබව දැන මෙසේ කීයේය. '**භික්ඛුණිපරිපාචිතං**' මෙහෙණවිසින් සපයනලද ගුණ පැවසීමෙන්

නිපදවනලද ලැබියයුත්තක් කරනලදය යන අර්ථයි. මේ සිකපදයෙහි පදභාජනයෙහි මෙහෙණද ඒ මෙහෙණගේ සැපයීම් ආකාරයද දක්වනු පිණිස 'භික්ඛුණී නාමා උභතො සඞ්ඝෙ උපසම්පන්නා, **පරිපාචෙති** නාම පුබ්බෙ අදාතුකාමාතං' යනාදිය වදාරනලදී. '**පුබ්බෙ ගිහිසමාරම්භා**' මෙහි '**පුබ්බෙ**' යනු පළමු කොට. '**සමාරම්භා**' මොනවට අරඹූ බව කියනු ලැබේ. පිළියෙල කරනලද්දට මේ නමෙකි. ගිහීන් විසින් සපයනලද්ද, ගිහිසමාරම්භ නම්. මෙහෙණගේ සැපයීමෙන් පළමුකොටම ගිහීන් විසින් යම් බතක් පිළියෙල කරනලදද, ඒ හැර ඒ පිණ්ඩපාතය තබා අනිකක් අනුභව කරන මහණහුට ඇවැත්වේ. ඒ බත අනුභව කරන මහණහුට ඇවැත් නොවේයයි කියනලදී. පදභාජනයෙහි වනාහි යම්හෙයකින් නෑයන් විසින් පවරනලද්දවුන් විසින් හෝ මහණක්හුගේ ප්‍රයොජනය පිණිස නොඇරඹුද පිණ්ඩපාතය අර්ථ වශයෙන් මොනවට අරඹන ලද්දේම වේ. සුවසේ ගෙන්වා ගත යුතු බැවිනි එහෙයින් ව්‍යඤ්ජනය අල්ලා නොගෙණ අර්ථයම දක්වනු පිණිස '**ගිහිසමාරම්භො නාම ඤාතකා වා හොන්ති පවාරිතා වා**' වදාරන ලද්දේය. '**පකතිපටියත්තං**' ප්‍රකෘතියෙන් ඒ මහණහුගේම ප්‍රයොජනය පිණිස 'තෙරුන්හට දෙන්නෙමු'යි පිළියෙල කරනලද්දේවේ. **මහාපච්චරියෙහි** වනාහි ඒ අනිකක්හටයයි නොකියා මහණුන්ට දෙන්නෙමු'යි පිළියෙල කරනලද්දේයයි විශේෂයක් නොතබා කියනලදී. '**පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති**' කැඳ කැවිලි කුදුමහත් පලයෙහි යන හැමතන්හි මෙහෙණ විසින් සපයන ලද්දෙහහිද ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජිකසමුත්ථානිකය. කායචිත්තයෙන් උපදී. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන පරිපාචිත ශික්ෂාපදයයි.

——\\——

දශමශික්ෂාපදයෙහි සියලු පාල්‍යාර්ථයද, විනිශ්චයද, දෙවන අනියතයෙහි කියූ නයින්ම දතයුතුය. මේ ශික්ෂාපදය දෙවන අනියතය හාද, මත්තෙහි අචෙලකවර්ගයෙහි පස්වන උපනන්ද ඇරැඹ පැණවූ සිකපද අතුරෙහි සිවුවන සිකපදය සමග එක් පිරිසිඳීමෙක් ඇත්තේය. අට්ඨොත්පත්තිවශයෙන් වෙන්ව පනවනලදී.

දහවන රහොනිසජ්ජශික්ෂාපදයායි

——\\——

වර්ණනාක්‍රමයෙන් තෘතීය භික්ෂුණීවර්ගය නිමියේය.

භොජනවග්ගයෙහි ප්‍රථම ශික්‍ෂාපදයෙහි '**ආවසථපිණ්ඩො**' ආවාසයෙහි පිණ්ඩය. හාත්පසින් වටකරනලද මඟි ගිලන් ගැබිනි පැවිදි යන මොවුන්ට සුදුසු පරිදි පැනවූ ඇඳපුටු ඇති නොයෙක් ගැබ්ද ප්‍රධාන පිරිසිදීම් ඇති ආවාසයක් කොට එහි පින් කැමැති බැවින් පඤ්චභොජනාදි පිණ්ඩය පනවනලද්දේ වේ. කැඳ බත් බෙහෙත් ආදී සියල්ල උන් උන්ට දෙනු පිණිස තබන ලද්දේවේය යන අර්ථයි. '**හියොපි**' හෙටද '**අපසක්කන්ති**' පහවයෙත්. '**මනුස්සා උජ්ඣායන්ති**' තීර්ථකයන් නොදක්නාහු. 'තීර්ථකයෝ කොතැන ගියාහුදැ'යි විචාරා මොවුන් දැක ගියාහුයයි අසා අවමන් කෙරෙත්. '**කුක්කුච්චායන්තා**' කුකුස් කරමින් අකප්පිය සංඥව උපදවමින් යන අර්ථයි. '**සක්කොති තම්හා ආවාසා පක්කමිතුං**' අඩයොදුනක් හෝ යොදුනක් හෝ යන්නට හැක්කේය. '**න සක්කොති**' මෙපමණක් ම නොහැක්කේ වේ. '**අනොදිස්ස**' මේ පාසාණ්ඩයන්ට හෝ මේ පාසාණ්ඩයන් අතුරෙහි මෙපමණ දෙනකුන්ට මැයි හෝ එක් පාසාණ්ඩයකු නොඋදෙසා සියල්ලන්ට පනවනලද්දේවේ. '**යාවදත්ථො**' බොජුන්ද මෙපමණමයයි නොපිරිසිඳ සෑහෙන පමණ පන වන ලද්දේය. '**සකිං භුඤ්ජිතබ්බං**' එක් දවසක් එක්වරක්ම අනුභව කටයුතුය. දෙවන දින පටන් පිළිගැණීම තිමිතිකොට දුක්කටය වේ. පිඩක් පිඩක් පාසා පාචිත්තිය වේ.

මේ වනාහි මෙහි විනිශ්චය වේ:

එක් කුලයක් විසින් හෝ නොයෙක් කුලයන් විසින් හෝ එක්ව එක් තැනක හෝ නොයෙක් තැන්හි හෝ. අද එක් තැනෙක්හිය, හෙට එක් තැනෙක්හිය'යි මෙසේ නියම නොකළ තැන්හි පනවනලද්ද, එක් තැනක එක් දවසක් අනුභව කොට දෙවන දවසෙහි එතැන හෝ අන්තැනක හෝ අනුභව කිරීම නොවටියි. නානාකුලයන් විසින් නානාස්ථානයන්හි පනවනලද්ද, එක් තැනක එක් දවසක් අනුභව කොට දෙවන දවසෙහි අන් තැනක අනුභව කිරීම වටියි. පිළිවෙළ ගෙවා නැවැත මුල පටන් අනුභව කිරීම නොවටීයයි **මහාපච්චරියෙහි** කියනලදී. එක් සමූහය නොයෙක් සමූහය එක් ගමය නොයෙක් ගම්ය යන මෙතැන්හි ද මෙම නයවේ. යම් ආවසථපිණ්ඩයෙක් එක් කුලයක් විසින් හෝ නොයෙක් කුලයන් විසින් හෝ එකට පනවන ලද්දේද සහල් නොලැබීමෙන් අතරතුර සිඳියේද, ඒ ආවසථපිණ්ඩයද අනුභව නොකටයුතුය. ඉදින් 'දෙන්නට නොහැක්කෙමු'යි සිඳදමා නැවැත කුසල් සිත උපන් කල්හි දෙන්නට පටන් ගණිත්ද මේ ආවසථපිණ්ඩය නැවැත එක් දවසක් අනුභව කිරීම වටීයයි **මහාපච්චරියෙහි** කියනලද්දේය.

'**අනාපත්ති ගිලානස්ස**' නැවැත එහි ලැග ලැග අනුභව කරන ගිලන් මහණහුට ඇවැත් නොවේ. '**ගච්ඡන්තො වා**' යම් මහණෙක් තෙමේ යනුයේ අතර මගැ එක් දවසක්ද, ගිය තැන එක් දවසක්ද, අනුභව කිරීම ලබන්නේය. පෙරළා එන කල්හිද මෙම නයවේ. ගොස් පෙරළා එන්නේද අතරමගැ එක් දවසක්ද, ආතැන එක් දවසක්ද අනුභව කිරීමෙහි වරද නැත්තේය. '**ගච්ඡිස්සාමි**' අනුභව කොට නික්මුණු මහණහුට ගඟ හෝ පිරී සිටියාද වෞරාදිභයෙක් හෝ වේද, ඒ මහණ තෙමේ නැවතී නිර්භයභාවය දැන යනුයේ නැවැත එක් දවසක් අනුභව කරන්නට ලබායි යන මේ සියල්ල **මහාපච්චරී** ආදියෙහි කියන ලද්දේය. '**ඕදිස්ස පඤ්ඤත්තො හොති**' මහණුන්ගේම ප්‍රයොජනය පිණිස උදෙසා පනවන ලද්දේවේද, '**න යාවදත්ථො**' සෑහෙන පමණින් පනවන ලද්දේ නොවේද, ටික ටික ලැබේද, එබඳු ආහාරය නිතිකල්හිම වළඳන්නට හැක්කේය. '**පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ**' කැඳ කැවිලි හා කුඩු මහත් පල ඈවිසින් හෙදවත්වූ සියලු තන්හි ඇවැත් නොවේ. කැඳ ආදිය නිතර වැළඳීම සුදුසුය. සෙස්ස ප්‍රකටමය. එළක ලොම සමුත්ථානිකය. කයින්ද කායචිත්තයෙන්ද, උපදී. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ආවසථපිණ්ඩ ශික්ෂාපදයයි

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි '**පරිහීනලාභසක්කාරො**' ඒ දෙව්දත් තෙමේ වනාහි අජාසත් රජහු ලවා පියරජු මරවාද, භාග්‍යවතුන්වහන්සේ නසනු පිණිස ධනුර්ධරයන් යොදවාද, ලොහිතුප්පාදය කොටද අප්‍රකට වූයේම වූයේය. යම් කලෙක දවල්හිම ධනපාලක ඇතු යෙදවූයේද, එකල්හි ප්‍රකට වූයේය. කිසේය යත්: 'දෙව්දත් තෙමේ ඇතු යෙදවූයේයයි කථා උපන්කල්හි, හුදෙක් ඇතු පමණක් නොයෙදවූයේය. රජුද මැරවූයේය, ධනුර්ධරයන්ද යැවූයේය, ගල්ද පෙරළුයේය, දෙව්දත් තෙමේ පාපයෙකු'යි ප්‍රකට වූයේය. 'කවරක්හු සමග මේ කම් කෙළේදැ'යි විචාළ කල්හි 'අජාසත් රජු සමගය'යි කීහ. ඉන්පසු නුවර වැස්සෝ 'කෙසේ නම් රජතෙමේ සඳුනට කටුවූ මෙබඳු සොරකු ගෙණ හැසිරෙන්නේදැ'යි නැඟීසිටියාහුය. රජතෙමේ නුවර ඇලලීගිය බව දැන දෙව්දතු නුවරින් බැහැර කෙළේය. එතැන් පටන් මොහුගේ බත්තලි පන්සියයද සිඳී ගියේය. මොහුගේ උපස්ථානයටද නොගියේය. එහි අන් මිනිස්සුද මොහුට කිසිවක් දියයුතුයයි හෝ කටයුතුයයි හෝ නොසිතූහ. එහෙයින් 'පරිහීනලාභසක්කාරො'යි වදරනලද්දේය. '**කුලෙසු විඤ්ඤාපෙත්වා**

**විසඤ්ඤපෙත්වා භුඤ්ජන්ති**' 'මාගේ ගණය තෙමේ නොබිඳේවා'යි පිරිස පෝෂණය කරමින් 'තෝ එක් මහණක්හට බත් දෙව, තෝ දෙදෙදනකුන්ට දෙව'යි මෙසේ විනවා පිරිස් සහිතවූ දෙව්දත් තෙමේ කුලයන්හි අනුභව කරයි. '**චීවරං පරිත්තං උප්පජ්ජති**' බත් නොගන්නවුන්ට සිවුරු නොදෙත්. එහෙයින් සිවුරු ටිකක් ලැබෙයි. '**චීවර කාරකෙ භික්ඛූ භත්තෙන නිමන්තෙන්ති**' ගමෙහි පිඩු පිණ්ඩස හැසිර කල් ගෙවා සිවුරු නිම කරන මහණුන් දැක 'මෙසේ වහා සිවුරු නිම කොට සිවුරු පරිභොග කරන්නාහුය'යි සිතා පින් කැමැති බැවින් බතින් පවරත්. '**නානාවෙරජ්ජකෙ**' නන්වැදෑරුම්වූ අන් අන් රටින් පැමිණියවුන් 'නානාවෙරඤ්ජකෙ'යිද පාඨයි. මෙහිද මේ අර්ථයමවේ.

'**ගණභොජනෙ**' ගණයාගේ බොජුන් නිමිති කොට. මෙහිද ගණනම් මහණහු සතරනමක් ආදිකොට ඉන් වැඩියක් මහණෝ වෙති. එහෙයින්ම සියලු අන්තිම පිරිසිඳීම දක්වන සේක්, '**යත්ථ චත්තාරො භික්ඛූ පෙ- එතං ගණභොජණං නාම**'යි වදාළසේක. ඒ මේ ගණභොජනය දෙයුරකින් ලැබේ. නිමන්ත්‍රණයෙන් හෝ විඥප්තියෙන් හෝය. නිමන්ත්‍රණයෙන් කෙසේ ලැබේද, යත්:- මහණුන් සිවුනමක් වෙත එළැඹ 'ස්වාමීනි' ඔබවහන්සේලා බතින් පවරමි, මාගේ බත ගණිවු, කැමැතිවවු, බලවු, ඉවසවු, බුහුමන් කරවු'යි මෙසේ යම් කිසි පරියාය වචනයකින් හෝ යම්කිසි භාෂාවකින් හෝ පංචවිධ හොජනයන්ගෙන් යම්කිසි නමක් ගෙණ පවරාද, මෙසේ එකට පවරනු ලැබූවෝ නියමිත කාල වසයෙන් අද හෝ හෙට හෝ එකට යෙත්. එකට පිළිගණිත්. එකට හිඳගෙණ වළඳත්. ගණභොජනය වේ. සියලු මහණුන්ට ඇවැත්වේ. එකට පවරන ලද්දහු එකට හෝ වෙන්ව හෝ යෙත්. එකට ගණිත්. වෙන්ව වලඳත්. ඇවැත්මය. මෙහි පිළිගැණීමම පමණවේ. එකට පවරනලද්දහු එකට හෝ වෙන්ව හෝ යෙත්. වෙන්ව ගණිත්. එකට හෝ වෙන්ව හෝ වලඳත් ඇවැත් නොවේ. පිරිවෙන් සතරකට හෝ විහාරයනට හෝ ගොස් වෙන්ව පවරන ලද්දහු එක් තැනක සිටියවුන් අතරෙහිම හෝ එක් මහණෙක් තෙමේ පුත්‍රයා විසින් එක් මහණෙක් තෙමේ පියා විසින්'යි මෙසේද වෙන්ව පවරන ලද්දහු එකට හෝ වෙන්ව හෝ යෙත්වා, එකට හෝ වෙන්ව හෝ වළඳත්වා, ඉදින් එකට ගණිත්ද, ගණභොජනය වේ. සියල්ලන්ට ඇවැත් වේ. මෙසේ වනාහි නිමන්ත්‍රණයෙන් ලබයි. විඥප්තියෙන් කිසේය, යත්:- සතර නමක් මහණෝ එකට සිටියාහු හෝ හුන්නාහු හෝ උපාසකයකු දැක 'අප සිවු නමට බත් දෙව'යි විනවන්නාහුය. වෙන්ව හෝ දැක 'මට දෙව, මට දෙව,යි මෙසේ එකට හෝ වෙන්ව හෝ විනවා එකට හෝ වෙන්ව හෝ යෙත්වා, බත් ගෙණද එකට හෝ වෙන්ව හෝ වළඳත්වා,

ඉදින් එකට ගණීත් නම් ගණභොජනය වේ. සියල්ලන්ට ඇවැත් වේ. මෙසේ විඥප්තියෙන් ලබයි.

'**පාදපි ඵාලිතා**' මහසමෙහි යට කොටසෙහි වූ සම පෙනේද, මෙසේ පැළුනාහ. වැලි හෝ කැටගල් හෝ හැපුනු ඇසිල්ලෙහි දුක් උපදවත්. ඇතුළු ගමෙහි පිඩු පිණිස හැසිරෙන්නට නොහැක්කේ වේ. මෙබඳු ගිලන්බවක් ඇති කල්හි ගිලන්සමයයි වැළඳිය යුතුය. මදගිලන් බව කැපයයි නොකටයුතුය. '**චීවරෙ කයිරමානෙ**' යම් කලෙක සළුවක්ද හුද ලැබ සිවුරක් කෙරෙත්ද, එකල්හි යම්හෙයකින් වෙන්ව චීවරකාරසමයෙක් නම් නැත්තේද, එහෙයින් යම් මහණෙක් තෙමේ එහි සිවුරෙහි කටයුතුවූ යම් කිසි කර්‍මයක් කෙරේද, **මහාපච්චරියෙහි** වනාහි යටත් පිරිසයින් හිදිවිදින්නෙක්දැයිද කියනලද්දේ වේද, ඔහු විසින් චීවරකාරසමයයි වැළඳිය යුතුය. **කුරුන්දියෙහි** වනාහි විස්තරයෙන්ම කියනලද්දේය. යම් මහණෙක් තෙමේ චීවරය පස්කඩ ආදිවසයෙන් සංවිධාන කෙරේද, සිඳීද, මොස සූත්‍ර තබාද, ආගන්තුකපත්‍ර තබාද, පෙරළා පැමිණියක් මසාද, ආගන්තුකපත්‍ර බඳීද, නුවාව සිඳීද, නුවාව අතින් හෝ දඬු කඩකින් හෝ ගටාද, නගාද, එහි පෙරළා පැමිණියක් මසාද, හුවැටි කෙරේද, දණ්ඩක හෝ අතෙහි හෝ ඕතාද, කතුර මුවහත් තබාද, පරිවර්‍තන කෙරේද, සියල්ලම සිවුර කෙරේමයයි කියනු ලැබේ. යමෙක් තෙමේ වෙත හුන්නේ ජාතකයක් හෝ ධර්‍මපදයක් හෝ කියාද, මෙතෙමේ සිවුර කරන්නෙක් නොවේ. මොහු හැර සෙස්සන්ට ගණභොජනය නිමිති කොට ඇවැත් නොවේ. '**අද්ධයොජනං**' මෙපමණදුර අඩයොදුනක් යනු කැමැත්තහු විසින් යමෙක් වනාහි දුර යනු කැමැත්තේ නම් එහි කියයුත්තෙක්ම නැත්තේය. '**ගච්ඡන්තෙන**' අදින්මග යන්නහු විසින් අඩයොදුන්තුළ ගව්වක් තන්හිද වැළඳීම වටියි. '**ගතෙන භුඤ්ජිතබ්බං**' ගියහු විසින් එක් දවසක් වැළඳිය යුතුය. '**නාවාභිරුහනෙ**' නැව් නැඟීමෙහිද මෙම නයවේ. මේ වෙනසය:- නැව් නැංගහු විසින් කැමැති තැනට ගොස්ද, යම්තාක් නොබසීද, ඒතාක් වැළඳිය යුතුය'යි **මහාපච්චරියෙහි** කියනලදී. '**චතුත්ථෙආගතෙ**' 'චතුත්ථෙ ආගතෙ' යනු මේ අන්තිම පරිච්ඡෙදයයි. තුන් නමක් පිඩු සිහා වළඳන තැනට සතරවන නමක් පැමිණි කල්හි යම් තැනක නොයැපෙත්ද, ඒ මහාසමය නම්වේ. යම් තැනක සියයක් හෝ දහසක් හෝ රැස් වෙත්ද, එහි කියයුත්තක්ම නැත්තේය. එහෙයින් එබඳු කාලයෙහි මහාසමයයි ඉටා වැළඳිය යුතුය. '**සො කොචි පරිබ්බාජකසමාපන්නො**' සහධාර්මිකයන් අතුරෙහි හෝ තීර්ථකයන් අතුරෙහි හෝ එක්තරා එකෙක්. මොවුන් අතුරෙහි යම්කිසිවකු විසින් කළ බත් ඇති කල්හි සමණභත්තසමයයි වැළඳිය යුතුය. '**අනාපත්ති**

**සමයෙ**' සත් සමයන් අතුරහි එක්තරා සමයෙක්හි ඇවැත් නොවේ. '**දෙව තයො එකතො**' යම් කෙනෙක් තුමූ නොකැප පැවරීම ඉවසා දෙතුන් දෙනෙක් හෝ එක්ව ගෙණ වළඳත්ද, ඔවුන්ටද ඇවැත් නොවේ.

එහි අතිමන්තිතචතුක්ක -පිණ්ඩපාතිකචතුක්ක - අනුපසම්පන්නචතුක්ක - පත්තචතුක්ක - ගිලානචතුක්ක යන පඤ්චවිධ චතුෂ්කයන්ගේ වශයෙන් විනිශ්චය දතයුතුය. කිසේය, යත්:- මෙහි ඇතැම් එකෙක් මහණුන් සතර නමක් 'බත් ගණු මැනැවැ'යි පවරයි. ඔවුන් අතුරෙහි තුන්නමක් එහි ගියහ. එකෙක් නොගියේය. උපාසක තෙමේ 'ස්වාමීනි' තෙර නමක් කොහිදැ'යි විචාරයි. 'උපාසකය' නොආයේය'යි කියත්. ඒ උපාසක තෙමේ එකෙණෙහි පැමිණි අන් මහණක්හට 'ස්වාමීනි' වඩිනු මැනැවැ'යි පිවිසවා සතර නමටම බත් පිළිගන්වයි. සියල්ලන්ට ඇවැත් නොවේ. ගණපූරකයට නිමන්ත්‍රණය නොකළ බැවිනි. තුන් දෙනෙක්ම එහි පවරනලද්දහු බත් ගත්තාහුය. ඔවුන් ගෙන් ගණය නොපිරේ. ගණපූරක තෙමේද නොපවරනලද්දේය. එයින් ගණය බිඳෙයි. මේ අතිමන්තිතචතුක්කයයි. පිණ්ඩපාතිකචතුක්කයෙහි පවරන කාලයෙහි එක් මහණෙක් තෙමේ පිණ්ඩපාතිකවේ. හෙතෙමේ නොඉවසයි. වඩිනකල්හි 'ස්වාමීනි' වඩිනු මැනැවැ'යි කියූ කල්හි නොඉවසූ බැවින් නොඑන්නහුද, එනු මැනැවැ, භික්ෂාව ලබවු'යි ගෙණ යෙත්. හෙතෙමේ ඒ ගණය බිඳියි. එහෙයින් සියල්ලන්ට ඇවැත් නොවේ. අනුපසම්පන්නචතුක්කයෙහි හෙරණකු සමග පවරන ලද්දහු වෙත්. හෙතෙමේද ගණය බිඳියි. පත්තචතුක්කයෙහි එකෙක්, තෙමේ නොගොස් පාත්‍රය යවයි. මෙසේද, ගණය බිඳෙයි. එහෙයින් සියල්ලන්ට ඇවැත් නොවේ. ගිලානචතුක්කයෙහි ගිලනකු සමග පවරනලද්දහු වෙත්. එහි ගිලනහුටම ඇවැත් නොවේ. අන්‍යයන්ට වනාහි ගණපූරකයෙක්වේ. ගිලනා කරුණු කොට ගණය නොබිඳෙයි. එහෙයින් ඔවුන්ට ඇවැත්මය. **මහාපච්චරියෙහි** ගිලෙනෙක් හෝ සිවුරුකරන්නෙක් හෝයි විශේෂයක් නොතබා සාධාරණ විසින් කියනලද්දේය. සමය ලබ්ධකතෙමේ, තෙමේම, මිදෙයි. සෙස්සන්ට ගණපූරක බැවින් ඇවැත් කරන්නේ වේ. එහෙයින් චීවරදනකාලය ලද මහණ ආදීන්ගේ වසයෙන් චතුෂ්කයෝ දතයුත්තාහුය.

ඉදින් ඉවසා ගියාවූ සිවුදෙනා අතුරෙහි එක් නුවණැති මහණෙක් තෙමේ 'මම තොපගේ ගණය බිඳින්නෙමි. පැවරීම ඉවසවු'යි කියා කැඳ කැවිලි අවසන්හි බත් පිණිස පාත්‍රය ගන්නවුන්ට නොදී 'මේ මහණුන් පළමු කොට වළඳවා හරිවු, මම පසුව අනුමොදනා කොට යන්නෙමි'යි හුන්නේ ඔවුන් වළඳ ගියකල්හි 'ස්වාමීනි' පාත්‍රය දුනමැනැවැ'යි උපාසකයා විසින් පාත්‍රය ගෙණ බත් දුන් කල්හි වළඳ අනුමොදනා කොට යයි.

සියල්ලන්ට ඇවැත් නොවේ. පඤ්චවිධ භොජනයන්ගේම වසයෙන්ම ගණභොජනයෙහි විරුද්ධයෙක් නැත්තේය. බතින් පවරන ලද්දහු කොමු පිළිගන්නාහුද, ඇවැතට පැමිණෙත්. ඒ කොමු ද ඔවුන් විසින් එකට නොපිළිගන්නා ලද්දහුය. කැඳ ආදියෙන් වනාහි විරුද්ධය වේ. ඒ කැඳ ආදීහු එකට පිළිගන්නාලද්දහුයයි මෙසේ එක් පණ්ඩිතයෙක් තෙමේ අන්‍යයන්හටද අනාපත්ති කරයි. එහෙයින් කිසිවෙක් සහබතක් කරනු කැමැත්තහු විසින් පැවරීම පිණිස යවන ලද්දේ විහාරයට පැමිණ 'ස්වාමිනි' හෙට අපගේ ගෙයි භික්‍ෂාව ගණු මැනැවැයි නොකියා 'බත් ගණු මැනැවැ'යි හෝ සහබත් ගණු මැනැවැ'යි 'සඞ්ඝ තෙමේ බත් ගණිවා'යි හෝ කියා නම්, භත්තුද්දෙසකයා පණ්ඩිත විය යුතුය. පවරනලද්දහු ගණභොජනයෙන්ද, පිණ්ඩපාතිකයෝ ධුතඞ්ග භෙදයෙන් මිදිය යුත්තාහුය. කිසේය, යත්: 'උපාසකය' හෙට නොහැකිය'යි මෙසේ කිය යුතුය. 'ස්වාමීනි' දෙවන දවසෙහි කියාද, නොහැකිය'යි කියයුතුය. මෙසේ අඩ මසකුදු ගෙවා නැවැත තෝ කුමක් කීයෙහිදැයි විචාළයුතුය. ඉදින් නැවැතද 'සහබත් ගණු මැනැවැ'යි කියා නම් ඉන්පසු 'උපාසකය' මේ මල් කැප කරවා මේ තෘණයි මෙසේ විකෙෂප කොට නැවැත 'තෝ කුමක් කීයෙහිදැ'යි විචාළයුතුය. ඉදින් නැවතත් එසේම කියා නම්, 'ඇවැත' තෝ පිණ්ඩපාතිකයන් හෝ මහතෙරුන් හෝ නොලබන්නෙහිය. හෙරණුන් ලබන්නෙහිය'යි කියයුතුය. 'ස්වාමීනි' අසුවල් අසුවල් ගමෙහිද පින්වතුන් වහන්සේලා වැළඳවූවාහු නොවෙත්ද, කුමක් හෙයින් මම නොලබම්දැ'යි කියූ කල්හි ඔවුහු පවරන්නට නොදනිත්. තෝ නොදන්නෙහිය'යි කියයුතුය. 'ස්වාමීනි' ඔවුහු කෙසේ පැවැරුවාහුදැ'යි අසාද, ඔවුහු 'ස්වාමීනි' අපගේ භික්‍ෂාව ගණු මැනැව'යි මෙසේ කීහු. ඉදින් හෙතෙමේත් එසේම කියා නම් වටියි. එකල්හි නැවැතද බත් ගණු මැනැවැයි කියාද, 'ඇවැත' තෝ දැන් බොහෝ මහණුන් නොලබහි, තුන් දෙනකුන්ම ලබහි'යි කිය යුතුය. 'ස්වාමීනි' අසුවල් අසුවල් ගමෙහිද සියලු භික්‍ෂුසඞ්ඝයා වැළඳෙව්වාහු නොවෙත්ද, මම කුමක් හෙයින් නොලබම්දැ'යි කියාද, තෝ පවරන්නට නොදනිහි'යි කියයුතුය. 'ඔවුහු කෙසේ පැවැරුවාහුදැ'යි අසාද, ඔවුහු භික්‍ෂාව ගණිවු'යි කීහුයි කියයුතුය. ඉදින් හෙතෙමේද, භික්‍ෂාව ගණු මැනැවැයි කියාද වටියි. එකල්හි නැවැතද බත්මයයි කියාද, ඉන්පසු 'තෝ යව, අපට තාගේ බතින් වැඩෙක් නැත්තේයයි කිය යුතුය. මේ අපගේ නිබද්ධ ගෝචරය වේ. අපි මෙහි පිඩු පිණිස හැසිරෙන්නෙමු'යි කියයුතුය. 'ස්වාමීනි' එහි හැසිරෙවු'යි කියා ආවක්හු අතින් 'කිම, පින්වත, භික්‍ෂූහු ලද්දහුදැ'යි විචාරත් නම්, මෙහි මොහු විසින් කිම, බොහෝ කොට කිය යුතුද, 'තෙරහු හෙට පිඩු පිණිස

හැසිරෙන්නෙමු'යි කීහු. 'තෙපි දැන් පමානොවවු'යි දෙවන දවසෙහි සෑ වත්කොට සිටි මහණෝ සඞ්ඝස්ථවිරයන් විසින් 'ඇවැත්ති' සමීපගමෙහි සඟබතක් වත්නේය. නුවණනැති මිතිසෙක් ගියේය. යමු, සමීපගමෙහි පිඩු පිණිස හැසිරෙන්නෙමු'යි කියයුතුය. භික්ෂූන් විසින් තෙරුන්ගේ වචනය කටයුතුය. අකීකරු නොවියයුතුය. ගම්දෙර නොසිටම පිඩු පිණිස හැසිරිය යුතුය. ඔවුන් පාත්‍ර ගෙණ වඩාහිඳුවා වළඳවන කල්හි වැළඳිය යුතුය. ඉදින් අසුන්හල්හි බත් තබා වීථියෙහි ඇවිදින්නාහු 'ස්වාමීනි' අසුන්හලෙහිදී බත් ගණිවු'යි සැල කෙරෙත් නම් නොවටියි. එකල්හි බත් ගෙණ ඒ ඒ තැන ගොස් බත් ගණිවු'යි කියත්ද, පළමු කොටම හෝ විහාරයට ගෙණ අවුත් සුදුසු තැනක තබා ආ ආවුන්ට දෙත්ද, මේ එළවන ලද භික්ෂාව නම් වටියි. ඉදින් බත් හලෙහි දන් පිළියෙල කොට 'බත්හලෙහි බත් ගණිවු'යි ඒ ඒ පිරිවෙණට යවත්ද, නොවටියි. යම් මනුෂ්‍යයෝ පිණ්ඩචාරිකභික්ෂූන් දැකම අසුන්හල හැමදෑ එහි වඩා හිඳුවා වළඳවත්ද, ඔවුහු ප්‍රතික්ෂෙප නොකටයුත්තාහ. යම් කෙනෙක් තුමූ ගමෙහිදී භික්ෂාව නොලැබ ගමින් නික්මෙන මහණුන් දැක 'ස්වාමීනි' බත් ගණිවු'යි කියත්ද, ඔවුහු ප්‍රතික්ෂෙප කටයුත්තාහ. නොනැවතිය යුත්තේ හෝය. ඉදින් 'ස්වාමීනි' නවතිනු මැනැව, බත් ගණිවු'යි කියත්ද, 'නවතිනු මැනැව'යි කියූ පදයෙහිලා නැවතීම වටියි. 'ස්වාමීනි' නවතිනු මැනැව, ගෙයි බත් පිළියෙල කරන ලද්දේය, ගමෙහිද බත් පිළියෙල කරනලද්දේය, නවතිවු'යි කියත්ද, ගෙයිද ගමෙහිද කළ බත නම්. යම් කිසිවකුගේ වේය'යි නැවතීම වටියි. 'නවතිවු, බත් ගණිවු'යි සම්බන්ධ කොට කියත්ද, නැවතීම නොවටියි. අසුන්හලින් පිඩු පිණිස හැසිරෙන්නට නික්මෙන්නවුන් දැක 'ස්වාමීනි' හිඳිනු මැනැවැ'යි කියූ කල්හිද මේ නයමවේ.

'**නිච්චභත්තං**' නිතිබත කියනු ලැබේ. 'නිතිබත ගණිවු'යි කියත්ද, බොහෝ දෙනකුන්ටද එකට ගැණීම වටියි. ලහබත් ආදියෙහිද මේ නයමවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙවන ගණභොජන ශික්ෂාපදයයි

——\\——

තෘතීය ශික්ෂාපදයෙහි '**න ඛො ඉදං ඔරකං භවිස්සති යථා ඉමෙ මනුස්සා සක්කච්චං භත්තං කරොන්ති**' යම් නියමකින් මේ මනුෂ්‍යයෝ

සකස් කොට බත් කෙරෙත්ද, එයින්, මේ ශාසනය නොහොත් බුද්ධ ප්‍රමුඛසඞ්ඝයා විෂයයෙහි පවත්වනලද මේ නය ලාමක නොවේ. සවලපවූ ලාමක එකක් නොවන්නේය'යි දන්නා ලැබේ. '**කිරපතිකො**' මෙහි **කිර** යනු ඒ කුලපුත්‍රයාගේ නාමයයි. අධිපති අර්ථයෙන් කිරපතිකයි කියනු ලැබේ. හෙතෙමේ වනාහි ඊශ්වර අධිපතියෙක්වේ. මාස ඍතු සංවත්සර නියමයෙන් වැටුප්දී කම්කරුවන් ලවා වැඩ කරවයි. '**බදරා පටියත්තා**' උපචාරවසයෙන් කියයි. '**බදරමිස්සෙන**' ඩෙබර මුසු කැඳින්. '**උස්සූරෙ ආහරියිත්ථ**' ඉතා දවල්වූ කල්හි ගෙණඑන ලද්දේය. '**මය්හං භත්තපච්චාසං ඉත්ථන්නාමස්ස දම්මි**' මේ භත්ත විකප්පනය නම් හමුවෙහිද නොහමුවෙහිද වටියි. හමුවෙහි දැක 'තුය්හං විකප්පෙමි'යි කියා පළමු ආරාධනා බත යමක්හට විකපනය කොට පරම්පරභොජනය වැළඳිය යුතුය. හමුවෙහි නොදැක පස්සහ දැහැමියන් අතුරෙහි 'ඉත්ථන්නාමස්ස විකප්පෙමි'යි කියා වැළඳිය යුතුය. **මහාපච්චරී** ආදියෙහි නොහමුවිකපනයම කියනලදී. ඒ මේ නොහමුවිකපනය යම්හෙයකින් විනය කර්මයෙන් සඞ්ග්‍රහකරනලදද එහෙයින් භාග්‍යවතුන් වහන්සේට විකපනය කිරීම නොවටියි. භාග්‍යවතුන් ගඳකිළියෙහි වැඩහුන් කල්හිද සභමැද වැඩහුන් කල්හිද සඞ්ඝයා විසින් ගණයට පමණවන මහණුන් ගෙණ ඒ ඒ කර්මය කරනලද්දේ මොනවට කරන ලද්දේම වේ. භාග්‍යවතුන් වහන්සේ කර්මය කොප්‍ය නොකෙරෙත්මය. සම්පාදනය නොකෙරෙත්. කුමක් හෙයින, යත්: ධර්මේශ්වර බැවින් කර්මය කොප්‍යය නොකෙරෙත් ගණපූරක නොවන බැවින් සම්පාදනය නොකෙරෙත් එහෙයිනි.

'**ද්වෙ තයො නිමන්තනෙ එකතො භුඤ්ජති**' පැවරීම් දෙකතුනක් එක් පාත්‍රයෙක්හි බහා මිශ්‍රකොට එකක්කොට අනුභව කෙරේය යන අර්ථයි. දෙතුන් කුලයක් පවරා එක් තැනක හිඳුවා එහෙත් මෙහෙත් ගෙණවුත් බත් දමත්ද, සූපබ්‍යඤ්ජන බහාලත්ද, එකට මිශ්‍රවේද, ඇවැත් නොවේයයි **මහාපච්චරියෙහි** කියනලදී. ඉදින් මුල් පැවරීම යටවේද, පැසුළු පැසුළු පැවරීම් මතුවේද, මතුවෙහි පටන් වළඳන මහණහුට ඇවැත්වේ. අත ඇතුළට ප්‍රවෙශ කොට පළමු පැවරීමෙන් එක් පිඩක් උදුරා වැළඳූ කල පටන් යම් ඒ ලෙසකින් හෝ වළඳන්නහුට ඇවැත් නොවේ. ඉදින් එහි කිරි හෝ රසයක් හෝ වක්කෙරෙත්ද, යමකින් යටකළ බත එක් රසයෙක් වේද, කෙළවර පටන් වළඳන්නහුට ඇවැත් නොවේයයි **මහාපච්චරියෙහි** කියනලදි. මහාඅර්ථකථාවෙහි වනාහි කිරිබතක් හෝ රසබතක් ලැබ හුන්නහුගේ පාත්‍රයෙහි එහිම අන්‍යයෝද කිරිබතක් හෝ රසබතක් හෝ බහාලත්ද, කිරි හෝ රසය හෝ බොන ඒ මහණහුට ඇවැත් නොවේ. වළඳන්නහු විසින් පළමු ලද මස් කඩ හෝ බත් පිඩ

හෝ මුඛයෙහි බහා කෙළවර පටන් වැළදීම වටියි. ගිතෙල් කිරිබතෙහිද මෙම නයය. ගෘහස්වාමියෙක් තෙමේ මහණුන් පවරායි, ඒ කුලයට එළැඹි මහණහුගේ පාත්‍රයෙහි ගෘහස්වාමි තෙමේද, ඔහුගේ අඹුදරු බැ බුහුන ආදීහුද තම තමන්ගේ කොටස් ගෙණවුත් පාත්‍රයෙහි බහත්, උපාසකයා විසින් පළමුව දුන් දෙය නොවළඳ පසුව ලද දෙය වළඳන මහණහුට ඇවැත්යි කියනලදී. **කුරුන්දට්ඨකථා** වෙහි වටීයයි කියනලදී. **මහාපච්චරියෙහි** 'ඉදින් වෙන්ව පිසත්ද, තමතමන්ට පිසූ බතින් ගෙණවුත් දෙත්ද, එහි පසුව ගෙණෙනලද්ද, පළමු කොට වළඳන මහණහුට පාචිත්තිය වේ. ඉදින් සියල්ලන්ට එක්ම පාකයෙක් වේද, පරම්පරභොජනය නොවේයයි කියනලදී. ගෘහස්වාමි තෙමේ පවරා හිඳුවයි. අන් මිනිසෙක් පාත්‍රය ගණියි. නොදිය යුතුය. 'ස්වාමීනි', කිම නොදෙවුදැ'යි ඇසූවිට 'උපාසකය' තාවිසින් පවරනලදුයෙම් නොවෙමි'යි කියයුතුය. 'ස්වාමීනි' වේවා, ලද ලද දෙය වළඳවු'යි කියා නම් වැළදීම වටියි. අනිකෙකු විසින් ගෙණවුත් බත් දුන් කල්හි විචාරා වැළදීම වටීයයි **කුරුන්දියෙහි** කියනලදී. අනුමොදනා කොට යන්නහුට බත් අසනු කැමැත්තෝ 'ස්වාමීනි' හෙටද වැඩිනු මැනැවැ'යි සියල්ලන් පවරත්ද, දෙවන දිනයෙහි අවුත් ලද ලද දෙය වැළදීම වටියි. කුමක් හෙයින, යත්:- සියල්ලන් විසින් පැවරූ බැවිනි. එක් මහණෙක් පිඬු පිණිස හැසිරෙන්නේ බත් ලබයි. අන් උපාසකයෙක් ඔහු පවරා ගෙයි හිඳුවයි. එහෙත් මෙතෙක් බත් පිළියෙල නොවූයේය. ඉදින් ඒ මහණ තෙමේ පිඬු පිණිස හැසිර ලද බත වළඳ නම් ඇවැත්වේ. නොවළඳ හුන් කල්හි 'ස්වාමීනි' කිම නොවළඳහිදැ'යි ඇසූ කල්හි 'තාවිසින් පැවරූ බැවිනැ'යි කියා 'ස්වාමීනි' ලද ලද දෙය වළඳවු'යි කියනලද්දේ වළඳ නම් වටියි. **'සකලෙන ගාමෙන'** සියලු ගම් වැසියන් එක්ව පවරන ලදුවම යම් කිසි තැනක හිඳ වළඳන මහණහුට ඇවැත් නොවේ. සමූහයා කෙරෙහිද මේ නයමවේ. **'නිමන්තියමානො භික්ඛං ගහෙස්සාමීති භණති'** බත් ගණුව'යි පවරනු ලබන්නේ 'තාගේ බතින් මට ප්‍රයොජන නැත්තේය. භික්ෂාව ගන්නෙමි'යි කියයි. **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ මෙසේ කියමින් මේ ශික්ෂාපදයෙහි නොපැවරීම කරන්නට හැක්කේය. වළඳනු පිණිස අවකාශ කරනලද්දේ වේයයිද, ගණභොජනයෙන් නොමිදේමය. චාරිත්‍රයෙන් නොමිදේයයිද කීහ. **මහාසුමන** ස්ථවිරයන් වහන්සේ 'යම් කරුණකින් නොපැවරීම කරන්නට හැක්කේද, ඒ කරුණෙන් ගණභොජනය නොමවේ. චාරිත්‍රය නොවේය'යි කීහ. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාක්‍රිය සමුට්ඨානය. මෙහි වැළදීම ක්‍රියාසමුට්ඨානය. විකපනය නොකිරීම

අක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන පරම්පර භොජන ශික්ෂාපදයයි

—\\—

චතුර්ථශික්ෂාපදයෙහි 'කාණමාතා' කාණාවගේ මවුතොමෝය. මැයගේ දූතොමෝ විශිෂ්ට රූ ඇත්තීවූය. යම් යම් කෙනෙක් ඇය දකිත්ද, ඒ ඒ අය රාගයෙන් කණවෙත්. රාගයෙන් අන්ධවෙත්ය. යන අර්ථයි. එහෙයින් අන්හුගේ කණබව කරන හෙයින් කාණායි ප්‍රසිද්ධවූය. ඇයගේ වසයෙන් මවු තොමෝද 'කාණමාතා'යි ප්‍රකට වූවාය. 'ආගතං' ඊමය. 'කිස්මිං විය' කෙබන්දක් මෙන් ලජ්ජාවීමක් මෙන් වේය යන අදහසය. 'රිත්තහත්ථං ගන්තුං' හිස් අත් ඇති මේ ගමනෙහි. ඒ මේ හිස් අත් ඇති. මේ ගමනෙහි. ඒ මේ හිස් අත් ඇති. ඒ හිස් අත් ඇති ගමන යන්නට ලජ්ජා ඇතියකු මෙන් වේයයි කියනලද්දේවේ. 'පරික්ඛයං අගමාසි' උපාසිකා තොමෝ ආයර්‍යශ්‍රාවිකාය. මහණුන් දැක ඇත්තාවූ දෙයක් නොදෙන්නට නොහැක්කීය. යම්තාක් සියල්ල ක්ෂයට ගියේද, ඒතාක් දෙවීය. 'ධම්මියා කථාය' මෙහි කාණාතොමෝද මවු පිණිස දෙසනු ලබන ධර්මය අසන්නී දෙශනාවගේ කෙළවර සෝවාන් වූය. 'උට්ඨායාසනා පක්කාමි' අසුනෙන් නැගිට ගියාය. ඒ පුරුෂ තෙමේද, ශාසතෘන් වහන්සේ වනාහි කාණමාතාවගේ ගෙට වැඩිසේකැයි අසා කාණාව ගෙන්වා පළමු තනතුරෙහිම තැබූයේය. මේ වස්තුව උපන් ඇසිල්ලෙහි වනාහි ශික්ෂාපදය නොපැනවූ කල්හිම පාථෙය්‍ය වස්තුව පහළවූයේය. එහෙයින් අනතුරුවමද මෙය දක්වන්නට 'තෙන ඛො පන සමයෙන' යනාදිය වදරන ලද්දේය. ඒ උපාසක තෙමේද ආයර්‍යශ්‍රාවක බැවින් සියල්ලම දෙවූයේය. එහෙයින් 'පරික්ඛයං අගමාසි'යි කියනලදී.

'යං කිඤ්චි පහෙණකත්ථාය' පඩුරු පිණිස පිළියෙල කළ යම් කිසි අතිරස අග්ගල, තලකැරලි ආදි සියල්ල මෙහි 'පූව'යි ගිණීමට යයි. 'යං කිඤ්චි පාථෙය්‍යත්ථාය' මග යන්නවුන්ට අතරමග පිණිස පිළියෙල කළ යම්කිසි බැදිපිටි නොබැදිපිටි තලසහල් ආදී සියල්ල මෙහි මන්ථයි කියාම ගිණීමට යයි. 'තතො වෙ උත්තරිං' ඉදින් තෙවන පාත්‍රය මුදුන් කරන ලදුව ගණීද, මුවවිට යට රෙඛාව පටන් මතුවෙහි තුබූ පූ ගණකින් පාචිත්තිය වේ. 'ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා' මුවවිට යට රෙඛාව පටන් සමව පිරුනු පාත්‍ර ගෙණ 'අත්‍ර මයා ද්වත්තිපත්තපූරා' මෙහි ඉදින් පාත්‍ර දෙකක් පිළිගත්තා ලද්දේ නම්. මෙහි මා විසින් පාත්‍ර

දෙකක් පුරා පිළිගන්නා ලද්දේය. තෝ එකක් ගණුව'යි කියයුතුය. ඔහු විසින්ද අන් මහණකු දැක පළමු කොට ආවහු විසින් පාත්‍ර දෙකක් පුරා ගන්නාලද්දේය. මා විසින් එක් පාත්‍රයක් ගන්නා ලද්දේය. තෝ නොගණුව'යි කියයුතුය. යමකු විසින් පළමු කොට එකක් ගන්නාලද්දේද, ඔහුගේද, පරම්පරාරොචනයෙහි මේ නයම වේ. යම් මහණකු විසින් තමන් විසින්ම තුනක් ගන්නා ලද්දේද, ඒ මහණහු විසින් අන් මහණකු දැක 'මෙහි තෝ නොපිළිගණුව'යි මෙසේ කියයුතුය. **'පටික්කමනං හරිත්වා'** අඳුන්හලට ගෙණ ගොස් අඳුන්හලට යන්නහු විසින්ද, හැරදැමූ ශාලාවට නොයායුතුය. යම් තැනක මහා භික්ෂු සඞ්ඝ තෙමේ හිඳීද, හැරදැමූ ශාලාවට නොයායුතුය. යම් තැනක මහාභික්ෂු සඞ්ඝ තෙමේ හිඳීද, එහි යායුතුය. **මහාපච්චරියෙහි** වනාහි 'යම් ශාලාවක් තොමෝ භික්ෂාව ලද තැනින්' ආසනනවූ ආසනශාලාවක්' වීද, එහි යායුතුය. සන්දිට්ඨසම්භත්තයන්ට හෝ ඥාතිකායන්ට හෝ දෙන්නෙමි'යි අන් තැනක යන්නට නොලබයි. ඉදින් මොහුගේ තිබඳ හිඳිත තැනක් වේද, දුරද යන්නට වටීයයි කියනලදී. **'සංවිභජිතබ්බං'** ඉදින් පාත්‍ර තුනක් පුරා ගන්නාලද්දේද, එකක් තමන්ට තබා දෙකක් භික්ෂුසඞ්ඝයාහට දියයුතුය. දෙකක් ගන්නාලද්දේ නම් එකක් තමන්ට තබා එක් පාත්‍රයක් සඞ්ඝයාහට දියයුතුය. මිතුරුලෙසින් දෙන්නට නොලබයි. යම් මහණකු විසින් එක් පාත්‍රයක් ගන්නාලද්දේද, ඔහු විසින් නොකැමැත්තෙන් කිසිවක් නොදියයුතුය. කැමැතිසේ කටයුතුය. **'ගමනෙ පටිප්පස්සද්ධෙ'** අතර මග උවදුරක් හෝ දැක ප්‍රයොජන රහිත බැවින් හෝ 'අපි දැන් නොයවන්නෙමු, නොයන්නෙමු'යි මෙසේ වැළකුනු කල්හි සිඳුනු කල්හි **'ඤාතකානං පවාරිතානං'** මේ නෑයන් බොහෝ කොට දෙන කල්හි දෙතුන් පාත්‍රයකට වඩා පිළිගන්නා මහණහුට ඇවැත් නොවේ. අන්ධ කථාවන්හි වනාහි ඒ නෑයන්ගේද පඩුරු මගවියදම් පිණිස පිළියෙල කොට යවන ලද දෙයින් පමණම වටීයයි කියනලදී. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියා සමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

සිවුවන කාණමාතුශික්ෂාපදයයි.

——\\——

පඤ්චමශික්ෂාපදයෙහි **'භික්ඛූ භුත්තාවී පවාරිතා'** බමුණහු විසින් 'ස්වාමීනි' යම්තාක් කැමැත්තහු නම් එපමණ ගණු මැනැවැ'යි මෙසේ සෑහෙන පමණ ගැණීමට කළ පැවරීමෙන්ද 'ඇවැත', පමණි, ටික ටික දෙව'යි මෙසේ තමන්ගේ ප්‍රතික්ෂෙප පවාරණයෙන්ද පවරන ලද්දහුය.

'**පටිවිස්සකෙ**' අවට ගෙවල වැසියෝ '**කාකොරවසද්දං**' කවුඩන් හඬන හඬ. රැස්ව විරාවය කරන්නවුන්ගේ ශබ්දය. '**අලමෙතං සබ්බන්ති**' මෙහි තිකාරය නොකියාම '**අලමෙතං සබ්බං**' යන මෙපමණක් කීම වටියි. '**භුත්තාවී**' අනුභව කළ භොජනය ඇත්තේය. එහිද යම් හෙයකින් යමකු විසින් එකද උලක් කා හෝ නොකා හෝ පරගලගත කරන ලද්දේවේද, හෙතෙමේ භුත්තාවීයි ගිණීමටයයි එහෙයින් මේ ශික්ෂාපදයෙහි පදභාජනයෙහි '**භුත්තාවී නාම පඤ්චන්නං භොජනානං**' යනාදිය වදළ සේක. '**පවාරිතො**' කළ පවාරණය ඇත්තේ. කළ ප්‍රතික්ෂෙප ඇත්තේ. ඒ පවාරණයද යම්හෙයකින් ප්‍රතික්ෂෙපමාත්‍රයෙකින් නොවේද, වැලි කෙසේ පවරණ ලද්දේවේද, යත්: පස් අභක්හුගේ වසයෙන් වේ. එහෙයින් මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි '**පවාරිතො නාම අසනං පඤ්ඤායති**' යන මෙයින් අඩාලකළ භොජනය ඇත්තේද, ඔහු විසින් කිසිවක් අනුභව කරනලද්දේය. කිසිවක් අනුභව නොකරන ලද්දේය. යමක් අනුභව කරනලද්දේද, ඒ සඳහා 'භුත්තාවී'යි ගිණීමට යන්නේය. එහෙයින් භුත්තාවී යන වචනයෙන් වෙන්වූ කිසි අත්ථසිද්ධියක් නොදකිමු. 'ද්විරත්ත තිරත්තං ඡප්පඤ්චවාචාහි' යනාදි තන්හි ද්විරත්තාදිවචන මෙන් පවාරිතපදයාගේ පරිවාරකභාවයෙන්ද බ්‍යඤ්ජනසිලිට්ඨතාවයෙන්ද මෙය කියන ලදැයි දතයුතුය. '**අසනං පඤ්ඤායති**' යනාදි තන්හි අඩාල කළ භෝජනය දක්නා ලැබේ. මේ පුද්ගල තෙමේ අනුභව කරන්නේ වේය යන අථයි. '**භොජනං පඤ්ඤායති**' පවාරණයට පොහොනා භොජනය දක්නා ලැබේ. ඔදනාදීන් අතුරෙහි ප්‍රතික්ෂෙප කටයුතුවූ එක්තරා භොජනයක් වේය යන අත්ථයි. '**හත්ථපාසෙ ඨිතො**' ඉදින් පවාරණයට පොහොනා භොජනයක් ගෙණ දයක තෙමේ දෙරියන් හමාරක් පමණවූ අත් පසෙහි වේනම් යන් අත්ථයි. '**අභිහරති**' ඉදින් ඒ දයක තෙමේ ඔහුට ඒ බත කයින් එළවානම් යන අත්ථයි. '**පටික්ඛෙපො පඤ්ඤායති**' ප්‍රතික්ෂෙපය දක්නා ලැබේ. එළවනලද ඒද. ඒ මහණ තෙමේ කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂේප කෙරේ නම් යන අත්ථයි. මේ පස් වැදෑරුම්වූ අඩගයන්ගේ වසයෙන් පවරන ලද්දේ නම් වේ. 'පඤ්චහි උපාලි ආකාරෙහි පවාරණා හොති: අසනං පඤ්ඤායති, භොජනං පඤ්ඤායති, හත්ථපාසෙ ඨිතො අභිහරති, පටික්ඛෙපො පඤ්ඤායති'යි මෙසේ වදරනලද්දේය.

එහි මේ විනිශ්චය වේ. '**අසනං**' යමක් අනුභව කෙරේද, යම් බොජුනක් අත්පසෙහි සිටියහු විසින් එළවනලද්ද ප්‍රතික්ෂෙප කෙරේද, ඒ භෝජනය බත-කොමු-අස්සුනු-මාලු-මස් යන මොවුන් අතුරෙහි එකෙක්මයයි දතයුතුය. එහි **ඔදන** නම් හැල් වී යව තිරිඟු තණ හෙලවරා අමු යන සත් වැදෑරුම් ධාන්‍යයන්ගේ සහලින් නිපන්නේය. එහි හැල්

නම් යටත් පිරිසයින් හුරුහැල් පටන් සියලුම හැල්වර්‍ගයි. 'වී' නම් සියලු වීවර්‍ගයි. යව තිරිඟුවල භෙදයක් නැත්තේය. 'තණ' නම් සුදු රතු කලු වූ සියලු තණවර්‍ගයි. 'හෙලවරා' නම් යටත් පිරිසයින් සිහින් වරා පටන් සියලුම සුදුවන් වරාය. 'අමු' නම් කලුහමුද බඩහමු ආදී භෙදවත් සියලුම ධාන්‍ය වර්‍ගයි. මෙහි හුරුහැල් සිහින් වරාද ධාන්‍යානුලොමයයි කියත්. ධාන්‍ය හෝ වෙත්වා, ධාන්‍යානුලෝමයෝ හො වෙත්වා, කියූ ප්‍රභෙද ඇති මේ සත්වැදෑරුම් ධාන්‍යයන්ගේ සහල් ගෙණ බත් පිසන්නෙමු'යි හෝ කැඳ පිසන්නෙමු'යි හෝ යම් කිසිවක් සඳහා පිසත්වා ඉදින් උණුසුම් වූවක් හෝ සිහිල් වූවක් හෝ ඇඹුල් කිරීමක් ආදීන් අතුරෙහි එක්තරා එකක් පිසන්නෙමු'යි හෝ වළඳන්නවුන්ගේ වළඳන කාලයෙහි ගත් ගත් තන්හි අවධි පෙනේද එය ඔදන සඞ්ග්‍රහයටම යයි. පවාරණය උපදවයි. ඉදින් අවධි නොපෙනේ නම් යාගුසඞ්ග්‍රහයයයි. පවාරණය නොඋපදවයි. යම් කිරිබතක් හෝ කොළ ගෙඩි කිළිල් මුසු ඇඹුල් කැඳවක් හෝ උදුනෙන් බානලද ඇසිල්ල ඇත්තී ඉතා උණුසුම් වේද, සිසාරා බොන්නට පිළිවන් වේද, අතින් ගත් පෙදෙසෙහි අවධි නොදක්වාද, පවාරණය නොඋපදවයි. ඉදින් උණුසුම පහව ගියකල්හි සිහිල් වූවා සඝභාවයට යේද, අවධිය දක්වාද, නැවැත පවාරණය උපදවයි. පෙරවූ තුනීබව නොරකියි. ඉදිනුදු දී, මොරු ආදිය නගා කොළ ගෙඩි කිළිල් බහා මිටක් පමණවූ සහල්ද, බහනලද්දහු වෙත්ද, වළඳන කාලයෙහි අවධිය පෙනේද, පවාරණය උපදවයි. කැඳ හැර සෙස්සෙන් කරන පැවරීමෙහි 'කැඳ දෙන්නෙමු'යි බතෙහි පැන් කාඩි කිරි ආදිය වත්කර 'කැඳ ගණු මැනැවැ'යි කියා දෙත්ද, ඒ කැඳ තුනී වූවා වේද, පවාරණය උපදවාය. ඉදින් පැසවූ පැන් ආදියෙහි බහා පිස දෙත්ද, යාගු සඞ්ග්‍රහයටම යෙයි. යාගුසඞ්ග්‍රහයට ගිය කල්හිද එහි හෝ අනිකක හෝ යම් තැනක මාලු මස් බහත්ද ඉදින් අබැටක් නමුදු මාලුමස් කඩක් හෝ නහරක් හෝ පෙනේද, පවාරණය උපදවයි. පිරිසිදු රස ඇත්තක් හෝ රස යාගුවක් හෝ පවාරණය නොඋපදවයි. කියූ ධාන්‍යයන්ගේ සහල් හැර අන් හුණසහල් ආදියෙන් හෝ අලමුල් ගෙඩිවලින් හෝ යන යම් කිසිවකින් කළ බතද පවාරණය නොඋපදවයි. සනයාගුව කියනු කිම, ඉදින් මෙහි මාලුමස් බහත්ද, පවාරණය උපදවයි. **මහාපච්චරියෙහි** බුබ්බි නම් වූ ඛාද්‍යය පිණිස කළ බතද පවාරණය උපදවායි කියනලදී. බිබික්කම් පිණිස කළ බත නම්, බිබික්කම් පිණිස කකාළ දියෙහි බහා උණුසුම් ගන්වන ලද සහල් කියනුලැබේ. ඉදින් සහල් වියලවා කත්ද, වටියි. බැදිපිටි ගණනට නොම යෙයි. බත් ගණනට නොයෙයි. නැවැත ඒ සහලින් කළ බත පවාරණය කෙරේමය. ඒ සහල් ගිතෙල් තලතෙල්

ආදියෙහි හෝ ලා පිසත්ද, පූ හෝ කරත්ද, පවාරණය නොකරයි. හබලපෙතිද ඒ හබලපෙතිවලින් කළ බැදි පිටිබත් ආදියද පවාරණය නොකරත්.

**කුම්මාස** නම් යවයෙන් කළ කොමුය. අන්‍යවූද, මුං ආදියෙන් කළ කොමුව පවාරණය නොඋපදවයි. **සත්තු** නම් හැල් වී යවයෙන් කළ බැදිපිටිය. තණවරා අමු යන මොවුන්ගේ කරල්ද, බැද මදක් කොටා දහය්යා පොලා නැවැත දැඩිව කොටා කුඩු කරත්ද ඉදිනුදු ඒ කුඩු තෙත් බැවින් එකට බැඳුණෝ වේද, අත්සුණු ගණනටම යත්තේය. කරපාකයෙන් බදිනලද වීවල සහල් කොටා දෙත්ද ඒ කුඩුද අත්සුණු ගණනටම යයි. සමපාකයෙන් බදිනලද වීවල හෝ වී බොල්වල හෝ සහල් බැදි සහල්ම හෝ වේද, පවාරණය නොකෙරෙත්. යම් සහල් ඈ පිටි, පවරාණය කෙරේද, කරපාකයෙන් බදිනලද සහල් කුඩුද පවාරණය කරයි. සමපාකයෙන් බදිනලද අව්වෙන් වියලනලද වීවල කුඩු පවාරණය නොකරයි. විළඳ හෝ ඒ විළඳින් කළ බත් අත්සුණු ආදිය හෝ පවාරණය නොකෙරෙත්. බදිනලද පිටිද යම්කිසි ශුද්ධ කැවිලියක් හෝ වේද, එද පවාරණය නොකරයි. මාලු, මස් පුරවනලද කැවිලියද බැදිපිටි පිඩු කොට නොපැසවා කළ අග්ගලාවද පවාරණය කරයි. **මත්ස්‍ය මාංසය** ප්‍රකටමය. මේ එහි වෙනසය. ඉදින් කැඳ බොන මහණහුට කැඳහුලු පමණවූ ම මස් කැබලි දෙකක් හෝ එක් බඳුනෙක හෝ නොයෙක් බඳුන්හි හෝ ලා දෙත්ද, ඒ මත්ස්‍ය මාංස නොකමින් පවාරණයට පොහොනා අන් යම් කිසි දෙයක් ප්‍රතික්ෂෙප කෙරේනම් නොපවරයි. එයින් කාද එකක් අතෙහි හෝ පාත්‍රයෙහි හෝ වේද, හෙතෙමේ අනිකක් ප්‍රතික්ෂෙප කෙරේ නම් පවරයි. දෙකම කනලද්දේ වේද, මුඛයෙහි අබැටක් පමණ නමුදු ඉතිරි වූවෙක් නැත්තේද, ඉදිනුදු අනිකක් ප්‍රතික්ෂෙප කෙරේනම් නොපවරයි. කැපමස් කමින් කැපමසක් ප්‍රතික්ෂෙප කෙරේනම් පවාරණ කරයි. කැපමසක් කමින් අකැපමසක් ප්‍රතික්ෂෙප කෙරේ නම් පවාරණය නොකරයි. කුමක් හෙයින, යත්ඃ අනතිරිත්තාපත්ති සාධකවූපවාරණයට වස්තුවක් නොවන බැවිනි. මහණහුට යමක් කන්නට වටීද, එයම ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේ. මෙය දන්නේ අකැප බැවින් ප්‍රතික්ෂෙප කරයි. නොදන්නේද ප්‍රතික්ෂෙප කටයුතු තන්හි සිටියක්ම ප්‍රතික්ෂෙප කෙරේ නම් එහෙයින් නොපවරයි. ඉදින් වනාහි අකැපමස් කන්නේ කැපමස් ප්‍රතික්ෂෙප කෙරේ නම් පවාරණය වේ. කුමක් හෙයින්, යත්ඃ අනතිරිත්තාපත්තිසාධකවූ පවාරණයට වස්තුවක් වන බැවිනි. ඔහු විසින් යමක් ප්‍රතික්ෂෙප කරනලද්දේද, එය පවාරණයට වස්තුවේ. යමක් කාද එය ප්‍රතික්ෂෙප කටයුතු තන්හි සිටියේය. කනු ලබන්න, මස්බව

නොහරීද, එහෙයින් පවාරණය කරයි. අකැපමස් කන්නේ අකැප මස් ප්‍රතික්ෂෙප කෙරේද, පෙරනයින්ම පවාරණය නොකරයි. කැපමස් හෝ අකැපමස් හෝ කන්නේ පස් බොජුන් අතුරෙහි යම් කිසි කැප බොජුනක් ප්‍රතික්ෂෙප කෙරේද, පවාරණය කරයි. කුලදූසක වෙජ්ජකම්ම උත්තරිමනුස්සධම්මාරොචන සාදිත රූපියාදියෙන් උපන් බුදුරජුන් විසින් පිළිකුල් කරනලද අනෙසනයෙන් උපන් අකැප බොජුන් ප්‍රතික්ෂෙප කෙරේනම්, පවාරණය නොකරයි. කැප බොජුනක් හෝ අකැප බොජුනක් හෝ වළඳන්නේද, කැප බොජුන පහකෙරේද, පවාරණය කරයි. අකැප බොජුන් පහකෙරේනම් පවාරණය නොකරයි. සියලු තන්හි කියූ නයින්ම කරුණු දත යුතුය.

මෙසේ 'අසනං' යනාදිතන්හි යමක් අනුභව කෙරේද, යම් බොජුනක් අත්පසෙහි සිටියහු විසින් එළවනලද්දක් ප්‍රතික්ෂෙප කරන්නේ පවාරණයට පැමිණේ. එය දැන, යම්සේ පැමිණේද, එය දැනගණු පිණිස මේ විනිශ්චය වේ. 'අසනං හොජනං' යන මෙහි යමකු විසින් එක් හුලක් නමුදු අනුභව කරනලද්දේවේද, හෙතෙමේ ඉදින් පාත්‍ර මුඛ හස්ත යන මොවුන් අතුරෙහි යම්කිසි තැනක පස්බොජුන් අතුරෙහි එකකුදු ඇති කල්හි පස්බොජුන් අතුරෙහි අන් එකකුදු ප්‍රතික්ෂෙප කෙරේ නම්, පවාරණය කරයි. කිසිතැනක බොජුනක් නැත්තේද, ආමිසගඳ පමණක් පෙනේද, පවාරණය නොකරයි. මුවෙහිද, අතෙහිද, බොජුනක් නැත්තේද, පාත්‍රයෙහි ඇත්තේද, ඒ අසුනෙහි වනාහි හිඳ අනුභවකරනු නොකැමැත්තේ විහාරයට පිවිස අනුභව කරනු කැමැත්තේ හෝ අතිකක්හට දෙනු කැමැත්තේ හෝ ඒ අතරෙහි බොජුන ප්‍රතික්ෂෙප කෙරේනම්, පවාරණය නොකරයි. කුමක් හෙයින, යත්: අඩාල කළ බොජුන්බව සිදලු බැවිනි. යමෙක් අන් තැනක ගොස් අනුභව කරනු කැමැත්තේ මුවෙහි බත් ගිල සෙස්ස ගෙණ යන්නේ අතරමගදී අන් බොජුනක් ප්‍රතික්ෂෙප කෙරේද, ඔහුටද පවාරණය නොවේයයි මහාපච්චරියෙහි කියනලදී. පාත්‍රයෙහි යම්සේද අතෙහිද එසේය. මුවෙහි හෝ විද්‍යමානහෝජනය ඉදින් නොබුදිනු කැමැත්තේ වේද, එකෙණෙහිද අනිකක් ප්‍රතික්ෂෙප කෙරේ නම් පවාරණය නොකෙරෙයි. එක්ම පදයෙක්හි කියූලක්ෂණය සියලු තන්හි දතයුතුවේ. තවද කුරුන්දියෙහි මේ නය දක්වන ලද්දේය. එහි 'මුවෙහි බත් ගිලිනලදද, අතෙහි බත් ඉතිරි බත් කන්නකුට දෙනු කැමැත්තේ පාත්‍රයෙහි බත් මහණෙක්හට දෙනු කැමැත්තේ ඉදින් එකෙණෙහි ප්‍රතික්ෂෙප කෙරේ නම් පවාරණය නොකෙරේය'යි කියනලද්දේමය. **'හත්ථපාසෙ ඨිතො'** මෙහි ඉදින් මහණෙක් හුන්නේවේද, අසුනෙහි පැසුළු කෙළවර පටන්, සිටියේ වේද විළුඹ කෙළවර පටන්, හොත්තේ වේද, යම් පසකින් හොත්තේ වේද, ඔහුගේ ඔබ කෙළවර

පටන්, හුන්නාවූ හෝ සිටියාවූ හෝ හොත්තාවූ හෝ දයකයාගේ දිගුකළ අත හැර ඉතා ආසන්නවූ යම් අවයවයෙක් වේද, ඒ අවයවයාගේ මොබ කෙළවරින් පිරිසිඳ දෙරියන් හමාරෙක් අත්පසැයි දතයුත්තේය. එහි සිට එළවූවක් ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේ. ඉන් ඈත සිට එළවූවක් ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය නොවේ. **'අභිහරති'** අත්පසතුළ සිටියේ ගණු පිණිස කය එළවයි. ඉදින් ලඟ හුන්නාවූද මහණ තෙමේ අතෙහි හෝ උකුලෙහි හෝ ආධාරයක හෝ තුබූ පාත්‍රය නොඑළවාම බත් ගණුවයි කියයි. එය ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණයෙක් නැත්තේය. බත් බඳුන ගෙණවුත් ඉදිරියෙහි බිම තබා ගණුවයි කියූ කල්හිද මේ නයමවේ. මදක් උඩට නගා හෝ මහණහු දෙසටම නමා හෝ ගණිවුයි කියූ කල්හි ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේ. ථෙරාසනයෙහි හුන් ස්ථවිර තෙමේ දුර හුන් ලදරු මහණක්හට පාත්‍රය යවා 'මෙයින් බත් ගණුව'යි කියයි. ගෙණ ගිය නොබැණ සිටි ලදරු මහණ තෙමේ 'මට කම්නැතැ'යි ප්‍රතික්ෂෙප කෙරේද, පවාරණය නොකරයි. කුමක් හෙයින, යත්: තෙරුන්ට දුරබැවින් හා දූතයාගේ එළවීමක් නැතිබැවිනි. ඉදින් ගෙණ ආ මහණතෙමේ 'මේ බත් ගණුව'යි කියා නම් එය ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේ. බොජුන්හලෙහි සිටි එකෙක් තෙමේ එක් අතකින් බත්බඳුන, එක් අතකින් හැන්ද ගෙණ මහණුන් වළඳවාද එහි අනිකෙක් අවුත් 'මම බත්බඳුන දරන්නෙමි, තෝ බත් දෙව'යි කියා ගත් මාත්‍රයක්ම කෙරේ වළඳවන තැනැත්තේම ඒ බත් බඳුන දරාද එහෙයින් ඒ බත් බඳුන එළවනලද්දේම වේ. එයින් දෙනු කැමැති බැවින් ගන්නක් ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේ. ඉදින් වළඳවන්නහු විසින් පැහැසූ ඇසිල්ලක් ඇත්තීමවේද, අන්‍යසාම ඒ බත් බඳුන දරාද, එයින් දෙනු කැමැති බැවින් ගින්නක් ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය නොවේ. හැන්දෙන් උඩට නැගූ ඇසිල්ලෙහි වේ. හැන්ද එළවීම ම ඔහුගේ අභිහාරය වේ. දෙදෙනාට සමබර ඇති කල්හිද ප්‍රතික්ෂෙප කරන්නේ පවාරණය වේමයයි **මහාපච්චරියෙහි** කියනලදී. ලඟහුන් මහණක්හට බත් දෙනු ලබන කල්හි අනික් මහණ තෙමේ අනික් පාත්‍රය වසාද, පවාරණය නැත්තේය. කුමක් හෙයින, යත්:- අන් මහණක්හට එළවූ කල්හි ප්‍රතික්ෂෙප කළ බැවිනි.

**'පටික්ඛෙපො පඤ්ඤායති'** මෙහි වචනයෙන් එළවනලද්දක් ප්‍රතික්ෂෙප කරණ මහණහුට පවාරණයෙක් නැත්තේය. කයින් එළවන ලද්දක් වනාහි කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණය වේයයි දතයුතුය. එහි කයින් කරන ප්‍රතික්ෂෙපය නම් ඇඟිල්ලක් හෝ අත හෝ මැසි විජිනියක් හෝ සිවුරු කොණක් හෝ සොලවයි. ඇස්බැමින්

හෝ යම්කිසි ආකාරයක් කරයි. කිපියේ හෝ බලයි. යන මේය. වචනයෙන් කරන ප්‍රතික්‍ෂේපය නම් 'පමණැ'යි හෝ නොගණිම්'යි හෝ නොබහාලව'යි හෝ පහවයව'යි හෝ කියයි. මෙසේ යම්කිසි ආකාරයකින් කයින් හෝ වචනයෙන් හෝ ප්‍රතික්‍ෂේප කළ කල්හි පවාරණය වේ යන මේය. එක් මහණක් තෙමේ බත් එළවූ කල්හි පවාරණයෙහි බියවූයේ අත් පහකොට නැවැත නැවැත පාත්‍රයෙහි බත් බහාලන්නහුට 'බහාලව, බහාලව, කොට කොට පුරව'යි කියයි. මෙහි කෙසේදැ'යි **මහාසුම්ම** ස්ථවිරයන් වහන්සේ නොබහාලනු පිණිස කියූ බැවින් පවාරණය නොවේයයි කීහ. **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ 'බහාලව, පුරව'යි කියන කිසිවකුට පවාරණය ඇතැ'යි කියා නොපවරායයි කීහ. අනිකෙක් බත් එළවන මහණකු සලකා 'ඇවැත' කිම, මෙයිනුදු කිසිවක් ගන්නෙහිද, නුඹ වහන්සේට කිසිවක් දෙමි'යි කීයේය. එහිද මෙසේ නොපැමිණෙන්නේයයි කියූ බැවින් පවාරණය වේයයි **මහාසුම්ම** ස්ථවිරයන් වහන්සේ කීහ. **මහාපදුම** ස්ථවිරයන් වහන්සේ වනාහි 'ගන්නෙහිදැ'යි කියන්නාවූ කිසිවකුට නම් පවාරණය ඇත්තේයයි කියා නොපවරායයි කීහ. එකෙක් මස්සහිත රසයක් එළවා 'රසය ගණිවු'යි කියයි. ඒ අසා ප්‍රතික්‍ෂේප කරන මහණහුට පවාරණයෙක් නැත්තේය. මත්ස්‍යරසය මාංසරයයි කියූ කල්හි ප්‍රතික්‍ෂේප කරන මහණහුට වනාහි පවාරණය වේ. 'මෙය ගණු මැනැවැ'යි කියූ කල්හිද පවාරණය වේමය. මාංසය වෙන්කොට මාංසරසය ගණුමැනැවැ'යි කියයි. ඉදින් එහි අබැටක් පමණ නමුදු මස් කඩක් ඇත්තේ නම් ඒ මස් රසය ප්‍රතික්‍ෂේප කරන මහණහුට පවාරණය වේ. ඉදින් වනාහි පෙරනලදුයේ වේනම් වටීයයි අභයස්ථවිරයන් වහන්සේ කීහ. මස්රසයෙන් විචාරන්නහු මහාස්ථවිරයන් වහන්සේ 'මොහොතක් බලාපොරොත්තු වෙව'යි කියා තළුතැටිය ගෙණඑවයි කීහ. එහි කෙසේද, **මහාසුම්ම** ස්ථවිරයන් වහන්සේ එළවන්නහුගේ ගමන සිඳුනේය. එහෙයින් පවාරණය කෙරේය'යි කීහ. මහාපදුම ස්ථවිරයන් වහන්සේ වනාහි 'මෙතෙමේ කොතැනයේද, මොහුගේ ගමන කෙබඳුදැ'යි ගන්නහුට නම් පවාරණය ඇතැ'යි කියා පවාරණය නොකෙරේය'යි කීහ. හුණ කිළිල් කොස් ආදියෙන් මිශ්‍ර කොට මාලු මස් පිසත්. එය ගෙණ කිළිල් සූප් ගණු මැනැව, කොස් ව්‍යඤ්ජනය ගණු මැනැව'යි කියත්ද, මෙයද පවාරණය නොකරයි. කුමක් හෙයින, යත්ඃ පවාරණයට නොසුදුස්සක නමින් කියූ බැවිනි. ඉදින් මාලුසූප් මස්සූප්යි හෝ, මෙය ගණු මැනැවැ'යි හෝ කියා නම් පවාරණය කරයි. මස් සමග පිසූ මස් මුසුවෙක් වේ නම්, එය දෙනු කැමැත්තේද, 'මස්මුසුව ගණු මැනැවැ'යි කියානම් වටියි. පවාරණය නොකෙරෙයි. මස් මුසුවැයි හෝ මේයයි හෝ කියූ කල්හි පවාරණය

නොකෙරෙයි. සියලු මත්ස්‍ය මාංස මිශ්‍රකන්හි මේ නයමවේ. යම් මහණෙක් තෙමේ නිමන්ත්‍රණයෙහි වළඳනුයේ එළවනලද මසක් 'උදෙසා කරනලදැයි හඟිමින් ප්‍රතික්ෂෙප කෙරේද, වස්තුව කැපවූයේද, මේ ශික්ෂාපදය අචිත්ත බැවින් පවරණලද්දේමවේයයි **මහාපච්චරියෙහි** කියන ලද්දේය. මිශ්‍රකථාව වනාහි **කුරුන්දියෙහි** මනාකොට කියනලදු, මෙසේද එහි කියනලදි. පිඩුසිහා හැසිරෙන මහණෙක් තෙමේ බත් මුසු කැඳක් ගෙණ කැඳ ගණු මැනැවැයි කියාද පවාරණය නොකෙරෙයි. 'බත් ගණු මැනැවැ'යි කියූ කල්හි පවාරණය කෙරෙයි. කුමක් හෙයින, යත්:- යමකින් පුළුවුස්නාලද්දේද, එය ඇති බැවිනි. මේ මෙහි අදහසයා:- කැඳමුසු බත ගණු මැනැවැ'යි කියාද, එහි ඉදින් කැඳ ඉතා බොහෝ හෝ වේද, සමසම හෝ වේද, පවාරණය නොකරයි. කැඳ මඳ වේද, බත් ඉතා බොහෝ වේද,පවාරණය කරයි. මෙද සියලු අට්ඨකථාවන්හි කියූ බැවින් ප්‍රතික්ෂෙප කරන්නට නොහැක්කේය. කරුණ වනාහි මෙහි දැක්ක නොහැකිය. 'බත් මුසුවක් ගණු මැනැවැ'යි කියාද බත් බොහෝ හෝ සමසම හෝ ඉතාමඳ හෝ වේද, පවාරණය කෙරේමය. බත් හෝ කැඳ හෝ ආමශීනය නොකොට මිශ්‍රකයක් ගණුමැනැවැ'යි කියාද, එහි ඉදින් බත් බොහෝ වූයේ හෝ සමවූයේ හෝ වේද,පවාරණය කරයි. ඉතා මඳ වූයේ පවාරණය නොකරයි. මෙද මත්ස්‍ය මාංස හා සම නොකටයුතුය. කරම්බකය වනාහි මාංස මිශුවූයේද, මාංසමිශ්‍ර නොවූයේද වේ. එහෙයින් කරම්බකැයි කියූ කල්හි පවාරණයෙක් නැත්තේය. මෙය වනාහි බත්මුසුවූයේම වේ. මෙහි කියූ නයින්ම පවාරණය වේ. බොහෝ රසැති බතෙහි රසය, බොහෝ කිරි ඇති බතෙහි කිරිය, බොහෝ ගිතෙල් ඇති කිරිබතෙහි ගිතෙල් ගණුමැනැවැ'යි වෙන් කොට දේද, එය ප්‍රතික්ෂෙප කරන මහණහුට පවාරණයෙක් නැත්තේය. යමෙක් වනාහි යමින් පවාරණය කෙරේද, හෙතෙමේ යමින්ම අනුභව කිරීම ලබයි. මඩට හෝ දියට හෝ පැමිණ සිටියහු විසින් ඉතිරිකරවිය යුතුය. ඉදින් අතරම ගහක් පිරී සිටියා වේද, ගංඉවුරෙහිවූ වනලැහබක වට කරකැවෙන්නහු විසින් වැළඳිය යුතුය. එකල්හි නැවක් හෝ හෙයක් හෝ ඇත්තේද, එයට නැගද සක්මන් කරන්නහු විසින්ම වැළඳිය යුතුය. ගමන නොසිඳිය යුතුය. යානයෙහි හෝ ඇත්, අස් පිටෙහි හෝ සඳමඩලෙහි හෝ හිරුමඩලෙහි හෝ හිඳ පවරණ ලද්දහු විසින් මධ්‍යාහ්නය යම්තාක්ද ඒතාක් එවුන් ගමන් කරන කල්හිද හුන්නහු විසින්ම වැළඳිය යුතුය. යමෙක් සිටියේ පවාරණය කෙරේද, සිටියහු විසින්ම යමෙක් හුන්නේද හුන්නහු විසින්ම වැළඳිය යුතුය. ඒ ඒ ඉරියවු වෙනස් කරන්නහු විසින් ඉතිරි කරවිය යුතුය. යමෙක් උළුවෙන් හිඳ පවාරණය කෙරේද, ඔහු උළුවෙන්ම හිඳ වැළඳිය

යුතුය. ඒ මහණහට වනාහි යටට පලාල පීඨයක් හෝ කිසි හිඳිනා කඩක් හෝ දිය යුතුය. පුටුවෙහි හිද පවරන ලද්දහු විසින් අසුන නොසොල්වාම හෙවත් හුන් තැනින් නොනැගිටම සිවු දිසාවන්ට හැරෙන්නහු විසින් වැළඳීම වටියි. ඇඳෙහි හිඳ පවරන ලද්දහු විසින් මෙතැනින් අතනින් සැරිසරන්නට නොලබයි. ඉදින් ඔහු ඇඳ සමග ඔසොවා අන් තැනකට ගෙණ යෙත් නම් වටියි. වැදහෙව පැවරුවහු විසින් හොත්තහු විසින්ම වැළඳිය යුතුය. පෙරළෙන්නහු විසින් යම් යම් පසකින් හොත්තේද, එතැන නොඉක්ම විය යුතුය.

'**අනතිරිත්තං**' ඉතිරි නොකරන ලද්දය. නොවැඩියක යන අර්ථයි. ඒ වනාහි යම් හෙයකින් කප්පිය කතාදීවූ සත්වැදෑරුම් විනයකර්මාකාරයෙන් නොකරනලද්දේ හෝ ගිලනහුට නොවැඩිවූවෙක් හෝ වේද, එහෙයින් පදභාජනයෙහි 'අකප්පියකතං' යනාදිය වදරන ලදී. එහි '**අකප්පියකතං**' යනු යම් ඵලයක් හෝ අල මුල් ආදියක් හෝ පස්වැදෑරුම් සමණ කැපයෙන් කැප නොකරන ලද්දද, යම් අකැප මසක් හෝ අකැප බොජුනක් හෝ වේද, යන මේ සියල්ල අකප්පිය නම් වේ. ඒ අකප්පිය 'අලමෙතං සබ්බං'යි මෙසේ ඉතිරිකරන ලද්දේ 'අකප්පියකත'යි දතයුතුය. '**අපටිග්ගහිතකතං**' මහණහු විසින් නොපිළිගන්නාලද්දම පෙරනයින්ම ඉතිරිකරණ ලද්දවේ. '**අනුච්චාරිතකතං**' කැප කරවන්නට පැමිණි මහණහු විසින් මදකුත් බැහැර නොකරන ලදව හෝ ඒ දිගට නොනමනලදුව හෝ කරන ලද්ද වේ. '**අහත්ථපාසෙ කතං**' කැප කරවන්නට පැමිණියහුගේ අත්පසින් පිටත සිටියහු විසින් කරනලද්දේ වේ. '**අභුත්තාවිනා කතං**' යමෙක් තෙමේ 'අලමෙතං සබ්බං'යි ඉතිරි කෙරේද, ඔහු විසින් පවාරණයට පොහොනා බොජුනක් නොවැළඳූවහු විසින් කරනලද්දේ වේ. '**භුත්තාවිනා පවාරිතෙන ආසනා වුට්ඨිතෙන කතං**' මෙය ප්‍රකටමය. '**අලමෙතං සබ්බන්ති අවුත්තං**' වාක් භෙද කොට මෙසේ නොකියන ලද්දෙක් වේ. මෙසේ මේ සත්වැදෑරුම් විනයකර්මකාරයෙන් යම් ඉතිරියක් කැප නොකරන ලදද ගිලනුන්ගෙන් ඉතිරි යමක් නොවේද, එදෙකද 'අනතිරිත්ත'යි දතයුතුය. අතිරිත්තය වනාහි ඔහුගේම ප්‍රතිපක්ෂනයින් දතයුතුය. තවද මෙහි '**භුත්තාවිනා කතං හොති**' ලඟ හුන් සභාග භික්ෂූහුගේ පාත්‍රයෙන් එක් බත් උලක් හෝ මස් කැබල්ලක් හෝ අනුභව කොට කරනලද්ද, බුදිනලද්දහු විසින්ම කරන ලද්දේයයි දතයුතුය. '**ආසනා අවුට්ඨිතෙන**' මෙහි වනාහි නොමුළාවනු පිණිස මේ විනිශ්චය වන්නේය.

භික්ෂූහු දෙනමක් උදෑසනම වළඳන්නාහු පවරනලද්දහු වෙත්. එක් නමක් එහිම හිඳිය යුතුය. අනික් භික්ෂු නම හිතිබත් හෝ ලහබත් හෝ ගෙණවුත් එයින් අඩක් ඒ මහණහුගේ පාත්‍රයෙහි බහා අත දෝනා

කොට සෙස්ස ඒ මහණහු ලවා කැප කරවා වැළඳිය යුතුය. කුමක් හෙයින, යත්: යමක් ඔහුගේ අතෙහි ඇලුනේද, ඒ ඇලුනු ආමිසය අකැප වේ. (එහෙයිනි) ඉදින් පළමු කොට හුන් මහණ තෙමේ තෙමේම ඔහුගේ පාත්‍රයෙන් අතින් බත් ගණීනම් අත් දෝනා කිසක් නැත්තේය. ඉදින් වනාහි මෙසේ කැප කරවා වලදන්නහුගේ පාත්‍රයෙහි නැවැත කිසි ව්‍යඤ්ජනයක් හෝ කැයුත්තක් හෝ බහාලත්ද, යමකු විසින් පළමු කොට කැප කරනලද්ද, හෙතෙමේ නැවැත කැප කිරීම නොලබයි. යමකින් නොකරනලදද එයින් කටයුතුය. යමක් නොකරන ලදද, ඒ කටයුතුය. 'යෙන අකතං' අන් මහණක්හු විසින් යමකින් පළමු කොට නොකරනලදද, එයින් කටයුතුය. 'යඤ්ච අකතං' යමකින් පළමු කොට කැප කරනලදද, එයිනුදු යමක් නොකරනලදද, එය කටයුතුය. ප්‍රථම භාජනයෙහි වනාහි කැප කරන්නට නොලබයි. එහි කරනු ලබත්, පළමු කරනලද්ද සමග කරනලද්දේවේද, එහෙයින් අතික් බඳුනෙක්හි කරන්නට වටීය යන අදහසවේ. මෙසේ අතික් බඳුනෙක්හි කරනලද්ද, වනාහි ඒ මහණහු විසින් පළමු කැප කරන ලද්ද සමග වැළඳීම වටියි. කැප කරන්නහු විසින්ද හුදෙක් පාත්‍රයෙහිම කැප කිරීම වටින්නේ නොවේ. සැළියක හෝ පැසක හෝ යන යම්කිසි බඳුනෙකලා ඉදිරියෙහි තබා නැමූ බඳුනෙහි කටයුතුය. එද මහණුන් සියයක් පවරණ ලද්දේවේද, සියල්ලන්ට වැළඳීම වටියි. නොපැවරුවන්ටද වටියි. යමකු විසින් කැප කරන ලදද, ඔහුට නොවටියි. ඉදිනුදු පවරා පිඩු පිණිස ගිය මහණකු පාත්‍රය ගෙණ එකාන්තයෙන් අනුභව කරන මඞ්ගලනිමන්ත්‍රණයෙහි හිඳුවත්ද, ඉතිරි කරවාම වැළඳිය යුතුය. ඉදින් එහි අන් මහණෙක් නැත්තේද, අසුන්හලට හෝ වෙහෙරට හෝ පාත්‍රය යවා අනුපසම්පන්නයකු අත යවා කැප කරවිය යුතුය. කැප කරන්නහු විසින් වනාහි අනුපසම්පන්නයාගේ අතෙහි තුබුනක් කැප නොකටයුතුය. ඉදින් අසුන්හලෙහි අව්‍යක්ත මහණෙක්වේද, තමා ගොස් කැප කරවා ගෙණවුත් වැළඳිය යුතුය.

'**ගිලානාතිරිත්තං**' මෙහි ගිලනකු වළඳ ඉතිරිවූ යමක් වේද, හුදෙක් එය ගිලානාතිරිත්ත නොවේ. එතකුදු වුවත් යම් කිසිවක් ගිලනකු උදෙසා 'අද හෝ හෙට හෝ යම් දවසෙක හෝ කැමැති වේද, එකල්හි අනුභව කරන්නේය'යි ගෙණෙන ලද්දේද, ඒ සියල්ල ගිලානාතිරිත්තයි දතයුතුය. යාමකාලිකාදීන් අතුරෙහි අනුහවයක් අනුහවයක් පාසා යම් දුක්කටයක් කියන ලද්දේද, එය අමිශ්‍රවශයෙන් කියනලදී. ඉදින් ආමිස සමග ගැටුනාහුද ආහාර පිණිසද අනාහාර පිණිසද පිළිගෙණ අනුභව කරන මහණහුට පාචිත්තියම වේ. '**සති පච්චයෙ**' පවස ඇති කල්හි පවස නැසීම පිණිස

යාමකාලිකයද, සත්තාහකාලිකය හා යාවජීවකය ඒ ඒ දෙයින් සංසිඳවිය යුතුවූ ආබාධයක් ඇති කල්හි ඒ ආබාධය සංසිඳුවා ගණු පිණිස වළඳන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන් කායවාචාචිත්තයෙන් උපදී. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

පස්වන පඨමපවාරණා ශික්ෂාපදයයි

——\\——

ෂෂ්ඨම ශික්ෂාපදයෙහි **'අනාචාරං ආචරන්ති'** ප්‍රඥප්තිව්‍යතික්‍රමය කරයි. **'උපනන්ධීති'** බද්ධවෛරය උපදවමින් ඒ පුද්ගලයා කෙරෙහි තමාගේ ක්‍රොධය බැන්දේය. නැවැත නැවැත ක්‍රොධය ඉපද වූයේය යන අර්ථයි. **'උපනද්ධො භික්ඛු'** උපදවනලද බද්ධ වෛරය ඇති මහණ තෙමේ. **'අභිහට්ඨුං පවාරෙය්‍ය'** එළවා. 'මහණ' එබැවින් කවයි, හෝ අනුභව කරව'යි හෝ මෙසේ පවරන්නේය. පදභාජනයෙහි වනාහි 'හන්ද භික්ඛු' යනාදිය සාධාරණවම එළවීමට කළ පවාරණයෙහි අර්ථ දක්වනු පිණිස **'යාවතකං ඉච්ඡසි තාවතකං ගණ්හාහි'**යි කියනලදී. **'ජානං'** පැවරුබව දන්නේ. යම් හෙයකින් මොහුගේ ඒ දැනීම තුන් අයුරකින් වේද එහෙයින් **'ජානාති නාම සාමං වා ජානාති'** යනාදි නයින් පදභාජනයෙහි වදරන ලදී. **'ආසාදනාපෙක්ඛො'** ආසාදනය, චොදනා කිරීම, තෙද රහිතකරනබව අපෙක්ෂා කරනුයේ. **'පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස'** යමක්හට එළවූයේද ඔහු පිළිගත්තා කල්හි එළවූ මහණහුට දුක්කටය වේ. අතිකොට වනාහි සියලු ආපත්තිභෙදය ප්‍රථම ශික්ෂාපදයෙහි කියනලද්දේය. මේ ශික්ෂාපදයෙහි වනාහි සියලු ආපත්තීහු එළවූවහුටම දතයුතුය. සෙස්ස ප්‍රථම ශික්ෂාපදයෙහි කියූනය ඇති බැවින් ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. කායචිත්තයෙන් වාචාචිත්තයෙන් කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුසල චිත්තයි. දුක්ඛවෙදනායි.

සවන දුතිය පවාරණා ශික්ෂාපදයයි

——\\——

සප්තමශික්ෂාපදයෙහි **''ගිරග්ගසමජ්ජො''** පර්වතයෙහි කරන අග්‍රනෘත්‍යය නොහොත් පර්වතයාගේ මුදුනෙහි කරන නෘත්‍යයයි. ඒ නෘත්‍යය සත්වන දිනයෙහි පවත්වන්නේයයි නුවර සොෂා කරනුලැබේ. නුවර

පිටත සමවූ බිම් පෙදෙසෙහි පවුසෙවෙනෙහි මහාජනයා රැස් වෙති. එහි නන්වැදෑරුම්වූ සීතාහරණාදි නාටක පවත්වත්. ඒ නෘත්‍ය දැකීම පිණිස මැසි පිට මැසි බඳිත්. සත්තරසවග්ගියා සත්තරසවග්ගිකයෝ. ඌනවීසති ශික්ෂාපදය පනවන්නට පෙර උපසපන් වූ තරුණයෝ. 'ඇවැත්ති' නෘත්‍යය බලන්නෙමු'යි ඒ සත්තරසවග්ගිකයෝ එහි ගියහ. ඉක්බිති ඔවුන්ගේ නෑයෝ 'අපගේ ආයසීයෝ ආහ'යි තුටුසිත් ඇතියෝ ඔවුන් නාවා විලවුන් ගල්වා වළඳවා අතිකුදු පූ කැවිලි ආදිය 'වෙහෙරට ගොස් වළඳනු මැනැවැ'යි ඔවුන් අතට දුන්හ. "මනුස්සා සත්තරසවග්ගියෙ භික්ඛූ පස්සිත්වා" යනාදිය ඔවුන් සඳහා කියනලදී. "විකාලෙ" කාලය පහව ගිය කල්හි. (කාලැයයි) භික්ෂූන්ගේ භෝජනකාලය අදහස් කරනලදී. ඒ කාලය ද සියලු අන්තිම පිරිසිඳීමෙන් මධ්‍යාහ්නකාලය ගැණේ. ඒ කාලය ඉක්මගිය කල්හි යන අර්ථයි. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි **"විකාලො නාම මජ්ඣන්තිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා"**යි වදරනලදී. සිටි මද්දහනද කාලසඞ්ග්‍රහයට යන්නේය. එතැන් පටන් කන්නට හෝ බුදින්නට හෝ නොහැකිය. වහාබොන්නට පමණක් හැකිය. (හැක්කේ වන්නේය. කුකුස් කරන්නහු විසින් නොකටයුතුය. කාලපරිච්ඡේදය දැන ගණු පිණිස කල්ටැඹක් යෙදිය යුතුය. කාලන්තරයෙහි හෝ බත්කිස කටයුතුය. **"අවසෙසං ඛාදනීයං නාම"** මෙහි තල කැරලි අග්ගලා ආදීවූ පූර්වාන්ත අපරාන්තධාන්‍යයෙන් කළ යමක් වේද, එහි කියයුත්තෙක්ම නැත. වනමූලාදි ප්‍රභෙද ගත ආමිස ගතිකවූ යමක් වේද, කවරේද, යත්, කෑයුතු රුක්ලියමුල්, කෑයුතු රුක්ලිය අල, කෑයුතු පියුම් මුල් අල, කෑයුතු තල් පොල් ආදීන්ගේ කරටි, උක් ඇඳඩු, කෑයුතු රුක්ලිය පතුරු, කෑයුතුකොල කෑයුතු මල්, කෑයුතු ගෙඩි, කෑයුතු රුක්ලිය ඇට, කෑයුතු ධාන්‍යාදීන්ගේ පිටි, කෑයුතු රුක්ලිය මැලියම් යන මෙද ඛාදනීය සඞ්ග්‍රහ යට ම යන්නේය. එහි ආමිසගතිය සලකනු පිණිස මේ මුඛමාත්‍ර නිදර්ශනයයි.

කෑයුතු මුල්හි මූලපලාමුල්, කරමුල්, කොලොම්වැන්න මුල්, තම්පලා මුල්, සුලුකැරමුල්, මහකැරමුල්, කිහිඳුමුල්, ලිහිකොළමුල් යන මේ ආදීවූ සූපයට ගතයුතු කොළමුල් ආමිස ගතිකවේ. මෙහිද තිහිඳුමුලෙහි දිරා මැලිවූවක් කපා හරිත්ද එය යාවජීවිකවේ. අනික් මුල්ද මේ නයින්ම දතයුතුය. මූලපලා මුල් කරමුල් ලිහිකොළමුල් යන මුල්වල දිරා මැලිව ගිය තැන්ද ආමිස ගතිකමැයි කියනලදී. පෙළෙහි 'කහ ඉතුරු වදකහ හෙළවදකහ අතිවිඩයන් කුළුරණ සුවඳහොට වම්මුතු යන යම් මුල් බෙහෙත් වේනම් එද, යම් අනික් මුල්බෙහෙතක් කෑයුතු දැයෙහිලා කැමෙහි ප්‍රයොජනය නොසපයාද, බිදියයුතු දැයෙහිලා බිදීමෙහි ප්‍රයොජනය

නොසපයාද, එද අනුදනිම්යි, වදාරනලදද, ඒ බෙහෙත්ද, යාවජීවික වේ. ඔවුන් අතුරෙහි සුලුපස්මුල මහපස්මුල යනාදිනයින් ගණ්ඨුලබන්නවුන්ගේ ගිණිමෙහි කෙළවරෙක් නැත්තේය. කෑයුතු දැයෙහිලා බිදිය යුතු දැයෙහිලා නොසැපයෙනබවම ඔවුන්ගේ ලක්‍ෂණය වේ. එහෙයිනි යම් කිසි මුලක් ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාරවශයෙන් මිනිසුන්ගේ කෑයුතු දැයෙහිලා බුදිය යුතු දැයෙහිලා සැපයේද එය යාවකාලික වේ. හෙවත් අරුණ නැගීම පටන් මද්දහන දක්වා අනුභව කටයුත්තේ වේ. එසේ ආහාර පිණිස නොසැපයෙන අනික් මුල් යාවජීවිකැයි දතයුතුය. ඉතා බොහෝ කොට කියාද මේ ලක්‍ෂණයෙහිම සිටියයුතුය. නම්සත් කියනු ලබන කල්හි ඒ ඒ නම් නොදන්නවුන්ට එහිලා, බලවත් මුළාබවෙක්ම වේ. එහෙයින් නම්සත්හි ආදරය නොකොට ලක්‍ෂණයම දක්වන ලද්දේය. මුලෙහි යම්සේද, එසේ අලදළු ආදියෙහිද යම් ලක්‍ෂණයක් දක්වන්නෙමු නම් ඔවුන්ගේ ම වසයෙන් විනිශ්චය දතයුතුය. පෙළෙහි කහ ආදීන්ගේ වසයෙන් අටවැදෑරුම් වූ ඒ යමක් වදරනලදද, එහි කඳන් පතුරුමල් ගෙඩිද යන සියල්ලද යාවජීවිකැයි වදරනලද්දේය.

කෑයුතු අලයෙහි දිග් අල, කොට අලැයි අල දෙවැදෑරුම් වේ. නෙළුම් කැල ආදීවූ අලද, උපුල් කෙකටිය ආදීවූ අලද යන යමක් ගටැයි කියත්ද, එහි සියලු අලවල දිරා මැලිවූ තැන්ද පතුරුද සියුම් මුල්ද යාවජීවික වෙත්. මේරූ සුවසේ අනුභව කට හැකිවූ සල්කලණ ලාඅල කැලලා අල අඹරැල්ල අල වැටකේ අල මාලුවා අල හිසැයි කියූ පියුම් හෙළපියුම් අල පිණ්ඩල වැල්ලල ආදීවූ වැල්අලද, කටුඅල මුරුංගා අල තල්අල තිලුපුල්, රතුපුල්, හෙළපුල්, හෙල්මැලි අල, කෙහෙල් අල, හුණ අල, කෙකටිය අල යන මේ ආදීවූ ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාර වශයෙන් මිනිසුන්ගේ කෑයුතු දැයෙහිලා බුදියයුතු දැයෙහිලා නැපයෙන අල යාවකාලික වේ. නොසේදූ පිටි නොකළ කිරිවැල් අල යාවජීවික වේ. සෝද පිටිකරන ලද්දේ යාවකාලික වේ. ඒ නොසේදූ පිටි නොකළ කිරිකවෙළු ජීවක උසභ සුදුලූනු ආදීන්හි අල යාවජීවිකවේ. ඒ කිරිකවෙළු ආදීහු පෙළෙහි "යානි වා පනඤ්ඤානිපි අත්ථි මූලානි භෙසජ්ජානි"යි මෙසේ මූල භෛෂද්‍ය සඞ්ග්‍රහයෙන් ම සඞ්ග්‍රහ කරනලදහ.

කෑයුතු දලුවෙහි පියුම්දලු, හෙළපියුම්දලු ම වැනිවේ. එරුමුල් සුලුකුරමුල් යන මේ ආදීවූ ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාර වශයෙන් මිනිසුන්ගේ කෑයුතු දැයෙහිලා බිදියයුතු දැයෙහි ලා සැපයෙන දලු යාවකාලික වේ. කහ ඉඟුරු මකවිනියද සීරැස් වැල් වැටකේ තල් කිතුල් කටු කිතුල් පොල් පුවක් රුක් ආදීන් ගේ දලු යාවජීවික වේ. සියල්ලද

පෙළෙහි "යානි වා පනඤ්ඤානි අත්ථි මූලානි භෙසජ්ජානි"යි මෙසේ මූලභෛෂජ්‍යවශයෙන් ම සඩ්ග්‍රහ කරන ලද්දේය.

කැයුතු කිළිලෙහි තල් කිතුල් කටු කිතුල් වැටකේ පොල් පුවක් ඉදි වේ එරු කෙසෙල් යන මොවුන්ගේ කිළිලැයි ගැණෙන ගොබඩ හුණ කිළිල බටකිළිල උක්කිළිල මූලපලාකිළිල අබකිළිල සාතාවාරි කිළිල හා සප්තවිධධාන්‍යයන්ගේ කිළිල් යන මේ ආදීවූ කිළිල් හා ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාරවශයෙන් මිනිසුන්ගේ කැයුතුදැයෙහි ලා බිදිය යුතු දැයෙහි ලා නිපැයෙන රුක්වැල් ආදීන් මුදුන් යාව ‣කාලික වේ. කහ ඉඟුරු වද ම කවි සුදුලූනු කිළිල් හා තල් කිතුල් කටුකිතුල් පොල් කිළිල්වල සිද දැමූ දිරා ගිය මුල් යාවජීවික වේ.

කැයුතු කඳෙහි පොළොවතුළට වැදුනු සිල්කලණ කඳ උක්තද නිලුපුල් රතුපුල් හෙළපියුම් හෙල්මැලි යන මොවුන් දඬු යන මේ ආදිය ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාරවශයෙන් මිනිසුන්ගේ කැයුතු දැයෙහිලා බිදිය යුතු දැයෙහිලා නිපැයෙන කඳ යාවකාලික වේ. උත්පලජාතීන්ගේ පත්දඬු ද පද්මජාතීන්ගේ සියලු දඬු ද කරඹ කඳත් ආදීහුද සෙසු සියලු කඳන් ද යාවජීවික වෙත්.

කැයුතු පතුරෙහි එක් ම එක් පතුර රසසහිත වූයේ යාවකාලික වේ. සෙසු සියලු පතුරු යාවජීවික වේ. පෙළෙහි චනාහි ඒ තෙවැදෑරුම් කිළිල් කඳන් පතුරු කසට බෙහෙතින් සඞ්ග්‍රහ කරනලදැයි දතයුතුය. 'මහණෙනි' කොහොඹ කසට කෙළිඳකසට හඟුලු කසට කරඳකසට යන කසට බෙහෙත්ද යම් අතික් කසට බෙහෙත් කැයුතු දැයෙහිලා කෑමෙහි ප්‍රයොජනය නොසපයාද අනුභව කටයුතු දැයෙහිලා අනුභව කිරීමෙහි ප්‍රයොජනය නොසපයාද එබඳු බෙහෙත් අනුදනිමි'යි මෙය වදරනලද්දේය. මෙහි මොවුන්ගේ එක්කිරීම සිදුවේ. කියන ලද මුල් පතුරු කොළ වසයෙන් පැවැති සියලු කසටයෝ කැපයහයි දතයුත්තාහ.

කැයුතු පත්හි මූලපලා කර කොළොම්වැන්න නම් පලා සුලුකැර පැවරුන මහකුර තිහිසුද ලිහිකොළ ලොහොළු මුරුංගා රුවර දියබෙරලිය සිහින්මුගු, මැ, රජමැ, මහානීප හැර සෙසු නීප සිහින් මිදි, කිඹුල්වැන්න, සුදුවරණ නැලිපලා, බිම හටගත් හුළුවිල්ල පලා යන මොවුන්ගේ පත්‍රද මෙබඳු වූ අන්‍යවූද ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාරවශයෙන් මිනිසුන්ගේ කැයුතු දැයෙහිලා බිදියයුතු දැයෙහිලා නිපැයෙන පත්‍රද එකාන්තයෙන් යාවකාලික වෙත්. අන්‍යවූ නියපිටු පමණ වූ කොළ ඇති යම් ලෝණිය පලාවක් රුකෙහි හා ගසෙහි හටගණීද, ඒ ලෝණිය කොළ යාවජීවික වේ. බිම්තිරිය කොළ ද යාවකාලිකයයි දිවයින වැස්සෝ කියත්. අඹදළු

යාවකාලිකවේ. හෝපලු දලු යාවජීවික වේ. පෙළෙහි 'මහණෙනි' යම් අන්‍ය වූ බෙහෙත් පත්, කොහොඹකොළ, කෙළිඳ කොළ, දුම්මැල්ල කොළ බෙහෙත් කෑයුතු දැයෙහිලා කෑමෙහි ප්‍රයොජනය නොසපයාද, අනුභව කටයුතුදැයෙහිලා අනුභව කිරීමෙහි ප්‍රයොජනය නොසපයාද එබඳු බෙහෙත් කොළ අනුදනිමි'යි වදරනලද්දේය. ඒ බෙහෙත් කොළ යාවජීවික වේ. හුදෙක් කොළ පමණක්ම යාවජීවික නොවේ. ඔවුන්ගේ මල් ගෙඩි ආදීහු ද යාවජීවික වෙත්. යාවජීවික පණීයන්ගේ හඟුලු කොළ කුඹුක් කොළ මුරුවා කොළ දුම්මැල්ලකොළ බුලත් කොළ පියුම් කොළ'යි මෙසේ ගණන් වසයෙන් කෙළවරෙක් නැත්තේය.

කෑයුතු මලෙහි මූලපලාමල් කරමල් කොළොම්මල් වැන්න මල් තම්පලාමල් තිහිදුමල් ලිහිකොළමල් සුලුතීපමල් මහාතීපමල් කෙකටියමල් පොල්, තල් වැටකේ යන මොවුන්ගේ ලාමල් සුදුවරණමල්, මුරුංගාමල්, උපුල් පියුම් ජාතික මල්හි මල් කෙමිය පමණක් අගස්ථිමල් කියන්ගස්මල් හෙළලූනුමල් යන මේ ආදීවූ ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාරවශයෙන් මිනිසුන්ගේ කෑයුතු දැයෙහිලා ද බිදිය යුතු දූයෙහිලාද නිපැදෙන මල් යාවකාලික වේ. හෝපලු මූනමල් කුයාසක දෙඹ සපු දෑසමන් කනෙරු කිණිහිරි කොඳ සත්පෙති දෑසමන් බෝලිද්ද යන මේ ආදීන්ගේ මල් යාවජීවික වේ. ඒ මල් පිළිබඳ ගිණීමෙහි කෙළවරෙක් නැත්තේය. පෙළෙහි කසට බෙහෙත් හාම එක් කිරීම් දතයුතුය.

කෑයුතු ඵලයෙහි කොස් දෙල් තල් පොල් අඹ දඹ අඹෙල්ල සිනිඹලා ලප්නාරන් ගිවුළු ලබු කොමඩු පුහුල් තිඹිරි තියඹරා වම්බටු, ඇටකෙහෙල් මස්කෙහෙල් මී යන මොවුන්ගේ යම් ඵලයෝ ලොකයෙහි ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාර වශයෙන් මිනිසුන්ගේ කෑයුතු දැයෙහිලා බිදිය යුතු දැයෙහිලා නිපැයෙත්ද, ඒ සියල්ලෝ යාවකාලික වෙත්, නම් ගණන් වසයෙන් ඔවුන්ගේ කෙළවරක් දක්වන්නට නොහැකිය. පෙළෙහි මහණෙනි, වළහසහල්, තිප්පිලි, ගම්මිරිස්, අරළු, බුළු, නෙල්ලි, කුකුරුමුවන් යන බලබෙහෙත් ද යම් අනික් පලබෙහෙත් කෑයුතු දැයෙහි ලා කෑමෙහි ප්‍රයොජනය නොසපයා ද, බිදිය යුතු දැයෙහි ලා බිදීමෙහි ප්‍රයොජනය නොසපයාද, එබඳු පලබෙහෙත්ද අනුදනිමි'යි වදරන ලදද, ඒ බෙහෙත් පල යාවජීවික වේ. ඔවුන්ගේද නොපැසුන දලුද කෝවක්කා ලුනුවරණ වැටකේ ඇත්දෙමට ආදීන්ගේ ඵලද යාවජීවික වෙත් සාදික්කා කුළුපල එන්සාල් තකුල් යි මෙසේ නම් වසයෙන් කෙළවරක් දක්වන්නට නො හැක්කේය.

කැයුතු ඇට අතුරෙහි දෙල්ඇට, කොස්ඇට, ඇඹෙල්ල ඇට සල් ඇට ඉඳි වැටකේ තිඹිරි යන මොවුන්ගේ මේරූ ගස්වල ඇට සිතිඹලා ඇට කෝවක්කා ඇට උපුල් පියුම් ජාතීන්ගේ පොකුරු ඇට යන මේ ආදී වූ ඒ ඒ ජනපදයන්හි ප්‍රකෘති ආහාර වශයෙන් මිනිසුන්ගේ කැයුතු දැයෙහිලා ද බිදිය යුතු දැයෙහිලාද නිපැදෙන ඇට යාවකාලික වේ. මීඇට දෙඹ ඇට අරළු ආදීන්ගේ ඇට අබ ඇට ලෝලු ඇට යන මේ ආදීවූ ඇට යාවජීවික වේ. ඔවුන්ගේ සඞ්ග්‍රහය පෙළෙහි පලබෙහෙතින්ම කරනලදැයි දතයුතුය.

කැයුතු මැලියම් අතුරෙහි එක්ම උක් ලහටුවම සත්තාහකාලික වේ. සෙසු ලහටු 'මහණෙනි' පෙරුම්කායම් හිඞගුදඩු තම්බාගත් මැලියම් හිඞගුකොළ තම්බාගත් මැලියම් රුක්කරටියෙන් වැහෙන මැලියම් රුක්කොළවලින් වැහෙන මැලියම් රුක්හි මේරූ කොළ තම්බාගත් මැලියම් දුම්මල යන මැලියම් බෙහෙත්ද යම් අනිකුදු මැලියම් බෙහෙත්ද අනුදනිම්යි මෙසේ පෙළෙහිවදළ මැලියම් යාවජීවික වේ. එහි යෙවාපනකවසයෙන් ගන්නාලද්දවුන්ගේ අඹමැලියම් කිණිහිරි මැලියම් යි මෙසේ නම් වසයෙන් කෙළෙවරක් දක්වන්නට නොහැක්කේය. මෙසේ මේ මූලඛාදනියාදීන් අතුරෙහි යම් කිසිවක් යාවකාලික වේද, ඒ සියල්ලම මේ අර්ථයෙහි "**අවසෙසං ඛාදනීයං නාමා**"යි සඞ්ග්‍රහ කරනලදී. "**භොජනියං නාම පඤ්ච භොජනානි**" යනාදියෙහි යමක් කියයුත්තේ නම් ඒ කියයුත්ත කියනලද්දේමය. "**ඛාදිස්සාමි, භුඤ්ජිස්සාමීති පතිගණ්හාති**" යම් මහණෙක් තෙමේ මේ කැයුතු දැයත් බිදියයුතු දැයත් පිළිගණීද, ඔහුට පිළිගැණීම නිමිති කොට දුක්කටය වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුත්ථානිකය. කයින්ද, කායචිත්තයෙන්ද, උපදී. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි ත්‍රිවෙදනයි.

සත්වන විකාල භොජන ශික්ෂාපදයයි

—||—

අෂ්ටම ශික්ෂාපදයෙහි **බෙලට්ඨිසීස** නම් මහාස්ථවිර තෙමේ ජටිලයන් දහසට ඇතුළත් වූයේ ය. "**අරඤ්ඤෙ විහරති**" දෙව්රමට නොදුරෙහි කෙලෙස් නැවීමට භාවනා කරන ගෘහය වූ එක් ආවාසයෙක වාසය කරයි. "**සුක්ඛකූරං**" නියඹලා අවුළුරහිත බත. ඒ ස්ථවිර තෙමේ වනාහි ඇතුළුගමෙහි වළඳ පසුව පිඩු පිණිස හැසිර එබඳු බතක් ගෙණ එයි. එද වනාහි අපිස් බැවිනි. ප්‍රත්‍යයයෙහි ගිජුබැවින් නොවේ. ස්ථවිර තෙමේ

සත් දවසක් නිරොධ සමාපත්තියෙන් කල් යවා සමාපත්තියෙන් නැගිට අව්වේලා වියලා තුබූ ඒ පිණ්ඩපාතය දියෙන් තෙමා වළඳන්නේය. ඉන්පසු සත් දවසක් සමාපත්තියෙන් යුක්තව හිඳියි. මෙසේ දෙසති තෙසති සිවුසති ඉක්මවා ගමට පිඩු පිණිස පිවිසෙන්නේය. "**විරෙත ගාමං පිණ්ඩාය පවිසති**"යි එහෙයින් කියනලදී. කාර, කරණ කිරියා යනු අර්ථවශයෙන් එකෙක් වේ. රැස් කොට තැබීම මොහුටනුයි. සන්නිධිකාර නම. සන්නිධිකාරයම සන්නිධිකාරක නම පිළිගෙණ එක් රැයක් ඉක්මවන ලද භොජනයට මේ නමෙකි. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි "සන්නිධිකාරකං නාම අජ්ජ පටිග්ගහිතං අපරජ්ජු"යි වදරනලදී. "**පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස**"යි මෙසේ සන්නිධි කළ යාවකාලික වූ හෝ යාමකාලික වූ හෝ යම් කිසිවක් අනුභව කරනු කැමැති බැවින් ගන්නාවූ මහණහුට පිළිගැණීම නිමිති කොට දුක්කටාපත්තියවේ. අනුභව කරන මහණහුට එක් එක් අනුභවය නිමිති කොට පාචිත්තිය වේ. ඉදින් පාත්‍රය නොමනාව දෙවනලද්දේවේද, ඇඟිල්ලෙන් ගටන කල්හි රෙඛා පෙනේද, ගැට ඇති පාත්‍රයක හෝ ගැට අතුරෙහි ආමිසඕජස පිවිසියේ වේද, ඒ ඕජස උෂ්ණයෙහි ලා තවන කල්හි වැගිරේද, උණු කැඳ හෝ ගත්කල්හි ආමිස ඕජස පෙනේද, එබඳු පාත්‍රයෙහිද දෙවන දිනයෙහි අනුභව කරන මහණහුට පාචිත්තිය වේ. එහෙයින් පාත්‍රය සෝද නැවැත එහි පහන්දිය හෝ වත්කර ඇඟිල්ලෙන් ගටා ඕජස් රහිතබව දතයුතුය. ඉදින් දියෙහි හෝ ඕජස් ඇති බව පාත්‍රයෙහි හෝ ඇඟිලිරෙඛා පෙනේද, නොමනාව සෝදන ලද්දේවේ. තෙල් පැහැති පාත්‍රයෙහි වනාහි ඇඟිලිරෙඛා පෙනේද, ඕ තොමෝ අව්‍යවහාරික වේ. මහණෝ බලාපොරොත්තු රහිතව යමක් හෙරණුන්ට දෙත්ද, හෙරණෝ එය තැන්පත් කොට තබා දෙත්ද, සියල්ල වටියි. තමන් පිළිගෙණ පරිත්‍යාග නොකරනලද්දක් වනාහි දෙවන දිනයෙහි නොවටියි. එයින් එක් උලකුදු අනුභව කරන මහණහුට පාචිත්තියම වේ. නොකැප මස් අතුරෙහි මිනීමස් නිමිති කොට ථුල්ලච්චය සමග පාචිත්තිය වේ. සෙසු මස් නිමිති කොට දුක්කටය සමග පාචිත්තිය වේ. යාමකාලිකය විපාසාදි හේතුවක් ඇති කල්හි අනුභව කරන මහණහුට පාචිත්තියවේ. ආහාරය පිණිස අනුභව කරන මහණහුට දුක්කටය සමග පාචිත්තිය වේ. ඉදින් පවරණ ලදුව කැප නොකළ බොජුනක් අනුභව කෙරේද, ඔදනාදීවූ කැප ආමිසයෙහි පාචිත්තිය දෙකක් වේ. මිනීමස් නිමිති කොට ථුල්ලච්චය සමග පාචිත්තිය දෙකක් වේ. යාමකාලිකය හෙතුවක් ඇති කල්හි ආමිස සහිතවූ මුඛයෙන් අනුභව කරන මහණහුට පාචිත්තිය දෙකක් වේ. නිරාමිස මුඛයෙන් අනුභව කරන මහණහුට එක්ම පාචිත්තියක්

වේ. ආහාරය පිණිස අනුභව කරන මහණහුට සාමිස නිරාමිස විකල්ප දෙකෙහි දුක්කටය වැඩේ. ඉදින් විකාලයෙහි අනුභව කෙරේනම්, ඔදනාදි කැප භොජනයෙහි සන්නිධිය හෙතුකොටද විකාලභොජනය හෙතුකොටද පාචිත්තිය දෙකක්වේ. නොකැප මස්හිලා මිනීමස් නිමිති කොට ථුල්ලච්චයද සෙසු මස් නිමිතිකොට දුක්කටයද, වැඩේ. යාමකාලිකයන්හි විකාලය ප්‍රත්‍යය කොට ඇවැත් නොවේ. ඉතිරි නොකළ අකප්පිය භොජනය ප්‍රත්‍යය කොට විකාලයෙහි සියලු විකල්පයන්හි ඇවැත්නොවේ.

**"සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය"** සත්තාහ කාලිකය යාවජීවිකය යන මෙදෙක ආහාරය පිණිස පිළිගන්නා මහණහුට පිළිගැණීම ප්‍රත්‍යය කොට පළමුකොට දුක්කටය වේ. ඉදින් නිරාමිස වේනම් අනුභව කරන මහණහුට අනුභව කිරීමක් පාසා දුක්කටය වේ. නැවැත ආමිසය හා ගැටුනක් හැනුනක් පිළිගෙණ තබනලද්දේවේද, වස්තු පරිද්දෙන් පාචිත්තියම වේ. **"අනාපත්ති යාවකාලිකං"** යනාදියෙහි විකාලභොජනශික්ෂාපදයෙහි දක්වන ලද කැයුතුදැයි බිදිය යුතුදැයි මධ්‍යාහනකාලය යම්තාක්ද ඒතාක් අනුභව කටයුතු බැවින් යාවකාලික වේ. අනුලොම් පැන් සමග අටවැදෑරුම් පානවර්ගී රාත්‍රියෙහි පශ්චිම යාමය යම්තාක්ද ඒතාක් අනුභව කටයුතු බැවින් යාමකාලය මෝහටනුයි යාමකාලික නම්වේ. ගිතෙල් ආදී පස්වැදෑරුම් බෙහෙත් සත්දවසක් තැබිය යුතු බැවින් සත්තාහකාලය මෝහටනුයි සත්තාහකාලික නම්වේ. දිය හැර සෙසු සියල්ලම දිවි ඇතිතාක් දිවි කෙළවර කොට හෙතුවක් ඇතිකල්හි අනුභව කටයුතු බැවින් යාවජීවිකැයි කියනු ලැබේ එහි අරුණ නැගීමෙහිදී පිළිගත් යාවකාලිකය සියක්වරක් නමුදු තබ තබා කාලය යම්තාක් නොඉක්මේද, ඒතාක් යාමකාලිකය එක් රැයක්ද, සත්තාහකාලිකය සත්රැයක්ද, අතික් යාවකාලිකය ප්‍රත්‍යයක් ඇති කල්හි දිවි කෙළවර දක්වා නමුදු අනුභව කරන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. අට්ඨකථාවන්හි වනාහි මෙතන්හි පාන කථාද; කප්පියානුලොම කථාද, "කප්පති නුඛො යාවකාලිකෙන යාමකාලිකං" යනාදි කථාද, කප්පියභූමිකථාද විස්තර කරන ලදහ. අපි එය ආතන්හිම කියන්නෙමු. එළකලොමසමුට්ඨානිකය. කයින්ද, කායචිත්තයෙන්ද උපදී. ක්‍රියාසමුට්ඨානය නොසංඥ විමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අටවන සන්නිධිකාරකශික්ෂාපදයයි

——||——

නවම ශික්ෂාපදයෙහි "පණීතභොජනානි" උත්තමභොජනයෝය. "**කස්ස සම්පන්නං න මනාපං**" සම්පත්තියෙන් යුක්ත දැය කාහට ප්‍රිය නොවේද. "**සාදුං**" මනාරසය. "**යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය**" මෙහි පිරිසිදු ගිතෙල් ආදිය (ඉල්ලා ගෙන) විනවා වළඳනුයේ පාචිත්තියට නො පැමිණේ. සෙඛියයන්හි සූපොදනවිඤ්ඤත්තිදුක්කටයට පැමිණේ. ඔදනය හා හැනුනවුන් විනවා වළඳනුයේ පාචිත්තියට පැමිණේයයි දතයුතුය. මේ මෙහි අදහසය. එහෙයින්ම "පණීතානි"යි නොකියා "**පණීතභොජනානි**"යි සූත්‍රයෙහි කියනලදී. "පණීතානි"යි කියූ කල්හි ගිතෙල් ආදීන්ගේම ගැණීම වේ. "පණීතභොජනානි"යි කියූ කල්හි ප්‍රණීත ගිතෙල් හා හැනුනු සප්තවිධ ධාන්‍යයෙන් කරනලද භොජන ප්‍රණීතභොජනැයි යන මේ අර්ථය පෙනේ. දැන් "**විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං**" යනාදිතන්හි මේ විනිශ්චය වේ. 'ගිතෙල් සමග බත් දෙව, ගිතෙල් වක්කර දෙව, ගිතෙල් මුසුකොට දෙව, ගිතෙල් සහිතව දෙව, ගිතෙල්ද බත්ද දෙව'යි පනවන මහණහුට ඉල්ලීමම නිමිතිකොට දුක්කටය වේ. වැළඳීම නිමිති කොට පාචිත්තිය වේ. 'ගිතෙල් බත් දෙව'යි කියූ කල්හි වනාහි යම්හෙයකින් හැල්බත් මෙන් ගිතෙල් බතක් නම් නැත්තේද, එහෙයින් සූපොදන විඤ්ඤත්ති දුක්කටයම දතයුතුය. ඉදින් 'ගිතෙල් සමග බත්දෙව'යි කියූ කල්හි බත් දී 'ගිතෙල් කොට අනුභව කරව'යි වෙඬරු හෝ කිරි හෝ දී හෝ දේද, 'මේ මිලයෙන් ගිතෙල් ගෙණ අනුභව කරව'යි කැප මිල හෝ දේද, යථාවස්තුකම වේ. හෙවත් ඉල්ලීම නිමිතිකොට දුක්කටයද පිළිගැණීම නිමිතිකොට දුක්කටයද අනුභව කිරීම නිමිතිකොට පාචිත්තියද වේ. 'ගිතෙල් සමග බත් දෙව, කියූ කල්හි 'ගිතෙල් සමග හෝ දෙන්න. ගිතෙල් නැති කල්හි පෙර නයින්ම ගවවෙඬරු ආදිය හෝ 'මෙයින් ගිතෙල් සමග අනුභව කරවයි ගවදෙනක හෝ දේද,' යථාවස්තුකමවේ. ඉදින් වනාහි ගිතෙල් සමග යාඥ කරන ලදුයේ එළුගිතෙල් සමග දේද, අතිකක් ඉල්වූවහුට අතිකක් දුන් බැවින් විසඞ්කේතවේ. හෙවත් විරුද්ධවේ. මෙසේ ඇති කල්හි අතිකක් ඉල්වූවහු විසින් අතිකක් දෙනලද්දේ නම්වේ. එහෙයින් ඇවැත් නොවේ. 'එළු ගිතෙල් සමග දෙව'යි යනාදි තන්හිද මේ නයවේ. 'කැප ගිතෙල් සමග දෙව'යි කියනලද්දේ අකැප ගිතෙල් සමග දේද, විසඞ්කේතයමවේ. 'අකැප ගිතෙල් සමග දෙව'යි කියූ කල්හි අකැප ගිතෙල් සමග දේද, පිළිගැණීම නිමිති කොටද පරිභොගය නිමිතිකොටද දුක්කටයමවේ. අකැප ගිතෙල් නැති කල්හි පෙරනයින්ම 'ගිතෙල් කොට අනුභව කරව'යි අකැප වෙඬරු ආදිය දේද, අකැප ගිතෙල් සමග දෙනලද්දේවේ. 'අකැප ගිතෙල් සමගැ'යි කියූ කල්හි කැප ගිතෙල් සමග

දේද, විසඞ්කෙතවේ. 'ගිතෙල් සමගැ'යි කියූ කල්හි සෙසු වෙඬරු ආදීන් අතුරෙහි එක්තරා එකක් සමග දේද, විසඞ්කෙතයමවේ. 'වෙඬරු සමග දෙව'යි යනාදි තන්හිද මේ නයවේ. යමකින් යමකින් විනවන ලද්දේද, ඒ විනවනලද දැය හෝ ඒ වස්තුව පිළිබඳ කැප මිල හෝ ලද කල්හි ඒ ඒ විනවනලද දැය ලද්දේම වේ. ඉදින් පෙළෙහි ආවාවූ හෝ නොආවාවූ හෝ අතිකක් දෙත්ද, විසඞ්කෙත වේ. පෙළෙහි ආවාවූ වෙඬරු ආදිය හැර අන් වෙඬරු ආදියකින් විනවන මහණහුට දුක්කටය වේ. යම්සේ 'ගිතෙල්බත් දෙව'යි කියූ කල්හි හැල්බත් මෙන් ගිතෙල්බත් නැති බැවින් සූපොදන විඤ්ඤත්ති දුක්කටයම වේයයි කියනලදී. 'වෙඬරුබත් දෙව'යි යනාදි තන්හිද මෙසේය. පිළිවෙළින් එකක් එකක් විස්තර කොට කියනු ලබන කල්හි මේ අර්ථයම කියයුතු වන්නේය. එද සැකෙවිනුදු දැන ගන්නට හැක්කේය. එහි විස්තරයෙන් කිම, 'එස නයො නවනීතෙන දෙහීති ආදිසුපි'යි එහෙයින් කියනලදී. ඉදින් සියලු ගිතෙල් ආදිය සමග එක් තැනෙක්හි හෝ නොයෙක් තන්හි හෝ විනවා පිළිලද්දක් එක් බඳුනෙක්හි වක්කර එක් රසයක් කොට එයින් තණගින් තමුදු දිවගෙහි එක් බින්දුවක් තබා අනුභව කෙරේද, පාචිත්ති නවයකට පැමිණේ.

"කායිකානි න වාචසිකානි - සබ්බානි නව නානාවත්ථුකානි
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො - පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා"

කයින් සිදුවෙත්, වචනයෙන් සිදුනොවෙත්, සියල්ලෝම ගිතෙල් වෙඬරු ආදීන්ගේ වසයෙන් නානාවස්තුක වෙත්. ඒ නව පාචිත්තියට එක්වර පැමිණෙන්නේය. මේ ප්‍රශ්නය දක්ෂයන් විසින් සිතිය යුතුය'යි පරිවාරයෙහි මෙය කියනලදී.

**"අගිලානො ගිලානසඤ්ඤී"** මෙහි ඉදින් ගිලන්සන් ඇතියෙක්ව බෙහෙත් පිණිස පස් බෙහෙත් විනවාද, **මහානාම ශික්ෂාපදයෙන්** කරවිය යුතුය. ගිතෙල් වෙඬරු තෙල් මී උක්හකුරු මාලු මස් කිරි දී යන නවප්‍රණීත භොජනයන් විනවනුයේ මේ ශික්ෂාපදයෙන් කරවිය යුත්තේය. මෙහෙණන්ට වනාහි මේ නවප්‍රණීත භොජනයෝ පාටිදෙසනීය වස්තුහු වෙත්. සූපොදන විඤ්ඤත්තියෙහි මහණ-මෙහෙණ දෙදෙනාහටම ශෛක්ෂ ප්‍රඥප්තියෙහි දුක්කටයම වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. චතුස්සමුට්ඨානිකය. කයින්ද කයවචනයෙන්ද කායචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද උපදී. ක්‍රියා සමුට්ඨානය නොසංඥවිමොක්ෂය, අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන පණීතභොජන ශික්ෂාපදයයි.

——\\——

දශමශික්ෂාපදයෙහි - සිවුපසයෙහි යටත් පිරිසයින් දැහැවිද යන සියල්ල පංසුකූලික වූයේම මෝහටනුයි සබ්බපංසුකූලික නම. හෙතෙමේ වනාහි සොහොනෙහි දැමූ බඳුනක්ම පාත්‍රය කොට, එහි දැමූ රෙදිකෑලි වලින්ම සිවුරක් කොට, එහි දැමූ ඇඳපුටුම ගෙණ පරිභොග කරයි1. **"අය්‍යවොසාටිකතානි"** යන මෙහි කලුරිය කළ පියානන් හා මුත්තනුවෝ අය්‍යයි කියනු ලැබෙත්. ඔවුන් පිණිස සොහොන් ආදියෙහි දමූ කෑයුතු දැය හා බිදියයුතු දැය වොසාටිකතානි කියනු ලැබෙත්. මිනිස්සු කලුරිය කළ නෑයන් උදෙසා දිවිසහිත කාලයෙහි ඔවුන්ට යමක් ප්‍රිය වේද, ඒ ප්‍රිය දෙය මේ සොහොන් ආදියෙහි පිඩු පිඩු කොට 'අපගේ නෑයෝ අනුභව කෙරෙත්වා'යි තබත්. ඒ මහණ තෙමේ එය ගෙණ අනුභව කරයි. දෙනු ලබන ප්‍රණීතවූද අතිකක් නොකැමැති වේ. **"සුසානෙපි රුක්ඛමූලෙපි උම්මාරෙපි අය්‍යවොසාටිකතානි සාමං ගහෙත්වා පරිභුඤ්ජති"**යි එහෙයින් කියනලදී. **"ථෙරො"** ස්ථිරය. ඝනවූ මසින් බැඳුනේය. **"වඨරො"** තරය. තරවූද ඝනසරීර ඇත්තාවූද, මේ මහණැයි කියනලද්දේවේ. **"මනුස්සමංසං මඤ්ඤෙ ඛාදති"** ඒ මහණහු මිනීමස් කාය'යි සලකම්හ. මිනීමස් කන්නෝ මෙබන්දෝ වෙත්යි. ඒ සොහොනෙහි හැසිරෙන ඒ මහණහු දුටුවන්ගේ මේ අදහස වේ. **"උදකදන්තපොනෙ කුක්කුච්චායන්ති"** යන මෙහි ඒ භික්ෂූහු මිනිසුන් විසින් සොහොනෙහි දැමූ බොජුන් ගෙණ අනුභව කළ කරුණු සඳහා පනවනලද ශික්ෂාපදයෙහි **"අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය"** යන මේ පදයෙහි අර්ථය මනාකොට නොසලකා කුකුස් කළහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි උපන් වස්තු වශයෙන් දරුවන් කෙරෙහි පියකු මෙන් ඒ මහණුන්ට හභවමින් අනුප්‍රඥප්තිය තැබූ සේක. "අදින්නං" කයින් හෝ කයපිළිබැදියකින් හෝ ගන්නා මහණහුට කායපටිබද්ධනිස්සග්ගිය යන්ගෙන් එක්තරා එකක්හුගේ වසයෙන් නොදෙනලද්දය. මේ නොදුන් දෙය සඳහාම පදභාජනයෙහි **"අදින්නං නාම අපටිග්ගහිතකං වුච්චති"**යි වදරනලදී. දෙවන පරිජිසිකපදයෙහි වනාහි **"අදින්නං නාම පරපරිග්ගහිතකං වුච්චති"**යි වදළසේක. **"දින්නං"** යන මේ පදය ඒ නොදුන් දෙයට ප්‍රතිපක්ෂ වශයෙන් ලක්ෂණ දැක්වීම පිණිස නිර්දේශයෙහි මොහු පිළිබඳ 'කයින් හෝ කයපිළිබැදියකින් හෝ බැහැරලූවකින් හෝ දෙත්'යි උදුරා දක්වනලදී. මෙසේ අතිකක් දෙන කල්හි **"හත්ථපාසෙ ඨිතො කායෙන වා කායපටිබද්ධෙන වා පතිගණ්හාති"**යි මෙසේ දෙනුලබන එය යටත් පිරිසයින් රථරේණුවක් නමුදු ඉදිත් පෙර කියූ ලක්ෂණ ඇති අත්පයෙහි සිටියේ කයින් හෝ කායපිළිබැදියකින් හෝ පිළිගණීද, මෙසේ මෙය පිළිගන්නාලද්දේ නම් දෙනලද්දේ නමැයි කියනු ලැබේ. 'මෙය ගණුව, මෙය තුඹට වේවා'යි නොදෙනලද්දෙක්

නොවේ. එහි "**කායෙන වා**" අත් ආදීන් අතුරෙහි යම්කිසි ශරීරාවයවයකින්, යටත් පිරිසයින් පය ඇඟිල්ලෙන් නමුදු දෙනුලබන්න කයින් දෙන ලද්දේ නම්වේ. පිළිගැනීමෙහිද මේ නයවේ. යම්කිසි ශරීරාවයවයකින්ම ගන්නා ලද්දේද, කයින් ගන්නාලද්දේම වේ. ඉදිනුදු නස්‍යය පිණිස තැනූ යුගපිලාවෙන් දෙනුලබන තෙල නාසා පුටයෙන් නොහොත් මුඛයෙන් ගිලනෙක්වම මුඛයෙන් පිළිගණීද, ආභොග මාත්‍රයෙන්ම මෙහි ප්‍රමාණය. මේ නය, මහාපච්චරියෙහි කියන ලද්දේය. "**කායපටිබද්ධෙන**" හැදි ආදීන් අතුරෙහි යම්කිසි උපකරණයකින් දෙනලද්දේද කයපිළිබැඳියෙන් දෙනලද්දේනම් වේ. පිළිගැණීමෙහිද මේ නයමවේ. සිරුර පිළිබඳවූ යම්කිසි පාත්‍ර තලු ආදියකින් ගන්නාලද්දේද, කය පිළිබැඳියෙන් ගන්නාලද්දේම වේ. "**නිස්සග්ගියෙන**" කයින්ද කයපිළිබැඳියෙන්ද මුදා අත්පස සිටියහුගේ කයින් හෝ කය පිළිබැඳියෙන් හෝ හෙලනු ලබන්නක්ම නිස්සග්ගිය ප්‍රයොගයෙන් දෙන ලද්දේ නම් වේ. මේ පාලිවණ්ණනාය.

මේ මතු කියන්නේ මෙහි පාලිමුත්තකවිනිශ්චයයයි: පස් අඟකින් පිළිගැණීම නැගෙන්නේය. බලවත් මධ්‍යම පිරිමියක්හුගේ එසවීම පමණක් වේ. අත්පස පෙනේ. එළවීම පෙනේ. දෙවියෙක් හෝ මිනිසෙක් හෝ තිරිසෙනෙක් හෝ දෙයි. ඉදින් ඒ දීම මහණ තෙමේ කයින් හෝ කයපිළිබැදියකින් හෝ පිළිගණී නම් මෙසේ පස් අඟනකින් පිළිගැණීම නගින්නේය. එහි සිටි හුන්, හොත්තවුන්ගේ අත්පස පවාරණ ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය. ඉදින් වනාහි දයක ප්‍රතිග්‍රාහක යන මොවුන්ගෙන් එකෙක් අහසෙහි වේද, එකෙක් බිමැ වේද, බිමැ සිටියහුගේද හිසින් අහසසිටියහුගේද, දෙන්නට හෝ ගන්නට හෝ දිගු කළ අත හැර ඉතා ලංවූ අවයවයක් වේද, ඒ අවයවයෙහි ලංවූ කෙළවරින් අත්පස පමණ පිරිසිඳිය යුතුය. ඉදින් එකෙක් ලිදෙහි වේද, එකෙක් ලිංතෙර වේද, කියූ නයින්ම අත්පස පමණ පිරිසිඳිය යුතුය. මෙබඳු අත්පසෙහි සිට ඉදින් පක්ෂියෙක් මුවතුඩින් හෝ ඇතෙක් සොඬින් හෝ ගෙණ මලක් හෝ ගෙඩියක් හෝ දේද, පිළිගැණීම සිදුවේ. අඩ අටරියනක් ඇත්තාවූ ඇත් කදෙහි හුන්නේ ඒ ඇතුවිසින් සොඬින් දෙනු ලබන්නක් ගණීද වටියි. එකෙක් බොහෝ බත් ව්‍යඤ්ජන බඳුන් හිසෙහි කොට භික්ෂු සඞ්ඝයාගේ සමීපයට පැමිණ සිටියේම 'ගණු මැනැවැ'යි කියාද, එහෙත් එළවීම නොපැනේ. එහෙයින් නොගතයුතුය. ඉදින් වනාහි මදකුත් නැමේද, මහණහු විසින් අතදිගු කොට යටම බඳුන එක්දෙසකින් නමුත් පිළිගතයුතුය. මෙපමණකින් සියලු බඳුන් පිළිගන්නා ලද්දේවේ. එතැන් පටන් බා හෝ ඔසොවා හෝ යමක් කැමැත්තේද, එය ගැණීම වටියි. බත් සහිත පැස් ආදියෙහි වනාහි එක් බඳුනෙක්හි කියයුත්තෙක්ම

නැත්තේය. කඳින් බත් ගෙණ යන්නේම ඉඳින් කඳ නමා දේද, වටියි. තිස්රියන් හුණෙක්වේ, එහි එක් කෙළවරක හකුරුකළයක් බඳින ලද්දේවේ. එක් කෙළවරක ගිතෙල් කළයක් වේ, එද පිළිගණීනම් සියල්ල පිළිගන්නා ලද්දේම වේ. උක්යන්ත්‍ර දෙණින් වැගිරෙන්නාවූම රසය ගණු මැනැවැයි කියාද, එහි එළවීම නොපෙනේයයි නොගතයුතුය. ඉඳින් කසට හැර අතින් එකතු කොට දේනම් වටියි. බොහෝ පාත්‍රයෝ ඇඳක හෝ පුටුවක හෝ කළාලයක හෝ දෙණක හෝ පුවරුවක හෝ තබතලද්දහු වෙත්ද, යම් තැනක සිටියහුගේ අත්පයෙහි දයක තෙමේ සිටියේ වේද, එහි සිට පිළිගණිමි යන හැඟීමෙන් ඇඳ පුටු ආදිය ඇඟිල්ලෙන් නමුදු පහසා සිටියහු විසින් හෝ හුන්නහු විසින් හෝ හොත්තහු විසින් හෝ ඒ පාත්‍රයන්හිලා යමක් දෙනු ලැබේද, ඒ සියල්ල පිළිගන්නා ලද්දේ වේ. ඉඳින් පිළිගන්නෙමියි ඇඳපුටු ආදියට නැගී හිඳී නම් වටීමය. පොළොවෙහි කුසින් කුස පැහැර පාත්‍ර තුබුනේ වේද යම් යම් පාත්‍රයක් ඇඟිල්ලෙන් හෝ කටුවකින් හෝ පහසා හුන්නේ වේද, එහි එහිම දෙනුලබන්නක්ම පිළිගන්නා ලද්දේවේ. මහකළාල් ඇත් අතුරුනු ආදීවූ කිසි කිසි තැනක තැබූ පාත්‍රයෙහි පිළිගැණීම සිදු නොවේයයි කියනලදී. එය අත්පස ඉක්මීම සඳහා කියනලදැයි දතයුතුය. අත්පස ඇති කල්හි යම් කිසි තැනක වටියි. ඒ රුකෙහි පිහිටා තුබූ පාත්‍රය හැරයි. එහි හටගත් පියුම් පතක හෝ කැලකොළ ආදියෙහි හෝ පිළිගැණීම නොවටියි. ඒ කොළ ආදිය කය පිළිබඳය යන ගිණීමට නොයයි. ඒ රුක්හි පිහිටා තුබූ පත්හි යම්සේද මෙසේ කණුවක බැඳ තුබූ ඇඳපුටු ආදියෙහි හෝ බලවත් මැදුම් පිරිමියකු විසින් නැගිය නොහැකි පුවරුවක හෝ ගලෙක හෝ පිළිගැණීම නොඋපදීමය. ඒ නැගිය නොහැකි පුවරු හා ගල් එහි උපන්හයි ගිණීමට පැමිණියාහු වෙත්. බිම අතුරුණු සියුම් වූ සිතිඹලා ආදී කොළවල පිළිගැණීම සිදු නොවේ. ඒ සියුම් සිතිඹලා බත් ආදීහු දිරාසිටින්නට සමත්‍් නොවෙත්ද, එහෙයිනි. මහත්වූ පියුම්පත් ආදියෙහි පිළිගැණීමම සිදුවේ. අත්පස ඉක්මවා සිටියේ දිග්දඬු ඇති කෙණෙස්සකින් දේද, එකල්හි' අවුත් දෙව'යි කියයුතුය. කියූ වචනය නොඅසා හෝ නොගෙණ හෝ පාත්‍රයෙහි බහාලීමම කෙරේද, නැවැත පිළිගත යුතුය. දුර සිට බත්පිඩ දමන කල්හිද මේ නයම වේ. පාපසුම්බියෙන් බැහැරට ගන්නා කල්හි පාත්‍රයෙහි රජස්සුණු වේද, දිය ඇති කල්හි සේදිය යුතුය. දිය නොමැති කල්හි රජස්සුණු පිසදමා පිළිගෙණ හෝ පිඩු පිණිස හැසිරිය යුතුය. පිඩුපිණිස හැසිරෙන කල්හි පාත්‍රයෙහි රජස් වැටේද, නැවැත පිළිගෙණ භික්ෂාව ගතයුතුය. නොපිළිගෙණ භික්ෂාව ගන්නහුට විනයදුක්කටය වේ. ඒ භික්ෂාව නැවැත පිළිගෙණ අනුභව කරන මහණහුට

ඇවැත් නොවේ. පිළිගෙණ දුනමැනැවැ'යි කියූ කල්හි ඒ වචනය නොඅසා හෝ නොගෙණ හෝ දෙන්නේම නම් විනය දුක්කටයක් නැත්තේය. නැවැත පිළිගෙණ අන්‍ය භික්ෂාවක් ගතයුතුය. මහ සුළඟක් ඒ ඒ දිගින් රජස්' හෙලා නම්, භික්ෂාව ගන්'නට නොහැක්'කේ' නම් අනුපසම්පන්නයක්හට දෙන්නෙමි'යි පිරිසිදු සිතින් කල්පනා කොට ගැණීම වටියි. මෙසේ පිඩු පිණිස හැසිර වෙහෙරට හෝ අසුන්හලට හෝ ගොස් ඒ පිණ්ඩපාතය අනුපසම්පන්නයක්හට දී නැවැත ඔහු විසින් දෙනලද්ද හෝ ඔහු කෙරෙහි විශ්වාසයෙන් හෝ පිළිගෙණ වැළඳීම වටියි. භික්ෂාව පිණිස හැසිරීමෙහිදී රජස් සහිතවූ පාත්‍රය අන් මහණක්හට දේද, "මේ පාත්‍රය පිළිගෙණ භික්ෂාව ගණුව හෝ අනුභව හෝ කරව'යි හෙතෙමේ කියයුතුය. ඒ මහණහු විසින් එසේ කටයුතුය. ඒ බත මතුවෙහි රජස් ඉපිලේද, කාඩිය බේරා හැර ඉතිරිය අනුභව කටයුතුය. ඒ රජස් ඇතුළට වැදුනේද පිළිගත යුතුය. අනුපසම්පන්නයකු නැති කල්හි අතින් නොමුදන්නහු විසින්ම යම් තැනක අනුපසම්පන්නයෙක් වේද, එහි ගෙණ ගොස් පිළිගත යුතුය. වියලි බතෙහි වැටුනු රජස් පහකොට වැළඳීම වටියි. ඒ රජස් ඉතා සියුම් වේ නම්, මතුපිට බත් සමග පහකට යුතුය. නොහොත් පිළිගෙණ වැළඳිය යුතුය. කැඳක් හෝ සූපයක් හෝ ඉදිරියෙහි තබා හැඳි ගාන කල්හි බඳුනෙන් බින්දු උඩට නැගී පාත්‍රයෙහි වැටෙත්ද, පාත්‍රය පිළිගතයුතුය. හැන්දෙන් ගෙණ අවුත් දෙන කල්හි ඉතා පළමු කොට හැන්දෙන් බින්දු පාත්‍රයෙහි වැටෙත්ද ඔවුහු මනාකොට වැටුනාහුය. එළවූ බැවින් දෙසෙක් නැත්තේය. කුඩා බඳුනකින් බත්ලන කල්හි ඒ කුඩා බඳුනෙන් දැලි හෝ අලු හෝ වැටේද, එළවූ බැවින් දෙසෙක් නැත්තේමය. අනතුරුව හුන් මහණක්හට දෙනු ලබන යමක් පාත්‍රයෙන් උඩට නැග අන් මහණක්හුගේ පාත්‍රයෙහි වැටේද, එය මනා වැටීමෙක් වේ. එය පිළිගත්නාලද්දක්ම වේ. ලිහිපලා කොළ ආදිය පලා එක් මහණක්හට දෙන කල්හි පලා කොළවලින් බින්දු අතික් මහණක් හුගේ පාත්‍රයෙහි වැටෙත්ද, පාත්‍රය පිළිගතයුතුය. යම් මහණක්හුගේ පාත්‍රය මතුවෙහි තබා පලත්ද, ඒ මහණහුගේ පාත්‍රයෙහි වැටුනු කල්හි දෙනු කැමැති බැවින් එළවූ බැවින් දෙසෙක් නැත්තේය. කිරිබතින් පාත්‍රයපුරවා දෙත්. පාත්‍රය රත්වූ බැවින් යටින් අල්ලා ගන්නට නොහැක්කේනම් මුවපිටිනුදු ගැණීම වටියයි. එසේත් නොහැක්කේ නම් පාත්‍රාධාරයෙන් ගතයුතුය. පාත්‍රය ගෙණ අසුන්හලෙහි හුන් මහණෙක් තෙමේ නින්දට වැටුනේ, ගෙණෙනු ලබන්නක් නොම දනීද, දෙනුලබන්නක් නොදනීද, නොපිළිගත්නා ලද්දේවේ. 'පිළිගන්නෙමි'යි කල්පනා කොට හුන්නේ නම් පිළිගැණීම වටියි. ඉදින් ඒ මහණ තෙමේ අතින් පාත්‍රය

හෝ පාත්‍රාධාරය මුදහැර පයින් පා අඩිය පාගා නිදද, වටීමය. පයින් පා අඩිය පාගා පිළිගන්නාවූ නො නිදන මහණහුට ද පිළිගැණීමෙහි අනාදරය හෙවත් අනාදර පිළිගැණීම වේ. එහෙයින් ඒ පිළිගැණීම නොකටයුතුය. අභයගිරිවාසීහු පා අඩියෙන් පිළිගැණීම කය පිළිබැදියෙන් පිළිගැණීම නම් වේ. එහෙයින් පිළිගැණීම නොවටීයයි කියත්. එය වචන මාත්‍රයෙක්ම වේ. අර්ථවශයෙන් මේ සියල්ලම කය පිළිබදම වේ. කායසංසග්ගියෙහිද මේ නය දක්වන ලද්දේය. මහණක්හට දෙනු ලබන යමක් වැඩේද එද තමන් ගෙණ වැළදීම වටියි. එහි "අනුජානාමි භික්ඛවෙ යං දීයමානං පතති තං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං. තං කිස්ස හෙතුඃ පරිච්චත්තං තං භික්ඛවෙ දයකෙහි" යනු සූත්‍රය වේ. මේ සූත්‍රය වනාහි නෙයාාර්ථ ඇත්තේ වේ. එහෙයින් මෙහි අදහස මෙසේ දතයුතුයඃ දෙනුලබන යමක් දයකයාගේ අතින් ගිලිහී පිරිසිදු බිමක හෝ පියුම්පත් වස්ත්‍ර කළල් ආදියෙක හෝ වැටේද එය තමන් ගෙණ වැළදීම වටියි. යමක් වනාහි රජස් සහිත බිමෙක වැටේද රජස් පිසදමා හෝ සෝද හෝ පිළිගෙණ හෝ වැළදිය යුතුය. ඉදින් පෙරළෙමින් ගොස් අන් මහණක්හුගේ සමීපයට යේද, ඔහු ලවා ගෙන්වා ගැණීම හෝ වටියි. ඒ මහණහුට 'තෝ ම අනුභව කරවා'යි කියාද, ඔහුටද ඒ කැම වටියි. නොඅණවන ලද්දහු විසින් නොගතයුතුය. නොඅණවන ලද්දහු විසින්ද, අන් මහණක්හට දෙන්නෙමි'යි ගැණීම වටීයයි කුරුන්දියෙහි කියනලද්දේය. කුමක් හෙයින් මේ පෙරළීගිය කැවිලිය අන් මහණක්හට ගන්ට නොවටීද, යත්ඃ භාග්‍යවතුන් වහන්සේ විසින් නො අනුදත් බැවිනි. 'තමන් විසින් ගෙණ අනුභව කරන්නටයයි වදරන්නාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ යමක් හටම දෙනු ලබන්නාවූ එය වැටේද, ඒ වැටුනු දැය ඔහු විසින් නො පිළිගන්නා ලද්දේද, එය ගෙණ අනුභව කිරීම අනුදන්නා ලද්දේය. 'මහණෙනි' දයකයන් විසින් ඒ දැය පරිත්‍යාග කරන ලද්දේය, යන වචනයෙන් මෙහි මෙරමාසතුබව දක්වන ලද්දේය. යම්හෙයකින් මූලසථයාහටම පරිභොගය වදරන ලද්දේද, එහෙයින් අතිකක්හු සතු දැය තමන් විසින් ගෙණ අනුභව කිරීම නොවටියි. ඔහුගේ අණින් වටියි. මේ මතු කියන්නේ මෙහි අදහසය. එය නොපිළිගත් දැයක් බැවින් යම්හෙයකින් අනුදන්නා ලද්දේද, එහෙයින් තුබූ පරිදිම උග්ගහිත පටිග්ගහිතකයි බැවින් ආමර්ෂණය නොකොට කිසිවකින් වසා තබනලද්දේ දෙවන දවසෙහිද වැළදීම වටියි. දෙවන දවසට තබා ප්‍රයෝජන ගැණීම ප්‍රත්‍යය කොට නොපිළිගත් බැවින් ඇවැත් නොවේ. පිළිගෙණ වැළදිය යුතුය. එදවසම ඒ දැය තමන් විසින් ගෙණ වැළදීම අනුදන්නා ලදී. එයින් මතු නොවේ. මේ වනාහි මෙහි අදහසය.

දැන් අව්‍යවහාරිකනය කියනු ලැබේ. අනුභව කරන්නන්ගේ දත් ගෙවී යත්. තිය ගෙවෙත්. පාත්‍රයෙහි පැහැය නැසී යයි. සියල්ල අව්‍යවහාරික වේ. ආවුධයෙන් උක් ආදිය පැලූ කල්හි මල පෙනේද, ඒ මල අලුත නැගුනේ වේ. පිළිගෙණ වැළඳිය යුතුය. ආවුධය සෝද පැලූ කල්හි මල නොපෙනේද ලොහොගඳ පමණක් ඉතිරිවේද, ඒ ලොහොගඳ අව්‍යවහාරික වේ. යම්බඳුවූද, ආවුධයක් ගෙණ පරිහරණය කරත්ද, එයින් පැලූ කල්හිද මේ නයම වේ. හෙවත් අව්‍යවහාරික නයමය. නොපිළිගන්වන ලදුව තමන් විසින්ම ගන්නාලද ඒ ආවුධය පරිභොගය පිණිස පරිහරණය නොකෙරෙත්යි. මෙයින් බාහිර පරිභොගය පිණිස තමන්ම හෝ ගෙණ අනුපසපනකු විසින් දෙනලද්දක් හෝ ගෙණ පරිහරණය කිරීම වටීයයි දැක්වේ. එහෙයින් පා ආදියෙහි ගෑම පිණිස තමන් විසින් ගෙණ පරිහරණය කළ තෙල් ආදිය අනුභව කරණු කැමැති වේනම්, නොපිළිගෙණ පරිභොග කරන මහණහුට ඇවැත්නොවේ. අභ්‍යන්තර පරිභොගය පිණිස තමන් විසින් ගන්නාලද්දක් පිළිගෙණ අනුභව කරන මහණහුට උග්ගහිත පටිග්ගහිතකය වේ. නොපිළිගෙණ පරිභොග කරන මහණහුට අදින්නමුඛද්වාරාපත්තිය වේ. මුල් බෙහෙත් ආදිය අඹරන කල්හි හෝ කොටන කල්හි අඹරන ගල් දරුගල් වන මොහොල් ගෙවෙත්ද, ඒ ඇඹරූ කෙටූ බෙහෙත්හි අමුතු පැහැයෙක් පෙනේනම් නොවටීයයි දන්නේය. පරිහරණය කරන වෑය තවා බෙහෙත් පිණිස මෝරුයෙහි හෝ කිරෙහි හෝ බහාලත්. එහි නිල්පැහැය පෙනේ නම් ආවුධයෙහි කියනලද්ද සමානවූ විනිශ්චය වේ. අමුමෝරු ආදියෙහිද, තමන් විසින් නොබහාලිය යුතුය. බහාලාතම් සමපාකයෙන් නොමිදේ.

වැසි වස්නා කල්හි පිඩු පිණිස හැසිරෙන්නහුගේ සිරුරෙන් හෝ සිවුරෙන් හෝ කිලිටිදිය පාත්‍රයෙහි වැටේනම් එය පිළිගත යුතුය. රුක්මුල් ආදියෙහි හිඳ වළඳන මහණහුගේ පාත්‍රයෙහි වැටුනු කල්හිද මෙම නයවේ. ඉදින් සත් දවසක් මුළුල්ලෙහි වැසි වස්නා කල්හි පිරිසිදු දිය වේද, අභ්‍යවකාශයෙන් හෝ වැටේද, වටියි. හෙරණක්හට ඔදනය දෙන මහණකු විසින් ඔහුගේ පාත්‍රයෙහි වූ හොජනය නොපහසන්නහු විසින්ම දියයුතුය. මොහුගේ පාත්‍රය හෝ පිළිගතයුතුය. නොපිළිගත් කල්හි ඔදනය පහසා නැවැත තමන්ගේ පාත්‍රයෙහි ඔදනය ගන්නා මහණහුට නොපිළිගත්තක් ගන්නාලද්දේවේ. ඉදින් දෙනු කැමැතිව 'හෙරණ' පාත්‍රය ගෙණ එව, ඔදනය ගණුව'යි කියාද, අනික් හෙරණ තෙමේද, 'මට කම් නැතැ'යි ප්‍රතික්ෂෙප කෙරේද, නැවත මේ ඔදනය මා විසින් පරිත්‍යාග කරනලදැ'යි කීකල්හිද 'මට මෙයින් ප්‍රයොජන නැතැ'යි කියාද, සියක් වරක් නමුදු පරිත්‍යාග කෙරේවා, යම්තාක් තමන්ගේ අතට පත්වූයේද,

ඒතාක් පිළිගන්නා ලද්දේම වේ. පාත්‍රාධාරයෙහි තුබුනක් බලාපොරොත්තු රහිතව ගණුව'යි කියාද, නැවැත පිළිගතයුතුය. බලාපොරොත්තු සහිතව පාත්‍රාධාරයෙහි පාත්‍රය තබා 'මෙයින් පූ හෝ බත් හෝ ගණුව'යි හෙරණකුට කියාද, හෙරණ තෙමේ අත සෝද සියක් වරක් ගෙණ තමන්ගේ පාත්‍රයෙහි තුබූ දැය නොපහසමින්ම තමන්ගේ පාත්‍රයෙහි බහාද, නැවත පිළිගැණීම් කිසෙක් නැත්තේය. ඉදින් තමන්ගේ පාත්‍රයෙහිවූ දැය පහසා එයින් ගණීද, හෙරණහු සතු දැය හා හැනුනේ වේද, නැවැත පිළිගත යුතුය. අභයගිරිවාසීහු වනාහි ගණු ලබන්න සිඳී එහි වැටේද, නැවැත පිළිගතයුතුයයි කියත්. ඔවුන්ගේ ඒ කීම 'එක් බත්පිඩක් ගණුව,එක් පූපයක් ගණුව, මේ සකුරුපිඩෙහි මෙපමණ පෙදෙසක් ගණුව'යි මෙසේ පිරිසිඳ කිය කල්හි, එහිලා දතයුතුය. මෙහි වනාහි පිරිසිඳීමෙක් නැත්තේය. එහෙයින් හෙරණහුගේ පාත්‍රයෙහි යමක් වැටේද, ඒ වැටුනු දැයම පිළිගැණීම හරින්නේය. හෙරණෙක් තෙමේ අතෙහි තුබූ දැය'කම් නැතැ'යි එහි නොඇලේද, මහණෙක් හෝ නොවඳුකාද, ඒතාක් මහණහු සතුම වේ. එහෙයින් පිළිගැණීම නොහරියි. තමන්ගේ හෝ මහණුන්ගේ හෝ කැඳ පිසන බඳුනෙක්හි කිසිවකු පිණිස බත් බහාලත්ද, 'හෙරණ' බඳුන මතුවෙහි අත තබව'යි කියා ඔහුගේ අතෙහි බහාලිය යුතුය. ඔහුගේ අතින් බඳුනෙහි වැටුනක්, දෙවන දවසෙහි බඳුන තමා අකප්පියභාවය නොකරන්නේය. එසේවන්නේ පරිත්‍යාග කළ බැවිනි. මෙසේ නොකොට බහාලාද, පාත්‍රය මෙන් බඳුන නිරාමිස කොට පරිභොග කටයුතුය. දයකයෝ කැඳකළයක් තබා ගියහ. ඒ කැඳකළය ලදරුහෙරණෙක් තෙමේ පිළිගන්වන්නට නොහැක්කේද, මහණ තෙමේ පාත්‍රය එළවා ද, හෙරණතෙමේ කළයෙහි බෙල්ල, පාත්‍රයෙහි මුවවිට තබා ඇල කරන්නේය. පාත්‍රයෙහි තුබූ කැඳ පිළිගන්නා ලද්දීම වේ. නොහොත් මහණ තෙමේ බිම අත තබාද, හෙරණ තෙමේ පෙරළා එහි තගාද වටියි. පූපැස් බත්පැස් උක්බරයනාදි මොවුන් අතුරෙහිද මේ නයම වේ.

පිළිගැණීමට සුදුසු බරක් දෙතුන් හෙරණ කෙනෙක් දෙත්ද, බලවත් එකකු විසින් හෝ ඔසවනලද්දක් දෙතුන් මහණ කෙනෙක් ගණිත්ද, වටියි. ඇඳක හෝ පුටුවක හෝ පාදයෙහි තෙල්කළයක් හෝ පැණිකළයක් හෝ එල්වත්ද, එහි ඇඳෙහි හෝ පුටුවෙහි මහණහුට හිදීම වටියි. නොපිළිගන්වා ගත් දැයක් නම් නොවේ. බිත්හි ගැසූ කොක්කෙක හෝ අකුස්සෙක හෝ තෙල්කළ දෙකක එල්වන ලද්දේවේද, පිළිගත් තෙල්බඳුන මතුවෙහි වේද, නොපිළිගත් තෙල්බඳුන යටැවේද, නොපිළිගත් තෙල්කළය මතුවෙහි වේද, මතුවෙහි තෙල්කළය ගෙණ අතික් තෙල්කළය ගන්නා මහණහුට මතුවෙහි තෙල්කළය නොපිළිගන්වා ගන්නාලද්දෙක් වේ. ඇඳ

යටැ නොපිළිගත් තෙල් නැලියක් වේද, මහණෙක් හමදිමින් මුස්නෙන් ගටා නම් උග්ගහිතකයෙක් නොවේ. පිළිගන්නාලද්දක් ගන්නෙමි'යි නොපිළිගන්නා ලද්දක් ගෙණ දැන නැවැත තබාද, උග්ගහිතක නොවේ. පිටතට ගෙණවුත් දැන ගණීද, පිටත නොතබා ගෙණගොස් එහිම තැබිය යුතුය.දෙසෙක් නැත්තේය. පෙර විවෘත කොට තබනලද්ද නොවැසිය යුතුය. පෙර යම්සේ තුබුනේද, එසේම තැබිය යුතුය. පිටත තබා නම් නැවැත නොපැහැසිය යුතුය. පිළිගත් තෙල් ආදියෙහි පුස් නගීද, ඉඟුරු ආදියෙහි පුස් නම්වූ ඝනසුණු නගීද, මෙය පිළිගත් දැයින් හටගත් බැවින් තතසමුට්ඨාන නම. හෙවත් එපිළිගත් දැයම නම්, එහෙයින් නැවැත පිළිගැණීමෙක් නැත්තේය.

තල්රුකකට හෝ නෙරළුරුකකට හෝ නැගගත් යමෙක් තෙමේ රැහණකින් බැඳ ගෙඩිවල්ලක් බා ගස උඩ සිටියේම ගණුව'යි කියාද නොගතයුතුය. බිම සිටි අන් එකෙක් රැහැන්මලය ගෙණ ඔසවා දේද, ගැණීම වරදෙක් නොවේ. ගෙඩි සහිතවූ මහ අත්තක් කැප කරවා පිළිගණීද, ගෙඩි පිළිගන්නාලද්දහුම වෙත්. කැමැති සේ පරිභොග කිරීමෙහි වරදෙක් නැත්තේය. වැටතුළ සිට වැඩ කඩා උක්දණ්ඩක් හෝ තිඹිරිගෙඩියක් හෝ. දෙත්ද අත්පස ඇති කල්හි පිළිගත හැකිය. ගමන් වළකනු පිණිස සිටවූ දඬුවල නොවැදී නික්මුනක් ගන්නාවූ මහණහුට දෙසෙක් නොවේ. දඬුවල වැදී නික්මුනු කල්හිද දෙසෙක් අට්ඨකථාවන්හි නොදක්වන ලද්දේය. අපි වනාහි 'යම් තැනක වැදුනේද, එතැනින් තමන් වැටුනක් මෙන් වේය'යි තර්කනය කරම්හ. අයබදු අයකර ගන්නා තැනින් පෙරළී පිටත වැටුනු භාණ්ඩයක් මෙන් එද නොනැවතී යන කල්හි ගැණීම යෙදෙන්නේය. වැටක් හෝ පවුරක් හෝ පන්නවා හැර දෙත්ද, පවුර ඝන පවුරෙක් නොවේද, ඇතුළු පවුරෙහි හෝ පිටත පවුරෙහි හෝ සිටියහුගේ අත්පස පොහෝනේද, සියක් රියනක් නමුදු උඩට ගොස් පැමිණියක් ගැණීමෙහි දෙසෙක් නැත්තේය. මහණෙක් තෙමේ ගිලන් හෙරණකු කඳින් ගෙණයාද, ඒ හෙරණ තෙමේ කුදුමහත් ගෙඩි දැක ගෙණ කරෙහි හුන්නේම දේනම් පිළිගැණීම වටියි. අනිකෙක් තෙමේ මහණකු ගෙණ යන්නේ කරෙහි හුන් මහණක්හට දේනම් එද වටීමය. මහණෙක් තෙමේ ගෙඩිඇති අත්තක් සෙවන පිණිස ගෙණ යේද, එකල්හි ගෙඩි කන්නට සිතක් උපන්කල්හි පිළිගන්වා ගෙණ කෑම වටියි. මැස්සන් වැළකීම පිණිස කැප කරවා පිළිගණීද, කනු කැමැත්තේත් වේද, මුල් පිළිගැණීමම පමණ වේ. කන මහණහුට දෙසෙක් නැත්තේය. මහණෙක් තෙමේ පිළිගැණීමට සුදුසුවූ භාණ්ඩයක් මිනිසුන්ගේ 'ඝානයෙක්හි තබා මග බැසයේද, යානය මඩෙහි එරේද, තරුණ මහණෙක් තෙමේ

ගැල්සක ගෙණ ඔසවාද, පිළිගැණීම වටියි. උග්ගහිතක නම් නොවේ. පිළිගත යුතු භාණ්ඩයක් නැවක තබා නැව රිටකින් හෝ පදීද, අතින් හෝ අදීද, වටීමය. පහුරෙහිද මේ නයම වේ. සැළියක හෝ මහාකළයෙක හෝ තබාද ඒ දැය අනුපසපනකු ලවා ගන්වා අනුපසපනහු අත අල්ලාගෙණ පීනීම වටියි. ඒ සැළි මහසැළි නැති කල්හි අනුපසපනකු ලවා ගන්වා ඔහු අත අල්ලාගෙණ පීනීමෙහි වරදෙක් නැත්තේය.

උපාසකයෝ ගමනට බට මහණුන්ට මාගෝපකරණ පිණිස සහල් දෙත්ද, හෙරණෝ මහණුන්ගේ සහල් ගැණීමෙන් තමන්ගේ සහල් ගන්නට අපොහොසත් වෙත්ද, මහණෝ ඒ හෙරණුන්ගේ සහල් ගණිත්ද, හෙරණහු තමන් ගත් සහල් අවසන්වූ කල්හි හෙරණුන්ගේ අතික් සහලින් කැඳ පිස සියල්ලන්ගේ පාත්‍ර පිළිවෙළින් තබා කැඳවක් කෙරෙත්ද, නුවණැති හෙරණෙක් තෙමේ තමන්ගේ පාත්‍රය ගෙණ තෙරුන්ට දේද, තෙරුන්ගේ පාත්‍රය දෙවන තෙරුන්ටදැයි මෙසේ සියලු පාත්‍රයන් පෙරළා දේද, සියල්ලන් විසින් හෙරණහු සතුවූවම අනුභව කරනලද්දේවේ. උග්ගහිතය ප්‍රත්‍යය කොට වරදට නොපැමිණෙත්මය. සන්නධිය ප්‍රත්‍යය කොට වරදට නොපැමිණෙත්. මෙහි වනාහි මවුපියන්ට තෙල් ආදියද, සෙවන පිණිස අතු ආදියද, ගෙණයන්නවුන්ගේද මොවුන්ගේද වෙනසෙක් නොදක්නා ලැබේ. එහෙයින් කාරණය පරීක්ෂා කටයුතුය. හෙරණ තෙමේ බත් පිසනු කැමැත්තේ සහල් සෝද නොසොල්වා ගල්කැට පහකරන්නට නොහැක්කේවේද, මහණහු විසින් සහල්ද බඳුනද පිළිගෙණ සහල් සෝද නොසොල්වා බඳුන උදුනට නැංවිය යුතුය. ගිනි නොදැල්විය යුතුය. පැසුණු කල්හි වහුං හැර පැසුනුබව දැනගත යුතුය. ඉදින් නොපැසුනේ වේද, පැසීම පිණිස වසා තැබීම සුදුසු නොවේ. රජස් හෝ අළු හෝ නොවැටෙනු පිණිස වසා තැබීම වටියි. පැසුණු කල්හි බෑමද වැළඳීමද වරද නොවේ. නැවැත පිළිගැණීම් කිසෙක් නැත්තේය. හෙරණ තෙමේ පිසීමෙහි දක්ෂවේ. එහෙත් මොහුට ඒ පිණිස අවකාශයෙක් නැත්තේය. කොතැනක හෝ යනු කැමැත්තේ වේ. මහණහු විසින් සහල් දිය සහිතවූ බඳුන පිළිගෙණ උදුනට නගා ගිනි දල්වා යව'යි කිය යුතුය. එයින් පසු පෙරනයින්ම සියල්ල කිරීම වටියි. මහණ තෙමේ කැඳ පිණිස පිරිසිදු බඳුන උදුනට නගා දිය නවාද වටියි. උණුවූ දියෙහි හෙරණ තෙමේ සහල් බහාද, එතැන් පටන් මහණහු විසින් ගිනි නොදැල්විය යුතුය. පැසුණු කැඳ පිළිගෙණ බීම සුදුසුවේ. හෙරණ තෙමේ කැඳ පිසාද, හස්ත සංයමය නැති මහණතෙමේ ක්‍රීඩා කරමින් බඳුන අල්වාද, පියන අල්වාද, උඩට නැගී පෙණ සිඳ හරීද, ඔහුට පමණක්ම බීම නොවටියි. දුරුපච්ණණ නම් දුක්කටය වේ. හැන්ද හෝ කිණිස්ස හෝ ගෙණ නොඔසවමින්

කළඹාද එකල්හි සියල්ලන්ටම නොවටියි. සමපාකයද දුරුප විඤ්ඤදුක්කටයද වේ. සැන්ද හෝ කිඤ්චිස්ස හෝ ඔසවාතම් උග්ගහිතකයද වේ. මහණහු විසින් පිඩු පිණිස හැසිර නැවැත පිළිගැණීම පිණිස පාත්‍රාධාරයෙහි පාත්‍රය තබනලද්දේවේද, එහි අත් ලොල් මහණෙක් ක්‍රීඩා කරමින් පාත්‍රය අල්ලාද පාත්‍ර පියන අල්ලාද, ඒ මහණහුට පමණක්ම එයින් ලද් බත නොවටියි. පාත්‍රය ඔසවා තබා නම් එය සියල්ලන්ටම නොවටියි.

අත්තකින් හෝ වැලකින් හෝ ගෙණ එහි හටගත් ඵල සොලවාද ඒ මහණහුට පමණක්ම එයින් ලද ඵලය ගැණීම නොවටියි දුරුපච්ඤඤදුක්කටයටද පැමිණේ. ගෙඩි හටගත් රුකකට වනාහි හේත්තුවීමද එහි කටුබැදීමද නොවටින්නේ නොවේ. දුරුපච්ඤඤදුක්කටය නොවේයයි **මහාපච්චරියෙහි** කියනලදී. වනයෙහි වැටී තුබූ අඹ ගෙඩි ආදිය දැක 'හෙරණක්හට දෙන්නෙමි'යි ගෙණවුත් දීමෙහි වරදෙක් නැත්තේය. සිංහයන් කා ඉතිරිවූ ඉඳුල් ආදිය දැකද හෙරණක්හට දෙන්නෙමියි පිළිගෙණ හෝ නොපිළිගෙණ හෝ ගෙණැවිත් දීමෙහි වරදෙක් නැත්තේය. ඉදින් විතර්කය පිරිසිදු කරන්නට, හෙවත් මට දෙන්නේයයි නොඋපන් සිත් ඇතිබව සලකන්නට, හෙරණක්හට දෙන්නෙමියි පිරිසිදු සිතින් මාවිසින් ගන්නාලදැයි හෝ සලකන්නට හැක්කේද, එයින් ලද මාංසය අනුභව කිරීමද වරදෙක් නොවේ. අමුමස් පිළිගැණීම ප්‍රත්‍යය කොට වදරට නොපැමිණේමය. උග්ගහිතකය ප්‍රත්‍යය කොට වරදට නොපැමිණේ. මවුපියන් පිණිස තෙල් ආදිය ගෙණ යන මහණහුට අතරමගදී රොගයෙක් හට ගණීද, ඒ තෙල් ආදියෙන් යමක් ගණු කැමැත්තේද, එය පිළිගෙණ වැළඳිය හැකිය. ඉදින් මුලදීම පිළිගන්නාලද්දේ වේද, එහි නැවැත පිළිගැණීම් කියෙක් නැත්තේය.

මවුපියන් පිණිස සහල් ගෙණවුත් දේද, ඒ මවුපියෝ එයින්ම කැඳ ආදිය සපයා දෙත් නම් පිළිගත හැකිය. සන්නිධිය ප්‍රත්‍යය කොට හෝ උග්ගහිතකය ප්‍රත්‍යය කොට හෝ වන දෙසෙක් නොවන්නේය. මහණතෙමේ බඳුන වසා දිය උණුකෙරේද, කෙළවර වනතුරු වැළඳිය හැකිය. මෙහි අළු වැටුනද පිළිගත යුතුය. දිග් අඬුවෙන් නැලිය ගෙණ මහණහු තෙල් පිසන කල්හි අලු වැටේද, අතින් නොමුදන්නහු විසින්ම පිස බාගෙණ පිළිගත යුතුය. අඟුරුද දැවද පිළිගෙණ තබනලද්දහු නම් මුල් පිළිගැණීමම ප්‍රමාණ වේ. මහණෙක් තෙමේ උක්දඬුවක් කයි. හෙරණෙක් තෙමේ 'මටත් දෙවු'යි කියයි. මෙයින් කපාගණුවයි කියනලද්දේ ගණියි. ඉතිරියෙහි නැවැත පිළිගැණීම් කිසෙක් නැත්තේය. සකුරුපිඩක් කන මහණහුටද මෙම නයවේ. කියූ තැනින් බිඳ ගත් දෙයින් ඉතිරිය

නොහළ පිළිගැණීම ඇත්තේම වේ. මහණෙක් තෙමේ සකුරු බෙදන්නේ පිළිගෙණ සමව කොටස් කෙරෙයි. මහණහුද හෙරණෝද අවුත් එක්ම ගැතීමකින්ම එක් එක් කොටස ගණිත්, හෙරණුන් විසින් ගත් කොටසින් ඉතිරි කොටස පිළිගන්නාලද්දේමවේ. ඉදින් ලොල් හෙරණෙක් ගෙණ නැවැත තබාද ඔහු විසින් ගෙණ නැවැත තුබූ ඉතිරිය නොපිළිගන්නාලද්දේම වේ. මහණෙක් තෙමේ දුම්වැටියක් පිළිගෙණ දුම් බෝද, මුඛයත් බොටුවත් රත්සිරියලින් ආලෙප කරනලද්දක් මෙන් වේද, යාවකාලිකය, අනුභකිරීම වටියි. යාවකාලිකය සමග යාවජීවික සංසග්‍රී දෙෂයෙක් නැත්තේය. පාත්‍රයක් හෝ පඩු හෝ පිසන මහණහුගේ කන්, නාසා, මුව සිදුරුවලින් දුම් ඇතුල් වේද, ව්‍යාධියක් හේතු කොට මලක් හෝ ගෙඩියක් හෝ සිඹීද, අව්‍යවහාරික බැවින් වරදෙක් නොවේ. ඔක්කාරය තල්ලට වැදී කුසතුළටම වදීද, අවිසය බැවින් වටියි. කටට පිවිසියක් අනුභව කරන මහණහුට විකාල භොජනාපත්තිය වන්නීය. දත්අතර රැඳුනු ආමිසරසය කුසතුළට ඇතුල්වේද, ඇවැත් වන්නීමය. සියුම් ආමිසයෙක් වේද, රසය නොදනේද, එය අව්‍යවහාර පක්ෂයට වැටේ. වේලාව ලංවූ කල්හි දියනැති තැනකදී බත් අනුභව කොට කාරා දෙතුන් කෙළපිඩක් හෙලා, දිය ඇති තැනකට ගොස් මුව සේදිය යුතුය. පිළිගෙණ තුබූ ඉඟුරු ආදීන්ගේ අංකුර නික්මෙත්ද, එහෙත් නැවැත පිළිගැණීම් කිසෙක් නැත්තේය. ලුනු නැති කල්හි මුහුදුදියෙන් ලුනුවලින් කරන කිස කළයුතුය.

පිළිගෙණ තුබූ ලුනුදිය, ලුනුවේද, ලුනු හෝ දියවේද, පැණි හෝ හකුරු වේද, හකුරු හෝ පැණිවේද, එහිලා මුල් පිළිගැණීමම පමණවේ. වැසිදිය හා වැටෙන හිමකැටද දිය වැනිම වේ. ප්‍රයොජනය ගන්නාහු විසින් ඉහිනි ඇටයෙන් දිය පහන් කර ගණිත්. එය අව්‍යවහාර වේ. ආමිසය සමග ගැණීම වටියි. ආමිස ගතිකවූ ගිවුළුපලාදියෙන් පහදවනලද දිය පෙරබතම වැළඳිය යුතුය. පොකුණු ආදියෙහි දිය මඩින් සන වුවද බිමෙහි වරදෙක් නැත්තේය. මුවෙහි හා අතෙහි ඇලේ නම් නොබිය යුතුය. පිළිගෙණ වැළඳිය යුතුය. කුඹුරුවල සීසෑතන්හි මඩින් සන වූ දිය ඇත්තේද පිළිගත යුතුය. ගලා ගොස් කඳුරැලි ආදියට වැද නදිය පුරා සිටීද, ඒ දිය ගැණීම වරදෙක් නොවේ. කුඹුක් රුකින් ගැවසුනු හෙබ් ආදීහු වෙත්ද, ගසින් වැටුනු මල්වලින් වැසුනු දිය ඇත්තාහුද ඒ දියෙහි මල් පැණි නොදැනේ නම් පිළිගැණීම් කිසෙක් නැත්තේය. දිය සවල්ප වේ නම් මල්පැණිත් පෙනේ නම් පිළිගත යුතුය. පවුකඳුරැලි ආදියෙහි කලුපැහැති කොළවලින් ගැවසීගත් දියෙහිද මේ නයමවේ. පැන්කළයෙහි රොන්සහිත මල් හෝ නටුසහිත කිරිඇති මල් හෝ බහනලද්දහු වෙත්ද, පළිගත යුතුය. මල් හෝ පිළිගෙණ බහාලිය යුතුය.

පළොල් සපු සත්පෙති දෑසමන් බහන ලද්දහු වෙත්ද, සුවඳ පමණක් සිටීද, එය අව්‍යවහාරික වේ. දෙවන දිනයෙහිද ආමිසය සමග ගැණීම වටියි. මහණහු විසින් තැබූ මල්සුවඳ ගැන්වූ පැතිත් හෙරණෙක් තෙමේ පැන් ගෙණ බී ඉතිරිය එහිම වක්කෙරේනම් පිළිගත යුතුය. පියුම්විල් ආදියෙහි ජලය පැතිරී සිටියේද මල් රොන් කළයෙන් ගසා පහකොට ජලය ගැණීම වටියි. කැප කරවා පිළිගෙණ තැබූ දූහැටි වේනම් ඉදින් ඒ දැහැටිරසය බොනු කැමැත්තේද, එහි මුල් පිළිගැණීමම වරද නොවේ. නොපිළිගෙණ තබනලද්ද පිළිගතයුතුය. නොදන්නාහුගේ කුසතුළට රසය පිවිසි කල්හි ඇවැත්මය. මේ ශික්ෂාපදය අචිත්තකම වේ.

ශරීරනිශ්‍රිත පෘථිවි ආදී මහාභූතයන් අතුරෙහි කුමක් වටීද, කුමක් නොවටීද, යත්: කිරි එනාහි වටියි. කැපමස් ඇති සතුන්ගේ කිරි හෝ වේවා, අකැපමස් ඇති සතුන්ගේ කිරි හෝ වේවා. එය බොන මහණහුට ඇවැත් නොවේ. කඳුලු කෙළ සොටු, මූත්‍ර මල සෙම දත්මල කබ, කඳුරු සිරුරෙහි නැගි ලුනු යන මේ සියල්ල වටියි. මොවුනතුරෙහි යමක් තුබූ තැනින් ඉගැලී පාත්‍රයෙහි හෝ අතෙහි හෝ වැටේද, එහෙත් එය පිළිගතයුතුය. සිරුරෙහි ලැගුනක් පිළිගන්නාලද්දේම වේ. උණු කිරිබත් බුදින මහණහුගේ ඩහදිය ඇඟිලි අනුසරින් එකට බැඳුනේම කිරිබතෙහි සිටීද, පිඬු පිණිස හෝ හැසිරෙන මහණහුගේ අතින් පාමුව විටට හා එයින් පාත්‍රයටත් ඩහදිය බසීද මෙහි පිළිගැණීම් කියෙක් නැත්තේය. දැවීගිය මහාභූතයන් අතුරෙහි මෙනම් දෙය නොවටීයයි ගැණීමෙක් නැත්තේය. නොමනාව දවනලද්ද නොවටියි. මොනවට දැවුනු මිනී ඇටද සුණුකොට ලේහය පිණිස එළවීම වරද නැත. කැපකරුවකු නැති කල්හි මල, මූත්‍ර, අලු යන යම් සිවුවැදෑරුම් මහාවිකටයන් තමන් විසින්ද, ගෙණ පරිභොග කිරීම වරදෙක් නොවේ. මෙහි අකීකරුවූ හෝ අසමර්ථවූ හෝ කැපකරු තෙමේ අසන්නපක්ෂයෙහිම සිටුනේය. අලු නැතිකල්හි වියලිදර දවා අලු ගත යුතුය. වියලිදර නැති කල්හි අමුදැව ගසින් කපාගෙණද කිරීම වටියි. මේ සිවුවැදෑරුම්වූද මහාවිකටය කාලඋදෙදස තම. සර්පදෂ්ටක්ෂණයෙහිම ගතයුතුය. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුත්ථානිකය. කයින්ද, කායචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන දන්තපොන ශික්ෂාපදයයි.

වර්ණිතාක්‍රමයෙන් සිවුවන භොජනවගීය නිමි

—||—

අචෙලක වර්ගීය පිළිබඳ ප්‍රථමශික්ෂාපදයෙහි- **"පරිවෙසනං"** අනුභව කරනතැනට. **"පරිබ්බාජකසමාපන්නො"** පැවිද්දකට පැමිණියේ. **"දෙති ආපත්ති පාචිත්තියස්ස"** මුවවිට දක්වා පිරිගත් කැඳපාත්‍රයක් එක් ප්‍රයොගයකින් දේද. එක් පාචිත්තියක් වේ. ප්‍රයොගය කඩ කොට දේනම් ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා ප්‍රයොග ගණනින් පාචිත්තිය වේ. පූ බත් ආදියෙහිද මේ නයමවේ. **"තිත්ථියෙ අතිත්ථියසඤ්ඤී"** මවු හෝ පියා හෝ තීර්ථකයන් අතරෙහි පැවිදි වේද, ඔවුන්ට මවුපිය හැඟීමෙන් දෙන මහණහුටද පාචිත්තියම වේ. **"දපෙති"** අනුපසම්පන්නයකු ලවා දෙවයි. **"උපනික්ඛිපිත්වා දෙති"** එබඳු බඳුනෙක තබා ඒ බඳුන ඒ තීර්ථකයන්ගේ සමීපයෙහි බිම තබා දෙයි. ඒ තීර්ථකයන්ගේ බඳුන හෝ බිම තබ්බවා එහිලා දෙයි. පාත්‍රය පාත්‍රාධාරයෙහි හෝ බිම හෝ තබා 'මේ පාත්‍රයෙන් හෝ ගණිවු'යි කීම වටියි. ඉදින් තීර්ථක තෙමේ 'මේ භොජනය මා සතුය, මා සඳහා ගෙණවුත් තබනලද්දේය. ඒ භොජනය මෙහි බහා ලවුයි කියාතම් බහාලිය යුතුය. ඔහු සතු බැවින් සියතින් දීමෙක් නම් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානිකය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන අචෙලක ශික්ෂාපදයයි.

——॥——

ද්විතීය ශික්ෂාපදයෙහි - **"පටිසක්කමනෙපි"** අසුන්හලෙහිද, **"භත්තවිස්සග්ගං"** බත් කිසට. **"න සමභාවෙසි"** නොපැමිණියේය. **"අනාචාරං"** උක්තාවශෙෂ කායවචීද්වාර ව්‍යතික්‍රමය. **"දස්සනූපචාරංවා සවණූපචාරංවා විජහන්තස්ස"** මෙහි ඉදින් සිටියේ හෝ හුන්නේ හෝ හරීද. යමෙක් යවනලද්දේද, හෙතෙමේ හරියි. ඔහුටද, ඇවතක් නම් නැත. ඔහු හරින කල්හි අත්ථිවශයෙන් අතිකා විසින් හරිනලද්දේම වේ. එහෙයින් යමෙක් යවාද ඔහුටම මේ ඇවැතවේ. ඉදින් එහි උපචාරය තුළ එක් පයක් වේද, දුක්කටය වේ. සීමාව ඉක්මීම නිමිතිකොට පාචිත්තිය වේ. මෙහිද දර්ශනොපචාරය පිළිබඳ අභ්‍යවකාශයෙහි දෙළොස් රියනක් පමණවේ. ශ්‍රවණොපචාරය පිළිබඳවද එසේය. ඉදින් අතර බිතුදෙර පවුරු ආදීහු වෙත්ද, ඔවුන් විසින් අතර කරනලද බව ඔවුන්ගෙන් වෙන්වූ බව දර්ශනොපචාරයාගේ ඉක්මීම වේ. ඒ දර්ශනොපචාරය ඉක්මීම් වසයෙන් ඇවැත දතයුතුය. **"න අඤ්ඤො කොචි පච්චයො හොති"** පෙළෙහි කියූ අයුරු ඇති අනාචාරය හැර අන් කිසි කරුණෙක් නොවේ. **"කලිසාසනං**

**ආරොපෙති"** "කලි" යනු ක්‍රොධයයි. ඔහුට අස්නක් ආරෝපණය කරයි. ක්‍රොධයාගේ අණ නගයි. ක්‍රොධවශයෙන් සිටීම් හිඳීම් ආදියෙහි දෙස් දක්වා, 'පිත්වත්ති' මොහුගේ සිටීම බලවු, හිඳීම බලවු, ඉදිරි බැලීම පසුබැලීම බලවු, කණුවක් මෙන් සිටියි. බල්ලකු මෙන් හිඳියි. වඳුරකු මෙන් එහා මෙහා බලයි. මෙසේ අමනාප වචන කියයි. 'මොහු හාද පෙළුනේ වන්නේය. යන්නේ නම් මැනැවැ'යි (යවයි) සෙස්ස ප්‍රකටයමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන්ද, වාචාචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවේදනයයි.

දෙවන උයොජන ශික්ෂාපදයයි

—\\—

තෘතීය ශික්ෂාපදයෙහි - **"සයනීඝරෙ"** නිදනගෙයි. **"යතො අයාසස හිස්කා දින්නා"** යම්හෙයකින් හික්ෂාව දෙනලද්දීද, එහෙයින් ආවහු විසින් යමක් ලැබිය යුතුද, එය ඔබවහන්සේ විසින් ලද්දේය. වඩිනුමැනව, යන අදහස්ය. **"පරියුට්ඨිතො"** රාගයෙන් මැඩුනු සිතැත්තේය. මෛථුන්දම්හි අදහස් ඇත්තේය යන අර්ථයි. **"සහොජනෙ"** ස්ත්‍රීපුරුෂ දෙදෙනකු සමගනුයි සහොජනම නම්. ඒ සහොජනයෙහි. නොහොත් "සහොජනෙ" සංභොගය ඇති. රාගයෙන් මැඩුනු සිතැති පුරුෂයාහට ස්ත්‍රිය භොග්‍යය වේ. එබඳු සිතැති ස්ත්‍රියටද පුරුෂ තෙමේ හොග්‍යය වේ. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි "ඉත්ථී චෙව හොති පුරාසො ච" යනාදිය වදරනලදය. "මහලලකෙ ඝරෙ" පුළුලින් පස්රියනට වැඩි නිදන ගෙහි. "පිට්ඨසඞ්ඝාටස්සහත්ථපාසං විජ්ජිත්වා" ඒ නිදනගෙයි ගැබෙහි යම් දෙරබාවෙක් වේද, ඒ දෙරබාවගේ අත්පස හැර ඇතුළත යහනට සමීපතැනක හිඳීය යන අර්ථයි. මෙබඳුවූද, නිදනගෙය මහාචතුස්සාලාදියෙහි වේ. **"පිට්ඨිවංසං අතික්කමිත්වා"** මෙයින් ගෙමැද ඉක්මීම දක්වයි. එහෙයින් යම් ඒ ලෙසකින් තුළ කුඩා නිදනගෙයි මැද ඉක්මීමෙහිදී. ඇවැත් දතයුතුය. මෙහි සෙස්ස ප්‍රකටමය. ප්‍රථම පාරාජිකසමුත්ථානිකය, ක්‍රියාසමුත්ථානය, සංඥවිමොක්ෂය, සචිත්තකය, ලොකවද්‍යය, කායකර්මයි. අකුශලචිත්තයි. අව්වෙදනයි.

තෙවන සහොජන ශික්ෂාපදයයි

—\\—

චතුත්ථ පඤ්චම ශික්ෂාපදයන්හි යමක් කියයුතු වන්නේද, ඒ සියල්ල අනියත දෙක්හි කියූ නයමය. සභොජන ශික්ෂාපදය යම්සේද, මෙසේ මොවුහුද, ප්‍රථමපාරාජික සමුත්ථානිකයෝමය.

—॥—

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි **"දෙථාවුසො භත්තං"** මෙහි ඒ බත එළවන ලද්දේවේ. එහෙයින් නිමන්ත්‍රණය ලද භික්ෂූහු මෙසේ කීහ. නොඑළවූ කල්හි වනාහි මෙසේ කියන්නට නොලබයි. පයුත්තවාචා වේ. **"තෙනහි භික්ඛවෙ පටිග්ගහෙත්වා නික්ඛිපථ"** මේ වනාහි භාග්‍යවතුන් වහන්සේ කුලයාගේ ශ්‍රද්ධාව රකිනු පිණිස වදළසේක. "ඉදින් බෙද ගෙණ කවු"යි වදරන්නාහු නම්, මිනිසුන්ගේ පැහැදීමෙහි වෙනස්බවෙක් වන්නේය. **"උස්සාදියිත්ථ"** පෙරළාගෙණ ගියහ. එය ගෙණ ගෙට ම ගියහයි කියන ලද්දේවේ. **"සන්තං භික්ඛුං"** මෙහි කොපමණකින් විද්‍යමාන වේද, කොපමණකින් අවිද්‍යමාන වේද, යත්ඃ වෙහෙරතුළ යම් තැනක සිටියනුට කුලයන් පයිරුපාසනයෙහි හිතක් උපන්නේද, එතැන් පටන් පසෙක හෝ ඉදිරිපිට හෝ යමකු දකීද, යමක්හට දෙළොස් රියන්තුළ සිටියහුට අසන්නට හැකිවූ ප්‍රකෘතිවචනයෙන් ආරොචනය කරන්නාට හැකිවේද, මෙතෙමේ විද්‍යමාන නම්වේ. එහා මෙහාද සොයා ආරොචනකෘත්‍යයක් නම් නැත්තේය. යමෙක් තෙමේ සෙවිය යුත්තේද, හෙතෙමේ අවිද්‍යමාන නම්වේඃ තවද, උපචාරසීමාව තුල මහණකු දැක විචාරන්නෙමියි ගොස් එහිදී යමකු දකීද, හෙතෙමේ "අහං ඉත්ථන්නාමස්ස ඝරං ගච්ඡාමි"යි හෝ "චාරිත්තං ආපජ්ජාමි"යි හෝ මෙබඳු වචනයෙන් විචාළ යුතුය. ඉදින් නොදකී නම් අවිද්‍යමාන මහණකු නොවිචාරා පිවිසියේ නම්වේ. **"අඤ්ඤතරාරාමං"** ඇතුළු ගමෙහි විහාරයෙක් වේද, ඒ විහාරයට යයි. **"භත්තියඝරං"** නිමන්තනලද්දවුන්ගේ ගෙයක් හෝ ලහබත් ආදිය දෙන්නවුන්ගේ ගෙයක් හෝ. **"ආපදාසු"** ජීවිතයට බ්‍රහ්මචර්‍ය්‍යයට අනතුරක් ඇති කල්හි විද්‍යමාන වූද, මහණකු නොවිචාරා යෑම වටියි. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨිනසමුත්ථානිකය. කයවචනයෙන්ද, කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාක්‍රියසමුත්ථානය, නොසංඥවිමොක්ෂය, අචිත්තකය, ප්‍රඥප්තිවද්‍යය, කායකර්මයි, වාක්කර්මයි, ත්‍රිචිත්තයි, ත්‍රිවෙදනයි.

සවන චාරිත්තශික්ෂාපදයයි.

—॥—

සප්තම ශික්ෂාපදයෙහි - **මහානාම** තෙමේ භාග්‍යවතුන්වහන්සේගේ සුලුපියපුත්‍ය. මසකින් වැඩිමහල්ය. ඵල දෙකෙක පිහිට ලැබූ ආය්‍ර්‍යශ්‍රාවකයෙක්ය. "**භෙසජ්ජං උස්සන්නං හොති**" ගාලෙන් ගෙණ වුත් තැබූ ගිතෙල් බොහෝ වේ. "**සාදිතබ්බා**" ඒ කාලයෙහි රෝගයෙක් නැතැයි ප්‍රතික්‍ෂෙප නොකටයුතුය. රෝගයක් ඇති කල්හි දන්වන්නෙමි'යි ඉවසිය යුතුය. "**එකකෙහි භෙසජ්ජෙහි පවාරෙමි**" නම්වසයෙන් ගිතෙල් තෙල් ආදීන් අතුරෙහි දෙකකින් හෝ තුනකින් හෝ පමණ විසින් පතකින් හෝ නැළියකින් හෝ ලාස්සකින් හෝය. "අඤ්ඤං භෙසජ්ජං විඤ්ඤාපෙති" සූත්‍රයෙන් පවරනලදුයේ තෙල්ය. ලාස්සකින් පවරන ලදුයේ ද්‍රෝණයෙකැයි මෙසේ පිනවන මහණහුට ඇවැත් වේයයි දන්නේය. "**න භෙසජ්ජෙන කරණීයෙ**" මුසුබතිනුත් යැපෙන්නට හැක්කේද, එය බෙහෙතින් කළ යුත්තෙක් නම් නොවේ. "**පවාරිතානං**" යම් කෙනෙක් තුමූ තමන්ට පෞද්ගලික පවාරණයෙන් පවරන ලද්දාහුද, ඔවුන්ට පැවරූ දැයට අනුරූපවසයෙන් පිනවීම හේතුකොට ඇවැත් නොවේ. සඞ්ඝයාගේ වසයෙන් පැවරූකල්හි පමණ සැලකිය යුත්තේමය. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය, ක්‍රියාසමුත්ථානය, නොසංඥවිමොක්‍ෂය, අචිත්තකය, ප්‍රඥප්තිවද්‍යය, කායකර්මයි, වාක්කර්මයි, ත්‍රිචිත්තයි, ත්‍රිවෙදනයි.

සත්වන මහානාම ශික්ෂාපදයයි

—॥—

අෂ්ටම ශික්ෂාපදයෙහි - "**අබ්භුය්‍යාතො**" ඉදිරියට ගියේය. පරසෙනගට මූණදී යන්නෙමි'යි නුවරින් නික්ම ගියේය, යන අර්ථයි. "**උය්‍යුත්තං**" යුද පිණිස කළ නික්මීම් ඇත්තාවූ. ගමින් නික්මුනාවූ, යන අර්ථයි. "**ද්වාදසපුරිසො හත්ථි**" ඇතුපිට නගින්නාවූ සිවු දෙනෙක. එක් එක් රකින්නෝ දෙදෙනෙක, දෙදෙනෙකැයි මෙසේ පුරුෂයන් දෙළොසක් ඇත්තේය. "**තිපුරිසො අස්සො**" අසුපිට නැගෙන එකෙක පා රකින්නෝ දෙදෙනෙකැයි මෙසේ පුරුෂයන් තිදෙනෙක් ඇත. "**චතුපුරිසො රථො**" එක් රියසරියෙක එක් යොධයෙක. ඇණි රකින්නාවූ දෙදෙනෙකැයි පුරුෂයන් සිවුදෙනෙක් ඇත. "**චත්තාරො පුරිසා සරහත්ථා**" ආවුධ ගත් අත් ඇත්තාවූ පුරුෂයන් සිවුදෙනෙකැයි මේ පැසුළු කෙළවරින් සිවුරඟ සෙනෙගින් යුත් සෙනාව නම්වේ. මෙබඳු සෙනගක් දකිනු පිණිස යන මහණහුට පියෙහි පියෙහි දුක්කටය වේ. "**දස්සනූපචාරං විජහිත්වා**" කිසිවකින් අතර කරනලද්දී හෝ වළකට

බැස සිටියා හෝ නොදක්නාලැබේ. මෙහි සිට දකින්නට නොහැකියයි අන් තැනකට ගොස් බලන මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය යන අර්ථයි. ඇත් ආදීවූ සිවුරඟ අතුරෙහි එකක් එකක්යි යටත් පිරිසයින් එක් පුරුෂයකු නැඟි ඇතකු හෝ ඊ ගත් අත් ඇති එක් පුරුෂයකු හෝ "**අනුයුත්තා**" නම්, රජතෙමේ උයනට හෝ යේද, මෙසේ ඇති කල්හි අනුයුක්ත හෙවත් යුද පිණිස ගමින් නික්මුනේ වේ. "**ආපදසු**" ජීවිතයට හෝ බ්‍රහ්මචර්‍ය්‍යයට හෝ අනතුරක් ඇති කල්හි මෙහි ගියේ මිදෙන්නෙමියි යන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනය.

අටවන උය්‍යුත්තසෙනා ශික්ෂාපදයයි.

——\\——

නවම ශික්ෂාපදයෙහි- "**අත්ථඞ්ගතෙ සුරියෙ සෙනාය වසති**" හිරු අස්තයට ගියකල්හි සෙනාසන්නිවෙස ස්ථානයෙහි වසයි. මෙහි සිටීවා, හෝ හිඳීවා, හෝ නිදවා, හෝ ඉදිනුදු අහසෙහි සෘද්ධියෙන් කිසි ඊර්‍ය්‍යාපථයක් කෙරේනම් පාචිත්තියම වේ. "**සෙනාය වා පටිසෙනා රුද්ධා හොති**" සංවරණය යම්සේ සිදීයේද, එසේ අවුරන ලද්දීවේ. "**පළිබුද්ධො**" වෛරියකු විසින් හෝ අධිපතියකු විසින් හෝ වළකනලද්දේ වේ. සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන සෙනාවාසශික්ෂාපදයයි

——\\——

දසමශික්ෂාපදයෙහි - උඩට නැග නැග මෙහිලා යුද්ධ කෙරෙත්යි "**උය්‍යොධික**" නම්වේ. යුදකරන තැනට මේ නමෙකි. මෙහිලා සෙනාවගේ ගණන දනිත්තුයි ඒ ගණිත තැන "**බලග්ග**" නම්වේ. සෙනාව ගණිනතැනය යන අර්ථයි. රථාකාරයෙන් ශකටාකාරයෙන් පදමාකාරයෙන් යනාදි ආකාරයන්ගෙන් සෙනාවගේ සිටීම "**සෙනාබ්‍යූහ**" නම්, සෙනාසිටවන තැනට මේ නමෙකි. "**තයො හත්ථී පච්ඡිමං හත්ථානීකං**" පෙර කියූ පුරුෂයන් දෙළොස් දෙනකු ඇති යම් ඇතෙක් වේද, ඒ ඇතු උපලක්ෂණ කොට ඇත්තු තිදෙනෙක. සෙසු

තන්හිද මෙම නයවේ. සමුට්ඨානාදීන් සමග සෙස් උය්‍යුත්තසෙනාශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුත්තේය.

දසවන උය්‍යොධික ශික්ෂාපදයයි

වර්ණනාක්‍රමයෙන් පස්වන අචෙලකවර්ගීය නිමි

——||——

සුරාපානවර්ගීය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි- "**භද්දවතිකා**" යනු එක් ගමෙක් වේ. ඒ ගම යහපත් වැටකින් යුක්තබැවින් මේ නම ලැබීය. "**පඨාවිනො**" මාර්ගිකයෝ. "**තෙජසා තෙජං**" තමන්ගේ තෙජසින්. ආනුභාවයෙන්. නාගයාගේ තෙජස. "**කාපොතිකා**" පරවිපා සමාන රතු පැහැ ඇති. "**පසන්නා**" යනු සුරාමණ්ඩයට මේ නමෙකි. "**අනනුච්ඡවියං භික්ඛවෙ සාගතස්ස**" ස්මෘතිමත්වූ පසැවාහිඟු ඇත්තහුට මද්‍යපානය නම් නොහොබනේයයි වදරන ලද්දේය. "**පුප්ඵාසව**" නම් මීමල් ආදීන්ගේ මල් රසයෙන් කරන ලද්දේය. "**ඵලාසව**" නම් මුද්‍රිකඵලාදිය මැඩගෙණ ඔවුන්ගේ රසයෙන් කරනලද්දේය. "**මධ්වාස**" නම් මිදිවල ජාතිරසයෙන් කරනලද්දේය. මැස්සන් බැඳි මීයෙන්ද කෙරේයයි කියත්. "**ගුළාසව**" නම් උක්පැණි ආදියෙන් කරනුලැබේ. "**සුරා**" නම් පිටි හා රාබිජු බහාලනලද්දීවේ. නෙරළු ආදීන්ගේ රසයෙන් කරනලද්දීද, සුරාමැයි පිළිගනී. රාබිජු බැහූ ඒ සුරාවගේ මණ්ඩය ගත් කල්හි මෙර මැයි යන ගිණීමට යේයයි කියත්. "අන්තමසො කුසග්ගෙනපි පිවති" මේ සුරා හෝ මෙරය හෝ, ද්‍රව්‍ය පිළියෙල කොට සැළියෙහි බහාලූ තැන් පටන්ද තල්, පොල් ආදීන්ගේ මල් පැණි, මලින් ගිලිහුණු තැන් පටන්ද, තණ අගකින් නමුත් බොන මහණහුටද පාචිත්තිය වේය යන අර්ථයි. එක් ප්‍රයොගයකින් බොහෝ බොන මහණහුට එක්ම ඇවැතක් වේ. කඩ කඩ කොට බොන මහණහුට ප්‍රයොග ගණනින් ඇවැත් වේ. "**අමජ්ජඤ්ච හොති මජ්ජවණ්ණං මජ්ජගන්ධං මජ්ජරසං**" අරළු, නෙල්ලි ආදිය එක්කොට කළ ලවණකාසියක් හෝ නොයෙක් ද්‍රව්‍යයන් එක් කොට එනම් බෙහෙතක් හෝ වේද, (ඒ ලොණසොවීරාදිය බොන මහණහුට අනාපත්තියි දන්නේය) "සූපසම්පාදකෙ සුවඳ ගන්වනු පිණිස මද්‍යය ස්වල්පයක් බහා සූප පිසත්, ඒ සූපාදිය අනුභව කිරීම නිමිති කොට ඇවැත් නොවේ. මාංසසම්පාකයෙහිද මේ නයමවේ. තෙල් වනාහි වාතබෙහෙත් පිණිසද මද්‍යය සමග පිසත්. එහිද ඉතා මදක්ලූ මද්‍යය ඇත්තේම ඇවැත් නොවේ. යමක් වනාහි වැඩි කොට බැහූ මද්‍යය ඇත්තේවේද, යමෙක මද්‍යයෙහි පැහැය ගඳ රස දක්නා ලැබේද, එහි ඇවැත්වේමය. "**අමජ්ජං අරිට්ඨං**" ඵලාරිෂ්ට

දන්තාරිෂ්ටාදීවූ යම් අරිෂ්ටයක් මද්‍යයක් නොවේද, එහි ඇවැත්නොවේ. තෙල්ලි ආදීන්ගේ රසයෙන් අරිෂ්ට කෙරෙත්ද, ඒ අරිෂ්ටය මද්‍යවර්ණගන්ධරස ඇත්තේම වේ. මද්‍යයද නොවේ. ඒ සඳහා මෙය කියනලදී. යම් රසයක් වනාහි ද්‍රව්‍ය බහාලනලද්දේ වේද, ඒ රසය මද්‍යය වේද, බීජය පටන් නොවටියි. මෙහි සෙස්ස ප්‍රකටමය. එළක ලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි. මෙහි වස්තු නොදන්නා බැවින් අචිත්තකබව දතයුතුය. අකුශල චිත්තයෙන් යුක්තවම වියයුතු බැවින් ලොකවද්‍යභාවය වේ.

පළමුවන සුරාපාන ශික්ෂාපදයයි

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි - "**අඞ්ගුලිපතොදකෙ**" ඇඟිලිවලින් කිතිලි ආදිය ගැටීම කියනු ලැබේ. "**උත්තසන්තො**" සිතහයෙන් කලාන්තවෙමින් "**අනස්සාසකො**" සිදීගිය ආශ්වාස ප්‍රශ්වාස සංචාරය ඇත්තෙක්ව "**අනුපසම්පන්නං කායෙන කායං**" මෙහි මෙහෙණද අනුපසම්පන්න ස්ථානයෙහි සිටියා. ඒ මෙහෙණද ක්‍රීඩාධ්‍යාසයෙන් ස්පර්ශකරන මහණහුට දුක්කටය වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජික සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ද්විවෙදනයි.

දෙවන අඞ්ගුලිපතොදකශික්ෂාපදයයි

—||—

තෘතීයශික්ෂාපදයෙහි - "**අප්පඤ්ඤත්තෙසු ධුනො**" භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් කරනලද්දේද, පනවනලද්දේද, එය නොදනිත්ය. යන අර්ථයි. "**උදකෙ හස්සධම්මෙ**" දියකෙළිය කියනු ලැබේ. "**උපරිගොප්ඵකෙ**" ගොප්ඇට පිළිබඳ මතුකොටස් පමණෙහි. "**හස්සාධිප්පායො**" ක්‍රීඩාධ්‍යාසය ඇත්තේ. "**නිමුජ්ජති වා**" යනාදිතන්හි ගිලීම පිණිස දියට බසින්නහුට පියවරක් පියවරක් පාසා දුක්කටය වේ. ගොප්ඇටින් මතුභාගප්‍රමාණ ජලයෙහි කෙළීමෙහි අදහස් ඇතිව ගිලීම් ඉපිලීම්හි ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය වේ. දියෙහි ගිලී දියතුළම යන මහණහුට හස්තවාර පදවාරයන්හි සියලු තන්හි පාචිත්තිය වේ. "**පිලවති**" පීනයි අත්වලින් පීනන්නහු අත්වරෙක්හි අත්වරෙක්හි පාචිත්තිය වේ. පා වාරයන්හිද මේනයම වේ.

යම් යම් අවයවයකින් පීනාද, ඒ ඒ අවයවයාගේ ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය වේ. ඉවුරෙන් හෝ රුකකින් හෝ දියට පනීද, පාචිත්තියම වේ. **"නාවාය කීළති"** පලුපත් රිටි ආදියෙන් නැව පදිමින් හෝ ඉවුරට නගමින් හෝ නැවෙහි ක්‍රීඩා කෙරේද, දුක්කටය වේ. **"හත්ථෙන වා"** යනාදිතන්හිද ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා දුක්කටය වේ. අභයගිරිවාසීහු අතින් දියෙහි දැමූ කැබලිත්තක පතනොප්පතනවාරයන්හි දුක්කටය කියත්. එය නොගතයුතුය. එහි වනාහි එක් ප්‍රයොගය බැවින් එක්ම දුක්කටය වේ. තවද ගොප් ඇටින් මතුවෙහි කියූ ඉපිලීම් ආදිය හැර යම්කිසි අන් අයුරකින් දියට බැස හෝ නොබැස හෝ යම් තැනක තුබූ දියක් යටත් පිරිසයින් බින්දුවක් ගෙණ හෙළන ක්‍රීඩා වෙත්ද ක්‍රීඩා කරන මහණහුට දුක්කටයම වේ. අර්ථප්‍රකාශ කරන අකුරුලිවීම වටියි. මේ මෙහි විනිශ්චයයි. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජික සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥා විමොක්ෂය සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන හස්සධම්මශික්ෂාපදයයි

—||—

චතුර්ථශික්ෂාපදයෙහි - **"කථායං නස්සෙය්‍ය"** මේ ධර්මය මේ තන්තිය මේ ප්‍රවේණිය කෙසේ නැසෙන්නේද, **"තං වා න සික්ඛිතුකාමො"** යමකු විසින් පනවනලද ශික්ෂාපදයෙන් කියනුලැබේද, ඒ පැනවූ ශික්ෂාපදයෙහි නොහික්මෙනු කැමැත්තේ. **"අපසාදෙතෙන"** සූත්‍රයෙහි හෝ අභිධර්මයෙහි හෝ ආ කරුණකින් **"එවං අම්හාකං ආචරියානං උග්ගහො"** මෙහි ගැරහිය යුතු ආචාර්යයන්ගේ උද්ග්‍රහණය නොගත යුතුය. ප්‍රවේණියෙන් පැමිණි, ආචාර්යයන්ගේ උද්ග්‍රහණයම ගතයුතුය. **කුරුන්දියෙහි** වනාහි ලොකවද්‍යශික්ෂාපදයෙහි ආචාර්යවාදය නොවටනේය. ප්‍රඥප්තිවද්‍ය ශික්ෂාපදයෙහි වනාහි වටීයයි කියනලදී. **මහාපච්චරියෙහි** සූත්‍රය සූත්‍රානුලොම සඞ්ඛ්‍යාත අර්ථකථාව උගන්නාවූම ඇදුරන්ගේ උද්ග්‍රහණය ප්‍රමාණය, නොදන්නාවුන්ගේ කථා පමණ නොවේයයි කියනලදී. ඒ සියල්ල ප්‍රවේණියෙන් පැමිණියේ සමොධානයට යන්නේය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. කායචිත්තයෙන්ද, වාචාචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද, හටගණියි. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සිවුවන අනාදරිය ශික්ෂාපදයයි.

—||—

පඤ්චමශික්ෂාපදයෙහි - රූප්‍රහාරාදීහු මනුෂ්‍යවිග්‍රහයෙහි කියූ නයින්ම දතයුත්තාහ. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු අනාදරිය ශික්ෂාපදය හා සමානයෝමය.

පස්වන හිංසාපනශික්ෂාපදයයි

—||—

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - **"භග්ගා"** යනු දනව්වට නමෙකි. **"සුංසුමාර ගිරං"** යනු නුවරට නමෙකි. **'භෙසකලාවනං'** ඒ නුවර ඇසුරු කළ වනයට නමෙකි. ඒ වනය වනාහි මෘගයන්ගේ පහසුවිහරණය පිණිස හුන් බැවින් මිගදයයි කියනුලැබේ. **'සමාදහිත්වා'** ගිනි දල්වා **'පරිපාතෙසි'** ලුහුබැන්දේය. **'සයං සමාදහති'** මෙහි නොගිලන්ව එබඳු වැඩක් නැතිව ගිනි දල්වනු කැමැති බැවින් ගිනිගානා දණ්ඩ තැබීම පටන් යම්තාක් ගිනිදැල් නොනගීද, ඒතාක් සියලු ප්‍රයොගයන්හි දුක්කටයවේ. **'පදීපෙපි'** පහන් දැල්වීමෙහි **'ජොතිකෙපි'** පා පිසීම් ඩහගැන්වීම් කර්මාදියෙහි ගිනි දැල්වීමෙහි **'තථාරූපප්පච්චයා'** පහන් දැල්වීම් ආදි ප්‍රත්‍යයයෙන් **'පටිලාතං උක්ඛිපති'** දැවෙන පෙනෙහෙල්ල කබලෙන් පිටත වැටෙන්න ඔසොවා තබයි. නැවැත තැබුනු තැන තබාය යන අර්ථයි. මෙසේ නොදැවුනු ගිනිපෙනෙල්ලක් ඔසොවා ගිනි කබලෙහි බහාලන මහණහුට දුක්කටය වේ. දැවුනු පෙනෙල්ලක් නැවැත දල්වන මහණහුට පාචිත්තියම වේ. **'තථාරූපප්පච්චයා'** පහන් ආදිය හැර අන්‍යවූද එබඳු කරුණකින් ගිනි දල්වන මහණහුට ඇවැත්නොවේ. **'ආපදාසු'** දුෂ්ටව්‍යාලමෘග අමනුෂ්‍යයන් විසින් කරනලද උපද්‍රවයෙක් වේද, එහි ගිනි දල්වන මහණහුට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ෂට් සමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

සවන ජොතිශික්ෂාපදයයි.

—||—

සප්තම ශික්ෂාපදයෙහි - **'චුණ්ණෙන වා මත්තිකාය වා'** මෙහි අනුදත් කාලය හැර සෙසු කාලයෙහි නෑම පිණිස සුණු හා මැටි රැස්කරන කාලය පටන් සියලු ප්‍රයොගයන්හි දුක්කටය වේ. **'පාරං ගච්ඡන්තො නහායති'** මෙහි වියලීගිය ගඟෙහි වැලි නගා කළ ආවාටයන්හිද නෑම වටියි. **'ආපදාසු'** භ්‍රමරාදීන් විසින් ලුහුබඳින ලද්දහුට

දියෙහි ගිලීම වරද නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය.එළකලොම සමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සත්වන නහාන ශික්ෂාපදයයි.

—\\—

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'නවං පන භික්ඛුනා චීවරලාභෙන'** මෙහි ලැබුයේයි ලභ නම. ලභම ලාභ නම්වේ. කුමක් ලැබුයේද, යත්: සිවුරෙකි. කෙබඳු සිවුරක්ද, යත්:- අලුත් සිවුරෙකි. මෙසේ 'නවං චීවරං ලාභෙන'යි කියයුත්තෙහි නිගගහීතය ලොප් කොට 'නවං චීවරලාභෙන'යි කියනලදී. 'පිළිලද අලුත් සිවුරු ඇත්තහු විසින්' යන අර්ථයි. මැද සිටි පද දෙකෙහි 'පන' යනු නිපාතයෙකි. **"භික්ඛුනා"** යමකු විසින් ලද්දේද, ඔහු දැක්වීමය. පදභාජනයෙහි වනාහි පදව්‍යඤ්ජන නොගෙණ යමක් ලද්දේද, ඒ දක්වනු පිණිස **'චීවරං නාම ඡන්නං චීවරානං'** වදරන ලදී: 'චීවරං' යන මෙහි යමක් හඳින්නට හෝ පොරවන්නට හෝ හැකිවේද, ඒම චීවරයි දතයුතුය. එහෙයින්ම 'විකප්පනුපගං පච්ඡිමං'යි නොවදරනලදී. 'කංසනීලං' සම්කරු නිල. **මහාපච්චරියෙහි** වනාහි යමල-ලොහොමල මේ කංසනීලැයි කියනලදී. 'පලාසනීලං' යම් කිසි නිල්පැහැති පත්‍රුසයෙකි. **'දුබ්බණ්ණකරණං ආදතබ්බං'** මෙය කප්බිඳු තැබීම සඳහා කියනලදී. නිල්පැහැ ආදියෙන් සියලු සිවුර දුර්වර්ණකිරීම නොවේ. කප්බිඳු තබන්නහු විසින් සිවුර රඳන් කොට සිවු කොන්හි හෝ තුන් කොණෙක හෝ දෙකොණෙක හෝ එක් කොණෙක හෝ මොනරකුගේ ඇස්මඩල පමණට හෝ මකුණු පිටක් පමණම හෝ ඒ තැබිය යුතුය. **මහාපච්චරියෙහි** මැඩිල්ලෙහි හෝ ගණ්ඨියෙහි හෝ කප්බිඳු තැබීම නොසුදුසුයයි කියනලදී. **මහාඅට්ඨකථාවෙහි** වනාහි ඒ වටීමයි කියනලදී. මුතුවැල වැනි කප්බිඳු පෙළක් හෝ කර්ණිකාකාරවූ කප්බිඳු හෝ දීම් ආදිය සියලු තන්හි වළක්වන ලදී. එහෙයින් එක්වට බිඳුවක් හැර අන් කිසි විකාරයකින් කප්බිඳු නොතැබිය යුතුය. **'අග්ගලෙ'** යනාදි තන්හි අලුත් රෙදි කැබලිලා මැසීම් ආදිය කප්බිඳු තැබූ සිවුරෙහි පසුව නගා කප්බිඳු තැබීමක් නැත්තේය. සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුට්ඨානිකය. ක්‍රියාක්‍රියසමුට්ඨානය නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අටවන දුබ්බණ්ණකරණ ශික්ෂාපදයයි

—\\—

නවම ශික්ෂාපදයෙහි - **'තස්ස වා අදින්නං'** ඒ සිවුරු හිමියාහට පරිභොග කරව'යි හෝ අත්හරුව'යි හෝ කැමැති පරිදි කරව'යි හෝ මෙසේ කියා නොදෙනලද්දය. **'තස්ස වා අවිස්සසන්තො'** යමකු විසින් විනයකම් කරනලද්දේද, ඔහුගේ අවිශ්වාසයෙන් හෝ, ඔහු විසින් දෙන ලද්දක් හෝ ඔහුගේ විශ්වාසයෙන් හෝ පරිභොග කරන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස තිංසකවණ්ණනාවෙහි කියූ නය ඇති බැවින් ප්‍රකටමය. කඨින සමුට්ඨානය. කායවාචායෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාක්‍රිය සමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන විකප්පන ශික්ෂාපදයයි

——\\——

දශමශික්ෂාපදයෙහි - **'අපනිධෙන්ති'** පහකොට සඟවා තබත්. **'හස්සාපෙක්ඛො'** සිනාසෙන අදහස් ඇතිව. **'අඤ්ඤං පරික්ඛාරං'** පෙළෙහි නො ආ පාත්‍ර පසුම්බි ආදියය. **'ධම්මකථං කථෙත්වා'** මහණහු විසින් නම් රැස්කොට තැබූ පිරිකර ඇත්තහු වීම නොවටියයි මෙසේ ධර්මකථා කියා දෙන්නෙමියි තබන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන චීවරාපනිධාන ශික්ෂාපදයයි.

වර්ණනාක්‍රමයෙන් සවන සුරාපානවර්ගය නිමි.

——\\——

සප්‍රාණකවර්ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'ඉස්සාසො හොති,'** ගිහිකාලයෙහි ධනුශිල්පයෙහි දක්ෂ ආචාර්ය වූයේය. **'ජීවිතා වොරොපිතා'** ජීවිතයෙන් තොරකරන ලද්දහු, ශික්ෂාපදයෙහිද, **'වොරොපෙය්‍ය'** තොරකරන්නේය. යම්හෙයකින් මෙය ව්‍යවහාර මාත්‍රයෙක්ම වේද, එහෙයිනි. මෙහි ශීර්ෂාභරණ වෙන් කළ කල්හි හිස මෙන් ප්‍රාණියකු ජීවිතයෙන් තොර කළ කල්හි ජීවිතය නම් වෙන්ව නොසිටියි. ඒකාන්තයෙන් අතුරුදහන් වීමටම යයි. එහෙයින් ඒ අර්ථය දක්වනු පිණිස පදභාජනයෙහි **'ජීවිතින්ද්‍රියං උපච්ඡින්දති'** යනාදිය වදරනලදී. මේ ශික්ෂාපදයෙහි තිරිසන් තැනැත්තේම **'පාණ'**යි දතයුතුය. ඒ ප්‍රාණීතෙමේ කුඩාවූයේද, මහත්වූයේද, මරණ මහණහුට වන ඇවතෙහි වෙනසෙක් නැත්තේය. මහත්වූ ප්‍රාණීහු කෙරෙහි යොදන උපක්‍රමය මහත් බැවින් අකුසලයෙහි මහත්බව වේ. 'පාණෙ

පාණසඤ්ඤී' යටත් පිරිසයින් අඳපුටු පිරිසිදු කරනුයේ මකුණු බිජුවටෙක නමුදු ප්‍රාණිය යන හැඟීම් ඇතිව කරුණ රහිත බැවින් එය බිඳිමින් පහ කෙරේද, පාචිත්තිය වේ. එහෙයින් මෙබඳු තන්හි කරුණාව උපදවා අප්‍රමත්ත වූවහු විසින් වත් කටයුතුය. සෙස්ස සමුට්ඨානාදිය සමග මනුෂ්‍යවිග්‍රහයෙහි කියූ නයින්ම දතයුතුය.

පළමුවන සඤ්චිච්චපාණ ශික්ෂාපදයයි.

—॥—

ද්විතීයශික්ෂාපදයෙහි - '**සප්පාණකං**' යම් ප්‍රාණිකෙනෙක් පැන් පරිභොගය කරණ කොට මියෙද්ද, ඒ ප්‍රාණීන් කරණකොට සප්‍රාණක වේ. එබඳු ජලය දැන ගනිමින් පරිභොග කරන මහණහුට ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය වේ. පාත්‍රයක් පුරාද නොසිඳ, එක්ම ප්‍රයොගයෙන් බොන මහණහුට එක් ඇවැතක් වේ. එබඳු දියෙන් ආමිස සහිත පාත්‍රයක් කරකවා සෝදන මහණහුටද, එබඳු දියෙහිලා උණුකැඳ පාත්‍රයක් නිවන මහණහුටද, පණුවන් සහිත ඒ දිය අතින් හෝ කෙණිස්සෙන් හෝ ගෙණ නාන මහණහුටද, ප්‍රයොගයක් ප්‍රයොගයක් පාසා පාචිත්තිය වේ. ගල් පොකුණකට හෝ පොකුණකට හෝ පිවිස පිටතට නික්මෙන පිණිස රැල නංවන මහණහුටද, ගල් පොකුණක් හෝ පොකුණක් හෝ පිරිසිදු කරන්නවුන් විසින් ඒ පොකුණෙන් නගාගත් දිය දියෙහිම ඉසිය යුතුය. ළඟ දියක් නැති කල්හි කැපදියට අටක් හෝ දසයක් හෝ පැන්කළ දිය පිහිටා සිටි තැනක වක්කර, එහි වක්කරයුතුය. පෙරළී දියෙහි වැටෙන්නේයයි රත්වූ ගලෙහි දිය නොවක්කර යුතුය. කැපදියෙන් ගලනිවා වැක් කිරීම වරද නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි. මෙහිද පළහැටි පණුවන්ගේ වැටීම දැනද පිරිසිදු සිත් ඇති බැවින් පාන් දැල්වීමෙහි මෙන් පණුවන් සහිතබව දැනද උදකසංඥාවෙන් පරිභොග කටයුතු බැවින් ප්‍රඥප්තිවද්‍යභාවය දතයුතුය.

දෙවන සප්පාණක ශික්ෂාපදයයි.

—॥—

තෘතීය ශික්ෂාපදයෙහි - '**උක්කොටෙන්ති**' ඒ ඒ මහණහුගේ සමීපයට ගොස් 'කර්මය නොකරනලදැ'යි යනාදිය කියමින් මතුකොට, උගුලුවන පිහිටා තුබු පරිදි පිහිටා සිටීමට නොදෙත්. '**යථා ධම්මං**' යම් අධිකරණයක්

සංසිඳීම පිණිස යම් ධර්මයක් වදරන ලද්දේද, එම ධර්මයෙන් යන අර්ථයි. **'නිහතාධිකරණං'** සංහිඳුවනලද අධිකරණය ශාස්තෲන් වහන්සේ විසින් වදාළ ධර්මයෙන්ම සංසිඳුවනලද අධිකරණය යන අර්ථයි. **'ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී'** යම් කර්මයකින් ඒ අධිකරණය සංසිඳුවන ලද්දේද, එය ධර්මකර්මය වේනම්, ඒ ධර්මකර්මයෙහි මෙතෙමේද, ධර්මකර්මසංඥ ඇතිව සංසිඳුවා සිටියේ ඉදින් නැවැත උගුල්වා නම් පාචිත්තියට පැමිණේය යන අර්ථයි. මේ නයින් සෙසු පදයෝද, දතයුත්තාහුය. මේ මෙහි සංක්ෂෙපය වේ. විස්තරය වනාහි **'ඉමෙසං පන චතුන්නං අධිකරණානං කති උක්කොටනා'** යනාදි නයින් පරිවාරයෙහි කියනලද්දේය. අර්ථකථාවන්හි ඒ සියල්ල ගෙණහැර දක්වා ඒ උක්කොටනයාගේම අර්ථය වර්ණනා කරනලද්දේය. අපි වනාහි ඒ උක්කොටනයාගේම අර්ථය වර්ණනා කරනලද්දේය. අපි වනාහි ඒ උක්කොටනය ඒ පරිවාරයෙහිම වර්ණනා කරන්නෙමු. මෙතැන්හි ගෙණහැර දක්වා වර්ණනා කරතු ලබනකල්හි ඉතා තදින් මුළාබව වන්නේයයි වර්ණනා නොකෙළෙමු. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

තෙවන උක්කොටන ශික්ෂාපදයයි.

——॥——

චතුර්ථ ශික්ෂාපදයෙහි - **'දුට්ඨුල්ලා නාම ආපත්ති'** සතර පාරාජිකා අර්ථොද්ධාරවශයෙන් දක්වන ලදී. සඞ්ඝාදිසෙසාපත්තිය මෙහි අදහස් කරනලදී. ඒ සඞ්ඝාදිසෙසාපත්තිය වසාලන මහණහුට පාචිත්තිය වේ. **'ධුරං නික්ඛිත්තමත්තෙ'** බලාපොරොත්තුව අත්හළ ඇසිල්ලෙහි. ඉදින් සඞ්ඝාදිසෙසය නොකියම්'යි ධුරය නික්ෂෙප කොට පසුව ආරොචනය කෙරේද, නොරකියි. අත්හළ ඇසිල්ලෙහිම පාචිත්තියයි කියනලද්දේවේ. මෙසේ බලාපොරොත්තුව අත්හැර වසාලනු පිණිසම අතිකක්හට ආරොචනය කෙරේනම් හෙතෙමේද, අතිකක්හටැයි මේ උපායයෙන් මහණුන් සියයක්, මහණුන් දහසක් යි යම්තාක් කෙළවර නොසිද්දේද, ඒ තාක් ඇවැතට පැමිණේමය. 'කවර කලෙක කෙළවර සිද්දේද, යත්:- මහාසුමමස්ථවිර තෙමේ වනාහි 'ඇවැතට පැමිණියේ කිසිවක්හට නො කියවයි එක් මහණක්හට ආරොචනය කරයි. හෙතෙමේ නැවතී ඇවැතට පැමිණි ඔහුටම ආරොචනය කරයි. එසේ ඇති කල්හි කෙළවර සිදේයයි කියයි. **මහාපදුම ස්ථවිර** තෙමේ 'මේ වනාහි වස්තුය, පුද්ගල තෙමේම

ඇවැතට පැමිණියේ එක් මහණක්හට 'කිසිවක්හට නො කියව'යි ආරෝචනය කරයි. මෙතෙමේ අනිකක්හට ආරෝචනය කරයි. හෙතෙමේ නැවතී යමකු විසින් මේ මහණහුට සැලකරන ලද්දේද, 'කිසිවක්හට නො කියව'යි ඔහුටම ආරෝචනය කරයි. මෙසේ තෙවන පුද්ගලයා විසින් දෙවැන්නහුට සැලකළකල්හි කෙළවර සිදුනේවේයයි කියයි. '**අදුට්ඨුල්ලං ආපත්තිං**' සෙසු පඤ්චාපත්තිස්කන්ධ '**අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං**' මෙහි අනුපසම්පන්නයකුගේ සුක්කවිස්සට්ඨිය හා කායසංසග්ගරාගයද යන මෙය දුළුල්වරද නම්වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂේප සමුට්ඨානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. අක්‍රියසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සිවුවන දුට්ඨුල්ලශික්ෂාපදයයි

—॥—

පස්වම ශික්ෂාපදයෙහි - '**අඞ්ගුලියො දුක්ඛා භවිස්සන්ති**' අකුරු ලියන්නහුගේ ඇඟිලි පීඩාවට පත් වන්නේයයි සිතුහ. '**උරස්සදුක්ඛො**' ගණිතයෙහි හික්මෙන්නහු විසින් බොහෝ දෙය සිතිය යුතුවේ. එයින් මොහුගේ හෘදය පෙළෙන්නේයයි සිතුහ. '**අක්ඛීනි දුක්ඛා භවිස්සන්ති**' රත්කරුසිප්හි හික්මෙන්නහු විසින් කහවණු පෙරළ පෙරළා දැක්ක යුත්තේ වෙයි. එයින් මොහුගේ ඇස් දුකින් පෙළේයයි සිතුහ. ඩංසාදීන් අතුරෙහි '**ඩංසා**' යනු පිඟුවන් මැස්සෝය. '**දුක්ඛානං**' දුකින් ඉවසිය යුතුවූ. '**තිබ්බානං**' දැඩිවූ. '**ඛරානං**' තියුණුවූ. '**කටුකානං**' පරුෂවූ. මන නොවඩන බැවින් කුළුරස වැතිවූ. '**අසාතානං**' නොමිහිරිවූ. '**පාණහරානං**' දිවි හැරගන්නාවූ '**සීමං සම්මන්නාති**' අලුත් සීමාවක් බඳියි. කුරුන්දියෙහි වනාහි උදකුක්ඛෙපය පිරිසිඳීමෙහිද දුක්කටය කියනලදී. '**පරිපුණ්ණවීසතිවස්සො**' පිළිසිඳ ගැණීම පටන් පිරිපුන් විසිවයස් ඇත්තේ. ගබ්වීස තෙමේද පිරිපුන් විසිවයස් ඇත්තේමයි ගිණීමට යන්නේය. එසමයෙහි වනාහි ගැබෙහි හොත් මාස සමග විසිවයස් ඇත්තාවූ **කුමාරකාශ්‍යප** තෙමේ උපසපන් වූයේ වේ. එකල්හි ආයුෂ්මත් කුමාරකාශ්‍යපහට 'භාග්‍යවතුන් වහන්සේ විසින් උනුවිසිවයස් ඇති පුද්ගල තෙමේ උපසපන් නොකටයුතුය'යි පනවනලද්දේය. මමද පිළිසිඳ ගැණීමෙහි පටන් විසිවයස් ඇතියෙම් උපසපන් වූයෙමි. එහෙයින් උපසම්පන් වූයෙම්ද, උපසපන් නොවූයෙම්දැ'යි මෙබඳු සිතෙක් වූයේය. භාග්‍යවතුන්වහන්සේට මෙකරුණ සැලකළහ. 'මහණෙනි' මවුකුසෙහි යම් පළමු සිතෙක් උපන්නේද,

ප්‍රථම විඥානයෙක් පහළවූයේද, එතැන් පටන් ඔහුගේ ඕ ම ජාතිය වන්නීය. මහණෙනි පිළිසිඳ ගැණීමෙහි පටන් විසිවයස් ඇත්තහු උපසපන් කරන්නට අනුදනිමි'යි වදාළසේක. එහි යමෙක්, දෙළොස් මසක් මවුකුස වැස වප්මස මහා පවුරුනු දිනයෙහි උපන්නේද, හෙතෙමේ එතැන් පටන් එකුන් විසිවන වසෙහි වප්මස පුන්පොහොයෙහි යම්තාක් මහාපවාරණය වේද, ඒ දිනය ඉක්මවා පැළවිය දිනයෙහි උපසපන් කටයුතුය. මේ උපායයෙන් ගර්භමාසය වැඩිවූ කල්හි පිරිහෙළීමද අඩුවූ කල්හි වැඩීමද දතයුතුය. පුරාතන ස්ථවිරයන් වහන්සේලා දෙළොස් මසක් මවුකුස වැස මහාපවුරුනු දිනයෙහි උපන්තැන් පටන් එකුන් විසිවයස් ඇත්තාවූ හෙරණහු තිකිණිමස පෞණිමිය ඉක්මවා පශ්චිමකයන් විසින් වස් එළැඹිය යුතු පැළවිය දිනයෙහි උපසම්පද කෙරෙත්. ඒ කුමක් හෙයින, යත්:- එහිලා කියනුලැබේ. එක් වසෙක චාතුද්දසී පොහොය සසෙක් වේ. මෙසේ විසි වසෙහි සිවුමසෙක් පිරිහේ. රජහු, තෙවන තෙවන වසෙහි වස උඩට අදිත්. (තෙවන වයෙහි එක් මසක් අධිකමාස වසයෙන් හරිමින් වස්සුක්කඩ්ඪනය කරති. යන අර්ථයි. කුමක් හෙයින යත්: තෙවන වසෙහි දහතුන් මසෙක් වේ. වසකට දෙළොස් මස බැවින් අටළොස් වස්හි අධික මාසයක් වෙන්ව ගෙණ සමසක් වැඩේයයි කියනලදී). මෙසේ අටළොස් වස්හි සමසෙක් වැඩේ. ඒ සමසින් උපොසථ වසයෙන් පිරිහුනු සිවුමස බැහැර කොට දෙමසෙක් ඉතිරි වේ. ඒ දෙමස ගෙණ විසි වස පිරුනේ වේයයි අධිකමාස සමග පිරිපුන් විසිවස ඇති බැවින් සැක නැතිව තිකිණි මස පෞණිමිය ඉක්මවා පැළවිය දිනයෙහි උපසම්පද කෙරෙත්. මෙහි වනාහි යමෙක් පවරා විසිවස් ඇත්තේ වන්නේද, ඔහු සඳහා 'එකුනවීසති වස්සං'යි කියනලදී. (යම්හෙයකින් ගර්භමාසයෝ ගණනූපග වෙත්ද) එහෙයින් යමෙක් තෙමේ මවුකුසෙහි දෙළොස් මසක් විසූයේද, හෙතෙමේ එක්විසිවයස් ඇත්තේ වේ. යමෙක් තෙමේ සත්මසක් විසූයේද, හෙතෙමේ සත්මසක් අධිකකොට ඇති විසිවයස් ඇත්තේවේ. සමසින් උපන්නේ වනාහි ජීවත් නොවේ. **'අනාපත්ති ඌනවීසති වස්සං පරිපුණ්ණසඤ්ඤී'** මෙහි උපසපන් කරන මහණහුට කිසියේත් ඇවැත් නොවේ. පුද්ගල තෙමේ වනාහි අනුපසම්පන්න වේ. ඉදින් අනුපසම්පන්නවූ හෙතෙමේද සවස් ඇවෑමෙන් අනිකකු උපසපන් කෙරේද, උපසපන්ය යන් සන් ඇතිව දසවස් පිරීමෙන් උපාධ්‍යායව උපසම්පද කරන ඔහු හැර ගණය පිරේ නම්, එහි උපසම්පදව ලත් තැනැත්තේ මැනැවින් උපසපන් වූයේවේ. අඩු විසිවයස් ඇතිව උපසම්පන්නයි ව්‍යවහාරයට පැමිණ වසන හෙතෙමේද, යම්තාක් නොදනීද, ඒතාක් ඔහුට ස්වර්ගාන්තරායෙක් නොවේමය. මොක්ෂාන්තරායෙක්ද නොවේ. දැන නැවැත

උපසම්පද වියයුතුය. සෙස්සප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පස්වන ඌනවීසතිවස්ස ශික්ෂාපදයය

—\\—

ෂෂ්ඨශික්ෂාපදයෙහි - **'පටියාලොකං'** සූර්‍ය්‍යාලොකයට විරුද්ධ මුඛයට. පැසුළුදෙසට යන අර්ථයි. **'කම්මිකා'** අයබදුගන්නා තැන කම්කරුවෝ. **'රාජානං වා ථෙය්‍යං ගච්ජන්ති'** රජුන්ගෙන් හෝ සොරකම් කොට වඤ්චා කොට රජු සතු කිසිවක් ගෙණ දැන් ඔහුට නොදෙන්නෙමු'යි යෙත් **'විසඞ්කතෙන'** අදුවල් කාලයෙහි යම්හයි කථා කොට ගෙණ ඒ නියම කරගත් කාලය වැරදවීමෙන්ද, නියම කරගත් දවස වැරදවීමෙන්ද යන මහණහුට ඇවැත් නොවේ. මග වැරදවීමෙන්ද, වන වැරදවීමෙන්ද, ඇවැත් වේමය. මෙහි සෙස්ස භික්ෂුණී වර්ගයෙහි කියූ නය ඇති බැවින් ප්‍රකටමය. ථෙය්‍යසත්ථසමුට්ඨානිකය. කාය චිත්තයෙන්'ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ථෙය්‍යසත්ථ ශික්ෂාපදයයි

—\\—

සප්තම ශික්ෂාපදයෙහි - **'පධූපෙනෙතා නිසීදති'** සුස්මමින් (දුකෙන් යුක්තව) තමන්හටම පරිභව කරමින් හුන්නේය. **'න අයෙපා සො භික්ඛු මං නිපාතෙසි' ආයසීය'** මේ මහණතෙමේ මා නොනික්මවූයේය. මා ගෙණ නොගියේය, යන අර්ථයි. මෙහි සෙස්ස සමුට්ඨානාදිය සමග, මෙහෙණක සමග සංවිධාන කොට ගෙණ එක් දිග්මගකට පැමිණීම කියූ ශික්ෂාපදයෙහි කියනලද නයින්ම දතයුතුය.

සත්වන සංවිධාන ශික්ෂාපදයයි

—\\—

අෂ්ටමශික්ෂාපදයෙහි- ගිජුලිහිණියන් නැසූහයි ගද්ධබාධි නම් වේ. පෙර ගිජුලිහිණියන් නැසූ පුරුෂයෝ මොහුගේනුයි ගද්ධබාධිපුබ්බ නම්වේ. ගද්ධබාධිපූර්වූ ඒ ගිජුලිහිණි නසන කුලයෙහි උපන්නක්හටය යන අර්ථයි.

ස්වර්ගමොක්ෂයන්ට අනතුරු කෙරෙත්නුයි **'අන්තරායික'** නම්වේ. ඔවුහු කම්ම, කිලෙස, විපාක, උපවාද, ආණාවීතික්කම වසයෙන් පස්වැදෑරුම් වෙත්. එහි පඤ්චානන්තර්‍ය්‍ය කර්‍මයෝ කර්‍මාන්තරායික නම් වෙත්. භික්ෂුණී දූෂකකර්‍මය එසේය. ඒ භික්ෂුණීදූෂකකර්‍මය මොක්ෂයටම අනතුරු කරන්නේය. ස්වර්ගයට අන්තරාය නොකරන්නේය. නියතමිථ්‍යා දෘෂ්ටිධර්‍මයෝ කෙලශාන්තරායික නම්වෙත්. පණ්ඩක තිරච්ඡානගත උභතො ව්‍යඤ්ජනකාදීන්ගේ ප්‍රතිසන්ධිචිත්තොත්පාද ධර්‍මයෝ විපාකාන්තරායික නම් වෙත්. ආර්‍ය්‍යොපවාදයෝ උපවාදාන්තරායික නම් වෙත්. ඒ ආර්‍ය්‍යොපවාදයෝ යම්තාක් ආර්‍ය්‍යයන් කමා නොකරවත්ද ඒතාක්ම අන්තරායික වෙත්. කමා කරවීමෙන් මත්තෙහි ආර්‍ය්‍යොපවාදන්තරායිකයෝ නොවෙත්. සිතා දැන පැමිණි ආපත්තීහු, ආඥව්‍යතික්‍රමාන්තරායිකයෝය. ඒ ආපත්තීහුද යම්තාක් කල් භික්ෂුභාවය පිළිදන්වාද, ගරුකාපත්තියට පැමිණියේ එයින් නොනැඟී සිටීද, ලහුකාපත්තියට පැමිණියේ නොදෙසාද, ඒතාක්ම අන්තරායික වෙත් ඔවුහුද භික්ෂුභාවයෙන් මිදීමෙන් හා පැමිණි ආපත්තීන්ගේ පාරිශුද්ධියෙන්ද මත්තෙහි ආඥව්‍යතික්‍රමාන්තරායිකයෝ නොවෙත්. එහි මේ අරිෂ්ට භික්ෂු තෙමේ බහුශ්‍රැතය. ධර්‍මකථිකය. එහෙයින් ප්‍රඥප්ති ව්‍යතික්‍රමාන්තරායිකයන් හැර සෙසු අන්තරායකරධර්‍ම දන්නේය. විනයෙහි දක්ෂ නොවන බැවින් ප්‍රඥප්ති ව්‍යතික්‍රමාන්තරායිකයන් නොදන්නේය. එහෙයින් රහසිගත වූයේ 'මේ ගිහියෝ පස්කම් කොටස් වළඳමින් සොතාපන්නද වෙති. සකෘදගාමීහුද වෙති. අනාගාමීහුද වෙත්. භික්ෂූහුද මන වඩන, ඇසින් විඳගතයුතු රූප-පෙ-දකින් -පෙ-කයින් විඳිය යුතුවූ පැහැසිය යුතුදෙය පහසත්. මොළොක්වූ ආස්තරණප්‍රාපූරණාදීන් පරිභොග කරත්. මේ සියල්ල පරිභොග කිරීම වටියි. එසේ නම් කුමක් හෙයින් ස්ත්‍රීරූප-පෙ-ස්ත්‍රීස්පර්‍ශ නොවටිත්ද, මොවුහුද වටිත්ය'යි මෙසේ සිතුයේය. මෙසේ අනවද්‍යප්‍රත්‍යයපරිභොග රසය හා සාවද්‍ය කාමගුණ පරිභොගරසය සසඳ ඡන්දරාගසහිතවූ පරිභොගයද, ඡන්දරාග රහිත පරිභොගයද, එකක් කොට දළ වැහැරි සමග ඉතා සියුම්හුයක් එක්කොට ගටන්නකුමෙන්, අබැටක් සමග මහමෙර සමබවට පමුණුවන්නකු මෙන් ලාමක දෘෂ්ටියක් උපදවා 'කිම, භාග්‍යවතුන්වහන්සේ විසින් මහමුහුද හෙයක් වසයෙන් බඳින්නකු විසින් මෙන් මහත් උත්සාහයෙන් ප්‍රථමපාරාජිකය පණවන ලද්දේද, මෙහි දෙසෙක් නැත්තේයයි සර්‍වඥතාඥනය සමග ප්‍රතිවිරුද්ධ වෙමින් භව්‍යපුද්ගලයන්ගේ ආශාව සිඳිමින් ජින නම්වූ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාසඞ්ඛ්‍යාත ආඥචක්‍රයට පහර දුන්නේය. **'තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි'** යනාදිය එහෙයින් කීයේය. **'අට්ඨිකඞ්කපලූපමා'** යනාදි තන්හි මද රසවිඳගැණීම් ඇති අර්ථයෙන්

ඇට සැකිල්ලකට බඳු උපමා ඇතියහ. '**මංසපෙසූපමා**' බොහෝ දෙනාට සාධාරණාර්ථයෙන් මස්වැදැල්ලකට බඳු උපමා ඇතියහ. 'තිණුක්කූපමා' අනුපායප්‍රති පත්තියෙන් දැන්ද මතුද දවන අර්ථයෙන් තණසූලකට බඳු උපමා ඇතියහ. '**අඞ්ගාරකාසූපමා**' මහත්ව තැවීමට කරුණු වන අර්ථයෙන් අඟුරුවළකට බඳු උපමා ඇතියහ. '**සුපිනකූපමා**' මඳකලක් එළඹ සිටීම් අර්ථයෙන් සිහිනයකට බඳු උපමා ඇතියහ. '**යාචිතකූපමා**' තාවකාලිකාර්ථයෙන් ඉල්වාගත් දෙයකට බඳු උපමා ඇතියහ. '**රුක්ඛඵලූපමා**' සියලු අඟපසඟ බිඳීම් අර්ථයෙන් රුක් ඵලයකට බඳු උපමා ඇතියහ. '**අසිසූනූපමා**' කෙටීම් අර්ථයෙන් කඩුව හා මස්ලොඹුකට බඳු උපමා ඇතියහ. '**සත්තිසූලූපමා**' විනිවිද යන අර්ථයෙන් සැත්හුලකට බඳු උපමා ඇතියහ. '**සප්පසිරූපමා**' සැකබිය සහිතය යන අර්ථයෙන් සප්හිසකට බඳු උපමා ඇතියහ. මෙහි මෙ සඞ්ක්ෂපයයි. විස්තරය වනාහි ප්‍රපඤ්චසූදනී නම්වූ මද්‍ධ්‍යමනිකායාර්ථකථාවෙන් ගතයුතුය. '**එවං ව්‍යා ඛො**' මෙසේ මෙන්මය. මෙහි සෙස්ස පෙර කියන ලදනය ඇති බැවින් ප්‍රකටමය. සමනුභාසනසමුත්ථානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. අක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශල චිත්තයි. දුඃඛවෙදනයි.

අටවන අරිට්ඨ ශික්ෂාපදයයි.

—॥—

නවමශික්ෂාපදයෙහි- '**අකටානුධම්මෙන**' ඇවැත නොදැක්මෙහි හෝ පැමිණි ඇවැත සඳහා පිළියම් නොකිරීමෙහි හෝ ලාමකදෘෂ්ටිය නොහැරීමෙහි හෝ ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් උත්ක්ෂෙපණීය කර්මයෙන් බැහැර කරනලද්දහුගේ අනුලොම්වන දැක කළ ඇතුළත් කිරීම අනුධර්මයි කියනු ලැබේ. ඒ (ඇතුළත් කිරීමයි කියූ) ඔසරණාසඞ්ඛ්‍යාත අනුධර්මය තෙමේ යමක්හට නොකරනලද්දේද, මෙතෙමේ නොකළ ඔසාරණය ඇත්තේ නම. එබන්දකු සමග යන අර්ථයි. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි '**අකටානුධම්මො නාම උක්ඛිත්තො අනොසාරිතො**'යි වදරන ලදී. '**දෙති වා පතිගණ්හාති වා**' එක් ප්‍රයොගයකින් බොහෝ ආමිස දෙන මහණහුටද, ගන්නහුටද එක් පාචිත්තියක් වේ. කඩ කඩකොට දෙන්නහුටද ගන්නහුටද යථොක්තදෘෂ්ටිය නොහළ බැවින් සමනුභාෂණ කර්මය කළ මහණහු සමග ගණුදෙනු කරන ප්‍රයොගගණිතින් පාචිත්තියාපත්තීහු වෙත්. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය.

ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන උක්ඛිත්තසම්භොග ශික්ෂාපදයයි

—||—

දශම ශික්ෂාපදයෙහි - '**දිට්ඨිගතං උප්පන්නං**' අරිෂ්ට මහණහුට මෙන් නුනුවණින් ඉල්පෙන්නාවූ මේ කණ්ටක හෙරණහුටද ලාමක දෘෂ්ටියක් උපන. '**නාසෙතු**' මෙහි නාසනා තොමෝ සංවාසනාසනා ලිඞ්ගනාසනා දණ්ඩකම්මනාසනායි තෙවැදෑරුම් වන්නීය. එහි ඇවැත් නොදැකීම් ආදිය නිමිති කොට කරන උත්ක්ෂෙපණා තොමෝ සංවාසනාසනා නම. 'දූෂක තෙමේ නැසිය යුතුය, මෙත්තියා භික්ෂුණිය නසවුයි ලිඞ්ගනාසනා නම. 'ඇවැත' සමණුද්දෙස, තාවිසින් අද පටන් ඒ භාග්‍යවතුන් වහන්සේ ශාස්තෘහුයි නොම කියයුතුයි, යන මේ දණ්ඩකම්මනාසනා නම. මෙහි මේ දණ්ඩකම්ම නාසනා තොමෝ අදහස් කරනලදී. එහෙයින් '**එවඤ්ච පන භික්ඛවෙ නාසෙතබ්බො -පෙ- විනස්ස**'යි වදළසේක. එහි '**චර**' යනු 'යව' යන අර්ථයි. '**පරෙ**' යනු පහවයව, මෙහි නොසිටුව. මමත්වය නැත්ත, '**විනස්ස**' නැසෙව. යම් තැනක ගියහු නො දක්නෙමුද එහි යව. '**උපලාපෙය්‍ය**' සිවුරු ආදිය හා උද්දෙස පරිප්‍රච්ඡාදිය දීමෙන් නලවන්නේය. '**උපට්ඨාපෙය්‍ය**' ඒ හෙරණහු ලවා තමාට උපස්ථාන කරවා ගන්නේය. සෙස්ස සමුට්ඨානාදියසමග අරිට්ඨශික්ෂාපදයෙහි කී නයින්ම දතයුතුය.

දසවන කණ්ටකශික්ෂාපදයයි

වර්ණනාක්‍රමයෙන් සත්වැනිවූ සප්‍රාණකවර්ගය නිමි.

—||—

සහධාර්මිකවර්ගය පිළිබඳ ප්‍රථමශික්ෂාපදයෙහි- '**එතස්මිං සික්ඛාපදෙ**' මේ ශික්ෂාපදයෙහි යමක් කියනලද්දේද, එහි ඒතාක් නො හික්මෙන්නෙමි. '**ආපත්ති පාචිත්තියස්ස**' මෙහි වනාහි වචනයක් වචනයක් පාසා ඇවැත් දතයුතුය. '**සික්ඛමානෙන භික්ඛවෙ භික්ඛුනා**' අවවාදය හිසින් පිළිගෙණ හික්මෙනු කැමැතියකුම වී දැනගත යුත්තේද වේ. විචාරිය යුත්තේද වේ. පරීක්ෂා කටයුතුද වේ. මෙහි සෙස්ස දුබ්බච ශික්ෂාපදයෙහි කියූ නයින්ම පදාර්ථ වශයෙන් දතයුතුය. විනිශ්චය වශයෙන් ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය.

ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්‍ෂය සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනය.

පළමුවන සහධාර්මික ශික්‍ෂාපදයයි.

—॥—

ද්විතීයශික්‍ෂාපදයෙහි-**'විනයකථං කථෙති'** විනයකථා නම් කප්පිය අකප්පිය ආපත්ති අනාපත්ති සංවර පහාණ යන මෙයින් යුක්තකථාය. ඒ විනයකථාව කියයි. **'විනයස්ස වණ්ණං භාසති'** විනය පිළිබඳ වර්ණනා නම් පස්වැදෑරුම්වූද, සත්වැදෑරුම්වූද, ආපත්තිස්කන්ධයන්ගේ වසයෙන් මාතෘකා තබා පදභාජනයෙන් වර්ණනා කිරීමය. එය කියයි. **'විනයපරියත්තියා වණ්ණං භාසති'** විනය පුහුණු කරන්නවුන්ගේ විනය පර්‍ය්‍යාප්තිය මුල් කොට සිටි වර්ණනාව ගුණය ආනිසංසය කියයි. විනයධර තෙමේ වනාහි විනයපර්‍ය්‍යාප්තිය මුල් කොට අනුසස් පසක් අනුසස් සයක් අනුසස් සතක්, අනුසස් අටක්, අනුසස් නවයක්, අනුසස් දසයක්, අනුසස් එකොළොසක් ලබයි. ඒ සියලු අනුසස් කියාය යන අර්ථයි. කවර නම් පස් අනුසයක් ලබාද, යත්:- තමාගේ ශීලස්කන්ධගොපනාදීවූ පස් අනුසසක් ලබයි. 'මහණෙනි' විනයධරපුද්ගලයා කෙරෙහි මේ අනුසස් පසෙක් වේ. තමාගේ ශීලස්කන්ධය, කරඬුවකලූ මැණික යම්සේ නොනැසේද, විපතට නොපැමිණේද, එසේ මොනවට ගොපනය කරනලද්දේ මොනවට රක්නාලද්දේ වේ. කැප අකැප නිසා උපන් කුකුසෙන් මඩනාලද්දවුන්ට පිළිසරණ වේ. සභාමැද විශාරදව කථා කරන්නේය. කරුණු සහිත වචනයෙන් සතුරන් තෙජස් රහිත කොට ඔවුන්ට මනා නිගැන්මෙන් නිගා කරයි. සද්ධර්මස්ථිතිය පිණිස පිළිපන්නේ වේ'යි මෙය වදරනලද්දේය.

කෙසේ මොහු විසින් තමාගේ ශීලස්කන්ධය මනාකොට ගොපනය කරනලද්දේ මනාකොට රක්නාලද්දේ වේද, යත්:- මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් තෙමේ ඇවැතට පැමිණෙනුයේ අලජ්ජිතා, අඤ්ඤාණතා, කුක්කුච්චපකතතා, අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, සතිසම්මොසා යන සයඅයුරෙන් පැමිණේ. අලජ්ජිතාවෙන් කෙසේ පැමිණේද, යත්:- නොකැපබව දන්නේම ශික්‍ෂාව මැඩ වස්තුව්‍යතික්‍රමය කරයි. මෙද වදරනලදී. 'දැන සිතා ඇවැතට පැමිණේද, පැමිණි ඇවැත සඟවාද, අගතියට යේද, මෙබඳු පුද්ගලයා තෙමේ අලජ්ජියි කියනුලැබේ'යි.

අඤ්ඤාණතාවෙන් කෙසේ පැමිණේද යත්? අඥනපුද්ගල තෙමේ අඥනභාවයෙන් මැඩවූයේ අවිසදභාවයෙන් මුඪ වූයේ කටයුතු නොකටයුතු

නොදන්නේ නොකටයුතු කරයි. කටයුතු වරදයි. වළකයි. මෙසේ අඥානභාවයෙන් ඇවැතට පැමිණේ. කුකුසෙන් මැඩුනු බැවින් කෙසේ ඇවැතට පැමිණේද, අකැපයෙහි කැපයි සත් ඇති බැවින් කෙසේ ඇවැතට පැමිණේද, යත්:- වලස්මස්, හූරුමස්යි අනුභව කරයි. දිවිමස්, මුවමස්යි, අනුභව කරයි. අකැප බොජුන්, කැපබොජුන්යි බුදියි. නොකාලයෙහි කාලයි හැඟීමෙන් බුදියි. අකැප පැන්, කැප පැන්යි බොයි. මෙසේ අකැපයෙහි කැපයි සත් ඇතිබැවින් ඇවැතට පැමිණේ. කැපයෙහි අකැපයි සත් ඇතිබැවින් කෙසේ ඇවැතට පැමිණේද, යත්:- හූරුමස්, වලස්මස්යි කයි. මුවමස්, දිවිමස්යි කයි. කැපබොජුන් අකැපබොජුන්යි බුදියි. කාලයෙහි නොකාලයි බුදියි. කැපපැන්, අකැපපැන්යි බොයි. මෙසේ කැපයෙහි අකැපයි සත් ඇති බැවින් ඇවැතට පැමිණේ. සිහිමුළාවෙන් කෙසේ ඇවැතට පැමිණේද, යත්:- සහසෙය්‍ය චීවරවිප්පවාස හෙසජ්ජ චීවරකාලයන් ඉක්මවීම් හෙතුවෙන් සිහිමුළාවෙන් ඇවැතට පැමිණේ. මෙසේ මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් තෙමේ මේ සයයුරෙන් ඇවැතට පැමිණේ. විනයධරතෙමේ වනාහි මේ සයයුරෙන් ඇවැතට නොපැමිණේ. අලජ්ජිභාවයෙන් කෙසේ ඇවැතට නොපැමිණේද, යත්:- ඒ විනයධර තෙමේ වනාහි 'පින්වත්නි' බලනු මැනැවැ, මෙතෙමේ කැප අකැපබව දන්නේම ශික්ෂාපදව්‍යතික්‍රමය කෙරේය'යි මේ පරොපවාද රක්නේද, ඇවැතට නොපැමිණේ. මෙසේ අලජ්ජිභාවයෙන් ඇවැතට නොපැමිණේ. ඉක්මන්කම නිසා පැමිණියාවූද, දෙසීමෙන් පිරිසිදුබවට පැමිණෙන්නාවූද, ඇවැත දෙසා වුට්ඨානගාමිනීවූ ඇවැතින් නැගිට පිරිසිදුබවෙහි පිහිටා ගණියි. එහෙයින් 'දැන සිතා ඇවැතට නොපැමිණේ. පැමිණි ඇවැත නොවසයි. අගතියටද නොයයි. මෙබඳු පුද්ගල තෙමේ ලජ්ජියි කියනුලැබේ. මේ ලජ්ජිභාවයෙහි පිහිටියේම වේ. අඥානභාවයෙන් කෙසේ ඇවැතට නොපැමිණේද, යත්:- ඒ විනයධර තෙමේ වනාහි කැප අකැපය දනියි. එහෙයින් කැපවූවක්ම කරයි. අකැපයක් නොකරයි. මෙසේ අඥානභාවයෙන් ඇවැතට නොපැමිණේ. කුකුසෙන් මැඩුන බැවින් කෙසේ ඇවැතට නොපැමිණේද, යත්:- ඒ විනයධරතෙමේ වනාහි කැප අකැපය නිසා කුකුසක් උපන් කල්හි වස්තුව බලා මාතෘකාවද, පදභාජනයද, අන්තරාපත්තියද, ආපත්තියද, අනාපත්තියද බලා කැප වේ නම්, කරන්නේය. අකැප වේ නම් නොකරන්නේය. මෙසේ කුකුසෙන් මැඩුනු බැවින් ඇවැතට නොපැමිණේ. අකැපයෙහි කැපයි හැඟීම් ආදියෙන් කෙසේ ඇවැතට පැමිණේද,යත්- ඒ විනයධර තෙමේ වනාහි කැප අකැප බව දනියි. එහෙයින් අකැපයෙහි කැප හැඟීම් ඇත්තේ නොවේ. කැපයෙහි අකැප සත් ඇත්තේ නොවේ. මොහුගේ සිහිය මැනැවින්

පිහිටියාවේ. ඉටිය යුත්ත ඉටයි. විකපනය කටයුත්ත විකපනය කරයි. මෙසේ මේ සයයුරෙන් ඇවැතට නොපැමිණේ. ඇවැතට නොපැමිණෙන්නේ නොකඩවූ සිල් ඇත්තේ පිරිසිදු සිල් ඇත්තේ වේ. මෙසේ මොහු විසින් තමන්ගේ ශීලසක්‍ඛන්‍ධය මොනවට ගොපනය කරනලද්දේ, මොනවට රක්නාලද්දේවේ.

කුකුසෙන් මඩනාලද්දවුන්ට කෙසේ පිළිසරණ වේද, යත්ඃ පිටත රටවලද පිටත දනවුවලද උපන් කුකුස් ඇති භික්‍ෂූහු 'අසුවල් නම් වෙහෙරෙහි විනයධරයෙක් වසා'යි දුරිතිදු ඔහු වෙතට පැමිණ කුකුස් විචාරත්. ඒ විනයධර තෙමේ ඔවුන් විසින් කළ කර්‍මයෙහි වස්තුව බලා, ආපත්ති අනාපත්ති ගරුකලහුකාදිභෙද සලකා, දෙසනාගාමිනී ඇවැත දෙසවා, වුට්ඨානගාමිනී ඇවැතින් නැඟිටුවා පිරිසිදු බැව්හි පිහිටුවාලයි. මෙසේ කුකුසෙන් මැඩුනවුන්ට පිළිසරණවේ.

**'විසාරදො සඞ්ඝමජ්ඣෙ වොහරති'** සඟමැද කතා කරන විනය නොදන්නහුට බිය හා තැතිගැනීම පැමිණේ. විනයධරයාට වනාහි ඒ බිය හා තැතිගැනීම නොවේ. කුමක් හෙයින්ද, යත් 'මෙසේ කියන්නහුට දෙසෙක් වේ, මෙසේ දෙසෙක් නොවේය'යි දැන කියන බැවිනි.

**'පච්චත්ථිකෙ සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හාති'** මෙහි සතුරෝ තමාට තමා සතුරුවූවෝද, සසුනට සතුරු වූවෝදැයි දෙපරිදි වෙත්. එහි මෙත්තිය භුම්මජක භික්‍ෂූහුද, වඩ්ඪ නම් ලිච්ඡවීද, අමූලිකවූ අන්තිමවස්තුවෙන් චොදනා කළහ. මොවුහු තමාට තමා සතුරු වූවෝය. දුශ්ශීලවූ ලාමක ස්වභාව ඇත්තාවූ අන්‍යවූද, යම් කෙනෙක් වෙත්ද, ඒ සියල්ලෝ තම තමන්ට සතුරු වූවෝය. විපරීත දැකුම් ඇති අරිට්ඨ භික්‍ෂු, කණ්ටකසාමණේර, විශාලාමහනුවර වැසි වජ්ජිපුත්‍රක භික්‍ෂූහු හා පරූපහාර අඤ්ඤාණ කඞ්ඛාපරවිතාරණාදි වාද ඇති මහාසඞ්ඝිකාදීහුද යන නොබුදුවූවන්ගේ අවවාදය බුදුවූවන්ගේ අවවාදයයි කළ රුකුල්දීම් ඇත්තාහු සසුනට සතුරෝ වෙති. ඒ සියල්ලෝම සහධර්‍මයෙන් කරුණු සහිත වචනයෙන් යම්සේ අසද්ධර්‍මය පිහිටු වන්නට නොහැකිවෙත්ද, එසේ හිස ඔසොවන්නට නොදී, ඔවුන්ට තදින් නිග්‍රහ කරයි.

**'සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති'** මෙහි ත්‍රිපිටක බුද්ධවචනය පර්‍ය්‍යාප්තිසද්ධර්‍ම නම්වේ. තෙළෙස් ධුතඟගුණ, තුදුස් කඳුවත්, දෙයාසූ මහවත් යන මෙය ප්‍රතිපත්තිසද්ධර්‍ම නම්වේ. එහි ඇතැම් ස්ථවිරයන් වහන්සේලා 'ආනන්ද' මාවිසින් තොපට යම් ධර්‍මයක් විනයක් දෙසන ලදද, පනවනලදද, ඒ ධර්‍මවිනය තෙමේ මාගේ ඇවෑමෙන් තොපට

ශාසනං වන්නේය යන මේ සූත්‍රයෙන් ශාසනයට මුල පර්‍යාප්තියයිද, ඇතැම් ස්ථවිරයන් වහන්සේලා 'සුභද්‍ර' මේ භික්ෂූහු මැනැවින් වසන්නාහු නම්, ලොකය රහතුන්ගෙන් ශූන්‍ය නොවන්නේය, යන මේ සූත්‍රයෙන් ශාසනයට ප්‍රතිපත්තිය මූලයයිද කියා යම්තාක් කල් මොනවට පිළිපන් පස්නමක් භික්ෂූහු විද්‍යමාන වෙත්ද, ඒතාක් ශාසනය සිටියේ වේයයි කීහ. අනික් තෙරහු පර්‍යාප්තිය අතුරුදහන් වූකල්හි මොනවට පිළිපන්නහුටද ධර්මාවබෝධය නැතැයි කීහ. ඉදින් පස්නමක් භික්ෂූහු සතර පරිජි රකින්නාහු වෙත්ද, ඔවුහු කුලපුත්‍රයන් පැවිදිකොට පසල්දනව්වෙහි උපසම්පද කොට දශවර්ගික ගණයා පූරවා මධ්‍යමජනපදයෙහි උපසම්පද කරන්නාහුද, මේ උපායයෙන් විංශද්වර්ගික සඞ්ඝයා පූරවා තමන්ගේද අබ්භානකර්ම කොට ශාසනය වැඩීමට මුල්බැසගත් බවට මහත්බවට පමුණුවන්නාහුය. මෙසේ මේ විනයධර තෙමේ තෙවැදෑරුම්වූම සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස පිළිපන්නේ වේ. මෙසේ මේ විනයධර තෙමේ ඒතාක් මේ අනුසස් පස ලබායයි දතයුතුය.

කවර නම් අනුසස් සයක් ලබාද, යත්:- උපොසථ, පවාරණ, සඞ්ඝකර්ම, ප්‍රව්‍රජ්‍යා, උපසම්පද, යන මොවුහු විනයධරයාහට අයත් වන්නාහ. නිස දෙන්නේය. හෙරණුන් ලවා උවැටැන් කරවන්නේය. චාතුද්දසික උපොසථ, පණ්ණරසිකඋපොසථ, සාමග්ගිඋපොසථ, සංඝඋපොසථ, ගණඋපොසථ, පුග්ගල උපොසථ, සුත්තුද්දෙසඋපොසථ, පාරිසුද්ධි උපොසථ, අධිට්ඨානඋපොසථයි යම් මේ නව උපොසථ කෙනෙක් වෙත්ද, ඒ සියලු උපොසථයෝ විනයධරයාහට අයත් වන්නාහුය. චාතුද්දසිකපවාරණ, පණ්ණරසිකපවාරණ, සාමග්ගිපවාරණ, සඞ්ඝපවාරණ, ගණපවාරණ, පුග්ගලපවාරණ, තෙවාචිකපවාරණ, ද්වෙවාචිකපවාරණ, සමානවස්සිකපවාරණ, යන යම් මේ නව පවාරණ කෙනෙක් වෙත්ද, ඒ නව පවාරණයෝද, විනයධරයාහට අයත් වන්නාහුය. ඔහු සතු වන්නාහුය. හෙතෙමේ ඒ පවාරණයන්ට සවාමිවේ. අපලොකනකර්ම, ඥත්තිකර්ම, ඥත්තිදුතියකර්ම, ඥත්තිචතුත්ථකර්ම යන යම් මේ සිවු වැදෑරුම් වූ සඞ්ඝකර්ම කෙනෙක් වෙත්ද, ඒ සිවුවැදෑරුම් කර්මයෝ විනයධරයාහට අයත් වන්නාහුය. උපාධ්‍යායව කුලපුත්‍රයන්ගේ යම් ප්‍රව්‍රජ්‍යාවක්, යම් උපසම්පදවක් කටයුත්තීද, මෝතොමෝද විනයධරයාහටම අයත් වන්නීය. අනික් ද්විපිටකධර තෙමේද මේ අපලොකනකර්මාදිය කිරීම නොලබන්නේය. ඒ විනයධර තෙමේම නිස දෙන්නේය. හෙරණුන් ලවා උවැටැන් කරවන්නේය. අනිකෙක් නිස දීම නොලබන්නේය. හෙරණුන් ලවා උවැටැන් කරවීම නොලබන්නේය. හෙරණුන් ලවා උවැටැන් කරවීම

බලාපොරොත්තුවනු යේ වනාහි විනයධරයා වෙත උපාද්‍ධ්‍යායග්‍රහණය කරවා වත්පිළිවෙත් ඉවසීම ලබන්නේය. මෙහිද නිසදීම හා හෙරණුන් ලවා උවැටැන් කරවා ගැණීම එක් අඞ්ගයෙකි. මෙසේ මේ අනුසස් සය අතුරෙහි එක් අනුසසක් සමග පළමු අනුසස් පස, සයෙක් වේ. අනුසස් දෙකක් සමග සතෙක් වේ. තුනක් සමග අටෙක් වේ. සතරක් සමග නවයෙක් වේ. පසක් සමග දසයෙක් වේ. මේ සියල්ල සමග එකොළොස් අනුසස් කෙනෙක් වෙත්. මෙසේ විනයධර පුද්ගල තෙමේ පසක් සයක් සතක්, අටක්, නවයක්, දසයක්, එකොළොසක්, අනුසස් ලබායයි දතයුතුය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ අනුසස් දක්වමින් විනයපර්‍ය්‍යාප්තියෙහි ගුණය වදරන සේකැයි දතයුතුය.

**'ආදිස්ස ආදිස්ස'** නැවැත නැවැත ව්‍යවස්ථා කරවා වෙන්වෙන්කොට **'ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති'** විනයපර්‍ය්‍යාප්තිය නිසා උපාලි ස්ථවිරයන් වහන්සේගේ ගුණය කියයි. ස්තුති කරයි. පසසයි. කුමක් හෙයින, යත්:- මාගේ ගුණවැණීම අසාද භික්ෂූහු 'උපාලිතෙරුන් වෙත විනය උගතයුතුය. විනය පුහුණු කටයුතුය'යි සිතන්නාහු නම් ඉතාම මැනැවැ'යි මෙසේ ඇති කල්හි මේ සාසනය බොහෝකල් සිටින්නේ වන්නේය. පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි පවතින්නේයය **'තෙධ බහූ භික්ඛූ'** ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ ගුණවැණීම අසා 'මේ අනුසස් සූත්‍රාන්තිකයෝ නොලබන්නාහුය. ආභිධර්මිකයෝ නොලබන්නාහුයයි ඇති සැටියෙන් වර්ණනා කළ අනුසස් ලැබීමෙහි උපන් උත්සාහ ඇති ස්ථවිරවූද, නවකවූද, මද්‍ධ්‍යම වූද, බොහෝ භික්ෂූහු ආයුෂ්මත් උපාලි තෙරුන් වෙත විනය පුහුණු කෙරෙත්යි මේ මෙහි අර්ථය වේ. 'ඉධ' යන මේ පදය නිපාතමාත්‍රයෙක්මය.

**'උද්දිස්සමානෙ'** ඇදුරහු විසින් අතැවැස්සාහට උදෙසනුලබන කල්හි. හෙතෙමේ යම් හෙයකින් ඇදුරහු තමන්ගේ රුචියෙන් උදෙසන කල්හි හෝ, ඇදුරහු යාඥ කොට අතැවැසියන්ට උදෙසවා ගන්නා කල්හි හෝ යම් මහණෙක් තෙමේ ඒ උදෙසීම දරාද, ඔහු හදරන කල්හි හෝ උදෙසන්නේ නම්වේ. එහෙයින් **'උද්දිසන්තෙ වා උද්දිසාපෙන්තෙවා සජ්ඣායං වා කරොන්තෙ'**යි පදපභාජනය වදරනලද්දේය. **'ඛුද්දානුඛුද්දකෙහි'** දුක්කට සඞ්ඛ්‍යාත ක්ෂුද්‍රාපත්තීන්ගෙන්ද දුබ්භාසිත සඞ්ඛ්‍යාත අනුක්ෂුද්‍රාපත්තීන්ගෙන්ද, **'යාවදෙව'** ඔවුන්ගේ පැවැත්මෙහි ඉම පිරිසිඳීම් වචනයි. මෙය කියනලද්දේවේ. යම් කෙනෙක් තුමූ මේ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාපදයන් උදෙසත්ද, උදෙසවත්ද, හදරත්ද නොහොත් ඒතාක් කල් ඔවුන් අතුරෙහි පවතිත්ද

යම්තාක් කැපවේද, කැපනොවේදැයි කුක්කුච්චසඞ්ඛ්‍යාත විප්‍රතිසාරය, වෙහෙසීම විචිකිච්ඡාසඞ්ඛ්‍යාත මනොවිලෙඛය තෙමේද, උපදීමය නොහොත් 'යාවදෙව' යනු අතිශයින් නිශ්චය කිරීමය. '**තස්ස සංවත්තන්ති**' යන මේ හා සම්බන්ධ වේ. කුකුස් පිණිස චිත්ත පීඩාව පිණිස චිත්තසංසය පිණිස බොහෝසෙයින් පවතිත්මැයි කියනලද්දේවේ. '**උපසම්පන්නස්ස විනයං විවණ්ණෙන්ති**' උපසම්පන්නයකු වෙත ඔහුට මේ විනයයෙහි විමති උපදවනු කැමැත්තේ විනයෙහි නුගුණ කියයි. නින්ද කරයි. ගරහයි. මෙහි සෙස්ස ප්‍රකටයමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

දෙවන විලෙඛනශික්ෂාපදයයි

——||——

තෘතීයශික්ෂාපදයෙහි- '**අන්වද්ධමාසං**' අනු පිළිවෙළින් අඩමසක් අඩමසක් පාසා. යම්හෙයකින් ඒ ප්‍රාතිමොක්ෂය තෙමේ උපොසථ දිනයෙහි උදෙසනු ලැබේද, එහෙයින් '**අනුපොසථික**'යි පදභාජනයෙහි වදරනලදී. '**උද්දිස්සමානෙ**' උදෙසනු ලබන කල්හි, යම්හෙයකින් වනාහි ඒ ප්‍රාතිමොක්ෂය තෙමේ පාමොක් උදෙසන්නහු විසින් උදෙසනු ලබන කල්හි උදෙසනු ලබන්නේ නම් වේද එහෙයින් '**උද්දිස්සන්තෙ**'යි පදභාජනයෙහි වදරනලදී. '**යං ච තත්ථ ආපත්තිං ආපන්නො**' ඒ පුරුදුවූ අනාචාරයෙහිදී යම් ඇවැතකට පැමිණියේ ද, ඒ ය. '**යථා ධම්මො කාරෙතබ්බො**' නොදැනීමෙන් පැමිණි බැවින් ඒ ඇවැතින් මිදීමෙක් නැත්තේය. යම්සේ වනාහි ධර්මවිනය සිටියේද, එසේ කරවිය යුත්තේය. දෙසීමෙන් පිරිසිදු වන ඇවැතකට පැමිණියේ නම් දෙසවිය යුත්තේය. අඛ්‍යාතකර්මයෙන් පිරිසිදුබවට පැමිණෙන ඇවැතකට පැමිණියේ නම් එයින් නංවාලිය යුත්තේය යන අර්ථයි. '**සාධුකං**' මනාකොට '**අට්ඨිකත්වා**' අර්ථි කොට ප්‍රයොජන ඇත්තෙක්යැයි කියනලද්දේ වේ. '**ධම්මකම්මෙ**' යනාදිතන්හි මොහාරොපණ කර්මය අදහස් කරනලදී. මෙහි සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

තෙවන මොහනශික්ෂාපදයයි.

——||——

චතුත්ථ ශික්ෂාපදයෙහි - **'පහාරං දෙන්ති'** ඇවැත්ති' පුවුවක් පනවවු, පා දේනා පැන් ආදිය ගෙණෙවු, යනාදිය කියා සප්තදශවර්ගික භික්ෂූන්ට සප්තදශවර්ගික භික්ෂූහු පහර දෙත්. **'පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස''** මෙහි පහර දෙනු කැමැති බැවින් පහර දුන් කල්හි මැරේද, පාචිත්තියටම පැමිණේමය. දෙනලද පහර කරණකොට අත හෝ පය හෝ බිඳේද, හිස හෝ සිදුරු වේද, පාචිත්තියටම පැමිණේ. 'යම්සේ මෙතෙමේ සහමැද නොබබලාද, ඔහුට එසේ කරන්නෙමි'යි මෙසේ විරූප කරන අදහසින් කණ හෝ නාසය හෝ සිඳීද, දුක්කටය වේ. **'අනුපසම්පන්නස්ස'** ගිහියකුට හෝ පැවිද්දකුට හෝ ස්ත්‍රියක පහරදේද, සඞ්ඝාදිසෙසය වේ. **'කෙන චි විහෙඨියමානො'** මිනිසකු විසින් හෝ තිරිසන්ගියකු විසින් හෝ වෙහෙසනු ලබන්නේ. **'මොක්ඛාධිප්පායො'** එයින් තමන්ගේ මිදීම පතමින්. **'පහාරං දෙති'** කාය ප්‍රතිබද්ධ-නිස්සග්ගිය යන මොවුන්ගෙන් එක්තරා එකෙකින් පහර දේද, ඇවැත් නොවේ. ඉදින් අතරමගදී වෙසෙනු කැමැතිවූ සොරකු හෝ පසමිතුරකු හෝ දැක 'උපාසක' මෙහි ම සිටුව, නොඑව,යි කියා, ඒ වචනය නොගෙණ නොසලකා එන්නහුට 'කොල' යව,යි මුගුරකින් හෝ අතින් හෝ පරහ දී යේද, හෙතෙමේ ඒ පහරින් මැරේද, ඇවැත් නොවේ. ව්‍යාල මෘගයන් කෙරෙහිද, මේ නයම වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. මේ ශික්ෂාපදයාගේ සමුත්ථානාදීහු ප්‍රථමපාරාජික ශික්ෂාපදය සමාන වෙත්. මේ ශික්ෂාපදය වනාහි දුඃඛවෙදනයි.

සිවුවන පහාරශික්ෂාපදයයි.

—||—

පඤ්චම ශික්ෂාපදයෙහි - **'තලසත්තිකං උග්ගිරන්ති'** පහරදෙන අයුරු දක්වා කයද කයපිළිබඳයක්ද නගත්. **'තෙ පහාරසමුච්චිතා රොදන්ති'** පහරකා පුරුදුවූ ඒ සප්තදශවර්ගික භික්ෂූහු පෙරද ලද පහර ඇති බැවින් දැනුදු පහර දෙන්නාහුය'යි සිතමින් හඬත්, යන අර්ථයි. **'පහාරස්ස මුච්චිතා'**'යිද හදරත්. එහි පහරින් බිය ඇත්තාහ යන අර්ථයි. **'උග්ගිරති ආපත්ති පාචිත්තියස්ස'** මෙහි නගා වැරදී පහර දේද, එකාන්තයෙන් දරන්නට නොහැක්කහුගේ පහර වහා වදීද, පහර නොදෙනු කැමැති බැවින් දුන් බැවින් දුක්කටය වේ. ඒ පහරින් අත් ආදීන් අතුරෙහි යම් කිසිවක් බිඳේද, දුක්කටයම වේ. **'මොක්ඛාධිප්පායො තලසත්තිකං උග්ගිරති'** මෙහි පෙර කියූ වස්තූන් අතුරෙහි පෙර නයින්ම අත්පා නගන්නහුට ඇවැත් නොවේ. ඉදින්

වැරදී පහර දේනම් ඇවැත් නොවේමය. සමුට්ඨානාදිය සමග සෙස්ස පළමු ප්‍රහාරශික්ෂාපදය සමානම වේ.

පස්වන තලසත්තික ශික්ෂාපදයය

——॥——

**ෂෂ්ඨශික්ෂාපදයෙහි**- **'අනුද්ධංසෙන්ති'** ඒ ෂඩ්වර්ගික භික්ෂූහු තුමූ ආකීර්ණ දෙෂ ඇති බැවින් 'මෙසේ ඇති කල්හි භික්ෂූහු අපට චොදනා කරන්නාහුය, ඇවැත සිහි නොකරවන්නාහුය, ආත්මාරක්ෂාව කරමින් පළමු කොටම භික්ෂූන්ට අමූලික සඞ්ඝාදිසෙසයෙන් චොදනා කරත්. මෙහි සෙස්ස තෙරසකසඞ්ඝාදිසෙසකාණ්ඩයෙහි අමූලකශික්ෂාපදයෙහි කියූ නය ඇති බැවින් ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සවන අමූලකශික්ෂාපදයයි

——॥——

සප්තම ශික්ෂාපදයෙහි **'උපදහන්ති'** උපදවත්. **'කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස'** වචනයක් වචනයක් පාසා පාචිත්තියාපත්තියි. **'අනුපසම්පන්නස්ස'** හෙරණක්හට 'තා, මාගමක සමග රහසිව හිඳිනලද්දේය, නිදනලද්දේය කනලද්දේය. බොන ලද්දේය. සඟමැද මේ මේ කරනලදැයි මේ ආදිනයින් කුකුස් උපදවාද වචනයක් වචනයක් පාසා දුක්කට වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහුද අමූලකශික්ෂාපදය හා සමානම වූවාහුය.

සත්වන සඤ්චිච්චශික්ෂාපදයයි

——॥——

අෂ්ටම ශික්ෂාපදයෙහි- **'අධිකරණජාතානං'** මේ භණ්ඩනාදිය කරණකොට උපන් විවාදධිකරණය ඇත්තවුන්ගේ **'උපස්සුතිං'** බස් ඇසෙන තරම් සමීපයෙහි. යම් තැනක සිට ඔවුන්ගේ බස් අසන්නට හැකි වේද, එහිය යන අර්ථයි. **'ගච්ඡති ආපත්ති දුක්කටස්ස'** මෙහි විවාදයට පැමිණි භික්ෂූහු කුමක් කියත්දැයි අසනු පිණිස යන මහණහුට පියවරක් පියවරක් පාසා දුක්කට වේ. **'මේථෙන්තානං'** අනිකකු සමග අනිකකු මන්ත්‍රණය

කරන කල්හි '**මනොතනොත**'යි හෝ පාඨයෙක් වේ. මේ අත්‍ර්ථමැයි '**වූපසමෙස්සාමි**' සංසිඳීමට යන්නෙමි. කලහ නොකරන්නෙමි. '**අත්තානං පරිමොචෙස්සාමි**' තමන්ගේ අකාරකභාවය කියා තමන් මුදන්නෙමි. මෙහි සෙස්ස ප්‍රකටමය. ථෙය්‍යසත්ථසමුට්ඨානිකය. කාය චිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. සිටිතැනට අවුත් මන්ත්‍රණය කරන්නාවුන්ට නොදැන්වීම් වසයෙන් කිසිකලෙක අක්‍රියසමුට්ඨානය රූපියශික්ෂාපදය, අඤ්ඤවාදක ශික්ෂාපදය, උපස්සුති ශික්ෂාපදය යන මේ ශික්ෂාපද තුන කිසි කලෙක ක්‍රියාවෙන්ද, කිසිකලෙක අක්‍රියාවෙන්ද සමුට්ඨානය වනබැවින් එක් පිරිසිඳීමක් ඇත්තේය. සංඥවිමොක්ෂය සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

අටවන උපස්සුති ශික්ෂාපදයයි

—||—

නවමශික්ෂාපදයෙහි- '**සවෙ ච මයං ජානෙය්‍යාම**' ඉදින් අපි දන්නමෝ නම්. චකාරය නිපාත මාත්‍රයෙක්මය. '**ධම්මිකානං**' ධර්‍මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් කළ බැවින් ධර්‍මයෝ මොවුන් කෙරෙහි ඇත්තාහයි, ධම්මිකනම්. ධාර්මිකවූ සිවුවැදෑරුම්වූ ඒ සඞ්ඝකර්‍මයන්ගේ '**ඛීයති ආපත්තිපාචිත්තියස්ස** මෙහි වචනයක් වචනයක් පාසා පාචිත්තිය වේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය . ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

නවවනකම්මපටිබාහන ශික්ෂාපදයයි

—||—

දශමශික්ෂාපදයෙහි - '**වත්ථුං වා ආරොචිතං**' චොදකයා විසින්ද චුදිතකයා විසින්ද තම තමන්ගේ කථා නොමෝ කියනලදද, අනුවිජ්ජක තෙමේ සම්මත කරනලදද, මෙපමණකින් වස්තුවම සැලකරනලද්දේවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙප සමුට්ඨානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. ක්‍රියාක්‍රියසමුට්ඨානයි. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

දසවන ඡන්දං අදත්වා ගමන ශික්ෂාපදයයි

—||—

එකාදශම ශික්ෂාපදයෙහි - **'යථාමිත්තතා'** යහලු කම් ලෙසින් 'යමෙක් මා සමග මිත්‍රවේනම්, ඔහුට, ඔහුට දෙව'යි කියනලද්දේවේ. සියලු පදයන්හි මේ නයවේ. සෙස්ස උජ්ඣාපනකාදි ශික්ෂාපදයන්හි කියූ නය ඇති බැවින් ප්‍රකට අර්ථ ඇත්තේමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

එකොළොස්වන දබ්බශික්ෂාපදයයි

——\\——

ද්වාදශම ශික්ෂාපදයෙහි - යමක් කිය යුතුවන්නේද, ඒ සියල්ල තිංසක කාණ්ඩයෙහි පරිණාමන ශික්ෂාපදයෙහි කියූ නයමවේ. මේම වනාහි වෙනසවේ. ඒ පරිණාමන ශික්ෂාපදයෙහි තමාට පිරිනැමූ බැවින් නිස්සග්ගිය පාචිත්තිය වේ. මේ ශික්ෂාපදයෙහිලා පුද්ගලයාහට පිරි නැමූ බැවින් සුද්ධිකපාචිත්තියවේ. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙළොස්වන පරිණාමනශික්ෂාපදයයි

වර්ණනාක්‍රමයෙන් අටවැනිවූ සහධාර්මිකවර්ගීය නිමි.

——\\——

රාජවර්ගීය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'ඔරකො'** ස්වල්පමාත්‍රය. **'උපරි පාසාදවරගතො'** ප්‍රාසාදයෙහි මතු මහලට නැංගේ **'අයස්සාතං වාහසා'** ආයශීයන් කරණ කොට, ඒ ආයශීයන් විසින් දන්වනලද බැවින් දනිම්'යි කියනලද්දේවේ. **'පිතරං පස්සෙථාති'** සිදුරක් දැක නසන්නට කැමැතිවේ. **'රාජන්තෙපුරං හත්ථිසම්මද්දං'** යනාදිතන්හි ඇතුන් විසින් කරනලද මැඩීම මෙහි වේය'යි 'හත්ථිසම්මද්ද' නම. හස්තිසම්බාධය යන අර්ථයි. **'අස්සරථසම්මද්ද'** පදයෙහිද මේ නයමවේ. කිසි කෙනෙක් 'සම්මත'ය හදරත්. ඒ හැදෑරීම නොගතයුතුය. **'රඤ්ඤො අන්තෙපුරෙ හත්ථිසම්මද්දං'**'යි ද පාඨයෙක්වේ. එහි ඇතුන්ගේ මැඩීම 'හත්ථිසම්මද්දයි අර්ථයවේ. රජුගේ අන්තඃපුරරයෙහි ඇතුන්ගේ මැඩීම 'හත්ථිසම්මද්දයි අර්ථයවේ. රජුගේ අන්තඃපුරයෙහි ඇතුන්ගේ මැඩීමෙක් ඇත්තේයයි කියනලද්දේවේ. සෙසු පදයන්හිද මෙම නයය. 'රජ්ජනීයානි' ඒ අන්තඃපුරයෙහි මෙබඳු රූපාදීහුය. **'මුද්ධාවසිත්තස්ස'** මුදුනෙහි අභිෂෙකකරනලද. රජතෙමේ මෙයින් නොනික්මුනේයයි අනික්ඛන්තරාජක නම්. නොනික්මුනු රජ ඇති යහන්ගෙයි

යන අර්ථයි. මෙහෙසි තොමෝ රතනැයි කියනුලැබේ. නික්මුනෙ 'නිහත' නම. මෙහෙසිය මෙයින් නොනික්මුනී අනීහතරතනය. ඒ නොනික්මුනු මෙහෙසිය ඇති යහන්ගෙයි යන අර්ථයි. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨින සමුට්ඨානිකය. කායවාචායෙන්ද, කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාක්‍රිය සමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන රාජන්තෙපුරශික්ෂාපදයයි

—\\—

ද්විතීයශික්ෂාපදයෙහි - 'විස්සරිත්වා' තදින් සිහිමුළාවී පුණ්ණපත්තං පූර්ණපාත්‍ර නම් සියයෙන් පස්කහවණුය. 'ක්‍යාහං කරිස්සාමි' මම කුමක් කරන්නෙම්ද, 'ආභරණං ඔමුඤ්චිත්වා' නව කෙළක් අගනා මහලිය පලඳනාව ගලවා. 'අන්තෙවාසී' මෙහෙකරුවන්. 'අපරික්ඛිත්තස්ස උපචාරෙ' මෙහි උපචාර නම් ආරාමය පිළිබඳ ලෙඩ්ඩුපාත දෙකෙකි. ආවාසයෙහි වනාහි කුල්ල හෙලූ තැන හෝ මෝල හෙලූ තැන හෝ යයි මහාපච්චරියෙහි කියනලදී. 'උග්ගණ්හාති ආපත්ති පාචිත්තියස්ස' මෙහි රත්රිදීමසු කහවණු තමන්ගේ ප්‍රයොජනය පිණිස ගන්නා මහණහුට හා ගන්වන මහණහුටද නිස්සග්ගියපාචිත්තිය වේ. සඞ්ඝ ගණ පුද්ගල චෛත්‍යනවකර්මාන්ත පිණිස ගන්නා මහණහුට දුක්කටය වේ. කප්පියවස්තුවක් හෝ වේවා, අකප්පියවස්තුවක් හෝ වේවා. යටත්පිරිසයින් මවුගේ කන්පලඳනාවක් හෝ ගිහියන් සතුවූ තල්පතක් හෝ භාණ්ඩාගාරික ශීර්ෂයෙන් රක්නා මහණහුට පාචිත්තියම වේ. ඉදින් මවුපියන් සතු ඒකාන්තයෙන් රැකිය යුතුවූ කැප බඩුවක්වේද, තමන්ගේ ප්‍රයොජනය පිණිස ගෙණ රැකිය යුතුය. 'මෙය රැක දෙව'යි කියූ කල්හි නොවටීයයි ප්‍රතික්ෂෙප කටයුතුය. ඉදින් රකුව'යි හෙළා යෙත්ද, මෙය පළිබොධයෙක් නම්වේ. රකින්නට වටියි. විහාරයෙහි කර්මාන්ත කරන්නාවූ වඩු ආදීහු හෝ රජුට ප්‍රියවූවෝ හෝ තමන්ගේ උපකරණ භාණ්ඩයක් හෝ යහන් බඩුවක් හෝ රැක දෙවු'යි කියත්ද, වඩුආදීන් කෙරෙහි ආලයෙන්ද රාජප්‍රියාදීන් කෙරෙහි බියෙන්ද, නොකටයුත්තේමය. ගුප්තස්ථානයක් දැක්වීම වටියි. බලාත්කාරයෙන් හෙලා ගියකල්හිද රැකීම වටියි. 'අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා' යන මෙහි ඉදින් අනුරාධපුර මහාවිහාරය සමානවූ මහත් ආරාමයෙක්වේද, එහි පවුරෙන් වටකළ පිරිවෙණෙහි යම් කිසි තැනක භික්ෂූන් විසින් හෝ භෙරණුන් විසින් හෝ ගන්නාලද්දේ වන්නේයයි සැකයක් උපදී නම්, එබඳුම තන්හි ගෙණ හෝ අන්හු ලවා ගන්වා හෝ

තැබිය යුතුය. අනුරාධපුරයෙහි මහබෝදෙර කොටුව අම්බඞ්ගණය සමානවූ මහාජනයා හැසිරෙන තන්හිදී නොගතයුතුය. **කුරුන්දියෙහි** වනාහි තනිව මග යනුයේද, මිනිසුන් නැති තැන්හි කිසි බඩුවක් දකීද, මිනිසුන්ගෙන්ද, ගැවසී ගත්කල්හි මිනිස්සු එම මහණහු ගැණ සැක කෙරෙත්ද, එහෙයින් මගින් ඉවත්ව හිඳිය යුතුය. හිමියන් ආකල්හි ඒ බඩු කියයුතුය. දැක්විය යුතුය. ඉදින් හිමියන් නොදක්තේ නම්, සුදුස්සක් කරන්නේය'යි කියනලදී. '**රූපෙන වා නිමිත්තෙන වා සඤ්ඤාණං කත්වා**' යන මෙහි රූප නම්, පොදිය තුළ තිබෙන බඩුවයි. එහෙයින් පොදිය මුද, ලිහා ගණන් කොට මෙපමණ කහවණු හෝය. මෙපමණ රන්රිදී හෝ යි සලකා සැලකිය යුතුය. නිමිත්ත යනු සලකුණු ආදියය. එහෙයින් සලකුණු කළ බඩු පොදියෙහි මැටියෙන් මුද්දර ගැසීමකැයි හෝ, ලාකඩයෙන් මුද්දර තැබීමකැයි හෝ, නිල් රෙදිකඩකින් බඩුපොදිය බඳිනලදැයි හෝ සුදුරෙදි කඩකින් බඳිනලදැයි හෝ, යන මේ ආදි සියල්ල සැලකිය යුතුය. '**භික්ඛු පතිරූපා**' ලජ්ජා ඇතියෝය. කුකුස් ඇතියෝය. ලොල් සැහැවි ඇති මහණුන්ගේ අතෙහි තබන්නට නොලබයි. යම් මහණෙක් වනාහි තමන් වසන ඒ ආවාසයෙන් නොම යේද, හිමියන් නොදකීද, ඔහු විසිනුදු තමන්ගේ සිවුරු ආදි මිලයක් නොකටයුතුය. සථිරවූ සෙනාසනයක් හෝ චෛත්‍යයක් හෝ පොකුණක් හෝ කරවිය යුතුය. ඉදින් බොහෝ කලක්හුගේ ඇවෑමෙන් හිමියා ඒද, 'උපාසක' තා සතුදෙයින් මෙනම් වැඩක් කරනලදය, අනුමෝදන් වෙව'යි කියයුතුය. ඉදින් අනුමෝදන් වේනම්, මෙසේ මේ කරුණ මැනැව. අනුමෝදන් නොවේනම් 'මාගේ ධනය දෙව'යි චොදනා කෙරේමය. අනිකකු සමාදන් කරවා දියයුතුය. '**රතනසම්මතං විස්සාසං ගණ්හාති**' යනාදිතන්හි ආමෂණය කටයුතු දෙයම සඳහා කියනලදී. ආමෂණය නොකටයුතු දෙය ගන්නට නොවටියි. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙවන රතනශික්ෂාපදයයි

—॥—

තෘතියශික්ෂාපදයෙහි- '**තිරච්ඡානකථං**' ආයතීමාර්ගීය වළහන කථාව. '**රාජකථං**' මහාමන්ධාතු ධර්මාශොකාදිරජුන් ඇරැබැ පැවැති කථාව. චොරකථාදීන්හිද මේ නයමවේ. '**සන්තං භික්ඛුං**' යන මෙහි යමක් කියයුත්තේද, ඒ කියයුත්ත චාරිත්‍ර ශික්ෂාපදයෙහි කියනලද නයමය. ඉදින් බොහෝ භික්ෂූහු කිසි කටයුත්තක් හෙතුකොට ගමට පිවිසෙත්ද,

'විකාලෙ ගාමප්පවෙසනං ආපුච්ඡිස්සාමි'යි සියල්ලන් විසින් ඔවුනොවුන් විචාරිය යුත්තේය. ඒ ගමෙහිදී ඒ කෘත්‍යය නොසැපයේයයි අන්ගමකට යෙත්ද ගම් සියයක් නමුදු වේවා, නැවැත විචාරණකෘත්‍යයෙක් නැත්තේය. උත්සාහය සංසිඳුවා වෙහෙරට යනුවෝ අතර අන් ගමකට පිවිසෙනු කැමැත්තාහු වෙත්ද, නැවැත විචාරිය යුත්තේමය. කුලගෙයක හෝ අසුන්හලෙක හෝ බත්කිස කොට තෙල් සිඟනු පිණිස හෝ ගිතෙල් සිඟනු පිණිස හෝ හැසිරෙනු කැමැත්තේ වේද, පියවිබස් ඇසීමට සුදුසු පසෙක්හි මහණෙක් ඇත්තේද, විචාරා යායුතුය. නැතිකල්හි නැතැයි යායුතුය. වීථියට බැසීමෙන් පසු මහණකු දකීද, විචාරීමෙක් නැත්තේය. නොවිචාරාද හැසිරිය යුතුමය. ගම මැදින් මගෙක් වේද, ඒ මගින් යන මහණහුට තෙල් ආදිය සිඟීම පිණිස හැසිරෙන්නෙමි'යි සිතක් උපන් කල්හි පියවිබස් ඇසෙන තැනක මහණෙක් ඇත්තේනම්, විචාරා හැසිරිය යුතුය. මගින් බැහැර නොව පිඬුපිණිස හැසිරෙන මහණහුට විචාරීමෙක් නැත්තේය. වට නොකළ ගමෙහි උපචාරය අදින්නාදන ශික්ෂාපදයෙහි කියුනයින්ම මෙහි දෙවන ලෙඩ්ඩුපාතයයි දතයුතුය. '**අඤ්ඤතරාරාමං**' යනාදිතන්හි හුදෙක් නොවිචාරා යෑමෙන් පමණක් අනාපත්ති නොවේ. පටිය නොබැඳ සඟළසිවුර නොපොරොවා යන මහණහුටද ඇවැත් නොවේ. '**ආපදාසු**' යන මෙහි සිංහයෙක් හෝ ව්‍යාඝ්‍රයෙක් හෝ ඒ ද, මෙඝය හෝ නගීද, අන්කිසි උපද්‍රවයෙක් හෝ උපදීද, ඇවැත් නොවේ. මෙබඳු ආපදවන්හි පිටතගමින් ඇතුළුගමට පිවිසෙනු වටියි. සෙස්ස ප්‍රකටමය. කඨින සමුට්ඨානිකය. කායවාචායෙන්ද කායවාචාචිත්තයෙන්ද, හටගණියි. ක්‍රියාක්‍රියසමුට්ඨානය නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන විකාලෙ ග්‍රාමප්‍රවෙශන ශික්ෂාපදයයි.

——\\——

චතුර්ථශික්ෂාපදයෙහි - බිඳීමම භෙදනක නම. ඒ බිඳීම මේ පාචිත්තියට ඇත්තේයයි භෙදනකමවේ. '**අරණිකෙ**' ගිනිදඬු දූන්නෙහි. '**වීධෙ**' පටියෙහි මුවපිට සටුනා ගැටයෙහි මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සිවුවන සූචිඝර ශික්ෂාපදයයි

——\\——

පඤ්චමශික්ෂාපදයෙහි - **'ඡේදනකං'** යනු කියූ නයමය. පමණ ඉකුත් කොට කරන කරවනලද ඇඳපුටු ආදීන්ගේ සිඳීම ඇති) **'ඡින්දිත්වා පරිභුඤ්ජති'** මෙහි ඉදින් පමණ ඉකුත්වූ උස ඇති ඇඳපුටු නොසිඳිනු කැමැත්තේ වේද, බිම කැන වැඩිපමණ බිම යටලා තියම පමණ මතුවෙහි දක්වයි. උඩුකුරු හෝ කොට පරිභොග කෙරේද, ඔසොවා හෝ මැස්සක තබා අටල්ලක් කොට පරිභොග කෙරේද, සියල්ල වටියි. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුට්ඨානිකය.

පස්වන මඤ්චපීඨ ශික්ෂාපදයයි

—||—

ෂෂ්ඨශික්ෂාපදයෙහි - පුලුන් දමා මසනලද්ද, මේ ඇඳපුටුවලැයි තුලොනද්ධ සම් යටකඩරෙදි අතුරා පුලුන් බහා මතුවෙහි කඩරෙද්දකින් මසනලද්දේය'යි කියනලද්දේ වේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුට්ඨානිකය.

සවන තුලොනද්ධශික්ෂාපදයයි

—||—

සප්තමශික්ෂාපදයෙහි - **'නිසීදනං අනුඤ්ඤාතං හොති'** කොතැන්හිදී අනුදන්නා ලද්දේද, යත්:- චීවරස්කන්ධකයෙහි පණීතභොජන වස්තුවෙහිදී අනුදන්නාලදී. ඒ ප්‍රණීත හොජන වස්තුවෙහිදී 'මහණෙනි' කායගොපනය පිණිස චීවරගොපනය පිණිස සෙනාසන ගොපනය පිණිස නිසීදනචීවරය අනුදනිමි'යි. වදරනලදමය. **'සෙය්‍යථාපි පුරාණාසි කොට්ඨො'** පැරණි සම්කරුතෙමේ යම්සේද, එසේය යන අර්ථයි. යම්සේ වනාහි සම්කරු තෙමේ සම පලල් කරන්නෙමි'යි එහා මෙහා එලාද, අදීද, මෙසේ ඒ උදයි ස්ථවිර තෙමේද, ඒ නිසීදනය (එහා මෙහා ඇද්දේය) එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ඕහට මෙසේ වදළසේක. **'නිසීදනං නාම සදසං වුච්චති'** ඇතිරිය සමානව අතුරා එක් කෙළවරක සුගත්වියතින් වියතක් පමණ පෙදෙසෙහි දෙතැනෙක්හි පලා දවලු තුනක් කරනුලැබේ. ඒ දවලු කරණකොට සදස නමැයි කියනු ලැබේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුට්ඨානිකය.

සත්වන නිසීදන ශික්ෂාපදයයි

—||—

අෂ්ටමශික්‍ෂාපදයෙහි - **'කණ්ඩුපටිච්ඡාදි අනුඤ්ඤාතා හොති'** කොතැන්හිදී අනුදන්නා ලද්දේද, යත්:- චීවරක්ඛන්ධකයෙහි **බෙලට්ඨසීස** වස්තුවෙහිදීය. එහි 'මහණෙනි' යම් මහණක්හට කැසීමෙක් හෝ පිළිකා හෝ අරිසස් භගන්දරා ප්‍රමෙහාදීන්ගේ වසයෙන් ලේ වැගිරීමෙක් හෝ මහ කුෂ්ට ආබාධයෙක් හෝ වේද, කුෂ්ට පිළිසන ඒ මහණහුට අනුදනිම්'යි වදරන ලදමය. **'යස්ස අධොනාභි උබ්භජාණු මණ්ඩලං'** යම් මහණක්හුගේ නැබෙන් යට, දණමඩලින් උඩ **'කණ්ඩු'** කැසීමය. **'පිළිකා'** ලේවන් තුඩු ඇති සියුම් පිළිකාය. **'අස්සාවො'** අරිසස් භගන්දරා මධුමෙහාදීන්ගේ වසයෙන් හෝ අශුචි වැගිරීමය. **'ථුල්ලකච්ඡු වා ආබාධො'** මහාපිළිකාබාධය කියනුලැබේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය.

අටවන කණ්ඩුපටිච්ඡාදිශික්‍ෂාපදයයි

——\\——

නවම හික්‍ෂාපදයෙහි **'වස්සිකසාටිකා අනුඤ්ඤාතා හොති'** කොතැන්හිදී අනුදන්නාලද්දේද, යත්: චීවරක්ඛන්ධකයෙහි **විශාඛා** වස්තුවෙහිදීය. එහි 'මහණෙනි' වැසිසළුසිවුර අනුදනිම්'යි වදරනලදමය. මෙහි සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය.

නවවන වස්සිකසාටිකශික්‍ෂාපදයයි

——\\——

දශමශික්‍ෂාපදයෙහි - **'චතුරඞ්ගුලොපමො'** සතරඟුලකින් අඩුපමණ ඇත්තේය. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුත්ථානිකය.

දසවන නන්දත්ථෙර ශික්‍ෂාපදයයි

වර්‍ණනා ක්‍රමයෙන් නවවැනිවූ රාජවර්‍ගීය නිමි.

——\\——

**'උද්දිට්ඨා ඛො'** යනාදිය කියූ නයමවේ.

——\\——

විනයවිවෘති

නම්වූ

සිංහලසමන්තපාසාදිකාවෙහි ඛුද්දකවර්‍ණනා නිමි.

පාටිදෙසනියා ධම්මා - ඛුද්දකානං අනන්තරා
ඨපිතා යෙ අයන්දානි - තෙසං භවති වණ්ණනා

ක්ෂුද්‍රක වස්තූන්ට අනතුරුව තබනලද යම් පාටිදෙසනීය ධර්මකෙනෙක් වෙත්ද, දැන් ඒ පාටදෙසනීයයන්ගේ මේ වර්ණනා තොමෝ වන්නීය.

එහි ප්‍රථම පාටිදෙසනීයයෙහි පළමුකොට '**පටික්කමනකාලෙ**' පිඬු පිණිස හැසිර පෙරළා එන කල්හි. '**සබ්බෙව අග්ගහෙසි**' සියල්ලම ගත්තේය. '**පවෙධෙන්ති**' වෙවුලන්නී. '**අපෙහි**' පහවෙව. '**ගාරය්හං ආවුසො**' යනාදිය පිළිදෙසිය යුතු ආකාරය දැක්වීමය. '**රථිකා**' වීථිය. "**බ්‍යූහං**' විනිවිද නොගොස් සිටි ගියවුන් විසින් පසු ආයුතු වීථිය '**සිඞ්ඝාටකං**' සිවුකොණක් හෝ ඇති තුන් කොණක් හෝ ඇති මග එක්වූ තැන. '**ඝරං**' කුලගෙය මොවුන් අතුරෙහි යම්කිසි තැනක සිට නොනෑමෙහෙණ අතින් යම්කිසි කෑයුත්තක් බිදියයුත්තක් ගන්නා මහණහුට ගැණීම නිමිතිකොට දුක්කටය වේ. අනුභව කිරීම නිමිතිකොට අනුභව කරන පිඬු ගණනින් පාටිදෙසනීයාපත්තිය වේ. ඇත්හල් ආදියෙහිදී ගන්නා මහණහුටද මෙම නයයි. මෙහෙණක් තොමෝ වීථියෙහි සිට දේද, මහණතෙමේ ඇතුළු අරම් ආදියෙහි සිට ගණීද, පාටිදෙසනීයාපත්තිය වන්නීමය. '**අන්තරඝරං පවිට්ඨාය**'යි කී බැවින් ගමෙහි සිට දෙන මෙහෙණකගේ වසයෙන් මෙහි ආපත්ති තොමෝ දතයුත්තීය. මහණහු සිටිතැන වනාහි පමණ නොවේ. එහෙයින් ඉදින් වීථී ආදියෙහි සිටි මහණ තෙමේ ඇතුළු අරම් ආදියෙහි සිට දෙන මෙහෙණකගේ අතින් ගණීද, ඇවැත් නොවන්නීමය. යාමකාලිකය, සත්තාහකාලිකය, යාවජීවිකය ආහාර පිණිස පිළිගණීද, දුක්කටයට පැමිණීම වේ. '**අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස**' යන මෙය ආමිසය සමග මිශ්‍ර නොවූ දෙය සඳහා කියනලදී. ආමිසය සමග මිශ්‍රවූ එක් රසයෙහි පාටිදෙසනීයම වේ. '**එකතො උපසම්පන්නාය**' මෙහෙණන් වෙත උපසපතියකගේ. මහණුන් වෙත උපසපතියකගේ අතින් පිළිගන්නා මහණහුට යථාවස්තුකම වේ. හෙවත් පාටිදෙසනීයාපත්තිය වේමය. '**දාපෙති න දෙති**' නොනෑමෙහෙණක් තොමෝ අන් කිසිවකු ලවා දෙවයි. එය ගන්නා මහණහුට ඇවැත් නොවේ. '**උපනික්ඛිපිත්වා දෙති**' අතින් අතට නොදී බිම තබා 'ආයයීය' මෙය ඔබ වහන්සේට දෙමි'යි දේද, මෙසේ දුන් දෙය, 'මැනැව නැගනියෙනි'යි කියා පිළිගෙණ එම මෙහෙණ ලවා හෝ අන් කිසිවකු ලවා හෝ පිළිගන්වා ගෙණ වැළඳීම වටියි. '**සික්ඛමානාය සාමණෙරාය**' දෙන්නාවූ මේ සික්ඛමානා සාමණේරී යන මොවුන්ගේ අතින් ගන්නා මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය.

ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන පාටිදෙසනීය ශික්ෂාපදයයි.

——||——

ද්විතීයශික්ෂාපදයෙහි - **'අපසක්ක තාව භගිනි'** යනාදිය පහකට යුතු ආකාර දැක්වීමය. **'අත්තනො භත්තං දාපෙති න දෙති'** මෙහි ඉදින් මෙහෙණ තමාගේ බත් දේද, මේ ශික්ෂාපදයෙන් ඇවැත් නොවේ. පළමු පාටිදෙසනීය ශික්ෂාපදයෙන් ඇවැත්වේ. **'අඤ්ඤස්ස භත්තං දෙති න දාපෙති'** මෙහි ඉදින් දෙවා නම් මේ ශික්ෂාපදයෙන් ඇවැත් වන්නීය. දෙන්නියට වනාහි මේ ශික්ෂාපදයෙන් ඇවැත් නොවන්නීමය. පළමු ශික්ෂාපදයෙන්ද ඇවැත් නොවන්නීය. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙවන පාටිදෙසනීය ශික්ෂාපදයයි

——||——

තෘතීයශික්ෂාපදයෙහි - **'උභතො පසන්නං'** උපාසකයා විසින්ද, උපාසිකාව විසින්ද යන දෙදෙන විසින් රත්නත්‍රයට පැහැදුනේය. ඒ කුලයෙහි ඒ අඹුසැමි දෙදෙනම සෝවාන් වූවෝමය. **'භොගෙන හායති'** මෙබඳු කුලය වනාහි අඩුකෙළක් ධනය ඇත්තේවේද, භොගයෙන් පිරිහේමය. කුමක් හෙයින, යත්:- යම් හෙයකින් ඒ කුලයෙහි උපාසිකා තොමෝ භොගයක් නොමරක්නීය. උපාසක තෙමේ නොරක්නේය. **'ඝරතො නීහරිත්වා දෙන්ති'** අසුන්හලට හෝ වෙහෙරට හෝ ගෙණවුත් දෙත්ද, මහණකු නොආකල්හි පළමු කොටම ගෙයින් බැහැර කොට දෙරකඩ තබා පසුව පැමිණි මහණහුට දෙත්ද වටියි. මහණකු දැක ගේතුළින් බැහැර කොට දෙනුලබන්නක් නොවටීයයි මහාපච්චරියෙහි කියනලදී. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන පාටිදෙසනීය ශික්ෂාපදයයි

——||——

චතුත්ථ ශික්ෂාපදයෙහි - '**අවරුද්ධා හොන්ති**' ප්‍රතිවිරුද්ධයෝ වෙත්. '**පඤ්චන්නං පටිසංවිදිතං**' පස් සහදැහැමියන් අතුරෙහි යම්කිසිවක් යවා කැයුත්තක් හෝ බිදියයුත්තක් හෝ ගෙණ එන්නෙමු'යි පළමු කොට දැන්වීමෙක් කරනලදද පළමු නොදන්වන ලද්දේමය, යන අර්ථයි. '**ආරාමං ආරාමූපචාරං ඨපෙත්වා**' අරණ්‍යසෙනාසනාරාමයද, ඒ ආරාමයාගේ උපචාරයද තබා අතරමගදී උපචාරයෙන් නික්මුනු මහණකු දැක හෝ ගමට ආවකුහට හෝ පළමුකොට දැන්වීමෙක් කරනලද්දේද, පළමුකොට නොදන්වන ලද්දේම වේයයි දතයුතුය. '**සචෙ සාසඞ්කං හොති සාසඞ්කන්ති ආවිකාතබ්බං**' ඉදින් සැකසහිත වේද, සැකසහිතය'යි කියයුත්තේය. කුමක් හෙයින් කියයුත්තේද යත්: ආරාමයෙහි සොරකු වසන කල්හි අපට නොසැලකරත්ය, යන කීමෙන් මිදීම පිණිසය. 'මිනිස්සු මෙහි සමීපයෙහි හැසිරෙත්'යි සොරහු කියයුත්තාහ. කුමක් හෙයින් කියයුත්තාහුද, යත්: තමන්ගේ උපස්ථාකයන් ලවා අප ගන්වත්ය යන කීමෙන් මිදීම පිණිසය. '**යාගුයා පටිසංවිදිතෙ තස්සා පරිවාරො ආහරීයති**' කැඳෙන් පළමු දන්වනලද්දක් කොට 'කිම, පිරිසිදු කැඳක් දුන් කල්හි, පූව හා බත්ද මේ කැඳට පිරිවරකොට දෙන්නෙමු'යි මෙසේ යම් කිසිවක් ගෙණ එත්ද, සියල්ල පළමුව දන්වන ලද්දේම වේ. '**භත්තෙන පටිසංවිදිතෙ**' යනාදි තන්හිද මේනයමවේ. අසුවල් නම් කුලය පළමු දන්වනලද්දක් කොට කැයුතුදෙය ආදිය ගෙණ යේයයි අසා ඒ හා සමග තමතමන්ගේ අතිකුදු දියයුතුදෙය ගෙණ එත්ද, වටියි. කැඳෙන් පළමු දැන්වීම කොට පූප හෝ බත් හෝ ගෙණ එත්ද, මෙද වටීය'යි **කුරුන්දියෙහි** කියනලදී.

'**ගිලානස්ස**' පළමු නොදැන්වීමෙහිද ගිලනාහට ඇවැත් නොවන්නීය. '**පටිසංවිදිතෙ වා ගිලානස්ස වාසෙසකං**' එකක්හට ප්‍රයොජනය පිණිස දැන්වීම කොට ගෙණ එන ලද්දේ, ඔහුගේ ඉතිරි සෙස්ස අනිකක්හටද, වලඳන්නට වටියි. සිවුදෙනකුට හෝ පස්දෙනකුට හෝ දැන්වීම කොට බොහෝ කැයුතු බිදිය යුතුදෙය ගෙණෙන ලද්දේ වේද, අන්‍යයන්ටත් දෙනු කැමැති වෙත්ද, මේ පළමු දන්වලද්දෙන් සෙස්සමය. මේ සියල්ලම වටියි. එකල්හි වැඩියක්ම වේනම් සන්නියාය මුද තබනලද්ද දෙවන දිනයෙහිද වටියි. ගිලනක් හට ගෙණ ඉතිරි දෙයෙහිද මේ නයමවේ. යමක් වනාහි පළමු නොදන්වන ලද්දක්ම කොට ගෙණෙන ලද්දේද, ඒ දෙය ආරාමයෙන් පිටත යවා දන්වනලද්දක් කරවා ගෙන්විය යුතුය. මහණුන් විසින් හෝ ගොස් අතරමගදී ගතයුතුය. යමක් වෙහෙර මැදින් යන්නෝ හෝ වනවරකාදීහු හෝ වනයෙන් ගෙණවුත් දෙත්ද, පෙරනයින්ම දැන්වීම කරවිය යුතුය. '**තත්ථ ජාතකං**' ආරාමයෙහි හටගන්නාවූම කැයුතු මුල් ආදියක් අනිකකු විසින් කැප කොට දෙනලද්දේද, ඒ දෙය

අනුභව කරන මහණුහුට ඇවැත්නොවේ. ඉදින් ද්‍රව්‍යය ගමට යවා පිස ගෙණ එත්ද, නොවටියි. දැන්වීම කරවිය යුතුය. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨිනසමුත්ථානික වේ. ක්‍රියාක්‍රියසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සිවුවන පාටිදෙසනීය ශික්ෂාපදයයි

—||—

විනයවිවෘති

නම්වූ

සිංහලසමන්තපාසාදිකාවෙහි පාටිදෙසනීය වර්ණනාව නිමි

—||—

යානි සික්ඛිතසික්ඛෙන - සෙඛියානීති තාදිනා
භාසිතානි අයංදානි - තෙසම්පි වණ්ණනාක්කමො

චතුර්විධ මාර්ගයෙන් ත්‍රිවිධශික්ෂාවෙහි හික්මුනාවූ මුළුමනින් නිමවූ කටයුතු ඇති අෂ්ටලොකධර්මයෙන් කම්පිත නොවන අර්ථයෙන් තාදීවූ භාග්‍යවතුන් වහන්සේ විසින් හික්මිය යුතුයයි යම් ධර්මකෙනෙක් වදරනලදදහුද, දැන් ඒ හික්මිය යුතු ධර්මයන්ගේද, මේ මතු ප්‍රකාශ වන්නේ වර්ණනා ක්‍රමයවේ.

ඒ සෙඛියාධිකාරයෙහි - '**පරිමණ්ඩලං**' හාත්පසින් වටකොට '**නාභිමණ්ඩලං ජාණුමණ්ඩලං**' නැබමඬලින් උඩ, දණමඬලින් යට. වසන්නහු විසින් දණමඬලින් යට දහ ඇටය පටන් අටඟුලක් පමණ අඳනය යටට බස්වා හැන්ද යුතුය. ඉන් පහත බස්වා හඳින මහණහුට දුක්කටයයි මහාඅර්ථකථාවෙහි කියනලදී. යම් පරිද්දෙකින් හුන්නහුගේ දණමඬලින් යට සතරඟුලක් පමණ ප්‍රතිච්ඡන්න වේයයි මහාපච්චරියෙහි කියනලදී. මෙසේ හඳින මහණහුට වනාහි හඳනය පමණ ඇතිව වටියි. එහි මේ පමණය: දිගින් මුෂ්ටිපංචකයෙකි. හෙවත් සිවුරියනක් හා එක් මිටි රියෙනෙකි. පළල දෙරියනක් පමණද දණමඬල වැසීම පිණිසවටියි. නැබමඬල සිවුරෙන්ද වසන්නට හැකිය. එහි එක් පටක් ඇති සිවුර මෙසේ හඳනාලද්දේද හැන්දාසේ නොසිටියි. දෙපට සිවුර වනාහි හැන්දසේ සිටියි. '**ඔලම්බෙන්තො නිවාසෙති ආපත්ති දුක්කටස්ස**' මෙහි හුදෙක් ඉදිරියෙන්ද, පස්සෙන්ද, එල්වා හඳින මහණහුටම පමණක් දුක්කටය නොවේ. 'තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහීනිවත්ථං නිවාසෙන්ති: හත්ථිසොණ්ඩකං මච්ඡවාළකං චතුක්කණ්ණකං තාලවණ්ටකං සතවලිකං නිවාසෙන්ති' යනාදිනයින් ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහි යම් අන්‍යවූ නිවාසනදෙෂයෝ කියනලද්දහුද එසේ හඳින මහණහටත් දුක්කටයම වේ. ඒ සියලු දෙෂයෝ කියූ නයින් හාත්පසින් වටකොට හඳින මහණහුට නොවෙත්'. මේ මෙහි සංක්ෂෙපයයි. විස්තරය වනාහි ඒ ඛුද්දකවත්ථුක්ඛන්ධකයෙහිම පහළ වන්නේය.

'**අසඤ්චිච්ච**' ඉදිරියෙන්ද පස්සෙන්ද එල්වා හඳින්නෙමි'යි මෙසේ නොසිතා. එතකුදු වුවත් හාත්පසින් වටකොටම හඳින්නෙමි'යි වැරද නොපිරිමඬුලු කොට හඳින මහණහුට ඇවැත් නොවේ. '**අසතියා**' අන්‍යවිහිතව ඉදිරියෙන් හා පස්සෙන් එල්වා. එසේ හඳින මහණහුට ඇවැත් නොවේ. '**අජානන්තස්ස**' මෙහි හඳින වත නොදන්නා මහණහුට ඇවැතින් මිදීමෙක් නැත්තේය. හඳිනවත මැනැවින් උගතයුතුමය. ඒ හඳිනවත නොඉගෙණීමම මෙයට අනාදරය වේ. ඒ අනාදරය දැන

නොඋගන්නා මහණහුටම යෙදේ. එහෙයින් උගත් වත් ඇත්තාවූද යම් මහණෙක් තෙමේ සිවුර උස්වූ බව හෝ සිවුර පහත්වූ බව හෝ නොදනීද, ඒ මහණහුට ඇවැත් නොවේ. කුරුන්දියෙහි වනාහි හාත්පසින් වටකොට හඳින්නට නොදත් මහණහුට අනාපත්තියි කියනලදී. යම් මහණෙක් කෘශවූ දඟ ඇත්තේ හෝ මහත් පිඩුමස් ඇත්තේ හෝ වේද, ඒ මහණහු සරුපබව පිණිස දණමඩලින් අටඟුලට වැඩිවද යටට බස්වා හැඳීම වටියි. 'ගිලානස්ස' දඟෙහි හෝ පයෙහි හෝ ව්‍රණයෙක් වේද, එකල්හි නගා හෝ බහා හැඳීම වටියි. 'ආපදාසු' ව්‍යාල මෘගයෝ හෝ සොරු හෝ ලුහුබැඳ එත්ද, මෙබඳු විපත් ඇතිකල්හි උස්පහත් කොට හඳින පොරවන මහණහුට ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජික සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශල චිත්තයි. දුඃඛවෙදනයි. ඵුස්සදෙව ස්ථවිරයන් වහන්සේ සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. ත්‍රිවෙදනයයි කීහ. උපතිස්ස ස්ථවිරයන් වහන්සේ වනාහි අනාදරය නිසා කියූ බැවින් ලොකවද්‍යය. අකුශලචිත්තය. දුඃඛවෙදනයයි කීහ.

**'පරිමණ්ඩලං පාරුපිතබ්බං'** 'තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ගිහීපාරුතං පාරුපන්ති'යි මෙසේ කියනලද නන්වැදෑරුම්වූ ගිහිපෙරවීම් නොපොරොවා මෙහි කියූසේම දෙකොණ සමකොට පොරෝනා වත පුරන්නහු විසින් හාත්පසින් වටකොට පෙරවිය යුතුය. මේ ශික්ෂාපද දෙක විශෙෂයක් නොතබා වදාරනලද්දේය. එහෙයින් විහාරයෙහිද ඇතුළුගමෙහිද හාත්පසින් වටකොටම හැන්ද යුත්තේද, වේ. පෙරවිය යුත්තේද, වේ. ස්ථවිරවාදය සමග සමුත්ථානාදීහු ප්‍රථම ශික්ෂාපදයෙහි කියූ නය ඇත්තාහුය. **'කායං විවරිත්වා'** උරහිසද ලයද විවෘත කොට. **'සුපටිච්ඡන්නෙන'** හිස වසා නොපොරොවන්නහු විසින්. එතකුදු වුවත් ගණ්ඨිය පාසෙයෙහිලා අවුණා නුවාකෙළවරින් බෙල්ල වසා දෙකොණ සමකොට හකුළා මණිබන්ධය දක්වා වසා ඇතුළු ගමෙහි යායුතුය.

ද්විතීය ශික්ෂාපදයෙහි - බෙල්ලෙහි වළ පටන් හිසද මණිබන්ධය පටන් දෙඅතද පිඩුමස පටන් දෙපයද නොවසා හින්ද යුතුය. **'වාසූපගතස්ස'** ඇතුළු ගැබ්හි විසීම පිණිස එළැඹි රාත්‍රිකාලයෙහි හෝ දවල්කාලයෙහි හෝ කය විවෘතකොටද හිඳින මහණහුට ඇවැත් නොවේ. 'සුසංවුතො' අත හෝ පය හෝ නොනටවමින් මොනවට හික්මුනෙක්ව යන අර්ථයි. **'ඔක්ඛිත්තචක්ඛු'** යට හෙළූ ඇස් ඇතිව. **'යුගමත්තං පෙක්ඛමානො'** වියගසෙහි යෙදූ දැමුනු ආජානීය අශ්ව තෙමේ ඉදිරියෙහි යුගමාත්‍රවූ.

වඩ්ඪුරියනෙත් සිවුරියන් පමණවූ භූමිභාගය බලයි. මේ කරුණෙන්ද මෙපමණ බලන්නහු විසින් ඇතුළුගම්හි යායුතුය. '**යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො**' යම් මහණෙක් ඒ ඒ දිශාභාගයෙහි ප්‍රාසාද කූටාගාර වීථි බලමින් යේද, දුක්කටාපත්තිය වේ. එක් තැනක සිට ඇත් අස් ආදීන්ගේ උවදුරු රහිතබව බැලීම වටියි. ඇතුළු ගම්හි හිඳින්නහු විසින්ද, යටහෙළු ඇස් ඇත්තහු විසින්ම හිඳිය යුතුය. 'උක්ඛිත්තකායා' නැගීම කරණකොට. ඉත්ථම්භූත ලක්ඛණයෙහි කරණවචනයි. එක් උරහිසකින් හෝ උරහිස් දෙකින් හෝ නැගූ සිවුරු ඇත්තෙක්ව යන අර්ථයි. ගම්දෙරතුළ එලිපත් කණුව පටන් සිවුරු නගා මෙසේ නොයායුතුය. හුන්කල්හි ධබරාව තුබූ තැනින් හැරගන්නහු විසින්ද සිවුරනොනගාම හැරගත යුතුය.

ප්‍රථමවර්ගයයි

—\\—

'**උජ්ජග්ඝිකාය**' මහසිනාවෙන් සිනාසෙමින් කියූ නයින්ම මෙහි කරණවචනයි. '**අප්පසද්දෙ අන්තරඝරෙ**' මෙහි කොපමණින් අල්පශබ්දය වේද, යත්: දෙළොස්රියන්ගෙයි ආදියෙහි සඞ්ඝ ස්ථවිරතෙමේය. මධ්‍යයෙහි දෙවන ස්ථවිර තෙමේය. කෙළවර තෙවන ස්ථවිර තෙමේය. මෙසේ හුන්කල්හි සඞ්ඝස්ථවිරතෙමේ දෙවන තෙරුන් සමග කථාකරයි. දෙවන තෙරතෙමේ ඒ සඞ්ඝස්ථවිරයන්ගේ ශබ්දයද අසයි. කථාවද ව්‍යවස්ථා කරයි. තෙවන තෙර තෙමේ වනාහි ශබ්දය පමණක්ම අසයි. කථාව ව්‍යවස්ථා නොකරයි. මෙපමණින් අල්පශබ්දය වේ. ඉදින් තෙවන තෙරතෙමේ කථාව ව්‍යවස්ථා කෙරේ නම් මහාශබ්දය නම්වේ. '**කායං පග්ගහෙත්වා**' කය නිසලකොට. සෘජුවූ කයින් ශාන්තවූ ඊර්යාපථයෙන් යායුත්තේද හිඳියයුත්තේද වේ. '**බාහං පග්ගහෙත්වා**' අත නිසලකොට '**සීසං පග්ගහෙත්වා**' හිස නිසලව සෘජු කොට තබා.

ද්විතීයවර්ගයයි.

—\\—

'**ඛම්භකතො**' ඛම්භකත නම් කටියෙහි අත තබා. උකුළෙහි තැබූ අත් ඇත්තේ '**ඔගුණ්ඨිතො**' හිස වසා පෙරවූයේ. '**උක්කුටිකාය**' යන මෙහි විළුම් දෙක ඔසොවා පා අගින් හෝ පා අග ඔසොවා විළුඹෙන්ම හෝ පොළොව පහසන්නහුගේ ගමන උක්කුටිකායි කියනුලැබේ.

කරණවචනය. මෙහි කියූ ලක්‍ෂණම වේ. 'දුස්සපල්ලත්ථිකාය' මෙහි අතින් අකවටු ඇවිලීම පිළියෙන් අකවටු ඇවිලීමැයි කියනුලැබේ. **'ආකිරන්තෙපි'** පිණ්ඩපාතය දෙන කල්හිද. **'සක්කච්චං'** සිහි එළවා. **'පත්තසඤ්ඤී'** පාත්‍රයෙහි හැඟීම උපදවා. සමසූපක නම් යම් තැනක බතට සිවුවන කොටස පමණවූ සූපයෙක් වේද, ඒය. මුග්ගසූප මාසසූප යන මෙහි මුං කොල්ලු ආදියෙන් කළ සූපයෝද සඞ්ග්‍රහවට යෙත්මැයි මහාපච්චරියෙහි කියනලදී. **'රසරසෙ'** යන මෙහි මුද්ග මාසසූප දෙක හැර සෙසු ඔලොණි නම් ව්‍යඤ්ජනය පලාවලින් කළ ව්‍යඤ්ජනය. මාලුරස මස්රස යනාදිය රසරසැයි දතයුතුය. ඒ රසරසය බොහෝ කොටද ගන්නා මහණහට ඇවැත් නොවේ. **'සමතිත්තිකං'** ඉටු පොහොනා පාත්‍රයතුළ මුවවිට රෙබාව නොඉක්මවා පිරුනු මුවවිටින් යට රෙබාව හා සමකොට පිරුනු **'ථූපීකතං පිණ්ඩපාතං පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස'** මෙහි මුදුන්කරනලද්දේ නම්, පාත්‍රයතුළ මුවවිට රෙබාව ඉක්මවා කරනලද්දේය. පාත්‍රයෙහි බහනලද්දේය. කරනලද්දේය. පුරනලද්දේය, යන අර්ථයි. මෙසේ මුදුන් කරනලද පාත්‍රය නොපිළිගෙණ මුවවිටතුළ රෙබාව හා සමප්‍රමාණය පිළිගතයුතුය. එහි මුදුන්කරන ලද්දේනම් ඔදනාදිපංචවිධ භොජනයන්ගෙන් කරනලද්දේයයි **අභය** ස්ථවිරතෙමේ කීයේය. **ත්‍රිපිටක චූළනාග** ස්ථවිරතෙමේ වනාහි 'පිණ්ඩපාතොනාම යාගුපි භත්තම්පි ඛාදනීයම්පි චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි, මේ සූත්‍රය දක්වා දවලුහුයක් නමුදු මුදුන් කරනලදුයේ නොවටීයයි කීය. ඒ තෙරුන්ගේ වාදය අසා භික්‍ෂූහු රුහුනට ගොස් **චූලසුමන** තෙරුන් අතින් 'ස්වාමීනි' මුදුන්කරනලද පිණ්ඩපාතය කුමකින් පිරිසිඳිනලද්දේදැයි විචාළාහුය. ඒ තෙරුන්ගේ වාදයද සැලකළහ. **චූලසුමන** ස්ථවිර තෙමේ එය අසා 'අනේ, චූළනාගතෙමේ සසුනෙන් ගිලිහුනේය. මම මොහුට සත්වරක් විනය කියවනුයෙම්, කිසිකලෙකත් මෙසේ නොකීම්. මෙතෙමේ කොයින් ලැබ මෙසේ කියාදැයි කීය. ඉක්බිති භික්‍ෂූහු 'ස්වාමීනි' දැන් කියනු මැනැවැ, කුමකින් පිරිසිඳින ලද්දේදැයි තෙරුන්ගෙන් ඉල්ලූහ. ස්ථවිර තෙමේ 'ඇවැත්නි' යාවකාලිකයෙකැ'යි කීහ. එහෙයින් යම්කිසි කැඳබතක් හෝ කුදුමහත් ඵලයක් හෝ ඉටීමට පොහොනා පාත්‍රයෙහි යටිමුව රෙබාව නොයික්මවාම ගතයුතුය. එද ඉටීමට පොහොනා පාත්‍රයකිනි. අනික් පාත්‍රයකින් වනාහි මුදුන්කරනලද්දේද වටියි. යාමකාලික සත්තාහකාලික යාවජීවිකයෝ වනාහි ඉටීමට පොහෝනා පාත්‍රයෙහිද, මුදුන් කරනලද්දහු වටිත්. පාත්‍රදෙකක බත් ගෙණ එකක පුරවා වෙහෙරට යවන්නට හැකියයි මහාපච්චරියෙහි කියනලදී. පාත්‍රයෙහි මුවපිටින් මතුකොට මැදබහන යම්තූ උක්කැබලි කුදුමහත් ඵලාදිය වටින් ඉඩඇති බැවින් අතින්

සොලොවන ලදුව යටට බසීද, එය මුදුන්කරනලද්දේ නොවේ. පූවැලක් තබා පිණ්ඩපාතය දෙත්ද, මුදුන් කරනලද්දේමවේ. මල්කැන් තකුල් කුළු පලාදිකැන් තබා දෙනලද්ද මුදුන්කරනලද්දේ නොවේ. බත් මතුවෙහි තල්ලක් හෝ පාත්‍රයක් හෝ තබා පුරවාගණීද මුදුන් කරනලද්දේ නම් නොවේ. **කුරුන්දියෙහිද** තළුවෙක හෝ පත්‍රයක හෝ බහා එය පාමතුවෙහි තබා දෙත්ද, වෙන්වෙන් බඳුන වටී'යයි කියනලදී. මෙහි ඇවැත් නොවේ. ගිලන් තෙමේ නොආයේය. එහෙයින් ගිලන්හටත් යමක් මුදුන්කරනලද්දේද, එය නොවටියි. සියලු තන්හිම පිළිගැණීමම නොසුදුසුය. පිළිගන්නා ලද්දේ වනාහි මැනැවින් පිළිගන්නා ලද්දේමවේ. පරිභොග කිරීම වටියි.

තෘතීයවර්ගීයයි.

—\\—

'**සක්කච්චං**' යන මෙහි නොසකස්ව පිළිගැණීමෙහිම ඇවැත්වේ. පිළිගන්නාලද්දේ වනාහි මැනැවින් පිළිගන්නාලද්දේම වේ. '**සක්කච්චං**'යිද, **පත්තසඤ්ඤීයිද** යන ශික්ෂාපද දෙක කියූ නයමය. '**සපදානං**' ඒ ඒ තන්හි පිරිසිඳීම නොදක්වා අනුපිළිවෙළින් 'සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමි' යන ශික්ෂාපදයෙහි සමසූපය පිළිබඳ කියයුත්ත කියනලද්දේමය. '**ථූපතො**' මුදුන පටන් මැදින් යන අර්ථයි. '**පටිච්ඡාදෙත්වා**' ප්‍රාණඝාත නොකළයුතුයයි. රජුන් විසින් නියමකළ කාලයන්හි ව්‍යඤ්ජනය වසාදෙත්. සූපොදන විඤ්ඤත්ති ශික්ෂාපදයෙහි කියයුත්තෙක් නැත්තේය. උජ්ඣානසඤ්ඤී ශික්ෂාපදයෙහි ගිලන් තෙමේ නොම්දේ. '**නාති මහන්තො කබලො**' මොනරබිජුවට ඉතාමහත්ය. කිකිළිබිජුවට ඉතා කුඩාය. ඒ බිජුවටයන්ගේ මධ්‍යම ප්‍රමාණපිණ්ඩය පමණවේ. 'ඛජ්ජකෙ' යන මෙහි කැයුතු මුල් ආදිසියල්ල ගතයුතුය.

චතුර්ථ වර්ගීයයි.

—\\—

'අනාහටෙ' නොගෙණෙනලද කල්හි. මුවදෙරට නොපැමිණවූ කල්හිය යන අර්ථයි. '**සබ්බං හත්ථං**' සියලු අත. '**සකබළෙන**' යන මෙහි දහම් කියනුයේ අරළුකඩක් හෝ වැල්මීකඩක් හෝ මුවෙහි බහා කියාද, යම්පමණකින් වචන අපරිපූර්ණ නොවේද, එපමණක් මුවෙහි ඇති කල්හි කීම වටියි. '**පිණ්ඩුක්ඛෙපකං**' පිඩ උඩ දමදමා. '**කබළාවච්ඡෙදකං**' ආලොපය සිඳ සිඳ. '**අවගණ්ඩකාරකං**' වඳුරකුමෙන් කොපුලෙහි කොට කොට.

**'හත්ථනිද්ධූනකං'** අත සලසලා. **'සිත්ථාවකාරකං'** බත්උලු වගුර වගුරා 'ජිව්හානිච්ඡාරකං' දිව පිටතට නෙරනෙරා. 'චපුචපුකාරකං' චපුචපුයි මෙසේ ශබ්දනගනගා.

පඤ්චමවග්ගීයයි

——\\——

**'සුරුසුරුකාරකං'** "සුරුසුරුයි" මෙසේ ශබ්ද නගනගා 'දවො' නින්දවචනයි. ඒ නින්දාවචනය. යම්කිසි වෛර වචනයකින් 'කිනම් බුද්ධද, සීලකබුද්ධද, ප්‍රතිබුද්ධද, කිනම් ධර්මයෙක්ද, ගොධර්මයෙක්ද, අජධර්මයෙක්ද, කිනම් සඞ්ඝද, මෘගසමූහයෙක්ද, සිවුවාසමූහයෙක්ද, යනාදි නයින් තෙරුවන් ඇරබැ නොකටයුතුය. යන අර්ථයි. **'හත්ථනිල්ලෙහකං'** අත ලෙවලෙව, අනුභව කරන්නහු විසින් ඇඟිල්ල පමණ නමුදු ලෙවින්නට නොවටියි. උකුකැඳ පැණිකිරිබත් ආදිය ඇඟිලිවලින් ගෙණ ඇඟිලි මුවෙහි බහ බහා අනුභවකිරීම නොසුදුසුනොවේ. පාත්‍රයලෙවීම් තොල්ලෙවීම් ආදියෙහිද මෙම නයවේ. එහෙයින් එක් ඇඟිල්ලකින් නමුදු පාත්‍රය නොලෙවිය යුතුය. එක් තොලක් නමුදු දිවෙන් නොලෙවිය යුතුය. තොල්මසින්ම ගෙණ මුවතුළට ඇතුල්කිරීමෙහි වරදෙක් නැත්තේය. **'කොකනදෙ'** මෙනම් ඇති. පද්මය කොකනදයි කියනු ලැබේ. ඒ පහය පියුම් සටහන් ඇත්තේය. එහෙයින් මේ පහයට කොකනදැයිම නම් කළහ. **'න සාමිසෙන හත්ථෙන පානීයථලකං'** ආමිසසහිත අතින් පැන්තළුව නොගතයුතුය යන මෙය පිළිකුල් වසයෙන් ප්‍රතික්‍ෂෙප කරනලදී. එහෙයින් සඟසතුවූද, පුද්ගලයන් සතුවූද, ගිහින් සතුවූද, තමන් සතුවූද, සකක්ද, දියගන්නා බඳුනක්ද, තලියක්ද, ඉඳුල්සහිත අතින් නොපිළිගත යුත්තේමය. ගන්නා මහණහුට දුක්කටයවේ. යම්ලෙසකින් අතෙහි එක් පෙදෙසෙක් ඉඳුල් මැකුනේ නොවේද, ඒ පෙදෙසින් ගැණීම වරද නොවේ. **'උද්ධරිත්වා'** බත්උලු දියෙන් නගා එක්තැනක රැස්කොට දිය බැහැරකරයි. **'භින්දිත්වා'** බත්උලු, දියහා මැඩ උදකගතික කොට බැහැරකරයි. **'පටිග්ගහෙ වා'** ඉඳුල් අත් දෝනා බඳුනකින් පිළිගන්නේ එය ඉඳුල්දිය වක්කරන බඳුනෙක වක්කෙරේද, **'නීහරිත්වා'** ගෙයින් පිටතට ගෙණලාද මෙසේ ලන මහණහුට ඇවැත් නොවේ. **'සෙතච්ඡත්තං'** සුදුවතින් වසාකළ ශ්වෙතච්ඡත්‍රය. **'කිලඤ්ජච්ඡත්තං'** හුණබටපතුරෙන් කළ ඡත්‍රය. **'පණ්ණච්ඡත්තං'** තල්පත් ආදීවූ යම් කිසිවකින් කරනලද්දය. **'මණ්ඩලබද්ධංසලාක බද්ධා'** මේ වනාහි ත්‍රිවිධවූම ඡත්‍රයන්ගේ නාමැදිරිය දක්වනුපිණිස කියනලද්දේය. ඒ වනාහි මණ්ඩලාකාරයෙන් බඳිනලද්දහුද, කුරුවලින් බඳිනලද්දහුද වෙත්, යම් ඡත්‍රයක් වනාහි

දණ්ඩසහිතව සිඳගත් තල්පත් ආදියෙන් කළ එක පර්ණච්ඡත්‍රයක් වේද, එද ඡත්‍රයමවේ. මේ ඡත්‍ර අතුරෙහි යම්කිසි ඡත්‍රයෙක් මොහුගේ අත්ලෙහිවේ නම් ඡත්තපාණි නම්වේ. හෙතෙමේ ඒ ඡත්‍රය දරණුයේ හෝ අංශයෙහිකොට හෝ කලවයෙහි තබා හෝ යම්තාක් අතින් නොමුදද, ඒතාක් මොහුට දහම් දෙසීම සුදුසු නොවේ. දෙසන්නහුට කියූනයින් දුක්කටයවේ. ඉදින් මොහුට අනෙකෙක් ඡත්‍රයක් දරාද යම්තැනක ඡත්‍රයෙහි දඬු කොණ සිටුවා ඡත්‍රය කෙලින්කොට තබා එහි යට හිඳිත්ද, සිටිත්ද, එබඳු ඡත්‍රාධාරයෙක්හි තුබූ ඡත්‍රයෙක්වේද, එය අතින් පහවූ ඇසිල්ලෙහි ඡත්තපාණි නම් නොවේ. ඔහුට දහම් දෙසීමෙහි වරදෙක් නැත්තේය. මෙහි ධම්පරිච්ඡේදය චනාහි පදසොධම්මශික්ෂාපදයෙහි කියූනයන්ම දතයුතුය. **'දණ්ඩපාණිස්ස'** මෙහි දණ්ඩ නම් මධ්‍යමපුරුෂයක්හුගේ සිවුරියනක් පමණ දිග්වූ දණ්ඩයයි. මොහුගේ දණ්ඩපාණිභාවය ඡත්තපාණිපුද්ගලයා කෙරෙහි කියූ නයින්ම දතයුතුය. **සත්ථපාණිපුද්ගලයා** කෙරෙහිද, මෙම නයවේ. කඩුව බැඳගෙණ සිටියේද සත්ථපාණිසඞ්ඛ්‍යාවට නොයයි. **'ආයුධපාණිස්ස'** යන මෙහි ආයුධය නම් මැදින්වක්වූ දණ්ඩක් සමානවූ දුනුවිකෘතිය. වටවූ දඬුඇති දුනුවිකෘතියයි කියනලද්දේද එතකුදු වුවත් ශරවිකෘතිය සමග සියලුම දුනුවිකෘති ආයුධැයි දතයුතුය. එහෙයින් ඊය සමග හෝ දුන්න ගෙණ. ඊය නැති දුන්න හෝ දුන්න නැති ඊය හෝ දුනුදිය සහිත දුන්න හෝ දුනුදිය රහිත දුන්න හෝ ගෙණ සිටියහුට හෝ හුන්නහුට හෝ දහම් දෙසීම නොවටියි. ඉදින් චනාහි දුන්න මොහුගේ බොටුවෙහි එල්වනලද්දේ වේද, යම්තාක් අතින් නොගණීද, ඒතාක් දහම් දෙසීමෙහි වරදෙක් නැත්තේය.

ෂෂ්ඨවර්ගීයයි

—||—

**'අක්කන්තස්ස'** ඡත්‍රදණ්ඩ ඇඟිලි අතරට ප්‍රවෙශ නොකොට හුදෙක් පාදුකාව මැඩසිටියක්හට. **'පටිමුක්කස්ස'** පාදුකාවලා (දමා) සිටියක්හට. පාවහන්හිද මේනයමවේ. **'ඔමුක්කො'** යන මෙහි විලුම් වැටිය මුද සිටියේ කියනු ලැබේ. **'යානගතස්ස'** යන මෙහි දෙදෙනකු විසින් අත්පුටුවෙන් ගන්නාලදුයේ නොහොත් සළුවක තබා හුණදඬුවකින් උසුලන ලැබේද, නොයොදනලද්දවූ හෝ සකපමණක් ගලවා තැබූ වයහාදීවූ යානයෙක හුන්නේද, යහන්ගතමැයි ගිණීමට යන්නේය. ඉදින් දහම්දෙසන, දහම්අසන දෙදෙනම එක් යානයෙක්හි හුන්නාහුම වෙත් නම් දහම් දෙසීමෙහි වරද නැත. වෙන්ව හුන්කල්හිද, උස් යානයෙහි හුන්නහු විසින් මිටියානයෙහි

හුන්නහුට දහම් දෙසීම වටියි. සම පමණකල්හිද වරද නැත. ඉදිරි යානයෙහි පසු යානයෙහි හුන්නහුට දහම්දෙසීම වටියි. ඉතා උස්වූ පසු යානයෙහිද හුන්නහු විසින් දහම් දෙසීම වරද සහිතය. **'සයනගතස්ස'** යටත් පිරිසයින් බිම එලාලූ කළාලයක හෝ පියවිබිම හෝ හොත්තහුට උස් ඇඳක හෝ පුටුවක හෝ බිම හෝ සිටියහු විසින් හෝ හුන්නහු විසින් හෝ දහම් දෙසීම නොවටියි. ඉතාඋස්වූ හෝ සමපමණවූ හෝ යහනෙක හොත්තහු විසින් යහන්ගතයාහට දහම් දෙසීම වරදෙක් නොවේ. හොත්තහු විසින්ද සිටියහුටද හුන්නහුටද දහම්දෙසීම සුදුසුය. හුන්නහු විසින්ද සිටියහුටද හුන්නහුටද වටියි. සිටියහු විසින් සිටියහුටම වටියි. **'පල්ලත්ථිකාය'** ගිලන්පටියෙන් අකවටු අවුළුවා හිඳීමෙන් හෝ, දෙඅතින් අකවටු අවුළුවා හිඳීමෙන් හෝ, වස්ත්‍රයෙන් අකවටු අවුළුවා හිඳීමෙන් හෝ යන යම්කිසි පල්ලත්ථිකයකින් යුක්තව හුන් නොගිලනක්හට දහම්දෙසීම නොවටියි. **'වෙඨිතසීසස්ස'** රෙදි වෙළුමකින් හෝ, මොලි ආදියකින් හෝ කෙසාන්තය යම්සේ නොපෙනේද, මෙසේ වෙළූහිස් ඇතියක්හට. **'ඔගුණ්ඨිතසීසස්ස'** හිස වසා පෙරවියක්හට. **'ඡමාය නිසීදිත්වා'** බිමහුන්නහු විසින්. **'ආසනෙ නිසින්නස්ස'** යටත් පිරිසයින් වස්ත්‍රයක් තමුත් තෘණ තමුත් අතුරා හුන්නහුට **'ඡපකස්ස'** සැඩොලකුගේ. 'ඡපකී' සැඩොලිය. **'නිලීනො'** සැඟවුනෙක්ව. **'යත්‍ර හි නාම'** යමෙක් තෙමේ නම් **'සබ්බමිදංචව මරිගතාන්ති තණේවව පරිපති'** 'මේ සියලු ලෝවැසි තෙමේ සංකරත්වයට ගියේය. ආචාරසීමාව නැත්තේයයි මේ වචනය අසා එහිම මන්ත්‍ර ඉගෙණීම පිණිස එම අඹරුකවෙත උස් අසුනෙහි උන් රජුද ඉගැන්වීම පිණිස මිටිඅසුනෙහි හුන් පුරෝහිත බමුණාද යන දෙදෙන අතර ඒ සැඩොල් තෙමේ එල්බ සිටි අත්ත බිඳගෙණ රුකෙන් වැටුනේය. වැටීද රජුපෙරවි යන දෙදෙන ඉදිරියෙහි සිට,

'උභො අත්ථං න ජානන්ති - උභො ධම්මං න පස්සරෙ
යො චායං මන්තං වාචෙති - අසමා කුම්භම්වාහිද'

යන මේ ගාථාව කීයේය.

එහි **'උභො අත්ථං නජානන්ති'** රජු හා පෙරවි බමුණුද යන දෙදෙනම තමන්ගේ ආචාර ප්‍රකාශක ග්‍රන්ථයෙහි අර්ථය නොදනිත්. **'ධම්මං න පස්සරෙ'** පෙල නොදනිත්. ඔවුහු දෙදෙන කවරහුද, යත්ඃ මේ යමෙක් උස් අසුනෙහි හිඳ මන්ත්‍රය හදරවාද, යමෙක් මිටි අසුනෙහි හිඳ හදරාද, මොවුහු දෙදෙනය. මෙසේ බමුණුද රජුද යන දෙදෙනම නොදැහැමි බැව්හි තැබීය. ඉන්පසු බමුණු තෙමේ **'සාලීනං'** යන ගාථාව කීයේය. ඒ ගාථාවෙහි අර්ථයඃ 'පින්වත' මම 'මේ ධම්'යි දනිමි, එතකුදුවුවත් මාවිසින්

බොහෝ කලක් මුළුල්ලෙහි අඹුදරුවන් සහිත පිරිවර දෙනා සමග රජු සතුවූ හැල්බත අනුභව කරනලද්දේය. '**සුචිමංසූපසෙචනො**' නානාප්‍රකාරවූ විකෘතියෙන් සැපයූ පිවිතුරුමස් සෙවුම, මුසු කිරීම මොහුටනුයි. '**සුචිමංසූපසෙචන**' නම. (නානාප්‍රකාර මාංස විකෘතියෙන් යුක්තවූ පිරිසිදු බොජුන් අනුභව කෙරෙමි) යන අර්ථයි. තස්මා ධම්මෙ න වත්තාමි' යම්හෙයකින් මෙසේ මාවිසින් රජුගේ බත අනුභව කරනලද්දේද, අන්‍යවූ බොහෝ ලාභයෝ ලබන ලද්දහුද, එහෙයින් මම ධර්මයෙහි නොපවතිමි. උදරයෙහි බැදුනෙක්ව හෙවත් උදරපොෂණය කරුණුකොට ධර්මය නොදන්නේ 'මේ ආචාරධර්මය තෙමේ ආචාර්යයන් විසින් වර්ණනා කරනලද්දේය. පසසනලද්දේය. සතුති කරනලද්දේයයි දනිමි. ඉක්බිති ඒ පෙරවිහට සැඩොල් තෙමේ '**ධිරත්ථු**' යනාදි ගාථා දෙකින් කීයේය. ඒ ගාථාවෙහි අර්ථය: බමුණ 'තාවිසින් යම් ධන ලාභයෙක් යම් යශස් ලාභයෙක් ලදද, ඒ ධන ලාභයටද යශස් ලාභයටද නිඳු වේවා. කුමක් හෙයින, යත්: යම් හෙයකින් තාවිසින් මේ ලැබූ ලාභය මත්තෙහි අපායයන්හි විනිපතනයට හෙතු වශයෙන් පවත්නේද, දැනුදු අධර්මචරණයෙන් වෘත්තිනම් වේද, එහෙයිනි. මෙබඳුවූ යම් වෘත්තියක් මත්තෙහි විනිපතනයට හෙතු බැවින් මෙහි අධර්මචරණය හෙතුකොටගෙණ හෝ නිපදීද, ඒ වෘත්තියෙන් කවරප්‍රයොජනයෙක්ද,

'ධිරත්ථු තං ධනලාභං - යසලාභඤ්ච බ්‍රාහමණ
යා වුත්ති විනිපාතෙන - අධම්මචරණෙන වා'

යන මේ ගාථාව ඒ සැඩෙලහු විසින් කියනලදී.

'**පරිබ්බජ මහාබ්‍රහ්මෙ**' මහබමුණ මෙදෙසින් වහා පලායව. '**පචන්තඤ්ඤෙපි පාණිනො**' අන්‍ය සත්ත්වයෝද පිසීමද කෙරෙත්. අනුභවයද කෙරෙත්. හුදෙක් තෝද රජුද යන දෙදෙන පිස අනුභව නොකෙරෙත්මය. '**මා ත්වං අධම්මො ආචරිතො අස්මා කුම්භමිවාද**' ඉදින් තෝ මෙතැනින් නොපහව, මේ අධර්මයෙහි හැසිරෙන්නෙහිද, එයින් තෝ, ඒ අධර්මයතෙමේ හැසිරෙනලද්දේ පාෂණය තෙමේ පැන්කළය යම්සේ බිඳින්නේද, එසේ නොබිඳුව, එයින් අපි තට

'පරිබ්බජ මහාබ්‍රහ්මෙ - පචන්තඤ්ඤෙපි පාණිනො
මා ත්වං අධම්මො ආචරිතො - අස්මා කුම්භමිවාභිද

යි කියමු.

'**උච්චෙ ආසනෙ**' යටත්පිරිසයින් උස්තැන්හිවූ බිම්පෙදෙසෙක හුන්නහුට මිටිඅසුනෙහි හුන්නහු විසින් දහම්දෙසීම නොවටියි. '**න ධීතෙන**

**නිසින්නස්ස**' තෙරුන්ගේ උවැටනට ගොස් සිටි තරුණ මහණකුගෙන් අසුනෙහිහුන් මහාස්ථවිර තෙමේ ප්‍රශ්නයක් විචාරාද, නොකියයුතුය. තෙරුන්ට ගෞරවයෙන් නැගිට විචාළ මැනැවැ'යි කියන්නට නොහැක්කේද, පසෙක සිටි මහණක්හට කියමි'යි කීම වටියි. '**න පච්ඡතො ගච්ඡන්තෙන**' ඉදින් මෙහි ඉදිරියෙහි යමින් පස්සෙන් යන්නකු අතින් ප්‍රශ්නයක් විචාරාද නොකියයුතුය. පැසුළුමහණහුට කියන්නෙමියි කියයුතුය. එක්ව උගත්ධර්මය හැදෑරීම කළහැකිය. සමව පෙළට යන්නක්හට කීමවටියි. '**න උප්පථෙන**' මෙහිද ඉදින් දෙදෙනම ගැල්මගින් හෝ එක් එක් සක්මගින් හෝ නොමගින් හෝ පෙළට යෙත්ද, වටියි. '**අසඤ්චිච්ච**' පිළිසන් තැනකට යන මහණහුගෙන් වහා මල හෝ මූත්‍ර හෝ අතරතුරදී නික්මේද, නොසිතා කෙළේ නම්වේ. ඒ මහණහුට ඇවැත් නොවේ. '**න හරිතෙ**' මෙහි යම් පණ ඇති රුකක මුලක් පොළොවෙහි පෙනෙන්නේද, නොහොත් අත්තක් බිම ඇලී පවත්නීද, සියල්ල හරිතසඞ්ඛ්‍යාවටමයයි. නොමළරුකක කදෙහිද තිල්තණ ආදිය නැති තැන, මලමූහෙළීම වරදෙක් නොවේ. තිල්තණ නැතිතැනක් බලන්නහුගෙන්ම වහා මලමූ නික්මේද, ගිලන්තැන සිටියේවේ. එහෙයින් වටියි. '**අප්පහරිතෙ කතො**' තිල්තණ නැති තැනක් නොලබන්නහු විසින් තණසුඹුලක් හෝ පිදුරුසුඹුලුවක් හෝ තබා මලමූකළ කල්හිද පසුව තිල් ඇතිතැනට ගලායේද, එහි වරදෙක් නොවේමය. මෙහි ඛෙල (කෙළ) යන වචනයෙන්ම සොටුද සඞ්ග්‍රහකරනලද්දේයයි **මහාපච්චරියෙහි** කියනලදී. '**න උදකෙ**' මෙය පරිභොගජලය සඳහාම කියනලදී. පරිභෝග කටයුතු නොවූ වැසිකිළි මුහුදු ආදියෙහි ඇති දියෙහි ඇවැත්නොවේ. වැසිවස්නා කල්හි හාත්පසින් දියසැඩ පහර වේද, දිය නැතිතැනක් බලත්ම මලමූ නික්මේද, එහිවරදෙක් නොවන්නේය. **මහාපච්චරියෙහි** වනාහි මෙබඳු වැසිකාලයෙහි දිය නැති තැනක් නොලබන්නහු විසින්ද දියෙහි මලමූ කිරීම වටීයයි කියනලදී. සියලු ශික්ෂාපදයන්හි නොකියූ සෙසු සියල්ල ප්‍රකටඅර්ථ ඇත්තේමය.

සප්තමවර්ගයයි

—||—

සමුත්ථානාදිය දක්වනු පිණිස මේ වනාහි ප්‍රකීර්ණයවේ. උජ්ජග්ඝික උච්චාසද්ද පටිසංයුක්තවූ ශික්ෂාපද සතරද, සකබළෙන මුඛෙන බ්‍යාහරණං යන එක් හික්ෂාපදයද, ඡමානීචාසනටඨාන පච්ඡතොගමන උප්පථගමන පටිසංයුක්තවූ ශික්ෂාපද පසදැයි යන මේ දශශික්ෂාපදයෝ සමනුභාසනසමුත්ථානිකයෝය. කායවාචාචිත්තයෙන් හටගණීත්.

ක්‍රියාසමුට්ඨානයෝය. සංඥවිමොක්ෂයෝය. සචිත්තකයෝය. ලොක වද්‍යයෝය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුක්ඛවෙදනයි. සූපොදන විඤ්ඤත්තිශික්ෂාපදය. ථෙය්‍යසත්ථසමුට්ඨාහිකය. කායචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියා සමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි. ඡත්තපාණි දණ්ඩපාණි සත්ථපාණි ආයුධපාණි පාදුක උපාහන යාන සයන පල්ලත්ථික වෙඨ්ඨිත ඔගුණ්ඨිත යන නම් ඇති එකොළොස් ශික්ෂාපදයෝ ධම්මදෙසන සමුට්ඨානිකයෝය. වාචාචිත්තයෙන් හටගණිත්. ක්‍රියාක්‍රිය සමුට්ඨානයෝය. සංඥවිමොක්ෂයෝය. සචිත්තකයෝය. ලොකවද්‍යයෝය. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි. සෙසු තෙපණස් ශික්ෂාපදයෝ ප්‍රථමපාරාජිකසමුට්ඨානිකයෝය. සියලු සෙඛිය ශික්ෂාපදයන්හි ආබාධප්‍රත්‍යයෙන් ඇවැත් නොවේ. ථූපීකතපිණ්ඩපාතයෙහිද, සූපබ්‍යඤ්ජනපටිච්ඡාදනයෙහිද, උජ්ඣානසඤ්ඤියෙහිද යන ත්‍රිවිධ ශික්ෂාපදයන්හි ගිලෙනෙක් නැත්තේය.

සෙඛියවණ්ණනාව නිමි.

—||—

අධිකරණසමථයන් අතුරෙහි - 'සත්ත' යනු ඒ සමථාධිකරණයන්ගේ ගණන පිරිසිඳීමය. චතුර්විධ අධිකරණය සමනය කරත්. ව්‍යපශමනය කෙරෙත්යි අධිකරණසථම නම්වේ. ඒ අධිකරණසමථයන්ගේ විස්තරය ඛන්ධකයෙහිද පරිවාරයෙහිද කියනලද්දේය. ඔවුන්ගේ අර්ථය එහිම වර්ණනා කරන්නෙමු. සෙස්ස සියලු තන්හි ප්‍රකටමය.

විනයවිවෘති

නම්වූ

සිංහලසමන්තපාසාදිකාවෙහි භික්ෂුවිභඞ්ගවර්ණනාව නිමි.

—||—

අනතුරු රහිතව මේ වර්ණනාව යම්සේ නිමවනලදද,

එසේ අනතුර රහිතව ප්‍රාණීහු නිවනට පැමිණෙත්වා.

—||—

# භික්ඛුණීවිභඞ්ගවණ්ණනා

—||—

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

—||—

**යො භික්ඛූනං විභඞ්ගස්ස - සඞ්ගහීතො අනන්තරං**
**භික්ඛුණීනං විභඞ්ගස්ස - තස්ස සංවණ්ණනාක්කමො**

**පත්තො යතො තතො තස්ස - අපුබ්බපදවණ්ණනං**
**කාතුං පාරාජිකෙ තාව - හොති සංවණ්ණනා අයං**

භික්ෂුවිභඞ්ගයට අනතුරුව යම් භික්ෂුණී විභඞ්ගයක් සඞ්ග්‍රහ කරනලද්දේද, ඒ භික්ෂුණී විභඞ්ගය පිළිබඳ සංවර්ණනාක්‍රමය යම්හෙයකින් පැමිණියේද, එහෙයින් ඒ භික්ෂුණී විභඞ්ගය පිළිබඳ පෙර නොකියූ පදවැණුම කරන්නට පාරාජිකයෙහි පළමුකොට මේ සංවර්ණනා තොමෝ වන්නීය.

—||—

'**තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති -පෙ- සාළ්හො මිගාරනත්තා**' යන මෙහි '**සාළ්හො**' යනු ඔහුගේ නාමයවේ. මිගාරමාතෘවූ විශාඛාවගේ මුනුබුරුවේ. එහෙයින් 'මිගාරනත්තා'යි කියනලදී. 'නවකම්මිකං' නවකර්මාන්ත විධානය කරන්නාවූ. '**පණ්ඩිතා**' පාණ්ඩිත්‍යයෙන් යුක්තවූ. '**ව්‍යත්තා**' ව්‍යක්තභාවයෙන් යුක්තවූ, '**මෙධාවිනී**' පෙළගැන්මෙහි සිහිය පෙරටුකොට සිටි ප්‍රඥවෙන්ද, අරුත් ගැන්මෙහි ප්‍රඥව පෙරටු කොට සිටි සිහියෙන්ද යුක්තවූ. '**දක්ඛා**' ඡෙකවූ. නොවරදවා වහා කටයුතු කරනසුලුවූ යනඅර්ථයි. '**අනලසා**' අලස බැවින් තොරවූ. '**තත්‍රූපායාය**' ඒ ඒ කර්මයන්හි උපායභූතවූ. '**වීමංසාය**' කටයුතු කර්ම පුනපුනා සිහිකිරීමෙන්. '**සමන්නාගතා**' යුක්තවූ. '**අලං කාතුං**' ඒ ඒ කර්ම කරන්නට සමර්ථවූ.

'**අලං සංවිධාතුං**' මෙසේද මෙසේද මේ කෘත්‍යය වේවා'යි මෙසේ සංවිධාන කරන්නටද සමර්ථවූ. '**කතාකතං ජානිතුං**' කරනලද්ද නොකරනලද්ද දැනගන්නට. '**තෙ**' ඔවුහු දෙදෙනය. ඒ සුන්දරීනන්‍ද නම් භික්ෂුණී තොමෝද, ඒ සාළ්හ තෙමේද යන අර්ථයි. '**හත්ථගෙග**' වලදවන තන්හි '**තිකුටෙ**' කොන් සමාන කොට දැක්වූ ගැඹුරෙහි '**විස්සරො මෙ භවිස්සති**' මාගේ ස්වරය විරූපවන්නේය. විප්‍රකාර ශබ්දයෙක් වන්නේය යන අර්ථයි. '**පතිමානෙන්තී**' බලාපොරොත්තුවෙමින්. '**ක්‍යාහං**' කිම, මම '**ජරාදුබ්බලා**' ජරාවෙන් දුර්වලවූ. '**චරණගිලානා**' පාදරෝගයෙන් යුක්තවූ. '**අවස්සුතා**' කායසංසර්ගරාගයෙන් මැඩුණු. **තින්තා** තෙත්වූ යන අර්ථයි. මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි එම රාගයම ගෙණ '**සාරත්තා**' යනාදිය වදරනලදී. එහි '**සාරත්තා**' යනු රඳින්යුත් වස්ත්‍රයක් මෙන් කායසංසර්ගරාගයෙන් ඉතා රත්වූ '**අපෙක්ඛවතී**' ඒ රාගයාගේම වසයෙන් ඒ පුරුෂයා කෙරෙහි පැවැති බලාපොරොත්තුවෙන් යුක්තවූ. '**පටිබද්ධචිත්තා**' ඒ රාගය කරණකොට ඒ පුරුෂයා කෙරෙහි බැඳ තැබූ සිත් ඇත්තියකමෙන් දෙවන පදවිභඞ්ගයෙහිද මේ නයමවේ. '**පුරිසපුග්ගලස්ස**' පුරුෂ සඞ්ඛ්‍යාත පුද්ගලයාගේ. '**අධක්ඛකං**' අකුයෙන් යට '**උබ්භජාණුමණ්ඩලං**' දණමඩලින් උඩ. පදභාජනයෙහි වනාහි පදපිළිවෙළින්ම 'හෙට්ඨක්ඛකං උපරිජාණුමණ්ඩලං'යි වදරනලදී. මෙහිද වැලමිටින් උඩද උබ්භජාණුමණ්ඩලයෙන්ම සඞ්ග්‍රහ කරනලදී. සෙස්ස මහා විභඞ්ගයෙහි කියූ නයින්ම දතයුතුය. '**පුරිමායො උපාදය**' සාධාරණපාරාජිකාපත්තියෙන් පරිජිවූ මෙහෙණහු සිවු දෙන යන අර්ථයි. '**උබ්භජාණුමණ්ඩලිකා**' මේ වනාහි මේ පාරාජිකාවගේ නාමමාත්‍රයෙකි. එහෙයින් පදභාජනයෙහි විචාරණය කරනලද්දේ නොවේ. මෙසේ උදෙසූ ශික්ෂාපදය පදපිළිවෙළින් විභාගකොට දැන් අවස්සුතාදිභෙදයෙන් ආපත්තිභෙදය දක්වන්නට '**උභතො අවස්සුතෙ**' යනාදිය කීය. එහි 'උභතො අවස්සුතෙ' දෙදෙන කායසංසර්ගරාගයෙන් තෙත්වූකල්හි මෙහෙණගේද පුරුෂයාගේද කායසංසර්ගරාගය කරණකොට තෙත්බව ඇතිකල්හිය යන අර්ථයි. '**කායෙන කායං ආමසති**' මෙහෙණතොමෝ යම්සේ පිරිසිදි කයින් පුරුෂයාගේ යම්කිසි කයක්, පුරුෂතෙමේ හෝ යම්කිසි කයකින් මෙහෙණගේ යම්සේ පිරිසිදි කය ආමර්ශණය කෙරේද, දෙයුරෙන්ම මෙහෙණට පරිජි ඇවැතවේ. '**කායෙන කායපටිබද්ධං**' කියූ අයුරින්ම තමන්ගේ කයින් පුරුෂයාගේ කය පිළිබඳවූ පුරුෂයාගේ කය 'ආමසති' මෙහි තොමෝ හෝ ආමර්ශණය කෙරේවා. ඒ පුරුෂයාගේ හෝ ආමර්ශණය ඉවසාවා ථුල්ලච්චයමවේ. සෙසු පදයන්හිද මේ නයින්ම විනිශ්චය දතයුතුය. ඉදින් මහණෙක්ද

මෙහෙණක්ද වේනම්, එහි මෙහෙණතොමෝ ආමර්ෂණය කරානම් මහණතෙමේ නිසලව සිතින් ඉවසානම් මහණතෙමේ, ඇවැතින් නොකරවිය යුත්තේය. ඉදින් මහණතෙමේ ආමර්ෂණය කෙරේනම් මෙහෙණ නිසලව සිතින්ම ඉවසානම් සිරුරු අවයවයක් නොසලන්නීද පාරාජිකක්ෂෙත්‍රයෙහි පාරාජිකයෙන්ද ථුල්ලච්චක්ෂෙත්‍රයෙහි ථුල්ලච්චයෙන්ද දුක්කටක්ෂෙත්‍රයෙහි දුක්කටයෙන්ද කරවිය යුත්තේය. කුමක් හෙයින, යත්:- '**කායසංසග්ගං සාදියෙය්‍ය**'යි වදළබැවිනි. මේ අට්ඨකථාවන්හි විනිශ්චයයි. මෙසේ ඇති කල්හි ක්‍රියාසමුට්ඨාන භාවයෙක් නොදක්නාලැබේ. එහෙයින් ඕ තත්බහුල නයින් කියනලදැයි දතයුතුය. '**උබ්භක්ඛකං**' අකුයෙන් උඩ. මෙහිද වැලිමිටෙන් යටද 'අධොජාණුමණ්ඩලයෙන්ම සඞ්ග්‍රහ කරණලද්දේය. '**එකතො අවස්සුතෙ**' මෙහි එකතොයි විශෙෂයක් නොතබා කියනලද්දේද. එසේ වුවද මෙහෙණහට කායසංසග්ගීරාගයෙන් තෙත්වීම ඇති කල්හි මේ ආපත්තිභෙදය කියනලදැයි දතයුතුය. එහි මේ මුලපටන් විනිශ්චයයි. මෙහෙණ තොමෝ කායසංසග්ගීරාගයෙන් තෙත් වූවා, පුරුෂතෙමේත් එසේමය. අකුයෙන් යට දණමඩලින් උඩ කායප්‍රදෙශයෙහි කායසංසග්ගීයාගේ ඉවසීම ඇතිකල්හි මෙහෙණට පාරාජිකයවේ. මෙහෙණට කායසංසග්ගීරාගය හෝ පුරුෂයාහට මෛථුනරාගය හෝ ගෘහනිශ්‍රිත ප්‍රෙමය හෝ ශුද්ධචිත්තය හෝ වේවා ථුල්ලච්චයමවේ. මෙහෙණට මෛථුනරාගය හෝ පුරුෂයාහට කායසංසග්ගීරාගය හෝ මෛථුනරාගය හෝ ගෘහනිශ්‍රිතප්‍රෙමය හෝ ශුද්ධචිත්තය හෝ වේවා, දුක්කටයවේ. මෙහෙණට ගෘහනිශ්‍රිත ප්‍රෙමය හෝ පුරුෂයාහට කියනලද සතරින් යම් ඒ එකෙක් හෝ වේවා දුක්කටයමවේ. මෙහෙණට ශුද්ධචිත්තය හෝ වේවා පුරුෂයාහට කියනලද සතරින් යම් ඒ එකෙක් හෝවේවා. ඇවැත්නොවේ. ඉදින් මහණෙක් වේද, මෙහෙණක් වේද, දෙදෙනාගේ කායසංසග්ගීරාගය වේද මහණහුට සඞ්ඝාදිසෙසයවේ. මෙහෙණට පාරාජිකයවේ. මෙහෙණගේ කායසංසග්ගීරාගය වේද, මහණහුගේ මෛථුනරාගය හෝ ගෘහනිශ්‍රිත ප්‍රෙමය හෝ වේද, මෙහෙණට ථුල්ලච්චයවේ. මහණහුට දුක්කටයවේ. දෙදෙනාහට මෛථුනරාගය හෝ ගෘහනිශ්‍රිතප්‍රෙමය හෝ වේද, දෙදෙනාහටම දුක්කටයමවේ. යමක්හුගේ යම්තැනක ශුද්ධ චිත්තය වේද, ඔහුට එහි ඇවැත් නොවේ. දෙදෙනාහටම ශුද්ධචිත්තය වේද, දෙදෙනාහටම ඇවැත් නොවේ. '**අනාපත්ති අසඤ්චිච්ච**' යනාදි තන්හි වැරදී හෝ ආමර්ෂණය කරන්නියටද, අන්‍යවිහිතවූ මෙහෙණහටද 'මේ පුරුෂය, මෝ ස්ත්‍රියයි නොදන්නියටද ඒ පුරුෂයා විසින් පැහැසූ තැනැත්තියහටද ඒ පහස නොඉවසන්නියහටද ආමර්ෂණය ඇතිකල්හිද, ඇවැත් නොවේ. සෙස්ස සියලුතන්හි ප්‍රකටමය.

ප්‍රථමපාරාජිකසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. අකුශලචිත්තයි. ද්විවෙදනයයි.

පළමුවන පාරාජික ශික්ෂාපදයයි

—||—

ද්විතීයපාරාජිකයෙහි - **'කච්චිනො සා'** කිම, ඕතොමෝ, **'අවණ්ණො'** අගුණ **'අකිත්ති'** නින්‍දා **'අයසො'** පරිවාරවිපත්ති නොහොත් අනභිමුඛයෙහි ගැරහීම. **'සා වා ආරොචෙති'** යම් මෙහෙණක් තොමේ පාරාජිකයට පැමිණියාද, ඕ, තොමෝ සැලකරයි. **'අට්ඨන්නං පාරාජිකානං අඤ්ඤතරං'** මහණුන් හා සාධාරණ සතරින්. අසාධාරණ සතරින්ද එක්තරා එකක්. මේ පාරාජිකයද පසුව පණවනලද්දේය. එහෙයින් **'අට්ඨන්නං'**යි විභඞ්ගයෙහි වදරණලදී. ප්‍රථම ශික්ෂාපදය සමග යුගල කළබැවින් මේ අවකාශයෙහි තබනලදැයි දතයුතුය. **'ධුරං නික්ඛිත්තමත්තෙ'** ධුර නික්ෂෙපකළ මාත්‍රයෙහි. මෙහි විස්තර කථාව සප්‍රාණකවර්‍ගයෙහි දුට්ඨුල්ලශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය. එහි වනාහි පාචිත්තියය. මෙහි පාරාජිකය යන මේම වෙනසවේ. සෙස්ස එබඳුමය. **'වජ්ජපටිච්ඡාදිකා'** මෙද මේ පාරාජිකාවගේ නාමමාත්‍රයෙක්මවේ. එහෙයින් පදභාජනයෙහි නොවිචාරණලද්දේය. මෙහි සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙප සමුත්ථානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. අක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුක්ඛවෙදනයි.

දෙවන පාරාජිකශික්ෂාපදයයි.

—||—

තෘතීය ශික්ෂාපදයෙහි **'ධම්මෙන'** විද්‍යාමාන වස්තුවෙන්. **'විනයෙන'** චොදනාකොට සිහිකරවා. මේ ශික්ෂාපදයාගේ පදභාජනය වනාහි 'යෙන ධම්මෙන යෙන විනයෙන උක්ඛිත්තො සුඋක්ඛිත්තො හොති' යන මේ අභිප්‍රාය පමණක් දක්වනු පිණිස වදරනලදී. **'සත්ථුසාසනෙන'** ඥප්තිසම්පත්තියෙන්ද, අනුසාවනසම්පත්තියෙන්ද. මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි **'ජිනසාසනෙන බුද්ධසාසනෙන'** ජිනසාසනෙන බුද්ධසාසනෙනයි වෙවචනමාත්‍රයක්ම වදරණලදී. **'සඞ්ඝං වා ගණං වා'** යනාදිතන්හි යම් සඞ්ඝ කෙනකුන් විසින් කර්‍මය කරණලද්දේද, ඒ සඞ්ඝයා හෝ එහි බොහෝවූ පුද්ගලසඞ්ඛ්‍යාත ගණයා හෝ එක් පුද්ගලයකු හෝ ඒ කර්‍මය හෝ නොගණියි. නොඅනුව පවතී. එහි ආදරය නොඋපදවයි

යන අර්ථයි. '**සමානසංවාසකා භික්ඛූ වුච්චන්ති සහායා**' සමාන සංවාසක භික්ෂූහු යහළුවෝයයි කියනුලැබෙත්. '**සො තෙහි සද්ධිං නත්ථි**' යන මෙහි එක කර්ම එකුද්දෙස සමසික්ඛතා යන මේ වනාහි සංවාසයය. ඒ මේ සමානවූ සංවාසය මොවුන්ගේනුයි සමානසංවාසකයහ. මෙබඳු භික්ෂූහු මහණක්හු පිළිබඳ ඒ සංවාසයෙහි එක්ව පවත්නා බැවින් සහායහයි කියනුලැබෙත්. දැන් යම් සංවාසයක් කරණකොට ඔවුහු සමානසංසංවාසකයහය කියනලද්දහුද, ඒ ඉවත්කරනු ලැබූ ඔහුට ඔවුන් සමග ඒ සංවාසය නැත්තේය. යම්කෙනකුන් සමග ඒ සංවාසය ඔහුට නැත්තේද, ඔහුවිසින් ඒ භික්ෂූහු තමන්ගේ සහායකයෝ නොකරණලද්දහුද එහෙයින් 'සමානසංවාසකා භික්ඛූ වුච්චන්ති සහායා, සො තෙහි සද්ධිං නත්ථි, තෙන වුච්චති අකතසහායො'යි කියනලදී. සෙස්ස සඞ්ඝභෙද ශික්ෂාපදදීන් අතුරෙහි කියූ නයබැවින් ප්‍රකට අර්ථ ඇත්තේමය. සමනුභාසනසමුත්ථානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. අක්‍රියසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

තෙවන පාරාජිකශික්ෂාපදයයි

—||—

චතුර්ථශික්ෂාපදයෙහි - '**අවස්සුතා**' ලොකාස්වාද සඞ්ඛ්‍යාතවූ මිත්‍රසන්ථවයාගේ වසයෙන් කායසංසග්ගරාගයෙන් තෙත්ව දෙවනපදයෙහිද මේ නයමවේ. '**පුරිසපුග්ගලස්ස හත්ථගහණං වා**' යනාදිතන්හි පුරුෂපුද්ගලයා විසින් අතින් යම් ගැණීමෙක් කරණලද්දේද, එය පුරුෂපුද්ගලයාගේ අතින් ගැණීමයයි කියනලද්දේය. සහළසිවුරෙහි කොණ අල්ලාගැණීමේද මේ නයවේ. '**හත්ථගහණං**' යන මෙහි හස්තග්‍රහණයද අන්‍යවූද අපාරාජික ක්ෂෙත්‍රයෙහි ගැණීමද එක්කොට හස්තග්‍රහණයයි කියනලද්දේයයි දතයුතුය. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි '**හත්ථගහණං වා සාදියෙය්‍ය**' යනු අතනම් වැලමිට පටන් නියඅග දක්වා. මේ අසද්ධර්මයාගේ ප්‍රතිසෙවනයපිණිස අකුවෙන් උඩ දණමඩලින් යට ගැණීම ඉවසාද ථූලච්චයට පැමිණීම වේයයි වදරණලදී. මෙහිද '**අසද්ධම්මො**' යනු කායසංසග්ග රාගයයි දතයුතුය. මෛථුනධර්මය නොදතයුතුය. මෛථුනය ලඟ ථූලච්චයෙක් නොවේ. 'විඤ්ඤූ පටිබලො කායසංසග්ගං සමාපජ්ජිතුං' යන වචනයද මෙහි සාධකය.

'තිස්සො ඉත්ථියො මෙථුනං තං න සෙවෙ,
තයො පුරිසෙ තයො ච අනරියපණ්ඩකෙ,

න වාචරෙ මෙථුනං ව්‍යඤ්ජනස්මිං
ඡෙජ්ජා සියා මෙථුන ධම්මපච්චයා
පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා'

මිනිස් අමිනිස් තිරිසන් වසයෙන් ස්ත්‍රීහු කියනලද්දහුද ඔවුන් පිළිබඳ මෛථුන සෙවනය නොකරන්නේය. මිනිස් අමිනිස් තිරිසන් යන පුරුෂයන් තිදෙන කරාද එළැඹ මෛථුනසෙවනය නොකරන්නේය. අනායසීවූ උභතොබ්‍යඤ්ජනකයන් තිදෙන හා පණ්ඩකයන් තිදෙන යන සදෙන කරාද එළැඹ මෛථුනසෙවනය නොකරන්නේය. මුදුපිට්ඨිලම්බී ආදි අනුලොම් පාරාජිකවස්තුවෙහි තමාගේ නිමිත්තෙහි මෙවුන්දම් නොහැසිරෙන්නේය. මෛථුන ධර්මප්‍රත්‍යයයෙන් පරිජි වන්නේය. මේ ප්‍රශ්නයනුවණැතියන් විසින් සිතිය යුතුය'යි පරිවාරයෙහි කියනලද සෙදමොචන ගාථාව හා විරුද්ධ වේදයත්: විරුද්ධ නොවේ. මෛථුනධර්මයට පූර්වභාගබැවිනි. වර්ණය, අවර්ණය වශයෙන් සුක්කවිස්සට්ඨිය කියනලදී. කායසංසග්ගය දුට්ඨුල්ලාවාචාය. අත්තකාමපාරිචයසීාය. සඤ්චරිත්තයයි මෙසේ සුක්කවිස්සට්ඨිය ආදිකොට ඇති පස්ව ශික්ෂාපදයෝ මෛථුනධර්මයට පූර්වභාගයයි කියනලදහ. එහෙයින් කායසංසග්ගය මෛථුනධර්මයට පූර්වභාග බැවින් ප්‍රත්‍යයවේ. මෙසේ සිදීමවන්නේය. මෛථුනධම්මපච්චයා යනමෙහි මේ කරුණෙන් අර්ථය දතයුත්තේය. සඞ්ඝාටිකණ්ණගහණාදි සියලු පදයන්හිද මේ ක්‍රමයෙන් විනිශ්චය දතයුතුය. අතිකක්ද ඇත්තේය. **'සඞ්කෙතං වා ගච්ඡෙය්‍ය'** යන මෙහි පදභාජනයෙහි **'ඉත්ථං නාමං ආගච්ඡ'** 'මෙ නම් තැනට එව' යන අර්ථය. **'අට්ඨමං වත්ථුං පරිපූරෙන්ති අස්සමණී හොති'** අනුලොම් විසින් හෝ පිළිලොම් විසින් හෝ එක් අතරකින් හෝ යන යම්කිසි ක්‍රමයකින් අටවන වස්තුව පුරන්නීම අශ්‍රමණීයවේ. යම් මෙහෙණක් තොමෝ එක් වස්තුවක් හෝ වස්තුසතක් හෝ බොහෝ වරක් නමුදු පුරාද, අශ්‍රමණී නොවේමය. පැමිණි ඇවැත් දෙසා මිදෙන්නීය. තවද මෙහි දෙසූ ගණනට පැමිණෙන ඇවැත් දතයුතුය. 'අත්ථාපත්ති දෙසිතා ගණනූපිකා අත්ථාපත්ති දෙසිතා න ගණනූපිකා'යි මෙය වදරණලද්දේය. එහි මේ විනිශ්චයයි. 'දැන් මේ ඇවැතට නොපැමිණෙන්නෙමි'යි ධුර නික්ෂෙපය කොට දෙසනලද්දී දෙසූ ගණනට පැමිණෙන ඇවැත් දතයුතුය. පාරාජිකයට අඞ්ගයෙක් නොවේ. එහෙයින් යම් මෙහෙණක් තොමෝ එක් ඇවතකට පැමිණියා ධුරනික්ෂෙපය කොට දෙසා නැවැත කෙලෙස් විසින් පැමිණෙන්නීද නැවැත දෙසාද, මෙසේ වස්තු අට පුරන්නීද, පරිජි නොවන්නීය. යම් මෙහෙණක් තොමේ ඇවැතට පැමිණ නැවැතද 'අන් වස්තුවකට පැමිණෙන්නෙමි'යි

උත්සාහ ඇත්තීම දෙසාද, ඇයගේ ඒ ඇවැත පිළිගැනීම සුදුසු නොවන්නී නොවේ. දෙසනලද්දීද, නොදෙසනලද්දීදවේ. දෙසූ ගණනට නොපැමිණෙන්නීය. පාරාජිකයටම අඩගවේ. අටවැනි වස්තුව පිරුණු ඇසිල්ලෙහිම පාරාජිකා වන්නීය. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙප සමුත්ථානිකය. කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

වර්ණනාක්‍රමයෙන් චතුර්ථශික්ෂාපදය නිමි.

——॥——

`උද්දිට්ඨා ඛො අය්‍යායො අට්ඨ පාරාජිකා ධම්මා`යි භික්ෂූන් අරබයා පණවනලද සාධාරණවූ සතරය, මේ සතරයයි මෙසේ' ප්‍රාතිමොක්ෂොද්දෙශමාර්ගයෙන් `උද්දිට්ඨා ඛො අය්‍යායො අට්ඨ පාරාජිකා ධම්මා`යි මෙසේ මෙහි අර්ථ දතයුතුය. සෙස්ස මහාවිභඞ්ගයෙහි කියූනයමය.

විනයවිවෘති

නම්වූ

සිංහල සමන්තපාසාදිකාවෙහි භික්ෂුණී විභඞ්ගයෙහි

පාරාජිකකාණ්ඩ වර්ණනාව නිමි.

——॥——

පාරාජිකානන්තරස්ස - අයංදානි භවිස්සති,
සඞ්ඝාදිසෙසකණ්ඩස්ස - අනුත්තානත්ථවණ්ණනා

පාරාජිකාවන්ට අනතුරුව දැන් සඞ්ඝාදිසෙසකාණ්ඩය පිළිබඳ මේ අප්‍රකට අර්ථවර්ණනාව වන්නීය.

'උද්දෙසිතං' බඳුතබන හලය. **'මායෝ එවං අවච'** ආර්යාවිය මෙසේ නොකියව. **'අපි නායෙ'** කිම, ආර්යාවිය **'අච්චාවදථ'** ඉක්මවා කියවූ. ආක්‍රොශ කරවූයි කියනලද්දේවේ. **'උස්සයවාදිකා'** මානොත්සන්නවශයෙන්, ක්‍රොධොත්සන්නවශයෙන් විවාදකරන්නී. යම්හෙයකින් ඕතොමෝ අර්ථහෙයින් යුක්ති කියන්නියක් වන්නීද, එහෙයින් උස්සයවාදිකා නම්. අට්ටකාරිකා වුච්චතීති යුක්ති කියන්නීයයි පදභාජනයෙහි වදරණලදී. මෙහිද **'අට්ටො'**යි ව්‍යවහාරිකවිනිශ්චය කියනුලැබේ. පැවිදි හෝ යමකට අධිකරණයයි කියත්ද, ඒය. **'දුතියං වා පරියෙසති'** සාක්ෂියක් හෝ සහායයකු හෝ සොයාද, දුක්කටයවේ. **'ගච්ඡති වා'** මෙහෙණ අසපුවෙක් හෝ වේවා, පිඩු පිණිස හැසිරෙණ මගෙක් හෝ වේවා, යම්තැනක සිටි මෙහෙණට යුක්ති කරන්නෙමියි සිතෙක් උපදීද, ඉන්පසු විනිසකරුවන්ගේ සමීපයට යන්නියට පියවරක් පියවරක් පාසා දුක්කටයවේ. **'එකස්ස ආරොචෙති'** පැමිණිලි විත්තිකාර දෙජනයන් අතුරෙහි යම්කිසි එකක්හුගේ කථාව ඒ දෙදෙනා අතුරෙහි යම්කිසි එකෙක් විනිසකරුවන්ට සැලකරයි. **'දුතියස්ස ආරොචෙති'** යන මෙහිද මේනයමවේ.

මේ මතු කියනුලබන්නී මෙහි නොමුළාබව පිණිස විස්තර කථාය: යම්කිසි තැනක යටත්පිරිසයින් මෙහෙණවරට පැමිණි විනිසකරුවන් දැක මෙහෙණ තොමෝ තමන්ගේ කථාව සැලකෙරේද, මෙහෙණට දුක්කටයවේ. උපාසකයෙක් තෙමේ තමන්ගේ කථාව සැලකෙරේද, මෙහෙණට ථුල්ලච්චයවේ. පළමුකොට උපාසක තෙමේ තමන්ගේ කථාව සැලකෙරේනම් මෙහෙණට දුක්කටයවේ. නැවැත ඕතොමෝ තමන්ගේ කථාව සැලකරා නම් ථුල්ලච්චයවේ. මෙහෙණ තොමෝ මාගේද තාගේද කථාව තෝම සැලකරවායි උපාසකයාහට කියාද, ඒ උපාසකතෙමේ තමන්ගේ හෝ කථාව පළමුකොට සැලකිරීමෙහි, දුක්කටයවේ. දෙවන සැලකිරීමෙහි ථුල්ලච්චයවේ. උපාසක තෙමේ 'මාගේද තාගේද කථාව තීම සැලකරවායි මෙහෙණට කියාද, මෙහිද මේ නයමවේ. මෙහෙණතොමේ කැපකරුලවා යුක්තිය කියවාද, එහි කැපකරු හෝ මෙහෙණගේ කථාව පළමුකොට සැලකෙරේවා, අන්‍යයා හෝ තමන්ගේ කථාව කැපකරුහෝ දෙදෙනාගේම කථාව අන්‍යයා හෝ දෙදෙනාගේම කථාව සැලකෙරේවා,

යම් ඒ පරිද්දෙකින් සැලකරණු ලබනකල්හි මෙහෙණට දුක්කටයවේ. දෙවන සැලකිරීම නිමිතිකොට ථුල්ලච්චයවේ. යම් ඒ පරිද්දෙකින් සැලකරණලද්ද, දෙදෙනාගේම කථාව අසා, විනිසකරුවන් විසින් විනිශ්චය කළ කල්හි යුක්තිවිනිශ්චයෙහි පර්‍ය්‍යවශානයවේ. ඒ විනිශ්චයාගේ කෙළවර මෙහෙණට ජයෙහිද පරාජයෙහිද සඞ්ඝාදිසෙසයවේ. ඉදින් එනාහි බොහෝකල් පැවැති අධිකරණයවේද, විනිසකරුවන් විසින් පෙර අසනලද්දේවේද, එකල්හි ඔවුහු මෙහෙණද යුක්තිකියන්නහුද දැකම තොපට කථාවක් නැත, මේ කරුණ අපි දනුම්හ'යි තුමූම විනිශ්චයකොට දෙත්ද, මෙබඳු විනිශ්චය කෙළවරද මෙහෙණට ඇවැත්නොවේ.

පළමුකොට පැමිණිය යුතු ආපත්තිය මේ ධර්‍මයටනුයි පඨමාපත්තික නම. ව්‍යතික්‍රමණයෙහිම පැමිණිය යුත්තේය යන අර්‍ථයි. ඒ ප්‍රථමාපත්තිය ඇති පදභාජනයෙහි එනාහි අදහස පමණක් දක්වන්නට **'සහවත්ථජ්ඣාචාරා ආපජ්ජති අසමනුභාසනාය'**යි වදරණලදී. මේ එනාහි මෙහි අර්‍ථයයි. වස්තුව්‍යතික්‍රමණය සමග යම් ධර්‍මයකට මෙහෙණතොමෝ පැමිණෙන්නීද, තෙවන සමනුභාෂණයෙන් නොපැමිණෙන්නීද මෙය පළමුකොටම වස්තුව්‍යතික්‍රමණය සමග පැමිණිය යුතුබැවින් පඨමාපත්තිකවේ. භික්ෂුණී සඞ්ඝයා කෙරෙන් පහකෙරේනුයි **නිස්සාරණීය** නම. ඒ පහකළයුතු පදභාජනයෙහි එනාහි අදහස පමණක් දක්වන්නට **'සඞ්ඝම්හා නිස්සාරීයති'**යි වදරණලදි. එහි යමකට පැමිණි මෙහෙණ තොමෝ භික්ෂුණීසඞ්ඝයා කෙරෙන් පහකරණු ලබානුයි හේ නිස්සාරණීයයි මෙසේ අර්‍ථය දතයුතුය. ඒ ධර්‍මය තෙමේම සඞ්ඝයා කෙරෙන් කිසිවකු විසින් පහකරණු නොලබයි. ඒ ධර්‍මයකරණකොට මෙහෙණ තොමෝ පහකරණු ලැබේද, එහෙයින් පහකෙරේනුයි නිස්සාරණීය නම. **'ආකඩ්ඪියමානා ගච්ඡති'** යුක්තිබණන මිනිසුන් විසින් තුමූ හෝ අවුත් දූතයකු හෝ යවා 'එව'යි කියනලද්දී විනිසකරුවන්ගේ සමීපයට යේද, ඉන් පසු අට්ටකාරක තෙමේ තමන්ගේ හෝ කථාව පළමුකොට සැලකෙරේවා. මෙහෙණගේ හෝ කථාව පළමුකොට සැලකෙරේවා, පළමු සැලකිරීමෙහි දුක්කටය නොමවේ. දෙවන සැලකිරීමෙහි ථුල්ලච්චය නොවේ. ඉදින් ඇමැතියන් විසින් විනිශ්චය කොට කරණලද යුක්තිකෙළවරද ඇවැත්නොවේමය. ඉදින් අට්ටකාරකතෙමේ 'මාගේද තීගේද කථාව තීම කියව'යි මෙහෙණට කියානම්, ඒ කරුණ කියන්නියගේද කථාව අසා කරණලද යුක්ති කෙළවරද ඇවැත්නොවේමය. **'රක්ඛං යාචති'** දැහැමි රැකුමක් ඉල්ලාද,

ඇවැත්නොවේ. දැන්, ඉල්ලූ ආරක්ෂාව යම්සේ දැහැමි වේද, එය දක්වනු පිණිස '**අඤ්ඤොදිස්ස ආචික්ඛති**'යි කීහ.

එහි අතීතය අරබයා නියමකොට කීමෙක් ඇත. නියම නොකොට කීමෙක් ඇත. අනාගත අරබයාද නියම කොට කීමෙක් ඇත. නියම නොකොට කීමෙක් ඇත. අතීතය අරබයා නියමකොට කීම කෙසේවේද, යත්: මෙහෙණවරෙහි ගම්දරුවෝ හෝ ධූර්තාදීහු හෝ යම්කිසි කෙනෙක් අනාචාරයෙහි හෝ හැසිරෙත්ද, රුක් හෝ සිඳිත්ද, ඵලාඵල හෝ ගෙණයත්ද, පිරිකර හෝ පැහැරගණිත්ද, එකල්හි මෙහෙණනොමෝ විනිශ්චය කාරකාමාත්‍යයන් කරා එළැඹ 'අපගේ මෙහෙණවර මේ නම් වැඩක් කරණලදැයි කියයි. කවුරුන් විසින්දැ'යි විචාළකල්හි 'අසුවලා විසින්, අසුවලා විසින්යි කියයි. අතීතය අරබයා නියමකොට කීම මෙසේවේ. ඕ නොවටියි. එය අසා ඒ විනිසකරුවෝ ඔවුන්ට දඬුවම් කෙරෙත්ද, ඒ සියල්ල මෙහෙණට නයවේ. 'දඩ ගන්නාහුයයි අදහස ඇති කල්හිද නයමවේ. ඉදින් 'මොහුට දඩ ගසවු'යි කියාද පස්මස්සක් පමණද දඩ ගත්කල්හි පාරාජිකයවේ. 'කවරක්හු විසින්දැ'යි විචාළ කල්හි 'අසුවලා විසිනැ'යි කීම අපට නොවටියි. තෙපිම දනගණිවු, හුදෙක් අපි ආරක්ෂාව ඉල්ලමු, ඒ ආරක්ෂාව අපට දුනමැනැව, ගන්නාලද බඩුවද ගෙන්වනු මැනැවැයි කියයුතුය. නියම නොකොට කීමවේ. ඕ වටියි. මෙසේ කියූකල්හි ඒ විනිසකරුවෝ ඒ ක්‍රියාව කළවුන් සොයා ඔවුන්ට දඩගසත්ද, සියලු වස්තුව ගත්කල්හිද, මෙහෙණට නය නොමවේ. ඇවැත් නොවේ. පිරිකර පැහැරගෙණ යන්නවුන් දැක ඔවුන්ට අවැඩ කැමැති බැවින් 'සොරහු, සොරහු'යි කීමද නොවටියි. මෙසේ කියූකල්හිද, ඔවුන්ට යම් දඬුවමක් කෙරෙත්ද, ඒ සියල්ලම මෙහෙණට නයවේ. 'මොහු විසින් මාගේ පිරිකර ගන්නාලද්දේය, ඒ පිරිකර ගෙන්වාලවා මොහුට දඬුවම් නොකරවයි තමන්ගේ වචනය කරන්නහුට කීම වටියි. දූසිදස්වැව් ආදිය පිණිස නඩු කියත්ද, මෙය අකැප නඩුකීමනම. එය නොවටියි. අනාගතය අරබයා නියම කොටකීම කෙසේ වේද, යත්: කියූ නයින්ම අනුන්විසින් අනාචාරාදියක් කළකල්හි මෙහෙණ නොමෝ 'අපගේ මෙහෙණවරෙහි මේ මේ වැඩ කරත්, මත්තෙහි නොකරණු පිණිස අපට ආරක්ෂාව දුනමැනැවැ'යි විනිසකරුවන්ට මෙසේ කියයි. එකල්හි 'කවුරුන් විසින් මෙසේ කරණලදදැ'යි විචාළ කල්හිද 'අසුවලා විසින්ද අසුවලා විසින්දැ'යි කියාද, මෙසේ අනාගතය අරබයා නියමකොට කීමවේ. එයද නොවටියි. ඔවුන්ට දඬුවම් කළකල්හි පෙර කියූ නයින්ම සියල්ල

මෙහෙණට නයවේ. සෙස්ස පූරිමය සමානමවේ. විනිසකරුවෝ 'මෙහෙණවරෙහි මෙබඳු නොකටයුතු කරන්නවුන්ට මෙනම් දඬුවම් කරම්හයි බෙර හසුරුවා අණෙහි නොසිටින්නන් සොයා දඬුවම් කෙරෙත්ද, මෙහෙණට නය නොමවේ. ඇවැත් නොවේ. යම් මේ විනිශ්චයක් මෙහෙණන්ට කියනලද්දේද, මහණුන්ටත් මෙම නයවේ. මහණහුටද නියමකොට කීම නොවටියි. එසේ කියූ කල්හි යම් දඬුවමක් කෙරෙත්ද, සියල්ල නයවේ. කියූනයින්ම දඬ ගන්වන මහණහුට පාරාජිකයවේ. යම් මහණෙක් දඬ ගසන්නාහයි දන්නේම නියම නොකොට කියාද, ඔවුහුද සොයාබලා දඬ ගසත්මද දෙසෙක් නොවේ. විහාරසීමාවෙහි රුක් ආදිය සිදින්නන්ගේ වෑපොරෝ ආදිය ගෙණ ගලෙන් කොටත් නම් නොවටියි. මුවහත බිඳිද, කරවාදිය යුතුය. දුවගොස් ඒ රුක් සිඳින්නන්ගේ පිරිකර ගණිත්ද හෙද නොකටයුතුය. සිත වහා පෙරළෙන්නේමය. එහෙයින් සොරසිත උපන්කල්හි මුල්සිඳීමටද යන්නේය. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්‍ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කමයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සප්තදශකසඞ්ඝාදිශෙෂයන් අතුරෙහි පළමුවන ශික්‍ෂාපදයයි

—||—

ද්විතීය ශික්‍ෂාපදයෙහි - 'වරහණ්ඩං' මුතු මැණික් වෙරළුම්ණි ආදීවූ මාහැඟි බඩු '**අනපලොකෙත්වා**' නොවිචාරා. '**ගණං** වා' මල්ලරජුන්ගේ ගණය හා කුමාරභත්තිගණාදියය. '**පූගං**' ධාර්මිකගණය. 'සෙණිං' නන්වැදෑරුම් දුවඳ කරණගණය හා පෙසකාරගණාදියය. යම්හෙයකින් යම් යම් තැනක රජහු ගණාදීන්ට ගම්නියම්ගම් 'තෙපිම මෙහි අනුශාසනා කරවුයි පාවාදෙත්ද, ඒ ඒ තන්හි ඔවුහුම අධිපතීහු වෙත්. එහෙයින් ඔවුන් සඳහා මේ කියනලදී. මෙහිද රජු හෝ ගණාදීන් හෝ විචාරාද භික්‍ෂුණී සඞ්ඝ තෙමේ විචාරිය යුත්තේමය. '**ඨපෙත්වා කප්පං**' තීර්ථකයන් අතුරෙහි හෝ අන් මෙහෙණන් අතුරෙහි හෝ පෙර පැවිදිවූ කැපබවට ගියක හැර සෙස්ස ප්‍රකටමය. චොරිවුට්ඨාපන සමුට්ඨානිකය. කිසි කායකීයක් හෙතුකොට මෙහෙණන් ගියකල්හි අවුත් ඛණ්ඩසීමාවක, හුන් තැනෙහිම තමන්ගේ ඇදුරෙහිවූ පිරිස සමග උපාධ්‍යායව උපසම්පද කරවන්නියට වාචා චිත්තයෙන් හටගණියි. ඛණ්ඩසීමාවකට හෝ නදියකට හෝ ගොස් උපසපන් කරන්නියට කායවාචාචිත්තයෙන් හටගණියි. නොවිචාරා උපසපන් කරවීම්වසයෙන්

ක්‍රියාක්‍රියය. සංඥාවිමොක්‍ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

දෙවන ශික්‍ෂාපදයයි

—\\—

තෘතීය ශික්‍ෂාපදයෙහි - **පරික්ඛෙපං අතික්කාමෙන්තියා** මෙහි එක් පයක් ඉක්මවන්තියට ථුල්ලච්චයවේ. දෙවනපය ඉක්මවූ ඇසිල්ලෙහි සඞ්ඝාදිසෙසයවේ. '**අපරික්ඛිත්තස්ස ගාමස්ස උපචාරං**' මෙහි වැට කිරීමට සුදුසු තැන එක් පයකින් ඉක්මවා නම් ථුල්ලච්චයවේ. දෙවන පයින් ඉක්මවූ ඇසිල්ලෙහි සඞ්ඝාදිසෙසයවේ. තවද මෙහි එක්ගමකින් නික්මෙන්නියට ග්‍රාමාන්තරප්‍රත්‍යයයෙන් ඇවැත් නොවේ. නික්ම අන්ගමකට යන්නියට පියවරක් පියවරක්පාසා දුක්කටයවේ. එක් පයකින් අන්ගමක පරික්‍ෂෙපය හෝ උපචාරය හෝ ඉක්මවූ ඇසිල්ලෙහි ථුල්ලච්චයවේ. දෙවන පයින් ඉක්මෙවූ ඇසිල්ලෙහි සඞ්ඝාදිසෙසයවේ. එයින් නික්ම නැවැත සිය ගමට පිවිසෙන්නියටද මෙම නයවේ. කඩ පවුරකින් හෝ වැටසිදුරකින් හෝ භික්ෂුණීන්ගේ විහාරභූමියට ඇතුල්වන්නට හැකිවේද, මෙසේ ඇතුල්වන්නී කැපබිමට පිවිසියාවේ. එහෙයින් වටියි. ඇත්පිට ආදියෙන් හෝ සෘද්ධියෙන් හෝ පිවිසේනම් වටීමය. මෙහි පයින් ගමනම අදහස් කරණලදී. එහෙයින්ම 'පඨමං පාදං අතික්කාමෙන්තියා' යනාදිය කීහ. ගම් දෙකක් භික්ෂුණීන්ගේ විහාර හා සබැඳි වැට ඇත්තේවේ. යම් ගමෙක භික්ෂුණීවිහාරය වේද, එහි පිඬුපිණිස හැසිර නැවැත විහාරයට පිවිස වෙහෙරමැදින් අනික් ගමකට මග ඇත්තේද, යෑම වටියි. එගමින් ඒ මගින්ම හැරී ආයුතුය. ඉදින් ගම්දෙරින් නික්ම එන්නීද, පෙරනයින්ම ආපත්තිභෙදය දතයුතුය. සියගමින් කිසියම් කාර්‍යයක් හෙතුකොට මෙහෙණන් සමග නික්මුනු මෙහෙණ නැවැත පිවිසෙන කල්හි ඇතෙක් හෝ මිදී ඒද ජන සම්බාධයෙක් හෝ වේද, එහිදී අන් මෙහෙණෝ වහා ගමට පිවිසෙත්ද, අන් මෙහෙණක් එනතුරු පිටතදෙර සිටියයුතුය. ඉදින් නොඑන්නීද, දෙවන මෙහෙණ තොමෝ ගියා නම්වේ. පිවිසීම වටියි. පෙර මහගමෙක් වේද, ගමමැද මෙහෙණවරක් වේද, පසුව සතරදෙනෙක් එගම ලැබ වෙන් වෙන්ව වැටින් වටකොට බෙදගෙණ බුදිත්ද, වෙහෙරින් එක් ගමකට යෑමවටියි. එගමින් අනික් ගමකට දෙරකඩින් හෝ වැට සිදුරකින් හෝ පිවිසෙන්නට නොවටියි. නැවැත වෙහෙරටම හැරී ඒම වටියි. කුමක් හෙයින්ද, යත්:- වෙහෙරට ගම් සතර සාධාරණ බැවිනි. '**අන්තරවාසකො තෙමියති**' යම් නදියක තෙමඩුලු වැසීමෙක් වේද, එසේ

හැඳගත්, වැසිකාලයෙහි තොටින් හෝ නොතොටින් හෝ බැස යම් කිසි තැනක එතෙර වන්නාවූ මෙහෙණගේ අඳනය එකහුල් දෑහුල් පමණ නමුදු තෙමේද, ඕය. සෙසු නදීලක්ෂණය. නදීනිමිත්තකථාවෙහි ප්‍රකාශ වන්නේය. මෙබඳු නදියකට තොටින් හෝ නොතොටින් හෝ බැස එතෙරවන කාලයෙහි පළමුපය උදුරා ඉවුරෙහි තබන්නියට ථුල්ලච්චයවේ. දෙවනපිය ඉදිරීම නිමිතිකොට සඞ්ඝාදිසෙසයවේ. හෙයකින්යේද, ඇවැත් නොවේ. පයින් නදියට බැස එතෙරවන කාලයෙහි හෙයට නැග එතෙරවන්නියටද, ඇවැත් නොවේ. හෙයකින් ගොස් එතෙරවන කාලයෙහි පයින්යන්නියට ඇවැත්වේමය. යානනාවා ආකාස ගමන් ආදියෙහිද මේ නයමවේ. මෙතෙරින් ගහින් එතෙර නොව අහසට පැන හෝ පරතෙරම පාගන්නියට ඇවැත් නොවේ. රඳන්කම් පිණිස ගොස් දර රැස්කිරීම් ආදි කටයුතුවලින් දෙතුන් මෙහෙණ කෙනෙක් දේතෙරෙහි හැසිරෙත්ද, වටියි. ඉදින් මෙහි කිසි මෙහෙණක් කලහකොට අතික් තෙරටයේද, ඇවැත්වේ. මෙහෙණෝ දෙදෙනෙක් එකට එතෙර වෙත්ද, එක් මෙහෙණක් තොමෝ ගහමැද්දී කලහකොට නැවැතී මෙතෙරටම එන්නීද ඇවැත්වේ. අන් මෙහෙණහට මෝතොමෝ ගියතැන සිටියාවේ. එහෙයින් පරතෙරට යන්නියටද ඇවැත් නොවේ. නෑමට හෝ බීමට හෝ බැසසිටි මෙහෙණතොමෝ ඒ ඉවුරටම පෙරළා එතෙරවේද, ඇවැත් නොවේ. '**සහ අරුණුග්ගමනා**' යන මෙහි හැදෑරීම හෝ අන්කිසි කර්මයක් හෝ කරන්නී අරුණට පෙරම දෙවැනියගේ සමීපයට එන්නෙමි'යි කල්පනාකෙරේද, ඒ මෙහෙණ නොදන්නා කල්හිම අරුණනගීද, ඇවැත් නොවේ. එකල්හි අරුණනැගීම දක්වා මෙහිම වන්නෙමියි හෝ කල්පනානොකිරීමෙන් විහාරයෙහි එක්පෙදෙසක හිඳීද, දෙවන මෙහෙණගේ අත්පසට නොබසීද, අරුණ නැගීමෙහි සඞ්ඝාදිසෙසයවේ. අත්පසම මෙහි පමණවේ. අත්පස ඉක්මීමෙහි එක් ගබඩාවක්වී නමුදු ඇවැතින් නොරකියි. '**අගාමකෙ අරඤ්ඤෙ**' මෙහි නික්ඛමිත්වා බහි ඉන්දඛීලා සබ්බමෙතං අරඤ්ඤං'යි මෙසේ කියූ ලක්ෂණ ඇතියේම අරණ්‍යයය. ඒ මේ අරණ්‍යය හුදෙක් ගම නොවීමෙන් අගාමකයි කියනලදී. විඣ්‍යවන හා සමාන නොවනබැවිනි. එබඳු වනයකට බටකල්හි දර්ශනොපචාරය හැරිය කල්හි ශ්‍රවණොපචාරය ඇත්තේනම් ඇවැත්වේ. එහෙයින්ම අට්ඨකථාවන්හි 'ඉදින් මෙහෙණන් මහාබොධි අඞ්ගනයට පිවිසෙන කල්හි එක් මෙහෙණක් තොමෝ පිටත සිටීද, ඇයටද ඇවැත්වේ. ලොහොපහයට පිවිසෙන්නියන් කෙරෙහිද, පිරිවෙණට පිවිසෙන්නියන් කෙරෙහිද, මේ නයමවේ. මහසෑය වඳින්නියන් අතුරෙහිද එක් මෙහෙණක් තොමෝ උතුරුදෙරින් නික්මයේද, ඇයටද, ඇවැත්වේ. ථූපාරාමයට පිවිසෙන්නියන් අතුරෙහි එක් මෙහෙණක් තොමෝ

පිටත සිටීද, ඇයටද ඇවැත් වේයයි කියනලදී. මෙහි දර්‍ශනොපචාරය නම් යම්තැනක සිටියහු දෙවන මෙහෙණක් තොමෝ දකීද එතැනය. ඉදින් තිරපවුරක අතර සිටියා වේද, දර්‍ශනොපචාරය හරී නම්වේ. ශ්‍රවණොපචාරය නම් යම්තැනක සිටියා මංමුළාහඬින් මෙන්ද ධර්‍මශ්‍රවණාරොචන ශබ්දයෙන් මෙන්ද, **අය්‍යෙයි** හඬනගන්නියගේ ශබ්දය අසාද, ඒ තැනය. අඛවෙසෙහි දුරද දර්‍ශනොපචාරය නම්වේ. ඕතොමෝ මෙබඳු ශ්‍රවණොපචාරය හලකල්හි ඇවැත් නොරකියි. හල ඇසිල්ලෙහිම සඞ්ඝාදිසෙසාපත්තියට පැමිණීමවේ. එක් මෙහෙණක් තොමෝ මගයන්නී නවතීද, උත්සාහ ඇතිව 'දැන් පැමිණෙන්නෙමි'යි ලුහුබඳීද, ඇවැත්නොවේ. 'ඉදින් පළමුකොට යන්නීහු අන් මගකින් යෙත්ද, ගියාහුනම් වෙති. අනාපත්තිම වේ. යන්නාවූ දෙදෙනකු අතුරෙන් එක් තැනැත්තියක් ලුහුබඳින්නට අපොහොසත් වන්නී 'මොතොමෝ යේවා'යි වෙන්වේද, අනික් තැනැත්තීද, 'මෝතොමෝ වෙන්වේවායි යේද, දෙදෙනාහටම ඇවැත්වේ. මගබැස යන්නවුන් අතුරෙහි ඉදිරියෙහි යන මෙහෙණ තොමෝ මංමුළාවූ බැවින් අන් මගක් ගණීද, පසුව යන මෙහෙණ තොමෝත් අන්මගක් ගණීද, එක් මෙහෙණක් එක් මෙහෙණක ගිය තැන සිටියි. දෙදෙනාහටම ඇවැත් නොවේ. '**පක්ඛසඞ්කන්තාවා**' තීර්ථායතනයට ගියා හෝ. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජිකසමුත්ථානිකය ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

තෙවන ශික්ෂාපදයයි

—||—

චතුර්ථ ශික්ෂාපදයෙහි - '**පාදපීඨං**' සේදූ පා තබන දඬුකඩ '**පාදකඨලිකං**' නොසේදූ පා තබන දඬුකඩ. '**අනඤ්ඤාය ගණස්ස ඡන්දං**' එම උත්ක්ෂෙපණීයකර්‍මකාරක ගණයාගේ ඡන්දය නොදැන. '**වත්තෙ වත්තන්තිං**' තෙතාළිස් ප්‍රභෙදවූ එතෙරවීමට හෙතුවූ වතෙහි පවතින්නිය. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුත්ථානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. ක්‍රියාක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සිවුවන ශික්ෂාපදයයි

—||—

පඤ්චම ශික්ෂාපදයෙහි - **'එකතො අවස්සුතෙ'** මෙහි 'මෙහෙණගේ මෛථුනරාගයෙන් තෙත්බව දතයුතුයයි මහාපච්චරියෙහි කියනලදී. මහාඅට්ඨකථාවෙහි මෙය නොකියනලදී. නියමකොට ඒ නොකීම පෙළ හා සමවේ. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජික සමුට්ඨානික වේ. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

පස්වන ශික්ෂාපදයයි

——||——

ෂෂ්ඨශික්ෂාපදයෙහි - **'යතො ත්වං'** යම් හෙයකින් තී **'උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස'** යනාදීවූ සඞ්ඝාදිසෙසය කෙළවරකොට ඇති ඇවැත්හු කවරියක්හට වෙත්ද, යත්ඃ කියූලෙසින් නියොග කරණ මෙහෙණට වේත්.

> 'න දෙති න පතිගණ්හාති පටිග්ගහො තෙන න
> විජ්ජති, ආපජ්ජති ගරුකං න ලහුකං තඤ්ච
> පරිභොග පච්චයා පඤ්හා මෙසා කුසලෙහි
> චින්තිතා'

'නියොග කරන්නිය නොදෙයි. ඕ, අතින් නොපිළිගණියි. ඒ කරුණෙන් නියොග කරන්නියගේ අතින් පිළිගැන්මෙක් නැත්තේය. මෙසේ ඇති කල්හි මෛථුන් රාගයෙන් තෙත්වූවහුගේ අතින් පිණ්ඩය ගැණීම නිමිතිකොට නියොග කරන්නිය. සඞ්ඝාදිසෙසයට පැමිණේ. ලහුකාපත්තියට නොපැමිණේ. එද පරිභොගය ප්‍රත්‍යය කොටය. මේ ප්‍රශ්නය නුවණැතියන් විසින් සිතිය යුතුයයි මෙය පරිවාරයෙහි කියනලදී.

මේ ගාථාව නියොගකරන්නිය සඳහා කියනලදී. නියොගලත් අතික් මෙහෙණගේ ආපත්තිභෙදය ප්‍රථම ශික්ෂාපදයෙහි බෙදනලද්දේය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ශික්ෂාපදයයි

——||——

සප්තම ශික්ෂාපදයෙහි - **යාවතතියකපදභාජනීය** මහාවිභඞ්ගයෙහි කියූනයින්ම දතයුතුය. සෙස්ස ප්‍රකටමය. සමනුභාසනසමුට්ඨානිකය.

ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි

සත්වන ශික්ෂාපදයයි

—\\—

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'කිස්මිඤ්චිදෙව අධිකරණෙ'** සතර අධිකරණයන් අතුරෙහි එකත්රා එකෙක. පදභාජනයෙහි වනාහි හුදෙක් අධිකරණවිභාගය දක්වනු පිණිස **'අධිකරණං නාම චත්තාරි අධිකරණානි'** යනාදිය වදරණලදී. සමුට්ඨානාදිය සමග සෙස්ස ප්‍රකටමය.

අටවැනි ශික්ෂාපදයයි

—\\—

නවම ශික්ෂාපදයෙහි - **'සංසට්ඨා'** මිශ්‍රවූවාහු. **'අනනුලොමිකෙන'** පැවිද්දන්ට අනුලොම් නොවූ. **'කායිකවාචසිකෙන සංසට්ඨා'** ගිහියන්ගේ කෙටීම් පිසීම් සුවඳඇඹරීම් මල්දම් ගෙතීම් ආදීවූ කායික ක්‍රියාවෙන්ද, හසුන් ගෙණ යැම පෙරළා ගෙණ ඊමැයි කියනලද වාචසික ක්‍රියාවෙන්ද මිශ්‍රවූවාහු. ලාමක කීර්තිශබ්දය මේ මෙහෙණින්ගේනුයි **පාපසද්දා** නම්හ. ලාමක වූ ආජීවසඞ්ඛ්‍යාත කීර්තිය මේ මෙහෙණින්ගේනුයි **පාපසිලොකා** නම්හ. සමුට්ඨානාදිය සමග සෙස්ස ප්‍රකටයමය.

නවවන ශික්ෂාපදයයි

—\\—

දශම ශික්ෂාපදයෙහි **'එවාචාරා'** මෙබඳු ආචාර ඇත්තාහු. තොපගේ ආචාරය යම්බඳුද, එබඳු ආචාර ඇත්තාහුය. යන අර්ථයි. සියලු තන්හි මෙම නයවේ. **'උඤ්ඤාය'** අවඥයෙන් පහත්කොට දැනීම පිණිස. **'පරිභවෙන'** මේ මෙහෙණෝ කුමක් කරන්නාහුදැ'යි මෙසේ පරිභව කොට දැනීමෙන්. **'අක්ඛන්තියා'** නොඉවසන බැවින් කොපයෙන් යන අර්ථයි. **'වෙභස්සා'** බලවත් කථා ඇතිබැවින්. තමන්ගේ බලය පවසන තැති ගැන්වීමෙන් යන අර්ථයි. **'දුබ්බල්‍යා'** තොපගේ දුර්වලභාවයෙන්. සියලුතන්හි අවඥයෙන්, පරිභවයෙන්යි මෙසේ සමුච්චයාර්ථය දතයුත්තේය. **'විවිච්චථ'** වෙන්වුව මැනැවැ. සමුට්ඨානාදීන් සමග සෙස්ස ප්‍රකටමය.

දසවන ශික්ෂාපදයයි.

—\\—

**'උද්දිට්ඨා ඛො අය්‍යායො සත්තරස සඞ්ඝාදිසෙසා'** මෙහි සවැදෑරුම්වූ ප්‍රථමාපත්තීන්ට අනතුරුව සඤ්චරිත්ත ශිෂාපදයද දුෂ්ටදෙෂශික්ෂාපද දෙකද යන මේ ත්‍රිවිධශික්ෂාපදයෝ මහා විභඞ්ගයෙන් ගෙණ බහා ප්‍රථමාපත්තික නවයද, සිවුවැදෑරුම්වූ යාවතතියකාපත්තීන්ට අනතුරුව මහාවිභඞ්ගයෙන්ම ගෙණ සිවුවැදෑරුම් යාවතතියක ශික්ෂාවන් බහා යාවතතියක ශික්ෂාපද අටද දතයුතුය. මෙසේ සියලුම ශික්ෂාපදයෝ ප්‍රාතිමොක්ෂාදෙශ මාර්‍ගයෙන් 'උද්දිට්ඨා ඛො අය්‍යායො සත්තරස සඞ්ඝාදිසෙසා ධම්මා'යි මෙසේ මෙහි අර්‍ථ දතයුතුය. පක්ෂමානත්තය හැර සෙස්ස ප්‍රකටමය. ඒ පක්ෂමානත්තය වතාහි ඛන්ධකයෙහි විස්තරවශයෙන් වර්‍ණනා කරන්නෙමු.

විනයවිවෘති

නම්වූ

සිංහල සමන්තපාසාදිකාවෙහි

භික්ෂුණී විභඞ්ගයෙහි

සප්තරසක සඞ්ඝාදිසෙසවර්‍ණනාව නිමි

—||—

"තිංස නිස්සග්ගියා ධම්මා - භික්ඛුණීනං පකාසිතා,
යෙ තෙසංදනි භවති - අයං සංවණ්ණනාක්කමො"

මෙහෙණින්හට යම් තිංස නිස්සග්ගියපාචිත්තීහු කෙනෙක් වදරණලද්දහුද දැන් ඒ පාචිත්තියාපත්තීන්ගේ මේ සංවණ්නා ක්‍රමයවේ.

"**ආමත්තිකාපණං**" බඳුන් අමත්තයි කියනුලැබේ. ඒ බඳුන් යම් කෙනෙක් විකුණත්ද, ඔවුහු ආමත්තිකයි කියනුලැබෙත්. ඔවුන්ගේ ආපණය තෙමේ ආමත්තිකාපණ නම්. එය හෝ පැතිරීම කරන්නාහුය යන අර්ථයි. "**පත්තසන්නිචයං කරෙය්‍ය**" පාත්‍රය තැන්පත්කිරීම කරන්නේය. නොඉටා හෝ විකපනය නොකොට හෝ පාත්‍රය එක්දවසක් තබන්නේ නම් යන අර්ථයි. සෙස්ස මහාවිභඞ්ගයෙහි කියූනයින්ම දතයුතුය. මේ ම මෙහි විශෙෂයවේ. ඒ මහාවිභඞ්ගයෙහි දසදවසක් පරිහාරයවේ. මේ ශික්ෂාපදයෙහිලා එක් දවසකුදු පරිහාරයෙක් නැත්තේය. සෙස්ස එබඳුමවේ. මෙද කඨිනසමුට්ඨානිකවේ. කායවාචායෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. අක්‍රියසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ශික්ෂාපදයයි

—\\—

ද්විතීය ශික්ෂාපදයෙහි - "**දුච්චොළා**" විරූපවස්ත්‍ර ඇතිව. දිරාගිය වත්ඇතිව යන අර්ථයි. "**අපය්‍යාහි**" අපි අය්‍යාහි කිම, ආය්‍යාවන් විසින්. "**ආදිස්ස දින්නං**" පැමිණියෝ බෙදගණිත්වායි කියාද, මේ සිවුර ගණයාහට, මේ සිවුර තොපට දෙමි'යි කියාද, දෙනු කැමැති බැවින් පාමුල තබා හෝ දෙන ලද්දේද, උදෙසා දෙනලද්දේ නම්වේ. මේ සියල්ලම අකාලචීවරයි. "**අය්‍යාය දම්මි**" මෙසේ පිළිලද සිවුරක් යථාස්ථානයෙහිම එළවිය යුතුය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනය.

දෙවන ශික්ෂාපදයයි.

—\\—

තෘතීය ශික්ෂාපදයෙහි - "**හන්ද**" ගණුව "**සයං**" "**අච්ඡින්දති**" එක් සිවුරක්දී එක් සිවුරක් පැහැර ගන්නියට එක් නිසගියෙක් වේ. බොහෝ පැහැර ගත්කල්හි බොහෝ නිසගීහු වෙත්. ඉදින් අකුලා තබන සිවුරු

එකටම පැහැර ගණිත්ද, වස්තු ගණනින් ඇවැත්වේ. බැඳ තැබූ චීවරයන්හි එක්ම ඇවැතක් වේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

තෙවන ශික්ෂාපදයයි.

—\\—

චතුර්ථ ශික්ෂාපදයෙහි - **'කයෙන'** මිලයෙන් **'න මෙ ආවුසො සප්පිනා අත්‍ථො තෙලෙන මෙ අත්‍ථො'** මේ වනාහි ඕ තොමේ ගෙණ එනලද ගිතෙල් දී තෙල්ද ගෙණ එන්නෙමි'යි සිතන්නී මෙසේ කිවුය. **'විඤ්ඤාපෙත්වා'** දන්වා 'මෙනම් දෙය ගෙණ එව'යි ඉල්වා හෝ, **'තඤ්ඤෙව විඤ්ඤාපෙති'** යමක් පළමුකොට විනවන ලද්දේද, එය විකවේද, නොපොහොනේද, එහෙයින් නැවැත ඒ විනවූවක්ම විනවාය යන අර්ථයි. **'අඤ්ඤඤ්ච විඤ්ඤාපෙති'** ඉදින් පළමු කොට ගිතෙල් විනවනලද්දේද, ගිතෙල් හා තෙල් එක්කොට පිසිය යුතුයයි වෙදහු විසින් කියූ බැවින් තෙලෙන් ප්‍රයොජන වේද, එහෙයින් තෙලෙන්ද මට ප්‍රයොජනය'යි කහවණුවකින් ගිතෙල් ගෙණෙන ලද්දේ වේනම්, මේ මිලෙන් දෙගුණයක් තෙල් ලබයි. ඒ තෙලිනුදු මේ කිස නිපදීද, එහෙයින් තෙල් ගෙණ එව'යි මෙසේ අනුසස් දක්වා විනවයි. සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සිවුවන ශික්ෂාපදයයි.

—\\—

පඤ්චම ශික්ෂාපදයෙහි - **'න මෙ සික්ඛමානෙ'** මේ වනාහි ඒ ථුල්ලනන්ද කුල දුහිතෘ තොමෝ **එකාන්තයෙන් මෙසේ** කියූ මේ කුළුදු තොමෝ මේ තෙල් හැර ගිතෙල්ද මට තමන්ගේ කුලගෙයින් ගෙණෙන්නේයයි සිතමින් කිවුය. **'චෙතාපෙත්වා'** දන්වාය යන අර්ථයි. සෙස්ස සියලු තන්හි සිවුවන ශික්ෂාපදය සමානමය.

පස්වන ශික්ෂාපදයයි

—\\—

ෂෂ්ඨශික්ෂාපදයෙහි - **'ඡන්දකං'** 'මෙනම් දහම් කිස කරන්නෙමු, යමක් දෙන්නට හැක්කහුද, එය දෙව්'යි මෙසේ අන්හට ඡන්දයද රුචියද උපදවා ගත් පිරිකරට මේ නමෙකි. **'අඤ්ඤදත්ථිකෙන'** අනිකක්හට ප්‍රයොජනය පිණිස දෙනලද. **'අඤ්ඤුද්දිස්සිකෙන'** අනිකක්හු උදෙසා දෙනලද. **'සඞ්ඝිකෙන'** සඞ්ඝයා හට පරිත්‍යාග කරණලද. **'සෙසකං උපනෙති'** යමක් පිණිස දෙනලද්දේද. එය මිල කරවා සෙස්ස අනිකක්හු පිණිස එළවයි. **'සාමිකෙ අපලොකෙත්වා'** 'තොප විසින් සිවුරු පිණිස දෙනලද්දේද, අපටද සිවුරු ඇත්තේය, තෙල් ආදියෙන් ප්‍රයොජන ඇත්තේය'යි මෙසේ විචාරා එළවයි. **'ආපදාසු'** එබඳු උවදුරුවලදී මෙහෙණෝ වෙහෙර හැරදමා යෙත්ද, මෙබඳු ආපදවන්හි. යම්බඳු වූවක් හෝ ප්‍රයොජනද එබඳු වූවක් පරිවර්තනය කරවන්නට වටියි. සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය. ක්‍රියාක්‍රියසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ශික්ෂාපදයයි

——\\——

සප්තමශික්ෂාපදයෙහි - **'සඤ්ඤාචිකෙන'** තමන් විසින් ඉල්ලාගත් යමකින්. මෙපමණෙක්ම මෙහි වෙනසය. සෙස්ස සවන ශික්ෂාපදය සමානම වේ.

සත්වන ශික්ෂාපදයයි

——\\——

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'මහාජනිකෙන'** ගණයකට පරිත්‍යාග කරණලද්දෙන්, මෙපමණෙක්ම මෙහි වෙනස්ය.

අටවන ශික්ෂාපදයයි

——\\——

නවම ශික්ෂාපදයෙහි - 'සඤ්ඤාචිකෙන' මේ පදය මෙයින් ඉතා අධිකවේ.

නවවන ශික්ෂාපදයයි

——\\——

දශම ශික්ෂාපදයෙහි - **'පරිවෙණං උද්‍රියති'** පිරිවෙණ වැනසෙන්නේය. ඇද වැටේය යන අර්ථයි. 'පරිපතති' යන මේ පදයද 'පුග්ගලිකෙ සඤ්ඤිච්චකෙන' යන මේ පදයද මෙපමණෙක්ම වෙනසය. සෙස්ස පූර්වය හා සමානමවේ.

දසවන ශික්ෂාපදයයි

—||—

එකාදශම ශික්ෂාපදයෙහි - **'ගරුපාපුරණං'** සීතකාලයෙහි පොරෝණය. **'චතුක්කංසපරමං'** මෙහි කංස නම් සතරකහවණු පමණවේ. එහෙයින් පදභාජනයෙහි **'සොළසකහාපණග්ඝනකං'** සොළොස් කහවණු අගනු එකකැ වදරණලදී

එකොළොස්වන ශික්ෂාපදයයි.

—||—

ද්වාදශම ශික්ෂාපදයෙහි - 'ලහුපාපුරණං' උෂ්ණකාලයෙහි පොරෝණය ශික්ෂාපද දෙක්හිම සෙස්ස ප්‍රකටමය.

ෂඩ් සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙළොස්වන ශික්ෂාපදයයි.

—||—

**'උද්දිට්ඨා ඛො අයස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා'** මෙහි මහාවිභඞ්ගයෙහි චීවරවර්ගයෙන් ධොවන ශික්ෂාපදයද, ප්‍රතිග්‍රහණ ශික්ෂාපදයද යන ශික්ෂාපද දෙක බැහැරකොට අකාලචීවරය කාලචීවරයයි ඉටා බෙදනලද ශික්ෂාපදය හා ද පෙරළා අච්ඡින්නචීවර ශික්ෂාපදය සමග ප්‍රථම වර්ගය පිරවියයුතුය. නැවැත එළකලොම වර්ගයාගේ ආදියෙහි ශික්ෂාපද සතක් බැහැරකොට අඤ්ඤදත්ථික ශික්ෂාපද සත බහා ද්විතීයවර්ගය පිරවියයුතුය. තෘතීයවර්ගයෙන් පඨමපත්ත ශික්ෂාපදය වස්සිකසාටික ශික්ෂාපදය ආරඤ්ඤක ශික්ෂාපදය යන මේ තුන බැහැරකොට පත්තසන්නිචය ගරුපාපුරණ ලහුපාපුරණ ශික්ෂාපදයන්

සමග තෘතීයවර්ගීය පිරවියයුතුය. මෙසේ මෙහෙණන්හට එක් පක්ෂයෙක්හිලා පනවනලද දෙළොස් ශික්ෂාපදද දෙපක්ෂයෙහිලා පණවනලද අටළොස් ශික්ෂාපදද මෙසේ සියල්ලෝම ප්‍රාතිමොක්ෂාදෙශමාර්ගීයෙන් 'උද්දිට්ඨා ඛො අය්‍යායො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා'යි මෙසේ මෙහි අර්ථ දතයුතුය. සෙස්ස කියූනයමය.

විනයවිවෘති

නම්වූ

සිංහල සමන්තපාසාදිකාවෙහි

භික්ඛුණී විභඞ්ගයෙහි

තිංසකනිස්සග්ගියවර්ණනාව නිමි.

——\\——

"තිංසකානන්තරං ධම්මා - ඡසට්ඨිසතසඞ්ගහා,
සංගීතා යෙ අයංදනි - හොති තෙසම්පි වණ්ණනා"

තිංසනිස්සග්ගිය පාචිත්තීන්ට අනතුරුව එක්සිය සැට සයකින් සඞ්ග්‍රහවූ යම් පාචිත්තියධර්ම කෙනෙක් සඞ්ගායනා කරණලද්දාහුද දැන් ඔවුන්ගේ මේ වර්ණනා තොමෝ වන්නීය.

එහි ලසුණුවර්ගීය පිළිබඳ ප්‍රථමශික්ෂාපදයෙහි - "ද්වෙ තයො භණ්ඩිකෙ" දෙකක් හෝ තුනක් හෝ පොදිබැඳි ලූනු. පිරීගත් මිදුළු ඇති ලූනුවලට මේ නමෙකි. "**න මත්තං ජානිත්වා**" පමණ නොදැන කෙත් රකින්නහු වළකත්, වළකත්, බොහෝ ලූනු සුහැරීනාහුව ගෙන්වූය. "**අඤ්ඤතරං හංසයොනිං**" ස්වර්ණහංසයොනියය. "සො තාසං එකෙකං" ඒ හංස තෙමේ ජාති සිහිකිරීමෙහි සමර්ථවූයේය. එකල්හි පූර්වස්නෙහයෙන් අවුත් ඔවුන්ට එක් එක් පත්‍රයක් දෙන්නේය. ඒ පත්‍රය වනාහි තැවීමට තැළීමට සිදීමට සුදුසුවූ ස්වර්ණයක්ම වේ. "**මාගධකං**" මගධ රට හටගත්තේය. මගධ රට හටගත් ලූනුම මෙහි ලූනුයයි අදහස් කරනලදී. ඒද පොදිලූනුමවේ. එකක් දෙකක් මිදුලු ඇති ලූනු නොවේ. **කුරුන්දියෙහි** වනාහි හටගත් දෙශය නොකියා "මාගධක නම් පොදිලූනුයි කියනලදී. "**අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ**" මෙහි ඉදින් දෙකක් තුනක් පොදිලූනු එකටම විකා ගිලීද, එක් පාචිත්තියක් වේ. පොදිය කඩා බිඳ එක් එක් මිදුලක් කන්නියට ප්‍රයොග ගණනින් පාචිත්තීහු වෙත්. පඩු පැහැති ලූනු ආදීන්ගේ පැහැයෙන්ද මිදුලෙන්ද වෙනස්බව දතයුතුය. පැහැයෙන් වනාහි **පලණ්ඩුක** නම් ලූනු පඩු පැහැතිවේ. **භඤ්ජනක** නම් ලූනු ලේ පැහැතිවේ. **හරිතක** නම් ලූනු තිල්පත් පැහැතිවේ. මිදුලෙන් වනාහි පලණ්ඩුකනම් ලූනෙහි එක් මිදුලක්වේ. භඤ්ජනක නම් ලූනෙහි මිදුලු දෙකක්වේ. හරිතක නම් ලූනෙහි මිදුලු තුනක්වේ. චාවල නම් ලූනු මිදුලු නැත්තේය. ඒ චාවල ලූනෙහි අඞ්කුරමාත්‍රයෙක්මවේ. **මහාපච්චරී** ආදියෙහි පලණ්ඩුකනම් ලූනෙහි මිදුලු තුනෙක, භඤ්ජණකයෙහි "මිදුලු දෙකෙක, හරිතකයෙහි එකෙකැයි කියනලදී. මේ පණ්ඩුලකාදීහු ස්වභාවයෙන්ම වටිත්. සූපමංසාදිය හා එක්කොට පිසීම් ආදියෙහි වනාහි මාගධක නම් ලූනුද වටියි. ඒ මාගධක ලූනු පැසෙන මුද්ගසූපාදියෙහි හෝ මත්ස්‍යමාංසවිකෘතියෙහි හෝ තෙල් ආදියෙහි හෝ ඩෙබර ගෙඩි වියලා සුණුකොට එයින් කළ ඛාද්‍යවිකෘතිආදියෙහි හෝ ඇඹුල්පලා ආදියෙහි හෝ ව්‍යඤ්ජනාදියෙහි හෝ යන යම්කිසි තැනක යටත්පිරිසයින් කැඳබතෙහිද බහලනලද්දේ වටියි. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය.

නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ලසුණශික්ෂාපදයයි.

——\\——

ද්විතීය ශික්ෂාපදයෙහි - **'සම්බාධෙ'** ප්‍රතිච්ඡන්නාවකාශයෙහි. ඒ අවකාශයෙහි විභාග දක්වනු පිණිස දෙකිසිල්ලය, මූත්‍ර කරණයයි කියනලදී. **'එකම්පි ලොමං'** කතුරෙන් හෝ අඬුවෙන් හෝ දැළිපිහියෙන් හෝ යන යම් කිසිවකින් එක් ප්‍රයොගයකින් හෝ නොයෙක් ප්‍රයොගයෙන් හෝ එක්ලොමක් හෝ බොහෝ ලොම් හෝ හරවන්නාවූ මෙහෙණට ප්‍රයොගගණනින් පාචිත්තියයෝ වෙත්. ලොම් ගණනින් නොවෙත්. **'ආබාධපච්චයා'** කැසීම්, සොරි ආදීවූ ආබාධහෙතුවෙන් ලොම් හරවන්නියට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. චතුස්සමුට්ඨානිකය. කයින් කය වචනයෙන් කය සිතින් හටගණියි. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙවන ශික්ෂාපදයයි.

——\\——

තෘතීය ශික්ෂාපදයෙහි - **'තලඝාතකෙ'** මූත්‍රකරණයට පහරදීමෙහි. **'අන්තමසො උප්පලපත්තෙනපි'** යන මෙහි පත්‍රය මහත්ය. කෙසුරකින් හෝ පහර දෙන්නියට ඇවැත්මය. **'ආබාධපච්චයා'** ගඩයකට හෝ වණයකට හෝ පහරදීම වරද නොවේ. සෙස්ස ප්‍රකටමය. ප්‍රථම පාරාජිකසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ද්විවෙදනයි.

තෙවන ශික්ෂාපදයයි.

——\\——

චතුර්ථශික්ෂාපදයෙහි - **'පුරාණරාජොරොධා'** පැරණි ගිහිබැව්හි රජුගේ අන්තඃපුර ස්ත්‍රියක්. **'චිරං චිරං ගච්ඡති'** කලින් කල යයි. **'ධාරෙථ'** හැකිවවුද, **'කස්සිදං කම්මං'** මේ ක්‍රියාව කවරක් හුගේදැයි විචාළ කල්හි ආරොචනය නොකළකල්හිදු මේ මෙහෙණෝ මාකෙරෙහි සැක

කරන්නාහුයයි සිතමින් 'මේ ක්‍රියාව මාගේය'යි මෙසේ කිවුය. '**ජතුමට්ටකෙ** ලාකඩින් කළ මටවූ දණ්ඩ නිමිතිකොට ගෙණය. වස්තුවශයෙන්ම මේ ජතුමට්ටකය කියනලදී. යම්කිසි දණ්ඩක් ප්‍රවෙශ කරන්නියට ඇවැත්මය. එහෙයින් 'අන්තමසො උප්පලපත්තම්පි මුත්තකරණං පවෙසෙති' වදළසේක. මෙද ඉතා මහත්මය. කෙසුර පමණකුදු ප්‍රවෙශ කරන්නියට ඇවැත්මය. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු තලඝාතක ශික්ෂාවෙහි කියනලද්ද සමානම වෙත්.

සිවුවන ශික්ෂාපදයයි

—\\—

පස්වම ශික්ෂාපදයෙහි '**අතිගම්භීරං උදකසුද්ධිකං ආදියන්ති**' ඉතා ඇතුළට ප්‍රවෙශකොට ජලයෙන් සෝදන්නී. 'කෙසග්ගමත්තම්පි අතික්කාමෙති' පුළුලින් තෙවන ඇගිල්ල හෝ සිවුවන ඇහිල්ල හෝ ගැඹුරෙන් පුරුක් දෙකකට වැඩියෙන් කෙසගක් පමණ නමුදු ප්‍රවෙශකරන්නියට පාචිත්තිය යන අර්ථයි. **මහාපච්චරියෙහි** එක් ඇහිල්ලක පුරුක් තුනක් ඇතුල්කිරීම නොලබයි. ඇහිලි තුනක හෝ සතරක හෝ එකද පුරුකක් ඇතුල් කිරීම නොලබාය'යි මෙය කියනලද්දේමය. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහුද තලඝාතක ශික්ෂාවෙහි කියනලද්ද සමානම වෙත්.

පස්වන ශික්ෂාපදයයි.

—\\—

**ඡට්ඨශික්ෂාපදයෙහි** - '**හත්තවිස්සග්ගං**' බත්කිස පානීයෙන ච විධූපනෙන ච උපතිට්ඨිත්වා' එක් අතකින් පැන්තළුව එක් අතකින් විජනිය ගෙණ පවන්සලමින් සමීපයෙහි සිටයන අර්ථයි. '**අච්චාවදති**' පෙරද නුඹවහන්සේ මෙසේ අනුභව කළහු, මම මෙසේ උපස්ථාන කෙළෙම්'යි පැවිදිසිරිත් ඉක්මවා ගෘහනිශ්‍රිත කථා කියාය යන අර්ථයි: '**යං කිඤ්චි පානීයං**' පිරිසිදු දියක් හෝ වේවා, මෝරු දී මීරස කිරිආදීන් අතුරෙහි එක්තරා එකක් හෝ වේවා, '**යා කාචි විජනී**' යටත් පිරිසයින් සිවුරු කොණක් නමුදු '**හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස**' මෙහි සිටීම හේතු කොටම පාචිත්තිය කියනලදී. ප්‍රහාර හේතුවෙන් ඛන්ධකයෙහි දුක්කටය පනවනලදී. '**දෙති දපෙති**' පැනක් හෝ සූපාදියක් හෝ 'මෙය පානය කරවු, මෙයින් අනුභව කරවු'යි දේද, මෙයින් පවන්සලමින් අනුභවකරවුයි තල්වැටක් දේද, අනිකකු ලවා හෝ දෙකම දෙවාද, ඇවැත් නොවේ. '**අනුපසම්පන්නං ආණාපෙති**' වෙතසිටිනු පිණිස

හෙරණකට අණකෙරේද, ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානිකය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ශික්ෂාපදයයි

—||—

සප්තම ශික්ෂාපදයෙහි - **'භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස'** මෙය පයොගදුක්කට නම. එහෙයින් හුදෙක් පිළිගැණීම නිමිතිකොටම නොවේ. පිළිගෙණ වනාහි අන්තැනකින් ගෙණර්ම නිමිති කොටද, වියලීම නිමිති කොටද වැසි දිනයෙහි බැදීම පිණිස උඳුන් සෑදීම නිමිතිකොටද කබල සෑදීම නිමිතිකොටද හැන්ද තැනීම නිමිති කොටද, දර ගෙණවුත් ගිනිකිරීම නිමිතිකොටද, කබලෙහි ධාන්‍ය බහාලීම නිමිති කොටද හැන්දෙන් ගැටීම් නිමිතිකොටද, කෙටීම පිණිස වනමෝල් සෑදීම් නිමිතිකොටද කෙටීම් පෙළීම් සේදීම් ආදිය නිමිති කොටද මුවෙහි තබා ගිලීම පිණිස දත්වලින් විකාද ඒතාක් සියලු ප්‍රයොගයන්හි දුක්කටයෝ වෙත්. ගිලිනකල්හි වනාහි පිඩුගණිතින් පාචිත්තියයෝ වෙත්. මෙහිද විඥප්තියද භොජනයද ප්‍රමාණවේ. එහෙයින් තමන් විනවා අනිකක් ලවා බැදීම් කෙටීම් පිසීම් කරවා අනුභව කරන්නියට පවා ඇවැත්වේ. අන් එකකුලවා විනවා තමන් බැදීම් ආදියකොට අනුභව කරන්නියට පවා ඇවැත්වේ. **මහාපච්චරියෙහි** වනාහි මේ ආමකධාන්‍ය නම් මව නමුදු විනවා අනුභව කරන්නියට පාචිත්තියමවේ. නොවිනවීමෙන් ලද්දක් බැදීම් ආදියකොට හෝ කරවා හෝ අනුභව කරන්නියට දුක්කටයවේ. අන් එකක්හුගේ විනවීමෙන් ලද්දක් තමන් හෝ බැදීම් ආදිය කොට ඒ මෙහෙණලවා හෝ කරවා අන් එකකුලවා හෝ කරවා අනුභව කරන්නියට පවා දුක්කටයමැයි කියනලදී. නැවැතද අන් එකක්හුගේ විනවීමෙන් ලද්දක්වේද, හෙද වනාහි තමන් බැදීම් ආදිය කොට අනුභව කරන්නියට පාචිත්තියමවේ. බැදීම්ආදිය කරවා අනුභව කරන්නියට වනාහි දුක්කටයයි කියනලදී. එය පූර්වාපරවිරොධයවේ. බැදීම් ආදිය කිරීමෙහි හෝ කරවීමෙහි වෙනසෙක් නොමඇත්තේය. මහාට්ඨකථාවෙහි වනාහි අන් එකකු විසින් විනවනලද්දක් අනුභව කරන්නියට දුක්කටයයි විශෙෂයක් නොතබා කියනලදී. එය යුතුමය. **'ආබාධපච්චයා'** සෑවදකර්මාදිය පිණිස ධාන්‍ය විනවීම නිමිතිකොට ඇවැත් නොවේ. නොවිනවීමෙන් ලබන්නක් වනාහි නව කර්මාන්ත පිණිස පිළිගැණීම වටීයයි මහාපච්චරියෙහි කියනලදී. 'අපරණ්ණං විඤ්ඤාපෙති' සප්තවිධ ධාන්‍ය හැර මුං, මෑ, ආදිය හෝ ලබු,

කොමඩු ආදීවූ හෝ අන්‍යවූ යම් කිසිවක් හෝ නෑ පැවරූතන්හි විනවන්තියට ඇවැත් නොවේ. අමුධාන්‍යයක් වනාහි නෑ පැවරූතන්හිද නොවටියි. සෙස්ස ප්‍රකටමය. චතුසසමුට්ඨානිකය. කයින් කයවචනයෙන් කයසිතින්, කයවචනසිතින්ද හටගණියි. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

සත්වන ශික්ෂාපදයයි.

—||—

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'තිබ්බිට්ඨරාජභටො'** පිහිටුවනලද රජහට දියයුතු හති, අය මේ බමුණහු විසිනැයි තිබ්බිට්ඨරාජභට නම. එක් තනතුරක් අයයෙන් ගෙණ එයින් ලැබූ මහත් අය ඇත්තේය යන අර්ථයි. **'තං යෙව භටපථං යාචිස්සාමි'** රජහට දියයුතුවූ අයද දී නැවැත එම තනතුරම යාඥ කරන්නෙමි'යි සිතමින් **'පරිභාසි'** ඒ මෙහෙණන්හට 'නැවැත මෙසේ නොකරවු'යි තර්ජනය කෙළේය. **'සයං ඡඩ්ඩති'** මලමූ ආදීවූ සතරවස්තූන් එක් ප්‍රයොගයකින් දමන්නියට එක්ම ඇවැතක්වේ. වෙන් වෙන් වසයෙන් දමන්නියට වස්තු ගණනින් ආපත්තිහුවෙත්. ඇණවීම නිමිතිකොටද මෙම නයවේ. දැහැටිදඬු දැමීම නිමිතිකොටද මෙහෙණට පාචිත්තියමවේ. මහණහුට හැමතන්හි දුක්කටයවේ. සෙස්ස ප්‍රකටමය. ෂඩ් සමුට්ඨානිකය. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

අටවනශික්ෂාපදයයි

—||—

නවමශික්ෂාපදයෙහි - **'යං මනුස්සානං උපභොගපරිභොගං රොපිමං'** කෙතක් හෝ වේවා, 'නාළකෙරාදි ආරමයක් හෝ වේවා, යම්කිසි වැවිලි ඇති තිල්වන් තැනක මේ වස්තූන් දමන්නියට පෙරනයින්ම ආපත්තිභෙදය දතයුතුය. කෙතෙහි හෝ අරමෙහි හෝ හිඳ අනුභව කරන්නී උක්ආදියක් හෝ කමින් යන්නී ඉඳුල්දිය කටුරොඩු ආදිය හෝ තිල්වන් තැනක දමාද, යටත් පිරිසයින් පැන් බී මුදුන සිඳදැමූ පොලක් හෝ දමාද, පාචිත්තියමවේ. මහණහුට දුක්කටයවේ. සෑතන්හි වපුළ බිජුවටෙහි යම්තාක් අඞ්කුරය නොනගීද, ඒතාක් මහණමෙහෙණ සියල්ලන්හට දුක්කටයවේ. නොවපුළ බිජුවට ඇති කෙත් කොන් ආදියෙහි හෝ නොහටගත් වැවිලිඇති

කෙත් ඉම් ආදියෙහි හෝ දැමීම වටියි. මිනිසුන්ගේ කසළ දමන තන්හිද වටියි. **'ඡඩ්ඩිතඛෙත්තෙ'** මිනිසුන් සස්‍ය උදුරාගිය කල්හි ඒ කෙත හළකෙත නම්වේ. එහිම වටියි. යම්තැනක කපනලද්දවූද, පුබ්බන්නාදිය නැවැත හටගන්නේයයි රකිත්ද, එහි යථාවස්තුක ඇවැත්මවේ. සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය. ක්‍රියාක්‍රියසමුත්ථානය. -පෙ-ත්‍රිවෙදනයි.

නවවන ශික්ෂාපදයයි

——\\——

දශමශික්ෂාපදයෙහි - **'යං කිඤ්චි නච්චං'** නාට්‍යකාරාදීහු හෝ නටත්වා, සොඬහු හෝ නටත්වා, යටත්පිරිසයින් මොනර, ගිරා, වඳුරු ආදීහු හෝ නටත්වා, මේ සියල්ලද නෘත්‍යමය. **'යං කිඤ්චි ගීතං'** නළු ආදීන්ගේ ගීතයක් හෝ වේවා. ආයතීයන් පිරිනිවන කල්හි තෙරුවන් ගුණයුත් සාධුකීළිත ගීතයක් හෝ වේවා, අසංයත භික්ෂූන්ගේ ධර්මභාණකගීතයක් හෝ වේවා. මේ සියල්ලද ගීතමය. **'කිඤ්චි වාදිතං'** තන්ත්‍රිබද්ධාදීවූ වාදනීය භාණ්ඩයන්ගේ වාදනයක් හෝ වේවා, කුළුබෙර ගැසීමක් හෝ වේවා, යටත් පිරිසයින් උදකභෙරිවාදනයක් නමුදු වේවා, මේ සියල්ලද වාදිතමය. **'දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස'** පියවර ගණනින් දුක්කටයට පැමිණීමවේ. **'යත්ථ ඨිතා පස්සති වා සුණාති වා'** එක් ප්‍රයොගයකින් බලන්නී බලාද, ඔවුන්ගේම ගීතවාදිතය අසාද එක්ම පාචිත්තියක්මවේ. ඉදින් එක් දිසාවක් බලා නෘත්‍යය බලාද, නැවැත අනික් දිසාවක් බලා ගායනා කරන්නවුන් බලාද, අනිත් දිසාවෙක්හි වයන්නවුන් බලාද, වෙන් වෙන්වූ ඇවැත්හු වෙත්. මෙහෙණ තොමෝ, තොමෝ නටන්නට හෝ ගයන්නට හෝ වයන්නට හෝ නොලබයි. අනිකක්හට 'නටව, ගයව, වයව'යි කියන්නටද, නොලබයි. 'උපාසක, චෛත්‍යයට උපහාර දෙවු, කියන්නටද, නුබවහන්සේලාගේ සැයට උපස්ථාන කරම්හ'යි විචාළ කල්හි 'යහපතැ'යි පිළිගන්නටද නොලබයි. සියලු තන්හි පාචිත්තිය යි සියලු අත්ථකථාවන්හි කියනලදී. මහණහුට දුක්කටයවේ. 'නුබවහන්සේලාගේ සැයට උපස්ථාන කරමුදැ'යි විචාළකල්හි 'උපස්ථාන කිරීම නම් යහපතැයි කීම වටියි. **'ආරාමෙ ඨිතා'** ආරාමයෙහි සිට ආරාමයතුළ හෝ ආරාමය පිටත හෝ නෘත්‍යාදිය බලාද, අසාද, ඇවැත් නොවේ. **'සති කරණීයෙ'** ලහබත් ආදිය පිණිස හෝ අන් කිසි කටයුත්තක් නිසා හෝ ගොස් ගියතන්හිදී බලාද අසාද ඇවැත් නොවේ. 'ආපදාසු' එබඳු උවදුරකින් උපද්‍රතවූවා නටන තැනට පිවිසෙන්නීද, මෙසේ පිවිස බලන්නියටද, අසන්නියටද, ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය.

එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනායි.

දසවන ශික්ෂාපදයයි

ප්‍රථමවූ ලසුණවර්ගයයි

—||—

අන්ධකාරවර්ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'අප්පදීපෙ'** සඳ හිරු ගිනි යන පහන් අතුරෙහි එකෙකිනුදු ආලොක රහිත තැන. එහෙයින්ම මේ ශික්ෂාපදයාගේ පදභාජනයෙහි **'අනාලොකෙ'**යි වදාරණලදී. **'සල්ලපෙය්‍ය වා'** ගෘහනිශ්‍රිත කථා කියන්නේය. **'අරහොපෙක්ඛා අඤ්ඤවිහිතා'** රහසෙහි ආස්වාදපෙක්ෂාවක් නැත්තී රහස් ආස්වාදයෙන් අන්‍යවිහිතවම නෑයකු හෝ විචාරාද, දනයෙහි හෝ පූජාවෙහි හෝ මන්ත්‍රණය කෙරේ. සෙස්ස ප්‍රකටමය. ථෙය්‍යසමුට්ඨානිකය. කායචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ද්විවෙදනායි.

පළමුවන ශික්ෂාපදයයි

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි - **'පටිච්ඡන්නෙ ඔකාසෙ'** මෙපමණක්ම වෙනස්වේ. සෙසු සියල්ල ප්‍රථමශික්ෂාපදය සමානමවේ.

දෙවන ශික්ෂාපදයයි

—||—

තෘතීය ශික්ෂාපදයෙහි - **'අජ්ඣොකාසෙ'** යනු වෙනස්වේ. සෙසු සියල්ල එබඳුමය.

තෙවන ශික්ෂාපදයයි

—||—

චතුර්ථ ශික්ෂාපදයෙහි - **'නිකණ්ණිකං'** කන්මුල කියනුලැබේ. කන්මුල කියන්නේයයි කියනලද්දේය. **'සති කරණීයෙ'** ලහබත් ආදිය

ගෙණර්ම පිණිස, විහාරයෙහි හෝ නොමනාව තැබුවක් තැන්පත් කිරීමපිණිස සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු ප්‍රථම ශික්ෂාපදය සමානමවෙත්.

සිවුවන ශික්ෂාපදයයි

—||—

පඤ්චම ශික්ෂාපදයෙහි - **'සරං සෙධෙන්තා'** ඔවුන්ට වනාහි මෙබඳු සිතෙක් වූයේය. 'ස්ථවිරාවගේ කිසි කායිකවාචසික ව්‍යතික්‍රමයෙක් නොදක්නාලැබේ. ගෙයද පිරිසිදු කරම්හ'යි ඉක්බිති ගේ පිරිසිදු කරන්නාහු ඒ අස්න දුටුවාහුය. **'අනොවස්සකං අතික්කාමෙන්තියා'** පළමු පිය ඉක්මවන්නියට දුක්කටයවේ. දෙවන පිය ඉක්මවන්නියට පාචිත්තියවේ. උපචාරය ඉක්මීමෙහිද මේ නයමවේ. **'ගිලානාය'** එබඳු ගිලන්බවෙන් විචාරන්නට නොහැක්කීද, **'ආපදාසු'** ගෙයි ගිනි හෝ නැගුනේවේද, සොරු හෝ නැගී සිටියාහුද, මෙබඳු උවදුරෙහි නොවිචාරා යන්නීද ඇවැත් නොවේ. මෙහි සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන්ද, කායවාචාචිත්තයෙන්ද, හටගණියි. ක්‍රියාක්‍රිය සමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

පස්වන ශික්ෂාපදයයි

—||—

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - **'අභිනිසීදෙය්‍ය'** හිඳින්නීනම්, හිඳ යන්නියට එක් ඇවැතක්වේ. නොහිඳ නිදා යන්නියට ඇවැත් දෙකක්වේ. **'ධුවපඤ්ඤත්තෙ'** මෙහෙණින්ගේ ප්‍රයොජනය පිණිස නිති පනවලද අසුනෙහි. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. -පෙ-ත්‍රිවෙදනායි.

සවන ශික්ෂාපදයයි

—||—

සප්තම ශික්ෂාපදයෙහිද සියල්ල සවන ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය.

සත්වන ශික්ෂාපදයයි

—||—

අෂ්ටමශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

අටවන ශික්ෂාපදයයි

—\\—

නවම ශික්ෂාපදයෙහි - **"අභිසපෙය්‍ය"** දිවිරීම කරන්නීනම්, "නිරයෙන අභිසපති නාම" "නිරයෙහි උපදිම්, අවීචියෙහි උපදිම්, නිරයෙහි උපදීවා, අවීචියෙහි උපදීවා"යි මේ ආදී නයින් ආක්‍රොශ කරන්නීය. **"බ්‍රහ්මචරියෙන අභිසපතිනාම"** "ගිහිනියක් වෙම්, සුදුවත් ඇත්තියක් වෙම්, පරිව්‍රාජිකාවක් වෙම්, අන්‍යවූ හෝ මා වැන්නියක් වේවායි මේ ආදිනයින් ආක්‍රොශ කරන්නීය. මෙහි වචනයක් වචනයක් පාසා පාචිත්තියවේ. නිරයද බ්‍රහ්මචර්‍ය්‍යයද හැර බැල්ලක්, ඊරියක්, කණියක්, කුණියක් වෙම්"යි මේආදී නයින් ආක්‍රොශ කරන්නියට වචනයක් වචනයක් පාසා දුක්කටයවේ. **"අත්ථපුරෙක්ඛාරාය"** අත්ථකථාව කියන්නියට. **"ධම්මපුරෙක්ඛාරාය"** පෙළ කියන්නියට. **"අනුසාසනී පුරෙක්ඛාරාය"** "දැනුදු තී මෙබන්දියක, මැනැවි, වැළකෙව, නොවළකින්නෙහි නම්, ඒකාන්තයෙන් නැවැත මෙබඳු වැඩකොට නිරයෙහි උපදින්නෙහිය. තිරිසන් යොනියෙහි උපදින්නෙහිය"යි මෙසේ අනුශාසනාවෙහි සිට කියන්නියට ඇවැත්නොවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

නවවන ශික්ෂාපදයයි

—\\—

දශම ශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුත්ථානිකය. කායවාචාචිත්තයෙන් හටගණියි. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනායි.

දසවන ශික්ෂාපදයයි

ද්විතීයවූ අන්ධකාරවර්ගයයි

—\\—

නග්ගවර්ගීය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'බ්‍රහ්මචරියං චිණ්ණෙන'** පුරුදුකළ බ්‍රහ්මචර්‍ය්‍යයෙන්. නොහොත් බ්‍රහ්මචර්‍ය්‍යයෙහි හැසිරීමෙන්ය. මෙසේ කරණාර්ථයෙහි හෝ සම්බන්ධාර්ථයෙහි හෝ ද්විතීයාවචනය දතයුතුය. **'අච්ඡින්නචීවරිකාය'** මෙය දියසළුව සඳහා කියනලදී. අන්සිවුරක් සඳහා නොකියනලදය. එහෙයින් දියසළුව පැහැරගත්කල්හි හෝ නැසුනුකල්හි හෝ නග්නව ස්නානය කරන්නියට ඇවැත් නොවේ. ඉදිනුදු දියසළුසිවුර මාහැඟි වේද, හැඳ පිටතයන්නට නොහැක්කීද, මෙසේ ඇතිකල්හිද නග්නව ස්නානය කරන්නට වටියි. මෙහි සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි ත්‍රිවේදනයි.

පළමුවන ශික්ෂාපදයයි

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

දෙවන ශික්ෂාපදයයි

—||—

තෘතීය ශික්ෂාපදයහි - **'අනන්තරායකිනී'** දශවිධ අන්තරායයන් අතුරෙහි එකද අන්තරායයකින් අන්තරාය නැත්තී. **'ධුරං නික්ඛිත්තමත්තෙ'** ධුරනික්ෂෙපයකොට පසුව මසානම් ඇවැත්මවේය, යන අර්ථයි. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙප සමුත්ථානිකය. අක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවේදනයි.

තෙවන ශික්ෂාපදයයි

—||—

චතුර්ථ ශික්ෂාපදයෙහි - පස්දවස පඤ්චාහ නම. පඤ්චාහයම පඤ්චාහික නම. පංචවිධ චීවරයන්ගේ පරිභොගවසයෙන් හෝ අවු කැවීම් වසයෙන් හෝ පෙරළීම **සඞ්ඝාටිචාර** නම. පරිභොගවසයෙන් හෝ අවුවෙහිලා වියළීම් වසයෙන් හෝ සඞ්ඝටිතාර්ථයෙන් සඞ්ඝාටියි ලැබූ නම් ඇති පංචවිධචීවරයන්ගේ පරිවර්තනය යන අර්ථයි. එහෙයින්ම

පදභාජනයෙහි **'පඤ්චමං දිවසං පඤ්ච චීවරානි'** යනාදිය වදළසේක. **'ආපත්ති පාචිත්තියස්ස'** මෙහිද එක් සිවුරක් නිමිතිකොට එක් ඇවැතක්වේ. සිවුරුපස නිමිතිකොට ඇවැත් පසෙක්වේ. **'ආපදාසු'** සොරබිය ආදියෙහිදී එක් සිවුරක් පරිභොග කරන්නට නොහැක්කේ වේද, මෙබඳු උවදුරක් ඇතිකල්හි ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

සිවුවන ශික්ෂාපදයයි

——\\——

පඤ්චම ශික්ෂාපදයෙහි - **'චීවරසඞ්කමනීයං'** දෙවනු දියයුතු සිවුරක්. අන් මෙහෙණක සතු සිවුරක් නොවිචාරා ගන්නාලදුව නැවැත දියයුතු සිවුරක්ය යන් අර්ථයි. **'ආපදාසු'** ඉදින් නොපොරොවන ලද්දක් හෝ නොහඳිනලද්දක් හෝ සොරු පැහැර ගණිත්ද, මෙබඳු විපත්ඇති කල්හි ඇයට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. කඨිනමසමුට්ඨානිකය. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

පස්වන ශික්ෂාපදයයි

——\\——

ෂෂ්ඨ ශික්ෂාපදයහි - **'අඤ්ඤං පරික්ඛාරං'** තලිය ආදී පිරිකර අතුරෙහි හෝ ගිතෙල් තෙල් ආදීන් අතුරෙහි යම්කිසි එක්තරා එකක්. **'ආනිසංසං'** 'කෙතෙක් අගනා එකක් දෙනු කැමැත්තහුදැ'යි විචාරයි. එකල්හි 'මෙතෙක් අගනා එකක්'යි කියත්. ඒතාක් කල් බලාපොරොත්තු වවූ, දැන් වස්ත්‍රය මහගිවේ. කීපදවසකින් කපු ලැබුනු කල්හි සම අගිනා එකක් වන්නේය'යි මෙසේ කියා වළකින්නියට ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනායි.

සවනශික්ෂාපදයයි

——\\——

සප්තම ශික්ෂාපදයෙහි - **'පක්කමිංසු'** අතික් මෙහෙණුන්ගේද ඊම බලත්තී 'එකාන්තයෙන් අප ගැණද බලත්නාහුයයි ඒ ඒ තැන ගියහ. **'පටිබාහෙය්‍ය'** වළකන්නී නම්, **'ආනිසංසං'** එක් මෙහෙණක්හට එක් සළුවක් නොපොහෝනේද ඒතාක් බලාපොරොත්තුවනු මැනැවි. කිහිපදවසකින් ලැබෙන්නේය. ඉන්පසු බෙදන්නෙමු'යි මෙසේ අනුසස් දක්වා වළකන්නියට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සත්වන ශික්ෂාපදයයි

—\\—

අෂ්ටම ශික්ෂාපදයෙහි - **නටා** නාම නටයෝ නම් යම් කෙනෙක් නැටුම් නටවත්ද ඔවුහුය. **නටකා** නාම නටකයෝ නම් යම් කෙනෙක් නටත්ද, ඔවුහුය. **ලඞ්ඝනකා** ලඞ්ඝනකයෝ නම් කෙනෙක් හුණදඬු වරපට ආදියෙන් පිනුම් ගැසීම කෙරෙත්ද, ඔවුහුය. **සොකසායිකයෝ** නම් මායාකාරයෝය. **කුම්භථූනිකයෝ** නම් කළයෙන් සෙල්ලම් කරන්නෝය. ඇතුළත සිදුර තබා රුක්හර ආදියෙන් කළ සිවුපස සමින් වැසූ වාදිතභාණ්ඩය වයන්නෝ **කුම්භථූනික** නම්වෙත්. බිම්බිසක වාදකැයිද කියත්. **'දෙති ආපත්ති පාචිත්තියස්ස'** මෙහි සිවුරුගණනින් ඇවැත් දතයුතුය. සෙස්ස ප්‍රකටමය. ෂඩ්සමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

අටවන ශික්ෂාපදයයි

—\\—

නවම ශික්ෂාපදයෙහි - **'දුබ්බලචීවරපච්චාසාය'** දුර්වලචීවර ප්‍රත්‍යාශාවක් ඇතිකල්හි. **'ආනිසංසං'** ආයර්ය. අපි නොහැක්කම්හ'යි කියත්, දැන් ඔවුන්ගේ කලපාසය පැමිණෙන්නේය. සැදැහැති ප්‍රසන්න පුරුෂතෙමේ එන්නේය. එකාන්තයෙන් දෙන්නේය'යි මෙසේ අනුසස් දක්වා වළකන්නියට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන ශික්ෂාපදයයි.

—\\—

දශමශික්ෂාපදයෙහි - **'කඨිනුද්ධාරං න දස්සන්ති'** මෙහි කෙබඳුවූ කඨිනුද්ධාරය දියයුත්තේද, කෙබඳුවූ කඨිනුද්ධාරය නොදියයුත්තේද, යත්:- යම් සිවුරක් පිළිබඳ අත්ථාරමූලකවූ ආනිසංසය මහත්වේද, උද්ධාරය මුල්වූ ආනිසංසය සවලපවේද, මෙබඳුවූ උද්ධාරය නොදියයුතුය. යම් සිවුරක් පිළිබඳ අතුනරමූලක ආනිසංසය සවලපවේද, උද්ධාරමූලක ආනිසංසය මහත්වේද, මෙබඳුවූ උද්ධාරය දියයුතුය. සමවූ ආනිසංසය ඇත්තේද, ශ්‍රද්ධාපරිපාලනය පිණිස දියයුත්තේමය. **'ආනිසංසං'** භික්ෂුණීසඞ්ඝ තෙමේ දිරූ සිවුරු ඇත්තේය. කඨිනානිසංසය මුල්වූ මහත් ලාභ ඇත්තේයයි මෙබඳු අනුසස් දක්වා වළකන්නියට ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන ශික්ෂාපදයයි.

තෘතීයවූ නග්ගවර්ගයයි

—॥—

තුවට්ටවර්ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'තුවට්ටෙය්‍යුං'** හොවින්නාහු නම්. සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ශික්ෂාපදයයි.

—॥—

ද්විතීය ශික්ෂාපදයෙහි - එක් ඇතිරිල්ලක්ද එක් පොරෝණයක්ද මේ මෙහෙණින්හටැයි **එකත්ථපාපුරණා** නම්. එසේ මෙසේ ගතහැකිවූ කොඳුපලස් ඇතිරිලි කළාල් ආදීන්ගේ එක් කොනක් අතුරා එක් කොණක් පොරොවා නිදන මෙහෙණින්හට මේ නමෙකි. **'වවත්ථානං දස්සෙත්වා'** මැද සිවුරක් හෝ කතුරුයටක් හෝ යටත් පිරිසයින් කාබානක් නමුදු තබා නිදන මෙහෙණින්හට ඇවැත් නොවේය යන අර්ථයි. සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙවන ශික්ෂාපදයයි.

—॥—

තෘතීය ශික්ෂාපදයෙහි - **'උළාරසම්භාවිතා'** උදරකුලයෙන් නික්ම පැවිදිවූ බැවින්ද, ගුණයෙන් උදරබැවින්ද, උදරැයි සම්භාවනා කරණලද්දහුය. **'ඉස්සාපකතා'** ඊර්ෂ්‍යාවෙන් අපකෘතවූ මඩිනලද්දහුය යන අර්ථයි. දූත්වීම බහුල වූවා මේ මෙහෙණත්ටතුයි. **සඤ්ඤත්තිබහුලා** නම්. දවසමුළුල්ලෙහි මහාජනයා හඟවන්නියෝය යන අර්ථයි. විනවීම බහුලවූයේ මේ මෙහෙණත්ටතුයි. **විඤ්ඤත්තිබහුලා** නම්. විඤ්ඤත්ති නම් හෙතුදාහරණාදියෙන් නන් නයින් අවබෝධ කරවීමැයි දතයුතුය. ඉල්ලීමැයි නොදතයුතුය. සක්මනෙහි නැවැතීම් ගණනින් ඇවැත් දතයුතුය. **'තිට්ඨති වා'** යනාදිතන්හි ප්‍රයොගගණනින්ද, **'උද්දිසති වා'** යනාදිතන්හි පියවරාදි ගණනින්ද, ඇවැත් දතයුතුය. සෙස්සප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

තෙවනශික්ෂාපදයයි

—||—

චතුර්ථශික්ෂාපදයෙහි - **'සති අන්තරායෙ'** දසවැදෑරුම් අන්තරාය ඇති කල්හි. **'පරියෙසිත්වා න ලභති'** අන්‍යවූ උපස්ථායිකාවක නොලබයි. **'ගිලානාය'** ගිලන් මෙහෙණට. **'ආපදාසු'** එබඳු උවදුරක් ඇතිකල්හි ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුත්ථානිකය. අක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සිවුවන ශික්ෂාපදයයි

—||—

පඤ්චමශික්ෂාපදයෙහි - **'අඤ්ඤං ආණාපෙති'** මෙහි ඉදින් නික්මවයි අණවනලද්දී, එක් ප්‍රයොගයකින් බොහෝවූද, ද්වාරයන් ඉක්මවාද එක් ඇවතෙක්වේ. එකල්හි මේ මේ දෙරද ඉක්මවාලවයි මෙසේ අණකරණලද්දී, ඉක්මවාද දෙරගණනින් ආපත්තීහු වෙත්. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

පස්වන ශික්ෂාපදයයි

—||—

ෂෂ්ඨශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. සමනුභාසනසමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සවනසිකපදයයි

—||—

සප්තම-අෂ්ටම-නවම ශික්ෂාපදයන්හි සියල්ල ප්‍රකමය. සියල්ලෝ එළකලොම සමුට්ඨානිකහය. ක්‍රියසමුට්ඨානහය. නොසංඥාවිමොක්ෂහය. අචිත්තකහය. ප්‍රඥප්තිවද්‍යහය. කායකර්මහය. ත්‍රිචිත්තහය. ත්‍රිවෙදනහය.

සත්වන අටවන නවවන ශික්ෂාපදයෝය.

—||—

දශම ශික්ෂාපදයෙහි - **'ආහුන්දරිකා'** සම්බාධහය. **'ධුරං නික්ඛිත්ත මත්තෙ'** ඉදිනුදු ධුරනික්ෂෙපය කොට පසුවයේද, ඇවැත්මය යන අර්ථයි. පවරා පස්යොත්තක් යන්නියට ඇවැත් නොවේ. සයොත්නෙහි කියයුත්තෙක්ම නැත්තේය. ඉදින්වනාහි තුන්යොත්තක් ගොස් ඒ මගින්ම පෙරළා ඒ නම් නොවටියි. **'අන්තරායෙ'** දසවිධ අන්තරායෙහි පරතෙර යනනෙමියි නික්මුනී පිරුණු නදියක් ඉදිරියෙහි ආයේද, සොරු හෝ මාර්ගයෙහි වෙත්ද, මෙඝය හෝ නගීද, නැවතීම වටියි. සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජිකසමුට්ඨානිකය. අක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

දසවන ශික්ෂාපදයයි

චතුර්ථ තුවට්ටවර්ගයයි

—||—

චිත්තාගාරවර්ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'රාජාගාරං'** රජුගේ ක්‍රීඩාගෘහය. **'චිත්තාගාරං'** ක්‍රීඩාකරන විසිතුරු සාලාවය. **'ආරාමං'** ක්‍රීඩාකරන සමීපවනය. **'උය්‍යානං'** ක්‍රීඩාකරන උයනය **'පොක්ඛරණිං'** ක්‍රීඩාකරන පොකුණය. එහෙයින් ම පදභාජනයෙහි **'යත්ථ කත්ථචි රඤ්ඤො කීළිතුං'** යනාදිය වදාරණලදී. **'දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස'** මෙහි පියවර ගණනින් දුක්කටයවේ. **'යත්ථ ඨිතා පස්සති'** ඉදින් මෙහි එක්ම තැනක සිටින්නී පිය නොඋදුරමින් ඒ පසම දකීද එක්ම පාචිත්තියක් වේ. ඒ ඒ දිසා කොටස් බලා බලන්නියට වෙන් වෙන් ඇවැත්හු වෙත්. මහාංණහට

වනාහි සියලු තන්හි දුක්කටය වේ. **'ආරාමෙ ඨිතා'** ආරාමයතුළ රාජගෘහාදිය කෙරෙත්ද ඒ රාජගෘහාදිය බලන්නියට ඇවැත් නොවේ. **'ගච්ඡන්තී වා ආගච්ඡන්තී වා'** පිණ්ඩපාතාදිය පිණිස යන්නියට මාර්ගයවේද, ඒ රාජගෘහාදිය දකීද, ඇවැත් නොවේ. **'සති කරණීයෙ ගන්ත්වා'** රජුගේ සමීපයට කිසි කටයුත්තක් හෙතුකොට ගොස් බලාද, ඇවැත් නොවේ. **'ආපදාසු'** කිසිවකුවිසින් පීඩාකරණලද්දී පිවිස බලාද ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. ත්‍රිවෙදනායි.

පළමු ශික්ෂාපදයයි

——||——

ද්විතීය ශික්ෂාපදයෙහි - හිඳීම් හොවීම්හි ප්‍රයොග ගණනින් ඇවැත්හු දතයුත්තාහුය. සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුට්ඨානිකය. ක්‍රියා සමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

දෙවන ශික්ෂාපදයයි

——||——

තෘතීය ශික්ෂාපදයෙහි **'උජ්ජවුජ්ජවෙ'** යම් පමණක් අතින් අදිනලද්දේ වේද, එපමණපෙදෙසක් වෙළූ කල්හි එක් ඇවැතක්වේ. කැටීමට පෙර කපු සෙවීම් ආදිකොට සියලු ප්‍රයොගයන්හි අත්වර ගණනින් දුක්කටවේ. **'කන්තිතසුත්තං'** දහුආදිය ගටා කටියි, නොමනාව කටිනලද්දක් හෝ නැවත කටියි. සෙස්ස ප්‍රකටමය. එළකලොම සමුට්ඨානිකය. ක්‍රියා සමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

තෙවන ශික්ෂාපදයයි

——||——

චතුර්ථශික්ෂාපදයෙහි - **'යාගුං වා'** යනාදිතන්හි සහල් කෙටීම ආදිකොට සියලු ප්‍රයොගයන්හි ප්‍රයොග ගණනින් දුක්කටයවේ. කැයුතු දෑ ආදීන් අතුරෙහි රූප ගණනින් පාචිත්තීහු වෙත්. **'යාගුපානෙ'** මිනිසුන් විසින් සඞ්ඝයාට වැඩ පිණිස කරණු ලබන්නාවූ කැඳ බීමෙහි හෝ සඟබතෙහි හෝ ඔවුන්ට සහාග බැවින් යම් කිසිවක් පිසන්නියට ඇවැත් නොවේ.

සැයට පිදීම පිණිස යහලුව සුවඳ ආදියෙන් පුදද, වටියි. **'අත්තනො වෙය්‍යාවච්චකරස්ස'** ඉදිනුදු මවුපියෝ එත්ද, යම්කිසි විජ්නියක් හෝ මුසුන්දණ්ඩක් හෝ කරවා වතාවත් කරණ තැන තබාම යම් කිසිවක් කිරීම වටියි. සෙස්ස ප්‍රකටමය. සමුත්ථානාදීහු තෘතීය ශික්ෂාපදය හා සමානම වෙත්.

සිවුවන ශික්ෂාපදයයි.

——\\——

පඤ්චම ශික්ෂාපදයෙහි - **'අසති අන්තරායෙ'** දසවිධ අන්තරාය නැති කල්හි ධුර නික්ෂෙපය කොට පසුව විනිශ්චය කරන්නී ඇවැතට පැමිණම විනිශ්චය කරයි. **'පරියෙසිත්වා න ලභති'** යහලු මෙහෙණත් නොලබයි. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙප සමුත්ථානිකය. අක්‍රියාසමුත්ථානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

පස්වන ශික්ෂාපදයයි

——\\——

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - සියල්ල නග්නවර්ගියෙහි අගාරික ශික්ෂාපදයෙහි කියූනයින්ම දතයුතුය. මේ වනාහි විශේෂයවේ. එය ෂඩ්සමුත්ථානිකය. මෙය සහත්ථායි කියූ බැවින් එළකලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ශික්ෂාපදයයි

——\\——

සප්තම ශික්ෂාපදයෙහි- **'පුන පරියායෙන'** නැවැත වරෙක්හි **'ආපදසු'** මහගි සිවුරක් සිරුරෙන් මුදා මොනවට තැන්පත් කරණලද්ද, සොරු පැහැර ගෙණයෙත්. මෙබඳු ආපදවත්හි නොතිසද හඳින්නියට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටටමය. කඨිනසමුත්ථානිකය. කායවාචායෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාක්‍රියසමුත්ථානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සත්වන ශික්ෂාපදයයි

——\\——

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'අතික්කමිත්වා'** රැකීම පිණිස නොදී, 'මේ ආවාසය ගොපනය කරව'යි මෙසේ නොවිචාරා'යි යන අර්ථයි. **'පරියෙසිත්වා න ලභති'** පිළිදැගුම් කරන්නියක නොලබයි. **'ගිලානාය'** වාගෙහදය කරන්නට අසමර්ථ වූවහුට. **'ආපදාසු'** රට බිදෙනකල්හි ආවාසයන් හැරදමා යෙත්. මෙබඳු ආපදවන්හි ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු අනතුරු ශික්ෂාපදය සමානම වෙත්.

අටවන ශික්ෂාපදයයි.

—||—

නවම ශික්ෂාපදයෙහි - **'බාහිරකං අනත්ථසංහිතං'** ඇත්, අස් රිය දුනු කඩු ශිල්ප, පරූපඝාතකරමන්ත්‍ර- සතුරන් මරණු පිණිස හරදැවින් කළ හුල් ජපකොට පොළොවෙහි සිටුවන මන්ත්‍ර, වසඟ කරණ මන්ත්‍ර,වියලවන මන්ත්‍ර, විසබෙහෙත් යෙදීම් ආදිවසයෙන් ප්‍රභෙද වූ අන්හු නසන යමක්. **'පරිත්තං'** යක්ඛපරිත්ත - නාගමණ්ඩලබන්ධනාදී වසයෙන් ප්‍රභෙදවූ සියල්ලම වටියි. සෙස්ස ප්‍රකටමය. පදසොධම්මසමුට්ඨානිකය. වාචායෙන්ද වාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන ශික්ෂාපදයයි

—||—

දශම ශික්ෂාපදයෙහි - **'වාචෙය්‍ය'** යන මේ පදය වෙනසි. සෙස්ස සමුට්ඨානාදිය සමග නවවන ශික්ෂාපදයෙහි කියූ නයින්ම දතයුතුය.

දසවන ඡන්දං අදත්වා ගමනශික්ෂාපදයයි

පස්වන චිත්තාගාර වර්ගයයි.

—||—

ආරාමවර්ගීය පිළිබඳ ප්‍රථමශික්ෂාපදයෙහි - **'පරික්ඛේපං අතික්කාමෙන්තියා උපචාරං ඔක්කමන්තියා'** මෙහි පළමු පියෙහි දුක්කටයවේ. දෙවන පියෙහි පාචිත්තියවේ. **'සීසානුලොකිකා'** පළමුව පිවිසෙන මෙහෙණින්ගේ හිස බලමින් පිවිසේද, ඇවැත් නොවේ. **'යත්ථ භික්ඛුණියො'** යම් තැනෙක්හි මෙහෙණෝ ඉතා පළමුකොට පිවිස හැදෑරීම් සැවැදුම්

ආදිය කෙරෙත්ද, එහි ඒ මෙහෙණන් වෙතට යෙමියි යෑම වටියි. **'ආපදසු'** කිසිවකු විසින් පෙළනලද්දී වේද, මෙබඳු ආපදවන්හි පිවිසීම වරදෙක් නොවේ. සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුත්ථානිකය. ක්‍රියාක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ශික්ෂාපදයයි

—\\—

ද්විතීයශික්ෂාපදයෙහි - **"ආයස්මා කප්පිතකො'** මෙතෙමේ ජටිලයන් දහසෙහි ඇතුළත්වූ ස්ථවිර තෙමේය. **'සංහරි'** සංක්‍රම කරවීය. **'සංහටො'** සංක්‍රම කරවනලදය. **කාසාවටො** නහවන ලදය. කරනවෑමියෝ සිවුරු හැඳ කර්මාන්ත කෙරෙත්. ඒ සඳහා කීහ. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

දෙවන ශික්ෂාපදයයි

—\\—

තෘතීයශික්ෂාපදයෙහි - **'අනුසාසනිපුරෙක්ඛරාය'** දැනුදු තී බාලය, අව්‍යක්තය, යනාදිනයින් අනුශාසනී පක්ෂයෙහි සිට කියන්නියට ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. සමුත්ථානාදීහු අනතුරු ශික්ෂාපදය හා සමානම වෙත්.

තෙවන ශික්ෂාපදයයි.

—\\—

චතුර්ථ ශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. චතුස්සමුත්ථානිකය. කායයෙන්ද කායවාචායෙන්ද, කායචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. නිමන්ත්‍රණය කරණලදුව නොවිචාරා අනුභව කරන්නියට ඇවැත ලැබෙන බැවින් කිසි කලෙක ක්‍රියාක්‍රය සමුත්ථානයවේ. පවරණලදුව කැපකරවාද කැපනොකරවාද අනුභව කරන්නියට ඇවැත ලැබෙන බැවින් ක්‍රියා සමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සිවුවන ශික්ෂාපදයයි.

—\\—

පඤ්චම ශික්ෂාපදයෙහි - කුලයෙහි මසුරුබව, කුලමච්ඡර නම්. කුලමසුරුබව මැට ඇත්තේනුයි. **කුලමච්ඡරිනී** නම. නොහොත් කුලය මසුරුකරාතුයි කුලමච්ඡරිනීය. '**කුලස්ස අවණ්ණං**' ඒ කුලය අශ්‍රද්ධාවත්ය. අප්‍රසන්නයයි. '**භික්ඛුනීනං අවණ්ණං**' මෙහෙණෝ දුශ්ශීලහ. ලාමක දහම් ඇතිහයි. '**සන්තංයෙව ආදීනවං**' කුලයාගේ හෝ මෙහෙණුන්ගේ හෝ ඇති අගුණ පැවසීමය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

පස්වන ශික්ෂාපදයයි

—||—

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - '**ඕවාදය**' ගරුධර්මය පිණිස, '**සංවාසාය**' පොහෝ පවුරුණු විචාරීම පිණිස. මෙහි මේ සඞ්ක්ෂෙපයයි. විස්තරය වනාහි භික්ඛුනොවාදක ශික්ෂාපදවර්ණනාවෙහි කියන ලද්දේමය. එළකලොම සමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

සවන ශික්ෂාපදයයි

—||—

සප්තම ශික්ෂාපදයෙහි - '**පරියෙසිත්වා න ලභති**' මෙහෙණක් නොලබයි. සෙස්ස ප්‍රකටමය. මේ ශික්ෂාපදයාගේ විස්තරයි. භික්ඛුනොවාදකයෙහි කියනලදදේමය. ධුරනික්ෂෙප සමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සත්වන ශික්ෂාපදයයි

—||—

අෂ්ටම ශික්ෂාපදයෙහි- '**එකකම්මං**' යනාදියෙන් පොහෝ පවාරණයෝම කියනලදහ. සෙස්ස ප්‍රකටමය. මේ ශික්ෂාපදයාගේද විස්තරය භික්ඛුනොවාදකයෙහි කියනලද්දේමය. ප්‍රථමපාරාජිකසමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

අටවන ශික්ෂාපදයයි

—||—

නවමශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. මේ ශික්ෂාපදයාගේද විස්තරය භික්ඛුනොවාදකයෙහි කියනලද්දේමය. ධුරනික්ෂෙපසමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

නවවන ශික්ෂාපදයයි

—||—

දශම ශික්ෂාපදයෙහි - **'පසාඛෙ'** නැබින්යට අධඃකායයෙහි, අධඃකාය වනාහි යම්හෙයකින් වෘක්ෂශාඛාවක මෙන් දෙකලවය බෙදී එයින් ගියෝද එහෙයින් පසාඛයි කියනුලැබේ. **'භින්නෙ'** යනාදිතන්හි ඉදින් 'බිඳුව, පලව'යි සියල්ල අණවාද ඇණවුම් ලද හෙතෙමේද, එසේම කෙරේද, ඇණවීම නිමිතිකොට දුක්කට සයටද පාචිත්තිය සයටද පැමිණේ. එතකුදු වුවත් 'උපාසක' මෙහි යම් කිසිවක් කටයුතුද, ඒ සියල්ල කරව'යි මෙසේ අණවාද, හෙතෙමේද සියලුම බිඳීම් ආදිය කෙරේද, එක් වචනයකින් දුක්කට සයක්ද පාචිත්තිය සයෙක්දැ ඇවැත් දෙළොසෙක්වේ. ඉදින් වනාහි බිඳීම් ආදියෙහි එකක්ම කියා 'මෙය කරව'යි අණවාද, හෙතෙමේද සියල්ල කෙරේද, යමක් අණවනලදද එයම කිරීම නිමිතිකොට පාචිත්තිය වේ. සෙසුතන්හි ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්‍මයි. වාක්කර්‍මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන ශික්ෂාපදයයි

ෂෂ්ඨ ආරාමවර්‍ගයයි

—||—

ගර්භිණීවර්‍ගය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'ආපන්නසත්තා'** කුසට පිවිස සත්වයන් ඇත්තී.

පළමුවන ශික්ෂාපදයයි.

—||—

ද්විතීය ශික්ෂාපදයෙහි - **'පායන්තිං'** කිරි පොවන්නිය. **'මාතා වා හොති'** දරුහට යමක් පොවාද, ඒ දරුගේ මවු හෝ වේද, **'ධාතී වා'** කිරිමවු හෝ වේද, සෙස්ස ප්‍රකටමය. ප්‍රථම ද්විතීය ශික්ෂාපද දෙකම

ත්‍රිසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

දෙවන ශික්ෂාපදයයි

——\\——

තෘතීය ශික්ෂාපදයෙහි - **'සික්ඛාසම්මුතිං දත්‍වා'** කුමක්හෙයින් ශික්ෂා සම්මුතිය දෙවුයේද, මාගම නම් ලොල්වේ. අවුරුදු දෙකක් ප්‍රාණඝාතාදියෙන් වැළකීමැයි කියූ සවැදෑරුම් ධර්මයන්හි නොහික්මී සිල් පුරණුයේ කලාන්තවේ. හික්මීමෙන් පසුව සිල් පුරණුයේ කලාන්ත නොවන්නේය. ස්ථිර වන්නේයයි දෙවීය. **'පාණාතිපාතා වෙරමණිං ද්වෙ වස්සානි අවීතික්කමසමාදානං සමාදියාමි'** යම් ඒ ශික්ෂාපදයක් 'පාණාතිපාතා වෙරමණී'යි පණවනලද්දේද ඒ ප්‍රාණඝාතයෙන් විරමණසඞ්ඛ්‍යාත ශික්ෂාපදය දෙවසක් නොඉක්මවිය යුතු සමාදනය කොට සමාදන්වෙමි'යන අර්ථයි. සියලු තන්හි මේ නයවේ. මේ ෂට් ශික්ෂාවෝ පැවිදිවූ සැට වයස් ඇත්තියටද දියයුත්තාහුමය. මේ ශික්ෂාවන්හි නොහික්මුනාහු උපසපන් නොකටයුත්තාහ.

තෙවන ශික්ෂාපදයයි.

——\\——

චතුර්ථ ශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. ඉදින් පළමුකොට ශික්ෂාසම්මුති තොමා නොදෙනලද්දී වේද, උපසම්පද මාලකයෙහිදී හෝ දියයුත්තීමය. මේ දෙදෙනම මහාසික්ඛමානා නම්හ.

සිවුවන ශික්ෂාපදයයි

——\\——

පඤ්චම ශික්ෂාපදයෙහි - කිසිසේත් **'ඌනද්වාදසවස්සං'** උනු දෙළොස්වස් ඇත්තියක, පරිපූර්ණ සංඝයෙන් උපසපන් කරන්නියට ඇවැත් නොවේ. ඕතොමෝ වනාහි අනුපසම්පන්නාමවේ. සෙස්ස ප්‍රකටමය.

පස්වන ශික්ෂාපදයයි

——\\——

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - පුරුෂසමාගමයට පැමිණි දසවස් ඇත්තියකට ශික්ෂාසම්මුතියදී පිරිපුන් දෙළොස්වස් ඇත්තියක උපසපත් කිරීම දෙෂයෙක් නොවේ.

සවන ශික්ෂාපදයයි

——\\——

සප්තම ශික්ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. සියලු ශික්ෂාපදයන්හි සමුත්ථානාදීහුද, දෙවන ශික්ෂාපදයෙහි කියනලද්දවුන් හා සමානමවෙත්. මේ වනාහි විශේෂයවේ. යම් තැනෙක සම්මුතිය ඇත්තීද එහි ක්‍රියාක්‍රියයවේ.

සත්වන ශික්ෂාපදයයි

——\\——

අෂ්ටම ශික්ෂාපදයෙහි - **'න අනුග්ගණ්හාපෙය්‍ය'** 'ආයසීාව', මැයට උද්දේස ආදිය දෙව'යි මෙසේ උද්දේස ආදියෙන් අනුග්‍රහ නොකරවානම්, **'පරියෙසිත්වා'** අන් මෙහෙණක සොයා නොලබයි. තොමෝ ගිලන්වූවා වේද, උද්දේස ආදිය දීමට නොහැක්කීවේද, ඒ මෙහෙණට ඇවැත් නොවේ. සෙස්ස ප්‍රකටමය. ධූරනික්ෂෙපසමුත්ථානිකය. අක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

අටවන ශික්ෂාපදයයි

——\\——

නවම ශික්ෂාපදයෙහි - **'න උපට්ඨහෙය්‍ය'** සුණෙන් මැටියෙන් දැහැටියෙන් මුවදෝනා පැනින් යි මෙසේ ඒ ඒ කටයුත්තෙන් උවැටැන් නොකරන්නේ නම්, සෙස්ස ප්‍රකටමය. ප්‍රථමපාරාජිකසමුත්ථානිකය. අක්‍රියසමුත්ථානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

නවවන ශික්ෂාපදයයි

——\\——

දශම ශික්ෂාපදයෙහි - **'නෙව වූපකාසෙය්‍ය'** ගෙණ නොයන්නේනම්, **'න වූපකාසාපෙය්‍ය'** 'ආයසීාව, මෙය ගෙණ යව'යි අන් මෙහෙණකට

නො අණවන්නේ නම්, මෙහි සෙස්ස ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුට්ඨානිකය. අක්‍රියසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

දසවන ශික්ෂාපදයයි

සප්තමවූ ගර්භිණීවර්ගයයි

—||—

කුමාරීභූත වර්ගය පිළිබඳ ප්‍රථම-ද්විතීය-තෘතීය ශික්ෂාපද තුන ගිහීගත පදයුත් පඤ්චම-ෂෂ්ඨ-සප්තම ශික්ෂාපද හා සමානයහ. යම් ගර්භිණීවර්ගයෙහි සියල්ලම ප්‍රථමවූ මහාශික්ෂාමාණාවෝ දෙදෙනෙක් වෙත්ද, ඒ දෙදෙන ඉකුත් විසිවයස් ඇත්තාහයි දතයුත්තාහ. ඔවුහු පුරුෂාන්තරයට පැමිණියාහු හෝ වෙත්වා. පුරුෂාන්තරයට නොපැමිණියාහු හෝ වෙත්වා, ශික්ෂාමාණාහයිම කියයුත්තාහ. ගිහීගතායි හෝ කුමාරීභූතායි හෝ නොකියයුත්තාහ. පුරුෂාන්තරයට ගියතැනැත්තියට දසවස් කාලයෙහි ශික්ෂාසම්මුතිය දී දෙළොස් හැවිරිදි කල්හි උපසම්පදව කටයුත්තීය. එකොළොස් හැවිරිදි කල්හි ශික්ෂාසම්මුතියදී තෙළෙස් හැවිරිදි කාලයෙහි උපසම්පද කටයුතුය. දෙළොස් තෙළෙස්, තුදුස් පසළොස් සොළොස්, සතළොස්, අටළොස් හැවිරිදි කල්හි ශික්ෂා සම්මුතියදී විසිහැවිරිදි කල්හි උපසම්පදව කටයුත්තීය. අටළොස් හැවිරිදි කලපටන් මෝතොමෝ ගිහීගතායිද, කුමාරීභූතායිද කීම වටියි. කුමාරීභූතා තොමෝ ගිහීගතායි නොකියයුත්තීය. මහාශික්ෂමාණ තොමෝ වනාහි ගිහීගතායි කීම නොසුදුසුය. කුමාරීභූතායිද කීම නොවටියි. ශික්ෂාසම්මුතිදානවශයෙන් වනාහි තිදෙනම ශික්ෂමාණාහයි කීම සුදුසුවේ.

පළමුවන - දෙවන - තෙවන ශික්ෂාපදයෝය.

—||—

චතුර්ථ - පඤ්චම - ෂෂ්ඨ ශික්ෂාපදයන්හි - සියල්ල ප්‍රකටමය. සියලු ශික්ෂාපදයෝ ත්‍රිසමුට්ඨානිකහය. සිවුවන ශික්ෂාපදය ක්‍රියසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි. පස්වන ශික්ෂාපදය ක්‍රියාක්‍රියසමුට්ඨානය. සංඥවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාකකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි. මෙහි වනාහි 'යමක් සඞ්ඝයා විසින් පිරිසිඳිය යුතුයයි කියනලද්දේද, එය පරීක්ෂා කටයුතුය යන අර්ථයි. සවන ශික්ෂාපදය

ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්‍ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි. මෙහි යමක් පිරිසිදැයි කියනලද්දේද, එය පරීක්‍ෂා කොටයයුත අර්ථයි.

සිවුවන පස්වන සවන ශික්‍ෂාපදයෝය.

——\\——

සප්තමශික්‍ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. ධුරනික්ෂෙපසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්‍ෂය. සචිත්තකය. ලොකවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. අකුශලචිත්තයි. දුඃඛවෙදනයි.

සත්වන ශික්‍ෂාපදයයි

——\\——

අෂ්ටම ශික්‍ෂාපදයෙහි - සියල්ල ප්‍රකටමය. සමුට්ඨානාදීහු අනතුරු ශික්‍ෂාපදය හා සමානම වෙත්.

අටවන ශික්‍ෂාපදයයි

——\\——

නවම ශික්‍ෂාපදයෙහි - '**සොකවස්සං**' සලකුණු කොට එන්නාවූ පුරුෂයන්ගේ ඇතුළත ශොකය ප්‍රවෙශ කරන්නීයයි 'සොකවස්සා' නමු. ඒ පරහට දුක් උපදවන්නීය. එහෙයින්ම '**සොකවස්සා නාම පරෙසං දුක්ඛං උප්පාදෙති**'යි කීහ. නොහොත් ගෙට ගෙයිසැළයක් මෙන්. මෝ තොමෝද, පුරුෂසමාගමය නොලබන්නී ශොකයට පැමිණෙන්නීය. මෙසේ යමකට ප්‍රවෙශ වන්නීද, එය මැයට ආවාසයක් වේයයි සොකවාසා නමු. එහෙයින් '**සොකං ආවිසති**'යි කීහ. '**අජානන්ති**' මෝතොමෝ මෙබඳු අයැකැයි නොදන්නීයය. සෙස්ස ප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥවිමොක්‍ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

නවවන ශික්‍ෂාපදයයි

——\\——

දශමශික්‍ෂාපදයෙහි - '**අනාපුච්ඡා**' නොවිචාරා. මෙහෙණින් විසින් පැවිදි කරණකල්හිද, උපසපන් කරණකල්හිද, දෙවරක් විචාළයුතුය. මහණුන්ට වනාහි එක්වරක් විචාළ කල්හිද වටියි. '**අජානන්ති**' මාතෘ ආදීන් ඇතිබව නොදන්නී. සෙස්ස ප්‍රකටමය. මෙය පෙර නොවූ

සමුට්ඨානශීර්ෂයවේ. චතුස්සමුට්ඨානිකය. වාචායෙන්ද කායවාචායෙන්ද වාචාචිත්තයෙන්ද, කායවාචාචිත්තයෙන්ද හටගණියි. කිසේය, යත්: අබ්භානකර්මාදීන් අතුරෙහි කිසියම් කටයුත්තකින් ඛණ්ඩසීමාවෙක්හි හුන්නී 'ශික්ෂමාණව මෙහිදීම ඇය උපසපන් කරන්නෙමු'යි උපසපන් කෙරේද, මෙසේ වචනයෙන් හටගණියි. අසපුවෙහි පටන් උපසපන් කරන්නෙමියි කියකියා ඛණ්ඩසීමාවට යන්නියට කායවාචායෙන් හටගණියි. දෙතැන්හිම ප්‍රඥප්තිභාවය දැනම ව්‍යතික්‍රම කරන්නියට වාචාචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. නොඅනුදන්වා උපසපන් කරණබැවින් ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දසවන ශික්ෂාපදයයි

—॥—

එකාදශ ශික්ෂාපදයෙහි - **'පාරිවාසියඡන්දදානෙන'** විගතඡන්දදානයෙන්. එහි පාරිවාසිය, පරිසපාරිවාසිය - රත්තිපාරවාසිය - ඡන්දපාරිවාසිය - අජ්ඣාසයපාරිවාසියයි සිවුවැදෑරුම්වේ. එහි පරිසපාරිවාසිය නම් භික්ෂූහු කිසි කටයුත්තක් නිසා රැස් වූවාහු වෙත්ද එකල්හි මේඝයක් හෝ නගීද බැහැර කිරීමක් හෝ කරණු ලැබේද, මනුෂ්‍යයෝ හෝ යටපත් කරමින් එත්ද, එකල්හි භික්ෂූහු 'අවකාශයක් නැත්තේය, අපි අන් තැනක යමු'යි ඡන්දය නොහැරම නැගීසිටිත්ද, මෙය **පරිසපාරිවාසිය** නම්වේ. පරිසපාරිවාසියෙහි ඡන්දය නොහළ බැවින් කර්මකිරීමෙහි දෝෂයක් නැත්තේය. නැවැත භික්ෂූහු 'උපොසථාදිය කරන්නෙමු'යි රාත්‍රියෙහි රැස්ව යම්තාක් සියල්ලෝ රැස්වෙත්ද, ඒතාක් ධර්මය අසන්නෙමු'යි එකක්හට ආරාධනා කෙරෙත්ද, ඔහු ධර්මකථාව කියත්දීම අරුණනගීද, ඉදින් චාතුද්දසී පොහොය කරන්නෙමු'යි හුන්නාහු පණ්ණරසියයි කිරීම වටියි. ඉදින් පණ්ණරසීපොහොය කරන්නට පැළවියලත් අනුපොසථදිනයෙහි පොහොය කිරීම සුදුසුනොවේ. අන්‍යවූ සඞ්ඝකෘත්‍යය කිරීම වරදනොවේ. මෙය **රත්තිපාරිවාසිය** නම්වේ. නැවැත භික්ෂූහු 'අබ්භානාදීවූ කිසි සඞ්ඝකර්මයක් කරන්නෙමු'යි හුන්නාහු වෙත්ද, එහි එක්නැකත් කියන මහණෙක් 'අද නැකත දරුණුය, මේ කර්මය නොකරවු'ය මෙසේ කියයි. ඒ භික්ෂූහු ඔහුගේ වචනයෙන් ඡන්දය හැර එහිම හුන්නාහු වෙත්. එකල්හි අතිකෙක් අවුත් 'අර්ථය තෙමේ නැකත් පුදන කියන බාලයා ඉක්ම යන්නේය'යි කියා 'නැකතින් කිම, කරවු'යි කියයි. මේ ඡන්දපාරිවාසිය නම්වේ. අජ්ඣාසය පාරිවාසිය නම්දවේ. මේ පාරිවාසියයෙහි නැවැත **ඡන්දපාරිශුද්ධිය** නොගෙණ කර්ම කිරීම සුදුසු නොවේ. **'වුට්ඨිතාය පරිසාය'** ඡන්දය හැර

කයින් හෝ වචනයෙන් ඡන්දය හැරීම් පමණකින් හෝ පිරිස නැගී සිටිකල්හි **'අනාපත්ති අවුට්ඨිතාය පරිසාය'** ඡන්දය නොහැර නොනැගිටිකල්හි ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. ත්‍රිසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. සංඥාවිමොක්ෂය. සචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

එකොළොස්වන ශික්ෂාපදයයි

—||—

ද්වාදශ ශික්ෂාපදයෙහි - **'උපස්සයො න සම්මති'** වසන අවකාශය නොපොහොනේය. සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු අනතුරු ශික්ෂාපදය හා සමානම වෙත්.

දෙළොස්වන ශික්ෂාපදයයි

—||—

ත්‍රයොදශ ශික්ෂාපදයෙහි - **'එකං වස්සං ද්වෙ'** එක් අතරක පැවැති එක් අවුරුද්දෙක්හි දෙදෙනක උපසපන් කෙරේද, සෙස්ස ප්‍රකටමය. සමුට්ඨානාදීහු කියනලද්දහු හා සමානමවෙති.

තෙළෙස්වන ශික්ෂාපදයයි

අෂ්ටමවූ කුමාරීභූතවර්ගයයි

—||—

ඡත්‍රවර්ගීය පිළිබඳ ප්‍රථම ශික්ෂාපදයෙහි - **'සකිම්පි ධාරෙති ආපත්ති පාචිත්තියස්ස'** මග යැමෙහි එක් ප්‍රයොගයෙන්ම සත් හා පාවහන් දවසක් නමුදු දරානම් එක්ම ඇවැතක් වේ. ඉදින් මඩ ඇති තැනට පැමිණ වහන් මුද ඡත්‍රයම දරමින් යේද දුක්කටයවේ. නැවැතද ගස්වැල් ආදිය දැක ඡත්‍රය බැහැරකොට වහන් නැගමයේද, දුක්කටයමවේ. ඉදින් ඡත්‍රයද බැහැර කොට, වහන්ද මුද, නැවැත දරානම් නැවැත පාචිත්තියවේ. මෙසේ ප්‍රයොගගණනින් ආපත්තීහු දතයුත්තාහ. සෙස්ස ප්‍රකටමය. එළකලොමසමුට්ඨානිකය. ක්‍රියාසමුට්ඨානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

පළමුවන ශික්ෂාපදයයි

—||—

ද්විතීයශික්ෂාපදයෙහි - **'යානෙන යායන්ති'** මෙහිද යානයෙන් බැස නැවැත නැවැත නගින්නියට ප්‍රයොගගණනින් ආපත්තීහු දතයුත්තාහුය. සෙස්ස ප්‍රථම ශික්ෂාපදයෙහි කියූ නයමය.

දෙවන ශික්ෂාපදයයි

——||——

තෘතීය ශික්ෂාපදයෙහි - **'විප්පකිරියිංසු'** මාණික්‍යයෝ විසුරුණහුය. මෙහිද මෙවුල් ආදී යම්කිසි හුයක්ලා දරන්නියට ප්‍රයොගගණනින් ආපත්තීහු වෙත්. සමුත්ථානාදීහු කියූ නයම ඇත්තාහුය. හුදෙක් මෙය අකුශලචිත්තවේ.

තෙවන ශික්ෂාපදයයි

——||——

චතුර්ථ ශික්ෂාපදයෙහි - හිසෙහි පැළඳිය යුතු ආභරණාදීන් අතුරෙහි යමක් යමක් දරාද, ඒ ඒ ආභරණයාගේ වසයෙන් වස්තුගණනින් ආපත්තීහු දතයුත්තාහ. සෙස්ස තෘතීය ශික්ෂාපදයෙහි කියූ නයමය.

සිවුවන ශික්ෂාපදයයි

——||——

පඤ්චම ශික්ෂාපදයෙහි - **'ගන්ධවණ්ණකෙන'** සඳුන් තුවරලා ඈ සුවඳකින්ද, කසාකල්කාදියකින්ද, (ඇඟඋලා නාන මෙහෙණට ඇවැත්ය) සෙස්ස ප්‍රකටමය. සමුත්ථානාදීහු තෘතීයශික්ෂාපදය හා සමානමවෙත්.

පස්වන ශික්ෂාපදයයි.

——||——

ෂෂ්ඨ ශික්ෂාපදයෙහි - සියල්ල පඤ්චම ශික්ෂාපදයෙහි කියනලද්දහු සමානමවේ.

සවන ශික්ෂාපදයයි

——||——

සප්තම ශික්ෂාපදයෙහි - **'උබ්බට්ටාපෙති ආපත්ති පාචිත්තියස්ස'** මෙහි අත නොමුද ඇඟ ඉලීම නිමිතිකර එක්ම ඇවැතක්වේ. අත මුද මුද ඇඟ ඉලීම නිමිතිකර ඇවැත්හු ප්‍රයොග ගණනින් වෙත්. සම්බාහනය නිමිතිකොටද මෙම නයවේ. **'ගිලානාය'** යටත් පිරිසයින් මඟ යෑමෙන්වූ පරිශ්‍රමයෙන්ද ආබාධ සහිත තැනැත්තියට. **'ආපදාසු'** සොරභීය ආදියෙන්වූ ශරීරකම්පනාදීන් අතුරෙහිය. සෙස්සප්‍රකටමය. සමුට්ඨානාදීහු තෘතීය ශික්ෂාපදය හා සමානම වෙත්.

සත්වන ශික්ෂාපදයයි

—||—

අෂ්ටමාදීවූ ත්‍රිවිධ ශික්ෂාපදයන්හි ශික්ෂමාණවලවා සාමණේරියලවා ගිහිනිය ලවා යන මේම වෙනස්බවය. සෙස්ස සප්තම ශික්ෂාපදයෙහි කියනලද්දහු සමානවේ.

අටවන නවවන දසවන ශික්ෂාපදයෝය.

—||—

එකාදශ ශික්ෂාපදයෙහි - **'භික්ඛුස්ස පුරතො'** අභිමුඛයෙහිම යන අර්ථයි. මේ වනාහි හාත්පස්හි දෙළොස්රියන් උපචාරය සඳහා කියනලද්දේයයි දතයුතුය. සෙස්ස ප්‍රකටමය. කඨිනසමුට්ඨානිකය. කායවාචායෙන්ද කායවාචාචිත්තයෙන්ද, හටගණියි. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

එකොළොස්වන ශික්ෂාපදයයි

—||—

ද්වාදශ ශික්ෂාපදයෙහි - **'අනොකාසකතං'** අසුවල් නම් තැන්හි විචාරමියි මෙසේ නොකළ අවකාශ ඇති එහෙයින්ම අනොකාසකතං, යනු කීහ. **'අනාපුච්ඡා'** යනුද **'අනොදිස්ස'** යනුද අසුවල් නම් තන්හි විචාරම්'යි මෙසේ නියම නොකොට හුදෙක් 'ආයර්‍ය' විචාරිය යුත්තෙක් ඇත්තේය, විචාරම්'යි මෙසේ කියා. සෙස්ස ප්‍රකටමය. පදසොධම්මසමුට්ඨානිකය. වාචායෙන්ද, වාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාක්‍රියසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනයි.

දෙළොස්වන ශික්ෂාපදයයි

—||—

ත්‍රයෝදශ ශික්ෂාපදයෙහි - **'පරික්ඛෙපං අතික්කාමෙන්තියා'** එක් පයකින් ඉක්මුනු කල්හි දුක්කටයවේ. දෙවන පයින් ඉක්මුනකල්හි පාචිත්තියවේ. උපචාරයෙහිද මේ නයමවේ. **'අච්ඡින්න චීවරිකාය'** යනාදිතන්හි තනවෙළුම් සිවුරම සිවුරයි දතයුතුය. **'ආපදාසු'** මහගි තනවෙළුමක්වේද, එය පොරොවා යන්නියටම උපද්‍රවයක් උපදීද, මෙබඳු විපත්හි ඇවැත් නොවේ. සෙස්සප්‍රකටමය. එළකලොමසමුත්ථානිකය. ක්‍රියාසමුත්ථානය. නොසංඥාවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවේදනයි.

තෙළෙස්වන ශික්ෂාපදයයි

නවමඡත්‍රවර්ගීයයි

——||——

**'උද්දිට්ඨා ඛො අය්‍යායො ඡසට්ඨිසතපාචිත්තියාධම්මා'** යන මෙහි භික්ෂූන්ට ඛුද්දකයෙහි සයානුවෙක. භික්ෂුණීන්ට දෙයානුවෙකැයි සියල්ලෝම එක්සිය අටාසූවක් ශික්ෂාපදයෝ වෙත්. එයින් සියලු භික්ෂුණීවර්ගීය පරම්පරභොජනශික්ෂාපදය - අනතිරිත්ත භොජනශික්ෂාපදය - ඉතිරි නොකළදෙයින් එළවා පැවැරීම දක්වන ශික්ෂාපදය - ප්‍රණීත භොජන විඤ්ඤත්ති ශික්ෂාපදය - අචෙලකශික්ෂාපදය - දුට්ඨුල්ල පටිච්ඡාදන ශික්ෂාපදය - ඌනවීසතිවස්සූපසම්පාදන ශික්ෂාපදය, මාගමක හා විධානකොට අද්ධාන ගමනශික්ෂාපදය - රාජන්තෙපුරප්පවෙසන ශික්ෂාපදය - විද්‍යමාන මහණහු නොවිචාරා, නොකල්හි ගාමප්පවෙසන ශික්ෂාපදය - නිසීදන ශික්ෂාපදය - වස්සිකසාටික ශික්ෂාපදය යන මේ දෙවිසි ශික්ෂාපදයන් බැහැරකොට සෙසු එක්සිය සසැටක් ශික්ෂාපදද ප්‍රාතිමොක්ෂොද්දෙශ මාර්ගයෙන් උදෙසනලද්දාහු වෙත්යි දතයුතුය. එහෙයින් **'උද්දිට්ඨා ඛො අය්‍යායො ඡසට්ඨිසතපාචිත්තියා ධම්මා - පෙ- එවමෙතං ධාරයාමි'**යි කීහ. එහි මේ සැකෙවින් සමුත්ථානවිනිශ්චයයි. ගිරග්ගසමජ්ජ ශික්ෂාපදය, චිත්තාගාරශික්ෂාපදය - සඞ්ඝාණිශික්ෂාපදය - ඉත්ථාලඞ්කාරශික්ෂාපදය - ගන්ධවණ්ණකශික්ෂාපදය - වාසිතකශික්ෂාපදය - විඤ්ඤාතක ශික්ෂාපදය - මෙහෙණන් ආදීන් ලවා උබ්බට්ටන පරිමද්දන ශික්ෂාපදයෝය යන මේ දශ ශික්ෂාපදයෝ අචිත්තක වෙත්. ලොකවද්‍ය වෙත්. මේ මෙහි අධිප්‍රායය. සිතින් වෙන්වද පැමිණිය යුතු බැවින් අචිත්තක වෙත්. සිත ඇති කල්හි අකුශලයෙන්ම පැමිණිය යුතුබැවින් අචිත්තක වෙත්. සිත ඇති කල්හි අකුශලයෙන්ම පැමිණිය යුතුබැවින් ලොකවද්‍යවෙත්. සෙස්සෝ අචිත්තකවෙත්. ප්‍රඥප්තිවද්‍යයෝම වෙත්.

චොරිදට්ඨාපනශික්ෂාපදය - ගාමන්තරශික්ෂාපදය - ආරාමශික්ෂාපදය - ගර්භිණීවර්ගයෙහි මුලපටන් ශික්ෂාපද සතද කුමාරීභූතවර්ගයෙහි මුලපටන් ශික්ෂාපද පසද, පුරිසසංසට්ඨ ශික්ෂාපදය - පාරිවාසිය ඡන්දදානශික්ෂාපදය - අනුවස්සා වුට්ඨාපන ශික්ෂාපදය - එකන්තරිකවුට්ඨාපන ශික්ෂාපදය යන මේ එකුන්විසි ශික්ෂාපදයෝ සචිත්තක වෙත්. ප්‍රඥප්තිවද්‍යවෙත්. සෙසු ශික්ෂාපදයෝ සචිත්තක වෙත්. ලොකවද්‍යවෙත්.

විනයවිවෘති

නම්වූ

සිංහලසමන්තපාසාදිකාවෙහි

භික්ෂුණීවිභඞ්ගයෙහි

ඛුද්දකවර්ණනාව නිමි

——||——

පාටිදෙසනීයා නාම - ඛුද්දකානං අනන්තරා
යෙ ධම්මා අට්ඨ ආරුළ්හා - සඞ්ඛෙපෙනෙව සඞ්ගහං
තෙසං පවත්තතෙ එසා - සඞ්ඛෙපෙනෙව වණ්ණනා

ඛුද්දකයන්ට අනතුරුව පාටිදෙසනිය නම්වූ යම් ධර්ම අටක් සැකෙවින්ම සඞ්ග්‍රහයට නගනලදද, ඔවුන්ගේ මේ වර්ණනාතොමෝ සැකෙවින්ම පවත්නීය.

මෙහි පෙළෙහි යම්හෙයකින් ගිතෙල් තෙල් ආදීහු දක්වනලදද, ඒ ගිතෙල් තෙල් විනවා අනුභව කරන්නියට පාටිදෙසනීයවේ. පෙළෙහි නොආ ගිතෙල් තෙල් ආදී සියල්ලෙහි දුක්කටයවේ.

මෙහි සෙස්ස ප්‍රකටමය. අටවැදෑරුම්වූද මේ පාටිදෙසනිය වනාහි චතුස්සමුට්ඨානිකය. කායයෙන්ද, කායවාචායෙන්ද කායචිත්තයෙන්ද කායවාචාචිත්තයෙන්ද හටගණියි. ක්‍රියාසමුට්ඨානය. නොසංඥවිමොක්ෂය. අචිත්තකය. ප්‍රඥප්තිවද්‍යය. කායකර්මයි. වාක්කර්මයි. ත්‍රිචිත්තයි. ත්‍රිවෙදනායි.

පාටිදෙසනීය වර්ණනාව නිමි

—॥—

යම් සෙඛියාධර්ම පන්සැත්තෑවක් උදෙසනලදද, ඔවුන්ට අනතුරුවම සප්තඅධිකරණ නම් ධර්මයෝ උදෙසනලදහ. ඔවුන්ගේ යම් අර්ථවිනිශ්චයෙක් තෙමේ මහාවිභඞ්ගයෙහි කියනලද්දේද, භික්ෂුණීවිභඞ්ගයෙහිද එය එබඳුමයයි යම්හෙයකින් දනිත්ද, එහෙයින් ඒ ධර්මයන්ගේ අර්ථවර්ණනාව වෙන්ව නොකියනලදී. එහි යම් අර්ථවර්ණනාවක් කියනලදද, ඒ අර්ථවර්ණනාව මෙහි කියනලදමය.

විනයවිවෘති

නම්වූ

සිංහලසමන්තපාසාදිකාවෙහි

භික්ෂුණීවිභඞ්ගවර්ණනාව නිමි.